භදන්තාචරිය ධම්මපාල සථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ
ථෙරගාථාඨ්ඨ කථා

(සිංහල පරිවර්තනය)

I



ප්‍රකාශනය
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

පේරගාථාඨ කථා
පළමුවෙනි භාගය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි, පේරගාථාඨ කථා පළමුවැනි කොටස සිංහලට පරිවර්තනය කරන ලද්දේ පූජ්‍ය හත්තොටුවේ ඉන්ද්‍රරතන හිමියන් විසිනි. උන් වහන්සේ මාතර පළාතේ ප්‍රධාන සංඝනායක විචිත්‍රභාණී ඌරුමුත්තේ සෝමරතන මා හිමියන්ගේ ශිෂ්‍ය වරයෙකි. උන් වහන්සේ සසුන් ගත වූයේ 1990දීය. 2001 වසරේදී ප්‍රාචීන අධ්‍යාන විභාගයෙන් සමස්ත දිවයිනෙන්ම ප්‍රමුඛයා ලෙස [illegible] "රාජකීය පණ්ඩිත" [illegible] හිමිකම් කිහ. 2004 [illegible] ශෝරාදෙණිය [illegible] ශාස්ත්‍රවේදී පාලි [illegible] උපාධිය [illegible] ඉක්බිති වැ [illegible] විද්‍යාලයෙන් [illegible] විද්‍යා) උපාධිය [illegible] උන්වහන්සේ දැනට [illegible] විද්‍යාලයේ [illegible] උපාධිය සඳහා [illegible] වලයේදී.

[illegible] අත්ත, නිහිළුව සිරි ධම්මානන්ද [illegible] පිරුවෙනෙහි පිරුවන්පති පදවිය උසුලන ඒ හිමියෝ, දෙහිවල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන මණ්ඩලයේ ද සේවය කරති. විවිධ ශාස්ත්‍රීය ලිපි ලේඛන පොත පත ද සම්පාදනය කරන උන්වහන්සේගේ පර්යේෂණ කෘතීන් අතර "අටපිරිකර දානානිසංසය" එක කෘතියකි. උන්වහන්සේගේ දැනුම විශාරදය. නිරවුල් ය, බස පැහැදිලිය. ව්‍යක්තය ධර්ම කරුණු පිළිබඳ අවබෝධය ඉතා උසස්ය. ශාස්ත්‍රීය සේවය මෙන්ම ආගමික සේවය ද උන්වහන්සේගේ කර්තව්‍යයෝය.

Vol. XVIII

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

ථේරගාථාඨ්ඨ කථා

පළමුවෙනි කොටස
(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

ථේරගාථට්ඨ කථා

පළමුවෙනි කොටස

(එකක - චුද්දස නිපාත)

සිංහල පරිවර්තනය

බෙලිඅත්ත නිහිළුව හ/සිරි ධම්මානන්ද පිරිවෙන්පති

රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය

පූජ්‍ය හත්තොටුවේ ඉන්දරතන හිමි

ඩී.ඒ. ගෞරව - (ජේරාදෙණිය) එම්.ඒ. (කැළණිය)

අධිකෂණය

ඒ. ලසිත් නලන්ත

ශාස්ත්‍රවේදී, (ගෞරව) රාජකීය පණ්ඩිත

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල

දුරකථන: 2734256 ෆැක්ස්: 21736737

හදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ
ථේරගාථාට්ඨ කථා

පළමුවෙනි කොටස
(එකක - චුද්දස නිපාත)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-11-0

පරිගණක අකුරුකරණය
නිල්මිණි විජේසේකර - පිළියන්දල

පිටකවරය
සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම

මුද්‍රණය
අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.
දුරකථනය: 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 21736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය භූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැළකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය්‍ය රීස් ඩේවිඩ්ස්තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර්තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනය ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයීක භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැළකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථෙරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථෙරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතියට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනා ගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධ ජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළ අටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථෙරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථෙරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එනලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන්

තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන සිංහල භික්ෂූන් විසින් පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දී අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුණු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණු මහා අට්ඨකථාවේ ලක්දිව සිදු වූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණු බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දී අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ ඤාඤේවිපුර (කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත

පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩබෙටක නම් ගම් බව පිළිගෙන ඇත. ආන්ද්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ ''කෝටනේමලී පුරිගුන්ඩ්ලු පල්ලි'' යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩකේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩකේටක යැයි විසුද්ධ මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කතාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද පැහිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අට්ඨාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථෙරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධ වර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවස ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සළකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන් ලක්ෂ එක්සැට්දහස්

සන්සිය පනස් ගුන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දන යුතු යැයි ප්‍රශාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොවේ, ඒවා සකස් කිරීම යහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසි ද සහිතවය.

''මහා අට්ඨකථාව ශරීරය කොටගෙන **මහාපච්චරිය කුරුන්දි** ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු.''

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහල වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටය යන ජන ප්‍රවාදයක් ද ඇත.

විනය පිටකය

	පෙළ	අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාලි	1 ආණා දෙනා සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	්වන ශ.ව.
	2. පාචිත්තිය පාළි	2 යථාපරාධ ශාසන විනය අට්ඨකථා		
බන්ධක	3 චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා		
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
		භික්ඛුපාතිමෝක්ඛ කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	්වන ශ.ව.
		භික්ඛුණී පාතිමෝක්ඛ (මාතිකාඨ කථා)		

අභිධර්ම පිටකය

1. ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
2. විභංගප්පකරණ	2 යථාධම්ම ශාසන සම්මෝහ විනෝදනී		බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
	3. නාමරූප පරිච්ඡේද කථා		
3. කථාවත්තුප්පකරණ			බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
4. පුද්ගලපඤ්ඤත්තිප්පකරණ			
5. ධාතුකථාප්පකරණ	පරමත්ථදීපනී		
6. යමකප්පකරණ	පඤ්චප්පකරණට්ඨකථා		
7. පට්ඨානප්පකරණ			

සූත්‍ර පිටකය

1. දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
2. මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
3. සංයුත්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
4. අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
5. ඛුද්දක නිකාය			
1. ඛුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
2 ධම්මපද	ධම්මපදට්ඨ ගාථා		බුද්ධඝෝෂ හිමි ්වන ශ.ව.
3. උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය ්වන ශ.ව.
4. ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය ්වන ශ.ව.
5. සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5 වන ශ.ව.
6. විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය ්වන ශ.ව.
7. පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය ්වන ශ.ව.

8. පෙරගාථා	පරමත්ථදීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
9. පේති ගාථා	පරමත්ථදීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
10. ජාතක	ජාතකට්ඨකථා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
11 නිද්දේස (චූල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා	උපසේන ආචාර්ය	6වන ශ.වි.
12. අපදාන (පෙර-පේති)	විසුද්ධ ජන විලාසනී	මහානාම ආචාර්ය	7වන ශ.වි.
13. පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී	ධම්මපාල ආචාර්ය	7වන ශ.වි.
14. බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී	බුද්ධදත්ත හිමි	5වන ශ.වි.
15. චරියාපිටක	පරමත්ථ දීපනී	ධම්මපාල ආචාර්ය	5වන ශ.වි.
	විසුද්ධි මග්ග	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධර්මපාල ආචාර්ය	5වන ශ.වි.
චතුභාණවාරපාලි	චතුභාණවාර අට්ඨකථා	ආනන්ද වනරතන	8වන ශ.වි.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදී.

මහානාම හිමි

පටිසම්භිදා මග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනීය මුන්වහන්සේ විසින් ලියා ඇත.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්තු - ප්‍රේතවත්තු - තෙරතෙරී ගාථා අට්ඨකථා මුන් වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා වරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරියවාද, ආචරිය මත, ආචරියා වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතර ද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත් අට සියයක් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ නැන්වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය තහවුරු කරනු සඳහා ඒවා මදකිනිඳු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රනාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්මය ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇති කරන ලද ආගමික ප්‍රබෝදයේ එක් ආභාසයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදිහත්වීමෙන් කොල්ලුපිටියේ ජ්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ

ඩික්මන් පාරේ නක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සංසනමාක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය බාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම මුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියානික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීමේ මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

''කථා පවත්තිනී'' නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනී නම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳව විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව

විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීම අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරඥේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනා පූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සළකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සම්ක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්තිථිකාමී,
කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ

අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍යරාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රීසුමංගල නායක මාහිමිපාණන්වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වීදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්නොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බඹුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත කිර්ති නරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත එච්.වී.ඇස්. නිශ්ශංක මහතා
පණ්ඩිත බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත අරුණ කේ. ගමගේ මහතා
පණ්ඩිත සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත දයා ගුණසේකර මහතා
පණ්ඩිත ලසිත් නලන්ත මහතා
පණ්ඩිත ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය : විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ

අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)

2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැළණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය)

3. හේමචන්ද්‍ර දිසානායක මහතා

4. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
(ශාස්ත්‍රපති)

5. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ (ශාස්ත්‍රපති)

6. හේමචන්ද්‍ර දිසානායක මහතා (සිංහල ශබ්ද කෝෂය)

7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (සිංහල ශබ්ද කෝෂය)

8. පණ්ඩිත ඒ. ලසිත් නලත්ත මහතා (සිංහල ශබ්ද කෝෂය)

9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)

පටුන

පිටු අංකය

පළමුවෙනි නිපාත වර්ණනා			1-318
1.	නිදාන වර්ණනා		1-21
1.1.1.	සුභූති	ථෙරගාථා වර්ණනා	22-37
1.1.2.	මහාකොට්ඨිත	ථෙරගාථා වර්ණනා	37-42
1.1.3.	කඩ්ඛාරේවත	ථෙරගාථා වර්ණනා	42-48
1.1.4.	පුණ්ණ මන්තානි පුත්ත	ථෙරගාථා වර්ණනා	48-53
1.1.5.	දබ්බ	ථෙරගාථා වර්ණනා	53-60
1.1.6.	සම්භූත	ථෙරගාථා වර්ණනා	60-64
1.1.7.	හල්ලිය	ථෙරගාථා වර්ණනා	64-66
1.1.8.	වීර	ථෙරගාථා වර්ණනා	67-68
1.1.9.	පිලින්දිවච්ඡ	ථෙරගාථා වර්ණනා	69-72
1.1.10.	පුණ්ණමාස	ථෙරගාථා වර්ණනා	72-74
1.2.1	චූළගවච්ඡ	ථෙරගාථා වර්ණනා	75-77
1.2.2.	මහාගවච්ඡ	ථෙරගාථා වර්ණනා	77-78
1.2.3.	වනවච්ඡ	ථෙරගාථා වර්ණනා	79-81
1.2.4.	සීවක සාමණේර	ථෙරගාථා වර්ණනා	81-83
1.2.5.	කුණ්ඩධාන	ථෙරගාථා වර්ණනා	84-90
1.2.6.	බෙලට්ඨ සීස	ථෙරගාථා වර්ණනා	91-92
1.2.7.	දාසක	ථෙරගාථා වර්ණනා	93-94
1.2.8.	සිඟාල පිතු	ථෙරගාථා වර්ණනා	95-96
1.2.9.	කුණ්ඩල	ථෙරගාථා වර්ණනා	97-98
1.2.10.	අජිත	ථෙරගාථා වර්ණනා	99-100
1.3.1.	නිග්‍රෝධ	ථෙරගාථා වර්ණනා	101-104
1.3.2.	විත්තක	ථෙරගාථා වර්ණනා	104-106
1.3.3.	ගෝසාල	ථෙරගාථා වර්ණනා	106-107
1.3.4.	සුගන්ධ	ථෙරගාථා වර්ණනා	108-109
1.3.5.	නන්දිය	ථෙරගාථා වර්ණනා	110-111

1.3.6.	අභය	තෙරගාථා වර්ණනා	111-114
1.3.7.	ලොමසකංගිය	තෙරගාථා වර්ණනා	114-116
1.3.8.	ජම්බුගාමිය	තෙරගාථා වර්ණනා	116-118
1.3.9.	හාරිත	තෙරගාථා වර්ණනා	118-120
1.3.10.	උත්තිය	තෙරගාථා වර්ණනා	120-122
1.4.1.	ගව්හරතීරිය	තෙරගාථා වර්ණනා	123-124
1.4.2.	සුප්පිය	තෙරගාථා වර්ණනා	124-127
1.4.3.	සෝපාක	තෙරගාථා වර්ණනා	127-130
1.4.4.	පෝසිය	තෙරගාථා වර්ණනා	130-132
1.4.5.	සාමඤ්ඤකානි	තෙරගාථා වර්ණනා	133-135
1.4.6.	කුමාපුත්ත	තෙරගාථා වර්ණනා	135-137
1.4.7.	කුමාපුත්ත සහාය	තෙරගාථා වර්ණනා	137-139
1.4.8.	ගවම්පති	තෙරගාථා වර්ණනා	139-141
1.4.9.	තිස්ස	තෙරගාථා වර්ණනා	141-143
1.4.10.	වඩ්ඪමාන	තෙරගාථා වර්ණනා	143-144
1.5.1.	සිරිවඩ්ඪ	තෙරගාථා වර්ණනා	145-146
1.5.2.	බදිරවනීය රේවත	තෙරගාථා වර්ණනා	146-149
1.5.3.	සුමංගල	තෙරගාථා වර්ණනා	150-152
1.5.4.	සානු	තෙරගාථා වර්ණනා	153-156
1.5.5.	රමණීය විහාරි	තෙරගාථා වර්ණනා	156-158
1.5.6.	සමිද්ධි	තෙරගාථා වර්ණනා	158-160
1.5.7.	උජ්ජය	තෙරගාථා වර්ණනා	160-161
1.5.8.	සඤ්ජය	තෙරගාථා වර්ණනා	162-163
1.5.9.	රාමණෙය්‍ය	තෙරගාථා වර්ණනා	163-164
1.5.10.	විමල	තෙරගාථා වර්ණනා	165-166
1.6.1.	ගෝධික	තෙරගාථා වර්ණනා	167-168
1.6.2.	සුබාහු	තෙරගාථා වර්ණනා	168-168
1.6.3.	වල්ලිය	තෙරගාථා වර්ණනා	168-169
1.6.4.	උත්තිය	තෙරගාථා වර්ණනා	169-171
1.6.5.	අඤ්ජනවනිය	තෙරගාථා වර්ණනා	172-174

1.6.6.	කුටිවිහාරිය	ථෙරගාථා වර්ණනා	174-176
1.6.7.	දුතිය කුටිවිහාරිය	ථෙරගාථා වර්ණනා	176-178
1.6.8.	රමණීයකුටික	ථෙරගාථා වර්ණනා	178-180
1.6.9.	කෝසල විහාරී	ථෙරගාථා වර්ණනා	180-182
1.6.10.	සීවලී	ථෙරගාථා වර්ණනා	182-188
1.7.1.	වප්ප	ථෙරගාථා වර්ණනා	189-191
1.7.2.	වජ්ජිපුත්තක	ථෙරගාථා වර්ණනා	191-193
1.7.3.	පක්ඛ	ථෙරගාථා වර්ණනා	194-196
1.7.4.	විමල කොණ්ඩඤ්ඤ	ථෙරගාථා වර්ණනා	196-198
1.7.5	උක්ඛෙපකටවච්ඡ	ථෙරගාථා වර්ණනා	198-200
1.7.6.	මේඝිය	ථෙරගාථා වර්ණනා	201-203
1.7.7.	ඒක ධම්ම සවණිය	ථෙරගාථා වර්ණනා	203-205
1.7.8.	එකුදානිය	ථෙරගාථා වර්ණනා	205-208
1.7.9.	ඡන්න	ථෙරගාථා වර්ණනා	208-210
1.7.10.	පුණ්ණ	ථෙරගාථා වර්ණනා	211-213
1.8.1.	චච්ඡපාල	ථෙරගාථා වර්ණනා	214-216
1.8.2.	ආතුම	ථෙරගාථා වර්ණනා	216-218
1.8.3.	මාණව	ථෙරගාථා වර්ණනා	218-220
1.8.4.	සුයාම	ථෙරගාථා වර්ණනා	221-223
1.8.5.	සුසාරද	ථෙරගාථා වර්ණනා	223-225
1.8.6.	පියඤ්ඡහ	ථෙරගාථා වර්ණනා	226-227
1.8.7.	හත්ථාරෝහ	ථෙරගාථා වර්ණනා	228-229
1.8.8.	මෙණ්ඩසිර	ථෙරගාථා වර්ණනා	229-231
1.8.9.	රක්ඛිත	ථෙරගාථා වර්ණනා	231-233
1.8.10.	උග්ග	ථෙරගාථා වර්ණනා	233-235
1.9.1.	සමිතිගුත්ත	ථෙරගාථා වර්ණනා	236-238
1.9.2.	කස්සප	ථෙරගාථා වර්ණනා	238-240
1.9.3.	සීහ	ථෙරගාථා වර්ණනා	240-242
1.9.4.	නිත	ථෙරගාථා වර්ණනා	242-243
1.9.5.	සුනාග	ථෙරගාථා වර්ණනා	244-245
1.9.6.	නාගිත	ථෙරගාථා වර්ණනා	245-247

1.9.7.	පවිට්ඨ	තෙරගාථා වර්ණනා	247-249
1.9.8.	අජ්ජුණ	තෙරගාථා වර්ණනා	249-251
1.9.9.	දේවසභ	තෙරගාථා වර්ණනා	251-253
1.9.10.	සාමිදත්ත	තෙරගාථා වර්ණනා	253-254
1.10.1.	පරිපුණ්ණක	තෙරගාථා වර්ණනා	255-256
1.10.2.	විජය	තෙරගාථා වර්ණනා	257-258
1.10.3.	ඒරක	තෙරගාථා වර්ණනා	258-260
1.10.4.	මෙත්තජී	තෙරගාථා වර්ණනා	260-262
1.10.5.	චක්ඛුපාල	තෙරගාථා වර්ණනා	262-265
1.10.6.	බණ්ඩසුමන	තෙරගාථා වර්ණනා	265-267
1.10.7.	තිස්ස	තෙරගාථා වර්ණනා	267-269
1.10.8	අභය	තෙරගාථා වර්ණනා	269-271
1.10.9.	උත්තිය	තෙරගාථා වර්ණනා	271-272
1.10.10.	දේවසභ	තෙරගාථා වර්ණනා	273-274
1.11.1.	බෙලට්ඨානික	තෙරගාථා වර්ණනා	275-276
1.11.2.	සේතුච්ඡ	තෙරගාථා වර්ණනා	277-278
1.11.3.	බන්ධුර	තෙරගාථා වර්ණනා	278-280
1.11.4.	බිතක	තෙරගාථා වර්ණනා	280-282
1.11.5.	මලිතවම්භ	තෙරගාථා වර්ණනා	283-284
1.11.6.	සුහෙමන්ත	තෙරගාථා වර්ණනා	284-287
1.11.7.	ධම්මසව	තෙරගාථා වර්ණනා	287-288
1.11.8.	ධම්ම සවපිතු	තෙරගාථා වර්ණනා	289-290
1.11.9.	සංඝරක්ඛිත	තෙරගාථා වර්ණනා	290-292
1.11.10.	උසභ	තෙරගාථා වර්ණනා	292-293
1.12.1.	ජෙන්ත	තෙරගාථා වර්ණනා	294-296
1.12.2.	වච්ඡගොත්ත	තෙරගාථා වර්ණනා	296-298
1.12.3.	වනවච්ඡ	තෙරගාථා වර්ණනා	298-300
1.12.4.	අධිමුත්ත	තෙරගාථා වර්ණනා	300-304
1.12.5.	මහානාම	තෙරගාථා වර්ණනා	304-306
1.12.6.	පාරාසරිය	තෙරගාථා වර්ණනා	306-309
1.12.7.	යස	තෙරගාථා වර්ණනා	310-312

1.12.8.	කිම්බිල	ථෙරගාථා වර්ණනා	313-314
1.12.9.	වජ්ජිපුත්ත	ථෙරගාථා වර්ණනා	314-316
1.12.10.	ඉසිදත්ත	ථෙරගාථා වර්ණනා	316-318

දෙවෙනි නිපාත වර්ණනාව 319-440

2.1.1.	උත්තර	ථෙරගාථා වර්ණනා	319-323
2.1.2.	පිණ්ඩෝල භාරද්වාජ	ථෙරගාථා වර්ණනා	324-326
2.1.3.	වල්ලිය	ථෙරගාථා වර්ණනා	327-328
2.1.4.	ගංගාතීරිය	ථෙරගාථා වර්ණනා	329-330
2.1.5.	අජින	ථෙරගාථා වර්ණනා	331-333
2.1.6.	මෙළජින	ථෙරගාථා වර්ණනා	333-335
2.1.7.	රාධ	ථෙරගාථා වර්ණනා	335-336
2.1.8.	සුරාධ	ථෙරගාථා වර්ණනා	337-338
2.1.9.	ගෝතම	ථෙරගාථා වර්ණනා	338-340
2.1.10.	වසභ	ථෙරගාථා වර්ණනා	341-345

2.2.1.	මහාචුන්ද	ථෙරගාථා වර්ණනා	346-348
2.2.2.	ජෝතිදාස	ථෙරගාථා වර්ණනා	349-351
2.2.3.	තේරඝණ්ඨිකානි	ථෙරගාථා වර්ණනා	351-353
2.2.4.	සෝමමිත්ත	ථෙරගාථා වර්ණනා	354-355
2.2.5.	සබ්බමිත්ත	ථෙරගාථා වර්ණනා	355-357
2.2.6.	මහාකාල	ථෙරගාථා වර්ණනා	358-359
2.2.7.	තිස්ස	ථෙරගාථා වර්ණනා	360-362
2.2.8.	කිම්බිල	ථෙරගාථා වර්ණනා	363-364
2.2.9.	නන්ද	ථෙරගාථා වර්ණනා	364-367
2.2.10.	සිරිම	ථෙරගාථා වර්ණනා	368-372
2.3.1.	උත්තර	ථෙරගාථා වර්ණනා	373-374
2.3.2.	භද්දජී	ථෙරගාථා වර්ණනා	375-378
2.3.3.	සෝභිත	ථෙරගාථා වර්ණනා	378-382
2.3.4.	වල්ලිය	ථෙරගාථා වර්ණනා	382-385
2.3.5.	විතසෝක	ථෙරගාථා වර්ණනා	386-388
2.3.6.	පුණ්ණමාස	ථෙරගාථා වර්ණනා	388-390
2.3.7.	නන්දක	ථෙරගාථා වර්ණනා	391-392

2.3.8.	භරත	ථෙරගාථා වර්ණනා	392-395
2.3.9.	භාරද්වාජ	ථෙරගාථා වර්ණනා	395-397
2.3.10.	කණ්හදින්න	ථෙරගාථා වර්ණනා	397-398
2.4.1.	මිගසිර	ථෙරගාථා වර්ණනා	399-400
2.4.2.	සීවක	ථෙරගාථා වර්ණනා	401-402
2.4.3.	උපවාන	ථෙරගාථා වර්ණනා	402-406
2.4.4.	ඉසිදින්න	ථෙරගාථා වර්ණනා	406-408
2.4.5.	සම්බුල කච්චාන	ථෙරගාථා වර්ණනා	408-410
2.4.6.	ඛිතක	ථෙරගාථා වර්ණනා	410-411
2.4.7.	සොණසෙට්ඨිපුත්ත	ථෙරගාථා වර්ණනා	412-413
2.4.8.	තිසභ	ථෙරගාථා වර්ණනා	413-415
2.4.9.	උසභ	ථෙරගාථා වර්ණනා	415-417
2.4.10.	කප්පටකුර	ථෙරගාථා වර්ණනා	417-419
2.5.1.	කුමරකස්සප	ථෙරගාථා වර්ණනා	420-424
2.5.2.	ධම්මපාල	ථෙරගාථා වර්ණනා	424-425
2.5.3.	බ්‍රහ්මාලි	ථෙරගාථා වර්ණනා	425-427
2.5.4.	මෝඝරාජ	ථෙරගාථා වර්ණනා	427-430
2.5.5.	විසාඛ පඤ්චාලි පුත්ත	ථෙරගාථා වර්ණනා	431-432
2.5.6.	චූලක	ථෙරගාථා වර්ණනා	433-435
2.5.7.	අනූපම	ථෙරගාථා වර්ණනා	435-436
2.5.8.	වජ්ජිත	ථෙරගාථා වර්ණනා	437-438
2.5.9.	සන්ධික	ථෙරගාථා වර්ණනා	438-440
තුන්වෙනි නිපාත වර්ණනාව			441-487
3.1.1.	අංගණික	ථෙරගාථා වර්ණනා	441-443
3.1.2.	පච්චය	ථෙරගාථා වර්ණනා	443-446
3.1.3.	බක්කුල	ථෙරගාථා වර්ණනා	446-450
3.1.4.	ධනිය	ථෙරගාථා වර්ණනා	450-452
3.1.5.	මාතංග පුත්ත	ථෙරගාථා වර්ණනා	452-454
3.1.6.	බුජ්ජසෝභිත	ථෙරගාථා වර්ණනා	455-457
3.1.7.	වාරණ	ථෙරගාථා වර්ණනා	457-459

3.1.8.	පස්සික	තෙරගාථා වර්ණනා	460-461
3.1.9.	යසෝජ	තෙරගාථා වර්ණනා	462-464
3.1.10.	සාටිමත්තිය	තෙරගාථා වර්ණනා	464-467
3.1.11.	උපාලි	තෙරගාථා වර්ණනා	467-477
3.1.12.	උත්තරපාල	තෙරගාථා වර්ණනා	478-479
3.1.13.	අභිභූත	තෙරගාථා වර්ණනා	480-482
3.1.14.	ගොතම	තෙරගාථා වර්ණනා	482-484
3.1.15.	හාරිත	තෙරගාථා වර්ණනා	485-485
3.1.16.	විමල	තෙරගාථා වර්ණනා	486-487

හතරවෙනි නිපාත වර්ණනාව 488-520

4.1.1.	නාගසමාල	තෙරගාථා වර්ණනා	488-490
4.1.2.	භගු	තෙරගාථා වර්ණනා	490-492
4.1.3.	සහිය	තෙරගාථා වර්ණනා	492-496
4.1.4.	නන්දක	තෙරගාථා වර්ණනා	496-499
4.1.5.	ජම්බුක	තෙරගාථා වර්ණනා	499-502
4.1.6.	සේනක	තෙරගාථා වර්ණනා	502-505
4.1.7.	සම්භූත	තෙරගාථා වර්ණනා	505-507
4.1.8.	රාහුල	තෙරගාථා වර්ණනා	507-510
4.1.9.	වන්දන	තෙරගාථා වර්ණනා	510-512
4.1.10.	ධම්මික	තෙරගාථා වර්ණනා	512-515
4.1.11.	සප්පක	තෙරගාථා වර්ණනා	516-518
4.1.12.	මුදිත	තෙරගාථා වර්ණනා	518-520

පස්වෙනි නිපාත වර්ණනාව 521-561

5.1.1.	රාජදත්ත	තෙරගාථා වර්ණනා	521-524
5.1.2.	සුභූත	තෙරගාථා වර්ණනා	524-528
5.1.3.	ගිරිමානන්ද	තෙරගාථා වර්ණනා	528-531
5.1.4.	සුමන	තෙරගාථා වර්ණනා	531-533
5.1.5.	වඩ්ඪ	තෙරගාථා වර්ණනා	534-535
5.1.6.	නදී කස්සප	තෙරගාථා වර්ණනා	536-538
5.1.7.	ගයා කස්සප	තෙරගාථා වර්ණනා	539-541
5.1.8.	චක්කලී	තෙරගාථා වර්ණනා	542-548

5.1.9.	විජිතසේන	ථෙරගාථා වර්ණනා	548-551
5.1.10.	යසදත්ත	ථෙරගාථා වර්ණනා	551-553
5.1.11.	සෝණකුටිකණ්ණ	ථෙරගාථා වර්ණනා	553-557
5.1.12.	කෝසිය	ථෙරගාථා වර්ණනා	557-561

සයවෙනි නිපාත වර්ණනාව **562-608**

6.1.1.	උරුවෙල කස්සප	ථෙරගාථා වර්ණනා	562-568
6.1.2.	තේකිච්ඡකානි	ථෙරගාථා වර්ණනා	568-572
6.1.3.	මහානාග	ථෙරගාථා වර්ණනා	572-574
6.1.4.	කුල්ල	ථෙරගාථා වර්ණනා	574-578
6.1.5.	මාලුංක්‍ය පුත්ත	ථෙරගාථා වර්ණනා	578-580
6.1.6.	අපර සප්පදාස	ථෙරගාථා වර්ණනා	581-583
6.1.7.	කාතියාන	ථෙරගාථා වර්ණනා	583-586
6.1.8.	මිගජාල	ථෙරගාථා වර්ණනා	586-589
6.1.9.	ජෙන්ත	ථෙරගාථා වර්ණනා	590-593
6.1.10.	සුමන	ථෙරගාථා වර්ණනා	594-596
6.1.11.	නහාතක මුනි	ථෙරගාථා වර්ණනා	596-598
6.1.12.	බ්‍රහ්මදත්ත	ථෙරගාථා වර්ණනා	598-601
6.1.13.	සිරිමන්ද	ථෙරගාථා වර්ණනා	601-605
6.1.14.	සබ්බකාමී	ථෙරගාථා වර්ණනා	605-608

සත්වෙනි නිපාත වර්ණනාව **609-629**

7.1.1.	සුන්දර සමුද්ද	ථෙරගාථා වර්ණනා	609-611
7.1.2.	ලකුණ්ටක භද්දිය	ථෙරගාථා වර්ණනා	612-617
7.1.3.	භද්ද	ථෙරගාථා වර්ණනා	618-621
7.1.4.	සෝපාක	ථෙරගාථා වර්ණනා	621-625
7.1.5.	සරභංග	ථෙරගාථා වර්ණනා	625-629

අටවෙනි නිපාත වර්ණනාව **630-643**

8.1.1.	මහා කච්චාන	ථෙරගාථා වර්ණනා	630-636
8.1.2.	සිරිමිත්ත	ථෙරගාථා වර්ණනා	636-639
8.1.3.	මහාපන්ථක	ථෙරගාථා වර්ණනා	639-643

නවවෙනි නිපාත වර්ණනාව			**644-649**
9.1.1.	භූත	ථෙරගාථා වර්ණනා	644-649
දසවෙනි නිපාත වර්ණනාව			**650-694**
10.1.1.	කාලුදායී	ථෙරගාථා වර්ණනා	650-657
10.1.2.	ඒකවිහාරික	ථෙරගාථා වර්ණනා	658-662
10.1.3.	මහාකප්පින	ථෙරගාථා වර්ණනා	662-671
10.1.4.	චුල්ලපන්ථක	ථෙරගාථා වර්ණනා	671-679
10.1.5.	කප්ප	ථෙරගාථා වර්ණනා	680-684
10.1.6.	උපසේන	ථෙරගාථා වර්ණනා	684-689
10.1.7.	අපර ගෝතම	ථෙරගාථා වර්ණනා	690-694
එකොළොස්වෙනි නිපාත වර්ණනාව			**695-698**
11.1.1.	සංකිච්ච	ථෙරගාථා වර්ණනා	695-698
දොළොස්වෙනි නිපාත වර්ණනාව			**699-708**
12.1.1.	සීලව	ථෙරගාථා වර්ණනා	699-703
12.1.2.	සුනීත	ථෙරගාථා වර්ණනා	704-708
දහතුන්වෙනි නිපාත වර්ණනාව			**709-716**
13.1.1.	සෝණ කෝළිවිස	ථෙරගාථා වර්ණනා	709-716
දාහතරවෙනි නිපාත වර්ණනාව			**717-727**
14.1.1.	බදිරවනීය රේවත	ථෙරගාථා වර්ණනා	717-721
14.1.2.	ගෝදත්ත	ථෙරගාථා වර්ණනා	722-727

සංඥාපනය

ථේරවාදී සම්ප්‍රදාය අනුව ත්‍රිපිටක බුද්ධ වචනය සූත්‍ර විනය හා අභිධර්ම යනුවෙන් බෙදේ. එහි සූත්‍ර පිටකයේ පස්වන ග්‍රන්ථය බුද්දක නිකාය ලෙස සාමාන්‍යයෙන් සළකනු ලැබේ. ථේරවාදීන් අතර ම බුද්දක නිකාය අභිධර්ම හා සූත්‍ර යන පිටක දෙකින් කවරකට අයත්වේදැයි යන්න පිළිබඳව මතභේද වූ බව සුමංගලවිලාසිනියේ කියැවේ.[1] මජ්ඣිම භාණකයෝ සූත්‍ර පිටකයටත් දීඝ භාණකයෝ අභිධර්ම පිටකයටත් බුද්දක නිකාය ඇතුළත් කරති.

බුද්දක නිකායෙහි පොත් පහළොවක් ඇති බව ථේරවාදී මහා විහාර සම්ප්‍රදායේ පිළිගැනීමයි. ඉන් අටවන ග්‍රන්ථය ථේරගාථා පාළියයි.[2] ''ථේරගාථා පාළිය ත්‍රිපිටක බුද්ධ වචනයට අයත් නොවන්නේ යැ''යි සියම් රටේ භික්ෂූහු පවසති. එසේම සර්වාස්තිවාදීහු ද ථේරගාථා පාළිය බුද්දක නිකායික ග්‍රන්ථයක් ලෙස නොපිළිගනිති.[3]

ඉපැරණිම බෙදීමක් වන නවංග සත්ථු ශාසනයෙහි සිවිවන අංගය වන ''ගාථා'' අංගයට ථේරගාථා පාළිය බුද්ධඝෝෂ මා හිමියන් විසින් අයත් කර ඇත.[4]

''ධම්මපදං ථෙරගාථා ථේරී ගාථා සුත්ත නිපාතෙ නොසුත්ත නාමිකා සුද්ධික ගාථා ච ගාථාති වෙදිතබබා.''

ගාථා අංගයට ගැනෙන ථෙරගාථා පාළියේ 264ක් තෙරවරුන්ගේ ප්‍රීතිමය වාක්‍ය හා සිය රහත් බව ප්‍රකාශ කරන්නා වූ භාවගීත ඇතුළත් වේ. බුද්ධ කාලයේ සිට අශෝක සමය දක්වා සිටි තෙරවරුන්ගේ භාවගීත මෙහි ඇතුළත්ය. බුද්ධ පරිනිර්වාණයට පසුව දේශිත ගාථා ලෙස ඡන්න හා චජ්ජපුත්තක තෙරවරුන්ගේ ගාථා දැක්වේ.

එම ථෙරගාථා පාළියේ ඇති ගාථාවන්හි නිදාන කථාව පැවසීමට හා ගාථාවන් අර්ථ විවරණය කිරීමට රචිත පාලි අට්ඨකථාව ''ථෙරගාථාට්ඨකථා'' නම් වේ. හෙළටුවා හා සෙසු සම්ප්‍රදායන්හි ථේරගාථා පාළියට ලියවුණු අටුවා ආශ්‍රයෙන් පාළි ථේරගාථාට්ඨකථාව ලියන ලද්දේ භදන්ත ධම්මපාල මහාස්ථවිරපාදයන් විසිනි. බුද්දක නිකායේ ගාථාමය ප්‍රබන්ධ සඳහා අටුවා ලියූ බදිරතිත්ථ වාසී ධම්මපාල තෙරුන්ගේ සයවන

ග්‍රන්ථය මෙම ''ථේරගාථාට්ඨකථාව''යි. ඒ සඳහා පෝරාණට්ඨකථාව හා ථේරගාථා පාළියට ලියූ හෙළටුවාව මෙන්ම ආගමට්ඨකථාවන් සහ බුද්දක නිකායික අටුවා ද මූලාශ්‍ර කරගත් බව ථේරගාථාට්ඨකථාවේ ම දැක්වේ.[9]

ඒ ඒ තෙරවරුන්ගේ චරිත වර්ණනාව සනාථ කිරීමට අපදාන පාළියේ ගාථා උපුටා දැක්වීම සෑම කථාවක ම දක්නට ලැබෙන ලක්ෂණයකි. ථේරගාථාට්ඨකථාවේ එන තෙරවරුන්ගේ චරිත කථාවල බොහෝ දුරට එක සමාන ආකෘතියක් ඇත.

1. ථේරගාථා පාළියේ එන ගාථාවේ මුල් කොටස යොදා එම ගාථාව දෙසූ තෙරුන්ගේ නම දක්වා නිදාන කථාව ඇරඹීම.

2. පෙර බුදුවරු හමුවේ කළ පින්දහම් පැවසීම.

3. අපදාන පාළියේ ගාථා මඟින් එසේ දැක්වූ කරුණු සනාථ කිරීම.

4. රහත්බව ප්‍රකාශ කිරීමට අදාළ ගාථාව පැවසූ බව දක්වා එහි අර්ථ දැක්වීම.

අනුපිළිවෙල ඇතැම්විට වෙනස් වුවත් මෙම අවස්ථා හතර සෑම ථේරගාථාර්ථ වර්ණනාවකම ඇත. ථේරගාථා අටුවාවේ එන ඇතැම් සංඥා නාම අපදාන පාළියෙන් වෙනස්වන අවස්ථා ද ඇත. බොහෝ තෙරවරුන්ගේ නම් ථේරගාථා පාළියෙහි හා අපදාන පාළියෙහි අසමානය.

අපදාන පාළියේ ''**සුසඤ්ඤතෝ**'' ලෙස එන රජුගේ නාමය ථේරගාථාට්ඨකථාවේ ''**සන්තුසිතෝ**'' ලෙස දැක්වේ.[7] ථේරගාථාට්ඨකථාවේ ''ඡෝතිදාස'' තෙරුන් පැවසීයැයි අපදාන පාළියෙන් උපුටා දක්වන ගාථා පන්තිය, අපදාන පාළියේ අයත් කරනුයේ ''**කාසුමාරිඵලදායක**'' තෙරුන්ටයි.[8] මෙවැනි අසමාන තැන් රැසකි.

ථේරගාථාට්ඨකථාවේ ''සෝම්මිත්ත'' නාමයෙන් දක්වෙන ථෙරගාථාව ථෙරගාථාපාළියේ අයත් කරනුයේ ''සෝම්චිත්ත'' තෙරුන්ටය. අටුවා කරණ සමයේ පැවති ''ම්'' යන්න පසුකාලීන පුස්කොළ පොත්වල ''ච්'' බවට පත් වූ බව මෙකරුණින් සනාථවේ. මෙසේ අටුවාවෙහි හා පෙළෙහි ඇතැම් වචන වෙනස් වූ තැන්ද ථේරගාථාට්ඨකථාව හා ථේරගාථා පාළිය සසඳා බැලීමෙන් සොයා ගත හැකිය.

ථේරගාථාට්ඨකථාවෙහි ව්‍යාකරණ පද විග්‍රහයට ප්‍රමුඛස්ථානයක් දෙයි. ''තථාගත'' ශබ්දය විග්‍රහ කිරීමේදී තුම දෙකකින් අර්ථ අටක් ජනිත වන බව පවසා, වැඩි විස්තර සඳහා උදාන, ඉතිවුත්තක වර්ණනා බලන ලෙස පවසයි. ධම්මපදට්ඨකථාවේදී සත් වියේදී උපසපන් වූවෝ දෙදෙනෙක්ම බව පැවසුවත් ථේරගාථාට්ඨකථාවේ එසේ නො දක්වේ. දබ්බමල්ලපුත්ත, හද්දිය, වසභ ආදී[9] කුඩා වියේදීම ප්‍රශස්ත බවට පත්ව විශේෂ බුද්ධ අවසරයෙන් උපසම්පදා වූ මහතෙරවරු රැසක් ථේරගාථාට්ඨකථාවෙන් හමුවීම සැලකිය යුත්තකි.

අප දන්නා පරිදි බුදුරජාණන් වහන්සේ හැරුණු විට මහා පුරුෂ ලක්ෂණ තිබූ එකම උත්තමයෝ නම් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පමණි. ථේරගාථාට්ඨකථාවේ බාවාරි තවුසාට ද මහා පුරුෂ ලක්ෂණ තුනක් වූ බව පැවසේ.[10] සෝපාක නමින් තෙරුන් වහන්සේලා දෙනමක් සිටි බව ද උන්වහන්සේලාට ඒ නම ලැබුණු අයුරු ද අපට දැනගත හැකි වනුයේ ථේරගාථාට්ඨකථාවෙනි. නපස්සු - හල්ලික දෙදෙනාගේ පසුකාලීන විස්තර සඳහන් වන ථේරගාථා අටුවාව මානව ක්‍රියාකාරිත්වයේ විවිධත්වය විදහා පෙන්වන (නානත්ථකායා නානත්ථ සංඥී) සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පර්යේෂණ මූලාශ්‍ර වලින් අනූන නිදසුන් කථා සමුදායකි.

විමල තෙරගාථා වණ්ණනාවේ සක්විති රජවරු හා ලොවුතුරා බුදුවරු පහළව වැඩ හිඳින විවස්ථායී කල්පවලදී (නැවත හටගන්නා) ඇතිවන මහත් වූ වර්ෂාවක් පිළිබඳව කියැවේ. ''චාතුද්දීප මහාමේඝා සකල චක්කාළ ගබ්භං පත්ථරිත්වා පාවස්සි''[11] යනුවෙන් මුලු මහත් සතර දිවයින් ඇතුලුව සක්වල ගැබ පුරාම පැතිරෙන මෙම වර්ෂාව ඇතිවනුයේ විවස්ථායී කල්පවල පමණකි.

පරිනිබ්බාණ සූත්‍රයේ පැවසෙන වස්සකාර මහාමාත්‍යයා අජාසත් රජු යටතේ මගධයේ සිටි අධිකරණ අංශයේ ඉහළම නිළධාරියා වේ. ඔහුගේ බලසම්පන්න භාවය දෙවැනි වූයේ මහරජුට පමණි. නඩුතීන්දුවලදී සිය පෞද්ගලික පළිගැනීම් වස්සකාර විසින් සිදුකළ බව උත්තර සාමණේර කථාවේ කියැවේ. අජාසත් රජු විසින් මැරීමට උපක්‍රම යෙදූ සීලව ආදී රාජ කුමාර පුවත් ද ථේරගාථාට්ඨකථාවේ ඇත.

මෙසේ බුද්ධකාලීන භාරතයේ සමාජ, ආර්ථික, දේශපාලන, අධිකරණ හා ආගමික යනාදී සෑම අංශයකම තොරතුරු ථේරගාථා අටුවාවෙන් දැනගත හැකිවේ.

ථේරගාථා පාළියේ එන ගාථාවන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

1. තෙරුන් වහන්සේලාම උතුම් නිවණෙන් සැනසීම ලබා ගැනීමෙන් නිරාමිස ප්‍රීතිය ප්‍රකට කිරීමට දේශිත ථේරගාථා.

මෙම ගාථා ද කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

1. නිර්වාණ සුවය පැවසෙන ගාථා
2. පරිසර අත්දැකීම් හා පරිසර වර්ණනා

2. බුදුරදුන් තමන් උදෙසා දෙසූ ගාථාම නැවත එම තෙරවරු උදාන වශයෙන් ප්‍රකාශ කිරීමෙන් ඇති වූ ථේරගාථා

1. දොස් පෙන්වීමට බුදුහු වදාළ ගාථා නිදෑ- තිස්ස, දාසක
2. උත්සාහ ගැන්වීමට බුදුහු වදාළ ගාථා නිදෑ- හාරිත
3. ගුණවර්ණනා කිරීමට බුදුහු වදාළ ගාථා නිදෑ- ගවම්පති

3. වෙනත් දිව්‍ය මනුෂ්‍යාදීන් තමන් උදෙසා පැවසූ ගාථාම නැවත රහත් වූ පසුව උන්වහන්සේලා විසින් දෙසූ ථේරගාථා

නිදෑ- දෙවියකු පැවසූ ගාථාවක් - සිඟාලක පිතු ථේරගාථාව
ජම්බුගාමිය තෙරුන්ගේ ගාථාව උන්වහන්සේගේ පියා පැවසුවකි.
කස්සප (1.9.2.) ථේරගාථාව උන්වහන්සේගේ මව පැවසූවකි.

4. සංවාදමය ථේරගාථා

තමාගේ ද වෙනත් අයකුගේ ද සංවාදයක් ප්‍රකාශ වන ථේරගාථා මේ ගණයට අයත් වේ. නිදෑ-වජ්ජිපුත්ත ථේරගාථාව.

ථේරගාථාට්ඨකථාවේ මූලාශ්‍ර අතර හෙළටුවා ද තිබූ බව මුලින් පැවසිණි. ඇතැම් හෙළවදන් එසේම පාලියට නැඟූ අවස්ථා ග්‍රන්ථය තුළ ඇති බැවින් ධම්මපාල මා හිමි හෙළටුවා යම් ප්‍රමාණිකත්වයකින් සළකා භාවිත බව පෙනී යයි.

''කොණං පවිසිත්වා'' යන වදන ''කොණට පිවිස'' යනුවෙන් හෙළටුවාවේ දැක්වෙන්නට ඇත. ''කුසල කොට්ඨාසං'' යන්න ද හෙළ වදනකි. ''කුසල් කොටස'' යනු එහි හෙළ වදනයි. [12] මෙවැනි සිංහල වදන් පාළි කරන ලද අවස්ථා කිහිපයක්ම ථේරගාථා අටුවාවේ දැක්වේ.

ථෙරගාථා අටුවාවේ එන ගාථා සංඛ්‍යාව

01. ඒකක	නිපාතය	වර්ග 12 කි.	කථා	120 කි.
02. දුක	නිපාතය	වර්ග 5 කි.	කථා	49 කි.
03. තික	නිපතය	වර්ග 1 කි.	කථා	16 කි.
04. චතුක්ක	නිපාතය	වර්ග 1 කි.	කථා	12 කි.
05. පංචක	නිපාතය	වර්ග 1 කි.	කථා	12 කි.
06. ඡක්ක	නිපාතය	වර්ග 1 කි.	කථා	14 කි.
07. සත්ත	නිපාතය	වර්ග 1කි.	කථා	05 කි.
08. අට්ඨ	නිපාතය	වර්ග 1 කි.	කථා	03 කි.
09. නව	නිපාතය	වර්ග 1 කි.	කථා	01 කි.
10. දස	නිපාතය	වර්ග 1 කි.	කථා	01 කි.

11. එකාදස, ද්වාදස, තෙරස හා චුද්දස නිපාත කථා 06 කි.

ථේරගාථා අටුවාවේ I කාණ්ඩයේ දක්වෙනුයේ මෙම කථා 245 පමණි.

ථේරගාථා පාළියේ

තෙරවරු	264කි.	ගාථා	1291කි.
නිපාත	21 කි.	වර්ග	35කි.

බදිරතිත්ථ වාසී මහා අටුවාචාර්ය ධම්මපාල මහා ස්ථවිරයන් වහන්සේ විසින් මුලින් සිංහල බසින් තිබූ ථෙරගාථා අටුවාව; ක්‍රි.ව. 6 වන සියවසේ දී පමණ පාළි බසට "පරමත්ථදීපනී නාම ථෙරගාථාටීයකථා" නාමයෙන් පරිවර්තනය කරන ලදී.

ඉන්පසු සයිමන් හේවාවිතාරණ මහතා ඇතුළු සත් පුරුෂයන් රැසකගේ ඇරයුමෙන් ප්‍රස්කොළ පොතක් ඇසුරෙන් පැවති ථෙරගාථාටීයකථාව, දෙයියන්දර වෑවලපියද්දේ සුවිසුද්ධාරාමාධිපති, විද්‍යාකීර්ති පරිවේණාධ්‍යක්ෂ, විද්‍යෝදය මහ පිරිවෙනේ පූජ්‍යපාද පල්ලාවෙල ශ්‍රී සද්ධාතිස්ස නායක මා හිමියෝ සංස්කරණය කර මුද්‍රණය සඳහා ඉදිරිපත් කළහ. උන්වහන්සේ මුද්‍රණය කරවූ පිටපත ඇසුරින් නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානාධිපති පූජ්‍ය කිරම විමලජෝති මා හිමියන්ගේ

ඇරයුමෙන්, මාතර පහළ පීක්වැල්ල පඤ්ඤාරාම පුරාණ විහාරාධිවාසී හා බෙලිඅත්ත - නිහිළුව හ සිරි ධම්මානන්ද පිරිවෙන්පති, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය පූජ්‍ය හත්තොටුවේ ඉන්දරතන හිමි වන ම විසින් මෙම ථෙරගාථාට්ඨකථාවේ සිංහල පරිවර්තනය රචනා කළෙමි. එම සත්කාර්ය සඳහා උපකාරී වූ මාගේ ගුරුදේවෝත්තම විචිත්‍රභාණී පූජ්‍යපාද උරුමුත්තේ සෝමරතනාභිධාන මාතර පළාතේ ප්‍රධාන සංඝ නායක මා හිමිපාණන් වහන්සේත්, පැවිදි සහෝදර ශාස්ත්‍රවේදී වරාපිටියේ මංගල හිමියන් ඇතුළු සහෝදර පිරිසත් උපකාර ස්මෘතියෙන් සිහිපත් කරමි.

පූජ්‍ය හත්තොටුවේ ඉන්දරතන හිමි.
පඤ්ඤාරාම පුරාණ විහාරය,
පහළ පීක්වැල්ල
මාතර.
2008.05.10

පාදක සටහන්

1. සුමංගලවිලාසිනි - හේවාවි. - පි

2. සිරි ලියනගේ - "බෞද්ධ ශබ්දකෝෂය" I - 2006 - පි. ix-xi

3. සාසනරතන හිමි, මොරවුවේ - "ලක්දිව මහායාන අදහස්" - විසිදුණු - 1999 -පි. 44

4. සමන්තපාසාදිකාව - බාහිර නිදාන වර්ණනාව

5. ථෙරගාථාට්ඨකථාව - හේවාවි. - 1918 - පි 155,237

6. ඉන්දරතන හිමි, හත්තොටුවේ - "පාළි අට්ඨකථා සාහිත්‍යයෙන් හෙළිවන අවිද්‍යමාන වූ සිහළට්ඨකථා සාහිත්‍ය" - 2006 පි. 36

7. අපදාන පාළි I - බු.ජ.ත්‍රි. 2005 - පි. 304 / ථෙරගාථාට්ඨකථා පි. 223

8. අපදාන පාළි II 246/ථෙරගාථාට්ඨකථා පි. 264

9. උදිත හිමි, හිත්තට්යේ - "ත්‍රිපිටක පරිභෂණය" - බ්‍රෝඩ්වේ - මාතර - 1965 පි. 147

10. ථේරගාථාඨකථාව - පි. 73

11. ථේරගාථාට්ඨකථාව - පි. 122

12. ථේරගාථාට්ඨකථාව - පි. 69, 260

පරමත්ථදීපනී නම් වූ
ථෙරගාථාට්ඨ කථා

ඒ භාග්‍යවත්, අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !

මහාකාරුණික වූ ඤාණ සාගරයාගේ පරතෙර දුටුවා වූ දක්ෂ වූ ගැඹුරු පැන විසඳුම් ඇත්තාවූ විසිතුරු නය දෙසුම් ඇත්තා වූ තථාගතයන් වහන්සේට (අනුනට පිහිටවන උතුමන් වහන්සේට) මම වඳිමි.

අට වැදෑරුම් විද්‍යාවන්ගෙන් හා පසළොස් චරණ දහමින් යුක්ත වූ ලෝකයෙන් මිදීමට මඟ පෙන්වන්නා වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසිනුදු පුදන ලද ඒ උතුම් වූ ධර්මරත්නයට මම වඳිමි.

යමෙක් සීලාදි ගුණයන්ගෙන් යුක්තව මගඵලයන්හි පිහිටි සේක්ද ඒ අනුත්තර වූ පුණ්‍ය ක්ෂේත්‍රයක් හෙවත් පින් කෙතක් වූ ආර්ය සංඝරත්නය මම නමදිමි.

මෙසේ රත්නත්‍රයට වන්දනා කිරීමෙන් ජනිත වූ යම් පිනක් වේ නම්, ඒ පුණ්‍යානුභාවයෙන් සැමතැන්හි නසන ලද අතුරු ආන්තරා ඇති මම මේ අටුවාව ආරම්භ කරමි.

යම් ඒ කරන ලද කටයුතු ඇති සුභූති ආදී මහරහතන් වහන්සේලා විසින් ද ආම්ඹයන්ගෙන් දුරු වූ රහත් තෙරණිවරුන් විසින් ද දේශනා කරන ලද ප්‍රීතිමය වාක්‍ය වැනි වූද ගැඹුරු වූ, ආර්ය මාර්ගයෙහි දක්ෂ වූ යහපත් වූ ප්‍රකාශන ද ශූන්‍යතා ධර්මයෙන් යුක්ත වූ ද ආර්ය ධර්ම මාර්ගය ප්‍රකාශ කරන්නා වූ ද ගාථා වන්ගෙන් යුක්ත වූ ධර්ම ග්‍රන්ථ **''තේරගාථා''** හා ''තේරීගාථා'' යන නම්වලින් ඛුද්දක නිකායෙහි තබා, තාදිගුණ ඇති මහරහතන් වහන්සේලා විසින් සංගායනා කළ සේක.

එම කෘති දෙකෙහි ගැඹුරු ඥානයෙන් බැස අවබෝධ කරගත යුතු වූ ධර්ම කරුණු පිළිබඳ අර්ථවර්ණනාව ඉතා දුෂ්කර වුවත් මවිසින් එය ඉටු කිරීමට කැමැත්තෙමි.

ශාස්තෘ ශාසනයෙහි පිහිටා සිටිමින්, පූර්වාචාරී නම් කේසර සිංහයන්ගේ අර්ථ විනිශ්චයන්හි ද පිහිටමින් එම අර්ථ වර්ණනාව කරමි.

එනිසා එම පුණ්‍ය විනිශ්චයෙහි එල්බ, පෝරාණ අට්ඨකථා න්‍යාය වූ නිකාය පසෙහි එන ක්‍රමය ඇසුරු කරමින්

ඉතා පිරිසිදු වූ මිශ්‍ර නොවූ අර්ථ විනිශ්චයෙහි දක්ෂ වූ මහාවිහාර වාසීන්ගේ පිළිගැනීමට විරුද්ධ නොවී - එය නොඉක්මවා, අනුපිළිවෙල කථාවෙන් තොරව යම් පදයක අර්ථ අවබෝධ කර ගැනීම අපහසු ද ඒ පදයන්ගේ අර්ථ විනිශ්චය ප්‍රකටව දක්වමින්

මෙම යහපත් වූ ථෙරගාථා හා ථෙරීගාථා අර්ථ වර්ණනාව ශක්ති ඇති පරිද්දෙන් සකසා කරන්නෙමි.

මෙසේ ශ්‍රී සද්ධර්මයේ චිර පැවැත්ම කැමති වූ ථෙරථෙරී ගාථාවන්හි අර්ථ භේද විමසනු කැමැති වූ සත්පුරුෂයිනි ! සාවධානව මේ අර්ථ වර්ණනාව අසවු.

මේ ''තේරගාථා'', ''තේරීගාථා'' යනු මොනවාද ? කෙසේ පැවත ආවේද ? යනාදී ප්‍රශ්නයන්ට පිළිතුරු ඉහත දක්වූ ගාථාවන්හි කියන ලද්දේමය. එය ප්‍රකටව දක්වනු සඳහා නැවත මෙසේ පවසනු ලැබේ.

එහි පළමුකොට ''තේරගාථා'' යනු **''සුභූති''** ආදී තෙරවරුන් විසින් පැවසූ ගාථාවෝයි. එහි ඇතැම් ගාථා තමන් වහන්සේලා අවබෝධ කළ,

මගඵල සුවය නුවණින් විමසා බලා ප්‍රීති වාක්‍ය වශයෙන් දේශිතය. ඇතැම් ගාථා තමන් වහන්සේලාගේ සමවත් සුව විහරණ, නුවණින් විමසා බැලීම් වශයෙන් දේශිතය. ඇතැම් ගාථා ප්‍රශ්න වශයෙන් දේශිතය. තවත් ගාථා රැසක් පිරිනිවන් පාන සමයෙහි සසුනේ ඇති නිදහස්ශීලී බව ප්‍රකටව දැක්වීම් වශයෙන් දේශනා කර ඇත. ඒ සියලු තෙරවරුන්ගේ ගාථාවෝ, ධර්ම සංගායනා කරන විට එක්රැස් කෙට "**ථේරගාථා**" යන නාමයෙන් ධර්ම සංග්‍රාහක භික්ෂූන් වහන්සේ විසින් සංග්‍රහ කරන ලදහ.

"ථේරිගාථා" වනාහි තෙරණිවරු සඳහා දේශිතය. තෙරණිවරුන් විසින් වදාළ ගාථා එක්රැස් කර සංග්‍රහ කර ඇත. එම ථේරගාථාව සහ ථේරි ගාථාව විනය පිටකය, සූත්‍ර පිටකය හා අභිධර්ම පිටකය යන තුන් පිටකයන්ගෙන් සූත්‍ර පිටකයෙහි ඇතුළත් වේ. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය හා ඛුද්දක නිකාය යන සූත්‍ර පිටකයේ නිකාය පසින් ඛුද්දක නිකායට ඇතුළත් වේ. සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම හා වේදල්ල යන නවංග ශාසනයෙන් "ගාථා" අංගයෙහි ඇතුළත් වේ.

"**දුවාසීතිං බුද්ධතෝ ගණ්හි ලොෙ සහස්සානි භික්ඛුතෝ**
චතුරාසීතිසහස්සානි යෙමෙ ධම්මා පවත්තිනෝ"

යනුවෙන් "අසූ දෙදාහක් බුද්ධ දේශිත වූත් දෙදහසක් ශ්‍රාවක භාෂිත වූත් අසූහාර දහසක් ධර්ම ස්කන්ධය මෙහි පවතින්නේ යැයි" මෙසේ ධර්ම භාණ්ඩාගාරික අනඳ තෙරුන් විසින් ප්‍රතිඥා කරන ලද සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයන් අතරින් ධර්ම ස්කන්ධයක කිහිපයක් සංග්‍රහ කරන ලදී.

එහි ථේරගාථා පාළිය නිපාත වශයෙන් ඒක නිපාතයේ සිට එක එකක් වැඩිවීම් වශයෙන් දාහතර වන නිපාතය දක්වාත්, දාසය වන නිපතය, විසිවන නිපාතය, තිස්වන නිපාතය, සතළිස් වන නිපාතය, පනස්වන නිපාතය, සැටවන නිපාතය, සැත්තෑවන නිපාතය යන මේ නිපාත සත ද සමඟ නිපාත විසි එකකින් යුක්ත වේ. වැටීම, හෙළීම (නිපතනං) බහා තැබීම (නික්ඛිපනං) යන අරුතින් "නිපාත" නම් වේ.

එක් එක් ගාථාවන්ගේ හෙළීම, බහා දැමීම, දැක්වීම යනු ඒක නිපාත යයි. මේ ක්‍රමයෙන් සෙසු නිපාතයන් හි ද අර්ථ දත යුතුයි. එහි ඒක නිපාතයෙහි වග්ග දොළොසකි. එක් එක් වර්ගයේ දහය, දහය බැගින් තෙරවරු එක්සිය විස්සෙකි. ගාථා ද එපමණම වේ.

විසුත්තරසතං තේරා කත කිච්චා අනාසවා
එකකමහි නිපාතමහි සුසංගීතා මහෙසිහි

කියන ලදී.

"කළ කිස ඇති අරහත් වූ - එක්සිය විස්සක් මහර්ෂී වූ තෙරවරු ඒකක නිපාතයෙහි ගාථා සංග්‍රහ කළහ යනුවෙන්. දුක නිපාතයෙහි තෙරවරු සතළිස් නවයකි. ගාථා අනූ අටකි. තික නිපතයෙහි තෙරවරු දාසයකි. ගාථා හතලිස් අටකි. චතුක්ක නිපාතයේ තෙරවරු දහතුන් දෙනෙකි. ගාථා පනස් දෙකකි. පඤ්චක නිපාතයෙහි තෙරවරු දොළොසකි. ගාථා සැටකි. ඡක්ක නිපාතයේ තෙරවරු දා හතරකි. ගාථා අසු හතරකි. සත්තක නිපාතයෙහි තෙරවරු පස් දෙනෙකි. ගාථා තිස් පහකි. අට්ඨක නිපාතයේ තෙරවරු තිදෙනෙකි. ගාථා විසි හතරකි. නවක නිපාතයේ එක් තෙරනමකි. ගාථා නවයකි. දස නිපාතයෙහි තෙරවරු සත් දෙනෙකි. ගාථා සැත්තෑවකි. එකොළොස්වන නිපාතයේ එක් තෙර නමකි. ගාථා එකොළොසකි. දොළොස් වන නිපාතයේ තෙරවරු දෙනමකි. ගාථා විසි හතරකි. දහතුන්වන නිපාතයේ එක් තෙරනමකි. ගාථා දහතුනකි. දාහතර වන නිපාතයේ තෙරවරු දෙනමකි. ගාථා විසි අටකි. පසළොස්වන නිපාතයක් නැත. දාසය වන නිපාතයෙහි තෙරවරු දෙනමකි. ගාථා තිස් දෙකකි. විසිවන නිපාතයේ තෙරවරු දස නමකි. ගාථා දෙසිය හතළිස් පහකට අධිකය. තිස්වන නිපාතයේ තෙරවරු තුන් නමකි. ගාථා එකසිය පහකි. සතළිස් වන නිපාතයේ එක් තෙර නමකි. ගාථා සතළිස් දෙකකි. පනස් වන නිපාතයෙහි එක් තෙර නමකි. පනස් පහක් ගාථා ඇත. සැටවන නිපාතයේ එක් තෙර නමකි. ගාථා සැට අටකි. සැත්තෑවන නිපාතයේ ද එක් තෙර නමකි. ගාථා සැත්තෑ එකකි. මේ සියල්ල සම්පිණ්ඩනය කළ විට තෙරවරු දෙසිය හැට හතරකි. ගාථා එක් දහස් තුන්සිය සැටකි.

එනිසා මෙය කියන ලදී.

"සහසසං හොනති තා ගාථා - තීණි සටඨී සතානිච
තේරා ච ඵොසතා සටඨී - චත්තාරෝ ච පකාසිතා"

"එහි ගාථා එක් දහස් තුන්සිය සැටකි. එම ගාථාවෝ තෙරවරු දෙසිය සැට හතර නමක් විසින් දේශනා කරන ලදහ.

ථේරී ගාථාව ද ඒක නිපාතයේ සිට එක එක වැඩිවීම් වශයෙන් නව වන නිපාතය දක්වාත්, එකොළොස්වන නිපාතය, දොළොස්වන නිපාතය, දාසය වන නිපාතය, විසිවන නිපාතය, තිස්වන නිපාතය, සතළිස් වන නිපාතය, මහා නිපාතය වශයෙන් නිපාත දහසයක් ඇතුළත් වේ. එහි ඒක නිපාතයේ තෙරණියෝ දහ අටකි. ගාථා ද දහ අටකි. දුක නිපාතයේ තෙරණියෝ දස නමකි. ගාථා විස්සකි. තික නිපාතයෙහි තෙරණියෝ අට නමකි. ගාථා විසි හතරකි. **චතුක්ක** නිපාතයේ එක් තෙරණියකි. ගාථා හතරකි. **පඤ්චක** නිපාතයෙහි තෙරණියෝ දොළොසකි. ගාථා සැට තුනකි. ඡක්ක නිපාතයේ තෙරණියෝ අට නමකි. ගාථා හතළිස් අටකි. **සත්තක** නිපාතයේ තෙරණියෝ තිදෙනෙකි. ගාථා විසි එකකි. අට්ඨ නිපාතයේ සිට සොළස නිපාතය දක්වා එක් එක් තෙරණිය ඒ ඒ නිපාතයේ ප්‍රමාණයට ගාථා දේශිතය. වීසති නිපාතයේ තෙරණියෝ සිවු දෙනෙකි. ගාථා අනූ හතකි. තිංස නිපාතයේ එක් තෙරණියකි. ගාථා තිස් හතරකි. චත්තාළීස නිපාතයේ එක් තෙරණියකි. ගාථා හතලිස් අටකි. මහා නිපාතයේ එක් තෙරණියකි. ගාථා සැත්තෑ පහකි. මෙසේ මෙම ථේරී ගාථාවෙහි නිපාතයන්ගේ ද ගාථාවන්ගේ ද ප්‍රමාණය දත යුතුයි. මෙසේ වෙන් කර දැක්වූ ප්‍රමාණ අනුව මේ ග්‍රන්ථ දෙකින් ථේරගාථාව මූලික වේ. පළමු කෘතියයි. එහිදැ:-

> ''**සීහානං ව නදත්තානං - දාඨීනං ගිරිගබ්භරෙ**
> **සුණාථ භාවිතත්තානං - ගාථා අත්තූපනායිකා**''

යන මේ ගාථාව පළමු මහා සංගීති අවස්ථාවෙහි ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් ඒ තෙරවරුන්ට ස්තුති කිරීම් වශයෙන් දෙසූ පළමු ගාථාවයි. එහි ''**සීහානං**'' යනු සිංහයන්ගේ ''සීහ'' ශබ්දය ''මහණෙනි ! මෘගයන්ගේ රජ වූ සිංහයා''[a] (සීහෝ භික්ඛවෙ මිගරාජා) යන තැන්හි සිංහයාට යෙදුණි. ''ඉක්බිති සීහ සෙන්පතියා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය''[b] යනාදියෙහි ප්‍රඥප්ති නාමයකැයි දත යුතුයි. පුද්ගලයෙකුගේ නමකි. ''මහණෙනි ! ''සීහ'' යනු තථාගත වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට යෙදෙන තවත් නාමයකි. (අධිවචනං)[c] යනාදී තැන්හි තථාගතයන්ට ම යෙදී ඇත. තථාගයන්ට සිංහයාට සමාන ඉරියවු පැවතුම් ඇත. මෙසේ මෙහිදී ද සමාන වූ පැවතුම් ඇතිවීම් වශයෙන් යෙදුණු බව

---

a. අංගුත්තර නිකාය. චතුක්ක නිපාතය

b. අංගුත්තර නිකාය. පංචක නිපාතය / මහාවග්ග - භේසජ්ජකඛන්ධක-සීහභාණවාර

c. අංගුත්තර නිකාය පංචක නිපාතය

දන යුතුයි. එනිසා ''සීහානංව'' යනුවේ. සීහානං+ඉව යන දෙපදය සන්ධිවීමේදී පරස්වරය ලොප් වේ. ''එවංස නෙ''[d] යනාදියෙහි මෙනි. මෙහි ''ඉව'' යනු නිපාත පදයකි. ''සුණාථ'' යන ආඛ්‍යාත (ක්‍රියා) පදයකි. සෙසු පද නාම පද වේ. සීහානං (සිංහයන්ගේ) යනු සම්බන්ධාර්ථයේ ඡට්ඨී විභක්ති වචනයකි. මෙහි ඒකාන්තයෙන් සම්බන්ධය ද ස්වරූප වශයෙන් නොකියන ලදී. අර්ථ වශයෙන්ම කියන ලද්දේය. යම්සේ ''ඔට්ඨස්සෙව මුඛං එතස්ස'' යන තැන්හි ''ඔට්ඨස්ස'' යැයි පැවසූ විට ''ඔට්ඨ සස මුඛං විය මුඛං එතස්ස'' (ඔටුවාගේ මුව මෙන් මොහුගේ මුව වේ) යන මේ අර්ථයම කියන ලදී. එසේම මෙහිද ''සීහානංව'' (සිංහයන් මෙන්) යැයි පැවසූ විට, ''සීහානං නාදො විය'' (සිංහයන්ගේ නාදය මෙන්) යැයි අර්ථ ගත යුතුයි. එහි ''මුඛ'' ශබ්දය සමීප කිරීම් අර්ථයෙහි වේ. මෙහිද ''නදනතානං'' (නද දෙන) පද සන්නිධානයකි. පද සමීප කිරීමකි. එනිසා ''සීහානංව'' යන පදය මෙහි නිදසුන් පදයකි. ''නදනතානං'' යනුවෙන් ඒ නිදර්ශනය කළ දෙයෙහි සබඳතාව දක්වන ලදී. ''දාඨීනං'' යනු එයට යෙදුණු විශේෂණයකි.

''ගිරිගබහරෙ'' යනු ඒ සිංහයන් සිටින තැන දැක්වීමකි. ''සුණාථ'' යනු ඇසීමෙහි යෙදවීමයි. ''භාවිතත්තානං'' යනු ඇසිය යුත්තාගේ ලක්ෂණ ප්‍රභාව දක්වීමයි. ''ගාථා'' යනු ඇසිය යුතු වස්තුව, කාරණය දැක්වීමයි. ''අත්තූපනායිකා'' යනු එහි විශේෂණ දැක්වීමකි.

කැමති නම් මෙහි ''දළ ඇති නද දෙන සිංහයන්ගේ'' යනුවෙන් පුරුෂ ලිංගයෙන් ඇති පදවල ලිංගය වෙනස් කර, ''සිංහ ධේනූන්ගේ'' (සීහිනං) ආදී ලෙස ස්ත්‍රී ලිංග වශයෙන් ද අර්ථ කිව යුතුයි. ඒක ශේෂ වශයෙන් හෝ අර්ථ ගත යුතුයි. සිංහයෝ ද සිංහ ධේනුහු ද සිංහයෝම ය. ඔවුහු දෙපිරිසම ''සීහ'' (සිංහ) නාමයෙන් ගැනීම සාධාරණය. එබැවින් මේ නිදාන ගාථා තුන පෙරගාථාවන්ට ද පෙරී ගාථාවන්ට ද සාධාරණම වේ.

එහි ඉවසීම් වශයෙන් ද (සහනතො) නැසීම්, වැනසීම්, වශයෙන් ද (හනනතො) ''සීහ'' නම් වේ. මෘගයන්ගේ රජ වූ සිංහයාගේ විශේෂ බලය යෙදීම් ආදී උපදුව ද ඔහු ඉවසන්නේ මය. ගොදුරු පිණිස යන්නේ ද තේජස් බලයෙන් මත් වූ ගඳ හස්තීන්, වන මී මුන් ආදීන් වෙත පැමිණ නිර්භය බැවින් හා තැති නොගැනීමෙන් ඔවුන් අභි භවනය කරයි. එසේ

---

d. ම.නි. සබ්බාසව සූත්‍රය

මැඩ පවත්වමින් ඔවුන් ඒකාන්තයෙන් මරා, මෘදු මස් කා සුවසේ වෙසෙයි. මේ අයුරින්ම රහතන් වහන්සේලා ද ආර්ය බල විශේෂයක් යෙදීමෙන් සියල්ලන්ගෙන්ම වන උපද්‍රව ඉවසන සේක්, රාගා දී කෙලෙස් ධර්මයන් මැඩ පවත්වා, ඉවසන සේක් - දුරු කළ සේක් පිරුණු තේජසින් කවරෙකු කෙරෙහි වුවත් නිර්භයව, තැති නොගෙන ධ්‍යානාදී සුවයෙන් වෙසෙන සේක්, ඉවසීමෙන් ද නැසීමෙන් ද සිංහයන් මෙන් වුවාහු ''සිංහයෝ'' (සීහා) නම් වෙති.

ශබ්දාර්ථ වශයෙන් යම් සේ ''කත්තන'' අර්ථයෙන් මුල - අග විපර්යාස වීමෙන් ''තක්ක'' යැයි කියනු ලැබේද, එසේම ''හිංසන'' අර්ථයෙන් ''සීහෝ'' යැයි පද සිද්ධ වූ බව දත යුතුයි. එසේම ''සහන'' අර්ථයෙන් ද ''සිහෝ'' නම් වේ. සෝදරාදී ප්‍රතික්ෂේප කරන නිරුක්ති නය්‍යය අනුව කියනු ලබන කල්හි, කිව යුත්තක් නැත්තේමය. නැතහොත් මෘගරාජ වූ කේසර සිංහයා තමාගේ පිරුණු තේජස් බල මහිමය නිසා තනිව හැසිරෙමින් වාසය කරයි ද කිසිම සහායයෙකු (දෙවැනියකු) අපේක්ෂා නොකරයි ද, මෙලෙසින්ම පිරුණු තේජස් බල මහිම නිසාත් විවේකයෙහි ඇලුණු නිසාත් හුදෙකලාව - ''තනිව හැසිරේ'' යන අර්ථයෙනුත් සිංහයන් මෙනැයි රහතන් වහන්සේලා ''සීහ'' නම් වෙති. එනිසා බුදුහු මෙසේ වදාළහ. ''**සීහංවෙකචරං නාගං**''[a] (සිංහයෙකු මෙන් ඇතෙකුමෙන් තනිව හැසිරෙන) යනුවෙන්. නැතහොත් තැති නොගන්නා ජව පරාක්‍රමාධි විශේෂ බල මහිමයෙන් සිංහයන් මෙන් වූ යන අර්ථයෙන් මේ මහතෙරවරු ''සිහ'' නම් වෙති. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාළහ. ''මහණෙනි! මෙලොව දෙදෙනෙක් හෙන ගසද්දී තැති නොගනිති. කවර දෙදෙනෙක් ද ? රහතන් වහන්සේ සහ මෘග රාජ වූ සිංහයා යන දෙදෙනයි.''[b] සිංහයා ජවයෙන් ද එසේම පරාක්‍රමයෙන් ද (වේගවත්බව, උත්සාහය) අන් සතුන් අභිබවා සිටියි. එසේම සිංහයා උසහ සියක් (උසහයක් යනු රියන් 140කි.) වුවත් පැන, වන මීමුන් මත වැටෙයි. පනිනුයේත් මඳ වැගිරෙන උතුම් මහා ඇතුන්ගේ හිසට පැන කුම්භස්ථලය බිඳ දන්න කළිර මාංසය කයි. මේ රහතන් වහන්සේ ද ආර්ය මාර්ග ජවයෙන් ද සෘද්ධිමය ජවයෙන් ද අන්‍යයන් හා අසමාන වෙති. සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් ද අන්‍යයන් අභිබවා සිටිති. එනිසා ''**සීහානංවා**'' යනුවෙන් සිංහයන් හා සමාන වූවෝ වෙති. මෙහිදී සිංහයාට සම කළ හැකි අනිකකු නොසිටින බව දත යුතුයි.

---

a. දේවතා සංයුක්තය - සං.නි.

b. අංගුත්තර නිකාය - දුක. නි.

අනියයින් විශිෂ්ය වූ ඉටසිම් ආදි අර්ථාදිය රහතන් වහන්සේ තුලම දක්නට ලැබෙන බැවින්, උන්වහන්සේ සිංහයාට සමාන වෙති.

''නදනතානං'' යනු ගර්ජනය කරන්නා වූ, නද දෙන, ගොදුරු පිණිස යෑම, පරාක්‍රමය, සතුට, දොළදුක් ආදියෙහි දී සිංහයෝ තමා වසන තැනින් නික්මවුත් කිළිපොලා සිංහ නාදය නම් වූ අභීත නාදය පවත්වති. එසේම රහතන් වහන්සේ ද ආධ්‍යාත්මික අරමුණු, ප්‍රත්‍යවේක්ෂණ, ප්‍රීති වාක්‍ය පහළ කිරීම් ආදියෙහි දී මේ අභීත වූ නාදය පවත්වති. එනිසා ''සිංහයන් මෙන් නද දෙන'' යැයි කියන ලදී.

''දාඨිනං'' යනු දළ ඇත්තවුන් අතර ප්‍රශස්ත වූ විශේෂ දළ ඇත්තා වූ, උසස් දළ ඇත්තාවූ යන අර්ථයි. යම්සේ සිංහයෝ අතිශය දැඩි වූ තියුණු වූ සතර දළයන්ගේ බලයෙන් ප්‍රතිවිරුද්ධ වූවන් මැඩලා, සිය මනදොළ පුරවා ගන්නාක් මෙන් සතරක් වූ ආර්ය මාර්ග නම් දළයන්ගේ බලයෙන් ඇරඹුමක් නැති සංසාරයෙහි පෙර මැඩලීමට නොහැකි වූ කෙලෙස් සතුරන් නසා, සිය මනදොළ (ප්‍රාර්ථනාව) ඉටු කරගන්නා රහතන් වහන්සේ දැකිය යුතුයි. මෙහි ''දළ මෙන්'' (දාඨා විය) යන තැන්හි ''දාඨා'' යන්නේ පරිසංකල්පනා වශයෙන්ම අර්ථ දත යුතුයි.

''ගිරිගබහරෙ'' යනු පර්වත ගුහාවයි. සම්පාර්ථයේ සත්තමී වදනකි. ඇතැම්හු (අභයගිරිකාදී) ''ගිරිගවගර''යි ද කියති. පර්වතයන්හි වන ගහණ, වන ලැහැබ් වල සිට යන අර්ථයයි. මෙහි වනාහී සිංහයන්ගේ බබළන තැන දැක්වීම මෙන්ම සිංහ නාදයට යෝග්‍ය වූ භූමිය දැක්වීම ද සිදුවේ. ''ගිරි කඳුරෙහි නද දෙන'' (නදනතානං ගිරිගබහරෙ) යනු පද ගැලපීමයි. යම්සේ සිංහයෝ අන් සතුන් විසින් ලංවිය නොහැකි, ජන ශූන්‍ය වූ ගිරි කඳුරුවල බොහෝ සෙයින් වෙසෙන්නාහු, තමාගේ දර්ශනයෙන් (දැකීමෙන්) කුඩා සා-මුව ආදීන්ගේ සන්තානයේ ඇතිවන තැති ගැනීම දුරු කිරීම සඳහා ගොදුරු පිණිස යාමට පළමුව සිංහ නාද කරත් ද එමෙන් ම අන් ජනයා ලං නොවනගිරි කඳුරු පර්වත වැනි වූ ජන ශූන්‍ය ශූන්‍යාගාරවල වෙසෙන මහරහතන් වහන්සේලා ගුණවලින් කුඩාවූ පුහුදුන් ජන සිත්හි ඇති තණ්හා, ඕසදිටු, පිරිතැවීම් දුරු කිරීම සඳහා දේශනා කළ ''ගාථා'' නම් වූ අභීත වූ සිංහ නාද පැවැත්වූහ.

එනිසා මෙය කියන ලදී.-

''සීහානං ව නදනතානං දාඨීනං ගිරිගබ්භරෙ
සුණාථ භාවිතත්තානං ගාථා අත්තූපනායිකා''

''ගිරි ගුහායෙහි නද දෙන, දළ ඇති සිංහයන් මෙන් වඩන ලද සිත් ඇති රහතන් වහන්සේලා තමා පිළිබඳව ගෙන හැර දක්වූ ගාථා අසවු.'' යනුවෙනි.

''**සුණාථ**'' යනු ඇසීමට අණකළ වදනයි. මේ වචනයෙන් කියනු ලබන ගාථා, රැස් වූ පිරිස් විසින් ඇසීමට කැමැත්ත උපදවමින්, ඇසීමෙහි (ශ්‍රවණයෙහි) කැමැත්ත උපදවයි. උත්සාහය උපදවමින් ගරු - බහුමාන උපදවයි. නැතහොත් ''සීහානං'' යනාදී පදයන්ගේ පරිකල්පනය අත්හැර ප්‍රධාන වශයෙන්ම අර්ථ දත යුතුයි. ''එනිසා දැඩි තියුණු බැවින් ප්‍රශස්ත වූ විශිෂ්ට දළ ඇති සිංහයන්ගේ ගිරි ගුහායෙහි සිට නද දෙන, සිංහ ගර්ජනය කරන මෘග රාජ වූ සිංහයන්ගේ නාදය මෙන් වූ රහතන් වහන්සේලාගේ අතීත සිංහ නාදය වැනි ගාථා අසවු.'' යන අර්ථයයි. එනිසා මෙය කියන ලදී. ''යම්සේ සිංහ නාද කරන සිංහයන්ට මෘගරාජයන්ට කිසිඳු බියක් තැති ගැනීමක් නොමැති වුවත් ඒ අතීත සිංහ නාදය අන්‍ය මෘගයන් තැති ගැනීමට පත් කරයි ද, එසේම වැඩූ ඉඳුරන් ඇති අප්‍රමාදී වූ රහතන් වහන්සේලාගේ සිංහ නාදය වැනි වූ සියලු ආකාර භය හේතූන් ප්‍රහීණ කරන බැවින් ''අතීත නාදයක් වූ ප්‍රමාදී පුනුදුන් ජනයා තැති ගන්වන ගාථා අසවු'' යන අර්ථයයි.

''**භාවිතත්තානං**'' යනු වඩන ලද සිත් ඇති යන්නයි. (ආර්යයන්ගේ) සිත වනාහී ''අත්තාහි කිරදුද්දමෝ''[a] ''යොවෙ ථීනත්තෙතා තසෙස උපූ'' යන තැන්හි සහ ''අත්තසම්මාපණිධී''[b] යන මේ තැන්වලදී ''අත්ත'' (ආත්මය) යැයි කියැවේ. ''එනිසා උසස් සමාධිමය වූ සමථ විදර්ශනාදිය වඩන ලද සිතැතිව, සමථ විදර්ශනා භාවනාවන් මස්තක ප්‍රාප්ත කරගෙන සිටි ආර්යයන්ගේ'' යන අර්ථයයි. නැතහොත් ''වඩනා ලද සිත් ඇති'' යනු වඩන ලද ස්වභාව ඇති සීලාදි ගුණදම් වැඩීම ස්වභාවය වූ යන අර්ථයයි. ගායනා කරනුයේ (ගීයකි) ''ගාථා'' නම් වේ. අනුෂ්ටුභ් ආදී වශයෙන් සෘෂිවරුන් විසින් පවත්වාගෙන පැමිණි සිවු පද හෝ සපද (පදහයක් ඇති) වචනයයි. ඊට සමාන වූ ප්‍රබන්ධයන්ට ගාථා යැයි කියති. ආත්මාර්ථාදී

---

a. ධම්මපද - අත්තවග්ග
b. සු.නි. මහාමංගල සූත්‍රය

a. නි. - මහාපදාන සූත්‍රය

ප්‍රභේද ඇති අභිවෘද්ධියට පමුණුවයි. ඒ අභිවෘද්ධි ආදිය නමා වෙත ගෙන දෙයි යන අරුතින් ''අත්තූපනායික'' නම් වේ. නැතහොත් ''භාවිතත්තානං'' යනු වඩන ලද සිත් ඇති බවයි. ආත්ම භාවයෙහි පවතින ''මමය'' යන හැඟීම මමත්වය ''අත්ත'' යැයි (ආත්මය) කියයි. ඔවුන් විසින් එය අප්‍රමාදී භාවනාවෙන් ද ආවර්ජන භාවනාවෙන් ද වඩන ලදී. මැනවින් ගුණ-සුවඳ ගන්වන ලදී. එනිසා කියන ලදී. ඒ රහතුන්ට කාය භාවනාව, සීල භාවනාව, චිත්ත භාවනාව හා පඤ්ඤා භාවනාව යනු සිවු භාවනාවන්ගෙන් පිරිපුන් ආධ්‍යාත්මයක් ඇතැයි දක්වයි.

''භාවනා'' යනුවෙන් මෙහිදී සම්බුද්ධ ප්‍රතිප්‍රදාව අදහස් කරන ලදී. යමක සත්‍ය සම්බෝධියක් වේ නම් එය ''අභිසමය'' හා ''තදත්‍ථ'' වශයෙන් දෙපරිදි වේ. සම්බෝධිය ත්‍රිවිධාකාරය. සම්මා සම්බුද්ධත්‍වය, පච්චෙක සම්බුද්ධත්‍වය හා ශ්‍රාවක සම්බුද්ධත්‍වය යනුවෙනි. එහි යහපත් බව තමන් වහන්සේ විසින්ම සියලුම ධර්මයන් දැනගත් බැවින් ද අවබෝධ කර ගත් බැවින් ද අන්‍යයන්ට අවබෝධ කරවන බැවින්ද ''සම්මා සම්බුද්ධ'' නම් වේ. සව්ඤ ඥාන පදයෙහි පිහිටි මාර්ග ඤාණය ද, මාර්ග ඤාණ පදයෙහි පිහිටි සර්වඥතා ඤාණය ද ''සම්මා සම්බුද්ධ'' යැයි කියැවේ. එනිසා කියන ලදී. ''ඒ බුද්ධ'' නම් වූ භාග්‍යවතුන් වහන්සේ සර්වඥ වූ සේක්, ගුරුවරයෙකු නොමැතිව පෙර නොඇසූ විරූ ධර්මයන්හි තමන් වහන්සේම සත්‍යාවබෝධ කළ සේක්, එහි ද සර්වඥ පදයට පත්වූ සේක්, තථාගත බලයන්හි ඉතා පුහුණුවූ සේක.'' යනුවෙන්. තථාගත බලයන්හි වසීභාවයෙන්, අවබෝධ කරගත් දේ අවබෝධ කරවීමෙහි (අනුන්ට) සමත්වන සේක.

වෙන් වෙන්ව (තනිව) තමන් වහන්සේම සත්‍යාවබෝධ කරගත්තේ ''පච්චේක සම්බෝධි'' නම් වේ. (පසේ බුදු) ''ලොවුතුරු බුදු රදුන්ට දෙවැනි වූ තමාගේම ඤාණයෙන් සත්‍යය අවබෝධ කරගත්'' යන අර්ථයයි. සම්මා සම්බුදුවරුන්ගේ නමාම අවබෝධ කරගත් ඤාණ ශක්තියෙන් පවතින සත්‍යාවබෝධය, බුදුරජාණන් වහන්සේට දෙවැනි වන අප්‍රමාණ සත්ත්වයන්ට සත්‍යාවබෝධ කිරීමට හේතු වේ. උපකාරී වේ. මේ පසේ බුදුවරු තනිවම සත්‍ය අවබෝධ කළ සේක්; සත්ත්වයන්ට සත්‍යාවබෝධ කිරීමෙහි හේතු නොවෙති. උපකාරී නොවෙති.

ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා අවසානයෙහි අර්හත් මගෙහි උපන්නෝ නම් ශ්‍රාවකයෝය. ශ්‍රාවකයන්ගේ සත්‍යාවබෝධය ලැබීම ''ශ්‍රාවක සම්බෝධිය'' නම් වේ.

මේ සම්බෝධි තුන, ත්‍රිවිධ බෝසතුන්ගේ තම තමාට අයත් පරිදි ආවා වූ ප්‍රතිපදාවෙන් සතිපට්ඨානාදි සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගේ වැඩීමෙන් පරිපූර්ණ වූ, මස්තකප්‍රාප්ත වූ බව දත යුතුයි. සෙසු අභිසමයන් මින් තොරව නොලැබේ. ප්‍රත්‍යක්ෂ අවබෝධයෙන් තොරව භාවනාභිසමය ඇතිනොවේමය. භාවනාභිසමය ඇති කල්හි සිහිය ද ප්‍රඥාණාභිසමය ද පරීක්ෂාභිසමය ද (පිරිසිඳ දත්) සිද්ධ වූයේම වේ.

යම් කලෙක අප මහ බෝසතාණෝ, සම්පූර්ණව පුරනලද බෝධි සම්භාර ධර්ම ඇති සේක්, කරන ලද පූර්ව කෘත්‍ය ඇති සේක් බෝ මැඩට නැඟ, "මගේ සිත උපාදාය රහිතව ආශ්‍රවයන්ගෙන් නොමිදෙන තාක් මේ පළඟින් නො නැගිටිමි"යි ප්‍රතිඥා කොට, අපරාජිත පළඟින් හුන් සේක්; සන්ධ්‍යා භාගය එළඹීමට ප්‍රථමව මර බල පරදා, පෙරයම්හි පෙර කඳපිළිවෙළ දන්නා වූ නුවණින් නානාප්‍රකාර වශයෙන් පෙර ජාතීන්හි විසූ අයුරු සිහිපත් කර බලා, මැදියමෙහි දිව්‍යෙ පිරිසිදු කිරීමෙන් චුති උත්පත්තිය පිළිබඳ දන්නාවූ අනාගත සංඥාවන් අවබෝධ කරගත් සේක. අවසන් (පශ්චිම) යාමයෙහි, "ඒකාන්තයෙන් මේ ලෝකය හිස්ය. මෙලොවට එන තැනැත්තා උපදියි, දිරායයි, මැරෙයි, චුතවෙයි. නැවත උපදියි. මෙසේ මේ සත්ත්වයා දුකෙහි ද ජරාමරණයන්හි ද නික්මීමක් නොදනියි"[a] ආදී වශයෙන් ජරා මරණයන්ගේ සිට පටිච්ච සමුප්පාදය ප්‍රමුඛව විදර්ශනාව ආවර්ජනය කර බලා, මහා කැළයක් සිඳීමට ඇඹරුම් ගලෙහි පොරව මනාව මදින්නාක් මෙන් කෙලෙස් වන ගහණය සිඳීමට ලෝකනාථයන් වහන්සේ ඥාණ පොරව මුවහත් කරන සේක්, බුදු බවින් ද හේතු සම්පත් මුහුකුරා යෑමෙන් ද සර්වඥ ඥානාධිගමයෙන් විදර්ශනා ගැබ ගන්වමින් අතරින් පතර නොයෙක්, නොයෙක් සමාපත්තීන්ට සමවදිමින් ව්‍යවස්ථා කළ අයුරින් නාම රූපයෙහි ත්‍රිලක්ෂණය ආරෝපණය කර විදර්ශනාව වඳනක් පාසා නා නා ප්‍රකාරව සංස්කාරයන් සිහිපත් කරන සේක්, තිස් හය කෝටි ලක්ෂයක් මාතෘකා වශයෙන් සිහිපත් කරන වාරය විස්තර කර, එහි "මහ වජ්‍රඥාණය" නම් වූ තියුණු, ශූර වූ, ප්‍රසන්න වූ විදර්ශනා ඥාණයෙහි නැගිටීම් සිහිපත් කිරීම් වශයෙන් පවතින ආර්ය මාර්ග ප්‍රතිපදාවෙන් කෙලෙස් එක් දහස් පන්සීය නසා - ගෙවා දමා ඉහළම (අග්‍ර) මාර්ගය ලද කෙණෙහිම "සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක්" නම් වේ. අග්‍ර වූ ඵලය ලක්ෂණ වශයෙන් අවබෝධ කළ තැන් පටන් සම්මා සම්බුද්ධ භාවයෙන් දස බල චතුර්වෛශාරද්‍ය ඥානය ම උන්වහන්සේගේ අතට පත් වූවක් ම විය. මෙය වනාහී අවබෝධයෙන් සම්මා සම්බුද්ධත්වය ලැබූ ප්‍රතිපදාවයි. (අභිසමයතො සම්මාසම්බොධිපටිපදා) ඒ සඳහා එළඹීම (තදඵත්තො) දීපංකර පාද මූලයෙන්

කියන විටරණ ලැබීමේ සිට තුසිත භවනයෙහි ඉපදීම දක්වා මේ අතර වූ බොධිසම්භාරයන් සම්පූර්ණ කිරීමයි. එහි යමක් කිවයුතු වේ නම් එය සියලුම ආකාරයෙන් චරියාපිටක ටීකාවෙහි සවිස්තර ලෙස පැවසේ. එහි කියන ලද පරිදි අවබෝධ කරගත යුතුයි.

පසේ බෝසත්වරු ද පසේ බුද්ධත්වය සඳහා කරන ලද ප්‍රාර්ථනා ඇති සේක්, අනුපිළිවෙලින් යහපත්ව පසේ බුදු බවට සුදුසු වූ පාරමී දම් පුරා සිටි කල්හි නුවණ මුහුකුරා යෑමෙන් උපන් සංවේග නිමිත්ත ගෙන, විශේෂ සහිතව භව සම්පත්තියෙහි ආදීනව දැක, තම නුවණින්ම පැවතුණු පැවතෙන හේතූන් ද නැතිවුණ නැතිවන හේතූන් ද පිරිසිඳ දැන "ඔහු මේ දුක යැයි නුවණින් මෙනෙහි කරයි."[a] යනාදී ක්‍රමයෙන් පැවති, චතුරාර්ය සත්‍ය කමටහන් වඩන සේක්; තමාගේ ප්‍රාර්ථනාවන්ට අනුරූප වූ සංස්කාරයන් පිරිමදිමින් - විමසමින් අනුක්‍රමයෙන් විදර්ශනාව උත්සාහවත් කර, මග පිළිවෙලින් අග්‍ර මාර්ගයට පැමිණීම පසේ සම්බුදු බව තමාම අවබෝධ කිරීම නම් වේ. අග්‍ර වූ මගඵලය ලැබීමේ පටන් "පසේ බුදුවරු" යන නමින් දෙවියන් සහිත ලොවෙහි අග්‍ර දක්ෂිණෙය්‍ය පුද්ගලයෝ වෙති.

ශ්‍රාවකයෝ වනාහි ශාස්තෘන්වහන්සේ සමඟ එක්ව බඹසර හැසිරෙමින්, උන්වහන්සේ වෙතින් චතුසත්‍ය මිශ්‍රිත කමටහන් කථාව ශ්‍රවණය කර, එකෙණෙහිම කාලාන්තරයක් පුරා පුරන ලද පාරමී දම් අනුව සිට, ගැටෙමින් වෑයම් කරමින් විදර්ශනාව උත්සාහ කරති. ඉදින් ප්‍රතිපදාව වඩමින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගනිමින් තම ප්‍රාර්ථනාවන්ට අනුව, ගැලපෙන අග්‍ර ශ්‍රාවක තත්ත්වය හෝ හුදෙක් මහා ශ්‍රාවක තත්ත්වය හෝ ලබති. හුදෙක් අග්‍ර මාර්ගය ලැබූ කෙණෙහිම "ශ්‍රාවක සම්බෝධිය" අවබෝධ කර ගැනීම නම් වේ. ඉන් අනතුරුව "ශ්‍රාවක බුද්ධ" නම් වේ. දෙවියන් සහිත ලොවෙහි අග්‍ර දක්ෂිණෙය්‍ය පුද්ගලයෝ වෙති. මෙසේ පච්චේක සම්බුද්ධත්වයේ ද ශ්‍රාවක සම්බුද්ධත්වයේ ද අවබෝධ කිරීම දත යුතුයි.

තදන්‍ත වශයෙන් වනාහී මහා බෝධි සත්වයෝ යටත් පිරිසෙන් (අන්තිම ප්‍රමාණයෙන්) සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් බෝධි සම්භාර ධර්ම සම්පූර්ණ කිරීම කැමතිවිය යුතුයි. මධ්‍යම ප්‍රමාණයෙන් අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද උපරිම ප්‍රමාණයෙන් (ඉහළම තත්ත්වයෙන්) දාසය සංඛ්‍ය කල්ප ලක්ෂයක් ද බෝධි සම්භාර ධර්ම සම්පූර්ණ කිරීම කළ යුතුයි. මෙම ප්‍රභේදයෝ පිළිවෙලින් ප්‍රඥාධික, ශ්‍රද්ධාධික හා විරියාධික වශයෙන් දත යුතුයි.

---

a. ම.නි. සබ්බාසව සූත්‍රය

ප්‍රඥාධික බෝසත්වරුන්ගේ ශ්‍රද්ධාව අල්ප වේ. ප්‍රඥාව ඉතා තියුණුය. එසේම උපාය කෞශල්‍යයෙන් ජනිත විශාරද - නෛපුණ්‍ය බව නිසා නොබෝ කලකින්ම පාරමිතා සම්පූර්ණ කර ගනිති. ශ්‍රද්ධාධික බෝසත්වරුන්ගේ ප්‍රඥාව මධ්‍යම ප්‍රමාණ වේ. ඔවුහු ඉතා වේගවත් නොවී ඉතා සෙමිනුත් නොවී පාරමිතා ධර්ම සම්පූර්ණ කරති. වීර්යාධික බෝසත්වරුන්ගේ ප්‍රඥාව ඉතා අල්ප වේ. ඔවුහු බොහෝ කාලයක් පාරමී ධර්ම සම්පූර්ණ කර ගැනීමට වැය කරති. මහා බෝධිසත්වරු මෙන් නොව පසේ බෝධිසත්වරුන් විසින් ප්‍රඥාධික බව ඇති නම් දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් බෝධිසම්භාර ධර්ම සම්පූර්ණ කිරීම කැමති විය යුතුයි. ඉන් වැඩි නොවේ. ශ්‍රද්ධාධික, වීර්යාධික පසේ බෝසත්වරු විසින් ද එකී සීමාවෙන් කල්ප කිහිපයක් ඉක්මවා පසේ බුද්ධත්වය ලබා ගනිති. අවබෝධ කර ගනිති. කිසිසේත්ම ඔවුහු තනියාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් නොපුරති. ශ්‍රාවක බෝසත්වරු අතරින් යමෙක් අග්‍ර ශ්‍රාවකබවට ප්‍රාර්ථනා කළාහු නම් ඔවුහු එක් අසංඛ්‍යෙය්‍ය කල්ප ලක්ෂයක් බෝධි සම්භාර ධර්ම සම්පූර්ණ කිරීම කැමති විය යුතුයි. යමෙක් මහා ශ්‍රාවක බව පතන්නාහු නම් ඔවුහු කල්ප ලක්ෂයක් ම පාරමී දම් පිරිය යුතුයි. බුදුරජාණන් වහන්සේගේ මවුපිය දෙදෙන ද උපස්ථායකයා ද පුත්‍රයා ද එසේම කල්ප ලක්ෂයක් පාරමී ධර්ම සම්පූර්ණ කළ යුතුයි. එහි යම්සේ:-

> ''**මනුසසත්තං ලිඬග සම්පත්ති හෙතු සත්ථාර දසසනං**
> **පබබජ්ජා ගුණ සම්පත්ති අධිකාරොව ඡඤ්ඤතා**
> **අට්ඨ ධම්ම සමොධානා අභිනීහාරෝ සම්ජ්ඣති**'' යනු

''මනුෂ්‍යත්වය, පුරුෂයකුවීම, ඣාන සම්පත් ලැබීම, ශාස්තෘන් වහන්සේ දැකීමේ වාසනාව, පැවිදිවීම, ගුණ සම්පත් ලැබීම, ප්‍රාර්ථනාව ඊට ඇති අතිශය කැමැත්ත යන මේ කරුණු අට එක්වීමෙන් මහබෝසත්වරුන්ගේ ප්‍රාර්ථනාව සමෘද්ධිමත් වේ.''

මෙසේ පැවසූ පරිදි කරුණු අට සම්පූර්ණ වී කරන ලද ප්‍රාර්ථනාව ඇති මහාබෝධිසත්වරුන්ගේ නියත විවරණ ලබා ගැනීමේ සිට විශේෂ සහිතව දානාදී පාරමීධර්ම සෙසු සියලු පාරමී ධර්මයන් ද රැස් කරනුයේ නමුදු, ඉහත කියන ලද කාල ප්‍රමාණය සම්පූර්ණ නොවී අතරමැද දී බුද්ධත්වයට පත්වීමක් නම් නැත. කුමක් නිසාද ? ඤාණයාගේ මුහුකුරා යෑම නොසිදුවන බැවිණි. නියම කරන ලද කාල සීමාවෙහිදීම වැඩී, වර්ධනය වී, විපුල බවට පත් වී ගැඹි ගෙන මුහුකුරා යෑමට පත්වේ. එසේම,

''මනුසසනනං ලිඬග සම්පනති විගනාසව දසසනං
අධිකාරෝ ඡඤතා එනෙ අභිනීහාර කාරණා'' යනු

''මිනිසත්බව, පුරුෂයකුවීමේ හේතු සම්පත්, ආශ්‍රව නැසුවකු දැකීම, ප්‍රාර්ථනාව හා පච්චේක බුද්ධත්වය කෙරෙහි කැමැත්ත යන මේ කරුණු පහ සම්පූර්ණවීමෙන් කරන ලද ප්‍රාර්ථනාව ඇත්තා වූ පසේ බෝසත්වරුන්ට ද ප්‍රාර්ථනාව හා කැමැත්ත (අධිකාරොච ඡඤතා) යන කරුණු දෙකින් යුක්තව කළ පැතුම් ඇති ශ්‍රාවක බෝසත්වරුන්ට ද ඒ ඒ පදවි සඳහා කියන ලද කාල සීමාවන් සම්පූර්ණ නොවී, අතරමැද දී පච්චේක සම්බුද්ධත්වය ද ශ්‍රාවක සම්බෝධිය ද අවබෝධවීමක් නම් නැත. කුමක් නිසාද ? ඤාණයාගේ මුහුකුරා නොයෑම හේතුවෙනි. මේ බෝසත්වරුන්ට ද මහා බෝධිසත්වරුන්ට මෙන් දානාදී පාරමී ධර්ම වඩන ලද්දාහු. ප්‍රඥා පාරමිතාව අනුපිළිවෙලින් ගැබ්ගෙන මුහුකුරා ගොස් බුද්ධ ඤාණය සම්පූර්ණ කරන්නාක් මෙන් දානාදී පාරමී දහම් වඩන ලදුයේ අනුපිළිවෙලින් සුදුසු පරිදි ගැබ්ගෙන මුහුකුරා ගොස් පච්චේක බෝධි ඤානයද ශ්‍රාවක බෝධි ඤානය ද සම්පූර්ණ කරයි. දන් දීමේ පුරුදුනාවයෙන් ඒ ඒ භවයන්හි අලෝභ සහගත අදහසින් සෑම තැන්හි නොඇලුණු සිතින්, අපේක්ෂා රහිත වූ සිත් ඇතිව; සීලමය පුරුදුනාවයෙන් සංවර වූ කාය-වාග් ඉන්ද්‍රිය ඇතිව ඉතා පිරිසිදු වූ කාය-වාග් කර්මාන්ත (කටයුතු) ඇතිව, පිරිසිදු දිවි පැවතුම් ඇත්තේ, ඉන්ද්‍රියයන්හි මැනවින් ආරක්ෂා කරන ලද දොරටු ඇතිව, භෝජනයෙහි ප්‍රමාණ දන්නෝ වී; නිදිවැරීමෙහි යෙදෙමින් සිත සමාධිගත කර ගනිති. මොවුන්ගේ මේ නිදිවැරීමෙහි යෙදීම ගතපච්චාගතික වත් පිරීම් (යන නැවත පෙරළා එන භික්ෂූහු විසින් පුරන වත) වශයෙන් දත යුතුයි. මෙසේ පිළිපදින්නා වූ උතුමන්ගේ ප්‍රාර්ථනා සම්පත් අනුව අල්ප දුක් විදීමකින් ම අෂ්ට සමාපත්තීහු ද පඤ්ඤාභිඥාවෝ ද ෂඩ් අභිඥාවෝ ද ප්‍රාර්ථනාවන්ට අනුගත පූර්වභාග විදර්ශනාව ද අතට පත් වූවාක් මෙන් වෙති. විරිය පාරමීතාදිය මෙහි ඇතුළත් වන්නේමය.

යමකු තුළ ඇති පච්චේක බෝධියට හෝ ශ්‍රාවක බෝධියට හේතුවන දානාදී පුණ්‍යධර්ම පිරීමෙහි ඇතිවන අතිෂය උත්සාහය ''වීර්යය'' (විරියං) නම් වේ. ඊට අනුරූප වූ අන්‍යයන්ගේ උපද්‍රව ඉවසීම ''ඛන්ති'' (බනති) නම් වේ. දාන සීලාදි පාරමිතා පිරීමෙහි මූලා කිරීමෙන් - රැවටීමෙන් තොරවූයේ නම් ඒ ''සත්‍ය'' (සච්ච) පාරමිතාවයි. සෑම කරුණක් ගැනම අනුශාසනා කිරීමෙහි ස්ථිර පිහිටීම් ඇති අධිෂ්ඨානශීලීභවය ''අධිට්ඨාන''පාරමිතාවයි. දාන ශීලාදිය යොමු කෙරන, පවත්වනු ලබන

අනෘ සෑම සත්ත්ව කෙරෙහි ම පවතින හිතවත් බව ''මෛත්‍රිය'' (මෙත්තා) නම් වේ. අනෙකුත් සත්ත්වයන් විසින් කරන ලද විප්‍රකාර ඇති කල්හි. ඊට මධ්‍යස්ථශීලී වේ නම් එය ''උපේක්ෂාව'' (උපෙක්ඛා) නම් වේ. මෙසේ දාන ශීල භාවනාවන් ද ශීල සමාධි ප්‍රඥාවන් ද සම්පූර්ණ කරනු ලබන කල්හි සෙසු වීරියාදි පාරමිතාවෝ සම්පූර්ණ වෙත්මය. එසේ පච්චේක බෝධිය සඳහා ත්, ශ්‍රාවක බෝධිය සඳහා ත් දානාදි ප්‍රතිපදාවන් ඒ ඒ බෝධිසත්වරුන්ගේ චිත්ත සන්තානයෙහි වැඩීම, විශේෂයෙන් වර්ධනය කිරීම ''භාවනා'' නම් වේ. විශේෂ වශයෙන් දාන - ශීලාදිය රැස්කළ කල්හි සන්තානයෙහි පවතින සමථ විදර්ශනාමය ප්‍රතිපදාව භාවනාවයි. ඒ බෝසත්වරු පෙර භවයන්හි භාවනාවන්හි යෙදීමෙන් රැස් කරන ලද හේතු සම්පත් ඇත්තෝ වෙති. එනිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''ආනන්ද, පූර්වයෝගාවචරයාගේ මේ අනුසස් පහකි. කවර පසක්ද ? ආනන්ද මේ සසුනෙහි පැවිදි වූ පූර්වයෝගාවචරයා මෙලොවදී ම කල් නොයවා රහත් බව ලබා ගනියි. ඉදින් එසේ කල් නොයවා මේ ලොවදීම රහත් බව ලබා නොගත්තානු නම් මරණ අවස්ථාවෙහි රහත් ඵලය ලබා ගනියි. නැතිනම් දෙව් පුතෙකු වී රහත් බව ලබා ගනියි. නැතහොත් බුදුවරුන්ගේ සම්පයේදී වහා ලබන අභිඤ්ඤා (ඛිපාභිඤ්ඤා) ඇත්තෙකු වේ. නැතහොත් පසුකලෙක (ලොවුතුරු බුදුවරයකු පහළ නොවන සමයක) පසේ බුදුවරයකු වේ.[a]

මෙසේ පූර්වභාග ප්‍රතිපදාවෙන් ද පාරමිතා පුරුදු පුහුණු කිරීමෙන් ද සමථ විදර්ශනා භාවනාවන් ද වැඩීමෙන් නිටන ලැබීමේ මාර්ගය වැඩීමෙන් ද ''අවබෝධය'' (අභිසමය) නම් වූ මාර්ග භාවනාවෙන් ද වඩන ලද සිත් ඇති බැවින් බුදු, පසේ බුදු, බුද්ධ ශ්‍රාවකාදි උතුමෝ, ''භාවිතත්තා'' (වැඩූ සිත් ඇත්තෝ) නම් වෙති. ඔවුන් අතුරින් මෙහිදී බුද්ධ ශ්‍රාවකයෝම අදහස් කරන ලදී. මෙහිදී ''සීහානං ව'' යන්නෙන් මේ තෙරවරුන්ගේ සිංහයන්ට සමාන පැවතුම් දක්වීමෙන්, තමාට විරුද්ධ වූවන් විසින් නොමැඩලිය හැකි බවත් ඔවුහු මැඩලා පවතින බවත් දක්වේ. ''සිංහයන් මෙන් නද දෙන - පෙ- ගාථා'' යන මේ ථෙර ගාථාවෝ සිංහ නාදයක් මෙන්ම පරවාදයන් විසින් අභිභවනය කළ නොහැකි බවත් ඒ පරවාදයන් මැඩලන බවත් දක්වයි. ''**භාවිතත්තානං**'' යන මේ වචනයෙන් මෙම කරුණු දෙකම ප්‍රකට කරයි. වඩන ලද සිත් ඇති බැවින් තෙරවරු මේ සසුනෙහි සිංහයන් වැනියැයි කියන ලදී. ඔවුන්ගේ ගාථාවෝ සිංහ නාදය හා සමානය. ''**අත්තූපනායිකා**'' යනුවෙන් අභිභවනය කිරීමෙහි ප්‍රයෝජන දක්වයි.

---

a. පුබ්බයෝගාවචර සූත්‍රය

එහි තෙරවරුන්ගේ විරුද්ධ වූවෝ නම් කෙලෙස් ධර්මයෝ ය. ඒවා මැඩලීමේදී තදංග, විෂ්කම්භන ප්‍රහාණයන් සමඟ සමුච්ඡේද ප්‍රහාණය ද වේ. පටිප්පස්සද්ධි (සංසිදීම) ප්‍රහාණය ද නිස්සරණ (නික්මීම) ප්‍රහාණය ද සිදු වූයේ ම වේ. යම් සේ උන්වහන්සේලා ''භාවිතත්තා'' යැයි කියත් ද ? ආර්යයෝ මාර්ග ක්ෂණයෙහි දී අප්‍රමාදී භාවනාව වඩනුයේ නම් වෙති. අග්‍ර වූ මාර්ග ඵලය ලැබීමේ සිට ''භාවිතත්ත'' (වැඩූ සිත් ඇත්තෝ) නම් වෙති. මෙසේ පවසන ලද්දෙහි විස්තරාර්ථ මෙසේ ය. මේ ප්‍රහාණයන් අතුරින් තදංග ප්‍රහාණයෙන් ඒ තෙරවරුන්ගේ සීල සම්පදාව දක්වන ලදී. විෂ්කම්භන ප්‍රහාණයෙන් සමාධි සම්පදාව දැක්විණි. සමුච්ඡේද ප්‍රහාණයෙන් ප්‍රඥා සම්පදාව ද සෙසු ප්‍රහාණයන්ගෙන් ඒවායේ ඵලය (විපාකය) ද දක්වන ලදී. ඒ තෙරවරුන්ගේ පිළිවෙතෙහි මුල්ම යහපත් බව (ආදි කල්‍යාණතා) සීලයෙන් දැක්විණි. ''කුසලධර්මයන්ගේ කුමක් මූලික වේද ? ඉතා පිරිසිදු ශීලයයි.'' (කොචාදි කුසලානං ධම්මානං, සීලඤ්ච සුවිසුද්ධං) ''සීලයෙහි පිහිටා....'' (සීලෙ පතිට්ඨාය)[a] ''සියලු පාපයන් නොකිරීම'' (සබ්බ පාපස්ස අකරණං)[b] යනාදි බුද්ධ වචන වලින් සීල ප්‍රතිපත්තිය මුල්ම යහපත් වීම බවත්, එය විපිළිසර නොවන ගුණ ඵළවන බවත් තහවුරු වේ. සමාධියෙන් මැද යහපත්වීම (මජෙඣ කල්‍යාණතා) දැක්විණි. ''සිත වඩමින්'' (චිත්තං භාවයං)[a] ''කුශලයන් වැඩීමෙන්'' (කුසලස්ස උපසම්පදා)[b] යන බුද්ධ වචනවලින් සමාධි පිළිවෙතින් මැද යහපත් වීම ද සෘද්ධිමය හැකියා දී ගුණ පැමිණීම ද දැක්විණි. ප්‍රඥාවෙන් අවසාන යහපත් බව දැක්විණි. (පරියොසාන කල්‍යාණතා). ''තම සිත දමනය කර ගැනීම.'' (සචිත්ත පරියොදපනං)[c] ''ප්‍රඥාව වඩනුයේ'' (පඤ්ඤා භාවයං)[d] යන බුද්ධවචන වලින් ප්‍රඥා ප්‍රතිපත්තිය අවසානයට දක්විණි. කුසල දහම් අතරින් ප්‍රඥාව උතුම් වේ. ප්‍රධාන වේ. එයම ඉෂ්ටානිෂ්ට නාදී ගුණ ඵළවීම ද සිදු කරයි.

''සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දා පසංසාසු න සම්ඤ්ඣනති පණ්ඩිතා''[c] යනුවෙන්

''ඒකඝන ගල් පර්වතය සුලඟින් නොසෙල්වෙන්නාක් මෙන් නින්දා - ප්‍රශංසා දෙකෙහි දීම පඬිවරු නොසැලෙති.'' යනුවෙන් ඒ බව පැවසුණි.

---

a. සං.නි. දෙවතා සංයුක්තය - ජටා සූත්‍රය
b. දී.නි. මහාපදාන / ධම්මපද බුද්ධවග්ග
c. ධම්මපදය - මඟවග්ගය ධම්මපද, ධම්මපද පණ්ඩිත වග්ග
ධම්මපද - අරහන්ත වග්ග
d. කොධ වග්ග

එසේම ශීල සම්ප්‍රදායෙන් ත්‍රිවිද්‍යා ගුණ දක්වීණි. ශීල සම්පත්තිය නිසාම ත්‍රිවිද්‍යා ලාභය සිදුවේ. සමාධි සම්පත්තියෙන් ඩේඅභිඤ්ඤා බව ලැබේ. සමාධි සම්පත්තිය නිසා ඩේ අභිඤ්ඤාවන්ට පත්වෙති. ප්‍රඥා සම්පත්තියෙන් වෙන් වෙන් වූ පටිසම්භිදාවෝ ලැබෙති. ප්‍රඥා සම්පත්තිය හේතුවෙන් චතුර් ප්‍රතිසම්භිධාවන්ට (සිවු පිළිසිඹියාපත් බවට) පත්වෙති. මේ ථේරගාථාවෙහි එන තෙරවරුන් අතුරින් ඇතැමෙක් ත්‍රිවිද්‍යා ලාභීහුය. ඇතැමෙක් සිවු ඩේ අභිඤ්ඤා ලාභීහුය. ඇතැමෙක් පිළිසිඹියාපත් රහතන් වහන්සේලා වෙති යන මේ අර්ථය දක්වන ලදුයි දත යුතුයි.

එසේම ශීල සම්පත්තියෙන් ඒ තෙරවරුන්ගේ කාමුක සැප සම්පත් විදීම නම් වූ අන්තයාගේ දුරු කිරීම දක්වයි. සමාධි සම්පත්තියෙන් සිරුරට දුඩි දුක් දීම නම් වූ අත්තකිලමථානු යෝගය ද ප්‍රඥා සම්පත්තියෙන් මධ්‍යම ප්‍රතිපදාව ඇසුරු කළ බව ද දක්වයි. එසේම ශීල සම්පත්තියෙන් ඒ තෙරවරුන්ගේ ක්ලේශයන්ගේ විතික්කම ප්‍රහාණය දක්වයි. සමාධි සම්පත්තියෙන් කෙලෙස්වල පරියුට්ඨාන ප්‍රහාණය ද ප්‍රඥා, සම්පත්තියෙන් අනුශය ප්‍රහාණය ද දක්වයි. ශීල සම්පත්තියෙන් දුශ්චරිත පාපී කෙලෙස් ධර්ම සෝදා හැරීමත්, සමාධි සම්පත්තියෙන් තෘෂ්ණාදී කෙලෙස් ධර්ම පිරිසිදු කිරීමත්, ප්‍රඥා සම්පත්තියෙන් වැරදි පිළිගැනීම් (දෘෂ්ටි) දී කෙලෙස් වලින් පිරිසිදු වීමත් දක්වයි.

තදංගප්‍රහාණයෙන් ඒ තෙරවරුන්ගේ අපායගාමීත්වයෙන් වැළකීම දක්වන ලදී. විෂ්කම්භන ප්‍රහාණයෙන් කාම භවයන්ගෙන් මිදීම ද සමුච්ඡේද ප්‍රහාණයෙන් සියලු භවයන්ගෙන් මිදීම ද දක්වන ලදුයි දත යුතුයි.

වඩන ලද සිත් ඇත්තවුන්ගේ (භාවිතත්තානං) මෙහි සීල භාවනා, චිත්ත භාවනා හා ප්‍රඥා භාවනා වශයෙන් භාවනා තුනෙකැයි දත යුතුයි. ඒ භාවනාවන්ගෙන්, එම සියලු භාවනා ඇතුළත් වූ සීල භාවනා ප්‍රතිපත්තියම මූලික යැයි යන සියල්ල ඉහත පැවසූ පරිදි දත යුතුයි. සිංහ නාදය සෙසු මෘග සමූහයා නො ඉවසති. එයට බියවෙති. ඉදින් එම සිංහ නාදය මැඩ පැවැත්වීමක් කෙසේ ලැබේද ? වෙනත් සිංහ නාදයකින්ම සිංහ නාදය මැඩලිය හැක්කේ වේ. මේ අයුරින්ම අන්‍ය තීර්ථකවාදීහු රහතන් වහන්සේලාගේ ප්‍රකාශන නො ඉවසති. එය මැඩ පැවැත්වීමක් කෙසේ ලැබේද ? අනික් රහතන් වහන්සේලාගේ ප්‍රකාශනයකින්ම (ථේරවාද) ඒවා අභිභවනය කළ හැකිවෙති. එයට හේතු කවරේද ? ''සියලු සංස්කාරයෝ අනිත්‍යයහ.'' ''සියලු සංස්කාරයෝ දුක් ගෙන දෙති'' සියලු සංස්කාරයෝ අනාත්මයහ'' යනුවෙන් නිර්වාණ ධාතුව පැවතීම හේතුවෙනි.

ධර්මයන්ගේ ස්වභාවය කිසිවෙකු විසිනිදු වෙනස් කිරීමට, මෙසේ නොපවත්නා බවට පත් කිරීමට නොහැක්කේමය. මෙහි යමක් කිව යුතු නම් එය සෙසු අපුවාවන්හි ප්‍රකටව දැක්වේ. මෙසේ මේ පළමු ගාථාවෙහි සංක්ෂිප්ත අර්ථ දැක්වීම දත යුතුයි.

දෙවන ගාථාවෙහි සම්බන්ධය දැක්වීම් වශයෙන් එන අර්ථ විවරණය මෙසේය. එහි යම් තෙර නමකගේ ගාථා ඇසීමට කැමති නම් ඒ සියල්ලන්ගේ සාධාරණ වශයෙන් නම, ගෝත්‍රය හා ගුණමහිමාදිය ප්‍රකට කිරීම සඳහා ''යථානාමා...'' යනාදි ඇතුළත් වේ. එහි **''යථානාමා''**යනු යම් යම් නම් ඇති; සුභූති, මහා කොට්ඨිත ආදී වශයෙන් නාම දැක්වීමෙන්, ප්‍රඥප්තිය දැක්වීමෙන් (පුද්ගල නාම) යන අර්ථයයි. **''යථා ගොත්තා''** යනු යම් යම් ගෝත්‍ර ඇති. ගෞතම, කාශ්‍යපාදි වශයෙන් කුල වශයෙන් ඒ ඒ ජාතියට අයත් යැයි දැක්වීම යන අර්ථයයි. **''යථාධම්ම විහාරිනෝ''** යනු යම් බඳු සමාපත්ති විහරණ ඇති; ''පර්‍යාප්තිය පිහිට කරගෙන නොසිට, තමාට යෝග්‍ය සමාපත්ති විහරණයන්හි ද යෙදෙමින් වෙසෙන'' යන අර්ථයයි. නැතහොත් **''යථාධම්මවිහාරිනෝ''** යනු ධර්මානුකූලව වැඩ වෙසෙන්නෝ ද යම් බඳු ශීලා දී ධර්මයන්හි ද දිව්‍යමය විහරණයන්හි නිතර වෙසෙන්නෝ, ''යාදිසවිහාර'' නම් වෙති. **''යථාධිමුත්තා''** යනු යම්බඳු අධිමුක්තීන් ඇති, ශ්‍රද්ධා විමුක්ති, ප්‍රඥා විමුක්ති ආදී යම් යම් අධිමුක්තියක් ඇති, ශූන්‍යාදී වශයෙන් යම් යම් සේ නිවණක් අවබෝධ කරන ලද ද **''යථාධිමුක්ත''** නම් වේ. ''නිර්වාණාධි මුක්තිකයන්ගේ ආශ්‍රව ක්ෂය බවට යයි.'' යනුවෙන් කියන ලදී. මේ දෙවිධියම පූර්වභාග වශයෙන් ම දත යුතුයි.

ධර්මයට අනුව, විහරණයට අනුව, අරහත් බවට පත් වූ පූර්වයෙන්ම දැක්වූ පරිදි අධිමුක්තික වූ ශ්‍රාවකයෝ සෙසු සමයන්හි නොලැබේ. එනිසා භාග්‍යවත්හු මෙසේ වදාළහ. ''යම් පුද්ගලයෙක් ඇදහීම ඉක්ම වූයේ ද ප්‍රත්‍යක්ෂයට පැමිණියේ ද පස්කඳට කෙළෙහි ගුණ නොසළකයි ද පටිච්ච සමුප්පාදයේ අර කඩා බිඳ දැමී ද'' යනුවෙන් ඒ උතුම් ගුණ කියැවේ. ''යථා විමුත්තා'' යන පාඨයද මෙතැනට යෙදේ. ''ප්‍රඥා විමුක්තිය, උභතෝ භාග විමුක්ති ආදියෙහි යම් යම් විමුක්තියක් වේද'' එය යන අර්ථයයි. **''සපඤ්ඤා''** යනු ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ප්‍රඥාවෙන්, පාරිහාරික (පරිහරණය කළ) ප්‍රඥාවෙන්, භාවනා ප්‍රඥාවෙන් යන ත්‍රිවිධ ප්‍රඥාවෙන් යුක්ත වූයේ **''විහරිංසු''** යනු ඒ ප්‍රඥාවන්ත භාවයෙන්ම ලබන ලද පහසු විහරණ ඇතිව විසූහ. **''අතන්දිතා''** යනු අනලස්ව; තමාට හිතවත් පිළිවෙතෙහි යෙදෙමින්, ශක්ති ඇති පරිද්දෙන් අනුන්ට හිතවත් පිළිවෙතිද උත්සාහවන්ත වෙමින්'' යන අර්ථයයි.

මෙහිදී නම් ගොත් ගැනීමෙන් ඒ ඒ තෙරවරුන්ගේ ප්‍රකාශයන්හි ප්‍රකට බව දක්වයි. ධර්ම විහාර ගැනීමෙන් සීල සම්පත්තිය ද සමාධි සම්පත්තිය ද දක්වයි. ''**යථාධිමුත්තා සපඤ්ඤා**'' යන මේ පදයෙන් ප්‍රඥා සම්පත්තිය දක්වන ලදී. ''**අතන්දිතා**'' යනුවෙන් සීල සම්පත් ආදියට හේතු භූත වූ වීර්ය සම්පත්තිය දක්වයි. ''යථානාමා'' යනුවෙන් ඒ තෙරවරුන්ගේ ප්‍රකාශිත නාමයක් වේද එය දක්වන්නේය. ''**යථාගොත්තා**'' යන මෙයින් සද්ධානුසාරී, ධම්මානුසාරී යන ගෝත්‍ර සම්පත්තීන් හි රැස්වීම ද දැක්වේ. ''**යථාධම්ම විහාරිනො**'' යනාදියෙන් සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඤාණ දර්ශන සම්පත්තීන්හි රැස්වීම ද ''අතන්දිතා'' යන මෙයින් මෙසේ ආත්මාර්ථය සාධනය කරගෙන සිටි උතුමන්ගේ පරාර්ථයෙහි යෙදීම දක්වයි.

නැතහොත් ''**යථානාම**'' යනු, මේ ඒ තෙරවරුන්ගේ ගුරුවරුන් විසින් ගත් නාමයන් දැක්වීමයි. තමාගේ නාමය පැවසීමයි. ''**යථාගොත්තා**'' යන මෙය කුල පුත්‍රයකු බව කුල-ගෝත්‍රාදිය ප්‍රකාශ කිරීමෙන් දක්වීමයි. ඉන් ඔවුහු ශ්‍රද්ධාවෙන් පැවිදි වූවන් බව දක්වයි. ''**යථාධම්මවිහාරිනො**'' යන මෙය සීල සංවර ආදී මරණ සම්පත්තීන්ගෙන් යුක්ත බව දැක්වීමයි. ''**යථාධිමුත්තා සපඤ්ඤා**'' යන මෙය ඒ තෙරවරුන්ගේ ආසවක්ඛය ඤාණයෙන් අවසන් වන ඤාණ සම්පත්තීන්හි අවබෝධය දැක්වෙන අෂ්ට විද්‍යා සම්පත්තීන්ගෙන් යුක්ත බව දක්වීමයි. ''අතන්දිතා'' යන මෙය චරණ සම්පත්තීන්ගේ අධිගම උපායයන් දැක්වීමයි.

''**යථානාමා**'' යන මෙයින් ඒ රහතන් වහන්සේලාට භාවිත නාම මාත්‍රය පමණක් දක්වයි. ''**යථාගොත්තා**'' යන වදනින් අවසන් චක්‍ර සම්පත්ති දෙක දක්වයි. යහපත් ච නොපිහිටුවන ලද සිත ද පෙර නොකළ පින් ඇති බව ද ඇත්තාට සද්ධානුසාරී හා ධම්මානුසාරී වූ ගෝත්‍ර සම්පත් පහළවීම නොවන්නේමය. ''**යථාධම්ම විහාරිනො**'' යන මෙයින් උන්වහන්සේලාගේ පූර්ව චක්‍ර සම්පත් දෙක දක්වයි. නුසුදුසු පෙදෙසක වෙසෙන හා සත් පුරුෂාශ්‍රායක් නැත්තාට එබඳු ගුණ විශේෂයක් නූපදින්නේමය. ''**යථාධිමුත්තා**'' යන මෙයින් සද්ධර්ම ශ්‍රවණ සම්පත්තියේ එක්වීම දක්වයි. අනුන්ගේ උපදේශනයකින් තොරව ශ්‍රාවකයන්ගේ සත්‍ය දැන ගැනීමක් නොමැතිවන්නේ ය. ''**සපඤ්ඤා අතන්දිතා**'' යන මෙයින් ඉහත කියන ලද පරිදි ගුණ විශේෂයන්ගේ විශේෂ හැසිරීමෙන් ඥානාරම්භය දක්වයි.

තවත් ක්‍රමයකි. ''**යථාගොත්ත**'' යන මෙහි ගෝත්‍ර දැක්වීමෙන් ඒ තෙරවරුන්ගේ නුවණින් මෙනෙහි කර බැලීම් සම්පත්තිය දක්වයි. කියන

ලද පරිදි ගෝත්‍රාදියෙන් යුතු නැනැත්තාට යෝනිසෝ මනසිකාරය පහළවේ. ''යථා ධම්ම විහාරිනො'' යන මෙහි ධර්ම විහාර ගැනීමෙන් සද්ධර්ම ශ්‍රවණ සම්පත්තිය දක්වයි. සද්ධර්ම ශ්‍රවණයෙන් තොරව මේ සම්පත් නොපවතියි.

''යථාධිමුත්තා'' යන මෙයින් ම මස්තකප්‍රාප්ත වන ධර්මානුධර්ම ප්‍රතිපදාව දක්වයි. ''**සපපඤ්ඤා**'' යන මෙයින් සැම තැන්හි විමසන නුවණැති බව දක්වයි. ''අතඤ්ඤිනා'' යන මෙයින් කියන ලද පරිදිම තමාට හිත පිණිස වූ සම්පත් සම්පූර්ණ කරගත්, අනුන්ගේ හිතසුව පිණිස පිළිවෙත් පිරීමෙහි නොපසුබස්නා බව දක්වයි. එසේම ''**යථාගොත්තා**'' යන මෙයින් ඒ රහතන් වහන්සේලාගේ ශ්‍රද්ධානුසාරී ගෝත්‍ර දක්වීමෙන් සරණාගමන සම්පත්තිය දැක්විණි. ''යථාධම්මවිහාරිනො'' යන මෙයින් ශීලස්කන්ධය පූර්වාංගම වූ සමාධි ස්කන්ධය දක්වන ලදී. ''**යථාධිමුත්තා සපපඤ්ඤා**'' යන මෙයින් ප්‍රඥා ස්කන්ධාදිය දැක්විණි. ශ්‍රාවක ගුණ අතුරින් සරණාගමනය මුල් පියවරයි. සමාධි මැද පියවරයි. ප්‍රඥාව අවසන් පියවරයි. මෙසේ මුල - මැද - අග යනාදී ලෙස සියලුම ශ්‍රාවක ගුණ දක්වන ලද්දේ වේ.

මෙබඳු ගුණ විභූතියක් යම් යහපත් ප්‍රතිපදාවක නියැලීමෙන් ඒ මහ තෙරවරුන් විසින් අවබෝධ කරන ලද්දේ ද එය දැක්වීමට ''ඒ ඒ තැන විදසුන් වඩා (තත්‍රා තත්‍රාවිපසසිත්‍රා...) යනාදී ගාථාව දැක්විණි. ''තත්‍රා තත්‍රා'' ඒ ඒ අරණ්‍ය - රුක්මුල් - පර්වතාදියේ විවේකී සෙනසුන්වල නැතහොත් ''තත්‍රා තත්‍රා'' යනු ඒ ඒ ප්‍රීති වාක්‍ය (උදාන) පහළ කිරීමට පෙර කාලයෙහි ''**විපසසිත්‍රා**'' යන විමසා බලා නාමරූප ව්‍යවස්ථා කිරීම්, ප්‍රත්‍යවේක්ෂාදියෙන් දෘෂ්ටි විශුද්ධිය, කංඛාවිතරණී විශුද්ධිය සම්පාදනය කොට, කලාප සිහි කිරීම් ආදි වශයෙන් විදර්ශනාව උත්සාහ ගන්වා ''**ඵුසිත්‍රා**'' යනු පැමිණ, සාක්ෂාත් කර ''**අච්චුතං පදං**'' යනු නිවණයි. එහි තමාම අනිර්වචනීය ධර්මතාව අවබෝධ කළ උතුමන්ගේ නූපදින හේතු - නොමැරෙන හේතු දැක්වීමයි. ''මෙහි චුතවීමක් නැත'' (නත්‍රී එත්‍රී චුති) යනු ''අච්චුතං'' (නිවණයි) සංඛත ධර්මයන් සමඟ අමිශ්‍ර බව දැක්වීම පිණිස ද එය කැමැත්තන් විසින් පිළිපැදිය යුතු බව දැක්වීම පිණිස ද ''පදං'' යැයි කියයි.

''**කතනත්තං**'' යනු කල යුත්තෙහි කෙළවර, යම් ඒ ආර්ය මාර්ගයක් ඒ තෙරවරුන් විසින් තමාගේම උත්සාහයෙන් උපදවන ලද ද එය ''කරන ලද'' (කතො) නම් වේ. ඒ ආර්ය මාර්ගයේ අවසාන වූ ඵලයට පැමිණියේය යන අර්ථයයි. එසේ අවසන් කරන ලද අග්‍ර ඵලයේ ඇති. නැතහොත් හේතු ප්‍රත්‍යයන් විසින් කරන ලද, නිපදවන ලද බැවින් සංඛත ධර්මයෝ ''කත'' නම්

වෙති. එහි නික්මීම - සිද දමීම කරන ලද බැවින් ''කතනෙතා'' යනු නිවණයි. ඒ නිවණ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ''මවිසින් ආර්ය මාර්ගය අවබෝධ කෙළෙමි'' යනුවෙන් ආර්ය ඵල නිවන් විමුක්ති ඤාණ දර්ශනයෙන් ප්‍රතිපත්තිය සිහිපත් කර බලමින්. නැතහොත් සත්‍යාබෝධ කිරීම් වශයෙන් යමක් ආර්යන් විසින් නොකළ යුතු විශේෂයෙන් දැන ගැනීම් (පරිඤ්ඤා) ආදී දොළොස් වැදෑරුම් කෘත්‍ය (කටයුතු) අග්‍ර ඵලයෙහි සිටියනු විසින් නිපදවන ලද බැවින් ද පර්යේෂණ කොට සොයා ගත් බැවින් ද ''කතං'' (කරන ලද) නම් වේ. මෙසේ නිවණ ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ මෙයින් තමාම ප්‍රහීණ කරන ලද කෙලෙස් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාව දක්වන ලදී. පූර්ව න්‍යාය අනුව අනික් ප්‍රත්‍යවේක්ෂාවෝ යි ''ප්‍රත්‍යවේක්ෂා දහ නවයක්'' දක්වන ලද්දේ වේ.

''**ඉමමත්ථං**'' යන මෙහි 'ඉමං' යනු ''සියලු ථෙරථෙරී ගාථා'' යන අර්ථයයි. තමාගේ ද සෙසු එහි රැස් වූ ධර්ම සංග්‍රාහක මහ තෙරවරුන්ගේ ද බුද්ධිය පෙරලා දමනු ලැබීමට ආසන්න වූ ප්‍රත්‍යක්ෂවීම් ඇතැයි කියන ලදී. ''**අත්ථං**'' යනු ''මාගේ කුටිය සෙවිලි කරන ලදි'' යනාදී ගාථාවලින් කියනු ලබන තමා පිළිබඳව වූත්, අනුන් පිළිබඳව වූත් ලෞකික - ලෝකෝත්තර කරුණු ප්‍රතිසංයුක්ත වූ අර්ථයයි. තේරුමයි. ''අභාසිංසු'' යනු ගාථා බැඳීම් වශයෙන් වදාළහ. එම ගාථා ප්‍රකටව දක්වමින් ''මේ මවිසින් කියනු ලබන ඒ වඩන ලද සිත් ඇති මහ තෙරවරුන්ගේ තමා පිළිබඳව පැවසෙන ගාථා අසවු'' යන අර්ථ යෝජනාවයි. ඒ මහ තෙරවරු ද මෙසේ දේශනා කරමින්, තමාගේ යහපත් පිළිවෙත් පැවසෙන ගාථාවලින් ශාසනයේ ඒකාන්ත නෛයර්‍යාණික බව දක්වීමෙන්, අන්‍යයන් ද ඒ යහපත් පිළිවෙතෙහි යොදවමින් මේ අර්ථ දක්වයි. ආයුෂ්මත් ධර්ම භාණ්ඩාගාරික තෙරණුවෝ මෙසේ ගෙනහැර දක්වමින්, මෙම ගාථාවලින් ඒ මහතෙරවරුන්ට ස්තුති කිරීම ද උන්වහන්සේලාගේ එම වදන්හි නිදාන භාවය ප්‍රකටවම උඩුකුරු කර දක්වන්නේ යැයි ද දත යුතුයි.

නිදාන ගාථා වර්ණනාව නිමියේය.

දැන් ''ජනනා මෙ කුටිකා'' යනාදි වශයෙන් පටහින ථෙරගාථාවන්ගේ අර්ථවර්ණනාව දැක්වේ. ඒ මේ අර්ථ වර්ණනාව ඒ ඒ ගාථාවන්ගේ අර්ථෝත්පත්තිය පවසා, අනතුරුව දක්වනු ලබන්නේ නම් අර්ථය ඉතා ප්‍රකට වේ. ධර්ම කරුණු දැනගත හැකි ද වේ. එනිසා ඒ ඒ ගාථාවන්ගේ අර්ථෝත්පත්ති දක්වා පසුව අර්ථවර්ණනාව කරන්නෙමි.

''එහි ජනනා මෙකුටිකා'' යන ගාථාවෙහි උපත කෙසේවිද ? කියනු ලැබේ. මේ මහා භද්‍ර කල්පයට කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ නොවූ කල්හිම හංසවතී නම් නුවර එක්තරා බමුණු මහසල් කුලයක එක් පුතෙක් ඉපදුණි. ඔහුට ''නන්ද මාණව'' යන නම විය. ඔහු වැඩිවියට පැමිණ ත්‍රිවිද්‍යා උගෙන, එහි සාරයක් (අර්ථයක්) නොදැක, තමාගේ පිරිවර වූ සතලිස් සතර දාහක් තරුණයන් සමඟ පර්වතයක් පාමුල ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අට සමවත් උපදවා, පංච අභිඤ්ඤාවන් ද ලබා ගත්හ. අතවැසි ආදීන්ට ද කමටහන් ප්‍රකාශ කරන අතර ඔවුහු ද නොබෝ දිනකින්ම ධ්‍යාන ලාභීහු වූහ.

මේ කාලයේදී පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සේක්, හංසවතී නුවර ඇසුරු කරමින් වාසය කරන සේක්. එක් දිනක් අළුයම් කාලයෙහි ලොව බලා වදාරණ සේක්, නන්ද තාපසයාගේ අතවැසි ජටිලයන් රහත්වන බව ද නන්ද තාපසයාගේ අංග දෙකකින් යුක්ත ශ්‍රාවක තනතුරකට කරන ප්‍රාර්ථනාව ද දැක උදෑසනම සිරුර පිළිදැගුම් කොට නිමවා පෙරවරු සමයෙහි පා සිවුරු ගෙන අන් කිසි භික්ෂුවක් නො කැඳවා සිංහයෙකු මෙන් හුදෙකලාව, නන්ද තාපසයාගේ අතවැසියන් ඵල ඵල්ලව ගෙන ඒමට ගිය කල්හි ''මාගේ බුද්ධ භාවය දැන ගනීවා'' යි පෙනෙමින් ම අහසින් බැස නන්ද තාපසයා ඉදිරියේ පොළොවෙහි සිටි සේක. නන්ද තාපසයා බුද්ධානුභාවයත් එමෙන්ම පිරිපුන් ලක්ෂණ සම්පත්තියත් දැක, ලක්ෂණ ශාස්ත්‍රය සිහිපත් කර බලා ''මේ ශරීර ලක්ෂණවලින් යුතු තැනැත්තා ගිහිගෙයි විසුවොත් සක්විති රජ කෙනෙක් වේ. පැවිදි වුවහොත් ලොව ඇලීම ඉවත් කළ (බැහැර ලූ) සර්වඥ වූ බුදුරජාණන් වහන්සේ නමක් වේ. මේ උත්කෘෂ්ඨ පුද්ගල තෙම අනිවාර්යයෙන්ම (නිසැකවම) බුදුවරයෙකි''යි දැන පෙරගමන් කොට පසඟ පිහිටුවා වැඳ අසුන් පනවා දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ පැනවූ අසුනෙහි වැඩ සිටි සේක. නන්ද තාපසයා ද තමාට යෝග්‍ය වූ අසුනක් ගෙන එකත් පසෙක සිටියේය.

එසමයෙහි සතලිස් සාර දහසක් ජටිලයෝ ඉතා රසවත්, පෝෂ්‍යජනක පළතුරු ගෙන ගුරුවරයා සමීපයට පැමිණියාහු; බුදුරදුන්ගේ ද ගුරුවරයාගේ ද නුන්නාවූ ආසන දැක මෙසේ පැවසූහ. ''ගුරුතුමනි ! අපි මේ ලෝකයේ ඔබට වඩා උතුම් පුද්ගලයෙක් නැතැයි සිතුවෙමු. මේ උතුම් පුරුෂයා වනාහි ඔබට වඩා ඉතා ශ්‍රේෂ්ඨ යැයි සිතන්නේද ?'' ඒ වදන් ඇසූ නන්ද තාපසතුමා ''නුඹලා කුමක් කියහුද ? අබ ඇටයක් සමඟ හැට අට ලක්ෂයක් යොදුන් උස් වූ මහමෙර සම කිරීමට කැමතිද? සර්වඥ බුදුවරයකු සමඟ මා සමාන නොකරන්න''යි පැවසීය. ඉක්බිති ඒ තාපසවරු ''ඉදින් මොහු පහත් පුද්ගලයෙක් නොවන්නේ නම් අපගේ ගුරුතුමා මෙවැනි උපමා නොදක්වන්නේය, ඒකාන්තයෙන් මෙතෙම ශ්‍රේෂ්ඨතම පුරුෂයා''යැයි සිතා බුදු පියාණන් වහන්සේගේ පාමුල වැටී හිසින් වන්දනා කළහ.

ඉක්බිති ඔවුන්ට ගුරුවරයා මෙසේ පැවසීය. ''දරුවණි, අපට බුදුවරුන්ට දීමට සුදුසු දාන මානයක් නැත. භාග්‍යවතුන් වහන්සේ ද පිඬු සිඟා යන වේලාවෙහි මෙහි වැඩම කළ සේක. එනිසා, අපි ශක්ති පරිද්දෙන් දානයක් දෙමු. නුඹලා ගෙනෙන ලද ප්‍රණීත පළතුරු ඇත්තේ ද ඒවා ගෙනෙවු'' යි කියා ඒවා ගෙන්වා අත් සොදා, තමා ම එම පළතුරු තථාගතයන්ගේ පාත්‍රයෙහි තැන්පත් කළේය. ශාස්තෘන් වහන්සේ පළතුරු පිළිගත් මොහොතෙහි දෙවියෝ එහි දිව්‍ය ඕජස් බහාලූහ. තාපසතුමා තමා ම ජලය ද පෙරා පිළිගැන්වීය. ඉක්බිති ආහාර වැළඳීම නිමා කර නුන් බුදුරජාණන් වහන්සේ සියලු අතවැසියන් අමතා සම්පයේ හිඳුවා පිළිසඳර කථාව කරමින් නුන් සේක.

ශාස්තෘන් වහන්සේ ''භික්ෂු සංඝයා එන්වා!'' යි සිතූ සේක. භික්ෂුහු ශාස්තෘන් වහන්සේගේ සිත දැන, ලක්ෂයක් පමණ මහරහත්හු පැමිණ උන්වහන්සේට වැඳ එකත් පසෙක සිටියහ. නන්ද තාපසයා අන්තේවාසිකයන්ට ඇමතීය. ''දරුවනි, බුදුරජාණන් වහන්සේ නුන් ආසනය ද කුඩා වූවකි. රහතන් වහන්සේලා ලක්ෂයකට ද ආසන නැත. නුඹලා විසින් භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු මහා සංඝයාට ද මහත් සත්කාර කිරීමට සුදුසුය. පර්වත පාදයෙන් වර්ණවත් වූත් සුවඳවත් මල් රැගෙන එවු''යි පැවසීය. අචින්තනීය (නොසිතිය හැකි) සෘද්ධි මහිමයෙන් මොහොතකින්ම වර්ණවත් සුවඳ මල් ගෙනවුත් බුදුරදුන්ට යොදුනක් පමණ වූ මල් අසුනක් පැනවූහ. අග්‍ර ශ්‍රාවකයන්ට තුන් ගවුවක් වූ ආසන දෙකක් ද සෙසු භික්ෂූන් වහන්සේලාට අඩ යොදුන් ආදී මල් අසුන් ද නටක පැවිද්දන්ට උසහයක් පමණ (රියන් 140ක්) මල් අසුන් ද සැදූහ.

මෙසේ පනවන ලද ආසන ඇති කල්හි නන්ද තාපසයා බුදු රජාණන් වහන්සේ ඉදිරියෙහි ඇඳිලි බැඳගෙන සිට, ''ස්වාමීනි !, අපට බොහෝ කාලයක් හිතසුව පිණිස මේ මල් අසුන් පිළි ගන්නා සේක්වා''යි ඇයැද සිටියේය. භාග්‍යවතුන් වහන්සේ මල් අසුනෙහි වැඩහුන් සේක. මෙසේ ශාස්තෘන් වහන්සේ වැඩහුන් ආකාරය දැන භික්ෂූන් වහන්සේලා ද තම තමාට පැමිණි ආසනවල වැඩහුන් කල්හි, නන්ද තාපසයා මහත් වූ මල් කූඩයක් ගෙන තථාගතයන් වහන්සේගේ හිසට එය අල්ලාගෙන සිටියේය. ශාස්තෘන් වහන්සේ, ''තාපසතුමන්ගේ මේ මහත් වූ සත්කාරය මහත් ඵල වේවා''යි නිරෝධ සමාපත්තියට සමවැදුණු සේක. ශාස්තෘන් වහන්සේ සමවතට සමවැදුණු බව දැන භික්ෂූන් වහන්සේලා ද සමවතට සමවැදුනහ. තථාගතයන් වහන්සේ සත් දිනක් නිරෝධ සමාපත්තියට සමවැද හුන් කල්හි තුළ අතවැසි තාපසවරු පිඬු සිඟා යන කාලයේදි වන මුල් පල වැල අනුභව කර, සෙසු කාලයෙහිදී බුදුරජාණන් වහන්සේට ඇඳිලි බැඳ වැඳගෙන සිටිති. නන්ද තාපසතුමා වනාහී පිඬුසිඟා යන වේලාවෙහිත් පිටත නොයා මල් කූඩය දරමින්ම සත් දිනක් ප්‍රීති සුවයෙන් ම ගත කළේය.

ශාස්තෘන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගිට මෛත්‍රී විහරණ අංගයෙන් ද දක්ෂිණාවට සුදුසු අංගයෙන් ද යන අංග දෙකින් සමන්විත වූ එක් ශ්‍රාවකයකුට ''සෘෂි සමූහයාගේ මල් අසුන් පිදීමට පුණ්‍යානුමෝදනා කරව''යි අණ කළ සේක. උන්වහන්සේ සක්විති රජකු ළඟදී ලැබූ මහාලාභයක් ඇති මහා යෝධයකු මෙන් සතුටු සිතැතිව, තම විෂයෙහි සිට, ත්‍රිපිටක බුද්ධ වචනයම සිහිකර අනුමෝදනාව කළ සේක. උන්වහන්සේගේ දෙසුම අවසන්හි තථාගතයන් වහන්සේ ද ධර්ම දේශනාවක් කළ සේක. ධර්ම දේශනා අවසන් වූ කල්හි, හතලිස් හතර දාහක් තාපසයෝ සියළු දෙනම රහත් බවට පත් වූහ. ශාස්තෘන් වහන්සේ ''මහණෙනි, මෙහි එව''යි අත දික් කළ සේක. එකෙණෙහිම ඔවුන්ගේ කෙස් රවුල් අතුරුදන් විය. අටපිරිකර කයෙහි හැඳ පොරවාගෙනම පහළ විය. සැට වස් පිරි මහතෙරුන් වහන්සේලා මෙන් ශාස්තෘන් වහන්සේ පිරිවරා ගත්හ. නන්ද තාපසතුමා වනාහී අවුල් වූ සිත් ඇති බැවින් සෝවාන් ආදී ගුණ විශේෂයකට නොපැමිණියේය.

ඔහුට මෙත් විහරණ ඇති තෙරුන්ගෙන් බණ ඇසීමට පටන් ගත් මොහොතෙහි සිටම ''අනේ, ඒකාන්තයෙන් මා හටද අනාගතයේ උපදින බුදුවරයකුගේ සසුනේදී මේ ශ්‍රාවකයන් වහන්සේ විසින් ලැබූ තනතුර ලැබෙන්නේ නම් යෙහෙකි''යි යන සිත පහළ විය. ඔහු එම කල්පනාව

නිසා (විතර්කය නිසා) මගඵල සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් විය. ඉක්බිති තථාගතයන් වහන්සේට වැඳ ඉදිරියෙහි සිටි තාපසතුමා ''ස්වාමීනි, යම් භික්ෂුවක විසින් සෘෂි සමූහයාට මල් ආසන අනුමෝදනා දේශනාව පැවැත් වූ සේක් ද උන්වහන්සේ ඔබ වහන්සේගේ ශාසනයෙහි කවර නම් ඇත්තෙකුවේද ?'' යි ඇසීය. ''ඒ භික්ෂුව අරණ විහාරී අංගයෙන් ද දක්ෂිණෙය්‍ය අංගයෙන් ද අග්‍රභාවයට පත් වූවෙකි''යි බුදුහු දෙසූහ. ''ස්වාමීනි, මා විසින් සත් දිනක් මල් කුඩයක් දරමින් ඔබ වහන්සේට සත්කාර කරන ලද්දෙමි. ඒ පුණ්‍ය මහිමයෙන් වෙනත් සැපතක් නොපතන්නෙමි. අනාගතයේ පහළ වන එක් බුදුරජාණන් වහන්සේ නමකගේ සසුනෙහි දී මේ තෙරුන් මෙන් අංග දෙකකින් සමන්විත අග්‍ර ශ්‍රාවකයෙක් වන්නේ නම් මැනවි''යි තාපසතුමා ප්‍රාර්ථනා කළේය.

ශාස්තෘන් වහන්සේ ද ''මේ තාපසතුමාගේ ප්‍රාර්ථනාව ඉටු වන්නේද''යි අනාගත සංඥාව උපදවා බලන සේක්, කල්ප ලක්ෂයකට පසුව එය සමෘද්ධවන බව දැක නන්ද තාපසයාට මෙසේ වදාළහ. ''මේ ඔබගේ ප්‍රාර්ථනාව හිස් වූවක් නොවන්නේය. කල්ප ලක්ෂයක් ඉක්මවා අනාගතයේදී ''ගෞතම'' නම් බුදුපියාණන් වහන්සේ ලොව පහළ වන සේක. ඔබගේ ප්‍රාර්ථනාව උන්වහන්සේ හමුයෙහි ඉටු වන්නේයැ''යි වදාරා, ධර්ම කථාවකින් ඔහු සිත් සතුටු කරවා බික් සඟන පිරිවරාගෙන අහසට පැන නැඟි සේක.

නන්ද තාපසතුමා ඇස් පෙනෙන මානය දක්වාම ශාස්තෘන් වහන්සේ සහ බික් සඟන උදෙසා ඇඳිලි බැඳ වැඳගෙන සිටියේය. ඔහු පසුව කලින් කලට බුදුපියාණන් වහන්සේ වෙත අවුත් බණ අසමින් නොපිරිහුණු ධ්‍යාන ඇතිව කල්යවා කළුරිය කොට, බඹලොව උපන්නේය. ඉන් චුතව වෙනත් ආත්ම භාව පන්සීයක ඉපිද පැවිදි වී ආරණ්‍යයෙහි වාසය කළේය. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේත් පැවිදි වී ආරණ්‍යයෙහි වාසය කරමින් ''ගත පච්චාගතවත'' පුරන ලදී. මේ ''වත'' සම්පූර්ණ නොකර, මහා ශ්‍රාවක බවට පත් වීමක් නම් නැත. ගත පච්චාගත වත පිළිබඳව ආගමටඨකතාවන්හි පැවසූ පරිදිම දත යුතුයි. ඔහු අවුරුදු විසි දාහයක් ගතපච්චාගත වත පුරා කළුරිය කොට කාමාවචර දිව්‍ය ලෝක අතරින් තාවතිංස දෙව්ලොව උපන්නේය.

මේ තොරතුරු අපදාන පාලියේ ගාථා වලින් මෙසේ දැක්වේ. අපදාන පාළියේ (I) සුභූති තෙථරාපදානයේ සිංහලාර්ථය පහත දැක්වනු ලැබේ.

''හිමවතට සමීපයේ වූ නිසභ නම් පර්වතයෙහි මා හට අසපුවක් විය. එහි මැනවින් සාදන ලද පන්සලක් විය. එකල පහි වසන මම උග්‍ර වූ තපස් ඇති ''කෝසිය'' නම් ජටිලයෙක් වූයෙමි. නිසභ පර්වතයෙහි නුදෙකලාවම වාසය කළෙමි. එදවස්හි මම ගස්වලින් නෙලාගත් ගෙඩි, මුල්, කොළ ආදිය අනුභව නොකළෙමි. ඉඹේම වැටුණු ඉදුණු කොළම අනුභව කරමින් ජීවත් වූයෙමි. දිවිගිය ද මේ යහපත් දිවිපැවැත්ම (සම්මා ආජීවය) වෙනස් නොකළෙමි. තම සිත අල්පේච්ඡ ගුණාදියෙහි පැහැද වූයෙමි. වෙදකම් ආදි නුසුදුසු ජීවිකාවන්ගෙන් දුරු වූයෙමි.'' (313-816)

''යම් කලෙක මා හට රාග සිතක් උපදී නම්, මම ම එය නුවණින් සිහිකර බලමි. එකඟ වූ සිත් ඇති මම, මා හට ම මෙසේ අවවාද කර ගනිමින් සිත දමනය කර ගනිමි. 'නුඹ ඇලුම් කරන දේවල්වල ඇලේ ද ගැටිය යුතු කරුණහේ තරහ සිතින් ගැටේද මුළාවන කරුණුවල මුළාවන්නෙහි ද එසේ නම් වනයෙන් නික්ම ගිහි බවට යව. මේ කැළයේ විසුම පිරිසිදු වූ නිර්මල තපෝ ගුණ ඇතියනට පමණක් අයත් වූවකි. නුඹ මේ පිරිසිදු වනය දූෂණය නොකර ඉන් පිටත්ව යව. ගිහි භාවයට ගිය නුඹ සෑම කල්හිම නුඹට ප්‍රිය වූ ද ලබන්නෙහිය. නුඹ ගිහි බව ද පැවිදි බවද යන දෙකම වරද්දා නොගනුව ! ඒ දෙක මිශ්‍ර කර නොගෙන වනයෙන් නික්ම යව. යම්සේ සොහොනේ දවුණු ගිණිපෙනෙල්ල කිසිදු සුභ කටයුත්තකට නොගනිද ගමෙහි හෝ කැලයේ ''දර කැබැල්ලක්'' ලෙස නොසලක්නේ ද එලෙසින් ම නුඹ ද ගිහියෙක් ද පැවිද්දෙක් ද නොවන්නෙහිය. ගිහි පැවිදි දෙකින්ම මිදුණු නුඹ සොහොන් පෙනෙල්ලක් බඳුය. අදම වනයෙන් නික්ම යව.'' (817-822)

''නුඹගේ මේ පාපී ස්වභාවය කවරෙකු නම් දන්නෙහිද ? නුඹ ශ්‍රද්ධා ධුරය දුරු කරන්නෙහි නම් එය නුඹගේ කුසීතකම වැඩි වීමට හේතු වේ. නුවර වැසියෙක් අශුචි පිළිකුල් කරන්නාක් මෙන් නුවණැත්තෝ නුඹ පිළිකුල් කරති. සෘෂිවරු නුඹ ඉවතට ඇඳ දමා සෑම කල්හි චෝදනා කරන්නාහුය. නුවණැත්තෝ නුඹ සසුනින් බැහැර වූවෙකැයි පවසති. නුවණැත්තන් හා එක්ව විසුමක් නොලබන නුඹ කෙසේ නම් තනිව ජීවත්වන්නෙහිද ?'' (823-825)

''බලවත් වූ ඇත් රජෙක් පැමිණ, ත්‍රිමදගලිත වූ මාතාංග කුලයෙහි උපන්නා වූ සැට වයස් පිරි මහ ඇතෙකු අත් රැළෙන් ඉවතට ඇද දමන්නේ ය. ඇත් රැළෙන් බැහැර එළවා දැමූ එම ඇතා සැපක් නම් නොලබයි. දුකින්

දොම්නසින් යුතුව ලතවෙමින් වෙවුලයි. එලෙසින්ම ජරාදුර නවුසෝ අඥාන වූ නුඹ පිරිසෙන් බැහැරලනී. ඔවුන් විසින් බැහැර කරන ලද නුඹ සිතින්, කයින් සුවයක් නොලබන්නෙහිය. රෑ දවල් දෙක්හිම ඇණුනු ශෝක නැමති හුල් ඇතිව ඇත් රැලෙන් බැහැර කළ ඇතෙකු මෙන් නුඹ පරිලාහයෙන් දුවෙන්නෙහිය. රන් කැබැල්ලක් කිසි තැනෙක යකුල නොදැවන්නාක් මෙන් සීලයෙන් තොර වූ නුඹ කිසිලෙසකිනුත් කෙලෙස් නොදවන්නෙහිය. නුඹ ගිහිගෙට ගොස් කෙසේ ජීවත් වන්නේද ? නුඹට මවගෙන් හෝ පියාගෙන් උරුම වූ තැන්පත් කළ ධනාදියක් නොමැත. සිරුරින් ඩාදිය වගුරුවමින් තමාට කර්මාන්ත කොට ගිහිගෙයි වසන්නෙහිය. එබඳු ගිහි වාසය නුඹට රුචි නොවේවා !'' මෙසේ මම පවට ගිය සිත කිළිටි බවින් මුදවමි. නොයෙක් ධර්ම කථා කියා සිත පවින් වළකන්නෙමි.'' (826 - 833)

''මෙලෙස නොපමාවෙන් වනයෙහි වෙසෙන මම ඒ අයුරින් අවුරුදු තිස් දාහක් ගත කළෙමි. උත්තමාර්ථය වූ නිවණ සොයන, අප්‍රමාදී බවේ ඇලුණු මා දුටු පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මාගේ සමීපයට වැඩම කළහ. තියඹරා ගෙඩියක වර්ණයට සමාන පැහැ ඇති, අප්‍රමාණ වූ ගුණ මහිම ඇති, උපමා විෂයාතිකාන්ත වූ රූපයෙන් අසම වූ බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක. මැනවින් පිපුණු මහසල් රුකක් මෙන් ද වැසි වළාකුළු අතුරෙහි වූ විදුලියක් මෙන් ද නුවනින් අසම වූ බුදුපියාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක. අතීත වූ සිංහරාජයකු මෙන් ද, එඩිතර වූ ඇත්රජෙකු මෙන් ද බැබළුණු ව්‍යාඝ්‍රරාජයකු මෙන් ද බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක. 'සිංගී' නම් රන් නිෂ්කයකට බඳු පැහැ ඇති, කිනිහිරි අඟුරු මෙන් දිලිසෙන 'ජෝතිරස' නම් මැණික බඳු වූ බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක. නිර්මල කෙලාකූටය වැනි වූ පුන්සඳ වැනි වූ මධ්‍යාහ්නයේ සූර්ය්‍ය වැනි වූ බුදුපියාණන් වහන්සේ අහසෙහි සක්මන් කළ සේක. (834-840)

අහසෙහි සක්මන් කරන උන්වහන්සේ දුටු මට එකල්හි මෙසේ සිතුණේය. ''මේ මහා සත්වයා දෙවියෙක්ද ? නැතිනම් මනුෂ්‍යයෙක් ද ? මවිසින් පොළොවෙහි වෙසෙන මෙබඳු මනුෂ්‍යයෙක් පිළිබඳව නො ඇසුවෙමි. එසේම නුදුටුවෙමි. මහා පුරිස් ලකුණු දැක්වෙන මන්ත්‍ර පදයකුත් ඇත. එනිසා මේ ශාස්තෘවරයෙක්ම ය.'' මෙසේ සිතූ මම, මාගේ සිත උන්වහන්සේ කෙරෙහි පැහැද වූයෙමි. නොයෙක් මල් ද සුවඳ ද්‍රව්‍ය ද රැස් කර, අනගි

මල් අසුනක් පණවා යහපත් සිතැති, මනෝඥ වූ පුරුෂයන් දමනය කරන්නවුන්ගෙන් අග්‍ර වූ බුදුරජාණන් වහන්සේට මෙම වදන් පැවසුවෙමි. ''වීරයන් වහන්ස! මවිසින් මේ අසුන ඔබ වහන්සේට සුදුසු කොට පනවන ලදී. මා සිත සතුට වඩමින් එම මල් අසුනෙහි හිඳිනු මැනවි.'' (841-845)

''භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ රෑ දාවල් සතක් මුළුල්ලෙහිම අභීත කේශර සිංහරාජයකු මෙන් එම මල් අසුනෙහි වැඩහුන් සේක. මම ද එම සතිය පුරාම උන්වහන්සේට නමස්කාර කරමින් සිටියෙමි. ලෝකයේ අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ සමාධියෙන් නැගිට, මාගේ කර්මය ප්‍රකාශ කරණ සේක, මෙම වදන් වදාළ සේක. ''භාවනාවන් අතුරින් ශ්‍රේෂ්ඨ වූ බුද්ධානුස්සති භාවනාව වඩවන්න. එය වැඩීමෙන් නුඹගේ අධ්‍යාශය සම්පූර්ණ වන්නෙහිය. කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දිව්‍ය ලෝකයේ සිත් අලවා ඵාසය කරන්නෙහිය. අසූ වාරයක් ශක්‍ර දේවේන්ද්‍ර සම්පත් ලබන්නෙහිය. පෘථිවියේ දහස් වරක් සක්විති රජ වන්නෙහිය. පෙදෙස් රජ සැප මෙතෙකැයි පමණ කළ නොහැක. මේ සියළු සැප සම්පත් නුඹ අනාගතයේ විඳින්නෙහිය. බුද්ධානුස්සති භාවනාවේ විපාකය මෙයයි. කුඩා මහත් වූ භවයන්හි හැසිරෙමින් මහත් වූ භෝග සම්පත් ලබන නුඹගේ භෝග සැප සම්පතෙහි කිසිදු අඩුපාඩුවක් නම් නොමැත. මේ බුද්ධානුස්සතියෙහි විපාකයයි. (846-852)

''කල්ප ලක්ෂයකින් මත්තෙහි ඔක්කාක වංශයේ උපදින 'ගෞතම' නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වෙති. නුඹ එකල්හි බොහෝ දෑසි දස් කම්කරුවන් ද අසුකෙළක් ධනය ද හැරදමා ගෞතම බුද්ධ ශාසනයෙහි පැවිදි වන්නෙහිය. ශාක්‍ය කුල ශ්‍රේෂ්ඨ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ සතුටු කොට, සුභූති නම් වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නෙහිය. උන්වහන්සේ භික්ෂු සංඝයා මැද වැඩ හිඳ එ සුභූති තෙරුන් දක්ෂිණෙය්‍ය ගුණයෙහි ද එසේම නොඇලීමෙහි (අරණ විහාරයේ) ද යන දෙකරුණින් නුඹ අග තනතුරු ලබන්නෙහිය.'' ලෝකෝත්තර වූ බුදුරජාණන් වහන්සේ මෙසේ විවරණ ලබා දුන් සේක් අහසේ යන හංස රාජයකු පරිද්දෙන් අහසට පැන නැග වැඩි සේක. මෙසේ ලෝක නාථයන් වහන්සේ විසින් ලැබූ අනුශාසනා ඇති මම උන්වහන්සේට වැඳ, හැම කල්හි තුටු වූ සිත් ඇතිව උතුම් බුද්ධානුස්සති භාවනාව වැඩුවෙමි. මනාව කරන ලද එම පුණ්‍යකර්මයෙන් හා චිත්ත ප්‍රණිධියෙහි හේතුවෙන් මිනිස් කය හැර දමූ මම තව්සිතා දෙව්ලොව ඉපදුනෙමි. අසූවරක් ශක්‍රදේවේන්ද්‍රව ද දහස් වරක් සක්විති රජ ද වූයෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ්‍ය සම්පත් ගණන් කළ නොහැක. උතුම්

සම්පත් අනුභව කළෙමි. මේ බුද්ධානුස්සති භාවනාවේ විපාකයයි. කුඩා මහත් භවයන්හි සැරි සැරූ මම, මහත් භෝග සම්පත් අනුභව ලැබුවෙමි. මේ බුද්ධානුස්සති භාවනාවේ විපාකයයි. මෙයින් කල්ප ලක්ෂයකට පෙර කරන ලද එම පුණ්‍ය ක්‍රියාව නිසා දුගතියක් නම් නොදකිමි. බුද්ධානුස්සති භාවනාවේ මේ විපාකයයි. සිවුපිළිසිඹියාවෝ ද අට වැදෑරුම් විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද ප්‍රත්‍යක්ෂ ලෙසම අවබෝධ කර ගත්තෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. (853-864)

මෙලෙස ආයුෂ්මත් සුභූති තෙරුන් වහන්සේගේ මෙම ගාථාවන් වදාළ සේක. මෙසේ සුභූති තෙරුණුවෝ පෙර තව්තිසා භවනයෙහි නැවත නැවත ඉපදීම් වශයෙන් නොයෙක් දිව්‍ය සැප විඳදා, ඉන් චුතව මනුෂ්‍ය ලෝකයේ ඉපිදී දහස් වාරයක් සක්විති රජකම ද නොයෙක් වාරයන් හි ප්‍රදේශ රාජ සම්පත්තිය ද වළඳමින් මහත් වූ මනුෂ්‍ය සම්පත් ද විඳිනු කළ සේක. පසුව අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේ සැවැත් නුවර ''සුමන'' නම් සිටුහුගේ ගෙදර අනේපිඬු සිටුතුමාගේ බාල සොහොයුරා ලෙස ඉපිද ''සුභූති'' නාමයෙන් ප්‍රකට වූහ.

මෙම කාලයේදී අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව, උතුම් දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව පටන්වා, අනුපිළිවෙලින් රජගහ නුවරට වැඩි සේක. එනුවර වේළුවනාරාමාදී පූජාවන් ලබා ලොවට අනුග්‍රහ පිණිස අප තථාගතයන් වහන්සේ රජගහ නුවර සීත වනයේ වැඩ වාසය කළහ. එසමයේ අනාථපිණ්ඩික සිටුතුමා සැවැත් නුවර නිෂ්පාදිත බඩු බාහිරාදිය රැගෙන, තම යහලුවා වූ රජගහ සිටුවරයාගේ ගෙදරට පැමිණියේ ය. එහිදී බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ බව ඇසූ සිටුතුමා සීතවනයේ වෙසෙන ශාස්තෘන් වහන්සේ වෙත වහා පැමිණ වැඳ සතුටු සාමීචියෙහි (පිළිසඳර කථාවෙහි) යෙදුණි. තථාගතයන් වහන්සේගේ පළමු හමුවේදී සෝවාන් වූ සිටුතුමා, සැවැත් නුවරට වැඩම කරන ලෙස ශාස්තෘන් වහන්සේට ආරාධනා කළේය. රජගහ නුවර සිට සැවැත් නුවර දක්වා වූ යොදුන් සතලිස් පහක් ඇති මාර්ගයේ යොදුනක්, යොදුනක් පාසා ලක්ෂය බැගින් වියදම් කරවා විහාර කරවීය. සැවැත් නුවර අට කරීසයක් (අමුණු නිස් දෙකක්) පමණ වූ ජේත කුමරුගේ උයන කෝටියක් ධන වියදමින් මිලට ගෙන, එහි භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවා පූජා කළේය. විහාරය පිළිගන්වන (පූජා කරන) දිනයෙහි මේ සුභූති සිටු පුත්‍රයාද අනේපිඬු සිටුතුමා සමඟ අවුත් ධර්මය අසා ශ්‍රද්ධාව උපදවා සසුනෙහි පැවිදි වූයේය.

පැවිදි වූ උන්වහන්සේ දෙව මාතිකාව ප්‍රගුණ කර, කමටහන් ගෙන ආරණ්‍යයෙහි මහණ දම් පුරන සේක්, මෛත්‍රී ධ්‍යානය පාදක කරගෙන විදර්ශනාව වඩා රහත් වූ සේක. උන්වහන්සේ ධර්මය දේශනා කරන සේක, ශාස්තෘන් වහන්සේ විසින් දෙසූ පරිදිම කෙනෙකු නියම නොමැතිව ධර්මය දේශනා කරන සේක. එනිසා අරණ්‍යවාසීන්ගෙන් (නොඇලී වෙසෙන්නන්ගෙන්) අග්‍ර වූහ. පිඬු පිණිස හැසිරෙන සේක්, ගෙයක් ගෙයක් පාසා මෛත්‍රී ධ්‍යානයට සමවැදෙමින් - එම සමාධියෙන් නැගිට භික්ෂාව පිළිගනිති. ''මෙසේ කිරීමෙන් දායකයන්ට මහත් ඵල වන්නේයැ''යි සිතා මෙසේ දක්ෂිණාව පිළිගන්නා බැවින් දක්ෂිණාව පිළිගන්නවුන් අතරින් අග්‍ර වූ සේක. එනිසා භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි, මගේ ශ්‍රාවකයන් වූ අරණ විහාරී භික්ෂූන්ගෙන් මේ සුභූති තෙරුන් අග්‍රවේ. දක්ෂිණාර්හ භික්ෂූන්ගෙන් සුභූති තෙරුන් අග්‍ර වේ'' යැයි වදාළ සේක.

මෙසේ මේ මහ තෙරුන් වහන්සේ රහත් බවෙහි පිහිටා තමා පුරන ලද පාරමී ධර්මයන්හි මස්තක ප්‍රාප්තියට පැමිණ, ලොව යථා ස්වභාවය මැනවින් දත් උතුමන් අතර සුවිශේෂ සළකුණක් වී බොහෝ ජනයාගේ හිත සුව පිණිස ජනපද චාරිකාවෙහි හැසිරෙමින් අනුපිළිවෙලින් රජගහ නුවර වැඩිසේක. බිම්බිසාර රජු තෙරුන්ගේ පැමිණීම අසා, සමීපයට පැමිණ වැඳ, ''ස්වාමීනි මෙහිම වසනු මැනව''යි කියා ''වාසය කරන තැනක් කරන්නෙමි'' කියා ඉවත ගියේ එය අමතක විය. තෙරුන් වහන්සේ සෙනසුනක් නොලැබ එළිමහනෙහිම කල්යැවූ සේක. තෙරුන්ගේ ආනුභාවය නිසා වැසි නොවැස්සේය. වැසි නොවසින බැවින් මහජනයා රැස්ව රජුගේ මාලිගාව ඉදිරියේ උද්ඝෝෂණයක් කළහ. රජු ''කවර කරුණකින් වැසි නොවසින්නේද ?''යි විමසනුයේ ''තෙරුන් එළිමනෙහි වසන බැවින් නොවසී යයි සිතමි'' යි කියා තෙරුන්ට කොළ සෙවිළි කළ කුටියක් කරවාදී, ''ස්වාමීනි මේ තණ කුටියෙහි වාසය කරන්න''යි පවසා, වැඳ ගියේය. තෙරුන් වහන්සේ කුටියට පිවිස තණ ඇතිරියෙහි පළඟකින් හුන් සේක. එකල්හි වැස්ස මඳින් මඳ වසී. මනාව වැස්ස නොවසියි. ඉක්බිති තෙරුන් වහන්සේ ලෝකයේ ''නොවසීය'' යන බිය දුරු කරනු කැමති සේක්, තමන් වහන්සේගේ ආධ්‍යාත්මික හා බාහිර වස්තූන්ගේ උපද්‍රව රහිත බව ප්‍රකට කරමින්

''ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා - වස්ස දෙව යථා සුඛං
චිත්තං මෙ සුසමාහිතං විමුත්තං - ආතාපි විහරාමි, වස්සදෙවා''

යන ගාථාව වදාළහ. ''මගේ කුටිය සොයන ලදී. එනිසා සුව ළඟවයි, වාත පිඩා රහිතය, මේඝය! කැමති පරිදි වසින්න. මගේ සිත මනාව සංවර වූයේය. මැනවින් කෙලෙසුන්ගෙන් මිදුනේ ය. ඇරඹූ වීර්ය ඇත්තෙමි. මේඝය! කැමති පරිදි වසිනු මැන.''

මෙහි ''ඡන්න'' ශබ්දය පළමුව ''ඒ කුමරිය සැඟවුණි, මේ කුමරු ද සැඟවුණේය. මෙය සුදුසු නොවේ.'' යන තැන්හි ඡන්න ශබ්දය යෝග්‍ය වූ අර්ථයේ යෙදී ඇත. ''එග්ගුණය ස්පර්ශායතන සයකි (ඡන්නං)'', යනාදියෙහි විචිත්‍ර වචනයෙහි සංඛ්‍යාර්ථයෙහි යෙදී ඇත. ''වැසුණේ (ඡන්නං) අතිශයින් වැසි වසී. විවෘත වූයේ නොවසී.''[a] ආදියෙහි ගහණාර්ථයේ යෙදේ.

''කෙසේ නම් මම නුඹ නිර්වස්ත්‍ර වූවෙකු (නිච්ඡන්නො) කරන්නෙමිද?'' යනාදියෙහි හැදීම් පෙරවීම් අර්ථයේ යෙදී ඇත. ''ආයුෂ්මත් ඡන්න අනාචාරයේ හැසිරේ'' යනාදියෙහි පුද්ගල නාමයක් ලෙස යෙදේ. ''සැම තැනින්ම වැසුණු (ඡන්නං), සැම තැන හාත්පසින් වැසුණු'' (පරිච්ඡන්නං) ''කුටිය සෙවන කරන ලදී. (ඡන්නා) ගිනි දල්වන ලදී'' යනාදියෙහි තණපත් ආදියෙන් වැඩීම දැක්වේ. මෙතැන ද කුටිය තණපත් ආදියෙන් සෙවිලි කිරීමේ'' අර්ථයම ප්‍රකට වන බව දත යුතුයි. එනිසා තණ වලින් හා කොළවලින් වැසුණේය. එය නොතෙමේ. වැසි දිය නොවැටේ. මැනවින් සෙවිලි කරන ලද බැවින් නොතෙමේ යන අර්ථයයි.

''මෙ'' යන ශබ්දය ''මවිසින් දුකසේ අවබෝධ කරන ලදී. දැන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය නොවේ'' යනාදියෙහි කරණාර්ථයේ යෙදී ඇත. ''ම විසින්'' යන අර්ථයයි. ''ස්වාමිනි ඒ මට භාග්‍යවතුන් වහන්සේ සංක්ෂිප්තව ධර්මය දේශනා කරන සේක්වා''[b] යන තැන්හි ''මෙ'' ශබ්දය සම්ප්‍රදාන (චතුර්ථී)යෙහි ''මට'' යන අරුතින් යෙදී ඇත. ''මහණෙනි !, පෙර සම්බුද්ධත්වයට පත් නොවූම බෝසත් වූ ම මාගේ'' (මෙ) යන තැන්හි ෂට්ඨී අර්ථයේ අයිතිය හඟවමින් යෙදී ඇත. මෙතැනදී ද ''මෙ'' යන්නෙන් සම්බන්ධනාර්ථයම දත යුතුයි. ''මගේ'' යන අර්ථයයි. කෙසේ වුවත් ලෞකික ධර්මයන්හි නොගැටෙන - නොඇලෙන හෙයින් රහතන් වහන්සේලාගේ මමායනයක්, මගේ යන හැඟීමක් නම් නැත. ලෝක සම්මතය වශයෙන් පමණක් උන්වහන්සේලා විසින් ''මමය, මගේය'' යන වදන් වහරනු ලැබෙති. දැන්

---

a. ථේරගාථා 447, මහාවග්ග ම.නි. අරියපරියෙසන සූත්‍රය

b. ස.නි. රාහුල සංයුත්ත - රාහුල සූත්‍රය

එනිසා ''මගේ ශ්‍රාවකයෝ ධර්මය දායාද කරගත්තාහු වෙති. ආමිෂය දායාද කරගත්තෝ නොවෙති''යි[c] බුහුදු වදාළහ.

''කුටිකා'' යනු මවු කුසටත් කරජකායටත් තණාදියෙන් වැසුණු කුටියටත් කියනු ලබන වදනකි. එසේමැයි. ''මව මට කුටිය කොට කියන්නෙහි. බිරිඳ කැදැල්ල කෙට කියහි. පුත්‍රයන් කුල ප්‍රවේණිය කොට කියහි. මාගේ බන්ධනය තෘෂ්ණාව යැයි කියහි.'' (සා.නි. දේවතා සං. කුටිකා සූත්‍රය) යනාදියෙහි මවු කුස කුටියකැයි කියන ලදී.

''එම්බා ඇට සැකිල්ලෙන් කළ කුටියක් ඇති, මසින් හා නහරවලින් වැසුණු, අශුචි පිරුණු දුගඳ හමන සිරුර නම් වූ නුඹට නින්දා වේවා! අනුන් අයත් සිරුරෙහි නුඹ මගේ යැයි ගන්නෙහිය.'' (ථෙරගාථා, 1155) ආදියෙහි කේශාදි දෙතිස් කුණුප සමූහයෙන් යුතු කරජකායට ''කුටිය'' යැයි කියන ලදී. ''කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ නැගණියගේ කුටිය තෙමේ'' (ම.නි. I සටිකාර සූත්‍රය) ''කුටිය නම් පිටතින් හා ඇතුළතින් හුණු පිරියම් කරන ලද්දකි.'' යනාදි තැන්හි තණ ආදියෙන් වැසූ කුටිය අදහස් වේ. මෙහිදී ද එම කුටියම අදහස් වේ. පන්සල, පර්ණශාලාව යන නම් වූ කුටියම අදහස් වේ.

''සුඛා'' යනු 'සුඛ' ශබ්දය ''කායික සුවය ද දුක ද පිටුදැක, පළමුවම චෛතසික දොම්නස් - සොම්නස් හැරපියා''[e] යන තැන්හි ''සුඛං'' යන්නෙහි සුඛ වේදනාව අදහස් විය. ''බුදුවරුන්ගේ පහළවීම සුවයකි. සදහම් දෙසුම ඇසීමට ලැබීම සුවයකි.' (ධම්ම පද - බුද්ධ වගග) යනාදියෙහි ''සුඛ'' යන සැප මූලයකි. ''මහණෙනි මේ පින යන්නට තවත් සමාන වදනකි ''සැප'' යන්න ආදියෙහි සුඛය හේතුවකි. ''යම් හෙයකින් මහාලිය ! රූපය සුවයකි. සුවයට වැටෙන්නෙකි. සැප ගෙන දෙනකි.'' (සං.නි. මහාලී සූත්‍රය) ආදියෙහි සුඛය ආරම්මණයකි. ''වුන්දය ! මේ දහම් ආර්ය විනයෙහි මෙලොව ම ඇතිවන සැප විහරණයෝ වෙති.'' යනාදියෙහි නිරෝගි බව ''සුඛ'' යන්නෙන් අදහස් වේ. ''නිවන උතුම් සුවයකි'' යන තැන්හි ''නිර්වාණය'' යන අර්ථයෙහි යෙදී ඇත. ''මහණෙනි !, සැප ඇති සර්ගයට පැමිණීමට මහා භාරතාදිය කියවීමෙන් පහසු නොවේ.'' යනාදියෙහි ''සුඛ'' යනු ප්‍රත්‍යයකි. ''දෙව්ලොවට පමුණුවන සැප විපාකය, සර්ගෝත්පත්තිය ගෙන දෙයි''

---

c. ම.නි. I. දෙධාධිතක්ක සූත්‍රය
d. ම.නි. I ධම්මදායාද සූත්‍රය
e. සු.නි. 67

ආදියෙහි ''සුඛ'' යන්න මනෝඥ වූ ප්‍රිය මනාප වූ අර්ථයෙහි යෙදී ඇත. මෙහිද ''සුඛ'' යන්නෙන් ප්‍රිය මනාප අර්ථය සහ හේතු ප්‍රත්‍ය අර්ථය ගෙන දෙයි. ඒ කුටිය ඇතුළතින් ද පිටතින් ද ප්‍රියමනාපව, වාසයට පහසු බවින් යුතුව සාදා දෙන ලද බැවින් ''සැප වේ'' (සුඛා) යැයි කියන ලදී. එසේම අධික ශීතෝෂ්ණ රහිත වූ සුවපහසු සෘතු ඇති බැවින් ද කායික හා චෛතසික සුවපහසු බවට උපකාරී වන බැවින් ද ''සැප වේ'' යැයි කියන ලදී.

''**නිවාතා**'' යනු ''අවාතා'' සුළං නොවදින ''වැසු දොරගුල් ඇති වසන ලද වා කවුලු ඇති බැවින් සුළඟින් උපද්‍රව නොමැත' යන අර්ථයයි. මෙසේ ඒ කුටියෙහි සැප ඇති බව ප්‍රකට කිරීමයි. සුළං හමනුයේ නම් සෙනසුන සෘතු සප්පාය නොවේ. සුළඟ නැති කල්හිම සෘතු සප්පාය වේ.

''**වස්ස**'' යනු වසින්න. මනාව වැසි ධාරා වස්වන්න. ''දෙව'' යනු වැස්සයි. මේ ''දේව'' ශබ්දය ''දේවයිනි ! (දෙව) කුසාවතී රාජධානිය ප්‍රමුඛව මේ ඔබ සතු නගර අසූහාර දාහකි. දේවයිනි ! මෙහි ඇල්ම උපදවන්න. දිවියෙහි අපේක්ෂාව කරන්න.'' (දීනි. II මහා සුදස්සන සූත්‍රය) යනාදියේ සම්මුති දෙවියන් වූ ක්ෂත්‍රියයන් අදහස් කරන ලදී. ''චාතුර්මහාරාජික දෙවියෝ විරූණවත්ය. සැප බහුල කර ඇත.'' යනාදියෙහි (අං.නි. 8 - දානුපපත්ති සූත්‍රය) උප්පත්ති දෙවියන් අදහස් කරන ලදී. ''ඒ දෙවියන්ට දෙව් වූ සියල්ල දක්නා වූ උත්තමයාගේ සසුනෙහි'' යන තැන විසුද්ධි දෙවියන් (රහතන් වහන්සේ) අදහස් කිරීමට ''දෙව'' ශබ්දය යෙදී ඇත. විසුද්ධි දෙවියන් වූ රහතන් වහන්සේලා අතර භාග්‍යවතුන් වහන්සේ අතිදේව භාවයෙන් ගන්නා ලද කල්හි සියලු විසුද්ධි දෙවියන් අදහස් කරන ලද්දේ වේ. ''අහස (දෙවෙ) වලාකුලින් තොරව පිරිසිදු වූ විට'' (ම.නි. II චූලසකුළුදායි සූත්‍රය) යනාදියෙහි ආකාශය අදහස් කරන ලදී. ''වැස්ස (දෙවෝ) ද කලින් කලට මනාව වැසි දහරා නොවසින්නේය.'' (අං.නි. තික බ්‍රාහ්මණ වග්ග) යන තැන්හි දේව ශබ්දයෙන් මේඝය හෝ වැහි වළාකුල අදහස් කරන ලදී. මෙහිද වැහි වලාකුල, මේඝය අදහස් කරන ලදී. තෙරුන් වහන්සේ, ''වැස්ස'' යනුවෙන් මේඝයට, වැහි වලාකුලට අණ කරති. වැසි වස්වන ලෙස පවසති. ''**යථා සුඛං**'' යනු කැමති සේ. රිසිසේ ''නුඹ වැසි වැස්වීමෙන් මට බාහිර උපද්‍රව කිසිවක් සිදු නොවේ. එනිසා කැමති සේ වසින්න. වැස්ස ඇසුරු කර ජීවත් වන සතුන්ට අනුග්‍රහ කරන්න'' යැයි තෙරුන් වහන්සේ පවසති.

අභ්‍යන්තර උපද්‍රවයන් ද නොපවතින බව දක්වමින් ''චිත්තං..'' යනාදිය පවසයි. එහි ''**චිත්තං මේ සුසමාහිතං**'' යනු මගේ සිත යහපත්ව, අතිශයින් ප්‍රශස්ත ලෙස, මැනවින් එකඟ කර එක් අරමුණක තබන ලදී. එම සිත නීවරණාදියෙන් මැඩලිය නොහැක. තවද පංච ඕරම්භාගිය හා උද්ධම්භාගිය වූ දස සංයෝජනයන්ගෙන් ද සියලු කෙලෙසුන්ගෙන් ද සිත විශේෂයෙන් මිදුනේය. ''එම සියලු කෙලෙස් ධර්මයෝ සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් ද සංසිදීම් (පටිප්පස්සද්ධි) වශයෙන් ද දුරු කර සිටියෙමි'' යන අර්ථයයි. ''**ආතාපී**'' යනු වීර්යයි. ඵල සමාපත්තිය ද විදර්ශනාව ඇරඹීම් වශයෙන් දිවිය්‍යධම්ම සුඛ විහරණය ද (මෙලොවදීම ලබන සැප) ලැබීම සඳහා ඇරඹූ වීර්ය ඇතිව වෙසෙමි. දිව්‍යමය විහරණයන්ගෙන් ආත්ම භාවය පවත්වමි. කෙලෙස් ප්‍රහාණය සඳහාම නොව, ප්‍රහාණය කළ යුතු සියලු දෙයෙහිම නොපවත්නා බව දක්වීමට මෙම වදන යොදන ලදී. බාහිර උවදුරු නොමැති බැවින් යම්සේ වැස්ස! නුඹ විසින් වැසි වැස්වීමෙහි යොදන ලද්දේ ද එලෙසින්ම මාගේ අභ්‍යන්තර උපද්‍රව ද නොමැත යනුවෙන් සිය ප්‍රීතිය දක්වමින් නැවත ද ''**වස්ස දෙව**'' යනුවෙන් පවසයි.

තවත් අර්ථ දක්වන ක්‍රමයක් මෙසේය. ''ජනතා'' යනු වසන ලද, සෙවිලි කරන ලද ''**කුටිකා**'' යනු ආත්ම භාවයයි. මහණෙනි ! නොයෙක් වර්ෂ සමූහයක් පුරා පැවති තණ්හාව ප්‍රමුඛ වූ අවිද්‍යා නීවරණාදියේ ප්‍රතිඵල ලෙස මේ කය ද බාහිර නාම රූප ද හටගත්තේය.'' යනාදියෙහි ''කය'' යැයි දක්වයි. ''මහණ, මේ ආත්ම භාවය නම් නැව, එහි ඇති මිථ්‍යා විතර්ක නම් දිය බැහැර කරව'' (ධම්මපද - හිඤ්ඣ වගග) යනාදියෙහි ''නැව'', ලෙස දැක්වේ. ''ගෙය සදන වඩුව! නුඹ දක්නා ලද්දෙහි, කැණිමඬල සුණුවිසුණු කළෙමි'' (ධම්ම පද ජරා වගග) යනාදියේ ''ගෙය''කැයි දැක්වේ. ''මිනිසෙක් ගුහාව නම් වූ ශරීරයේ රාගාදී වශයෙන් ඇලුනේ, මෝහය නම් වූ පස්කම් සේවනයෙහි දැඩිව ගිලුනේවේද...'' (සු.නි. ගුහට්ඨක සූත්‍රය) යන තැන්හි ආත්මභාවය ''ගුහාව''කැයි දැක්වේ. ''නිදොස් වූ සුදුවැස්මක් ඇති එක් දිවියක් ඇති රියක් (රථයක්) ඇත.'' (සං.නි. IV කාමභූ සූත්‍රය) ආදියෙහි ආත්මභාවය ''රථය''කැයි දැක්වේ. ''නැවත ගෙය නොසාදන්නෙහි'' (ධම්මපද - රජා වගග) යන තැන්හි ''ගෙය''කැයි දක්වේ. ''කුටිය විවෘතය. ගිනි නිවන ලදී'' (සු.නි. ධනිය සූත්‍රය) ආදියේ ''කුටිය'' කැයි කියන ලදී. එනිසා මෙතැනදී ද ඒ ආත්මභාවය 'කුටිය'කැයි දක්විණි. ආත්මභාවය දර ආදිය නිසා ලැබෙන ගෙයක්, කුටියක් මෙනි. ''ඇට'' ආදී නම් ඇති පඨවි ධාතු ආදී සිවු මහා භූත ද ස්පර්ශාදිය ද නිසා ලැබෙන කුටියකැයි කියන ලදී. එහි සිත නම් වඳුරා ද වෙසේ. එනිසා කියන ලදී.

''මේ ඇට සැකිළි කුටියෙහි - වඳුරෙක් වසයි සුවසේ
වඳුරා පස් දොරින් - මේ කුටිය හසුරුවයි
ද්වාර වලින් ගැටෙමින් නැවත නැවතත් සසර පුරා හැසිරේ.''

අට්ඨී කංකළ කුටී චෙසා මක්කටා වසරෝ ඉති
මක්කටෝ පඤ්ච ද්වාරාය කුටිකාය පසක්කිය
ද්වාරෙන අනුපරියාති සට්ඨයනෙහා පුනපපුනං''

ඒ මේ ආත්ම භාවය නම් තෙරුන්ගේ කුටිය තුනක් වූ සයක් වූ සහ අටක් වූ අසංවර ද්වාරයන්ගේ වශයෙන්, ඒවා සිදු කරන රාගාදිය නොමැති වූයේ, ප්‍රඥාවෙන් එම ඉන්ද්‍රියයන් සංවර කරන ලද බැවින්, මනාව වසන ලද බැවින් ''වසන ලදී'' (ඡන්නා) යැයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''සෝතයන්ගේ (කන්හි) සංවරය පවසමි. ප්‍රඥාවෙන්ම එය සංවර කරනු ලැබේ.'' (සු.නි. අජිත පුච්ඡා) මෙසේ වදාළ අයුරින් වසන ලද්දේමය. කෙලෙස් දුක් නැති බැවින් ද, නිරාමිස සුවය ඇති බැවින් ද සැපෙන් සැපයට පැමිණියේ ය. එසේම සුළඟ නැති සේ (නිවාතා) නිහතමානී වූයේ මානය, දැඩි බව, එකටෙක කිරීම් ආදියෙන් තොරව උඩඟු නොවූ පැවතුම් ඇත්තේය.

මෙයද තවත් ක්‍රමයකි. - මට කෙලෙස් ධර්මයන්ගේ සංවරණයෙන් පමණක් මේ සුවය නොලැබුණේය. අග්‍ර මාර්ගය වූ සමාධියෙන් ද මනාව සමාධිගත වූ සිතින් ද අග්‍ර මාර්ග ප්‍රඥාවෙන් ද සියලු සංයෝජනයන්ගෙන් මිදුණු සිත් ඇති බැවින් ද එම සුවය ලැබුනේ යැයි දක්වනු සඳහා සුභූති තෙරණුවෝ ''මගේ සිත මනාව සංවර කරන ලදී. කෙලෙසුන්ගෙන් මිදුනේය'' යි පවසති. මෙසේ වුවත් ''දැන් මම කටයුතු නිමවන ලදැ''යි අල්පෝත්සාහී නොවන්නෙමි. දෙවියන් සහිත ලෝකයාට හිත - සුව එළවනු සඳහා උත්සාහ වඩමින් වීර්යවන්තව වෙසෙමි. පිඬු සිඟායන කල්හි ද ගෙයක් ගෙයක් පාසා මෛත්‍රී බ්‍රහ්ම විහරණයෙන්ම කල්යවමි. ''එනිසා මේඝය ! නුඹ ද මට ප්‍රිය වූවක් කරනු කැමති බැවින් ද වැස්ස නිසා ජීවත්වන සත්ත්වයන්ට අනුකම්පා පිණිස ද මනාවූ වැසි ධාරා පවත්වන්න.'' යනුවෙන් මෙහි අර්ථ දත යුතුයි. මෙහිදී ද තෙරුන් වහන්සේ ''මාගේ කුටිය මැනවින් සෙවුනේය. සුව ගෙන දේ. සුළඟ නොහමයි'' (ඡන්නා මේ කුටිකා සුඛා නිවාතා) යන මෙයින් ලෞකික හා ලෝකෝත්තර භේද ඇති තමන් වහන්සේගේ අධිශීල ශික්ෂාව දක්වන සේක. ''මගේ සිත මනාව සංවර කරන ලදී'' (චිත්තං මෙ සුසමාහිතං) යන මෙයින් අධිචිත්ත ශික්ෂාව දක්වති.

''කෙලෙසුන්ගෙන් මිදුනෙමි'' (විමුත්තං) යන මේ වචනයෙන් අධිප්‍රඥා ශික්ෂාව දක්වති. ''වීර්යවන්තව වෙසෙමි.'' (ආතාපී විහරාමි) යන මේ වදන් වලින් දිවිය ධම්ම සුඛ විහරණය දක්වයි.

නැතහොත් ''ජන්තා මෙ කුටිකා සුඛා නිවාතා'' යන මේ වදන් වලින් අනිමිත්ත විහරණය දක්වයි. උන්වහන්සේගේ කෙලෙස් වසා දැමීම් වශයෙන් හා නිත්‍යාදී නිමිති පිළිගැනීමෙන් දුරු වූ බැවින් එය දැක්වීම් වශයෙන් ''චිත්තං මෙ සුසමාහිතං'' යන මේ වදන් වලින් අප්‍රණිහිත (කෙලෙසුන්හි සිත නොපිහිටන) විහරණය ද ''විමුත්තං'' යන්නෙන් ශූන්‍යතා විහරණය ද ''ආතාපී විහරාමි'' යන මෙයින් ඒ ත්‍රිවිධ විහරණයන්ගේ අවබෝධ ලැබීම ද දක්වයි. පළමු විහරණයෙන් ද්වේෂ (තරහ) ප්‍රහාණය ද දෙවන විහරණයෙන් රාග ප්‍රහාණයද තෙවන විහරණයෙන් මෝහ ප්‍රහාණය ද සිදුවේ. එසේම දෙවැන්නෙන් හෝ පළමු - දෙවන විහරණ දෙකින්ම හෝ ධර්ම විහාර සම්පත්තිය ද තෙවැනි විහරණයෙන් විමුක්ති සම්පත්තිය ද දක්වයි. ''ආතාපි විහරාමි'' යන මෙයින් අනුන්ට හිත වැඩ පතන ප්‍රතිපත්තිය ද (පිළිවෙත ද) මැලිකමක් නොමැති බවද දක්වන්නේයැයි අවබෝධ කරගත යුතුයි.

මෙසේ ''යථානාමා...'' දී වශයෙන් ගාථාවෙහි දක්වන ලද ධර්ම විහාරාදිය මේ ගාථාවෙන් දක්වන ලද බැවින්, එහි නොදක්වන ලද නාම ශ්‍රෝතාදිය අතුරින් නාමය දක්වීමට ''**ඉත්ථං සුදං**'' යනාදිය කියන ලදී. යම් තෙර නමක් නමින් ප්‍රකට ද ඔවුන්ගේ නම ද, යම් තෙර නමක් ශ්‍රෝතයෙන් ප්‍රකට වුවාහු ද ඔවුන්ගේ ශ්‍රෝත්‍රය ද, යම් තෙර නමකගේ නාම-ශ්‍රෝත දෙකම ප්‍රකට නම් ඒ දෙකම ද දක්වනු ලැබෙත්. මේ තෙරුන් වහන්සේ ශ්‍රෝත්‍රයෙන් නොව නාමයෙන්ම ප්‍රකට බැවින්, ''**ඉත්ථං සුදං ආයස්මා සුභූති**''යැයි කියන ලදී. එහි ''**ඉත්ථං**'' යනු මේ අයුරින්. මේ ආකාරයෙන් යන අර්ථයයි. ''සුදං'' මෙහි ''සු'' යන්නෙහි පැවති ඉකාරය සන්ධි වීමේදී ලොප්විය. ''සු'' යනු නිපාතයක් පමණි. ''මේ ගාථාව'' යන අර්ථය ගෙන දෙයි. ''**ආයස්මා**'' යනු ප්‍රිය වදනකි. ගෞරවණීය බව හා ප්‍රසාද ජනක ශරීර සම්පත්තියෙන් ද ගුණ සම්පත්තියෙන් ද මෙසේ සුන්දර වූ ශරීරාවයන්හි ශෝභාවෙන් ද (විභූති) සීල සම්පත්ති ශෝභාවෙන් ද **සුවිභූති** යුක්ත වූ බැවින් ''**සුභූති**'' යනුවෙන් හඳුන්වන ලදහ. අගනාසීලාදි ස්ථීර ගුණයන් යුක්ත බැවින් ''**ථෙරෝ**'' නම් වේ. ''අභාසිත්‍ථ'' යනු වදාළහ. කුමක් හෙයින් මේ මහා තෙරවරු තමන් වහන්සේලාගේ ගුණ මහිම ප්‍රකාශ කරත්ද ? මේ දිගු සංසාරයේ පෙර අවබෝධ නොකළාවූ අතිශය ගැඹුරු වූ අතිශයින්

ශාන්ත - ප්‍රණීත වූ තමන් වහන්සේලා විසින් අවබෝධ කරගත්, ලොවුතුරා දහම් සිහිපත් කර බලා, ප්‍රීති වේගයෙන් නැගුණු ප්‍රීති වාකෘයක් වශයෙන් ද සසුනේ නෛර්යාණික භාවය (නිවනට අයත් බව) දක්වීම් වශයෙන් ද අතිශය අල්පේච්ඡභාවයෙන් යුතුව ආර්යයන් වහන්සේලා තමාගේ ගුණ ප්‍රකාශ කරති. යම්සේ ලෝක නාථයන් වහන්සේ අවබෝධ කරගත් ධර්මයන් පිළිබඳ දැක්වීම් වශයෙන් ''මහණෙනි ! දස විධ බලයන් ගෙන් යුතුව තථාගතයන් වහන්සේ (චතුර් වෛශාරද්‍ය) සතර විශාරද ඥානයන්ගෙන් පිරිපුන් වෙති.'' ආදී වශයෙන් තමන් වහන්සේගේ ගුණ මහිම දේශනා කර වදාළ සේක් ද එසේම තෙරුන් වහන්සේලාගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා වදාරන ලදුයි දත යුතුයි.

සුභූති ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.2

''**උපසනෙනා**'' ආදී ගාථාව ආයුෂ්මත් මහා කොටිඨිත තෙරුන් වහන්සේගේ ගාථාවකි. එහි උපත කෙසේද ? මේ තෙරුන් වහන්සේ ද පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නම් නුවර මහත් වූ භෝග සම්පත් ඇති කුලයක ඉපිද, වැඩිවිය පැමිණ මවුපිය දෙදෙනාගේ ඇවෑමෙන් විවාහ වී ගෘහ වාසයෙහි වසයි. හේ එක් දිනක් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා පවත්වන කාලයේ හංසවතී නුවර වැසියන් සුවඳ මල් ආදිය ගත් අත් ඇතිව බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් වෙත එළඹෙනු දැක, ඔවුන් සමඟ විහාරයට ගියේය. ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් සිවුපිළිසිඹියා පත් රහතන් වහන්සේලා අතරින් අග්‍රභාවයෙහි තබනු දැක ඔහුට ''මේ භික්ෂුව මේ බුදු සසුනෙහි පිළිසිඹියාපත් තෙරවරු අතරින් අග්‍ර විය. මමත් අනාගතයේ පහළවන බුදුරජාණන් වහන්සේ නමකගේ සසුනෙහි පිළිසිඹියාපත් තෙරවරුන්ගෙන් අග්‍ර වන්නේ නම් මැනවැ''යි යන සිත ඇතිවිය. මෙසේ පහළ වූ සිත් ඇති ඔහු ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව නිමාවට පත් වූ කල්හි උන්වහන්සේ සමීපයට ගොස්, ''ස්වාමීනී ! හෙට මගේ දානය පිළිගනීවා''යි ආරාධනා කළේය. ශාස්තෘන් වහන්සේ ඇරයුම පිළිගත් සේක. ඔහු භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට, තම නිවසට ගොස් රාත්‍රිය මුළුල්ලෙහිම බුදුරජාණන් වහන්සේට ද භික්ෂූන් වහන්සේලා ද වැඩ හිඳින තැන් සුවඳ මල් දම්

ආදියෙන් අලංකාර කොට, ප්‍රණීත වූ කන-බොන-ආහාර පාන පිළියෙල කරවිය. ඒ රාත්‍රිය ඇවෑමෙන් සිය නිවසෙහි භික්ෂූන් වහන්සේලා ලක්ෂයක් පිරිවරාගත් භාග්‍යවතුන් වහන්සේට විවිධ වූ කැඳ බත් කැවිලි ආදියෙන් සහ නානා රසවත් සූප ව්‍යඤ්ජන, සුවඳ හැල් බතින් වළඳවා, උන්වහන්සේලාට වළඳා නිම වූ කල්හි ඔහුට මෙසේ සිතුණේය. ''මම ඉතා මහත් වූ තනතුරක් ප්‍රාර්ථනා කරමි. එක් දිනක් පමණක් දන් දී එම තනතුර පැතීම මට තරම් නොවේ. අනුපිළිවෙලින් සත් දිනක් මහ දන් පවත්වා සත්වන දින දන් වැළඳූ බුදුරජාණන් වහන්සේගේ පාමුල, වස්ත්‍ර භාණ්ඩාගාරය හැර තුන් සිවුරට ප්‍රමාණවත් උතුම් සියුම් වස්ත්‍රයක් තැබුවේය. ලක්ෂයක් භික්ෂූන්ට ද තුන් සිවුරු පිදීය. අනතුරුව තථාගතයන් වහන්සේ වෙත එළඹ ''ස්වාමීනි ! නුඹ වහන්සේ විසින් මීට සත් දිනකට පෙර අගතනතුරෙහි පිහිට වූ භික්ෂුව මෙන් මම ද අනාගතයේ පහළ වන බුදුරජාණන් වහන්සේ කෙනෙකුන්ගේ සස්නෙහි පැවිදිව සිවුපිළිසිඹියා පත් භික්ෂූන් අතුරින් අග්‍රවේවා!''යි පතමින් ශාස්තෘන් වහන්සේගේ පාමුල හොත්තේය. ශාස්තෘන් වහන්සේ ද ඔහුගේ පැතුම ඉටුවන බව දුටු සේක්, ''මෙයින් කල්ප ලක්ෂයක් ගත වූ පසු අනාගතයෙහි ගෞතම නම් බුදුරජාණන් වහන්සේ ලොව උපදින සේක. උන්වහන්සේගේ සසුනෙහි දී නුඹගේ පැතුම ඉටු වන්නේයැ''යි වදාළ සේක. මෙය අපදානයෙහි ද ගාථාවලින් ප්‍රකාශිතය. (එහි සිංහලාර්ථය මෙසේය.) (අපදාන - II - කොටිඨිත ථෙරපදාන - බු.ජ.ත්‍රි. - පිටුව 326).

''පසැස් ඇති සියලු ලෝක පිළිබඳ තත්වාකාරයෙන් දත්තා වූ පස් මරුන් දිනූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ මින් කල්ප ලක්ෂයකට පෙරදී ලොව පහළ වූ සේක. සියලු සතුනට අවවාද කරන්නා වූ දහම් දෙසා සත්ත්වයන් සසරින් එතෙර කරන්නා වූ, දේශනාවෙහි දක්ෂ වූ එම බුදුරජාණන් වහන්සේ බොහෝ ජනයා සසරින් එතෙර කරවූ සේක. සව් සතුනට අනුකම්පා කරන කාරුණික වූ සියලු සතුනට හිත වැඩ සළසන්නාවූ බුදුපියාණන් වහන්සේ, තමා වෙත පැමිණි සියලු තීර්ත්‍යකයන් පන්සිල්හි පිහිට වූ සේක. මෙලෙස එම කාලය තීර්ත්‍යකයන්ගෙන් තොර වූ නිරවුල් වූ තාදී ගුණ ඇති වශීභූත වූ රහතුන්ගෙන් පිරී විසිතුරු වූයේය.'' (5881-5884)

ඒ බුදුරජාණන් වහන්සේ පනස් අට රියනක් උස් වූ රන් ඇඟෑයක් වැනි වූ දෙතිස් මහ පුරිස් ලකුණින් හෙබි වූ සේක. එකල අවුරුදු ලක්ෂයක් පරමායුෂ වේ. එපමණ කල් වැඩ සිටියා වූ ඒ සර්වඥයන් වහන්සේ බොහෝ ජනයා සසරින් එතෙර කරවූ සේක. එසමයේ මම හංසවතී නුවර

වේද පරප්‍රාප්ත වූ බමුණෙක් වූයෙමි. බුදුරජාණන් වහන්සේ වෙත එළඹ දම් දෙසුමක් ඇසුවෙමි. එවිට ඒ වීරයන් වහන්සේ අර්ථයෙහි ද ධර්මයෙහි ද නිරුක්තියෙහි ද ප්‍රතිභානයෙහි ද දක්ෂවූ ප්‍රභේද ගත ප්‍රතිසම්භිදාඥාන ඇති ශ්‍රාවකයෙකු අග තනතුරෙහි තැබූ සේක. එය අසා සතුටට පත් වූ මම ශ්‍රාවකයන් සහිත වූ උතුම් වූ බුදුරජාණන් වහන්සේ සතියක් සියතින් වැළඳුවෙමි. මම බුද්ධි සාගර වූ සිය ශ්‍රාවකයන් සහිත වූ බුදුරජාණන් වහන්සේට සිවුරු පිණිස වස්ත්‍ර පූජා කර, පාමුල වැටී එම තනතුර පැතුවෙමි. (5885-5890)

ඉක්බිති ලෝකාග්‍ර වූ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. ''මාගේ පාමුල වැටුනා වූ පියුම් ගැබකට බඳු පැහැ ඇති මේ උතුම් බමුණා දෙස බලවු. මොහු සිවු පිළිසිඹියාවන් දත් ශ්‍රේෂ්ඨ වූ භික්ෂුවකගේ තනතුර පතයි. මොහුගේ එම ශ්‍රද්ධාවෙන් ද ත්‍යාගයෙන් ද ධර්ම ශ්‍රවණයෙන් ද යුතු වූ සිත නිසා සැම තැන සැප ඇතිව කුදු මහත් භවයන්හි සැරිසරා මතු එම ප්‍රාර්ථනාව ඉටු කර ගන්නේය. මින් කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ නමින් ''ගෞතම'' නම් වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ සසුනෙහි ධර්මය දායාද කරගත්, ධර්මයෙන් නිර්මිත වූ වැනි, ඖරස පුත්‍ර වූ ''කොටිඨිත'' නම් ශ්‍රාවකයෙක් ව නුඹ අගතනතුර ලබන්නෙහිය.'' (5891-5895)

''මෙම ප්‍රකාශය අසා තුටු වූ මම දිවි හිමියෙන් මෙත් සිත වැඩුයෙමි. සිහිය, ප්‍රඥාව සහිත ඒ උතුම් බුදුරජාණන් වහන්සේට ගෞරව දැක්වූයෙමි. ඒ මම එම කර්ම විපාකයෙහි ද ප්‍රාර්ථනාවෙහි මහිමයෙන් ද මිනිස් කය හැර දමා තව්තිසා දෙව්ලොව ඉපදුනෙමි. එහි තුන් සිය වාරයක් ශක්‍රදේවේන්ද්‍රව දෙවි රජය කරවීමි. පන්සිය වාරයක් සක්විති රජවීමි. ලැබූ ප්‍රදේශ රාජ්‍ය සම්පත්තිය ගණන් කළ නොහැක. ඒ කර්ම බලයෙන් සැම තැන්හි සුවපත් වූයෙමි. දිව්‍ය-මනුෂ්‍ය දෙගතියෙහි මිස අනික් භවයකට නොපැමිණියෙමි. මෙය මා රැස් කළ පුණ්‍ය මහිමයාගේ විපාකයයි. අවසන් භවයට පැමිණි මම සැවැත් නුවර එක් බමුණු කුලයක ඉපදුනෙමි.'' (5896-5902)

''මගේ මව චන්‍දවතී නම් වූවාය. පියා අස්සලායන නම් විය. ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් මගේ පියා රහත් බවට පමුණුවා භික්ෂු සේක් ද එකල්හි මම බුදුපියාණන් වහන්සේ කෙරෙහි පහන් වූයෙමි අනාගාරික වූ පැවිද්දට පැමිණියෙමි. මහා මුගලන් රහතන් වහන්සේ මාගේ ආචාර්යවරයා වූ සේක. සැරියුත් තෙරුන් වහන්සේ මාගේ උපාධ්‍යාය

වූ සේක. හිසකේ කපන විටම මාගේ සක්කාය දෘෂ්ඨිය සහමුලින් සිදුවුණි. කසාවත පොරවාත්ම මම රහත් බවට පත්වූයෙමි. මගේ සිහිය, අර්ථයෙහි ධර්මයෙහි නිරුක්තියෙහි හා ප්‍රාතිභානයෙහි වෙන් වෙන් වශයෙන් විනිවිද ගොස් ප්‍රභේදගත වූයේය. එනිසා ලෝකාග්‍ර වූ බුදුරජාණන් වහන්සේ සිවුපිළිසිඹියාපත් රහතන් වහන්සේලා අතුරින් මා අග්‍රස්ථානයෙහි තැබූ සේක.'' (5903-5906)

''සාරිපුත්‍ර මහ තෙරුන් වහන්සේ විසින් සිවුපිළිසිඹියාවන් පිළිබඳව විමසන ලද සියළු ප්‍රශ්න මම මනාව නිසැකව විසඳුයෙමි. එනිසා, මම ගෞතම සම්බුදු සසුනෙහි සිවුපිළිසිඹියා පත් වූ භික්ෂූන් අතර අග්‍ර වූයෙමි. මවිසින් සියළු කෙලෙස් දවනු ලද්දෙමි. සියළු භවයෝ නසන ලදහ. ඇත් රජකු මෙන් බැඳුම් සිඳ - ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන්ම යහපත් විය. මා ත්‍රිවිද්‍යාලාභී වූයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කරන ලද්දෙමි. මම සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරගත්තෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව සම්පූර්ණ කළෙමි.'' (5907-5910)

මෙසේ ඔහු ඒ ඒ භවයන්හි පුණ්‍ය සම්භර ධර්මයන් රැස් කරමින් දෙව් - මිනිස් දෙගතියෙහි සැරි සරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත් නුවර බමුණු මහසල් කුලයක ඉපදුණේය. ඔහුට ''කොටිඨිත'' යන නමින් ලදී. ඔහු වැඩිවියට පැමිණ ත්‍රිවේදය මනාව ඉගෙන බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගියේය. එක් දිනක් ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්මය අසා, ලබන ලද ශ්‍රද්ධා ඇතිව පැවිදි උපසම්පදාව ලැබුවේය. උපසපන් තැන් පටන් විදර්ශනා කර්මය වඩන්නාවූ උන්වහන්සේ සිවු පිළිසිඹියාවන් සමඟම රහත් බව ලැබූ සේක. පිළිසිඹියාවන්හි පුරුදු කළ වශී භාවය ඇති උන්වහන්සේ, ඒ පිළිබඳ මනාසේ දත් මහතෙරවරුන් වෙත පැමිණ ප්‍රශ්න විචාරද්දීත් දස බලයන් වහන්සේ වෙත පැමිණ ප්‍රශ්න විචාරද්දීත් පිළිසිඹියාවන් පිළිබඳව ම ප්‍රශ්න විමසන සේක. මේ අයුරින් කොටිඨිත තෙරණුවෝ සිවුපිළිසිඹියාවන් පිළිබඳ කරන ලද ප්‍රාර්ථනා ඇති බැවින් ද නිතර පුරුදු පුහුණු කර - වශී භාවයට පැමිණි බැවින් ද සිවුපිළිසිඹියා පත් තෙරවරු අතර අග්‍ර භාවයට පත් වූහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ මහා වෙදල්ල සූත්‍රය අර්ථෝත්පත්ති කොට කොටිඨිත තෙරණුවන් සිවුපිළිසිඹියාපත් මහ රහතුන් අතරින් අග්‍ර ස්ථානයෙහි තැබූ සේක. ''මහණෙනි!, සිවුපිළිසිඹියාපත් මාගේ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා අතුරින්

මේ මහා කොට්ඨිත තෙරණුවෝ අග්‍ර වෙති'' යනුවෙන් උන්වහන්සේ ඊට පසු කාලයෙහි විමුක්ති සුවය විඳිනු ලබන සේක් ප්‍රීති වාක්‍යයක් වශයෙන් ''උපසනෙතා'' ආදී ගාථාව වදාළ සේක.

''උපසනෙතා උපරතෝ මනනභාණී අනුද්ධතෝ
ඛුනාති පාපකෙ ධම්මෙ දුමපතතං ව මාළුතෝ''

''ඉත්‍ථං සුදං ආයස්මා මහා කොට්ඨිතා ථෙරෝ ගාථං අභාසි'' සන්සුන් ඉඳුරන් ඇති, පවින් වැළකුණු නුවණින් පිරික්සා බලමන් මද වශයෙන් කථා කරන සුළු වූ උඩඟු නොවූ මම සුළඟෙහි ලු රුක් පතක් (ගසක කොළයක්) මෙන් පාප ධර්මයන් දුරු කරමි.''

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන් වහන්සේ වදාළ සේක. එහි ''**උපසනෙතා**'' යනු මනස (සිත) සයවැනි වූ ඉඳුරන්ගේ (ඉන්‍ද්‍රිය හයේ) සංසිඳීමෙන්, අවිඡ නැති, අරමුණුවල වැරදි අයුරින් නොයෙදීමෙන් සන්සිඳුණු ''**උපරතෝ**'' යනු සියලු පාපකරණයන්ගෙන් බැහැර වූ, වැළකුණු ''**මනනභාණී**'' යන්නෙහි 'මන්තා' යනු ප්‍රඥාවයි. ප්‍රඥාවන් විමසා බලා කියයි - කථා කරයි. මන්තභාණී සුදුසු කල්හිම කථා කරයි. ''දහම් කාරණාදිය නොවිසිඳුණු කල්හිම කථා කරයි'' යන අර්ථයයි. නැතහොත් මන්ත්‍ර කීම් වශයෙන් කථා කරයි යන අරුතින් මන්තභාණී නම් වේ. ''තමාගේ අනුශාසනා වශයෙන් නරක කීම් වලින් බැහැර වූ අංග සතරකින් සම්පූර්ණ සුභාෂිත වදන්ම කථා කරයි.'' යන අර්ථයයි. ''ජාති ආදී වශයෙන් තමා උසස් කර නොදක්වයි.'', ''උඩඟු නොවූයේ'' යන අරුතින් ''**අනුද්ධතෝ**'' නම් වේ. නැතිනම් ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගේ සංසිඳීමෙන්, ඉන් වැලකීමෙන් උපශාන්ත වූ ත්‍රිවිධ මනෝ දුශ්චරිතාදියෙන් වැලකුණු, දුරු කළ අරුතින් ''**උපරතෝ**'' නම් වේ. සතර විධ වාග් දුශ්චරිතයන් නොපවතින බැවින් ද ප්‍රමාණාත්මක වදන් ඇති බැවින් ''**මනනභාණී**'' නම් වූ ත්‍රිවිධ දුශ්චරිත නමිති ඉපදීමෙහි ද උඩඟු - නොසන්සුන් බව ද නොමැති වූ හෙයින් ''අනුද්ධතෝ''. මෙසේ ත්‍රිවිධ දුශ්චරිතයන් ප්‍රහාණය කිරීමෙන් පිරිසිදු ශීලයෙහි පිහිටියා වූ; නොසන්සුන් බව ප්‍රහාණය කිරීමෙන් සන්සිඳුණු; එයම සමාධි පදය කොට, විඳසුන් වඩා මඟ ඵළිවෙලින් පවිටු දහම් කම්පා කරයි. ලාමක වූ සියලු පාපධර්මයන් ක්ලේශ ධර්මයන් කම්පා කරයි. සමුච්ඡේද වශයෙන් (සම්පූර්ණයෙන් විනාශ කිරීම් වශයෙන්) දුරු කරයි. ඒ කෙසේද ? සුළඟින් ඉවතට ගෙන යන ගසක කොළයක් මෙනි. විශාල වෘක්ෂයක, ගසක, පත්‍රයක්, වේළුණු කොළයක් සුළඟින් හෝ වායුවෙන් හෝ සොලවයි. නටුයෙන් ගලවා දමයි. (වෙන් කරයි). බැහැරට ගෙනයයි.

එලෙසින්ම ඉහත කියන ලද පිළිවෙලින් පැවති පාපී ධර්මයන් තමාගේ සන්තානයෙන් බැහැරලයි. මෙසේ මේ තෙරුන් වහන්සේගේ රහත් භාවය දැක්වීම් වශයෙන්, රහත් බව පවසන ගාථාව වදාරන ලදැයි දත යුතුයි.

මෙහිද කාය-වාග් දුශ්චරිතයන් ප්‍රහාණ කරන වචනයෙන් ප්‍රයෝග (ක්‍රියා) ශුද්ධිය දක්වයි. මානෝ දුශ්චරිතය ප්‍රහාණ කරන වචනයෙන් චිත්ත ශුද්ධිය දැක්වේ. මෙසේ ක්‍රියාවන්හි හා සිතේ ශුද්ධිය ඇත්තාගේ "අනුද්ධටෝ" යන වචනයෙන් සිතේ විසිරුණු බව නැතිව සිත එකඟ වූ බැවින් නීවරණයන්ගේ ප්‍රහාණය දක්වයි. එම ශුද්ධීන් අතරින් කාය (ප්‍රයෝග) ශුද්ධියෙන් ශීල සම්පත්තිය ප්‍රකට කරන ලදී. චිත්ත ශුද්ධියෙන් සමථ භාවනාවට උපකාර වූ ධර්ම අල්වා ගැනීමත්, නීවරණ ප්‍රහානයෙන් සමාධි භාවනාවත් දක්වේ. "ධුනාති පාපකෙ ධම්මෙ" (පාප ධර්මයන් කම්පා කරයි. ඉවත ලයි) යන මෙයින් ප්‍රඥා භාවනාව ප්‍රකට කරන ලදී. මෙසේම අධි සීල ශික්ෂාදී ත්‍රිවිධ ශික්ෂාව ද ත්‍රිවිධ කල්‍යාණ ශාසනයන් ද තදංග ප්‍රහාණාදී ත්‍රිවිධ ප්‍රහාණයෝ ද අන්ත දෙක දුරු කිරීම හා මැදුම් පිළිවෙත වැඩීමත්, අපාය භය ආදියෙහි ඉක්මවා යන ක්‍රමය ද සුදුසු පරිදි වෙන් කොට යෙදිය යුතුයි. මේ ක්‍රමයෙන් සෙසු ගාථාවන්හි ද සුදුසු පරිදි අර්ථ වර්ණනාව දත යුතුයි. ඒ ඒ තැන පැමිණෙන මුලදී නොපැවසූ අර්ථය පමණක්ම ඉදිරියේදී වර්ණනා කර දක්වන්නෙමු. "මෙසේ මේ ගාථාව ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් වහන්සේ වදාළහ" යන මෙය ගෞරවාර්ථයේ යෙදුණු වචනයකි. "මහා මොග්ගල්ලාන" යන ලෙසම ගෞරව පූජා පිණිස "මහා කොට්ඨිත" යනුවෙන් යෙදී ඇත.

මහා කොට්ඨිත ථේරගාථා අර්ථ වර්ණනාව නිමා විය.

1.1.3

"**පඤ්ඤං ඉමං පසස**" යනු ආයුෂ්මත් කංඛාරේවත තෙරුන්ගේ ගාථාවයි. මේ ගාථාවෙහි උප්පත්තිය කෙසේද ? මෙම තෙරුන් වහන්සේ ද පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි හංසවතී නුවර බමුණු මහසල් කුලයක ඉපදුණහ. එක් දිනක් බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාව ඇසීමට ඉහත කථා පුවත්වල පැවසූ පරිදිම, මෙම බමුණා ද මහජනයා සමඟ විහාරයට ගොස්, පිරිස් කෙළවර හිඳ බණ ඇසුවේය.

ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් ධ්‍යානයන්හි ඇලුණු භික්ෂූන් අතුරින් අග තනතුරෙහි තබනු දුටු ඔහු ''මම ද අනාගතයේ මෙවැනිම තනතුරක් ලැබීම සුදුසු''යි සිතා දේශනාව අවසන්හි ශාස්තෘන් වහන්සේට හෙට දින දානය සඳහා ඇරයුම් කළේය. පෙර කී පරිදිම මහත් සත්කාර කිරීමෙන් අනතුරුව භාග්‍යවතුන් වහන්සේට වැඳ මෙසේ පවසමින්, ''ස්වාමීනි, මම මේ මහා පින්කම සිදු කිරීමෙන් අනික් කිසිඳු සම්පත්තියක් නොපතමි. මින් සත් දිනකට පෙර, නුඹ වහන්සේ විසින් අගතනතුරෙහි පිහිට වූ භික්ෂුව මෙන් මම ද අනාගත බුදුවරයන් වහන්සේ කෙනෙකු හමුවේදී ධ්‍යානලාභී භික්ෂූන් වහන්සේලා අතුරින් අග්‍ර වන්නේ නම් මැනවි'' යි ප්‍රාර්ථනා කළේය. ශාස්තෘන් වහන්සේ අනාගතය බලා, එම පැතුම ඉටුවන බව දුටු සේක්,'' අනාගතයේ මින් කල්ප ලක්ෂයක් ගිය තැන ගෞතම නම් බුදුරජාණන් වහන්සේ ලොව උපදින සේක. උන්වහන්සේගේ සසුනෙහි ධ්‍යානලාභීන් අතුරින් නුඹ අග්‍ර වන්නේයැ''යි විවරණ දී විහාරයට වැඩි සේක. ඒ බමුණා දිවිතාක් කුසල දහම් වඩා කල්ප ලක්ෂයක් දෙව් මිනිසුන් අතර සැරි සරා අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර එක් මහා සැප සම්පත් ඇති පවුලක උපන්නේය. දිනක් ඔහු පසු බත් කල බණ ඇසීමට යන මහජනයා සමඟ විහාරයට ගොස් පිරිස් කෙළවර සිට, දස බලයන් වහන්සේගේ දහම් කථාව අසා තබන ලද ශ්‍රද්ධා ඇතිව, පැවිදිව උපසපන් බව ලැබීය. කමටහන් ගෙන ධ්‍යාන පරිකර්ම කරනුයේ ධ්‍යාන ලාභීව, එම ධ්‍යානය ම පාදක කරගෙන රහත් බවට පත්වූ උන්වහන්සේ, බොහෝ සෙයින් දස බලයන් වහන්සේ විසින් සමවැදිය යුතු සමාපත්තිවලට සමවදිමින් දිවා රෑ සෑම වේලාවෙහිම ධ්‍යානයන් පුරුදු කරන ලදුව ඒ පිළිබඳ වශීකරණභාවයට (නිපුණතාවට) පැමිණියහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ, ''මහණෙනි !, මගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් ධ්‍යානලාභීන් අතරින් මේ කඬබාරේවත තෙරණුවෝම අග්‍රවෙති''යි උන්වහන්සේ ධ්‍යානලාභීන් අතුරින් අග තනතුරෙහි තැබූ සේක. මෙය අපදානයේ මේ අයුරින් විස්තර වේ. අපදාන පාළියේ පාළි ගාථාවෙන් ඇති එම විස්තරයේ සිංහලාර්ථය මෙසේය. (අපදාන කඬබාරේවත තේරාපදානය)

''මෙයින් කල්ප ලක්ෂයකට පෙර, සියලු ධර්මයන් පිළිබඳ විනිවිද දකින නුවණැස් ඇති ලෝකනායක වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේට සිංහයෙකුගේ බඳු පිරුණු හණු ඇත්තේය. අට අංගයන්ගෙන් සමන්විත බ්‍රහ්ම ස්වර ඇති උන්වහන්සේට හංස බෙර හඬ බඳු වූ හඬක් ඇත්තේය. හස්තියෙකුගේ ගමනට බඳු ගමන් විලාස ඇත්තේය. සඳහිරු දෙනෙතට වඩා බබලන පැහැ ඇති සේක.

උන්වහන්සේ මහ නුවණැති සේක. මහාවීර්යවන්ත වූ සේක. මහත් ධ්‍යාන ඇති සේක. මහත් වූ බල ඇති සේක. මහාකාරුණිකයන. අනාථයනට නාථ වන සේක. මහත් වූ මෝහාන්ධකාරය නසන සේක. සත්ත්වයන්ගේ ආසයානුශය දන්නා වූ, තුන් ලොවට අග්‍ර වූ මොනෙය්‍ය ගුණයෙන් පිරුණු ඒ සම්බුදුරජාණන් වහන්සේ කිසි කලෙක බොහෝ හික්මෙන ජනයා, හික්මවමින් දහම් දෙසූ සේක. ඒ බුදුරජ ධ්‍යාන කරන සුලු වූ ධ්‍යානයෙහි ඇලුනා වූ උපශාන්ත වූ නොකැළඹුනා වූ වීර වූ ශ්‍රාවකයෙකු පිරිස් මැදදී ධ්‍යාන ලාභීන්ට අග්‍ර යැයි වර්ණා කරමින් ජන සමූහයා සතුටු කළ සේක.'' (6056-6060)

''එකල මම හංසවතී නුවර උපන් වේද පාරගත බමුණෙක් වීමි. එම ධර්ම දේශනාව අසා සතුටු වූ මම එම අගතනතුරම පැතුවෙමි. එවිට විශිෂ්ට නායක වූ බුදුරජාණන් වහන්සේ සඟමැද වැඩ හිඳ, ''බමුණ, නුඹ සතුටුවන්නෙහිය. නුඹගේ ප්‍රාර්ථනාව ඉටු වන්නේය''යි වදාළ සේක. ''මෙයින් කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ උපදින, නමින් ''ගෞතම'' නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ කල්හි උන්වහන්සේගේ ධර්ම දායාද කරගත්, ධර්මයෙන් නිර්මිත වූවාක් වැනි ඕරස පුත්‍ර ''රේවත'' නම් වූ ශ්‍රාවකයා වනුයේ නුඹයි.'' (මෙසේ වදාරා බුදුපියාණන් වහන්සේ වැඩි සේක.) මනාව රැස් කරන ලද පුණ්‍ය සම්භාර ධර්මය ද උසස් ප්‍රාර්ථනාව ද නිසා මම මිනිස් සිරුර හැර දමා තව්තිසාවෙහි ඉපදුනෙමි. අවසන් භාවයට පැමිණි මම කෝලිය නගරයේ කුලවත් වූ සමෘද්ධ වූ සම්පූර්ණ වූ මහත් ධන ඇති ක්ෂත්‍රිය වංශයෙහි උපන්නෙමි. බුදුරජාණන් වහන්සේ කපිලවස්තු නගරයට වැඩම කර දම්දෙසූ අවස්ථාවෙහි උන්වහන්සේ කෙරෙහි පැහැදුණු මම අනාගාරික නම් වූ පැවිද්දට පැමිණියෙමි. ඒ ඒ තැන්වල කැප, අකැප දෙය පිළිබඳය පැවති මාගේ බලවත් සැකය දහම් දෙසීම මගින් බුදුරජාණන් වහන්සේ දුරු කළ සේක.'' (6061-6068)

''අනතුරුව මම තරණය කළ සංසාර සාගරය ඇතිව, සැම කල්හි ධ්‍යාන සුවයෙහිම ඇලී වාසය කළෙමි. මෙසේ වසන මා දුටු බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළ සේක. ''ධ්‍යාන කරන්නා වූ කෙලෙස් තවන වීර්යය ඇත්තා වූ බඹසරහි හැසිරෙන්නාවූ පුද්ගලයා; මෙලොව හෝ පරලොව හෝ පිළිබඳ ඇතිවන සැක සංකා සියල්ලම තමන්ගේම හෝ අනුන්ගේ නුවණින් දුරු කරන්නේමය.'' මෙයින් කල්ප ලක්ෂයකට පෙර කරන ලද මාගේ කර්මයෙහි විපාක මෙහිදී දක්විණි. දුන්නෙන් මනාව මිදීගිය හී සැරයක් මෙන් මාගේ සියලු කෙලෙස් දැවී ගියේය. ඉක්බිති ලෝකාන්තයට

ගිය, මොනෙයය ගුණ මහිමයෙන් පිරුණු, මහ නුවණැති බුදුරජාණන් වහන්සේ ධ්‍යානයේ ඇලුණු මා දැක ධ්‍යාන වඩන භික්ෂූන් අතුරින් අග්‍රස්ථානයෙහි තැබූ සේක. මවිසින් සියලු ක්ලේශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත් රජෙකු මෙන් බැඳුම් සිඳ දමා, ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙතට මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් වූයේමය. ත්‍රිවිද්‍යා අවබෝධ කළෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. නිමා කළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අටවැදෑරුම් විමෝක්ෂයෝද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරන ලද්දෙමි. බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලද්දෙමි. (6069-6075)

මෙලෙස කොට නිම වූ කටයුතු ඇති මේ මහතෙරුන් වහන්සේ; පෙර බොහෝ කාලයක් තමා තුළ වූ සැකයෙන් පීඩිත සිත, දැන් සියලුම ආකාරයෙන් දුරු කරන ලද සැක ඇත්තෙකුයි නුවණින් විමසා බලා; ''අහෝ ඒකාන්තයෙන් මාගේ ශාස්තෘන් වහන්සේගේ දේශානුභාවය පුදුම සහගතය. එම ආනුභාවය නිසාම මම දැන් දුරු වූ සැක ඇතිව අධ්‍යාත්මය සංසිඳුවාගෙන සන්සුන් සිතැත්තේ වෙමි.'' යනාදී ලෙස භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ හටගත් බුහුමන් (ගෞරව) ඇතිව, ඊට ප්‍රශංසා කරමින් ''**පඤ්ඤං ඉමං පස්ස**'' යනාදී මේ ගාථාව වදාළහ.

''පඤ්ඤං ඉමං පස්ස තථාගතානං - අගහි යථා පජ්ජලිතෝ නිසීථේ
අලෝකදා චක්ඛුදදා භවන්ති -යෙ ආගතානං විනයන්ති කංඛං''නි

''යම් කෙනෙක් තමන් වෙත පැමිණි ජනයාගේ සැක දුරලත් ද ඥානාලෝකය ලබා දෙන්නේ ද පැණැස දෙන්නේ ද මධ්‍යම රාත්‍රියේ ඇවිලෙන ගින්නක් වැනි වූ ඒ තථාගතවරුන්ගේ මේ ප්‍රඥා මහිමය බලනු මැනවි.''

මෙහි ''**පඤ්ඤා**'' යනු ප්‍රඥාවයි. ''ආකාරයෙන් දනියි'' (පකාරෙහි ජානාති ''ආකාරයෙන් දැනුම් දෙයි'' (පකාරෙහි ඤාපෙති) යන අරුතින් 'ප්‍රඥා' නම් වේ. හික්මවිය යුතු ජනයාගේ සිතුම් පැතුම් චර්යාධිමුක්ති ආදිය පිළිබඳ ආකාරය ද කුසලාදී වූ ද ස්කන්ධාදි වූ ද ධර්මයන් දෙසිය යුතු ආකාරය ද දනියි. ''යථා ස්වභාවය වශයෙන් අවබෝධ කරන්නේ ද ඒ ආකාරයෙන්ම දැනුම් දෙයි.'' යන අර්ථයයි. ශාස්තෘන් වහන්සේගේ දේශන ඤාණය මෙහිදී අදහස් කරන ලදී. එනිසා ''**ඉමං**'' යනුවෙන් කියන ලදී. එහි වනාහි තමා කෙරෙහි සිදු වූ දේශනා බලයෙන්, ප්‍රත්‍යක්ෂයෙන් න්‍යාය ගන්නාක් මෙන් පැමිණ සිටි ඒ උතුම් බුදු නුවණ ගෙන ''ඉමං'' (මේ) යැයි

කියන ලදී. යම් තැනක පටන් ශ්‍රාවකයන් විසින් ශාස්තෘන් වහන්සේගේ දේශනා ඥානය නය්‍ය වශයෙන් ගනු ලැබේද; එතැන් පටන් තමාගේ විෂයෙහි පවතින ප්‍රතිවේධ ඥානය ද නය්‍ය වශයෙන් ගන්නා ලද්දේමය. එනිසා ආයුෂ්මත් ධර්ම සෙනාපති සැරියුත් තෙරණුවෝ මෙසේ වදාළහ. ''ස්වාමීනි, මවිසින් ද දහම් පිළිවෙල දැන ගන්නා ලද්දෙමි.'' **''පස්ස''** යනු අනියම් වශයෙන් විශ්මයට පැමිණීමකි. තමාගේ සිතට ම මෙසේ ආමන්ත්‍රණය කරයි. භාග්‍යවතුන් වහන්ස් ප්‍රීතිවාක්‍ය පහළ කරමින් මෙසේ වදාළහ. ''මේ බොහෝ වූ ලෝකය දෙස බලව. (පස්ස) අවිද්‍යාවෙන් මඩනා ලද, කර්ම ක්ලේශාදියෙන් උපත්, අන්‍යයන් කෙරෙහි තණ්හාවෙන් ඇලුණා වූ මේ සත්ත්වයෝ භවයෙන් නොමිදුණෝ වෙති.'' (උදානපාලි ලොකාවලෝකන සූත්‍රය)

''තථාගතානං'' යනු එසේ පැමිණීම් ආදී අර්ථයෙන් තථාගත වූ තථාගතවරුන්ගේ ''එලෙස (තථා) ''පැමිණියේය'' (ආගතො) යන අරුතින් 'තථාගත' නම් වේ. ''එපරිදි ගියේය'' (තථා ගතො) යන අරුතින් 'තථාගත' නම් වේ. 'තථ ලක්ෂණයට පැමිණියේ' අරුතින් 'තථාගත' නම් වේ. 'තථ (සත්‍ය) වූ ධර්මයෙහි තත් වූ පරිද්දෙන්ම අවබෝධ කරන ලදී.'' යන අරුතින් ''**තථාගත**'' නම් වේ. කියන ලෙසම කරන ලද බැවින් (තථාකාරිතාය) 'තථාගත' නම් වේ. 'වෙන අයෙකු විසින් නොමැඩලිය හැකි' යන අරුතින් ද 'තථාගත' නම් වේ. මෙලෙස අට කාරණයකින් භාග්‍යවතුන් වහන්සේ ''**තථාගත**'' නම් වන සේක. සත්‍ය භාවයට (තථාය) පැමිණි බැවින් 'තථාගත' නම් වේ. සත්‍ය බවට (තථාය) ගිය බැවින් 'තථාගත' නම් වේ. තථ (සත්‍ය) ලක්ෂණයට ගිය බැවින් 'තථාගත' නම් වේ. සත්‍යයන්ට පැමිණි බැවින් 'තථාගත' නම් වේ. එබඳු ආකාර ඇතැයි 'තථාගත' නම් වේ. ''එසේ පවතී'' යන අරුතින් 'තථාගත' නම් වේ. 'තථ ධර්ම මගින් පැමිණියේය' යන අරුතින් 'තථාගත' නම් වේ. තථාගත භාවයෙන් 'තථාගත' නම් වේ. මෙලෙසින් ද අට කරුණකින් භාග්‍යවතුන් වහන්සේ ''තථාගතෝ'' නම් වේ. මේ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. සවිස්තර වශයෙන් පරමත්ථදීපනී උදානට්ඨ කථාවෙහි ද ඉතිවුත්තකට්ඨකථාවෙහි ද කියන ලද පරිදිම දත යුතුයි.

දැන් ඒ තථාගතයන් වහන්සේලාගේ ප්‍රඥාවෙහි අන්‍යයන්ට සාධාරණ නොවන බව (අසාධාරණ බව) ගුණ විශේෂය දැක්වීමට ''අගී යථා'' යනාදිය කියන ලදී. ''**යථා අගී**''යනු උපමා වචනයකි. ''**යථා**'' යනුවෙන් එය උපමාවක් බව දක්වයි. ''**පජ්ජාලිනො**'' යනු උපමාව කළ යුතු දෙය

සමඟ සම්බන්ධය දැක්වීමකි. ''**නිසීදේ**'' යනු කටයුතු කරන කාලය දැක්වීමයි. මෙහි මේ අර්ථයයි. ''යම් සේ මධ්‍යම රාත්‍රියෙහි අංග සතරකින් සමන්විත වූ අන්ධකාරය පවත්නා කල්හි, උස් තැනක දල්වන ලද ගින්න එම ප්‍රදේශයේ අඳුර දුරු කරමින් සිටියි ද මේ අයුරින් ම තථාගතවරුන්ගේ මේ දේශනා සංඛ්‍යාත වූ සියලුම හික්ම විය යුතු ජනයාගේ සැක සංකා නැමති අඳුර පලවා හරින ප්‍රඥාව බලන්න'' යනුවෙන් යම් සේ දේශනා විලාශයෙන් සත්ත්වයන්ට ''ඤාණමය වූ අලෝකයක් දෙන්නේය'' යන අරුතින් ''**ආලෝකදා**'' නම් වේ. ''ප්‍රඥාමය වූ ම ඇසක් දෙන්නේ''යැයි ''**චක්ඛුදදා**'' නම් වේ. ඒ දෙකින්ම සැක දුරු කිරීමට ම පදනම් කරගෙන, ඒ බව දක්වමින් ''**යෙ ආගතානං විනයනිඃ කඬඛං**'' යනාදිය පැවසීය. තථාගතවරු තමාගේ සමීපයට පැමිණි ළඟා වූ හික්මවිය යුත්තන්ගේ ''ඉතා ඈත අතීතයේ මම සිටියෙමිද ?'' ආදී වශයෙන් පවතින සොළොස් (16) සැකයන් ද ''බුද්ධ රත්නය සැක කරයි. ධර්ම රත්නය සැක කරයි'' ආදී වශයෙන් පවතින අට වස්තුක සැකය ද යන විචිකිච්ඡාව සැකය දුරු කරති. දේශානුභාවයෙන් එම සැක සංකා සියල්ල දුරු කරති. විද්වංශනය කරති. පසුතැවිම් නම් වූ සැකය විනය හික්මීමෙන් හික්මවන ලද්දේ වෙති.

තවත් ක්‍රමයකින් අර්ථ දැක්වීම - මධ්‍යම රාත්‍රී භාගයේ දල්වන ලද ඉතා දීප්තිමත් ගිනි ජ්වාලා මනාව දැල්වෙමින්, ඉතා ආසන්නයේ සිටියවුන්ට ආලෝක දීම පමණකින්ම අඳුර දුරලා, සම විෂම බව ප්‍රකට කරමින් ආලෝකය ලබාදෙයි. ඉතා ආසන්නයේ සිටි පුද්ගලයන්ට මනාව ප්‍රකට කරමින් ඇසින් කටයුතු කිරීමට හැකියාව ලබාදීම් වශයෙන් ''ඇස් ලබාදෙන්නේ'' නම් වෙයි. ''මේ අයුරින්ම තථාගතවරු තමන් වහන්සේලාගේ දහම් කයට දුරින් සිටි - නොකළ ප්‍රාර්ථනා ඇත්තවුන්ගේ ප්‍රඥාව දැල්වීමෙන් මෝහන්ධකාරය දුරු කොට කායික වශයෙන් සම - විෂම බව ප්‍රකට කරමින් ආලෝකය දෙන්නාහු වෙති. සම්පයේ සිටියා වූ කරන ලද ප්‍රාර්ථනා ඇත්තවුන්ට දහම් ඇස උපදවමින් ප්‍රඥා නම් ඇස් දෙන්නාහු වෙති. යම් තථාගත කෙනෙකු විසින් තමන් වහන්සේගේ වචන ඇසෙන මානයට පැමිණි, මා වැනි සැක බහුල වූවන්ගේ සැක සංකා දුරු කරත් ද ආර්ය මාර්ගය ඉපදවීමෙන් සැකය විනාශ කරත් ද ඒ තථාගතවරුන්ගේ ඤාණාතිශය, ප්‍රඥාව බලන්න'' යැයි පද යෙදීමයි. පද පිළිවෙලයි. මෙසේ මේ ගාථාව තෙරුන් වහන්සේ තමාගේ සැක දුරු කිරීම ප්‍රකාශ කිරීම් වශයෙන් රහත් බව පවසන ගාථාවක් ද වේ. මෙම තෙරුන් වහන්සේ පුහුදුන් අවස්ථාවෙහි දී කැප වූ දෙයෙහි ද කුකුස් කරන්නෙකු, පසුතැවෙන්නෙකු වී සැක බහුලව විසූ බැවින් ''කඬබා රේවත'' නමින්

ප්‍රකට වූ සේක. පසුව රහත් බවට පත් වුවත් එලෙසම ව්‍යවහාර කරන ලදී. එනිසා ''මෙසේ මේ ගාථාව ආයුෂ්මත් කඬ්ඩාරේවත තෙරණුවෝ පැවසූහ''යි කියන ලදී. මෙහි අර්ථ කියන ලද්දේමය.

කඬ්ඩාරේවත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.4

''සඛිරෙව සමාසෙථා'' යනාදී ආයුෂ්මත් පුණ්ණ තෙරුන්ගේ ගාථාවෙහි උත්පත්තිය කෙසේද ? උන්වහන්සේ ද පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙරදීම හංසවතී නුවර බමුණු මහසල් කුලයක ඉපිද, අනුක්‍රමයෙන් වැඩිවියට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ පසුව; එක් දිනක් බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා පවත්වන සමයේ පෙර කී පරිද්දෙන්ම මහ ජනයා සමඟ විහාරයට ගොස්, පිරිස් කෙළවර හිද බණ අසමින් සිටියේය. ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් ධර්ම කථික භික්ෂූන් අතුරින් අග්‍රස්ථානයෙහි තබනු දුටු එම බමුණා ''අනාගතයේ මවිසින් ද මෙසේ වූ අගතනතුරක් ලැබීම සුදුසුයැ''යි සිතා, දේශනාව අවසානයේ පිරිස නැගී සිටි කල්හි ශාස්තෘන් වහන්ස් වෙත එළඹියේය. පැමිණ ඉහත කියන ලද පරිදිම සත් දිනක් දානය සඳහා ආරාධනා කර, බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහදන් පවත්වා අනතුරුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසීය. ''ස්වාමීනි මම මේ මහා පුණ්‍ය කර්මයෙන් වෙනත් සැපතක් නොපතමි. මින් සත් දිනකට පෙර ධර්ම කථිකයන් අතුරින් අගතැන්පත් භික්ෂුව මෙන් මම ද අනාගතයේ එක් බුදු සසුනක ධර්ම කථික භික්ෂූන් අතුරින් අග්‍ර වන්නේ නම් මැනවි''යි යනුවෙනි. මෙසේ පතන ලද ඔහුගේ අනාගතය බැලූ ශාස්තෘන් වහන්සේ එම පැතුම ඉටුවන බව දුටු සේක. ''අනාගතයේදී මින් කල්ප ලක්ෂයකට පසුව ගෞතම නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සේක. නුඹ උන්වහන්සේගේ සසුනෙහි පැවිදි භාවය ලබා ධර්මකථික භික්ෂූන් අතුරින් අග තනතුර ලබන්නෙහිය'' යනුවෙන් පදුමුත්තර බුදුරජාණෝ නියත විවරණ ලබාදුන් සේක.

එම බමුණා දිවි ඇතිතාක් යහපත් කටයුතු කරමින් සිට, ඉන් චුතව කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුණ්‍ය සම්භාර ධර්මයන් රැස් කරමින් දෙව්-

මිනිස් දෙගතියෙහි හැසිර අපගේ භාග්‍යවතුන් වහන්සේ පහළ වූ කාලයෙහි, කපිලවත්තු නගරය සමීපයේ 'දෝණ වත්තු' නම් එක් බමුණු ගමක බමුණු මහසල් කුලයක අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ බෑණා වී උපන්නේය. ඔහුට නම් තබන දිනයේ ''පුණ්ණ'' යැයි නම් කළහ. ඔහු පසුව අප ශාස්තෘන් වහන්සේ සම්බුද්ධත්වයට පැමිණ පවත්වන ලද උතුම් දම්සක් දෙසුම් ඇතිව, අනුපිළිවෙලින් රජගහ නුවරට වැඩමවා එහි වාසය කරන කාලයෙහි දී අඤ්ඤා, කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ සමීපයේ පැවිදිව උපසපන් බව ලබා ගත්තේය. ප්‍රධාන වීර්යයෙහි යෙදුණු උන්වහන්සේ සියලු කටයුතු නිමවා පැවිදිබවේ කටයුතු මස්තක ප්‍රාප්ත කරගත් සේක් ''දස බලයෙන් වහන්සේගේ සමීපයට යන්නෙමි යි මාමා වූ තෙරුන් සමඟ ශාස්තෘ වහන්සේ සමීපයට නො ගොස්, කපිලවත්තු නුවර (හාස්පස) සමීපයේ නැවතී නුවණැස මෙහෙයවා කටයුතු කරන සේක් නොබෝ දිනයකින්ම විදර්ශනාව වඩා රහත්බවට පත්වූ සේක. මෙය අපදාන පාළියෙහි මෙලෙසින් ගාථාවලින් කියන ලද්දේය. එහි සිංහලාර්ථ පහත දැක්වේ. (අපදාන පාළි I පුණ්ණත්‍ථේරාපදාන)

''වේද උගන්වන, මන්ත්‍රධර වූ වේදත්‍රයෙහි පරතෙරට ගියා වූ මම, ශිෂ්‍යයන් විසින් පිරිවරාගෙන මනුෂ්‍යයන්ට උතුම් වූ බුදුරජාණන් වහන්සේ වෙතට ගියෙමි. පුදසත්කාර පිළිගැනීමට සුදුසු වූ තුන් ලොව මැනවින් දත් මහා මුනි වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඉතා සංක්ෂිප්තව මාගේ කර්මය වදාළ සේක. මම ඒ ධර්මය අසා බුදුරජාණන් වහන්සේට ඇඳිලි බැඳ, දකුණු දිගට මුහුණ ලා පැදකුණු කර ගියෙමි. සංක්ෂිප්තව ඇසූ ධර්මය විස්තර කර ප්‍රකාශ කළෙමි. එම මාගේ වචන ඇසූ සියලු ශිෂ්‍යයෝ සතුටු වූහ. ඔවුහු තම දෘෂ්ටීන් අත්හැර බුදුන් කෙරෙහි සිත පහදවා ගත්හ. මම සංක්ෂිප්තව ද විස්තර වශයෙන් ද ධර්මය දෙසුවෙමි. අභිධර්ම ක්‍රම දන්නා වූ මම දශ කථා වස්තුවෙන් විශුද්ධීන් පිළිබඳව සියල්ලන්ටම අවබෝධ කරවා ආශ්‍රව රහිතව වෙසෙමි. මම මීට කල්ප පන්සීයකට පෙර සිවු මහා දිවයින්හි ම අධිපති වූ, සත් රුවනින් හෙබියා වූ ''සුප්පකාසක'' නම් සක්විති රජවරු සිවු දෙනෙක්ව ඉපදුණෙමි. සිවිපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද මවිසින් සාක්ෂාත් කරන ලද්දෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කළෙමි.'' (438-445)

ඒ පුණ්ණ තෙරුන් සමීපයේ පැවිදි වූ කුල පුත්‍රයෝ පන්සීයක් වූහ. තෙරුන්වහන්සේ තමා ම දස කථා වස්තූන් ලබන ලද බැවින් ඔවුන්ට ද දශ විධ කථා වස්තුවෙන් අවවාද දුන්හ. ඔවුහු එම අවවාදයෙහි පිහිටා ක්‍රියා

කළාහු සියල්ලෝ ම රහත් බවට පත්වූහ. ඔවුහු තමාගේ පැවිදි කිස මස්තක ප්‍රාප්ත වූ බව දැන උපාධ්‍යායන් වහන්සේ වෙත පැමිණ ''ස්වාමීනි, අපගේ කටයුතු මස්තක ප්‍රාප්ත විය. දශවිධ කථා වස්තුව ද ලබන ලදහ. අපට දැන් දශ බලයන් වහන්සේ බැලීමට යෑමට සුදුසු කාලයයි.'' යනුවෙන් පැවසූහ. තෙරුන් වහන්සේ ඔවුන්ගේ වචන අසා සිතූ සේක. ''මගේ දශවිධ කථා වස්තු ලාභීත්වය ශාස්තෘන් වහන්ස් ද දන්නා සේක. මම දහම් දෙසන විට දශවිධ කථා වස්තුවෙන් බැහැර නොවීම ධර්මය දේශනා කරමි. ඉදින් මා බුදුන් වෙත යන්නේ නම් එකල්හි සියලු භික්ෂූහු මා පසුපස එති. මෙසේ සමූහ පිරිවරක් ගෙන මගේ දශබලයන් වහන්සේ දැකීමට යෑම නුසුදුසුය. මෙම භික්ෂූන් පළමුව ගොස් බුදුහු දකිත්වා''යි යනුවෙනි. මෙසේ සිතා එම භික්ෂූන්ට මෙසේ වදාළහ. ''ඇවැත්නි, නුඹ වහන්සේලා පළමුව ගොස් තථාගතයන් වහන්සේ බැහැදකිවු. මගේ වචනයෙන් ද උන්වහන්සේගේ ශ්‍රී පාදය වඳිවු. මම ද නුඹලා ගිය මගින්ම පසුව එන්නෙමි'' යනුවෙනි. දස බලයන් වහන්සේ උපන් රට වැසියෝ වූ ඒ සියලුම තෙරවරු, සැමදෙනම රහත්වූවාහු, දශකථා වස්තුලාභී වූවාහු තම උපාධ්‍යායන් වහන්සේගේ අවවාදය පිළිගෙන තෙරුන්ට වැඳ රජගහනුවර බලා පිටත් වූහ. එම තෙරවරු අනුපිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙමින් සැට යොදුන් මඟ ගෙවා රජගහනුවර වේළුවනාරාම මහා විහාරයට පැමිණ, දස බලයන් වහන්සේගේ පා වැඳ එකත් පසෙක සිටියහ. ''භාග්‍යවත් වූ බුදුවරයන් වහන්සේලාගේ බොහෝ කලක පටන් පුරුදු කළ සිරිතක් නම් ආගන්තුකව එන භික්ෂූන් වහන්සේලා සමඟ පිළිසඳර කථා පැවැත්වීමයි'' යන පරිදි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් සමඟ ''මහණෙනි ! නුඹලාට ඉවසිය හැකිද ? යැපිය හැකිද ?'' ආදී වශයෙන් ප්‍රිය වූ අයුරින් පිළිසඳර කථාව කළ සේක, ''මහණෙනි ! නුඹලා කොහි සිට පැමිණියාහුද ? යි විචාළ සේක. උන්වහන්සේලා ''ස්වාමීනි, ජාතිභූමියෙහි සිට''යැයි පැවසූහ. එවිට බුදුපියාණන් වහන්සේ, ''මහණෙනි! ජාති භූමියෙහි ජාති භූමක වූ සබ්‍රහ්මචාරී භික්ෂූන්ගෙන් කවරෙක් නම් තමාද අල්පේච්ඡ වූයේ භික්ෂූන්ට ද අල්පේච්ඡබවෙහි ගුණ කියන්නේ වේද ? එබඳු කවර භික්ෂූවක් නුඹලා විසින් මැනවින් ඇසුරු කරන ලද්දේ ද ?'' වීමසූ සේක. (ම.නි.I රථ විනීත සූත්‍රය) මෙසේ දශවිධ කථාවස්තු ලාභී භික්ෂුවක් පිළිබඳ වීමසූ විට, ඒ තෙරවරු, ''ස්වාමීනි! මන්නානි බැමිණිපුත්‍ර පුණ්ණ ආයුෂ්මතුන් වහන්සේ මෙවැනි හැකියාවලින් පිරිපුන් වූ සේක. අප විසින් උන්වහන්සේ මැනවින් ඇසුරු කරන ලදහ''යි දනුම් දුන්හ. මෙම කථාව අසා සිටි ආයුෂ්මත් සැරියුත් මහ තෙරණුවෝ පුණ්ණ හිමියන් දකිනු කැමති වූහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ රජගහ නුවරින් සැවැත් නුවරට වැඩියහ. පුණ්ණ

හිමියෝ ද ''තථාගතයෝ සැවැත්නුවර වසති''යි අසා දස බලයන් වහන්සේ දකිනු කැමති ව අවුත්, තථාගතයන් වසන ගඳකිළිය තුළට ම පිවිසියහ. ශාස්තෘන් වහන්සේ ද එ හිමියන්ට දහම් දෙසූ සේක. තෙරුන් වහන්සේ ධර්මය අසා, දස බලයන් වහන්සේට වැඳ, විවේකී වාසය සඳහා අඤ්ඤවනයට ගොස් එක්තරා රුක් මූලක දිවා විහරණයෙන් හුන්සේක. සැරියුත් තෙරණුවෝ ද උන්වහන්සේ පැමිණි බව අසා, මුහුණ දූක බලා ගැනීමේ රිසියෙන් (හිස්කෙළිය බලන සුලුව), අවසර ඇති වේලාවක් සලකා ඒ රුක්මුල වැඩ සිටි පුණ්ණ තෙරුන් වෙත වැඩියහ. පුණ්ණ තෙරුන් සමඟ පිළිසඳර කථා කොට නිම වූ සැරියුත් තෙරණුවෝ, ''සප්ත විශුද්ධි කර්ම'' පිළිබඳව පුණ්ණ තෙරුන්ගෙන් විමසූහ. පුණ්ණ තෙරණුවෝ ද ඇසූ ඇසූ ප්‍රශ්න විසඳා අවසන, රථ විනීත උපමාවෙන් සැරියුත් තෙරණුවන්ගේ සිත සතුටු කළහ. ඒ රහතන් වහන්සේලා දෙනම ඔවුනොවුන්ගේ යහපත් වචන මැනවන් පිළිගත්හ. සතුටුවූහ.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඉන්පසු කලෙකදී භික්ෂු සංඝයා මැද වැඩ සිටි තෙරුන් දැක ''මහණෙනි ! මාගේ ශ්‍රාවක වූ ධර්ම කථික භික්ෂූන් වහන්සේලා අතුරින් මේ පුණ්ණ මන්තානිපුත්‍ර තෙරණුවෝ ම අග්‍රවෙති''යි ධර්ම කථිකයන්ට අග තනතුරෙහි පිහිට වූ සේක. උන්වහන්සේ එක් දිනක් තමාගේ විමුක්ති සුඛය සිහිපත් කර බලා, ''ශාස්තෘන් වහන්සේ නිසා මම ද අනෙක් බොහෝ සත්ත්වයෝ ද සසර දුකින් මිදුණෝය. මේ උතුම් සත්පුරුෂ ආශ්‍රය බොහෝ දෙනාට උපකාරීමය'' යනුවෙන් හටගත් ප්‍රීති සොම්නස් ඇති සේක්, තම ප්‍රීති වේගය පළකිරීම් වශයෙන් ප්‍රීති වාක්‍යයක් ලෙස **''සඛහිරෙව සමාසෙථ''** යනාදී ගාථාව වදාළහ.

> **''සඛහිරෙව සමාසෙථ පණ්ඩිතෙ භත්‍ථ දස්සිහි**
> **අත්‍ථං මහන්තං ගම්භීරං දුද්දසං නිපුණං අණුං**
> **ධීරා සමධිගච්ඡන්ති අපමත්තා විචක්ඛණා''**

''ඉත්‍ථං සුදං ආයස්මා පුණ්ණෝ මන්තානිපුත්තෙනා ථෙරෝ ගාථං අභාසිත්‍ථා''ති. ''ප්‍රාඥවූ යථාර්ථ ධර්මයන් දක්නා වූ සත්පුරුෂයන් සමඟ ම එක් වවු. අප්‍රමාද වූ විචක්ෂණ වූ ප්‍රාඥයෝ, මහත් වූ ගැඹුරු වූ දුකසේ දත යුතු වූ නිපුණ වූ සියුම් වූ අර්ථය අවබෝධ කර ගනිති.''

මෙසේ මේ ගාථාව ආයුෂ්මත් මන්තානිපුත්‍ර පුණ්ණ තෙරුහු වදාළහ.

එහි **''සඛහිරෙව''** යනු සත්පුරුෂයන් සමඟම, සත්පුරුෂයෝ යැයි මෙහිදී බුද්ධාදී ආර්යන් වහන්සේලා ම අදහස් කරන ලදී. එම ආර්යයෝ

මුළුමනින්ම අසත්පුරුෂ ධර්ම දුරු කළාහුය. සත් ධර්මයෙහි ඉහළටම ගිය බැවින් ද අතිශයින් ප්‍රශස්ත වූ බැවින් ද විශේෂයෙන් ''ශාන්තයෝ ය'', ''සත්පුරුෂයෝ ය'' යි පවසති. **''සමාසෙථ''** යනු මනාව සේවනය කරවු, එක්ව වාසය කරවු, එම ආර්යයන් වහන්සේලා ඇසුරු කරමින්, ඔවුන්ගේ වචන අවවාද අසමින් දුටු දේ අනුව යෑමෙන් ද (දිට්ඨානුගතියෙන්) එක්ව විසීම වන්නේ ය යන අර්ථයයි. **''පණ්ඩිතෙ හපථ දසසිහි''** යනුවෙන් ඒ උතුමන්ගේ ගුණ දක්වයි. පසසයි. ''පණ්ඩා'' යනු ප්‍රඥාවයි. ''ප්‍රඥාව මොවුන්ට උපන්නේය'' යන අරුතින් **''පණ්ඩිතා''** නම් වේ. එසේම අර්ථාදී භේදය ද අර්ථ විපරීත නොකොට දක්නාවූ ශක්තිය ද ඇතැයි **''අපථ දසසිනො''** නම් වේ. ඒ පඬිවරුන්, අර්ථ දකින්නවුන් ඇසුරු කරවු. ඒ කුමක් සඳහා ද?

''ඒ ශාන්ත වූ පණ්ඩිතයෝ මැනවින් ආශ්‍රය කිරීමෙන්, ඒකාන්තයෙන්ම යහපතක් වන්නේය. මාර්ග ඤාණාදියෙන්ම යුක්තව, කෙලෙස් බැහැර කරමින් වෙසෙනුයි ''අපථං'' අර්ථවත් වූ, මහත් වූ ගුණ ඇති බැවින් ද ශාන්ත වූ බැවින්ද ''මහනතං'' මහත් වූ ගැඹුරු බැවින් ද ගැඹුරු ඥානයන්ට ගෝචර වූ බැවින් ද හීන වූ ''ඡන්දා''දී අසත් ධර්ම දැකීමටවත් නොහැකි වූ බැවින් ද ''ගමභීරං'' ගැඹුරු වූ එසේම සෙසු කටයුතු වලින් දැකිය යුතු බැවින්, දුකසේ දැකීම් ඇති බැවින් ''දුඳදසං'' වේ. තියුණු වූ නුවණැති ස්වභාවයෙන් ද දක්ෂ වූ ඤාණයටම ගෝචර වන බැවින් ද ''නිපුණං'' නිපුණ වූ නිපුණ-දක්ෂ වූ බැවින් ද සූක්ෂම ස්වභාවයෙන් ද **''අණුං''** සියුම් වූ නිර්වාණය නොවෙනස්වන හා පරමාර්ථ ස්වභාවය නිසා ඉතා සූක්ෂම වේ. ආර්යභාවය (උතුම් බවට පත්වීම) සිදු කරන බැවින් අර්ථවත් වූ (අපථං), මහත් වූ නිමිති ගන්නා බැවින් මහත් වූ (මහනතං), අප්‍රකට-ගැඹුරු ස්වභාවය ඇති බැවින් ගැඹුරු වූ (ගම්භීරං), දුක්විඳ මහන්සියෙන් ම දතයුතු බැවින් හා සැපසේ නොදැකිය හැකි බැවින් දුකසේ දතයුතු වූ (දුදදසං), ගැඹුරු බැවින් ද දුකසේ දත යුතුය. දුකසේ දතයුතු හා ගැඹුරු වූ චතුරාර්ය සත්‍යය විශේෂයෙන් ම දැකීමට දක්ෂවූ - නිපුණවූ (නිපුණං) නිරෝධ සත්‍යය සියුම්ව දැකීම වේ. (අණුං) මේ අයුරින් නුවණැත්තෝ චතුරාර්ය සත්‍යයම අවබෝධ කරගනිති. **''ධීරා''** යන ධීරයෝ නම් ධෛර්යයෙන් (ධිති) යුක්ත වූවෝය. චතුරාර්ය සත්‍යය පිළිබඳ කමටහන් භාවනාව වඩා මැනවින් එය අවබෝධ කර ගනිති, අප්‍රමාදීව සැමතැන්හිම සිහිය උපදවා අප්‍රමාදී පිළිවෙත පුරති. මොවුහු ධීරයෝ නම් වෙති. **''විචකඛණා''** යනු විදර්ශනා භාවනාවෙහි දක්ෂයෝ ය. කුසලයෝ ය. එනිසා ''සත්පුරුෂයන් ම ඇසුරු කරවු'' යනු පද පිළිවෙලයි. **''පණ්ඩිතෙහපථදසසිහි''** යනු පංචමී අර්ථයේ වචනයකි. පණ්ඩිත වූ අර්ථ දක්නාවූ ආර්ය සම්ප්‍රදායට අයත් වූවන් සමඟ එක් වූ

ධීරයෝ, මහත් බව ආදී ගුණ ඇති අර්ථය අවබෝධ කර ගැනීමට හැකිවේද, එබඳු වූ සත් පුරුෂයන් ම ඇසුරු කළ යුතු යැයි සම්බන්ධය දක්වයි. මෙසේ මේ පුණ්ණ තෙරුන්ගේ ද අවබෝධය ප්‍රකට කරන, රහත් බව පළ කරන ගාථාව ප්‍රකාශ වී යැයි දත යුතුයි.

පුණ්ණ මන්තානිපුත්ත ථේරගාථා වර්ණනාව නිමියේය.

1.1.5

''යො දුඤ්ඤයො'' යනු ආයුෂ්මත් දබ්බතෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේද ? මොහු ද පදුමුත්තර බුදුන් දවස හංසවතී නුවර එක් කුලවත් ගෙදරක ඉපිද වැඩිවිය පැමිණි සිටු පුත්‍රයෙක් විය. පෙර කී පරිදිම මහජනයා සමඟ ගොස් බණ අසන විට දිනක්, ශාස්තෘන් වහන්සේ එක් භික්ෂූවක් සෙනසුන් පනවන්නවුන් අතුරින් අග තනතුරෙහි තබනු දැක, ඒ සඳහා මහා පින්කම් කරමින් එම තනතුර ම ප්‍රාර්ථනා කළේය. ශාස්තෘන් වහන්සේ වෙතින් ඊට නියත විවරණ ලබා දිවි ඇති තාක් කුසල් දහම් සිදුකොට, ඉන් චුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, කාශ්‍යප සම්බුදුන්ගේ සසුන පිරිහී ගෙන යන කාලයෙහි පැවිදි විය. එකල්හි ඔහු සමඟ තවත් සයදෙනෙක් එකම සිතින් පැවිදි වූහ. එම සත් භික්ෂූහු සෙසු පැවිද්දන් විසින් බුදු සසුනට කරන අගෞරව දැක, ''මෙහි වාසය කරන්නේ කුමකටද? ඒකාන්තයෙන්ම මහණ දම් කොට දුක් කෙළවර කරන්නෙමු''යි කතිකා කරගෙන, හිණිමඟක් බඳවා, ඉතා උස් වූ පර්වතයක් මුදුනට නැංගහ. තමාගේ චිත්තබලයන් දන්නා වූ උන්වහන්සේලා ''හිණිමඟ බිමදමත්වා, ජීවත් වීමට ආශා ඇත්තෝ බසිත්වා පසුව පසු නොතැවී අප්‍රමාදී වන්නෝ සිටිත්වා''යි යනුවෙන් සියල්ලෝම එකම සිතක් ඇත්තෝ වූවාහු හිණිමඟ බිමට දමූහ. ''ඇවැත්නි !, අප්‍රමාදීවවූ'' යි ඔවුනොවුන්ට අවවාද දී තම තමන්ට, කැමති කැමති තැන්වල හිඳ මහණ දම් පිරීමට පටන් ගත්හ. ඔවුන්ගෙන් එක් භික්ෂුවක් භාවනාව අරඹා දින පහකින් රහත් විය. ''මාගේ කටයුතු නිමාවිය. මම මෙතැන හිඳ කුමක් කරන්නෙමිද ?''යි ඍද්ධියෙන් උතුරු කුරු දිවයිනට ගොස් පිණ්ඩපාතය කරගෙන වුත්, ''ඇවැත්නි මේ පිණ්ඩපාතය වළඳවු. පිඬුසිඟා යෑම මා හට ම වේවා, නුඹලා මහණ දම් පුරවු''යි උන්වහන්සේ සෙසු භික්ෂූන්ට පැවසූහ. එවිට අන්‍ය භික්ෂූහු, ''ඇවැත්නි, අපි හිණිමඟ පහත දමන විට මෙසේ කථා කර ගත්තෙමුද ?

''යමෙක් පළමුව ධර්මය සාක්ෂාත් කරගනියි ද ඔහු ආහාර (භික්ෂාව) ගෙනේවා! ඔහු ගෙනා දෙය සෙසු අය අනුභව කොට මහණදම් කරන්නෝය'' යනුවෙන් සාකච්ඡාවක් කරන ලද ද ?''යි රහතන් වහන්සේගෙන් ඇසූහ. එවිට උන්වහන්සේ ''ඇවැත්නි, එබඳු සම්මුතියක් නොවීය'' යි වදාළහ. එවිට එම භික්ෂූහු ''නුඹ වහන්සේ පෙර පින් බලයෙන් (හේතු සම්පත් අනුව) රහත් වූහ. අපි ද කෙසේ හෝ උත්සාහ කර දුක් කෙළවර කරන්නෙමු. නුඹ දැන් පිටත්ව යන්න''යි පැවසූහ. රහතන් වහන්සේ ඔවුන්ට ආහාර දීමට නොහැකි වූ බැවින්, පහසු තැනක හිඳ පිණ්ඩපාතය වළඳා පිටත වැඩියහ. ඉතිරි භික්ෂූන් සදෙනාගෙන් එක් භික්ෂුවක් සත්වන දිනයේදී අනාගාමී ඵලයට පත්ව, ඉන් චුත වී සුද්ධාවස බඹලොව උපන්නේය. ඉතිරි තෙරවරු ඉන් චුතවූවාහු එක් බුද්ධාන්තරයක් දෙව් මිනිසුන් අතර සැරිසරා, ඒ ඒ කුලවල උපන්හ. එම පස්දෙනාගෙන් අයෙක් ගන්ධාර රටෙහි තක්සිලා නුවර රජගෙයි උපන්නාහ. තව කෙනෙක් බාහිය රටෙහි කෙළෙඹි පුත්‍රයකුගේ පවුලෙහි උපන්හ. තව කෙනෙක් රජගහ නුවර සිටු පවුලක උපන්නේය. සිවුවැන්නා මජ්ඣන්තික රටෙහි පරිබ්‍රාජිකාවකගේ කුසෙහි උපන්නේය. පස්වැනි මේ දබ්බ තෙරණුවෝ මල්ල රට, අනුපිය නම් නුවර එක් මල්ල රජකෙනෙකුගේ ගෙදර පිළිසිඳ ගත්හ. උන්වහන්සේගේ මව, ළංවූ ප්‍රසූති ඇත්තී කළුරිය කළාය. මළ සිරුර සොහොනට ගෙන ගොස් දරුසෑයට නංවා ගිනි තැබූහ. ඇගේ උදර පටලය ගින්නෙන් ඉතා රත් වී දෙකට පැලුණි. දරුවා ඔහුගේම පුණ්‍ය බලය නිසා උඩ පැන, එක් තෘණ පඳුරක් මත වැටුණේය. සොහොන් ගිනි ලන්නෝ එය දැක එම දරුවා ගෙන සිටු මවුට (ආත්තම්මාට) දුන්හ. ඇය ඔහුට නම් තබන්නී, තණ පඳුරේ වැටී දිවිලද බැවින් ''දබ්බ'' යන නම තැබුවාය. ඒ දබ්බ කුමරුට සත් අවුරුදු කාලයේදී අපගේ ශාස්තෘන් වහන්සේ බික් සඟන පිරිවරාගෙන මල්ල රටෙහි චාරිකාවේ හැසිරෙමින් වැඩමවා අනුපිය අඹ වනයේ විසූ සේක. දබ්බ කුමරු ශාස්තෘන් වහන්සේ දුටු පමණින්ම පැහැදී පැවිදි වනු කැමතිව, ''මම දසබලයන් වහන්සේගේ සම්පයේ පැවිදි වන්නෙමි''යි ආත්තම්මාට කියා ඇයගෙන් ''දරුව, යහපත''යි අවසර ලැබුවේය. ඇය කුමරා ගෙන ශාස්තෘන් වහන්සේ ළඟට ගොස්, ''ස්වාමීනි, මේ කුමරා පැවිදි කළ මැනව''යි කීවාය. ශාස්තෘන් වහන්සේ එක්තරා භික්ෂුවකට ''මහණ, මේ දරුවා පැවිදි කරව''යි පැවරූ සේක. ඒ තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ වචනය පිළිගෙන දබ්බ කුමරු පැවිදි කරවමින් තව පංචක කමටහන ලබා දුන්නේය. පෙර හේතු සම්පත් ඇති කරන ලද ප්‍රාර්ථනා ඇති එකුමරු පළමු කෙස් වැටිය කපද්දීම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. දෙවැනි කෙස් වැටිය කපන විට සකෘදාගාමී ඵලයෙහි ද තෙවෙනි කෙසේ වැටිය කපන විට අනාගාමී ඵලයෙහි ද පිහිටි

එකුමරුට, සියලු කෙස් ගා දැමීමත්, රහත් බවට පත්වීමත් පෙර පසු නොවී එක් විටම සිදුවිය.

ශාස්තෘන් වහන්සේ මල්ල රටෙහි කැමති තැන් කල් වැස, නැවත රජගහ නුවරට වැඩමවා වේළුවනාරාමයෙහි වාසය කළ සේක. එකල්හි ආයුෂ්මත් දබ්බ මල්ලපුත්‍ර තෙරණුවෝ හුදකලාව වූ විටක තමා විසින් කළ යුතු කටයුතු නිම වූ බව දැක, සංඝයාට වතාවත් කිරීමෙහි සිය කය යොදවනු කැමතිව මෙසේ සිතූ සේක. ''මම සංඝයාට සෙනසුන් පැනවීමෙහි ද සඟ බත් නියම කිරීමෙහි ද යෙදෙන්නේ නම් මැනවි'' යි යනුවෙනි. උන්වහන්සේ ශාස්තෘන් සමීපයට ගොස් තමන්ගේ සිතුවිල්ල දැන් වූ සේක. ශාස්තෘන් වහන්සේ ඔහුට සාධුකාර දී සෙනසුන් පැනවීමෙහි ද සඟබත් නියම කිරීමෙහිද යෙදීමට පවරාදුන් සේක. ඉක්බිති ''මේ දබ්බ ඉතා ළඳරුවෙකු වුවත් මහත් වූ ස්ථානයක හිඳියි'' යනුවෙන් පැවසූ තථාගතයන් වහන්සේ, දබ්බ තෙරුන් සත් හැවිරිදි වියේදීම උපසම්පදා කළ සේක. දබ්බ තෙරණුවෝ උපසම්පදා කළ දිනයේ සිටම රජගහ නුවර වසන සියලු භික්ෂූන්ට සේනාසන පනවන සේක, සඟබත් ද නියම කරන සේක. උන්වහන්සේ සෙනසුන් පනවන බව සෑම දිසාවෙහි ම ප්‍රකට විය. දබ්බ මල්ලපුත්ත තෙරණුවෝ සමාන අදහස් ඇති භික්ෂූන්ට එක තැන අසුන් පනවති. සම්පව ද දුරින් ද සෙනසුන් පනවති. යෑමට අසමත් භික්ෂූහු ඍද්ධියෙන් රැගෙන යති. ඉක්බිති උන්වහන්සේට භික්ෂූහු කල්හිත් නොකල්හිත් ''ඇවැත්නි අපට ජීවක අඹ වනයෙහි අසුන් පනවන්න. අපට මද්දකුච්ඡි නම් වූ මිගදායෙහි අසුන් පනවන්න'' ආදී වශයෙන් සෙනසුන් නියම කරවාගෙන, උන්වහන්සේගේ ඍද්ධිය දකිමින් යති. උන්වහන්සේ ද ඍද්ධියෙන් මනෝමය කායයන් මවා එක් එක් තෙරුන්ට තමා සමාන වූ ම භික්ෂුව බැගින් දී ඇඟිල්ල දුල්වෙන එළියෙන් ඔවුනට පෙරටුව ගොස් ''මේ ඇඳකි. මේ පුටුවකි'' යි ආදී වශයෙන් පවසා සෙනසුන් පනවාදී, නැවත තමන් වහන්සේ වසන තැටම පැමිණෙති. මේ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් මේ කථා පුවත ත්‍රිපිටකයේ දැක්වේ. ශාස්තෘන් වහන්සේ මෙම කාරණයම අර්ථොත්පත්ති කර, ඊට පසු කාලයේ ආර්යයන් සමූහය මැද සිටි දබ්බමල්ල තෙරුන් සෙනසුන් පනවන භික්ෂූන් අතර අගතනතුරෙහි තැබූ සේක. ''මහණෙනි, මගේ ශ්‍රාවක වූ සෙනසුන් පනවන භික්ෂූන් අතුරින් මේ දබ්බමල්ල පුත්‍ර තෙරණුවෝ ම අග්‍රවෙති'' යි යනුවෙනි. මෙය අපදාන පාළියේ ගාථා ලලින් ද විස්තර වශයෙන් දැක්වේ. එහි සිංහලාර්ථය මෙසේය. (අපදාන පාළි II දබ්බත්‍ථේරාපදානය)

''මීට කල්ප ලක්ෂයකට පෙර පසැස් ඇත්නා වූ සියලු ලොව දත්, පස්මරුන් දිනූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. සියලු සතුනට අවවාද දෙන, ඔවුන්ට දහම් අවබෝධ කරවා සසරින් එතෙර කරවීමෙහි සමත් වූ ධර්ම දේශනාවෙහි දක්ෂ වූ බුදුරජාණන් වහන්සේ බොහෝ ජන සමූහයා සසරින් එතෙර කරවූ සේක. සියලු සතුනට අනුකම්පා කරන, කාරුණික වූ හිත කැමති වන බුදුරජාණන් වහන්සේ වෙත එළඹුණු සියලු තීර්ත්ථකයෝ, පන්සිල් සමාදන් වූහ. එසමයේ මේ පෘථිවිය තිර්ත්ථකයන්ගෙන් හිස්ව, නිරුවුල්ව නාදී ගුණ ඇති වශීභූත වූ මහරහතුන්ගෙන් පිරී පැවතුණි. විසිතුරු විය. ඒ බුදුරජාණන් වහන්සේගේ උස රියන් පනස් අටකි. රන් ඇඟයක් මෙන් එතුමෝ බැබලුණහ. දෙතිස් මහ පුරිස් ලකුණින් හෙබි සේක. එම කාලයේ සත්වයන්ගේ පරමායුෂ වර්ෂ ලක්ෂයකි. ඒ තාක් කල් වැඩහුන් බුදුපියාණන් වහන්සේ බොහෝ ජනයා සසරින් එතෙර කළසේක. (5769-5774)

''එසමයේ මම හංසවතී නුවර මහත් යශ (කීර්තිමත්) සිටු පුත්‍රයෙක් වූ යෙමි ලොව බබුළුවන බුදුරජාණන් වහන්සේ වෙත එළඹ, උන්වහන්සේගේ ධර්ම දේශනාව ඇසුවෙමි. භික්ෂූන්ට සෙනසුන් පනවන සිය ශ්‍රාවකයෙකු අග තැන්හි තබා පැසසූ උන්වහන්සේගේ වචන ඇසූ මම අතිශය සතුටු වූයෙමි. සංඝයා සහිත ඒ බුදුරජාණන් වහන්සේට දානාදී පින්කම් කර, උන්වහන්සේගේ පාමුල වැටී එම අගතනතුර පැතුවෙමි. එකල්හි මහාවීර වූ බුදුපියාණන් වහන්සේ මගේ පින්කම පසසමින්, ''යමෙක් සංඝයා සහිත බුදුරදුන්ට සතියක් වැළඳවූයේ ද සියුම් පත් බඳු ඇස් ඇති, සිංහයෙකුට බඳු පිරුණු උරහිස් ඇති, රන්වන් සිරුරක් ඇති මේ සිටුපුතා උතුම් තතුරක් පතමින් මගේ පාමුල වැටුණේය. මෙයින් කල්ප ලක්ෂයකට පසුව, ඔක්කාක වංශයේ උපදින ''ගෞතම'' නම් වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළවෙති. එකල්හි මොහු දබ්බ නමින් උන්වහන්සේගේ ශ්‍රාවකයෙක්ව සෙනසුන් පනවන්නන් අතර අගතනතුර ලබන්නේය.'' යනුවෙන් විවරණ දුන් සේක. (5775-5781)

''මැනවින් කරන ලද එම පින්කමෙන් ද චිත්ත ප්‍රණිධියෙන් ද යුතු වූ මම මිනිස් සිරුර හැර දමා තව්තිසාවට ගියෙමි. එහි තුන්සිය වරක් දෙව් රජය කරවූ මම, පන්සිය වාරයක් සක්විති රජව ඉපදුනෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ්‍ය සම්පත් අප්‍රමාණය. එම කර්මයේ බලයෙන් හැම තැන්හිම සැප වින්දෙමි.'' (5782-5784)

''මෙයින් කල්ප අනූ එකකට පසුව. මනා වූ ඇස් ඇති සියලු ධර්ම මනාව දක්නා වූ විපස්සී නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. තාදී ගුණ ඇති ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ රහතන් වහන්සේ කෙනෙකුන්ට ''ශුද්‍යකි''යි දැන දැනම දුෂ්ට සිතින් නින්දා කළෙමි. පසුව මා නරවීර වූ එම බුදුරදුන්ගේ ශ්‍රාවක රහතන් වහන්සේලාට සළාකයක් ගෙන කිරිබත් පිරිනැමුවෙමි. පසුව මේ මහා භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණ කුලයේ උපන්, මහත් කීර්තිමත් වූ වාද කරන්නවුන් අතර ශ්‍රේෂ්ඨ වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. ශ්‍රාවකයන් පිරිවරා වැඩ සිටි උන්වහන්සේ, මිසදිටු තීර්ථකයන් මැඩ පවත්වා සසුන බබුලුවමින්, හික්මවිය යුතු ජනයා හික්මවමින් සිට පිරිනිවන් පෑ සේක. බුදුපියාණන් වහන්සේ ද ශිෂ්‍යයන් ද පිරිනිවි කල්හි සසුන පිරිහී යනු දුටු දෙවියෝ ශෝකයට පත්ව මුදා ලූ කෙස් ඇතිව, හඬන මුහුණින් යුතුව හඬා වැලපුනහ.'' (5785-5791)

''දහම් ඇස නිවුණි. මනා පිළිවෙත් සහිත ශ්‍රාවකයෝ නොමැත. සදහම් නො අසමු. අහෝ ! අප කළ පින් මද බව පෙනේ.'' යනුවෙන් දෙවියෝ වැළපුනහ. එකල්හි මේ නිශ්චල පෘථිවිය චංචල වී කම්පා විය. සාගරය ද සොවින් තැවුනෙකු මෙන් දුක් හඬින් හැඬීය. සිවු දිශාවෙහි වූ දිව්‍ය බෙර නාද දුන්නේය. හාත්පස බියජනක වූ හෙණ පිපිරුණේය. අහසින් උල්කා පතිත විය. ධූම කේතූන් ද දර්ශනය විය. ගොඩ ඉපදුණු සියලු සත්ත්වයෝ ද මෘගයෝ ද බැගෑ හඬ නැගූහ. සසුන පිරිහෙන බව හඟවන දරුණු භූත විකාරයන් දැක සංවේගයට පත් වූ භික්ෂූහූ සත් නමක් වූ අපි මෙසේ සිතුවෙමු. ''සසුනින් තොර වූ අපගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද ? අපි මහ වනයට පිවිස බුදු සසුනෙහි යෙදෙන්නෙමු.'' යනුවෙන් සිතූ අපි වනයට පිවිසියෙමු. වනයේ උස් වූ පර්වතයක් දුටු අපි හිණිමගකින් ඊට නැගී, පසුව ඒ හිණිමඟ බිම දමුවෙමු. එවිට සංඝස්ථවිරයෝ, ''බුද්ධෝත්පාදය අතිශය දුර්ලභය. දුර්ලභ වූ ශ්‍රද්ධාව ලබන ලද අපට බුදු සස්න ද මඳ වශයෙන් හෝ ඉතිරිව පවතී. මේ උතුම් මොහොත ඉක්මවා ගියහොත් අනන්ත වූ දුක් සයුරෙහි ගිලීමට සිදුවේ. එනිසා බුදු සසුන පවතින මොහොතෙහි ඉන් ප්‍රයෝන ගත යුතුය''යි අපට අවවාද දුන්හ. ඒ සංඝස්ථවිරයෝ නොපමාව රහත් වූහ. ඒ අනුව ගිය දෙවැනියා අනාගාමී වූ අතර ඔවුන් හා එක්ව සිටි සිල්වත් වූ අපි දෙවිලොව ඉපදුනෙමු. අනාගාමී වූ තෙරුන් ශුද්ධාවාසයේ දීම නුදෙකලාව පිරිනිවියේ ය. මම ද පුක්කුසාති ද සභිය ද බාඛිය ද කුමාර කස්සප ද යන අපි පස් දෙන ඒ ඒ තැන ඉපදුනාහු ගෞතම බුදුරජාණන් වහන්සේගේ අනුකම්පාව ලබා සසර බැඳුමෙන් මිදුනෙමු. (5791-5802)

''මම මල්ල රට කුසිනාරා නුවර උපන්නෙමි. මා ගැබින් බිහිවන සමයෙහි මවු මළාය. ඈ චිතකයට නංවන ලද්දීය. එයින් ගිලිහී මම වැටුනෙමි. කුසතණ පඳුරක් මත වැටුණු බැවින් ''දබ්බ'' යැයි ප්‍රකට වීමි. බ්‍රහ්මචාරී විසූ හෙයින් (පෙර භවයේ) මම සත් වියේදීම රහත් වුනෙමි. මම කිරිබත් දුන් පිනෙහි විපාක වශයෙන් ආයුවර්ණාදී පංච බලයෙන් ආඪ්‍ය වුයෙමි. රහතන් වහන්සේ කෙනෙකුට නින්දා කළ පාපයේ විපාක ලෙස බොහෝ පාපීහු මට චෝදනා කළහ. දැන් මා පින් ද පාපයන් ද ඉක්ම වූයෙමි. ආශ්‍රව රහිත වූයෙමි පරම ශාන්තිය වූ නිවනට පැමිණ වසන්නෙමි. යහපත් පැවතුම් ඇති තෙරවරු සතුටු කරමින් සෙනසුන් පැනවීමි. ඒ ගුණයෙහි පැහැදුණු බුදුරජාණෝ මා සෙනසුන් පනවන භික්ෂූන් අතුරින් අග්‍රස්ථානයෙහි තැබූ සේක. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. සියලු භවයන් සිඳ දැමුවෙමි. බැඳුම් සිඳ දැමූ ඇත් රජෙකු මෙන් ආශ්‍රව රහිතව වාසය කරමි. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන්ම යහපත් විය. ත්‍රිවිද්‍යාවන්ට පත් වූයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කළෙමි. බුදුන් ගේ අනුශාසනය ඉටු කළෙමි.'' (5803-5810)

මෙසේ උන්වහන්සේ වදාළ පරිදිම, පෙර එක් රහතන් වහන්සේ නමට අවමන් කිරීම් වශයෙන් ඇති වූ පාප කර්මය නිසා බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයේ පැසුණහ. ඒ පාප කර්මයේ කිලිටි බවින් චෝදනා කරන මෙත්තිය - භූම්මජක භික්ෂූහු ''මොහු විසින් අපි කල්‍යාණ භක්තික ගැහැවියා කෙරෙහි බිඳුවන ලද්දෙමු''යි වැරදි ලෙස ගෙන අමූලික වූ සීල විපත්ති පරාජිකාවෙන් චෝදනා කළහ. එම අධිකරණය සංඝයා විසින් සති විනයෙන් සංසිඳවූ කල්හි මේ තෙරුන් වහන්සේ ලොවට අනුකම්පා පිණිස තමන් වහන්සේගේ ගුණ ප්‍රකට කරමින් ''යො දු දන්තීයො'' යන ගාථාව වදාළ සේක.

''යො දුදන්තීයො දමෙන දනෙතා දබෙබා සනතුසිතො විතිණණ කඞඛා විජිතාවී අපෙතභෙරවො හි දබෙබා සො පරිනිබබුතො යීතනෙතා'' ති

''දමනය කිරීමට දුෂ්කර වූ යමෙක් ආර්ය මාර්ගයෙන් හෝ පුරුෂ දම්‍ය සාරථීන් වහන්සේ විසින් දමනය කරන ලද සේක් ද, සුදුසු වූ සතුටින් යුක්ත වූ, දුරු කළ සැක ඇති, දිනූ කෙලෙස් ඇති, පහවූ බිය ඇති, අචල

ස්වභාවයට පැමිණි ඒ දබ්බ පැවිදි තෙම කෙලෙස් පරිනිර්වාණයෙන් පිරිනිවියේය.''

මෙහි ''යෝ'' යනු නියමක් නොමැති දැක්වීමකි. එයට ''සෝ'' යනුවෙන් නියමිත අර්ථය දක්විය යුතුයි. මේ පද දෙකින්ම අනිකකු මෙන් දක්වා, තමාට ම පවසා ගනියි. ''දුද්දමියෝ'' යනු දමනය කිරීමට අපහසු, දමනයට අසමත් වූ, මෙය ද තමාගේ පුනුදුන් කාලයෙහි මිසදිටුගත්, කලබලකාරී කය ඇති, කෙලෙස් වලින් පිරුණු සිතේ, දැඟලීමත් ඉන්ද්‍රියයන්ගේ නොසන්සිඳීමත් ගැන සිතා මෙය පවසයි. ''දමෙන'' යනු උත්තමවූ අග්‍ර මාර්ග දමනයෙන්, ඔහු විසින් ද දමනය කළ යුතු බැවින්, මොහු විසින් දමනය කරන ලදැයි කිම සුදුසුය. අනිකකු විසින් නොවේ. නැතහොත් ''දමෙන'' යනු දමනයෙන්, පුරුෂ දමනයෙහි දක්ෂ වූ තථාගතයන් විසින් දමනය කරන ලද ''දබ්බා'' යනු නුවණැති වූ, භව්‍ය වූ සුදුසු වූ (භබ්බ) යන අර්ථයයි. මේ තෙරුන් අරමුණු කරගෙන ම භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. ''දබ්බය, පණ්ඩිතයෝ (දබ්බයෝ) මෙසේ අනුන්ගේ පිහිටෙන් **ප්‍රශ්න නිරාකරණය** නොකරති.'' (චුල්ලවග්ග-2සමථක්ඛන්ධක) ''**සන්තුසිතෝ**'' යනු යම් සේ ලබන ලද ප්‍රත්‍ය සන්තෝෂයෙන් ද ධ්‍යාන සමාපත්ති **සන්තෝෂයෙන්** ද මාර්ග ඵල සන්තෝෂයෙන් ද යනු දාසය වස්තුවක් වූ ද අට වස්තුවක් වූ ද සැකය (විචිකිච්ඡාව), පළමු මාර්ග ඥානයෙන්ම උදුරා දමන ලද බැවින් දුරු කළ සැක ඇතිව ''විජිතාවී'' ශ්‍රේෂ්ඨ පුරුෂයා විසින් **දිණිය** යුතු වූ සියලුම කෙලෙස් (කිලිටි) දහම් දිනන ලද බැවින්, විනාශ කළ බැවින්, ''දිනන ලද පුද්ගලයා'' නම් වේ. ''අපෙතභෙරවෝ'' යනු විසි පහක් වූ භයවීම් වලින් සියලුම අයුරුන් දුරු වූ හෙයින් ''අපෙත (පහ වූ) භෙරවෝ'' (භයවීම් ඇතිව) නිර්භයතාවයෙහි ඇලුණේ නැවත ''දබ්බෝ'' යනු නාමය දක්වීමයි. ''**පරිනිබ්බුතෝ**'' යන පිරිණිවීම් දෙකකි. ''සොපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීම කෙලෙස් පරිනිර්වාණයයි. අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීම ස්කන්ධ පරිනිර්වාණයයි''. මෙම පිරිනිවීම් දෙකින් මෙහිදී කෙලෙස් පිරිනිවීම අදහස් කරන ලදී. එනිසා ''දුරුකළ යුතු දහම් මාර්ග ඥානයෙන්, සර්ව ප්‍රකාරයෙන්ම ප්‍රහීණ කරන ලද බැවින් කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවන ලදී'' යන අර්ථයයි. ''**යීතතෙතා**'' යනු සිටි ස්වභාවයයි. **ස්ථිරව** සිටීමයි. රුචි අරුචි වස්තු පිළිබඳ තාදී ගුණයට එළඹීමයි. **ලෝක** ධර්මයන්හි කම්පා නොවී ස්ථිරව සිටීමයි. ''**හි**'' යනු හේතු (කාරණය දක්වන) අර්ථයේ නිපාතයකි. පෙර යමක් දමනය කළ නොහැකි වූවෙක්ම සිටියේ ද ඔහු, පුද්ගල දමනයේ දක්ෂ ශාස්තෘන් වහන්සේ විසින් උතුම් - ආර්‍ය්‍ය දමනයෙන් දමනය කළ සේක් ද, සන්තෝෂයෙන් යුක්ත

ද, දුරු වූ සැක ඇත්තේ ද, දිනූ ඉඳුරන් ඇත්තේ ද, පහවූ භයවීම් ඇත්තේ ද මේ ගුණාංගවලින් පිරුණු ඒ දබ්බ තෙරුන් පිරිනිවියේය. එම නිවණෙහි ස්ථිරව පිහිටි මෙබඳු වූ තෙරුන් කෙරෙහි ''සිත් පැහැදවීම'' කළ යුතුයි. ''සිත අප්‍රසාද කර ගැනීමෙන් ඊට වෙනස් බවකට නොපැමිණෙන්නේය'' යනුවෙන් බුද්ධිමත් සත්ත්වයන්ට අනුකම්පා කරන සේක් දබ්බ තෙරණුවෝ සිය රහත් බව ප්‍රකාශ කළහ.

දබ්බ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.6

''යො සිතවනං'' යනු ආයුෂ්මත් සම්භූත තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? මෙයින් කල්ප එක් දහස් අටසියයකට පෙර අත්‍යදස්සී නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව ඉපිද, දෙවියන් සහිත ලෝකයා සසර නම් මහ සැඩ පහරින් එතෙර කරවමින්, එක් දිනක් මහත් වූ භික්ෂූ සංඝයා සමඟ ගංගා තීරයට පැමිණි සේක. එසමයෙහි මේ සම්භූත තෙරුන් ගෘහපති කුලයෙහි ඉපිද, එසේ වැඩමවූ බුදුපියාණන් දැක පැහැදී සිත් ඇතිව, සම්පයට පැමිණ වැඳ, ''ස්වාමීනි ! කිම එතෙරට යනු කැමති සේක්ද?''යි විමසීය. භාග්‍යවතුන් වහන්සේ ද ''එසේය, යන්නෙමු'' යි වදාළහ. ඔහු එකෙණෙහිම එක්කොට බැඳි නැවක් යෙදවීය. ඔහුට අනුකම්පා කළ ශාස්තෘන් වහන්සේ භික්ෂූ සංඝයා සමඟ නැවට නැඟුණු සේක. ඔහුත් එම නැවට නැඟ සුවසේ භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂූ සංඝයා ද එතෙරට වැඩමවා, දෙවැනි දින මහා දානයක් පවත්වා, පසුගමන් කරමින් පැහැදුණු සිතැතිව වැඳගෙනම නැවතුණේය. ඔහු ඒ පින් කමෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, මෙයින් කල්ප එක් දහස් තුන්සීයකට පෙර ක්ෂත්‍රිය කුලයෙහි ඉපිද, ධාර්මික වූ සක්චිති රජකෙනෙකු විය. ඔහු සත්ත්වයන් සුගති මගෙහි පිහිටුවා ඉන් චුතව මින් කල්ප අනූ එකකට පෙර පහළ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ සසුනෙහි පැවිදිව ධූතාංග ධර්මයන් සමාදන්ව සොහොනෙහි වසමින් මහණදම් පිරුවේය. නැවත කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි ද යහලුවන් තිදෙනෙකු සමඟ පැවිදිව වසර විසි දාහක් මහණදම් පිරුවේය. එක් බුද්ධාන්තරයක් දෙව් - මිනිස් සැප විඳ අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි රජගහ නුවර බමුණු මහසල් පවුලක බමුණු පුතෙක් ලෙස උපන්නේය. ඔහුට ''සම්භූත'' යන

නම නබන ලදී. ඔහු වැඩිවියට පත්වෙත්ම බමුණු සිත් සතරෙහි පරතෙරට ගියේ ය. භූමිජ, ජෙය්‍යසේන සහ අභිරාධන යන යහලුවන් නිදෙනා සමඟ භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් ධර්මදේශනාවක් අසා පැහැදී ලබන ලද ශ්‍රද්ධාව ඇතිව පැවිදි විය. ඒ සඳහා මෙය කියන ලදී.

''භූමිජෝ ජෙය්‍යසෙනෝ ච සම්භූතෝ අභිරාධනෝ
එතෙ ධම්මං අභිඤ්ඤාසුං සාසනෙ චරතාදිනෝ''

''භූමිජ, ජෙය්‍යසේන, සම්භූත සහ අභිරාධන යන මොවුහු සසුනෙහි පැවිදි වූ උතුම් තාදී ගුණයන්ට පැමිණ ධර්මයන් අවබෝධ කර ගත්හ.''

ඉක්බිති සම්භූත තෙරුන්, භාග්‍යවතුන් වහන්සේ සමීපයේ දී කායගතා සති භාවනා කමටහන ගෙන, නිතර සීතවනයේ වාසය කරයි. එනිසාම මේ ආයුෂ්මතුන් ''සීතාවනිය''යැයි ප්‍රකට විය. එසමයේ දිනක් වෙසවුණු මහරජතුමා කිසියම් කරුණකින් දඹදිව දකුණු දිශාවට යෑම සඳහා අහසින් යන්නේ, තෙරුන් එළිමහනෙහි හිඳිමින්ම කමටහන් සිහිපත් කරනු දැක විමානයෙන් බැස තෙරුන්ට වැඳ, ''මේ තෙරුන් වහන්සේ සමාධියෙන් නැගී සිටින අවස්ථාවෙහිදී මාගේ මෙහි පැමිණීම දන්වවු. ඒ දක්වා උන්වහන්සේට ආරක්ෂාව ද සපයවු.''යි යක්ෂයන් දෙදෙනෙකුට අණකොට ගියේය. එම යක්ෂයෝ තෙරුන් වහන්සේ සමීපයේ හිඳිමින්, කමටහනින් නැගිට සිටි කල්හි ඒ බව දැනුම් දුන්හ. එය ඇසූ තෙරණුවෝ, ''නුඹලා මගේ වචනයෙන් වෙසවුණු මහරජුට මෙසේ කියවු. භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි සිටියවුන්ට ''සති ආරක්ෂාව'' (සති ආරකඛා) පවතින්නේ මය. එම ආරක්ෂාව මා කෙරෙහි ද පවතියි. එනිසා දරුව, නුඹ අල්පෝත්සාහී වෙත්වා. භාග්‍යවතුන් වහන්ස්ගේ අනුශාසනාවෙහි පිහිටි අයට මෙබඳු ආරක්ෂා විධිවිධාන යෙදීමක් අවශ්‍ය නොවේ.'' යනුවෙන් පවසා එම යක්ෂයන් දෙදෙනා යවා, එකෙණෙහිම විදසුන් වඩා ත්‍රිවිද්‍යාවන් ප්‍රත්‍යක්ෂ කරගත්හ. ඉන්පසු වෙසවුණු මහරජු, නැවත හැරී එනුයේ, තෙරුන් සමීපයට ගොස්, මුවෙහි ආකාරය දැකීමෙන් ම උන්වහන්සේ ''නිමවා කටයුතු ඇත්තෙකැ''යි (රහත්වූවෙකැයි) දැන, සැවැත් නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේට ඒ බව දැනුම් දුන්නේය. ඔහු භාග්‍යවතුන් ඉදිරියේ තෙරුන් වර්ණනා කරමින් මෙසේ පැවසීය.

''සති ආරකඛා සමපනෙනා ධිතිමා විරිය සමාහිතෝ
අනුජානෝ සත්‍ථු සම්භූතෝ තෙවිජ්ජෝ මච්චු පාරගූ''

''සති ආරක්ෂාවෙන් යුක්ත වූ ධෛර්‍යවන්ත වූ වීර්යයෙන් යුක්ත වූ ශාස්තෘන් වහන්සේගේ අනුජාත පුත්‍ර වූ සම්භූත තෙරුන්, ත්‍රිවිද්‍යාලාභී ව මාර විෂය ඉක්මවා පරතෙරට ගියේය.''

යන ගාථාවෙන් තෙරුන්ගේ ගුණ වර්ණනා කළේය.

මෙම තොරතුරුම අපදාන පාළියේ මෙසේ දැක්වේ. පාලි ගාථාවලින් දැක්වෙන එම අපදාන සිංහලාර්ථය මෙසේ දැක්වේ. පාලි ගාථාවලින් දැක්වෙන එම අපදානයේ සිංහලාර්ථය මෙසේය. (අපදාන පාළි I කරණීය තෙරාපදානං)

''දෙපා ඇත්තන්ට උත්තම වූ නර ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවත් අට් දස්සී බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවරන ලදුව ගංතෙරට එළඹි සේක. මුවවිට දක්වා සමව පිරුණු, කපුටන්ට, පවා ඉවුරෙහි සිට පැන් පානය කළ හැකි සේ දියෙන් පිරී ගිය තරණය කිරීම දුෂ්කර වූ ඒ ගංගාවෙන් මම බුදුරජාණන් වහන්සේ ද භික්ෂූ සංඝයා ද එතෙර කරවීමි. ඒ මීට එක් දහස් අටසිය කපකට කලින් කරන ලද කුසල කර්මයේ බලයෙන් මේ දක්වා දුගතියක නූපදුනෙමි. ගඟින් එතෙර කරවීමේ පිනෙහි විපාකය එසේය. මීට කල්ප එක් දහස් තුන්සියකට පෙර සත්රුවනින් හෙබි, මහබලැති සම්භෝගවා නම් පස් සක්විති රජ කෙනෙකු වීමි. මම මේ අවසන් භවයේදී බමුණු කුලයෙහි ඉපදුනෙමි. යහළුවන් තිදෙනෙකු සමඟින් බුදු සසුනෙහි පැවිදිවීමි. මවිසින් සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරන ලදහ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''(2285-2289)

අනතුරුව ආයුෂ්මත් සම්භූත තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන භික්ෂූන් දැක, ''ඇවැත්නි මගේ වචනයෙන් ද භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිවු. මෙසේ ද කියවු.''යි පවසා, ධර්මාධිකරණයෙහි තමා විසින් ශාස්තෘන් වහන්සේ නොවෙහෙසුනු ලද බව පවසමින් (දක්වමින්) ''**යො සීතවනං**'' යනාදී ගාථා වදාළහ.

''යො සීතවනං උපාග භික්ඛු එකො සන්තුසිතො සමාහිතත්තෝ
විජිතා වී අපෙත ලොමහංසො රක්ඛං කායගතාසතිං ධිතීමා''

''යම් මහණෙක් විවේකය සොයා සීතා වනයට වැඩි සේක් ද ධෛර්‍යයවන්ත වූ ඒ මහණ, හුදකලාව, සතුට වූයේ, එකඟසිත් ඇතිව

කායගතාසතිය වඩන්නේ. දිනන ලද කෙලෙස් ඇතිව පහවූ ලොවුදහ ගැනීම් ඇතිව වෙසෙයි.

ඒ භික්ෂූනු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ සම්භූත තෙරුන්ගේ පණිවුඩය දනුම් දෙමින්, ''ස්වාමීනි, ආයුෂ්මත් සම්භූත තෙරුන් භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳියි. මෙසේ ද කියයි.'' යනුවෙන් වදාරා ඒ ගාථාව පැවසූහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ, ''මහණෙනි, ආයුෂ්මත් සම්භූත තෙරුන් ප්‍රත්‍ය ධර්මය පිළිබඳ සූක්ෂම ධර්ම කරුණු විවරණයට පැමිණ මා ධර්ම විනිශ්චයෙහි නොවෙහෙසිය. වෛශ්‍රවණ විසින් ඔහුගේ උත්සාහය පිළිබඳව මා හට දනුම් දුන්නේය'' යැයි වදාළහ. ඒ භික්ෂූහු ඒ ඒ තැනදී සම්භූත තෙරුන් විසින් කියන ලද ''**යො සීතවනං**'' යන ගාථාව ශාස්තෘන් වහන්සේට පැවසූහ.

එහි ''සීතවනං'' යනු රජගහ නුවර සමීපයේ ඇති මහත්වූ භයානක සොහොනකි. ''**උපගා**'' යනු වාසය කිරීම් වශයෙන් එළඹියේය. මේ වදනින් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදත් පැවිද්දන්ට සුදුසු වූ වාසය කරන තැන් දක්වයි. ''**භික්ඛු**'' යනු සසර භය බැලීම් වශයෙන් ද කෙලෙස් බිඳලූ බැවින් ද ''භික්ඛු'' නම් වන භික්ෂුවයි. ''**එකො**'' යනු දෙවැනියෙක් නොමැති හුදෙකලාව මෙයින් කාය විවේකය දක්වයි. ''**සන්තුසිතො**'' යනු සතුටු වූ මෙයින් සිවුපසයෙන් සතුටුවන ''ලක්ෂණ සහිත ආර්ය වංශය දක්වයි. ''**සමාහිතත්තො**'' යනු උපචාර හා අර්පණා භේද ඇති සමාධියෙන් සංසිඳුණු සිත් ඇති මේ ''චිත්ත භාවනා'' අභිමුඛ වූයේ, ''භාවනාවේ ඇලුණු ආර්ය වංශය'' දක්වයි. ''**විජිතාවී**'' යනු සසුනෙහි මනාව පිළිපැදීමෙන් දිනිය යුතු කෙලෙස් සමූහය පරවා, තමා ජයගෙන සිටියේ, කෙලෙස් දිනුවහු. මෙයින් උපධි විවේකය දක්වයි. භයට හේතු වූ සියලුම කෙලෙස් දුරුකළ - පහ කළ බැවින් ''අපෙත ලොමහංසො'' නම් වේ. මෙයින් සම්‍යයක් (යහපත්) ප්‍රතිපත්තියෙහි (පිළිවෙතේ) විපාක දක්වයි. ''රක්ඛං'' යනු ආරක්ෂා කරමින් ''**කායගතාසතිං**'' යනු කය අරමුණු කරගෙන පවත්වන සිහිය, කායගතා සති කමටහන වැඩීම් වශයෙන් අත් නොහැර, ''**ධිතිමා**'' යනු ධෛර්‍යයවන්තයා, එකඟ වූ සිත් ඇති බැවින්, දිනූ ඉඳුරන් ඇති වූ - නුවණැත්තා නැතිනම් උපාය පිළිවෙත් දක්වීමකි. මේ මෙහි සංක්ෂිප්තාර්ථයයි. ''ඒ භික්ෂුව විවේක සැප කැමතිව හුදෙකලාව ම සීතවනයට ගියේය. පැමිණ ආහාර ලොල් බව ආදිය දුරුකල බැවින් සතුටින් යුක්තව ධෛර්‍යයවන්තව කායගතාසති කමටහන වඩමින්, එසේ ලැබූ ධ්‍යානයම පාදක කරගෙන අරඹන ලද විදර්ශනා ඇතිව, අවබෝධ කළ අග්‍රමාර්ගයෙන් සන්සුන් සිත්

''යො පානුදී'' යනු ආයුෂ්මත් භල්ලිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත්තිය කෙසේද ? මේ භල්ලිය තෙරුන් මීට කල්ප තිස් එකකට පෙර බුදුවරු පහළවීමට පෙර කාලයේ දී සුමන නම් එක් පසේ බුදුවරයෙකුට පැහැදුණු සිතින් පලවැල ආදිය පිරිනමා, සුගතින්හිම සැරි සැරුවේය. සිබි නම් සම්මා සම්බුදුන් පහළ වූ මුල් කාලයේම අරුණවතී නුවර බමුණු පවුලක උපන්නේය. ''උජිත හා ඔජිත' නම් සත්තුවාහක පුත්‍රයෝ දෙදෙන උන්වහන්සේට ප්‍රථමාහාර දානය පිදූහ.''යි අසා, තම යහලුවකු සමඟ භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගිය මේ බමුණු පුත්‍රයා, උන්වහන්සේට වැඳ හෙට දිනය සඳහා දානයට ආරාධනා කොට, මහදන් පවත්වා ප්‍රාර්ථනාවක් ද කළහ. ''ස්වාමීනි, අප දෙදෙනම අනාගතයේදී නුඹ වහන්සේ වැනිම වූ බුදුවරයෙකුට පළමු ආහාරය දෙන්නෙමු''යි ඒ දෙදෙනම පැතූහ. ඒ දෙදෙන ඒ ඒ භවයන්හි පින්කම් කරමින් දෙව් මිනිසුන් අතර සැරිසරනුයේ, කාශ්‍යප භාග්‍යවතුන්ගේ සමයෙහි ගොපලු සිටු පුතෙකුගේ පුතුන් ලෙස ඉපිද බොහෝ කාලයක් භික්ෂු සංඝයාට කිරි ආහාරවලින් උපස්ථාන කළහ. අපගේ භාග්‍යවත් සම්මා සම්බුදුරජාණෝ පහළ වූ කල්හි පොක්ඛරවතී නම් නුවර සාත්තුවාහකයකුගේ ගෙදර දෙසොහොයුරන්ව ඉපදුනහ. ඔවුන්ගෙන් වැඩිමලා ''තපස්සු'' නම් විය. බාලය ''භල්ලිය'' නම් විය. ඔවුහු පන්සීයක් පමණ ගැල්වල බඩු පුරවාගෙන වෙළඳාම් පිණිස (මධ්‍ය ඉන්දියාවට) පැමිණියහ. අප භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයට පත් අලුතම, සත් සතියක් විමුක්ති සුවය ප්‍රත්‍යවේක්ෂා කරමින් කල්යැවූ සේක් අටවන සතියෙහි රාජායතන ගස මුල වැඩ විසූ සේක. රාජායතන වෘක්ෂයට සමීපයෙහි මහා මාර්ගයක් (වෙළඳුන් යන එන) පවතියි. ඒ වෙළඳ දෙබෑයෝ මේ මාර්ගයේ පැමිණියාහු. රාජායතන ගස සමීපයේදී මඩවතුර නොමැති මඟෙහි කරත්ත ඉබේම නැවතුණහ. ''කවර කරුණකින් මෙසේ වීද ?'' යි සිතන්නාවූ ඒ සොයුරන්ගේ පැරණි සහ ලේ නෑයෙකු වූ දේවතාවෙක්, ගස් අතු අතර පෙනී සිටිමින්, ''නිදුකාණෙනි, මේ භාග්‍යවතුන් වහන්සේ සම්බුද්ධත්වයට

පත් නොබෝ කල් ඇති සේක්, සති හතක් නිරාහාරව විමුක්ති සුව විඳිමින් දුන් රාජායතන වෘක්ෂ මූලයෙහි හුන් සේක. උන්වහන්සේට ආහාර පිළිගන්වන්න. එය නුඹලාට බොහෝ කාලයක් හිතසුව පිණිස පවතින්නේමය.'' යනුවෙන් පැවසීය. එය ඇසූ දෙසොහොයුරෝ මහත් වූ ප්‍රීතියට පැමිණියාහු, ''ආහාර සම්පාදනය කිරීමට යාමෙන් පමාවේ.'' යැයි සිතා, අත්සුණු (බැඳපු පිටි) ද මී පිඬු ද භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ. බුද්ධ, ධම්ම යන සරණ දෙකෙහි පිහිටා ඔවුහු, කේශ ධාතූන් ලබාගෙන සිය රටට ගියහ. ඒ දෙදෙන ගෞතම බුදු සසුනෙහි පළමු උපාසකයෝ වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැසට වැඩමවා, දම්සක් සුතුර පවත්වා අනුපිළිවෙලින් රජගහ නුවරට පැමිණ වාසය කළ සේක. එම කාලයේ තපස්සු භල්ලික දෙදෙන රජගහ නුවරට පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත් පසෙක සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළ සේක. එය ඇසූ තපස්සු සෝවාන් ඵලයෙහි පිහිටා උපාසකයෙක් විය. භල්ලිය වනාහී පැවිදි ව ෂඩ් අභිඥා ලබා ගත්තේය. එනිසා අපදාන පාළියෙහි එය පාලි ගාථාවලින් මෙසේ දක්වේ. එම ගාථාවන්හි සිංහලාර්ථය මෙසේය. (අපදාන පාළි II වල්ලිකාරඵලදායකත්ථෙරාපදානං)

''එකල්හි 'සුමන' නම් වූ බුදුරජාණන් වහන්සේ තක්කරා රාජධානියෙහි වැඩවිසූ සේක. මෙයින් තිස් එකක් වූ එම කල්පයෙහි යම් පළතුරු දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් මට දුගතියක් නම් නොවීය. පළතුරු දානයේ විපාක මෙබඳුය. මවිසින් කෙලෙස් දවන ලදී. සියලු භවයන් නසන ලදී. ඇත් රජෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වාසය කරමි. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට යහපතක් ම සැළසුවේය. ත්‍රිවිද්‍යාවෝ අවබෝධ කළෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද මවිසින් සාක්ෂාත් කරන ලදහ. බුදුරදුන්ගේ අනුශාසනය ඉටු කළෙමි.'' (5001-5005)

එක් දිනක් මාරයා භල්ලිය තෙරුන්ට හිංසා පිණිස අවුත් මහත් භයානක රූපයක් දක්වීය. ඔහුට තමන් වහන්සේ සියලු භය දුරු කළ බව පෙන්වා දෙමින් භල්ලික රහතන් වහන්සේ ''**යො පානුදී**'' යන ගාථාව වදාළ සේක.

''**යො පානුදී මඤ්ඤරාජස්ස සෙනං නළ සෙතුං ව සුදුබ්බලං මහොසෝ විජිතාවී අපෙතභෙරවෝ නිදනෙතා සෝ පිරිනිබ්බුතෝ යීතතෙතා**''

''මහත් වූ ඕඝය, ඉතා දුර්වල වූ බට ඒ දණ්ඩක් සුණු විසුණු කරන්නාක් මෙන් යමෙක් කාමාදි මාරසේනාව දුරු කරන ලද්දේ ද, කෙලෙසුන් දිනූ, පහවූ භය ඇති, දැමුණු ඒ කෙලෙස් පරිනිර්වාණයට පත් කළ රහතන් වහන්සේ අකම්පිත වූ සිතැතිව සිටිති.''

එහි ''යො පානුදි'' යනු පහ කළ, ඉවත දැමූ, දුරු කළ, සුණු විසුණු කළ ''මච්චු රාජසස'' යනු ''මච්චු'' නම් මරණයයි. ස්කන්ධයන්ගේ බිඳී යෑමයි. ඒ මරණය තමාම, තමාගේ විෂයෙහි අනුව ජීවත්වන බැවින්, 'ප්‍රධානියා' යන අරුතින් ''රාජා'' යැයි ගෙන ''මච්චු රාජ'' නම් වේ. ඔහුගේ ''සෙනං'' සේනාව, මාර සේනාවයි. දිරා යෑම ආදී රෝගයෙන් මරණ වශඟයට හේතුවන බැවින් ''සේනාව'' නම් වේ. ඔහුගේ සේනාව ඉතා මහත්ය. නානා ප්‍රකාරව විශාල වේ. එනිසා ''මහා සේනාව'' යැයි කියැවේ. ඒ බව මෙසේ වදාළහ. ''අපට යුද්ධයට එන්නා වූ මාරයාගේ මහ සේනාට සමඟ යුද්ධයක් නැත.'' නැතිනම් මරණයේ ගුණ වශයෙන් ''මච්චු'' නම් වේ. මෙතැනදී දේවපුත්ත මාරයාම අදහස් කරන ලදී. ඔහුගේ ද උපකාරී බවට ගියාවූ කාමාදි මහා සේනාවක් ඇත. එය මෙසේ දක්වේ.

''නුඹගේ (මාරයාගේ) පළමු සේනාව කාමයයි. දෙවැනි සේනාව නොඇලීමයි. තෙවැනි සේනාව සාපිපාසා දෙකයි. නුඹේ සිවුවන සේනාව තණ්හාව යැයි කියයි. කය සිත මැලි බව (ථීන මිද්ධ) පස්වන සෙනඟයි. සයවන සේනාව භය වීමයි. නුඹේ සත්වන සේනාව සැකයයි. මානය හා ගුණමකුබව අටවන සේනාවයි.

(සුත්ත නිපානය - පධාන සුත්‍රය)

''නළ සෙතුංව දුබ්බලං මහොසෝ'' යනු සාරයෙන් තොර වූ බට ඒ දණ්ඩක් මෙන් වූ; අතිශයින් සැලෙන බැවින් වහා දුර්වල වන කෙලෙස් සේනාව; ''නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය මහත් වූ බල ඇති බැවින් මහෝඝයක් හා සමානය. ආර්ය වූ මාර්ගයෙන් යමෙක් මේ කෙලෙස් සේනාව (මාර සේනාව) පහ කළ සේක් ද ඒ දිනූ සතුරන් ඇති, පහවූ භය බිරම් ඇති, දමනය කළ ඉඳුරන් ඇති ඒ රහතන් වහන්සේ කෙලෙස් පිරිනිවීමෙන් ස්ථිරව සිටිසේක'' යනු පදපිළිවෙලයි. එය ඇසූ මාරයා, ''මේ මහා ශ්‍රමණයා මම මාරයා බව දැනගත්තේය'' යි ලැජ්ජාවෙන් එහිදී ම අතුරුදහන් විය.

හල්ලිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.8

''යො බුද්ධමියො'' යනු ආයුෂ්මත් වීර තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? මීට අනූ එක් කල්පයකට පෙර විපස්සි බුදුරජාණන් වහන්සේට ආරාසයක් සාදා මොනූ විසින් පුදන ලදී. තවත් දිනෙක ඉඳුවර මල් වැනි වූ නික ගසේ මල් ගෙන බුදුන්ට පිදුවේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, මෙයින් තිස්පස්වන කල්පයෙහි ක්‍ෂත්‍රිය රජ කුලයේ ඉපිද මහා ප්‍රතාප නම් සක්විති රජු විය. ඔහු දැනැමින් සෙමින් රජ කරමින් සත්සයන් දෙව් ලෝ යන මාවතෙහි පිහිටුවීය. නැවත මේ මහා භද්‍ර කල්පයෙහි කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි මහත් සම්පත් ඇති සිටුවරයෙක්ව, දුගී මගී යාචකාදීන්ට දන් දුන්නේය. සංඝයාට ද කිරිබත් පූජා කළේය. මෙසේ ඒ ඒ භවයන්හි දානාදී පුණ්‍ය සම්භාර ධර්ම රැස් කරමින් සෙස්සන් ද නිර්වාණ මඟට යොමු කරමින්, දෙව් මිනිසුන් අතර සැරිසරා, අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ කල්හි සැවැත්නුවර පසේනදි කොසොල් රජුගේ ඇමති පවුලක උපන්නේය. ''වීර'' යැයි ඔහුට නම් තැබිය. ඔහු වැඩිවියට පත්ව නමට අනුවම බලයෙන්, ජවයෙන් යුක්ත වූයේ සංග්‍රාමයෙහි ශූරයෙක් විය. ඔහුගේ මවුපියන්ගේ බලවත් පෙරැත්ත කිරීම නිසා විවාහ වූ ඔහු එක් පුතෙකු ලැබ, පෙර කරන ලද පුරුදුනාවය නිසා කාමයන්හි ආදීනව දැක, සංවේග උපදවා පැවිදි විය. උත්සාහ කරනුයේ වැයම් කරනුයේ නොබෝ දිනකින්ම ඔහු, ෂඩ් අභිඥා උපදවා ගත්තේය. ඒ බව අපදාන පාළියේ ගාථා වලින් විස්තරව දක්වේ. එහි සිංහලාර්ථ මෙසේය. (අපදාන පාළි I - නිග්ගුණ්ඩි ප්‍රත්‍යේකබුද්ධාපදානං)

''මම විපස්සි බුදුරජාණන් වහන්සේගේ ආරාමිකයෙක් වීමි. ඒ මම නික මල්ගෙන බුදුරාණන් වහන්සේට පිදීමි. මෙයින් අනූ එක්වන කල්පයේ මම යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් දුගතියක් නොදුටුවෙමි. බුදු පුදෙහි මේ මා ලැබූ විපාකයයි. ඉන්පසුව මීට කල්ප තිස් පහකට පෙර මහත් බල ඇති ජනයන්ට අධිපති වූ මහා ප්‍රතාප නම් සක්විති රජ වූයෙමි. සිවුපිළිසිඹියා, අෂ්ට විමෝක්‍ෂ හා ෂඩ් අභිඥා සාක්‍ෂාත් කරගත් මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි'' (2290-2293)

මෙසේ රහත් බවට පැමිණ ඵලසමවත් සුවයෙන් කල් යවන උන්වහන්සේගේ ගිහි කල භාර්යාව, තෙරණුවන් ගිහිබවට පත් කර ගැනීමේ අදහසින් නිතර නිතර නොයෙක් ක්‍රම වලින් පොළඹවා ගැනීමට පැමිණෙන්නීය. එක් දිනක් තෙරුන් දවල් වසන තැනට ගිය ඇය, ස්ත්‍රී ලීලා

දැක්වීමට පටන් ගත්තිය. එවිට ආයුෂ්මත් වීර තෙරුන් වහන්සේට ''මා පොළඹවා ගනු කැමති වන බාල නැනැත්තිය! නුඹගේ උත්සාහය මහාමේරුව මදුරු පියාපත් සුළඟකින් සෙලවීමට කැමති වන්නාක් මෙනි'' යැයි ඇගේ ක්‍රියාවේ නිරර්ථක භාවය පෙන්වමින්, ''**යො දුද්දමියො**'' යන ගාථාව වදාළහ.

''**යො දුද්දමියො දමෙන දන්තො වීරො සන්තුසිතො විනිණ්ණකඞ්ඛො**
විජිතා වී අපෙත ලොමහංසො වීරො සො පරිනිබ්බුතො යීතන්තො''

''දුකසේ දමනය කළ යුතු යමෙක්, ආර්‍ය්‍ය මාර්ගයෙන් හෝ පුරුෂ දම්‍ය සාරථීන් වහන්සේ විසින් හෝ දමනය කරන ලද්දේ ද; වීර වූ සන්තුෂ්ට වූ දුරු කළ සැක ඇති. කෙලෙසුන් දිනූ පහවූ ලොමුදහ ගැනීම් ඇති ඒ වීර මහණ, පිරිනිවි බැවින් ස්ථිරව පිහිටියේ වේ.''

එහි ''**යො දුද්දමියෝ**'' යන පදයන්ගේ අර්ථය පෙර කියන ලද පරිදිම දත යුතුයි. මේ එහි පදයන්ගේ අර්ථයයි. ''යමෙක් පෙර දමනය නොකළ සතුරු කෙලෙස් ඇති බැවින් හෝ සංග්‍රාමයේ දී දමනය කිරීමට, ජය ගැනීමට අසමත් බැවින් දුකසේ දමනය කළ යුතු වූවෙක් වේද ඔහු; දැන් උත්තම වූ දමනයෙන් සංවර කරන ලදී. චතුර්විධ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය සම්පත්තියෙන් යුතු බැවින් වීර වූ පෙර පැවසූ ලෙසට සන්තෝෂයෙන් යුතුව, දුරු කළ සැක ඇත්තේ, කෙළෙසුන් දිනූ, දුරු කළ ලොමුදැහැගැනීම් ඇති වීර නම් වූ තෙරුන් වහන්සේ; වීර නම් තෙරණුවෝ ඉතිරි නොකර කෙලෙස් පිරිණිවනින් පිරිනිව හෙයින් ස්ථිර ස්වභාවයෙන් යුක්ත වූයේමය. ගිහිකල භාර්යාව වැනි ස්ත්‍රීන් සියක්, දහසක් පැමිණියත් උන්වහන්සේ සෙලවිය නොහැකිමය.'' මෙය ඇසූ එම ස්ත්‍රිය, මගේ සැමියා මෙසේ කටයුතු කරන කල්හි ''මට ගිහිගෙයින් කවර ප්‍රයෝජනයක්ද ?''යි හටගත් සංවේග ඇත්තී භික්ෂුණීන් අතර පැවිදි වී, නොබෝ දිනකින් ම ත්‍රිවිද්‍යා ලාභී භික්ෂුණියක් වූවාය.

වීර තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.9

''සඨාගතං'' ආදී මේ ගාථාව ආයුෂ්මත් පිළිඳිවච්ඡ තෙරුන් වහන්සේ විසින් දේශිතය. එහි උපත කෙසේද ? මේ තෙරුන් වහන්සේ, මීට පෙර පහළ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වැඩ වසන සමයෙහි හංසවතී නුවර මහා භෝග සම්පත් ඇති පවුලක ඉපිද, පෙර පැවසූ පරිදිම ශාස්තෘන් වහන්සේ සමීපයේ සිට ධර්මය ඇසුවේය. ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක් දෙවියන්ගේ ප්‍රියමනාප බව ලබන්නන් අතුරින් අග්‍රස්ථානයෙහි තබනු ලුවු ඔහු; එම තනතුරම පතමින්, දිවි ඇති තාක් කුසල් කර, ඉන් චුතව දෙව් මිනිස් අතර සැරිසරුවේය. සුමෙධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී මිනිස් ලොව උපන් ඔහු, උන්වහන්සේගේ පිරිනිවණින් පසුව කළ බුදු සෑයට පූජා පවත්වා මහා සංඝයාට මහ දන් දුන්නේය. ඉන් චුතව දෙව් මිනිස් දෙගතියේම සැරිසරමින්, බුදුවරු පහළ නොවූ කාලයේ සක්විති රජකුව මහජනයා පන්සිල්හි පිහිටුවා දෙව් ලොව පිහිට කරගත්තන් කළේය. ඉන්පසුව අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවීමට පෙර කාලයේ ඔහු, සැවැත් නුවර බමුණු කුලයක උපන්නේය. ඔහුට තැබූ නම ''පිලිඳි'' යන්නයි. ''වච්ඡ'' යනු ගෝත්‍ර නාමයයි. මෙනිසා පසුකාලයේ ඔහු ''පිලිඳිවච්ඡ'' යැයි ප්‍රකට වූයේය. සංසාරිකව පුරුදු කළ, කළකිරීම් බහුලතාවය නිසා පිරිවැය පැවිද්දෙකු ලෙස මහණ වූ ඔහු; චූලගන්ධාර නම් විද්‍යාව ඉගෙන එහි බලයෙන් අහසින් යැමටත් අනුන්ගේ සිත් දැන ගැනීමටත් සමත් ව ලාභයෙන්, කීර්ති ප්‍රශංසාදියෙන් අග්‍රප්‍රාප්තව රජගහ නුවර වාසය කළේය.

ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය ලබාගත් සේක, අනුක්‍රමයෙන් රජගහ නුවරට වැඩම කළ සේක. එතැන් පටන් බුද්ධානුභාවයෙන් ඔහුගේ ඒ විද්‍යාව නොසැපිරේ. තමාගේ කටයුතු සිතූ පරිදි ඉටු නොවේ. එනිසා ඔහු මෙසේ සිතුවේය. ''යම් තැනක මහගන්ධාර විද්‍යාව පවතී ද එම ප්‍රදේශයේ චූලගන්ධාර විද්‍යාව නො සැපිරෙන බව මවිසින් පෙර ආචාර්ය ප්‍රාචාර්යයන්ගෙන් අසා ඇත. ශ්‍රමණ භවත් ගෞතමයෝ පැමිණි තැන් පටන් මා හට මෙම විද්‍යාව සම්පූර්ණ නොවේ. එනිසා නිසැකව ම ශ්‍රමණ භවත් ගෞතමයෝ මහා ගන්ධාර විද්‍යාව දන්නේම ය. උන්වහන්සේ ඇසුරු කිරීමෙන්, එතුමන් වෙතින් මේ මහා විද්‍යාව සම්පූර්ණ කරගත හැකි නම් ඉතා මැනවි.'' යනුවෙනි. මෙසේ සිතූ ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, ''මම ශ්‍රමණභවත් ගෞතමයන් සමීපයෙන් එක් විද්‍යාවක් ඉගෙන ගනු කැමැත්තෙමි. මට ඊට අවසර දෙනු

මැනවි'' යි අයැද සිටියේ ය. ''එසේ නම් පැවිදි වන්න''යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඔහු ''විද්‍යාවේ මුලින් කළ කටයුතු නම් පැවිදිවීමයැ''යි සිතා පැවිදි විය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්මදේශනා කළ සේක් චරිතයට අනුකූල වූ කමටහනක් දුන් සේක. එම භික්ෂූන් වහන්සේ පෙර දී කළ උපනිශ්‍රය සම්පත් ඇති බැවින්, නොබෝ කලකින් ම විදර්ශනා වඩා රහත් බවට පත් වූ සේක. උන්වහන්සේ පෙර භවයේ දී දුන් අවවාද අනුව ක්‍රියා කොට දෙව්ලොව උපන් දෙවියෝ කළගුණ දන්නා බැවින්, තෙරුන් වහන්සේ කෙරෙහි හටගත් ගෞරවය නිසා උදේ - හවස ඇසුරු කිරීමට පැමිණෙති. මේනිසා උන්වහන්සේ දෙවියන්ගේ ප්‍රිය මනාප බව ලැබීමෙන් අග්‍ර බවට පත් වූ සේක. මේ තොරතුරු අපදාන පාළියේ පාලි ගාථාවන්ගෙන් සවිස්තරව දක්වේ. එහි සිංහලාර්ථ මෙසේය. (අපදාන පාළි I පිළිඳිවච්ඡත්තෝරාපදානය)

''ලෝකනාථ වූ අග්‍ර පුද්ගල වූ සුමේධ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි පහන් වූ සිත් ඇති, මනා වූ සිත් ඇති මම, උන්වහන්සේගේ ස්තූපයට පූජාවක් කළෙමි. ෂඩ් අභිඥාලාභී ඍද්ධිමත් රහතන් වහන්සේලා රැස්කොට සඟබතක් දුනිමි. එම සුමේධ බුදුරජාණන් වහන්සේගේ අග්‍රෝපස්ථායක වූ සුමේධ නම් තෙරණුවෝ මට පුණ්‍යානුමෝදනා කළහ. එම පින්කමෙහි සිත පැහැද වූ මම දෙව් විමනක ඉපදුනෙමි. අසූ හය දහසක් දෙවඟනෝ මා පිරිවරා ගත්හ. එම අප්සරාවෝ සියලු කාමයන් පිනවා ගැනීමට මා අනුව සිටිති. සැප සම්පතින් අන් දෙවියන් අභිබවා සිටිමි. මෙය ස්තූප පූජාවේ පුණ්‍ය විපාකයයි. පසුව මම මෙයින් කල්ප විසි පහකට පෙර පිරිසිදු බොජුන් ඇති ''වරුණ'' නම් සක්විති රජ වූයෙමි. එකල්හි සිටි මනුෂ්‍යයෝ බිජු නොව පුරති. නගුල් - සී සෑම් ආදිය නොමැති එසමයේ සිටි මිනිස්සු කැලෑවෙහි වගා නොකළ බිම්හි හටගත්, ස්වයං ජාත (ඉබේ හටගත්) හාල් අනුභව කරති. මෙසේ රාජ්‍ය කළ මම නැවත දෙව්ලොව උපන්නෙමි. එකල්හි මා හට පහළ වූ සැප සම්පත් මෙසේය. ''මිතුරු - සතුරු සැම ප්‍රාණීහු මා හට හිංසා නොකරති. ඒ සමට මා ප්‍රියවෙති. ස්තූප පූජාවේ පුණ්‍ය විපාකය මෙයයි. මීට කල්ප එක් දහස් තිහකට පෙර දුන් දානයේ බලයෙන් මම දුගතියකට නොගියෙමි. ස්තූපයේ සුගන්ධාලේප කිරීමේ ඵලය එයයි. මේ භද්‍ර කල්පයෙහි ද මම ජනාධිපති වූ, මහානුභාව ඇති මහත් බල ඇති සක්විති රජෙක් වූයෙමි. එකල්හි මම බොහෝ දෙනා පන්සිල්හි පිහිටුවා ඔවුන් සුගතිගාමී කළෙමි. එම දෙවියන්ට ප්‍රියව වෙසෙමි. පටිසම්භිදාවෝ සාක්ෂාත් කළෙමි. කෙලෙස් දවන ලදහ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. (728-740)

එසේම දෙවියන්ට අතිශයින් ප්‍රිය වූ බැවින් මේ තෙරුන්වහන්සේ ප්‍රශංසාවට ලක් කළ භාග්‍යවතුන් වහන්සේ; ''මහණෙනි, දෙවියන්ට ප්‍රියමනාප වන මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරින් පිලින්දිවච්ඡ තෙරණුවෝ අග්‍රවෙති''යි දේවතාවන්ට ප්‍රිය මනාප භාවයෙන් අග්‍රස්ථානයෙහි තැබූ සේක. උන්වහන්සේ එක් දිනක් භික්ෂු සංඝයා මැද වැඩ හිඳ, තමාගේ ගුණ මහිම සිහිපත් කළ සේක. එම ගුණයන්ට මුලික වූ විද්‍යා නිමිත්ත (විශේෂ ඥාණ) භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැමිණි බව දුටු උන්වහන්සේ **''සඞ්ගතං නාපගතං''** යන ගාථාව වදාළ සේක.

''සඞ්ගතං න දුරාගතං නයිදං දුමනන්තිනං මම
සංචිහනෙතසු ධමෙමසු යං සෙඨ්ඨං තමුපාගමිං'' ති

''මාගේ මේ යහපත් පැමිණීමකි. නපුරු පැමිණීමක් නොවේ. මේ ම විසින් වරදවා ගත් සිතුවිල්ලක් ද නොවේ. දුක්ඛාදී ලෙස මැනවින් බෙදා දක්වන ලද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ වූ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළෙමි ද එය උතුම් පැමිණීමකි.''

එහි **''සඞ්ගතං''** යනු ''සුන්දර, යහපත් පැමිණීමකි. මේ මගේ පැමිණීම'' යැයි සම්බන්ධ කරයි. නැතහොත් **''සඞ්ගතං''** යනු මවිසින් මැනවින් පැමිණියේ යැයි විභක්තිය වෙනස් කර අර්ථ ගත යුතුයි. ''නාපගතං'' යනු ඉවත් නොවූ, නපුරු පැමිණීමක් නොවූ, හිතාහිටෘද්ධියෙන් පහ නොවූ, ඉවත් නොවූ, මෙය දුෂ්ට, නොසතුටු සිත් ඇත්තක් නොවේ. ''මම'' යනු මේ මාගේ දුෂ්ට-නරක විමසීමක් නොවේ. ''භාග්‍යවතුන් වහන්සේ සමීපයට මාගේ පැමිණීමත්, මවිසින් උන්වහන්සේ වැඩම කළ තැනට (නිවනට) පැමිණීමත් යහපත් වූ ම පැමිණීමකි. යහපත් පැමිණීමක් වන නිසාම එය නපුරු පැමිණීමක් නොවේ. එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ දී ධර්මය ශ්‍රවණය කොට, ''පැවිදි වන්නෙමි'' යන යම් සිතක් මට ඇතිවිද, කියන ලද ද, පවසන ලද ද, සිතා - විමසා ඇති වූ මේ සිත නරක සිතක් නොවේ'' යන අදහසයි. දැන් ඊට හේතු දක්වමින්, **''සංචිහනෙතසු''** ආදිය වදාළහ. **''සංචිහනෙතසු''** අනුපිළිවෙළ, ක්‍රමානුකූලව බෙදන ලද ''ධමෙමසු'' ධර්මයෙහි වෙනත් සමයන්හි පැමිණි අන්තගාමී පිළිවෙත් පිළිබඳව හෝ සම්මා සම්බුදුවරයන් වහන්සේ විසින් දුක්ඛාදී වශයෙන් මැනවින් බෙදා දක්වන ලද ධර්මයෙහි **''යං සෙඨ්ඨං තදුපාගමිං''** එම ධර්මයෙහි ශ්‍රේෂ්ඨ වූ චතුරාර්ය ධර්මය අවබෝධ කරගෙන, ශාසන බ්‍රහ්මචර්යාවට පැමිණියෙමි. මේ ධර්මයයි, මේ විනයයි දැන එළඹියෙමි. සම්මා සම්බුදුවරයන් වහන්සේලා විසින්ම මෙසේ කුසලා කුසල වශයෙන් හෝ ස්කන්ධාදී වශයෙන් තත් වූ

පරිද්දෙන්ම මනාව බෙදා දක්වූ ස්වභාව ධර්මයෙහි, යම් ශ්‍රේෂ්ඨ - උතුම් - ඇති උතුම් වන ඒ මාර්ග ඵලයට පැමිණියෙමි. ''අර්ථය මෙනෙහි කිරීමට පැමිණ, එය සාක්ෂාත් කළෙමි. එනිසා මේ මගේ යහපත් පැමිණීමකි. නුසුදුසු පැමිණීමක් - පිරිහීමක් නොවේ. මෙලෙස පැමිණීමට සිතීම යහපත් සිතුවිල්ලකි. නරක සිතුවිල්ලක් නොවේ.'' යනු පද පිළිවෙලයි.

පිලින්දිවච්ඡ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.1.10

''විහරි අපෙක්ඛං'' යන මෙය ආයුෂ්මත් පුණ්ණමාස තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේද ? ඔහු වනාහී විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සමයේ දී සක්වාලිහිණී කුලයෙහි ඉපිද, උන්වහන්සේ වැඩම කරනු දැක, පැහැදුණු සිතින් යුතුව, තම මුව තුඩින් සල් මලක් ගෙනවුත් පූජා කළේය. ඔහු එම පින් කමෙන් දෙව් මිනිසුන් අතර සැරි සරා, මෙයින් කල්ප දාහතකට පෙර අට වරක් සක්විති රජය කරවිය. මේ මහා භද්‍රකල්පයෙහි කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සසුන පිරිහෙන කාලයේ සිටු කුලයෙහි ඉපිද, පැවිදිව මහණදම් නිසි පරිදි පුරා, නැවත ඉන් චුතව දෙව් මිනිස් දෙගතියෙහි හැසිරෙමින් සිට; අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර, සම්ද්ධි නම් බමුණාගේ පුතා වී උපන්නේය. ඔහු උපන් දිනයෙහි එම ගෙදර සියලුම හිස්ව තිබූ සැලි, රන්වන් මෑ ඇට වලින් පිරුණේය. එනිසා ඔහුට ''පුණ්ණ මාස'' යන නම තබන ලදී. ඔහු වැඩිවියට පැමිණ බ්‍රාහ්මණ විද්‍යාවන්හි පරතෙරට පැමිණ, විවාහ වී එක් පුතෙකු ලැබුවේය. සංසාරික හේතු සම්පත් ඇති බැවින් ගිහිගෙයි විසීම පිළිකුල් කරනුයේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, බණ අසා ලබන ලද ශ්‍රද්ධා ඇතිව පැවිදිව, උපසම්පදාව ද ලැබුවේය. උන්වහන්සේ පූර්ව කෘත්‍යයන්ගෙන් යුතුව තව පංචක කමටහනෙහි ම යෙදුණු සේක්, විදර්ශනා වඩා රහත් බවට පත් වූ සේක. එනිසා අපදානයෙහි එය මෙසේ කියැවේ. අපදානයේ එන පාලි ගාථාවන්හි සිංහල අර්ථය මෙසේය. (පචේචාගමනියත්ථේරාපදානං, අපදාන පාළි I)

''මම එකල සීහඤ්ඤ නදී තීරයෙහි පිරිසිදු දිය සෙවෙල් පමණක් අනුභව කරන, පවින් වැලකුණු සක්වාලිහිණියෙක් වීමි. එසමයේ කෙලෙස් මල දුරු

කළ, අහසෙහි ගමන් කරන බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. තුඩින් සල් මලක් ගෙනවුත් ඒ විපස්සි බුදුරජාණන් වහන්සේට පිදුවෙමි. එවිට විපස්සි බුදුරජාණන් වහන්සේ, ''යමෙකුගේ ශ්‍රද්ධාව තථාගතයන් වහන්සේ කෙරෙහි නිශ්චලව පිහිටියේ ද, ඔහු ඒකාන්තයෙන් ම ඒ සිත් පැහැදවීම නිසා දුගතියකට නොයන්නේ ය''යි වදාළ සේක.

ඒකාන්තයෙන් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ පැමිණීම ඉතා යහපත් වූවකි. සක්වාලිහිණියෙකු වූ මවිසින් මනාවූ කුශල බීජයක් රෝපණය කරන ලදී. මීට කල්ප අනූ එකකට පෙර යම් මලක් මවිසින් පිදුයෙම් ද එහි පින් බෙලෙන් දුගතියක නූපදුනෙමි. පුෂ්ප පූජාවේ විපාකය මෙයයි. මෙයින් දාහත්වන කල්පයෙහි දී සුචාරුදස්සන නම් එකම නම ඇති මහා බලවත් වූ සක්විති රජවරු අට දෙනෙක්ව ඉපදුනෙමි. මවිසින් පිළිසිඹියාවෝද .... සාක්ෂාත් කරන ලදහ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' (1361-1367)

ඉක්බිති උන්වහන්සේගේ ගිහි කළ භාර්යාව අලංකාරව සැරසී පුතා සමඟ පැමිණ ප්‍රිය කථා බහින්, ස්ත්‍රී ලීලා දැක්වීමෙන් උන්වහන්සේගේ සිත් ගැනීමට වෑයම් කළාය. තෙරුන් වහන්සේ ඇගේ උත්සාහය දැක, තමන් වහන්සේ කිසි තැනෙක්හි නො ඇලෙන බව පවසමින් ''විහරි අපෙක්ඛං'' යන ගාථාව වදාළ සේක.

''විහරි අපෙක්ඛං ඉධවා හුරංවා
යෝ වෙදගූ සම්තෝ යතත්තෙනා
සබ්බෙසු ධම්මෙසු අනුපලිත්තෝ
ලෝකස්ස ඛන්ධාදා උදයබ්බයඤ්ඤා''

මෙහි ''විහරි'' යනු විශේෂයෙන් ගෙන ගියේය, දුරු කළේය, පහ කළේය. ''අපෙක්ඛං'' යනු තණ්හාවයි. ''ඉධ'' යනු මේ ලෝකයෙහි, මේ අත්බවෙහි ''හුරං'' යනු පරලොව හෝ අනාගත ආත්මභවයන්හි නැතිනම් ''ඉධ'' යනු ආධ්‍යාත්මික ආයතනයන්හි, ''හුරං'' යනු බාහිර ආයතනයන්හි ''වා'' ශබ්දය ''අපදා වා ද්විපදා වා'' යන තැන මෙන් සමුච්චයාර්ථයෙහි එකතු කර දැක්වීමෙහි යෙදේ. ''යෝ'' යනුවෙන් තමන් වහන්සේම වෙනත් අයෙකු මෙන් දක්වයි. ''වෙදගූ'' යනු නුවණින් (වෙද) අවබෝධ කළ, මාර්ග ඥාණයෙන් නිවණට ගිය, චතුරාර්ය සත්‍යය අවබෝධ කළ, විශේෂයෙන් පිරිසිඳ දැනීම - ප්‍රහාණය - සාක්ෂාත් කිරීම හා වැඩීම යන ක්‍රමයෙන්

චතුරාර්ය සත්‍ය අවබෝධ කළ, අවබෝධයෙහි පිහිටි **''යතත්තෝ''** යනු මාර්ග සංවරයෙන් සංයුත්ත වූ සංවර වූ ස්වභාවයයි. යහපත් වෑයමෙන් (සම්මා වායාම) හෝ සංවර වූ ස්වභාවය **''සබ්බෙසු ධම්මෙසු අනුපලිත්තෝ''** සියලුම ආරම්මණ ධර්මයන් හි තණ්හා - දිට්ඨි ආලේප වශයෙන් නොගෑවුණු, ස්පර්ශ නොවූ, එයින් ලැබීම් ආදී ලෞකික ධර්මයන්හි සමතික්‍රමණය, ඉක්මවා යෑම දක්වයි. **''ලොකඤ්ඤ''** යනු උපදාන (දැඩිවගත්) කරගත් ස්කන්ධ පංචකයේ; ඒවායේ කැඩීම් - බිඳීම් ස්වභාවය නිසා **''ලෝක''** නම් වේ. **''ඡඤ්ඤදා''** යනු දැනගෙන, **''උදයබ්බයඤ්ඤූ''** යන ඉපදීමත් නැතිවීමත්ය. පහළවීමත් වැය වී යාමත්ය. මෙයින් ඉහත කියන ලද ගුණයන්ගෙන් යුතු පූර්ව භාග ප්‍රතිපදාව දක්වයි. මෙහි අර්ථය වනාහි මෙසේ දත යුතුයි. ''යමෙක් සියලු ම ස්කන්ධ ලෝකයේ ඇතිවීම හා නැතිවීම සම ප්‍රඥාවෙන් දැන; උසස්ම ඥානය ලබා සංවර වූයේ වේද කිසි තැනෙක නො ඇලෙන ඔහු, සැම තැන්හිම අපේක්ෂාවක් නැතිව, භික්මුණු සිතින් සතුටින් යුක්තව මෙබඳු ස්ත්‍රීන්ගේ විප්‍රකාර පිළිබඳව කිසිත් නොසිතා සිටිති. එනිසා අඳ බාල තැනැත්තිය, නුඹ ආවා වූ මගින්ම නැවත හැරී යන්න'' යි යනුවෙනි. ඉක්බිති ඒ ස්ත්‍රිය, ''මේ ශ්‍රමණයා මා කෙරෙහි ද පුතු කෙරෙහිද අපේක්ෂා රහිතයෙකි. මොහු පොළඹා ගැනීමට නොහැකි''යි සිතා ගියාය.

පුණ්ණමාස තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

පළමු වැනි වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්ත වේ.

1.2.1

''පාමාජ්ජ බහුලෝ'' යනු ආයුෂ්මත් චූලගවච්ඡ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? ඔහු වනාහි පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දිළිඳු පවුලක ඉපදුණේය. අනුන්ට බැල මෙහෙකම් කරමින් දිවිගෙවන ඔහු දිනක් භාග්‍යවතුන් වහන්සේගේ සුජාත නම් ශ්‍රාවකයා පාංශුකූලයක් සොයනු දැක, පැහැදුණු සිතින් උන්වහන්සේ වෙත පැමිණ වස්ත්‍රයක් දී, පසඟ පිහිටුවා වැන්දේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් තිස්තුන් වරක් දෙව් රජව (ශක්‍ර දේවේන්ද්‍රව) උපන්නේය. සත් සිය වරක් සක්විති රජකම ලැබුවේය. අනේක වාරයක් ප්‍රදේශ රාජ සම්පත් වින්දේය. මෙසේ දෙව් මිනිසුන් අතර සැරිසරා, කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සසුන පිරිහීගෙන යන කාලයේ පැවිදිව මහණ දම් පිරුවේය. එක් බුද්ධාන්තරයක් දෙව් මිනිස් දෙගතියෙහි එකිනෙකට යමින් සිට, අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කල්හි කොසඹෑවේ බමුණු ගෙදරක උපන්නේය. ඔහුගේ නම ''චූලගවච්ඡ'' නම් විය. ඔහු වැඩිවියට පැමිණ බමුණු සිප් සතරෙහි පරතෙරට ගියේය. පසුව බුදුගුණ අසා පැහැදුණු සිතින් ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කළ සේක. ලබන ලද ශ්‍රද්ධාව ඇතිව පැවිදි වූ ඔහු, නොබෝ දිනකින් උපසපන් වී සිය චරිතයට සුදුසු කමටහන් ගෙන, එම කමටහන් නිතර වඩමින් වාසය කළේය. මෙසමයේ කොසඹෑ නුවර වැසි භික්ෂූ කලහ කරන්නෝ වූහ. නමුත් චූලගවච්ඡ තෙරුන් ඒ දෙපිරිසේම වාදය පිළිනොගෙන, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙන ලද අවවාදයෙහිම පිහිටා, විදසුන් වඩා රහත් බවට පත්විය. එනිසා අපදාන පාළියේ මෙම විස්තරය මේ අයුරින් දැක්වේ. (අපදාන පාළි II, උපඩ්ඪුසස දායකත්‍ථෙරාපදානං)

''එසමයේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සුජාත නම් ශ්‍රාවකයා, පාංශුකූල සිවුරක් කිරීමට රෙදි කඩක් සොයමින් කසල ඇති තැන්හි සොයනු දුටු හංසවති නුවර බැල මෙහෙ කරමින් ජීවත්වූ මම, උන්වහන්සේට රෙදි කඩක් පුදා හිසින් වැන්දෙමි. මැනවින් කරන ලද මේ පුණ්‍ය කර්මය නිසාත් ප්‍රාර්ථනා මහිම නිසාත් මිනිස් සිරුර හැර දමා, මම දෙව් ලොව ඉපදුනෙමි. තිස් තුන් වරක් ශක්‍රදේවේන්ද්‍රට දිව්‍ය රාජ්‍යය විචාළෙමි. සැත්තෑ සත් වරක් සක්විති රජව සම්පත් වින්දනය කළෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ සම්පත් පමණ කළ නොහැක. වස්ත්‍ර කැබැල්ලක් පිදීමේ පිනින් අපාය බිය රහිත වූ මම සතුටු වූයෙමි. ඉදින් මා කැමැත්තේ නම් වන පර්වතාදියෙන්

යුක්ත මේ මුළු පෙදෙසම කොමු පිළියෙන් වැසියාමේ හැකියාවක් මට ඇත. රෙදි කඩක් පිදීමේ පින් කමෙහි විපාකය එබඳුය. මීට කල්ප ලක්ෂයකට පෙර යම් දානයක් දුන්නේ නම්, එහි විපාක වශයෙන් මම දුගතියකට කිසි කලෙක නොගියෙමි. රෙදිකඩ පිදීමේ පින්හි විපාකය එසේය. මවිසින් සියළු කෙලෙස් දවන ලදී. සියලු භව නැසුවෙමි. ඇත්රජෙකු මෙන් ආශ්‍රව නම් බැඳුම් සිඳ සුවසේ වෙසෙමි. බුදුරදුන් වෙත මාගේ පැමිණීම යහපත් වූවකි. මම ත්‍රිවිද්‍යාවන් අවබෝධ කළෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි. සිවු පිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරන ලද මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' (5279-5288)

ඉක්බිති චූලගවච්ඡ තෙරණුවෝ රහත් බවට පත්ව, ඒ භික්ෂූන්ගේ කලහයෙන් ඔවුනොවුන්ම වැනසෙන බව දැක, ධර්ම සංවේගයට පත්වූහ. තමන් වහන්සේ අවබෝධ කරගත් විශේෂ අධිගමයන් සිහිපත් කිරීමෙන්, උන්වහන්සේට හටගත් ප්‍රීති සොම්නස් බව නිසා, ''**පාමොජ්ජ බහුලො**'' යන ගාථාව වදාළ සේක. එහි ''**පාමොජ්ජ බහුලො**'' යනු ඉතා පිරිසිදු සිල් ඇති බැවින් විපිළිසර නොවීම් වශයෙන් හා අධිකුසල දහම් හි විශේෂයෙන් ඇලීම් වශයෙන් ප්‍රමෝදය සතුට බහුල වූයේ, එනිසා ''**ධම්මෙ** බුද්ධපවෙදිතෙ'' යනුවෙන් කියන ලදී. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ''ධම්මෙ'' යනු තිස් හතක් වූ බෝධි පාක්ෂික ධර්මයෙහි හෝ නව විධ වූ ලෝකෝත්තර ධර්මයෙහි උන්වහන්සේට වනාහි සර්වඥ වූ බුදුරජාණන් වහන්සේ විසින් සාමුක්කංසික ධර්ම දේශනාව පවත්වන ලදී. එබැවින් ඒ ධර්මය, ''බුදුරජාණන් වහන්සේ විසින් දේශිත'' නම් වේ. අවබෝධ කිරීම් වශයෙන් උන්වහන්සේගේ දේශනා කරන ලද ධර්මය ද මෙහි අදහස් වේ. ''**පදං සන්තං**'' යනු නිර්වාණය අදහස් කිරීමට යෙදුවකි. මෙබඳු වූ භික්ෂුව ශාන්ත පදයට, ශාන්ත වූ කොටසට සියලු සංස්කාර සංසිඳවීම් වශයෙන් පැමිණේ. අයත් වේ. ''**සඞ්ඛාරූපසමං**'' යනු උතුම් සුවදායී බවට ''**සුඛං**'' යනු නිවණට පැමිණේ. නිවන් සැප විඳියි. පිරිසිදු සිල් ඇති භික්ෂුව විපිළිසර නොවීම් වශයෙන් ප්‍රමෝදය බහුල වූයේ, සත් ධර්මයෙහිම නිරත වූයේ - යෙදුනේ, විමුක්තියේ කෙළවරට පැමිණේ. නිවණට පත්වේ. යම්හෙයකින් ද, ''ආනන්දය, කුසල් හා සීලය විපිළිසර නොවීම් පිණිස හේතුවේ. විපිළිසර නොවීම ප්‍රමෝදය - සතුට පිණිස හේතුවේ'' යනුවෙන් බුදුහු වදාළ බැවිනි. නැතහොත් ''**පාමොජ්ජබහුලො**'' යනු ''භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ වන සේක. ධර්මය ස්වාක්ඛාතය. (මැනවින් දේශිතය) එහි ඒ ප්‍රමාද බහුල පුද්ගලයා කුමක් නම් කරන්නේද ?'' යන්න හඟවමින් ''**ධම්මෙ**

බුද්ධසාවෙදිනෙ'', ''බුදුන් දෙසූ ධර්මයෙහි'' ආදී වශයෙනි. ශ්‍රද්ධාවෙන් යුක්ත පුද්ගලයාට, සත් පුරුෂ ඇසුර හා සද්ධර්ම ශ්‍රවණයන් ලැබූ, නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් ධර්මානු ධර්ම ප්‍රතිපත්තීන්ට සුවසේ පැමිණීම් වශයෙන් සමාපත්තිහු අතට පත් වූවාක් මෙන් වැටහෙති. එනිසා ''සද්ධාජාතො උපසඞ්කසමති උපසඞ්කමනෙතා පයිරුපාසති'' (ශ්‍රද්ධාව උපදවා සම්පයට පැමිණෙයි. සම්පයට පැමිණ ඇසුරු කරයි) යනාදිය කියන ලදී.

චූලගවච්ඡ ථේර ගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.2

''පඤ්ඤාබලී'' යනු ආයුෂ්මත් මහාගවච්ඡ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? මොනු පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ භික්ෂු සංඝයාට පැන් දානයක් දුන්නේය. පසුව සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ද උපාසකයෙක් වී නිවණම අරමුණු කරගෙන බොහෝ පින්කම් කළේය. ඔහු එම පින්කම්වල විපාක වශයෙන් ඒ ඒ කාම සුගති භවයන්හි ම ඉපදෙමින් සසර සැරිසරා; අප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි මගධ රට, නාළක ගමෙහි සමිද්ධි නම් බමුණාගේ පුත්‍රයෙකු ලෙස උපන්නේය. ඔහුට ''මහාගවච්ඡ'' යන නම විය. ඔහු වැඩිවියට පැමිණ ''ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙකි''යි අසා; ''ඒ සැරියුත් තෙරණුවෝ මහා ප්‍රඥාවන්තයෙකි. උන්වහන්සේ ශ්‍රාවක බවට පත් වූ යමෙක්වේ ද ඔහු නියතයෙන්ම මේ ලොව අග්‍රම පුද්ගලයා විය යුතුයැ''යි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සැදහැසිත් උපදවා, උන්වහන්සේ සමීපයේ පැවිදි විය. පැවිදිව කමටහන් ගෙන එහි යෙදුණු මහාගවච්ඡ තෙරණුවෝ නොබෝ දිනකින්ම රහත් බවට පත් වූ සේක. මේ බව අපදාන පාළියේ විස්තර වේ. එහි සිංහලාර්ථ මෙසේය. (අපදාන පාළි, II උදක දායක තෙරාපදානං)

''පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ අනුත්තර වූ භික්ෂු සංඝයා කෙරෙහි පැහැදුණු සිත් ඇති මම සතුටු සිතින් පැන් කළයක් පිදුවෙමි. පර්වත මුදුනක වුවද ගස් මුදුනක හෝ අහසෙහි හෝ පොළොවෙහි හෝ යම් තැනක හිඳ පැන් කැමති වේද වහා මට පැන් පහළ වේ. එදා මීට කල්ප

ලක්‍ෂයකට පෙරදී පැන් කලයක් දන් දුන්නෙමිද ඒ දානයේ විපාක ලෙස මේ දක්වා දුගතියකට නොගියෙමි. මව්සින් කෙලෙස් දවන ලදී. සියලු භවයන් නැසුවෙමි. බැඳුම් සිදින ලද ඇත් රජෙකු මෙන් ආශ්‍රව රහිතව සුවසේ වෙසෙමි. බුදුරදුන් වෙත මාගේ පැමිණීම ඉතා යහපත් පැමිණීමකි. ත්‍රිවිද්‍යාවන් ලබන ලද මම බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්‍ෂයෝද ඡඩ් අභිඥාවෝ ද මව්සින් සාක්‍ෂාත් කරන ලදහ. බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5298-5303)

උත්තමහන්සේ මෙසේ රහත් බවට පත්ව විමුක්ති සුව විඳිමින් සසුනේ නෛර්‍යාණිකභාවය ප්‍රකට කිරීමෙන්, සබ්‍රහ්මචාරීන්ගේ උත්සාහය ජනනය කිරීම, වර්ධනය කිරීම පිණිස ''පඤ්ඤාබලී'' යන ගාථාව වදාළ සේක.

එහි ''පඤ්ඤාබලී'' යනු පරිහරණය කළ යුතු ප්‍රඥාවෙන් හා විදර්ශනා ප්‍රඥාවෙන් නිතර උත්සාහවත් වී අතිශය වූ ප්‍රඥා බලයෙන් යුක්ත වූ ''සිලවතූපසනෙනා'' යනු උසස් බවට ගිය මතුපාරිශුද්ධි ශීලයෙන් ද ධූතාංග ධර්ම නම් වත් පිළිවෙතින් ද යුක්ත වූ, බබළන්නා වූ ''සමාහිතො'' යනු උපචාර හා අර්පනා භේද ඇති සමාධියෙන් සන්සුන් වූ සිත් ඇති ''ඣානරතො'' යනු එම අරමුණම සිහි කිරීමෙහිම ලක්‍ෂණ සිහි කිරීමෙහි ම යෙදුණු සිහියෙන් යුක්ත වූයේ සැම කල්හි සිහියෙන් තොරව නොවසන හෙයින් ''සතිමා'' නම් වූ ''යදත්‍ථියං'' යනු අර්ථ වශයෙන් අපේක්ෂා රහිත වූ එහි යමෙකුට යමකින් අර්ථයක් වේ ද ඒ යදත්‍ථිය නම් වේ. යම් ප්‍රත්‍යයක් පරිභෝග කරන්නාට පරිභෝජනයෙන් වනාහී ඒ අර්ථය ඉටුවේ. දායාද පරිභෝජනයෙන් අන්‍ය වූ වෙනත් භෝජනයක් ද නිදසුන් වශයෙන් දත යුතුයි. අනුභව කරනුයේ පරිභෝජනය කරනුයේ 'භෝජන'යි. (භුඤ්ජීයති පරිභුඤ්ජීයතීතිවා භොජනං) මෙහි භෝජන යනු සිවුපසයයි. ''යදත්‍ථිකං'' යන පාඨයද මෙහි යෙදේ. ''යම් අර්ථයකට, යමක් සඳහා ශාස්තෘන් වහන්සේ විසින් ප්‍රත්‍යය අනුදන්නා ලද සේක් ද, ඒ අර්ථය සඳහා කය පවත්වා ගැනීමේ කැමැත්ත'' ආදී වශයෙන් අර්ථ දත යුතුයි. ''අර්ථය'' යනු අනුපාදිසේස නිර්වාණ ධාතුවට සමවැදීමයි. එනිසා අනුපාදිසේස පිරිනිවණට පත්වීම සඳහා සිවුපසය අනුභව කරන තමාගේ අනුපාදිසේස පරිනිර්වාණ කාලයේ පැමිණීම ම අපේක්ෂා කරමින් සිටියි. මෙහි මේ සම්බුද්ධ ශාසනයේ විතරාගී වූ උතුමන්ට පමණක් මේ අපේක්ෂාව ඇත. ඉන් බැහැර වූ සසුනක කාමයන්හි නොඇලීමක් ඇත්තහුට ''මෙය නැත'', ''මෙබඳු සිතක් - අපේක්ෂාවක් නැත'' යන අදහසයි.

මහාගවච්ඡ ථේර ගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.3

''නිලබ්භවණ්ණා'' යන මේ ගාථාව ආයුෂ්මත් වනවච්ඡ තෙරුන් වහන්සේ විසින් පැවසූවකි. එහි උපත කවරේද ? වනවච්ඡ තෙරුන් පෙර අත්‍යදස්සි භාග්‍යවතුන් ලොව පහළ වූ සමයේ කැසිබු යෝනියෙහි ඉපිද ''චිනතාය' නම් නදියේ වාසය කරයි. ඒ කැසුබුවාට ඉතා කුඩා සිරුරක් විය. ඔහු එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ නදී තෙර සිටිනු දුටුවේය. ''භාග්‍යවතුන් වහන්සේ එතෙරට යනු කැමැත්තෙන් සිටිති''යි සිතා උන්වහන්සේ තම පිටෙහි හිඳුවාගෙන ගෙන යනු කැමතිව පාමුල හොත්තේය. භාග්‍යවතුන් වහන්සේ, කැසබුවාගේ අදහස දැන ඔහුට අනුකම්පාවෙන් පිටට නැඟි සේක. ඔහු එකෙනෙහිම ප්‍රීති සොම්නසට පැමිණ, ගඟට බැස දුනුදියේ වේගයෙන් විදි සැරයක් මෙන් බුදුහු පරතෙරට ගෙන ගියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ පින්ඵල ද මෙහිදී උපදින සම්පත් ආදිය ද දේශනා කොට වැඩිසේක. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරි සරා, නොයෙක් සිය ගණනක් වාරයන්හි තවුස් පැවිද්දෙන් පැවිදිව ආරණ්‍යවාසියෙක් විය. නැවත කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දවස පරවේයකුව ඉපිද කැළයේ වෙසෙන මෙත් සහගත විහරණයෙන් සිටින භික්ෂුවක් දැක සිත් පැහැදවිය. ඉන් පුන වූ ඔහු; බරණැස් නුවර එක් උසස් පවුලක ඉපිද, වැඩිවියට පැමිණ ගිහිගේ ගැන කළකිරී පැවිදිව නිවන් පතාගෙන බොහෝ පින්කම් කළේය. මෙසේ ඒ ඒ මනුෂ්‍යාත්මයන්හි හැසිර, අපගේ බුදුරජාණන් වහන්සේගේ කාලයේදී කපිලවත්තු නගරයේ ''වච්ඡගොත්ත'' නම් බමුණාගේ ගෙදර පිළිසිඳ ගත්තේය. ඔහුගේ මව, පිරිපුන් ගැබ ඇත්තී වනපෙත දැකීමට හටපත් දොළ දුක් ඇත්තී කැළයට පිවිස හැසිරුණාය. එවිට ඇයගේ කර්මජ වාතයෝ සැලුනහ. දැසි දස්සෝ ඇය තිර වලින් වට කර ගත්හ. ඇය ඉතා පින්වත් පුතෙකු වැදුවාය. එකුමරු බෝසතුන් සමඟ වැලිකෙළියේ පටන් සිටි යහලුවෙකු විය. ඔහුගේ නම ද ග්‍රෝත්‍ර නාමය ද ''වච්ඡ'' යනු විය. වනයට ඇළුම් කළ බැවින් ඔහු ''වනවච්ඡ'' යැයි ප්‍රකට විය. පසු කාලයක මහා බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය කොට, මහත් වූ ප්‍රධාන වීර්‍යය වඩන අවස්ථාවෙහි, ''මම ද සිදුහත් කුමරුන් සමඟ කැළයෙහිම වෙසෙමි''යි සිතා ගෙදරින් නික්මවුන් තාපස පැවිද්දන් පැවිදිව හිම වනෙහි වාසය කළේය. පසුව ''බෝසත්හු බුද්ධත්වයට පත්වූහ''යි අසා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, පැවිදිව කමටහන් රැගෙන ගොස් කැළයෙහි වාසය කළ වනවච්ඡ තෙරණුවෝ නොබෝ දිනකින් ම විදර්ශනාව වඩා රහත් ඵලය සාක්ෂාත් කරගත් සේක.

ඒ පිළිබඳ විස්තරය අපදාන පාළියේ දැක්වේ. එම පාලි ගාථාවන්හි සිංහල අර්ථය මෙසේය. (අපදාන පාළි II, තරණීය තෙරාපදානං)

''ලොව දනයුතු සියල්ල තමන් වහන්සේ ම අවබෝධ කරගත්, ලෝක නායක වූ අතීදස්සී බුදු රජාණන් වහන්සේ චිනතා නදී තීරයට වැඩි සේක. එකල මම දියේ හැසිරෙන කැසුබුවෙක් වීමි. බුදුරජාණන් වහන්සේ ගඟින් එතෙර කරවනු කැමති වූ මම උන්වහන්සේ වෙත ගියෙමි. ''මහාමුනි වූ බුදුරජුනි ! මාගේ පිටට නගින්න. ලෝක සඤ්ඤා සසර දුකින් එතෙර කරවන ඔබ වහන්සේ, මේ ගඟින් එතෙර කරවන්නෙමි.'' යි යන මාගේ අදහස දැනගත් කීර්තිමත් අතීදස්සී බුදුහු මාගේ පිටට නැඟි සේක. යම් නැනක පටන් මට සිහිපත් කළ හැකි ද යම් භවයක මම ඤාණවන්ත බවට පැමිණියෙමි ද මේ කාලය තුළ ඔබවහන්සේගේ පාදස්පර්ශය ලැබූ මොහොතෙහි මා ලැබූ සුවය බඳු සැපක් නම් නොලැබුවෙමි. මහත් යශස් ඇති අතීදස්සී බුදුහු ගංතෙර සිට මෙසේ වදාළහ. ''මේ ගඟෙහි සෑඩ පහර තරණය කරමි''යි පැමිණි මාගේ සිත දත් මෙම කැසිබු රජු මා ඉන් එතෙර කර වූයේය. මොහු බුදුන් එතෙර කරවූ පිනින් ද මෙත් සිත් ඇති බැවින් ද කල්ප දහ අටක් දෙව් සැප විඳින්නේය. එම කුසලය නිසා දෙව්ලොවින් චුතව බුදුසස්නක පැවිදිව සැක සංකා නම් සෑඩ පහර තරණය කරන්නේය.'' මෙසේ වදාළ බුදු වදන් ඇසූ මම; සරු කෙතක රෝපිත ස්වල්ප වූ බිජුවට මැනවින් වැසි වැටී මහත් ශස්‍ය ඵලයක් ලැබීමෙන් සතුටුවන ගොවියකු මෙන් බුදුන්ගේ වදන් නැමති වැසි දිය වැටුණු මාගේ පුණ්‍යඵලය මා සිත තුටු කරන්නේය. ඒ මම දැන් ප්‍රධන් වීර්යයෙහිම යොමු කළ සිත් ඇත්තෙමි. උපශාන්ත වූයෙමි. උපධි රහිත වූයෙමි. සියලු ආශ්‍රව මැනවින් දැන ආශ්‍රව රහිතව වෙසෙමි. එසේ ඇති මම මීට පෙර කල්ප දහ අටකට පෙර යම් කුසලයක් කළෙමි ද එහි බලයෙන් දුගතියක් නුඳුටුවෙමි. බුදුරදුන් ගඟින් එතෙර කිරීමේ පින එබඳුය.''

''මවිසින් සියලු කෙලෙස් නසන ලදී. සියලු භවයන් නැසුවෙමි. බැඳුම් සිඳ සුවසේ වෙසෙන් ඇත් රජෙකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම යහපත් වූවක්ම විය. ත්‍රිවිද්‍යාවන් ලැබූ මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. සිවුපිළිසිඹියාවන් ද අෂ්ට විමෝක්ෂයන් ද ෂඩ් අභිඥාවන් ද මැනවින් සාක්ෂාත් කරන ලද්දෙමි. බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5177-5192)

මෙසේ රහත් බවට පත්ව භාග්‍යවතුන් වහන්සේ කපිල වස්තුවෙහි වැඩ වාසය කරන කාලයේදී, එහි ගොස් උන්වහන්සේට වැඳ, භික්ෂූන් වහන්සේලා සමඟ එක් වූ වනවච්ඡ තෙරණුවෝ පිළිසඳර කරාවෙහි යෙදුණු සේක. ඒ භික්ෂූන් විසින් ''ඇවැත්නි !, කිම වන අරණ පහසු විහරණයට යෝග්‍යද ?''යි විචාළ විට ''ඇවැත්නි !, කැළයේ පර්වත ඉතා දැකුම්කලු යැ''යි පවසමින් තමන් වහන්සේ වාසය කළ වන පර්වතය වර්ණනා කරමින් ''**නීලබහවණණා**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**නීලබහවණණා**'' යනු නිල්වලා බඳු ශෝභාව ඇති, නිල්වලා බඳු පිහිටීම් ඇති; ''**රුචිරා**'' යනු මනහර වූ කටයුතුවලට උචිත වූ පැහැපත් වූ; ''**සිතවාරී**'' යනු සීතල ජලය ඇති, ''**සුචින්ධරා**'' යනු ඉතා පිරිසිඳු භූමිභාග ඇති බැවින් පිරිසිඳු සිත් ඇති ආර්යයන්ට වාසය පිණිස සුදුසු වන බැවින් මනහර වූ ගාථාවේ පහසු උච්ඡාරණය පිණිස අනුනාසික සහිතව (බිඳුව සහිතව) මෙසේ ද පාඨයක් ඇත. ''**සීතං වාරිසුචින්දරා**'' එහි අර්ථය මෙසේය. ''සීතල පිරිසිදු ජල දහර සිසිල් නිර්මල නදියට ගලා යයි.'' ''**ඉන්දගොපක සඤ්ඡනනා**'' යනු ඉන්දගෝපක - උදුගොටුවෝ නම් පබළු බඳු වූ රතුපාට පණුවන්ගෙන් ගැවසුණු එසේ ඔවුන් ඉතා බහුල වූ කාලයක් බැවින් මෙසේ කියන ලදී. ඇතැමිනු ඉන්‍දගෝපක නම් රතු තණ විශේෂයකැයි කියති. තවත් අය කිණිහිරි ගස් යැයි කියති. ''**සෙලා**'' යනු ගල් වලින් වැසුණු පර්වතයි. පස් සහිත කඳු නොවේ යන අර්ථයයි. එනිසා ''**යථාපි පබ්බතො සෙලො**'' (ශෛලමය පර්වත මෙන්) යැයි කියන ලදී. ''රමයන්ති මං'' යනු මගේ සිත අලවයි. මා හට විවේකයෙහි ඇල්ම වැඩි දියුණු කරවයි. මෙසේ තෙරුන් වහන්සේ; තමාගේ බොහෝ කාලයක් මුලුල්ලෙහි වඩන ලද ''වන වාසයේ ඇල්ම'' ප්‍රකාශ කරන සේක් ත්‍රිවිධාකාරයකින් විවේකයේ ඇලීමට දක්වූ සේක. එහි උපධි විවේකයෙන් රහත් බව ප්‍රකට කරන ලදැයි දත යුතුයි.

වනවච්ඡ ථේර ගාථා අර්ථ විවරණාව නිමියේය.

එහි පර්වත දෙකක් අතරෙහි වැඩහුන් වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ දැක, පැහැදුණු සිතින් උන්වහන්සේ සමීපයට ගොස් වැඳ, ඇදිලි බැඳගෙනම සිටියේය. නැවත එම වනයේ තිබූ මනහර ඇත්දෙමව ගෙඩි දැක, එම ගෙඩි කඩා බුදුරදුන්ට පිදූවේය. බුදුපියාණන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් එම ගෙඩි පිළිගත් සේක. ඔහු ඒ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරි සරන්නේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි මිනිස් භාවයක් ලබා තම මාමා සමඟම පැවිදි වී නිර්වාණය පතාගෙන බොහෝ කුසල් රැස් කළේය. අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ පහළ වූ කාලයෙහි ඔහු, වනවච්ඡ තෙරුන්ගේ බෑණා වී උපන්නේය. ඔහුට ''සීවක'' යන නම තැබීය. ඔහුගේ මව ''තම වැඩිමල් සොයුරා වූ වනවච්ඡ, සසුනෙහි පැවිදිව, මහණකමේ කටයුතු නිමවා කැළයේ සුවසේ වසන්නේයැ''යි අසා තම පුතුට මෙසේ කීවාය. ''දරුව සීවකය ! තෙරුන් සමීපයේ පැවිදි වී උන්වහන්සේට උපස්ථාන කරන්න. දැන් වනවච්ඡ තෙරණුවෝ ඉතා මහලු වූවෙකි.'' ඔහු මවගේ එම වදන ඇසූ පමණින්ම පෙර සසරේ කරන ලද පුරුදුතාවය නිසා මාමා වූ තෙරුන් ළඟ පැවිදි විය. උන්වහන්සේට උපස්ථාන කරමින් වනයෙහි ම වාසය කළේය. එම සාමණේරයෝ කිසියම් කටයුත්තකට ගමට වැඩම වූ කල්හි, උන්වහන්සේට දරුණු ආබාධයක් හට ගත්තේය. ගමේ මිනිස්සු ද බෙහෙත් ආදිය කළ නමුත් එම ආබාධය සුව නොවිණි. සාමණේර නම පමාවනු දුටු තෙරුන් වහන්සේ, ''සාමණේරයන් වහන්සේ පමාවනුයේ කවර කරුණකින්ද ?''යි සිතා, එම ගමට ගොස්, ඔහුගේ දැඩි ගිලන් බව දැක කළ යුතු යම් යම් කටයුතු කරමින් දිවා කාලය ගත කළ සේක. රාත්‍රී කාලයේදී ඉතා අලුයම් වේලෙහි තෙරණුවෝ, ''සීවකය ! මම පැවිදි වූ දා සිට මේ දක්වා ගමෙහි රෑ ගත නොකළෙමි. එනිසා දැන් මම කැළයට යන්නෙමි''යි පැවසූහ. එය ඇසූ සීවක සාමණේරයන් ද ''ස්වාමීනි ! මගේ ද කය පමණක් ගමේ ඇත. සිත වනාහි ඇත්තේ කැළයේමය. එනිසා නිදාගෙනම කැළයට යන්නෙමි''යි පැවසීය. එය ඇසූ තෙරුන් වහන්සේ ඔහුගේ අත අල්ලාගෙන කැළයටම ගෙන ගොස් අවවාද දුන් සේක. සාමණේරයෝ එම තෙරුන්ගේ අවවාදයෙහි ම පිහිටා සිට, විදසුන් වඩා රහත් බවට පත්වූහ. එම විස්තරය අපදාන පාළියේ මෙසේ දැක්වේ. (අපදාන පාළි I , කාසුමාරි ඵලදායක තෙරාපදානං)

''කඳු අතරෙහි කිණිහිරි රුකක් මෙන් බබලමින් වැඩ සිටියා වූ කෙලෙස් දුවිලි ඉවත ලූ ලෝකයාටම ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ කෙරෙහි පහන් සිත් ඇති මම සොම්නස් වූයෙමි, හිසෙහි ඇදිළි බැඳගෙන ඇත් දෙමට ඵල කඩාගෙන බුදුරදුන්ට

පූජා කළෙමි. මිට කල්ප තිස් එකකට පෙර යම් ඵල දායනයක් දුන්නෙමි ද එහි විපාක ලෙස මම දුගතියක නූපදුනෙමි. ඒකාන්තයෙන් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වෙත පැමිණි මාගේ ගමන යහපත් වූවකි. ත්‍රිවිද්‍යා ලැබූ මම බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදි. සියලු භව නසන ලදි. - පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටුකළෙමි.'' (3272-3277)

උන්වහන්සේ රහත් බවට පත්ව; උපාධ්‍යායන් වහන්සේ විසින් තමාට දේශනා කළ අවවාද සසඳා බලා - තමාගේ විවේකයේ ඇලීම ද කළ කටයුතු ඇති බවද ප්‍රකාශ කරමින් ''**උපජ්ඣායො මං අවචා**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**උපජ්ඣායො**'' යනු හරි වැරදි නැවත නැවත සිහිපත් කරයි, හිතෛෂීභාවය උපදවා නැණසින් බලයි යන අරුතින් ''උපාධ්‍යාය'' නම් වේ. ''**මං**'' යනුවෙන් තමන් වහන්සේ දක්වයි. ''**අවචා**'' යනු දේශනා කළ සේක. ''**ඉතො ගච්ඡාම සීවක**'' යනු කියන ලද ආකාරය දැක්වීමයි. ''සීවකය !, එන්න මේ ගමෙන් නික් මී ආරණ්‍යයටම යමු. ඒ කැළයම අපගේ වාසයට යෝග්‍ය වේ'' යන අදහසයි. මෙසේ උපාධ්‍යායන් වහන්සේ වදාළ විට සීවක සාමණේරයෝ ඉතා කිකරු වූ යහපත් අජානීය අශ්වයකු මෙන් කශයෙන් පහර ලැබ හටගත් සංවේග ඇති වූයේ ආරණ්‍යයටම - වනයටම යනු කැමැති බව ප්‍රකට කරමින්,

> ''**ගාමෙ මෙ වසති කායො, අරඤ්ඤං මෙ ගතං මනො**
> **සෙමානකො'පි ගච්ඡාමි, නත්ථි සඞ්ඛා විජානතං**'' යනුවෙන් පැවසූහ.

එහි අර්ථ මෙසේය. ''යම් හෙයකින් දැන් මගේ සිරුර පමණක් ගමෙහි පවතී, සිත වනාහි වනයට ම ගියේ වේද එහෙයින් සයනය කරන්නෙම් නමුදු වනයට ම යමි. ගිලන් බව නිසා සයනය කරමින් සිටි සාමණේරයෝ; හිඳගෙන හෝ සිටගෙන යාමෙහි අසමත් වෙති. ''සයනය කරමින් ම, මේ නිදා සිටින ඉරියවුවෙන්ම සර්පයකු මෙන් ඇදෙමින්, ස්වාමිනි ! එන්න වනයට ම යමු.'' කුමක් නිසාද ? ''**නත්ථි සඞ්ඛා විජානතං**'' යනු කාමයන්හි ද සංසාරයෙහි ද ආදීනව මෙන්ම යථාස්වභාව ධර්මය ද නික්මීමෙහි හා නිර්වාණයෙහි අනුසස් ද තත්වූ පරිදිම දන්නා බැවින් මා හට කිසිඳු නැනක ඇලීමක් නැත. එනිසා උපාධ්‍යායන් වහන්සේගේ ප්‍රකාශය ඇසූ වනම, එය පිළිගෙන සිටියේ, එම උපදේශයේ පිහිටා රහත් බව ප්‍රකාශ කරන ලදී.

සීවක සාමණේර ථේර ගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.5

''පඤ්ච ඡන්දෙ පඤ්ච ඡහෙ'' යනු ආයුෂ්මත් කුණ්ඩධාන තෙරුන් වහන්සේගේ ගාථාවකි. එහි උපත කෙසේද ? එම තෙරුන් පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සමයෙහි හංසවතී නුවර කුල ගෙදරක ඉපිද වැඩිවියට පැමිණියේය. එම තරුණයා ද භාග්‍යවතුන් වහන්සේ වෙත පෙර පැවසූ පරිදිම අවුත් ධර්ම දේශනාවක් අසන්නේ, ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුව පළමුව සළාක ගන්නවුන් අතුරින් අග්‍රස්ථානයෙහි තබනු දුටුවේය. ඔහු එම තනතුරම ප්‍රාර්ථනා කරමින් ඊට අනුරූප වූ පින් දහම් සිදු කරමින් ජීවත් විය. ඔහු එක් දිනක් පදුමුත්තර බුදුරජාණන් වහන්සේ, නිරෝධ සමාපත්තියෙන් නැගිට සිටි කල්හි; රත් සිරියල් කුඩු ඉසින ලද මෙන් රතුපාට වූ මහත් වූ කෙසෙල් කැනක් ගෙන උන්වහන්සේට පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන පරිභෝග කළසේක. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් එකොළොස් වරක් ශක්‍ර දේවේන්ද්‍රයාව උපන්නේය. විසිහතර වාරයක් සක්විති රජකම ලැබුවේය. මෙලෙස ඔහු නැවත නැවතත් පින් දහම් කරමින් දෙව් මිනිස් දෙගතියෙහිම සැරිසරනුයේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි භූමිගත දෙවියෙක්ව උපන්නේය. දීර්ඝායුෂ්ක බුදුවරුන්ගේ කාලවලදී අඩමසක් පාසා පොහොය කිරීමක් සිදු නොවේ. එසේමැයි. විපස්සි බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි වර්ෂ හයකට වරක් පොහොය කිරීම සිදුවිය. කස්සප බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි වර්ෂ හයකට වරක් පොහොය කිරීම සිදුවිය. කස්සප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි මාස හයකට වරක් ප්‍රාතිමෝක්ෂය උදෙසීමට රැස්වීම සිදුවිය. එලෙස පාමොක් උදෙසීමට රැස්වන කාලයේදී පිටිසර වැසි යහළු භික්ෂූහු දෙනමක් එක්ව ''පොහොය කරන්නෙමු''යි නගරය බලා පිටත් වූහ. මේ භූමිගත දෙවියා මෙසේ සිතිය.'' මේ භික්ෂූන් වහන්සේලා දෙනමගේ මිත්‍රත්වය ඉතා දැඩි වූවකි. මේ දෙදෙන ඔවුනොවුන් බිඳවිය හැකිද ? නොහැකිද ? යි සිතමින්, ඒ භික්ෂූන්ගේ අටසරයක් අපේක්ෂා කරමින් ඔවුන් සමඟම ගියේය. ඉක්බිති එක් තෙර නමක්, තම සිවුර යහළුවාගේ අතෙහි තබා ශරීර කෘත්‍ය කිරීමට දිය ඇති තැනකට ගොස්, සේදූ අත් පා ඇතිව වන ලැහැබින් නික්මී පැමිණියේය. බිම් වැසි දෙවියා ද එම තෙරුන්ගේ පසු පසින් ඉතා දැකුම්කළු ස්ත්‍රී රූවක් මවාගෙන, කේශ කලාපය කඩා විසුරුවාගෙන, කථා බස් කරගෙන සම්බන්ධ වූ බවක් පෙන්වමින්, පිටෙහි පස් පිස දමමින්, හැඳි සළුව නැවත නැවත සකසමින් තෙරුන්ගේ පසුපසින් ම වන ලැහැබින් නික්මුණේය. එකත් පසෙක සිටි යහළු තෙරුන් වහන්සේ මෙම සිදුවීම දැක, දොම්නසට පැමිණියේ ''මේ

භික්ෂුව සමඟ බොහෝ කාලයක් නිස්සේ පැවති විශ්වාසය දැන් නැසුණේය. ඉදින් මොහු මෙබඳු පව්ටෙකැයි දැන්නේ නම් මේ සා දිගු මාඵතෙහි මොහු සමඟ නොඑන්නෙමි''යි සිතා, ළඟට පැමිණි එම තෙරුන්ට, ''ඇවැත්නි! නුඹගේ පා සිවුරු ටහා ගන්න. නුඹ වැනි පාපියෙකු සමඟ එක මාඵතක නොයමි'' යි පැවසූහ. එම කථාව ඇසූ, ඒ පාපයට ලැජ්ජා ඇති භික්ෂුවගේ හඳවත තියුණු සැනකින් විදින්නාක් මෙන් විය. ඉක්බිති උන්වහන්සේ තම යහළු තෙරුන්ට, ''ඇවැත්නි ! නුඹ වහන්සේ පවසනුයේ කුමක්ද ? මම මෙපමණ කාලයක් දුක්ක ටාපත්තියකට පත් වූ බවක්වත් නොදනිමි. නුඹ මට අද ''පාපියෙකි'' යි කියන්නේය. නුඹ වහන්සේ දුටුවේ කුමක්ද ?'' යි පැවසීය. එබස් ඇසූ අනික් තෙර නම ''අනිකක් කුමට දකින්නේද ? නුඹ මෙවැනි අලංකාර වූ ස්ත්‍රියක් සමඟ එකතැනක හිඳ මෙහි පැමිණියේ නොවේද?'' යි ප්‍රශ්න විචාළේය. එවිට නිර්දෝෂී භික්ෂූන් වහන්සේ, ''ඇවැත්නි! එබඳු දෙයක් ම විසින් නොකරන ලදී. මෙබඳු වූ ස්ත්‍රියක් මා නම් නුදුටුවෙමි''යි තෙවැනිවර දක්වා ම සිය නිදොස් බව ප්‍රකාශ කළත්, අනික් තෙරනම එය නොපිළිගත්තේය. තමන් වහන්සේ දුටු කරුණ ම සත්‍ය ලෙස පිළිගත් උන්වහන්සේ යහළු තෙරුන් සමඟින් එක මඟක නොයා, වෙනත් මඟකින් උන්වහන්සේ ශාස්තෘන් වහන්සේ වෙත ගියහ. අනික් භික්ෂුව ද වෙනත් මඟකින් ශාස්තෘන් වහන්සේ වෙතටම පැමිණියේය. ඉක්බිති භික්ෂු සංඝයා පොහෝ කරන සීමා ගෙයට (පොහෝ ගෙයට) පිවිසෙන වේලාවෙහි එම භික්ෂුව, ස්ත්‍රිය සමඟ පැමිණි භික්ෂුව ද එම සඟ පිරිසෙහි සිටිනු දැක, ''මේ පොහෝ සීමාවේ මෙබඳු පාපී භික්ෂුවක් සිටියි. මම ඔහු සමඟ පොහොය නොකරමි''යි කියා සීමාවෙන් පිටතට ගියේය. එවිට භූමි වැසි දෙවියා, ''ම විසින් කළ දේ ඉතා බැරෑරුම් වූවකි''යි දැන මහලු උපාසකයකුගේ වේශයක් මවාගෙන උන්වහන්සේ වෙත පැමිණියේය. ''ස්වාමීනි ! ඔබ වහන්සේ කුමක් නිසා මෙතැන සිටින්නේද ?''යි ඇසූ එම දෙවියාට තෙරුන් වහන්සේ, ''උපාසකය ! මේ පොහොය ගෙට එක් පාපී භික්ෂුවක් ඇතුළු විය. ''මම ඔහු සමඟ පොහොය නොකරමි''යි කියා ඉන් නික්ම පිටත සිටියෙමි.'' යි වදාළහ. එවිට දෙවියා, ''ස්වාමීනි ! මෙසේ එය පිළිනොගනු මැනවි. ඒ භික්ෂුව ඉතා පිරිසිදු සිල් ඇත්තෙකි. නුඹ වහන්සේ දුටු ස්ත්‍රිය වෙනත් අයෙකු නොව මම ම වෙමි. මවිසින් නුඹ වහන්සේලා විමසීම සඳහා 'මේ දෙදෙනා වහන්සේගේ මිත්‍රභාව ඉතා දැඩි වූවක් ද ? එසේ නොවූවක්ද ?''යි ලජ්ජි, අලජ්ජී භාවයන් බලා ගැනීම පිණිස එම ක්‍රියාව කළෙමි.''යි සියලු කරුණු හෙළි කළේය. එවිට එම තෙරුන්, ''සත්පුරුෂය ! නුඹ කවරෙක්ද ?'' යි ඇසීය. එවිට දෙවියා, ''ස්වාමීනි ! මම එක් භූමි වැසි දෙවියෙක්මි''යි කියමින්ම දිව්‍යාත්ම භාවයෙහි සිටගෙන තෙරුන්ගේ පා මූල වැටී, ''ස්වාමීනි !

මට සමාවන්න. මේ වරද එම තෙරුන් නොදනියි. උන්වහන්සේ සමඟ එක්ව පොහොය කරන්න''යි ඉල්ලීය. ඒ ඉල්ලීම අනුව එම තෙරුන් වහන්සේ පොහොය ගෙට පිවිස, යහළු තෙරුන් සමඟ එකතැන හිඳ පොහොය කළ සේක. නමුත් මිනුස්ස වශයෙන් නැවත උන්වහන්සේ සමඟ එක නැන නොවිසීය. එම තෙරුන්ට සිදු වූ පුවත ද නොදන්වීය. පාරාජිකාපත්තියෙන් චෝදනා ලද භික්ෂුව විදසුන් වඩනුයේ නොබෝ දිනකින් ම රහත් ඵලයෙහි පිහිටියේය.

ඒ භූමිවැසි දෙවියා ඒ පාප කර්මයේ විපාක වශයෙන් එක් බුද්ධාන්තරයක්ම අපායෙහි දුක් වින්දේය. යම්කිසි කලෙක මනුෂ්‍යත්වයකට පත්වේද, එවිට අන් පුද්ගලයන් කරන වැරදි ඔහු මතම වැටේ. එම වැරදිවලට ඔහු ම හසුවේ. අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සැවැත් නුවර බ්‍රාහ්මණ පවුලක උපන්න ඔහු ''ධාන මාණව''නමින් ප්‍රකට විය. ඔහු වැඩිවියට පත්ව ත්‍රිවේද පාර ප්‍රාප්තව තුරුණු විය ගෙවා මහලු වූ කාලයේදී ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා, තබන ලද ශ්‍රද්ධාව ඇතිව සසුනෙහි පැවිදි වී උපසම්පදාව ලැබීය. උන්වහන්සේ උපසම්පදාව ලැබූ දවසේ සිටම ගමට පිවිසෙන කල්හිදී, ගමින් බැහැරවන කල්හිද අලංකාරව සැරසුණු ස්ත්‍රියක් උන්වහන්සේගේ පසුපසින් එන්නීය. විහාරයට පිවිසෙන කල්හි ද ඇය, උන්වහන්සේ සමඟම පිවිසේ. සිටින කල්හි සිටී. මෙසේ නිතරම ස්ත්‍රිය හා එක්ව වසන බවක් සෙසු මිනිසුන්ට පෙනේ. ඒ ස්ත්‍රිය තෙරුන්ට නොපෙනේ. උන්වහන්සේ පෙර අත්බවේ කල පාප විපාක වශයෙන් අනුන්ට පමණක් ඇය පෙනේ. ගමෙහි කැඳ බත් පිරිනමන ස්ත්‍රීහු, ''ස්වාමීනි, මේ කැඳ හැන්ද නුඹ වහන්සේටය. මේ කැඳ හැන්ද අපගේ යෙහෙළියන්ටය''යි අපහාස කරමින් උන්වහන්සේට කැඳ බෙදති. ඉන් තෙරුන් වහන්සේ මහත් වූ වෙහෙසට, ලැජ්ජාවට පත්වෙති. විහාරයට ගිය විට සාමණේරවරු ද තරුණ පැවිද්දෝ ද උන්වහන්සේ පිරිවරාගෙන ''ධාන කොණ්ඩයෙක් වීය'' යනුවෙන් අපහාස කරති. මෙනිසා උන්වහන්සේ කුණ්ඩධාන තෙරුන් යැයි ප්‍රකට විය. උන්වහන්සේ නැගිට යනවිට ද සිටින විටද කරනු ලබන මේ විහිළු තහළු ඉවසීමට නොහැකිව, උමතුවක් ගෙන, ''නුඹලා කොණ්ඩයෝය. නුඹලාගේ උපාධ්‍යායවරු කොණ්ඩයෝය. නුඹලාගේ ආචාර්‍යවරු කොණ්ඩයෝය.''යි බාල පැවිද්දන්ට අක්‍රෝශ පරිභව කළහ. එවිට ඔවුහු ශාස්තෘන් වහන්සේට මෙසේ දන්වූහ. ''ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්ස, මේ කුණ්ඩධාන තෙරුන් ළඳරු සාමණේරවරු සමඟ මෙබඳු පරුෂ වචනය කියන්නේය.'' ශාස්තෘන් වහන්සේ එය අසා, ''එසේනම් ඔහු කැඳවන්න''යි එම තෙරුන් කැඳවා,

''ධානය ! නුඹ සාමණේරවරුන් සමඟ මෙවැනි පරුෂ වදන් කථා කරනවා යැයි පැවසීම ඇත්තක්ද ?''යි ඇසූ සේක. උන්වහන්සේ, ''ස්වාමීනි එය ඇත්ත''යැයි පිළිගත් කල්හි; ''එසේ පරුෂ වදන් කියන්නේ ඇයි ?'' දයි විචාළ සේක. කුණ්ඩධාන තෙරුන්, ''ස්වාමීනි ! නිතර මා වෙහෙසට පත් කිරීම ඉවසිය නොහැකිව මෙසේ පරුෂ වදන් කිවෙමි''යි පැවසීය. එවිට බුදුපියාණන් වහන්සේ, ''නුඹ පෙර කරන ලද පාප කර්මය අද දක්වාම ක්ෂය කරගත නොහැකිව සිටින්නෙහිය. නැවත පරුෂ වදන් කියමින් භික්ෂූන් නිසා තවත් පවු රැස් කරගන්නෙහිද ?''යි අසා, ''මින් පසුව පරුෂ වදන් නොකියා නිහඬව සිටින්න''යි වදාළ සේක.

''කිසිවකුට රළු පරළු බසක් නොකියන්න. නුඹ රළු බස් කී විට එම තැනැත්තා නැවතත් නුඹට රළු බස් කියයි. මෙසේ එකට එක කියා ගැනීම දුක පිණිසම පවතී. විරුද්ධකාරයා තරහ කාරයෝ මෙනිසා ඔබ හා ගැටෙති.''

''ඉදින් වටින් කඩා දමූ ලෝහ තලියක් නිශ්ශබ්දව නිබෙන්නාක් මෙන් නුඹ ද කෙලෙස් ගිනි නිවා නිෂ්ශබ්ද වී නිර්වාණයට පැමිණ නිශ්චල වූයේ නම් නුඹට එකට එක කියා ගැනීමක් හෝ කිරීමක් නොපවතී.'' (ධම්මපද - දණ්ඩවග්ග)

මේ තෙරුන් වහන්සේ ස්ත්‍රියක් සමඟ හැසිරෙන බව කොසොල් රජුට ද ආරංචි විය. රජු ''යවු කොල්ලණි ! විමසා බලවු'' යි ජනයා යවා, තමාද මද පිරිවර ඇතිව තෙරුන් වසන තැනට ගොස් එක් පසෙක බලාගෙන සිටියේය. ඒ මොහොතෙහි තෙරුන් වහන්සේ සිවුරක මසමින් සිටිසේක. ඒ ස්ත්‍රිය ඒ අසළින්ම සිටින බව පෙනුනේය. රජු ඒ දැක, ''මේ කරුණ ඇත්තක්ද ?'' යි බැලීමට ඈ සිටින තැනට ගියේය. රජු ඉදිරියට එනවිට ඇය තෙරුන් වසන ඇතුළු කුටියට යන ආකාරයක් දක්වූවාය. රජු ද ඈ ගිය කුටියට ම ඇතුළු වී සෑම තැනම සෙවූ නමුත් ස්ත්‍රියක් නොලැබුණි. මේ පිළිබඳ විමසූ රජතුමා, ''මැය ස්ත්‍රියක් නොවේ. මේ තෙරුන්ගේම එක් කර්ම විපාකයකි''යි දැන; මුලින් පැමිණෙද්දි තෙරුන්ට නොවැඳ ඇතුළට පිවිසි හෙයින් ද දැන් උන්වහන්සේම කළ චෝදනාව අසත්‍ය බව වැටහුණු හෙයින් ද ඉදිරියට අවුත් තෙරුන්ට වැඳ එකත්පසෙක සිටියේය. ''ස්වාමීනි! නුඹ වහන්සේ ආහාර පාන ලැබීමෙහි වෙහෙසට පත්වනුයේ නොවේද?''යි රජු ඇසීය. එවිට තෙරුන් ''එසේය, මහරතුමනි !''යි පිළිතුරු දුන්නේය. ''ස්වාමීනි ! මම මෙබඳු කිලුටක් සහිතව වෙසෙන ආර්යයන් වහන්සේලාගේ දුක දනිමි. මෙසේ ස්ත්‍රියක් සමඟ හැසිරෙන නුඹ වහන්සේ දැක කවරෙක්

නම් පැහැදී දන් දෙයිද ? මෙතැන් පටන් නුඹ වහන්සේ කිසි තැනක නොයන මැනවි. මම සිවුපසයෙන් ම නුඹ වහන්සේට උපස්ථාන කරමි. නුඹ වහන්සේ නොපමාව යෝනිසෝ මනසිකාරයෙහි යෙදෙමින් වීර්ය වඩනු මැනවි'' යි පැවසූ රජු නිති දන් වැට පිහිටුවා මාළිගයට ගියේය.

තෙරුන් වහන්සේ මෙසේ රජුගේ උපස්ථාන ලැබ, සිවුපසය මැනවින් ලැබුණු බැවින් එකඟ වූ සිත් ඇතිව, විදසුන් වඩා රහත් ඵලයෙහි පිහිටියහ. රහත් වූ තැන් පටන් ඒ ස්ත්‍රිය ද අතුරුදහන් වූවාය.

එකල්හි මහා සුභද්‍රාව උග්ග නුවර මිසදිටු පවුලක වසන්නී. ''ශාස්තෘන් වහන්සේ මට අනුකම්පා කරන සේක්වා !''යි පොහොය අටසිල් සමාදන් වූවා, මස්මාංශයන්ගත් වැළකී මතු මහල් තලයෙහි සිටියාය. ''මේ මල් සමූහය අතරක නොරැඳී, ගොස් බුදුරදුන්ගේ මස්තකයෙහි වියනක් වී සිටිවා. දසබලයන් වහන්සේ එම සංඥාවෙන් හෙට පන්සීයක් භික්ෂූන් වහන්සේලා සමඟ මගේ දානය පිළිගනිත්වා''යි සත්‍යක්‍රියා කොට, දෑසමන් මල් අට මිටක් විසි කළාය. එම මල් අහසින් ගොස් බුදුපියාණන් වහන්සේ දම් දෙසන ස්ථානයේ උඩුවියනක්ව සිටියේය. ශාස්තෘන් වහන්සේ එම දෑසමන් මල් වියන දුටු සේක්; සුභද්‍රාවගෙ ආරාධනාව ඉවසා, දෙවැනි දින අරුණ නැගුණු කල්හි ආනන්ද තෙරුන් ඇමතූ සේක. ''ආනන්දය ! අද අපි ඉතා දුර ප්‍රදේශයකට දානය සඳහා යන්නෙමු. පුහුදුන් භික්ෂූන්ට නොව රහතන් වහන්සේලාට ම සලාක දෙන්න''යි. වදාළහ. තෙරුන් වහන්සේ භික්ෂූන්ට මේ බව දැන් වූ සේක. ''ඇවැත්නි !, ශාස්තෘන් වහන්සේ අද දුර ප්‍රදේශයකට දාවළ දානය සඳහා වැඩිති. පුහුදුන් භික්ෂූහු නොඒවා, ආර්යයෝ ම සලාක ගනිත්වා !''යි පැවසූ කල්හි කුණ්ඩධාන තෙරණුවෝ, ''ඇවැත්නි! මට සලාකයක් දෙන්න''යි පළමුවෙන්ම අත දිගු කළහ. එවිට ආනන්ද තෙරුන්, ''ඇවැත්නි ! ශාස්තෘන් වහන්සේ නුඹ වැනි භික්ෂූන්ට සලාක නොදෙන සේක, රහතුන්ට ම දෙන සේක''යි විතර්කයක් උපදවා ශාස්තෘන් වහන්සේ වෙත ගොස් මෙකරුණ දැනුම් දුන්නේය. ශාස්තෘන් වහන්සේ, ආනන්ද හිමියන්ට ''ගන්නවුන්ට සළාක දෙන්න''යි වදාළහ. තෙරුන්ට මෙසේ සිතුණි. ''කුණ්ඩධාන තෙරුන්ට සළාක දීම නුසුදුසුය. නමුත් ශාස්තෘන් වහන්සේ එය වළකන්නේය. (උන්වහන්සේට සළාක දීමට වදාරන්නේය). මෙහි කුමක් හෝ කරුණක් තිබිය යුතුයි'' යනුවෙනි. තෙරුන් ''කුණඩදාන තෙරුන්ට සළාකයක් දෙන්නෙමි''යි සිතා ගෙන නැවත භික්ෂූන් වෙත පැමිණියේය. කුණ්ඩධාන තෙරුන් වහන්සේ ආනන්ද හිමියන් පැමිණීමට පෙර ම, අභිඥාපාදක චතුර්ත්‍රධ්‍යානයට සමවැද සෘද්ධියෙන්

අහසෙහි වැඩහිඳිමින්, ''ආනන්දයණි ! මට සළාකයක් දෙන්න. ශාස්තෘන් වහන්සේ මා පිළිබඳව දන්නා සේක. මා වැනි භික්ෂුවක් පළමුවෙන් ම සළාකය ගැනීම කිසි කලෙකත් ශාස්තෘන් වහන්සේ නො වළක්වන සේක''යි පවසා අත දිගුකර සළාකයක් ගත් සේක. ශාස්තෘන් වහන්සේ මෙම සිදුවීම අරමුණු කරගෙන කුණ්ඩධාන තෙරුන් මේ සසුනේ පළමුව සළාක ගන්නා තෙරවරුන් අතුරින් අග තනතුරෙහි තැබූ සේක. මේ තෙරුන් වහන්සේ රජුගෙන් උපස්ථාන ලැබ සුදුසු ආහාර පාන ලැබීම නිසා සන්සුන් සිතැතිව, විදසුන් වඩා ලබන ලද හේතු සම්පත් ඇති සේක; ෂඩ් අභිඥාලාභී වූහ. එනිසා අපදාන පාළියේ එම විස්තරය මෙසේ දැක්වේ. (අපදාන පාළි I, කුණ්ඩධාන තෙරාපදානං)

''සතියක් නිරෝධ සමවතින් වැඩ සිටි, ලොව සියල්ල තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත්, අග්‍ර පුද්ගල වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වෙත මම පැමිණියෙමි. උන්වහන්සේට සමාපත්තියෙන් නැගී සිටි විට මම, කෙසෙල් කැනක් පූජා කළෙමි. ලෝක නායකයන් වහන්සේ එය පිළිගෙන මාගේ සිත පහදවමින් වැළඳූ සේක. අනුත්තර වූ සත්ත්වයන් සසරින් එතෙර කරවන්නා වූ බුදුරජාණන් වහන්සේ එය වළඳා තම අසුනෙහි වැඩ හිඳ මෙසේ වදාළ සේක.

''මෙම පර්වතයෙහි රැස් වූ යම් සත්ත්ව කෙනෙක් වේ නම් ඔවුහු ද ආරණ්‍යයේ මේ ධර්මය ඇසීමට සුදුසු භූතයෝ ද මාගේ වචනය අසත්වා. යමෙක් කේශර සිංහයෙකු මෙන් සර්වඥ වූ මා හට උපස්ථාන කළේ ද මම ඔහුට කවරෙක් දයි ප්‍රකාශ කරන්නෙමි. මාගේ එම වදන් අසවු. මෙතෙමේ මින් පසුව එකොළොස් වරක් ශක්‍රදේවේන්ද්‍රව උපදින්නේය. තිස් හතර වාරයක් සක්විති රජුව විඳින්නේය. මෙයින් කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ උපදින ගෝත්‍රයෙන් ගෞතම නම් වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සේක. එකල්හි මෙතෙම සිල්වත් රහතන් වහන්සේලාට ආකෝෂ කිරීමේ පාපයෙන් ''කුණ්ඩධාන'' යන නමක් ලබන්නේය. මොහු ඒ ගෞතම බුදුරදුන්ගේ ධර්මයට දායාද වූ ධර්මයෙන් නිර්මිත වූවාක් වැනි වූ ''කුණ්ඩධාන'' නම් ඖරස පුත්‍ර බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.''

''මම ප්‍රකර්ෂ විවේකයෙහි යෙදුනෙම්, ධ්‍යාන කරන සුලු වූයෙම් ධ්‍යානයෙහි ඇලුනෙම් ශාස්තෘන් වහන්සේ සතුටු කොට ආශ්‍රව රහිතව වෙසෙමි. අග්‍ර ශ්‍රාවක දෙනම පිරිවරා ගත් භික්ෂු සංඝයා මැද සිටි බුදුරජාණන් වහන්සේ සළාක ගැන් වූ සේක. සිවුර ඒකාංශ කරගෙන ලෝක නායක වූ

තථාගතයන් වහන්සේ ඉදිරියේ නැගී සිටි මම පළමු සළාකය ගත්තෙමි. ඒ ක්‍රියාව නිමිති කරගෙන දස දහසක් සක්වල කම්පිත කරන්නාවූ බුදුරජාණන් වහන්සේ මා අග්‍ර ස්ථානයෙහි තැබූ සේක. නිර්වාණය නම් යෝග ක්ෂේමභූමියට ගෙන යන ධුරවාහකයා නම් මාගේ වීර්යයි. මම මේ බුදු සසුනෙහි අටසන් සිරුර දරමි. සිවු පිළිසිඹියාවෝ -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කලෙමි. (1003-1018)

මෙසේ මහානුභාව සම්පන්න වූ මේ තෙරුන් වහන්සේගේ ගුණ නොදත් පුහුදුන් භික්ෂූහු එදා පළමු සළාකය ගන්නා විට "මේ කිම්ද ?"යි යන අවඥා සගහත එකම සිතක් දුරුහ. ඔවුන්ගේ සැක සංකා දුරු කරනු සඳහා තෙරුන් වහන්සේ අහසට පැන නැගී, සෘද්ධිමත් පෙළහර දක්වා රහත් මාර්ග ඥානයෙන් ම තමා ලැබූ රහත් බව ප්‍රකාශ කරන සේක. "පඤ්ච ඡින්දෙ" යන ගාථාව වදාළහ.

එහි "පඤ්ච ඡින්දෙ" යනු අපායෙහි ඉපදීම ඇති කරන පඤ්ච ඕරම්භාගිය සංයෝජනයන්, පයේ බැඳි රැහැනක් ඇති පුරුෂයෙක් එය සැනකින් කපා දමන්නාක් මෙන් වීර්යවන්ත භික්ෂුව සෝවාන් ආදී මාර්ග තුනින් එම සංයෝජන පස සිදින්නේය. දුරුකරන්නේය. "පඤ්ච ජහෙ" යනු ඉහළ දිව්‍ය ලෝකෝත්පත්තිය ගෙන දෙන පඤ්ච උද්ධම්භාගිය සංයෝජන, පුරුෂයෙකුගේ බෙල්ලේ බැඳි රැහැනක් මෙනි. එය අර්හත් මාර්ගයෙන්ම දුරු කරන්නේය. සිද දමන්නේය යන අර්ථයයි. "පඤ්ච චුත්තරිභාවයෙ" යනු එම උද්ධම්භාගිය සංයෝජන දුරු කිරීමෙන් ශ්‍රද්ධාදී පස් ඉන්ද්‍රියන්ට වඩා ඉහළ අනාගාමී මාර්ගාවබෝධය ද ඊට ඉහළ වූ අග්‍රමාර්ග නම් වූ අර්හත් ඵලය ද වඩන්නේය. "පඤ්ච සඞ්ගාතිගො" යනු මෙබඳු වූ පසක් වූ රාග, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨි යන සංසයන්ගේ අතික්‍රමණයෙන් හෙවත් ඉක්මවීමෙන්, ප්‍රහාණයෙන් පංච සංගයන් ඉක්මවා "භික්ඛු ඔඝතිණ්ණාති වුච්චති" යනු "සර්ව ප්‍රකාරයෙන්ම කෙලෙස් සිඳ බිඳ දමන ලද බැවින් "භික්ඛු" නම් ලද භික්ෂුව (රහතන් වහන්සේ) කාම, භව, දිට්ඨි, අවිද්‍යා යන සතර ඕඝයන් (සැඩ ප්‍රහාරයන්) තරණය කොට, ඒවායේ එතෙර පිහිටි නිර්වාණයෙහි පිහිටියේ යැයි කියනු ලැබේ." යන අර්ථයයි.

කුණ්ඩධාන ථේර ගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.6

''යථාපි භද්‍රෝ ආජඤ්ඤෝ'' යනු ආයුෂ්මත් බෙලට්ඨ සීස තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කාලයේ උසස් කුළයක ඉපදී, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ධර්මය අසා, ලබන ලද ශ්‍රද්ධාව ඇතිව පැවිදි වී මහණදම් පිරූ නමුත් උපනිශ්‍රය සම්පත් නැති බැවින් ආර්ය ගුණ විශේෂයක් උපදවා ගැනීමට නොහැකි වූහ. නමුත් නිවණ අරමුණු කරගෙන බොහෝ පින්දහම් සිදු කරගත් බැවින් දෙව් මිනිස් දෙගතියෙහි හැසිරෙන කල්හි; මෙයින් කල්ප තිස් එකකට පෙර දී වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ දැක - පැහැදි උන්වහන්සේට නාරන් ගෙඩියක් පූජා කළේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් ලොව ඉපිද, තව තවත් පින් දහම් රැස්කර සුගතියෙන් සුගතියට පත් වෙමින් සිට, අප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර එක් බමුණු ගෙදරක උපන්නේය. ඉපිද භාග්‍යවතුන් වහන්ස් බුද්ධත්වය ලබා ගැනීමට පෙර කාලයේදී උරුවේල කාශ්‍යප තාපසතුමා ළඟ තවුස් පැවිද්දෙන් පැවිදිව ගිනි පුදමින් සිටියේය. බුදුරජාණන් වහන්සේ උරුවෙල කාශ්‍යප දමනය කරමින් ආදිත්ත පරියාය සූත්‍ර දේශනාව පැවැත් වූ කල්හි පැරණි ජටිලයන් දහස සමඟම රහත් බවට පත්විය. මෙම විස්තරය අපදාන පාළියේ ගාථා වලින් ද දැක්වේ. එහි සිංහලාර්ථය මෙසේය. (අපදාන පාළි II - මාතුලුඞ්ගඵලදායක තෙථරාපදානං) ''පණ්ණරසි දිනයේ (පසළොස්වක දා) සඳ මෙන් බබලන, කිණිහිරි රුකක් වැනි වූ පහන් ගසක් මෙන් දිලිසෙන ලෝක නායක වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ කෙරෙහි පහන් සිත් උපදවා දක්ෂිණාර්හ වූ ප්‍රාඥ වූ ශාස්තෘන් වහන්සේට මම නාරන් ගෙඩියක් පිදුවෙමි. එදා සිට, මෙයින් කල්ප තිස් එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නො ඉපදුනෙමි. ඵලදානයේ විපාකය එබඳුය. ම විසින් කෙලෙස් දවන ලදී. සියලු භවයෝ නැසුවෙමි - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කළෙමි. (5425-5430)

මෙලෙස ලබන ලද රහත් බව ඇති, ආයුෂ්මත් ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්ද මහතෙරුන් වහන්සේගේ උපාධ්‍යාය වූ මේ බෙලට්ඨසීස තෙරණුවෝ; එක් දිනක් ඵල සමවතින් නැගී සිට, ශාන්ත වූ ප්‍රණීත වූ නිරාමිස සුවය ද තමාගේ පූර්ව යෝගයෙන් ද සිහිපත් කර බලා හටගත් ප්‍රීති සොම්නස් බව නිසා ''**යථාපි භද්‍රෝ ආජඤ්ඤෝ**'' යන ගාථාව වදාළ සේක.

එහි ''යථාපි'' යනු උපමාවක් දක්වන අරුතෙහි යෙදුණු නිපාතයකි. ''භද්‍රෝ'' යනු යහපත් වූ, සුන්දර වූ, වීර්ය බලයෙහි සමර්ථ වූ, ජව - පරාක්‍රමාදියෙන් යුක්ත වූ ''ආජඤ්ඤෝ'' යනු ආජානීය වූ, උසස් වර්ගයේ වූ, ජාතියේ හා කාරණා කාරණා නැවැරදිව දැනීම් වශයෙන් උසස් පැවතුම් ඇති, එබඳු සත්ත්වයෝ තිදෙනෙකි. ඔවුන් අතුරින් ආජානීට වෘෂභයා මෙහිදී අදහස් විය. ඔහු සී සෑමෙහි දක්ෂ ලෙස යොදා ඇත්තෙකි. එනිසා කියන ලදී. - ''නඞ්ගලා වත්තනී'' යනුවෙන්, හී වැටෙහි යොදන ලද, නඟුලේ ද නඟුල් තලයේ ද පෙරලීම් වශයෙන් ''නඞ්ගලං'' හි වැටෙනි. නඞ්ගල පථයෙහි ඔබිනොබ පෙරලී කුඹුරෙහි සී සායි යන අර්ථයයි. නඟුල පෙරලී යයි. එය මෙහි සිදුවේ යන අරුතින් ''නඞ්ගලාවත්ත'' නම් වේ. කෙතෙහි, නඟුල් පථයෙහි යන අරුතින්, එහි ''නඞ්ගලාවත්තනි'' නම් වේ. ගාථාවෙහි සුඛෝච්ඡාරණය සඳහා මෙහි ''වත්තනී'' යනුවෙන් දීර්ඝ කරන ලදී. ''සිඛී'' හිස මත වසාගෙන සිළු මෙන් සිටින බැවින් ''සිඛා'' නම් වූ අං එය ඇත්තේ ''සිඛී'' නම් වේ. ඇතැම්හු මෙහි ''සිඛා'' යනුවෙන් මොල්ලිය අදහස් කළ බව කියති. අර්ථ දෙකම ගත්තත්, මෙහිදී නඟුලම ඉස්මතු කර දක්වයි. ''අප්පකසිරෙන'' යනු අල්ප වෙහෙසකින්, නිදුකින්, ''රත්තිඤ්ඤිවා'' යනු දවල් ද රත්‍රියේ ද ''මෙසේ මා හට නිදුකින් දිවා රෑ ගත වේ'' යන අරුතයි. මෙය කියන ලදී. යම් සේ යහපත් වූ අජානීය වෘෂභයෙක් නොසළකමින් නිදුකින් ඔබිනොබ පෙරලමින් යන්නේද, යම්තාක් සී සෑමෙහි පරිශ්‍රමයක් උත්සාහයක් දක්වයිද, එලෙසින්ම මගේ දිවා රාත්‍රී කාලය නිදුකින්ම ගතවේ. ඉක්මවා යයි. එම හේතුවෙන් කියන ලදී. ''සුඛෙ ලද්ධෙ නිරාමිසෙ'' යනු ''කාමුක ආමිෂ, ලෞකික ආමිෂ හා සසර පැවැත්මට හේතුවන ආමිෂාදියෙන් මිශ්‍ර නොවූ එනිසාම ශාන්ත වූ ප්‍රණීත වූ ඵලසමවත් සුව ලද බැවින්'' යන අරුතයි. මෙය පථමා විභක්ති අර්ථයේ තැබූ සත්තමී වචනයකි. ''වනප්පගුම්බෙ'' යන්න මෙණි. ''එලෙසින්ම සෙසු අය ද පැවතිය යුතුයි'' යන අරුතයි. නැතහොත් එතැන් පටන් රෑ දවල් නිදුකින්ම ගතවේ යැයි විමසීම සඳහා කියන ලදී. ''සුඛො ලද්ධෙ නිරාමිසෙ'' යනු නිරාමිස සුවය ලැබූ කල්හි'' එය ලද අවස්ථාවෙහි සිට'' යන අර්ථයයි.

බෙලට්ඨ සීස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේ ය.

1.2.7

''**මිඬි යදා**'' යනු ආයුෂ්මත් දාසක තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ මෙයින් කල්ප අනූ එකකට පෙර බුදුවරු නූපන් කාලයක මනුෂ්‍යයෙක්ව උපන්හ. ගන්ධ මාදන පර්වතයෙන් බැස මිනිස් පථයෙහි එක් ගමක පිඬු පිණිස හැසිරෙන අජිත නම් පසේ බුදුරජාණන් වහන්සේ දුටු ඔහු ඉතා රසවත් අඹ ගෙඩියක් උන්වහන්සේට පූජා කළේය. ඔහු ඒ පින් බෙලෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා කාශ්‍යප බුදුන්ගේ සසුනෙහි පැවිදිභාවයට පත්ව නිර්වාණය පතාගෙන බොහෝ පින් දහම් කළේය. මෙසේ රැස් කරන ලද කුසල කර්ම ඇති ඔහු, සුගතියෙන් සුගතියට යමින් අප තථාගතයන් වහන්සේ ලොව පහළ වූ කාලයේ සැවැත් නුවර උසස් පවුලක ඉපිද ''දාසක'' නමින් ප්‍රකට විය. ඔහු අනේ පිඬු සිටුතුමා විසින් විහාරය ආරක්ෂා කිරීමෙහි යොදන ලදුව මැනවින් එම කටයුත්තෙහි යෙදුණි. එනිසා නිතරම බුදුන් දකීමෙහි ද ධර්ම ශ්‍රවණයෙහි ද යෙදීමෙන් ලබන ලද ශ්‍රද්ධා ඇති ඔහු සසුනේ පැවිදි විය. ඇතැම්හු මෙසේ කියති. ''මොහු කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ උසස් කුලයක ඉපිද, වැඩිවියට පත්ව එක්තරා රහතන් වහන්සේ නමකට උපස්ථාන කරනුයේ, දික් කිසියම් වැඩක් කරගනු කැමතිව උන්වහන්සේට අණ කරන ලදී. ඔහු එම පාප කර්මය නිසා අප භාග්‍යවතුන් ලොව පහළ වූ සමයේ සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දාසියෙකුගේ කුසෙහි උපන්නේය.'' යනුවෙනි. වැඩිවියට පත් වූ ඔහු, සිටුතුමා විසින් විහාරය ආරක්ෂා කිරීමෙහි යොදන ලදුව පෙරකී ලෙසම ලබන ලද ශ්‍රද්ධා ඇති විය. මහ සිටුතුමා ඔහුගේ යහපත් අදහස දැන දාස භාවයෙන් මුදවා ''කැමති පරිදි පැවිදිවන්න''යි පැවසීය. පසුව ඔහු පැවිදිවිය. පැවිදි වූ දින සිටම උන්වහන්සේ, කුසිතව කම්මැලිව කිසිදු වත් පිළිවෙතක් නොකරති. ශ්‍රමණධර්ම කිරීමක් - මගඵල ලැබීමක් කොයින්ද ? හුදෙක් ලැබෙනතාක් වළඳා නිදා ගැනීමෙන් ම කල් ගෙවීය. ධර්ම ශ්‍රවණය කරන කාලයෙහි ද ධර්මශාලාවෙහි එක් කොණක පිරිස කෙළවරම හිඳගෙන සුරු සුරු හඬින් ප්‍රාශ්වාස කරමින් නිදිකිරා වැටේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ හිමිගේ පෙර උපනිශ්‍රය සම්පත් විමසා බලා, උන්වහන්සේට සංවේග ඉපදවීම පිණිස ''**මිඬි යදාහොනි මහඝාසොව**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**මිඬි**'' යනු ථීන මිද්ධ දෙකින් මඩනා ලද, යමෙක් කායික මැලි බවින් යුතුවේද (මිද්ධ) ඔහුගේ සිත ද දුර්වල වේම (ථීන)ය. ''**යදා**'' යනු යම් කාලයක ''**මහාඝාසෝ**'' යනු මහත් වූ භෝජන අනුභව කරන්නෙක් වේ.

පමණ ඉක්මවා අශීලාචාරව ආහාර ගන්නා හපන්ක, අලංසාටක, නත්‍රවට්ටක, කාකමාසක, හුත්තඵමික යන බමුණන් පස්දෙන මෙන් ආහාර ගනී.

''නිඳායිතා'' යනු නිදා ගන්නා වූ **''සම්පරිවත්ත සායී''** යනු පෙරළී පෙරළී නිදන්නේ වේ. මේ වචන දෙකින්ම **''නිදීමේ සුවය, ස්පර්ශ සුවය, කායික මැළි බවින් යුතු සැපය විඳිමින් කල් ගෙවයි''** යන අරුතින් **''නිවාපපුටෝ''** යනු සහල් කුඩු ආදී ඌරු ආහාරදී **පෝෂණය කළ** ගෘහවැසි ඌරෝ, බාල කාලයේ පටන් පෝෂිත ශරීරය ඉතා මහත් වුවත්, ගෙයින් පිටව යාමක් නොසිතා ඇඳ පුටු ආදියේ යට පෙරළෙමින් පෙරළෙමින් ම නිදන්නේ මය. මෙම ගාථාවේ අදහස මෙසේය. -''යම් පුරුෂයකු කායික මැළි බවින් යුතුවේද ඔහු මහත් වූ ආහාර පානාදියෙන් පෝෂිත මහා ඌරෙකු මෙන්, වෙනත් ඉරියවුවකින් සිටීමට නොහැකිව පෙරළෙමින් නිදාගැනීම ම කරයි. මෙසේ වූ පුද්ගලයා අනිත්‍යය දුක අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමට නොහැකිව වෙසේ. එය සිහිපත් නොකරන හෙයින් මඳ වූ ප්‍රඥා ඇති ඔහු නැවත නැවත මවුකුසට පැමිණේ. (සසර සැරි සරයි). ගැබෙහි වාසයෙන් නොමිදෙයි. මෙම ගාථාව ඇසූ දාසක තෙරණුවෝ සංවේග උපදවා විදසුන් වඩා නොබෝ දිනකින්ම රහත් බව සාක්ෂාත් කරගත්හ. මෙම සිදුවීම අපදාන පාළියේ මෙලෙස විස්තර වේ.

''එකල්හි මුනි ගුණ ඇති පසලොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ සමාධියෙහි දක්ෂ වූ ''අජිත'' නම් පසේ බුදුරජාණන් වහන්සේ හිමවතෙහි වැඩ විසූහ. ලෝකයාගේ ජ්‍යෙෂ්ඨයන් පිළිගන්නා වූ රන්වන් සිරුරැති බුදුරජාණන් වහන්සේ වීථියට පිළිපන් කල්හි මම එක් අඹ ඵලයක් පිදුවෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතිය නොඉපදුනෙමි. මවිසින් කෙළෙස් දවන ලදී. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත් වූ එම දාසක තෙරණුවෝ මේ ගාථාවෙන් භාග්‍යවතුන් වහන්සේ මට අවවාද දුන්සේකැයි පවසා, ''මේ ගාථාව මා හට හෙණ්ඩුවක් වී යැ''යි එම ගාථාව නැවත දේශනා කළ සේක. මෙලෙස මේ තෙරුන් වහන්සේ පෙරළා දැක්වීම් වශයෙන් (පරිවත්තාහාරනයෙන) තම රහත් බව ප්‍රකාශ කරන ලද්දේ වේ.

දාසක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.8

''අහූ බුද්ධස්ස දායාදෝ'' යනු සිඟාලක පිතු තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? ඔහු මෙයින් කල්ප අනූ හතරකට පෙර සතරංසි නම් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස හැසිරෙනු දැක, පැහැදුණු සිත් ඇතිව උන්වහන්සේට වැඳ, තම අතේ තිබූ තල් ගෙඩියක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද, තව තවත් භවයන්හි පින්දහම් කරමින් සුගතීන්හි ම සැරිසරා, කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේ මනුෂ්‍යයෙක්ව උපන්නේය. සසුනේ ලබන ලද ශ්‍රද්ධා ඇතිව පැවිදි භාවයට පත් වූ ඔහු අටියී සඤ්ඤාව වැඩුවේය. නැවත අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර උසස් කුලයක ඉපිද වැඩිවියට පැමිණ විවාහ වී එක් පුතෙක් ලැබ, ''සිඟාලක'' යන නම එම පුතාට තබන ලදී. එනිසා ඔහුට ''සිඟාලක පිතා'' යැයි වහරන ලදී. ''සිඟාලකගේ පියා'' යන අරුතයි. පසුව හෙතෙම ගිහිගේ කළකිරී සසුනෙහි පැවිදි විය. භාග්‍යවතුන් වහන්සේ, සිඟාලක පිතු තෙරුන්ගේ අදහස් බලා, අටියීක සඤ්ඤාව කමටහනක් ලෙස දුන් සේක. උන්වහන්සේ එම කමටහන වඩමින් භග්ග ජනපදයේ සුංසුමාර ගිරි භේසකලාවනයෙහි සිටි සේක. ඉක්බිති එම වනයෙහි අධිගෘහීත දේවතාවා ''මම හිමියන්ගේ උත්සාහය වඩවා භාවනා බලයෙන් නොබෝ කලකින්ම රහත් බව අතට පත් වූවක් කරන්නෙමි''යි සිතා එම අදහසම වෙනත් අයුරකින් දක්වමින් ''අහූ බුද්ධස්ස දායාදෝ'' යන ගාථාව පැවසීය.

එහි ''අහූ'' යනු වේ. මෙය වර්තමාන කාල අර්ථයේ යෙදුණු අතීත කාල වචනයකි. ''**බුද්ධස්ස**'' යනු සර්වඥ බුදුරජාණන් වහන්සේගේ ''දායාදෝ'' ධර්ම දායාද කරගත්, නව ලෝකෝත්තර ධර්මයට දායාද වූ තමාගේ සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටා එය පිළිගන්නා වූ නැතහොත් ''අහූ'' යනු විය. ''මෙනම් වූ බුදුරජාණන් වහන්සේගේ ධර්ම දායාද වූ කිසියම් බැඳුණු පුද්ගලයෙක් මෙහිම සිටී'' යන අර්ථයයි. එනිසා ''කාමරාගය වහාම ප්‍රහීන කරුණු ඇතැයි මම සිතමි.'' යනුවෙන් කියන ලදී. ''**හෙසකලාවනෙ**'' යන ''භේසක'' නම් යක්ෂයා විසින් තබන ලද, පිළිගන්නා ලද බැවින් ''භේසකලාවන'' නම් වූ දර ආදිය බහුල වූ බැවින් ''භේසකලාවන'' යැයි ලබන ලද නම් ඇති අරණ්‍යයෙහි කැළයෙහි ඒ භික්ෂුව බුදුරදුන්ගේ දායාද ලබාගත් බැවින්, හුදෙක් අටියී සඤ්ඤාවම වඩන බැවින් ''මේ මුළු පෘථිවියම'' යැයි කියන ලදී. එහි ''**කෙවල**'' යනු සියලු සමස්ත ''**අටියීක සඤ්ඤාය**'' යනු අටියීක භාවනාවෙන් සියලු දෙයම ''ඇට'' ලෙස සිතන භාවනා

කමටහනින් ''අඵී'' යනු ''ඇට'' යැයි ස්ථිර ලෙස පිහිටීම් වශයෙන් පැතුරුණා වූ ''පථවිං'' යනු ආත්මභාවය නම් පොළොවෙහි. මෙහි ආත්ම භාවය ''පථවි'' යනුවෙන් අදහස් කරන ලදී. ''කවරෙක් නම් මේ පොළොව අත්හරින්නේද ?'' (කො ඉමං පථවිං විජෙස්සති) යනාදියෙහි මෙනි. ''මඤ්ඤෙහං'' යනු මම සිතමි. මෙහිදී ''මඤ්ඤාහං'' යන පාඨයද සුදුසුය. ''සො'' යනු ඒ භික්ෂුව වහාම - නොපමාව ම කාමරාගය දුරු කරයි. දුරු කරන්නේ යැයි මම සිතමි. කුමක් හෙයින්ද ? අට්ඨික සඤ්ඤාවෙන් කාම රාගයේ සෘජු පටිපන්න භාවයට පත් වූ හෙයිනි. මෙය කියන ලදී. ''යමෙක් එක් ප්‍රදේශයක ලබන ලද අට්ඨික සංඥාව, තම සියලුම ආත්මභාවය පුරාම පතුරුවා හැරියේද, ඒ භික්ෂුව ඒ අට්ඨික සංඥාව ම පාදක කරගන විදර්ශනාව වඩා නොබෝ දිනකින් ම අනාගාමී මාර්ගයන් උපදවා ගැනීමෙන් සියලුම ආකාරයෙන් කැමතිවීම් අරුතින් ''කාම'' නම් වූ ද ඇලීම් අර්ථයෙන් ''රාග'' යැයි ද ලබන ලද නම් ඇති කාමරාගය ද, අර්හත් මාර්ගයෙන් තණ්හාව ද දුරුකරන්නේය.'' මේ ගාථාව ඇසූ ඒ තෙරුන් වහන්සේ ''මේ දේවතාවා මා හට උත්සාහ ඉපදවීමට මෙසෙ කියන්නේයැ''යි දන අප්‍රතිහත ධෛර්ය උපදවා විදසුන් වඩා රහත් බවට පත් වූ සේක. එනිසා අපදාන පාළියේ එම තොරතුරු මෙසේ දක්වා ඇත. (අපදාන පාළි II - තාලඵලදායක තෙථරාපදානං)

''සියල්ල තමන් වහන්සේම අවබෝධ කරගත් සතරංසි පසේ බුදුරජාණන් වහන්සේ, අපරාජිත වූ සමාධියෙන් නැගිට පිඬු පිණිස වැඩම කළ සේක. උන්වහන්සේ වෙත පැමිණි මා, පහන් සිත් ඇත්තෙම් මා අත වූ තල් ගෙඩියක් නරාසභයන් වහන්සේට පිදුවෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙම් ද එහි විපාක ලෙස මේ දක්වා දුගතියක නූපදුනෙමි. ඵල දානයේ විපාකය එබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුපියාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5442-5447)

රහත් බවට පත් වූ උන්වහන්සේ ඒ දේවතාවා විසින් කියූ වචන සිහිපත් කරමින්, එම ගාථාවම උදාන වශයෙන් - ප්‍රීති වාක්‍යයක් ලෙස වදාළ සේක. එයම එම තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම විය.

සිඟාලක පිතු තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.9

''**උදකං හි නයන්ති**'' යනු ආයුෂ්මත් කුණ්ඩල තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? මේ තෙරුන් වහන්සේ ද නිවණ අරමුණු කරගෙන බොහෝ කුසල දහම් රැස් කොට, කළ ප්‍රාර්ථනා ඇතිව සිටියදී, විපස්සි භාග්‍යවතුන් වහන්සේ අහසින් යනු දක පැහැදුණු සිත් ඇත්තේ එක් පොල් ගෙඩියක් පූජා කරනු කැමති වූහ. ශාස්තෘන් වහන්සේ ඔහුගේ අදහස දැනගත් සේක්, අදහසින් බැස එය පිළිගත්හ. ඔහු අතිශයින් පැහැදී, එනිසාම ලබන ලද ශ්‍රද්ධාව ඇතිව සසුනේ පැවිද්ද ඉල්වීය. ශාස්තෘන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවා, ''මේ පුරුෂයා පැවිදි කරන්න''යි පැවසූ සේක. ඔහු පැවිදිව, ලැබූ උපසපන් බව ඇති වූයේ මහණදම් පුරා, එම ආත්ම භාවයෙන් චුතව බුද්ධාන්තර සයක් දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳ්දේය. අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි, සැවැත් නුවර බමුණු කුලයේ උපන් ඔහු ''කුණ්ඩල'' නමින් ප්‍රකට විය. ඔහු වැඩිවියට පැමිණ - සසුනෙහි ලබන ලද ශ්‍රද්ධා ඇති වූයේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදි විය. උන්වහන්සේගේ සිත වික්ෂේප (අවුල් සහගත බව) බහුල වූ බැවින් ගුණ විශේෂයක් උපදවා ගැනීමට නොහැකි විය.

එක් දිනක් පිඬු පිණිස ගමට වැඩි උන්වහන්සේ අතරමඟදී, බිම සාරා දිය පහරවල් තනා තමා කැමති තැනට දිය ගෙන යන්නාවූ පුරුෂයන් දැක එකරුණ සිත තබාගත් සේක. ගමේදී එක්තරා හී වඩුවෙක් හී දඬුවක් ගෙන හැර - ඇස් කෙළවරින් බලා සෘජු කරනු දක එයද සිත තබා ගත් සේක. ඉදිරියට වැඩි උන්වහන්සේ නිම් වළලු, නැබ ආදී රිය සකට අවශ්‍ය උපකරණ තුනී කරන, සසිත ලී වඩුවන් දැක එය ද සිත තබාගෙන විහාරයට නැවත වැඩි සේක. කරන ලද බත් කිස ඇති උන්වහන්සේ පා සිවුරු තබා, දිවා විහරණයෙහි යෙදුණු සේක් තමා විසින් දකින ලද නිමිති උපමා වශයෙන් ගෙන තම සිත දමනය කර ගැනීමට උත්සාහ ගත් සේක. ''සිත් පිත් නැති ජලය පවා මිනිස්සු තමා රිසි තැනට ගෙන යති. එසේම අචේතනික වූ වක් වූ මේ හී දඬුව උපක්‍රමයෙන් සෘජු කරති. එසේම ලී වඩුවෝ මේ අචේතනික ලී දඬු, ලී කොට ආදිය නිම්වළලු ආදී වශයෙන් වක්‍රාකාරවද සෘජු බවට ද පමුණුවති. එනිසා කුමක් නිසා මා හට මාගේ සිත දමනය කරගත නොහැක්කේද ?''යි දැඩිව සිතා විදර්ශනාව වැයමින් වඩන්නේ නොබෝ කලකින් ම රහත් බවට පත් වූහ. මෙම විස්තර අපදාන පාළියේ මෙලෙස දැක්වේ. (අපදාන II - නාළිකෙරඵලදායක තෝරාපදානං)

''එකල මම බන්ධුමති නුවර ආරාමයේ වතාවත් ඉටු කරන්නෙක් වීමි. අහසින් වැඩම කරන කෙලෙස් දුවිලි ඉවත ලූ බුදුරදුන් දුටුවෙමි. මම පොල් ගෙඩියක් භාග්‍යවතුන් වහන්සේට පිදුවෙමි. මහත් යස ඇති උන්වහන්සේ අහසේ සිටිමින් ම එය පිළිගත් සේක. මා හට ප්‍රීතිය ගෙන දෙන්නා වූ මෙලොවදී ම සුට ඵළවන්නා වූ එම ඵලය බුදුරදුන් පුදා, මම මහත් වූ ප්‍රීතියට ද උතුම් සැපයට ද පැමිණියෙමි. ඒ ඒ අත්භවයෙහි උපන් මට රුවන් පහළ විය. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඵල දායනයක් දුන්නෙම් නම් එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නො ඉපදුනෙමි. මගේ දිවැස පිරිසිදු විය. සමාධියෙහි මාසිත පිහිටියේය. අභිඥාවන්හි කෙළවරට පැමිණියෙමි. ඵල දානයේ විපාකය එබඳුය. මවිසින් කෙලෙස් දවන ලදී. සියලු භවයෝ නැසුවෙමි. බැඳුම් සිඳි ඇත් රජෙකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරදුන් වෙත මාගේ පැමිණීම ඉතා යහපත් වූවකි. ත්‍රිවිද්‍යාවන් ලැබුවෙමි. සිවු පිළිසිඹියාවන් ද අෂ්ට විමෝක්ෂයන් ද ෂඩ් අභිඥාවන් ද සාක්ෂාත් කළ මම බුදුරදුන්ගේ අනුශාසනාවට ඉටු කළෙමි. (5448-5456)

මෙසේ යම් නිමිති උපකාර කරගෙන විදසුන් වඩා රහත් බවට පත් වූයේද එම නිමිති සමඟ තමාගේ සිත දමනය කිරීම සඳහාමින්, තමා ලැබූ රහත් බව ප්‍රකාශ කරන සේක්; ''**උදකං හි නයන්ති නෙත්තිකා**'' යන ගාථාව වදාළ සේක.

එහි ''උදකං හි'' යන්නෙහි ''හි'' ශබ්දය නිපාතයක් පමණි. ''**නයන්ති**'' යනු පොළොවේ ඒ ඒ තැන් කණිමින් පහත් තැන් පුරවමින්, ඇල මාර්ගයක් සාදා හෝ ගස් ඔරු තබා හෝ ජලය තමා කැමති තැනකට ගෙන යෑමයි. එසේ කරන්නෝ ''**නෙත්තිකා**'' නම් වේ. ''**තෙජනං**'' යනු ඊතලයයි. මෙය කියන ලදි. ''දියාළුවෝ තමා රිසි තැනට දිය ගෙන යති. හී වඩුවෝ ද තවා - රත් කර ඊතල සෘජු කෙරෙති. රිසි සේ නවති. නැමීම් වශයෙන ලී වඩුවෝ නිම්වළලු ආදිය සෑදීම සඳහා ලී සසිමින් දුව නමති. තමා කැමති සේ සෘජු හෝ වක් කරති. මෙසේ මෙපමණක් ම අරමුණු වශයෙන් ගෙන පඬිවරු පිළිගත්, සමාදන් වූ පරිදි ශීලාදි ගුණදම් වලින් සුන්දර වූවාහු; ධෛර්යවන්තව සෝවාන් ආදි මඟඵල උපදවමින් තමා දමනය කරගනිති. අර්හත්භාවයට පත් වූවහු ඒකාන්තයෙන් දැමුණෝ නම් වෙති.

කුණ්ඩල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.2.10

''**මරණෙ මෙ භයං නත්ථි**'' යනු ආයුෂ්මත් අජිත තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේද ? එම තෙරුන්, මීට කල්ප අනූ එකකට පෙර විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදී උන්වහන්සේට දිවුල් ගෙඩියක් පිදුවේය. එතැන් පටන් ඒ ඒ අත්බවෙහි පින් දහම් කරමින් දෙව් මිනිසුන් අතර සැරිසරා මේ මහා භද්‍ර කල්පයෙහි, අපගේ තථාගතයන් වහන්සේ ලොව පහළවීමට පෙර කාලයේදී සැවැත් නුවර කොසොල් මහ රජුගේ අග්‍රාසනිය බමුණාගේ පුතු වී උපන්නේය. එකුමරු අජිත නමින් ප්‍රසිද්ධ විය. මේ කාලයේදී සැවැත් නුවර විසූ ත්‍රිවිධ මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබියා වූ ත්‍රිවිධ වේදයන්හි පරතෙරට පත් බාවාරි නම් බ්‍රාහ්මණයා, සැවැත් නුවරින් නික්ම ගොස් තවුස් පැවිද්දෙන් පැවිදි වූයේ, ගෝධාවරී ගංතෙර වූ කපිඨ නිඝණ්ඨාරාමයේ වාසය කරයි. ඉක්බිති අජිත එම තාපසයා සමීපයේ පැවිදි වූයේ වැඩ කැමති දෙවියකු විසින් මෙහෙය වන ලද බාවාරි තවුසා විසින් ශාස්තෘන් වහන්සේ වෙත යවන ලද මෙත්තෙය්‍යාදී සිසුන් සමඟ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, සිතින්ම ප්‍රශ්න නඟා ඒවා විසඳූ කල්හි උන්වහන්සේ කෙරෙහි අතිශයින් පැහැදුණේය. පැහැදී සසුනේ පැවිදි වී කමටහන් ගෙන විදසුන් වඩා රහත් බවට පත්විය. එය අපදාන පාළියේ මෙසේ විස්තර වේ. (අපදාන පාළි II - කපිඨ ඵලදායකත්‍ථෙරාවදානං)

''ලෝකවාසීන්ගේ පූජාවන් පිළිගන්නා වූ රන්වන් ශරීර ශෝභාවෙන් යුතු වූ බුදුරජාණන් වහන්සේ වීථියට පිළිපන් කල්හි, මම උන්වහන්සේට දිවුල් ගෙඩියක් පිදුවෙමි. එදා මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමිද එහි විපාක වශයෙන් මම දුගතියක නො ඉපදුනෙමි. ම විසින් කෙලෙස් දවන ලදී. සියලු භව නසන ලදී. ඇත් රජෙකු මෙන් ආශ්‍රව නම් බැඳුම් සිඳ සුවසේ වෙසෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5463-5467) රහත් බවට පත් වූ උන්වහන්සේ සිංහනාද කරන සේක් ''**මරණෙ මෙ භයං නත්ථි**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**මරණෙ**'' යනු මරණ නිමිත්තෙහි, මරණ හේතුවෙනි. ''මෙ'' යනු මා හට, ''**භයං නත්ථි**'' යනු භවයේ උපදින මුල් සිඳ දැමූ බැවින් ද ජාතිය (උපත) ක්‍ෂය කළ බැවින් ද නැවතත් ඉපදීමේ භයක් නැත. නොසිඳන ලද භව මුල් ඇති පුද්ගලයන්ට, ''මට කවරාකාරයක නැවත උපතක් හිමිවේද?'' යන මරණ භය ඇති වන්නේය. ''**නිකන්ති**'' යනු අපේක්ෂාවක්, තණ්හාවක් නැත. ජීවිතයෙහි මනාව ම මඩින ලද සංස්කාර (රැස්කිරීම්) නම් වූ උපදාන

ස්කන්ධයන්ගේ වශයෙන් ඇතිවන දුක් ආදිය නැති බැවින්, මනාව එළඹ සිටි සිහි ඇතිව ශරීරය පිළිබඳ සැකය පිළිබඳ සැකය හෝ සිය සිරුර, දේහය නැමති දුක් රැස බහා තබමි. අත්හැර දමමි. බහා තබනුයේ ද මේ සිරුරින් කරගත යුතු දේ ඉටු කරගත් බැවිනි. එනිසා දැන් එය ඒකාන්තයෙන්ම අත්හැර දමන්නෙමි. ප්‍රඥාවේ විපුලත්වයට පත් වූ බැවින්, සිහි ඇතිව වසනුයේ, සිහියේ විපුලත්වයට පත්වීමෙන්, සිහියෙන් යුතුව මේ කය අත් හරින්නේනෙමි'' යි යන මේ ගාථාව පැවසූ තෙරුන් වහන්සේ ධ්‍යානයට සමවැද ඉන් පසුව පිරිනිවියහ.

අජිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දෙවැනි වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.3.1

''නාහං භයස්‍ස භායාමී'' යනු ආයුෂ්මත් නිග්‍රෝධ තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේද ? මෙයින් කල්ප එක් දහස් අටසියකට පෙර බමුණු මහසල් කුලයක උපන් මෙම තෙරුන්, වැඩිවියට පත්ව කාමයේ ආදීනව හා පැවිද්දෙහි අනුසස් දැක ගෘහ බන්ධනාදිය අත්හැර ආරණ්‍යයකට පිවිසියේය. කැළයේ එක්තරා සල් වන පෙදෙසක පන්සලක් තනාගෙන තවුස් පැවිද්දෙන් පැවිදි වී වන-මුල්-ඵලාදිය අහරටගෙන ජීවත් විය. මෙම කාලයේ පියදස්සී නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක්, දෙවියන් සහිත ලෝකයාට දහම් අමා වැසි වස්වමින්, කෙලෙස් සන්තාපයන් නිවා දමමින් ලොව හිත වැඩ සැළසූ සේක. එක් දිනක් උන්වහන්සේ තාපසතුමා කෙරෙහි හටගත් අනුකම්පාවෙන් එම සල් වනයට පිවිස නිරෝධ සමාපත්තියට සමවැදුනහ. තවුසා වන මුල් ඵල ගෙන පන්සල පැමිණි මොහොතේ භාග්‍යවතුන් වහන්ස් දැක, පැහැදුණු සිත් ඇතිව පිපුණු සල් අතු ගෙන කොල අතු මණ්ඩපයක් සාදා එහි සැම තැනම සල් මල්වලින් වසා බුදුරදුන්ට වැන්දේය. පසුව ආහාර සඳහාවත් පිටත නොයා, හටගත් ප්‍රීති සොම්නස් සහගත සිතින් ම තථාගතයන් වහන්සේට නමස්කාර කරගෙන ම සිටියේය.

නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි ශාස්තෘන් වහන්සේ මේ තවුසාට අනුකම්පා පිණිස ''භික්ෂු සංඝයා එත්වා''යි සිතූ සේක. ''මොහුගේ සිත භික්ෂු මහා සංඝ රත්නය කෙරෙහි ද පහදිත්වා''යි පැතූ සේක. එකෙණෙහිම භික්ෂු සංඝයා වැඩිසේක. තාපසතුමා එම භික්ෂු මහා සංඝරත්නය දැක, පැහැදුණු සිත් ඇතිව, උන්වහන්සේලාට වැඳ ඇදිලි බැඳගෙනම සිටියේය. භාග්‍යවතුන් වහන්සේ සිතහ පහළ කිරීම වශයෙන් ඔහුට ලැබෙන සම්පත් පිළිබඳව පැවසෙන ධර්ම දේශනාවක් පවත්වා, භික්ෂු සංඝයා සමඟම එම වනයෙන් නික්මුණු සේක. එම තාපසතුමා ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස්සුන් අතරම සැරිසරමින්, සසර නැවැත්ම වූ නිවන පතාගෙන බොහෝ පින්දහම් රැස්කර ගත්තේය. අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත් නුවර බමුණු මහසල් කුලයක උපන් ඔහු, ''නිග්‍රෝධ'' නාමයෙන් ප්‍රකට විය. ඔහු අනේපිඬු සිටුතුමා විසින් පූජා කරන ලද ''ජේතවනාරාමය පිළිගන්නා දවසෙහි පැවති බුද්ධානුභාවය දැක, උපදවා ගත් ශ්‍රද්ධාව ඇතිව පැවිදි වී, විදසුන් වඩා නොබෝ කලකින්ම ෂඩ් අභිඥා ලාභියෙකු බවට පත්විය. මෙම තොරතුරු අපදාන පාළියේ සවිස්තරව දක්වේ. (අපදාන පාළි II - සාලමණ්ඩ පියඤ්ඤාපදානං)

''සල්වනයට පිවිසි මම එහි අසපුවක් මැනවින් සෑදුවෙමි. සල් මල් ගැවසි එම වනයෙහි සුවසේ වසුවෙමි. සියල්ල තමන් වහන්සේ ම අවබෝධ කරගත්තා වූ භාග්‍යවතුන් පියදස්සී සම්බුදුරජාණන් වහන්සේ විවේක සැප කැමතිව සල් වනයට වැඩම කළ සේක. එකල්හි මම අසපුවෙන් නික්ම වනයට ගොස් සිටියෙහි. මුල් හා ඵල සොයමින් වනයෙහි ඇවිද්දෙමි. ඒ මහා වනයෙහි මනාසේ වැඩහුන්නා වූ, සමාධියට සමවැදී බබළන්නාවූ, මහත් යශස් ඇති පියදස්සි සම්බුදුරජුන් පසුව දුටුවෙමි. උන්වහන්සේ මතුයෙහි එකට බැඳි දඬු සතරක් තබා, මනා මඩුවක් සැදූ මම, එය සල්මල්වලින් වැසුවෙමි. මම සල්මලින් වැසූ මණ්ඩපය සතියක් දරා සිටිමින්, ඒ පිළිබඳ සිත පහදවා බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට වැන්දෙමි. පුරුෂෝත්තම බුදුරජාණන් වහන්සේ සමාධියෙන් නැගිට වියදඬු දුර බලමින් වැඩහුන් සේක.''

''එකල්හි පියදස්සී බුදුරජාණන් වහන්සේගේ චරුණ නම් ශ්‍රාවකයන් වහන්සේ ලක්ෂයක් රහතුන් සමඟ බුදුරදුන් වෙත පැමිණි සේක. පස්මරුන් දිනූ ලෝක ජේෂ්ඨයා වූ නර ශ්‍රේෂ්ඨ වූ පියදස්සී භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා මැද වැඩ හිඳිමින් සිනා පහළ කළ සේක. එම බුදුරදුන්ගේ අනුරුද්ධ නම් වූ උපස්ථායක භික්ෂුව නැගිට සිවුර ඒකාංශ කර බුදුරජාණන් වහයන්සේගෙන් මෙසේ විචාළේය. ''භාග්‍යවතුන් වහන්සේ; ශාස්තෘන් වහන්සේ සිනා පහළ කිරීමට හේතු කිම ? ශාස්තෘන් වහන්සේ කරුණක් ඇති කල්හිම සිනා පහළ කරන සේක.'' එවිට බුදුපියාණෝ මෙසේ වදාළහ. ''යම් මාණවකයෙක් සතියක් පුරා ම මා හට මල් සෙවණක් දරුවේද ඔහුගේ ඒ ක්‍රියාව සිහිපත් කර මම සිනා පහළ කෙළෙමි. යම් තැනක එම පිනෙහි විපාකය දේ නම් එබඳු තැනක මම නොදකිමි. දෙව්ලොව හෝ මිනිස් ලොව ඇති සැප ඊට නොසෑහේ. මේ පින්කම හේතුවෙන් දෙව්ලොව වසන ඔහුගේ සියලු පිරිස සල් සෙවණවලින් වැසුනෝ වෙති. ඔහු එසේ පින්කමේ විපාකය සමඟ එක් වී එම දෙව්ලොව, දිව්‍යමය වූ නෘත්‍ය-වාදිත ගීතයන් හි හැමදා සිත අලවමින් වසන්නේය. ඔහුගේ සියලු පිරිස මල් සුවඳින් සුවඳවත් වූයේ වේ. එකෙණෙහි සල්මල් වැසි ද වසන්නේය. මේ මිනිස් තෙම දෙව්ලොවින් චුව මිනිසකු ලෙස උපදී නම්, මේ මිනිස් ලොවේද හැමදා සල්මල් සෙවණක් ම දරන්නේය. සමාන වූ තාල ඇති නෘත්‍ය - ගීතාදියෙන් යුතු පිරිවර නිතර ඔහු පිරිවරාගෙන සිටින්නේය. බුද්ධ පූජාවෙහි විපාකය මෙබඳුය.'' (5219-5336)

''හිරු උදාවන කල්හි සල්මල් වැසි වසී. පින් කමෙන් යුක්ත වූ මොහුට හැමකල්හිම සල්මල් වැසි වසී. මෙයින් එක් දහස් අටසිය වන කල්පයේදී ඔක්කාක කුලයේ ගෞතම නම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළවන සේක. මේ තාපස තෙම උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ, ධර්මයෙන්ම නිර්මිත වූ ඖරස බුද්ධ පුත්‍ර වූයේ සියලු ආශ්‍රව මනාව දූන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය. ධර්මය අවබෝධ කළා වූ මොහුට සල්මල් සෙවනක් ඇතිවේ. පිරිනිවීමෙන් පසු සෑය දූවෙන කල්හි ද එහි සල්මල් සෙවනක් පවතින්නේය.''

''මහාමුනි වූ පියදස්සී බුදුරජාණෝ මෙලෙස පින්කමේ විපාකය වදාරා, දහම් වැස්සෙන් සැම දෙන සනහමින් දහම් දෙසූ සේක. ඒ මම දෙවියන් අතර කල්ප තිහක් දිව්‍ය රාජ්‍යය විඳාළෙමි. හැට හත් වරක් සක්විති රජ වීමි. දෙව්ලොවින් මෙහි පැමිණ මහත් වූ සැප ලැබුවෙමි. මෙම මිනිස් ලොවේදී ද මහත් වූ සදාකාලික සල්මල් සෙවණක් මා හට වේ. ශාක්‍යකුල ශ්‍රේෂ්ඨ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ සතුටු කොට, ජය පරාජය හැරදමා අවල ස්ථාන වූ නිවනට පැමිණියෙමි. මෙයින් එක්දහස් අටසියක් කල්පයන්ට පෙර යම් බුද්ධ පූජාවක් කළෙම්ද එහි විපාක වශයෙන් දුගතියක නො ඉපදුනෙමි. බුද්ධ පූජාවේ විපාකය එබඳුය.''

''මවිසින් කෙළෙස් දවන ලදී. සියලුම භව නැසුවෙමි. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි මාගේ ගමන යහපත් පැමිණීමක් ම වේ. මම ත්‍රිවිද්‍යා අවබෝධ කළෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. මවිසින් සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරන ලදහ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5237-5248)

මෙසේ ෂඩ් අභිඥා ලැබ, මාර්ග ඵල සුවයෙන් කල් යවන උන්වහන්සේ, බුදු සසුනේ නෛයර්‍යාණික බව ප්‍රකට කිරීම සඳහා; තමන් වහන්සේ ලැබූ රහත් ඵලය ප්‍රකාශ කිරීම් වශයෙන් ''**නාහං භයස්‍ස භායාමි**'' යන ගාථාව වදාළ සේක.

එහි ''භය වේ'' යනු ''භයං'' ජාති ජරා මරණාදී භය හේතුවෙන් ''**භයස්‍ස**'', පංචමී අර්ථයේ යෙදුණු ඡට්ඨී විභක්ති වචනයකි. භයක් හෝ භයවීමට නිමිත්තක්, ජාති, ජරා මරණාදී හේතුවකින් මම භය නොවෙමි.

ඊට හේතු මෙසේ දක්වයි. ''**සත්ථා තෙ අමතඤ්ඤ කොවිදො**'' යනු දක්ෂ වූ, ''**යත්ථ භයං නාවතිස්සති**'' යනු යම් නිවණක ඉහත පැවසූ පරිදි භයක් නොසිටියි ද ඊට අවසරයක් නොලබයි ද ''**තෙන**'' යනු ඒ නිවණින් ම ''**වජන්ති**'' යනු අභයස්ථානයටම යති, නිර්වානය ම අභයස්ථානයකි. එයට යති. ''මඟෙන වජන්ති භික්ඛවො'' යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන්, ''ශාස්තෘන් වහන්සේ විසින් අවවාද කරනු ලබන භික්ෂූහු සසර පවතින භයෙන් මිදෙන්නෝ වෙති.'' යන අර්ථයයි. යම් තැනක පවතින, යම් නිමිත්තක්, යම් ආර්ය මාර්ගයක අවබෝධ වීම හේතුවෙන් අත්තානුවාදාදී පස් විසි ආකාර වූ (25) භයක් නොම පිහිටියි ද පිහිටක් නොලබයි ද ඒ ආයර්ය මාර්ගයෙන්, අභයස්ථානය වෙතට ශාස්තෘ අනුශාසනයෙහි යෙදෙන භික්ෂූහු යති. ඒ මගින් ම මම ද ගියෙමි. එනිසා මා හට ජාති ජරා මරණාදී භයෙන් භයට පත්වීමක් නැත. මෙලෙස තෙරුන් වහන්සේ රහත් බව ප්‍රකාශ කළ සේක.

නිග්‍රෝධ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.2

''නිලා සුගීවා'' යනු ආයුෂ්මත් චිත්තක තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? ඒ තෙරුන් පදුමුත්තර භාග්‍යවතුන්ගේ කාලයේ පටන් නිවන පතාගෙන කුසල් රැස් කරමින් සසර සැරිසරනුයේ මෙයින් කල්ප අනූඑකකට පෙර, මනුෂ්‍යයෙක්ව ඉපදුනේය. නුවණැති බවට පත් වූ ඔහු විපස්සී භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් මල් පූජා කොට වැඳ, ''මේ පින්කමෙන් ද ශාන්ත වූ ධර්මාවබෝධය ම ලැබේවා !''යි උන්වහන්ස් වෙතින් ද නිර්වාණයම පැතුවේය. ඔහු ඉන් චුතව එම පින්කමේ විපාක වශයෙන් තාවතිංසයෙහි ඉපදුනේය. භවයෙන් භවයට යමින් පින් දහම් කළ ඔහු දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, මේ බුදෙධාත්පාද කාලයෙහි රජගහ නුවර මහ සම්පත් ඇති බමුණු ගෙදරක උපන්නේය. චිත්තක නාමයෙන් ඔහු ප්‍රකට විය. චිත්තක බමුණු තරුණයා අප භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩවසන සමයෙහි උන්වහන්සේ වෙත පැමිණ, ධර්ම ශ්‍රවණය කිරීමෙන් ලබන ලද ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි විය. චිත්තක හිමියෝ තම චරිතයට ගැලපෙන කමටහන් රැගෙන කැළයකට පිවිස, භාවනාවෙහිම නිරත වූ සේක්, ධ්‍යාන උපදවා ගත්හ. එම

ධ්‍යානයම පාදක කරගෙන විදසුන් වඩා නොබෝ කලකින් ම රහත් බවට පත් වූ උන්වහන්සේ පිළිබඳව අපදාන පාළියේ මෙසේ විස්තර වේ. (අපදාන පාළි II - තිකිඞ්ඡකණිපුප්ඵියත්ථෙරාපදානං)

''කිණිහිරි රුකක් මෙන් බබලන්නා වූ, කඳු අතරෙහි වැඩ සිටියා වූ ලෝක නායක වූ කෙලෙස් දූවිලි වලින් තොරවූ විපස්සී බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. මම කිංකිණි මල් තුනක් ගෙන උන්වහන්සේට පිදුවෙමි. උන්වහන්සේට ගෞරව පිණිස දකුණු දිගට මුහුණලා ගියෙමි. මවිසින් මැනවින් කරන ලද එම පින්කමේ බලයෙන් හා ප්‍රාර්ථනාවේ බලයෙන් මිනිස් සිරුර හැර දමා, තව්තිසා දෙව්ලොවට ගියෙමි. ඉපදුනෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් බුද්ධ පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් දුගතියක් නොදුටිමි. ඒ බුද්ධ පූජාවේ විපාකයයි. මවිසින් කෙලෙස් දවන ලදී. සියලු භව නැසුවෙමි. බැඳුම් සිඳගත් ඇත් රජෙකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරදුන් වෙත පැමිණීමෙන් මට යහපත් ම විය. ත්‍රිවිද්‍යා ලබන ලදී. බුදුරදුන්ගේ අනුශාසනය ඉටු කළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ඬේ අභිඥාවෝ ද මවිසින් සාක්ෂාත් කරන ලදහ. බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5249-5255)

රහත් බවට පැමිණි උන්වහන්සේ, ශාස්තෘන් වහන්සේට වැඳීමට රජගහ නුවරට වැඩිසේක. එහි වැසි භික්ෂූන් විසින්, ''ඇවැත්නි ! කිම ආරණ්‍යයෙහි අප්‍රමාදීව විසුවෙහිද ?'' යි විචාරන ලද්දේ, තමන් වහන්සේගේ අප්‍රමාදී විහරණය දැනුම් දීමෙන් රහත්බව ප්‍රකාශ කරන සේක්, ''**නීලා සුගීවා**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**නීලා සුගීවා**'' යනු නිල්වන් මනා ගෙල ඇති'' ගාථාව සුඛෝච්චාරණය සඳහා මෙහි දීර්ඝය යොදන ලදී. රෝම රාජියෙන් සුන්දර වූ ගෙලකින් සමන්විත වූ යන අරුතයි. එය බොහෝ සෙයින්ම නිල්වන් වූ බැවින් ''**නීලා**'' වේ. බබල හා ප්‍රිය උපදවන බැවින් ''**සුගීවා**'' නම් වේ. ''සිඛිනෝ'' යනු මස්තකයේ හටගත් සිඳුවෙන් සශ්‍රික වූ බැවින් ''**සිඛිනෝ**'' සිඳු ඇති ''**මොරා**'' යනු මොණරු, මයුරෝ, ''**කාරංවිය**'' යනු කර ගසක් මෙන් නැතහොත් ඒ වනයේ නම ''කාරංවී'' යනුයි. එනිසා ''එම වනයේ වසන'' අරුතින් ''කාරංවිය'' යැයි යෙදුණි. ''කාරාවී'' නම් වනයෙහි යන අරුතයි. ''**අභිනදන්ති**''යනු වර්ෂා කාලයේ මේඝ ගර්ජනවා අසා කෙකාරව ශබ්දය කරමින්, සෘතු සම්පත්තියෙන් ජනිත වූ ස්වරය නිසා හංසාදීන්ගේ නද පරදවන්නාක් මෙන් නද දෙති. ''**තෙ**'' යනු ඒ මොනරු ''**සීතවාතකඤ්ඣ**

කලිනා'' යනු ශීතල මේඝ වාතයෙන් හටගත් ''කලි'' යන මිහිරි හඬ ඇති වැසි වස්වමින් ''**සුත්තං**'' යනු අහර ගැනීමෙන් පසු ඇතිවන ක්ලාන්ත ගති දුරු කිරීමට නිදාගත්, කයේ වෙහෙස දුරු කිරීම සඳහා හෝ අතදුන් වේලාවෙහි (සුපුරුදු වේලාවේ) නිදා ගන්නා ''**කායං**'' යනු සමථ, විදර්ශනා යන ධ්‍යානයන්හි ධ්‍යාන සීල භාවනාවෙන් යුක්තව වෙසෙන, ''**නිබොධෙනති**'' යනු ප්‍රබෝධ කරති. මොවුහු නින්දට නොගොස්, නිදිවරමින් තමා විසින් කළ යුතු දේ සිදු කරති. ''මම කවර දෙයක් සිදු කරන්නෙම් ද?'' යි යන සිහිකල්පනාව උපදවාගෙන සයනයෙන් නැගිටිති'' යන අර්ථයයි.

චිත්තක තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.3

''අහං බො වෙළුගුම්බසම්මිං'' යනු ආයුෂ්මත් ගෝසාල තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? එම තෙරුන් පූර්ව බුදුවරුන් වෙත කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නිවණ පතාගෙන කුසල් රැස් කරමින් සසර සැරිසරන සමයේදී, මෙයින් කල්ප අනූ එකකට පෙර, එක්තරා පර්වතක ගස් අත්තක එල්ලෙන පසේ බුදු රජාණන් වහන්සේ කෙනෙකුන්ගේ පාංශුකූල සිවුරක් දැක, ''මෙය අනිවාර්යයෙන්ම අර්හත් ධ්වජයකි''යි පැහැදුණු සිතැතිව මලින් පූජා කළේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් තව්තිසා භවනයෙහි උපන්නේය. එතැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, අප බුදුරජාණන් වහන්සේ පහළවන සමයේ මගධ රට ධනවත් පවුලක ඉපිද 'ගෝසාල' නාමයෙන් ප්‍රකට විය. ඔහු සෝණ කුටිකණ්ණ සමඟ කළ හැදිනීම් ඇති බැවින් (මිතුරකු වූ හෙයින්) කුටිකණ්ණගේ පැවිදි වීම අසා, ''ඔහු මහා සම්පත් ඇත්තෙකි. එබඳු පුද්ගලයන් පැවිදි වන විට මම කුමක් කරම්ද ?''යි හටගත් සංවේග ඇතිව අප භාග්‍යවතුන් වහන්සේ සමීපයේ පැවිදි විය. ගෝසාල හිමියෝ තම චරිතයට අනුකූල කමටහන් ගෙන, සුදුසු සෙනසුනක් සොයමින් ගොස්, තම උපන් ගමට නුදුරෙහි එක් පර්වත සමබිමක (සානුවක) වාසය කළහ. එක් දිනක් තම ගමට පිඬු සිඟා වැඩි තෙරුන්ට, මෑණියෝ මිහිරි හකුරු සහිත කිරිබතක් බෙදුවාය. උන්වහන්සේ එය රැගෙන තමා වෙසෙන පර්වත සෙවණෙහි හිඳ, එම දානය වැළඳූ සේක. වළඳා පාත්‍රය හා දෙ අත් සෝදාගෙන, විදසුන් භාවනාව වැඩීමට පටන්ගත් සේක. එක්තරා උණ

ලැහැබක් මුල හිඳි උන්වහන්සේ, සුදුසු භෝජන ලැබීමෙන් කයේ හා සිතේ යෝග්‍ය බව නිසා එක්තැන් වූ සිතැතිව, උදයව්‍යය ඤාණාදී තියුණු ශූරවූ ඤාණයන්හි, අල්ප යෝග්‍ය බව නිසා එක්තැන් වූ සිතැතිව, උදය ව්‍යය ඤාණාදී තියුණු ශූරවූ ඤාණයන්හි, අල්ප වෙහෙසකින් විදර්ශනාව ඔසවා තබා, මාර්ග පිළිවෙලින් භාවනාව මස්තක ප්‍රාප්ත කරගෙන සිවුපිළිසිඹියාපත් අර්හත් බව සාක්ෂාත් කරගත් සේක. අපදාන පාළියේ ද එය මෙලෙස විස්තර වේ. (අපදාන පාළි II, පංසුකූල පූජක ථෙරාපදානං)

''හිමවතට නුදුරෙහි උරග නම් පර්වතයක් විය. එහි ගස් මුදුනක එල්ලන ලද පංසුකූල චීවරය දුටුවෙමි. එකල්හි මම කිංකිණි මල් තුනක් නෙලාගෙන සතුටු සිතින් ම ඒ පාංශු කූල සිවුරට පිදුවෙමි. මැනවින් කරන ලද එම කර්මය සහ චිත්ත ප්‍රණිධිය (ප්‍රාර්ථනාව) නිසා මිනිස් සිරුර හැර දමූ මම තව්තිසා දෙව්ලොව ඉපදුනෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් පින්ක් කළෙමි් ද අර්හත් ඵලය පිදීමේ එම පින්කම හේතුවෙන් දුගතියක නූපදුනෙමි. මව්සින් කෙලෙස් දවන ලදී. සියලුම භව නැසුයෙමි. බැඳුම් සිඳි ඇත් රජෙකු මෙන් කෙලෙසුන් සිඳ ආශ්‍රව රහිතව සුවයෙන් වෙසෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි. (5256-5262)

රහත් බවට පත්ව මෙලොව සැප විහරණය සඳහා පෙර සිටි පර්වත සම බිමට ම යනු කැමති තෙරුන් වහන්සේ තමාගේ පිළිවෙත සෙසු අයට දන්වමින් ''**අහං බො වෙළුගුම්බ සම්මං**'' යන ගාථාව දේශනා කළ සේක.

එහි ''**වෙළුගුම්බසම්මං**'' යනු උණ පඳුර සමීපයේ එහි සෙවණෙහි, ''**භුඤ්ජාන මධුපායාසං**'' යනු මී පැණි මිශ්‍ර කිරිබත වළඳා ''පදක්ඛිණං'' යනු ප්‍රදක්ෂිණා කිරීමෙන් ශාස්තෘන් වහන්සේගේ අවවාදය මැනවින් පිළිගෙන යන අර්ථයයි. ''**සම්මසනෙතා බන්ධානං උදයබ්බයං**'' යනු පංච උපදානස්කන්ධයන්ගේ ඇතිවීම හා නැතිවීම සිහිපත් කරමින්, මැනවින් බලමින්, දැන් කරන ලද කටයුතු ඇති බැවින් ඵල සමවතට සමවැදීම සඳහා විඳසුන් භාවනාවෙහි සිත පිහිටුවමින් යන අර්ථයයි. ''**සානු පටිගමිස්සාමි**'' යනු පෙර මම විසූ පර්වතයේ සමබිමට ම යන්නෙමි. ''**විවෙකමනුබ්‍රූහයං**'' යනු සංසිඳුණු විවේකය ද ඵල සමවතින් හටගත් කාය විවේකය ද වඩමින්, නැතිනම් එසේ වැඩීම සඳහා යන්නෙමි. මෙසේ වදාළ තෙරුන් වහන්සේ එම ස්ථානයට ම වැඩි සේක. මෙම ගාථාව ම මේ ගෝසාල තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කරන ගාථාව විය.

ගෝසාල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.4

''අනුවස්සිකො පබ්බජිතො'' යනු ආයුෂ්මත් සුගන්ධ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවීද ? එම තෙරන් වහන්සේ මීට කල්ප අනූ දෙකකට පෙර පහළ වූ තිස්ස නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වැඩ වසන සමයේ මනුෂ්‍යයෙක්ව උපන්හ. වැඩිවියට පත් වූ ඔහු මුව දඩයමින් කැලයෙහි ම දිවි ගෙවීය. ශාස්තෘන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් පා සළකුණක් තබමින් වැඩි සේක. ඔහු එම පා සටහන දැක, පෙර බුදුවරු හමුවේදී කළ ප්‍රාර්ථනා ඇති බැවින්, ''මේ පියවර නියතයෙන්ම දෙවියන් සහිත ලෝකයේ සිටින අග්‍ර, උතුම් පුද්ගලයාගේම ය''යි දැඩි සතුටට පත්ව කටු කරඬු මල් ගෙන ඉන් පා සළකුණු පුදා සිත පහදවා ගත්තේය. ඔහු එම පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපදුණි. පසුව ඉන් චුත වූ ඔහු ඒ ඒ භවයන්හි පින් දහම් රැස් කරමින් දෙව් - මිනිස් දෙගතියෙහි සැරි සරමින් සිට, කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි කෙළෙඹි පුත්‍රයෙක් වී උපන්නේය. බුදුරජාණන් වහන්සේට ද භික්ෂු මහා සංඝරත්නයට ද මහා දානයක් පූජා කළ එම සිටුතුමා තථාගතයන් වෙසෙන ගඳ කිළිය, ඉතා වටිනා රන්වන් සඳුන් අඹරා බඳුම ලෙස ගාමින් සුවඳවත් කරවා මෙසේ ප්‍රාර්ථනාවක් කළේය. ''උප නූපන් සැම භවයකදීම මාගේ ශරීරය මෙම සුවඳින් යුක්ත වේවා !'' මෙසේ වෙනත් භවයන්හි ද ඉපිද බොහෝ පින්කම් කළ ඔහු කාම සුගති ලෝකවලට අපමණ සැප විඳ; අපගේ බුදුපියාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සැවැත් නුවර මහත් වූ සම්පත් ඇති බමුණු ගෙදරක උපන්නේය. උපන් එ කුමරු මවුකුස පිළිසිඳ ගත් දින පටන් මවගේ සිරුර සහ මුළු ගෙයම දිව්‍යමය සුවඳින් යුක්ත විය. උපන් දිනයේ දී විශේෂයෙන් ම අතිශය සුවඳක් මුළු ගේ පුරාම හැමුවේය. ඔහුගේ ''සුගන්ධ'' යන නම තැබූහ. එකුමරු අනුපිළිවෙලින් වැඩී, මහාසේල තෙරුන් දැක, පැහැදී උන්වහන්සේගෙන් බණ අසා, උන්වහන්සේ ළඟම පැවිදි විය. පැවිදි වූ දින සිට විදසුන් භාවනාව වැඩූ එම තෙරුන් වහන්සේ සත් දිනක් ඇතුළතදී ම රහත් බවට පත් වූහ. මෙම තොරතු අපදාන පාළියේ ද මෙලෙසින් දැක්වේ. (අපදාන පාළි II - කෝරණ්ඩ පුෂ්පීය තෙරාපදානං)

''මම පෙර පිය මුතු පරපුරින් උරුම වූ වනයේ දඩයම් කිරීමෙන් ජීවත් වූයෙමි. සිවුපා සතුන් මරා ජීවත් වූයෙමි. මා හට කුසලයක් නම් නැත. මගේ අසපුව ඉදිරියෙහි පසැස් ඇති ලෝක නායක වූ තිස්ස බුදුරජාණන් වහන්සේ මට අනුකම්පාවෙන් පියවර තුනක් දැක් වූ සේක. එම

පියවර දැක සතුටු වූ මම පැහැදුණු සිතින් පියවර සටහනෙහි සිත පැහැදවීමි. පිපී ගිය කරඬුගසක් දුටු මම කොපු සහිත මල්ගෙන ශ්‍රේෂ්ඨ පාද ලාඤ්ඡනයට පූජා කළෙමි. මැනවින් කළ එම පින්කම නිසාත් චිත්ත ප්‍රණිධිය නිසාත් මිනිස් සිරුර හැරදැමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. මම යම් දිව්‍යමය හෝ මනුෂ්‍ය ආත්මභාවයක උපදින්නේ ද එහිදී ප්‍රභාසහිතව කෝරණ්ඩ පුෂ්ප වර්ණ වූ සමක් ලබාගෙන ජීවත් වෙමි. මෙයින් කල්ප අනූ දෙකකට පෙර යම් කර්මයක් මවිසින් කරන ලද්දේ ද ඒ හේතුවෙන් දුගතියක නො ඉපදුනෙමි. පා සටහන් පිදීමේ විපාකය මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්ස්ගේ අනුශාසනාව ඉටු කළෙමි.'' (5263-5272)

රහත් බවට පත් වූ උන්වහන්සේ එම කාරණය ප්‍රකට කරන සේක, ''**අනුවස්සිකො පබ්බජිතො**'' යන මේ ගාථාව වදාළ සේක. එහි ''**අනුවස්සිකො**'' යනු අනුව ගිය, එළඹුණු එක් වර්ෂයක් ඇති ''අනුවස්ස'' නම් වේ. අනුව ගිය වර්ෂයක් ඇති යන අරුතින් ''අනුවස්සික'' නම් වේ. ''**පබ්බජිතො**'' යනු පැවිද්දයි. පැවිදිවීමයි. පැවිදි වී ගෙවී ගිය වසරක් ඇති, පැවිදි වී එක් වසරක් වන යන අරුත් දෙයි. නැතිනම් අනුව පසුපසින් යන ලද වසර අනූවසරකි. ''එය ඔහුට ඇත'' යැයි ''අනුවස්සික'' නම් වේ. යම් පැවිද්දෙකුට වස් පිරිපූර්ණ නොවූයේ ද එම වස ගණන් නොගැනේ. එනිසා මේ තෙරුන්ට ද වස් පිරිපුන් නොවූ බව පැවසීමට ''අවස්සික'' යන්න යොදන්නට ඇත. ''**පඤ්ච ධම්මසුධම්මතං**'' යනු ශාස්තෘන් වහන්සේ දෙසූ දහමෙහි ඇති ස්වාක්ඛාතාදි වශයෙන් මැනවින් දෙසූ බව, සුධර්මතාවය, ඒකාන්තයෙන් නිවණම ගෙන දෙන බව යන ගුණාංග දෙස බලව. ''යම් තැනක වසරක් පැවිදි විසූ නුඹ පෙරකඳ පිළිවල දන්නා නුවණ, දිව කන් ලබන නුවණ, ආශ්‍රවයන් ක්ෂය කරන්නා වූ නුවණ යන ත්‍රිවිද්‍යාවන්ට එළඹියෙහි. එම ඤාණ අවබෝධ කළෙහි සාක්ෂාත් කළෙහි. මෙසේ බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළේ වෙහි. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ලැබූ, අවවාද ලැබූ නුඹ; ඒ අනුව හික්මුනෙහි.'' මෙසේ මහණකමේ කළ යුතු කටයුතු නිම කිරීමෙන් හටගත් ප්‍රීති සොම්නස විඳින තෙරුන් වහන්සේ තමා, අන්‍යයකු කර (තමා ඉදිරිපිට සිටින්නෙකු කර) මෙසේ ගාථාව වදාළේ යැයි දත යුතුයි.

සුගන්ධ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.5

''ඔභාසජාතං'' යන ගාථාව ආයුෂ්මත් නන්දිය තෙරුන් පැවසූවකි. එහි උපත කෙසේ ද? එම තෙරණුවෝ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ දවස මිනිස් කුලයේ උපන්හ. එම ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි, උන්වහන්සේගේ ධාතු නිධන් කර තැනූ මහසෑයට සඳුන් හර වලින් වේදිකාවක් කරවා මහත් පූජා සත්කාර පැවැත් වූ ඔහු; එතැන් පටන් මහත් ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී නිර්වාණය පතාගෙන බොහෝ පින්දහම් රැස්කරගත්තේය. දේව-මනුෂ්‍ය දෙගතියේම සැප විඳිමින් සසර සැරි සරා, අප තථාගතයන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි කපිලවස්තු නුවර ශාක්‍ය කුල ගෙදරක උපන් ඔහුට නන්දිය යන නම තබන ලදී. වැඩිවියට පත් එකුමරු, තමා ද පැවිදිව විඳසුන් වඩා කළ ප්‍රාර්ථනා ඇති බැවින් නොබෝ කලකින්ම රහත් ඵලය ලබාගත්තේය. නන්දිය මහ රහතන් වහන්සේගේ චරිත විස්තරය මෙසේ අපදාන පාළියේ දක් වේ.

(අපදාන පාළි I, සපරිවාරිය තෙරාපදානය)

''ලෝක ජ්‍යේෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ පදුමුත්තර නම් බුදුරජහු ගිනි කඳක් මෙන් බබල බබලා පිරිනිවන් පෑ සේක. මහාවීර වූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි, උන්වහන්සේගේ ධාතු නිධන් කළ මහසෑයක් කරන ලදී. ඒ අති උතුම් වූ සෑරජුට සැදැහැජනයා දිවා රෑ උවටැන් කළහ. පහන් සිත් ඇති මම, සතුටු සිතින් එම සෑරජුට සඳුන් වේදිකාවක් කළෙමි. සෑරජුට යෝග්‍ය වූ පරිදි සඳුන් දුම්නි ද පිදුවේය. එම පූජා කර්මයේ විපාක වශයෙන් සසර දෙවි-මිනිස් දෙගතියේ උපන් මම ලාමකයෙක් නොවුනෙමි. පහත් සිත් ඇත්තෙක් නොවීමි. මීට කල්ප එක්දහස් පන්සීයකට පෙර මහත් බල ඇති සමන්ත නම් සක්විති රජවරු අටදෙනෙක්ව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලද්දේය. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' (1955-1960)

රහත් බවට පත්වූ නන්දිය තෙරුන්, අනුරුද්ධාදී තෙරවරු සමඟ නැගෙනහිර දිසාවේ වූ මිගදායෙහි (මුවන්ට අභයදුන් බිම) වාසය කළ සේක. එසමයේ පාපී මාරයා මේ තෙරුන් භය කරනු කැමතිව පැමිණියේය. උන්වහන්සේ ඉදිරියේ මහත් බියජනක රූපයක් මැවූ විට තෙරුන් ''මේ පාපී මාරයා ම යැ''යි දැන; ''පාපී මාරය! නුඹගේ විෂය ඉක්මවූවන්ට නුඹගේ කාර්යයන්ගෙන් කුමක්නම් කළ හැකිද? ඒ උතුමන්ට අවහිර

කිරීමෙන් නුඹම ඉතා දරුණු වූ අනර්ථයන්ට පැමිණෙන්නෙහියැ''යි දක්වමින් ''ඔභාස ජාතං එලගං'' යන ගාථාව දේශනා කළේය.

එහි ''**ඔභාසජාතං**'' යනු යම් මහණෙකුගේ සිත, ''ඤාණය'' - ''ප්‍රඥාව'' නම් ආලෝකයෙන් හටගත් ආලෝක ඇත්තේ ද; අග්‍ර මාර්ග ඥානය අවබෝධ කරන ලද්දේ ද; එනිසා එමගින් ඉතිරි නොකර සියලුම කෙලෙස් නැමති අන්ධකාරයන් නසා -වනසා දැමූ බැවින්, ''සිත ඉතා ප්‍රභාස්වර (බබලන) බවට පත්වූයේය'' යන අර්ථයයි. ''**එලගං**'' යනු එලයට පත්වූ. අග්‍රඵල ඤාණයෙන් හෙවත් අර්හත් මාර්ග, අර්හත් ඵල සිත් ඇති යන අදහසයි'' ''**චිත්තං**'' යනු රහතන් වහන්සේගේ සිතයි. සමාන බැවින් කියයි. එනිසා ''**අභිඤ්ඤාසෝ**'' යැයි කියන ලදී.

තණ්හාව නිරුද්ධ වූ බැවින්. දුරුකළ බැවින් රහතන් වහන්සේලාට, ''නිරන්තරව අර්හත් ඵල සමවතින් සමවැදීම් වශයෙන් අර්හත් ඵලයෙන් යුක්තවූවෝ'' යැයි කීම සුදුසුය. ''**තාදිසං**'' යනු ''එබඳු වූ ඉහතින් කියූ ගුණාංගයන්ගෙන් යුක්ත වූ රහතන් වහන්සේට'' යන අර්ථයයි. ''**ආසජ්ජා**'' යනු හිරිහැර කොට, විරුද්ධකම් කොට. ''**කණ්හ**'' යනුවෙන් මාරයාට ආමන්ත්‍රණය කරයි. ඒ මාරයා, පව්වූ ක්‍රියා කරන බැවින් ද පව්වූ - කළු-නපුරු අය හා උපතින් සමවන බැවින් ද ''කණ්හ'' නම් වේ. ''**දුක්ඛං නිගච්ඡසි**'' යනු මෙලොවදී කුසට පැමිණි දෙය නොදිරවීම් වශයෙන් නිරර්ථක වූ කාය පරිහරණයේ අනේක දුක් ද පරලොව දී ප්‍රතිකාරයක් - පිළියමක් කළ නොහැකි අනේක අපා දුක්වලට ද පැමිණෙන්නෙහිය. දුක් විඳින්නෙහිය. එය ඇසූ මාරයා ''මේ ශ්‍රමණයන් වහන්සේ මා හඳුනාගත්හ'' යි ලැජ්ජිතව වහාම එහිදී අතුරුදහන් විය.

නන්දිය ථේරගාථා අර්ථ විවරණය නිමියේය.

1.3.6

''**සුත්වා සුභාසිත වාචං**'' යන ගාථාව ආයුෂ්මත් අභය තෙරුන් විසින් පැවසූවකි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සසුනේ පැවිදි බව ලැබූ ප්‍රසිද්ධ ධර්ම කථිකයෙක් වූහ. උන්වහන්සේ ධර්ම දේශනා කරන විට පළමුවෙන්ම ගාථා සතරකින්

භාග්‍යවතුන් වහන්සේට ස්තුති කොට, පසුව ධර්මය දේශනා කළහ. මේ පින්කමේ විපාක වශයෙන් කල්ප ලක්ෂයක් පුරාම දිගු සසරෙහි අපායේ ඉපදීමක් නම් සිදුනොවුණි. ඒ බව මෙසේ ගාථාවකින් කියන ලදී.

''අභිත්‍ථවිත්‍වා පදුමුත්තරං ජිනං
පසන්න චිත්තෝ අභයෝ සයම්භුං
නාගච්ඡි කප්පානි අපාය භූමිං
සතං සහස්සානි උළාර සඳ්ධෝ''

''පදුමුත්තර බුදුරජාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කොට, අභය සලසන්නා වූ තමා විසින්ම චතුරාර්ය සත්‍ය අවබෝධ කළ තථාගතයන් වහන්සේ කෙරෙහි සිත පදහවා ගැනීමෙන් උපදවා ගත් මහත් වූ ශ්‍රද්ධාව නිසා (මම) කල්ප ලක්ෂයක් පුරාම අපාය භූමියට නොගියෙමි.

කෙත්වතු සම්පත් ආදිය ලබා, පූර්ව -මධ්‍යම හා අවසාන චේතනා වශයෙන් ඉතා මහත් වූ සිත ඇතිව කරන ලද දානාදී අප්‍රමාණ පුණ්‍ය මහිමය නිසා උන්වහන්සේ සසර විදි සැපද අප්‍රමාණය. ''අචින්ත්‍යය වූ මහා පුරුෂයන් කෙරෙහි පැහැදුණු සිත් ඇත්තන්ගේ විපාකය ද අචින්ත්‍යම වේ'' යැයි කියන ලදී. ඒ ඒ භවයන්හිදී රැස්කරන ලද පුණ්‍ය මහිමය ද උන්වහන්සේට උපස්ථම්භක (ආධාර) විය. එසේම විපස්සී බුදුරජාණන් වහන්සේ උදෙසා ඔහු වැටකේ මලින් පූජාවක් පැවැත්වී ය. මෙවැනි මහත් වූ සුවිසල් පින්කම් කිරීමෙන් ලද විපාක නිසා කාම සුගතීන්හිම ඉපදුණු මේ සුපින්වත් පුරුෂයාණේ අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි බිම්බිසාර රජුගේ පුතෙකු වී ඉපදුණි. ''අභය'' නාමයෙන් ඔහු ප්‍රකට විය. ඔහුගේ උපත පිළිබඳව අන්‍ය සමයන්හිද කියැවේ. ඔහුට නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘතුමා උභතෝකොටික ප්‍රශ්නයක් ඉගැන්වීය. ''මේ පැනය අසා ශ්‍රමණ ගෞතමයන්ට වාදාරෝපණය කරව''යි පැවසූ නිගණ්ඨනාථ පුත්ත අභය කුමරු අප භාග්‍යවතුන් වහන්සේ කරා එවිය. භාග්‍යවතුන් වහන්සේ කරා එළඹි ඔහු එම ප්‍රශ්නය උන්වහන්සේගෙන් විමසීය. එම ප්‍රශ්නයේ නානාවිධ ව්‍යාකරණයන් විස්තරාත්මකව පැවසූ විට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී ඔහු, ''නිගණ්ඨයන් පැරදුණි. ශ්‍රමණ භවත් ගෞතමයෝම ''**සම්මා සම්බුද්ධයන**''යි දැන බුදුසසුනේ උපාසකයෙක් බවට පත් විය. ඉන්පසු කාලයක බිම්බිසාර රජු කළුරිය කළ කල්හි හටගත් සංවේග ඇතිව ඔහු සසුනේ පැවිදි විය. පසුව ''තාලච්ඡිග්ගලූපම'' සූත්‍ර දේශනාව අසා සෝවාන් ඵලය ලබාගත් අභය තෙරණුවෝ, විදසුන් වඩා

රහත්බවට පත්වූ සේක. අර්හත්වය සාක්ෂාත් කරගත්හ. එය අපදාන පාළියේ මෙලෙසින් විස්තර වේ. (අපදාන පාළි II, තේතක ප්‍රත්‍යේක තෙරාපදානං)

''පුරුෂෝත්තම වූ බුදුරජාණන් වහන්සේ විනතා නදී තෙර වැඩසිටි සේක. මනාව සන්සිදුණු සිතැති, එකඟ වූ සිතැති, කෙලෙසුන් දුරලූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි මම සිත පහදවා ගතිමි. එකල මම ප්‍රසන්න සිත් ඇතිව, සතුටුවූයෙම් අතිශය සුවදවත් වැටකේ මලින් උන්වහන්සේට පූජා කළෙමි. මීට කල්ප අනූඑකකට පෙර කරන ලද පුණ්‍ය පූජාවේ අනුසස් ලෙස මේ දක්වා දුගතියක නො ඉපදුනෙමි. බුද්ධ පූජාවෙහි විපාකය මෙබඳුය. මවිසින් කෙලෙස් දවන ලදී. -පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව මැනවින් ඉටුකළෙමි.'' (5473-5478)

රහත් බවට පත්වූ අභය තෙරණුවෝ තම පිළිවෙත් ප්‍රකට කිරීම් වශයෙන් ස්වකීය රහත් බව පෙන්වමින්, **සුඝා සුභාසිතං වාචං** '' යන ගාථාව වදාළහ.

එහි **'සුඝා''** යනු කන් යොමුකර, ශ්‍රෝතද්වාරයෙන් (කනින්) මැනවින් විමසා බලා, **''සුභාසිතං''** යනු මැනවින් කියන ලද, යහපත් වූ දේව භාෂිතයෙක් වූ, සම්මා සම්බුදුවරයන් වහන්සේ මහා කාරුණික බැවින් කිසිදු හිංසාත්මක දෙයක් නොපවසති. ඒකාන්තයෙන්ම උන්වහන්සේලා චතුරාර්ය සත්‍යයට පුද්ගලයා යොමුකරන වචනයක් ම පිටකරති. දේශනා කරති. චතුරාර්ය සත්‍යයෙන් පරිබාහිර වූ ධම් දේශනාවක් නම් භාග්‍යවතුන් වහන්සේලා කිසිසේත් නොපවත්වති. ''**බුද්ධඝ්ඝ**'' යනු සර්වඥ වූ බුදුවරුන්ගේ. ''**ආදිච්චබන්ධුනො**'' යනු සූර්ය වංශයේ උපන් බැවින් භාග්‍යවතුන් වහන්සේ ආදිත්‍යයන් ගේ ඥාතියා යන අරුතින් ''ආදිච්ච බන්ධු'' නම් වලින් හැඳින් වේ. ඒ ආදිත්‍ය බන්ධු වූ භාග්‍යවතුන් වහන්සේගේ. භාග්‍යවතුන් වහන්සේ සූයර්යාගේ ඥාති වන බැවින් ''ආදිත්‍ය බන්ධු'' නාමය යෙදේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

''යො අන්ධකාරෙ තමසී පභංකරො
වෙරොචනො මණ්ඩලී උග්ගතෙජො
මා රහු ගිලී චරං අන්තලික්ඛෙ
පජං මම රාහු පමුඤ්චසූරියන්ති''

''යම් ඉරක්, තද ගන අඳුර පළවා හැර ආලෝකය පතුරවයි ද බබළනුයේ වේද මණ්ඩලාකාර සටහන් ඇත්තේ ද උග්‍ර වූ තේජස් සහිත

ද එම්බල රාහු අසුරය! අන්තරීක්ෂයෙහි (අභ්‍යවකාශයෙහි) ඇවිදිනා මගේ පුතු වූ හිරු නොගිලුව. එම්බා රාහු අසුරය! හිරු අත්හරුව.''

''පඤ්චත්‍ථි'' යනු අවබෝධ කළෙමි. ''හි'' යනු නිපාතයක් පමණි. ''නිපුණං'' යනු තේරුම් ගැනීමට අමාරු, අතිශයින් සියුම් වූ නිරෝධ සත්‍යයයි. නැතහොත් චතුරාර්ය සත්‍යයයි. ''හි'' යනු හේතු අර්ථයේ නිපාතයකි. ''ඒ අභය තෙරුන් වහන්සේ චතුරාර්ය සත්‍යය මැනවින් අවබෝධ කරගත් සේක් එහි නිපුණ වූයේ ද එනිසා දැන් උන්වහන්සේට තවත් අවබෝධ කරගත යුතු දෙයක් නැත'' යන අර්ථයයි. කෙසේ අවබෝධ කරගත් සේක්ද? යන්න දක්වීමට **''වාළඟං උසූනා යථා''** යම් සේ සත් කොටසකට බිඳින ලද වල්ගා කෙළවරෙහි හියෙහි විදීමට පුහුණු වූ දක්ෂ වූ දුනුවායකු හිය නොවැරදී විදින්නාක් මෙන්'' චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළෙමි'' යන අදහසයි.

අභය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.7

''දබ්බං කුසං'' යනු ආයුෂ්මත් ලෝමසකංගිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ මීට කල්ප අනූ එකකට පෙර විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක, පැහැදුනු සිතින් නාමලින් උන්වහන්සේට පිදූහ. ඒ පින්කම නිසා දෙව්ලොව ඉපිද, නැවත නැවත පින්දහම් සිදුකර කාම සුගතීන්හිම සැරිසැරූ උන්වහන්සේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සසුනේ පැවිදිව මහණදම් පිරූහ. එසමයෙහි ශාස්තෘන් වහන්සේ භද්දේකරත්ත ප්‍රතිපදාව දේශනා කළ බැවින් එක්තරා භික්ෂුවක් භද්දේකරන්න සූත්‍රය රැගෙන ලෝමසකංගිය තෙරුන් සමඟ සාකච්ඡා කළේය. නමුත් උන්වහන්සේට එකරුණු නොවැටහේ. නොවැටහෙන කල්හි ''මම අනාගතයේදී නුඹ වහන්සේට භද්දේකරන්ත සූත්‍රය වටහා දීමට සමත් වන්නෙමි''යි ප්‍රාර්ථනාවක් කළේය. අනික් භික්ෂුව ''විචාරන්නේ නම් මැනවි''යි කීවේය. ඔවුන් අතුරින් පළමු තෙරුන් වහන්සේ බුද්ධාන්තරයක් දෙවිමිනිසුන් අතර සැරිසරා, අප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේදී කපිලවස්තුවේ ශාක්‍ය රාජකුලයෙහි උපන්හ. ඔහු ඉතා සියුමැලි බැවින් බල්ලකුගේ මෙන් පා තලයෙහි ලෝම ඇති විය. එනිසා ඔහුට

''**ලෝමසකංගිය**'' යන නම තබන ලදී. අනික් තෙරුන් දෙව්ලොව ඉපිද චන්දන දෙව්පුත් නමින් ප්‍රකට විය. ''ලෝමකසංගිය කුමරු, සෙසු අනුරුද්ධාදී ශාක්‍ය කුමාරවරු සමඟ ගොස් පැවිදිවීමට අකමැති විය. එනිසා ඔහු සංවේගයට පත් කිරීම සඳහා චන්දන දෙව්පුත් පැමිණ හද්දේකරත්තය පිළිබඳව විමසීය. කුමරු එය නොදත්තේය. චන්දන දෙව්පුත් ''නුඹ කුමක් නිසා 'මොහුට හද්දේකරත්තය කියන්නෙමි''යි පොරොන්දු වූයෙහි? දැන් නුඹ එහි නමවත් නොදන්නෙහි යැ''යි චෝදනා කළේය.

ලෝමසකංගිය කුමරු දෙව්පුත් සමඟ භාග්‍යවතුන් වහන්සේ හමුවීමට ගොස්, ''ස්වාමීනි, මවිසින් පෙර මොහුට හද්දේකරත්තය ප්‍රකාශ කරන බවට පොරොන්දුවක් වූයේද?''යි විචාළේය. භාග්‍යවතුන් වහන්සේ, ''එසේය, කුල පුත්‍රය! කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සමයේ දී නුඹ එබඳු පොරොන්දුවක් වූයෙහිය''යි වදාළ සේක. ඒ මේ අර්ථ මජ්ඣිම නිකායේ උපරි පණ්ණාසකයේ සඳහන් වන අයුරින්ම විස්තර දත යුතුයි. ඉක්බිති ලෝමසකංගිය කුමරු, ''ස්වාමීනි !එසේ නම් මා පැවිදි කළ මැනව්''යි කීවේය. භාග්‍යවතුන් වහන්සේ, ''තථාගතවරු මවුපියන් විසින් නොඅනුදත් පුතුන් පැවිදි නොකරන්නාහ''යි එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එකුමරු තම මවු **සමීපයට** ගොස් ''මෑණියනි! මට පැවිදිවීමට අවසර දෙනු ලැබේවා''යි කීවේය. මව, ''දරුව! නුඹ ඉතා සියුමැලිය. එනිසා නුඹ කෙසේ නම් පැවිදි වන්නෙහිද?''යි ඇසූ කල්හි තමාට උවදුරු ඉවසීමට හැකි බව පවසන ලෝමසකංගිය කුමරු ''**දඛ්බං කුසං පොටකිලං**'' යන ගාථාව ප්‍රකාශ කළේය.

එහි ''**දඛ්බං**'' යනු දබ්බ නම් තණකොළ වර්ගයයි. ''**සඳූල්**'' ''**හි තණ**'' යනු ද එයට ම පැවසෙන නමකි. ''**කුසං**'' යනු කුස තණයි. බට ගස් වර්ගයකි. ''**පොට කිලං**'' කටු සහිත හා කටු රහිත වැලුක් පැලෑටිය. මෙහිදී කටු සහිත වැලුක්ම අදහස් කරන ලදී. සැවැන්න මුල් ආදිය මැනවින් දූනගත හැකිය. දබ්බාදී තෘණ වර්ග ද සැවැන්න ආදී තණ ද පයින් පාගන ලද්දේ දුක් ඇති කරයි. ගමනට අනතුරක් කරයි. එම තණවර්ග උරයෙන්ම ඉවත් කරන්නෙමි. උරයෙන් බැහැර ලමි. මෙසේ ඉවත් කරද්දී ඇතිවන කටුක දුක ඉවසිය හැක්කෙමි. එනිසා කැළයේ රුක් ගොමු අතරට පිවිස මහණදම් **පිරීමට** මා හට හැකිවන්නෙමි. එනිසා පයින් ඒවා පැහිමෙහි කවර කරුවක්ද?''යි අසයි. ''**විවේකමනුබ්‍රූහයං**'' යනු කාය විවේකය, චිත්ත විවේකය හ උපධි විවේකය වඩමින්. සමූහ වාසය අත්හැර නුදකලාව කාය විවේකය වඩන්නේම නිස් අටක් වූ අරමුණු අතරින් යම්කිසි අරමුණක

සිත සමාධිගත කිරීමෙන් චිත්ත විවේකය ද වඩන්නේ ය. සමූහවාස නොමැති සන්සුන් සිතැත්නාට ම විදර්ශනාවට සිත යොමු කිරීමෙන් සමථය ද විදර්ශනාව ද වැඩිය හැකි වේ. මෙම භාවනා දෙකෙහි සිත මාරුවෙන් මාරුවට යොදවන්නාගේ කෙලෙස් ක්ෂයවීමෙන් උපධි විවේකය ඇති වේ. නොසන්සුන් සිත් ඇත්නාට මෙය නො ලැබේ. එනි සා ''විවේකසුව වඩමින්' යනුවෙන් කියන ලදී. කාය, චිත්ත හා උපධි විවේකය වඩමින් යන අර්ථයයි. මෙසේ පැවසූ කල්හි එකුමරුගේ මව ''එසේ නම් දරුව නුඹ පැවිදි වන්න''යි අවසර දුන්නාය. ඔහු නැවත භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පැවිද්ද ඉල්වීය. ශාස්තෘන් වහන්සේ ඔහු පැවිදි කළ සේක. ඔහු පැවිදි වී කරන ලද පූර්ව කටයුතු ඇතිව, කමටහන් ගෙන අරණ්‍යයට පිවිසි කල්හි භික්ෂූනු මෙසේ පැවසූහ. ''ඇවැත්නි! නුඹ ඉතා සියුමැලිය. ආරණ්‍යයෙහි වාසය කිරීමට සමත්වන්නෙහිද?''යි විමසූ එම තෙරවරුන්ට ද ලෝමසකංගිය තෙරුන් එම ගාථාවෙන්ම පිළිතුරු දුන්නේය. අරණ්‍යයට පිවිසි උන්වහන්සේ භාවනාවෙහි සිත් යොමුකළ සේක්, නොබෝ දිනකින් ම ෂඩ් අභිඥා ලබාගත් සේක. එම විස්තරය අපදාන පාළියේ මෙලෙස දැක් වේ.

''රන්වන් ශරීර ශෝභාවෙන් යුක්ත වූ ලෝවැසියාගේ පූජාවන් පිළිගන්නා වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විථියට වැඩම වූ අවස්ථාවෙහි මම නා මලින් උන්වහන්සේ පිදුවෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් පූජාවක් කළෙම්ද එහි විපාක වශයෙන් මේ දක්වාම දුගතියක නම් නූපන්නෙමි. ඒ පුෂ්ප පූජාවේ විපාක මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් ඵලයට පත් වූ තෙරුන් වහන්සේ නැවතත් තම රහත් බව ප්‍රකාශ කිරීම සඳහා එම ගාථාව වදාළ සේක.

ලෝමසකංගිය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.8

''කච්චි නො වත්ථ පසුතො'' යනු ආයුෂ්මත් ජම්බුගාමිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? එහිමියෝ පෙර බුදුවරුන් ඉදිරියෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී නිවණ පතාගෙන

බොහෝ කුසල් රැස්කර, මෙයින් කල්ප තිස් එකකට පෙර වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී මනුෂ්‍යයෙක් ව උපන්හ. දිනක් ඔහු එරබඳු මල් දැක, ඒ මල් නෙලා ගෙන බුදුගුණ සිහිකරමින් භාග්‍යවතුන් වහන්සේ උදෙසා පූජාකරමින් අහසට විසිකළේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් තව්තිසා දෙව්ලොව ඉපදුණි. ඉන් පසුවද තව තවත් පින්දහම් කරමින් දේව මනුෂ්‍යාත්මභාවයන්හි ඉපිද අපගේ බුදුරදුන් ලොව පහළ වූ සමයේ චම්පාවේ ජම්බුගාමිය නම් උපාසකයාගේ පුතු වී උපන්නේය. එනිසා එකුමරු ට ජම්බුගාමිය පුත්ත යන නම භාවිත විය. ඔහු වැඩිවියට පත්ව භාග්‍යවතුන් වහන්සේ සම්පයේදී ධර්ම ශ්‍රවණය කොට, ලබන ලද සංවේග ඇතිව සසුනේ පැවිදි විය. කරන ලද පූර්ව කටයුතු ඇති උන්වහන්සේ කමටහන් ගෙන සාකේත නුවර අඳුන් වනයෙහි වෙසෙති. ඉක්බිති උන්වහන්සේගේ පියතුමා, ''කිම මාගේ පුතා සසුනේ පැවිදිව කැමැත්තෙන් වෙසේ ද? නැතිනම් අකමැතිව වෙසේ ද?''යි විමසා දැන ගැනීමට **''කච්චි නො වත්‍ථ පසුතො**'' යන ගාථාව ලියා උන්වහන්සේ වෙත එව්වේය. උන්වහන්සේ එය කියවා, ''මගේ පියා ප්‍රමාදව වාසය කිරීම සැකකරයි. මම අදම පුනුදුන් බවින් මිදෙන්නෙමි''යි අද දක්වාම මා හට පුනුදුන් බවින් මිදීමට නොහැකි වීය''යි සංවේග උපදවා වහ වහා උත්සාහ කර, වෑයම්කර නොබෝ කලකින්ම ෂඩ් අභිඥා ලබාගත් සේක. එනිසා අපදාන පාළියේ එම තොරතුරු මෙසේ දැක් වේ.

''එරබඳු ගසක පිපුණු මල් දුටු මම, ඒවා කඩාගෙන ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ සිහිපත් කර, ඇදිලි බැඳගෙන අහසෙහි එම මල් පූජා කළෙමි. මැනවින් කරන ලද ඒ කර්මයේ බලයෙන් ද චිත්ත ප්‍රණිධිය හේතුවෙන් ද මම මනුෂ්‍ය ශරීරය හැරදමා තව්තිසා දෙව්ලොව ඉපදුනෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් කුසල කර්මයක් සිදු කළෙමි ද එනැන් සිට දුගතියක් නම් නුදුටුවෙමි. මල් පූජාවෙහි විපාකය මෙබඳුය. මවිසින් කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත් වී නෑයන් වසන නුවරට වැඩි උන්වහන්සේ බුදුසසුනේ නෛර්යානික බව ප්‍රකාශ කරමින් ඍද්ධිමය පෙළහරක් දැක්වූහ. එය දුටු ඤාතීහු පැහැදුණු සිතැතිව බොහෝ සංඝාරාම කරවූහ. තෙරුන් වහන්සේද තම පියා විසින් එවූ ගාථාව හෙන්ඩුවක් මෙන් ගෙන උත්සාහ කර, වෑයම් කර රහත් බවට පත්වූහ. රහත් බව ප්‍රකාශ කරන උන්වහන්සේ සිය පියාට ගෞරවයක් ලෙස ඔහු එවූ **''කච්චි නො වත්‍ථපසුතො**'' යන ගාථාව ම වදාළ සේක.

එහි ''**කච්චි**'' යනු ප්‍රශ්නාර්ථයේ නිපාතයකි. ''**නො**'' යනු ප්‍රතිශේෂාධාර්ථ නිපාතයකි. ''**වත්ථ පසුතො**'' යනු වස්තු සැකසීමෙහි නිරත වූ. සිවුරෙන් සැරසීමට අතිශයින් කැමති වූ. එහි ඇලුණු. මෙය නිදසුන් වශයෙන් දැක්වීමක් පමණි. පාත්‍රා සැරසීම් අදි වපල, අස්ථිර ගති ස්වභාවයන් ද මෙහිදී අදහස් කරන ලදී. ''**කච්චි න වත්ථ පසුතො**'' යන පාඨය ද සුදුසුය එහි ද මුලින් පැවසූ අරුතම ඇත. ''**භූසනාරතො**'' යනු ශරීරය සැරසීමෙහි කැමති වූ, අතිශයින් ඇලුණු. ඇතැම්හු සසුනේ පැවිදිකය පිළිබඳ දැඩි බැඳීම නිසා සිවුරු ආදි පිරිකර සෙවීම ද ශරීරය අලංකාරය කිරීම, සැරසීමෙහි යෙදුනාහු වෙති. ''කිම නුඹ වහන්සේ පිරිකර සෙවීමෙහි ද ශරීරය සැරසීමෙහි ද නිරත නොවූවාහු ද?'' යනු මේ මුල් ගාථා පද දෙකේ අර්ථයයි. ''**සීලමයං ගන්ධං**'' යනු නොකැඩීම් වශයෙන් ඉතා පිරිසිදු වූ සතර විධ සංවර ශීලයෙන් මනාව උපලක්ෂිත වූ. ''යමෙකු වෙත ඇති උතුම් සිල් සුවඳ දෙවියන් කෙරෙහි ද හමායන්නේය'' යනුවෙන් පැවසූ ලෙ සිලය සුවඳකි. කිම නුඹගේද සිල් සුවඳ හමන්නේද? සීල සම්පත්තිය හා යහපත් වූ කිතු ගොස පැතිරවීමෙන් නුඹ සැම දිසාවක්ම අලංකාර කරන්නෙහි ද?'' ''**නෙතරා පජා**'' යනු සෙසු දුසිල් පුද්ගලයෙක් නොවේ. දුසිල් බව නිසා දුසිල් පුද්ගලයන්ගෙන් දුගඳ හමයි. මෙසේ නුඹගෙන් දුගඳ නොහමා, කිම සීලමය වූ සුවඳක්ම හමන්නේ ද?'' යන අර්ථයයි. නැතහොත් ''නෙතරා පජා'' යනු සෙසු දුසිල් ජනයාගෙන් නෙකෙනු නොවේ. ''යම් සේ සිල් සුවඳම හමන්නේය'' යන විවරණය අනුව මෙහිදී සිල් සුවඳ හැමීම ම ප්‍රකටව දක්වයි.

ජම්බුගාමිය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.9

''**සමුන්නමයමත්තානං**'' යන මේ ගාථාව ආයුෂ්මත් හාරිත තෙරුන් විසින් පැවසූවකි. එහි උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇති එම තෙරුන්, ඒ ඒ භවයන්හි ඉපදෙමින් නිර්වාණාවබෝධය පිණිස අනේකවිධ පුණ්‍ය සම්භාර ධර්මයන් රැස්කර ගත්තේය. මෙයින් කල්ප තිස් එකකට පෙර පහළ වූ සුදස්සන නම් පසේ බුදුරජාණන් වහන්සේ දැක පැහැදුණු සිත් ඇති හෙතෙම, කෙළින්ද මලින් උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කමේ විපාක ලෙස කාම සුගතීන්හිම ඉපදෙමින් අවුත්, අප තථාගත

සම්මා සම්බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත් නුවර බමුණු මහසල් කුලයක ඉපිද **''හාරිත''** නමින් ප්‍රකට විය. හාරිත වැඩිවියට පත් වූ කල්හි මාපියෝ, ඔහුට සුදුසු කුලයකින් තරුණ බැමිණියක් විවාහ කර දුන්හ. ඔහු ඇය සමඟ කම්සුව විඳිමින් පසුවන කල්හි, දිනක් තමාගේත් ඇයගේත් රූපසම්පත්තිය නුවණින් විමසා බැලූ හාරිත කුමරුට පෙර පින් බලයෙන් මෙහෙයවනු ලබන්නේ, ''මෙබඳු වූ රූප සම්පත්තිය පවා නොබෝ දිනකින්ම ජරාවට මරණයට පත්වන්නේය''යි කල්පනා විය. එසේ සිතා දින කිහිපයක් ගත වූ විට ඔහුගේ තරුණ භාර්යාව කළු සර්පයෙක් දෂ්ට කිරීමෙන් මිය ගියාය. ඉන් බොහෝ සේ කළකිරුණු හාරිත, ශාස්තෘන් වහන්සේ සම්පයට ගොස් ධර්මශ්‍රවණය කොට ලැබූ ශ්‍රද්ධා ඇත්තේ, සියලු ගිහි බැඳීම් සිඳ සසුනේ පැවිදි විය.

හාරිත හිමියෝ සිය චරිතයට ගැලපෙන කමටහන ගෙන, වාසය කළ නමුත් කමටහන සම්පූර්ණ නොවේ. සිත සෘජු කරගැනීම අපහසු වේ. එක අරමුණක සිත නො පිහිටයි. උන්වහන්සේ පිඬු පිණිසගමට වැඩි මොහොතේ එක්තරා හී වඩුවෙක් හී දඬු යන්තුයෙහි දමා සෘජු කරනු දැක, ''මොවුහු අචේතනි දෙය ද සෘජු කරති, කුමක් හෙයින් මම සිත සෘජු නොකරන්නෙමිද?''යි සිතා වහා එතැනින් හැරී අවුත්, දිවා කාලයේ වසන තැන හිඳ විදසුන් භාවනාව වැඩීමට පටන් ගත්හ. එවිටම භාග්‍යවතුන් වහන්සේ අහසෙහි හිඳිමින් අවවාද දෙන සේක්, **''සමුන්නමයමන්තා නං''** යන ගාථාව වදාළ සේක. ඇතැමෙක් මෙම ගාථාව හාරිත තෙරුන්ම තමා වෙනත් අයකු ලෙස සලකාගෙන තමාටම අවවාද පිණිස වදාළ බව කියති.

මෙසේ එම ගාථාවේ **''සමුන්නමයං''** යනු මැනවින් උත්සාහ ගෙන නැගී සිටින්න. ''සමාපත්ති වශයෙන් කුසීත බවට පත්වීමට නොදී, සිත ඉන් නඟා සිටුවමින් වීර්ය සමථයෙහි සිත යොදවන්නේ ය'' යන අර්ථයයි. **''අත්තානං''** යනු සිතයි. නැතිනම් **''සමුන්නමයා''** යනු කුසීත භාවයෙන් සිත ඔසවා තබයි. මකාරය පද සන්ධි කිරීමෙන් පැමිණියකි. නිග්ගහීතයට ''ම'' ආදේශ වී ඇත. (**සමුන්නමයං+ අත්තානං**) ''හීන වූ වීර්ය ඇති බැවින් නුඹගේ සිත කමටහනෙහි මැනවින් නොපිහිටයි. එනිසා වීර්ය ඇරැඹීම් වශයෙන් මනාව සිත කමටහනෙහි ඔසවා තබව. පහත්බවට, දීන බවට නොයා උත්සාහ කරව.'' යන අදහසයි. මෙසේ උත්සාහ කරමින් **''උසුකාරොව තෙජනං චිත්තං උජුං කරිත්‍වාන අවිජ්ජං හිනු හාරිත!''** යනු යම් සේ හී වඩුවා ඊතලයක් මඳක් ඉහලට නංවා, පහතට නවං, විදිනු ලැබූ කල්හි ඉලක්කය බිඳලීමට සමත් වනසේ සෘජු කරන්නේ ද එලෙසින්ම

කුසීත බවින් පහතට වැටීමෙන් ආරක්ෂාවීම් වශයෙන්ද උඩඟුබවින් ඉහළට යෑමෙන් වැලකීම් වශයෙන් ද; අර්පණා සම්පත් ලැබීම් වශයෙන් සිත සෘජුකරවා, සන්සුන් සිත් ඇතිව, විදසුන් වඩා වහාම අග්‍ර වූ මාර්ග ඥාණයෙන් අවිද්‍යාව බිඳ වනසා දමන්නෙහි. මෙය ඇසූ තෙරුන් වහන්සේ නොබෝ වේලාවකින්ම රහත් බව ලබාගත් සේක. මෙම චරිත විස්තරය අපදාන පාළියේ මෙලෙස සඳහන් වේ. (කුටජ පුප්ඵිය තෙරාපදානං අපදාන පාළි II)

''හිමවතට නුදුරෙහි වස්සල නම් පර්වතයක් විය. එහි කඳු අතරෙහි සුදස්සන නම් (පසේ) බුදුරජාණන් වහන්සේ වාසය කරන සේක. මම හිමවතෙහි හටගත් මල් රැගෙන අහසින් යන්නේ සිවුඕස තරණය කළ ආශ්‍රව රහිතව වෙසෙන බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. කෙළිද මල් හිසින් දරාගෙන, ඇඳිලි බැඳ, දතයුතු- සියල්ල තමන් වහන්සේම අවබෝධ කරගත් මහර්ෂී වූ බුදුපියාණන් වහන්සේට පූජා කළෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර කරන ලද පුෂ්ප පූජාවේ ආනිසංස වශයෙන් මේ දක්වා දුගතියක නො ඉපදුනෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙසේය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි''

රහත් බවට පත්ව, තමන් වහන්සේගේ කටයුතු නිමාකළ බව දැන්වීම් වශයෙන් එම ගාථාවම නැවත වදාළ සේක්.

හාරිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.3.10

''ආබාධෙ මෙ සමුප්පන්නෙ'' යනු ආයුෂ්මත් උත්තිය තෙරුන් වහන්සේ පැවසූ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව, නිවන් සුවය පතාගෙන බොහෝ පින්දහම් සිදුකරමින් සසර සැරිසරන කල්හි, මීට කල්ප අනූ හතරකට පෙර සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයේ චන්දභාග නම් නදියෙහි වූ මහත් වූ ගැඹුරු තැනක කිඹුලෙක් වී උපන්හ. එම කිඹුලා දිනක් පරතෙරට යනු කැමතිව නදී තෙරට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දැක,

උන්වහන්සේ එතෙර කරනු කැමතිව ඉවුරට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස පිටෙහි පා තැබූ සේක. එකෙණෙහිම සතුටු සිතැති කිඹුලා, ඔද වැඩි ගිය ප්‍රීති වේගයෙන් උත්සාහය දෙගුණ කරගෙන සැඩපහර සිඳිමින් වහාම භාග්‍යවතුන් වහන්සේ පරතෙරට පැමිණවීය. භාග්‍යවතුන් වහන්සේ කිඹුලාගේ සිත පැහැදුණු බව දුටුසේක් ''මෙතෙම මේ අත්බවින් චුතව දෙව්ලොව උපදින්නේ ය. එතැන් පටන් කාම සුගතීන්හිම උපදින්නේ ය. මෙයින් කල්ප අනූ හතරකට පසුව නිර්වාණාවබෝධය ලබන්නේ ය'' යනුවෙන් වදාරා වැඩි සේක. එකී ලෙසම ඒ කිඹුලා කාම සුගතීන්හි ම සැරිසරා, අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ කල්හි, සැවැත් නුවර එක්තරා බ්‍රාහ්මණයෙකුගේ පුත්‍රව ''උත්තිය'' නමින් ඉපදුණි. එම බමුණා වැඩිවියට පැමිණ ''නිවණ සොයන්නෙමි''යි පිරිවැජියෙක්ව එහෙ මෙහෙ සැරිසරන විට භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක ලඟට පැමිණ ධර්ම ශ්‍රවණය කොට, ලබන ලද ශ්‍රද්ධා ඇතිව සසුනෙහි පැවිදි විය. පැවිදි වුවත් ශීලාධියෙන් අපිරිසිදු වූ නිසා ආර්ය ගුණ විශේෂයක් උපදවා ගත නොහැකි විය. වෙනත් භික්ෂුවක් ආර්ය ගුණ විශේෂ උපදවාගෙන රහත්බව ප්‍රකට කරනු දුටු උත්තිය තෙරුන් වහන්සේ, ශාස්තෘන් වහන්සේ වෙත එළඹ ඉතා සංක්ෂිප්ත මාර්ගයේ මුල් පියවර වූ සීලයම පිරිසිදු කරව''යි යනාදී ලෙස සංක්ෂිප්තව අවවාද කළ සේක. ඒ අනුව විඳසුන් වැඩීම ඇරඹූ උත්තිය හිමියන්ගේ ශරීරයේ ආබාධයක් ඇති විය. එම ආබාධය උපන් කල්හි වඩාත් කළකිරුණු සිත් ඇතිව වඩ වඩාත් වෙර වඩා විදර්ශනා භාවනාවට සිත් යොමුකළ උන්වහන්සේ රහත් ඵලය සාක්ෂාත් කරගත්හ. මෙය අපදාන පාළියේ මෙ ලෙසින් විස්තර වේ. (අපදාන පාළි I, උත්තරිය ථේරාපදානං)

''එකල මම චන්‍ද්‍රභාගා නදී තීරයේ කිඹුලෙක්ව උපන්නෙමි. ගොදුරු සෙවීමෙහි යෙදුණු මම නදී තොටට පැමිණියෙමි. එවිට තමන් වහන්සේම ලොව සියල්ල අවබෝධ කරගත්, අග්‍ර පුද්ගල වූ ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ, ගඟ තරණය කරනු කැමතිව නදී තොටට පැමිණි සේක. එකල්හි මම ද එතැනට ගියෙමි. ගොස් උන්වහන්සේට මෙසේ සැලකළෙමි. ''මහාවීරයන් වහන්ස! මාගේ පිටට නගිනු මැනවි. මම ඔබවහන්සේ ගඟින් එතෙර කරන්නෙමි. පිය පරපුරින් මේ නදිය මාහට හිමිවිය. මුනීන්‍ද්‍රයනි! අනුකම්පා කළ මැනවි.'' එසේ කරන ලද මාගේ ඇරයුම පිළිගත් බුදුරජාණන් වහන්සේ මා පිටට නැගුණු සේක. සතුටු සිතින් පිනාගිය මම ලෝකනාථයන් වහන්සේ ගඟින් එතෙර කළෙමි.

''ගඟෙහි එතෙරට වැඩි සිද්ධත්ථ බුදුපියාණෙනි ''නුඹ නිවණට පැමිණෙන්නෙහිය''යි වදාරා මා සැනසූ සේක. ඉන් පුන පූ මම දෙව්ලොව ඉපදුනෙමි. දිවාඃංගනාවන් පිරිවරාගෙන දිව සැප විඳිදෙමි. ශක්‍ර දේවේන්ද්‍රට සත් වරක් උපන් මම දෙවිරජය කරවීමි. තෙවරක්ම පෘථිවියට ම ප්‍රධාන වූ සක්විති රජ වූයෙමි. දැන් මම විවේකයෙහි ඇලී, ප්‍රඥා ඇතිව, මනාව සංවර කරගත් ඉඳුරන් ඇතිව සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදිව අන්තිරම සිරුර දරමි. මෙයින් කල්ප අනූනහතරකට පෙර නරශ්‍රේෂ්ඨ වූ තථාගතයන් වහන්සේ ගඟින් එතෙර කිරීමේ කුශලයේ බලයෙන් මම මේ දක්වාම දුගතියක නූපන්නෙමි. ගඟින් එතෙර කිරීමේ පුණ්‍ය මහිමය එවැනිය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ උත්තිය තෙරුන් වහන්සේ තමාගේ ශ්‍රමණ පිළිවෙත් සම්පූර්ණ කිරීම අවසන් කළ බව ප්‍රකට කිරීම් වශයෙන් සිය අර්හත්ඵය පවසන සේක්, ''ආබාධෙ මෙ සමුප්පන්නෙ'' යන ගාථාව වදාළ සේක.

එහි ''අබාධෙ මෙ සමුප්පන්නෙ'' යනු පුද්ගල ශරීරය ආබාධිත, රෝගීබවට පත් කරන හෙයින් ''ආබාධ'' නම් වූ ධාතු ප්‍රකෝපවීමෙන් හටගත් රෝගයක් මා තුළ හටගත් කල්හි ද ''**සති මෙ උපජ්ඣා**'' මට ඒ පිළිබඳ සිහිය උපදියි. ''මට ආබාධයක්, වේදනාවක් උපන්නේය. එයට ඉඩ හසර ලබාදුනහොත් එම ආබාධය තව තවත් වැඩෙන්නේය. යම් සේ මේ ආබාධය නොවැඩේද එලෙසින් වීර්යාරම්භ කරමි. නොපැමිණි ඵලයන්ට පැමිණීම සඳහාත්, අවබෝධ නොකලසත්‍යයන් අවබෝධකරගැනීම සඳහාත්, සාක්ෂාත් කරගත නොහැකි වූ දෙය සාක්ෂාත් කරගැනීමටත් වීර්යාරම්භ කරමි. එම වීර්යාරම්භයට පාදක වූ සිහිය නිසා දුක් වේදනාවලින් පෙළනු ලැබුවත් මා හට සිහියෙන් යුතුව සිටීමට හැකි විය. මා කෙරෙහි වීර්ය පහළ විය. එනිසා කියන ලදී. ''මා කෙරෙහි ආබාධය උපන් කල්හි, එය අප්‍රමාදීවීමට මට කාලයයි'' යනුවෙන් සිතා ආබාධය පැවතියත් සිහිය අංකුසයක් (හෙණ්ඩුවක්) කරගෙන මේ උත්තිය තෙරුන් වහන්සේ රහත් බවට පත්වූ සේක.

උත්තිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

තෙවැනි වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.4.1

''ඵුට්ඨොඛංසෙහි'' යනු ආයුෂ්මත් ගව්හරතීරිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ පෙර බුදුවරුන් වෙත කළ ප්‍රාර්ථනා ඇතිව සසර සැරි සරා, මෙයට කල්ප තිස් එකකට පෙර සිබි බුදුරජාණන් වහන්සේගේ කාලයේදී මුව වැද්දෙක්ව උපන්හ. එම වැද්දා දිනක් වනයේ හැසිරෙන විට එක්තරා රුක් මූලක වැඩ හිඳ දේව, නාග, යක්ෂාදීන්ට ධර්ම දේශනා කරන සිබි භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක පැහැදුණු සිතැතිව ''මේ උත්තමයන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ යැ''යි ස්වරයෙහි සිත පිහිටුවීය. එම වැදි එසේ කරගත් චිත්ත ප්‍රසාදයෙන්ම දෙව්ලොව ඉපදුනේය. නැවත ඉන් චුතව ඒ ඒ කාම සුගති භවයන්හිම සැරිසරා අවුත්, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර බමුණු කුලයක ඉපිද විය පත් බ්‍රාහ්මණයෙක් වූයේය. අග්ගිදත්ත නමින් ප්‍රකට වූ ඔහු භාග්‍යවතුන් වහන්සේගේ යමක මහා ප්‍රාතිහාර්යය දැක හටගත් පැහැදීම් ඇතිව, සසුනේ පැවිදිව කමටහන් ගෙන ගව්හරතීරයේ තැනක වාසය කරයි. එනිසා උන්වහන්සේ, ගව්හරතීර තෙරුන් වහන්සේ'' ලෙස ප්‍රකට වූහ. එසේ වාසය කරමින් විදර්ශනා වැඩූ උන්වහන්සේ නොබෝ කලකින් ම රහත් බව ලබාගත් සේක. මෙම විස්තර අපදාන පාළියේ මෙලෙස සඳහන් වේ. (අපදාන පාළි II - සොසසඤ්ඤක තෙථෝර පදානං)

''පෙර මම මහා වනයේ හැසිරෙන මුව වැද්දෙක් වීමි. කෙලෙස් දූවිලි රහිත වූ, දිව්‍ය සමූහයා විසින් පිරිවරා ගත්, චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කරන්නා වූ, අමා නිවන ගෙන දෙන්නා වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. ලෝකයාට බහුධූ වූ එම සිබි බුදුරජාණන් වහන්සේ දෙසූ මිහිරි දහම් පද ඇසුවෙමි. අසම වූ අප්‍රති පුද්ගල වූ බුදුපියාණන් වහන්සේ කෙරෙහිද එම මිහිරි ස්වරයෙහි ද සිත පැහැදවීමි. එසේ සිත පැහැදවීමෙන් අතිදුෂ්කර වූ භවය තරණය කළෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර එසේ සිත පහදවා ලැබූ සංඥාවේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ධර්ම සංඥාවෙහි විපාකය මෙසේය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් ඵලය ලබාගත් උන්වහන්සේ, භාග්‍යවතුන් වහන්සේට වැඳ අවසර ගෙන සැවැත්නුවරට වැඩි සේක. උන්වහන්සේ වැඩම වූ පුවත ඇසූ නෑ සමූහයා පැමිණ මහාදානයක් පැවැත්වූහ. තෙරුන් වහන්සේ දින

කිහිපයක් එහි වැස, නැවත ආරණ්‍යයට ම යනු කැමති වූහ. එවිට ඤාතීහු, ''ස්වාමීනි! ආරණ්‍යය නම් මැසි මදුරු ආදි බොහෝ උවදුරු ඇති තැනකි. මෙහිම වසනු මැනවි''යි ආරාධනා කළහ. එය ඇසූ තෙරුන් වහන්සේ ''මාහට රුචි වනුයේ ආරණ්‍ය වාසය පමණක්මය''යි විවේකයේ ඇලීම ප්‍රකට කිරීම් වශයෙන් ද තබා ලැබූ රහත්ඵලය ප්‍රකාශ කිරීම් වශයෙන් ද ''ඵුට්ඨා ඩංසෙහි'' යන ගාථාව වදාළ සේක.

එහි ''ඵුට්ඨා ඩංසෙහි'' යනු ''ඩැහැ ලේ බොන බැවින් ''ඩංස'' යන නම් ලද අඩක ආදී මැසිවර්ග විසින්, මදුරු ආදී තියුණු තුඩ ඇති ප්‍රාණීන් විසින් ස්පර්ශ කරන ලද, දෂ්ඨ කරන ලද '' යන අර්ථයයි. **අරඤ්ඤසඤ්ඤිං** යනු ගමින් දුනු පන්සියයක් ඈත ප්‍රත්‍යයන්ත නම් ලද ආරණ්‍යය, වනය නම් වනයෙහි. ''බ්‍රහාවනෙ'' යනු මහගස්, රුක්ගොමු ආදියෙන් ගහන වූ මහාවනයෙහි, මහ කැළයෙහි. **''නාගො සඛාම සීසෙවා''** යනු යුද බිමකට වන් මහ ඇත් රජකු සේ. සංග්‍රාම මධ්‍යයේ සතුරු සෙනඟ සුනුවිසුණු කරන ඇතකු මෙන්; ''ආරණ්‍යයෙහි විසීම නම් බුද්ධාදීන් විසින් වර්ණිත වූ පසසන ලද දෙයකි'' ආදී වශයෙන් ඊට උත්සාහ වත්ව, සිහි ඇතිව එම වනයේ වෙසෙමි. එහිදී ඇතිවන මැසි මදුරු උපදුව ඉවසන්නෙමි. ඉන් නො කලකිරෙන්නෙමි.'' මැසිමදුරු ආදීහු මා හට දෂ්ඨ කළත් යුද බිමට වන් ඇතෙකු මෙන් සිහි ඇතිව ඒවා ඉවසන්නෙමි'' යනුවෙන් ආරණ්‍යය අත් නොහරින බව මෙම ගාථාවේ අදහසයි.

ගවිභරතීරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.2

''අජරං ජීරමානෙනා'' යනාදී ගාථාව ආයුෂ්මත් සුප්පිය තෙරුන් විසින් පැවසූවකි. එහි උපත කෙසේද? පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි කුලගෙයක උපන් සුප්පිය තෙරණුවෝ, වැඩිවියට පත්ව ගිහිගේ කළකිරී තවුස් පැවිද්දෙන් පැවිදිව කැළයෙහි වාසය කළහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ දක පැහැදී ඵලවැල පූජා කළේය. පසුව මහා සංඝරත්නයට ද ඵලවැල පූජා කළේය. ඒ පුණ්‍ය කර්මයේ විපාක වශයෙන් දෙව්-මිනිසුන් අතර සැරි සරා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි ක්ෂත්‍රිය කුලයෙහි උපන් හෙතෙම ගිහිගේ කළකිරී සසුනේ

පැවිදි වී මහත් බහුශ්‍රැතයෙක් විය. ජාති මදයෙන් හා උගත්කමේ මදයෙන් මත් වූ එම තෙරුන් තමා උසස්කර සිතා, සෙසු භික්ෂූන් පහත් කර සළකමින් වාසය කළේය. අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි, එම තෙරුන් තමාගේ කර්මයන්ට අනුරූප ලෙසම සැවැත් නුවර සොහොන් පල්ලෙකුගේ ගෙදර ඉතා අවලස්සන දරුවෙකුව උපන්නේය. ඔහුගේ නම සුප්පිය නම් විය. තරුණවියට පත් වූ සුප්පිය, තම යහළුවෙකු වූ සෝපාක තෙරුන් සමීපයට පැමිණ, ධර්ම ශ්‍රවණය කිරීමෙන් ලැබූ ශ්‍රද්ධාව ඇතිව සසුනේ පැවිදි විය. යහපත්ව පිළිවෙත් මැනවින් සම්පූර්ණ කළ සුප්පිය තෙරුන් වහන්සේ ''අජරං ජීරමානෙන'' යන ගාථාව දේශනා කළහ.

එහි **''අජරං''** යනු ජරාවට පත්වීමක් නොමැති නිවණයි. නිවණ නුපදින බැවින් ''එහි ජරාවක් නැත. නිවණ අවබෝධ කළ පුද්ගලයන්ට ද නැවත උපතක් නැත.'' යන ලෙසින් ජරාවට පත්වන හේතූන් නැතිකළ බැවින් නිවණ ''අජර'' නම් වේ. **''ජීරමානෙන''** ජරාවට පත්වේයනු ක්‍ෂණයක් **ක්‍ෂණයක්** (මොහොතක්) පාසා ජරාවට පත්වෙමින් පවතින **''තපපමානෙන''** යනු සන්තාපයට පත්වන රාගාදී එකොළොස් ගින්නෙන් දැවෙන, **''නිබ්බුතිං''** යම් සේ සන්තාපයට පත්වන හේතු නිවාදැමූ බැවින් නිවීම, නිවණ නම් වූ, **''නිම්මිසසං''** යනු පෙරලා ගනියි. භුවමාරු කරයි. **''පරමං සනතිං''** යනු කෙලෙස් ඉතිරි නොකර, පිරිතැවීම් සංසිඳවීම් වශයෙන් උතුම් ශාන්තියයි. සතර යෝගයන්ගෙන් ලුහුබැඳීම් වශයෙන් නොපැමිණෙන බැවින් **''යොගකෙඛමං''** යෝගක්‍ෂෙම වූ, නිවණට වඩා උතුම් වූ දෙයක් නොමැති බැවින් **''අනුත්තරං''** අනුත්තර වූ. මෙහි සංක්‍ෂිප්ත අර්ථය මෙසේය. ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ජරාවෙන් මැඩගත් බැවින් දිරායන්නා වූත්, එසේ රාගාදී ගිනිවලින් නිතර සන්තාපයට පත්වූත්, එසේම අනිත්‍ය දුක් සහගත, අසාර යන සර්ව ප්‍රකාරයෙන්ම නොසන්සිඳෙන ස්වභාව ඇති, උපද්‍රවයන්ගෙන් යුක්ත වූත් යන ස්වභාවයන්ට ප්‍රතිවිරුද්ධ වූ බැවින් ජරාවක් නැති, අතිශයින් සන්සුන් වූ, කිසි උපද්‍රවයක් නොමැති, අනුත්තර වූ නිවණ ලැබීමෙන් දනට ඇති ශෝකී බව දුරු වී, ''අනේ මට මෙය ඒකාන්ත ලාභයකි. මට මහත් වූ අභිඥාධියක් අතට පැමිණියේය'' යනුවෙන් සැපයට පරිවර්තනය වන්නේය. මිනිස්සු යම්කිසි බඩු බාහිරාදියක් නුවමාරු කර ගැනීමේදී අපේක්‍ෂාවක් නොමැතිව ගැනීමෙන් අතිශය ගෞරවත්වයක් ඇතිවන්නාක් මෙන් තෙරුන් වහන්සේ ද ආත්ම සංකල්පනා දුරුකර වාසය කරන සේක්, තම ශරීරයෙහි ද ජීවිතයෙහි ද අපේක්‍ෂාවක් නොමැතිව උතුම් නිවණ අවබෝධ කරගත් බව, ඇසුරු කරගත් බව පවසන සේක්, **''නිම්මිසසං පරමං සනතිං යොගකෙඛමං අනුත්තරං''** යනුවෙන් තමන්

වහන්සේ කී පිළිවෙතම වඩමින් විදර්ශනාවට සිත උත්සාහවත් කර, රහත් බවට පත්වූ සේක.

අපදාන පාළියේ එම තොරතුරු මෙසේ දැක් වේ. (අපදාන පාළි II, සබ්බඵල දායක තෙරාපදානං)

''එකල මම මන්ත්‍රයන් හි කෙළවරට පත් බමුණෙක් ව වරුණ නමින් ප්‍රකටව සිටියෙමි. පසුව පුතුන් දසදෙනෙකු හැර දමා වනයට පිවිසෙමි. එහි මනාව බෙදූ අසපුවක් සෑදූ මම, පන්සලක් කරවාගෙන වාසය කළෙමි. ලෝකයේ ප්‍රජාවන්ට යෝග්‍ය වූ ඒ පදුමුත්තර බුදුපියාණන් වහන්සේ මා සසරින්ගොඩ කරනු කැමතිව ඒ මගේ අසපුවට වැඩි සේක. බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් වනයම ඒකාලෝක වූයේය. ගිනිගත් වනයක් මෙන් පෙනෙන්නට විය. එවැනි වූ තාදි ගුණ ඇති බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ පෙළහර දැක සතුටු වූ මම කොළගොටුවක් ගෙන පලවැලයෙන් එය පිරවූයෙමි. අනතුරුව බුදුරජාණන් වහන්සේ වෙත ගොස්, එම ඵලවැල ගොටුව පූජා කළෙමි. එය පිළිගත් උන්වහන්සේ මාහට මෙසේ වදාළහ.

''නුඹ මේ ඵලාගොටුව ගෙන මා පසුපස එව. සංඝයා එය වැළඳූ කල්හි නුඹට පින් සිදුවන්නේය. ''ඒ වචන පිළිගත් මම ඵලවැල ගොටුව සංඝයාට පූජා කළෙමි. එහි සිත පැහැද වූ මම තුසිත දෙව් ලොව උපන්නෙමි. එම දෙව්ලොව - දිව්‍යමය නැටුමින්, ගැයුමින්, වැයුමින් යුතුව කුසල කර්මයෙන් ජනිත සැප විඳිමි. දිව්‍ය මනුෂ්‍ය ආත්ම භාවයන්හි උපන් මම, අනූන වූ භෝග සම්පත් විඳිමි. ඵල දානයේ විපාකය එබඳුය. බුදුපියාණන් වහන්සේට ඵල දානයක් දුන් මම, මුහුදින් වට වූ පළිත සහිත සිවුමහා දිවයින්හිම ආධිපත්‍ය පතුරුවා වාසය කළෙමි. මේ පක්ෂි සමූහයා ඉහළට නැගෙනතාක් දුර අහසෙහි මාගේ බලය පැතිරුණි. ඵල දානයේ විපාකය එබඳුය. වනයෙහි සිටිනතාක් යක්ෂ, භූත, රාක්ෂස, කුම්භාණ්ඩ, ගුරුළු ආදිහු මාගේ මෙහෙවරට පැමිණෙති. ඉදිබුලෝද බල්ලෝ ද මී මැස්සෝ ද ඩැහැ ලේ බොන මැසි මදුරුවෝ ද මාගේ අණසකට පත්වූහ. ඵලදානයේ විපාකය මෙබඳුය. කුරුළු යෝනියේ උපන් මහ බල ඇති සුපර්ණ නම් වූ ගුරුළු රාජ පක්ෂීහු පවා මාගේ සරණයෙහි පිහිටියහ. ඵලදානයේ විපාක එබඳුය. දීර්ඝායුෂ විඳින, සෘද්ධිමත් මහත් යසස් ඇති නාගයෝ ද මට කීකරු වූවෝ වූහ. ඵලදානයේ විපාක මෙබඳුය. සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්, වෘක හා කරබානා වලස් යන මොවුහු පවා මාගේ වසඟයට පත්වූහ. බෙහෙත්, තණපත්, වෘක්ෂාදියේ හා අහසෙහි වෙසෙන

සියලුම දෙවියෝ ද මාගේ පිහිට (සරණ) පැතූහ. ඵල දානයේ විපාක මෙබඳුය''

''එසේ සැප විඳි මම දැන් දකීමට අතිශයින් අපහසු වූ, ඉතා සියුම් වූ, ගැඹුරු වූ මනාව දේශිත නිවණ ප්‍රත්‍යක්ෂ කරගෙන වෙසෙමි. ඵල දානයේ විපාකය මෙබඳුය. අෂ්ට විමෝක්ෂ ලැබූ මම ආශ්‍රව රහිතව, ප්‍රඥාවන්තව වෙසෙමි. මහත් යස ඇති, ක්ෂය කළ දොස් ඇති ඵලයන්ට (මාර්ග) පත්වූ බුදුපුතුන්ගෙන් කෙනෙකු වූයෙමි. කුශල මූලයෙන් මෙහෙයන ලදුව, අභිඥාවන්හි කෙළවරට පත් මම; සියලු ආශ්‍රව මනාව දැන, අනාශ්‍රවයෙක්ව වෙසෙමි. (ආශ්‍රව දුරු කර වෙසෙමි) ත්‍රිවිද්‍යා ලාභී, සෘද්ධි ලාභ සහිත, මහත් යසස් ඇති, දිවකන් ලද බුදුපුතුන් අතුරින් කෙනෙකු වූ මම සියලු කෙලෙස් දූවූයෙමි. මෙයින් කල්ප ලක්ෂයකට පෙර කරන ලද ඵලදානයේ විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාකය මෙබඳුය. සියලු භව සිඳ දැමූ මම බැඳුම් සිඳ දැමූ ඇත්රජෙකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාලාභී වූ මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩ් අභිඥාවෝ ද සාක්ෂාත් කරගත් මම බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

සුප්පිය තෙරුන් රහත් බවට පත්වීමෙන් පසුව ද සිය රහත්බව පෙන්වීම සඳහා (ප්‍රකාශ කිරීමට) එම ගාථාව ම දේශනා කළේය.

සුප්පිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.3

''**යථාපි එකපුත්තසමිං**'' යනු ආයුෂ්මත් සෝපාක තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේ සිදුවීද? ඔහු පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හි ඉපිද නිවන් සැප පතාගෙන බොහෝ කුසල් රැස් කළේය. කකුසඳ නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි එක් සිටුගෙදරක උපන් ඔහු, දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් බුළු ඇට මද පිළිගැන්වූයේය. මා කෙරෙහි අනුකම්පාවෙන් භාග්‍යවතුන් වහන්සේ ඒවා පිළිගත් සේක. එම සිටුතුමා භික්ෂු සංඝයා

කෙරෙහිද අතිශය ප්‍රසන්නව සලාක බත් පිහිටුවා, සංඝයා උදෙසා දෙන බත් වශයෙන් භික්ෂූන් වහන්සේලා තිදෙනෙකුට මරණයට පත්වන තෙක්ම කිරිබත් පූජා කළේය. හෙතෙම මේ පින්කම්වල බලයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැප සම්පත් අනුභව කරමින්, සැරිසරන කල්හි, එක් මනුෂ්‍යාත්මභාවයක ඉපිද එක්තරා පසේ බුදුවරයෙකුට කිරිබත් පූජා කළේය. මෙලෙස ඒ ඒ භවයන්හිදී නොයෙක් පින්දහම් කරමින් කාම සුගතීන්හිම සැරිසැරූ මොහු මේ බුද්ධෝත්පාද කාලයෙහි පෙර කරන ලද අකුසල කර්මයක් නිසාවෙන් සැවැත් නුවර එක්තරා දුප්පත් ස්ත්‍රියකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ඔහුගේ මව දසමසක් කුසින් ගැබ දරාගෙන සිට, මුනුකුරා ගොස් වදන කල්හි, දරුගැබ හරස්වීමෙන් සිහි මුර්ඡාවී මැරුණාක් මෙන් සිටියාය. මෙසේ බොහෝ වේලාවක් සිටි බැවින් ''ඇය මළේයැ''යි සිතූ නෑයෝ, ඇය සොහොනට ගෙන ගොස් චිතකයකට නංවා, දේවතානුභාවය නිසා හටගත් අවුවැසි සුළං නිසා ගිනි දැල්වීය නොහැකිව නැවත හැරී ආහ. (පැමිණියහ) පශ්චිම භාවියකු වූ දරුවා දේවතානුභාවයෙන් මවුකුසින් සුවසේ බිහිවිය. මවු කළුරිය කළාය. දෙවියෝ ඔහු රැගෙන මනුෂ්‍ය රූපයෙන් සොහොන් පල්ලාගේ ගෙයි තබාගෙනම කිහිපදිනක් සුදුසු ආහාරවලින් දරුවා පෝෂණය කළහ. ඉන්පසු කාලයක එම සොහොන් පල්ලා, මෙම දරුවා තම පුතෙකු මෙන් ඇති දැඩි කළේය. ඒ දරුවා මෙලෙස වැඩෙමින්, ඒ සොහොන් පල්ලාගේ පුතු වූ සුප්පිය සමඟ කෙළිසෙල්ලම් කරමින් සිටියේය. ඔහු සොහොනේම ඉපිද, එහිම වැඩෙමින් සිටි බැවින් ''සෝපාක'' නමින් ප්‍රකට විය.

එක් දිනක් අප භාග්‍යවතුන් වහන්සේ ඉතා අලුයම් කාලයෙහි සිය නුවණ දැල විසිරුවා හික්මවිය හැකි සත්ත්වයන් දෙස බලන සේක් මේ සත් හැවිරිදි සෝපාක දරුවා දුටු සේක. දැක එම සොහොනට වැඩම කළ ශාස්තෘන් වහන්සේ වෙත, පෙර කරන ලද කුසල කම් නිසා මෙහෙය වුණු සෝපාක පැමිණ වැඳ පසෙකින් හිඳ ගත්තේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසූ සේක. බණ ඇසූ ඔහු පැවිද්ද ඉල්ලීය. ''පියාගෙන් අවසර ලැබුනේද?''යි ඇසූ කල්හි සෝපාක පියා වෙත ගොස් පැවිදිවීමට අවසර ඉල්ලීය. ඔහුගේ පියා ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ, වැඳ ''ස්වාමීනි ! මේ දරුවා පැවිදි කරන සේක්වා''යි ඉල්වීය. ශාස්තෘන් වහන්සේ සෝපාක කුමරු පැවිදි කරවා මෛත්‍රී භාවනා කමටහනෙහි නියුක්ත කළ සේක. මෛත්‍රී කමටහන වඩමින් සොහොනේ වාසය කළ සෝපාක තෙරුන් නොබෝ දිනකින්ම මෛත්‍රී ධ්‍යානය උපදවාගෙන, එම ධ්‍යානයම පාදක කරගත් සේක; විදසුන් වඩා රහත් ඵලය සාක්ෂාත් කරගත් සේක. අපදාන

පාළියේ එම තෙරුන් මෙසේ ප්‍රකාශ කරයි. (අපදාන පාළි II. විහිටක මිඤ්ජිය තෙරාපදානං)

''සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණි ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ සමූහයා කෙරෙන් වෙන්ව හුදකලාව වනයට වැඩි සේක. මම බුළු ඇට මද ගෙන වැලක ඇමිණුවෙමි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කඳු අතරේ හිඳ ධ්‍යාන වැඩූහ. ඒ බුදුරදුන් දුටු මම පැහැදුණු සිතින් දැහැණාර්හ වූ වීරයන් වහන්සේට බුළු ඇට මද පිළිගැන්වීමි. එදා මම යම් බුළු ඇට දානයක් පිළිගැන්වූයෙම් ද එහි විපාක වශයෙන් මේ දක්වාම දුගතියක නූපන්නෙමි. මවිසින් කෙලෙස් දවන ලදී. සියලු භව නසන ලදී. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ දමා ආශ්‍රව රහිතව වෙසෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මෙසේ රහත් බවට පත්වූ උන්වහන්සේ සෙසු සොහොනේ වසන භික්ෂූන්ට මෛත්‍රී භාවනා කමටහනේ අගය පෙන්වමින් ''**යථාපි එකපුත්තසමිං**'' යන ගාථාව වදාළ සේක.

එහි ''**යථා**'' යනු උපමා අර්ථයේ නිපාතයකි. ''**එක පුත්තසමිං**'' යනු කුල පරපුර පිරිසිදු කරයි, ආරක්‍ෂා කරයි යන අරුතින් ''පුතා'' නම් වේ. අනුජ ආදී භේද ඇති පුතා. දරුවා. එක පුතා. ඔහු කෙරෙහි, තම එකම පුතු කෙරෙහි. පුතු විෂයෙහි. මෙය සත්තමී විභක්ති වචනයකි. ''**පියසමිං**'' යනු ප්‍රිය වන බැවින්, එකම පුතු බැවින් රූපය, හැසිරීම්, ආදියෙහි ප්‍රේම කරන බැවින්. ''**කුසලී**'' කුසල යනු ක්ෂේම වූ සුවපත් භාවයයි. ''එය ලබාගැනීම මොහුට ඇත''යි 'කුසලී' නම් වේ. සත්ත්වයන් කෙරෙහි පතුරුවන හිතෙෂී මෙත් සහගත භාවයයි.''**සබ්බෙසු පාණෙසු**'' යනු සියලු සතුන් කෙරෙහි. ''**සබ්බත්ථ** සෑම දිශාවකම. නැතිනම් සෑම භවාදියකම සිටින, නැතහොත් සෑම අවස්ථාවකම සිටින සත්ත්වයන් කෙරෙහි. එම ගාථාවේ අදහස මෙසේය. ''යම් සේ ප්‍රිය වූ මනාප වූ එකම පුතු කෙරෙහි මාපියෝ මිත්‍රත්වයෙන් ඒකාන්ත හිතෙෂීභාවය පතුරුවන්නේ ද එමෙන්; පෙරදිග ආදී භේද ඇති සියලු දිශාවෙහිම, කාමාදී සියලු භවයන්හිම, ළදරු ආදී සෑම අවස්ථාවකම සිටින සියලු සතුන් කෙරෙහි ඒකාන්ත හිතෙෂීභාවය පතුරන්නේ නම්, ''මොහු අපගේ මිතුරෙකි, මොහු සතුරෙකි'' ආදී ලෙස සීමා නොකොට සීමා වෙන්කිරීම් බිඳ දමා සෑම දෙනාටම එකම මෙත් සිත පතුරුවන්නේ නම් මැනවි. මේ ගාථාව වදාළ සෝපාක තෙරණුවෝ ''ආයුෂ්මතුනි! ඉදින් නුඹ වහන්සේලා ද මේ මෛත්‍රී භාවනාව අනුව හික්මෙවු. මෛත්‍රී භාවනාව

වඩවු. භාග්‍යවතුන් වහන්සේ විසින් ''සැපසේ නිදයි'' ආදී වශයෙන් මෛත්‍රී භාවනාවේ ආනිසංස එකොළොසක් දක්වන ලදහ. ඒකාන්තයෙන්ම නුඹලා එම ආනිසංස ලබන්නෝ වෙත්වා !''යි අවවාද දුන්හ.

සෝපාක පේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.4

''අනාසනනවරා'' යනු ආයුෂ්මත් පෝසිය තෙරුන් වහන්සේගේ ගාථාවකි. එහි උපත කෙසේද? උන්වහන්සේද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති සේක. ඒ ඒ භවයන්හි ඉපිද නිවන් පතාගෙන බොහෝ කුසල දහම් රැස් කරගෙන කාම සුගතීන්හිම සැරිසරා, මීට කල්ප අනූ හතරකට පෙර තිස්ස නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි මුව වැද්දෙක් ව ඉපිද කැළයේ හැසිරුණේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුග්‍රහ කිරීම පිණිස කැළයට වැඩමවා ඔහුගේ ඇසට පෙනෙන සේ වැඩ සිටි සේක. උන්වහන්සේ දුටු පහන් සිත් ඇති වැදි තෙම දුනු හී පසෙක දමා ඇදිලි බැඳගෙන සිටියේය. භාග්‍යවතුන් වහන්සේ හිඳගනු කැමති බවක් දක්වූ සේක. ඔහු එකෙණෙහිම තණ මිටි ගෙන සමබිමක මැනවින් තණ අතුරා අසුන පිළිගැන්වීය. අනුකම්පා ඉපිද වූ භාග්‍යවතුන් වහන්සේ එම අසුනෙහි වැඩහුන් සේක. එසේ භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳි කල්හි අතල් ප වූ ප්‍රීති සොම්නස්භාවයට පත්ව, උන්වහන්සේ වැඳ නමස්කාර කළ වැදි තෙමේ තුටු වූ සිතින් එකත් පසෙක සිටියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ''මොහුගේ කුසල බීජය සඳහා මෙපමණක්ම සෑහේ''යැයි දැන අසුනින් නැගිට වෙහෙරට වැඩි සේක. උන්වහන්සේ වැඩම කළ නොබෝ වේලාවකින් සිංහයකු විසින් එම වැද්දා මරන ලදී. කළුරිය කළ වැදිතෙම දෙව්ලොව උපන්නේ ය. එම වැදිතෙම භාග්‍යවතුන් වහන්සේ නොපැමිණි කල්හි සිංහයා විසින් මරන ලද්දේ නම් නිරයේ උපදින්නේය. මේ බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහු සුගතිගාමී කරවීමටත්, ඔහු තුළ කුසල් බීජ රෝපණයටත් කැළයට වැඩම කළ සේක. එසේ ලැබූ දිව්‍යාත්ම භාවයේ පරමායුෂ විඳනය කළ හෙතෙම ඉන් චුත වී කාම සුගතීන්හිම සැරිසැරුවේය. අප තථාගතයන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සැවැත් නුවර එක්තරා මහත් සම්පත් ඇති සිටුගෙදරක සංග්‍රාමජිත් තෙරුන්ගේ බාල සොහොයුරාව උපන්නේය. ''පෝසිය'' නමින් ප්‍රකට වූ එකුමරු

වැඩිවියට පත්ව, විවාහ වී එක් දරුවෙකු ලැබීය. එය ඔහුගේ අවසන් භවය බැවිනුත් පෙර කළ කුසල දහම් වලින් මෙහෙයවනු ලැබූ නිසාත් ජාති ජරා මරණාදිය පිළිබඳ හටගත් සංවේග ඇති බැවින්, පැවිදි වී ආරණ්‍යගත හුදකලා දිවියක් ගෙවමින් තචපංචක කර්මස්ථානය වැඩුවේය. උන්වහන්සේ නොබෝ දිනකින් ම විදර්ශනාව වඩා රහත් බවට පත්වූ සේක. එනිසා එම තෙරුන් තම චරිතාපදානය මෙලෙස අපදාන පාළියේ දක්වා ඇත. (අපදාන පාළි II, නිණමවිඨිදායක තෙරාපදානං)

''හිමවතට නුදුරෙහි ලම්බක නම් පර්වතයක් විය. එහි එළිමහනෙහි නිස්ස නම් සම්බුදුරජාණන් වහන්සේ සක්මන් කළ සේක. එකල මම මහවනයේ ඇවිදින මුව වැද්දෙක් වීමි. උන්වහන්සේට මම තණමිටක් පූජා කළෙමි. එය දේවාතිදේව වූ බුදුරජාණන් වහන්සේට හිදීම සඳහා දී සිත පහදවා ගත්තෙමි. ශාස්තෘන් වහන්සේ වැඳ පුදා ගත් මම උතුරු දෙසට හැරී ගියෙමි. එසේ ගිය නොබෝ වේලාවකින්ම සිංහයෙක් මා මැරීය. සිංහයා පැන මරා දැමූ මම එහිදීම මියගොස්, මරණාසන්න අවස්ථාවෙහි ආශ්‍රව රහිත බුද්ධ ශ්‍රේෂ්ඨයන් විෂයෙහි කරනලද ඒ උතුම් පින්කමේ විපාක වශයෙන් දුන්නෙන් මිදුණු හීයක් මෙන් දෙව්ලොව උපන්නෙමි. ඒ පින්කමේ ඵල වශයෙන් මට පහළ වූ විමානය ඉතා යහපත් එකකි. එහි බෙදුම් දාහකි. ගෝලාකාර මුදුන් සීයකි. ධජයන්ගෙන් පිරිපුන්ය. කොළ පැහැයෙන් යුතු විය. උදා වූ හිරු මෙන් බබලන ඒ ප්‍රාසාදයේ දිව්‍යාංගනාවන් විසින් පිරිවරාගත් මම අධික කම් සුව වින්දෙමි.''

''එම කුශල මූලයේ විපාක වශයෙන් දෙව් සැප උපරිමව විඳ, මිනිසත් බවට පැමිණ ආශ්‍රවයන් ක්ෂය කළෙමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර තණ ඇතිරියක් පූජා කිරීමේ සිට මේ දක්වා දුගතියක් නොලැබුවෙමි. තණමිටි පූජාවේ ආනිසංස එබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව මැනවින් ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ පෝසිය තෙරණුවෝ බුදුරදුන්ට වැඳීම පිණිස සැවැත් නුවර පැමිණ, ඥාතීන් කෙරේ හටගත් කරුණාවෙන් නැගෙවලට වැඩියහ. එවිට උන්වහන්සේගේ ගිහි කාලයේ බිරිඳ, වැඳ අසුන් පනවා පළමුව සැදැහැති උපාසිකාවක් මෙන් වත් පිළිවෙත් ඉටුකළාය. තෙරුන් වහන්සේගේ අදහස් නොදන්නා ඇ පසුව ස්ත්‍රී මායම් ආදියෙන් උන්වහන්සේ පොළඹවා ගැනීමට වෙහෙස වූවාය. තෙරණුවෝ ''අනේ මේ අඳ බාල තැනැත්තිය, මා වැන්නන්ටද මෙසේ හැසිරෙන්නීය''යි සිතා කිසිවක්ම නොපවසා අසුනින් නැගිට වනයටම ගියහ. උන්වහන්සේ එනු දුටු

ආරඤ්ඤික භික්ඛූහු ''ඇවැත්නි! කිම වහාම පැමිණියේ ඇයි? ඤාතීහු දක්නට නොලැබේ ද?''යි විමසූහ. තෙරුන් වහන්සේ තමන් වහන්සේට සිදුවූ සිදුවීම ප්‍රකාශ කරන සේක්, ''අනාසන්නචරා එතා'' යන ගාථාව වදාළ සේක.

එහි ''අනාසන්නචරා'' යනු මේ ස්ත්‍රීහු නම් ලං නොවිය යුත්තෝය. සමීපයට නො ගිය යුත්තෝය. දුරින්ම හිඳගෙන කටයුතු කරන පුරුෂයාට හිත වැඩ සලසන්නෝය. එසේ ස්ත්‍රීන්ට ලංනොවීම නිතරම කළ යුතුයි. සැම කල්හිම කළ යුතුයි. දවල් ද රෑ ද රහසිගත වේලාවන්හි ද ලංනොවිය යුතුයි. ''විඤ්ඤාතා'' යනු කරුණු කාරණා දන්නහු විසින්. ''අනාසන්නපරා'' යන පාඨය ද සුදුසුය. එම අරුතම ගෙන දෙයි. මේ පාඨයේ අදහස මෙසේ දත යුතුයි. ''චණ්ඩ වූ ඇත්, අස්, මී, ගව, සිංහ, ව්‍යාඝ්‍ර, යක්ෂ, රාක්ෂ, පිසාචාදීහු මනුෂ්‍යයන් සමීපයට නොඑත් නම් එය ශ්‍රේෂ්ඨය. අනර්ථය පිණිස හේතු නොවේ. ඒ සැඩ අමනුෂ්‍යාදීහු සමීප වීමෙන් මෙලොවදී පමණක්ම අනර්ථයක් සිදු කරති. ස්ත්‍රීහු වනාහී පුරුෂයන්ට ලං වී මෙලොවත් පරලොවත් යහපත නසති. සසරින් මිදීමට ඇති හැකියාව ද වනසා දමා මහත් වූ අනර්ථයකට පුරුෂයා ඇද දමති. එනිසා ''මේ ස්ත්‍රීහු නම් කරුණු කාරණා දන්නහු විසින් නිතරම සමීපයට නොඑළඹිය යුත්තෝ වෙති.'' දැන් එම කාරණය තමා මුල් කරගෙන දක්වන සේක් ''ගාමා'' යනාදී පදය වදාළහ. එහි ''ගාමා'' යනු ගම්මානයයි. මෙය දුතියා අර්ථයේ යෙදුණු පඤ්චමී විභක්ති වචනයකි. ''අරඤ්ඤමාගම්ම'' යනු අරණ්‍යයෙන් අවුත්. ''ම'' යන්න පද දෙක සන්ධි කරන්නකි. ''අරඤ්ඤං'' යන්න පංචමී අර්ථයේ යෙදුණු දුතියා විභක්ති පදයකි. ''තතෝ'' යනු ඒ කුඩා ඇඳෙන්. ''අනාමනෙත්වා'' යනු කථාබහ නොකර, පැරණි බිරිඳට ''අප්පමාදිවන්න'' යනාදී වචනයක්වත් නොපවසා. ''පොසියෝ'' යනු තමාම අනිකකු මෙන් දක්වා කියයි. ඇතැම්හු මෙම වචනය ''පක්කමිං'' විය යුතු බව පවසති. ඔවුන්ට ''පෝසිය නම් වූ මම පිටත්ව ගියෙමි'' යනු පද පිළිවෙලයි. ඇතැම්හු ඒ ස්ත්‍රිය තම ගෙදරට පැමිණි තෙරුන් පොළඹවාගනු කැමති වූවාය. එය දුටු තෙරණුවෝ වහාම නැගිට, ගෙදරින් නික්ම විහාරයට ගොස් තමන්ගේ කුටියෙහි ඇඳෙහි හුන්න. ඒ ස්ත්‍රියද පසුබත් කාලයේ අලංකාරව සැරසී විහාරයට අවුත් තෙරුන්ගේ කුටියට ම පිවිසියාය. එය දුටු තෙරුන් කිසිවක් නොපවසා ඇඳෙන් නැගිට වහාම දවල් වසන තැනට වැඩියේය''යි පවසති. ඔවුන්ට ''ගාමා අරඤ්ඤමාගම්ම'' යන පදයේ අර්ථය ඉහත පැවසූ ලෙසම ගත හැකිය. මෙහිදී ''විහාර'' යනුවෙන් ආරණ්‍යයම අදහස් කරන ලදී.

පෝසිය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.5

''සුඛං සුඛත්ථා'' යනු ආයුෂ්මත් සාමඤ්ඤකානි තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේද? උන්වහන්සේද පෙර බුදුවරුන් සමීපයේදී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි ඉපිද කුසල දහම් රැස් කරනුයේ මෙයින් කල්ප අනූ එකකට පෙර පහළ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී මනුෂ්‍යයෙක්ව උපන්හ. හෙතෙම විපස්සි බුදුරජාණන් වහන්සේ දක පැහැදුණු සිතින් එක් ඇදක් පූජා කළේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරිසරමින් අවුත් අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේ එක්තරා පරිව්‍රාජක පුත්‍රයෙක්ව උපන්නේය. ''සාමඤ්ඤකානි'' නමින් ප්‍රකට වූ ඔහු, වැඩිවියට පැමිණ ශාස්තෘන් වහන්සේගේ යමක මහා ප්‍රාතිහාර්යය දැක සසුනේ පැවිදි විය. චරිතයට යෝග්‍ය කමටහන් ගෙන ධ්‍යාන උපදවාගත් උන්වහන්සේ, එම ධ්‍යානයම පාදක කරගෙන විදසුන් වඩා රහත් වූහ. උන්වහන්සේ තම චරිතාපදානය මෙසේ දක්වූහ. (අපදාන පාළි II, මඤ්ඣදායක තෙරාපදානං)

''ලෝක ජ්‍යෙෂ්ඨ වූ තාදී ගුණ ඇති විපස්සී බුදුරජාණන් වහන්සේට මම පැහැදුණු සිතින් යුක්තවූයෙමි සියතින්ම එක් ඇදක් පූජා කළෙමි. එසේ ඇදක් පිදීමේ පිනින් මම ඇත්, අස්, දිව්‍ය ආදී යාන ලැබුවෙමි. දැන් ආශ්‍රවක්ෂය කළෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඇදක් පූජා කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඇඳ පූජා කිරීමේ විපාක මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. සියලු භව නසන ලදී. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ දමා වෙසෙමි. -පෙ- මවිසින් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

එම තෙරුන්ගේ ගිහිකළ යහළුවෙකු වූ ''කාතියාන'' නම් පිරිවැජියා; බුදුරජාණන් වහන්සේගේ පහළවීමේ සිට අන්‍ය තීර්ථකයන්ගේ ලාභ සත්කාරාදිය නැසුණු බැවින්, කෑම් බීම් ආදී පමණක්වත් නොලැබ ආජීවක බව පිළිබඳව කළකිරී තෙරුන් වහන්සේ වෙත එළඹ මෙසේ ඇසීය. ''නුඹ වහන්සේලා ශාක්‍යපුත්‍රයෝ නම් වෙති. මහත් වූ ලාභ සත්කාර කීර්ති ආදියෙන් අග්‍රප්‍රාප්තව සුවසේ ජීවත් වන්නෝය. අපි වනාහී දුක්ඛිතව දුෂ්කරව ජීවත්වෙමු. කෙසේ පිළිපදින්නහුට මෙලොවත් පරලොවත් සැප ලැබේද?''යි ප්‍රශ්න කළ කල්හි තෙරණුවෝ ''නොවෙනස්වන සැපයක් ඇත්නම් ඒ ලෝකෝත්තර සැපයම වේ. එය ලැබෙනුයේ ඊට අනුකූල වූ පිළිවෙත් සම්පූර්ණ කිරීමෙනි''යි වදාරා; තමන් වහන්සේ එම සැපයට

පැමිණි බව ප්‍රකට කරන සේක්, ''සුඛං සුඛත්ථෝ ලභතෙ නදාචරං'' යන ගාථාව වදාළ සේක.

එහි ''සුඛං'' යනු සැපයි. නිරාමිස සුවය මෙහිදී අදහස් වේ. ඵලසමාපත්තිය හා නිර්වාණය මෙහිදී අදහස් කරයි. එය එසේමැයි. මේ සමාධි නම් ශික්ෂාව වර්තමානයේම සැප ගෙන දෙයි. අනාගතයේ සැප විපාක ලබාදෙයි. 'නිවන උතුම්ම වූ සැපය'යැයි කියන ලදී. ''**සුඛත්ථෝ**'' යනු සැපය කැමැත්තා, ඉහත විස්තර කළ සැපයෙන් ප්‍රයෝජනයක් ඇත්තා. ''ලභතෙ'' යනු පැමිණෙයි. සැප වේදනාව කැමැත්තාටම ලැබේ. අන්‍යයන්ට නොලැබේ. සැප කැමැත්තා කවරෙක්ද''යි පැවසීමට ''**නදාචරං**'' ආදිය දක්විණි. එම සැපය නම් වූ අර්ථය පිණිස හැසිරෙන්නේ. යම් පිළිවෙතකින් යුක්ත වූ. සැප ලබන පිළිවෙත් පුරන්නේ යන අර්ථයයි. හුදෙක් එම පිළිවෙත් පිරීමෙන් අපේක්ෂිත වූ සැපය පමණක් නොව **කීර්තිය** ද ලැබේ. ''මොහු සිල්වතෙකි. ඉතා පිරිසිදු කාය වාග් හැසිරීම් ඇත්තෙකි. ධ්‍යාන වඩන්නෙකි. ධ්‍යානාංගයන්ගෙන් පිරිපුන් වූවෙකි''. ආදි වශයෙන් **කීර්තිය** අනභිමුඛයෙහි ද (තමා නැති තැන ද) හොඳ නම පැතිරීම් වශයෙන් ලැබේ. ''**යසසඃ වඩ්ඪති**'' යනු ඉදිරියේදී ගුණ පැවසීම්, ස්තුති කිරීම් ආදියෙන්ද පිරිවර සම්පත් ආදි වශයෙන් ද ඔහුගේ යසස වැඩේ. දැන් ''**නදාචරං**'' යනුවෙන් නාමිකව දැක්වූ අර්ථයෙහි පිළිපැදිය යුතු පිළිවෙතෙහි ස්වභාවය දක්වමින්, ''**යො අරියමට්ඨඞ්ගික මඤ්ඤසං උජුං භාවෙති මගඵං අමතඤ්ඤ පත්තියා**'' යනුවෙන් වදාළහ. එහි අර්ථය මෙසේය. ''යම් පුද්ගලයෙක් කෙලෙස් වලින් දුරු වී පිරිසිදුවීම සඳහා පිළිපදිනු ලබන ප්‍රතිපත්තිය, ආර්යභාවය ගෙන දෙන බැවින් ''**අරියං**'' නම් වේ. සම්මා දිට්ඨිය ආදි වශයෙන් අංග අටකින් සමන්විත බැවින් ''**අට්ඨඞ්ගික**'' නම් වේ. අන්ත දෙකින් බැහැර වූ මැදුම් පිළිවෙත වැඩීම් වශයෙන්, ඇද රහිත වූ බැවින් ''අඤ්ජසං'' (මාර්ගය) නම් වූ. කයින් වන වැරදි ආදියෙන් දුරු වූ බැවින් ''**උජුං**'' (සෘජු) නම් වූ නිවණ කැමැත්තවුන් විසින් මාර්ගයෙහි යෙදීමෙන්, කෙලෙසුන් වනසා දමමින් ගමන් කිරීමෙන් ''**මගං**'' යනු මාර්ගය වශයෙන් ලැබූ නම් ඇති. දුක් නැති කරන පිළිවෙත; නිවණට, අසංඛත ධාතුවට පැමිණීම සඳහා හෝ අවබෝධ කර ගැනීම සඳහා හෝ අවබෝධ කරගැනීම සඳහා වඩයි; තමාගේ සන්තානයෙහි උපදවයි, වඩයි. එසේ වඩන පුද්ගලයා නොවෙනස්වන සැපය ''**නදාචරං**'' ලැබීමට කැමැත්තා එහි හැසිරෙයි. එනිසා ඔහු ඉහත විස්තර කළ සැප ලබයි.

මෙම දේශනාව ඇසූ පිරිවැජියා පැහැදුණු සිතින් යුක්තව සසුනේ පැවිදි විය. යහපත් වූ ආයර්‍ය මාර්ගයෙහි ගමන් කළ හෙතෙම නොබෝ කලකින් ම විදසුන් වඩා රහත් බව ලබාගත්තේය. මෙම ගාථාවම සාමඤ්ඤානි තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ විය.

සාමඤ්ඤකානි ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.6

''සාධු සුතං'' යනු ආයුෂ්මත් කුමා පුත්ත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? මේ තේරුන් වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, මෙයින් කල්ප අනූ එකකට පෙර අඳුන් දිවිසම් පොරවාගත් තාපසයෙක් වී බන්ධුමති නුවර රාජෝද්‍යානයේ වාසය කළහ. ඒ තවුසා විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින්, පයේ ගල්වන තෙල් පිළිගැන්වීය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද, එතැන් පටන් සුගතීන්හිම සැරිසරමින් අවුත් අප තථාගතයන් වහන්සේ ලොව පහළ වූ සමයේදී අවන්ති රට වෙලුකණ්ටක නම් නුවර ගහපති කුලයක උපන්නේය. නන්ද නමින් ප්‍රකට වූ ඔහුගේ මව ''කුමා'' නම් වූවාය. එනිසා ''කුමාපුත්ත'' යනුවෙන් ද ජනයා මොනු හැඳින්වූහ. ඔහු වැඩිවිය පත්ව සාරිපුත්ත මහරහතන් වහන්සේ සමීපයේදී බණ අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි විය. පසුව උපසම්පදාව ද ලැබූ උන්වහන්සේ කරන ලද පූර්ව කටයුතු ඇති සේක්, පිටිසර පර්වත පෙදෙසක වෙසෙමින් මහණදම් පුරන නමුත් ගුණ විශේෂයක් උපදවා ගැනීමට අපොහොසත් විය. එනිසා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණි කුමාපුත්ත තෙරණුවෝ ධර්මශ්‍රවණය කොට, නැවත කමටහන් ලබාගෙන සුදුසු සෙනසුනක වාසයට ගොස් විදසුන් වඩා රහත් ඵලයෙහි පිහිටියහ. එනිසා අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කර ඇත. (අපදාන පාළි II - අබ්භඤ්ඤදායක තෙරාපදානං)

''මම බන්ධුමති නුවර රජ උයනෙහි වාසය කළෙමි එසමයෙහි මම සම්, කඩමාලු හඳින තවුසෙක් වීමි. සියලු දෙය තමන් වහන්සේ ම දැනගත්තා වූ, අපරාජිත වූ, ප්‍රධන් වීර්යයෙහි මෙහෙයු සිත් ඇති, ධ්‍යාන වඩන්නා වූ, ධ්‍යානයෙහි ඇලුනා වූ, පස් වැදෑරුම් වශී ධර්මයන්ගෙන් පිරිපුන් නිර්මල වූ

බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. සියලු අභිමතාර්ථයන් සමෘද්ධිමත් කරගත්, චතුරෝඝයන් තරණය කළ, ආශ්‍රව රහිත බුදුරජානන් වහන්සේ දැක, පහන් වූ සිත් ඇති මම සතුටු සිතින් අඟ ගල්වන තෙල් පූජා කළෙමි.''

''එසමයේ මීට කල්ප අනූඑකකට පෙර යම් තෙලක් පූජා කළෙමි ද එතැන් සිට මම දුගතියකට නොගියෙමි. ඇඟ ගල්වන තෙල් පිදීමේ විපාකය මෙබඳුවේ. මවිසින් දැන් සියලු කෙලෙස් දවන ලදී. සියලු භවයන් නසන ලදී. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳදමා අශ්‍රව රහිත වෙසමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ එම තෙරණුවෝ, අරණ්‍යයෙහි වසන කල්හි දැඩිවූ පැවතුම් ඇති භික්ෂූන් දැක ඔවුන්ට අවවාද දෙමින්, සසුනේ නෛර්යාණික බව ප්‍රකාශ කිරීම වශයෙන් ''**සාධු සුතං සාධු චරිතකං**'' යන ගාථාව වදළහ.

''සාධු'' යනු යහපති. මැනවි ''**සුතං**'' යනු ඇසීමයි. එහිදී සසරින් මිදීම ආශ්‍රිත වූ විශේෂයන් ම අල්පේච්ඡා දී ගුණයන්ගෙන් යුක්ත වූ දසකථාවස්තූන් ශ්‍රාවණය කිරීම මෙම වචනයෙන් අදහස් කරන ලදී. ''**සාධු චරිතකං**'' යනු එම අල්පේච්ඡදී චරිත, බොහෝ කලක් එම යහපත් චරිතයන්හි ම හැසුරුණු චරිත, එසේ හැසිරීම, මේ පදවලින් බහුශ්‍රැත බවද ඊට අනුරූපී ප්‍රතිපත්තිය ද මැනවැයි (සුන්දරයයි) දක්වයි ''සදු'' යනු සෑම කල්හි. නවක, තරුණ, මහළු යන සෑම අවස්ථාවකදී ම සෑම ඉරියවුවකදීම, ''**අනිකෙත විහාරෝ**''යනු කෙලෙසුන්ට නිවාසයක් වූ පංචකාම ගුණයන් ට හෝ ලෞකික ඔඩාරම්මණ ධර්මයන්ට හෝ වාසස්ථානවූයේ ''නිකේත'' නම් වේ. මෙසේ කියන ලදී ''ගහපතිය, රූප නිමිත්තෙ ඇලී වාසය කිරීම ''නිකේතසාරී'' යැයි කියනු ලැබේ'' ආදී වශයෙණි. ඒ වාසස්ථානයන්ගේ, නිකේතයන්ගේ ප්‍රහාණය සඳහා පිළිපැදීම අනිකේත විහාර නම් වේ. ''**අත්ථ පුච්ඡනං**'' යනු මෙකරුණු නොදන්නාගේ කලණ මිතුරකු හමුවට ගොස් මෙලෝ, පරලෝ හා පරමාර්ථ ප්‍රභේදාදිය පිළිබඳ ප්‍රශ්න කිරීමයි, අර්ථ චීමසීමයි, කුශලාකුශලාදි ස්වභාව ධර්මයන් ගේ අර්ථය, ''ස්වාමීනි කුසලය කුමක් ද ? අකුසලය කුමක් ද ? සාවද්‍ය දෙය කුමක් ද ? නිවරද්‍ය දෙය කුමක් ද ?'' ආදී වශයෙන් චිමසීමයි. අර්ථ විමසුමයි. ''**පදකඛිණකම්මං**'' යනු එසේ චිමසා ලැබුණු පිළිතුරු, උපදෙස්, අවවාද මනාව ගෞරවයෙන් පිළිගෙන, ඒ වායෙහි පිහිටා යහපත් ව හැසිරීමයි. මෙතැනටද ''සාධු'' ''මැනවි'' යන පදය යෙදිය යුතුයි. ''**එතං සාමඤ්ඤං**'' යනු යහපත්ව ඇසීම් ආදී වශයෙන්

කියූ ලෙස යමක් ඇසන ලද ද, යමක් අනුව හැසිරෙන ලද ද, යමක් අනුව හැසිරෙන ලද ද, පඤ්චකාම යන්ගෙන් වෙන් කියූ ලෙස යමක් අසන ලද ද, යමක් අනුව හැසිරෙන ලද ද, පඤ්චකාමයන් ගෙන් වෙන් ව විසීම ද, සත්පුරුෂයන් වෙතින් අරුත් විමසීම ද, ඒවා ගෞරවයෙන් පිළිගෙන හැසිරීමද යන මේවා ශ්‍රමණ ධර්මවේ. මෙයම ශ්‍රමණභාවයයි. මෙම ප්‍රතිපදාවෙන්ම, පිළිවෙතින්ම ශ්‍රමණභාවය වේ. වෙනත් පිළිවෙතකින් නොවේ. එනිසා ම ''සාමඤ්ඤං'' යන්න නොවෙනස්වන මාර්ගඵලයන්ට (ආර්ය මාර්ග ඵලයන්ට) භාවිතවන තවත් සමාන වචනයකි. මෙය අපණ්ණක ප්‍රතිපදවයි. මේ ශ්‍රමණභාවය යමකින් ලැබේද එය දැක්වීමට ''**අකිඤ්චනඤ්ඤ**'' ''පළිබෝධ රහිත'' යැයි කියන ලදී. අල්වාගැනීම් නැත්තාට කෙත්වතු , රන්රිදී , දැසි දස් යනාදී දෙය පිළිබඳ අයිතිවාසිකම්, අල්ලාගැනීම් රහිත පුද්ගලයාට යන අර්ථයයි.

කුමාපුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.7

''**නානාජනපදං යන්ති**'' යනු ආයුෂ්මත් කුමාපුත්ත සහාය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේදී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන් පතාගෙන කුසල් රැස්කළහ. මෙයින් කල්ප අනූ හතරකට පෙර සිද්ධත්ථ නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවූ සමයෙහි එක් ධනවත් පවුලක උපන් හෙතෙම, වැඩිවියට පැමිණ කැළයට ගොස් බොහෝ ගස් දඬු කඩාගෙන සැරයටි සාදා සංඝ රත්නයට පූජා කළේය. එබදුම වෙනත් පිංකමිද ශක්ති පමණින් සිදුකර, දිව්‍යලෝකයන්හි ඉපිද දෙව්සැප විඳිමින් ම කල්යවා, අප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි වේලුකණ්ටක නුවර සමෘධිමත් පවුලක උපන්නේය. ඔහුගේ නම සුදත්ත නම් විය. ඇතැම්හු වාසුල නම් වූ බව ද කියති. ඔහු කුමාපුත්තගේ ප්‍රිය යාලුවෙක්ව සිටියේය. ''කුමාපුත්ත පැවිදිවිය'' යන පුවත ඇසූ හෙතෙම, කුමාපුත්ත පැවිදි වූ ශාසනය නම් ඒකාන්තයෙන්ම පහත් වූවක් නොවන්නේය.'' යැයි සිතා ඔහු අනුවම පැවිදිවනු **කැමැත්තේ** ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසූ සේක. ඔහු ඉතා වැඩියෙන් පැවිද්දෙහි ඇලුණේ, පැවිදි වී කුමාපුත්ත සමගම ප්‍රත්‍යන්ත පර්වතයක භාවනාවෙහි නියැලී වාසය කළේය.

එසමයේ බොහෝ භික්ෂූහු නොයෙක් ජනපදයන්හි ජනපද චාරිකාවේ හැසිරෙමින් එම ස්ථානයට ද පැමිණෙති. එනිසා එම ස්ථානයෙහි කලබල ඇතිවිය. මෙය දුටු සුදත්ත තෙරණුවෝ, මේ භික්ෂූහු තෛර්ර්‍යාණික සසුනේ පැවිදි වුවත්, ජනපද පිළිබඳව සිතමින් සිටිනුයේ චිත්ත සමාධියට බාධා කරති.'' යි සිතා උපන් සංවේගයෙන්; එම සංවේගයම තම සිත දමනය කර ගන්නා හෙණ්ඩුවක් කරගෙන **''නානාජනපදං යන්ති''** යන ගාථාව වදළහ.

එහි ''නානා ජනපදං'' යනු ''වෙන වෙනම වූ නානාවිධ ජනපදයන්හි කාසි - කෝසල ආදී ප්‍රභේද ඇති නොයෙක් රටවල , පෙදෙස්වල '' යන අර්ථයයි. ''**යන්ති**'' යනු යති. සංචාරය කරති. **''විචරන්තා''** යනු අසුවල් ජනපදය සුලභ ආහාරපාන ඇත්තකි. ආහාර ලැබීම පහසුය. අසුවල් ජනපදය බියරහිතය, රෝගාබාධ රහිතය'' ආදී වශයෙන් කල්පනා කරමින් ජනපද චාරිකාවේ හැසිරෙන්නෝ **''අසඤ්ඤතා''** යනු එම ජනපදයන් පිළිබඳවම කල්පනා කිරීමෙන් තොර නොවූ සිත් ඇති බැවින් අසංයතව, අසංවරව, ''**සමාධිඤ්ච විරාසෙන්ති**'' යනු සැමදෙනාට ම උතුරු මිනිස් දම් වර්ධනයේ මූලාධාර වූ උපචාර අර්පණාදී භේද සහිත සමාධිය ද වරද්ද ගනිති. ''ච'' ශබ්දය සම්භාවනාර්ථයේ යෙදී ඇත. දේශද්ශාන්තරවල හැසිරීමෙන් ධ්‍යාන සිතට අවසරයක් නොලැබේ. එනිසා නොපැමිණියාවූ සමාධීන් ට සිත නොඑළඹෙයි. පැමිණියාවූ චිත්ත සමාධි ආදී වශීභාවයන් නැවත නැවත නොවැඩීමෙන් දිරාගොස් විරුද්ධව සිටියි. වරද්ද ගනියි. ''කිංසු රට්ඨංචරියා කරිස්සති'' යන්නෙහි ''සු'' යනු නිපාතයකි. මෙසේ ජනපද චාරිකාවේ හැසිරෙන්නෝ කුමක් කරන්නෝද ? ''කිං'' යනු කවරනම් අර්ථයක් ඉටුකරගනියි ද? නිරර්ථක වූ ම දෙයක් කරයි''යනුවෙන් ගැරහීමට මෙය පවසන ලදී. ''**තස්මා**'' යනු යම්හෙයකින් මෙබදු වූ දේශාන්තරවල හැසිරීමෙන් භික්ෂුවගේ සමාපත්තීන්ට අතර්ථයක් වේ. භික්ෂු ආකල්ප වරද්ද ගනියි. එබැවින්, ''**විනෙය්‍ය සාරම්භං**'' යනුවෙන් වෙසෙන ප්‍රදේශයේ නොඇලීම් වශයෙන් උපන් එකට එක කිරීම නම් වූ සිත කෙලෙසන දහම්, ඊට අනුරූප වූ ප්‍රතිසංස්කරණයන්ගෙන් දුරුකර, සංසිඳුවාගෙන ''**ඣායෙය්‍ය**'' යනු අරමුණු පිළිබඳව හෝ ලක්ෂණ පිළබඳව හෝ නැවත නැවත සිතීම් - කල්පනාකිරීම් - මෙනෙහිකිරීම් යන දෙයාකාර ධ්‍යානයන් වඩවන්නේය. ''**අපුරක්ඛතෝ**'' යනු මිත්‍යා දෘෂ්ටි කල්පනාවන්ගෙන් හා තණ්හාදියෙන් පෙරටු නොවූයේ එම අකුසල් සිත් හි වසඟයට නොපැමිණි කමටහන් ම මෙනෙහි කරන්නේය යන අර්ථයයි. මෙසේ එම භික්ෂූන්ට අවවාද වශයෙන් ගාථාව දේශනා කළ තෙරණුවෝ එයම හෙණ්ඩුවක් කරගෙන තම සිත සංවර කරගත් සේක්, විඳසුන් වඩා රහත් ඵලය ලබාගත්හ.

''එකල් හි මම මහවනයට පිවිස හුණ ගසක් කපා සැරයටියක් සාදා සංඝයාට පිදුවෙමි. එම චිත්ත ප්‍රසාදය නිසා මනා ව වූත ඇති සංසරන්නයට වැද, එල්බෙන දණ්ඩක් (සැරයටියක්) පූජාකර උතුරුදෙසට ගියමි. එද මීට කල්ප අනුහරතකට පෙර සැරයටියක් පිදිමේ පිණින්, මේ දක්වාම දුගතියක් නුඳුටුවෙමි. සැරයටි දනයේ විපාක මෙබඳුය. ම විසින් සියළු කෙලෙස් දවන ලදි. - පෙ - බුදුරජානන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

යම් අර්ථයක් අංකුසයක් කරගත් මේ තෙරුන් වහන්සේ රහත් බව ලබාගත්තේ ද එම අර්ථයම හඳවතෙහි තබාගෙන., රහත් බවට පත් වූ පසුව ද **''නානාඡනපදංයනතී''** යන මේ ගාථාව ම දේශනාකළහ. එනිසා එයම උන්වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම නම් විය.

කුමාපුත්ත සහාය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.8

''යො ඉද්ධියා සරභූං'' යන මේ ගාථාව ආයුෂ්මත් ගවම්පති තෙරුන්ගේ ගාථාවකි. එහි උපත කෙසේ ද ? මෙම තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා හා පින්දහම් ඇත්තෙකි. මීට කල්ප තිස් එකකට පෙර ලොව පහළ වූ සිබි භාග්‍යවතුන් වහන්සේ, දැක පැහැදුණු සිතින් මල් පූජා කළ පිනින් දෙව් ලොව ඉපදුණු උන්වහන්සේ ඒ ඒ භවයෙහි දී තව තවත් පින් දහම් කරගත්හ. කෝණාගමන භාග්‍යවතුන් වහන්සේගේ සැයට ඡත්‍රයක් ද චේදිකාවක් ඔහු විසින් ඉදි කළේය. කස්සප බුදුන් දවස එක්තරා ධනවත් සිටුගෙයක උපන්නේ ය. එම ගෙදර බොහෝ ගව සම්පතක් විය. ගොපල්ලෝ එම ගව සම්පත සුරකියි. මෙතෙමේ එහි අතරින් පතර යුතු අයුතු දේ විමසමින් හැසිරේ. ඔහු එක් දිනක් රහතන් වහන්සේ නමක් ගමෙහි පිඬුපිණිස හැසිර, ගමින් පිටත සිට දිනපතා ම දනය වළඳන බව දුටුවේය. ''ආර්යයන් වහන්සේ සුර්ය තාපයෙන් වෙහෙසට පත්වන්නේය'' යි සිතූ ඔහු මහරි දඩු සතරක් ඔසවා, ඒ මත්තෙහි මහරි අතු දමා ගස් අතු මණ්ඩපයක් කරවා පූජා කළේය. එම මණ්ඩප සමීපයේ මහරි ගසක් රෝපණය කළ බව ද කියති. ඔහු කෙරෙහි අනුකම්පාවෙන් රහතන්

වහන්සේ දිනපතාම එහි හිඳ බත් කිස කළසේක. ඔහු ඒ පින්කම හේතුවෙන් ඔහුගේ විමන් දොර මහත් මහරි වනයක් පහළ විය. එහි වණ්ණගන්ධ සම්පන්න වූ පුෂ්පයෝ සැම කල්හි ම පවතිති. එනිසා එම උයන ''සේරිස්සක'' නාමයෙන් ප්‍රකටවිය. ඒ දෙව් පුතු ද එක් බුද්ධාන්තරයක් දෙව් මිනිසුන් අතරෙහි සැරි සරා, මේ බුද්ධෝත්පාද කාලයෙ හි යස තෙරුන්ගේ යහළුවන් සතර දෙනා අතුරින් ගවම්පති නම් යහලුවා ලෙස උපන්නේ ය. යස කුමරුගේ පැවිදි වීම ඇසු ගවම්පති කුමරු ද තම යහලුවන් සමග භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණියේ ය. ශාස්තෘන් වහන්සේ ගේ ධර්ම දේශනාව ඇසු ඔවුහු සතර දෙනම රහත් ඵලයෙහි පිහිටියහ.

අපදන පාළියේ දී උන්වහන්සේ මෙසේ පවසා ඇත.

''ඒ මම පෙර මුව වැද්දෙක් ව වනයෙහි ඔබිනොබ හැසිරුනෙමි. සියළු දහම් හි පරතෙරට පැමිණියා වූ කෙලෙස් දුරලූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. පැහැදුණු සිතැති මම සතුටින්, ඒ මහා කරුණික වූ, සියලු සත්ත්වයන් කෙරෙහිම හිත වැඩ සලසන්නා වූ උන්වහන්සේ ට නොයෙක් මලින් පූජා පැවැත්වීමි. මෙයින් කල්ප තිස් එකකට පෙර මම යම් බඳු මල් පූජාවක් කළෙමි ද, එතැන් පටන් මම දුගතියක නූපන්නෙමි. මල් පුජාවෙ හි මේ විපාකය යි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත්ව ඒ හි භික්ෂු පැවිදි උපසම්පදව ලැබූ ගවම්පති තෙරුන්, විමුක්ති සුවය විඳමින් සාකේත නුවර අඳුන් වනයෙහි වාසය කළේය. එසමයෙහි මහත් වූ භික්ෂුසංඝයා පිරිවරාගත් භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවරට වැඩම වා අඳුන් වනයට පිවිසිසේක. එහි සෙනසුන් ප්‍රමාණවත් නොවූ බැවින් මධ්‍යම රාත්‍රියෙහි නදියේ ජලය වැඩි වූ බැවින් සාමණේරා දී හූ මහත් ශබ්ද කළහ. භාග්‍යවතුන් වහන්සේ එම මහා ශබ්දය අසා ගවම්පති තෙරුන්ට මෙසේ අණකළ සේක ''ගවම්පතිය ! යන්න, ජල සඬපහර මැඩ පවත්වා භික්ෂූන් වහන්සේ සඳහා සුවපහසු වාසයක් ඇතිකරන්න.'' ගවම්පති තෙරණුවෝ ද එය අසා, ''ස්වාමිනී, යහපති'' යි පවසා, එතැනට වැඩ ඍද්ධිබලයෙන් නදියේ ජල පහර මැඩ පැවැත්වූහ. එසේ මැඩපැවැත් වූ ජල පහර ඉතා දුරින් පර්වත කුටයක් මෙන් සිටියේ ය. එතැන් පටන් ගවම්පති තෙරුන්ගේ ආනුභාවය (බලමහිමය) ප්‍රකට විය.

එක්දිනක් භාග්‍යවතුන් වහන්සේ මහත් වූ දෙව් පිරිස් පිරිවරා දහම් දෙසන එම තෙරුන් දැක, ලොවට අනුකම්පා පිණිස එම තෙරුන්ගේ

මහත් වූ ගුණයන් ප්‍රකට කරන සේක්, එම ගුණයන්ට ප්‍රශංසා කරමින් ''**යො ඉද්ධියා සරභං**'' යන ගාථාව වදළ සේක.

එහි ''**ඉද්ධියා**'' යනු අධිෂ්ඨාන ඍද්ධියෙන් ''**සරභං**'' යන එනමින් හැඳින්වෙන නදියයි. ''**අධ්‍යපෙසි**'', දිය පහර ගලාගෙන යෑමට නොදී පර්වත කූටයක් මෙන් මහත් සැඩපහර නැවැත්වීද, මහත් වූ ජල රැසක් කෙට නැවැත්වී ද, ''**අසිතො**'' යනු ''න සාතො'' තණ්හා දෘෂ්ටි ආදී නිශ්‍රය රහිත වූ, ''බන්ධන'' නම් වූ සියලු සංයෝජන මුළු මනින් ම සිඳ දැමූ බැවන්, කිසිදු බන්ධනයකින් නොබැඳුණු එසේම ''එජා'' නම් වූ තෘෂ්ණා දී කෙලෙසුන්ගේ නොපවත්නා බැවින් (න + එජා) ''අනේජ'' නම් වූ ''**අනෙජො**'' ඒ ගවම්පති තෙරණුවෝ උන්වහන්සේ සියළු ඇලීම් ඉක්මවුහ. සියළුම රාග, දේවේෂ, මෝහ, මාන, දෘෂ්ඨි ආදී සංගයන් හෙවත් ඇලීම් ඉක්මවා සිටි බැවින් ''**සබ්බසඞ්ගාතිගතං**'' නම් වේ. අසේඛ ප්‍රතිපදවට පිළිපන් මුනිවරයෙකු බැවින් ''**මහාමුනිං**'' නම් වේ. එසේ ම කාම, කර්ම ආදී භව සංඛ්‍යාත ප්‍රභේදයන් හි, සියලුම භවයන් හි පරතෙරට හෙවත් නිවණට පැමිණි බැවින් ''**භවස්ස පාරගූං**'' භව පරතෙරට පැමිණි. ''**දෙවා නමස්සන්ති**'' යනු උන්වහන්සේට දෙවියෝ ද වඳිති. සෙසු ජනයා පිළිබඳව කියනු කිම ? මෙම ගාථාව අවසානයේ දී බොහෝ දෙනාට ධර්මාවබෝධ විය. තෙරුන් වහන්සේ සිය රහත්බව ප්‍රකාශ කරන සේක්, ''ශාස්තෘන් වහන්සේ පුදන්නෙමි'' යි එම ගාථාව ම වදළ සේක.

ගවම්පති ථේරගාථා අර්ථ චරිණනාව නිමියේය.

1.4.9

''**සත්තියා විය ඔමට්ඨා**'' යනු ආයුෂ්මත් තිස්ස තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කොස් ද ? මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හි දී නිර්වාණය ප්‍රාර්ථනා කරමින් නොයෙක් පින්දහම් රැස්කළේය. තිස්ස නම් භාග්‍යවතුන් වහන්සේගේ බෝධිමූලයෙහි වූ වියළි කොළ ආදී කසල, බැහැර කර පිරිසිදු කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිලවස්තුවේ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදිව උපසපන් වී අරණ්‍යයක වෙසෙන තිස්ස හිමියෝ, ජාතිය නිසා මන් උපදවාගෙන, ක්‍රෝධ - බලවත්

සිත් තැලීම් ආදියෙන් ද අනුන්ට දොස් කීමෙන් ද යුක්තව හැසිරෙති. මහණකම සඳහා කිසිදු උත්සාහයක් නො කරති.

ඉක්බිති එක් දිනක් ශාස්තෘන් වහන්සේ දිවැසින් බලන සේක්., විවර වූ මුව ඇතිව දවල් වසනතැන නිදසිටින්නා වූ තිස්ස හිමි දුටුසේක. දැක සැවතින් අහසට පැනනැගී එතැනට වැඩමවා අහසෙහිම වැඩ සිටිමින් මහත් වූ ආලෝකයක් පතුරුවා, එම ආලෝකය නිසා අවදි වූ උන්වහන්සේට සිහිය උපදවා අවවාද දෙන සේක්, ''**සතතියා විය ඔමට්ඨා**'' යන ගාථාව වදළසේක.

එහි ''**සතතියා විය**'' යනු මේ දේශනා ශීර්ෂයයි. එක් පැත්තක මුවහත ඇති සැනකින් යන අර්ථයයි. ''**ඔමට්ඨා**'' යනු පහරදෙනලද, පහරදීම් සතරකි. ඔමට්ඨ, උම්මට්ඨ, මට්ඨ හා විමට්ඨ යනුවෙණි. එහි උඩ හිඳ යටට ගැසූ පහර ඕමට්ඨ නම් වේ. යට සිට උඩට ගැසූ පහර උම්මට්ඨ නම් වේ. අගුල්, යකඩ කුරු මෙන් සිරුර විනිවිද ගිය පහර මට්ඨ නම් වේ. සෙසු සියලුම ආකාරයේ පහර දීම් විමට්ඨ නම් වේ. මෙතැනදී ඕමට්ඨ නම් පහර දීම අදහස් වේ. එය වනාහි දරුණුම පහරදීමයි. එසවීම අපහසුවූ සැතකි. පිළියම් කිරීම අසීරු වූවකි. ශරීරය තුල ම පවතින දෝෂයක් වේ. ශරීරය තුලම සැරව හා ලේ වැගිරෙයි. සැරව හා ලේ ශරීරයෙන් පිට නොවී තුවාලයේ හාත්පස වෙලාගෙන සිටියි. කුණු ලේ ඉවත් කරනු කැමැත්තන් විසින් තුවාල කරු අඳක බැද යටිකුරු කළ යුතු (හිස යටට සිටින සේ) වේ. මෙයින් මරණයට හෝ පැමිණෙයි. නැතිනම් මරණය හා සමාන දුකකට පත්වේ. ''**ඩය්‍හමානෙ**'' යනු ගින්නෙන් දැවෙන කල්හි (ගින්නෙන් දවෙමින්) ''**මත්ථකෙ**'' යනු හිසයි. මෙහි අදහස මෙසේය. - ''යම්සේ හිස ගිනි ගත්තෙකු වහා එම ගින්න නිවාගැනීමට විර්ය කරන්නේ ද එබඳුම ප්‍රයෝග - උත්සාහ කරන්නේ ද ? ඒ ආකාරයෙන් ම භික්ෂුව ද කාමරාගය දුරුකිරීම සඳහා සිහි ඇතිව, අප්‍රමාදී ව උත්සාහ වඩමින් වාසය කරන්නේ ය''(එසේ කළ යුත්තේය) මෙලෙස භාග්‍යවතුන් වහන්සේ ඒ තිස්ස තෙරුන්ගේ ක්‍රෝධ, චිත්ත පීඩාවන් සංසංදවීම සඳහා අවවාද දෙන සේක්., මුඛ්‍යවශයෙන් කාමරාගය ප්‍රහාණය කිරීම මාතෘකා කරගෙන දේශනාව නිමාකළ සේක. තෙරුන් වහන්සේ එම ගාථාව අසා, සංවේගයට පත් සිතින් විදසුන් වැඩීමෙහි උත්සාහවත් ව වාසය කළහ. එම අදහස දැනගත් ශාස්තෘන් වහන්සේ සංයුක්ත නිකායේ කියැවෙන තිස්සත්‍රෙථරසූත්‍රය දේශනා කළසේක. එම දේශනාව අවසානයේ දී තිස්ස තෙරුන් රහත්ඵලයෙහි පිහිටියේ ය. උන්වහන්සේ තම චරිත කථාව අපදන පාළියේ මෙසේ විස්තර කර දක්වති.

''දෙව්ලොව, මිනිස්ලොව යන දෙලොවම යශස් අනුභව කර, අවසන අනුත්තර ශාන්තිය ගෙනදෙන නිවණට පැමිණියෙමි. යම් පුරුෂයෙක් සම්බුදුරජාණන් වහන්සේ සඳහා හෝ උන්වහන්සේගේ බෝධිය උදෙසා හෝ පින් රැස් කරන්නේ නම් ඔහුට කුමක් දුර්ලභ වේද? මාර්ග - ඵල පිළිබඳව ද දීඝනිකායාදිය හා ධ්‍යානාභිඥා ගුණයන්යන් හි ද අන් අයට වඩා අධික ඥාන ලාභියෙක් ව ආශ්‍රම රහිතව පිරිනිවන් පාන්නෙමි. පෙර මම සතුටු සිතින් බෝ මළුවෙහි වැටුණු වියලිපත් බැහැරලා, මේ විසිඅංගයන්ගෙන් හැමකල්හිම යුක්ත වීමි. මවිසින් කෙලෙස් දවන ලදි.- පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ එම තෙරුන් වහන්සේ තම රහත්ඵලය ප්‍රකාශ කරන සේක්, ශාස්තෘන් වහන්සේට පූජා කරනු කැමති ව එම ගාථාව ම නැවත වදළසේක.

නිස්ස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.4.10

''සතතියා විය ඔමට්ඨා'' යනු ආයුෂ්මත් වඩ්ඪමාන තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? මොහු ද පෙර බුදුවරු හමුවෙහි කරනලද ප්‍රාර්ථනා ඇත්තෙකි. මෙයින් කල්ප අනූ හතරකට පෙර නිස්ස නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද වියට පැමිණියේ, නිස්ස භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරෙනු දැක පැහැදුණු සිතින්, මනාව පැසුණු නටුයෙන් ගිලිහුණු අඹගෙඩි පූජාකළේය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් ලොව උපන්නේය. ඒ ඒ භවයන් හි දී තව තවත් පින්දහම් රැස් කරගත් හෙතෙම, මේ අපගේ සම්බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි දී වේශාලියේ (විශාලා මහනුවර) ලිච්ඡවී රජ පවුලක ඉපිද වඩ්ඪමාන නමින් ප්‍රකට විය. වියටපත් ඒ රජ කුමරු ශුද්ධාවන්ත, තුණුරුවන් හි පැහැදුණු, දීමෙහි ම ඇලුණු දයක යෙක්ව නිති සංඝයාට උපස්ථාන කළේය. ඔහු කරන ලද යම් අපරාධයක් නිසා, ශාස්තෘන් වහන්සේ ඔහුට පත්ත නික්කුජ්ජන කර්මය පැනවූ කල්හි, එය සංසිඳුවා ගෙන උපන් සංවේගය නිසා පැවිදි විය. පැවිදි වූ නමුත් කය සිත මැලි බැවින් යුක්තව (ථීනමිද්ධ නීවරණයේ වෙලී) වාසය කළ වඩ්ඪමාන තෙරුන්

වෙත වැඩම කළ ශාස්තෘන් වහන්සේ, එහිමියන් තුල සංවේග ඇතිකරවමින් ''සතතියා විය ඔමට්ඨා'' යන ගාථාව වදාළ සේක. එහි ''**භවරාගපහාණාය**'' යනු භව රාගය ද රූප රාගය ද අරූප රාගය ද දුරු කිරීම පිණිස, ඉදින් ආධ්‍යාත්මික සංයෝජනයන් දුරු නොකර, ප්‍රහීන නොකර බාහිර සංයෝජනයන් ගේ ප්‍රහාණයක්, දුරුවීමක් නම් සිදු නොවේ. මේ දෙක අතර මැද ප්‍රහීනවීමක් නොමැත. උද්ධම්භාගිය සංයෝජනයන් ප්‍රහීණ නොවූ කල්හි ඕරම්භාගිය සංයෝජන මුළුමණින්ම ප්‍රහීණ වුවත් උද්ධම්භාගිය සංයෝජන දුරුකිරීම අපහසු වෙති. එනිසා පහසුවෙන් ප්‍රහීණය කළහැකි දෙයින් අපහසු ප්‍රහීණ කිරීම උද්ධම්භාගිය සංයෝජන ප්‍රහීණ කිරීම අදහස් කළ සේක. නැතහොත් තෙරුන් වන්සේගේ අදහස් අනුව ම එසේ දේශනා කළසේක. සෙසු අර්ථ විභාග මුලින් දැක්වූ තිස්ස තෙරුන්ගේ වස්තුවෙහි පැමිණි ලෙස දතයුතුයි.

වඩ්ඪමාන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සතර වන වර්ගයේ අර්ථවර්ණනාව සමාප්තයි.

1.5.1

''විවරමනුපතන්ති විඤ්ඤූනා'' යනු ආයුෂ්මත් සිරිවඩ්ඩ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිර්වාණය ප්‍රාර්ථනා කරගෙන බොහෝ පින්දහම් රැස්කරගත්හ. මෙයින් කල්ප අනූ එකකට පෙර පහළ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ සමයෙහි සිටුකුලයක ඉපිද වැඩිවියට පත්වූ හෙතෙම, විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක - පැහැදී උන්වහන්සේට කිංකිණි මලින් පූජා කළේය. ඒ පින්කමෙන් දෙව්ලොව උපන් ඔහු; තව තවත් පින්දහම් රැස් කරමින් සුගතීන්හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ නුවර මහත් ධනය ඇති බ්‍රාහ්මණ ගෙදරක උපන්නේ ය. සිරිවඩ්ඩ නාමයෙන් ප්‍රකටව වැඩිවියට පත්වූ ඔහු, බිම්බිසාර රජු හමුවේදී (බුදු වූ අලුතම) ශාස්තෘන් වහන්සේ දෙසූ සද්ධර්මයෙහි උපන් ප්‍රසාදය නිසාත් සංසාරික පුරුදුනාවය නිසාත් පැවිදි විය. පැවිදිව කරන ලද පූර්ව කටයුතු ඇති සිරිවඩ්ඩන තෙරණුවෝ, වේහාර පාණ්ඩව පර්වත දෙකට නුදුරු තැනක වූ අරණ්‍යායතන පවිත්‍ර ගුහාවක කමටහන් වැඩීමෙහි ම යෙදී වාසය කළහ. එම වේලාවෙහි මහත් වූ අකල් මේඝයක් (මහවරුසාවක්) පහළ විය. විදූලිය පර්වත විවරයට වැටෙමින් හෙන මෙන් හැසිරෙයි. (පුපුරයි). තෙරුන් වහන්සේගේ ග්‍රීෂ්මයෙන් තැවුණු ශරීරය තෙත් වූ වැසි සුලඟින් ස්පර්ශ කරන ලද්දේ ග්‍රීෂ්ම තාපනයෙන් සංසිදුණි. යෝග්‍ය වූ සෘතු ලැබීම නිසා සිත එකඟ කරගත හැකි විය. තෙරණුවෝ එකඟ වූ සිතින් විදසුන් වඩා රහත් බවට පත්වූ සේක. උන්වහන්සේ මෙසේ අපදාන පාළියේදී සිය චරිත විස්තරය දැක්වූ සේක.

''රන්තොරණක් මෙන බබලන සර්වඥ වූ ලෝකනායක බුදුරජාණන් වහන්සේගේ, සිසිල් දිය ඇති විලකට බැස ජලස්නානය කළසේක. මම කිංකිණි මල් රැසක් ගෙන ඔදවැඩී ගිය සිතැතිව, සතුටින් ද්විපදෝත්තම (දෙඇන්තන් අතරින් උතුම් වූ) තාදී ගුණ ඇති විපස්සි බුදුරජාණන් වහන්සේට පිදුවෙමි.''

''මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක් නුදුටුවෙමි. බුද්ධ පූජාවෙහි විපාකය එබඳුය. ඒ මම මෙයින් කල්ප විසි හතකට පෙර සත්රුවනින් හෙබි මහත් බලැති හිමරථ නම් සක්විති රජ වූයෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - ප - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. ''

රහත්බවට පත්වූ උන්වහන්සේ සිය නික්ලේශී භාවය ප්‍රකාශ කරන සේක්; තමන් වහන්සේට වූ ලාභයම අර්ථෝත්පත්ති කරගෙන ප්‍රීතිය ප්‍රහළ කරමින් ''**විවරමනපතනති විජ්ජුතා**'' යන ගාථාව වදළසේක.

එහි ''**විවරං**'' යනු විවරයෙහි. අතර මැද ''**අනුපතනති**'' යනු කියු ලක්‍ෂණයෙහි වැටෙති. පතතිති. බැබලෙති. යන අර්ථයයි. බැබලීමට විදුලියෙහි පැවතීම වේ. ''අනු'' යන්න මෙහිදී දුනියා විභක්තියෙහි යෙදී ඇත. ''ගසක් පාසා බබලයි'' ''**රුක්‍ඛමනු විජ්‍ජොතනති**'' යන්න මෙණි. ''විජ්ජුතා'' යනු වාතයෙන් කම්පිත වූ (විදුලිය). ''**වෙභාරස්සව පණ්ඩවස්සව**'' යනු ''වේභාර පර්වතයට ද පණ්ඩව පර්වතයට ද යන අතරෙහි වූ විවරයෙහි වැටෙයි'' යන අර්ථයයි. ''**නගවිවරගතො**'' යනු පව්ත (නග) විවරයට, පර්වත ගුහාවට පැමිණි (එහි වැඩ සිටි) ''**ඣායති**'' යනු ආරම්මණයන් හෝ ලක්‍ෂණයන් පිළිබඳව නැවත නැවත සිතමින් දැහැන් (ධ්‍යාන) වඩයි. සමථ හා විදර්ශනා භාවනාවන් පෙරටුකරගෙන වඩයි. ධ්‍යාන කරයි. ''**පුත්තො අපාටිමස්ස තාදිනො**'' යනු ශීලස්කන්ධ ආදී ධර්මකාය සම්පත්තියෙන් ද රූප කාය සම්පත්තියෙන් ද අනුපම වූ, උපමාරහිත වූ, ඉෂ්ටානිෂ්ටාදී කාරණයන් හි තාදී ලක්‍ෂණය සහිත, අකම්පිත බුදුරජාණන් වහන්සේගේ ඖරස පුත්‍රයා; මෙහි යෙදුණු ''පුත්ත'' යන වචනයෙන් ම තෙරුන්වහන්සේ; තමා රහත්බවට පත්වීම් වශයෙන් ශාස්තෘන් වහන්සේගේ අනුජාත පුතෙකු බව ප්‍රකාශ කළ සේක.

සිරිවඩ්ඩ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.2

''**චාලෙ උපචාලෙ**'' යනු ආයුෂ්මත් බදිරවනීය රේවත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි හංසවතී නුවර තීර්ත නාවික පවුලක ඉපිද මහා ගංගාවෙහි මහතොටක සිට නාවික කාර්යයහේ නිරත වූහ . එක් දිනක් ශ්‍රාවක සංඝයා සහිත භාග්‍යවතුන් වහන්සේ ගඟ තෙරට පැමිණි බව දුටු ඔහු; පැහැදුණු සිතින් නැව් සමූහයක් යොදවා මහත් වූ පූජා සත්කාර කරමින් උන්වහන්සේලා ගඟින් එතෙර කරවීය. පසුව ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා

අතරින් අගතනතුරට පත් කරනු දැක, එම තනතුරම ප්‍රාර්ථනා කරගෙන භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු මහා සංඝරත්නයට ද මහදන් පැවැත්වීය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහුගේ එම ප්‍රාර්ථනාව ඉටුවන බව පැවසූ සේක. ඔහු එතැන් පටන් ඒ ඒ උපනුපන් භවයන්හිදී සසරින් මිදීම සඳහා කුසල් දහම් රැස්කරමින් දෙව්මිනිස් දෙගතියෙහි සැරිසරා, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි මගධ රට නාළක නම් ගමේ රූපසාරී බැමිණියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. වැඩිවියට පත්වූ මේ බමුණු තරුණයාට විවාහයක් කරදෙනු කැමති දෙමාපියෝ ඔහුට ඒ බව දැනුම් දුන්හ. ඔහු සැරියුත් තෙරුන්ගේ පැවිදිවීම අසා, ''මගේ වැඩමහල් සොයුරු වූ උපතිස්ස මේ සියලු සම්පත් හැර දමා පැවිදි විය. ඔහු විසින් වැමෑරූ කෙළ පිඬ මම කෙසේ නම් දැන් ගිලින්නෙම්ද'' යි විමසමින් උපන් සංවේග ඇතිව, උගුලට හසුනොවී දිවයන මුවෙකු මෙන් ඥාතීන් රවටා පූර්ව වාසනා මහිමයෙන් මෙහෙයවනු ලබන්නේ භික්ෂූන් සම්පයට ගියේය. ගොස් තමා ධර්මසේනාපතීන් වහන්සේගේ බාල සොහොයුරා බව දැනුම් දී පැවිදිවීමට ඇති කැමැත්ත ද පැවසීය. භික්ෂූහු ඔහු පැවිදි කළහ. පිරිපුන් විසිවයස් ඇති රේවත හිමියන් උපසම්පද කොට, කමටහන් වැඩීමෙහි නියුක්ත කළහ.

උන්වහන්සේ කමටහන් රැගෙන කිහිරි වනයට (බදිරවනං) ගොස්; ''රහත්බවට පත්වීමෙන් පසුව භාග්‍යවතුන් වහන්සේ ද ධර්මසේනාපතීන් වහන්සේ ද දකින්නෙමි.'' යි උත්සහ කරනුයේ, වෑයම් කරනුයේ; ඤාණය මුහුකුරා ගොස් නොබෝ කලකින්ම ෂඩ් අභිඥා උපදවා ගෙන අර්හත්ඵල සාක්ෂාත් කරගත්හ. එසේ කටයුතු නිමකළ උන්වහන්සේ තම චරිතය මෙසේ දක්වූහ.

''හිමවතින් හටගෙන ගලාඑන භගීරථී නම් ගඟක් විය. මම ඒ ගඟෙහි සැඩ රළ වේගයෙන් යුතු විෂම තීර්ථයක රැකියාව කරන නැවියෙක් වූයෙමි. පදුමුත්තර බුදුරජාණන් වහන්සේ රහතන් වහන්සේලා දහසක් සමඟ ගඟෙහි සැඩ පහර තරණය කිරීමට වැඩම වූ පුවත මම ඇසුවෙමි. බොහෝ නැව් එක්කර තැනූ මහා නැවෙහි, වඩුවන් ලවා මනාව සෙවිලි කරවා බුදුරජාණන් වහන්සේට පූජා කළෙමි. බුදුපියාණෝ එම උතුම් නැවට නැගිසේක්; ගඟ මැද දී මෙලෙසින් වදළසේක.''

''යමෙක් මෙසේ රහතන් වහන්සේලා සහිත බුදුරජාණන් වහන්සේ ගඟින් එතෙර කරවයිද, ඔහු එම සිත් පැහැදීම නිසා දෙව්ලොව උපදින්නේය.

ඔබට මේ මනාව අලංකාර කළ මහා නැව බඳු දෙව් විමනක් පහළවේ. හැමකල අහසේ මල් වියනක් ඇතිවේ. මෙයින් කල්ප පනස් අටකට පසුව නුඹ සිවුමහා දිවයින්ට ම ප්‍රධාන වූ ජයගන්නා වූ තාරක නම් සක්විති රජවන්නෙහිය. මෙයින් කල්ප පනස් හතකට පසුව මහබල ඇති චම්පක නම් ක්ෂත්‍රිය රජව උදවන හිරුමෙන් බබලන්නේය. මෙයින් කල්ප ලක්ෂයකට පසුව පහළවන ඔක්කාක කුලයේ ඉපිද ගෝතම නාමයෙන් හැඳින්වෙන ශාස්තෘන් වහන්සේගේ කාලයේදී නුඹ දෙව්ලොවින් චුතව රේවත නම් බ්‍රාහ්මණයෙක් වන්නෙහිය. කුශල මූලයන් විසින් මෙහෙයවනු ලබන නුඹ, ගෞතම බුදුසසුනෙහි ශ්‍රද්ධාවෙන් පැවිදි වන්නෙහිය. පැවිදිව භාවනායෝගීව විදසුන් වඩා සියලු ආශ්‍රව ප්‍රහීන කරන නුඹ නිකෙලෙස්ව පිරිනිවන් පාන්නෙහිය.''

නිර්වාණය නම් යෝග ක්ෂේම භූමියට මා ගෙනයන ගැල්බර උසුලන ගවයා නම් මාගේ වීර්යයි. දැන් මම බුදුසසුනෙහි අවසන් සිරුර දරමි. මීට කල්ප ලක්ෂයකට පෙර කරන ලද කුසල කර්මය මෙම අත්බැව්හිදී විපාක දුන්නේ ය. දුනුදියෙන් මනාව මිදුණු හියේ වේගය මෙන් ඒ කුසලයෙන් මාගේ කෙලෙස් දවිණි. ඉක්බිති ලෝකයේ කෙළවරට ගිය මහ නුවණැති බුදුරජාණන් වහන්සේ වන සෙනසුනෙහි ඇලුණු මා දැක, වනවැසිව දැහැන් වඩන භික්ෂූන් අතරින් අගතනතුරෙහි තැබූ සේක. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලබාගත් රේවත තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ ද ධර්මසේනාපතීන් වහන්සේද වැඳගනු කැමතිව, සෙනසුන් හකුළුවා තබා පාසිවුරු ගෙන අනුපිළිවෙලින් සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියහ. වැඩමවා ශාස්තෘන් වහන්සේට ද ධර්මසේනාපතීන් වහන්සේටද වන්දනා මාන කොට දින කිහිපයක් එහිම විසූ රේවත තෙරණුවන්; ශාස්තෘන් වහන්සේ විසින් ආර්යයන් වහන්සේලා මැද වැඩ හිඳිසේක් ආරඤ්ඤක භික්ෂූන් අතරින් අග්‍රස්ථානයෙහි තැබූසේක. ''මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා අතුරින් ආරණ්‍යයෙහි වසන්නවුන් ගෙන් මේ බදිරවනීය රේවත තෙරණුවෝම අග්‍රවෙති'' යි වදළහ.

පසුකලෙක උන්වහන්සේ තම උපන් ගමට වැඩ සිය සොහොයුරියන් වූ චාලා, උපචාලා, හා සිසුපචාලා යන තිදෙනාගේ පුතුන් වූ චාලා, උපචාලා හා සිසුපචාලා යන තම බෑනාවරු තිදෙන කැඳවාගෙන වුත් පැවිදි කොට කමටහන් වැඩීමෙහි නියුක්ත කළසේක. ඔවුහු ද කමටහනෙහිම

නියුක්ත වෙමින් වාසය කළහ. මෙසමයේ රේවත තෙරුන්ට කිසියම් ආබාධයක් ඇතිවිය. එය ආරංචි වූ සැරියුත් මහරහතන් වහන්සේ, ''රේවත තෙරුන්ගෙන් රෝගය පිළිබඳව ද අධිගමයන් පිළිබඳව ද විමසන්නෙමි'' යි එතැනට එළඹිසේක. රේවත තෙරණුවෝ, දුරදීම තමා වෙත වැඩමවන සැරියුත් තෙරුන් දුටුවහ. දැක ඒ සාමණේරවරුන්ට සිහිය ඉපැවීම සඳහා අවවාද දෙමින්, ''**චාලෙ උපචාලෙ**'' යනාදී ගාථාව වදළහ.

එහි ''**චාලෙ උපචාලෙ සිසුපචාලෙ**'' යනු සාමණේරවරුන්ට ඇමතීමයි. ඔවුන්ට චාලා, උපචාලා හා සිසුපචාලා යන ස්ත්‍රිලිංගික නාම ගිහිකාලයේ භාවිතා වූ බැවින් පැවිදි වූ පසුවත් එසේම ව්‍යවහාර කරන ලදී. ඇතැම් හු මොවුන් ගේ නම් චාලී, උපචාලී හා සිසුපචාලී නම් වූ බවද කියති. යම් කරුණක් සඳහා මෙසේ අමතනු ලැබුවේද ඒ කරුණ දක්වන සේක්; ''**පනිස්සකා නුඛො විහරථ**'' යන්න දේශනා කළහ. අනතුරුව එසේ සිටීමට හේතුව ''**ආගතො වො චාලං විය වෙධි**'' යනුවෙන් දැක්වූහ. මෙහි ''**පනිස්සකා**'' යනු සිහි ඇතිව ද? සිහි නොමැතිව ද ? යි අවධාරණය කරයි. ''**ආගතො**'' යනු පැමිණියේය.

''**වො**'' යනු නුඹලාගේ'' **චාලං විය වෙධි** '' යනු හිස කෙස්ගස පවා දෙපලු කිරීමට සමත් දුනුවායකු මෙන් මෙම ගාථාවෙහි අරුත මෙසේය. ''තියුණු ඉතා වේගවත් අවබෝධවීම් හා ප්‍රඥා ඇති බැවින් චාලවෙධි දුණුවායෙක් වැනි වූ ශාස්තෘන් වහන්සේ බුදු නුඹලාගේ මාමා වන සැරියුත් මහ රහතන් වහන්සේ වැඩම කළහ. එනිසා හෙරණුනි ! තමා ශ්‍රමණයෝය යන හැඟීම උපදවාගෙන, සිහි කල්පනාවෙහි නියුක්තව වෙසෙවු. අවබෝධ නොකළ අධිගමයන් හි අප්‍රමාද වන්න'' මෙම ප්‍රකාශය ඇසූ සාමණේරවරු සැරියුත් තෙරුන්ට පෙරගමන් කිරීම් ආදී නිසිවත් දක්වා මාමාවන තෙරවරු දෙදෙනාම පිළිසඳර කථාවට පිවිසි කල්හි, මඳක් ඈත් වී සමාධියට සමවැද වැඩහුන්හ. ධර්මසේනාපතීන් වහන්සේ, රේවත තෙරුන් සමඟ වූ පිළිසිඳර කථාව නිමවා අසුනින් නැගිට ඒ සාමණේරවරු වෙත වැඩම කළහ. ඔවුහු එම අධිෂ්ඨානයෙන් කාලය පිරිසිඳීම කල බැවින්, තෙරුන් වහන්සේ සම්පවන විටම ධ්‍යානයෙන් නැගිට වැඳ එකත් පසෙක සිටියහ. ''නුඹලා දැන් කවර කවර විහරණයන්ගෙන් යුක්තව වාසය කරවුද?'' යි සැරියුත් තෙරණුවෝ ඇසූ කලහි එම සාමණේරවරු,'' ස්වාමීනී! මේ මේ විහරණවලින් පසුවෙමි'' යි පැවසූහ. එය ඇසූ සැරියුත් තෙරුන්,'' දරුවන් පවා මෙසේ හික්මවන්නා වූ මාගේ සොහොයුරා ඒකාන්තයෙන් ම සත්‍ය වූ වදන් ඇත්තෙකි. ධර්මය අනුව පවතින්නෙකි''යි රේවත තෙරුන්ට ප්‍රශංසා කරමින් වැඩිසේක.

බදිරවනීය රේවත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.3

"සුමුනිකො" යනු ආයුෂ්මත් සුමංගල තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහිදී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී නිවන් පතාගෙන නොයෙකුත් පින්දහම් රැස්කළහ. සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයේ රුක් දෙවියෙක් ව ඉපිද; එක් දිනක් ශාස්තෘන් වහන්සේ දිය නා, එක් සිවුරකින් යුක්තව සිටිනු දැක, සතුටින් අත් පොළසන් දුන්නේය. ඔහු ඒ පින්කම නිසා දෙව් මිනිසුන් අතර සැරිසරා අවුත්; මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවරට සමීප එක්තරා ගමක කිසියම් පාපකර්මයක් නිසා දිළිඳු පවුලක උපන්නේය. ඔහු සුමංගල නමින් ප්‍රකට විය. වැඩිවියට පැමිණි ඔහු කුඩා දැකැත්තක්, නඟුලක් හා උදැල්ලක් පමණක් ඇතිව කෘෂිකර්මාන්තයෙන් දිවි ගෙවීය.

මෙතෙම එක් දිනක් පසේනදී කොසොල් රජතුමා විසින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන භික්ෂු මහා සංඝරත්නයට මහදන් පවත්වන කල්හි; දානෝපකරණ රැගෙන පැමිණි මිනිසුන් සමඟ දී කලයක් ගෙන පැමිණියේය. දන් බෙදීමට සහාය වූ ඔහු භික්ෂූන්ට කරන සත්කාර සම්මාන දැක, "මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රීය භික්ෂූහු මැනවින් හැඳ පොරවාගෙන, ඉතා රසවත් අහර අනුභව කර, අවුවැසි සුලං නොඑන සෙනසුන්හි සුවසේ වැඩවෙසෙති. එනිසා මම ද පැවිදි වන්නේ නම් යෙහෙකි" යි සිතා එක්තරා මහතෙරනමක් සමීපයට ගොස් තමාගේ පැවිදිවීමේ කැමැත්ත දැනුම් දුන්නේය. උන්වහන්සේ ද මේ දිළිඳු ගොවියා කෙරෙහි කරුණාවෙන් ඔහු පැවිදි කළ සේක. කමටහන් ද ගෙන කුලයට පිවිසි සුමංගල තෙරණුවෝ; මද කලකින් ම නුදකලා වාසයේ කළකිරී, උකටලී වූ සිතින් සිවුරු හරිනු කැමතිව නෑයන්ගේ ගමට යන අතරමගදී කැසපට කවාගෙන කුඹුරෙහි සීසාන ගොවියෝ දුටුවහ. කිලිටි වස්ත්‍ර හැඳගෙන, මුළු සිරුරෙහිම මඩ තවරාගෙන අවුවැසි සුලඟින් පීඩාවිඳින ගොවියන් දුටු උන්වහන්සේ; "මේ සත්ත්වයෝ ජීවත්වීම සඳහා ඉතා මහත් වූ දුක් අනුභව කරති" යි සංවේගයට පත්වූහ. එසේ සිතත්ම නුවණ මුහුකුරා ගිය උන්වහන්සේට මුලදී ගත් කමටහන මැනවින් වැටහුණේය. සුමංගල හිමියෝ සමීපයේ වූ රුක්මුලක් වෙත වැඩම වා, විවේකීව හිඳිමින් යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව විදසුන් වඩා මඟ ඵල පිළිවෙලින් ලැබ රහත් ඵලයට පත්වූහ.

උන්වහන්සේ විසින් සිය චරිතාපදානය මෙසේ දැක්වූහ.

''ලෝක ජ්‍යේෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ අපරිමිත දස්සි බුදුරජාණන් වහන්සේ විහාරයෙන් නික්ම තඩාගයක් (විලක්) වෙත වැඩම කළහ. එහිදී පැන් සනහාගත් භාග්‍යවතුන් වහන්සේ අඳනයෙන් පමණක් සැරසී දිශානු දිශාවන් බලමින් වැව් ඉවුරෙහි වැඩසිටි සේක. එකල්හි රුක්දෙවියෙකු වූ මම සිය භවනයෙහි හුන්නෙමි; සූර්යයා මෙන් බබලන, රන් කඳක් මෙන් දිලිසෙන ලෝක නායකයක් වහන්සේ දුටුවෙමි. දැක තුටු සිත් ඇතිව සොම්නස් සිතින් අත්පොළසන් දුන්නෙමි. ඒ පින්කමේ විපාක වශයෙන් නෘත්‍ය, ගීත, පසඟතුරු නාද ආදියෙන් පිරිපුන් දෙව් සැප ලැබුවෙමි. දේව මනුෂ්‍ය භවයන්හි ඉපිද යසසින් සැම දෙන ඉක්මවා සිටියෙමි. මගේ යසස ඉතා විශාලය.''

''පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස; ඔබවහන්සේට නමස්කාර වේවා ! පුරුෂෝත්තමයන් වහන්ස ! ඔබ වහන්සේට නමස්කාර වේවා. සර්වඥයන් වහන්ස! නුඹ වහන්සේ තමා ද සතුටු වී අන්‍යයන් ද සතුටු කරන සේක.'' මනාවූ ව්‍රත ඇති තථාගතයන් වහන්සේ පිරිවරාගත් මම උන්වහන්සේ ද සතුටු කොට උවටැන් කළෙමි. එපිනින් තුෂිත භවනයෙහි උපන්නෙමි. මීට කල්ප එක් දහස් හයසියයකට පෙර සත්රුවනින් පිරි මහත් බල ඇති ''ඒකචින්තිත'' නමින් සක්විති රජවරු එකළොස් දෙනෙක්ම ඉපදුනෙමි. දැන් මම සියලු කෙලෙස් නැසූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

මෙසේ රහත්බවට පත්ව සමාපත්ති සුවයෙන් සැණසුණු සුමංගල තෙරණුවෝ, තමාගේ දුකින් මිදීම ප්‍රකාශ කරමින් ප්‍රීති වාක්‍ය පහළ කරන සේක; ''**සුමුත්තිකො**'' යන ගාථාව දේශනා කළහ.

එහි ''**සුමුත්තිකො**'' යනු ඉතා යහපත්ව, සසරෙහි කෙළවරක් ඇති කරන - නැවත ඉපදීමක් නැති මිදීමක් වූ බැවින් ''මනාව මිදුණෙමි''යි පැවසීය. එසේ උතුම් වූ විමුක්ති සුවයට ප්‍රශංසා කරමින්, එහිවූ ආශ්චර්ය ජනකබව නිසා අත්පොළසන් දෙමින් '' සුමුත්තිකො'' '' මනාව මිදුනෙමි''යි පැවසීය. නැවත ඒ විමුක්ති සුවය තමා කෙරෙහි දැඩිව පිහිටිබව දක්වමින් ''**සානුසුමුත්තිකොම්හි**'' යනුවෙන් දැක්වීය. ''මැනවි, මැනවි, මම මනාව මිදුනෙමි'' යන අර්ථයයි. මෙතෙමේ කුමකින් මනාව මිදුණේද? මේ තෙරුන් වහන්සේ කාමය ප්‍රධාන සියලුම සසර පැවැත්මට හේතුවන ධර්මයන්ගෙන් මනාව මිදුණහ. තමන් වහන්සේට පෙර තිබූ අනිෂ්ට වූ ඉතා දැඩි දුක්ඛිත බව පෙන්වමින් ''**නීහි බ්‍රුජ්ජකෙහි**'' යනාදිය දක්වූහ. එහි ''බුජ්ජකෙහි'' යනු කුදු ස්වභාවයෙන්. කුදු ආකාරයෙන් මෙය පංචමී විභක්ති වචනයකි.

මිදීමේ අර්ථයක් ගෙන දෙන බැවිණි. ගොවියා ද තමා ශරීරයෙන් කුදු නොවූවත් තමා තුන් තැනක කුදුවූවකු කර දක්වයි. ගොයම් කැපීමෙහිද යි සැමෙහි ද උදැල්ලෙන් වැඩ කිරීමෙහි ද යන මේ තුන් ක්‍රියාවේදී ගොවියා කුදුවී වක් වී එම කටයුතු කළයුතු බැවින් ''තුන් කුදුයෙන්'' යනුවෙන් කුදුවීම් ලෙස එය දක්වුණි . දැන් එම කුදුවීම් වල ස්වරූපය දක්වන සේක්, ''අසිනාසු මයා නඞ්ගලාසු මයා බුජ්ඣකුඳ්දාලාසු මයා'' යනුවෙන් පැවසූහ. එහි ''අසිනාසුමයා'' යනු ''ගොයම් කැපීමෙන් මිදුනෙමි'' යන අර්ථයයි. පංචමී අර්ථයෙහි සත්තමී විභක්තිය යෙදී ඇත. සෙසු පද දෙකෙහි ද මේ ක්‍රමය ම වේ. ඇතැම් හු මෙහි '' අසිනාසුමයා'' යන්නෙන් ''ගොයම් කැපීම් ආදියට හේතු වූ කරුණු වලින් මම මිදුණෙමි'' යන අදහස දෙන බව කියති. ඔවුන්ගේ මතය අනුව කාරණාර්ථයේ හා හේතු අර්ථයේ සත්තමී විභක්තිය යෙදී ඇත. ''නඞ්ගලාසු'' යනුවෙන් ලිංග විපර්යාස කොට දක්වන ලදී. නඟුලින් වැඩ කිරීමෙහි, ඉතා දුක්ඛිත කටයුත්තෙහි යන අර්ථයයි. තමා වැළකුණු උදැල්ලෙහි ස්වභාව වශයෙන් ද පරිහරණය කිරීමේ අල්ප බැවින් ද ''බුඳුකුඳ්දාලාසු'' කුඩා උදැල්ලෙන් යැයි දක්වන ලදී. පරිහරණය කිරීම් වශයෙන් තියුණු නොවූ උදැල්ලෙන් යන අර්ථයයි. ''ඉධමෙ'' යන තැන් හි ''ම'' කාරය පද දෙකක් සැකි කරන්නකි. නැතහොත් ''පි'' යනු නිපාතයකි. ''ඒ දැකැති ආදිය ගමෙහි තිබුණත්, දැන් මගේ සම්පයට ගෙනාවත් දැන් ඉන් මට ප්‍රයෝජනයක් නැත'' යන අර්ථයයි. මෙහිදී ඉක්මන්වීම් වශයෙන් එක වචනය දෙතුන් වරක් යෙදී ඇත. ''ඣායාමි'' යනු ඵලසමාපත්ති ධ්‍යාන වශයෙන්, දිට්ඨධම්ම සුව විහරණ වශයෙන් හා දිව්‍යමය විහරණාදී වශයෙන් ධ්‍යාන වඩමි. ''ඣාය සුමඞ්ගල'' යන්නෙන් තමාටම ආමන්ත්‍රණය කරගනියි.

උන්වහන්සේ ධ්‍යාන වැඩීමට ඇති කැමැත්ත දැක්වීමට එම වදන දෙතුන්වරක් යොදන ලදහ. ''අප්පමත්තො විහර'' යනු ප්‍රඥාවේ හා සිහියේ විපුලත්වය සාර්ථාර්ථ සාධක වේ. එනිසා නුඹ අප්‍රමාද වන්නෙහි. දැන් නුඹ එසේ අප්‍රමාදවීම නිසා සුවසේ වාසය කරන්නෙහි. ''සුමංගලය'' සුවසේ වාසය කරන්න'' යන අර්ථයයි. ඇතැම් හු ''රහත් වීමට පෙර දීම විදර්ශන භාවනාවට පිළිපන්, සසුන් පැවිද්දෙහිම ඇලුණු, පෙර තමා විදි ගෘහවාස දුක පිළිකුල් කරන තෙරණුවෝ මෙම ගාථාව දේශනා කිරීමෙන් අනතුරුව රහත් බවට පත්වූහ.'' යි කියති. ඔවුන්ගේ අදහස අනුව මෙම ගාථාවේ අවසනට එන ''ඣාය අප්පමත්තො විහර'' යන (අප්‍රමාදීව ධ්‍යාන වඩමින් වෙසෙන්න.) පදයන්ගේ අර්ථය විදර්ශනා මාර්ගය වැඩීම් වශයෙන් ගැලපෙන්නේ මය.

සුමංගල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.4

''මතං වා අම්ම රොදනිං'' යනු ආයුෂ්මත් සානු තෙරුන් වහන්සේගේ ගාථාවයි. එම ගාථාවේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හී දී නිර්වාණය පතාගෙන පින්දහම් රැස්කරගත්හ. මෙයින් කල්ප අනූ හතරකට පෙර සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට අත්පා දෙවීමට හා මුව සෝදූ ගැනීමට ජලය ගෙනවිත් දුන් ඔහු නිතර උන්වහන්සේට උපස්ථාන කළේය. ශාස්තෘන් වහන්සේ දැනය වළඳන වේලාවෙහි අත් පා සෝදූ ගැනීමට කැමති වූසේක. ඔහු ශාස්තෘන් වහන්සේගේ අදහස දැන වහාම දිය ගෙනැවිත් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ අත් පා සෝදගෙන දැනය වළඳ අවසන, මුව සෝදගනු කැමතිවිය. ඔහු එම කරුණද වහා දැනගෙන මුවදෝනා පැන් පිළිගැන්වීය. ශාස්තෘන් වහන්සේ මුව සෝදගෙන එම කටයුතු අවසන් කළ සේක. මෙලෙස භාග්‍යවතුන් වහන්සේ ඔහු කෙරෙහි අනුකම්පාවෙන් ඔහුගේ සියලු ඇප උපස්ථාන ඉවසූ සේක. හෙතෙම එසේ කරගත් පුන්‍ය සම්භාර ධර්මය නිසා දෙවිලොව ඉපිද, තව තවත් පින්දහම් කරගෙන දෙවි මිනිසුන් අතර ම සැරි සැරුවේය. අපගේ ලොවුතුරා බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත්නුවර එක්තරා උපාසකයෙකුගේ ගෙදර පිළිසිඳ ගත්තේය. ඔහු පිළිසිඳගත් කල්හිම පියා ගෙදරින් පිටවී වෙනත් පෙදෙසක වාසයට ගියේය. උපාසිකාව දසමසක් ඇවෑමෙන් පුතකු බිහිකර, ඔහුට ''සානු'' යන නාමය තැබුවාය. අනුක්‍රමයෙන් වැඩුණු සානු කුමරු සත් හැවිරිදි වියේදීම, භික්ෂූන් සමීපයට ගෙන ගොස් පැවිදි කරවූවාය. ''මේ සසුනෙහි අප්‍රමාදීව වාසය කර අතිශයින්ම සැපදයක වූ නිවන ලබන්නෙමි.'' යන අදහසින් පැවිදි වූ එකුමරු සානු සාමණේර නමින් ප්‍රකට විය. ඉතා ප්‍රඥාවන්ත වූ උන්වහනසේ වත් පිළිවෙත් හි මනාව සපුරා, බහුශ්‍රැතව ධර්ම කථිකයෙක්ව සත්ත්වයන් කෙරෙහි මෙත් සහගතව වාසය කළ බැවින් දෙවි මිනිසුන් සැමට ම ප්‍රිය - මනාප වූ පුද්ගලයෙක් වූහ. එම තොරතුරු සියල්ල සානු සූත්‍රයෙහි පැමිණි ආකාරයෙන්ම දැනගත යුතුයි.

සානු සාමණේරයන්ගේ අතීත භවයේ මව, යක්ෂයෝනියෙහි ඉපිද සිටියාය. ඒ යකින්නට ''මැය සානු තෙරුන්ගේ මෑණියෝය''යි සෙසු යක්ෂයෝ ගරුසිත් උපදවා ගෙන ගරුසත්කාර කරති . මෙසේ කල්ගතවන විට පුනුදුන් භාවයෙහි ආදීනව ප්‍රකාශ කරන්නාක් මෙන් එක් දිනක් සාණු සාමණේරයන්ට නුවණින් කල්පනා කිරීමට නොහැකි වූ බැවින් අනුවණින් යුතු වූයේ සිවුරු හැරීමේ සිතක් පහළවිය. එය වහා දැනගත් යක්ෂ මව,

මනුෂ්‍ය මව වෙතගොස් ''ඔබේ පුතා සිවුරු හරිනු කැමතිව සිටී''යැයි දැනුම් දුන්නාය. ''එනිසා නුඹ වහා උන්වහන්සේ වෙත ගොස් මේ ගාථාවන් කියව''යි පැවසූ යක්ෂණිය අතුරුදහන් වූවාය.

සානු මා බුද්ධං වජ්ජාසි - යක්ඛිණී වචනං ඉදං
මාකාසි පාපකං කම්මං - ආවී වා යදි වා රහෝ

සචෙ හිං පාපකං කම්මං - කරිස්සසි කරොසි වා
නතෙ දුක්ඛා පමුච්චති - උප්පච්චාපි පලායතෝ

''සානු ! නුඹ බුදුරජාණන් වහන්සේට වරදක් නොකරව, ප්‍රකටව හෝ අප්‍රකටව කිසිදු පාප කර්මයක් නොකරව, මෙය යක්ෂණියගේ ඉල්ලීමයි. ඉදින් නුඹ පාපකර්මයක් කරන්නේ හෝ කරවන්නේ නම් නුඹට දුකින් මිදීමක් නම් නැත. නුඹ වෙතින් සියල්ලෝම දුරුවෙති.

මනුෂ්‍ය මව මෙය අසා වැලපෙමින්, දඩි ශෝකයෙන් වෙලුණි සිතේ දුක්දොම්නස් ඇත්ති වූවාය. ඉක්බිති සානු සාමණේරයෝ පෙරවරු සමයෙහි හැඳ පොරවාගෙන පා සිවුරු රැගෙන මව සමීපයට පැමිණියහ. පැමිණ අඬන මව දුටු උන්වහන්සේ, ''මෑණියණි ! කුමක් නිසා අඬන්නෙහි ද? යි ඇසූහ. මව ''නුඹ වහන්සේ නිසා අඬමි'' යි කිවාය. එවිට සානු හිමියෝ, ''**මතං වා අම්ම රොදනති - යො වා ජීවං න දිස්සති**'' යන ගාථාව පැවසූහ. එහි අර්ථය මෙසේය. ''මෑණියණි! හැඬීම නම් නෑ මිතුරෝ තම ඤාති හිත මිත්‍රාදීහු මැරුණුවිටම සිදුකරති. පරලොව ගිය බැවින් ම ඔවුහු උදෙසා වැලපෙති. යම් ඤාති හිත මිත්‍රාදියෙක් ජීවත් වෙමින් සිට වෙනත් දේශයකට යන්නේ නම් ඔහු ද දක්නට නොලැබෙන බැවින්, ඔහු උදෙසාද හඬති. වැලපෙති. මේ කරුණු දෙකම මා පිළිබඳව විද්‍යමාන නොවේ. එබැවින් නුඹ ඉදිරියේම ජීවත් වෙමින් සිටින මා පිළිබඳව මෑණියණි! නුඹ කුමක් නිසා හඬන්නී ද ? මා වෙනුවෙන් හැඬීමට නුඹට කිසිම කරුණක්, හේතුවක් නැත'' එය ඇසූ මව ''මහණෙනි! යමෙක් ශික්ෂාපද ප්‍රතික්ෂේප කර ගිහිබවට පැමිණෙන්නේ නම් එය ආර්ය විනයෙහි මරණයක් යැයි කියැවේ.'' යන සූත්‍ර පදය අනුසාරයෙන් ''උපැවිදිවීම ආර්ය විනයෙහි මරණය නම් වේ.'' යැයි දක්වන්නී මේ ගාථා දෙක කීවාය.

''මතං වා පුත්ත රොදනති යොවා ජීවං න දිස්සති
යොච කාමෙ චජිත්වාන පුනරාගච්ඡතෙ ඉධ

තඤ්චාපි පුත්ත රොදන්ති - පුත ජීවං මතෝ හි සෝ
කුක්කුලා උඛතෝ නාත කුක්කුලං පතිතුමිච්ඡසි''

''පුතේ! මැරුණු පුද්ගලයා නිසා හෝ යමෙක් ජීවත් වුවත් නොපෙනේ ද (දුරුරට වාසය නිසා) ඔහු වෙනුවෙන් ද ඥාති හිතමිත්‍රාදීහු හඬති. යමෙක් මේ ගිහි සැප හැර දමා පැවිදි ව නැවත ගිහි බවට පැමිණේ නම් ඔහු ජීවත් වුවත් මළ අයෙකු වැනිය. මම ඔහු නිසා හඬමි. කුක්කුල නිරයෙන් ගොඩ ආ නුඹ නැවත ඒ නිරයට ම පැමිණීමට සිතන්නෙහිද?''

එහි ''**කාමෙ චජිත්‍වාන**'' යනු නික්මීමේ (නෙක්ඛම්ම) අදහසින් වස්තු කාමයන් අත්හැර දමා; එහිදී ක්ලේශ කාමය ද තාවකාලිකව ප්‍රහාණය කිරීම අදහස් වේ. පැවිදිවීම මෙහිදී කාමයන් අත්හැරීම ලෙස දතයුතුයි. ''**පුනරාගඡ්ඡතෙ ඉධ**'' යනු මේ ගෙදරටම නැවත එන්නේ ය. මෙය ගිහිබවට පත්වීම අරමුණු කරගෙන කියයි. ''**තඤ්චාපි**'' යනු යමෙක් පැවිදිව නැවත සිවුරු හැර යැයි ද ඔහු වැනි පුද්ගලයෝ මැරුණු අය හා සමානය. එනිසා මා වැන්නන් ඊට හඬති. කුමක් නිසා ද? ''**පුන ජීවං මනෝ හි සෝ**'' යනු යමෙක් ගිහිබවට පත්වුවත් පසුව ඔහු ජීවත්වේ. නමුත් ගුණයන්ගේ ගිනවීමක්, මැරීයාමෙන් ඔහු මළ පුද්ගලයකුසේ සළකන්නේ ම ය. දැන් එම සාමණේරයන්ට විශේෂයෙන් සංවේග ඉපිදවීමට 'කුකකුලා'' යනාදිය පැවසුවාය. එහි අර්ථ මෙසේය. - ''ගිනිගෙන දැවෙන අර්ථයෙන් ගිහිගෙය **කුක්කුල නිරය** හා සමානය. එනිසා ගිහිබවට යෑම කුක්කුල නිරයට යෑමකි. නුඹට අනුකම්පා කළ මවිසින් නුඹ කුක්කුල නිරයෙන් (ගිහිබවින්) ඔසවා උඩට ගෙන තැබුවෙමි. සානු පුතේ! නුඹ නැවත එයට වැටීමට කැමති වන්නෙහි ද?'' මෙය ඇසු සානු සාමණේරයෝ උපන් සංවේග ඇතිව, විඳසුන් වඩා නොබෝ කලකින්ම රහත් බවට පත්වූහ.

උන්වහන්සේ විසින් සිය චරිතාපදනය මෙසේ දක්වන ලදී.

''මෙම පැහැදුණු ඉඳුරන් ඇති, කෙලෙස් කැලඹිලි නැති, දැනය වළඳන ඒ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දැක පැහැදී; උන්වහන්සේට කළයෙන් දිය ගෙනවුත් දුනිමි. ඒ පින්කමේ විපාක වශයෙන් මම අද පහවූ සැක ඇතිව පිරිසිදු වූයෙමි. නිර්මල වූයෙමි. භවයෙහි උපදිනා කල්හි මට යහපත් විපාක ඇතිවිය. මෙයින් කල්ප අනූහතරකට පෙර යම් ජල දනයක් දුන්නෙමි ද ඒ හේතුවෙන් දුගතියක නූපන්නෙමි. ජල දනයේ විපාකය මෙබඳුය. ඒ මම මෙයින් කල්ප හැට එකකට පෙර, සත් රුවනින් යුතු මහත්

බල ඇති විමල නම් සක්විති රජකෙනෙක් වූයෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත්වූ සානු තෙරණුවෝ, මේ ගාථාව නිසා මාගේ විදර්ශනා ආරම්භය ද අරහත් බවට පත්වීම ද සිදුවීයැයි උදන් ඇණීම් වශයෙන් එම ගාථාවම නැවත දේශනා කළ සේක.

සානු ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.5

''යථාපි භද්‍රෙ ආජඤ්ඤෙ'' යනු ආයුෂ්මත් රමණීය විහාරී තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි ඉපිද බොහෝ පින් රැස්කරගත්හ. මෙයින් කල්ප අනූ එකකට පෙර විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් පසඟ පිහිටුවා වැඳී, හෙතෙම කෝරණ්ඩ මලින් පූජා කළේය. ඒ පින්කමෙන් දෙවිලොව උපන් ඔහු තව තවත් භවයන් හි දී පින්දහම් රැස්කර කාම සුගති ලෝකයන්හිම සැරිසරා; මේ බුද්ධෝත්පාද කාලයේ රජගහනුවර එක්තරා සිටු පුතෙක් ව ඉපදුණේය. ඔහු යෞවන මදයෙන් කාමයන් හි මුළාවට පැමිණ එහි ගැලී වාසය කරයි. ඔහු එක්දිනක් එක්තරා පර අඹුවක් කරා යන්නෙකු රාජ පුරුෂයන් විසින් අල්ලා විවිධාකාර දඬුවම් දෙනු දැක; සංවේග උපදවා ශාස්තෘන් වහන්සේ කරා අවුත් ධර්මශ්‍රවණය කොට සසුනේ පැවිදි වූයේය. පැවිදි වුවත් ඔහු ස්වභාවයෙන්ම රාග චරිතයකු බැවින් පිරිවෙණ මැනවින් අතුපතුගෑමෙහි ද පානය කරන හා පරිහරණය කරන පැන් මැනවින් ගෙනැවිත් තැබීමෙහි ද ඇඳපුටු මැනවින් පැනවීමෙහි ද නියැලී වාසය කරයි. මෙනිසා උන්වහන්සේ, ''රමණීය විහාරී'' නාමයෙන් ප්‍රකට වූහ. උන්වහන්සේ දිනක් රාගය උත්සන්න වී නුවණින් මෙනෙහි නොකිරීම නිසා දැන දැන ශුක්‍ර මෝචනය කිරීමේ ඇවතට පත්ව ''මා හට නින්දවේවා! මෙසේ දයක කාරකාදීහු ශ්‍රද්ධාවෙන් දුන් දෙය වළඳ මෙසේ කළ මා හට නින්ද වේවා'' යි විපිළිසර වූසේක්; ''ගිහිබවට පත්වන්නෙමි'' යි සිතා ගෙන විහාරයෙන් පිටව ගොස් අතර මග එක් ගසක් මුල හුන්හ. ඒ මාර්ගයෙන් යන කරත්ත පේළියක යෙදූ එක් ගොනෙකු වෙහෙසට පත්ව, විෂම තැනකදී පය පැකිලී

වැටුනේය. ඒ ගැල් කරුවෝ එම ගොනා ගැලෙන් මුදවා තණ දිය ආදිය දී වෙහෙස දුරු වූ පසු නැවතත් ගැලෙහි යොදූ පිටත්ව ගියහ. මෙය දුටු තෙරුන් වහන්සේ, ''මේ ගොනා වරක් පැකිලී වැටී නැවත නැගිට සිය ගැල ඇදගෙන ගියේය. එලෙසින්ම මම ද වරක් කෙලෙස් වසඟ වීම නිසා පැවිදි භාවයෙන් වැටුනෙමි. නැවත ඉන් නැගිට මහණදම් පිරීම කළ යුතුයැ''යි නුවණින් මෙනෙහි කර, නැවත හැරී විහාරස්ථානයට අවුත් උපාලි මහරහතන් වහන්සේට තමාගේ වැරැද්ද පැවසූහ. උපාලි මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි නැවත ආපත්තියෙන් නැගී සිට, පිරිසිදු වූ ශීලයෙහි පිහිටි රමණීය විහාරී තෙරණුවෝ විදර්ශනාව වඩා නොබෝ කලකින් ම සියළු කෙලස් නසා අර්හත් ඵලයෙහි පිහිටියහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''සක් ලකුණින් බබලන, තැබූ ශ්‍රී පාද සටහන් දුටු මම ඒ විපස්සි බුදුරජානන් වහන්සේගේ පිය සටහන් අනුව ගියෙමි. පිපුණු කොරණ්ඩ ගසක් දුටු මම මුල සිට මැනවින් පිපුණාවූ එම ගසේ මල් රාශිය සතුටු සිතින් බුදුරදුන්ට පූජා කොට උතුම් වූ පා වැන්දෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් පුෂ්ප පූජාවක් මවිසින් කරන ලද්දෙමි ද එතැන් සිට මම දුගතියක නූපන්නෙමි. පියවර සටහන් පිදීමෙහි විපාකය මෙබඳුය. ඒ මම මෙයින් කල්ප පනස් හතකට පෙර සත්රුවනින් හෙබි මහත් බල ඇති විතමල නම් සක්විති රජව උපන්නෙමි. දැන් මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි''

රහත් බවට පත්වූ රමණීය විහාරී තෙරුන්, විමුක්ති සුව විඳිමින් තමාගේ පෙර ජීවිතය සිහිපත් කර ඒ සමගම ආර්යධර්මාවබෝධය ලැබූ බවද පෙන්නුම් කිරීම් වශයෙන් ''**යථාපි භද්දෙ ආජඤ්ඤා බලිඤා පනි තිඨතී**'' යන ගාථාව දේශනා කළසේක.

එහි ''**බලිඤා**'' යනු පය පැකිලී ''**පනිතිඨතී**'' යනු පිහිටයි. නැගිටියි. නැවත මුලින් සිටියේම සිටියි. ''**එවං**'' යනු එසේ'' යම්සේ හදුවූ (සොඳුරු වූ) ආජානීය වෘෂභයා බර උසුලනුයේ වෙහෙසට පත් ව විෂම ස්ථානයට පැමිණ එක්වරක් පය පැකිලී වැටී, එපමණ කින් සිය බර ඉසිලීම අත් නොහරින්නේ ද, උත්සහ වීර්ය වඩා පරාක්‍රමයෙන් යුතුව පය පැකිලී වැටුනත් නැවත නැගී සිටින්නේද, නැවත තමාගේ ස්වභාවයෙහි පිහිටා ම බර උසුලන්නේ ද; එලෙසින් ම කෙලෙසුන්ගෙන් විඩාවට, පීඩාවට

පත්වූ මම අපරාධ ක්‍රියාවකින් පය පැකිලී වැටී, නැවත උත්සාහ වීර්ය වඩා ඉන් නැගිට වරදට පිළියම් කර පිරිසිදු වූයෙමි මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් දර්ශන සම්පන්න වූයෙමි; එමෙන්ම සම්මා සම්බුදුරජානන් වහන්සේගේ ඉගැන්වීම් අනුව ක්‍රියා කොට ආර්ය ජාතියෙහි උපන්නෙමි උන්වහන්සේ ශ්‍රාවකයෙක් වෙමි. උන්වහන්සේගේ උරයෙහි දැරීමට සුදුසු බැවින්, උන්වහන්සේ විසින් මා බිහකළ බැවින් ඖරස පුත්‍ර වූ ඒ මම සොඳුරු අජානීය වෘෂභයාට සමාන වූ කටයුතු ඇති බැවින් ආජානෙය්‍ය පුරුෂයෙක් වශයෙන් මා දරවු සලකවු'' යන අර්ථයයි.

රමණීය විහාරී ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.6

''සද්ධායාහං පබ්බජිතෝ'' යනු ආයුෂ්මත් සමිද්ධි තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නොයෙකුත් පින්දහම් රැස් කරගත්හ. මෙයින් කල්ප අනූ හතරකට පෙර පහළ වූ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිත් ඇතිව මුදුන් සිටින සේ බැඳි නැටි සහිත මල් මිටි පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් ලොව ඉපිද තව තවත් පින්දහම් සිදුකර, කාම සුගතීන්හිම ඉපිදෙමින් සිට අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි දී රජගහනුවර සිටු ගෙයක උපන්නේය. ඔහු උපන් දිනයේ පටන් ඒ ගෙදර ධන ධාන්‍ය වර්ධනය විය. ඔහුගේ ශරීරය ද ඉතා සිත්කලු දර්ශනීය වුවක් විය. ගුණවත් කම ද එසේම විය. මෙසේ සම්පත් සමෘද්ධියෙන් ද ගුණ සමෘද්ධියෙන් යුතු වූ බැවින් ''සමිද්ධි'' නමින් ඔහු ප්‍රකට විය.

එ කුමරු බිම්බිසාර රජ සමාගමයේ දී බුදුරදුන්ගේ අනුභාවය දැක, ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදිවිය. භාවනාවෙහි ම නියැලී මහණදම් පිරීමෙහි උත්සාහවත් වූ උන් වහන්සේ., භාග්‍යවතුන් වහන්සේ තපොදරාමයේ වැඩ වසන කල්හි එක් දිනක් මෙසේ සිතූහ. ''ඒකාන්තයෙන් ම මට ශාස්තෘෘ වූ අර්හත් සම්මා සම්බුදුරජානන් වහන්සේ දැකීමට ලැබීම උතුම් වූ ලාභයකි. මම ස්වාක්ඛාත වූ (මැනවින් දෙසූ) ධම් විනයෙහි පැවිදි භාවය ද ලැබුවෙමි. මාගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලා ද සීලවන්තයෝය,

කලණ මිතුරෝය ''යනුවෙන් සිතත් ම උත්වහන්සේට මහත් වූ ප්‍රීතියක් ඇතිවිය. මෙසේ සතුටුවීම නො ඉවසන්නා වූ පාපී මාරයා තෙරුන් සමීපයෙහි සිට මහත් වූ බිය ජනක ශබ්දයක් කළේය. පොළව පැළෙන්නාක් මෙන් විය. තෙරුණුවෝ මේ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ, ''මරයා නුඹගේ ඇස් අන්ධකිරීමට සිතයි. යව මහණ!, ඒ පිළිබඳව නොසිතා එහිම වාසය කරන්න'' යි වදළසේක, තෙරුණුවෝ එහි ගොස් අප්‍රමාදීව වාසය කරනුයේ නොබෝ කලකින් ම විදසුන් වඩා රහත්ඵලයෙහි පිහිටියහ. උත්වහන්සේ විසින් සිය චරිතාපදනය මෙසේ දක්වන ලදී.

''කිණිහිරි රුකක් මෙන් බබලමින් පර්වතයන් අතරෙහි වැඩසිටි, සියලු දිශා ආලෝක කරන්නා වූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. එකල් හි මම මනාව දුනු හී යොද නටුව සහිත මලක් කඩාගෙන, ඉන් බුදුරදුන් පිදුවෙමි. මෙයින් කල්ප අනූ හතරකට කලින් යම් පුෂ්ප පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මම දුගතියක නුපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මීට කල්ප පනස් එකකට පෙර සත් රුවනින් හෙබි ඉතා බලවත් සක්විති රජෙකුව ජුතිඤර නමින් වැජඹුනෙමි. දැන් මවිසින් සියලු කෙලෙස් දවන ලදී - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත්බවට පත් ව එම ස්ථානයෙහි ම වැඩ වසන තෙරුන් වහන්සේගේ **ක්ෂීණශ්‍රව** බව නොමදත් මාරයා නැවතත් පැමිණ පෙර මෙන් ම බියජනක ශබ්දයක් කළේය. එය ඇසූ තෙරුන් වහන්සේ බිය නොවුසේක. තැතිගැනීම් නැතිසේක්, ''නුඹවැනි මාරයන් සීයක්, දහක් පැමිණියත් මාගේ එක ලෝමයක් වත් කම්පා නොවේ'' යැයි සිය රහත්බව ප්‍රකාශකරන සෙක්, ''**සද්ධායාහං පබ්බජිතෝ**'' යන ගාථාව වදළහ.

එහි ''සද්ධාය'' යනු දහම් ඇසීමේ කැමැත්තෙන් හටගත් කර්මඵල ඇදහීම පිළිබඳ ශ්‍රද්ධාවෙන් මෙන්ම රත්නත්‍රය පිළිබඳ ව වූ ශ්‍රද්ධාවෙන් ද යුක්තව ''**අහං**'' යනුවෙන් තමා දක්වයි. අදහස් කරයි. ''**පබ්බජිතෝ**'' යනු පැවිදි වූයෙමි. ''**අගාරස්මා**'' යනු ගෙයින් නික්ම, ගෘහවාසයෙන් වෙන් ව, ''**අනගාරියං**'' යනු පැවිද්දයි. කෘෂිකර්ම - වෙළඳම් ආදී කටයුතු ගිහිගේ වූ වහුට යෝග්‍ය බැවින් ''අගාරිය'' නම් වේ. එම කටයුතු නොමැති බැවින් පැවිද්ද ''අනගාරිය'' නම් වේ. ''**සති පඤ්ඤාච මෙ වුද්ධා**'' යනු පිහිට වීම ලක්‍ෂණ කර ඇති සිහියයි. දැනගැනීම ලක්‍ෂණ කර ඇති ප්‍රඥාවයි. මේ ධර්

දෙක විඳසුන් ලක්ෂණ මෙනෙහි කිරීමේ සිට මාර්ග ප්‍රත්තියෙහි පිහිටි මවිසින් රහත්වීම දක්වා වඩන ලදී. වර්ධනය කරන ලදී. දැන් එහි වැඩිය යුත්තක් නැත. මෙයින් සතියේ හා ප්‍රඥාවේ විපුලත්වය, ඉතා මහත් බව දක්වයි ''චිත්තඤ්ච සුසමාහිතං'' යනු අෂ්ට සමාපත්ති උපදවා ගැනීම් වශයෙන් ද නව ලෝකෝත්තර ධර්ම වශයෙන් ද මගේ සිත වහා සමාධිගත වේ. දැන් එහි සන්සිදවීමක් නොමැත. සමාධියේ විපුලබව මෙහිදී දක්වා ඇත. එනිසා ''කාමං කරසු රූපානි'' යනුවෙන් පව්වු මාරය ! මා සඳහා යම් කිසි විප්‍රකාර රූපාදියක් මවන්නේ නම් එය කැමති සේ සිදුකරන්න. එම රූප හා ශබ්ද මා හට කිසිදු පීඩාවක් නො කරන්නේ ය. මගේ සිරුර සෙලවීමක්වත් කළ නොහැකි වන්නේ ය. සිත අන් අතකට පෙරළීමක් කෙසේ සිදුවේ ද ? එනිසා නුඹගේ ක්‍රියාවන් බාරනොගත් තුටු පඬුරක් මෙන් කිසිදු අර්ථයක් ඉටුනොකරයි. හුදෙක් නුඹගේ සිත වෙහෙසීම පමණක් සිදුවේ. යනුවෙන් පවසා තෙරුන් වහන්සේ මාරයාට තර්ජන කළහ. එය ඇසූ මාරයා, ''ශ්‍රමණයා මා පිළිබඳව දැනගත්තේ යැ'' යි එහිම අතුරුදහන් විය.

සම්ද්ධි ථේරගාථා අර්ථ විවරණනාව නිමියේය.

1.5.7

''නමෝ තෙ බුද්ධවීරත්ථු'' යනු ආයුෂ්මත් උජ්ජය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවී ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු ඉදිරියේ දී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී පින්දහම් රැස් කරගත්හ. මෙයින් කල්ප අනූදෙකකට පෙර පහළ වූ තිස්ස භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු ඔහු කිණිහිරි මල් වලින් උන්වහන්සේට පූජාකළේය. ඒ පින්කමේ මහිමයෙන් දෙව්ලොව ඉපිද සැපවිඳ, හෙතෙම ඒ ඒ භවයන් හි දී තවත් පින්දහම් සිදුකර දෙව් මිනිස්සු දෙගතියෙහි ම සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවර එක්තරා සොත්තිය බ්‍රාහ්මණයකුගේ පුතු ලෙස උපන්නේය. ඔහු උජ්ජය නමින් ප්‍රකට විය. වැඩිවියට පැමිණ ත්‍රිවේද පාරගත වූ උජ්ජය, එහි සාරයක් හෙවත් හරයක් නොදැක උපනිශ්‍රය සම්පත්තියෙන් මෙහෙයවනු ලබන්නේ වේළුවනාරාමයට ගොස් ශාසතෘන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළේය. එය අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි වූ උජ්ජය, සිය චරිතයට යෝග්‍ය කමටහන් රැගෙන අරණ්‍යයට පිවිස එහි වාසය කරමින් විඳසුන් වඩා නොබෝ කලකින් ම රහත්ඵලයෙහි පිහිටියේ ය.

උජ්ජය තෙරණුවෝ සිය චරිතාපදානය මෙසේ දක්වුහ.

''තාදී ගුණ ඇති සතර ඕසයන් තරණය කළ තිස්ස බුදුරජාණන් වහන්සේ දැක පැහැදුණු සිත් ඇති මම, කිනිහිරි මලක් පි පී තිබෙනු දැක එය නෙලා පුජා කළෙමි. මෙයින් කල්ප අනූ දෙකකට පෙර යම් මල් පුජාවක් කළෙමි ද එතැන් සිට මම දුගතියක නූපන්නෙමි. මේ බුද්ධ පූජාවේ විපාකයයි. මෙයින් කල්ප තිස් පහකට පෙර අරුණබල නමින් ප්‍රකට වූ සත් රුවනින් හෙබි මහ බලවන්ත සක්විති රජෙකු වූයෙමි. දැන් මවිසින් සියලු කෙලෙස් දවන ලදී - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත්බවට පැමිණි උජ්ජය තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ, උන්වහන්සේට වැද එකත් පස්ව සිටියහ. පසුව භාග්‍යවතුන් වහන්සේට ස්තුති කරමින් තමන් වහන්සේගේ ක්ෂීණාශ්‍රව භාවය ප්‍රකාශ කරමින් ''නමෝ තෙ බුද්ධ වීරත්ථු'' යන ගාථාව වදළහ.

එහි ''**නමෝ**'' යනු ප්‍රණාමය දක්වීමයි. ''**තෙ**'' යනු ප්‍රණාමය, නමස්කාරය ලබන්නා දක්වයි. නුඹ වහන්සේට යන අර්ථයයි. ''**බුද්ධවීර**'' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට ආමන්ත්‍රණය කරයි. භාග්‍යවතුන් වහන්සේ අභිඤ්ඤෘය්‍යාදී භේද ඇති චතුරාර්ය සත්‍ය විෂයෙහි විශිෂ්ට සේ දැනීම් වශයෙන් තමන් වහන්සේ ම ලොව දත යුතු සියල්ල ඉතිරි නොකර අවබෝධ කරගත් බැවින් 'බුද්ධ' නම් වෙති. එසේ ම පස් මරුන් පරද ජයගැනීම් වශයෙන් මහත් වූ වීර්යයෙන් යුක්ත වූ බැවින් ''වීරො'' (වීරයා) යනුවෙන් ද උන්වහන්සේට භාවිතා කෙරේ. ''**අත්ථු**'' යනු වේවා. ඔබවහන්සේට නමස්කාර වේවා ! යනුවෙන් සම්බන්ධ කරගත යුතුයි. ''**විසමූ තෙතා සි සබ්බධි**'' යනු සියලුම කෙලෙස්වලින් ද සියලු සංස්කාරයන් ගෙන් ද මිදුණු බැවින්, වෙන් වූ බැවින්, නුඹ වහන්සේට කිසිදු නොමිදුණු කෙලෙස් ධර්මයක් නම් නැත. යම්හෙයකින් මම ''**තුය්‍හාපදනෙ විහරං විහරාමි අනාසවො**'' යනුවෙන් ඔබ වහන්සේගේ ප්‍රතිපත්ති චාර්යාවෙහි, අවවාදයෙහි, ගිය මාර්ගයෙහි පිළිවෙත් පිරීමෙන් වාසය කරමි. මම ශක්ති පමණින්, බල පමණින් පිළිපදිනුයෙම් කාමාශ්‍රවාදී සතර වැදැරුම් ආශ්‍රවයන් මනාව ප්‍රහීණ කර අනාශ්‍රවයෙක් ව වාසය කරමි. එබදු වූ බුද්ධවීරයාණනි ! නුඹ වහන්සේට නමස්කාර වේවා!

උජ්ජය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.8

''යතො අහං'' යනු ආයුෂ්මත් සඤ්ජය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී සසරින් මිදීම සඳහා පින් රැස්කරගෙන විපස්සි භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි මනුෂ්‍යයෙක් ව උපන්හ. මහත් පිරිසක් ඇතිව සිටි ඔහු, තම කීර්තියෙන් වස්තුව රැස්කර, තෙරුවන් උදෙසා පින් කරනුයේ තමා දිළිඳු වී ජන සමූහයාට සංග්‍රහ කරමින් පින් කිරීමෙහි ම නිරත විය. කලින් කලට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පැහැදුණු සිතින් උන්වහන්සේට ද භික්ෂූන් වහන්සේලාට ද ඒ ඒ වතාවත් ආදිය ද කළේය. ඔහු ඒ පින්කමේ බලයෙන් දෙව්ලොව උපන්නේ ය. පසුව තව තවත් පින්දහම් රැස්කරගෙන සුගතියෙහි ම සැරිසරා, අප තථාගතයන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි රජගහ නුවර මහත් සම්පත් ඇති බමුණකුගේ පුතු ව ඉපිද ''සඤ්ජය'' නමින් ප්‍රකට විය.

වැඩිවියට පත් වූ ඔහු බ්‍රහ්මායු, පොක්ඛරසාති ආදී ඉතා ප්‍රසිද්ධ බමුණු පඩිවරු පවා බුදුසසුනෙහි අතිශයින් පැහැදෙනු දැක, හටගත් ප්‍රසාදයෙන් ශාස්තෘන් වහන්සේ වෙත එළඹුණේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසු සේක. ධර්මශ්‍රවණය කළ ඔහු සෝවාන් ඵලයෙහි පිහිටා පසුකලෙක පැවිදි විය. පැවිදි වන විට හිසකෙස් බාද්දීම ඟඩ අභිඥාලාභී විය.

සඤ්ජය තෙරණුවෝ සිය චරිතාපදනය මෙසේ දක්වා ඇත.

''විපස්සි බුදුරජාණන් වහන්සේට භක්තිමත් මහාප්‍රාඥ සමූහයක් විය. එකල්හි මම සියලු කටයුතුවල යෙදුණු වතාවත් කරන්නෙක් වීමි. මහර්ෂී වූ බුදුරදුන්ට පිදීමට දෙයක් මා වෙත නොතිබුණි. පිරිසිදු සිතින් මම බුදුසිරිපා වැන්දෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර බුදුරදුන්ට වතාවත් කළෙමි ද එතැන් සිට දුගතියක නූපන්නෙමි. වතාවත් කිරීමේ ප්‍රතිඵලය මෙබඳුය. මෙයින් කල්ප අටකට පෙර සත්රුවනින් හෙබි මහ බල ඇති සුචින්තික නම් සක් විති රජව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' උන්වහන්සේ ඟඩ අභිඥා උපදවා ගෙන තම ක්ෂීණාශ්‍රව භාවය ප්‍රකාශ කරන්සේක, ''යතො අහං පබ්බජිතො'' යන ගාථාව දේශනා කළහ.

එහි ''යතො අහං පබ්බජිතො'' යනු මේ තැනක සිට, යම් තැනක පටන් මම පැවිදි වූ යෙමි ද, ඒ පැවිදි වූ දින සිට ''නාභිජානාමි සඞ්කප්පං අනරියං දොසසංහිතං'' යනු රාගාදී දෝෂයන්ගෙන් යුක්ත වූවක්, එසේ ම අනාර්ය - නීහීන වූ දෙයක්, ආර්යාදී උතුමන් විසින් නොකරන බැවින් ද අනාර්යයන් විසින් ම සිදුකරන බැවින් ද අනාර්ය වූ පාපී වූ අරමුණෙහි අසත්‍ය ගුණ සංකල්ප සිහිකිරීමක් වශයෙන් ''සංකල්ප'' නම් වූ කාම විතර්ක, මිත්‍යා විතර්ක ආදියක් සිතීමක් නොළෙමි. කෙස් බාද්දීම මම රහත්බවට පත්වූයෙමි'' යන අර්ථයයි. මෙසේ සිය රහත්භාවය ප්‍රකට කළසේක.

සඤ්ජය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.9

''**විහවිභාහිනදිතෙ**'' යනු ආයුෂ්මත් රාමණෙය්‍ය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? රාමණෙය්‍ය තෙරුණුවෝ ද පෙර බුදුවරු හමුවෙහි දී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී නොයෙකුත් පින්දහම් රැස්කරගත්හ. සිබි නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද, වැඩිවියට පැමිණ භාග්‍යවතුන් වහන්සේ දැක සිත පහදවා ගත් හෙතෙම සුවද මලින් බුදුන් පිදුවේය. ඒ පින්කමින් ඔහු දිව්‍යාත්මභාවයක් ලැබීය. සසර සැරිසරමින් තව තවත් පින්දහම් සිදුකරගත් ඔහු කාම සුගතීන් හිම සැප විඳ, අප තථාගතයන් වහන්සේගේ කාලයෙහි සමෘද්ධිමත් පවුලක ඉපදුණේය. වැඩිවියට පත්ව ජේතවනාරාමය පූජාකරන අවස්ථාව දැක හටගත් ශ්‍රද්ධාවෙන් පැවිදිවිය. චරිතානුකූල කමටහන් ගත් උන්වහන්සේ අරණ්‍යයෙහිම විසූහ. එසේ අරණෙහිම වසන උන්වහන්සේ තම ශරීර සම්පත්තිය නිසා ද පැවිද්දට යෝග්‍ය සේ පිළිවෙත් සපුරන බැවින් ද ප්‍රසාද එළවන බැවින් ද ''රාමණෙය්‍ය'' නමින් '' ප්‍රකට වූහ.

එක් දිනක් මාරයා එම තෙරණුවන්ට හිංසා කරනු කැමතිව මහත් බිය ජනක ශබ්දයක් කළේය. එය ඇසූ තෙරුන් වහන්සේ ප්‍රකෘතියෙන් ම ස්ථීර අදහස් ඇති බැවින්, ඊට තැතිගැනීම් නැති වූසේක්, ''මේ මාරයා'' යැයි දැන, මෙකරුණෙහි සිය අප්‍රසාදය පළකරමින් ''**විහවිභාහිනදිතෙ**'' යන ගාථාව දෙසූ සේක.

එහි ''විහවිහාහිනදිතෙ'' යන්නෙහි ''විහවිහා'' යනු නිතර ශබ්ද පවත්වන බැවින් විහවිහ යනු නම ලද ''වටුවන්ගේ නාදය නිමිති කරගෙන, මහත් වූ සෝභාව හේතුවෙන්'' යන අර්ථය යි. ''**සිප්පකාභිරුතෙ හි ච**'' යන්නෙහි ''සිප්පිකා'' යනු දේවකාපර නැමති ගිලන් බවින් පෙළෙන බඩගිනි වූ දරුවන් සහිතව හඬන සාමුවෝය. හුනහපුළුවෝය. ඇතැම් හු දඬුලෙහෙනුන් මෙහිදී අදහස් වන බව කියයි. එම හුනහපුළුවන්ගේ ඉතා බියජනක නාදයෙන්. මෙහි හේතු අර්ථයේ තතියාව යොදී ඇත. ''ඒ හේතුවෙන් ඒ ශබ්ද නිසා'' යන අර්ථයයි. ''**න මෙ තං එදැනි චිත්තං**'' යනු මගේ සිත නොසැලේ, නොසෙලවේ. මෙහි අදහස මෙසේ දතයුතුයි. - ''මේ අරණ්‍යයෙහි වටුවන්ගේ හා හුණහපුළුවන්ගේ මහා නාද වශයෙන්, පාපී මාරය ! නුඹගේ මේ විප්‍රකාර හේතුවෙන් මගේ සිත කමටහනින් පහ නොවේ, නොවැවේ. ඊට හේතු මෙසේ දක්වයි. ''**එකත්ත නිරතං හි මෙ**'' යන්නෙහි ''හි'' ශබ්දය හේතු අර්ථයේ යෙදේ. යම්හෙයකින් මගේ සිත සමූහවාසය හැරදමා හුදකලාව තනිව සිටීමට කැමති ද නැතහොත් බාහිර අරමුණු කරා නොයමින් එක අරමුණක, එකඟභාවයෙහි පවතින්නේ ද නැතිනම් නිවණෙහිම දැඩිව ඇලී සිටින්නේ ද එනිසා මාගේ සිත කමටහනින් පහ නොවේ, නො සෙලවේ, මේ ගාථාව ප්‍රකාශ කරමින් ම රාමණෙය්‍යක තෙරණුවෝ, විදසුන් වඩා රහත් බවට පත්වූහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වා ඇත.

''හිරුමෙන් ප්‍රතාපවත් වූ රන්වන් පැහැයෙන් බබලන මෙත් සිත් ඇති සිබි නම් භාග්‍යවතුන් වහන්සේ සක්මනට නැගුණුසේක. එදින මම පහන් වූ සිත් ඇතිව, සතුටින් ශ්‍රේෂ්ඨඥාන ඇති බුදුරජාණන් වහන්සේට වැඳ මීතේලි මලින් උන්වහන්සේ පූජාකළෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද එතැන් පටන් මම දුගතියක නුපන්නෙමි. බුද්ධ පූජාවෙහි විපාකය මෙබඳුය. මෙයින් කල්ප තිස් එකකට පෙර සත් රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති ''සුමෙධ යස'' නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් නැසුවෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රාමණෙය්‍ය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.5.10

"ධරණී ච සිඤ්චති වානි" යනු ආයුෂ්මත් විමල තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන් හි දී සසරින් මිදීම සඳහා තව තවත් කුසල් රැස් කළහ. විපස්සි භාග්‍යවතුන් වහන්සේ දවස සක් පිඹින පවුලක ඉපිද වැඩිවියට පත්වූයේ එම ශිල්පයෙහි නිෂ්පත්තියට ගිය ඔහු, දිනක් විපස්සි භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දුක පැහැදුණු සිතින් සක්පිඹ උන්වහන්සේට පූජා කොට, එතැන පටන් කලින් කලට ශාස්තෘන් වහන්සේට උපස්ථාන කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් ලොව උපන් ඔහු, ඒ ඒ භවයන්හි දී තව තවත් පින් රැස්කර කාම සුගතීන්හිම හැසිර, කස්සප භාග්‍යවතුන් වහන්සේ දවස "අනාගතයේ දී මා හට නිර්මල පිරිසිදු ශරීරයක් ලැබේවා !" යි පතා බෝධිවෘක්ෂය සුවඳ පැනින් නැහැවීය. සැමළුවේ ද බෝ මළුවේ ද වූ මල් අසුන් ආදිය සේදවීය. භික්ෂූන් වහන්සේලා සතුව තිබූ කිලිටි ශ්‍රමණ පිරිකර ආදිය ද සේදවීය. එසේ පින්කම් කළ ඔහු ඉන් චුතව දෙව් මිනිසුන් අතර සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහ නුවර සමෘද්ධිමත් පවුලක උපන්නේය. මවුකුස වාසය කාළාවූ ද ඉන් නික්මුණා වූ ද ඔහුගේ ශරීරය පිත්, සෙම් ආදියෙන් කිලිටි නොවී, පියුම් පතෙහි ලූ දියමෙන් කිසිදු අපවිත්‍ර දව්‍යයක් සිරුරෙහි නොතැවරී පශ්චිම භවික බෝසත් ශරීරයක් මෙන් ඉතා පිරිසිදු වූයේ විය. එනිසා එකුමරුට "විමල"යන නාමය තබන ලදී.

වැඩිවියට පත් විමල කුමරු රජගහ නුවරට ප්‍රථමයෙන් පිවිසි බුදුරජාණන් වහන්සේගේ අනුභාවය දැක, ලබන ලද ශ්‍රද්ධාවෙන් සතර මහා දිවයිනට ම වැටෙන මහා වර්ෂාවක්, මුලු සක්වල ගැබ පතුරවා වැස්සේය. නැවත හටගන්නා විටවිට කල්පයේ දී බුදුවරු ද සක්විති රජවරු ද වැඩ සිටින කාලයෙහි ම මෙබඳු වර්ෂා ඇතිවේ. ශරීරයේ සියළු දහයත් සන්සිඳී ඍතුලාභය නිසා තෙරුන්ගේ සිත සන්සුන් විය, එකඟ විය, සමාධිගත සිත් ඇති උන්වහන්සේ එකෙණෙහි ම විදසුන් වඩා මාර්ගඵල පිළිවෙලින් ලැබ උතුම් වූ අර්හත් ඵලයෙහි පිහිටිසේක. උන්වහන්සේ විසින් සිය චරිතාපදනය මෙසේ දක්වන ලදී. "ඒ විපස්සී බුදුරජාණන් වහන්සේ වැඩසිටි සමයෙහි මම සක් පිඹින්නෙක් වීමි මහර්ෂී වූ සුගතයන් වහන්සේට නිතර ම සක්පිඹිමින් මම උවටැන් කළෙමි. තාදිගුණ ඇති ලෝක නාථයන් වහන්සේට උවටැන් කිරීමෙහි විපාකය දකිත්වා. හැම කල්හි ම සැට දහස් තූර්ය නාදයෝ මා පිරිවරාගෙන සිටිති. මෙයින් කල්ප

තිස් හතරකට පෙර මහත් බල ඇති මහා නිග්ඝෝස නම් වූ සක්විති රජවරු 16 දෙනෙක්ව මම උපන්නෙමි. දැන් මව්සින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ -බුදුරදුන්ගේ අනුශාසනාව මනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ කොට නිම වූ කටයුතු ඇති සතුටු සිතින් යුක්ත වූ විමල තෙරණුවෝ ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කරමින් (උදන් අනමින්) ''ධරණී ච සිඤ්ඣති වාති මාලුතො'' යන ගාථාව දේශනා කළහ.

එහි ''ධරණී'' යනු පොළවයි. පොළව සියලුම ජල දහරා ධරන බැවින් ''ධරණී'' නම් වේ ''**සිඤ්ඣති**'' යනු හාත්පස අහස පුරවාගෙන වැසි වසී. මහා මේඝයෙන් වැටුණු දියදහරා වලින් පොළව තෙමේ. තෙත් වේ ''වාති මාලුතො'' යනු දිය හා මිශ්‍ර වූ සීතල සුලං හමයි ''**විජ්ඣතා චරති** නභෙ'' යනු ඒ ඒ තැන ගර්ජනා කරමින් ගඩ ගඩ ශබ්ද නගමින් මහ වැසි වසින බැවින් නික්මෙන විදුලි දහරාවෝ අහසෙහි ඔබිනොබ හැසිරෙති. ''උපසමනති විතක්කා'' යනු යෝග්‍ය වූ සෘතු ලැබීමෙන් සමථ විපස්සනාවන්ගෙන් අවබෝධ වූ පුඵිභාගයේ කෙලෙස් තදංග (තාවකාලික) වශයෙන් සංසිඳුණේ විය. කාම විතර්කා දී සියලුම මහා විතර්කයෝ ආර්යමාර්ග අධිගමනයෙන් සංසිඳෙති. ඉතිරි නොකර සකල ක්ලේශයන් මුලිනුපුටා දමන ලදී. සමීපයෙහි පවතින්නා වූ ආර්යමාර්ග ක්ෂණය වර්තමාන කොට දක්වයි. අතීත අර්ථයෙහි මෙතැන දී වර්තමාන වචනයක් යෙදී ඇත. ''(උපසමනති'' යනුවෙන්) ''චිත්තඤ්ඣ සුසමාහිතං මම '' යනු එසේම ලෝකෝත්තර චිත්ත සමාධියෙන් මා සිත මැනවින් සමාධිගත වේ. දැන් එය සමාධිගත කිරීමට කිසිවක් කළ යුතු නොවේ. කළ යුතු සියල්ල කර නිම වූ බැවිණි. මෙලෙස තෙරණුවෝ රහත් බව ප්‍රකාශ කළහ.

විමල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

පස්වන වග්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.6.1

''**වස්සති** දෙවො'' යනාදී ගාථා සතර ගෝධික, සුබාහු, වල්ලිය හා උත්තිය යන මේ සතර තෙරවරුන්ගේ ගාථාවෝ ය. ඒවායේ උපත කෙසේ සිදුවී ද ? මොවුහු සිව් තෙරවරු ම පුවි බුදුවරු හමුවෙහි දී කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයෙහි දී අපමණ පුණ්‍යසම්පත්තීන් රැස්කරගෙන, මෙයින් කල්ප අනූ හතරකට පෙර සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සිටුගෙවල්වල උපන්හ. වියපත් ඒ සතර දෙන ඔවුනොවුන් යහළු මිත්‍ර ව එකට හැසිරුණහ. ඔවුන්ගෙන් එක් අයෙක් සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ පිඬුපිණිස හැසිරෙනු දැක සැන්දක් පුරවා භික්‍ෂාව පිළිගැන්වීය. දෙවැන්නා පහන් සිතින් උන්වහන්සේට පසඟ පිහිටුවා වැන්දේය. වැඳ අදිලිබැඳගෙන සිටියේ ය. තෙවැන්නා පහන් සිතින් එක් මල් මිටකින් භාග්‍යවතුන් වහන්සේ පිදුවේය. සිවුවැන්නා සමන් මලින් බුදුරදුන් පිදුවේය. මෙසේ ඒ සිවු දෙනම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සිත පහදවා රැස් කරගත් ඒ පුණ්‍යරාශියේ විපාක වශයෙන් දෙව් ලොව උපන්හ. පසුව ඒ ඒ භවයන්හි දී තව තවත් පින්දහම් රැස් කරගත් ඔවුහු දෙව් මිනිසුන් අතර සැරි සරා, කාශ්‍යප බුදුරදුන්ගේ කාලයෙහි සිටු කුලයේ ඉපිද, එක්වම ගොස් පැවිදිව මහණදම් පිරූහ. පසුව අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි මල්ල රජවරු සිවුදෙනෙකුගේ පුතුන් ව ඉපදුණු ඔවුහු, ගෝධික, සුබාහු, වල්ලිය හා උත්තිය නාමයෙන් ප්‍රකට වූ හ. ඔවුනොවුන් දඩිසේ මිත්‍රව විසූ ඒ සතර දෙන කිසියම් කටයුත්තකට කපිලවස්තුවට ගියහ. එ සමයේ ශාස්තෘන් වහන්සේ කපිලවස්තුවට වැඩමවා නිග්‍රෝධාරාමයේ වැඩ වසමින්, යමක මහා ප්‍රාතිහාර්ය දක්වා සුදොවුන් ප්‍රමුඛ ශාක්‍ය රාජ කුල රජදරුවෝ දමනය කළසේක. එ දින මල්ල රජදරුවෝ සතර දෙන එම ප්‍රාතිහාර්ය දැකීමෙන් ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි ව විදසුන් කර්මස්ථාන වඩන්නාහු නොබෝ කලකින් ම සිවුපිළිසිඹියාපත් මහරහත් භාවය ලබාගත්හ.

එම තෙරවරු සිවුදෙන තම චරිතාපදන මෙසේ දැක්වූහ.

''මම රන්වන් වූ ලෝකයාගේ පූජාවන් ලබන්නා වූ පූජාවන්ට ගෙයක් වැනි වූ වන ලැහැබින් නික්මුනු තණ්හාව ක්‍ෂය කර, ප්‍රඥාවෙන් උපශාන්ත වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. තාදී ගුණ ඇති මහාවීර වූ ඒ සිද්ධත්‍ථ බුදුරජාණන් වහන්සේට මම සැන්දක් පමණ භික්‍ෂාව පිදුවෙමි. සුයිට බන්‍ධු වූ බුදුරජාණන් වහන්සේ පියවරින් පියවර ලුහුබැඳ යන

මහජනකාය දහම් වැස්සෙන් නිවන කල් හි මට මහත් වූ ප්‍රීතියක් ඇති විය. මීට කල්ප අනූ හතරකට පෙර යම් දැනයක් පුජා කළෙම් ද මේ දක්වා ම දුගතියෙහි නුපන්නෙමි. භික්ෂාදනයේ විපාකය මෙවැනිය. මෙයින් කල්ප අසූ හතකට පෙර සත්රුවනින් හෙබි මහාරේණු නම් සක්විති රජවරු සත් දෙනෙක්ට උපන්නෙමි. මවිසින් දැන් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මේ ගෝධික ථේර චරිතාපදනයයි.

1.6.2

''රන්වන් වූ ශරීර ඇති උතුම් ආජානීයයකු වැනි ශ්‍රේෂ්ඨ වූ ත්‍රිමද ගලිත මාතංග නම් ඇත් කුලයේ උපන් ශ්‍රේෂ්ඨ ඇත් රජෙකු බඳු වූ මහර්ෂී වූ පුන්සඳ මෙන් සියලු දිශා බබුළුවන ලෝක ජ්‍යෙෂ්ඨ වූ විථියට පිළිපන්නා වූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දුටු මම, ඒ උතුමන් වහන්සේගේ නුවණෙහි සිත පහදවා, ඇදිලි බැඳ සොම්නස් වුයෙම් පහන් සිතින් උන්වහන්සේට පසඟ පිහිටුවා වැන්දෙමි. මෙයින් කල්ප අනුහතරකට පෙර කරන ලද ඒ පින්කමේ බලයෙන් මේ දක්වා මම දුගතියකට නොගියෙමි. බුද්ධ ඥානය වන්දනා කිරීමේ විපාකය එබඳුය. මෙයින් කල්ප සැත්තෑ තුනකට පෙර සත් රුවනින් හෙබි, මහත් බල ඇති නරශ්‍රේෂ්ඨ සක්විති රජවරු දසය දෙනෙක් ව මම උපන්නෙමි. මවිසින් කෙලෙස් දවන ලදී - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.

මේ සුබාහු ථේර චාරිතාපදනයයි.

1.6.3

''එකල්හි මම තිවරා නුවර වෙසෙන මල් කරුවෙක් වුයෙමි. පහවූ කෙලෙස් ඇති ලෝකනායක වූ සිද්ධත්‍ථ බුදුරජාණන් වහන්සේ මහ මඟ වැඩම කරනු දුටු මම. පහන් සිතින්, සතුටු වූ යෙම් උපුල් මල් මිටකින් උන්වහන්සේ පිදුවෙමි. දැන් ඒ මම යහපත් වූ මල්ල රජවරු පිරිවරාගෙන

පෙර තමා කළ පින්කමෙහි ඉෂ්ට විපාක විඳින්නෙමි. මල් පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප අනූහතරකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. මල් පූජවේ මේ විපාකයයි. මෙයින් කල්ප අනූ හතරකට පෙර සිට ම මේ දක්වා මම, නජ්ජුපසම නම් සත්සීයක් රජවරු ලෙස උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මේ වල්ලිය ථේර චරිතාපදනයයි.

1.6.4

''මම සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට සමන් මල් පිදුවෙමි. උන්වහන්සේගේ ශ්‍රී පාදයෙහි මවිසින් මල් සතක් සතුටින් විසුරුවන ලදී. ඒ පින්කමේ බලයෙන් මම අද දෙව් මිනිසුන් අතර අතිශයින් බබලන්නෙමි. සම්බුදුසසුනෙහි දැන් අන්තිම දේහය දරමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. මේ මල් පූජාවේ විපාකයයි. මෙයින් කල්ප පහකට කලින් සමන්තභද්‍ර නාමයෙන් සිවුමහ දිවයින්ට හා සිවුසාගර සහිත පෘථිවියට ම ප්‍රධාන වූ සක්විති රජවරු දහතුන් දෙනෙක්ව උපන්නෙමි. ''දැන් මම සියලු කෙලෙස් දවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

මේ උන්නිය ථේර චරිතාපදනයයි.

රහත්බවට පත් වූ මේ සිවුදෙනා වහන්සේලාම ලොව ප්‍රකට වූහ. ප්‍රසිද්ධ වූහ. රාජරාජ මහාමාත්‍යයන් විසින් සත්කාර කරන ලදහ. ගරු කරන ලදහ. ඒ පුද ලබමින් ඔවුහු වනයේ ම විසූහ. එක් දිනක් බිම්බිසාර රජතුමා ඒ සතර දෙනා වහන්සේ රජගහ නුවරට වැඩම කළ කල්හි, සමීපයට ගොස් වැඳ තුන්මාසයක් රජගහ නුවර වස් වසනු සඳහා ආරාධනා කොට, වෙන් වෙන් වශයෙන් කුටි කරවා දුන් නමුත් සිහි කල්පනා නොමැති වීමෙන් එම කුටි සෙවිලි නොකළේය. තෙරවරු සෙවිළි නොකළ කුටිවල වාසය කළහ. වැසි කාලයේ වැස්ස නොවසී. රජු ''කවර කරුණකින් වැසි නොවසින්නේ ද ?'' යි සිතනුයේ ඒ කරුණ සළකා වහාම එම කුටි

සෙවිළි කරවීය. මැටි කර්මාන්ත, සිතුවම් කර්මාන්ත ආදියෙන් එම කුටි අලංකාර කරවා, මහත් වූ කුටි පූජා කිරීමේ උත්සවයක් පවත්වා, භික්ෂු මහා සංඝරත්නයට මහ දන් පවත්වා කුටි පූජා කළේය. රජුට අනුකම් පාවෙන ඒ කුටිවලට පිවිසි තෙරවරු මෛත්‍රී සමාපත්තියට සමවැදුනහ. මේ අවස්ථාවෙහි නැගෙනහිරින් මහා මේඝයක් (වැහි වලාවක්) නැගී තෙරවරු සමවතින් නැගිටි මොහොතෙහි ම වසින්නට පටන් ගත්තේය. ඒ තෙරවරුන් අතුරින් ගෝධික තෙරණුවෝ සමවතින් නැගිට, මේඝ ගර්ජනාවක් සමග ම මෙම ගාථාව වදළහ.

''වස්සති දෙවෝ යථා සුගීතං
ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා
චිත්තං සුසමාහිතං ච මය්හං
අථ චෙ පත්ථයසි පවස්ස දෙවා'' ති

''සුන්දර ගායනයක් සේ වැසි වහී මගේ කුටිය සෙවිලි කරන ලදී. සුවපහසු එළවන එහි වා කලුළු වසා ඇත. මගේ සිත ද මැනවින් සමාධිගත විය. මේඝය ! කැමති නම් දැන් වසින්න.''

එහි ''**වස්සති**'' යනු වසියි. වැසි දහරා පවත්වයි ''**දෙවෝ**'' යනු මේඝයයි. වැස්සයි. ''**යථා සුගීතං**'' යනු සුන්දර ගීතයක් මෙන් ගර්ජනා කරමින්, ගොරවමින් නදදෙමින් යන අදහසයි. වැස්ස වසින කාලයේ සිය දහස් ගණන් වැසි පටල පායා නද දෙමින් විදුලිය කොටමින් ශෝභමාන වේ. තනිව වැසි නොවසී. එනිසා ''සිනිඳු, මධුර, ගැඹුරු ඝෝෂා පවත්මින්, නාද කරමින් වැසි වසී'' යයි මෙහිදී දක්වේ. එහි ශබ්දයෙන් පීඩාවක් නොවේ. ''**ඡන්නා මෙ කුටිකා සුඛා නිවාතා**'' යනු මෙසේ වැසි ඇතුලට නොවැටේ ද එලෙසින් ම තණපත් ආදියෙන් මාගේ කුටිය සෙවිලි කරන ලදී. එනිසා වැසි වැසීමෙන් පීඩාවක් නොවේ. පරිභෝග සුවය ද ඍතු පහසුව සැලසීමෙන් ඍතු සුවය ද ලැබෙන බැවින් ''සුඛා'', සුවසේ වෙසෙමි. වසන ලද අඟුලු හා වා කවුළු ආදියෙන් යුතු බැවින් සුලඟින් වන උවදුරු වලින් දුරු වී. මේ වදන් දෙකින් ම යෝග්‍ය ආවාසයක් ලැබූ බැවින් පීඩාවක් නොවන බව දක්වයි. **චිත්තං සුසමාහිතං ච මය්හං**'' යනු මාගේ සිත ද වහා සමාධිගත වේ. අනුත්තර වූ සමාධියෙන් නිර්වාණය නම් අරමුණෙහි සිත මනාව පිහිටියේය. මේ ගාථා පදයෙන් අභ්‍යන්තරික උවදුරු නොමැති නිසා අඩු උත්සාහ ඇති බව දක්වයි. ''**අථ චෙ පත්ථයසි**'' යනුවෙන් දැන් නුඹ කැමති නම්, ප්‍රාර්ථනා කරයි නම් ''**පවස්ස**'' යනු

වසින්න. දිය දහරා වගුරුවන්න. වැසි දහරා විසිරුවන්න. ''දෙව'' යනුවෙන් වැහිවලාව අමතයි. සෙසු තෙරවරු තිදෙනා වදාළ ගාථාවන්හි තෙවැනි පදය පමණක් වෙනස් වේ.

ගෝධික ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

එහි සුබාහු තෙරුන් විසින් පැවසූ ගාථාවේ ''**චිත්තං සුසමාහිතඤ්ච කායෙ**'' යනු මගේ සිත, මේ කයෙහි කායගතාසති භාවනාව වැඩීම් වශයෙන් මැනවින් සමාධිගත විය. මැනවින් සිත ඇතුළට පිවිසි සිටී. මේ තෙරණුවෝ කායගතාසති භාවනාව වැඩීමෙන් ලැබූ ධ්‍යනය පාදක කරගෙන ම විදසුන් වඩා රහත් වූහ. එනිසා ''මගේ සිත ද කය පිළිබඳව මැනවින් සමාධිගත විය. යනුවෙන් පවසන ලදී.

සුබාහු ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

වල්ලිය තෙරුන්ගේ ගාථාවේ ''**තඤ්චං විහරාමි අප්පමත්තො**'' යනු එම කුටියෙහි අප්‍රමාද ප්‍රතිපත්තියෙන් අර්හත් ඵලය මස්තක ප්‍රාපත කරගත් බැවින්, අප්‍රමාදීව ආර්ය විහරණයන්ගෙන් යුක්තව, දිව්‍යමය විහරණයන් ගෙන් යුක්තව ඉරියවු පවත්වමින් වෙසෙමි, ශරීරය පවත්වා ගනිමි යන අදහසයි.

වල්ලිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

උත්තිය තෙරුන් විසින් දෙසූ ගාථාවෙහි ''අදුතියො'' යනු තනිවම, යහලුවකු නොමැතිව වෙසෙමි. ''කෙලෙස් සමූහයාගෙන් ද භික්ෂු සමූහයාගෙන් ද වෙන්ව - දුරුව වසමි'' යන අදහසයි.

උත්තිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

මේ සතර තෙරවරුන්ගේ වස්තුව යි.

1.6.5

''අසාඤ්ඩං කුටිකං කත්වා'' යනු ආයුෂ්මත් අඤ්ඤනවනිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සුදස්සන නම් මාලාකාරයෙක් ව දැසමන් මලින් බුදුරජාණන් වහන්සේට පූජා පැවැත්වූහ. සසරේ ඒ ඒ භවයන්හි දී බොහෝ පින්දහම් රැස්කර ගෙන දෙව් - මිනිසුන් අතරෙහිම සැරිසරා, කස්සප භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි පැවිදිව මහණදම් පිරූහ. අනතුරුව මේ බුද්ධෝත්පාද කාලයෙහි විශාලා මහනුවර වජ්ජී රාජකුලයේ ඉපිද වැඩිවියට පැමිණි අවස්ථාවෙහි, විශාලාවේ වැසි නොවසින බැවින් දුර්භික්ෂයක් ද රෝග බියක් ද අමනුස්ස බියක් ද යන ත්‍රිවිධ භයක් ඇතිවිය. ඒ සියලු තොරතුරු රතන සූත්‍ර වර්ණනාවෙහි කියන ලද ආකාරයෙන්ම දතයුතුයි.

භාග්‍යවතුන් වහන්සේ විශාලාවට වැඩම වූ කල්හි ත්‍රිවිධභය සන්සිඳී නුවර සුවපත් වූ කල්හි, ශාස්තෘන් වහන්සේගේ ධම් දේශනාවට බොහෝ දෙව් මිනිස්සු රැස්වූහ. ඒ සියල්ලන්ට ම ධම්මාභිසමය විය. මේ රජ කුමරු බුද්ධානුභාවය දැක ශ්‍රද්ධාව උපදවා සසුනේ පැවිදිවිය. ඒ සමඟ පසුව කියැවෙන පුද්ගලයෝ සිවුදෙන ද යහළු ලිච්ඡවි රාජ කුමාරවරු මොහු පැවිදිවන විට ම පැවිදිවූහ. මොවුහු කස්සප බුදුරජාණන් වහන්සේ ගේ සසුනේ පැවිදිව ප්‍රියශීලී මිත්‍රකමින් යුක්තව මහණදම් පිරූහ. එමෙන් ම ඒ සියලු දෙන පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයේ දී කුසල් බීජ රෝපණය කිරීම් ආදිය සිදුකළහ.

පැවිදිව කළ පුර්ව කටයුතු ඇති උන්වහන්සේ සාකේත නුවර අඳුන් වනයට වැඩ සුසානයක වාසය කරන සමයේ ඉතා ලංවූ වස් විසීම් ඇති බැවින්, මිනිසුන් විසින් අත්හැර දැමුණු දිරාගිය දික් සඟලා පුටුවක් දැක, එය ගල් සතරක් මත තබා මත්තෙහි තණපත් ආදියෙන් වසා, දොරක් යොදා වස් එළඹියහ. එසේ වස් සමාදන් වූ පළමු මාසයේදීම උත්සාහ කර, වෑයම් කර රහත්බවට පත් වූහ.

උන්වහන්සේගේ චරිතාපදනය මෙසේ දැක්වේ.

''එකල් හි සුදස්සන නම් මාලාකාරයෙක් වූ මම, ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ පහකළ කෙලෙස් මල ඇති බුදුරජාණන් වහන්සේ

දුටුවෙමි. දැසමන් මල් රැගෙන මම පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පිදුවෙමි. ඒ හේතුවෙන් පිරිසිදු ඇස් ලැබූ මම සතුටු වූ යෙමි දිවැස පිරිසිදු කළෙමි. මම මේ පුෂ්ප පූජාව හේතුවෙන් ද චිත්ත ප්‍රණිධිය නිසා ද කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුගතියක නුපන්නෙමි. මීට කල්ප තිස් හයකට පෙර, මම මහත් බල ඇති ''දේවුත්තර'' නමින් සක්විති රජවරු දසය දෙනෙක් ව උපන්නෙමි. මව්සින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත්බවට පත්ව විමුක්ති සුව විඳින්නා වූ උන්වහන්සේ, සමාපත්තියෙන් නැගිට, එම සමාපත්ති සුවය ම නැවත සිහිපත් කර බලා හටගත් ප්‍රීතිවේගයෙන් උදන් අනන සේක්, ''ආසන්දිං කුටිකං කත්වා'' යන ගාථාව වදළහ.

එහි ''ආසන්දිං කුටිකං කත්වා'' යන්නෙහි 'ආසන්දි' නම් දිගු පා ඇති චතුරස්‍රාකාර ඇඳ පුටුවකි. දිග පළල සමාන වේ මය. එහි හිඳීමට පමණක් ම හැකිය. සයනය කිරීමට නොහැක, එබඳු ආසන්දි නම් පුටුවෙන් කුටියක් කර, වාසය කිරීම සඳහා ඉහතින් කියූ පරිදිම කුටියක් සාද, යම් තැනක හිඳ සෘතු විපර්යාස ආදියෙන් පීඩාවක් නොවී සුවසේ මහණදම් පිරිය හැකි ද එබදු වූ කුටියක් සාදගෙන, මෙයින් ඉතා උසස් සෙනසුනක් සාදගත් බව තමන් වහන්සේගේ අල්පේච්ඡ හා ලද දෙයින් සතුටුවන ගුණ මහිම නිසා දක්වයි. ධර්මසේනාපති සැරියුත් තෙරණුවෝ මෙසේ පවසා ඇත.

''පල්ලඞ්කෙන නිසින්නස්ස
ජනූකෙනාභිවස්සති
අලං ඵාසු විහාරාය
පහිතත්තස්ස භික්ඛුනෝ'' ති

''පලඟින් හුන්නා වූ වීර්ය වඩන භික්ෂුවට දණ මඬලින් ඔබ්බෙහි තෙමෙන කුටියේ වුවත් පහසුවෙන් වාසය කළ හැකි වේ.''

ඇතැම්හු ''ආසන්දිං කුටිකං'' යන පාඨය දක්වා ''ආසන්දියක් පමණ කුටියක් සාද'' යනුවෙන් අර්ථ කියති. සෙසු සම්ප්‍රදයන් හි ''අසුන් ගැනීම්, හිදගැනීම් ආදියට යෝග්‍යව මිනිසුන් සඳහා කරන ලද ඇඳක් මත සැදූ කුටිය ආසන්දි නම් වේ'' යැයි පවසා ''ඒ ආසන්දි නම් කුටියක් සාද'' යනුවෙන් අර්ථ කියයි. ''ඔගය්හ'' යනු ඇතුළු වී, පිවිස ''අඤ්ජනවනං'' යනු මෙබඳු නමක් ඇති වනයට, අඳුන්වන් හෙවත් කළු පාටින් යුතු මල් වලින්

බබලන අඤ්ජන නම් වූ වැල් බහුල ව ඇති බැවින් එම වනය ''අඤ්ජනවනය'' යන නම ලබා ඇත. ඇතැම් හු ''අඤ්ජන යනු විශාල පැලෑටි වර්ගයක් ය'' යි කියති. එම පැලෑටි බහුල වූ අඤ්ජන වනයට ඇතුළු වී, ආසන්දි කුටියක් කර (සාද), ''**තිසෙසා විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං**'' යනු මවිසින් ත්‍රිවිද්‍යා ලබන ලදී. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකර වාසය කරන්නෙමි. මෙසේ පද පිළිවෙල ගලපා ගත යුතුයි. මෙම ගාථාවම තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම වේ.

අඤ්ජනවනිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.6.6

''කෙ කුටිකායං'' යනු ආයුෂ්මත් කුටි විහාරිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? හෙතෙම පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ අහසින් වැඩම කරනු දැක, ''ජල දනයක් දෙන්නෙමි'' යි සීතල දිය ගෙන ප්‍රීතිසොම්නස් භාවයට පැමිණ උඩ බලා අහසට දමීය. ඔහුගේ අදහස දැනගත් ශාස්තෘන් වහන්සේ ඔහුගේ ප්‍රසාදය දියුණු කිරීම සඳහා අහසේ වැඩ හිඳිමින් ම එම දිය පිළිගත්සේක. එය දුටු ඔහු අපමණ ප්‍රීතියක් වින්දේය. සෙසු සිදුවීම් ඉහත දැක්වූ අඤ්ජනවනිය තෙරුන්ගේ කථාවේ දැක්වූ පරිදි දත යුතුය. මෙහි ඇති විශේෂත්වය නම් - මේ රජකුමරා පැවිදිව කරන ලද පුවේ කටයුතු ඇති ව, විදසුන් භාවනාවෙහි යෙදී සවස් කාලයක කෙතක් සමීපයෙන් යන කල්හි වැස්සක් හටගත්තේ ය. එවිට කෙත් රකින්නකුගේ ශූන්‍ය (හිස්) වූ කුටියක් දුටු උන්වහන්සේ ඊට ඇතුලු වී, එහි තණ ඇතිරියේ හුන්සේක. වැඩ හුන් මොහොතේ ම තමාට ගැලපෙන සෘතු ලැබීමෙන් සිරුර ප්‍රසන්න වූයේ විදසුන් වඩා, සියලු කෙලෙස් නසා රහත්බවට පත්වූහ.

උන්වහන්සේ විසින් සිය චරිතාපදනය මෙසේ දක්වා ඇත.

''මම අහසෙහි වඩින්නා වූ රන්වන් වූ ගිනිගෙන දිලිසෙන ගිනිකඳක් වැනි වූ පූජාසත්කාරයන් ට ආසන වූ බුදුරජාණන් වහන්සේට අතින් දිය ගෙන අහසට විසි කළෙමි. මහාවීර වූ කාරුණික වූ බුදුරජාණන් වහන්සේ එය පිළිගත් සේක. අහසෙහි වැඩහිඳිමින් ම පදුමුත්තර බුදුරජාණන් වහන්සේ,

''මේ ජල දනයෙන් ද එහි ප්‍රීතිය ඉපදවීමෙන් ද මොහු කල්ප ලක්‍ෂයක් මුලුල්ලෙහි දුගතියක නුපදී.'' යනුවෙන් පැවසූ සේක. ද්විපදෝත්තම වූ ලෝක ජේෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨයන් වහන්සේ කෙරෙහි කරන ලද එම පින්කම නිසා මම දැන් ජය පරාජ දෙකින් දුරුව නිශ්චල වූ නිවණට පැමිණියෙමි. මෙයින් කල්ප හයදහස් පන්සීයකට පෙර මම සිවුමහා දිවයිනම ඇතුලත් පෘථිවියට අධිපති වූ සහස්සරාජ නම් වූ සක්විති රජවරු තිදෙනෙක් ව උපන්නෙමි. මවිසින් සියළු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ තෙරණුවෝ, එහි වැඩහිඳින කල් හි කෙත් රකින්නා පැමිණ, ''කුටියේ කවුද ? යි ඇසීය. එය ඇසූ තෙරණුවෝ ''**භික්‍ඛු කුටිකායං**'' යනාදිය පැවසුහ. එවිට කෙත් රකින්නාගේ ද තෙරුන්ගේ ද ප්‍රශ්න පිළිතුරු දෙක එකතු කර ''කො කුටිකායං ? භික්ඛු කුටිකායං'' වීතරාගො සුසමාහිත චිත්තො එවං ජානාහි ආවුසො! අමොඝා තෙ කුටිකා කතා'' යන වාක්‍ය ගාථාවට නගා සංගායනා කරන ලදී. එහි ''කො කුටිකායං'' යනු මේ කුටියේ සිටිනුයේ කවු ද? කෙත් රකින්නාගේ ප්‍රශ්නයයි. ඊට දුන් පිළිතුර ''කුටියේ භික්‍ෂුවකි'' යන්න තෙරුන්ගේ ප්‍රකාශයයි. ඉක්බිති ඒ කෙත් රකින්නා තමන් වහන්සේගේ අනුත්තර දක්‍ෂිණෙය්‍යභාවයට පත් වූ කුටි පරිභෝගය අනුව සතුටු කරවා, මහත් වූ පුණ්‍ය සම්පත්තියක පිහිටුවීමට ''**වීතරාගො**'' යනාදිය කියන ලදී. එහි අර්ථ මෙසේ ය. - ''එක් කෙලෙස් සිද දැමූ භික්‍ෂුවක් නුඹගේ කුටියෙහි හුන්නේ ය එසේම උන්වහන්සේ අග්‍රමාර්ගයේ ගමන් කිරීමෙන් සියලුම ආකාරයෙන් රාගය සිදදමන ලද බැවින් වීතරාගී නම් වේ. ඉතා උතුම් වූ සමාධියෙන් නිර්වාණය අරමුණු කර වහා සමාධිගත වූ සිත් ඇති බැවින් මනාව සන්සුන් වූ සිත් ඇත්තෙක් වේ. පින්වත් කෙත රකින්න ! මෙහි අර්ථ මා පවසන පරිදි දනගන්න. අදහන්න. ස්ථිරව පිළිගන්න නුඹගේ කුටිය හිස් නොවුවක් කරන ලදී. නුඹවිසින් සෑදූ කුටිය හිස්නොවූ, වද නොවූ, ඵල සහිත, සැප ගෙනදෙන්නකි. අර්හත් වූ ක්‍ෂීණාස්‍රවයන් වහන්සේ කෙනෙකු විසින් පරිභෝග කළ බැවිණි. ඉදින් මෙය නුඹ අනුමෝදන් වේනම් එය නුඹට ඉතා බොහෝ කාලයක් හිත සුව පිණිස හේතු වේ.'' එය ඇසූ කෙත රකින්නා ''මට ඒකාන්තයෙන් ලාභයක් විය, මට වාසනාවක් විය, මේ මගේ කුටියෙහි මෙවැනි වූ ආර්‍යයන් වහන්සේ නමක් පිවිස නිදගත්තේ ද එය මහත් ලාභයකි.'' යි පැහැදුණු සිතින් අනුමෝදන් විය.

මේ කථා සල්ලාපය දිව කණින් ඇසූ භාග්‍යවතුන් වහන්සේ, කෙත් රකින්නාගේ අනුමෝදන් වීම ද දැන එහි විපාක දැක්වීම් වශයෙන් සැප සම්පත් දක්වන සේක්, කෙත් රකින්නාට මේ ගාථාවන් වදළසේක.

විහාසි කුටිකායං භික්ඛු සන්ත චිත්තෝ අනාසවෝ
තෙන කම්ම විපාකෙන දෙවිත්තෙ භවිස්සසි

ඡත්තිංසක්ඛත්තුං දෙවින්දෙ දෙවරජ්ජං කරිස්සසි
ඡත්තිංසක්ඛත්තුං චක්කවත්ති රාජා රට්ඨෙ භවිස්සසි
රතනකුටිකෝ පච්චෙක බුද්ධෝ විතරාගෝ භවිස්සසි''

නුඹගේ මේ කුටියේ ශාන්ත වූ සිත් ඇති රහතන් වහන්සේ නමක් වැඩ සිටියේ ය. එහි විපාක වශයෙන් නුඹ ශක්‍ර දේවේන්ද්‍රව උපදින්නේහිය. නුඹ තිස්හයවරක් දෙව් රජව දෙවිරජය කරන්නෙහිය. එමෙන් ම තිස් හය වරක් චක්කවත්ති රජකම කරන්නෙහිය. පසුව රතනකුටික නම් පසේබුදුව වීතරාගී ව පිරිනිවන් පාන්නෙහිය.'' කුටියෙහි දී ලබන ලද ගුණ විශේෂ ඇති බැවින් එම තෙරණුවෝ එතැන් පටන් ''කුටිකා විහාරී'' කුටිවිහාරිය තෙරුන් නාමයෙන් ප්‍රකට වූහ. මෙම ගාථාවම එම තෙරුන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව විය.

කුටිවිහාරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.6.7

''අයමානු පුරාණියා'' යනු ආයුෂ්මත් දෙවැනි කුටි විහාරිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවී ද ? හෙතෙම පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූ සිතින් දැඩි ශ්‍රීෂ්ම කාලයේ බට මලකින් සෑදූ විජිනිපතක් පූජාකළේය. එය පිළිගත් ශාස්තෘන් වහන්සේ අනුමෝදනා ගාථාවකින් ඔහු සතුටු කළසේක. ඉන්පසු සිදු වූ තොරතුරු අඤ්ජනවනිය තෙරුන්ගේ කථා පුවත අනුව දත යුතුයි. මෙහි ඇති විශේෂය මෙසේය. - මේ රාජ කුමරු ද කියූ පරිදි ම පැවිදි වී එක්තරා පැරණි කුටියක වසමින් මහණදම් පිළිබඳව නොසිතා, ''මේ කුටිය දිරාගියේ ය. මෙවන් පැරණි කුටියක වසමින් මහණදම් පිළිබඳව නොසිතා, ''මේ කුටිය දිරාගියේ ය. වෙනත් කුටියක් සෑදීමට සුදුසුයැ'' යි නවකම් පිළිබඳව සිතක් ඉපිදවීය.

උන්වහන්සේගේ දියුණුව කැමති එක් දේවතාවෙක්, සංවේග ඉපිදවීම සඳහා ඒ මොහොතේ ම මේ වනා ටැටහෙන නමුත් ගැඹුරු අර්ථ ඇති "**අයමානු පුරාණියා**" යන ගාථාව පැවසීය.

එහි "**අයං**" යනු ආසන්නයේ බව හඟවන පයමා විභක්ති පදයකි "**ආහු**" යනු "විය" යන අර්ථයයි. ගාථාව සුබෝච්චාරණය පිණිස දීර්ඝ කරන ලදී. "**පුරාණියා**" යනු පැරණි වූ දිරාගිය "**අඤ්ඤං පඨයසෙ නවං කුටිං**" යනු මේ කුටිය පැරණි, දිරාගිය නිසා මෙයින් අනික් කුටියක් දැන් සැදියයුතු බැවින්. අලුත් කුටියක් පතන්නෙහි ? කැමතිවෙහි ? සියල්ලෙන් සියල්ල කැමතිවෙහි ? "**ආසං කුටියා විරාජය පුරාණියා**" යනු පැරණි වූවක් මෙන් නව කුටිය පිළිබඳ ආශාව, තණ්හාව, අපේක්ෂාව දුරු කරව ! සියලු ම ආකාරයෙන් එහි නො ඇලුණු සිත් ඇති වන්න. කුමක් නිසා ද ? නව කුටියෙන් මහණ! නුඹට දුක් ගෙන දේ. මහණ ! දැන් නැවත ඉපදීමෙන් දුක් ගෙනදෙන බැවින් දුකයි. එනිසා අනික් නව දුකක් නුපදවා මේ උපන් පැරණි කුටියෙහි ම සිට තමා විසින් කළ යුතු දේ කරන්න. මෙහි අදහස මෙසේ දත යුතුයි. - "මහණ ! නුඹ මේ පැරණි තණ කුටිය දිරාගියේ යැයි අනික් නව තණ කුටියක් කරනු කැමැත්තෙහිය. ශ්‍රමණ ධර්ම පිරීමට කැමැත්තක් නැත. මෙසේ කැමති පුද්ගලයා භාවනාවෙහි නිරත නොවීම් වශයෙන් අලුත් භවයක් ඉපිදවීමන් නො ඉක්මවීමෙන් අනාගත ශරීර කුටියක් ප්‍රාර්ථනා කිරීම "කුටියක් කරනු කැමතිවීම" නම් වේ. ඒ නව කුටියක් සැදීමට යෑමෙන් වන දුකට වඩා වැඩි වූ ජරාමරණ, ශෝක, පරිදේව ආදී අනේක දුක්ඛයන් ගෙන් මිශ්‍ර වූ බැවින් දුක් සහගත වූ, එනිසා නව තණ කුටියේ මෙන් නව ශරීර කුටියකට ඇති ආශාව, අපේක්ෂාව, දුරුකරව. සියලුම ආකාරයෙන් එහි නො ඇලුණු සිත් ඇති වන්න. මෙසේ නුඹට සසර පැවතුම් දුක නො වන්නේ ය." මේ දෙවියාගේ වචනය ඇසූ තෙරණුවෝ සංවේග උපදවා ගත්සේක්., විදසුනෙහි සිත පිහිටුවා වෑයම් කර, උත්සාහ කර නොබෝ කලකින් ම රහත්ඵලයෙහි පිහිටියහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

"තාදී ගුණ ඇති ද්විපදෝත්තම වූ ලෝක ජ්‍යෙෂ්ඨ වූ තණ ඇතිරියක වැඩහුන් පදුමුත්තර බුදුරජාණන් වහන්සේට බට මලක් ගෙන විජිනිපතක් බැඳ පිළිගැන් වූයෙමි. ලෝක නායක වූ බුදුරජාණන් වහන්සේ විජිනිපත පිළිගෙන මා අදහස දැනගත්සේක් මෙසේ පැවසූහ. "යම් සේ මගේ සිරුර නිවේද පරිළාහයක් නො වන්නේ ද එසේ ම ඔබගේ සිත ත්‍රිවිධ අග්නියෙන්

නිවේවා ! කෙලෙසුන්ගෙන් මිදේවා!'' වනය ඇසුරු කළ යම් දේවතා කෙනෙක් ටුවාහු ද ඒ සියලු දෙව්වරු, ''දයකයාහට දේශනා කරන බුද්ධ වචනය අසමු '' යි රැස්වුහ. එහි දිව්‍ය සමූහයා විසින් පිරිවරා ගෙන වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දයකයා සතුටු කරමින් මෙසේ වදළසේක. ''මොහු මේ විජිනිපත පිදීම නිසාත් චිත්තප්‍රණිධිය නිසාත් සුබ්බත නම් වූ සක්විති රජ වන්නේය.'' කුශල මූලයෙන් මෙහෙයු මොහු පසුව මාලුත නම් සක්විති රජ වේ. මේ විජිනිපත් දැනය නිසාත්, මහත් වූ සත්කාරය නිසාත් කල්ප ලක්‍ෂයක් මුලුල්ලෙහි දුගතියක නුපදින්නේය.'' එසේ විවරණ ලද මම මෙයින් කල්ප තිස් දහකට පෙර සුබ්බත නමින් සක්විති රජවරු අටක් වූයෙමි. දැන් මවිසින් සියලු කෙලෙස් නසන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවෙහි පිහිටි තෙරණුවෝ, ''මෙය මාහට රහත් වීමට අංකුසයක් වූයේ ය'' යි එම ගාථාව ම නැවත දේශනා කළහ. එයම උන්වහන්සේගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව විය. කුටිය පිළිබඳ අවවාදයෙන් ලැබූ ගුණ විශේෂ ඇති බැවින් එම තෙරණුවෝ ''කුටිවිහාරිය'' නාමයෙන් ප්‍රසිද්ධ වූහ.

දෙවැනි කුටිවිහාරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.6.8

''රමණීයා මෙ කුටිකා'' යනු ආයුෂ්මත් රමණීය කුටික තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? හෙතෙමේ ද පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඉදිරියේ දී කුසල් බිජුවට වපුරා දෙව් මිනිසුන් අතර සැරිසරා, මෙයින් කල්ප එක්දහස් අටසියකට පෙර පහළ වූ අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටුගෙයක උපන්නේ ය. වැඩිවියට පත් හෙතෙම බුදුවරුන්ට යෝග්‍ය ආසනයක් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වීය. මලින් ද භාග්‍යවතුන් වහන්සේට පූජා කර, පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණා කොට තම නිවසට ගියේය. ඉතිරි විස්තර අඤ්ජන වනිය තෙරුන්ගේ කථාවෙහි කියූ පරිදි ම දතයුතුයි. මෙහි ඇති විශේෂත්වය - මොහු ද පැවසූ ලෙසම පැවිදි වී කළ පුවී කටයුතු ඇත්තේ, වජ්ජි රටෙහි එක්තරා ගමක වූ ආවාසයක කුටියක වෙසේ. ඒ කුටිය ඉතා අලංකාරය, දර්ශනීය වේ. ප්‍රසාද

එළවයි, මනාව පරිකර්ම කළ බිත්ති ඇත. ආරාමය සිත් අලවන පොකුණු ආදියෙන් විසිතුරුය. මුතු දලක් වැනි වැලි විසිරුණු බිමක් ඇත. වත් පිළිවෙත් මනාව පිරූ තෙරුන්ගේ සිත ද මනාව සුමට වූ යේ තාදි ගුණ සහිතව වඩාත් රමණීය ව සිටියි. උන්වහන්සේ එම කුටියෙහි වසනසේක්, විඳසුන් වඩා නොබෝ දිනකින් ම රහත්ඵලයෙහි පිහිටියහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වුහ.

''අල්ප ශබ්ද ඇති නිශ්චල වූ මහවනයට පිවිසි තාදි ගුණ ඇති අතීදස්සි බුදුරජාණන් වහන්සේට ම විසින් සිහ සුනක් පූජා කළෙමි. මල් මිටක් ගෙන ඒ ශාස්තෘන් වහන්සේ පැදකුණු කළ මම, උතුරු දිශාභිමුඛව ගියෙමි. ද්විපදෝත්තම වූ ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ කෙරෙහි කරන ලද එම පින්කම හේතුවෙන් නිවන ලැබූ මම සියලු භව නසන ලද්දෙමි. මෙයින් එක්දහස් අටසිය වන කල්පයේ මම යම් දනයක් දුන්නෙමි ද, ඒ හේතුවෙන් මම දුගතියක නුපන්නෙමි. සිංහාසන දනයේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප හත්සියකට පෙර, සත්රුවනින් හෙබි, මහත් බල ඇති සන්දිම නම් ක්‍ෂත්‍රිය සක්විති රජව උපන්නෙමි. මවිසින් සියළු කෙලෙස් දවන ලදී - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි''

රහත් බවට පත් වූ තෙරණුවෝ එම ආවාසයේ වසන කල් හි කුටියේ රමණීයබව නිසා විහාර නරඹන මිනිස්සු ඒ ඒ තැනින් පැමිණ කුටිය නරඹති. එක් දිනක් සුරාදියේ ලොල් වූ ස්ත්‍රීහු කිහිප දෙනෙක් එහි අවුත් කුටියේ රමණීය බව දැක, ''මෙහි වසන මේ ශ්‍රමණයන් වහන්සේ අපවිසින් සිත් ඇදගත හැකි පුද්ගලයෙකි'' යි සිතා ''ස්වාමීනි ! ඔබ වසන තැන අතිශයින් රමණීය වේ. අපි ද රමණීය වූ රූසිරින් යුතු පළමු යොවුන් බවේ සිටි තරුණියෝ වෙමු'' යි පවසමින් ස්ත්‍රී ලීලා දැක්වීමට පටන් ගත්හ. මෙය දුටු තෙරණුවෝ තමන් වහන්සේගේ විතරාගී භාවය ප්‍රකාශ කරන සේක්, ''**රමණීයා මෙ කුටිකා සද්ධා දෙය්‍යා මනොරමා**'' යන ගාථාව වදළ සේක.

එහි ''**රමණීයා මෙ කුටිකා**'' යනු ''ස්වාමීනි ! නුඹවහන්සේගේ කුටිය රමණීයවේ'' යනුවෙන් නුඹලා විසින් පැවසු දෙය සත්‍යයකි. මේ මම වසන කුටිය රමණීයයි. මනෝඥ වූ ස්වරූප ඇත. එය ශ්‍රද්ධාවෙන් දුන් ධනයෙන් සෑදුවකි. මෙවැනි ප්‍රියමනාප කර්මාන්තවලින් අලංකාරව පැවිද්දන්ට පිරිනැමූ මේ කුටි දනයේ විපාක වශයෙන් මේ මේ කර්මඵල

ලැබේ යැයි අදහන ශ්‍රද්ධාකාමී ජනයා විසින්, ධර්මය පිළිබඳ ආශාවෙන් දුන් බැවින්, ශ්‍රද්ධාවෙන් දුන් ධනයෙන් මේ කුටිය නිමවන ලදී. ඒ කුටිය ලෙස ශ්‍රද්ධාවෙන් නැන වුවන්ගේ ද මේ කුටිය බලන්නවුන්ගේ ද මෙහි වසන්නවුන්ගේ ද සිත් අලවන බැවින් ''මනෝරමා'' නම් වේ. නැතිනම් සද්ධා දෙයෙ (ශ්‍රද්ධාවෙන් දුන් දෙයින් සැදූ) බැවින් ම මනෝරම වේ. ශ්‍රද්ධාවෙන් දන්නෝ සකසා පිළියෙල කොට දෙති. ශ්‍රද්ධාවෙන් දුන් දෙය වළඳන සත්පුරුෂයෝ, දයකයාට බොරුනොකර ප්‍රයෝග සම්පත්තියෙහි නියැලෙති. නුඹලා සිතන පරිදි කාමුකසැප නොසොයති යන අදහසයි ''**න මෙ අත්ථො කුමාරීහි**'' යනු යම්හෙයකින් මම කාමයන්ගෙන් වෙන් වූ සිත් ඇත්තෙම් ද එනිසා මා හට කැපකරු දයිකාවන් වශයෙන් වත් කුමරියන්ගෙන්, ස්ත්‍රීන්ගෙන් ප්‍රයෝජනයක් නොමැත. රාගවශයෙන් අවශ්‍යය යන්න ගැන කියනු කිම ? එනිසා ''මාහට කිසිසේත් ම කුමරියන්ගෙන් ප්‍රයෝජනයක් නැත. කුමරියෝ සමූහයක් මෙහි දී අදහස් කළබව දත යුතුයි. ''මා වැන්නවුත් සම්පයේ දී මෙසේ නොපිළිපදින්න. මෙසේ ක්‍රියා නොකරන්න. මෙය නුඹල, නුඹලාට ම කරගන්නා අවැඩක්. නුඹලාට සමාන වූ ළාමක අදහස් ඇති අය ඉදිරියේ දීම නුඹලාගේ මේ ළාමක ක්‍රියාව ශෝභමාන වේ.'' යන අදහස දෙමින් ''**යෙසං අත්ථො නහිං ගච්ඡථ නාරියො**'' යන්න පැවසුසේක. එහි ''**යෙසං**'' යනු කාමයෙහි නොකළ කිරුණු, එහි ඇලී - ගැලී වසන්නක් ගේ ''**අත්ථො**'' යනු ප්‍රයෝජනවත් වේ. ''**නහිං**'' යනු එහි, ඔවුන්ගේ සමීපයට ''**නාරියො**'' යනු ඇමතීමයි. ආලපන විභක්තියයි. මෙම ගාථාව ඇසූ ස්ත්‍රීහු මකුවුවා - නිහඬවුවා යටිකුරු මුව ඇතිව පැමිණි මාර්ගයෙන් ම ගියහ. මෙසේ ''**නමෙ අත්ථො කුමාරීහි**'' යන කාමයෙහි කිසිදු අර්ථයක් නැතිබව ප්‍රකාශ කිරීම ම මේ තෙරුන් වහන්සේගේ රහත්බව ප්‍රකාශ කිරීම ලෙස දත යුතුයි.

රමණීයකුටික ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.6.9

''**සද්ධායාහං පබ්බජිතො**'' යනු ආයුෂ්මත් කෝසල විහාරිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? ඔහු ද පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ හමුවේ දී කුසල් බිජුවට වපුරා ඒ ඒ භවයන් හි දී නොයෙක් පින්කම් සිදුකළේය. ඉතිරි විස්තර අඤ්ඤතවනිය තෙරුන්ගේ පුවතෙහි

පැමිණි ලෙස ම දනයුතුයි. මෙහි ඇති විශේෂත්වය නම්: මේ රජකුමරු ද ඉහත පැවසූ පරිදිම පැවිදි වී, කරන ලද පූර්ව කටයුතු ඇතිව කොසොල් රට එක්තරා ගමක, එක් උපාසක පවුලක් නිසා අරණ්‍යයෙහි වාසය කළේය. ඒ උපාසකයා ද ගස මුල හුන් තෙරණුවෝ දැක කුටියක් කරවා දුන්නේය. තෙරුණුවෝ එම කුටියේ වෙසෙමින්, සුදුසු සෙනසුනක් ලැබ සිත එකඟ වූ බැවින් විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත්ඵලයෙහි පිහිටියහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වුහ.

''මම හිමවතට නුදුරු තැනක පන් පැදුරක් එළාගෙන වාසය කළෙමි. එද ආහාරයේ ගිජු නොවූ මම නිතර පන් ඇතිරියෙහි ම වෙසෙන ව්‍රත සමාදනය සුරැකීමි. මම කලම්බ, බිළලි, තක්කල යන අලවඟී සාරා, ඩෙබර, බදුලුගෙඩි හා බෙලි යන පළතුරු කඩා ගෙන ආහාරයක් සැදුවෙමි. තුන් ලොවෙහිම පූජා පිළිගැනීමට සුදුසු වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මා ගේ සිතැඟි දැන මා සමීපයට වැඩිසේක. එසේ එළඹි මහෝත්තම වූ දෙවියන්ට දෙවි වූ නරශ්‍රේෂ්ඨ වූ බුදුපියාණන් වහන්සේ මා සතුටු කරමින් එය වැළඳූ සේක. එම දනය වළඳ අවසන් හි උන්වහන්සේ මෙසේ වදළසේක.

''නුඹ තම සිත පහද මට බිළාලි අල පිළිගැන්වූයෙහි ද ඒ හේතුවෙන් නුඹ කල්ප ලක්‍ෂයක් මුලුල්ලෙහිම දුගතියකට නො යන්නෙහිය. මෙයින් පනස් සතරවන කල්පයෙහි සත් රුවන් සහිත මහ බලවත් සුමේලය නම් සක්විති රජකෙනෙක් ව උපදින්නෙහි ය.''

මේ මාගේ අවසන් භවය වේ. සියලු භවයන් හි ඉපදීම නසන ලදී. සම්බුදු සසුනෙහි අවසන් ශරීරය දරන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' මෙසේ රහත්බවට පත් වූ උන්වහන්සේ, විමුක්ති සුවය විඳීම් වශයෙන් උපන් ප්‍රීති වේගයෙන් උදන් අණනසේක්, ''**සඬ්ගායාහං පබ්බජිතො**'' යන ගාථාව වදළසේක.

එහි ''**සඬ්ගාය**'' යනු භාග්‍යවතුන් වහන්සේ විශාලාවට පැමිණි කල්හි ඒ මහානුභාවය දක, ''මේ සසුන ඒකාන්තයෙන් නෛර්‍යාණිකය. එනිසා ඒකාන්තයෙන් මේ ප්‍රතිපත්තියෙන් ජරා මරණ දෙකින් මිදෙන්නෙමි'' යි උපන් ශ්‍රද්ධාවෙන් පැවිදි වී, පැවිද්දට පැමිණ, ''**අරඤ්ඤෙ මෙ කුටිකා කතා**'' යනු ඒ පැවිද්දට ගැලපෙන පරිදි කැළයෙහි වසනු සඳහා මා හට කුටියක් කරන ලදී. ''ආරණ්‍යයේ වසමින් පැවිද්දට ගැලපෙනසේ හුදකලාව

වාසය කරමි'' යි යන අදහසයි. එනිසා කියන ලදී - ''**අසමන්තෝ ච ආනාපී - සමාහිතෝ පනිස්සතෝ**'' යනු අරණ්‍යයෙහි වාසයෙන් ලැබූ කාය විවේකයෙන් නිදිවැරීමෙහි යෙදී, එහි සිහියෙන් යුක්තව ම වෙසෙමින් අප්‍රමාදී වූ යෙමි. අරඹූ වීර්ය ඇතිව කෙලෙසුන් තවන්නෙමි. පූර්වභාග සිහි නුවණේ පරිපූර්ණත්වයෙන්, විදසුන් වඩා අර්හත්ඵලාව බෝධය කරගන්නා ප්‍රඥාවෙන්, සිහියේ විපුලත්වයට පැමිණ අතිශයින් ම විමසන නුවණින් හා සිහියෙන් යුක්තව වාසය කරමි.'' යන අදහසයි.

අප්‍රමාදීබව ආදී ගුණ පැවසීම් වශයෙන් මෙම ගාථාවම උන්වහන්සේගේ රහත්බව ප්‍රකාශ කිරීම විය. කොසොල් රට බොහෝ කලක් උන්වහන්සේ විසූ බැවින් ''කෝසලවිහාරී'' නාමයෙන් ප්‍රකටවූහ.

කෝසල විහාරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.6.10

''**තෙ මෙ ඉජ්ඣිංසු සාධකපජ්ජා**'' යනු ආයුෂ්මත් සීවලී තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? මොහුද පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයේ දී ඉහතින් පැවසූ ලෙස ම විහාරයට ගොස් පිරිස් කෙළවර හිඳ ධර්මශ්‍රවණය කරනුයේ, ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් ලාභ ලබන (ප්‍රත්‍ය ලාභ) භික්ෂූන් අතුරින් අග තනතුරෙහි පිහිටුවනු දුටුවේය. ''මවිසින් ද අනාගතයේ දී මෙබඳු තනතුරක් දරන භික්ෂුවක් වේවා'' යි දසබලයන් වහන්සේට දන්වා සත් දිනක් බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට මහාදානයක් පැවැත්වීය. පසුව ''භාග්‍යවතුන් වහන්සේ මම මේ මහා පින්කම කිරීමෙන් වෙනත් කිසිදු සම්පත්තියක් නොපතමි. අනාගත බුදුවරයන් වහන්ස කෙනෙකුගේ ශාසනයේ මම ද නුඹවහන්සේ අගතනතුරෙහි තැබූ ලාභීන්ගෙන් අග්‍ර භික්ෂුව මෙන් ලාභීන්ගෙන් අග්‍රවේවා!'' යි පැතුවේය. ශාස්තෘන් වහන්සේ එයට අනතුරක් නොවන බව දැක, ''මේ නුඹගේ ප්‍රාර්ථනාව අනාගතයේ පහළ වන ගෞතම බුද්ධ ශාසනයේ දී ඉටුවන්නේය'' යනුවෙන් විවරණ දී වැඩි සේක.

ඒ කුලපුතු ද දිවි ඇතිතාක් කුසල් කොට, දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, විපස්සී බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි බන්ධුමතී නුවරින්

බැහැර එක් ගමක පිළිසිඳ ගත්තේය. එසමයේ බඳුමති නගර වැසියෝ රජු සමග සාකච්ඡා කොට දසබලයන් වහන්සේට දන් දෙති. දිනක් ඔවුහු සියලු දෙනම එක්ව මහා දානයක් පවත්වන්නා හු ''අපගේ මහා දනෝත්සවයෙහි කවරක් අඩුපාඩු ද ? යි විමසා මීපැණි - උක්සකුරු හා මිදුණු කිරි නිමවූ බව දැන, ''මේ අඩු දුව්‍ය කොතැනින් ගෙනඑමු ද ? යි ජනපදයෙන් නුවරට පිවිසෙන මාර්ගයේ පුරුෂයෙක් තැබුවේය. එකල් හි ගමේ උපන් කුලපුත්‍ර, තම ගමෙන් උක්සකුරු ද මිදුණුකිරි කළයක් ගෙන, ''ඒවා විකුණා නගරයෙන් කිසිවක් මිළට ගනිමි'' යි සිතා නුවර බලා පිටත් විය. නගරාසන්නයේ දී ''මුව - අත්පා සෝදා ගෙන නුවර පිවිසෙන්නෙමි'' යි සිතා පහසුතැනක බලන්නේ නඟුල් හිසක් මත වූ මැස්සන් නොමැති දඬු මී වදයක් දැක, ''මගේ පිනින් ම මෙය පහළවීයැ'' යි කියා අතපය සෝදා පවිත්‍රව එය ද රැගෙන නුවරට පිවිසියේ ය. නුවරැන් විසින් මාර්ගයේ තබන ලද පුරුෂයා ඉදිරියට එන ඔහු දැක, ''පින්වත් පුරුෂය ! නුඹ මෙම දුව්‍ය ගෙන යනුයේ කා හට ද ?'' යි ඇසීය. එවිට එම කුලපුත්‍ර ''ස්වාමීනි ! කිසිවකුට නොවේ, මේවා විකිණීම සඳහා ගෙන යමි'' යි පැවසීය. ''එසේ නම් මේ කහවණුව ගෙන මේ දඬුමීයන්, උක්සකුරු හා මිදුණුකිරි මාහට දෙන්න'' යි එම පුරුෂයා පැවසූ විට, කුලපුත්‍ර මෙසේ සිතීය ''මේවා බොහෝ මිල ඇති භාණ්ඩ නොවේ. මොහු එක් වරම බොහෝ මුදලක් දෙයි. මෙය විමසිය යුත්තකි'' යි සිතා, එම පුරුෂයාට ''මම මේවා එක කහවණුවකට නොදෙමි'' යි පැවසීය. ''එසේනම් කහවණු දෙකක් ගෙන දෙව'' යි නගර වැසි පුරුෂයා කීය. කුලපුත්‍ර ''කහවණු දෙකකටවත් නොදෙමි'' යි මෙසේ කේවල් කර කහවණු දහසකටත් එම භාණ්ඩ ගනු කැමතිවීය. එවිට ඒ කුලපුත්‍ර ''මීට වඩා වැඩිකිරීම නුසුදුසුයි. මෙයින් ඇති ප්‍රයෝජනය හෙවත් මේවා මිලට ගන්නේ කුමකට ද ? යි විමසා බලමි'' යි සිතා එම පුරුෂයාගෙන් ''මේ භාණ්ඩ බොහෝ මිල සහිත ඒවා නොවේ. නමුත් මේ සඳහා ඔබ නොවටිනා මුදලක් ගෙවයි. කුමක් සඳහා මේ වා මිලට ගන්නේ ද ? යි ඇසීය. එවිට එම නගර වැසි පුරුෂයා ''මේ අපේ නුවර වැසියෝ රජු සමග තරඟයකට විපස්සි බුදුරජාණන් වහන්සේට දන් දෙති. අද මේ දුව්‍ය දනෝපකරණ අතර නොතිබුණි. එනිසා දැන් ඒවා සොයනු ලැබේ. ඉදින් මේ දුව්‍ය නොලැබෙනම් නුවර වැසියෝ පරදිති. එනිසා මම මේ දුව්‍ය කහවණු දහක් වුවත් දී ගන්නෙමි'' යි පැවසීය.

''පින්වත, බුදුරජාණන් වහන්සේට දන්දීම නුවර වැසියන්ට පමණක් ම සුදුසු ද ? වෙනත් අයට නොහැකි ද ? යි කුලපුත්‍ර ඇසුවිට, ''යම් කිසියකුට දීමට වස්තුවක් තිබේ නම් ඔහුට ම පැමිණ එය පූජා කළ හැකිය'' යි නගර

පුරුෂයා කිවේය. එවිට කුලපුත්‍ර ''මේ නුවරුන්ගේ දනයේ දී කිසිවකු කහවණු දාහක් වටින දේ දී තිබේ ද ?'' යි අසා ''යහලුව ! නැත'' යි පැවසුවිට, ''නුඹ මේ ද්‍රව්‍ය දෙක දහසක් අගනා බව කීවා නොවේ ද ? එනිසා යව ! නුවරුන්ට මෙසේ කියව ! ''මේ පුරුෂයා කිරි හා පැණි මිල මුදලට නොදෙයි. සියතින් ම පූජා කරනු කැමතිව සිටියි. ඔහුගේ දනයට නුඹලා විරුද්ධ නොවවු, යි දැනුම් දෙව'' යි කියා පුරුෂයා යැවීය. නුවර වැසියෝ එය අසා කැමතිව ''නුඹ අපගේ දනයේ ජ්‍යෙෂ්ඨ බවට පත්ව කාය සාක්ෂි වශයෙන් ම සිටිවා'' යි අවසර දුන්හ. ඔහු තම වියදමට ගෙන ආ මස්සකින් කුළු රස ද්‍රව්‍ය පසක් (පංච කුළුරසයක්) ගෙන කුඩුකළේය. පසුව ගොටුවක් ගසා ඊට මී වදය මිරිකා පැණිදමා පංචකුළුරස චූර්ණය සමඟ මනාව කලවම් කරගෙන, එම මිශ්‍රණය නෙලුම් කොළයකට දමා මනාව පිළියෙල කර, දසබලයන් වහන්සේට නුදුරු තැනෙක හුන්නේය. මහජනයා විසින් මහත් වූ සත්කාරයෙන් කරන පූජාවන් දෙස බලා ගෙන තම අවස්ථාව එනතෙක් අතේ දුරින් සිට, තම අවස්ථාව පැමිණි කල් හි ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස්, ''භාග්‍යවතුන් වහන්සේ මේ දුප්පතාට උපන් පූජාව මා හට අනුකම්පාවෙන් පිළිගන්නාසේක් වා'' යි පැවසීය. ශාස්තෘන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් සිවුමහ රජවරුන් දුන් ශෛලමය පාත්‍රයෙන් එම පූජාව පිළිගෙන, හැට අට ලක්ෂයක් වූ භික්ෂු මහා සංඝරත්නයට ම මේ පූජාව ප්‍රමාණවත් වේවායි අධිෂ්ඨාන කළසේක. ඒ කුලපුත්‍ර නිම වූ බත් කිස ඇති භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක සිට මෙසේ පැවසීය. ''භාග්‍යවතුන් වහන්සේ, අද මම බහුමතී නුවර වැසියන් විසින් ඔබවහන්සේට කළ පූජාවන් මහත් සත්කාරයන් දුටුවෙමි. මම ද මේ පුණ්‍යකර්මයේ බලයෙන් උපනුපන් ආත්මයන් හි දී ලාභයෙන් ද කීර්තියෙන් ද අග්‍රප්‍රාප්ත වේවා'' යි පැතීය. භාග්‍යවතුන් වහන්සේ ද ''කුලපුත්‍රය එසේම වේවා'' යි වදරා ඒ නගර වාසීන්ට ද කුලපුතුට ද වළඳ අවසන අනුමෝදනා කථාව පවත්වා විහාරයට වැඩිසේක. දිවිඇතිතාක් පින්දහම් සිදුකළ කුලපුත්‍රයා දෙව් මිනිස් දෙගතියේ සැරිසරා මේ අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සුප්පවාසා කෝලිය රජ දුවගේ කුස පිළිසිඳ ගත්තේය. එකුමරු පිළිසිඳ ගත් දින පටන් උදේ - සවස පන්සීයක් ගැලින් තැගි බෝග සුප්පවාසා කෝලිය දුවට ලැබේ. ඉක්බිති ඇය ඒ පින්වත් කුමරුගේ පින්මහිම විමසීමට සියතින් බිජුවට දමූ ධාන්‍ය පැස ස්පර්ශ කළාය. එක් එක් බීජයෙන් ගැල් සියය, දහස බැගින් ධාන්‍ය ලැබුණි. එක් එක් අමුණු සතරක කුඹුරකින් ගැල් පනහක හෝ හැටක ධාන්‍ය ලැබුණි. අටුව පිරෙන කාලයට අටු දොරකඩ අතින් ස්පර්ශ කරන්නීය රජදුවගේ පිනින් අටුවෙන් ධාන්‍ය ගන්නාවු නමුත් ගත් ගත් තැන නැවත

පිරේ. ක්ෂයවීමක් නොමැත. පිරුණු ආහාර භාජන ද රාජ දුවගේ පිනින් පහළවීයැයි කියා යාචකාදීන්ට ආහාර ගෙන දෙනු ලැබුවත් එම භාජන හිස් කිරීමට නොහැකිවේ. දරුවා කුසට පැමිණ විර්ෂ සතක් ම ඉක්මුණාය. ඒ අවුරුදු සතෙහි ගැබ මුහුකුරා යෑම නිසා මව ද දරුවා බොහෝ දුක්වින්දහ. ඇය තම සැමියා අමතා ''මරණයට පෙර, මම ජීවත්ව සිටිය දීම දානයක් දෙන්නෙමි. යන්න, ශාස්තෘන් වහන්සේට මේ දුක දන්වා හෙට දින දනය සඳහා ආරාධනා කරන්න. උන්වහන්සේ පවසන දෙය මාහට නොවලහා කියන්න'' යි පවසා ඔහු ශාස්තෘන් වහන්සේ සමීපයට යැවුවාය. ඒ කෝලිය රජු ශාස්තෘන් වහන්සේ වෙත ගොස්, තම බිරිඳගේ පණිවුඩය දැනුම් දුන්නේය. ''ස්වාමීනි ! ඔබවහන්සේ පාදයන් කෝලිය දුව වඳින්නීය'' මෙය ඇසූ ශාස්තෘන් වහන්සේ, ඇය කෙරෙහි අනුකම්පා උපදවා, ''කෝලිය දුව සුවපත් වේවා! සුවසේ ඉතා නිරෝගී පුතෙකු බිහිකරත්වා'' යි වදළහ. රජු එය අසා භාග්‍යවතුන් වහන්සේට වැඳ තම නිවස බලා ගියේය. ඔහු පැමිණීමට පෙර ම සුප්පවාසාවගේ කුසින්, පෙරහන් කඩකින් වැගිරෙන දිය දෝතක් මෙන් දරුවා නික්මුණි. පිරිවරාගෙන සිටි හඬමින් සිටි ජනයා සිනාසුනහ. තුටු පහටු වූ ජනයා රජුට මේ බව දැන්වීමට ඉදිරියට පැමිණි අතර ඔවුන් එනු දුටු කෝලිය රජ, ''මොවුන්ගේ මේ පැමිණීමෙන් ම දසබලයන් වහන්සේ ප්‍රාර්ථනාව එලෙසම ඉටුවීය'' යි සිතීය. ඔහු වහා පැමිණ ශාස්තෘන් වහන්සේ වඳළ වචනය කෝලිය දුවට කීවේය. රජදුව ''නුඹ විසින් ආරාධිත දනය මංගල්‍ය දනයක් ම වේ. යන්න ශාස්තෘන් වහන්සේට සත්දිනක් සඳහා දනයට ඇරයුම් කරන්න'' යි රජු නැවත යැවුවාය. රජු එලෙස ආරාධනා කර සතියක් ම බුදුපාමොක් මහසඟනට මහදන් පැවැත් වීය. සියලු නෑ හිත මිතුරන්ගේ සන්ත්‍රාසයට පත් සිත් නිවමින් උපන් බැවින් දරුවාට ''සීවලී'' නම තැබීය. ඔහුට ගැබෙහි සත් වසරක් විසීමට සිදු වූ හෙයින් උපන් මොහොතේ සිට තනිවම සෑම කටයුත්තක්ම කළ හැකිවිය. ධර්මසේනාපති වූ සැරියුත් තෙරණුවෝ දනය අවසන් වූ සත්වන දින සීවලී කුමරු හා කථාබහ කළහ. ශාස්තෘන් වහන්සේ ද ධම්මපදයේ එන මේ ගාථාව වදළසේක.

''යො ඉමං පළිපථං දුගඤං සංසාරං මොහමච්චගා
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදය නිබ්බුතො තමහං බ්‍රූමි බ්‍රාහ්මණං''

''යමෙක් මේ කෙලෙස්වලින් පිරුණු දුගතියත්, සංසාරයත්, එමෙන් ම මෝහයත් පසු කළේ ද පහකළේ ද පීනා පරතෙරට ගියා වූ භාවනාවේ

ඇලුණු, ස්ථිර වූ, නිසැක වූ කිසිම ගැනීමක් බැඳීමක් නැතිව නිවුණාවූ ඔහු ''බ්‍රාහ්මණයෙකි'' යි මම කියමි.''

ඉක්බිති තෙරුන් වහන්සේ, ''නුඹ විසින් මෙබඳු දුක් රාශියක් විඳි බැවින් පැවිදිවීම සුදුසු නොවේ ද ?'' යි සීවලී කුමරුගෙන් විමසුහ. එවිට දරුවා ''ස්වාමිනි, මම පැවිද්ද කැමැත්තෙමි'' යී පැවසීය. සුප්පවාසාව ''මගේ දරුවා සැරියුත් තෙරුන් සමඟ කථාකරන්නේ යැ'' යි දැක, ඒ බව පවසමින් තෙරුන්වහන්සේ වෙත පැමිණ, ''ස්වාමීනි, ඔබවහන්සේ සමඟ කුමක් කථා කළේ ද ?'' යි විමසුවාය. එවිට තෙරණුවෝ, ''ඔහු විසින් චින්ද දුක් රැස පවසා නුඹ කැමති නම් බුදුසසුනේ පැවිදිවන බව දරුවා පැවසීය'' යි වදළහ. එවිට සතුටු වූ සුප්පවාසාව ''ස්වාමීනි ! දරුවා ගෙන යන්න ඔහු පැවිදිකරන්න'' යි කැමැත්ත දුන්නාය තෙරුන් වහන්සේ සීවලී කුමරු රැගෙන විහාරයට ගොස් ඔහු පැවිදි කිරීමට තව පංචක කර්මස්ථානය දී පැවිදි කරන සේක්, ''සීවලීය! නුඹට වෙනත් අවවාදයකින් වැඩක් නැත. නුඹ ම සත් වසරක් චින්ද දුක් රැස මෙනෙහි කරව'' යි වදළ හ. එවිට සීවලී කුමරු, ''ස්වාමීනි ! නුඹ වහන්සේ මා පැවිදි කරන්න. මවිසින් ඉටුකල හැකි දේ කිරීමට මම දන්නෙමි'' යි පැවසීය. කුමරුගේ පළමු කෙස් රොද කපන විට ම ඔහු සෝවාන් විය. දෙවැනි කෙස් රොද කපන විට සකෘදගාමී ඵලයෙහි ද යනාදී ලෙස සියලු ම කෙස් බා අවසන් වන විට ම පෙර පසු නොවී රහත් ඵලයෙහි පිහිටියේය. එකුමරු පැවිදි වූ දින පටන් භික්ෂුසංඝයාට සිවුපසයේ අඩුවක් නොවිණි. මෙතකින් උන්වහන්සේගේ පැවිදි වීම දක්වා වූ කථාව අවසන් වේ. දැන් ගාථාවේ නිදන කථාව ඇරඹේ.

පසුදිනෙක ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර වැඩිකල්හි, උන්වහන්සේ වෙත පැමිණි සීවලී තෙරුණුවෝ., වැඳ ''ස්වාමීනි ! මගේ පින විමසනු කැමැත්තෙමි. මට පන්සීයක් තෙරවරු දෙන්න'' යි ඉල්ලුහ. බුදුපියාණේ, ''සීවලීය ! කැමතිතාක් භික්ෂූන් රැගෙන යන්න''යි වදළහ. සීවලී තෙරණුවෝ පන්සීයක් තෙරවරුන් තෝරාගෙන හිමවත බලා ගමනාරම්භ කර, කැලයක් මැදින් යෑමට පටන් ගත්හ. එම භික්ෂු පිරිසට නිග්‍රෝධ වෘක්ෂයක අධිශ්‍රිත දේවතාවා සත් දිනක් දන් දුන්නේය. මෙසේ සීවලී තෙරුන් වහන්සේ ප්‍රධාන පිරිසට

''පළමුව නිග්‍රෝධ වෘක්ෂ දේවතාවා ද දෙවනුව පණ්ඩව පර්වත වැසි දේවතාවා ද යන ක්‍රමයෙන් තෙවැනිව අචිරවතියේ දී ද සිවුවැනිව උතුම් සාගරයේ දී ද පස්වැනිව හිමවතේ දී ද සයවැනිව ඡද්දන්ත පර්වතයේ දී

ද සත්වැනි ව ගන්ධමාදන පර්වතයේ දී ද අටවැනිව රේවත පර්වතයේ දී ද යන සෑම තැනකදීම සත් දවස බැගින් දන් ලැබුනහ.''

ගන්ධමාදන පර්වතයේ සිටි නාගදත්ත දෙවිරජ සත්දින තුල එක් දිනක් පිඬුපිණිස කිරි පූජාකළේය. තව දිනක් ගිතෙල් පූජා කළේය. භික්ෂු සංඝයා මේ පිළිබඳව සාකච්ඡා කළහ. ''මේ දේවරාජයාගේ දොවන වැස්සියන් නොපෙනේ, මිදුණු කිරි මැඩීමක් - මිරිකීමක් නොපෙනේ, එනිසා මේ දෙවිරජුට කෙසේ මේ කිරි, ගිතෙල් ද්‍රව්‍ය පූජා කිරීමට හැකි වී ද? යි ඇසුවිට, දෙවිරජ ''ස්වාමිනි! එය නුඹ වහන්සේලා කාශ්‍යප දශබලයන් වහන්සේගේ කාලයේ දී දුන් කිරි සලාක බතෙහි විපාකයකි'' යි පැවසීය. ඊට පසු කාලයක දී ශාස්තෘන් වහන්සේ බදිරවනීය රේවත හිමියන්ගේ පෙරගමන් කිරීම අර්ථෝත්පත්ති කොට සීවලී තෙරුන් තම ශාසනයේ ලාභ, යස දෙකින් අග්‍රප්‍රාප්ත භික්ෂූන්ගේ අග්‍රස්ථානයෙහි තැබුසේක.

මෙසේ ලාභයෙන්, කීර්තියෙන් අග්‍රප්‍රාප්ත වූ සීවලී තෙරුන්ගේ රහත්බවට පත් වීම පිළිබඳව ඇතැම් ආචාර්යවරු මෙසේ කියති. ''ඉහත කී අයුරින් ම ධර්මසේනාපති සැරියුත් තෙරුන් අවවාද දුන් කල්හි, ''යමක් මාවිසින් කල හැකි ද, එය කිරීමට මම දන්නෙමි'' යි පැවිදිව විදසුන් කමටහන වඩමින් එදවස්හිම එක්තරා විවේකී කුටියක් දුක එහි වාසය කළේය. එසේ වැඩ තමා මවුකුස දී සත් වසරක් විඳි දුක සිහිකර, ඒ අනුසාරයෙන් අතීත, අනාගත භව පිළිබඳව සිහිපත් කළ සීවලී තෙරුන්ට තුන්භවය ම ගිනිගත්තාක් මෙන් වැටහුණි. ඤාණය මුහුකුරා ගිය බැවින් විදසුන් විථියට සිත යොමුවිය. එකෙණෙහිම මාර්ග පිළිවෙලින් සියලුම ආශ්‍රව ක්ෂයකර, රහත්බවට පත්විය'' යනුවෙණි. මේ තෙරවරු හෙවත් ආචාර්යවරු දෙපිරිසේම තෙරුන්ගේ රහත් වීම පැවිදි කළ දිනම සිදුවූ බව කියැවේ.

සීවලී තෙරුන් සිවුපිළිසිඹියා පත් ෂඩ් අභිඥාලාභී මහතෙර නමක් විය. ඒ බව අපදාන පාලියේ එන තෙරුන්ගේ චරිතාපදනයේ මෙසේ දක්වේ.

''එකල්හි වරුණ නම් දෙව් රජ වූ මම බල වාහන සහිතව බුදුරජාණන් වහන්සේට උවටැන් කළෙමි. අපි දස්සි බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි සියලු ම තූර්යනාද රැගෙන උතුම් බෝරුක වෙතට ගියෙමි. නැටුම් - ගැයුම් - වැයුම්වලින් යුත්තවූ මම බුදුරජාණන් වහන්සේ ඉදිරියේ මෙන්

බෝරුක අභියස පූජා පැවැත්වීමි. ඒ බෝධිරාජයාට උවටැන් කල මම, එහිම පලක් බැඳගෙන කඵරිය කළෙමි. මෙසේ කරන ලද තම පින්කම් වලින් ප්‍රසන්න වූ සිත් ඇති මම, ඒ බෝධි පූජාවෙහි පැහැදුණු සිතින් නිම්මාණරතී දෙව් ලොව උපන්නෙමි. දෙව් මිනිසුන් අතර උපන් මා, හැටදහසක් තූර්යනාදයෝ පිරිවරාගෙන සිටිති. මීට කල්ප පන්සීයකට පෙර දී සුබාහු නමින් සත්රුවනින් හෙබි සක්විති රජවරු, තිස් හතරක් ව උපන්නෙමි. දැන් මම ත්‍රිවිධ අග්නිය නිවුයෙමි. (භවතුයේ ඉපදීම දුරුකළෙමි) සියලු භවයන් හි ඉපදීම නැතිකළෙමි. මේ සම්බුදුසසුනෙහි අවසන් ශරීරය දරමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ සීවලී තෙරණුවෝ විමුක්ති සුවයෙන් හටගත් ප්‍රීතිවේගයෙන් සතුටු වූ සේක්, සිය සතුට ප්‍රකාශ කරමින් ''**තෙ මෙ ඉජ්ඣිංසු සඞ්කප්පා**'' යන ගාථාව වදළහ.

එහි ''තෙ මෙ **ඉජ්ඣිංසු සඞ්කප්පා යදත්ථා පාවිසිං කුටිං විජ්ඣා** විමුත්තිං පවෙච්ඡසිං'' යනු මවිසින් පෙර කාම සංකල්පාදියේ සිද දැමීමෙන් නෙක්ඛම්මා දී සංකල්ප වෙසෙසින් ප්‍රාර්ථනා කරන ලදී. ''කෙදිනක ඉතා මහත් වූ සැපයකට, දැන් මේ ආර්යන් වහන්සේලා පැමිණ වසන සැපයට පත්වෙමි ද ?'' යි මගේ සිත විමුක්ති සුව ලැබීමෙහි ම යෙදුණි. විමුක්තිය ලැබීමට ම වූ මාගේ සංකල්පනාව, මනෝරථය නිතර ම අප්‍රමාදීව වැඩුයෙමි. එසේ නම් අර්ථයක්, ප්‍රයෝජනයක් නිපදවීමට හෙවත් උපදවා ගැනීමට ශූන්‍ය වූ කුටියකට පිවිස විදසුන් භාවනාව වැඩුයෙමි ද, ඒ මම ත්‍රිවිද්‍යා ඵල විමුක්තිය සොයමින්, ගවේෂණය කරමින් සිටි මාගේ ඒ සෑම ප්‍රාර්ථනාවක් ම ඉටුවිය. සමෘද්ධ විය. ''කුසල සංකල්ප නිෂ්පන්න විය. මනෝරථය පිරිපුන් විය.'' යන අර්ථයයි. එහි සමෘද්ධිමත් භාවය දක්වීමට ''මානානුසයමුජ්ජහං'' යි කියන ලදී. යම් හෙයකින් මානා දී අනුසයන් (සංයෝජන) දුරුකළෙම් ද මුලිනුපුටා බැහැර ලුයෙමි ද එ නිසා ඒ මාගේ ප්‍රාර්ථනාවෝ සමෘද්ධිමත් වුහ. මාන අනුසය ප්‍රහීන වූ වීට ප්‍රහීන නොවූ ක්ලේශ ධර්මයක් නම් නැත. ''රහත් බවට පත්වූයේ මය'' යන අර්ථයයි. මානානුසය ප්‍රහීණ කිරීම උන්වහන්සේගේ අභිලාෂය වූ සංකල්ප සමෘද්ධියට හේතුවක් වශයෙන් මෙසේ දක්වන ලදී.

සීවලී තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සයවන වර්ගයේ ගාථාවන්හි අර්ථ වර්ණනාව සමාප්තයි.

1.7.1

''**පස්සති පස්සෝ**'' යනු ආයුෂ්මත් වප්ප තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? ඔහු පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර සිටුගෙයක ඉපිද වැඩිවියට පත්ව,'' අසුවල් අසුවල් තෙරවරු ශාස්තෘන් වහන්සේගේ පළමු ධර්මදේශනාව පිළිගත්හ'' යි යන්න අසා ඉතා සතුටට පැමිණියේ ය. පසුව භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ තමා තෙරුවන් සරණයන බව පවසා., ''ස්වාමීනි ! මම ද අනාගතයේ දී නුඹ වහන්සේ වැනි සම්බුදුවරයකුගේ ප්‍රථම ධර්මදේශනාව අසන්නවුත් අතුරින් එක් අයෙකුවෙමි වා'' යි ප්‍රාර්ථනා කළේය. ඔහු දිවි ඇති තාක් එලෙසින් පින්දහම් සිදුකොට ඉන් චුතව දෙව් - මිනිස්සු දෙගතියේ සැරි සරා අපගේ බුදුරජාණන් වහන්සේ පහලවන සමයෙහි කපිලවස්තුවේ වාසෙට්ඨ නම් බමුණාගේ පුතෙකු වී උපන්නේය. දෙමාපියෝ ඔහුට වප්ප යන නම තැබුහ. ''අසිත ඍෂිවරයා විසින් සිදුහත් කුමරු සඑඟ වන්නේය'' (බුදුවන්නේය) යනුවෙන් පවසන ලද බැවින් කොණ්ඩඤ්ඤ පුමුඛ බ්‍රාහ්මණ පුතුන් සමග ගෘහවාසය හැරදමා තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වී එකුමරු බුද්ධත්වයට පත් වූ පසුව, උන්වහන්සේ සමීපයට ගොස් බණ අසා නිවන් අවබෝධ කරගන්නෙමි'' යි සිතා උරුවේලාවෙහි වාසය කළේය. මහ බෝසතාණෝ සයවසරක් දුෂ්කර ක්‍රියා කොට, ඉන් වෙන්ව දළ ආහාර ගැනීමට පටන් ගත්කල් හි උන්වහන්සේ හැර දමා ඉසිපතනයට ගිය වප්ප තවුසා, සම්බුද්ධත්වයට පත් වූ ශාස්තෘන් වහන්සේ සත් සති ගෙවා ඉසිපතනයට වැඩ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීමෙන් පසුදින සෝවාන් ඵලයෙහි පිහිටියේය. පස්වන දින අස්සජි කොණ්ඩඤ්ඤාදී තවුසන් සමග ම මහරහත් ඵලයෙහි පිහිටි වප්ප තෙරණුවෝ, සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''දෙව් රජුන් දෙදෙනෙකුගේ මහා සංග්‍රාමයක් එළඹුණි. බොහෝ දෙවියෝ රැස්වූවාහු මහා සෝෂාවක් හටගත්තේය. ලෝකයාගේ පූජාවන් පිළිගත්නා වූ තුන් ලෝ මැනවින් දත් ශාස්තෘ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ අහසෙහි වැඩ හිඳිමින් මහජනයා සංවේගයට පත්කළ සේක. එකෙණෙහි සියලු දෙවියෝ තුටුව බැහැර ලූ ආයුධ හා යුධ ඇඳුම් සහිතව බුදුරජාණන් වහන්සේට වැඳ එකඟ සිතින් පසෙක සිටියහ. අපගේ සිත් දැනගත් බුදුරජාණෝ මේ ශ්‍රේෂ්ඨ වචන ප්‍රකාශ කළ සේක. හටගත් අනුකම්පාවෙන් යුධ ගිනි නිවුසේක.

''එක් ප්‍රාණියකු හෝ නසන දුම්ත සිත් ඇති මනුෂ්‍යයා එම නපුරු සිත නිසා අපායෙහි ම උපදින්නේ ය. යුධ පෙරමුණෙහි බොහෝ ප්‍රාණීන් නසන්නා වූ ඇතකුමෙන් සිය සිත නිවවූ, නැවත නැවත නො නසවූ.''

මෙය ඇසූ යක්ෂ සේනාවෝ විශ්මයට පත් වූහ. තාදි ගුණ ඇති ලෝක නායකයන් වහන්සේගේ සරණ ගිය ඔවුහු යුද්ධය නැවැත්වූහ. පසැස් ඇති බුදුපියාණෝ ජනසමූහයාට කරුණු අවබෝධ කරවා පවින් ගොඩ ගත්හ. දෙවියන් විසින් බලාසිටිය දීම උන්වහන්සේ උතුරු දෙසට වැඩිසේක. ඒ අසිරිය දුටු මම පළමු කොට බුදුන් සරණ ගියෙමි. එහි ආනුභාවයෙන් කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුගතියක නූපන්නෙමි. මෙයින් තිස් දහස් වන කල්පයේ දී රජවරු අතර ශ්‍රේෂ්ඨ වූ මහා දුන්දුභි නාමයෙන් සක්විති රජවරු දසයක් ව සැප වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් නැසුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ තමා ලැබූ සම්පත් ප්‍රත්‍යවේක්ෂා කිරීම වශයෙන් නුවණින් විමසා, ශාස්තෘන් වහන්සේගේ ගුණ අසීමිත බව දැන, ''මෙවැනි බුදුවරයෙකුට බාහුලිකාවදයෙන් කථාකළෙමු. අනේ පුහුදුන් බව නම් අන්ධ අවස්ථාවකි. ඇස් නැති බවකි. ඇස් ඇති බව නම් ආර්යභාවයමයැ'' යි දක්වන සෙක්, **''පස්සති පස්සෝ''** යන ගාථාව වදළසේක.

එහි **''පස්සති පස්සෝ''** යනු සම්‍යක් දෘෂ්ටියෙන් ධර්මයන් දකියි. විපරීත නොවී දනියි, අවබෝධ කරගනියි යන අරුතින් **''පස්සති''** - දකියි යන වචනය යෙදේ. දර්ශන සම්පන්න වූ ආර්ය පුද්ගලයා වනාහී අවිපරීත කොට දකින්නා ''මෙතෙම විපරීත නොවූ දර්ශන ඇත්තෙකි'' යි අවබෝධ කරගනියි. ප්‍රඥාව නම් ඇසින් ධර්මය හා අධර්මය තත්ත්වාකාරයෙන් ම අවබෝධ කරගනියි. හුදෙක් ඇසට පෙනෙන දෙය පමණක් නොව ඇසට නොපෙනෙන දෙය ද වටහා ගනියි. යමෙක් ප්‍රඥා ඇස නොමැතිව ධර්මයෙහි යථා ස්වභාවය නොදනී ද ඔහු, ''ධර්මය නොදන්නා පුහුදුන් වූ අඳබාල ඇස් නැත්තෙකු'' යි තමාගේ ප්‍රඥා නම් ඇසින් අවබෝධ කරගනියි. **''අපස්සතෙනා අපස්සනතං පස්සනතං ච න පස්සති''** යනු ප්‍රඥාව නම් ඇස නොමැති නොදක්නා වූ අන්ධ බාලයා, එබදු වූ ම අඳබාලයකු දැක, ''මෙතෙම ධර්ම අධර්ම දෙක තත් වූ පරිදි නොදනී'' යැයි වටහා නො ගනියි, නො දකියි, නොද නියි, එලෙසින් ම 'තම ප්‍රඥා ඇසින් ධර්ම අධර්ම දෙකෙහි යථාස්වභාවය දකින්නා වූ පණ්ඩිතයා' දැක ''මොහු මෙවැනි ස්වරූප ඇති

උතුමෙකි'' යි වටහා නො ගනියි, නො දනියි, එනිසාම අපි පෙර තවුසන් ව සිටිය දී නිවැරදි දැක්මක් නොවූ හෙයින්, සියලු ඥාන සාගරයේ පරතෙරට ගොස් ලොව සියලු දෙය අතැඹුලක් සේ දන්නාවූ දක්නා වූ භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව අවබෝධ කරගැනීමට අපොහොසත් ව ආවුසෝ වාදයෙන් කථා කළෙමු. උන්වහන්සේ තත්වාකාරයෙන් වටහා නො ගත්තෙමු. දන් වනාහී බුද්ධානුභාවයෙන් යුක්තව ආයර්‍යයන් ද පුහුදුන් පුද්ගලයන් ද තත් වූ පරිදි අවබෝධ කරගැනීමට දැකීමට සමත් වෙමි. සේවනය කළයුතු නො කළ යුතු ධර්‍මයන්හි හා පුද්ගලයන් කෙරෙහි තමන් වහන්සේගේ අවිපරීත ප්‍රතිපත්තිය මෙසේ දක්වූහ.

වජ්ජ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.2

''එකකා මයං අරඤ්ඤෑ'' යන ගාථාව ආයුෂ්මත් වජ්ජිපුත්ත තෙරුන් විසින් පැවසූවකි. එහි උපත කෙසේ ද ? මොහුද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන් හි දී නිවන් පතාගෙන පින් රැස්කළේය. මෙයින් කල්ප අනූ එකකට පෙර විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද වැඩිවියට පැමිණ, එක් දිනක් බුදුරජාණන් වහනන්සේ දැකීමෙන් උපන් ශ්‍රද්ධාව නිසා පැවිදිවිය. කරන ලද පුවි කටයුතු ඇති වජ්ජිපුත්ත තෙරණුවෝ කමටහන් ගෙන විශාලා මහනුවරට නුදුරුව එක්තරා වන ලැහැබක වාසය කරති. එකල්හි විශාලා මහනුවර මහත් වූ උත්සවයක් විය. ඒ ඒ තැන නෘත්‍ය ගීත වාදනයන් පැවැත්විණි. මහජනයා තුටු පහටු වූ සිතින් උත්සව සිරි නරඹති. උත්සව සම්පත් විඳිති. එය ඇසූ වජ්ජිපුත්ත තෙරණුවෝ අනුවණින් පැවිද්ද ගැන කළකිරී, විවේක සුවය නොසලකා හරිමින් කමටහන ඉවත දමා තම නො ඇල්ම මෙසේ ගාථාවකින් පැවසුහ.

''එකකා මයං අරඤ්ඤෑ විහරාම
අපවිද්ධංව වනස්මිං දරුකං
එතාදිසිකාය රතියා
කොසුනාම අමොහි පාපියෝ''

''වනයේ හැර දැමූ දරකඩක් මෙන් අපි හුදකලාව මේ වනයේ වසමු. මෙවැනි සුන්දර වූ රාත්‍රියෙහි ප්‍රීතිවීමට නොහැකිව සිටින කවරෙක් නම් අප වැනි පවුකාරයෝ වෙත් ද ?''

එය ඇසූ වන ලැහැබට අධිගෘහිත දේවතාවා ඒ භික්ෂුව කෙරෙහි අනුකම්පා උපදවා, ''මහණ ! නුඹ ඉදින් අරණ්‍ය වාසය අප්‍රිය කරමින් සිටින්නෙහිය. විවේක සුව කැමති නුවණැත්තෝ නුඹට ගෞරව කරත් ම ය'' යන අර්ථය දක්වමින් මේ ගාථාව පැවසීය.

''එකකො ත්වං අරඤ්ඤෑ විහරසි - අපවිද්ධං ව වනස්මිං දාරුකං
තස්ස තෙ බහුකා පිහයනති - නෙරයිකා විය සග්ගගාමිනං''

''වනයේ හැර දැමූ දරකඩක් මෙන් නුඹ වනයේ හුදකලාව වෙසෙන්නෙහිය. නුඹට බොහෝ දෙනා ප්‍රියකරති. ස්වර්ගයට යනු කැමති නිරිසතුන් මෙනි'' ''මහණ ! නුඹ කෙසේ නම් මේ නෛෂ්ක්‍රාණික වූ සම්බුදු සසුනෙහි පැවිදි වී, නිවනට අයත් නොවූ විතර්ක මෙනෙහි කරන්නෙහි ද ?'' යි එම තෙරුන් සංත්‍රාසයටත් සංවේගයටත් පත් කළේය. මෙසේ ඒ වජ්ජිපුත්ත තෙරුන් ඒ දෙවියා විසින් සංවේගයට පත් කරන ලදුයේ, කසපහර ලැබූ ආජානීය අශ්වයකු මෙන් විඳසුන් භාවනාවට සිත යොදවා නොබෝ වේලාවකින් ම විදසුන් වඩා රහත්ඵලයෙහි පිහිටියේය.

අපදන පාළියේ උන්වහන්සේ තම චරිතාපදනය මෙසේ දක්වා ඇත.

''රන්වන් වූ සිරුරක් සහිත හිරු මෙන් බබලන රැස් ඇති, සියලු දිශා බබුලුවන පුන් සඳ වැනි වූ සාගරවලින් පිරිවරාගත් පොළව මෙන්, සවුවන් විසින් පිරිවරාගත් විපස්සි බුදුරජාණන් වහන්සේ දුටුයෙමි. උන්වහන්සේ ට නාමල් රේණු වලින් පූජා කළෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර මේ රේණු පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුදු පුදෙහි විපාකය මෙබඳුය. මෙයින් කල්ප සතලිස් පහකට පෙර මහ බල ඇති සත්රුවනින් හෙබියා වූ රේණු නම් සක්විති රජුව සුව වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් ඵලය ලබාගත් වජ්ජිපුත්ත තෙරණුවෝ එම රහත් ඵල ප්‍රාප්තියට අංකුසයක් වැනි වූ තමාගේ ද දේවතාවාගේ ද ගාථා දෙක සිහිපත් කර

''එකකා මයං අරඤ්ඤෙ විහාරාම
අපවිද්ධං' ව වනස්මිං දාරුකං
තස්ස මෙ බහුකා පිහයන්ති
නෙරයිකා විය සග්ගගාමිනං ''

යන ගාථාව වදළහ. එහි අර්ථ මෙසේ ය. ''අපේක්ෂාවක් නොමැතිව වනයේ විසි කර දැමූ දරකඩක් මෙන් ඉදින් අපි හුදකලාව, තනිවම, කිසිදු හවුහරණක් නොමැති ව මේ වනයේ වෙසෙමු. මෙසේ වසන මා හට බොහෝ දෙනා ප්‍රිය කරති. මා පිළිබඳව සිහිකරන තමාට වැඩ කැමති කුල ප්‍රත්‍රයෝ මා වැන්නන් වීමට ප්‍රාර්ථනා කරති. ''අහෝ ! ඒකාන්තයෙන් අපිත් මේ වජ්ජිපුත්ත තෙරුන් මෙන් ගිහිගේ අත්හැර දමා අරණ්‍යයෙහි වාසය කරමු නම් යෙහෙකි'' යනුවෙන් සිතති. ඒ කෙසේ ද ? ස්වර්ගයට (දෙව් ලොව) යනු කැමති නිරයේ වසන්නෝ මෙනි. යම් සේ නිරයේ වූ වෝ තමා ම කළ පාපකර්මයෙන් නිරයේ ඉපදුනාහු, දෙව් ලොව යෑමට හා දෙව් ලොව සැප විඳින්නෙමු නම් මැනවි'' යි සිතති, පතති, එවැනි වූ සම්පත්තියකි මේ පැවිද්ද'' යන අර්ථයයි.

මෙහි දී තමා කෙරෙහි ගෞරවාර්ථ බහුවචන ප්‍රයෝගය කැමති බැවින් ''අපි හුදකලාව වසමු'' (එකකං මයං විහරාම) යනුවෙන් පැවසීය. නැවත එහි අර්ථය ඒ කවචන බව දක්වනු සඳහා ''ඒ මට'' (තස්සමෙ) යනුවෙන් ඒ කවචන ප්‍රයෝගය යෙදුණි. ඒ තෙරුන්ට ද ස්වර්ග ගාමීවනු කැමති වීමට ද යන දෙකටම ප්‍රියකරති (පිහයන්ති) යන පදය යෙදිය යුතුයි. එහි දුතියා විභක්තියෙහි සම්ප්‍රදන විභක්ති අර්ථය දැකිය යුතුයි. එලෙස ප්‍රාර්ථනා කිරීම ද තමන් වහන්සේ බඳු වූ අරණ්‍යයෙහි විසීම් ආදී ගුණ පතන්නවුන්ගේ වශයෙන් ද ''සැම දෙන එසේ පතත්වා'' යි පවසමින් මේ ගාථාව දේශනා කරන ලදී. ''තස්ස මෙ'' යනු ''ඒ මා සමීපයේ ඇති, මා ලඟ ඇති ගුණයන් හි'' යන අර්ථයයි.

වජ්ජිපුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.3

''වුතා පතනති'' යනු අයුෂ්මත් පක්ඛ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි දී කළ ප්‍රාර්ථනා ඇති ව ඒ ඒ භවයන්හි දී පින් කරමින් කුසලතා සපුරා ගත් හ. මෙයින් කල්ප අනූ එකකට පෙර යක්ෂ සෙන්පතියකුව ඉපිද විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක - පැහැදුණු සිතින් දිව්‍යමය වස්ත්‍රයන්ගෙන් උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරි සැරූ හෙතෙම, අපගේ බුදුපියාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි ශාක්‍ය ජනපදයේ දේවදහ නියම්ගම වූ ශාක්‍ය රජ පවුලක උපන්නේ ය. සම්මෝද කුමාරයා නමින් ඔහු ප්‍රසිද්ධ විය. ඔහු කුඩා කාලයේ වාත රෝගයක් නිසා පාද අක්‍රිය විය. එනිසා සුළු කාලයක් කොරෙකු මෙන් එහි මෙහි (ඔබිනොබ) ගියේ ය. මෙනිසා ''පක්ඛ'' (කොරා) නාමයෙන් ද ඔහු ප්‍රසිද්ධ විය. පසුව එම රෝගය සුව වුවත් එම නාමය ම ව්‍යවහාර විය. එකුමරු භාග්‍යවතුන් වහන්සේ කපිල වස්තුවට වැඩි පළමු අවස්ථාවේ වූ පෙළහර දැක උපන් ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි විය. කරන ලද පූර්ව කටයුතු ඇති පක්ඛ තෙරුන් සුදුසු කමටහන් ගෙන අරණ්‍යයෙහි වාසය කළේය. එක් දිනක් ගමේ පිඬු පිණිස හැසිරීමට එන අතරමග වූ රුක්මූලක උන්වහන්සේ විවේක සුවයෙන් වැඩහුන් හ. එවිට එක්තරා උකුස්සෙකු මස් වැදුල්ලක් රැගෙන අහසින් යනු දුටුවහ. බොහෝ උකුස්සෝ වහා එතැනට අවුත් ඒ මස් වැදුල්ල උදුරා ගත්හ. පළමු උකුස්සාගේ මුවින් ගිලිහුණු එය තව උකුස්සෙකු ඩැහැ ගත්තේය. තව උකුස්සෙකු නැවත එය පැහැර ගත්තේය. මෙම සිදුවීම දුටු තෙරුන් වහන්සේ, ''මේ මස් වැදුල්ල මෙන් කාමයෝ ද සැමට සාධාරණ ද බොහෝ දුක් ගෙනදෙන, බොහෝ උවදුරු ඇතිකරන්නේ ද වෙති.'' යනුවෙන් කාමයේ ආදීනව ද නෙක්ඛම්මයේ ආනිසංස ද සිහිපත් කළහ. විදර්ශනාවෙහි සිත පිහිටුවා ගත් උන්වහන්සේ අනිත්‍යාදී වශයෙන් සෑම දෙයක් පිළිබඳව ම මෙනෙහි කරමින් පිඬු පිණිස හැසිර, දනය වළඳ දවල් වසන තැන හිඳ විදසුන් භාවනාව වඩා රහත්ඵලයෙහි පිහිටියහ. උන්වහන්සේගේ චරිතාපදනය අපදාන පාළියේ මෙසේ දැක්වේ.

''ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ විපස්සි නම් භාග්‍යවතුන් වහන්සේ එදා සැට දහසක් භික්ෂූන් සමග බන්ධුමතී නගරයට පිවිසි සේක. නුවරින් නික්ම දීප චෛත්‍ය ස්ථානයට ගිය මම කෙලෙස් දුවිලි බැහැර ලූ, ලෝකයාගේ පූජාවන්ට සුදුසු වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. අසූ දහසක් යක්ෂයෝ මා පිරිවරාගෙන තව්තිසා වැසි දෙවියෝ ශක්‍රයාට

කරන්නාක් මෙන් මට උපස්ථාන කරති. එද මම බුදුරජාණන් වහන්සේ දැක පැහැදී, භවනයෙන් නික්ම වස්තුයක් පුද උන්වහන්සේට වැන්දෙමි. අහෝ ! බුදුරජාණෝ අසිරිමත් වෙති. ධම් රත්නය ද අසිරිමත්ය. අපගේ ශාස්තෘ සම්පත්තිය ද අසිරිමත් ය. බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් මේ පෘථිවිය ද කම්පා විය. ආශ්චර්ය ජනක ලොමු දහැ ගන්නා වූ එම විස්මය දුටු මම තාදී ගුණ ඇති ද්විපදෝත්තම බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත පැහැද වීමි. එසේ සිත් පහදවා වස්තුය පූජා කළ මම ඇමති සහිත පිරිවර සමග ම උන්වහන්සේ සරණ ගියෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පින්කමක් කළෙමි ද ඒ හේතුවෙන් දුගතියක නූපන්නෙමි. බුදු පුදෙහි විපාකය එබඳුය. මීට කල්ප පසළොසකට පෙර සත් රුවනින් හෙබි මහත් බල ඇති සුවාහන නම් සක්විති රජවරු දසය දෙනෙක් වූ මම දැන් සියලු කෙලෙස් නැසූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වීමට උපකාර වූ ඒ සංවේග වස්තුව ම අංකුසයක් කරගෙන විඳසුන් වඩා සත්‍යාව බෝධ කරගත් උන්වහන්සේ එම සිදුවීම ම ප්‍රකට කිරීම වශයෙන් ද සිය රහත්බව ප්‍රකාශ කිරීම සඳහා ද ''චුතා **පතනති**'' යන ගාථාව වදළහ.

එහි ''**චුතා**'' යනු ගිලිහුනා හු, ''පතනති'' යනු අනුක්‍රමයෙන් වැටෙති. ''**පතිතා**'' යනු වචන වශයෙන් භූමියට වැටෙන, අහසෙහි ගිලිහී වැටුණු, බිමට වැටෙන ''ගිද්ධා'' යනු ගිජුබවට පැමිණි. ''පුනරාගතා'' යනු නැවත වරක් අල්ලාගනියි. ''ව'' ශබ්දය සැමතැනම යොදූ අර්ථ ගත යුතුයි. මෙම ගාථාවේ අදහස මෙසේය. - මුවින් ගිලිහී අනුක්‍රමයෙන් වැටෙන මාංශ පේශිය (මස් වැද්දල්ල) බිම පතිත වුවත්, අනික් උකුස්සකුගේ මුවින් ගිලහුනත් ගිජු වූ සියලුම උකුස්සෝ නැවත අවුත් එය ඩැහැගනිති. මේ දිගුසසර හැසිරෙන සත්ත්වයෝ ද මෙම උකුස්සන් බඳු වෙති. යමෙක් කුසල් දහම්වලින් වැටුනේ ද ඔවුහු නිරයාදියේ උපදිති. මෙසේ දුකට වැටුණු සම්පත්හි භවයේ සිටී ඔවුහු; එහි කම් සුව විඳීම වශයෙන් කාම, රූප, අරූප භවාදියෙහි පවතින දඩි ආශාව නිසා නැවත නැවත උපදිති. භව උපතින් නොමිදුණු බැවින් ඒ ඒ භව ගාමී කර්ම හේතුවෙන් ඒ ඒ භවයන්හි ඉපිද දුක් විඳිති. මේ සත්ත්වයෝ මෙසේ සසර දිගටම පවතිති. මම වනාහී කළයුතුදේ කළෙමි. පරිඤ්ඤාදී (පිරිසිඳ දැනී) භේද සහිත සොළොසක් (දසයක්) වූ කටයුතු නිමකළෙමි. නැවත මා හට කළ යුත්තක් නොමැත. ඇලිය යුතු, රමණය කළයුතු, උතුමන් විසින් ආශ්‍රිත වූ රම්‍ය වූ නිවණෙහි - සංඛත

ධාතුවෙහි ඇලුණෙමි. විශේෂයෙන් ඇලුණෙමි. රම්‍ය වූ ඒ සුවයෙන් සුවපත් වූයෙමි. එල සමවත් සුවයෙන් අත්‍යන්ත සුවදයක නිවණට අනුපිළිවෙලින් පැමිණියෙමි. සුවයෙන් හෝ සුවදයි පිළිවෙලින් හෝ විඳසුන් සුවයෙන් ද මාර්ග සුවයෙන් ද මම එල සුවයට ද නිර්වාණ සුවයට ද අනුපිළිවෙලින් පැමිණියෙහි.'' මෙලෙස ගාථාවේ අර්ථ දැනගත යුතුයි.

පක්ඛ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.4

''දුමඛායාය උපපන්නො'' යනු විමල කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද?. පෙර තෙරවරු මෙන්ම විමල කොණ්ඩඤ්ඤ තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහිදී කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හි දී සසරින් මිදීම සඳහා කුසල් රැස්කරගත් අයෙකි. මෙයින් කල්ප අනූ එකකට පෙර පහළවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ, මහත් ධනවත් කුලයක ඉපිද වියට පත්වූ හෙතෙම; මහ පිරිස් පිරිවරා දම් දෙසන භාග්‍යවතුන් වහන්සේට පැහැදුණු සිතින් රන්මල් සතරකින් පූජා පැවැත්වීය. එය දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ශ්‍රද්ධාව වැඩි දියුණු කිරීමට ඊට සුදුසු ප්‍රාතිහාර්යයක් දක්වූ සේක. ඒ මල් වැනි වුම රන්මය ප්‍රභාවක් ඒ සියලු ප්‍රදේශයේම පැතිරුණි. එම අසිරිය දුටු ඔහු බොහෝ සෙයින් පැහැදී, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එම උතුම් පෙළහරම සිහිකරමින් නිවසට ගියේය. බුද්ධාරම්මණ ප්‍රීතියෙන් ම කිසියම් රෝගයක් වැළඳී මරණයට පත්ව තුසිත දෙව්ලොව ඉපිද සැප වින්දේය. සසර තව තවත් කුසල් රැස්කරමින් කාම සුගතීන්හි ම සැරි සැරූ ඔහු; මේ බුද්ධෝත්පාද කාලයෙහි බිම්බිසාර රජුට දව අම්බපාලිගේ කුසෙහි පිළිසිඳ ගත්තේය.

බිම්සර රජු තරුණ කාලයේ දී අම්බපාලියගේ රූපසම්පත්තිය අසා හටගත් කැමැත්ත ඇතිව, මිනිසුන් කිහිප දෙනෙකු සමග වෙස් වලාගෙන විශාලාවට ගොස් එක් රැයක් ඇය සමඟ සංවාසයෙහි යෙදුණේය. එවිට මොහු ඇගේ කුසෙහි පිළිසඳ ගත්තේය. අම්බපාලිය ද ගැබ පිහිටි බව රජුට දැනුම් දුන්නාය. රජුද තමා කවුදැයි පවසා ඇයට දිවයුතු ද්‍රව්‍ය පරිත්‍යාග කර ගියේය. ගැබ මුහුකුරා ගිය ඇය පුතෙකු වැදුවාය. ඔහුට විමල යන නම තැබුවාය. පසුව විමල කොණ්ඩඤ්ඤ නාමයෙන් ප්‍රකට විය. වැඩිවියට පත්

ව භග්‍යවතුන් වහන්සේ විශාලාවට වැඩම වූ මොහොතේ බුදුසිරි දැක පැහැදුණු සිතින් පැවිදි වූ විමල කොණ්ඩඤ්ඤ තෙරුන් පූර්ව කටයුතු නිමවා දිනකින්ම සියලු කෙලෙස් නසා රහත් ඵලයෙහි පිහිටියේය.

අපදානපාළියෙහි උන්වහන්සේ මෙසේ සිය චරිතාපදානය දක්වූහ.

''ලෝක ජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ මහත් ජනකායට නිර්වාණය පිළිබඳව ධර්ම දේශනා කරන සේක. තාදිගුණ ඇති ද්විපදෝත්තම වූ උන්වහන්සේගේ ධර්මය ඇසූ මම රත්මල් සතරක් පූජා කළෙමි. එකල් හි යම්තාක් දුර පිරිස පැනිර සිටියේද ඒතාක් දුර පැනිරී රන් පියස්සක් මැවුණි. බුදු රැස් ද රන් රැස් ද මිශ්‍රව ආලෝකය මහත් විය. ඔද වැඩි සිතින් සතුටට පත්වූ මම; ජනයාට මෙලොව සැපගෙන දෙන, ප්‍රීතිය උපද වන බුදුරජාණන් වහන්සේට ආයාචනා කොට, මනාව්‍රත ඇති උන්වහන්සේ වැඳ අවසර ගෙන මගේ ගෙදර ගියෙමි. නිවසේ සිටි මම බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ සිහිකළෙමි. එසේ සිත් පැහැදවීම නිසා මම තුසිත භවනයෙහි උපන්නෙමි. මෙයින් කල්ප අනූඑකකට පෙර යම් බුද්ධ පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. මෙයින් කල්ප සතලිස් තුනකට පෙර දී මහත් බල ඇති නේමි සම්මත නම් සක්විති රජවරු දසය දෙනෙක්ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ විමල කොණ්ඩඤ්ඤ තෙරහු සිය රහත් බව ප්‍රකාශ කරන සේක්; ''දුමඛායය'' යනාදී ගාථාව වදළහ.

එහි ''දුමඛායය'' යනු අඔගස් සමූහයෙන් තැබූ නම් ඇති අම්බපාලියට යන අර්ථයයි. ආධාරාර්ථයේ මෙහි සත්තමී විභක්තිය යෙදී ඇත. **''උපපජ්ජතෙහා''** යනු ඇගේ කුසේ උපන්. ඉපදුණාවු **''ජාතො පණ්ඩර කෙතුනා''** යනු සේසත් (සුදුකුඩය) දරු බැවින් ''පණ්ඩර'' සුදු කොඩි දරන්නා නම් වූ බිම්සර රජුට දව උපන් ඔහු නිසා උපන් පළමුවූ උපත දැක්වීම සඳහා මේ දෙදෙනාගෙන් උපන්නේයැයි මේ ජාතියේ(අත්මභාවයේ) පහළවීම දැක්විණි. වැදුවා වූ කාලයේ පටන් ''උපන්නේ ය'' යන වහර ලොව පවතී. මෙහි දී ''අම්බපාලියට පුත්ව උපන්නෙමි'' යන්නෙන් තමා උසස්කර දැක්වීම දුරුකරයි. නොයෙක් ස්වාමි, ප්‍රත්‍යන්ගේ ද විශේෂාධිගම ලාභය ද මෙයින් දක්වයි. ''සේසත දරන රජුට දව උපන්නෙමි'' යන මේ ප්‍රකාශයෙන් දැනගත් විශිෂ්ට පියා දැක්වීම් වශයෙන් අනුන් විසින් හෙළා

දූකීම දුරුකරයි. ''**කෙතුහා**'' යන්නෙන් ''මානය දුරුකළෙමි'' යි කියයි. මානය කැමති සේ අවබෝධ කරගත්තෙමි යි කියයි. තත්වු පරිදි දූනගත්තෙමි. ''කෙතුනායෙව'' ප්‍රඥාවෙන් ම ප්‍රඥාව වනාහී නිවැරදි ධර්මයන් හි අවබෝධ කිරීම් වශයෙන් ඉතා උස්ව නැගි අරුතින් ද මරසෙනග මැඩලීමෙහි පුර්වංගම වූ අර්ථයෙන් ද ''ආයර්යන්ගේ ධජය'' නම් වේ. ඍෂිවරුන්ගේ ද ධජය වූ ඒ ප්‍රඥාව නම් ධර්මයෙන් ''**මහාකෙතුං පධංසයි**'' මහත් වූ විෂය ඇති බැවින් ද මහත් වූ සෙය්‍යමාන, ජාති මානාදී ප්‍රභේද සහිත බොහෝ මානයන් ගෙන් යුක්ත වූ බැවින් ද සෙසු දහම් මනාව ඔසවාගත් බැවින් ද එම පාපී ධර්ම ධජයක් වූ මේ පාපී මාරයාම ''මහාකේතු'' නම් වේ. ඒ මාර බලය විද්වංසනය, අතික්‍රමණය කිරීම් වශයෙන් අභිභවනය කළෙමි. නිර්වාණය සේවනය කළෙමි. ''මහා ධජය හෙවත් මාරයා පැරදුවෙහිය'' යනුවෙන් තමා වෙනත් අයෙකු මෙන් දූක්වීම් වශයෙන් (ආත්ම සංකල්පයෙන් බැහැර ව) සිය රහත්ඵලය ප්‍රකාශ කරන ලදී.

විමල කොණ්ඩඤ්ඤ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.5

''**උකෙඛපකටවච්ඡසස**'' යනු ආයුෂ්මත් උක්ඛේපකට වච්ඡ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී කුසල් රැස්කරගත් සසරින් මිදීම කැමති පින්වතෙකි. මෙයින් කල්ප අනූහතරකට පෙර පහළ වූ සිද්ධත්‍ථ බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී කුලවත් ගෙයක ඉපිද, වැඩිවියට පැමිණි මොහු ශාස්තෘන් වහන්සේ උදෙසා (සඳහා) ශාලාවක් සාදන්නා වූ කම්කරු පිරිසකට එක් ටැඹක් අවශ්‍ය බව දූන එම ටැඹ පූජා කොට එම උතුම් පින්කමට සහාය විය. ඒ පින්කමෙන් දෙව් සැප විඳි හෙතෙම තව තවත් පින්දහම් සිදුකර කාම සුගතීන් හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත් නුවර එක් බමුණු පවුලක උපන්නේය. වච්ඡ යනු ඔහුට ගෝත්‍රයෙන් තැබූ නාමයයි. වච්ඡ බමුණා භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය අසා උපන් ශ්‍රද්ධාව නිසා පැවිදි විය. කොසොල් රට ගම් ආවාසයක වසනුයේ තමා වෙත පැමිණි භික්ෂූන් වහන්සේගෙන් ධර්මය උගන්නා වච්ඡ තෙරණුවෝ ''මේ විනය ශික්ෂාය, මෙ සූත්‍ර පිටකයයි, මේ

අභිධම්ම යි'' යනුවෙන් වෙන් වෙන් ව වටහා ගැනීමට අසමත් වුහ. එක් දිනක් ආයුෂ්මත් දම්සෙනෙවි සැරියුත් තෙරුන්ගෙන් විමසා වෙන් වෙන් වශයෙන් මනාව වටහාගත්හ. පළමු ධම් සංගීතියට පෙරත් පිටක ආදි පැනවීම් පර්යාප්ති සද්ධම්යෙහි ව්‍යවස්ථාපිත වුයේ මය. භික්ෂූන්ට ''විනයධර'' ආදි ව්‍යවහාරයන් පැවතුණේ එහෙයිනි. වච්ඡ තෙරණුවෝ ද ත්‍රිපිටක බුදුවදන ඉගෙන නැවත නැවත විමසනුයේ එහි කියැවෙන රූපාරූප ධම් පිළිබඳව සිත මෙහෙයවා, විදසුනෙහි පිහිටා සිහිකරනුයේ නොබෝ කලකින්ම රහත්වුහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වුහ.

''සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට මහත් වූ උපාසක පිරිසක් විය. ඔවුහු බුදුසරණ ගියාහු තථාගතයන් වහන්සේ අදහති. ඔවුහු සියලු දෙන එකතුව සාකච්ඡා කොට භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන ශාලාවක් සෑදුහ. ඊට එක් ටැඹක් මදි වූ හෙයින් ඔවුහු මහවනයෙහි එය සෙවූහ. මම ඒ උපාසක සමුහයා වනයේ සිටිනු දැක, ඔවුන් වෙත පැමිණ අදිලි බැඳගෙන ඔවුන්ගෙන් ''කුමක් සොයමි ද ?'' යි විචාළෙමි. මා විසින් විචාරණ ලද ඒ සිල්වත් උවසුවෝ ''අපි උපස්ථාන ශාලාවක් කරනු කැමැත්තෙමු. ඊට එක් ටැඹක් නොමැතිව එය සොයමු.'' එවිට ඔවුන්ට මම, ''ඒ ටැඹ මම දෙන්නෙමි. මම එය ගෙනවුත් ශාස්තෘන් වහන්සේට පුදන්නෙමි. එනිසා එය සෙවීමට නුඹලා වෙහෙස නොවෙත් වා'' යි පැවසීමි. ඊට පැහැදුණු ඔවුහු සතුටු සිතින් ඒ ටැඹ මා හට පැවරූහ. එම වචන කී ඔවුහු පෙරළා තම තමන්ගේ නිවෙස් බලා ගියහ. ඒ උපාසක පිරිස ගිය නොබෝ වේලාවකින් මම ටැඹක් දුටුවෙමි. තුටු සිතින් එය ඔසවා ගත් මම බුදුරදුන්ට පූජා කළෙමි. එසේ සිත් පැහැදවීම නිසා මා හට මහල් සීයකින් හෙබි දිව්‍ය විමානයක් පහළවිය. එකල බෙර වයන විට දෙව් පිරිස් මා පිරිවරා ගත්හ. මෙයින් කල්ප පනස් පහකට පෙර යසෝධර නම් රජෙක් වූයෙමි. එහි දී ද මට මහල් සීයක් ඇති උඩට නැගුණු උතුම් කුළු ගෙවලින් හෙබි එක් ටැම් ඇති මනහර වූ භවනක් පහල විය. මෙයින් විසි එක් වන කල්පයේ උදේන නම් ක්ෂත්‍රියෙක් වූයෙමි. එ කල ද මට මහල් සීයක් සහිත උස් වූ මාලිගයක් පහළ විය. මා උපනුපන් දිව්‍ය මනුෂ්‍ය ආත්මයන් හි සැම සැප සම්පතක් ම විඳින්දෙමි. එක් ටැඹක් පිදීමේ පුණ්‍ය විපාක මෙබඳුය. මීට කල්ප අනූ හතරකට පෙර ටැඹක් පිදුවෙමි ද එදා සිට මේ දක්වා ම දුගතියක නුපන්නෙමි. එක් ටැඹක් පිදීමේ පුණ්‍ය ඵලය මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් ව, කොට නිමවූ කටයුතු ඇති ව නොපසුබට උත්සාහයෙන් තමන් වහන්සේ වෙත පැමිණියා වූ ගිහි - පැවිදි සැමට අනුකම්පා උපදවා ත්‍රිපිටක බුද්ධ වචන විමසා ධර්ම දේශනා කළ සේක. එසේ දම් දෙසූ එක් දිනෙක තමා අනිකකු මෙන් දක්වමින්

''උක්ඛෙපකටවච්ඡස්ස සඞ්කලිතං බහූහි වස්සෙහි
තංභාසති ගහට්ඨානං සුනිසින්නෝ උළාරපාමොජ්ජෝ''

යන ගාථාව වදාළහ.

එහි ''උක්ඛෙපකටවච්ඡස්ස'' යනු කරන ලද පුහුණුවීම් ඇති භික්ෂූන් සමීපයෙන් වෙන වෙන ම උගත් විනය, සූත්‍ර හා අභිධර්ම වෙන් වෙන් ව දැක්වෙන විනය, සූතාභිධර්මයන් ම මෙනෙහි කර සජඣායනා කිරීම් වශයෙන්., ඒ ඒ තැන් මනාව පිරිසිද දැන සිටි උක්ඛේපකටවච්ඡ තෙරුන් විසින් තෘතියා විභක්ති අර්ථයේ ෂට්ඨී විභක්තිය යෙදුණු වචනයකි. ''සඞ්කලිතං බහූහි වස්සෙහි'' යනු බොහෝ වසර ගණනක් සම්පිණ්ඩනය කිරීම් වශයෙන් හදවතේ තබා රැස්කරන ලද, ''සඞ්කලිත'' යන පාඨය ද සුදුසුය. සැකිල්ලක් මෙන් කරන ලද, ඒකාබද්ධ වශයෙන් වාචොද්ගත කරන ලද යම් බුද්ධවචනයක් වේ ද එය ''තං'' යනු ඒ පර්යාප්ති ධර්මය කියයි, පවසයි. ''ගහට්ඨානං'' යනු ගිහියෝ බොහෝ බැවින් කියන ලදී. ''සුනිසින්නෝ'' යනු ඒ ධර්මයෙහි යහපත් ව නිශ්චලව හුන්. ''ලාභ සත්කාරාදියේ ඇලීමක් නොමැතිව හුදෙක් විමුක්තියෙහි ම පිහිටා දම් දෙසමි'' යන අර්ථයයි. එනිසා ''උළාරපාමොජ්ජෝ'' යනුවෙන් ''ඵල සමවත් සුවයන් වශයෙන් දම්දෙසුම අවසන උපදින්නා වූ මහත් වූ ප්‍රමෝදය ඇතිව'' යන්න කියන ලදී. මේ ගාථාවේ අදහසය නම් ''ඇවැන්නි යම්සේ භික්ෂුවක් ඇසු පරිදි, පයර්‍යාප්ති වශයෙන් හදළ පරිදි ධර්ම සවිස්තර ව අන්‍යයන්ට දේශනා කරන්නේ ද එලෙසින් ම මේ සම්බුදු දහමෙහි අර්ථාවබෝධය ඔහු ලබයි. ධර්මාවබෝධය ද ලබයි. ධර්මානුකූල ප්‍රමෝදය - ප්‍රීතිය ද ලබයි.''

උක්ඛේපකටවච්ඡ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.6

''අනුසාසි මහාවීරො'' යනු ආයුෂ්මත් මේඝිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවිද? පෙර බුදුවරු හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී කුසල් දහම් රැස්කරගත් උන්වහන්සේ; මෙයින් කල්ප අනූ දෙකකට පෙර පහළ වූ විපස්සි බුදුරජාණන් වහන්සේගේ දවස සිටුගෙයක උපන්හ. වියට පැමිණ සිටි සමයේදී විපස්සි භාග්‍යවතුන් වහන්සේ සියලු බුද්ධකෘත්‍යයන් නිමවූසේක් ආයුසංස්කාරය අත්හළ සේක. ඉන් පොලෝ කම්පාවීම් ආදිය ඇතිවූ විට මහජනයා බියට තැතිගැනීමට පත්විය. එවිට වෙසවුණු මහරජතුමා ඊට හේතු පවසා ජනයාගේ සැක බිය දුරු කළේය. එම කාරණය ඇසූ මහජනයා සංවේගයට පත්විය. මේ කුලපුත්‍රයා ද බුද්ධානුභාවය අසා ශාස්තෘන් වහන්සේ කෙරෙහි උපදවාගත් ගෞරව බහුමානයෙන් යුතුව මහත් වූ ප්‍රීති සොම්නසක් වින්දනය කළේය. එම පින්කමෙහි විපාක වශයෙන් දෙව් - මිනිස් ආත්මභාවයන්හි ම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිල වස්තුවේ ශාක්‍ය රජ පවුලක උපන්නේය. මේඝිය නමින් ප්‍රකටව වියට පත්වූ ඒ කුමරු භාග්‍යවතුන් වහන්සේ සම්පයෙහි පැවිදිවිය. උන්වහන්සේට උපස්ථාන කරමින්, භාග්‍යවතුන් වහන්සේ සමඟ ඡාලිකාවෙහි වාසය කරන කල්හි; කිපිල්ලිකා නදී තෙර අඹවනයක් දුටු මේඝිය තෙරණුවෝ එහි වසනු කැමති වූහ. දෙවරක්ම භාග්‍යවතුන් වහන්සේ විසින් වැළකූ නමුත් තෙවනවර අවසර දුන්හෙයින් එහි වැඩි මේඝිය තෙරුන්ට මිසදිටු විතර්කවලින්, මැසි මදුරුවන් විසින් කනු ලබන හෙයින් සිත සමාධිගත කර ගැනීම අසීරුවිය. නැවත ශාස්තෘන් වහන්සේ සම්පයට ගොස් මේ බව දැනුම් දුන් විට; මේඝිය තෙරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ, ''මේඝිය ! චේතෝ විමුක්තිය මුනුකුරා නොයෑම නිසා ධර්ම පසක් සම්පූර්ණ වී පවතියි'' යනාදි වශයෙන් අවවාද දුන්සේක. උන්වහන්සේ එම අවවාද පිළිගෙන, එහි පිහිටා විදසුන් වඩා නොබෝ දිනකින්ම රහත්ඵලයෙහි පිහිටි සේක.

අපදන පාළියේ උන්වහන්සේ මෙසේ පවසා ඇත.

''යම් කලෙක විපස්සි බුදුරජාණන් වහන්සේ ආයුසංස්කාරය අත්හලසේක්ද, එකල් හි සාගරය වටකරගෙන ඇති පෘතුවිය කම්පා විය. විසිතුරු මලින් සැරසූ මාගේ දිගු විසල් භවනය ද තථාගතයන්ගේ ආයුසංඝකාරය අත්හැරීමෙන් කම්පාවිය. මගේ භවනය කම්පිත වූ කල්හි තැති ගැනීම් ද ඇති විය. කුමක් නිසා මහත් ආලෝකයක් වීද'' මහා භූත

විකාරයක් කුමක් නිසා වූයේද? එවිට වෛශ්‍රවණ දෙව්රජ මෙහි පැමිණ මහජනයා සන්සිඳවීය. ''එකඟ සිත් ඇත්තෝ සංවරයෙන් යුක්ත වවු. ප්‍රාණීන් කෙරෙහි බියක් නැත. යම් බුදුකෙනෙක් උපදනා කල්හි මහා පෘථිවිය කම්පිතවී ද, ඒ බුදුරජතෙම ආශ්චර්යය. ඒ ධර්මය ආශ්චර්යය. අපගේ ශාස්තෘ සම්පත්තිය ද ආශ්චර්යය.'' එසේ ගුණ සඳහන් වූ බුදුගුණ ගායනා කල මම කල්පයක් ස්වර්ගයෙහි සුව වින්දෙමි. සෙසු කල්පයන්හි ද මා විසින් කුසල් කරන ලදී. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් බුද්ධ සංඥාවක් ඉපිද වූයෙම්ද ඒ හේතුවෙන් දුගතියක නූපන්නෙමි. බුද්ධ සඤ්ඤාවෙහි විපාකය මෙබඳුය. මෙයින් කල්ප දහතරකට පෙර මම, සම්ත නම් මහත් බල ඇති ප්‍රතාපවත් සක්විති රජෙක් වූයෙමි. මෙයින් මවිසින් දැන් සියලු කෙලෙසුන් නසන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ; ශාස්තෘන් වහන්සේගෙන් අවවාද ලැබීම නිසා ''මවිසින් අර්හත්භාවය සාක්ෂාත් කරන ලදැ''යි සිය ඥානය ප්‍රකාශ කරමින් මේසිය තෙරණුවෝ,

''අනුසාසි මහාවීරෝ සබ්බධම්මාන පාරගූ
තස්සාහං ධම්මං සුත්වාන විහාසිං සන්තිකෙ සතෝ
තිස්සොවිජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං''

යන ගාථාව වදළහ.

එහි අර්ථය - ''සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය මහාවීර වූ සර්ව්ඥයන් වහන්සේ, මට අවවාද කළහ. මම උන්වහන්සේගේ අවවාද අසා සිහි ඇතිව, උන්වහන්සේ වෙතම විසුවෙමි. ඒ මම ත්‍රිවිද්‍යා ලැබුවෙමි. බුදුසසුන කරන ලදී.'

එහි ''අනුසාසිං'' යනු මේසිය මුහුකුරා නොගිය චේතෝ විමුක්තිය නිසා ධර්ම පසක් සම්පූර්ණ නොවේ'' යනාදී වශයෙන් අවවාද දුන්සේක. උපදෙස් දුන්සේක. ''මහාවීරෝ'' යනු මහත්වූ වික්‍රමයෙන් විරිය පාරමිතාව සපුරා, චතුරංග සමන්නාගත වීර්යාධිෂ්ඨානයෙන් කිසිවකුට සමනොවූ, සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්ත වූ බැවින් ''මහාවීර'' නම් බුදුරජාණන් වහන්සේ යන අර්ථයයි. ''සබ්බ ධම්මාන පාරගූ'' යනු සියලු සංඛත ධර්මයන්ගේ පරතෙරට ගිය, සර්වඥ වූ ''තස්සාහං ධම්මං සුත්වාන'' යනු ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සාමුක්කංසික චතුරාර්ය සත්‍යය ධර්මදේශනාව

අසා විසුවෙමි. ''සනතිකෙ'' යනු අඹ වනයේදී මිසදිටු චිතර්කයන්ගෙන් උපදුව වූ බැවින් වාලුකා වෙහෙරට ගොස් ශාස්තෘන් වහන්සේ සමීපයේම වාසය කළෙමි. ''සතො'' යනු සිහිඇතිව, සමථ විදර්ශනා දෙකින් අප්‍රමාදි ව යන අර්ථයයි. ''අහං'' යනු මෙලෙස යම්සේ අනුශාසනා කරන ලද මම, මා හට මෙසේ ත්‍රිවිද්‍යාවෝ අවබෝධ වූහ. මවිසින් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. සම්පූර්ණ කළෙමි. ''බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''යන මේ ප්‍රකාශයෙන් ඉහත පැවසූ පරිදිම ත්‍රිවිද්‍යා අවබෝධයම ශාස්තෘන් වහන්සේගේ අවවාදය ඉටුකළ බව දැක්වීමකි. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාව ඉටුකරන්නෝ නම් ශීලාදි ශික්ෂා සම්පූර්ණ කරන්නෝම යැයි ප්‍රකාශිතය.

මෙසිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.7

''කිලෙසා ඣාපිතා මයහං'' යනු ආයුෂ්මත් ඒක ධම්මසවණීය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද? එම තෙරුන් පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී රුක් දෙවියෙක්ව උපන්නේ ය. හිඤ්ඤූන් කීප නමක් මංමුලාව මහකැළයේ වාසය කරනු දුටු එම දෙවියා, උන්වහන්සේලා කෙරෙහි අනුකම්පාවෙන් තම භවනයෙන් බැස, උන්වහන්සේලා සනසවා, වළඳවා කැමති තැනටම වැඩම කරවීය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් දේව් - මිනිසුන් අතරෙහි සැරිසරා අවුත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ බුදුකිස නිමවා පිරිනිවි කාලයේ දී රජ කුලයේ උපන්නේ ය. බුදුපිරිනිවණ සිදුවූ කාලයේ බරණැස කිකී නම් රජු රජකළේය. ඔහු කළුරිය කල කල්හි ප්‍රථ්වින්දර නමින් ඔහුගේ පුතු රජවිය. ඔහුගේ පුතා සුයාම රජුය. සුයාම රජුගේ පුත්‍රයා වූ කිකී බ්‍රහ්මදත්ත නාමයෙන් උපන් ඉහත කී පින්වත් කුමරුගේ රාජ්‍ය සමයේ බුදුසසුන පිරිහී තිබුණි. ධම්ශ්‍රවණයක් පවා නොවිණි. '' යමෙක් දහම් පදයක් දෙසන්නේ නම් ඔහුට රන් ලක්ෂයක් දෙමි''යි අණබෙර ගැසුවත් කිසිදු ධම්දේශකයෙක් හමුනොවිණි. රජු ''මගේ පිය මුතුන් මිත්තන්ගේ කාලයේ ධම්ය පැවතුණි. ධම් කථාවන් සුලභ විය. දැන් සිවුපද ගාථාවක්වත් පවසන්නෙකු පවා දුර්ලභය. මේ ''ධම්ය'' නම් සංඥාව අතුරුදන්වීමට පළමුව පැවිදිවෙමි''යි සිතා රජකම හැරදමා හිමවත බලා ගියේය. මෙය දුටු ශක්‍රයා වහාම අවුත්

''අනිච්චා වත සංඛාරා'' යන (සියළු සංඛත ධර්ම අනිත්‍ය වේ) සිවුපද ගාථාව කියා රජුගේ ආශාව සන්සිඳුවා නැවත රාජ්‍යයෙහි පිහිටුවීය. ඒ රජු නැවතී බොහෝ පින්දහම් කොට කාම සුගතීන් හිම සැරිසරා අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සේතව්‍ය නුවර සිටුකුලයක ඉපදුණේය. වියට පත් වූ සිටුකුමරු භාග්‍යවතුන් වහන්සේ සේතව්‍ය නුවර සිංසපා වනයේ වැඩ වසන සමයේදී උන්වහන්සේ වෙත පැමිණ වැඳ එකත් පසෙක සිටියේය. ඔහුගේ සිත වටහා ගත් බුදුරජාණන් වහන්සේ ''අනිච්චා වත සංඛාරා'' යන ගාථාවෙන් ම ධර්ම දේශනා කළසේක. ඒ ගාථාව සංසාරික වශයෙන් කළ පුනුණුවිම් ඇති බැවින් ඔහුට අනිත්‍ය සංඥාව ඉතා ප්‍රකටව අවබෝධවිය. ඉන් ලබන ලද ශ්‍රද්ධාව ඇතිව සංවේග උපදවා සසුනේ පැවිදි වූ සිටු කුමරු ධර්ම දේශනාවෙහිම සිත පිහිටුවා ගත්තේය. දුක්ඛ - අනිත්‍ය සංඥාවන් ම මෙනෙහි කරමින් විදසුන් භාවනාවට සිතයොමුකළ එම තෙරණුවෝ රහත්බවට පත්වූහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකෝ වනයේ හැසිරෙන්නා හු මහවනයේ මංමුලාවූවාහු අන්ධයන් මෙන් ඒ මේ අත හැසිරෙති. පදුමුත්තර බුදුරජාණන් වහන්සේද එම මහවනයේ මං මුළාවූ ශ්‍රාවකයන් ද සිහිපත් කළ මම භවනයෙන් බැස ඒ භික්ෂූන් වහන්සේලා වෙත පැමිණියෙමි. උන්වහන්සේලාට නිවැරදි මග පෙන්වා දී ආහාර පානද පිළිගැන්වූයෙමි. ඒ උතුම් වූ බුදුරජාණන් වහන්සේ උදෙසා කළ ඒ මහා පුණ්‍යකර්මය හේතුවෙන් මම දැන් සත් හැවිරිදි වූයේ ම රහත් ඵලය සාක්ෂාත් කළෙමි. මෙයින් කල්ප පන්සීයකට පෙර සත්රුවනින් හෙබි සචක්ඛු නම් වූ සක්විති රජවරු දොළොසක් වූයෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

උන්වහන්සේ එකම ධර්ශ්‍රවණයකින් කළයුතු කටයුතු නිමවා රහත් වූ හෙයින් ඒකධම්ම සවණීය නාමයෙන් ප්‍රකට වූහ. රහත් බවට පත්වූ උන්වහන්සේ මෙසේ සිය අර්හත්ඵල ප්‍රකාශ කළසේක.

'' කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
විකිණ්ණෝ ජාතිසංසාරෝ නත්ථිදානි පුනබ්භවෝ''

යන ගාථාව පැවසූහ.

එහි අර්ථය - ''මා විසින් සියලු කෙලෙස් නසන ලදී. සියලු කාමාදී භව නසන ලදී. ජාති සංසාරය විශේෂයෙන්ම ක්‍ෂය විය. දැන් පුනර්භවයක් නැත.''

එහි ''**කිලෙසා**'' යනු යමෙකුගේ සන්තානයේ ඉපිද එය කෙලෙසන, හානිකරන තවන, පීඩාවට ලක් කරන රාගාදි ධර්ම ක්ලේශයෝ කෙලෙස් නම්වේ. ''**ඣාපිතා**'' ගස් - පැල ආදිය වන ගින්නෙන් පිළිස්සෙන්නාක් මෙන් ආර්ය මාර්ග ඤාණ නම් ගින්නෙන් මුල් සහිතව ම කෙලෙස් දවන ලදී. ''**මයා**'' යනු මවිසින්, මගේ සන්තානයේ, ''**භවො සබ්බෙ සමූහතා**'' යනු කාම, කර්ම භවාදී සියලු භව නසන ලද බැවින්, කෙලෙසුන් දවන ලද කල්හි කෙලෙස් නිසා සසර පැවැත්මත් , කර්ම නිසා පැවැත්මත් නසන ලදී. කර්ම භවයන්ගේ උපත නසන ලදී. උප්පත්තිභව ද නසන ලද්දේමය. නූපදනා ධර්ම ස්වභාව කරගත් බැවින් නැවත මෙලොවට පැමිණීම විශේෂයෙන් ක්‍ෂය කරන ලදී. සංසාරික උපත, ජාතිය නැති කරන ලදී.

''ස්කන්ධයන්ගේ අඛණ්ඩ පැවැත්මත් ධාතු, ආයතනාදියේ නොනවත්වා පැවැත්මත්, නැවත නැවත පැවතීමත් ''සංසාරය'' යැයි කියනු ලැබේ.

මෙසේ වූ ලක්‍ෂණ ඇති සංසාරය විශේෂයෙන් ක්‍ෂය (නැති) කරන ලදී. එහි - සා ''**නත්ථිදානි පුනබ්භවො**'' යනුවෙන් නැවත උපතක් නොමැතිව, ජාති සංසාරික පැවැත්ම විශේෂයෙන් ක්‍ෂය කළ බැවින් පුනර්භවයක් (නැවත වීමක්) නැත්තේමය. ''සියලු ම භව නසන ලද'' බැවින් නැවත පෙරළී පැවතිය යුතු වූ ස්වභාව ඇති ජාති සංසාරය වෙසෙසින් නසන ලදී. එනිසාම දැන් ඕන් මතු පුනර්භවයක් නැතැයි යෙදිය යුතුයි.

ඒක ධම්ම සවණීය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.8

''අධිචෙතසො අප්පමජ්ජතො'' යනු ආයුෂ්මත් ඒකුදානිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද? මෙම තෙරණුවෝ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති ඒ ඒ භවයන්හි දී සසරින් මිදීම සඳහා

පින්දහම් රැස් කරගත්හ. අත්ථදස්සි නම් භාග්‍යවතුන් වහන්සේ දවස යක් සෙන්පතියෙක් ව ඉපිද, උන්වහන්සේ පිරිනිවි හෙයින් ''මට වූයේ අලාභයකි. මට වූයේ නොලැබීමකි. ශාස්තෘන් වහන්සේ දිවමන්ව සිටිය දී දානාදි කිසිදු පින්කමක් සිදුකරගත නොහැකි වූයෙමි'' යනුවෙන් ශෝක පරිදේවයන්ට පැමිණියේය. එය දුටු සාගර නම් බුද්ධශ්‍රාවකයාණෝ මෙම යක්ෂ සෙන්පතියාගේ දුක්ශෝක දුරුකරවා, ශාස්තෘන් වහන්සේගේ ථූපය වන්දනා කිරීමට යෙදවූහ. එම යක්සෙනෙවි පස් වසරක්ම ථූප පූජාවේ නියැලී ඉන්වුතව, එපින් බෙලෙන් දෙව් මිනිසුන් අතර සැරිසරා කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සිටුගෙයක උපන්නේ ය. වැඩිවියට පත් සිටුකුමරු වරින් වර බුද්ධෝපස්ථාන යට ගියේය. එසමයේ ශාස්තෘන් වහන්සේ දිනපතා ''අධිචෙතසො'' යන ගාථාවෙන් තම ශ්‍රාවකයන්ට අවවාද දෙනු ඇසුවේය. එම ගාථාව අසා උපන් ශ්‍රද්ධාවෙන් පැවිදි වූ සිටුකුමරු නැවත නැවත එම ගාථාවම සිහි කරමින් මහණදම් පිරුවේය. උන්වහන්සේ නුවණ මුනුකුරා නොගිය බැවින් ගුණ විශේෂයක් උපදවා ගැනීමට අපොහොසත් වූහ. ඉන් චුතව දෙව්ලොව ඉපිද කාමසුගතීන්හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේ සැවැත්නුවර මහත් ධනවත් බමුණු පවුලක ඉපිද විය පැමිණියේය. ජේතවනාරාමය පිළිගත් සමයෙහි බුද්ධානුභාවය දැකීමෙන් උපන් ශ්‍රද්ධා ඇති මේ බමුණු තරුණයා සසුනේ පැවිදි විය. කරන ලද පූර්ව කටයුතු ඇති උන්වහන්සේ අරණ්‍යයෙහි වෙසෙමින් සිට දිනක් ශාස්තෘන් වහන්සේ වෙත පැමිණියහ. එදින ශාස්තෘන් වහන්සේ, තම සමීපයේ උසස් සමාධියෙහි සිත පිහිටුවාගෙන වැඩසිටි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දැක, ''අධිචෙතසො'' යන මේ ගාථාව වදරමින් උදන් ඇනූසේක. එය ඇසූ මෙම තෙරණුවෝ තමා පෙර බොහෝ කාලයක් මෙම ගාථාව පුරුදුකළ බැවින් අරණ්‍යයෙහි වෙසෙමින් එම ගාථාව නිතර පැවසූහ. මෙනිසා උන්වහන්සේ ''එකුදනියේ'' යන නමින් ප්‍රකටවූහ. මෙසේ කාලය ගෙවූ උන්වහන්සේ එක දිනක් සිත එකඟ කරගෙන විඳසුන් වඩා රහත්ඵලය ලබාගත්හ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''යසසට පත් වූ මම අත්ථදස්සි බුදුරදුන් පිරිනිවීමට අනතුරුව යක්ෂයෝනියෙහි උපන්නෙමි. එකල්හි මම මෙසේ සිතුවෙමි. මාගේ සම්පත් පවත්නා කල්හි යම් හෙයකින් බුදුරජාණන් වහන්සේ පිරිනිවිසේක් ද, එය මට අලාභයකි. නපුරු පහන් වීමකි. නපුරු හිරු නැගීමකි. මෙසේ සිතන මාගේ අදහස දැනගත් සාගර නම් ශ්‍රාවකයෙක් දැනගෙන, මා ගොඩගනු කැමතිව මා සමීපයට මෙසේ පැවසීය.

''නුවණැති පින්වත! කවර හේතුවකින් ශෝක කරන්නේ ද? බිය නොවනු මැනවි. ධර්මයෙහි හැසිරෙන්න. බුදුරදුන් විසින් සෑම දෙනාටම කුශල බීජ සම්පත්තිය නැවත නැවත දෙන ලදී. යමෙක් ජීවමාන වූ ලෝක නායක බුදුරජාණන් වහන්සේ පුදන්නේ නම්, එසේම පිරිනිවි බුදුරදුන්ගේ අබෑටක් පමණ වූ ධාතූන් වහන්සේ නමක් හෝ පුදන්නේ නම්, ඒ සෑම විටකම චිත්ත ප්‍රසාදය සමව පවතින්නේ නම් ලැබෙන පින එක හා සමානය.'' මෙසේ පැවසූ සාගර තෙරණුවන්ගේ වදන් ඇසූ මම සඒඥ සෑයක් සෑදුවෙමි. බුදුරදුන්ගේ ඒ උතුම් සෑය මම වසර පහක් ම පිදුවෙමි. ද්විපදෝත්තම වූ ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ කෙරෙහි කල එම මහා පින්කම හේතුවෙන් සම්පත් අනුභව කොට රහත් වූයෙමි. මෙයින් සත් සිය වන කල්පයේ සත් රුවන් සහිත මහත් බල ඇති භූරිපඤ්ඤ නම් සක්විති රජෙක්ව සිටුවරක් උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් නැසූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව විමුක්ති සුවයෙන් කල් යැවූ; ආයුෂ්මත් ධර්මභාණ්ඩාගාරික තෙරුන් විසින් ප්‍රතිභානය විමසීම සඳහා ''ඇවැත්නි ! මා හට ධර්ම කියන්න''යි ආරාධිත වූ; ඒකුදනිය තෙරණුවෝ බොහෝ කාලයක් පුරුදු කරන ලද බැවින්

''අධිචෙතසො අපමජ්ජතො මුනිනො මොන පථෙසු සික්ඛතො
සොකා න භවන්ති තාදිනො උපසන්තස්ස සද සතිමතො''

යන මේ ගාථාවම වදළහ.

එහි ''අධිචෙතසො'' යනු උසස් සිත් ඇති, සියලුම චිත්තයන්ට වඩා ඉහල වූ අර්හත්ඵල චිත්තයෙන් යුක්ත වූ යන අර්ථයයි. ''අපමජ්ජතො'' යනු ප්‍රමාද නොවන, අප්‍රමාදීව නිවරද ධර්මයන්හි පසුබට නොවීමෙන් යුක්ත වූයේ යැයි කියන ලදී. ''මුනිනො'' යනු ''යමෙක් දෙලොව මනාව අවබෝධ කරගනියි ද හේ ''මුනි'' නම්වේ. යන පරිදි මෙලොව පරලොව යන දෙලොව මනාව අවබෝධ කරගන්නා ''මෝන'' නම් ඥානයෙන් යුතු ඒ අර්හත් ඵල ප්‍රඥාව නම්වූ මෝන ධර්මනාවයෙන් සමන්විත වූ හෙයින් රහතන් වහන්සේ ද ''මුනි'' නම් වේ.

ඒ මුනිවරයාට, ''මොනපථෙසු සික්ඛතො'' යනු අරහත් ඤාණ සංඛ්‍යාත වූ මොන් පථයෙහි, උපාය මාර්ගයෙහි, සත්තිස් බෝධි පාක්ෂික

ධර්මයන් හි. ඒ ශික්ෂා පදයන්ගෙන් හික්මුණු මෙහිදී පූර්වභාග ප්‍රතිපදාව ගෙන දක්වයි. -''රහත් බව නම් ශික්ෂාවන්ගේ පරම නිෂ්ඨාවයි.'' එනිසා මෙසේ හික්මුණු, මේ ශික්ෂා මාර්ගයෙන් මුනිභාවයට පත්වූ මුනිවරයාට යනුවෙන් අර්ථ දතයුතුයි. සිත දියුණු කිරීම් වශයෙන් සෝවාන් ආදී මාර්ග ඵල සිත් ලැබීම් වශයෙන්, ''උසස් වූ ආර්ය සිත්වල චතුරාර්ය සත්‍යය ධර්ම අවබෝධ කරගැනීමේ පිළිවෙතෙහි අප්‍රමාදීව යෙදුණු, ආර්ය, අග්‍ර මාර්ග ඤාණයන්ගෙන් යුක්ත වූ මුනිවරයාට'' යනුවෙන් සම්ප්‍රදන අර්ථය මෙහිදී ගැලපේ. නැතහොත් ශික්ෂාවන්හි අප්‍රමාදීවීමෙන් ප්‍රමුඛ හේතුව (කාරණ) වූ රහත්ඵලය ලැබීම කියනලදැයි දතයුතුයි. එනිසා අප්‍රමාදී හේතුව ද හික්මීම් - හේතුවද උසස් සිත්, ''අධිචිත්ත'' යැයි අර්ථ වත්වේ. **''සොකා න භවන්ති තාදිනෝ''** යනු තාදී ගුණ ඇති ක්ෂීණාස්‍රව මුනිවරයාගේ අභ්‍යන්තරයෙහි (සිතෙහි) ඉටුවීම්, කඩවීම්, වෙන්වීම් ආදී හේතුවෙන් වන ශෝක, චිත්ත සන්තාපාදිය නොමැත. නැතහොත් තාදී ලක්ෂණ සහිත අසේඛ මුනිවරයාට ශෝක සිත් නොමැත. **''උපසන්තස්ස''** යනු රාගාදියේ අනිශය සන්සිදීමෙන් උපශාන්ත වූ **''සදා සතීමතෝ''** යනු සිහියේ විපුලත්වයට පැමිණි බැවින් නිරන්තරව සිහියෙන් යුක්තවම වෙසෙන. මෙහිදී ද ''අධිචෙතසෝ'' යන්නෙන් අධිචිත්ත ශික්ෂාවද **''අප්පමජ්ජතෝ''** යන්නෙන් අධිශීල ශික්ෂාව ද ''මුනිනෝ මොනපථෙසු සික්ඛතෝ'' මේ පදයෙන් අධිප්‍රඥා ශික්ෂාව ද අදහස් කරන ලදී. නැතහොත් ''මුනිනෝ'' යන පදයෙන් අධිප්‍රඥා ශික්ෂාව ද අදහස් වේ. ''මොනපථෙසු සික්ඛතෝ'' යන මෙම පදයෙන් ඒ ලෝකොත්තර ශික්ෂාවන් ගේ පූර්වභාග ප්‍රතිපදාව ද ''සොකා න භවන්ති'' යනු ශික්ෂාවන්ගේ සම්පූර්ණ වීමෙන් ලැබෙන ආනිසංස පැවසීම ද ලෙස දතයුතුයි. මෙම ගාථාවම ඒකුදනිය තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථාව විය.

ඒකුදනිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.9

''සුඛාන ධම්මං මහනෝ මහාරසං'' යනු ආයුෂ්මත් ඡන්න තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවීද? මෙම තෙරණුවෝ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනාවන් ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන් පතාගෙන පින් රැස්කළහ. සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි

සිටුකුමරෙක්ව ඉපිද වැඩිවියට පත්ව; දිනක් එම සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ එක්තරා රුක්මුලක වැඩහිඳුණු දැක; පැහැදුණු සිතින් මුදු වූ පහස් ඇති තණ ඇතිරිල්ලක් අතුරා පූජා කළේය. හාත්පස මල් ද විසුරුවා පූජා පැවැත්වීය. ඒ මහා පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව උපන් ඔහු තව තවත් පින් කොට කාම සුගතීන්හිම සැරිසරා, අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සුදොවුන් මහ රජුගේ දුසියකගේ කුස උපන්නේය. ''ඡන්න'' නාමයෙන් බෝධිසත්ත්වයන් උපන් දිනම උපන්නා වූ ඔහු; පසුව ශාස්තෘන් වහන්සේ කිඹුල්වතට වැඩම වූ අවස්ථාවෙහි ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි වූයේය. භාග්‍යවතුන් වෙත අප්‍රමාණ ප්‍රේමයෙන් ''බුදුනු අපගේය. ධර්මය අපගේය'' යනුවෙන් මමත්ත්වය උපදවා ගෙන, ඒ දැඩිවූ සෙනෙහස සිඳ ගැනීමට නොහැකිව මහණදම් නිසිපරිදි නොපිරිය. ශාස්තෘන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව උන්වහන්සේගෙන් අණ ලැබූ ලෙසම බ්‍රහ්ම දණ්ඩනය දීමෙන් සන්ත්‍රාසයට, සංවේගයට පත් කරන ලද ඡන්න හිමියෝ එම දැඩි සෙනෙහස සිඳ දමා විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් බවට පත්වූහ.

උන්වහන්සේ සිය චරිතාපදනය මෙලෙස පැවසූහ.

''මම සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට පන් ඇතිරිල්ලක් දුන්නෙමි. හාත්පස අසෙනිය මල් අතුරා පිදුවෙමි. මෙබඳු ගුණ ඇති සිත් කලු මහාර්ග වූ ප්‍රාසාදයක් ලැබූ මාගේ ඇඳෙහි අනගි පුෂ්පයෝ නිති වැගිරෙති. දිව සැප ලැබූ මම විසිතුරු මල් අතුළ සයනයෙහි සැතපුනෙමි. එකෙණෙහි සයනයෙහි මල් වැසි වසින්නේය. මීට කල්ප අනූ හතරකට පෙර පන් ඇතිරිල්ලක් පූජා කිරීමේ පිනින් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඇතිරිලි දුනයේ විපාකය මෙබඳුය. මෙයින් පස් වන කල්පයකට පෙර සත් රුවනින් හෙබි, මහ බලවත් තිණ සන්ථාරක නම් සක්විති රජවරු සත් දෙනෙක් ව උපන්නෙමි. දන් මම සියලු කෙලෙසුන් නැසුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ ඡන්න තෙරණුවෝ විමුත්ති සුවයෙන් සන්තර්පිත වූ ප්‍රීතිය නිසා උදන් අනමින් මේ ගාථාව වදළහ.

''සුඛාන ධම්මං මහතෝ මහාරසං
සබ්බඤ්ඤුතඤ්ඤාණවරෙන දෙසිතං
මඟ්ගං පපජ්ජිං අමතස්ස පත්තියා
සෝ යොගක්ඛෙමස්ස පථස්ස කොවිදෝ''

එහි ''සුභාවිතාන'' යනු අසා, කණින් ගෙන, යොමුකල කන් ඇතිව සිතට ගෙන ''ධම්මං'' යනු චතුරාර්ය සත්‍යය ධර්මයයි. ''මහතෝ'' යනු භාග්‍යවතුන් වහන්සේගෙන්, උන්වහන්සේ මහත් වූ උළාර වූ සීලාදී ගුණයන්ගෙන් යුක්ත වූ බැවින්, දෙවියන් සහිත ලෝවැස්සා විසින් විශේෂිත වූ පිදියයුතු වූ බැවින් ''මහා'' යනුවෙන් නම් වෙති. ඒ මහා ශ්‍රමණයන් වහන්සේ යන ''මහාසමණ'' නාමය ද උන්වහන්සේට යෙදේ. මෙය පංචමී විභක්ති වචනයකි. ''භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය අසා'' ''**මහාරසං**'' යනු විමුක්ති රසයට දයක වූ බැවින් මහත් රසැති ''**සබ්බඤ්ඤුතඤ්ඤාණවරෙනදෙසිතං**'' යනු සියල්ල දැන සර්ව්ඥ වූ බව ''**සබ්බඤ්ඤුතා**'' නම් වේ. ඒ උතුම් වූ ඥානය ම, ඥානයන් අතර ශ්‍රේෂ්ඨ වූ උතුම් ඥානය. එම උතුම් වූ සර්වඥ ඥානය ඇති පුද්ගලයා ''**සබ්බඤ්ඤුතඤ්ඤාණවර**'' නම් වේ. එනම් භාග්‍යවතුන් වහන්සේය. ''උන්වහන්සේ විසින් සර්ව්ඥතා ඤාණය නම් වූ අග්‍ර ඤාණයෙන් හෝ ඊට උපකාරවන සේ දෙසූ, කියූ දහම් අසා යනුවෙන් අර්ථය දත යුතුයි. මෙහිදී විස්තර කළ යුතු සියල්ල පරමත්ථදීපනී නම් වූ ඉතිවුත්තක අට්ඨවාවෙහි පැවසූ පරිදි දතයුතුයි. ''**මග්ගං**'' යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. ''**පපජ්ජිං**'' යනු පිළිපැද්දෙමි. ''**අමතස්ස පත්තියා**'' යනු නිවන් අවබෝධ කර ගැනීම සඳහා හේතුවන ප්‍රතිපදව පිළිපැද්දෙමි. ''සෝ'' යනු ඒ භාග්‍යවතුන් වහන්සේ ''**යොගක්ඛෙමස්ස පථස්ස** කොවිදෝ'' යනු සතර යෝගයන්ගෙන් උපදුව නොවූ නිවණට යන යම් මාර්ගයක් වේ නම් ඒ මාර්ගයේ යෙදීමට දක්ෂ වූ, කුසල සම්පන්න වූ, මේ ගාථාවේ අර්ථ මෙසේය. - භාග්‍යවතුන් වහන්සේගේ චතුරාර්ය සත්‍යය දේශනාව අසා නිවන අවබෝධ කර ගැනීමට හේතුවන මාර්ගයට මම පිළිපන්නෙමි, පිළිපැදීමට අවශ්‍ය මාර්ග මවිසින් සිදුකරන ලදී. ඒ භාග්‍යවතුන් වහන්සේ සර්ව්ප්‍රකාරයෙන් ම යෝගක්ෂේම වූ නිර්වාණ මාර්ගයෙහි නිපුණයහ. අනුන්ගේ සන්තානයේ හෝ අනුන්ගේ සිත්වල ඇති දේ දැකීමෙහි කුසලයහ, දක්ෂයහ. ''යම් මාර්ගයක උන්වහන්සේ ගමන් කළසේක් ද මම ද එහි ගමන් කළෙමි'' යන මේ අර්ථවත් ගාථාවෙන් ම ඡන්න තෙරණුවෝ සිය රහත්බව ප්‍රකාශ කළහ.

ඡන්න ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.7.10

''සීලමෙව'' යනු ආයුෂ්මත් පුණ්ණ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවී ද ? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී නිවන් පතා ගෙන කුසල් දහම් රැස්කර ගත්සේක්, මීට කල්ප අනූ එකකට පෙර බුදුවරුන්ගෙන් ලොව ශූන්‍ය වූ කාලයක බමුණු කුලයක උපන්හ. වැඩිවියට පත් ව සියලු බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන් හි නිශ්පත්තියට හෙවත් කෙළවරට ගොස්, කාමයන් හි ආදීනව දුටු මේ බමුණු තරුණයා; ගිහි ගේ හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව හිමවතෙහි පන්සලක් සාදගෙන වාසය කළේය. ඔහු වසන තැනට ඉනා නුදුරු තැනෙක එක් පච්ත ගුහාවක පසේ බුදුවරයන් වහන්සේ නමක් ආබාධිතව පිරිනිවන් පෑ සේක. එසේ පිරිනිවෙණ මොහොතෙහි මහත් වූ ආලෝකයක් දසදෙස පැතිරුණේය. එය දුටු තවුසා ''කෙසේ ද මේ ආලෝකය ඇතිවුයේ ? යනුවෙන් විමසනු සඳහා ඔබිනොබ ඇවිද, බලනුයේ ගුහාවෙහි පසේ බුදුන් පිරිනිවි බව දුටුවේය. සුවඳ දර ඒ ඒ තැනින් රැස්කරගත් ඔහු, එම සිරුර දවා සුවඳ දිය ඊට ඉස්සේය. මෙම සිදුවීම දුටු එක් දිව්‍ය පුත්‍රයෙක් අහසෙහි හිඳ ''මැනවි, මැනවි සත්පුරුෂය ! ඉනා මැනවි. නුඹ විසින් සුගතිගාමී වීම සඳහා බොහෝ පින් රැස්කරගත්තෙහිය. එනිසා නුඹ අනාගතයේ කාම සුගතින් හි ම උපදින්නේය. ඔබ මතු පුණ්ණ නමින් ප්‍රකට වන්නෙහිය.'' යනුවෙන් පැවසීය.

ඒ තාපසතුමා එසේ කළ පින් ඇතිව කාමසුගතින් හි සැපවිඳ අප බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි, සුණාපරන්ත නම් ජනපදයේ සුප්පාරක පටුනෙහි ගහපත් කුලයක ඉපදුණි. පුණ්ණ නමින් ප්‍රකට වූ මේ සිටු පුත්‍රයා වෙළඳාම පිණිස මහත් වූ ගැල් රැසක් ගෙන සැවැත් නුවරට ගියේය. එසමයේ භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වෙසෙති. පුණ්ණ සිටුපුත් සැවත් නුවර උපාසකයන් සමඟ විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේගෙන් ධර්මය අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි විය. වත් පිළිවෙතින් ආචාර්ය උපාධ්‍යාය සිත් සතුටු කල පුණ්ණ හිමියෝ, එක් දිනක් ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ, ''භාග්‍යවතුන් වහන්සේ ! ඔබවහන්සේ මා හට ඉනා සංක්ෂිප්ත අවවාදයක් - සුණ්ණාපරන්ත ජනපදයේ වෙසෙන මා හට ඉනා යෝග්‍ය වූ උපදෙසක් දෙන්නේ නම් මැනවි'' යනුවෙන් ආරාධනා කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ, ''පුණ්ණය ! නුඹට චක්ඛු විඤ්ඤෙය්‍ය වූ (ඇසින් දතයුතු වූ) රූපයෝ වෙති'' යනා දී වශයෙන් අවවාද දී සිංහනාද කරවා පුණ්ණ තෙරුන් පිටත් කර හැරි සේක. භාග්‍යවතුන් වහන්සේට වැඳ

අවසර ගෙන පුණාපරන්තයට ගිය පුණ්ණ හිමියෝ, එහි සුප්පාරක පටුනේ වැඩ වසමින් සමථ විදර්ශනා භාවනාවන් වඩා ත්‍රිවිද්‍යාවන් අවබෝධ කරගත් සේක.

උන්වහන්සේ සිය චරිතා පදනය මෙසේ දක්වුහ.

''සියල්ල තමන් වහන්සේ ම අවබෝධ කළා වූ පස්මරුන් දිනූ ගුණගරු වූ පසේ බුදුරජාණන් වහන්සේ හටගත් ආබාධ ඇතිසේක්, පර්වතකුට පබ්භාරයක පර්වත අතරෙහි වැඩ වසන සේක. එකෙණෙහි මගේ අසපුව හාත්පස මහත් වූ නාදයක් විය. බුදුරදුන් පිරිනිවි මොහොතෙහි මහත් ආලෝකයක් පැතිරුණි. ඒ මොහොතේ වනයේ සිටි වලස්, වෘක, කළු හිස් වලස් වාඝ සිංහා දි සියලු සත්ත්වයෝ නාද කළහ. මම ඒ භූත විකෘතිය දැක පසේ බුදුන් වැඩ සිටි පර්වතයට ගියෙමි. එහි දී පිරිනිවි අපරාජිත වූ පසේ බුදුරදුන් දුටුවෙමි. සුපිපි සල් රුකක් වැනි වූ උද වූ හිරු වැනි, පහ වූ සිළු ඇති ගිනි අඟුරු රැසක් වන් පිරිනිවි පසේ බුදුන්ට තණ ද දර ද පුරවා චිතකයක් සැදුවෙමි. මැනවින් සෑදූ එම සැයෙහි බුදුසිරුර දවුයෙමි. දවු සිරුරෙහි සුවඳ දිය ඉස්සෙමි. එකෙණෙහි අහසෙහි සිටි යක්‍ෂයෙක් මා හට නමක් තැබිය.

''සියල්ල තමන් වහන්සේ ම අවබෝධ කරගත්තා වූ බුදුරදුන්ගේ ආදහනය නුඹ සම්පුණ කළෙහිය. මුනිවරය ! නුඹ සැම කල්හි නමින් පුණ්ණ වේවා.''

මම ඒ තාපස වෙස් හැර දෙව්ලොව උපන්නෙමි. අහසෙහි දිව්‍යමය සුවඳ හමයි. එහි දී ද මාගේ නම පුණ්ණ විය. දෙව් වූ සේක් මිනිස් වූ සේක් මාගේ අදහස් සම්පුණ වූයේය. මේ මාගේ අවසන් ආත්ම භාවයයි. මෙහි දී ද මම පුණ්ණ නාමය ලැබුවෙමි. ශාක්‍ය කුල ශ්‍රේෂ්ඨ වූ බුදුරදුන් සතුටු කොට සියලු ආශ්‍රව දූන, ඒ ආශ්‍රව දුරුකර සුවසේ වෙසෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් කමියක් කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ශරීරාදහන පින්කමේ විපාක මෙයයි. සියලු කෙලෙස් දවන ලද මාගේ සියලු භව උප්පත්ති නැසුවෙමි. අනාශ්‍රව වූයේ සුවෙන් වෙසෙමි. බුද්ධ ශ්‍රේෂයන් වෙත පැමිණීම මාගේ යහපත් පැමිණීමකි. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරදුන්ගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ තෙරුන් වහන්සේ බොහෝ මිනිසුන් සසුනෙහි බෙහෙවින් පැහැද වූහ. පන්සීයක් පමණ පුරුෂයෝ ද එපමණ ම ස්ත්‍රීහු

ද උන්වහන්සේගේ උපාසක උපාසිකා බවට පත්වූහ. එහි දී රත්සඳුන් දැවයෙන් ''චන්දන ඝාලා'' නම් ගඳකිලියක් කරවූ පුණ්ණ තෙරණුවෝ, ''ශාස්තෘන් වහන්සේ පන්සීයක් සමඟ අවුත් මේ ශාලාව පිළිගනිත්වා'' යි භාග්‍යවතුන් වහන්සේට මල් දුතයෙකු මගින් ආරාධනා කළහ. භාග්‍යවතුන් වහන්සේ ඍද්ධි ආනුභාවයෙන් පන්සීයක් භික්ෂූන් වන්සේ පිරිවරා ගෙන, එහි ගොස් චන්දන ශාලාව පිළිගෙන, අරුණ නැගීමට පළමුව ම නැවත ජේතවනයට ම වැඩම කළ සේක. ඊට පසු කාලයක පිරිනිවෙන මොහොතේ දී පුණ්ණ තෙරණුවෝ සිය රහත් බව ප්‍රකාශ කරමින් මෙම ගාථාව වදළසේක.

''සීලමෙව ඉධ අග්ගං - පඤ්ඤවා පන උත්තමෝ
මනුස්සෙසු ච දෙවෙසු - සීල පඤ්ඤාණතෝ ජයං''

එහි ''සීලං'' යනු හික්මීම් අර්ථයෙන් සීලයයි. පිහිටන, සමාදන් වන අර්ථවලින් ද ''සීල'' නම් වේ. සීලය යනු සියලු ගුණයන්ගේ පිහිටීම යි. එනිසා ''ඉතා නුවණැති මිනිසා සීලයෙහි පිහිටා සිට'' යනුවෙන් කියන ලදී. සමාදන් වේ, කය වචන යන ද්වාර දෙක සංවර කරයි යන අර්ථ ගෙන දේ. එම සීලය ම සියලු ගුණයන් ට මූලික වූ බැවින් ද පුමුඛ වූ බැවින් ද අග්‍රවේ. ''එනිසා මහණ ! නුඹ වහන්සේ මූලදීම පිරිසිදු විය යුත්තේහිය. කුසල ධර්මයන්ට කුමක් මුල් වන්නේ ද ? සුවිසුද්ධ වූ ශීලය ම මුල්වේ.'' මුඛ්‍ය වූ ප්‍රමුඛ වූ මෙය ප්‍රාතිමෝක්ෂයැයි වදළ පරිද්දෙණි. ''ඉධ'' යනු නිපාතයක් පමණි. ''පඤ්ඤවා'' යනු ඤාණයෙන් යුක්ත වූ ඒ උතුම්, ශ්‍රේෂ්ඨ, ප්‍රවර පුද්ගලයා පුද්ගල අධිෂ්ඨානය පිණිස වදහළ ගාථාවෙන් ප්‍රඥාවෙන් ම ශ්‍රේෂ්ඨ බව දක්වයි. කුසල දහම් සඳහා ද ප්‍රඥාව උතුම් වේ. දැන් ඒ සීලයේ ද ප්‍රඥාවේ ද අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ ප්‍රඥාවෙන් යුත් පුද්ගලයා ජය ගනියි.'' යනුවෙන් සීල. ප්‍රඥා දෙක නිසා විරුද්ධ වූවන් ජය ගැනීම ද කාම කෙලෙස් ජය ගැනීම ද වේයැයි දක්වයි.

පුණ්ණ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සත්වන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.8.1

''සුසුඛුමනිපුණත්ථදස්සිනා'' යනු ආයුෂ්මත් වච්ඡපාල තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? මෙම තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී පින් රැස්කරමින් දෙව් මිනිසුන් අතරම ඉපදෙමින් සසර සැරි සරා, මීට කල්ප අනූ එකකට පෙර දී බමුණු පවුලක උපන්නේ ය. ඒ බමුණු කුමරු වැඩිවියට පත් ව සියලු බ්‍රාහ්මණ ඉගැන්වීම් නිමවා, ගිනි පුදමින් හැසිරුණේය. එක් දිනක් මහත් වූ ලෝහ පාත්‍රයකට කිරිබතක් යාගකර, ඉතිරි වූ කිරිබත් කොටස ගෙන දක්ෂිණාර්හ පුද්ගලයකු සොයමින් සිටින විට දී; විපස්සී භාග්‍යවතුන් වහන්සේ අහසෙහි සක්මන් කරනු දැක, ආශ්චර්යමත් අත්භූත සිතින් උන්වහන්සේට වැඳ, කිරිබත පුදනු කැමති බව දැක්වීය. ඔහුට අනුකම්පා වෙන් භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත්සේක. එම පින්කමේ විපාක වශයෙන් දෙව් - මිනිසුන් අතර සැරි සරා මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර මහ සම්පත් ඇති බමුණු පුතෙක් ව උපන්නේ ය. වච්ඡපාල නමින් ප්‍රකට වූ ඔහු; බිම්බිසාර රාජසමාගමයේ දී උරුවෙල කාශ්‍යප තෙරුන් මහත් ප්‍රාතිහාර්යයක් දක්වා, ශාස්තෘන් වහන්සේට අතිශයින් ගෞරව කිරීම් දක ලැබූ ශ්‍රද්ධා ඇති ව සසුනේ පැවිදි විය. පැවිදි වී සත්වන දිනයේ ම විදසුන් වඩා ෂඩ් අභිඥාවන් උපදවාගත් උන්වහන්සේගේ චරිතාපදනය මෙසේ දැක් වේ.

''මහත් වූ ලොහො තලියක කිරි බතක් බහාගෙන, දනක් දෙනු කැමති වූ මම ඒ පූජාව දෙතිස් මහ පුරිස් ලකුණින් යුතු ස්වණ්ණවණ්ණ වූ භික්ෂුසංඝයා විසින් පිරිවරන ලදුව අරණින් නික්මුනා වූ විපස්සි බුදුරජාණන් වහන්සේ වෙත පිළිගැන්වූයෙමි. ලොවට ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ එකල් හි අහසේ වූ සක්මනට නැගුණු සේක. විශ්මය ජනක වූ ලොමුදහ ගන්නා ඒ අසිරිය දුටු මම තලිය පසෙක තබා මෙසේ පැවසීමි.

''දෙව් මිනිසුන් සහිත ලොවෙහි නුඹ වහන්සේ සවිඤ්ඤ ද දේව ද වනසේක. මහාමුනි වූ බුදුරජාණන් වහන්ස! අනුකම්පා උපදවා මෙය පිළිගත මැනවි.''

ලෝකයේ ශාස්තෘවූ මහාමුනි වූ ලෝක නායක වූ භාග්‍යවතුන් සවිඤ්ඤයන් වහන්සේ මාගේ අදහස දැන එය පිළිගත් සේක. මෙයින් කල්ප

අනූ එකකට පෙර , මම යම් දනයක් දුන්නෙමි ද ඒ හේතුවෙන් මෙතෙක් දුගතියක නූපන්නෙමි. කිරිබත් දනයේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප සතලිස් එකකට පෙර සත් රුවනින් පිරි මහත් බල ඇති ''බුද්ධ'' නම් සක්විති රජෙක් වීමි. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ උන්වහන්සේ සුවසේ තමන් වහන්සේ නිවන් අවබෝධ කරගත් බව දක්වමින් -

''සුසුඛුමනිපුණඤ දඤසිනා
මනිකුසලෙන නිවාත වුත්තිනා
සංසෙවිත වුදධ සීලිනා
නිබ්බාණං නහි තෙන දුල්ලහං''

යන ගාථාව වදල සේක.

එහි ''**සුඛුමනිපුණඤ දඤසිනා**'' යනු අතිශයින් දැකීමට අපහසු වූ, සියුම් වූ නිපුණ වූ සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදදී අර්ථයෙහි ද අනිත්‍යාදියෙහි ද ආරෝපණය කොට දකියි යන අරුතින් ''සියුම්, නිපුණ වූ අර්ථ දකී'' නම් වේ. එයින් යුතු වූයේ ''**මනි කුසලෙන**'' ප්‍රඥාවෙන් දක්ෂ වූ නුවණින්, දක්ෂකමින් පිරිපුන් වූ මෙලෙස පවතින්නාගේ ප්‍රඥාව වැඩේ. මෙසේ ක්‍රියා කිරීමෙන් නොවැඩේ යනුවෙන් ධම්මවිචය සම්බොජ්ඣංග ප්‍රඥාව ඉපදවීමෙහි දක්ෂ වූ. ''**නිවාතවුත්තිනා**'' යනු සබ්‍රහ්මචාරීන් කෙරෙහි යටහත් පැවතුම් ඇති, සීලයෙන් වෘද්ධ හා නවකයන් කෙරෙහි සුදුසු පරිදි පිළිපදින්නා වූ ''**සංසෙවිතවුද්ධසීලිනා**'' යනු මනාව ඇසුරු කළ, නිතර පුරුදු කළ, වෘද්ධ සීලයෙන් යුතු වූ. ''එම වෘද්ධ ශීලය යමෙකුට වේනම් ඔහු විසින්'' යන අර්ථය පිණිස ''සංසෙවිතවුද්ධසීලිනා'' යි කියන ලදී. නැතහොත් මොහු විසින් ඇසුරුකරන ලදී. වෘද්ධ ශීලය මොහු විසින් උපාශ්‍රිතය, සේවනය කරන ලදී යන අරුතින් ''සංසෙවිතවුද්ධසීලී'' නම් වේ. ඔහු විසින් ''නි'' යනු හේතු අර්ථයේ නිපාතයකි.

යම් හෙයකින් ඒ යටහත් පැවතුම් ඇති, මනාව සේවනය කළ වෘද්ධ ශීල සහිත වූ, ප්‍රඥාවෙහි දක්ෂ වූ සියුම් නිපුණ අර්ථ දක්නාවූ උත්තම පුද්ගලයාට ඒ ගුණ මහිම නිසා නිර්වාණාවබෝධය දුර්ලභ නොවේ. යටහත් පැවතුම් ඇති බැවින් ද ඇසුරු කරන ලද වෘද්ධශීල ඇති බැවින් ද නුවණැත්තෝ ඔහුට අවවාද කිරීමටද අනුශාසනා කිරීමට ද සිතති.

ඔවුන්ගේ එම අවවාදයෙහි පිහිටා තමාගේම ප්‍රඥා සම්පන්න භාවයෙන් ඉතා සියුම්, නිපුණ අර්ථ දැකීමෙහි ද විඳසුන් කමටහන් වඩා නොබෝ දිනකින් ම නිවණට පැමිණෙන්නේය. මෙම ගාථාවම තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම විය.

වච්ඡපාල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.2

''යථා කළීරෝ සුසුවඩ්ඪිතග්ගෝ'' යන මෙම ගාථාව ආයුෂ්මත් ආතුම තෙරුන්වහන්සේගේ ගාථාවකි. උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි ඒ ඒ භවයන්හි දී නිවන් පතාගෙන නොයෙක් පින් දහම් රැස්කර, මෙයින් කල්ප අනූ එකකට පෙර සිටුගෙයක උපන්හ. වැඩිවිය පත් සිටු කුමරු විපස්සි භාග්‍යවතුන් වහන්සේ වීථියෙහි වඩිනු දැක පැහැදුණු සිතින් සුවඳ මලින් ද සුවඳ සුණු වලින් ද උන්වහන්සේ පිදුවේය. ඒ පින්කමේ බලයෙන් දෙව්ලොව ඉපිද කාමසුගති ලෝකයන්හිම සැරිසරා කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සසුනේ පැවිදිව මහණදම් පිරුවේය. උන්වහන්සේගේ ඤාණය මුනුකුරා නොගිය බැවින් ආර්යගුණ කිසිවක් උපදවාගත හැකි නො වීය. අනතුරුව අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේ සැවැත්නුවර සිටු ගෙදරක උපන්නේ ය. ''ආතුම'' නමින් ප්‍රකට වූ එම සිටු පුතු නිසි වයසට එලඹි කල්හි, ඔහුගේ මව '' මගේ පුතුට බිරියක් ගෙනෙමි''යි නෑයන් සමඟ කථාබහ කළාය. එම සාකච්ඡාව ඇසූ ආතුම සිටුපුත්, හේතු සම්පත්තියෙන් මෙහෙයවනු ලබනුයේ ''මට ගිහිගෙයි විසීමෙන් කවර ප්‍රයෝජනයක් ද ? දැන් මම පැවිදිවෙමි'' යි සිතා භික්ෂූන් සමීපයට ගොස් පැවිදි විය. පැවිදි වූ ආතුම ගිහිබවට පත්කරගැනීමට ඔහුගේ මව නොයෙකුත් උපක්‍රම යෙදුවාය. උන්වහන්සේ ඇයට අවස්ථාවක් නොදී තම ස්ථිර අදහස මෙසේ ගාථාවකින් වදළහ.

''යථා කළීරෝ සුසු වඩ්ඪිතග්ගෝ දුනික්ඛමෝ හොති පසාඛජාතෝ
එවං අහං භරියානිතාය අනුමඤ්ඤං මං පබ්බජිතොම්හි දානි''

මෙහි **''කළීරෝ''** යනු පැළයයි. මෙහිදී උණ ගොබයක්, උණ පැලයක් අදහස් කරන ලදී. ''සුසු'' යනු තරුණ වූ **''වඩ්ඪිතග්ගෝ''** යනු මනාව

වැඩුණු අතු ඇති, තරුණ ළපටි පැළයක් හෝ මනාව වැඩුණු අතුවල හටගත් කොළ අතු ඇති ''දුනහිඤමෙ'' යනු උණ ගොමුවෙන් නික්මවීමට, බැහැරකරවීමට නොහැකි වන්නේ ය. ''**පසාඛ ජාතෙ**'' යනු හටගත් ශාඛා ප්‍රශාඛා ඇති ශාඛාවන්හි ද පුරුකක් පාසා හටගත් අනුශාඛා ඇති ''**එවං අහං හරියාය නිතාය**'' ''යම්සේ උණ කිළිලක් හුණ පඳුරෙහි ශාඛා ප්‍රශාඛා වැඩි වර්ධනය වූ වේ ද එම උණ පැළය, ඉන් ඉවත් කිරීම අපහසු වූවක් වන්නේ ද එලෙසින් ම මම ද භාර්යාව විසින් මා වෙත ගෙනෙන ලද දූ පුතුන්ගේ වශයෙන් වර්ධනය වන ඇලීම නිසා ගිහිගෙයින් නික්මීම දුෂ්කර වන්නේ ය. නමුත් උණ පැළය නොවැඩුණු ශාඛා ප්‍රශාඛා ඇතිව උණ පඳුරෙහි වේනම් එය ඉවත් කිරීම ඉතා පහසුය. එමෙන්ම නො ඉපදුණු දූ පුතුන් ඇති බැවින් මම ගිහි බන්ධනයන්ගෙන් සුවසේ නික්මුණෙමි. නොගෙනා භාර්යාව ඇති මම, තමාගේම කැමැත්තෙන් දූන් පැවිදි වූයෙමි. එය ඉතා යහපත් දෙයකි''යි තමන් වහන්සේ ගිහිගෙයින් නික්මීමේ කැමැත්ත ප්‍රකාශ කරයි. ''**අනුමඤ්ඤු මං පබ්බජිතොඹිදනී**'', ''මගේ පැවිද්ද අනුදන්නේ නම් මැනවි''යි මෑණියන්ට කියයි. මෙම පාඨයේ අදහස මෙසේය.- ''මෑණියනි ! නුඹ පෙර මගේ පැවිද්ද අනුමත නොකළෙහිය. දූන් මම පැවිදි වී සිටිමි. එනිසා මාගේ පැවිද්ද අනුදත මැනව. මට මහණකමෙහි ම සිටීමට ඉඩදෙන්න. නුඹට මා නැවැත්විය හැකි නොවේ.'' මෙසේ තම මෑණියන්ට අවවාද දෙමින් විදසුන් වැඩූ ආතුම තෙරණුවෝ මග පිළිවෙලින් කෙලෙස් දවා ෂට් අභිඥාලාභියෙකු වුහ. උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වුහ.

''උතුම් පහයෙහි හිඳ බබලන කුඹුක් ගසක් වැනි මොහදුරු දුරු කරන්නා වූ පස් මරුන් දිනූ විපස්සි බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. පහයට නුදුරින් උන්වහන්සේ වඩින කල්හි, සුර්යයා මෙන් උන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් ප්‍රභාව විහිදුණි. ඒ දැක සතුටු සිත් ඇති මම සුවඳ පැන් ඉස උන්හන්සේට පූජා කළෙමි. ඉන්පසු කලුරිය කළ මම, මීට අනූඑක් කල්පයකට පෙර කළ එම කුසලයේ ආනුභාවයෙන් එතැන් සිට මේ දක්වා දුගතියක නුපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් තිස් එක්වන කල්පයේ සත්රුවනින් යුත් මහත් බල ඇති සුගන්ධ නම් සක්විති රජ ව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂට් අභිඥා උපදවා ගත් උන්වහන්සේ, තම මවුට මෙසේ අවවාද දී ඇය බලා සිටියදී ම අහසින් වැඩිසේක. රහත් බවට පත් වූ පසුව ද උන්වහන්සේ නිතර නිතර මේ ගාථාව ම වදළසේක.

එහි ''පබ්බජිතොම්හි'' යන මේ පදයෙන් ආතුම තෙරුන්ගේ රහත්බව ප්‍රකාශ වේ. තම සන්තානයේ මල දුරුකරව, එසේ දුරු කිරීම ම පැවිද්ද නම් වේ'' යැයි දේශනා කරන ලද හෙයිණි

ආතුම තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.3

''ජිණණඤ්ඤව දිසවා දුබ්බණඤ්ඤව බ්‍යාධිතං'' යනු ආයුෂ්මත් මාණව තෙරුන් වහන්සේගේ ගාථාවකි. එහි උපත කෙසේ ද ? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා සහ ඒ ඒ උපනුපන් භවයන් හි දී සසරින් මිදීම සඳහා රැස්කරගත් කුසල සම්භාරයන් ඇති උන්වහන්සේ; මීට කල්ප අනූ එකකට පෙර බමුණුකුව ඉපිද ලක්ෂණ ශාස්ත්‍රයෙහි පර ප්‍රාප්ත වූහ. විපස්සි භාග්‍යවතුන් වහන්සේ උපන් කෙණෙහි ගොස් ශරීර ලක්ෂණබලා, පුර්ව නිමිති විමසා ''ඒකාන්තයෙන් මෙතෙම බුදුවන්නේ ය'' යැයි ප්‍රකාශ කර, විවිධාකාරයෙන් ස්තුති කර, ප්‍රදක්ෂිණා කොට වැඳ ගියේය. ඒ පින්කමේ විපාක වශයෙන් කාමසුගතීන් හි ම සැරි සරා මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර බමුණු මහසල් කුලයක ඉපදුණේය. ඉපිද සත් විය දක්වා ඇතුලු ගෙයි ම හැදී වැඩි, සත්වන වසරෙහි දී උපනයනය සඳහා උයනට ගෙනයන අතර මග දී මහළුවූවන්, ලෙඩවූවන් හා මැරුණු පුද්ගලයන් දැක - පෙර ඔවුන් නොදැක තිබු බැවින් පිරිවර ජනයාගෙන් ඒ පිළිබඳව විමසීය. ජරාවට පත්වීම, රෝගවලට ගොදුරුවීම හා මරණය අප සැම දෙනාටම උරුම වූ ස්වභාවයක් බව අසා හටගත් සංවේග ඇති බමුණු කුමරු නැවත පෙරළා එන කල් හි විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේගේ ධර්ම්ශ්‍රවණ කොට, මාපිය අවසරයෙන් පැවිදි වී නොබෝ දිනකින් ම විදසුන් වඩා මහරහත් ඵලයෙහි පිහිටියේ ය. මාණව තෙරුන් වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''විපස්සි බුදුරදුන් ලොව පහළවන කල් හි, ඇති වූ නිමිති බලා, මම මෙසේ පැවසුවෙමි. ''ජන සමූහයා කෙලෙස් ගින්නෙන් නිවමින් බුදුරජාණන් වහන්සේ ලොව පහළවන්නේය. යම් උතුමෙකු පහළවන කල් හි දස දහසක් ලෝකධාතු කම්පා වෙත් ද දැන් ඒ ශාස්තෘ වූ පසැස් ඇති භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන සේක. යම් උතුමෙකු පහළ

වන කල්හි මහත් ආලෝකයක් පැතිරුණේ ද දූන් ඒ උතුමාණෝ දහම් දෙසන සේක. යම් උතුමෙකු උපදින මොහොතෙහි ගංගා නොගැලුවේ ද, දූන් ඒ පසැස් ඇති භාග්‍යවත් හු දහම් දෙසති. යම් උතුමෙකු පහළවන කල්හි අවීචියේ ගිනි නිවුණේ ද දූන් ඒ ශාස්තෘ වූ පසැස් ඇති භාග්‍යවත් හු දහම් දෙසති. යම් උතුමකු පහළවන විට පක්ෂීහු අහසේ ගමන් අත් හැරියා හු ද ඒ උතුම් භාග්‍යවත් හු දූන් දහම් දෙසති. යම් උතුමෙකු උපදින කල්හි සුලං නොහැමුවේ ද, දූන් ඒ ශාස්තෘවූ පසස් ඇති භාග්‍යවත් හු දහම් දෙසති. යම් උතුමෙකු උපදින කල් හි සියලු රත්න බැබලුනා හු ද, දූන් ඒ ශාස්තෘ වූ පසැස් ඇති භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසති. යම් උතුමෙකු උපදින කල් හි සත් පද චික්‍රමය, සත් පියවර තැබීම කරන ලද්දේ ද, දූන් ඒ පසැස් ඇති භාග්‍යවත් හු දහම් දෙසති. උපන් මොහොතේ ම ඒ බුදුවන කුමරු සියලු දිශා බැලුවේය. අහිත වදන් පැවසීය. මේ බුදුවරුන්ගේ ධර්මතාවන් වේ.''

මෙසේ ජනයා සංවේගයට පමුණුවා, ලෝකනායකයන් වහන්සේට ස්තුති කොට සඒඥයන් වහන්සේට වැඳ නැගෙනහිරට මුහුණ ලා ගියෙමි. එදු මීට කල්ප අනූ එකකට පෙර යම් බුද්ධ ස්තූතියක් කළෙමි ද, මේ දක්වා ම මම දුගතියක නූපන්නෙමි. බුදුවැණුමෙහි මේ විපාකයයි. මීට කල්ප අනූ එකකට පෙර මම, සත් රුවනින් හෙබි මහ බල ඇති සම්මුබාථවිය නම් සක්විති රජව උපන්නෙමි. මීට කල්ප අනූ නවයකට පෙර සත් රුවන් සහිත බලවත් වූ පයවිදුන්දුහි නම් සක්විති රජවුයෙමි. මෙයින් අසූ අටවන කල්පයේ ද ඕභාස නමින් එවැනි ම සක්විති රජ කෙනෙක් ව උපන්නෙමි. මීට කල්ප අසූ හතකට පෙර සරිතවිඡේදන නමින් ද කල්ප අසූහයකට පෙර වාතසම නමින් ද කල්ප අසූතුනකට පෙර රතනපජ්ජල නමින් ද කල්ප අසූවකට පෙර ගිරිසාර නමින් ද මහත් බල ඇති - සත් රුවනින් පිරි සක්විති රජවරුන් ව උපන්නෙමි.''

දූන් මම සියලු කෙලෙස් දවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේ අනුශාසනාව ඉටුකළෙමි.''

අවබෝධ කරගත් රහත් බව ඇති උන්වහන්සේගෙන් භික්ෂූන් වහන්සේලා ''ඇවැත්ති ! නුඹ කුමක් නිසා ඉතා ළදරුවියේ දීම සංවේග උපදවා පැවිදිවූයෙහි ද ?'' යි විමසන ලදුව; තමන් වහන්සේගේ පැවිදිවීමේ නිමිත්ත පැවසීමට ද රහත්බව ප්‍රකාශ කිරීමට ද මේ ගාථාව වදළසේක.

''ජිණ්ණඤ්ච දිස්වා දුක්ඛිතඤ්ච ව්‍යාධිතං
මතං ච දිස්වා ගතමායුසංඛයං
තතෝ අහං නික්ඛමිතූන පබ්බජිං
හිත්වාන කාමානි මනෝරමානි''

''ජරාවට පත් වූ වෙකු ද, දුක්පත් ගිලන් වූ වෙකු ද ආයු ගිලිහී මැරුණු කෙනෙකු ද මම දුටුවෙමි. එනිසා මම සිත්කලු වූ පස්කම් සුව හැර දමා ගිහිගෙන් නික්ම පැවිදි වූයෙමි.''

මෙහි ''ජිණ්ණං'' යනු ජරාවෙන් දුඋරු වූ, කැඩීගිය බිඳිගිය දිරාගිය, හිස කෙස් සුදු වූ ශරීරය රැළි ගැසුණු ස්වභාවය යි. ''**දුඛිතං**'' යනු දුකට පත් වූ, දුකින් යුක්ත වූ ''**ව්‍යාධිතං**'' යනු ගිලන් වූ, මෙහි දී ''**බ්‍යාධිතං**'' යන්නෙන් ද දුකට පත්වීමේ හේතුව දක්වයි. ''**දුක්ඛිතං**'' යන වචනයෙන් ඒ පුද්ගලයාගේ දැඩිසේ ගිලන් බවට පත්වීම දක්වයි. ''**මතං**'' යනු කළුරිය කළ, යම් අයුරකින් කළුරිය කළ, ආයුෂ ක්ෂය වූ ව්‍යය වූ බැවින් කය බිඳීමට පත් වූ. එනිසා ''ගතමායුසංඛයං'' යනුවෙන් කියන ලදී. ''ගෙවී ගිය ආයු ඇති'' මේ ජරාවෙන් හා ගිලන් බවින් යුක්ත වුවත් දැක ''මේ ජරාව, ගිලන් බව මොවුන්ට පමණක් වන දේ නොවේ. ඒවා සියල්ලන්ට ම සාධාරණය, එනිසා මම ද ජරා ආදියෙන් මැඩුනෙක්මි. ඒවා ඉක්ම නොවුවෙක්මි.'' යි සංවේගයට පත්ව. ''**නික්ඛමිතූනා**'' යනු නික්මී. ''නික්ඛමිත්වා'' යන අර්ථයයි. පැවිදිවීමේ අදහසින් ගිහිගෙයින් නික්ම ''**පබ්බජිං**'' ශාස්තෘ ශාසනයෙහි පැවිදි වූ යෙමි. ''**පහාය කාමානි මනෝරමානි**'' යනු ඉෂ්ට, කාන්ත, මනාප වූ රාගය පහ නොකළවුන්ගේ සිත අලවන බැවින් සිත්කලු වූ වස්තුකාමයන්හි ඇති ආශාව දුරුකර, ඒවා සමඟ බැඳුණු කැමැත්ත - ආශාව - රාගය ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් මුලුමණින්ම නසා ඒ පිළිබඳව අපේක්ෂාවක් නොමැතිව, ඉවත දමා යන අර්ථයයි. කාමාදියේ ප්‍රහාණ කිරීම දැක්වීම් වශයෙන් මෙහිදී තෙරුන් වහන්සේගේ රහත්බව ප්‍රකාශවිය. ළඳරු කාලයේ, මාණවක සමයේ පැවිදි වූ බැවින් මේ තෙරුන්ට '' මාණව '' යන නාමය ලැබුණි.

මාණව ථේරගාථා අර්ථ විවරණාව නිමියේය.

1.8.4

"කාමච්ඡන්දෙ, චබ්‍යාපාදෙ" යනු ආයුෂ්මත් සුයාම තෙරුන් වහන්සේගේ ගාථාවයි. පෙර බුදුවරුන් හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයන්හි දී සසරින් මිදීම නම් වූ නිවන්සැප ලැබීම සඳහා පින් රැස් කරගත්හ. මෙයින් කල්ප අනූ එකකට පෙර පහළ වූ විපස්සි බුදුරජාණන් වහන්සේගේ සමයෙහි ඛේමවතී නුවර බමුණු පවුලක ඉපිදණු හෙතෙම, වියට පත්වන්ම සියලු බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන් හි කෙළවරට ගියේය. ඔහු බමුණු මන්ත්‍ර වේදිය අන්‍යයන්ට උගන්වයි. මෙසමයෙහි විපස්සි භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්ෂු සංඝයා පිරිවරාගෙන පිඬු පිණිස ඛේමවතී නුවරට වැඩිසේක. ඒ දක පැහැදුණු සිතැති බමුණා, ශාස්තෘන් වහන්සේ තම නිවසට වැඩමවාගෙන, අසුන් පනවා ඒ මත මල් වියනක් අතුරා පූජා කළේය. එහි වැඩ හිඳි ශාස්තෘන් වහන්සේ ප්‍රණීතවූ ආහාරපාන වලින් සන්තර්පනය කළේය. වළඳ අවසන් වූ කල මල් සුවඳින් පූජා පැවැත්විය. මෙසේ කරන ලද සියලු පූජා පිළිගත් ශාස්තෘන් වහන්සේ ඔහුට පුණ්‍යානුමෝදනා දේශනාව පවත්වා වෙහෙරට වැඩිසේක. ඒ මහා පින්කමේ විපාක වශයෙන් ඔහු; කාමසුගතීන් හි ඉපිද තවතවත් පින් රැස්කරමින් දෙව් - මිනිස් සැප විඳ මේ බුද්ධෝත්පාද කාලයෙහි විශාලා මහනුවර එක්තරා බමුණෙකුගේ ම පදප්‍රාප්ත විය. ඉතා සිත්කලුවූ ගෘහවාසීන්ගේ කාම උපභෝග සම්පත් පිළිකුල් කර, ධ්‍යානයෙහි ඇලී කල් යවන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ විශාලාවට වැඩම වූ අවස්ථාවෙහි ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වූ ඒ බමුණු තරුණයා හිස කෙස් කපද්දීම රහත් බවට පත්විය. සුයාම තෙරණුවෝ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

"මම එකල් හි නිඝණ්ඩු ශාස්ත්‍රය හා කෙටුභ ශාස්ත්‍රය සහිත ලක්ෂණ ශාස්ත්‍ර පුත්‍රයා වී උපන්නේ ය. හේ සුධාව නම් විය. හෙතෙම වියපත් වූයේ වේදතුයෙහි, පායෙහි ද ඉතිහාසයෙහි ද දක්ෂ වී ඛේමවතී නුවර බමුණෙක් ව විසුවෙමි. පදපාඨ දන්නෙමි. ව්‍යාකරණයෙහි ද නිමිති ශාස්ත්‍ර යෙහි ද දක්ෂව ත්‍රිවේදයෙහි පරතෙරට පත් වූ මම ශිෂ්‍යයනට මන්ත්‍ර පාඨ කියවීමි. මම මගේ මාපියන් පුදනු කැමති ව උපුල් මල් මිටි අටක් අසුනක තැබුවෙමි. එකල් හි නරශ්‍රේෂ්ඨ වූ විපස්සි බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන සියලු දිශා බබුලුවමින් එහි වැඩමකළ සේක. ඒ බුදුරජාණන් වහන්සේට ආරාධනා කළ මම, මල් අතුරා අසුනක් පනවා මගේ නිවෙසේ උන්වහන්සේ වඩා හිඳුවෙමි. මගේ ගෙදර මා සඳහා පිළියෙල වී පැවති

ආහාරපාන පහන් සිතින් උන්වහන්සේට පූජා කළෙමි. වළඳ අවසානයේ උන්වහන්සේට සුදුසු කල් දැන, මල් මිටක් ද පූජා කළෙමි. ඒ සවිඥයන් වහන්සේ අනුමෝදනා කොට උතුරු දෙස බලා වැඩියහ.''

''මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පුෂ්ප දනයක් දුන්නෙම් ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. පුෂ්පදනයේ විපාකය මෙබඳුය. මෙයින් අනූ වන කල්පයෙහි සත්රුවනින් හෙබි මහත් බලැති වරදස්සන නම් සක්විති රජ වූයෙමි. දැන් මම සියලු කෙලෙස් දවුයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ උන්වහන්සේ නීවරණ ප්‍රහාණය කිරීම් වශයෙන් තම රහත්බව ප්‍රකාශ කරීමට

''කාමච්ඡන්දෙ ච බ්‍යාපාදො ථීනමිද්ධඤ්ච භික්ඛුනො
උද්ධච්චං විචිකිච්ඡා ච සබ්බසොව න විජ්ජති''

යනුවෙන් වදළහ.

එහි ''කාමච්ඡන්දෙ'' යනු කාමයන්හි ඇලුණු, කාමයෙහි ද ඔහු ඇලුණේ යැයි කාමච්ඡන්ද නම් වේ. කාමරාගයයි. මෙහි දී සියලුම ආකාරයේ රාගය, ඇලීම කාමච්ඡන්දය ලෙස ගැනේ. අග්‍රමාර්ගය වූ ආර්‍ය මාර්ගයෙන් දුරු වූ යන අදහසයි. එනිසා ''සබ්බසොව න විජ්ජති'' සියලුම ආකාරයෙන් නොපවති යැයි කියන ලදී. සියලුම ආකාරයේ තෙහුමික ධර්මයන්ට කැමතිවීම් අර්ථයෙන් ''කාම'' නම් වේ. ඒ කාමයෙහි පවත්නා රාගය - ඇලීම කාමච්ඡන්දයයි. භාග්‍යවතුන් වහන්සේ ''අරූප භූමියෙහි දී කාමච්ඡන්දනීවරණය නිසා ථීනමිද්ධ නීවරණය ද උද්ධච්ච නීවරණය ද අවිද්‍යා නීවරණය ද උපදින්නේ ය'' යි වදළසේක. ක්‍රෝධභාවයට යයි, සිත කිලිටිභාවයට යයි යන අරුතින් ''බ්‍යාපාදො'' නම් වේ. ''මට අනර්ථයක්, අවැඩක් කළේ ය'' යි ආදී වශයෙන් පවතින දැඩි වෛරයයි. ''ථීනං'' යනු සිතේ කම්මැලි බවයි. සැගවී පවතින ද්වේෂයයි. ''මිද්ධං'' යනු කයේ මැලි - අලස බවයි. සිතේ කරදරයක්, විපතක් නොමැති කල් හි මේ දෙකම ඇති වේ. ථීනය ද මිද්ධ ය ද ''ථීනමිද්ධ'' ලෙස එක්වේ. කෘත්‍ය, ආහාර හා විරුද්ධ වීම් එක සමාන බැවින් මේ දෙකම එකට ගන්නා ලදී. සිතේ විසිරුණු ස්වභාවය ''උද්ධච්චං'' නම් වේ. යම් කරුණකින් සිත විසිරීයයි ද උඩගු භාවයට පත්වේ ද එසේ ඇතිවන සිතේ වික්ෂිප්තභාවය ''උද්ධච්ච'' යයි. මෙහි දී උද්ධච්චයට කෘත්‍ය - ආහාර ප්‍රතික්ෂේප වූවන් සමාන බැවින්

කුක්කුච්චය ද ගන්නා ලදයි දතයුතුයි. පසුතැවිලිවන ස්වභාවය කුක්කුච්ච නම් වේ. කළ- නොකළ කුසලාකුසලයන් පිළිබඳව සිතමින් විපිළිසර වීම කුක්කුච්ච නම් වේ. ''**විචිකිච්ඡා**'' යනු ''මෙසේ වූයේ ද ? මෙසේ නොවී ද ?'' ආදී ලෙස පවතින සැකයයි. ධර්මයන්ගේ ස්වභාවය සොයමින් මෙහෙසේ. දුකට පත්වේ. යන - අරුතින් ''විචිකිච්ඡා'' නම් වේ. බුද්ධා දී අට නැන් කෙරෙහි පවතින සැකයයි. ''**සඞ්ඛසෙ**'' යනු සියලුම ආකාරයෙන් **ඉතිරි නොකර ''න විජහති**'' යනු නොපවතියි. ආර්ය මාර්ගයෙන් මෙම පංච නීවරණ මුලුමණින් ම සිඳ ලු බැවින් දැන් මා කෙරෙහි ඒවා නොපවතියි. මේ අවසන් පද දෙක මුලින් කී නීවරණ ධර්ම පසට ම වෙන වෙනම යොද අර්ථ ගත යුතුයි. මෙම ගාථාවේ අර්ථය මෙසේය. - ''යම් භික්ෂුවක් විසින් ඒ ඒ ආර්ය මාර්ගයන් මගින් මුලුමනින්ම කාමච්ඡන්දය ද ව්‍යාපාදය ද ථීන මිද්ධය ද උද්ධච්ච කුක්කුච්චය ද විචිකිච්ඡාව ද සියලු ම ආකාරයෙන් සිඳලු බැවින්, ඒවා උන්වහන්සේගේ සිතේ නොපවතියි. ඔහුට නැවත කළයුතු දෙයක් නැත. ඔහු කළයුතු දේ කරන ලදී රහත්බව ප්‍රකාශ කිරීම් වශයෙන් සිය දැනුම - අවබෝධය මෙසේ උන්වහන්සේ දක්වති. පංචනීවරණ ධර්ම සෝවාන් ආදී ආර්ය මාර්ගාංගයන් මගින් සම්පූර්ණයෙන් ම සිඳ ලු කල් හි ඒකාන්තයෙන් ම එම පුද්ගලයාගේ සියලු කෙලෙස් මුලුමනින් ම සිඳ දමන ලද්දේම ය. එනිසා භාග්‍යවතුන් වහනසේ ''පංච නීවරණ ධර්ම ප්‍රහාණය කර, සිත සියලුම කෙලෙස්වලින් මුදා ගන්නේය'' යනුවෙන් වදළසේක.

සුසාම ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.5

''**සාධු සුවිහිතාන දස්සනං**'' යනු ආයුෂ්මත් සුසාරද තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි බමුණෙක්ව උපන්හ. සියලු විද්‍යාවන් හි කෙළවරට පැමිණි ඔහු කාමයේ ආදීනව දැක ගිහිගෙයින් නික්ම තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවතෙහි ආරණ්‍යයක ආශ්‍රමයක් කරවාගෙන, එහි වාසය කළේය. ඔහුට අනුග්‍රහ පිණිස පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිඬුසිගා යන වේලාවෙහි එතැනට එළඹිසේක. උන්වහන්සේ වඩිනු දුරදීම දුටු, පැහැදුණු සිත් ඇති බමුණා පෙරගමන් කොට, පාත්‍රය

ගෙන මිහිරි ඵලවැල එහි තබා පූජාකළේය. භාග්‍යවතුන් වහන්සේ එම දානය පිළිගෙන, අනුමෝදනා දේශනාව පවත්වා විහාරයට වැඩිසේක. ඒ බමුණු කරන ලද මෙම පින්කමෙහි විපාක වශයෙන් කාමසුගතීන්හි ඉපිද, සසර සැරි සරා අපගේ බුදුරජාණන් වහන්සේ පහළවන සමයෙහි ධර්මසේනාපති වූ සැරියුත් මහතෙරුන්ගේ ඥාති බමුණු පවුලක ඉපිද මඳ වූ නුවණැති බැවින් "සුසාරද" යන නමින් ප්‍රකට ව විසීය. පසුකලෙක හෙතෙම සැරියුත් මහතෙරුන් සමීපයේ දී ධර්මය අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදිව, විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් විය. උන්වහන්සේ සිය චරිතාපදානය මෙසේ දැක්වූහ.

"වේද හදරන්නා වූ, මන්ත්‍රධාරී වූ, වේදත්‍රයෙහි පරතෙරට ගිය මම හිමවත සමීපයේ වූ අසපුවක වෙසෙමි. මාගේ ගිනි පිදීමෙක් ද විය. ඇටඹ ඵල මල්ලක දමා ගසක් මුදුනෙහි එල්ලා තැබුවෙමි. ලෝකයාගේ පූජාවන්ට භාජන වූ ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මා සසරින් ගොඩගනු කැමතිව පිඬුපිණිස හැසිරෙමින් මා වෙත වැඩිසේක. පහන් සිත ඇති මම, සතුටින් යුක්තව බුදුරදුන්ට එම ඵල පිළිගැන් වූයෙමි. මාගේ පුණ්‍ය ප්‍රීතිය වඩන්නා වූ මෙලොවදීම සැප ගෙනදෙන්නා වූ රන්වන් පැහැයෙන් බබලන ලෝවැසි ජනයාගේ පුද පූජා පිළිගන්නා වූ ශාස්තෘන් වහන්සේ අහසේ වැඩ හිඳ මෙසේ වදළසේක.

"මෙම ඵලදානය හා චිත්ත ප්‍රණිධිය නිසා කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුගතියකට නුඹ නො පැමිණෙන්නේ ය."

"මෙම කුශලය නිසා මම දිව්‍ය - මනුෂ්‍ය සම්පත් විඳිමි. දැන් අචල වූ ජය - පරාජ දෙකින්ම දුරුවූ උතුම් නිවණ අවබෝධ කළෙමි. මෙයින් සත්වන කල්පයේ දී සත්රුවනින් පිරි, මහත් බලැති සුමංගල නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවුවෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ සත්පුරුෂ ආශ්‍රය ප්‍රකට කිරීම් වශයෙන් සිය රහත්බව ප්‍රකාශ කරන සේක්.

"සාධු සුවිහිතාන දස්සනං කඩ්ඛා ජිජ්ජති බුද්ධි වඩ්ඪති
බාලම්පි කරොන්ති පණ්ඩිතං තස්මා සාධු සතං සමාගමෝ"

යන ගාථාව වදළ සේක. එහි ''සාධු'' යනු සුන්දර වූ, යන අර්ථයයි. ''**සුවිහිනාන දස්සනං**'' යනු මනාව පිහිට වූ සිත් ඇත්තන්ගේ (සුවිහිනානං) දර්ශනය - දැකීම. ගාථාව පහසුවෙන් පැවසීම සඳහා සුවිහිනානං යන තැන බින්දුව ලොප් කරන ලදී. සීලාදී ගුණ ධර්මයන්ගෙන් මනාව සංවර වූ ස්වභාව ඇති, අනුන් කෙරෙහි අනුකම්පාවෙන් මනාව දෙසන දම් දෙසුම් ඇති ආර්යයන් වහන්සේලාගේ දර්ශනය - දැකීම ඉතා යහපත් වූවකි. ''**දස්සනං**'' යනු ශ්‍රවණාදියෙහි ද බොහෝ උපකාර ඇති බැවින් දැකීම යනු නිදසුනක් පමණ යැයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ. ''යම් භික්‍ෂු පිරිසක් සීල, සමාධි, විමුක්ති, විමුක්ති ඥාන දර්ශන ආදියෙන් සමන්විත වූ සේක් ද අවවාද දෙන, අවබෝධ කරවන, නිවන් මග දක්වන, එහි සමාදන් කරවන, ආර්ය මාර්ගයෙහි උත්සාහවත් කරවන, සතුටු කරවන ප්‍රමාණවත් සද්ධර්ම දේශනාවක් පවත්වන්නෝ වෙත් ද; මහණෙනි එබඳු භික්‍ෂූහු බොහෝ උපකාර ඇත්තෝ යැයි මම කියමි.'' දැකීම මූලික වූ බැවින් හේ අන්‍යයන්ගේ දැකීම් පමණින් ම ''මේ ගුණ ඔවුන්ට විද්‍යමාන වේ'' යැයි කියන ලදී. එය හේතු දක්වන වචනයකි. මෙබඳු වූ ස්වරූප ඇති කලණ මිතුරන්ගේ දැකීම් පමණින් ම නුවණ ඇති තමාට වැඩ කැමති කුල පුත්‍රයා උන්වහන්සේලා වෙත පැමිණේ, ඇසුරු කරයි. ''ස්වාමීනි ! කුසල් යනු කුමක් ද ? අකුසල් යනු කුමක් ද ?'' යි ආදී ප්‍රශ්න විමසයි. ඒ සත්පුරුෂ තෙරවරු ද ඔහුගේ නානාවිධ වූ සැක ඇති තැන් හි ඇති සැකය දුරුකරති. එනිසා ''**කඞ්ඛා ඡ්ජති**'' යනුවෙන් ''සැක සිඳින ලදී'' යැයි කියන ලදී. ඒ සත්පුරුෂ තෙරවරු ධර්මදේශනාවෙන් සැක සහිත පුද්ගලයන්ගේ සැක දුරුකරවා, පුර්වභාග වූ කර්මපථ සම්මා දිට්ඨිය ද විදර්ශනා සම්මා දිට්ඨිය ද උපදවති. එනිසා ඒ පුද්ගලයන්ගේ බුද්ධිය වැඩේ. (බුදධි වඩඪති) යම් කලෙක ඔවුහු විදසුන් වඩා චතුරාර්ය සත්‍යධර්ම අවබෝධ කරගනින් ද එකල් හි සොළොස් වස්තුක වූ ද අට වස්තුක වූ ද සැකය සිඳෙයි. සම්පුණියෙන් ම වැනසෙයි. වෙනස් කළ නොහැකි ලෙසම ඔවුන්ගේ ප්‍රඥාව වැඩේ. බාල, මෝඩ බව ඉක්ම වූ ඔවුහු පණ්ඩිතයෝ වෙති. ඔවුන්ගේ බුද්ධිය වැඩෙයි. එනිසා ''**බාලම්පි කරොන්ති පණ්ඩිතං**'' යනුවෙන් බාලයෝ ද නුවණැත්තෝ කරති යන නිගමනය ගන්නා ලදී. ඉහත පැවසූ ලෙසම සත්පුරුෂයන් දැකීමෙන් හා සැක සංකා දුරුකරගැනීමෙන් බුද්ධිය වැඩෙයි. එනිසා ඔවුහු සැක සහිත බාලයෝ නුවැණැති බවට පමුණුවති. මෙම කාරණය - හේතුව නිසා සත්පුරුෂයෝ ඉතා යහපත් වෙති. සුන්දර වෙති. එබඳු ආයර්‍ය උතුමන්ගේ එක් වීම යහපත වර්ධනය කරන්නකි. මෙසේ ගාථාවේ අර්ථ දතයුතුයි.

සුසාරද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.6

''උසභතනෙතසු නිපතෙ'' යනු ආයුෂ්මත් පියඤ්ජහ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී ඒ ඒ භවයන්හි දී කළ ප්‍රාර්ථනා ඇතිව නිවන් පතාගෙන කළ පින්දහම් ඇතිසේක්; මෙයින් කල්ප අනූ එකකට පෙර විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත එක් රුක් දෙවියෙක් ව උපන්හ. පවිත අතර වසන එම දෙවියා දේව සමාගමයන්හි දී අල්ප ආනුභාව ඇති බැවින් පිරිස් කෙළවර හිඳ ධර්මය අසා ලැබූ ශ්‍රද්ධා ඇති ව, එක් දිනක් ඉතා පිරිසිදු රමණීය ගංගාවක වැලි තලාවක් දැක; ''ශාස්තෘන් වහන්සේගේ අපමණ ගුණ සමූහය මෙයට ද වඩා අනන්තය. අප්‍රමාණයැ''යි ශාස්තෘන් වහන්සේගේ ගුණ සිහිපත් කළේය. මෙසේ ශාස්තෘ ගුණයන්හි පිහිටුවන ලද සිත් පැහැදවීම ඇති එම දෙවියා ඉන් චුතව කාම සුගතීන් හි ම සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයෙහි විශාලා මහනුවර ලිච්ඡවි රජ පවුලක ඉපිද, යුධකාමී වූ තරුණයෙක් ව නො පැරදුණු සටන් ඇතිව, සතුරන්ට මහත් හානි පමුණුවන බැවින් ''පියඤ්ජහ'' නමින් ප්‍රකට විය. ශාස්තෘන් වහන්සේ විශාලා මහනුවරට වැඩම වූ මොහොතෙහි ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වී අරණ්‍යයෙහි වාසය කළ උන්වහන්සේ, විදසුන් වඩා මහරහත් ඵලයෙහි පිහිටි සේක. උන්වහන්සේ විසින් සිය චරිතාපදානය මෙසේ දැක්වූහ.

''හිමවත් පව්වෙහි කඳු අතරෙහි වෙසෙමි. ශෝභන වූ වැලිතලාවක් දැක බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි.'' උන්වහන්සේගේ නුවණට සැසඳීමට උපමාවක් නැත. ශාස්තෘන් වහන්සේට සංග්‍රාමයකුත් නැත. සියලු ධර්මයන් මනාව දැන නුවණින් නිශ්චයට පැමිණේ. පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස ! ඔබවහන්සේට නමස්කාර වේවා. පුරුෂෝත්තමයන් වහන්ස ! ඔබවහන්සේට නමස්කාර වේවා. උතුම් නුවණ යම්තාක් වේ ද ඒතාක් නුවණින් ඔබවහන්සේ හා සම කෙනෙක් නැත. මෙසේ බුද්ධ ඥානයෙ හි සිත පහදවා කල්පයක් මුලුල්ලෙහි මම ස්වර්ගයෙහි සතුටු වුයෙමි. සෙසු කල්පයන් හි ද ම විසින් කුසල් කරන ලදී. මෙයින් එක් අනුවන කල්පයේ යම් බුද්ධ ඥාන සංඥාවෙහි මේ විපාකයයි. මෙයින් තෙසැත්තෑවන කල්පයේ සත් රුවනින් පිරි මහත් බල ඇති පුලින පුප්ඵීය නම් සක්විති රජ කෙනෙක් වුයෙමි. මම දැන් සියලු කෙලෙස් දැවුයෙමි - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත් වූ පියඤ්ජහ තෙරණුවෝ; ''අද පුනුදුන් පුද්ගලයන්ගේ ප්‍රතිපත්තියෙන් ආර්යයන්ගේ ප්‍රතිපත්තිය ඉතා දුරවේ'' යන මෙම අර්ථය දැක්වීම් වශයෙන් ද සියලු කෙලෙස් නසා රහත් වූ බව දැක්වීම් වශයෙන් ද මෙම ගාථාව වදළහ.

''උපපත්තෙනසු නිපතෙ නිපතනෙනසු උපපතෙ
වසෙ අවසමානෙසු රමමානෙසු නො රමෙ''

එහි ''උපපත්තෙනසු'' යනු සත්ත්වයෝ දියුණුවන, උසස්බවට පත්වන කල්හි මාන, උද්ධච්ච, තදගති හා එකටෙක කිරීමාදියෙන් තමා හුවා දැක්වීම් (අත්තුක්කංසනයෙන්) වශයෙන් නොසන්සුන් වන අවස්ථාවෙහි; ''**නිපතෙ**'' යනු නැමෙන්නේය. ඒ පාපීධම් දුරින් ම දුරුකිරීම් වශයෙන් යටහත් පැවතුම් ඇත්තකු වන්නේය. ''**නිපතනෙනසු**'' යනු පහතට නැමෙන කල්හි, හීනාධිමුක්තික වූ කුසීත බව ආදියෙන් ගුණයන්ගෙන් පිරිහෙන අවස්ථාවෙහි, ''**උපපතෙ**'' යනු තමා උසස්බවට පත්වන්නේ ය. ප්‍රණීතාධිමුක්තික වූ වීර්යාරම්භයෙන් ගුණ මහිමයෙන් නැගී සිටින්නේය. උසස් බවට පත්වන්නේය. නැතහොත් ''**උපපත්තෙනසු**'' යනු කෙලෙස් නැගී නැගී සිටිනා කල් හි, මැඩගෙන නැගිසිටීම් වශයෙන් කෙලෙස් හිස ඔසවන කල් හි ''**නිපතෙ**'' යනු යම්සේ එම කෙලෙස් නූපදින්නේ ද එසේ සුදුසු වූ ප්‍රත්‍යවේක්ෂාදියකින් මැඩපැවැත්වීම වශයෙන් විෂ්කම්භනය කරන්නේය. එසේ ම මුලුමනින් ම සිඳ දමන්නේය. ''**නිපතනෙනසු**'' යනු බිඳවැටෙන කල් හි, අනුවණින් මෙනෙහි කිරීමෙන් වීර්ය උත්සාහ ප්‍රයෝගාදිය මඳ වූ බැවින් හෝ එසේ ඇරඹි සමථ විදර්ශනාදී ධම් පිරිහෙන කල් හි; ''**උපපතෙ**'' යනු නුවණින් මෙනෙහි කිරීමෙන් ද වීර්යාරම්භ සම්ප්‍රදයෙන් ද ඔවුහු නැගී සිටින්නේය. මාර්ග ඵල උපදවන්නෝය. ආර්ය මාර්ගය වඩන්නෝ ය. ''**වසෙ අවසමානෙසු**'' යනු සෙසු ජනයා (සත්ත්වයා) මග බඹසරෙහි ද ආර්ය වාසයෙහි ද නො හැසිරෙන කල් හි තමා එම විහරණයන්ගෙන් යුක්ත වන්නේය. බඹ සර වාසයෙහි යෙදෙන්නේය. නැතහොත් ආර්යයෝ කෙලෙස් වසඟව දෙවැනි වාසයක නො වසන්නා හු ද යම් බඹසරක විසීමෙන් ඔවුහු ''අවසමාන'' නම් වේ. ද එසේ තමා ද එම ගුණ අනුගමනය කරයි. ''**රමමානෙසු නො රමෙ**'' යනු සෙසු සත්ත්වයෝ කාම ගුණයන් හි ඇලී කෙලෙස්වල ගැලෙන කල්හි තමා එහි නො ඇලෙන්නේය. ''**නො රමෙ**'' යනු නො ඇලේ. නැතිනම් ආර්යයෝ නිරාමිෂව ධ්‍යානයන් හි වෙසෙසින් ඇලෙන කල් හි තමා ද එහි ඇලෙන්නේය. ඉන් අන්ආකාරයකට වෙනස් බවකට කිසිදු නොයන්නේය. පංච කාම ගුණයන් හි කිසිදු අයුරකින් නො ඇලෙන්නේය යන අර්ථයයි.

පියඤ්ජහ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

''ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං'' යන ගාථාව ආයුෂ්මත් හත්ථාරෝහ පුත්ත තෙරුන් වහන්සේ විසින් දෙසන ලද්දකි. එහි උපත කෙසේ ද ? ඒ ඒ භවයන් හි දී රැස් කරන ලද පුණ්‍ය සම්භාර ධර්ම ඇති මේ තෙරණුවෝ ද පෙර බුදුවරු හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇතිව සසර සැරි සැරූහ. විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටුගෙයක ඉපිද වැඩිවිය පැමිණියේ, එක් දිනක් බික් සඟන පිරිවරාගෙන විහාරයෙන් නික්ම වඩින ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් මලින් පූජා පැවැත්විය. මල්වලින් පූජා පවත්වා පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණා කොට පින් රැස්කරගත් හෙතම, එපින් බෙලෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා මෙ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත් නුවර හත්ථාරෝහක කුලයෙහි උපන්නේය. වැඩිවියට පත්ව සියලු හස්ති ශිල්පයන් හි අගතැන්පත් වූ මේ ඇත් ගොවුවාට දිනක් ඇතුන් හික්මවමින්, නදී තෙරට යන විට, පෙර පින් බෙලෙන් මෙහෙයවනු ලබනුයේ, ''මම මේ ඇතුන් දමනයෙන් කවර ප්‍රයෝජනයක් ද ? තමා දමනය කරගැනීම ම උතුම් වේ'' යැයි සිතක් පහළ විය. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, ධර්මය අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි ව, සිය චරිතයට ගැලපෙන කමටහන් රැගෙන විදසුන් භාවනා වෙහි සිත යොදවා බොහෝ කලක් පුරුදු කරන ලද කමටහන් ඇති විය. ඔබිනොබ දුවන සිත; දක්ෂ හස්ත්‍යාචාර්යකු හෙණ්ඩුවෙන් මත් වූ මද වෑහෙන මතැතෙකු දමනය කරන්නාක් මෙන් නුවණින් සලකා බැලීම නම් හෙණ්ඩුවෙන් දමනය කරමින් ''ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං'' යන ගාථාව උන්වහන්සේ විසින් දෙසන ලදී.

එම ගාථාවෙහි ''ඉදං'' යනු ගාථාව පවසන්නාගේ සිතේ ආත්ම ප්‍රත්‍යක්ෂ සඳහා කියන ලද්දකි. ''පුරෙ'' පෙර සිත දමනය කිරීමට, නිග්‍රහකිරීමට පෙර ''අචාරි'' යනු හැසිරුණේය, දමනය නොවූ අස්ථිර චඤ්චල වූ සිත නොයෙක් අරමුණුවල හැසිරුණේය. ''චාරිකං'' යනු කැමති සේ හැසිරුණේය. එනිසා ''යෙහිච්ඡකං යත්ථකාමං යථාසුඛං'' යනාදිය කියන ලදී. රිසිසේ, කැමති තැනක, සුවයේ සිත හැසිරුණේය. ''තදජ්ඣහං'' යන්නෙහි (තං + අජ්ජ + අහං) ''තං'' යනු ඒ සිතයි. ''අජ්ජ'' යනු දැන් - අද ''අහං'' මම ''නිග්ගහෙස්සාමි'' යනු නිග්‍රහ කරන්නෙමි. කළකිරෙමි, දමනය කරන්නේමි, ''යොනිසො'' යනු උපායෙන් - නුවණින් ''යථා'' යනු යම්සේ. අංකුසයෙන් ඇතුන් බිදලන්නාක් - දමනය කරන්නාක් මෙණි. මෙහි අදහස මෙසේ දතයුතුයි. - මේ මගේ සිත මීට පෙර රූපා දී විවිධ

අරමුණුවල ඇලීමට කැමති වුයේ ද ඒ ඒ රිසි රිසි තැන්හි ඇලුණේය. යම් නැනක හැසිරීමෙන් සැපයක් - සුවයක් ලැබේ ද එබඳු සුව ඇති තැන්හි බොහෝ කාලයක් හැසිරුණේය. එබඳු වූ සිතට අද මම, දක්ෂ ඇත් ගොවුවෙකු හෙණ්ඩුවකින් මද වෑහෙන ඇතුන් දමනය කරන්නාක් මෙන් නුවණින් මෙනෙහි කිරී මෙන් දමනය කරන්නෙමි. සිතට නිග්‍රහ කරන්නෙමි. මම මගේ සිතට විසිරීයාමට, අවුල්ව යෑමට අවසර නොදෙමි.''

මෙසේ පවසන් ම තෙරුන් වහන්සේ විදසුන් වඩා රහත් ඵලය සාක්ෂාත් කරගත් සේක. උන්වහන්සේගේ චරිතාපදනය අපදනපාළියේ මෙසේ දැක්වේ.

''දක්ෂිණාවන්ට සුදුසු වූ රන්වන් වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ තම ශ්‍රාවකයන් පෙරටු කරගෙන තම ආරාමයෙන් නික්මුණු සේක. මොහඳුර දුරු කරන්නා වූ සර්ව්ඥ වූ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ දුටු මම; පහන් සිත් ඇතිව සතුටින් යුවළ මල් පූජා කළෙමි. ද්විපදෝත්තම වූ තාදී ගුණ සහිත බුදුරදුන් කෙරෙහි හටගත් සිත් පැහැදීම නිසා අතිශය සන්තෝෂයට පත් මම, තථාගතයන්ට නැවත නැවත වැන්දෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් මල් පූජාවක් කළෙම් ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නුපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මීට කල්ප සතලිස් එකකට පෙර සත් රුවනින් හෙබි - මහබලවත් ''වරණ'' නම් සක්විති රජ වුයෙමි. දැන් මම සියලු කෙලෙස් දවුයෙමි- පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මෙම ගාථාවම තෙරණුවන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව ද විය.

හත්ථාරෝහ පුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.8

''අනෙක ජාති සංසාරං'' යනු ආයුෂ්මත් මෙණ්ඩසිර තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුරජාණන් වහන්සේලා හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇති ව ඒ ඒ

භවයන් හි දී නිටන් පතාගෙන නොයෙක් පින් දහම් සිදුකරගත් හ. මෙතෙම මෙයින් කල්ප අනූ එකකට පෙර බමුණු කුලයක ඉපිද වැඩිවිය පත්ව, සසර පුරුදුතාවය නිසා ගිහිගේ හැර දමා ඍෂි පැවිද්දෙන් පැවිදිව මහත් වූ ඍෂිවරු පිරිවරාගෙන හිමවතෙහි වාසය කළේය. දිනක් එහි වැඩ ම වූ ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු ඍෂිතුමා තම ශිෂ්‍ය ගණයා ලවා නෙලුම් මල් ගෙන්වා ඉන් උන්වහන්සේට පූජා කළේය. මල් පූජා වෙන් අනතුරුව සිය සිසුන්ට අප්‍රමාදීව කටයුතු කරන ලෙස ඔවදන් දී කළුරිය කර දෙව් ලොව උපන්නේ ය. මෙසේ දෙව් සැප විඳිමින් සසර සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී සාකේත නුවර ගහපති පවුලක උපන්නේ ය. ඒ කුමරුගේ හිස බැටළුකුට (මෙණඬ) සමාන වූ බැවින් ''මෙණ්ඩසිර'' නාමයෙන් ප්‍රකට විය. භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවර අඳුන් වනයෙහි වැඩ වසන සමයෙහි මෙණ්ඩසිර සිටුතුමා උන්වහන්සේ වෙත පැමිණ, ලබන ලද ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වී සමථ හා විදර්ශනා කමටහන් වඩා, ෂඩ් අභිඥා උපදවා ගත්තේය.

උන්වහන්සේගේ චරිතාපදානය මෙසේ අපදන පාළියේ දැක්වේ.

''හිමවත නුදුරෙහි නා නා වෘක්ෂයන්ගෙන් ගැවසී ගත් මහත් වූ සත්ත්ව සමූහයාට වාසස්ථාන වූ ගෞතම නම් පර්වතයක් විය. එහි මැද මැනවින් මැවූ අසපුවක් විය. මම තමාගේ ම ශිෂ්‍යයන් පිරිවරාගෙන එම අසපුවෙහි විසුවෙමි. දිනක් මම ඔවුන්ට මෙසේ කීවෙමි.

''මගේ ශිෂ්‍යයෝ පැමිණෙත් වා ! මට පියුම් ගෙන එත්වා ! ද්විපදෝත්තම වූ තාදී ගුණ සහිත බුදුරජාණන් වහන්සේට මල් පූජා කරන්නෙමු. ''ඔවුහු ''එසේය'' යි මට පිළිතුරු දී පියුම් ගෙන ආහ. මම සව්ඥයන් වහන්සේ නිමිති කොට එම මල් පිදුවෙමි. ඉන් පසුව ශිෂ්‍යයන් කැඳවා මැනවින් අවවාද කළෙමි.

''නුඹලා නොපමාවවු ! අප්‍රමාදී වීම, සැප ගෙන දෙන්නේය.'' මෙසේ පැවසු මගේ වදන් වචනක්ෂම වූ මට කීකරු වූ සියලු සිසුනු පිළිගත්හ. මෙසේ අවවාද කළ මම ද නොපමාව ම වාසය කොට කළුරිය කළෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් මල් පූජාවක් කළෙම් ද එතැන් පටන් දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවෙහි විපාකය මෙබඳුය. මෙයින් කල්ප පනස් එකකට පෙර සත්රුවනින් පිරි මහ බලවත් සක්විති රජෙක්ව ''ජනුත්තම'' නාමයෙන් ප්‍රකට වීමි.

දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි. - පෙ - බුද්ධානු ශාසනය මනාව ඉටුකළෙමි.''

පසුව උන්වහන්සේ සිය පෙර ආත්මභාව සිහිපත් කරන සේක්;

''අනෙක ජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
තස්ස මෙ දුක්ඛජාතස්ස
දුක්ඛක්ඛන්ධා අපරද්ධා''

යන ගාථාව වදළසේක. එම ගාථාවෙහි ''අනෙකජාති සංසාරං'' යනු නොයෙක් සිය දහස් ගනන් වූ ජාති වල, මේ සංසාර සාගරයේ නොයෙක් භාවයන් හි, මාර්ගයක් (අද්ධා) අදහස්වන බැවින් මෙතැන අත්‍යන්ත සංයෝගයේ දුතියා විභක්තියෙහි ඒකවචනය යෙදී ඇත. ''**සන්ධාවිස්සං**'' යනු හැසිරුණෙමි. ඒ ඒ භවයන් හි ඉපිදෙමින් මැරෙමින් නැවත ඉපිදෙමින් සැරිසැරුවෙමි. ''අනිබ්බිසං'' යනු එම සැරි සැරීම නවතන ඥානය නොලැබුයෙමි. සසර පැහැත්ම නවතන චතුරාර්ය සත්‍යවබෝධය නොමැතිව. ''**තස්ස මෙ**'' මෙසේ හැසිරුණු මා හට ''**දුක්ඛජාතස්ස**'' යනු ඉපදීම් වශයෙන් උපන් දුක් ඇති, දුක් සහිත භවයන් හි ඉපදීම නිසා උපන් දුක් ස්වභාව ඇති. ''දුක්ඛක්ඛන්ධා'' යනු කර්ම ක්ලේෂ විපාක වශයෙන් කියැවෙන මහත් වූ දුක් රැස්. ''අපරද්ධා'' යනු අර්හත් ඵලය ලබාගැනීමේ සිට සසර සැරීම නතරවිය. ඉන් මිදුණි. දැන් මගේ සසර පැවැත්මක් නැත. ''අපරධ්‍යා'' යන පාඨය ද ඇතැම් තැනක යෙදේ. නොපවත්නා සංසිද්ධියෙන් සසර පැවැත්ම මුලිනුපුටා දැමූ බැවින් ''සසරින් පහවූ'' යන අර්ථයයි. මෙම ගාථාවම මෙණ්ඩසිර තෙරණුවන්ගේ රහත් බව ප්‍රකාශ කිරීම ද විය.

මෙණ්ඩසිර ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.9

''**සඛො රාගො පහීනො මෙ**'' යනු ආයුෂ්මත් රක්ඛිත තෙරුන් වහන්සේ පැවසූ ගාථාවයි. එහි උපත කෙසේද? පදුමුත්තර බුදුන් දවස

සිටුගෙයක ඉපිද වැඩිවියට පත් සිටු කුමරෙක්ව, එක්දිනක් ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පැහැදුණු සිතින් දේශනා ඥානය අරඹයා උන්වහන්සේට ස්තුති කළේය. ශාස්තෘන් වහන්සේ මේ සිටුපුත්‍රයාගේ සිත් පැහැදීම දැක "මොහු මින් කල්ප ලක්ෂයකට පසුව ගෞතම නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි රක්ඛිත නම් මහා ශ්‍රාවකයා වන්නේය" යි විවරණ දුන්සේක. එය අසා අතිශයින් සතුටට පත්වූ සිටුපුතු ඒ ඒ භවයන්හි දී තවත් පින්දහම් සිදුකර, දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා; අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි "වේදේහ" නම් නියම් ගමෙහි ශාක්‍ය රජ පවුලක උපන්නේය. රක්ඛිත නමින් ප්‍රකට වූ මේ ශාක්‍ය කුමරු; ශාක්‍ය - කෝලිය රජවරුන් විසින් භාග්‍යවතුන් වහන්සේ පිරිවරාගෙන සිටීම සඳහා දුන් පන්සීයක් රජකුමරුවන් ගෙන් කෙනෙක්ව පැවැදිවිය. ඒ රාජකුමාරවරු පැවිද්ද පිළිබඳව නොකැමැත්තෙන් (නැයන්ගේ බලකිරීමෙන්) පැවිදි වූ බැවින්; ශාස්තෘන් වහන්සේ ඔවුහු රැගෙන කුණාල වැව් ඉවුරට වැඩියහ. එහිදී ස්ත්‍රී දෝෂ ප්‍රකට කෙරෙන කාමයේ ආදීනව දැක්වෙන කුණාල ජාතකය දේශනා කළසේක; එම ශාක්‍ය කෝලිය තෙරවරු කමටහන් වැඩීමෙහි යෙදවූ සේක. එකල් හි රක්ඛිත තෙරණුවෝ කමටහන් වැඩීමෙහි නිරතව විඳසුන් භාවනාවට සිත යොමුකර රහත්බවට පත්වූහ.

උන්වහන්සේ සිය චරිතාපදනය අපදන පාළියේ දී මෙසේ දක්වූහ.

"ලෝක ජ්‍යේෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මහත් වූ ජන සමූහයාට නිවන් මග දේශනා කරන සේක. උන්වහන්සේගේ උතුම් වචන ඇසූ මම; ඇදිලි බැඳගෙන එකඟ සිතින් යුතුව බුද්ධ ඥානයට මෙසේ පැසසුවෙමි.

"යම්සේ මහා සාගරය ජලාශයකට අග්‍රවේද, සිනේරු පර්වතය පර්වත අතරින් අග්‍රවේද; එසේම යම් කෙනෙක් සචේතන වශයෙන් පවතින් නම් ඔවුන්ගේ ඥානය බුද්ධ ඥානයෙහි කලාවකට ද සම නොවේ. සචේතනිකයන්ගේ ඥානයන් අතරින් බුද්ධ ඥානයට අග්‍රවේ."

එය ඇසූ කාරුණික වූ සෘෂිවූ බුදුරජාණන් වහන්සේ දහම් විථියෙහි පිහිටුවා භික්ෂු සංඝයා මැද වැඩ හිඳමින් මෙසේ වදළසේක. "ලෝක නායක වූ බුදුරජාණන් විෂයෙහි වූ නුවණ පිළිබඳව යමෙක් ප්‍රශංසා කරන ලද්දේ ද; එහි විපාක වශයෙන් ඔහු මේ කල්ප ලක්ෂය පුරාම දුගතියක නූපදින්නෙහිය. එකඟ වූ මානව දමනය කළ සිතින් යුක්තව මින් කල්ප

ලක්ෂයකට පසුව රක්ඛිත නම් බුද්ධශ්‍රාවකයෙක් වන්නේය.'' යනුවෙණි. මින් කල්ප පනස්දහකට පෙර මහත්වූ සත් රුවනින් හෙබි මහ බලැති යසුග්ගත නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දුවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත්වූ උන්වහන්සේ, තමන් වහන්සේ සියලු කෙලෙස් නැසූ බව ප්‍රත්‍යාවේක්ෂා කරමින් ''**සබ්බෝ රාගෝ**'' යන ගාථාව වදළහ.

එම ගාථාවෙහි ''**සබ්බෝ රාගෝ**'' යනු කාමරාගාදී ප්‍රභේද ඇති සියලුම රාගය. ''**පහීණෝ**'' යනු ආර්යමාර්ගය වැඩීමෙන්; මුලුමනින්ම කෙලෙස් සිඳ දැමීම් වශයෙන් ප්‍රහාණය කරන ලදී. ''**සබ්බෝ දොසෝ**'' යනු නැසීම, වැනසීම ආදී නොයෙක් ආකාරයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපාදය - දැඩි තරහව. ''**සමූහතෝ** '' ආර්ය මාර්ගය වැඩීමෙන් මැනවින් නසන ලදී. ''**සබ්බෝ මෙ විගතෝ මොහෝ**'' යනු දුක නොදැනීම ආදී වශයෙන් අට වැදෑරුම් වූද කෙලෙස් වස්තු විභාග වශයෙන් අට වැදෑරුම් වූ ද සියලුම ආකරයේ මෝහය මවිසින් ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් නැතිකරන ලදී. දුරුකරන ලදී. ''**සීති භූතොඝ්මි නිබ්බුතෝ**'' එනිසා මේ ආකාරයෙන් කෙලෙස් මුල් සිඳ දමා, මැනවින් කෙලෙස් සංසිඳ වූ බැවින්; කෙලෙස් සම්පූර්ණ යෙන් නසා පරිදහයෙන් - දවීමෙන් දුරුවූ බැවින් සිසිල් බවට පැමිණියෙමි. එසේම සියලුම කෙලෙස් පිරිනිවි හෙයින් පිරිනිවියෙමි. මම මෙසේ නිවුණෙමි. පිරිණිවියෙමි වෙමියි සිය රහත් බව ප්‍රකාශ කරන ලදී.

රක්ඛිත රේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.8.10

''යං මයා පකතං කම්මං'' යනු ආයුෂ්මත් උග්ග තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? මෙම තෙරණුවෝ ද පෙර බුදුවරු ඉදිරියේ දී කළ ප්‍රාර්ථනාව ඇතිව, ඒ ඒ භවයන්හි දී පින් දහම් සිදුකරගත් උතුමෙකි. මෙයින් කල්ප තිස් එකකට පෙර සිඛී නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටු ගෙයක ඉපිද, වැඩිවියට පත් වූ මෙතෙම; එක් දිනක් සිඛී භාග්‍යවතුන් වහන්සේ දුක පැහැදුණු සිතින් කේතකී මලක් පූජා කළේය. එම පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද, කාම සුගතීන් හිම

ඉපිදෙමින් සසර සැරිසරා අවුත්, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි දී කොසොල් රට උග්ග නම් නියම් ගම සිටුපුතාවී උපන්නේ ය. ඔහුගේ නම ද ''උග්ග'' විය. වැඩිවියට පත් වූ උග්ග සිටුතුමා දිනක් භාග්‍යවතුන් වහන්සේ උග්ග නියම් ගම භද්‍රාරාමයේ වැඩවසන සමයෙහි එහි ගොස් ධර්මය අසා ලබන ලද ශ්‍රද්ධාව ඇතිව සසුනේ පැවිදි විය. උන්වහන්සේ විදසුන් කමටහන වඩා නොබෝ දිනකින් ම රහත්ඵලයෙහි පිහිටියහ. අපදාන පාළියේ මෙසේ උන්වහන්සේ සිය චරිත කථාව පවසති.

''විනතා නම් නදී තීරයේ පලඟත් පුළිල ගසක් විය. මම ඒ ගස සොයා යන්නෙමි ලෝකනායක වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. එකල්හි මම පිපුණු වැටකේ මලක් දැක, එය නටුවෙන් කඩාගෙන ලෝක බන්ධු වූ සිඛී බුදුරජානන් වහන්සේට පිදුවෙමි. ''මහාමුනීන්‍ද්‍රයන් වහන්ස ! බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්ස ! ඔබ වහන්සේ අච්‍යුත නම් වූ අමෘතපදය හෙවත් නිවණට යම් නුවණකින් පැමිණිසේක්ද ඒ උතුම් වූ නුවණට මේ මල පූජාවේවා !'' යි ඒ බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ සර්වඥතා ඥානයට පූජා පැවැත් වූ මම පසුව පුළිල ගස වෙත ගියෙමි. මෙම පූජාව නිසා ඒ සඤ්ඤාව මට පහළවිය. ඤාණ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් බඳු වූ පුෂ්ප පූජාවක් කළෙම් ද එතැන් සිට මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඤාණ පූජාවේ විපාකය මෙබඳුය. මීට කල්ප දහතුනකට පෙර සත්රුවනින් යුතු මහත් බලවත් බලුග්ගත නම් සක්විති රජවරු දොළොසක් ව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - ප - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත්ව තමන් වහන්සේ සසර පැවැත්ම සිඳ දැමූ බව ප්‍රකට කරමින් මෙම ගාථාව වදළහ.

''යං මයා පකතං කම්මං අප්පං වා යදිවා බහුං
සබ්බමෙතං පරික්ඛීණං නත්ථිදානි පුනබ්භවොා'' යනුවෙනි.

මෙම ගාථාවේ **''යං මයා පකතං කම්මං''** යනු මේ ක්‍රියාවක් තුන් දොරින් ද නවයක් වූ උත්පත්ති දොරටුවලින් ද අටක් වූ අසංවරයන්ගෙන් ද අටක් වූ සංවරයන්ගෙන් ද පාපාදී වශයෙන් ද දානාදී වශයෙන් ද නොයෙක් ආකාරවලින් මේ ඉමක් කොණක් නොපෙනෙන දිගු සසරතුල මවිසින් කළ, රැස්කළ නිපදවාගත් විපාක ධර්ම. **''අප්පං වා යදි වා බහු''** යනු ඒ ධර්මයන් හි වස්තුව චේතනාව, ප්‍රයෝගය, කෙලෙස් ආදී වශයෙන් දුර්වල

වූ බැවින් අල්ප වූ ද යන මේ ''**සබ්බමෙතං පරික්ඛීණං**'' සියලුම කර්ම ක්‍ෂය කළෙමි. අග්‍ර වූ ආර්ය මාර්ගය අවබෝධ කරගත් බැවින් ක්‍ෂය කළ යුතු ධර්ම ක්‍ෂය කරන ලද්දෙමි. සසර පැවැත්මට හේතුවන කෙලෙස් ප්‍රහාණය කළවිට කර්ම පැවැත්ම ප්‍රහීණ වූයේමවේ. විපාකයන් පැවැත්මක් නොඋපදියි. එනිසා ''**නත්ථිදානි පුනබ්භවො**'' යි නැවත අනාගත පුනර්භවයක්, නැවත ඉපදීමක් මා හට නැනැයි කියන ලදී. ''**සබ්බ මෙවෙතං**'' යන පාඨය ද ''**සබ්බමෙතං**'' යන්න වෙනුවට යෙදීම සුදුසුය. එහි පද විභාගය ''සබ්බමෙව එතං'' යනුවේ. ''මේ සියලුම කර්ම'' යන අර්ථයයි.

උග්ග ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

අටවැනි වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.9.1

''යං මයා පකතං පාපං'' යනු ආයුෂ්මත් සම්භිගුත්ත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී පින් රැස්කරමින් සසර සැරිසැරූහ. විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ - කාලයේ දී සිටුගෙයක උපන් හෙතෙම; වියට පත්ව භාග්‍යවතුන් වහන්සේ දැකීමෙන් පැහැදුණු සිත් ඇතිව දෑ සමන් මලින් පූජා පැවැත්වීය. එම සිටුතුමා ඒ පින්කමේ විපාක වශයෙන් උපනුපන් ආත්මභාවයන් හි කුලයෙන්, රූපයෙන්, පිරිවරින් යන සම්පත්වලින් අනෙකුත් පුද්ගලයන් අභිභවා සිටියේය. මෙබඳු එක් අත්බවක දී එක්තරා පසේ බුදුරජාණන් වහන්සේ කෙනෙකුන් පිඬු පිණිස හැසිරෙනු දැක; ''මේ මුඩු මහණා අත් පා කොරවූවෙකියි සිතමී. මෙතෙම එය සඟවාගෙන හැසිරෙයි'' යනුවෙන් දෝෂාරෝපණය කොට ගියේය. ඔහු ඒ අකුසල කර්මය නිසා නිරයේ පැසී බොහෝ දුක් විඳ; කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මනුෂ්‍යයෙක්ව ඉපිද පිරිවැජි පැවිද්දෙක් බවට පත්විය. හෙතෙම එක් දිනක් එක් සීලාචාර වූ උපාසකයකු දැක දොස් දක්වමින් '' නුඹ කුෂ්ටරෝගියෙක් වන්නෙහිය'' යැයි පරිභව කළේය. නාන තොට මිනිසුන් විසින් තබන ලද නොයෙක් සුවඳ ද්‍රව්‍ය විනාශ කළේය. මෙසේ රැස්කරගත් පාප කර්ම නිසා නැවත නිරයේ ඉපිද බොහෝ කාලයක් දුක් අනුභව කළේය. පසුව අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සැවැත්නුවර එක්තරා බ්‍රාහ්මණයකුගේ පුතෙකු ලෙස උපන්නේය. ''සම්භිගුත්ත'' නාමයෙන් ඔහු ප්‍රකට විය. වැඩිවිය පත් ඒ බමුණු පුතු ශාස්තෘන් වහන්සේගේ දම් දෙසුම අසා ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදිවිය. ඉතා පිරිසිදු සිල් ඇතිව වාසය කරන උන්වහන්සේට පෙර කරන ලද පාප කර්මය නිසා කුෂ්ඨ රෝගයක් උපන්නේය. ඉන් උන්වහන්සේගේ ශරීරාවයව සිඳී බිඳී වැගිරෙයි. මෙනිසා උන්වහන්සේ ගිලන් ශාලාවෙහි නිදගත්හ.

එක් දිනක් ධර්මසේනාපති සැරියුත් තෙරණුවෝ, ගිලන් බව විමසීමට ඒ ඒ තැනට ගොස්, ඒ ඒ ගිලන් වූ තෙරවරුන්ගෙන් සුවදුක් විමසමින් වැඩමවන සේක් ! එම තෙරුන් දැක ''ඇවැත්නි ! මේ ස්කන්ධයන්ගේ පැවැත්ම සියලු දුක්වලට හේතුවයි. මේ වේදනාදී ස්කන්ධ ධර්ම නොපවතින කල්හි ම දුක නැතිවේ'' යනුවෙන් වේදනා ව මූලික ව විදසුන් කමටහනක් දී වැඩිසේක. සම්භිගුත්ත තෙරණුවෝ එම අවවාදයෙහි පිහිටා විදසුන් වඩා ෂඩ් අභිඥා ලාභියෙක් වූහ.

උන්වහන්සේ විසින් සිය චරිතාපදානය මෙසේ අපදාන පාළියේ දක්වන ලදී.

''විපස්සි බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සාගර හා පර්වත සහිත වූ පෘථිවිය කම්පා විය. නිමිති කියන්නේ ''සියලු සත්ත්වයන් අතරින් ශ්‍රේෂ්ඨ වූ සර්වඥයන් වහන්සේ ලොව පහළ වන්නේ ය. ජන සමූහයා සසර සයුරින් නගා සිටුවන්නේ ය.'' යනුවෙන් ප්‍රකාශ කළහ. එම නිමිතිපාඨකයන්ගේ වචන ඇසූ මම බුදු උපත නිමිති කරගෙන ජාති පූජාව කළෙමි. ජාති පූජාව හා සමවූ වෙනත් පූජාවක් ලොවෙහි නැත. කුසල් රැස් කරමින් මම එම පූජාව පිළිබඳව සිත පහදවා ගනිමි. ජාති පූජාව සිදුකළ මා කළුරිය කොට, දිව්‍ය- මනුෂ්‍ය වූ කාම සුගතීන්හි ඉපිදෙමින්, සියලු සම්පත්තියෙන් සෙසු සත්ත්වයෝ අභිභවනය කළෙමි. ජාතිපූජාවේ විපාකය මෙබඳුය. මගේ සිත අනුවම කිරි මවුවරු මට උපස්ථාන කරති. ඔවුහු මගේ සිත කෝප නොකරති ජාති පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පින්කමක් කරන ලද්දෙමි ද එනිසා මම දුගතියක නූපන්නෙමි. මේ ජාති පූජාවේ විපාකයයි. මෙයින් කල්ප තුනකට පෙර මහබලවත් සුපරිචරිය නම් සක්විති රජවරු තිස් හතර දෙනෙක්ව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී - පෙ - මම දැන් බුද්ධානුශාසනය ඉටු කළෙමි.''

ෂටඅභිඥා ලාභීව ප්‍රහීන කරන ලද කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කිරීම වශයෙන් දැන් විඳිනු ලබන රෝගය නිසා පෙර ජාතියකදී තමා විසින් කළ පාප කර්ම සිහිපත් කර, දැන් එම සියලු කම් හා පාපධර්ම ප්‍රහීණකළ බව දක්වමින් උන්වහන්සේ මේ ගාථාව වදළහ.

''යං මයා පකතං පාපං
පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු
ඉධෙව තං වෙදනීයං
වත්‍ථු අඤ්ඤං න විජ්ජති.''

එහි ''පාපං'' යනු අකුසල කර්මයන්ය. ඒවා ලාමක වූ අර්ථයෙන් ''පව්'' යැයි කියති. ''පුබ්බෙ'' පෙර කාලයේදී ''අඤ්ඤාසු ජාතිසු'' මෙයින් අන්‍යවූ ජාතිවලදී අන්‍ය වූ වෙනත් ආත්මභාව වල දී මෙහි අර්ථය මෙසේ දතයුතුයි. ''ඉදින් මම මේ ආත්මභාවයේ දී එබඳු වූ පාපයක් කරන ලද්දේ නම්, දැන් එහි හටගැනීමක් වත් නැත. මෙයින් අන්‍යවූ පෙර ආත්මභාවලදී

කරන ලද පාපයක් වේනම් දැන් මේ ආත්මභාවයේ දී ම එහි විපාක විඳිය යුතුයි. අනුභව කළයුතුයි. ඒ කුමක් නිසාද ? මෙයින් අන්‍ය වූ උපතක් නොමැති බැවිණි. ඒ කර්මයේ විපාකදීමේ අවසරය ලබන වෙනත් ස්කන්ධ පංචකයක් ''**වත්‍ථු අඤ්ඤං න විජ්ජති**'' නොමැති බැවිණි. මේ ස්කන්ධයෝ වනාහී සියලු ම උපාදන කරගැනීම් - දැඩිව ගැනීමට ප්‍රහීණ කරන ලද බැවින්, දර - පරඩැල් ආදිය රහිත වූ ගින්නක් මෙන්, අවසන් (චුති) සිත නිරුද්ධවීමෙන් ප්‍රතිසන්ධියක් (නැවත ඉපදීමක්) නොමැතිව නිවියන්නේය'' යනුවෙන් තමන් වහන්සේ රහත් වූ බව ප්‍රකාශ කළ සේක.

සමිති ගුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.2

'යෙන යෙන සුහික්ඛනී'' යනු ආයුෂ්මත් කස්සප තෙරණුවන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? මෙතෙම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ බමුණු පවුලක ඉපිද, ත්‍රිවේදයෙහි හා සෙසු බමුණු සිප් සතරෙහි කෙළවරට පත් විය. දිනක් ඔහු භාග්‍යවතුන් වහන්සේ දක පැහැදුණු සිතින් සමන්මල් පූජා කළේය. ශාස්තෘන් වහන්සේගේ හාත්පස ද මත්තෙහි ද සමන් මල් මිටි දමන ලදී. ඒවා බුද්ධානුභවයෙන් මල් වියනක් සේ නොමැලවී සත් දිනක් තිබුණි. එම අසිරිය දුටු බමුණ පුතු අතිශයින් පැහැදුණුසිත් ඇති විය. තව තවත් පින් දහම් කරමින් කල්ප ලක්‍ෂයක් පුරා කාම සුගතීන්හිම සැරි සරා මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර එක් උසස් බමුණකුට දව පුතෙක් ව උපන්නේ ය. එකුමරු කස්සප නමින් ප්‍රකට විය. ඔහු කුඩා කාලයේ දීම පියා කළුරිය කළේය. මව දරුවා පෝෂණය කළාය. ඒ කුමරු දිනක් ජේතවනාරාමයට ගොස්, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාවක් අසා හේතු සම්පත් ඇති බැවින් නුන් අසුනෙහි දීම සෝවාන් විය. මවගෙන් අවසරගෙන පසුව කස්සප කුමරු පැවිදි විය. ශාස්තෘන් වහන්සේ වස් වැස පවාරණය කොට, ජනපදචාරිකාවේ හැසිරෙන කල් හි තමා ද උන්වහන්සේ සමග යනු කැමතිව මවගේ කැමැත්ත ලබා ගැනීමට ඇය වෙත ගියේය. කස්සප හිමියන්ට එම අවසරය දෙන මැණියෝ අවවාද වශයෙන් මෙම ගාථාව කීවාය.

''යෙන යෙන සුභික්ඛානි
සිවානි අභයානි ච
තෙන පුත්තක ගච්ඡස්සු
මා සොකාපහතො භව.''

එම ගාථාවෙහි ''යෙන යෙන'' යනු යම් තැනෙක සත්තමී විභක්තියේ කරණ වචනයකි. යම් යම් දිශාවකට යන අර්ථයයි. ''සුභික්ඛානි'' යනු ආහාර පාන සුලභ වූ ප්‍රදේශ හා රටවල් යන අර්ථයයි ''සිවානි'' බිය සැක නැති, රෝගාබාධ නැති ප්‍රදේශ ''අභයානි'' යනු සොරබිය ආදී භය කිසිවක් නොමැති ප්‍රදේශ, නිර්භය තැන් රෝගාබාධ නැති දුර්භික්ෂ භය ඇති ප්‍රදේශ 'සුභික්ඛ' හා 'සිවානි' යන දෙපදයෙන් අදහස් කරන ලදී ''තෙන'' යන්නා වූ ඒ ඒ දිශාවෙහි ''පුත්තක'' යනුවෙන් අනුකම්පාව නිසා කස්සප තෙරුන්ට පුතේ ! යනුවෙන් ආමන්ත්‍රණය කරයි. ''මා'' යනු ප්‍රතිශේධනාර්ථයේ (වැලැක්වීමේ අර්ථයේ) නිපාතයකි. ''සොකා පහතො'' යනු ඉහතකී ලක්ෂණ නොමැති රටවලට, ප්‍රදේශවලට ම යන්න. දුර්භික්ෂ, භය ආදී සහිත ප්‍රදේශවලට ගොස් ශෝකයෙන් පීඩාවට පත්නොවන්න. මෙම මවගේ අවවාදය ඇසූ තෙරුන් වහන්සේ, ''මගේ මව මා හට ශෝක රහිත තැනට යාමට ආශීර්වාද කරන්නීය. එනිසා මම සර්වප්‍රකාරයෙන් ම ශෝක රහිත වූ විශේෂයෙන් ම නිර්භයවූ ස්ථානයට (නිවණට) පත් වීම සුදුසුයැ'' යි උත්සාහ වඩා විදසුනෙහි සිත පිහිටුවා නොබෝ කලකින් ම අරණ්‍යයෙහි වෙසෙමින් ම රහත් බවට පත්වූහ. අපදන පාළියේ උන්වහන්සේ විසින් මෙසේ පවසන ලදී.

''වේද හදරන, මන්ත්‍රධාරී වූ වේදතුයේ පරතෙරට ගිය මම එළිමහනෙහි සිටියෙමි; වනයෙහි හැසිරෙන සිංහයකු වැනි වූ තැති නොගන්නා ව්‍යාඝ්‍රරාජයකු වැනි වූ මාතංග කුලයේ ත්‍රිමදගලිත හස්ති රාජයකු වැනි වූ මහර්ෂී වූ ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි. ඒ මට සමන් මල් රැගෙන අහසෙහි දැමුවෙමි. බුදුරදුන්ගේ ආනුභාවයෙන් ඒ සියල්ල හත්පසින් බුදුහු පිරිවරා ගැණුණි. මහාවීර වූ ලෝකනායකයන් වහන්සේ අධිෂ්ඨාන කල කල් හි, ඒ නරශ්‍රේෂ්ඨයන් වහන්සේ පිරිවරා ගෙන සිටි මල් වියන් විසිරී ගියේය. අනතුරුව ඇතුලට පිවිසි නැටි ඇති පිටතට හැරුණු මල් ඇති ඒ මල් වියන සතියක් පුරාම බුදුරදුන්ට සෙවන දී එතැනින් අතුරුදන් වීය. විශ්මය ජනක වූ ලොමුඩැහැගන්නා වූ ඒ අසිරිමත් සිදුවීම දුටු මම සුගත වූ ලෝකනායකයන් වහන්සේ කෙරෙහි සිත පැහැදුවුයෙමි. එසේ සිත් පැහැදවීමේ බලයෙන් මෙහෙය වූ මම කල්ප

ලෝකයක් ම දුගතියක නුපන්නෙමි. මෙයින් එක්දහස් පන්සිය වන කල්පයේ දී විණ්ණමාලාස නම් වූ මහ බලැති සක්විති රජවරු විසිපහක් ම සැප වින්දෙමි. ඒ මම දැන් සියලු කෙලෙස් දැවුයෙමි - පෙ - බුද්ධානුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ කස්සප තෙරණුවෝ; ''මේ මවගේ ප්‍රකාශය ම මාහට රහත්වීම සඳහා අංකුසයක් - පිහිටාධාරයක් වුයේය'' යි එම ගාථාවම නැවත දේශනා කළහ.

කස්සප තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.3

''සීහපඤ්ඤත්තෝ විහර'' යනු ආයුෂ්මත් සීහ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති මෙතෙම, මෙයින් කල්ප දහ අටකට පෙර දී පහළ වූ අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේගේ දවස ''චන්දභාගා'' නම් නදී තෙර කිඳුරු යෝනියෙහි ඉපදුණේය. මල් ආහාර කොටගත්, මලින් කළ වස්ත්‍ර අඳින එම කිඳුරා දිනක් අහසින් වැඩම කරන අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් උන්වන්සේ පුදනු කැමතිව ඇඳිළි බැඳගෙන සිටියේය. ඔහුගේ අදහස දත් බුදුරජාණන් වහන්සේ අහසින් බැස එක් ගසක් මුල පලක් බැඳ හුන්සේක. කිඳුරා සඳුන් තෙල් ගල්වා සඳුන් සුවඳැති මලින් පූජා කරවා, වැඳ භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට ගෞරව දක්වා පිටව ගියේය. එම පින්කමේ විපාක ලෙස ඔහු දෙව් මිනිස් දෙගතියෙහි ඉපදුණි. සීහ නමින් පතල වූ ඔහු භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් උන්වහන්සේට වැඳ එකත් පසෙක සිටියේය. ඔහුගේ අදහස් දත් බුදුරජාණන් වහන්සේ ධම්දේශනා කළ සේක. දහම් ඇසු සීහ ලබන ලද ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදිව, කමටහන් ගෙන කැළයේ වාසය කරයි. නමුත් භාවනා කරන උන්වහන්සේගේ සිත නානා අරමුණුවල දිවයයි. එකඟ නොවේ, අපේක්ෂිත මගඵල උපදවා ගත නොහැකි වෙයි. මේ බව දුටු ශාස්තෘන් වහන්සේ අහසෙහි පෙනී සිට මෙම ගාථාවෙන් අවවාද කළ සේක.

''සීහපඤ්ඤතෙනා විහර රත්තිං දිවමතන්දිතෝ
හාවෙහි කුසලං ධම්මං ජහ සීඝං සමුස්සයං'' යනුවෙනි.

එම ගාථාව වදාරා අවසන් වත්ම සීහ තෙරණුවෝ විදසුන් වඩා රහත්වූහ. ඒ බව මෙසේ අපදාන පාළියේ දැක්වේ.

"එකල්හි මම චන්ද්‍රභාග නදී තීරයේ වෙසෙන කිඳුරෙක් වීමි. මල් අනුභව කරන මම මලින් කළ වස්ත්‍ර හැන්දෙමි. එකල්හි නර ශ්‍රේෂ්ඨ වූ ලොවට ජ්‍යෙෂ්ඨ වූ අත්‍යදස්සී භාග්‍යවතුන් වහන්සේ අහසෙහි හංස රාජයකු මෙන් වන හිසින් වැඩම කළහ. "පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස ! ඔබ වහන්සේට නමස්කාර වේවා. ඔබ ප්‍රසන්න වූ විශෝධිත සිතක් ඇති උතුමකු වන සේක. අතිශය ප්‍රසන්න වූ මුහුණ හා ඉන්ද්‍රියන් ඇති සේක." මහා ප්‍රාඥ වූ මනා නුවණැති සර්වඥයන් වහන්සේ අහසින් බැස සඟල සිවුර අතුරා රුකක් මුල පලක් බැඳ හුන් සේක. සඳුන් සුණු (චූර්ණය) ගෙන බුදුරජාණන් වහන්සේ වෙත ගියෙමි. පහන් සිතින් - සතුටින් යුක්තව ඉන් බුදුන් පිදුවෙමි. ලෝක ජෙට්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේට වැඳ, සතුටු සිතින් උතුරු දෙස බලා ගියෙමි. මෙයින් එක් දහස් අටසිය වන කල්පයේදී යම් සඳුන් පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා ම දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ මේ විපාකයයි. මින් කල්ප එක්දහස් භාරසියකට පෙර රෝහිත නම් මහ බල ඇති සක්විති රජවරු තිදෙනෙක්ව උපන්නෙමි. ම විසින් කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

සීහ තෙරුන්ට අවවාද වශයෙන් දෙසන ලද "සීහපඤ්ඤතෙනා විහර" යන ගාථාවෙහි "සීහ" යනු තෙරුන්ට ඇමතීමයි. සීහය !, "අපඤ්ඤතෙනා විහර" සිහියෙන් යුක්තව අප්‍රමාදීව සියලු ඉරියව්වල සතිය පිහිටුවා විමසුම් නුවණින් වාසය කරව. දැන් ඒ අප්‍රමාදීව විහරණය විපාකයත් සමඟ සංක්ෂිප්තව දැක්වීමට, "රත්තින්දිවං" යනාදිය දෙසන ලදී. එහි අර්ථය මෙසේය. "රාත්‍රියේ ද දවාලෙහි ද සක්මණෙහි යෙදෙමින් වෙර වඩා සිත බැඳ තබන ධර්ම වලින් සිත පිරිසිදු කර ගන්න."යි කියූ ආකාරයෙන් ම සතර සම්‍යක් ප්‍රධාන වීර්ය වැඩීම් වැඩීම් වශයෙන් නොමැලිව, නොකුසීතව අරඹන ලද වීර්ය වැඩීම් වශයෙන් වීර්යයෙන් කුසල් ද සමථ විදර්ශනා දී ධර්ම ද ලෝකෝත්තර ධර්මයද වඩන්න. උපදවා ගන්න. තමා තුළ දියුණු කර ගන්න. එසේ කුසල් වඩා "ජහ සීඝං සමුස්සයං" යනු නුඹගේ ආත්මභාවයෙහි, සිරුරෙහි බැඳී පවතින ජඤරාගය පළමුව වහා අත්හරින්න.

දුරු කරන්න. කල්නොයවා ම බැහැරලන්න. එසේ ඇති කල්හි පසුව අවසන් සිත නිරුද්ධ වීමෙන් ඉතිරි නොවීම ම ස්කන්ධ රූප දුරු වන්නේය. අත් හරින්නේය." රහත් බවට පත් වූ සීහ තෙරණුවෝ ඒබ ව ප්‍රකාශ කරන සේක් එම අවවාද ගාථාව ම නැවත වදාළහ.

සීහ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.4

"සබ්බරත්තිං සුපිත්‍වා න" යනු ආයුෂ්මත් නීත තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? මෙතෙම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ සමයෙහි සුනන්ද නම් බුමුණකු වී නොයෙක් සිය ගණන් බමුණන්ට මන්ත්‍ර උගන්වයි. හේ "වාජපෙය්‍ය" නම් මහා යාගයක් කරයි. භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණාට අනුකම්පා කළ සේක; එම යාග ස්ථානයට ගොස් අහසෙහි සැරි සැරූහ. බමුණා ශාස්තෘන් වහන්සේ දුටු පමණින් ම සිත් පහදවා ගෙන, මල් ගෙන ඒමට සිසුන්ට දන්වා. මල් ගෙනා කල්හි ඒවා අහසෙහි දමා පූජා කළේය. බුද්ධානුභාවයෙන් එම මල් රැස එම ස්ථානය ද මුලු නගරයෙහි ද පැතිරී සිටින මල් වියනක් විය. ශාස්තෘන් වහන්සේ පිළිබඳව මහජනයා තුළ මහත් වූ ප්‍රීතියක් ඇතිවිය. එම කුසල කර්මයේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරි සැරූ සුනන්ද බ්‍රාහ්මණයා; අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත් නුවර එක් බමුණකුගේ පුතෙක් ව උපන්නේ ය. එවිට ඔහුගේ නම "නීත" නම් විය. නීත වැඩිවියට පැමිණ, "මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සුව ස්වභාවයෙන්, සුව හැසිරීමෙන් ඉතා රසවත් ආහාර වළඳා, මනාව සෙවිලි කළ සෙනසුන්හි වෙසෙති. ඒනිසා මොවුහු වෙත පැවිදිවීමෙන් සුවසේ වාසය කිරීමට හැකිවේ" යැයි සිතා සැප විදීමේ කැමැත්තෙන් පැවිදි විය. පැවිදිව ශාස්තෘන් වහන්සේගෙන් කමටහන් රැගෙන ගොස් කිහිප දිනක් එය සිහිපත් කර, පසුව එය හැර දමා, බඩ තදවන තෙක් ආහාර ගෙන මුලු දවසෙහි ම සමූහ සාකච්ඡාවේ නියැලෙමින්, තිරිසන් කථාවෙන් කල් යැවූ නීත තෙරුන් රාත්‍රියේ දී කය සිතමැලි භාවයෙන් (ථීන මිද්ධ) මැඩී මුලු රැයම නිදා ගත්හ. මෙසේ කල් යැවූ උන්වහන්සේගේ නුවණ මුහුකුරා යෑම පිළිබඳව සළකා බැලූ ශාස්තෘන් වහන්සේ මෙසේ අවවාද කළ සේක.

"සබ්බරත්තිං සුපිත්වාන දිවා සංගණිකෙ රතො
කුදස්සු නාම දුමේමඩෝ දුක්ඛස්සන්තං කරිස්සති" යනුවෙනි.

එහි "සබ්බරත්තිං" යනු මුලු රාත්‍රියෙහිම "සුපිත්වාන" නිදාගෙන, ''රාත්‍රී පළමු යාමෙහි සක්මනට බැස සිත ආවරණය කරන දහම් වලින් සිත පිරිසිදු කරන්නේය" යනාදි ලෙස පැවසූ පරිදි නිදි වැරීමෙහි නොයෙදුණු. හුදෙක් රෑ තුන් යාමයෙහි ම නින්ද බැසගෙන යන අර්ථයයි. "දිවා" යනු දවල් කාලයයි. මුලු දවල් කාලයෙහි සමූහයා වෙත ඇලී සමූහ සාකච්ඡාවලින්, තිරිසන් කථාවෙන් යුක්තව කය දැඩි කර ගැනීම ම අපේක්ෂිත අන් භික්ෂූන් සමඟ හිඳියි. සමූහ සාකච්ඡාවෙහි ඇලී ගැලී, ඉන් ඉවත් වීමේ අකමැත්තෙන් සිටීම "සඛාණිකෙ රතො"නම් වේ. පෙළෙහි "සඛාණිකාරතො" යන්න ද යෙදේ. "කුදස්සු නාමා" යනු කවදා ද ? 'සු' යනු නිපාතයක් පමණි. 'කවර කාලයක ද ?' යන අර්ථයයි. "දුමේමඩෝ" යනු මෝඩකමින් යුක්තව 'දුක්ඛස්ස' සසර පැවැත්ම ගෙනදෙන දුකෙහි "අන්තං" කෙළවර අවසානය. කෙළවරක් දැකීම කවදා නම් ඉටුවේද ? මෙසේ කල්ගත කරන්නට දුකෙහි කෙළවර කිරීමක් නම් නැත. "දුමේඩ දුක්ඛස්සන්තං කරිස්සසි" යන පාඨය ද පෙළෙහි යෙදේ. මෙසේ ශාස්තෘන් වහන්සේ විසින් වදාළ ගාථාවෙන් සංවේගයට පත් වූ නීත තෙරණුවෝ නොබෝ කලකින් ම රහත් ඵලයෙහි පිහිටියහ. උන්වහන්සේ ඒ බව මෙසේ අපදාන පාළියේ දක්වා ඇත.

"මන්තු පාරගත වූ වේද හදාරන යාග කිරීමෙහි යෙදුණු, සුනන්ද නම් බමුණා වූ මම මහා යාගයක් කළෙමි. අග්‍ර කාරුණික වූ ඍෂි වූ ලොව මැනවින් වටහා ගත් පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ජනයාට අනුකම්පා කරමින්, එවිට අහසෙහි සක්මන් කළසේක. උපධි විරහිත ලෝක නායක වූ සර්වඥයන් වහන්සේ අහසෙහි සක්මන් කරමින් අපමණ සත් වග කෙරෙහි මෙත් සිත පැතිර වූහ. මන්තු පාරගත බමුණා සිය සියලු සිසුන් ලවා මල් නටුවෙන් නෙළා රැස් කරවා අහසට දමා පූජා කළේය. එවිට මුලු නගරයම වසාගෙන මල් වියනක් ලෙස එම මල් විසිරී ගියේය. ඉන් ඉවත් නොවී සතියක්ම බුද්ධානුභාවය නිසා මල් වියන පැවතුණි.

එම කුසල කර්මය නිසා සම්පත් අනුභව කළ මම දැන් සියලු ආශ්‍රව මැනවින් දැන ක්ෂය කිරීමෙන් ලොව විසන්නික නම් වූ නිවණ අවබෝධ කළෙමි. එපමණම මෙයින් කල්ප එක් දහස් එක සියකට පෙර, මහ බලවත් සක්විති රජවරු තිස්පස් දෙනෙක් ව "අබ්භස" නමින් ප්‍රකට වූයෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.'' රහත් වූ තෙරණුවෝ ඒ බව ප්‍රකාශ කරනු සඳහා වදාළ ගාථාව ම පැවසූහ.

නීත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.5

"චිත්තනිමිත්තඤ්ඤ කොවිදෝ" යනු ආයුෂ්මත් සුනාග තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? පෙර බුදුවරු හමුවෙහි දී කළ ප්‍රාර්ථනා ඇති සුනාග තෙරණුවෝ ද ඒ ඒ භවයන්හි ඉපිද නිවන් පතාගෙන කුසල් රැස්කර ගත්හ. මෙයින් කල්ප තිස් එකකට පෙර පහළ වූ සිබි බුදුරජාණන් වහන්සේගේ කාලයේ බමුණු ගෙදරක ඉපදී වැඩිවිය පැමිණ, ත්‍රිවේද පාරගතව අරණ්‍ය ආශ්‍රමයක වාසය කරමින් බමුණු දරුවන් තුන්දාහකට මන්ත්‍ර ඉගැන්වූහ. එක් දිනක් එම බමුණා ශාස්තෘන් වහන්සේ දැක මහ පුරිස් ලකුණු විමසා බලා, "මෙබඳු අංග ලක්ෂණවලින් හෙබි මෙතෙම අනන්ත ජින නම් වේ. අනන්ත වූ ඥාණ සම්පත් ඇති බුද්ධ නම් උතුමන් වහන්සේ වන්නේයැ"යි බුදු නුවණ අරබයා මහත් වූ ශ්‍රද්ධාවක් උපදවා ගත්තේය. ඒ සිත් පැහැදවීම් කුසලයෙන් ඉන් චුතව දෙව් මිනිස් දෙගතියේ ඉපිද සැප විඳ, මේ බුද්ධොත්පාද කාලයෙහි නාලක ගම එක් බමුණුකුගේ පුතුව උපන්නේය. සුනාග නම් වූ ඒ බමුණු කුමරු ධර්ම සේනාපති සැරියුත් තෙරණුවන්ගේ ගිහිකළ යහළුවෙකි. එනිසා ශාස්තෘන් වහන්සේ වෙත අවුත් ධර්මය අසා, සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා පැවිදිව, නොබෝ දිනකින්ම විදසුන් වඩා රහත් විය. උන්වහන්සේ සිය චරිතය අපදාන පාළියේ මෙසේ දැක්වූහ.

'හිමවත සමීපයේ වසහ නම් පර්වතයක් විය. එම පර්වතය පාමුල මට අසපුවක්විය. එකල්හි මම බමුණෙක්ව තුන් දාහක් සිසුන්ට ඉගැන්වූයෙමි. සිසුන් සියලු දෙන රැස් කරවා විවේකස්ථානයක සිටියෙමහි. එසේ එකත්පසෙක සිටි මන්ත්‍ර පාරාගත වූ මම, බුද්ධ ධර්මය (බුද්ධ වේදය) විමසමින් බුද්ධ ඥානයෙහි සිත පැහැද වූයෙමි එසේ සිත පහදවා ගත් මම පන් ඇතිරිල්ලක් මත හිඳ, පලක් බැඳගෙන ම කළුරිය කළෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර මම යම් බුද්ධ ඥානය පිළිබඳ වූ සඤ්ඤාවක් මෙනෙහි කළෙමි ද මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඥාන සංඥාවෙහි විපාක මෙබඳුය. මෙයින් විසිහත් වන කල්පයේදී සත් රුවනින් පිරි, මහ බලවත් සිරිධර නම් සක්විති රජව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත්ව භික්ෂූන් වහන්සේලාට ධර්ම දේශනා කිරීම් වශයෙන් සිය රහත් බව ප්‍රකාශ කරන සුනාග තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

''චිත්ත නිමිත්තස්ස කොවිදෝ
පවිවෙකරසං විජානිය
ඣායං නිපකෝ පතිස්සතෝ
අධිගච්ඡෙය්‍ය සුඛං නිරාමිසං'' යනුවෙනි.

එහි ''චිත්තනිමිත්තස්ස කොවිදෝ'' යනු භාවනා සිතේ නිමිති ගැනීමෙහි දක්ෂ වූ "මෙ සමයේ සිත උත්සාහවත් කළ යුතුයි. මේ සිත සතුටු කළ යුතුයි. මේ සිත මැදහත්ව බැලිය යුතුයි." යනාදී ලෙස උත්සාහ කිරීමාදියෙහි වූ සිත් නිමිති ගැනීමෙහි දක්ෂ වේ. "පවිවෙකරසං විජානිය" කාය විවේකයෙහි නියැලී එය වඩමින්; "චිත්ත විවේකයෙහි රසය හඳුනාගෙන, විවේක සුව අනුභව කොට" යන අර්ථයයි. ''විවේක සුවය පානය කර'' (පිවිත්වා) යනුවෙන් ද කියයි. "ඣායං" යනු පළමුව අරමුණු සිහිපත් කරමින් ද පසුව ලක්‍ෂණ සළකා බැලීමෙන් ද ධ්‍යාන වඩනුයේ. දැහැන් වඩන "නිපකෝ" යනු කමටහන් පරිහරණය - භාවිත කිරීමෙහි දක්ෂ වූ "පතිස්සතෝ" යනු පිහිට එළවූ සිහිය ඇති. ''අධිගච්ඡෙය්‍ය සුඛං නිරාමිසං'' යනු මෙසේ සමථ නිමිත්තාදියේ කුශලත්වයෙන් ලබන ලද චිත්ත විවේක සුවයෙහි පිහිටා, සිහි ඇතිව, මැනවින් නිමිත්තාදියේ කුශලත්වයෙන් ලබන ලද චිත්ත විවේක සුවයෙහි පිහිටා, සිහි ඇතිව, මැනවින් දැනගෙන විදර්ශනා ධ්‍යානයෙහි ද යෙදෙමින්. වඩමින් සිටියි. ඔහු කාමාමිෂයන් හා සසර පැවැත්මට හේතුවන ආමිෂාදියෙන් වෙන්ව නිරාමිෂ වූ නිවන් සුවය ද ඵල සුවය ද (මාර්ගඵල) ලබා ගන්නේ ය. නිවන් සැපයට එළඹෙන්නේ ය.

සුනාග ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.6

"ඉතො බහිද්ධා පුථූ අඤ්ඤවාදිනං" යනු ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එම ගාථාවේ උපත කෙසේද ? මෙතෙම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී නාරද නම් බමුණෙක් ව, එක් දිනක් මිදුලෙහි සිටියේ, බික් සඟන පිරිවරා වැඩම කරන භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් ගාථා තුනකින් ස්තුති කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් ඔහු කාම සුගතීන්හිම සැරිසරා, නව තවත් පින් දහම් කරමින්

සැප විඳ; මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිල වස්තුවේ රජ පවුලක උපන්නේය. නාගිත නම් වූ ඒ ශාක්‍ය කුමරු භාග්‍යවතුන් වහන්සේ කපිල වස්තුවෙහි වැඩ වසන කාලයේදී දේශිත මධුපිණ්ඩික සූත්‍රය අසා ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදිව විදසුන් වඩා රහත් විය. උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ පවසති.

"විශාල ලෙස පිපී පැතිර ගිය මල් ඇති වනයෙහි හුන් මම ලෝකනායක වූ, දක්ෂිණාසුවය වූ, බල (තථාගත බල) යන්ට පැමිණි, බික්ඛ සඟන පිරිවරාගත් බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. "ත්‍රිවිද්‍යා සිහිත ෂඩ් අභිඥාලාභී, මහත් ඍද්ධි ඇති ලක්ෂයක් මහරහත්හු සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිරිවරාගෙන සිටිති. එය දුටු කවරෙක් නම් නොපහදී ද ? අනන්ත වූ ඤාණ සහිත ඒ සර්වඥයන් වහන්සේගේ නුවණ හා සැසඳිය හැකි උපමාවක් දෙවියන් සහිත ලෝකයේ නොමැත. ඒ බව දුටු කවරෙක් නම් නොපහදී ද ? හුදෙක් රත්නාකරයක් මෙන් දක්වන දහම් කය, වෙනස් කිරීමට විකෘති කිරීමට කිසිවෙකු සමත් නොවේ. ඒ බව දුටු කවරෙක් නම් උන්වහන්සේ වෙත නො පහදී ද ?" යන මේ අදහස් සහිත ගාථා තුනකින් නාරද සාරගර්හය නම් වූ මම පස්මරුන් දිනූ පදුමුත්තර සම්බුදුරජාණන් වහන්සේට ස්තුති කළෙමි.

ඒ සිත් පැහැදවීම නිසාත් බුදුරජාණන් වහන්සේට ස්තුති කිරීම නිසාත් මම මේ දක්වා වූ කල්ප ලක්ෂය මුලුල්ලෙහිම සුමිත්ත නම් ක්ෂත්‍රිය සක්විති රජව සැප විඳිමි. දැන් මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ, ශාස්තෘන් වහන්සේ විසින් දෙසන ලද ධර්මයෙහි නෛයර්‍යාණිකබව සිහිකිරීමෙන් හටගත් ප්‍රීතියෙන්, සතුටින් යුක්තව මෙසේ උදන් ඇණූසේක.

"ඉතෝ බහිද්ධා පුථු අඤ්ඤවාදිනං
මඝෝ න නිබ්බානගමෝ යථා අයං
ඉතිස්සු සඩ්ඝං භගවානුසාසති
සත්‍ථා සයං පාණිතලෙව දස්සයං" යන ගාථාව කීහ.

මේ ගාථාවේ "ඉතෝ බහිද්ධා" යනු මේ බුදු සසුනින් බැහැර වූ අන් සමයන්හි එනිසා "පුථු අඤ්ඤවාදිනං" යි කියන ලදී. "නානාතීර්ථකයන්ට" යන අර්ථයයි. "මඝෝන නිබ්බාණගමෝ යථා අයං" යනු යම්සේ මේ

ආර්ය අෂ්ටාංගික මාර්ගය ඒකාන්තයෙන්ම නිවන ලබා දෙන්නකි යි ''නිබ්බාණගාමී'' නම් වේ. මෙබඳු නිවන් දක්වන මාර්ගයක් අන්‍ය තීර්ථක සමයන්හි නොමැත. සම්මා සම්බුද්ධ නොවූවන් විසින් එම සමයන් ඇතිකළ බැවිණි. භාග්‍යවතුන් වහන්සේ මෙනිසාම "මහණෙනි! මෙම බුදු සසුනෙහි ම පළමු ශ්‍රමණයාත්, දෙවන ශ්‍රමණයාත්, තෙවැනි ශ්‍රමණයාත්, සිවුවන ශ්‍රමණයාත් සිටිති. අන්‍ය පර පාදයෝ (අනෙකුත් සමයන්) ශ්‍රමණයන්ගෙන් ශූන්‍යය" යනුවෙන් දේශනා කළහ. "ඉති" යනු මෙසේ "සූ" යනු නිපාතයක් පමණි. "සඞ්ඝං"යනු භික්ෂූ සංඝයා මෙය උසස් කර දැක්වීමකි. "දෙව් මිනිසුන්ගේ ශාස්තෘහුය" (සත්‍ථා දේවමනුස්සානං) යන්න මෙණි. ''සංඝං'' යනු සමූහයයි. හික්මී මගඵල උපදවාගත් යන අදහසයි. "භගවා" භාග්‍යවත් බව ආදී කරුණුවලින් "භගවා" නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මේ දැක්වුයේ සංක්ෂිප්ත වශයෙනි. සවිස්තරව පරමත්‍රදීපනී ඉතිවුත්තක අටුවාවෙහි කියූ පරිදි දත යුතුයි. "සත්‍ථා" යනු මෙලොව හා පරලොව පරමාර්ථ පිළිබඳව සුදුසු සේ අනුශාසනා කරන හෙයින් "සත්‍ථා" නම් වන සේක. ''සයං'' තමාම. මෙම ගාථාවේ අර්ථය මෙසේය - "සීලාදී ස්කන්ධත්‍රය සංග්‍රහ කරන්නා වූ සම්මා දිට්ඨි ආදී අංග අටකින් යුතු බැවින් අෂ්ඨාංගික වූ නිවන වෙත යන ආර්ය මාර්ගයක් මගේ මේ බුදු සසුනෙහි වේ නම්; එවැනි මාර්ගයක් වෙනත් කිසිඳු සමයක නොමැත." යනුවෙන් සිංහනාද කරන අපගේ භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේම ස්වයම්භූ ඥානයෙන් අවබෝධ කරගෙන, තමන් වහන්සේම මහා කරුණාවෙන් මෙහෙයවීමෙන් තම දේශනා විලාශ සම්පත්තියෙන් ද අපත් ඇඟිලක් මෙන් දක්වමින් භික්ෂූ සංඝයාට හික්මීමට සහ නිර්වාණාවබෝධයට අනුශාසන කරන සේක. අවවාද කරන සේක.

නාගිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.7

"**බන්ධා දිට්ඨා යථාභූතං**" යනු ආයුෂ්මත් පවිටිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ පැතුම් ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන් පතාගෙන පින් රැස් කරනුයේ අත්‍රදස්සි නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයේ දී කේසව නම් තාපසව උපන්නහ. එක් දිනක් කේසව තවුසා ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ,

බණ අසා, පහන් සිතින් ඇඳලි බැඳ ටැඳගෙන ප්‍රදක්ෂිණා කොට වැඳ ගියේය. ඔහු ඒ පින්කම නිසා දෙව්ලොව ඉපිද තවත් පින්දහම් සිදුකරමින් කාම සුගතින්හි ඉපිදෙමින් සසර සැරිසරා; අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි මගධ රට බමුණු පවුලක ඉපිද, අනුක්‍රමයෙන් වියට පත්ව ගිහිගෙයින් නික්මීමේ කැමැත්තෙන් පිරිවැජි පැවිද්දෙන් පැවිදිව, එහි හඳාළ යුතු දේ හඳාරා හැසිරෙන කල්හි උපතිස්ස හා කෝලිත යන දෙදෙන බුදු සසුනේ පැවිදි වූ බව අසා, "ඔවුහු දෙපල මනා ප්‍රඥාවන්තයින්ය. ඔවුහු යම් සසුනක පැවිදි වී නම් එය උතුම් වන්නේ ය" යි සිතා ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් බණ අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව බුදු සසුනේ පැවිදි විය. ශාස්තෘන් වහන්සේ ඔහුට විදසුන් භාවනා කමටහන දුන් සේක. විදසුන් වැඩීමෙහි නිරත වූ උන්වහන්සේ කල් නොයවාම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

"නාරද යනු මගේ නාමයයි. කේසව යනු මා හඳුන්වන ගෝත්‍ර නාමයයි. ඒ මම කුසල් අකුසල් කුමක්ද ? යි සොයමින් බුදුරදුන් සමීපයට පැමිණියෙමි. මෙත් සිතින් යුතු කාරුණික වූ පසැස් ඇති මහාමුනි වූ ඒ අතුළුදස්සි සර්වඥයන් වහන්සේ සත්‍යයන් අස්වසමින් දහම් දෙසන සේක. තම සිත පහදවා ගෙන මුදුනෙහි ඇඳිලි බැඳ මම, ශාස්තෘන් වහන්සේට වැඳ නැගෙනහිර දෙසට ගියෙමි. මෙයින් කල්ප එක් දහස් හත්සියකට පෙර අමිත්තතාපන නම් මහත් බල ඇති සක්විති රජුව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ ඒ බව ප්‍රකාශ කරමින්

"ඛන්ධා දිට්ඨා යථාභූතං
භවා සබ්බෙ පදාළිතා
විකඛිණ්ණො ජාති සංසාරෝ
නත්ථිදානි පුනබ්භවෝ" යන ගාථාව වදාළහ.

එහි "ඛන්ධා" යනු පඤ්ච උපදානස්කන්ධයන්ය. විදර්ශනාවට පැමිණීම් ලක්ෂණයෙන් ද ශ්‍රමණ බවේ ලක්ෂණ වශයෙන් ද තත්වාකාරයෙන් පිරිසිඳ දැනගැනීම් ආදී හාත්පසින් ම දැනගැනීම් වශයෙන් දැකිය යුතු හෙයින් දක්නා ලද "යථා භූතං" විදර්ශනා ප්‍රඥාව සහිත වූ මාර්ග ප්‍රඥාවෙන් "මේ දුකය ..." ආදී වශයෙන් විපරීත නොවී තත්වාකාරයෙන් ම දක්නා ලද,

"භවා සබ්බෙ පදාලිතා" කාමාදි සියලු භවයන් ද උත්පත්ති භාවාදිය ද මාර්ග ඤාණය නම් සැතින් (ආයුධයෙන්) බිඳින ලදි. විද්වංසනය කරන ලදි. කෙලෙසුන්ගේ පළා දැමීම ම මාර්ග ප්‍රඥාවෙන් කාම උප්පත්ති ආදි භව විනාශ කිරීම නම් වේ. එනිසා "විකඛිණො ජාති සංසාරො නත්ථිදානි පුනබ්භවො" යනුවෙන් කියන ලදි. ජාති නම් වූ සංසාරය (ඉපදීම) විශේෂයෙන් ක්‍ෂය කරන ලදි. දැන් පුනර්භවයක් නැත. මෙම අර්ථ ඉහත කියන ලද පරිදිම දත යුතුයි.

පවිට්ඨ ථේරගාථා අර්ථ විස්තරය නිමියේය.

1.9.8

"අසක්‍ඛිං වත අත්තානං" යනු ආයුෂ්මත් අජ්ජුණ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? පෙර බුදුවරු හමුවෙහිදි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදි නිවන්පතා ගෙන කුසල දහම් රැස් කරගත් අජ්ජුණ තෙරණුවෝ; විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිංහයෙකුව උපන්හ. දිනක් එක් ගසක් මුල හුන් ශාස්තෘන් වහන්සේ දුටු එම සිංහයා, "මෙතෙම ඒකාන්තයෙන් මේ කැලයේ සිටින සියලු දෙනාටම ශ්‍රේෂ්ඨ වූ පුරුෂ සිංහයා වන්නේය"යි පැහැදුණු සිතින් පිපුණු සල් අත්තක් කඩා ඉන් ශාස්තෘන් වහන්සේ පූජා කළේය.

ඒ පින්කම හේතුවෙන් තිරිසන් බවින් මිදී දෙව්ලොව ඉපිද කාම සුගතීන්හි ම සැරිසරූ ඔහු; මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර සිටු ගෙයක ඉපිද අජ්ජුණ නාමයෙන් ප්‍රකට විය. වැඩිවියට පත් වූ අජ්ජුණ නිගණ්ඨයන් සමීපයේ කළ පුහුණුවීම් ඇතිව "මම මෙසේ නිවණ අවබෝධ කරගන්නෙමි"යි නිවන් ප්‍රාර්ථනා කරගෙන, ළඳරු කාලයේදී ම නිගණ්ඨයන් සමීපයේ පැවිදි විය. එහි හරයක් නොමැති බව දැක වෙසෙන කල්හි, ශාස්තෘන් වහන්සේගේ යමක මහා ප්‍රාතිහාර්ය දැක ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදිව විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් විය.

උන්වහන්සේ සිය චරිතාපදානය අපදාන පාළියේ මෙසේ දැක්වේ.

"එකල්හි විශිෂ්ට ජන්ම ඇති මනා කෙසරු ඇති සිහරජෙක් වූයෙමි. ගිරිදුර්ගයක් සොයන්නෙමි බුදුරජාණන් වහන්සේ දිටිමි. දැක මෙසේ

සිතිමි. "මේ මහාවීරයන් වහන්සේ මහජනයා කෙළෙස් ගින්නෙන් නිවති. මම ඒ දේවතාතිදේව වූ නර ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණෙමි නම් යහපති." මෙසේ සිතූ මම සල් අත්තක් බිඳ කෝෂය සහිත සල්මලක් ගෙනාවෙමි. බුදුරදුන් වෙත පැමිණ ඒ උතුම් මල පූජා කළෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් උදාර වූ මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. මල් පූජාවේ විපාකය මෙබඳුය.

මෙයින් නවවන කල්පයේ මහත් බල ඇති විරෝචන නම් සක්විති රජවරු තිදෙනෙක්ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ -බුදුරජාණන්වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත්ව, අනුත්තර වූ සුවයේ හෙවත් නිවනෙහි අවබෝධයෙන් හටගත් ප්‍රීති වේගයෙන් උදන් අනන සේක්; උන්වහන්සේ මේ ගාථාව වදාළ සේක.

"අසක්‍කිං වත අත්තානං
උද්ධාතුං උදකා ථලං
වුය්හමානො මහොසෙව
සව්වානි පටිවිජ්ඣහ"

එහි "අසක්‍කිං"යනු හැකි වූයෙමි. "වත" යනු විෂ්මයාර්ථයේ නිපාතයකි. අති විෂ්මයට පත්වීමක් ලෙස සත්‍ය ප්‍රතිවේධය දැක්වේ. එනිසා මෙය කියන ලදී. "මහණෙනි ! නුඹලා කුමක් සිතුවද ? අතිශය දුෂ්කර වූ ද අතිශයින් අමාරු වූ ද සත් කඩකට බිඳි සෙමර වල්ගයක කෙළවරින් කෙළවර ගැලපීමටත් වඩා දුෂ්කර වූ අවබෝධයකි." යනාදී ලෙස චතුරාර්ය සත්‍යාවබෝධයේ දුෂ්කර බව කියන ලදීත "අත්තානං" යනු තමාගේ ආධ්‍යාත්මය සඳහා කියන ලද්දකි. ඔහු වෙනත් අයෙකු නොවේ. තමාම ය. "උද්ධාතුං" යනු උඩට ගැනීමට "උද්ධටං" පාඨය ද යෙදේ. "උදකා" යනු සංසාර මහෝඝය නම් වූ ජලයයි. "ථලං" නිවන නම් වූ ගොඩබිමයි. "වුය්හමානො මහොසෙව" යනු මහා සාගරයට ගසාගෙන යන්නකු මෙන් මෙහි අදහස මෙසේය. - යම්සේ ගැඹුරු පැතිරුණු පිහිටක් නැති මහත් වූ සැඩ පහරක මහත් වේගයෙන් ගසාගෙන යන පුරුෂයකු දැක; කිසියම් වැඩ කැමති අයෙක් ලං කරන ලද, කිසිවකු නැති ශක්තිමත් නැවක් ලැබ, ඊට තමා සුවසේ නැගීමට දිය පහරින් උඩට ඒමට හැකිවේද,

ගොඩබිමට පැමිණෙන්නේ ද මේ ආකාරයෙන්ම මම සසර නම් මහා සැඩ පහරෙහි කෙළෙස් ආදියෙන් ගසාගෙන යනු ලබන්නෙමි; ශාස්තෘන් වහන්සේ විසින් එළවන ලද සමථ විදර්ශනාදියෙන් අලංකෘත ආර්ය මාර්ගය නම් නැව දැක, ඊට තමාම නැගී නිවණ නම් ගොඩබිමට (ක්ෂේමභූමියට) පැමිණීමට සමත් වූයෙමි. අහෝ ! එය පුදුමයකි. යම්සේ එම හැකියව ලැබුවේ ද එය දැක්වීමට "සඤ්ඤානි පවිවිජ්ඣහං" යනුවෙන් කියන ලදී. යම් සේ මම දුක්ඛාදි චතුරාර්ය සත්‍යය ධර්මය පිරිසිඳ දැන, ප්‍රහාණය කර, සාක්ෂාත් කර, වඩා අවබෝධ කරගත්තෙම් ද ආර්ය මාර්ග ඤාණයෙන් අවබෝධ කරගත්තෙම් ද එහෙයින් "මම ඒකාන්තයෙන් තමාම දියෙන් ගොඩ වී ගොඩබිමට පැමිණීමට හැකියාව ලැබුවෙමි." යනුවෙන් පද පිළිවෙල දත යුතුයි.

අජ්ජුණ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.9

"උත්තිණ්ණා පඞ්ක පලිපා" යනු ආයුෂ්මත් දේවසභ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහිදී ඒ ඒ භවයන්හිදී නිවන් පතාගෙන, සසරින් මිදීමට පින් රැස් කරගත්හ. සිබි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී පරවියකුව ඉපිද, එක් දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් උන්වහන්සේට එක් පියල් ඵලයක් පූජා කළේය. ශාස්තෘන් වහන්සේ එම පරවියාගේ පැහැදීම වැඩි කිරීම සඳහා එම ඵලය වැළඳූ සේක. ඉන් දැඩි සතුටට පත් පහන් සිත් ඇති පරවියා වරින් වර උන්වහන්සේ වෙත පැමිණ වැඳ සිත පහදවා ගත්තේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද, තව තවත් පින් දහම් සිදු කරමින් දෙව් මිනිසුන් අතරෙහි සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේදී එක්තරා ප්‍රාදේශීය රජෙකුගේ පුතුව ඉපිද තරුණ අවස්ථාවෙහි ම පිය උරුමයෙන් රාජ්‍ය ලැබ, රජ සැප විඳිමින් ම ශාස්තෘන් වහන්සේ දැකීමට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසූ සේක. ධර්ම අසා ලැබූ ශ්‍රද්ධා ඇති ඒ රජු සංවේගයට පත්ව තම රජකම හැරදමා බුදු සසුනේ පැවිදි විය. විදසුන් වඩා නොබෝ දිනකින් ම කෙලෙස් නසා රහත්ඵලයෙහි පිහිටියේ ය.

ඒ පිළිබඳව උන්වහන්සේ අපදාන පාළියේ දී මෙසේ පවසන ලදී. බුදුරජාණන් වහන්සේට නුදුරින් වූ ගිරි ගුහාවක සයනය කළෙමි. ලෝකයේ අසහාය නායක වූ බුදුරජාණන් වහන්සේ උදේ ද හවස ද දුටුවෙමි. දෙපා ඇත්තවුන්ට ප්‍රධාන වූ උන්වහන්සේට පිදිය යුතු කිසිවක් මා වෙත නොවිණි. පියල් ගෙඩියක් ගෙන බුදුරදුන් සමීපයට ගිය මම එය උන්වහන්සේට පිදුවෙමි. ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත්හ. පිළිගත් එම පියල් ගෙඩිය විනායකයන් වහන්සේ වැළඳූ සේක. එම සිත් පැහැදවීමෙන් ම මම කලුරිය කළෙමි. මම මෙයින් කල්ප තිස් එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එදා සිට ම දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප පහළොවකට පෙර මහත් බල ඇති පියාලි නම් වූ සක්විති රජවරු තිදෙනෙක් ව උපන්නෙමි. ම විසින් දැන් සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත්ව ප්‍රතිඥ කරන ලද කෙලෙස් පිළිබඳව සිහිපත් කිරීමෙන් උපන්නා වූ සතුටින් යුතුව උදන් අණන සේක්, උන්වහන්සේ මේ ගාථාව වදාළහ.

"උතතිණණා පඞ්ක පලිපා පාතාලා පරිවජ්ජිතා
මුත්තෝ ඔඝා ච ගන්ථා ච සබ්බෙ මානා විසංහතා"

මෙම ගාථාවෙහි "උතතිණණා" යනු එතෙර වූයෙමි. ඉක්මවූයෙමි. "පඞ්ක පලිපා" යනු මඩ ද මඩ වගුරු ද පංක යනු ස්වාභාවික මඩයි. පලිප යනු ගැඹුරු, පළල්, විශාල මඩ වගුරකි. මෙහි මඩ වැනි වූ කාමරාගය අදහස් විය. අඟුළි ආදි දේ ඉපදීමෙන් සිතේ තැවරීමෙන් පලිපයක් වැනි වූයේ පලිපයයි. පුත්‍රදාරාදීන් කෙරේ බලවත් ඡන්ද රාගයෙන් ඇලීමයි. " මෙම මඩ තවරා ගැනීමෙන් ද නොමනා ලෙස කීම් කෙරීම් ද මවිසින් අනාගමී මාර්ගයට පැමිණෙන විට සියලු ම ආකාරයෙන් ඉක්මවන ලදී" යනුවෙන් කියයි. 'සංක හා පලිප නම් වූ කාම, ඡන්ද රාගාදිය තරණය කළෙමි." "පාතාලා" යනු පහත, නිරයට පමුණුවයි යන අරුතින් "පාතාලා" යන්නෙන් අදහස් වන බව කියති. මෙහිදී අගාධයේ වැටී එතෙරවීමට අපහසු අර්ථයෙන් පාතාලයක් වැනි වූ හෙයින් පාතාල නම් වූ මිත්‍යා දෘෂ්ටීහු ය. එම වැරදි පිළිගැනීම් ද මවිසින් පළමු සෝවාන් මාර්ගයට පැමිණෙත්ම සර්වප්‍රකාරයෙන් ම නැති කරන ලදී. මුලුමනින් ම සිඳ දැමුවෙමි. එනිසා "පාතාලා පරිවජ්ජිතා" පාතාල නම් මිසදිටු අදහස්දුරු

කරන ලදැයි කියන ලදී. "මුත්තො ඔසා ච ගත්‍වා ච" යනු කාමාදී ඕඝයන්ගෙන් ද අභිධ්‍යාදී කාය ග්‍රන්ථා දී ගැට වලින් ද ඒ ඒ දෙයින් මිදුනෙමි. මැනවින් මිදුනෙමි. නැවත නොවිසුරුණු, ගැට - බැඳීම් නොමැති බැවින් ඉක්මවන ලදී යන අර්ථයයි. "සබ්බෙ මානා විසංහතා" යනු නවවිධ වූ මානයෝ ද අග්‍ර මාර්ගාවබෝධයෙන් විශේෂයෙන් විනාශ කරන ලදහ. මුලුමනින්ම සිඳ දමන ලදහ. ඇතමෙක් "මානවිධා හතා" යනුවෙන් මානවිධි නසන ලදැයි කියති. "මාන කොට්ඨාස" යන අර්ථයයි. ඇතමෙක් "මාන විසා"යනුවෙන් අර්ථ ගනිති. ඔවුන්ට අනුව මාන විෂය වූ දුකෙහි විපාක වශයෙන් "මාන විස" යනුවෙන් අර්ථ දත යුතුයි.

දේවසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.9.10

"පඤ්චකඞ්ගා පරිඤ්ඤතා" යනු ආයුෂ්මත් සාමිදත්ත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, අපරාදස්සි භාග්‍යවතුන් වහන්සේ පහළ වූ කාලයෙහි සිටුගෙයක උපන්හ. වැඩිවිය පත් ඒ සිටු කුමරු ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි, උන්වහන්සේගේ සෑයට මලින් ඡත්‍රයක් මත ඡත්‍රයක් කරවා පූජා පැවැත්වීය. ඔහු ඒ පිනින් දෙව් ලොව ඉපිද, තව තවත් පින් රැස් කර දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අපගේ බුදුරජාණන්වහන්සේ ලොව පහළ වූ සමයේ රජගහ නුවර එක් බමුණු පුතෙක්ව උපන්නේය. ඔහු සාමිදත්ත නමින් ප්‍රකට විය. වැඩිවියට පත් ඒ සාමිදත්ත බමුණා, බුද්ධානුභාවය අසා උපාසකයන් සමඟ විහාරයට ගොස්, ශාස්තෘන් වහන්සේ ධර්ම දේශනා කරනු දැක පැහැදුණු සිතින් එකත් පසෙක සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ සිත දැන ඒ අනුව දහම් දෙසූ සේක ඉන් ඔහු සසර කළකිරී සසුනෙහි උපන් ශ්‍රද්ධා ඇති විය. ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වූ සාමිදත්ත තෙරුන් ඤාණය මුහුකුරා නොගිය බැවින් දින කිහිපයක් ආශාවට වසඟව විසීය. නැවත ශාස්තෘන් වහන්සේ විසින් ධර්ම දේශනාවෙන් උත්සාහවත් කරන ලද උන්වහන්සේ; විදසුන් කමටහන ගෙන එහි ම යෙදී වාසය කළ සේක්, නොබෝ දිනකින් ම රහත් බවට පත්වූහ.

අපදාන පාළියේ උන්වහන්සේගේ චරිතය මෙසේ දක්වන ලදී.

"භාග්‍යවත් වූ අත්‍යදස්සි බුදුරදුන් පිරිනිවි කල්හි, උන්වහන්සේගේ ධාතු සෑය මතුයෙහි ඡත්‍රයක් මත ඡත්‍රයක් කරවා පූජා කළෙමි. කලින් කල අවුත් එම සෑයට වන්දනාමාන කළෙමි. මල් වියනක් ද කරවා ඒ මත ඡත්‍රයක් නැංවූයෙමි. මෙහි විපාක වශයෙන් කල්ප එක් දහස් හත් සීයක් ම දිව්‍ය රාජ්‍ය සැප වින්දෙමි. මිනිස් බව ද ලැබුයෙමි. මේ පූප පූජාවේ විපාකයයි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. සියලු භව නැසුයෙමි. බැඳුම් සිඳ දැමූ ඇත් රජෙකු මෙන් කෙලෙස් සිඳ දමා ආශ්‍රව රහිතව වෙසෙමි. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීමෙන් යහපතක් ම විය. ත්‍රිවිද්‍යාවන් ලබා ගත් මම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

පසු කාලයේ දී උන්වහන්සේගෙන් සෙසු භික්ෂූහු, "ඇවැත්නි ! කිම නුඹ වහන්සේ විසින් උතුරු මිනිස් දම් අවබෝධ කරගත්තෙහිද ?"යි විමසූහ. එවිට සාමිදත්ත තෙරුන් වහන්සේ බුදු සසුනේ නෛයාණිකභාවයත්, තමාගේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියත් ඔවුන්ට විදහා දක්වමින් සිය රහත් බව ප්‍රකාශ කරන සේක්; මේ ගාථාව වදාළහ.

"පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා
වික්ඛීණෝ ජාති සංසාරෝ නත්ථි දානි පුනබ්භවෝ"

මෙම ගාථාවෙහි "පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා" යනු මැනවින් මේ පංච උපාදානස්කන්ධ පිළිබඳ "මෙය දුකය, මෙපමණ දුක පවතී, මින් ඔබ්බට දුක නැත" යි යන ත්‍රිවිධ පිරිසිඳු දැනීම් වලින් පිරිසිඳ දැන ගන්නා ලදී. දන්න ලදී. අවබෝධ කරගන්නා ලදී. "තිට්ඨන්ති ඡින්න මූලකා" යනු එසේ පිරිසිඳ දත් බැවින් ඒ දුකට මූලය, හේතුව වූ තණ්හාව - ඇලීම සියලුම ආකාරයෙන් ප්‍රහීණ කරන ලදී. එම මූලයෝ අවසන් චිත්ත නිරෝධය දක්වා සිඳුණු මුල් ඇතිව සිටිති. අවසන් චිත්ත නිරෝධයත් සමඟ නැවත පිළිසිඳ ගැනීමක් නොමැතිව එම මූලයෝ නිරුද්ධ වෙති. එනිසා "ඉපදීම (ජාති) නම් වූ සංසාරය විශේෂයෙන් ක්ෂය කරන ලදී. දැන් පුනර්භවයක් නැත"යි කියන ලදී. මෙහි විස්තරාර්ථ ඉහත දැක්වූ පරිදි දත යුතුයි.

සාමිදත්ත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

නව වන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.10.1

"**න තථාමතං සතරසං**" ආයුෂ්මත් පරිපුණ්ණක තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ධම්ම දස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටුගෙයක ඉපිද වියට පැමිණියහ. එම ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි සෑද වූ බුදුසෑයට මල් ආදියෙන් මහත් වූ පූජාවක් ඔහු විසින් සිදු කරන ලදී. ඒ පින්කම හේතුවෙන් ඔහු දෙව් ලොව ඉපිද, තව තවත් පින් රැස් කරමින් කාම සුගතීන්හිම සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිල වස්තුවේ ශාක්‍ය රාජ කුලයෙහි ඉපිද, වියට පැමිණ. පිරිපුන් විභව සම්පත් ඇති බැවින් පරිපුණ්ණක නාමයෙන් ප්‍රකට විය. මහත් සම්පත් ඇති ඔහු සැම කල්හිම සතරස නම් ආහාරය අනුභව කළේය. තම කුලයෙන් පැවිදි වූ ශාස්තෘන් වහන්සේ මිශ්‍ර ආහාර වළඳන බව ඇසූ ඒ ශාක්‍ය කුමරු " ඉතාම සියුමැලි වුවත් භාග්‍යවතුන් වහන්සේ නිවන් සුව අපේක්ෂාවෙන් යම් සේ යැපෙන සේක් ද, මම කවර හෙයින් ආහාරයට ගිජුව පිරිසිඳු ආහාර සොයන්නෙම් ද, අප විසින් නිවන් සුවය ම සෙවිය යුතුයි" යනුවෙන් සසර පිළිබඳව හටගත් සංවේගයෙන්, ගිහි සැප හැර බුදු සසුනේ පැවිදි විය. භාග්‍යවතුන් වහන්සේ විසින් කායගතාසති කමටහනෙහි යොදවන ලද පරිපුණ්ණක තෙරුන්, එතැන් පටන් තමා ලැබූ ධ්‍යානය පාදක කරගෙන, විදසුනට සිත යොමා විදසුන් වඩා රහත් ඵලයෙහි පිහිටියේය. අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පවසති.

"ධම්මදස්සි බුදුරජාණන්වහන්සේ පිරිනිවි කල්හි ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේගේ සෑයෙහි කොඩි ගසක් නැංවූයෙමි. ඉණිමඟක් සාදවා උතුම් සෑයට නැගුණෙමි. දෑ සමන් මල් ගෙන එම උතුම් සෑයට පිදුවෙමි. "බුදුහු ආශ්චර්යය, ධර්මය ආශ්චර්යය, අපගේ ශාස්තෘ සම්පත්තිය ද ආශ්චර්යය." මේ පූජාව නිසා මම දුගතියක නූපන්නෙමි. ථූප පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප අනූ හතරකට පෙර ථූපසිඛර නමින් මහ බලවත් සක්විති රජවරු සොළොස් දෙනෙක් ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ - බුද්ධානුශාසනය ඉටු කළෙමි."

රහත් බවට පත්වූ උන්වහන්සේ ධර්ම ගෞරවයෙන් උපන් ප්‍රීති වේගයෙන් එම ප්‍රීතිය දසත පතුරුවමින් උදන් අනන සේක්; '**න තථාමතං සතරසං**" යනාදී ගාථාව වදාළ සේක.

එම ගාථාවේ "**න තථාමනං සතරසං සුධනනං යං මයඡ පරිභුත්තං**" යන පාඨයේ "**තථා**" යනු එසේ, ඒ ආකාරයෙන්, "**අමනං**" යනු අභිමත වූ, කැමති වූ "**සතරසං**" යනු සතරස නම් භෝජනයයි. එය සියවරක් පිසූ ගිතෙල් ආදියෙන් සැකසූ රසවත් ආහාරයකැයි කියැවේ. නැතිනම් "**සත**" ශබ්දය අනේකාර්ථයෙහි යෙදේ. **සතසො** සිය ආකාරයකින්, **සහසෙසා** - දහස් ආකාරයකින් ආදිය මෙණි. එනිසා යම් ආහාරයක් නොයෙක් සිය ගණන් සූප ව්‍යංජන එක්කර නානාවිධ රසයෙන් යුතුව සාදනු ලැබේද එය "සතරස" නාමයෙන් හැඳින්වේ යැයි ද කියති. "නානාවිධ රස ඇති ආහාරය" යන අර්ථයයි. දෙවියන්ගේ ම ආහාරය සුධා භෝජනයයි. දෙවියන් වළඳනුයේ එයයි. "සුධනනං" යනු එයයි. "**යං මයා අඡ පරිභුත්තං**" යම් ආහාරයක් මවිසින් අද පරිභෝජනය කරන ලද ද ඒ මේ සතරස භෝජනයයි. සුධා ආහාරය ද මෙතැනට යෙදිය යුතුයි. මෙම ගාථාවේ අර්ථය මෙසේය.

"මවිසින් දැන් නිරෝධ සමාපත්තියට සමවැදීම් වශයෙන් ද ඵල සමවතට සමවැදීම් වශයෙන් ද අතිශයින් ශාන්ත - ප්‍රණීත වූ නිවන් සුව කැමති සේ, අභිමත සේ, නුවණැත්තන් විසින් අගය කරන සේ අද විඳිනු ලැබෙත් නම් ද එබඳු වූ සුවයක්; පෙර රජව සිටියදී මා අනුභව කළ සතරස භෝජනයෙන් හෝ දේවාත්මභාවය ලබා සිටියදී අනුභව කළ සුධා භෝජනයෙන් හෝ නොලැබුණි. කුමක් නිසාද? මේ නිවන් සුවය ආර්යයන් විසින් සේවය කරන ලද්දකි. නිරාමිෂ වූවකි. කෙලෙසුන් නොපවතින තැනකි. සතරස ආදී භෝජන පුහුදුන් පුද්ගලයන් විසින් සේවනය කරන ලදී. ආමිෂ සහිතය. කෙලෙසුන්ගෙන් ගහනය. ඒ ආහාර වළඳන සුවය, මේ නිවන් සුවයෙන් අඩක්වත්, දාසයෙන් කොටසක්වත්, සොළොස් කලාවෙන් කලාවක් වත් නො වටී. සම නොවේ. "දැන් අද මවිසින් යමක් වළඳන ලද ද '' යනුවෙන් පැවසූ දහම අප්‍රමාණ වූ ඥාන සාගරයක් ඇති ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දෙසූ දහමකියි පවසයි. අප්‍රමාණ වූ, පිරිසිඳුවෙන් කර නොදැක්විය හැකි, ඉපදීම් - නැසීම් දෙකින් දුරු වූ, අනන්ත වූ, අසංඛත නම් නිර්වාණ ධාතුව සිය නුවණින් තමන් වහන්සේම දැක, අප්‍රමාණ අනන්ත ඥාන සාගරය අවබෝධ කරගත් බැවින් උන්වහන්සේ ''**අපරිමිත දඝසිනා ගොතමෙන**" නම් වේ. ගෞතම ග්‍රෝතුයේ උපන් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් "**ඛයං විරාගං අමනං පණීතං**" යනාකාරයෙන් මද - ප්‍රමාද දුරු කරන, පිපාස දුරු කරන, සියලු සංස්කාර ධර්ම සන්සිඳුන ආදී වශයෙන් ශාස්තෘන් වහන්සේ මනාව දෙසන ලද ධර්මය අනුව විස්තර කෙරෙන නුවණ අද මවිසින් අවබෝධ කර ගන්නා ලදී." යනුවෙන් අර්ථ දත යුතුයි.

පරිපුණ්ණක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.2

"යස්සාසවා පරික්ඛීණා" යනු ආයුෂ්මත් විජය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? විජය තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇත්තෙකි. පියදස්සි භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි ධනවත් කුලයක උපන් හෙතෙම, වියට පැමිණ; පිරිනිවි බුදුරදුන්ගේ සෑයට මාණික්‍යමය වූ වේදිකාවක් කරවා එය පූජා කිරීමට මහත් උත්සවයක් කළේය. ඒ පින්කම නිසා ඔහු නොයෙක් සිය ගණන් ආත්මභාවයන්හි මාණික්‍ය ලෝකයෙන් ශෝභාමත් විය. මෙසේ දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි සැවැත් නුවර බමුණු පවුලක ඉපිද, විජය නාමයෙන් ප්‍රකට විය. වියට පත් ඒ බමුණු කුමරු සියලු වේදා දී විද්‍යාවන්හි පරතෙට ගියේය. තවුස් පැවිද්දෙන් පැවිදි වූ ඔහු ධ්‍යානලාභීව ආරණ්‍යයෙහි වාසය කොට, බුදුරදුන්ගේ පහළවීම අසා උපන් ප්‍රසාදයෙන් උන්වහන්සේ වෙතට පැමිණ, ශාස්තෘන් වහන්සේට වැඳ එකත් පසෙක සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසූ සේක. ඒ ධර්ම දේශනාව අසා පැවිදිව විදසුන් වැඩූ විජය තෙරුන් නොබෝ කලකින්ම රහත් ඵලයෙහි පිහිටියහ.

අපදාන පාළියේ මෙසේ උන්වහන්සේගේ චරිතාපදානය දැක්වේ.

"ලෝක නායක වූ පියදස්සි බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි, මම පැහැදුණු සිතින් සතුටු වූයෙමි එම සෑයට රත්නමය වේදිකාවක් කළෙමි. මැණික් පිරිවරාගෙන උතුම් වේදිකාවක් සැදුවෙමි. ඒ වේදිකා පූජෝත්සවය කරවූ මම කලුරිය කළෙමි. දිව්‍යමය හෝ මනුෂ්‍යමය යම් යම් අත්බවෙක උපදිමි ද ඒ හේතුවෙන් අහසේ මිණිරුවන් මට පහළ විය. ඒ පින් විපාකය මෙබඳුය. මෙයින් එක් දහස් හයසියවන කල්පයේදී මනිප්පභාස නමින් මහබලැති සක්විති රජවරු තිස්හය දෙනෙක්ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ විජය තෙරණුවෝ, සිය රහත්බව ප්‍රකාශ කරමින් **"යස්සාසවා පරික්ඛීණා"** යන ගාථාව වදාළ සේක.

එම ගාථාවේ **''යස්සාසවා පරික්ඛීණා"** යනු යම් යම් උතුම් පුද්ගලයෙකුගේ කාමාශ්‍රවාදී සිවු ආශ්‍ර ධර්ම සියලුම ආකාරයෙන් ක්ෂය

වූයේ ද ආර්ය මාර්ගයෙන් ක්ෂය කරන ලද්දේ ද, "**ආහාරෙව අනිසසිතො**" යමෙක් ආහාරයෙහි තණ්හා, දෘෂ්ටියෙන් වෙලී නොමැති ද එහි ගිජු නොවූයේ ද ආහාරයේ ඇලී - ගැලී නොසිටී ද මෙහිදී ආහාරය ගන්නා ලද්දේ නිදසුන් වශයෙනි. ආහාර යන්නෙන් සිවුපසය ම මෙතැනදී අදහස් කරන ලදී. සිවුපසයට සමාන වචනයක් ලෙස "ආහාර" ශබ්දය දත යුතුයි. "**සුඤ්ඤතො අනිමිත්තොච**" යන මෙහිදී අප්‍රණිහිත (ආශාවන්හි නොපිහිටි) විමෝක්ෂයම (නිවණම) ගන්නා ලදී. මෙහි නිවණට නම් තුනක් යෙදී ඇත. නිවණෙහි රාගාදිය නොමැති බැවින් ශූන්‍ය වේ. (සුඤ්ඤං යනු නිවණට නමකි). ඒ ශූන්‍ය විමුක්තිය ඇති බැවින් නිවන "ශූන්‍ය විමෝක්ෂයකි" එසේම රාගාදී නිමිති ද සංස්කාරාදී නිමිති ද නොමැති බැවින් නිවණ "**අනිමිත්ත**" (අනිමිත්තං) නම් වේ. නිමිති රහිත වූ විමුක්ති බැවින් "**අනිමිත්ත** විමෝක්ෂයකි." එසේම නිවනෙහි රාගාදී ආශාවන්, ප්‍රාර්ථනා නොමැති බැවින් අපණිහිත නම් වේ. රාගාදී ආශාවන්හි නොපිහිටි මිදීම යන අරුතින් නිවණ "**අප්‍රණිහිත විමෝක්ෂයක**"යි කියැවේ. ඵල සමවතට සමවැද, එය අරමුණු කරගෙන වාසය කරන උතුමන්ට මේ ත්‍රිවිධ විමෝක්ෂයෝම ගෝචර වෙති. "**ආකාසෙව සකුනානං පදං තස්ස දුරන්නයං**" අහසේ පියඹා යන කුරුල්ලන්ගේ පය මෙතැනදී පැකිලුණේය. මෙතැන හිස වැදුණේය. මෙතැන කුස වැදුණේය. පියාපත් මෙහි පිහිටියේය. ආදී වශයෙන් අහසේ ස්ථාන ලකුණු කළ නොහැක. එබඳු ස්ථාන පෙන්විය නොහැක. ඒ ආකාරයෙන් ම මෙම විමෝක්ෂයන්ගෙන් යුතු භික්ෂුව "නිරයාදියට මේ ආකාරයෙන් ගියේ යැ" යි දැක්වීමට, පෙන්වීමට නොහැක.

විජය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.3

"**දුක්ඛා කාමා එරකා**" යන ගාථාව ආයුෂ්මත් ඒරක තෙරුන් විසින් පැවසූවකි. එහි නිදානය කෙසේද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදී පුණ්‍ය සම්භාර ධර්ම සම්පූර්ණ කරගෙන පැමිණි ඒරක තෙරුන් සිද්ධත්ථ භාග්‍යවතුන්ගේ කාලයෙහි සිටුගෙයක ඉපිද වැඩිවියට පත්ව; දිනක් ශාස්තෘන් වහන්සේ දැක, පැහැදුණු සිතින් උන්වහන්සේට පිදීමට කිසිවක් නො ලැබ "මම ඒකාන්තයෙන් ශරීර ශක්තියෙන් පින් කරන්නෙමි" යි උන්වහන්සේ වැඩම කරන මාවත සෝදා සම කළේය.

ශාස්තෘන් වහන්සේ ඔහු විසින් සෑදූ ඒ මාවතෙහි වැඩි සේක. එය දුටු සිටු කුමරු පැහැදුණු සිතින් යුක්තව, ඇදිලි බැඳගෙන සතුටු සිතින් බුදුරදුන්ගේ ශ්‍රී ශරීරය නොපෙනී යන තෙක්ම බුදු ගුණ මෙනෙහි කරමින් - එම ප්‍රීතියෙන්ම සිටියේය. ඒ පින්කම නිසා දෙව්ලොව උපන් හෙතෙම තව තවත් පින් දහම් සිදු කරමින් කාම සුගතීන්හි ම සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත් නුවර ඉතා සම්භාවනීය සිටුවරයෙකුගේ පුත්‍රයාව ඒරක නමින් ඉපදුණි. ඒරක සිටුපුතු රූප සම්පන්නය. දර්ශනීයය. දුටුවන් පහදවන සුලුය. කළයුතු නොකළයුතු දේ දැන කිරීමෙහි සමත්ය. උතුම් වූ ව්‍යක්ත භාවයෙන් පිරිපුන්ය. ඔහුගේ දෙමාපියෝ කුලයෙන්, රූපයෙන්, හැසිරීමෙන් හා වයසින් ඔහුට සුදුසු වූ දැරියක් ගෙනවුත් විවාහ කර දුන්හ. ඔහු ඇය සමඟ සහවාසයෙන් ගිහි සුව විඳින කල්හි පශ්චිමභවික බැවින් කිසියම් සංවේගාත්මක කරුණක් නිසා සසර කළකිරී, ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්මය අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි විය. ශාස්තෘන් වහන්සේ ඔහුට කමටහන් දුන්සේක. කමටහන් ගත් නමුත් ඒරක තෙරුන් දින කිහිපයකට පසුව නැවත කාම වසඟ විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත දැන අවවාද කිරීම් වශයෙන් "දුක්‍ඛා කාමා ඒරකා" යන ගාථාව වදාළ සේක. එය ඇසූ තෙරුන් වහන්සේ " මවිසින් මෙබඳු උතුම් ශාස්තෘවරයකු හමුවේ කමටහන් ගෙන, එය අත්හැර දමා මිත්‍යා විතර්කයන්ගෙන් යුතුව විසීමෙන් ඉතා නුසුදුසු වූවක් කරන ලදී" යනුවෙන් සංවේගයට පත්ව, වහාම විදසුන් භාවනාවෙහි සිත පිහිටුවා නොබෝ දිනකින් රහත් බවට පත්වූහ. උන්වහන්සේ සිය චරිතාපදානය මෙසේ දැක්වූහ.

"පසැස් ඇති බුදුරජාණන් වහන්සේ කුඩා ගඟකින් එතෙර වී වනයට වැඩම කරන සේක. මම ඒ උතුම් ලකුණු ඇති සිද්ධාර්ථ බුදුරදුන් දුටුවෙමි. උදැල්ල හා කුඩය ද ගෙන ඒ මාර්ගය සමකළ මම ශාස්තෘන් වහන්සේට වැඳ තම සිත පහදවා ගතිමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර යම් කර්මයක් සිදු කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්ඛා දුගතියක නූපන්නෙමි. මාර්ග දානයේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප පනස් හතකට පෙර සුප්පබුද්ධ නාමයෙන් සක්විති රජව සැප විඳෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත්ව, ඒ බව ප්‍රකට කරමින් භාග්‍යවතුන් වහන්සේ වදාළ ගාථාවම උන්වහන්සේ නැවත මෙසේ දේශනා කළහ.

"දුක්ඛා කාමා එරක !
න සුඛා කාමා එරක !
යෝ කාමෙ කාමයති,
දුක්ඛං සෝ කාමයති එරක !

යෝ කාමෙ න කාමයති එරක !
දුක්ඛං සෝ න කාමයති එරකා

මේ ගාථාවෙහි "**දුක්ඛා කාමා**" යනු මේ වස්තු කාම, ක්ලේශ කාමාදිය දුක වස්තු කරගෙන ඇති බැවින්; විපරිණාම දුක; සංස්කාර දුක යන දුක් ස්වභාවයන්ගෙන් යුතු බැවින් දුකකි. කාමයෝ දුක් සහගතය. දුක නිපදවන සුලුය. එනිසා "කාමයන්ගේ අල්ප ආශ්වාද ඇත. බොහෝ දුක් ඇත. බොහෝ උවදුරු ඇත. කාමයේ ආදීනව බොහෝය" යනුවෙන් කියන ලදී. "**එරක !**" යනුවෙන් පළමුව තථාගතයන් වහන්සේ එම භික්ෂුවට අමතයි. පසුව තෙරුන් වහන්සේ ම තම නමින් තමා අමතයි. "**න සුඛා කාමා**" කාමයෝ නම් එය දන්නාහට සුවයක් නොවෙති. නොදන්නාහටම සුව ගෙන දෙති. එනිසා "යමෙක් සුවය දුක් වශයෙන් දකියි ද ඔහු දුක හුලක් වශයෙන් දකියි" ආදී වශයෙන් කියන ලදී. "**යෝ කාමෙ කාමයති දුක්ඛං සෝ කාමයති**" යම් සත්ත්වයෙක් කෙලෙස් කාමයන් හා වස්තු කාමයන් කැමති වේද, ඔහුට ඒ කාමුක සම්පත් නොලැබීයෑමෙන් අනාගතයේ අපා දුකට හේතු වශයෙන් ද සසර පැවතුම් දුකට හේතු වශයෙන් ද දුකම ගෙන දෙයි. වස්තු කාමයෝ දුකට වස්තු වූ බැවින් මෙසේ ඔහු දුක් ස්වභාව ඇති, දුක් නිමිති ඇති, දුක වස්තු කර ගත් දුකම කැමතිවේ යැයි කියන ලදී. එනිසා මෙහි අර්ථ කියන ලද ආකාරයෙන්ම දත යුතුයි. යමෙක් කාමයන් නොකැමතිවේද හෙතෙම දුක් නොකැමති වේ.

ඒරක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.4

"**නමෝ හි තස්ස භගවතෝ**" යනු ආයුෂ්මත් මෙත්තජී තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි නිදානය කෙසේද ? හෙතෙම අනෝමදස්සි බුදුන් දවස සිටු කුමරෙක්ව ඉපිද, වැඩිවියට පත්ව, බුදු සසුනේ වෙසෙසින්

පැහැදී බෝධි වෘක්ෂයට ගඩොලින් වේදිකාවක් කරවා සුදු පාටින් සායම් කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුට පුණ්‍යානුමෝදනා කළ සේක. ඒ පින්කම හේතුවෙන් දෙව්ලොව උපන් හෙතෙම ඒ ඒ භවයන්හිදී තව තවත් පින් දහම් සිදුකර දෙව් මිනිස් දෙගතියේ සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයේ මගධ රට එක්තරා බමුණකුගේ පුතුව ඉපදී මෙත්තජ් නාමයෙන් ප්‍රකට විය. වියට පත් ඔහු කාමයේ ආදීනව දැක තවුස් පැවිද්දෙන් පැවිදිව ආරණ්‍යයෙහි වාසය කරනුයේ බුදුරදුන්ගේ පහළවීම අසා, පූර්ව පුරුදුකාවයෙන් මෙහෙයවනු ලබන්නේ ශාස්තෘන් වහන්සේගේ සමීපයට අවුත් පැවැත්ම අරබයා ප්‍රශ්න විමසා, ශාස්තෘන් වහන්සේ එම ප්‍රශ්න විසඳූ කල්හි ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදිව, විදසුන් වඩා රහත් ඵලයෙහි පිහිටියේය. උන්වහන්සේ සිය චරිතාපදානය අපදාන පාළියේ මෙසේ දක්වා ඇත.

"මම අනොමදස්සි බුදුරජාණන් වහන්සේගේ බෝධිය වටා වේදිකාවක් කරවීමි. එය වටා සුණු වලින් පරිකර්ම කොට අලංකාර කළෙමි. ශාස්තෘෘ වූ අනෝමදස්සි නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ මැනවින් කළ එම පින්කම දැක භික්ෂු සංඝයා මැද වැඩහිඳ මේ ගාථාව වදාළහ. "මේ යහපත් පින්කම නිසාත් පිරිසිදු චිත්ත ප්‍රණිධිය නිසාත් සම්පත් අනුභව කොට දුක් කෙළවර කරන්නේ ය." මම ප්‍රසන්න වූ මුව ඇත්තෙමි. එකඟ වූයෙමි. සන්සුන් සිත් ඇත්තෙමි. බුදුසසුනෙහි අවසන් දේහය දරමි. මෙයින් නොඅඩු වූ කල්ප සියකට පෙර සබ්බෝසන නම් සක්විති රජව සැප වින්දෙමි. මවිසින් කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ ශාස්තෘන් වහන්සේට ස්තුති කරමින් මේ ගාථාව වදාළ සේක.

"නමෝ හි තස්ස භගවතෝ
සක්‍ය පුත්තස්ස සිරීමතෝ
තෙනායං අඟපාපත්තෙන
අඟෝ ධම්මෝ සුදෙසිතෝ"

මේ ගාථාවෙහි "නමෝ" යනු නමස්කාරයයි. "හි" යනු නිපාතයක් පමණි. "තස්ස" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් සමතිංස පාරමී ධර්ම සම්පූර්ණ කර, සියලු කෙලෙස් බිඳ අනුත්තර වූ සම්‍යක්

සම්බෝධියට පැමිණියේක් ද අවබෝධ කළසේක් ද උන්වහන්සේට "**සක්‍ය රාජස්‍ය පුත්තෝ**" ශාක්‍ය රජුගේ පුතා "සක්‍ය පුත්ත" නම් වේ. වෙනත් අයෙකුට සමාන නොවූ පුණ්‍ය සම්පත්තියෙන් සම්භාවිත වූ උතුම් රූප සම්පත්තියෙන් ද ධර්මකාය සම්පත්තියෙන් ද යුතු වූ බැවින් "සිරිමා" ශ්‍රීමත් වූ ඒ භාග්‍යවන් අරහත් ශාක්‍ය පුත්‍ර වූ සිරිමතුන් වහන්සේට නමස්කාර වේවා ! උන්වහන්සේට මම වඳිමි යන අර්ථයයි. "**තෙන**" ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් "අයං" ඒ ධර්මය තමා විසින් ප්‍රත්‍යක්ෂ කරගත් බැවින් මෙසේ පවසයි. "**අග්ගප්පත්තෙන**" අග්‍ර වූ සර්වඥභාවයට, සියලුම ගුණයන්හි අග්‍ර භාවයට - ශ්‍රේෂ්ඨභාවයට පත් වූ "**අග්ගො ධම්මො**" යනු අග්‍ර, උතුම් නවවිධ ලෝකෝත්තර ධර්මය මනාව, නොවෙනස් ව දෙසන ලදහ. විදාරන ලදහ.

මෙත්තජී ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.5

"අඤ්ඤොහං හතනෙත්තොස්මි" යනු ආයුෂ්මත් චක්ඛුපාල තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයන්හි දී පින් රැස් කරමින් පැමිණ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද, වැඩිවියට පත්වූහ. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ථූප පූජාව සිදු කිරීමේදී මල් රැගෙන ථූපයට පූජා කිරීමේ පිනින් ඔහු දෙව්ලොව ඉපදුණි. තව තවත් පින් කරමින් දෙව්-මිනිස් දෙගතියෙහි සැරිසරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර මහා සුවණ්ණ නම් කෙළෙඹියාට පුතුව උපන්නේ ය. ඔහුගේ නම "පාල"නම් විය. එකුමරු ඔබිනොබ ඇවිදින කාලයේ දී ඔහුගේ මව තව පුතෙකු වැදුවාය. එවිට දෙමාපියෝ කුඩා පුතුට "චුල්ලපාල" නමත් වැඩිමලාට "මහාපාල" යන නමත් ව්‍යවහාර කළහ. වැඩිවියට පත් වූ ඒ දෙදෙනම විවාහ ප්‍රාප්ත වූහ. එසමයේ ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. එම විහාරයට දිනපතා යන උපාසකයන් සමඟ එහි ගිය මහාපාල ශාස්තෘන් වහන්සේගෙන් බණ අසයි. ධර්ම ශ්‍රවණයෙන් ලැබූ ශ්‍රද්ධාව නිසා සිය ගෘහ කටයුතු බාල සොයුරාට පවරා තමා පැවිදි විය. පැවිදිව ලැබූ උපසපන් බව ඇතිව, ආචාර්ය උපාධ්‍යායන් හමුවේ වස් පසක් වැස; වස් පවරාණයෙන් අනතුරුව

ශාස්තෘන් වහන්සේගෙන් කමටහන් ගෙන; සැටක් පමණ සහාය භික්ෂූහු පිරිවරා, භාවනාවට සිදුසු වාසස්ථානයක් සොයමින් එක් ප්‍රත්‍යන්ත ගමකට වැඩ එහි ගම්වැසි උවසුවෝ කරවා දුන් පන්සලෙහි වාසය කරමින් මහණදම් පිරූහ. එසේ භාවනා කරන කල්හි උන්වහන්සේට ඇස් රෝගයක් ඇතිවිය. වෛද්‍යවරයා බෙහෙතක් සාදා දුන්නේය. වෛද්‍යවරයා පැවසූ ලෙස උන්වහන්සේ ප්‍රතිකාර නොගත්හ. එනිසා ඇස් රෝගය වර්ධනය විය. උන්වහන්සේ "මේ මගේ ඇස් රෝගයට ද වඩා කෙලෙස් රෝගය සන්සිඳවීම ඉතා උතුම් වන්නේයැ"යි ඇස් රෝගය ගැන නොසිතා විදසුන් භාවනාව වැඩීමෙහි ම සිත යොමු කළහ. එසේ භාවනාවට යොමු වූ උන්වහන්සේගේ කෙලෙස් ද දෙ ඇස් ද පෙර පසු නොවී එක විටම බිඳුණි. වැනසුනි. උන්වහන්සේ ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ කෙනෙක් වූහ. අපදාන පාළියේ උන්වහන්සේ මෙසේ සිය චරිතාපදානය දැක්වූහ.

"ලෝ වැස්සාගේ පූජාවන් පිළිගන්නා වූ ලෝකනායක වූ සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි, උන්වහන්සේට මහා චෛත්‍ය පූජාවක් පැවැත්විණි.ඒ මහර්ෂීන් වහන්සේට මහත් වූ පූජාවක් පැවැත්වෙන කල්හි මම දියබෙරලිය මල් රැගෙන එම සෑයට පූජා කළෙමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙම්ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. මල් පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප නවයකට පෙර සෝමදේව නම් වූ මහත් බල ඇති සක්විති රජව අසූ පස් වාරයක් සැප චින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

ඉක්බිති ඇස් බිඳියැමනිසා විහාරයේ තෙරුන් නවතා ගමට පිඬු සිඟා වැඩි සහායක භික්ෂූන් වෙතින් උපාසකයෝ "කුමක් හෙයින් තෙරුන් වහන්සේ නොවැඩිසේක් ද ?"යි විමසූහ. තොරතුරු අසා දුකට පත් ඔවුහු පිණ්ඩපාතය රැගෙන උන්වහන්සේ වෙත ගොස්, "ස්වාමීනි ! කිසිවක් නොසිත්වා. දැන් අපි ම ඔබවහන්සේට පිණ්ඩපාතය රැගෙන එන්නෙමු"යි ආරාධනා කර සිවුපසය ගෙනවුත් උපස්ථාන කළහ. සෙසු භික්ෂූහු තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා නොබෝ දිනකින්ම රහත් වූ හ. වැස් වැස නිම වී පවාරණය කළ ඒ භික්ෂූහු, "ස්වාමීනි ! අප ශාස්තෘන් වහන්සේට වැඳීම සඳහා සැවැත්නුවරට යන්නෙමු"යි පැවසූහ. තෙරණුවෝ "මම ඉතා දුර්වල ඇස් නොපෙනෙන්නෙකි. මාර්ගය ද උපද්‍රව සහිතය. මා රැගෙන යන නුඹලා මහත් වෙහෙසට පත්වෙති. එනිසා නුඹලා පළමුව යන්න. ගොස් ශාස්තෘන් වහන්ස ද මහා ශ්‍රාවකයන් වහන්සේලා ද මාගේ

වචනයෙන් වදින්න. චූලපාලට මගේ පුවත් කියා, පැමිණීමට අසමත් බව දන්වා කිසියම් පුරුෂයකු මා වෙත එවන්න"යි පැවසූහ. ඒ භික්ෂූහු නැවත ද යෑමට ආරාධනා කළත් යෑමට අකමැති වූ හෙයින්, "යහපති" යි පිළිතුරු දී, සෙනසුන් අකුලා තබා, උපාසකවරුන්ට දන්වා අනුපිලිවෙලින් දෙවිරම වෙහෙරට ගොස්; ශාස්තෘන් වහන්සේ ද මහා රෙවතරුන් ද මහාපාල තෙරුන්ගේ වචනයෙන් වැඳ දෙවැනි දවස් හි පිඬු පිණිස හැසිරෙමින් චූලපාලගේ ගෙට ගොස් සියලු පුවත් දැන්වූහ. එවිට චූලපාල "ස්වාමීනි! මේ මගේ පාලිත නම් බෑණා එහි යැවීමට හැකිය"යි කී කල්හි, එම තෙරවරු "මාර්ගය උවදුරු සහිතය. මොහුට ගිහි ස්වභාවයෙන් එහි යා නොහැක. එනිසා පැවිදි කර යවමු" යි පැවසූහ. ඔහු පැවිදි කරවා තෙරුන් වෙත යැවූහ. එම පාලිත සාමණේරයා අනුපිළිවෙලින් තෙරුන් වසන තැනට පැමිණ, තමාගේ පැමිණීම තෙරුන්ට දන්වා උන්වහන්සේත් සමඟ සැවැත් නුවර බලා පිටත් වූහ. එසේ එන අතර මඟ ගමක් අසල කැළයේ එක් දර කඩන්නියකගේ ගී ශබ්දයක් අසා, ඇය කෙරේ ඇලුණු පාලිත හිමියන්, තෙරුන් වහන්සේගේ සැරයටි කොණ අතහැර, ස්වාමීනි! මොහොතක් හිඳුණු මැනවි. මම වහා එන්නෙමි" යි කියා ඇය වෙත ගොස්, එහිදී සීල විපත්තියකට පැමිණියේය. තෙරුන් වහන්සේ, ''දැන් ස්ත්‍රියකගේ ගී හඬක් ඇසුණි. සාමණේරයා ද පමාවෙයි. ඒකාන්තයෙන් මොහු සිල විපත්තියකට පැමිණියේ ය" යි සිතූහ. එම සාමණේරයා අවුත් "ස්වාමීනි! යමු"යි කී කල්හි, තෙරුන් වහන්සේ "කිම නුඹ පාපියෙක් වූවෙහිද ?" යි ඇසූහ. සාමණේරයා නිහඬ විය. නැවත නැවත විමසුවත් කිසිවක් නො පැවසීය. තෙරණුවෝ, "නුඹ වැනි පාපියෙක් මගේ සැරයටිය අල්ලා ගැනීමක් නම් නැත. නුඹ මෙතැනන් පලා යව"යි පැවසූහ. ඔහු විසින් නැවත ''ස්වාමීනි ! මාර්ගය බොහෝ උවදුරු ඇත්තකි. නුඹ වහන්සේ ද අන්ධය. කෙසේ යන්නේද ?"යි කී කල්හි, "එම්බල මෝඩය ! මා මෙහිම වැටී මිය ගියත් නැවත නැවත පැකිලී වැටුණත් නුඹ වැන්නකු සමඟ යෑමක් නම් නැත"යි පවසා මේ අර්ථය දැක්වෙන මෙම ගාථාව වදාළහ.

"අන්ධොහං හතනෙත්තොඝම්හි කන්තාරද්ධාන පක්කන්තෝ
සයමානොපි ගච්ඡිඝ්ඝ න සහායෙන පාපෙනා''ති.

මෙම ගාථාවේ "අන්ධෝ" යනු ඇස් විනාශ වූ "හතනෙත්තෝ" යනු වැනසුණු ඇස් ඇති මෙබඳු වූ ප්‍රායෝග විපත්ති වශයෙන් මම නැසුණු නෙත් ඇති බැවින් අන්ධයෙක්මි. උපතින් අන්ධයෙක් නොවෙමි යන පරිදි මේ අන්ධභාවයේ වෙනස දත යුතුයි. නැතහොත් "අන්ධෝ" යනුවෙන්

"අන්ධ වූ වයසට ගිය මාපියන් පෝෂණය කරමි" යනාදියේ මෙන් මසැස විකල් වීමකි. වැනසීයාමක් දැක්වේ. "මේ සියලුම පිරිවැජියෝ අන්ධයෝ ය. ඇස් නැත්තෝ ය" වැනසීයාමක් දැක්වේ. "මේ සියලුම පිරිවැජියෝ අන්ධයෝ ය. ඇස් නැත්තෝ ය" යනාදියෙහි මෙන් ද "අන්ධයා, එක ඇසක් ඇත්තා දෙඇසම ඇත්තා" යනාදියෙහි මෙන් ද ප්‍රඥා ඇස විකලත්වයට පත්වීම **"හතනෙත්තා සමි"** යන්නෙන් අදහස් වේ. මේ දෙපදයෙන් මුඛ්‍ය වශයෙන් ම අන්ධභාවය දක්වයි. **"කන්තාර ද්ධා පක්කන්තෝ"** යනු කාන්තාරයේ මෙන් වනයේ දිගු මාවතට එළඹී. ස්වභාවයෙන්ම ඇති වූ කාන්තාරයක් නොව සංසාරික දිගු මාවතට එළඹී යන අදහසයි. මෙබඳු වූ කාන්තාර දිගු මාවතකට මේ තෙරුන් පැමිණ සිටියේය. **"සයමාන්නොපි"** නින්දෙන් වුවත් පා දෙකින් යා නොහැකිව උරයෙන් ද දණ මඬලින් ද බිම දිගා වී පෙරලෙමින් සිටියත් නො යන්නෙමි" **"න සහායෙන පාපෙන"** යනු නුඹ වැනි පවිටු පුද්ගලයකු සාහයකු කරගෙන නොයන්නෙමි යන අදහසයි. මෙය ඇසූ සාමණේරයා සංවේගයට පැමිණ "ම විසින් ඉතා බැරෑරුම් වූ සාහසික කටයුත්තක් කරන ලදී"යි අත් හිසේ බැඳගෙන අඬමින් වන ලැහැබින් පිටත්ව ගියේය. ඉක්බිති තෙරුන් වහන්සේගේ සිල් තේජසින් පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවන ආකාරයක් දැක්විය. ශක්‍රයා එකරුණ බලා, වහා තෙරුන් වෙත පැමිණ සැවතට යන පුරුෂයෙක් බව හඟවා සැරයටියෙන් කෙළවර රැගෙන, දිගු මාර්ගය හකුලුවමින් එදින සැන්දෑවේ ම සැවැත්නුවරට තෙරුන් රැගෙන ආවේය. එහි ජේතවනාරාමයේ චූල පාලිත විසින් සෑද වූ පන්සලෙහි අසුනක තෙරුන් හිඳුවා ශක්‍රදේවේන්ද්‍රයා, චූලපාලගේ යහලුවෙකු මෙන් ඔහු වෙත ගොස් තෙරුන් පැමිණි බව දන්වා තම දෙව්ලොවටම ගියේය. චූලපාලිත ද උන්වහන්සේට දිවි ඇතිතාක් මැනවින් උපස්ථාන කළේය.

චක්ඛුපාල ථේරගාථා අර්ථ විවරණාව නිමියේය.

1.10.6

"ඒක පුඤ්ඤං චජිත්වාන" යනු ආයුෂ්මත් බණ්ඩ සුමන තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ සිටුගෙයක ඉපිද වැඩි වියට පත්වූහ. ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි සෑදවූ රන් සෑයට, රජු මහා පූෂ්ප පූජාවක් කරනු

ලබන කල්හි තමාට පූජා කිරීමට මල් නොවූ බැවින් මෙම සිටුතුමා ඒ ථූපය අවට සඳුන් වේදිකාවක් වටකරවා මහත් වූ පූජාවක් සිදු කළේය. ඒ මහා පින්කමේ විපාක වශයෙන් දෙව්-මිනිස් දෙගතියේ මහත් වූ සම්පත් අනුභව කළ හෙතෙම කාශ්‍යප බුදුන් දවස කෙළෙඹි පුත්‍රයෙක් ව උපන්නේ ය. කාශ්‍යප බුදුරදුන් පිරිනිවි කල්හි සෑද වූ රථ ථූපය උදෙසා රජු මල් පූජාවක් කරනු ලබන කල්හි, තමන්ට පූජා කිරීමට මල් නොලැබූ එම කෙළෙඹියා එක් බණ්ඩ සුමන මලක් දැක මහත් වූ මුල සමඟ ම එය කඩාගෙන සෑයට පූජා කරන්නේ, මහත් වූ ප්‍රීති සොම්නසක් වින්දේය. ඒ පින්කම හේතුවෙන් ද දෙව්ලොව උපන් හෙතෙම අසූ කෝටියක් හවුරුදු දිව සැප විඳ අපගේ බුදුරදුන් පහළ වූ කල්හි පාවා නුවර මල්ල රජ පවුලක උපන්නේ ය. ඔහු උපන් කල්හි එම ගෙදර බණ්ඩ හකුරු ද සුමන මල් ද පහළ විය. එනිසා ඒ රජකුමරුට "බණ්ඩ සුමන" යැයි නම් තබන ලදී. වැඩි වියට පත් එකුමරු භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර චුන්දගේ අඹ වනයෙහි වැඩ වසන කල්හි, උන්වහන්සේ වෙත අවුත් ධර්ම ශ්‍රවණය කොට, ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදි විය. පැවිදිව නොබෝ දිනකින් ම විඳසුන් වඩා රහත් ඵලයෙහි පිහිටි එම තෙරණුවෝ තම චරිතාපදානය අපදාන පාළියේ මෙසේ දැක්වූහ.

"ලෝක ජ්‍යේෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ ගිනි කඳක් මෙන් බබලා පිරිනිවන් පෑ සේක. මහාවීර වූ එම බුදුරජාණන් වහන්සේගේ ධාතු නිධන් කළ මහ සෑයක් බඳින ලදී. අති උතුම් වූ ඒ ධාතුගෙයට බොහෝ ජනයා දිවා රෑ දෙක්හි උපස්ථාන කළහ. මම එහි පහන් සිතින්, සතුටු සිතින් සඳුන් වේදිකාවක් සෑදුවෙමි. පසුව සෑ රජුට සුදුසු වූ පරිදි සඳුම් දුම් දුන්නෙමි. ඉන්පසුව දිව්‍යමය හෝ මානුෂ්‍යමය භවයන්හි උපන්නා වූ මාගේ ළාමක බවෙක් නම් නොවිණි. පෙර කළ කුසල කර්මයේ විපාකය එයයි. මෙයින් කල්ප එක්දහස් පන්සීයකට පෙර මහත් බල ඇති සමග්ග නම් වූ සක්විති රජවරු අට දෙනෙක් සැප වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත්බවට පත්ව තමාගේ පෙර ජාතිය සිහිපත් කළ බණ්ඩ සුමන හිමියෝ, එහිදී තමා විසින් සුමන මල් පිදීම නිසා දිවසැප ලැබීමත්, නිවන් සැප ලැබීමත් සිදු වූ බව දැක තම ප්‍රීතිය පහළ කිරීම් වශයෙන් මෙම ගාථාව වදාළහ.

"එකපුප්ඵං චජිත්වාන අසීතිං වස්ස කොටියෝ
සගෙහසු පරිවාරෙත්වා සෙසකෙනම්හි නිබ්බුතෝ"

මෙම ගාථාවේ "එකපුඤ්ඤං" යනු එක මලකි. මෙහිදී සුමන මලක් අදහස් කරන ලදී. "චජිත්‍වාන" යනු ශාස්තෘන් වහන්සේගේ රූපයට පූජා කිරීම් වශයෙන් පරිත්‍යාග කර, පූජා කරන "අසීතිං වස්සකොටියො" යනු මනුෂ්‍ය ලෝකයේ ගණන් කිරීම අනුව වසර අසූ කෝටියක්. මෙහි අත්‍යන්ත සංයෝගයේ දුකියා විභක්තිය යෙදී ඇත. මෙහිදී සයක් වූ කාම ස්වර්ගයන්හි දෙවැනි අත්බවේ සිට සැරිසරූ බව අදහස් වේ. එනිසා "සඟොසු" යනුවෙන් තාවතිංස ප්‍රමුඛ දිව්‍ය ලෝකවල ඉපදුනෙමි. නැවත නැවත ඉපදීම් වශයෙන් එහි සිටි බැවින් මෙහි සත්තමී බහු වචනය යෙදුණි. "පරිචාරෙත්වා" යනු රූපාදී අරමුණුවල ඉඳුරන් හසුරුවා, සැප විඳ දිව්‍යාංගනාවන් විසින් තමා පිරිවරාගෙන උපස්ථාන කර "සෙසකෙනම්හි නිබ්බුතො" යනු මල් පූජා වශයෙන් පවතින කුසල චේතනාවන්හි භව සම්පත් ප්‍රදානය කිරීමට ඇති බල මහිමයෙන් ඉතිරි වූ යම් ඒ නිවන් සැප ලැබීමට හේතු වූ කුසලයක් වී ද ඒ සඳහා කියන ලදී. මෙහි බොහෝ පූර්වාපර වශයෙන් පැවති චේතනාවෝ විය. "සෙසකෙන" යනු එම කර්මයේ විපාක වශයෙන් ඉතිරි වූ, එම විපාක ඉතිරිව තිබියදීම එහි විපාක වශයෙන් නිවුණෙමි. නිවනට පැමිණියෙමි. කෙලෙස් පරිනිවණින් පිරිනිවියෙමි. මේ යම් ආත්මභාවයක සිට තමා රහත් බව සාක්ෂාත් කරගත්තේ ද එම අවසන් ආත්ම භාවය ද ඒ කර්මයේ විපාකයක් බව දක්වයි. මෙබඳුම සැප විඳින ආත්මභාව තවත් ඉතිරිව තිබියදී පිරිනිවයෙමි යන අදහසයි.

බණ්ඩ සුමන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.7

"හිත්වා සතපලං කංසං" යන ගාථාව ආයුස්මත් තිස්ස තෙරුන් වහන්සේ විසින් පැවසූවකි. එහි උපත කෙසේද ? මෙතෙමේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී වාහන සාදන පවුලක ඉපිද වැඩවියට පත්ව, එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් සඳුන් දර කඩකින් ඵලකයක් සාදා එය උන්වහන්සේට පූජා කළේය. ඒ පින් කමේ විපාක වශයෙන් දෙව්ලොව උපන් ඔහු, තව තවත් භවයන්හි ඉපිද පින් දහම් රැස් කර කාම සුගතීන්හිම සැරිසරා; මේ බුද්ධෝත්පාද කාලයෙහි රෝරුව නුවර රජ ගෙදර උපන්නේ ය. වියට පත් ඔහු පියාගේ ඇවෑමෙන් රජ වී බිම්සර රජු

සමඟ නොදුටු මිත්‍රඥයෙන් වෙලී ඔහු වෙතට මිණි මුතු වස්ත්‍රාදී පුද පඬුරු යැවීය. බිම්සර රජ එම ත්‍යාග ලබා සතුටු පිළිතුරු ත්‍යාග වශයෙන් සිතුවම් පටක බුදුසිරිත ද රන් පටියක ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය ද ලියවා යැවිය. එය දුටු රෝරුව රජු පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇති බැවින් ද ප්‍රතීත්‍යසමුත්පාදය ද බලා කාරණා කාරණා විමසා බලා, හසුනේ වූ දෙය හදෙහි තබාගෙන උපන් සංවේගයෙන්, "ම විසින් භාග්‍යවතුන් වහන්සේ දක්නා ලද්දෙමි. මේ හසුන ද එක්වරම අවබෝධ විය. කාමයෝ බොහෝ දුක් ගෙන දෙති. බොහෝ උවදුරු ඇත. ගිහිගේ වැසීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද ?"රජකම හැරදමා කෙස් රවුල් බහා කසාවත් හැඳ, භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වී මැටි පාත්‍රයක් ගෙන පුක්කුසාති රජ මෙන්. මහජනයා හඬද්දීම තම නුවරින් නික්ම අනුපිළිවෙලින් රජගහ නුවරට පැමිණියේය. එහි සප්පසොණ්ඩික පර්වත ප්‍රාන්තයේ වෙසෙන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණි ඔහු උන්වහන්සේට වැඳ එකත් පසෙක සිටියේය. ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා විඳසුන් කමටහන රැගෙන, එහිම සිත පිහිටුවා වෙසෙමින් විඳසුන් කමටහන වැඩිදියුණු කිරීමෙන් රහත් විය.

එනිසා අපදාන පාළියේ මෙසේ උන්වහන්සේ සිය චරිතය දක්වන ලදී.

"පෙර දැව කර්මයෙහි මනාව හික්මුණු වඩුවෙක් වූ මම සඳුන් පුවරුවක් සාදා එය ලෝකබන්ධු වූ බුදුරජාණන් වහන්සේට පිදුවෙමි. ඒ හේතුවෙන් මා හට පහළ වූ මේ රනින් නිම වූ විමානය බබලයි. හස්තියා ද අශ්වයා ද දිව්‍යමය යානාවක් ද මා හට ලැබුණි. ප්‍රාසාද, සිවිකා කැමති තාක් පහළ විය. මා හට ස්ථාවර වූ රත්න නිධාන පහළ විය. සඳුන් පුවරු පිදීමේ පුණ්‍ය විපාකය මෙබඳුය. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් ඵලකයක් පිදුවෙමි ද එතැන් සිට මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඵලක දානයේ විපාකය මෙයයි. මෙයින් පනස් හත්වන කල්පයේ සන්ත නම් මහබලැති සක්විති රජවරු සිවු දෙනෙක් ව සප්ත රත්නයෙන් සමන්විත වූ රජ සැප වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ ප්‍රීතිය පහළ කිරීම් වශයෙන් තමාගේ පිළිවෙත පවසමින් මෙම ගාථාව වදාළහ.

"හිත්වා සතපලං කංසං සොවණ්ණං සතරාජිකං
අගහිං මත්තිකාපත්තං ඉදං දුතියාභිසෙචනං"

මෙම ගාථාවෙහි "**හිත්වා**" යනු අත්හැර "**සතපලං**" යනු යමෙක පලමී සීයයක් පමණ ප්‍රමාණයක් වේ නම් සතපල ප්‍රමාණ වූවකි. සිය පලමක් අගනා "**කංසං**" යනු රන් තැලියයි. "**සොවණ්ණං**" යනු රත්තමය රනින් කළ "**සතරාජිකං**" බෙදූ විසිතුරු අනේක රූපාලංකාර වලින්ද, විසිතුරු වූ නොයෙක් රේඛාවලින් ද බබළන "**අගහිං මත්තිකා පත්තං**" මෙබඳු වූ මහත් අනර්ඝ භාජනයක මීට පෙර ආහාර වැළඳුවෙමි. බුදුරදුන්ගේ අවවාදය අනුව දැන් එය අතහැර, මැටිමුවා පාත්‍රයක් දැන ගත්තෙමි. ''පුදුමයි ! මවිසින් කළ දෙය ආර්ය ව්‍රතය අනුව පැවතීමකි" යි භාජනය පිළිබඳ පැවසීමෙන්, තම රජකම හැරදැමීමත් පැවිදිවීමත් සිහිකර සතුටුවීම අදහස් වේ. ඒ නිසා "**ඉදං දුතියාභිසෙචනං**" යනුවෙන් කියනලදී. පළමුව මම රාජාභිෂේකය ලැබුවෙමි. මේ පැවිදිවීම දෙවැනි අභිෂේකයක් බඳුය. පළමු අභිෂේකය රාගාදියෙන් කිලිටි වූ, සැක සංකා සහිත අනර්ථ වූ දුක හා බැඳී පවතින නිහීන වූ අවස්ථාවකි.

දැන් මම ලැබූ මේ අභිෂේකය එම දුක්බදයි බැවින් වෙන් වූ උතුම් ප්‍රණීත වූවකි යන අදහසයි.

නිස්ස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.8

"**රූපං දිස්වා සති මුට්ඨා**" යනු ආයුෂ්මත් අභය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන්පතාගෙන පින් රැස්කරගත්හ. සුමේධ භාග්‍යවතුන් වහන්සේ ගේ කාලයේ දී සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූ හෙතෙම දිනක් සුමේධ බුදුරජාණන් වහන්සේ දැක පහන් සිතින් සලල නම් සුවඳ මල් වලින් පිදුවේය. ඒ පින්කම හේතුවෙන් දෙව්ලොව ඉපිද, තව තවත් පින්දහම් සිදුකර කාම සුගතීන්හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර බමුණු පවුලක "අභය" නාමය ලබා ඉපිද වැඩිවියට පැමිණියේය. පෙර හේතුසම්පත් මගින් මෙහෙයවනු ලැබූ අභය බමුණා ශාස්තෘන් වහන්සේ වැඩ සිටින විහාරයට දිනක් ගොස් ධර්මදේශනාව අසා

ලබන ලද ශ්‍රද්ධාවෙන් බුදුසසුනේ පැවිදිවිය. පූර්ව කටයුතු නිමවූ උන්වහන්සේ විදසුන් කමටහන වඩමින් වෙසෙන අතර දිනක් ගමට පිඬුසිඟා වැඩියහ. එසේ වැඩම වූ උන්වහන්සේ නිවසක අලංකාරව සැරසී හුන් ස්ත්‍රියක් දැක නුණුවණින් මෙනෙහි කිරීම් වශයෙන් ඇගේ රූපයට ඇලී රාග සිත් ඉපිද වූහ. විහාරයට වහා පිවිසි අභය තෙරණුවෝ "සිහිය නොමැතිව බැලූ මට එම රූපාරම්මණය නිසා කෙලෙස් ඉපදුණි. මවිසින් කරන ලද්දේ ඉතා නුසුදුසු ක්‍රියාවකි" යි තම සිතට නිග්‍රහ කරමින් එකෙණෙහිම විදසුන් වඩා රහත් ඵලයට පත්වූහ.

අපදාන පාළියේ උන්වහන්සේ මෙසේ සිය චරිතාපදනය දක්වූහ.

"සියල්ල තමන්වහන්සේ දැනගත්තාවූ අපරාජිත වූ සුමේධ බුදුහු විවේක සුවය වඩමින් මහවනයට පිවිසිසේක. ලෝකනායකයන් වහන්සේ ඉදිරියෙහි පිපුණු සලල ගසක් දුටු මම ඉන් මල් කඩාගෙන බුදුරජාණන් වහන්සේට පිදුවෙමි. තිස් දහස්වන කල්පයේ යම් මලක් පිදුවෙම්ද මේ දක්වා ම දුගතියක් නො දනිමි. බුදු පුදෙහි විපාකය මෙබඳුය. කල්ප එක් දහස් නවසියයකට පෙර නිම්මිත නමින් මහත් බල ඇති සක්විති රජවරු දසය දෙනෙක්ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත්වූ උන්වහන්සේ, "තමාගේ කෙළෙස් ඉපදීම් දැක්වීමෙන්, කෙළෙස් අනුව පවතින කෙලෙස් වසඟවූවහුට සංසාර දුකින් මිදී හිස එසවීමක් නම් නොලැබේ. මම වනාහි ඒ කෙළෙස් දුරලූයෙමි"යි දක්වමින් මෙම ගාථාව වදළහ.

> "රූපං දිස්වා සති මුට්ඨා පිය නිමිත්තං මනසිකරොතො
> සාරත්ත චිත්තෝ වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
> තස්ස වඩ්ඪන්ති ආසවා භවමූලා භව ගාමිනෝ."

මෙම ගාථාවෙහි "**රූපං**" යනු ඇලුම් කටයුතු රූපායතනයයි. මෙහිදී ස්ත්‍රී රූපය අදහස් කරන ලදී. ''**දිස්වා**" දැසින් දැක චක්ඛුද්වාරය ආශ්‍රයෙන් නිමිති, අනුව්‍යඤ්ජන, උප ලක්ඛණ වශයෙන් රූපය පිළිබඳව සිතට ගෙන, එහි මේ ආකාරයෙන් ගැනීම හේතුවෙන් "**සති මුට්ඨා**" අසුභ සහගත කයෙහි අසුභ භාවය සිහිකිරීමෙන් පවතින සිහිය නොමැතිව යම් රූපයක් දැකීමෙදී සිහිය නොමැතිවීද එය දැක්වීමයි. "පිය නිමිත්තං මනසි කරොතො" යම්සේ එළඹ සිටි අරමුණ "සුභය සැපය" ආදී ලෙස ප්‍රිය නිමිති ගෙන

අනුවණින් මෙනෙහි කිරීමෙන්, නිවැරදි සිහිකිරීමෙහි සිහි මුලාවී යන අර්ථ යෝජනාවයි.

එසේම එයින් **"සාරත්ත චිත්තෝ වෙදෙති"** යනු මනාව එහි ඇලුණු සිතින්, ඒ අරමුණ වැළඳගනියි, සතුටුවෙයි එහි බැසගෙන සිටියි. බැසගැනීම් වශයෙන් ඒ අරමුණම ගිලගෙන එහිම නැවතී සිටියි. මෙසේ ඇලී ගැලී සිටින්නාට **"තස්ස වඩ්ඪන්ති ආසවා භව මූලා භවගාමිනෝ"** ඒ සංසාර භවයේ පැවැත්මට මුල වූ හේතුව කාමාශ්‍රවාදී සිවු ආශ්‍රවයෝ ඒ පුද්ගලයාට තව තවත් වැඩේ. සසර පැවැත්ම තව තවත් දිගු වේ. නොපිරිහේ මම වනාහි සංස්කරණය කිරීමෙහි පිහිටා, විදසුන් වඩමින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගනිමින් මඟ පිළිවෙලින් ඒ සතර ආශ්‍රවයෝ ඉතිරි නොකරම ප්‍රහීණ කළෙමි ක්ෂය කළෙමි යන අදහසයි.

අභය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.9

"සඳ්ධං සුත්වා සතිමුට්ඨා" යන ගාථාව ආයුෂ්මත් උත්තිය තෙරුන් විසින් පැවසූවකි. එහි උපත කෙසේද? උත්තිය තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි ඉපිද නිවන් පතා පින්දහම් රැස්කරගෙන, සුමේධ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද වියට පත් වූ සිටුකුමරෙක් වූහ. එක් දිනක් ඔහු ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් ගෝණකාදී පලස් අතුළ, උඩුවියන් බැඳි බුදුවරුන්ට සුදුසු වූ අගනා පලඟක් ගදකිළියෙහි පනවා පුජාකළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්-මිනිස් දෙගතියේ සැරිසරා අපගේ බුදුරදුන් පහළ වූ සමයෙහි කපිලවස්තුවේ ශාක්‍ය රජ පවුලක ඉපිද උත්තිය කුමරු නමින් ප්‍රකට විය. වැඩිවියට පත් ඔහු ශාස්තෘන් වහන්සේ නෑයන් හමුවූ මෙහොතෙහි පැවති බුද්ධානුභාවය දැක ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදිවී, මහණදම් පුරා, එක් දිනක් නුවර පිඬු සිඟා වැඩියේය. අතර මඟ එක් ස්ත්‍රියකගේ ගී ශබ්දයක් අසා අනුවණින් එය මෙනෙහිකර එම ශබ්දයේ තදින් ඇලුණු උත්තිය තෙරණුවෝ, නැවත නුවණින් මෙනෙහි කිරීමෙන් එම රාගය දුරුකර, විහාරයට පිවිසියහ. ඒ පිළිබඳව උපන් සංවේගයෙන් දවල් වසන තැන හිදී උන්වහන්සේ එකෙණෙහි ම විදසුන් වඩා රහත්බවට පත්වූහ. අපදාන පාළියේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

''ලෝකජ්ජේට්ඨ වූ තාදිගුණ ඇති සුමේධ භාග්‍යවතුන් වහන්සේට උඩුවියන් හා ඇතිරිලි සහිත උසස් පලඟක් මවිසින් පූජා කළෙමි. එකල්හි එය සත්රුවනින් පිරි පලඟක් විය. මාගේ අදහස අනුවම හැමකල්හි මට එබඳු පර්යංක පහළ විය. තිස් දහස්වන කල්පයේ මම යම් පලඟක් පූජා කළෙමි ද ඒ හේතුවෙන් දුගතියක නුපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. විසි දහස් වන කල්පයේ සත්රුවන් පිරි මහ බල ඇති සුවණ්ණාභ නමින් සක්විති රජවරු තිදෙනෙක් ව උපන්නෙමි. මම දන් සියලු කෙලෙස් දූවුයෙමි - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ, තමාට කෙලෙස් ඉපදුණු අයුරු හා ඊට හේතු දැක්වීම් වශයෙන්, ''කෙලෙස් පිළිකුල් නො කරන්නාට සසර දුකින් මිදීමක්, නිස එසවීමක් නැත. මම මේ සියළු කෙලෙස් පිළිකුල් කර ඉවතලුවෙමි'' යි දක්වමින් මෙම ගාථාව වදළහ.

''සඳ්ධං සුත්වා සති මුට්ඨා පිය නිමිත්තං මනසිකරොතො
සාරත්ත චිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති,
තස්ස වඩ්ඪන්ති ආසවා සංසාරං උපගාමිනො'' ති.

එහි ''සඳ්ධං'' යනු ඇලියයුතු, ඇලෙන ප්‍රිය ශබ්දරම්මණයයි. ''සංසාරං උපගාමී නො'' යනු

''බන්ධානංච පටිපාටි ධාතු ආයතනානි ච
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති''

''ස්කන්ධයන්ගේ පිළිවෙලින් පැවතීමෙන්, ධාතු හා අයතනාදිය නොසිදී පවතින කල්හි එය සංසාරය යැයි කියනු ලැබේ.'' යනුවෙන් පැවසෙන සසර පැවතුම් කාරණ එකතුවීමෙන්, පැවතීමෙන් සසරට එළඹෙති. සසර පැවත්ම ගෙනදෙති. ''සංසාරූපගාමිනො'' යන පාඨය ද යෙදේ. සෙසු පදයන්ගේ අර්ථ මුලින් පැවසූ ගාථාවේ අර්ථමෙන් දතයුතුය.

උත්තිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.10.10

"සම්මජ්ජන සම්පනෙනා" යනු අයුෂ්මත් දේවසභ තෙරුන් වහන්සේ පැවසූ ගාථාවකි. එහි නිදනය කෙසේද ? දේවසභ තෙරණුවෝ පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, සිබී නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටු ගෙයක ඉපිද වැඩිවිය පැමිණ, දිනක් ඒ බුදුරජාණන් වහන්සේට පැහැදුණු සිතින් බදුවද මල් පූජා කොට නිවන් පතාගෙන කුසල් රැස්කරගත්හ. ඒ පින්කම් නිසා දෙව් - මිනිස් දෙගතියේ සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිලවත්‍ථු වේ. ශාක්‍ය රජ කුලයෙහි උපත් හෙතෙම දේවසභ නමින් ප්‍රකට විය. වියට පත් එ කුමරු කලහය සන්සිඳවීමට ශාස්තෘන් වහන්සේ පැමිණි කල්හි බුද්ධානුභාවය දැක, පැහැදුණු සිතින් සරණ සිල්හි පිහිටියේය. නැවත ශාස්තෘන් වහන්සේ නිග්‍රෝධාරාමයේ වැඩ වසන කල්හි උන්වහන්සේ වෙත පැමිණි, දේවසභ කුමරු ලබන ලද ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වී කළ පුර්වකටයුතු ඇතිව විදසුන් කමටහන වඩා නොබෝ දිනකින් ම රහත් ඵලයෙහි පිහිටියේය.

උන්වහන්සේ සිය චරිතාපදනය අපදන පාළියේ මෙසේ දක්වුහ.

"කෙලෙසුන් විරහිත වෘදයා මෙන් නිර්මල වූ, පිරිසිදු වූ, පැහැදුනා වූ, කෙලෙස් මලින් නොකැළඹුණු නන්දිභව නම් තන්හාව හා භවය ක්‍ෂය කරන ලද්ද වූ, ත්‍රිවිධ ලෝකයේම ඇල්ම නැති කළ, ජනසමුහයා කෙලෙස් ගින්නෙන් නිවන්නා වූ, සසර සයුරින් එතෙර වූ, එසේ එතෙර වූවන් අතරින් උතුම් වූ, වනසේ හිඳ ධ්‍යාන වඩන්නා වූ ඒ එකඟ වූ සත්හුන් වූ සිබී බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් කුසල කර්මයක් කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප සතකට පෙර මනුජේන්ද්‍රවූ මහත් වූ යසස් ඇති සමන්තචක්ඛු නම් සක්විති රජ වූයෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ, තමන් වහන්සේ අවබෝධ කරගත් විමුක්ති සුවය නිසා උපත් ප්‍රීති සොම්නසින් උදන් ඇණීම් වශයෙන් මෙම ගාථා වදළහ.

''සම්මප්පධාන සම්පන්නෝ සතිපට්ඨාන ගොචරෝ
විමුත්ති කුසුමසඤ්ඡ නෙනා පරිනිබ්බායිස්සත්‍යනාසවෝ.''

එහි ''**සම්මප්පධාන සම්පන්නෝ**'' චතුරංග සමන්නාගත සම්‍යක් ප්‍රධන් වීර්යයෙන් යුක්ත වූ, ඒ වීර්‍යය මගින් කළයුතු කටයුතු සම්පාදනය කර සිටියි යන අර්ථයයි. ''**සතිපට්ඨාන**'' යනු කායානුපස්සනාදී සතිපට්ඨාන ගොදුරු කරගෙන පවතියි යන අරුතින් සතර සතිපට්ඨාන ගෝචර වූ, අරමුණු වූ, සතර සතිපට්ඨානයන් හි පිහිටි සිත් ඇති යන අර්ථයයි. ගුණ ශෝභන නම් උතුම් වූ සුවදැති විමුක්තිය නම් වූ මලින් අලංකාර වූ, මනාව වැසුණු යන අර්ථය ''**විමුත්ති කුසුමසඤ්ඡන්නෝ**'' යන්නෙහි ඇත. ''පරිනිබ්බායිස්සත්‍ය නාසවෝ'' යනු මෙසේ පිළිපදින්නා වූ භික්ෂුව නොබෝ කලකින් ම අනාශ්‍රවයකු වී සෝපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවේ යන අර්ථයයි. මෙය ම දේවසභ තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ කිරීම විය.

දේවසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දසවන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.11.1

''හිත්වා ගිහී භවං අනවොසිතත්තෝ'' යනු ආයුෂ්මත් බේලට්ඨානික තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි නිදානය කෙසේද? මෙම තෙරණුවෝ ද පෙරබුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, මෙයින් කල්ප තිස් එකකට පෙර වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු පවුලක ඉපිද බමුණ ශිල්ප ශාස්ත්‍රයන්හි නිෂ්පත්තියට පැමිණියහ. ඔහු ගිහිගේ හැර සෘෂි පැවිද්දෙන් පැවිදිව සෘෂිවරුන් පිරිවරාගෙන හැසිරෙනුයේ එක් දිනක් වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ දැක ප්‍රීති සොම්නසට පැමිණ, ශාස්තෘන් වහන්සේගේ ඤාණ සම්පත්තිය හේතුවෙන් සිත පහදවා එම උතුම් ඤාණය උදෙසා මලින් පූජාවක් කළේය. ඒ පින්කම හේතුවෙන් දෙවිමිනිසුන් අතර සැරිසරමින් සැප විඳ ඔහු, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සැවැත්නුවර බමුණු පවුලක ඉපිද බේලට්ඨානික නමින් ප්‍රකට ව, වැඩිවියට පත් ව ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි ව, කමටහන් ගෙන කොසොල් රටෙහි අරණ්‍යයක වාසය කළේය. උන්වහන්සේ පසුව අලසව කය වැඩීමෙහි ම නියැලී එරුමවදන් කියන්නෙකු වූහ. මහණදම් වැඩීමෙහි සිතක් නො ඉපදවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, උන්වහන්සේගේ ඤාණයේ මුහුකුරු යෑම බලා මෙම අවවාද ගාථාවෙන් උන්වහන්සේ සංවේගයට පත්කළ සේක.

''හිත්වා ගිහී භවං අනවොසිතත්තෝ
මුඛනංගලී ඔදරිකෝ කුසීතෝ
මහා වරාහොව නිවාප පුට්ඨෝ
පුනප්පුනං ගබ්භමුපේති මන්දෝ''ති.

උන්වහන්සේ තමන් ඉදිරියේ සිටි බුදුරදුන් මෙසේ අවවාද දෙන්නාක් මෙන් වැටහී මෙම ගාථාව අසා දැඩිසේ සංවේගයට පත් වූහ. එම අවස්ථාවෙහි ඤාණය මුහුකුරා ගිය බැවින් විදසුන් වඩා නොබෝ කලකින් ම රහත්බවට පත් වූ බේලට්ඨානික තෙරණුවෝ මෙසේ සිය චරිතාපදනය දක්වූහ.

''සුපිපි කිණිහිරි රුකක් මෙන් බබලන කඳ අතරෙහි හුන්නා වූ ඔසධී තාරකාවක් මෙන් සියලු දිශා අලෝකවත් කරන්නාවූ බුදුරදුන් දුටුවෙමි. තම බමුණු දහමෙහි මැනවින් හික්මුණු මානවකයෝ තිදෙනෙක් පිරිකර බර ගෙන මා පසුපසින් නිතර පැමිණෙති. තවුසකු විසින් ගොටුවක තබා මට පිළිගැන්වූ මල් සතක් ගත් මම ඉන් වෙස්සභූ බුදුරදුන්ගේ සර්වඥ

ඥානයට පිදුවෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් දුගතියක නුපන්නෙමි.

ඤාණ පූජාවේ විපාකය මෙබඳුය. මීට කල්ප විසි නවයකට පෙර සත්වරුවනින් යුතු මහත් බල ඇති විපුලාභාස නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි. -පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ අවවාදයට ප්‍රතිපූජා කරමින්, උන්වහන්සේට ස්තුති කිරීම් වශයෙන් ද තම රහත් බව ප්‍රකට කිරීම් වශයෙන් ද මෙම ගාථාව ම නැවත බේලට්ඨානික තෙරුන් විසින් දේශනා කරන ලදී.

එම ගාථාවෙහි ''**හිත්වා ගිහිත්වං**'' යනු ගිහිබව හැරදමා, පැවිදි වී යන අර්ථයයි. ''**අනවොසිතත්තෝ**'' යනු සුදුසු වූ වාසයෙහි නොයෙදුණු, යම් අර්ථයක් සඳහා සසුනේ පැවිදි වී ද සුදුසු වූ විශේෂ දැනීම් ආදියෙහි නොහැසිරීමෙන්, අවසන් නොකළ පරිපූර්ණ නොවූ අර්ථ ඇති, කළයුතු කටයුතු නොකළා වූ. නැතහොත් ''**අනවොසිතත්තෝ**'' යනු නොකළා වූ අනුව පැවතීම් ස්වභාව ඇති විසුද්ධි මාර්ගයෙහි ද අනු පිළිවෙලින් විසිය යුතු වූ වාසය කිරීම් ඇත, දස වැදෑරුම් ආර්යවාසන් හි ද අනු පිළිවෙලින් විසිය යුතු වූ වාසය කිරීම් ඇති දස වැදෑරුම් ආර්යවාසයන්හි නොයෙදුණු නොවිසූ ''මුව නම් වූ නගුලක් මොහුට ඇත''යන අරුතින් ''**මුඛනංගලී**'' වේ. නඟුලෙන් පොළව කනින්නාක් මෙන් අනුන්ට එරුසෙ වචන කීමෙන් තමා සරසමින් යන අර්ථයයි. ''**ඔදරිකෝ**'' යනු උදර පුරණයෙහි යෙදුණු, බඩ වැඩීමෙහිම නියලුණු, ''කුසීතෝ''යනු අලස වූ සිත වැඩීමෙහි නොයෙදුණු, මෙසේ යෙදුණු, කටයුතු කරන්නාගේ නිෂ්පත්තිය දක්වමින්, ''**මහා වරාහොව නිවාප පුට්ඨෝ පුනප්පුනං ගබ්භ මුපෙති මන්දෝ,**'' යනුවෙන් පැවසූ පාඨයේ අර්ථ ඉහතින් කියූ පරිදිමය. කුඩු ආදියෙන් බඩ වඩාලන්නා මහ ඌරෙකුමෙන් නැවත නැවත ගැබෙහි වාසයට පැමිණේ, මෙහි ද යම්සේ පැවිදිව වැස නිම නොකළ ආයතිවාස ඇති බැවින් අනුවණය, නැවත නැවත මවුකුසට පැමිණේ, මා වැනි පඬිවරු මෙසේ විපරිතභාවයට පත් නොවී, යහපත්ව පිළිපැදීමෙන් අරමුණ මස්තක ප්‍රාප්ත කරගෙන පිරිනිවේ යන්න ප්‍රකාශ කරමින් රහත්බව දක්වන ලදයි දත යුතුයි.

බේලට්ඨානික ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.2

''මානෙන වඤ්චිතාසෙ''යනු ආයුෂ්මත් සේතුච්ඡ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද ? උන්වහන්සේ පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන් හි දී නිවන් පතාගෙන පින් රැස්කරගත්හ. තිස්ස සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද වැඩිවියට පත් වූ හෙතෙම එක් දිනක් එම බුදුරජාණන් වහන්සේ දැක, පැහැදුණු සිතින් ඉතා රසවත් කොස් හා පොල් වලින් සැදු රසකැවිලි පූජාකළේය. ඒ පින්කම හේතුවෙන් දෙව්ලොව ඉපිද දෙව් මිනිසුන් අතර සැරිසරමින් තවත් පින්දහම් කොට, මේ බුද්ධෝත්පාද කාලයේ දී එක්තරා ප්‍රාදේශිය රජකුගේ පුත්‍රයෙක් ව උපන්නේ ය. සේතුච්ඡ කුමරු නාමයෙන් ප්‍රකට වූ ඔහු පියාගේ ඇවෑමෙන් රාජ්‍ය ලැබ, උත්සාහ සම්පත්තිය නොමැති වූ බැවින් රාජ්‍ය කටයුතු පමාකිරීමෙන්, රජකම වෙනත් අයෙකුගේ අතට ගියේය. පසුව දුකට හා සංවේගයට පැමිණි සේතුච්ඡ කුමරු ජනපදචාරිකාවේ යමින් සිටිය දී ශාස්තෘන් වහන්සේ දැක උන්වහන්සේ වෙත පැමිණ ධර්ම අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදිව කෙලෙස් නැසීමට අවශ්‍ය කටයුතු සිදුකර, එදින ම රහත්බවට පත්විය. එනිසා උන්වහන්සේ මෙසේ සිය චරිතාපදනය, අපදනපාළියේ දක්වුහ.

''මම පෙර තිස්ස බුදුරජාණන් වහන්සේට පොල් ද කැමති වූ රසකැවිලි ද පූජාකළෙමි.

''මහර්ෂී වූ තිස්ස බුදුරජාණන් වහන්සේට එය පිදූ මම කැමති සේ භවසම්පත් ලැබුයෙමි. කැමති දෑ කරන්නෙකු වූයෙමි. ප්‍රමුදිතව සතුටුවුයෙමි. මෙයින් කල්ප අනූ දෙකකට පෙර යම් දනයක් දුන්නෙමි ද ඒ හේතුවෙන් දුගතියක නූපන්නෙමි. මේ නාළිකේර ඵල දනයේ විපාකයයි. මෙයින් කල්ප දහතුනකට පෙර, සත් රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති ඉන්දසම නම් සක්විති රජව උපන්නෙමි, දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි, - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත්ව කෙලෙස්වලට ගරහමින් උන්වහන්සේ මෙම ගාථාව වදළහ.

''මානෙන වඤ්චිතා සෙ සඞ්ඝාරෙසු සඞ්කිලිස්සමානා සෙ
ලාභාලාභෙන මථිතා සමාධිං නාධිගච්ඡන්ති.''

මෙම ගාථාවේ ''**මානෙන වඤ්චිතා සෙ**'' මම අනෙක් අයට වඩා ශ්‍රේෂ්ඨ වෙමි'' යි ආදී වශයෙන් පවතින මානයෙන්, අනුන් පහත්කර හා තමන් උසස් කර දැකීම් වශයෙන් කුසල දහම් වැනසීම් වශයෙන් විප්‍රකාර වූයෙමි. ''**සඞ්ඛාරෙසු සඞ්කිලිස්සමානාසෙ**'' යනු ආධ්‍යාත්මික හා බාහිර චක්ෂුරාදි ඉන්ද්‍රියන්ගේ ද රූපාදී අරමුණුවල ද සංඛත ධර්මයන්හි ද කිලිටි වූ සිත් ඇති වූයෙමි.

''මේ මම ය මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි.'' යනුවෙන් ආත්ම වශයෙන් ගෙන තණ්හාවෙන් කිලිටිභාවයට පත්වන්නා වූ, ''**ලාභාලාභෙන මථිතා**'' යනු පාසිවුරු ආදිය ද වස්ත්‍රාදිය ද ලැබීමෙන් හා ඒවා නොලැබීමෙන් ඒ නිමිති කර ගෙන උපදින ඇලීම් - ගැටීම් ආදියෙන් මැඩුනෙමි, කිලිටිවුයෙමි, මැඩලූයෙමි, මෙහි මානය හා ලාභාලාභාදියෙන් මතුවීම නිදසුන් වශයෙන් පමණක් දැක්විණි, ඉතිරි සියලුම ලෞකික කෙලෙස් ධර්ම මෙහි දී අදහස් වන බව දතයුතුයි. ''**සමාධිං නාධිගච්ඡන්ති**'' යනු මෙබඳු වූ පුද්ගලයෝ සමාධියට, සමථ විපස්සනා දී සිත එකඟ කරගැනීමට කිසිද, නොපැමිණෙති, එම සැප කිසිද, නො ලබති, නො විඳිති, චිත්ත සමාධියට ඇවැසි දහම් නොමැති නිසා ඉන් ඉහළ සැප ද නො ලබති, ''මෙම සසුනෙහි ද මානාදියෙන් වැඩුණු භික්ෂුහු අඥාන බැවින් චිත්ත සමාධියට නොපැමිණෙති. නුවණැති භික්ෂුහු එසේ නොවෙති, ඔවුහු මා මෙන් ම මානාදියෙන් යටපත්නොවී චිත්ත සමාධියට පැමිණෙත්මය'' යන්න ප්‍රකාශ කිරීම් වශයෙන් සිය රහත් භාවය පවසන ලදුය දතයුතුයි.

සේතුච්ඡ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.3

''නාහං එතෙන අත්ථිකෝ'' යනු ආයුෂ්මත් බන්ධුර තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී එක්තරා රජකුගේ අන්තඃපුරයෙහි ආරක්ෂක සේවයේ නියැලියෙක් වූහ. එක් දිනක් එම භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා ගෙන රාජංගනයෙහි වඩිනු දුටු ඔහු පැහැදුණු සිතින් කණවේර මලින් භික්ෂු සංඝයා සහිත බුදුරදුන් පිදුවේය, ඒ පින්කමේ බලයෙන් දෙව්ලොව උපන් ඔහු,

කාමසුගතීන්හිම සැරිසරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ සීලවති නම් නුවර සිටු පුතෙක් ව ඉපිද බන්ධුර නාමයෙන් ප්‍රකට විය. වැඩිවියට පත් බන්ධුර සිටුපුතු කිසියම් කටයුත්තක් සඳහා සැවැත්නුවර ගියේය. එහිදී විහාරයට යන උපාසකවරු සමග ගොස් ශාස්තෘන් වහන්සේගේ දම්දෙසුම ඇසූ ඔහු ලබන ලද ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි විය. උන්වහන්සේ ඤාණය මුහුකුරා ගිය බැවින් විදසුනෙහි සිත පිහිටුවා නොබෝ දිනකින් ම රහත් ඵලයෙහි පිහිටියහ.

බන්ධුර තෙරණුවෝ අපදන පාළියේ මෙසේ සිය චරිතාපදනය දක්වූහ. ''ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ සිද්ධත්‍ථ නම් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් පිරිවරා නගරයට පිවිසි සේක. එකල්හි මම රජුගේ මැනවැයි සම්මත වූ අන්තඃපුර පාලකයා වූයෙමි. පහයෙහි සිටි මම ඒ ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි, කණවේරමල් රැගත් මම ඒ මල් හික්ෂු සංඝයා වෙත ඉස්සෙමි, ඉන් වැඩි කොටස බුදුරදුන් උදෙසා පිදුවෙමි, මෙයින් කල්ප අනූනහතරකට පෙර කළ පුෂ්ප පූජාවේ විපාක වශයෙන් මම මේ දක්වා ම දුගතියක නුපන්නෙමි. මල් පූජාවේ විපාක එබඳුය, මෙයින් කල්ප අසූ සතකට පෙර සත්රුවනින් හෙබි මහ බලැති මහිද්ධික නම් වූ සක්විති රජවරු සිවුදෙනෙක්ව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් ව, කළගුණ සැලකීමෙහි සිත පිහිටුවා, තමාට පෙර උපකාර කළ රජුට ප්‍රත්‍යුපකාර කිරීම සඳහා සීලවති නුවරට ගොස් රජුට ධම්දේශනා කරමින් චතුරාර්ය සත්‍ය ධම්ය ප්‍රකාශ කළ උන්වහන්සේගේ දේශනාව අසා රජු සෝවාන් විය, තම නුවර සුදස්සන නම් මහා විහාරයක් කරවූ රජතුමා එය තෙරුන් වහන්සේට පූජා කළේය. බන්ධුර තෙරුන්ට එතැන් පටන් මහත් ලාභ සත්කාර ඉපදුණි. උන්වහන්සේ එම සියලු ලාභ සත්කාර ද විහාරයද සංඝයාට පවරා දී තමන්වහන්සේ පෙර මෙන් ම පිඬුපිණිස හැසිරෙමින් යැපුණුසේක. මෙසේ දින කිහිපයක් එහි විසූ උන්වහන්සේ සැවැත් නුවරට යනු කැමති වූහ. එවිට හික්ෂූහු ''ස්වාමීනි! නුඹ වහන්සේ මෙහිම වාසය කරනු මැනවි. ඉදින් සිවු පසයෙන් අඩුවක් වේ නම් අපි එය සම්පූර්ණ කරන්නෙමු,'' යි පැවසූහ. එවිට බන්ධුර තෙරණුවෝ, ''ඇවැත්නි! මට මහත් වූ සිවුපසයෙන් ප්‍රයෝජනයක් නැත, ලැබෙන ප්‍රත්‍යයකින් යැපෙමි, මා ධම්රසයට ම කැමැත්තෙමි, එය පමණක් ම මට අවශ්‍යය'' යි පවසමින් මෙම ගාථාව වදළහ.

''නාහං එතෙන අත්ථිකෝ
සුඛිනෝ ධම්මරසෙන තප්පිතෝ
පිත්වාන රසගඟුත්තමං
නව කාහාමි විසෙන සන්ථවං''

එහි ගාථාවෙහි ''නාහං එතෙන අත්ථිකෝ'' යම් හෙයකින් නුඹලා මා සතුටු කරනු කැමතිව සිවුපසයෙන් සම්පූර්ණව උපස්ථාන කරන්නෙමු යි පවසන් ද එබඳු ආමිෂ ලාභයක්, ආමිෂ ප්‍රත්‍ය රසයක් මා හට අවශ්‍ය නැත, මට ඉන් ප්‍රයෝජනයක් නැත, ''ලද දෙයින් සතුටු වීම උතුම් සැපය වේ.'' එ නිසා මම ලද දෙයින් තුටුව ඉන් යැපෙමි, දැන් එසේ ආමිෂ ප්‍රත්‍ය අනවශ්‍ය බවට හේතු දක්වමින් මෙසේ පවසයි, ''**සුඛිනෝ ධම්මරසෙන තප්පිතෝ**'' සත්තිස් බෝධිපාක්ෂික ධර්ම රසයෙන් මෙන් ම නවවිධ ලෝකෝත්තර ධර්ම රසයෙන් ද සන්තර්පිතව ප්‍රීතිවෙමි, සුවපත්වෙමි, උතුම් වූ සුවයෙන් යුක්ත වෙමි යන අර්ථයයි, ''**පිත්වාන රසගඟුත්තමං**'' සියලු රස අතුරින් අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ ඒ උතුම් දහම් රසයම පානය කර සිටියෙමි, ''සියලු රස අතුරින් දහම් රසයම පානයකර සිටියෙමි, එනිසා ''සියලු රස අතුරින් දහම් රසය ම ජයගනී'' යැයි කියන ලදී.

''නව කාහාමි විසෙන සන්ථවං'' මෙබඳු වූ රසයෙන් උතුම් වූ දහම් රසය පානය කර සිටියෙමි. පස්කම් සුවය නම් විෂ රසයෙන් ප්‍රීතිවීම, එම විෂ රසය හා එක්වීම නොකරන්නෙමි. එසේ පස්කම් සුව ප්‍රියකිරීමට කරුණක්, හේතුවක් නොමැත.

බන්ධුර ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.4

''ලහුකෝ වත මෙ කායෝ'' යනු ආයුෂ්මත් බිතක තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? මේ තෙරුන් ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි පින් රැස්කරමින් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි දී යක්ෂ සෙන්පතියෙක් ව උපන්නේ ය. එක් දිනක් යක්ෂ සමාගමෙහි හුන් හෙතෙම ශාස්තෘන් වහන්සේ එක්තරා

රුකක් මුල සිටිනු දක, උන්වහන්සේට වැඳ එකත් පසෙක සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසීය. දහම් ඇසූ යක් සෙනෙවි මහත් වූ ප්‍රීති සොම්නසක් විඳිමින් අත්පොලසන් දෙමින් නැගී සිට ශාස්තෘන් වහන්සේට වැඳ පැදකුණු කොට ගියේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරිසැරූ ඔහු, අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත්නුවර බමුණු පවුලක උපන්නේ ය. බිතක බමුණු නාමයෙන් ප්‍රකට වූ හෙතෙම වැඩි වියට පත්ව මහමුගලන් තෙරුන් වහන්සේගේ මහත් ඍද්ධිමය බව අසා, ''මමත් ඍද්ධිමත් අයෙකු වන්නෙමි'' යි පූර්ව හේතු බලයෙන් මෙහෙයවනු ලබන්නේ පැවිදිවිය. භාග්‍යවතුන් වහන්සේ හමුවේදී කමටහන් ගත් බිතක තෙරුන් වහන්සේ සමථ විදර්ශනාදියෙහි ම සිත පිහිටුවා කමටහන් වඩා නොබෝ දිනකින්ම ෂඩ් අභිඥා ලාභී මහතෙර නමක් බවට පත්වූහ. උන්වහන්සේ මෙසේ සිය චරිතාපදනය දක්වූහ.

''ද්විපදෝත්තම වූ නරශ්‍රේෂ්ඨ වූ පසැස් ඇති පදුමුත්තර නම් වූ බුදුරජාණන් වහන්සේ තමන් විසූ වනයෙන් නික්ම අවුත් දහම් දෙසූහ. ඒ මහර්ෂීන් වහන්සේ සම්පයෙහි යක්ෂ සමාගමක් විය. එකල යම් කරුණකින් ඔවුහු එහි පැමිණියාහු ද එය සපුරමින් බුදුරදුන් දෙස සාවධානව බලා සිටියහ. මම බුදුරජාණන් වහන්සේගේ දහම් දෙසුම අසා, ප්‍රසන්න වූ සිත් ඇතිව අත්පොළසන් දී උන්වහන්සේට උපස්ථාන කළෙමි. ශාස්තෘන් වහන්සේට මැනවින් කළ උවටැනෙහි විපාකය බලනු මැනවි. ඒ පිනෙන් මම තිස්දහසක් කල්ප මුලුල්ලෙහි දුගතියක නූපන්නෙමි. මෙයින් එක්දහස් නවසිය වන කල්පයේ දී සත් රුවනින් ආඪ්‍ය වූ මහත් බල ඇති සුමංගල නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. ''

රහත් බවට පත්වූ බිතක තෙරණුවෝ වෙසෙසින් ඍද්ධිමය හැකියාවන්හි වශීභාවයෙන් නානා ප්‍රකාර වූ ඍද්ධිවිධයන්හි නියැලෙමින් ඍද්ධිමය ප්‍රාතිහාර්යයන් ගෙන් ද අනුශාසනා ප්‍රාතිහාර්යයෙන් ද සත්ත්වයන්ට අනුග්‍රහ කරමින් විසූහ. භික්ෂූන් වහන්සේලා උන්වහන්සේගෙන් ''ඇවැත්නි ! කෙසේ නම් නුඹ වහන්සේ ඍද්ධිමය ශක්‍යතා පරිහරණය කරන්නෙහි ද?'' යි ඇසූහ. එයට පිළිතුරුදීම් වශයෙන් බිතක තෙරණුවෝ මේ ගාථාව වදළහ.

''ලහුකො වත මෙ කායො ඵුට්ඨො ච පීතිසුඛෙන විපුලෙන
තූලම්ව එරිතං මාළුතෙන පිලවතීව මෙ කායෝ'' ති.

උදන් ඇණීම් වශයෙන් මේ ගාථාව වදළ බව ඇතැම්හු පවසති. එම ගාථාවේ "**ලහුකෝ චන මෙ කායෝ**" යනු පංචනීවරණාදිය විෂ්කම්භනය කිරීමෙන් ද දැ හතර වැදැරුම් චිත්ත දමනයන්ගෙන් ද සතර සෘද්ධිපාද වැඩීමෙන් ද මනාව පුහුණු කළ වයි භාවයෙන් ද මගේ රූපී කය සැහැල්ලුය. ඒකාන්තයෙන්ම මම මහා භූතයන්ගෙන් නිර්මිත මේ ශරීරය (කරජ කාය) සිතට අනුව පරිහරණය කරමි" යන අදහසයි. "**පුථ්‍යො ච පීති සුඛෙන විපුලෙන**" සැමතැන්හිම පැතිර ගිය මහත් උදර වූ ප්‍රීතිමත් සුවයෙන් මගේ කය ස්පර්ශ කරන ලදී. මේ කය එලෙසින්ම සැහැල්ලු වූවකි. ඒ බව දැක්වීමට මෙසේ පවසන ලදී. සුබ සංඥාවට බැස ගැනීමත් සමග ම ලුහු (සැහැල්ලු) සඤ්ඤාවට පැමිණීම (බැස ගැනීම) වේ. සුවයේ පැතිරීම මෙහිදී ඒ සමුට්ඨාන රූප වශයෙන් දත යුතුයි. කෙසේ නම් චතුර්ත්‍රධ්‍යානයෙන් යුක්ත වූ ප්‍රීති සුව පැතිරවීම ඉක්ම වූ ප්‍රීති සුවය යැයි සම්මතවී ද? මෙහිදී චතුර්ත්‍රධ්‍යාන වශයෙන් නො පවසන ලදී. ඉක්බිති පූර්ව භාග වශයෙන් ප්‍රීති සුවයෙන් යැයි ප්‍රීතිය හා සමාන වූ සුවයෙන්, උපේක්ෂාව ද මෙහිදී ශ්‍රමණ ස්වභාවයක් බැවින් ඤාන විශේෂ යෝගයක් වශයෙන් සැපය කැයි අදහස් කරන ලදී. එසේම කියන ලදී. "සුව සඤ්ඤාවට බැසගනී" යනුවෙන්, පාදක වූ ධ්‍යානාරම්මණයෙන් හෝ රූපකාය ආරම්මණයෙන් හෝ සෘද්ධිමය සිත සමග එකට උපන් (සහජාත) සුව සඤ්ඤාවට බැසගනියි. පිවිසෙයි. එය දකියි, ඊට සපැමිණෙයි. මෙම ගාථාවේද මෙම අර්ථය දත යුතුයි. අට්ඨකථාවෙහි එය එසේ ම කියන ලදී. "සුව (සුඛ) සඤ්ඤාව යනු උපේක්ෂාව සමග යෙදුණු සඤ්ඤාවයි. උපේක්ෂාව ශාන්ත වූ සුව එළවන්නකැයි කියන ලදී. එයම සඤ්ඤා නීවරණයන්ගෙන් ද විතර්කා දී විරුද්ධ ධර්මයන්ගෙන් ද මිදුණු බැවින් ලඝු (සැහැල්ලු) සඤ්ඤාවක් මෙන් දත යුතුයි. එම සඤ්ඤාවට සිත යොමුකළ තැනැත්තාට තම ශරීරය ද පුළුන් පොදක් මෙන් සැහැල්ලු භාවයෙන් වැටහේ. මේ ආකාරයෙන් එබඳු භික්ෂුව සුලඟින් ගසාගෙන යන පුළුන් රොදක් මෙන සැහැල්ලු වූ නොපෙනෙන්නා වූ කයින් (ශරීරයෙන්) බඹලොවට ද යයි." ඒ නිසා මේ ගාථාවෙහි "**තූලම්ව එරිතං මාළුතෙන පිලවතීව මෙ කායෝ**" යනුවෙන් කියන ලදී. එහි අර්ථය - යම් කලෙක මම බඹලොවට රහත්බවින් හෝ සෘද්ධියෙන් යනු කැමැති වූයෙම් ද එකල් හි සැඩ සුලඟින් ඔසවාගෙන යනු ලබන පුළුන් පොදක් මෙන් අහසෙහි පාවී මගේ කය යයි.

බිතක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.5

''**උකකණ්ඨිතෝ**'' යන ගාථාව ආයුෂ්මත් මලිතවම්භ තෙරුන් වහන්සේ විසින් පැවසූවකි. එහි උපත කෙසේ ද ? මෙතෙමේ ද පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හිමවටතට නුදුරෙහි එක්තරා විලක හැසිරෙන කුරුල්ලෙක්ව උපන්නේය. පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ එම පක්ෂියාට අනුග්‍රහ පිණිස එහි ගොස් විල් තෙර සක්මන් කළසේක. කුරුල්ලා භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතින් විලෙහි පිපුණු කුමුදු මල් ගෙන, ඉන් බුදුරදුන්ට පූජා කළේය. එම පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි උපන් හෙතෙම සසර සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී හාරුකච්ඡ නුවර එක්තරා බමුණකුට දව පුතෙක් ව ඉපිද මලිතවම්භ නාමයෙන් ප්‍රකට විය. වියට පත් ඒ බමුණා පච්ඡාභූම මහා තෙරුන් වෙත පැමිණ උන්වහන්සේගෙන් ධර්මය අසා, ලද ශ්‍රද්ධාව ඇතිව සසුනේ පැවිදිව විදසුන් කමටහන වඩමින් වාසය කළේය. උන්වහන්සේගේ ස්වභාවය වෙනස් විය. යම් තැනක ආහාරපාන සුලභව නො ලැබේ ද සෙසු ප්‍රදේශවල ආහාරපාන සුලභ ද ඒ ආහාරපාන සුලභව ලැබෙන සෙනසුන එය හැර දමා ආහාරපාන දුලභ සෙනසුනක් වෙත උන්වහන්සේ පැමිණෙති. මෙසේ වාසය කළ මලිතවම්භ තෙරණුවෝ පුථිග්ගතු සම්පත් ඇති බැවින් ද මහාපුරුෂයකු වන බැවින් ද නොබෝ දිනකින්ම විදසුන් වඩා රහත්බවට පත්වූහ.

අපදාන පාළියේ උන්වහන්සේ මෙසේ පැවසුහ.

''හිමවතට නුදුරෙහි රත්පියුම්, උපුල්, හෙළ පියුම් ආදියෙන් ගැවසීගත් මහත් වූ ස්වාභාවික විලක් විය. එවිට සිල්වත්, බුද්ධිමත් වූ කුසල් අකුසල් මේ මේ යැයි දැනගැනීමෙහි දක්ෂ වූ කකුධ නම් පක්ෂියෙක්ව මම උපන්නෙමි. ලෝකයාගේ පූජාවන් පිළිගැනීමට සුදුසු වූ මහා මුනි වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඒ ස්වයංජාත විලට නුදුරෙහි සක්මන් කළ සේක. ජලයෙහි හටගත් කුමුදු මලක් කඩාගත් මම ඒ මල බුදුරජාණන් වහන්සේ වෙත පිළිගැන්වූයෙමි. මගේ අදහස දත් උන්වහන්සේ එය පිළිගත්හ. එම කුශලයෙන් මෙහෙය වූ මම මේ කල්ප ලක්ෂය මුලුල්ලෙහි ම දුගතියක නූපන්නෙමි. මෙයින් කල්ප එක්දහස් හයසීයකට පෙර දී මහත් බල ඇති වරුණ නම් සක්විති රජවරු අටදෙනෙක් ව උපන්නෙමි, දැන් මම සියලු කෙලෙස් දවුයෙමි, - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව නැවත සිහිපත් කරමින් උදන් අණන සේක් මේ ගාථාව වදළහ.

''උකකණ්ඨිතොපි න වසෙ රමමානොපි පක්කමෙ
තත්‍රෙවානත්‍රසංහිතං වසෙ වාසං විචක්ඛණො''ති.

මේ ගාථාවෙහි ''**උක්කණ්ඨි තොපි න වසෙ**'' යම් ආවාසයක වසන මාහට සුදුසුවූ ආහාර පාන දුලභවීමෙන් අධිකුශල දහම්හි කළ කිරුවන, එහි නොඇලෙන සිත් උපදීද, එබදු තැන කළකිරීම ඇතිවූවත් මම වාසය කරමි. වෙනත් ආහාර පාන සුලභ තැන් සොයා නො යමි. ''**නවසෙ**'' මෙහි ''න'' කාරයෙන් ''**පක්කමෙ**'' යන පදය සම්බන්ධ කර අර්ථ ගතයුතුයි. ''රමමානොපි පක්කමෙ'' යම් ප්‍රත්‍ය අඩුවීමක් නැති ආවාසයක වෙසෙන මා හට කළකිරීම් ආදියක් ඇතිනොවී ඒකාන්තයෙන් එහි ඇලීම් ඇතිවේ ද, එසේ ඇලීම ඇතිවන ආවාසය හැර ප්‍රත්‍ය පහසුකම් අඩු වූ සෙනසුනක් වෙත යන්නෙමි. මෙසේ පිළිපැද්දවූ මම නොබෝ දිනකින් ම ස්වාර්ථ සාධනය කරගත්තෙමි. මෙය උන්වහන්සේ සිය පිළිවෙත සිහිපත් කර බැලීම් වශයෙන් වදළ ගාථාවකි, අනුන්ට අවවාද දීමෙහි ද නොවැසියුතු, හැරදැමියයුතු සෙනසුන් පිළිබද විධාන දී මෙහි ද මෙය යෙදිය හැකිවේ. ''**තත්‍රෙවානත්‍රෙ සංහිතං වසෙ වාසං විචක්ඛණො**'' යම් ආවාසයක ප්‍රත්‍ය පහසුකම් දුලබ ද එහි මහණකම සම්පූර්ණ කරගත නොහැකි ද එය අනර්ථදායක ආවාසයකි. යම් ආවාසය ආහාරපාන සුලබ ද ශ්‍රමණධර්ම සම්පුර්ණවේ ද එබදු සෙනසුන අර්ථ දායක වුවකි. අභිවෘද්ධිය අපේක්ෂා කරන විචක්ෂණ නුවණැත්තා අනර්ථදායක සෙනසුන හැරදමා ස්වාර්ථ සාධනය කරගනු කැමතිව එහි නොවසන්නේය. යම් තැනක අංග පසකින් සමන්විත වූ ආවාසයක් ලැබේ ද සත්විධ සප්පායයන් ලැබේ ද එහිම වාසය කළ යුතුයි.

මලිතවම්භ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.6

''**සතලිඛඝස්ස අත්‍රස්ස**'' යන ගාථාව ආයුෂ්මත් සුභේමන්ත තෙරුන් වහන්සේ විසින් පැවසුවකි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති ව ඒ ඒ භවයන් හි දී නිවන් පතාගෙන පින් රැස්කරමින් පැමිණියහ. මෙයින් කල්ප අනූ දෙකකට පෙර **තිස්ස** නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී වැද්දෙක් ව ඉපිද වනයේ වාසය

කළේය. ඔහුට අනුග්‍රහ පිණිස වනයට වැඩම වූ බුදුරජාණන් වහන්සේ එම වනය සමීපයේ රුකක් මුල හුන්සේක. භාග්‍යවතුන් වහන්සේ දුටු වැද්දා, පැහැදුණු සිතින් ඉතා සුවඳවත් දොඹ මල් කඩා උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කම නිසා දෙව්ලොව උපන් ඔහු තව තවත් පින්දහම් කොට දෙව් - මිනිසුන් අතර සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී පර්යන්ත ප්‍රදේශයක සම්පත් ඇති බමුණකුගේ පුතෙකු වී උපන්නේය. සුහේමන්ත නම් වූ ඔහු වැඩි වියට පත්ව සඞ්කස්ස නුවර මිගදයෙහි වසන අප භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දහම් අසා, ශ්‍රද්ධා ඇතිව පැවිදිවිය. උන්වහන්සේ ත්‍රිපිටකධාරීව විදසුන් භාවනාවෙහි සිත පිහිටුවා නොබෝ කලකින්ම ෂඩ් අභිඥාන උපදවා ගත්හ.

උන්වහන්සේ සිය චරිතාපදනය අපදන පාළියේ මෙසේ දක්වූහ.

''වැද්දෙක් වූ මම මහවනයේ වාසය කළෙමි. පිපුණු දොඹගසක් දුටු මම බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ සිහි කළෙමි. වැල්ලෙහි සෑයක් සෑදූ මම, ඒ මල් නෙලා යහපත් වූ, සුවඳවත් වූ ඒ මල් බුදුරදුන්ට පිදුවෙමි. මෙයින් කල්ප අනූ දෙකකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙමි ද එම බුදු පුදෙහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නුපන්නෙමි. මෙයින් කල්ඒ අනූ එකකට පෙර සත් රුවනින් ආඪ්‍යවූ මහත් බල ඇති තමොනුද නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

රහත්බවට පත්ව ''මවිසින් බුද්ධ ශ්‍රාවකයන් පතන යම් මාර්ගඵලාදියක් වේ නම් එම මග ඵල ලැබුයෙමි, දැන් මම භික්ෂූන් වහන්සේලාට අනුග්‍රහ කරමින් විසීම මැනවි.'' යනුවෙන් සිතූ සුහේමන්ත තෙරණුවෝ, සිවුපිළිසිඹියාපත් බැවින් ද නොපසුබස්නා වීර්ය ඇති බැවින් ද තම සමීපයට පැමිණි භික්ෂූන්ට ධර්මකථා දක්වමින් සුදුසු පරිදි අවවාද කළහ. අනුශාසනා කළහ. ඔවුන්ගේ සැක සංකා සිඳලූහ. නිරවුල්, ගැටළු රහිතවූ කමටහන් දෙමින් වාසය කළහ. එක් දිනක් තමා සමීපයට සපැමිණි භික්ෂූන්ට නුවණැති පුද්ගලයන්ගේ ගුණ විශේෂ දක්වමින් මෙම ගාථාව වදළහ.

''සතලිඛඝස්ස අසථස්ස සතලකඛණධාරිනො
එකඛඝදසී දුමෙමධො සතදසසී ච පණඩිතො''

එහි ''**සතලිඛසස**'' සැඟවුණු, අප්‍රකට අර්ථ ප්‍රකට කරයි, අවබෝධ කරයි යන අර්ථයෙන් ''ලිඛඝ''නම් වේ. අර්ථවත් ශබ්දයන් හි පවතින නිමිත්තයි. නොයෙක් සිය ගණන් ලිඛගයෝ මොවුන්ට ඇත යන අරුතින් ''සතලිඛග'' නම් වේ. ''සත'' ශබ්ද අනේකාර්ථයෙහි යෙදේ.''න තථා සතං සහස්සං'' ආදී තැන් හි මෙන් මෙහි ද ශබ්දය සංඛ්‍යාර්ථයේ යෙදී ඇත. ඒ සියක්, නොයෙක් ආකාර ලිංග ඇති තැනැත්තාට, ''**අසස්ස**'' දතයුතු දේ දත්, ''ඤාණයෙන් කෙලෙස් නැති කිරීමෙන් ලබන අර්ථය'' යන තේරුමයි. එහි ද එක් අයෙකුට වුවත් නොයෙක් අර්ථ ඇති සංඥානාම යෙදේ. යම්සේ ශක්‍රයා, පුරින්දද, මඝ යන නම් මෙන් ප්‍රඥාව, විද්‍යාව, නුවණ ඤාණය යන නම් ද එකම දෙයක් හැඳින් වුවත් නානාර්ථ ජනනය කරයි. නිදසුනක් ලෙස තාවතිංසයේ අධිපතියා යන අරුතින් ''ඉන්ද්‍ර'' ශබ්දය යෙදුනත්, ඔහුට ''ශක්‍රයා'' යන නම එම අර්ථයෙන් නොයෙදේ. එසේම සම්‍යක් දෘෂ්ටියෙහි අවබෝධයෙන් ''ප්‍රඥාව'' යන ශබ්දය පවතී ද එම අර්ථය ''විද්‍යා'' ආදී ශබ්දයන් හි නොමැත. ඒ නිසා ''**සතලිඛසස අසස්ස**'' නොයෙක් ලිංග ඇති අර්ථයාගේ යනුවෙන් කියන ලදී. නොයෙක් ලක්‍ෂණ දරණ බව ''**සතලක්‍ඛණධාරිනො**'' යන්නෙන් පැහැදිළි කරයි. මෙයින් ලකුණු කරයි යන අරුතින් ''ලක්‍ෂණ'' යන්න යෙදේ. අර්ථයට ප්‍රත්‍යවන බැවින්, තමාගේ ඵලයට ප්‍රත්‍යවන බැවින් ලක්‍ෂණ වේ. ඒ නිසා ''ඒ මේ මෙහි හේතුවයි. කාරණයයි.'' යනුවෙන් ලක්‍ෂ්‍ය කර, ඉලක්ක කර දක්වයිද එම එකම අර්ථයම අනේක ප්‍රභේදව වැටහේ. එනිසා ''සතලක්‍ඛණධාරිනො'' නොයෙක් ලක්‍ෂණ දරන්නාවූ යනුවෙන් කියන ලදී. නැතහොත් ''ලකුණු කරයි '' යන අරුතින් ''ලක්‍ෂණ'' නම් වේ. ඒ ඒ අර්ථයාගේ ලක්‍ෂණ ආදියේ ආකාර විශේෂයයි. එම ලක්‍ෂණ අර්ථ වශයෙන් ද අර්ථ විශේෂ වශයෙන් ද දත යුතුයි. එහිදී ''ඒ අනිත්‍යාදී සාමාන්‍ය ලක්‍ෂණ දක්වයි. හඟවයි.'' යන අරුතින් ලිංගයෝ යැයි කියන ලදී. එහිදී එකම වූ අර්ථයක ආකාර, ලක්‍ෂණ නානාවිධවූ දක්නට ලැබේ. ඒ නිසා ''නොයෙක් ලිංග ඇති නොයෙක් ලක්‍ෂණ ඇති අර්ථයාගේ'' යනුවෙන් කියන ලදී.

ඒ නිසා ආයුෂ්මත් දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ ''සියලු දහම් සියලුම ආකාරයෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඤාණයට ගොදුරුවන්නේ ය'' යැයි වදළහ. ''**එකඛදසසී දුමෙමධො**'' යනු මෙසේ නොයෙක් ලිංගයන් හි, නොයෙක් ලක්‍ෂණයන්හි, නොයෙක් අර්ථයන්හි ඇති පදයන්ගේ යමෙක් එකම ලිංගයක්, එකම ලක්‍ෂණයක් එකම අයුරකින් දකීනම්, මද නුවණැති බැවින් මෙසේ දැක, ''තමා දුටු දෙයම සත්‍යය වේ. සෙසු සියලු ඉගැන්වීම් බොරුය, හිස්ය.'' යනුවෙන් සෙසු යහපත් දේ ඉවත

දමත් ද ඔහු අඥාණයෙකි. ඇතා දුටු අන්ධයෝ මෙන් එකම දෙයක් ගෙන අනුවණව, මෝඩකමින් එහිම ඇලී, ධර්මතාවල පවතින්නාවූ විවිධාකාර බව නොදැන වැරදි පිළිගැනීම් හි, දෘෂ්ඨීන්හි එල්බෙති. එම දෘෂ්ඨීන්ට සහාය දක්වති. ''**පණ්ඩිතො**'' යනුවෙන් ප්‍රඥාවන්තයා වනාහි තම නුවණින් ධර්මතාවන්හි නානාවිධ බව තම ප්‍රඥා ඇසින් (පණෑසින්) සර්වප්‍රකාරයෙන් ම අවබෝධ කරගනියි. එහි ලැබෙන සියලුම කරුණු තම ප්‍රඥාවෙන් නිවැරදිව මැනවින් දකියි. අන්‍යයන්ට ද එම කරුණු පෙන්වා දෙයි. දේශනා කරයි. එවැනි පුද්ගලයා පණ්ඩිතයෙකි. විචක්ෂණයෙකි. අර්ථ දක්වීමෙහි දක්ෂයෙකි. මෙලෙස සුභේමන්ත තෙරණුවෝ උසස් බවට පත් වූ තම සිවුපිළිසිඹියාපත් භාවය භික්ෂූන් වහන්සේලාට ප්‍රකට කළහ.

සුභේමන්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.7

''**පබ්බජිං තුලයිත්වාන**'' යනු ආයුෂ්මත් ධම්මසව තෙරුන් වහන්සේ ගේ ගාථාවකි. එහි උපත කෙසේද? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සුවච්ඡ නම් බමුණෙක් ව ත්‍රිවිද වේදයන්හි පරතෙරට ගොස් ගිහි වාසයේ දොස් දැක තවුස් පැවිද්දෙන් පැවිදිව, පර්වතයක් අතර වූ අරණ්‍යයක අසපුවක් කරවාගෙන, බොහෝ තාපස පිරිස් සමඟ වසූහ. ඉක්බිති ඔහු තුල කුසල බීජයක් රෝපණය කරනු කැමති පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ අසපුව සමීපයෙහි අහසෙහි සිට සෘද්ධිමය ප්‍රාතිහාර්යක් දක්වූ සේක. එය දුටු තවුසා සතුටට පත්ව පැහැදුණු සිතින් පූජා කිරීමට නාමල් ගෙන්වා ගත්තේය. ශාස්තෘන් වහන්සේ ''මොහුට කුසල් බීජය සඳහා මෙපමණක්ම සෑහේ'' යනුවෙන් සිතා නැවත වැඩම කළ සේක. තවුසා නාමල් ගෙන උන්වහන්සේ වැඩමවන මාර්ගයේ විසුරුවා සිත පහදවාගෙන ඇඳිලි බැඳගෙන සිටියේය. ඒ පිංකමේ විපාක වශයෙන් දෙව්ලොව උපන් ඔහු ඒ ඒ භවයන්හි දී කාම සුගති ආත්මභාව ලබමින් සසර සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි මගධ රට බමුණු පවුලක ඉපිද ''ධම්මසව''නමින් ප්‍රකට විය. වියට පත් ඔහු පූර්ව හේතු බලයෙන් මෙහෙයවනුයේ ගිහිගේ ආදීනව දැක පැවිද්දෙහි ආනිසංස ද දැක, දක්ෂිණාගිරියෙහි වාසය කරන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ

දහම් අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වී විදසුන් කමටහන් ගෙන, එය වඩා නොබෝ දිනකින්ම රහත්ඵලයට පත්වූවේය.

ධම්මසව තෙරණුවෝ සිය චරිතාපදනය අපදන පාළියේ මෙසේ දක්වූහ.

''මන්ත්‍ර පාරගත වූ සුවච්ඡ නම් බමුණෙක්ව සිය ශිෂ්‍ය සමූහයා සමග පච්චන්තාන්තරයෙහි මම වාසය කළෙමි. ලෝකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර නම් ඒ බුදුරජාණන් වහන්සේ මා සසරින් ගොඩගනු කැමතිව එතැනට වැඩම කළහ. උන්වහන්සේ අහසෙහි සක්මන් කළහ. දුම් දමූහ. එසේම ඇවිලගත්හ. එසේ පෙළහර දක්වා මා සතුටු වූ බව දැන ප්‍රාචීන දිශාභාමුඛව වැඩම කළහ. විශ්මය ජනක වූ ලොමු ඩැහැගැන්නා වූ ඒ අසිරිමත් සිදුවීම් දුටු මම නාමල් ගෙන උන්වහන්සේ වැඩම කළ මඟෙහි ඇතිරුවෙමි. මෙයින් කල්ප ලක්ෂයකට පෙර මල් විසිරවීමේ යම් බුද්ධ පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියකට නොගියෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර මහබල ඇති මහාරථ නම් සත්රුවනින් හෙබි සක්විති රජව සැප වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් ඵලයට පත් වූ උන්වහන්සේ, තමන් වහන්සේගේ ප්‍රතිපත්තිය ප්‍රත්‍යවේක්ෂාකර, සතුටට පත්ව උදම් ඇණීම් වශයෙන් මෙම ගාථාව වදළහ.

''පබ්බජිං තුලයිත්වාන අගාරස්මා අනගාරියං
තිසෙසා විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං''

එම ගාථාවෙහි ''පබ්බජිං තුලයිත්වාන'', ''ගිහි වාසය සම්බාධ - කරදර සහිතය. කෙලෙස්වලට මාවතකි.'' ආදී වශයෙන් සඳහන් වන ගිහි වාසයේ ඇති ''කාමයේ අල්ප වූ ආස්වාද ඇත. බොහෝ දුක් ගෙන දේ. බොහෝ වෙහස ගෙනදේ'' ආදී වශයෙන් කාමයෙහි ආදීනව දැක, ගිහි කාමුක බව ප්‍රතික්ෂේපකර නික්මීමෙහි ආනිසංස සළකාබලා නුවණින් මෙනෙහි කර, විමසා බලා පැවිදිවූයෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉහතින් පැවසූ පරිදිම දතයුතුයි. මෙය ම තෙරුන් වහන්සේ ගේ රහත් බව ප්‍රකාශ කිරීම ලෙස දත යුතුයි.

ධම්මසව තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.8

"සවීසං වස්සසතිකො" යනු ආයුෂ්මත් ධම්මසව පිතු තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ පෙර බුදුවරු ශූන්‍ය වූ කාලයක සිටුවරයෙක් ව ඉපදුනහ. හේ තුරුණුවියට පැමිණ භූතගණ නම් පර්වතයේ වැඩසන පසේ බුදුවරයෙකු දැක, පැහැදී උන්වහන්සේ ට බෝලිද්ද මල් පූජා කළේය. ඒ පිනෙහි විපාක වශයෙන් දෙව්ලොව උපන් ඔහු තව තවත් පින් දහම් කර, කාම සුගතීන්හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි මගධයේ බමුණු පවුලක උපන්නේ ය. වියපත් ව විවාහ වූ ඔහු, ධම්මසව නම් තම පුතු තරුණ වියේදී පැවිදි වූ කල්හි, "මගේ පුතා තරුණයෙකුව සිටියදීම පැවිදි විය. මම පැවිදි නොවන්නේ කුමක් නිසාද ?" යි එකසිය විසිවයස්වූ තමාගෙන් අසා හටගත් සංවේගයෙන් ශාස්තෘන් වහන්සේ වෙත ගොස් ධර්මය අසා පැවිදි විය.

කමටහන් ගෙන විදසුන් භාවනාව වැඩූ ධම්මසව පිතු තෙරණුවෝ නොබෝ දිනකින් ම රහත් වූහ. අපදන පාළියේ උන්වහන්සේ සිය චරිතාපදනය මෙසේ දක්වූහ.

"හිමවතට නුදුරෙහි භූතගණ නම් පර්වතයක් විය. සියලු දෙය තමන්වහන්සේම දැනගත් ලොව හා නොගැටුණු සිබිනම් එක් පසේ බුදුවරයෙක් වැඩ විසූහ. බෝලිද්ද මල් ගෙන ඒ බුදුරදුන්ට පිදූ මම එහි විපාක වශයෙන් කල්ප එකුන් සිය දහසක් මුලුල්ලෙහි දුගතියකට නොගියෙමි. මීට කල්ප එකොළොසකට පෙර "ධරණීපති" නම් මහත් බලැති සක්විති රජව, සත්රුවනින් පිරි රජය කරවූයෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි."

රහත් බවට පත් වූ උන්වහන්සේ තම පිළිවෙත සිහිපත්කර බලා, හටගත් සොම්නසින් ප්‍රීති වාක්‍ය පහළ කරනසේක්; මෙම ගාථාව වදළහ.

"සවීසං වස්සසතිකො පබ්බජිං අනගාරියං
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං"

එහි "සවීසං වස්සසතිකො" යනු උන්වහන්සේ එක්සිය විසි වයස් වූවෙකි. ඒ මම උපතින් එක්සිය විසි වසරකට වඩා වයස් ඇත්තෙක්ව,

''පබ්බජිං'' පැවිදිවූයෙමි. ශ්‍රමණභාවයට පැමිණියෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. මෙම ගාථාව ම ධම්මසවසපිතු තෙරණුවන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව විය.

ධම්මසවපිතු තේරගාථා අර්ථ විවරණනාව නිමියේය.

1.11.9

''නනූනායං පරමහිතානුකම්පිනෝ'' යනු ආයුෂ්මත් සංඝරක්ඛිත තෙරුන් වහන්සේ ගේ ගාථාවයි. එහි උපත කෙසේද? පූර්ව බුදුවරු හමුවෙහි තැබූ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද පෙර ඒ ඒ ජාතිවල දී පින් රැස්කර ගනිමින්, මෙයින් කල්ප අනූනතරකට පෙර දී සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. එක් දිනක් ඒ සිටුකුමරු පර්වත පාදයක වසන පසේ බුදුවරු සත් නමක් කෙරෙහි පැහැදුණු සිතින් බක්මී මලින් පූජා කළේය. ඒ පිංකමේ විපාක වශයෙන් දෙව්ලොව උපන් හෙතෙම තව තවත් පින් දහම් සිදුකර සුගතීන් හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර සමෘද්ධිමත් කුලයක උපන්නේ ය. ඔහුට ''සංඝරක්ඛිත'' යන නාමය තබන ලදී. තුරුණු වියට පත් වූ ඒ කුමරු, ශ්‍රද්ධාව උපදවා ගෙන සසුනේ පැවිදි ව කමටහන් රැගෙන, එක් භික්ෂුවක් සහාය කරගෙන අරණ්‍යයෙහි වාසය කරයි. එම තෙරුන් වසන තැනට නුදුරෙහි එක් වන ලැහැබක මුවැත්තියක් පැටවකු වද, බඩසයින් පෙලුණත් පැටවා අත් නොහැර දරු සෙනෙහස නිසා සමීපයෙහි ඇති ගොදුරුම ගත්තීය. ඇය සමීපයෙහි තණ හා දිය නිමවූ පසු ඇය ආහාර නොලැබ ක්ලාන්ත වූවාය. මෙය දුටු තෙරුන් වහන්සේ, ''අනේ ඒකාන්තයෙන්ම මේ ලෝ වැසියා තණ්හාවෙන් බැඳීම නිසා මහත් වූ දුක් විඳිති. ඒ තණ්හාව සිද දැමීමට අසමත් වෙති''යි සංවේගයෙන් සිහිකර, එ කරුණම අංකුසයක් කරගනිමින් විදසුන් භාවනාව වඩා රහත්වූහ.

උන්වහන්සේ විසින් සිය චරිතය අපදන පාළියෙහි මෙසේ දක්වූහ. ''හිමවතට නුදුරෙහි කුක්කුට නම් පර්වතයක් ඇත. ඒ පර්වතපාදයේ පසේ බුදුවරු සත්නමක් වෙසෙති. උදු වූ චන්ද්‍රයා හා සමානව බබලන පිපුණු කොළොම් ගසක් දුටු මම, ඒ මල් දෝතින් ගෙන සත් පසේ බුදුවරයන්ට පිදුවෙමි. මෙයින් සිවු අනූවන කපෙහි යම් මල් පූජාවක් කළෙමි ද එනිසා දුගතියක් නොදනිමි.

බුද්ධ පූජාවේ විපාකය මෙයයි. මෙයින් කල්ප අනූදෙකකට පෙර සත්රුවනින් පිරී, මහත් බලැති ථූල්ල නම් සක්විති රජ ව උපන්නෙමි. දන් මැවිසින් සියලු කෙලෙස් දූවුයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකලෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ තම සහායක භික්ෂුව මිථ්‍යා විතර්ක බහුලව වාසය කරනු දැක, ඒ මුවදෙන ම උපමා කොට ඒ භික්ෂුවට අවවාද දෙනසේක්, මෙම ගාථාව වදළහ.

''**න නූනායං පරමහිතානුකම්පිනෝ**
රහොගතෝ අනුවිගණෙති සාසනං
තථාහයං විහරති පාකතින්ද්‍රියෝ
මිගී යථා තරුණජාතිකා වනෙ'' ති.

එහි ''**න නූනායං**'' යන්නෙහි ''**න**'' යනු ප්‍රතිශේධාර්ථයේ නිපාතයකි ''**නූනං**'' සිතීමෙහි, කල්පනා කිරීමෙහි, නනුනායං යන්නෙහි පද වෙන් කිරීම ''න නූනං අයං'' වේ. ''**පරමහිතානුකම්පිනෝ**'' අතිශයින් ම අනුත්තර වූ හිතවත් වූ සත්වයන්ගේ යහපත කැමති, සත්වයන්ට අනුකම්පා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ, ''**රහොගතෝ**''රහසිගත වූ ශූන්‍යාගාරයක් - මිනිසුන්ගෙන් විරහිත වූ ස්ථානයක්. කායවිවේකයෙන් යුතු වූයේ යන අර්ථයයි. ''**අනුවිගණෙති**'' යනු මෙතැනට ''න නූනං'' යන දෙපදය සම්බන්ධ කළ යුතුයි. ඒ කාන්තයෙන් අනුගමනය කරන්නේ යැයි නොසිතමි. නොයෙදේ යැයි සිතමි යනුවෙන් කල්පනා කරයි, සිතයි, ''**සාසනං**'' යනු ප්‍රතිපත්ති ශාසනයයි. චතුරාර්ය සත්‍ය කමටහන වැඩීමකි'' යන අදහසයි. ''**තථාහි**'' ඒ කාරණයෙන් ම, ශාස්තෘ අනුශාසනය ඉටුනොකරමින් මං ''**අයං**'' මේ භික්ෂුව. ''**පාකතින්ද්‍රියෝ**'' මනස සයවැනි කොට ඇති ඉඳුරන්ගේ, යම්සේ සිය අරමුණු විෂයන් හි විද්‍යමානවන ස්වාභාවික ඉඳුරන්හි, ''**සංවර නොවූ චක්ඛුද්වාරදී ඉඳුරන්හි**'' යන අර්ථයයි. යම් තණ්හාවෙන් ඇලුණු තැනැත්තෙකුගේ සසර පැවැත්ම නොසිදුණේ ද ඒ භික්ෂුව ප්‍රකෘති ඉඳුරන් ඇතිව ම මෙසේ, එහි උපමාව දක්වමින්, ''**මිගී යථා තරුණජාතිකා වනෙ**'' යන්න පවසන ලදී, යම්සේ මේ තරුණ ස්වභාවයෙන් යුතු මුවදෙන පුත්‍ර ස්නේහය නොසිදුණු බැවින් වනයෙහි දුක් අනුභව කරන්නීය, ඒ දුක ඉක්මවා නොයන්නීය, ''එසේ ම මේ භික්ෂුව ද ඇලීම, ගේහසිත නොසිඳු බැවින් පියවි ඉඳුරන් ඇතිව වෙසෙමින් සසර දුක ඉක්මවා නොයයි'' යන අදහසයි. ''**තරුණජාතිකා**'' යන පාඨය ද යෙදේ, වැඳූ අලුත, ළඳරු

පැටවකු ඇති යන අර්ථයයි. මෙම ගාථාව ඇසූ ඒ සහායක භික්ෂුව හටගත් සංවේග ඇතිව විදසුන් වඩා නොබෝ කලකින් ම රහත් බවට පැමිණියේය.

සංඝරක්ඛිත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.11.10

"නගා නගගෙසු සුසංවිරූළහා" යනු ආයුෂ්මත් උසභ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි නිදනය කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන් පතාගෙන පින්දහම් සිදුකළහ. මෙයින් දෙව් පුතෙකු වී උපන් උන්වහන්සේ, ශාස්තෘන් වහන්සේ දැක පැහැදී දිවමලින් පූජා පැවැත්වුහ. ඒ පූජාකළ මල් සමූහය සත්දිනක් මල් මඩුවක ආකාරයෙන් බුදුරදුන් පිරිවරාගෙන සිටියේය. එවිට දෙව් මිනිසුන්ගේ මහත් වූ එකතුවක් ද විය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් භවයන්හි සැරි සැරූ දෙවිපුතු, අපගේ ගෞතම බුදුරදුන් පහළ වූ සමයෙහි කොසොල් රට පොහොසත් පවුලක උපන්නේ ය. උසභ නමින් ප්‍රකට වූ හෙතෙම වියපත්ව, ජේතවනාරාමය පිළිගැනීමේ දී ශාස්තෘන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා පැවිදිවිය. කරන ලද පුව් කටයුතු ඇති උසභ තෙරණුවෝ අරණ්‍යයෙහි පර්වතපාදයක විසූහ.

එසමයේ දී ඉතා අලුයම වැසි වැස, පව්ත ශිඛරයන්හි රුක් ගොමු වැල් ආදිය ගණ, සැඩ ස්වභාව ඇත්තේ විය. දිනක් උසභ තෙරුණුවෝ, ලෙනින් නික්ම ඒ වනයේ සිත්කලු බව ද පව්තයේ දැකුම්කලු බව ද නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් "මේ මහත් වූ නා ගස් ආදිය අචේතනික වුවත් සෘතු සම්පත්තියෙන් වැඩීමට පැමිණෙයි. මම කුමක් හෙයින් මෙබදු සෘතු සම්පත්තියක් ලැබ, ආර්ය ගුණ නොවඩන්නෙම් ද ?" යි සිතමින් මෙම ගාථාව වදළහ.

"නගා නගගෙසු සුසංවිරූළහා
උදගා මෙසෙන නවෙන සිත්තා
විවෙක කාමස්ස අරඤ්ඤ සඤ්ඤිනෝ
ජනෙති හියෝ‍ා උසභස්ස කල්‍යතං නති."

එහි "නගා" යනු වෘක්ෂයෝ ය. ඇතැම් හු "නාගා" යන පාඨය යොදති. නා ගස් යන අර්ථයයි. "නගගෙසු" යනු පර්වත ශිඛරයන් හි,

''සුසංවිරුළ්හා'' මනාව හාත්පසින් වැඩුණු මුල් ඇති ව, වටේට ද මත්තෙහි ද මනාව හටගත් අතුරිකිලි දළු ආදියෙන් යුතු යන අර්ථයයි. ''උදහමෙසෙන නවෙන සිත්තා'' යනු පළමුව උපන් මහත් වූ වැසිදිය ලැබීමෙන් මනාව වැඩුණු, ''විවෙකකාමස්ස'' යනු කෙලෙසුන්ගෙන් තොර වූ චිත්ත විවේකය කැමැත්තාට ''අරණ්‍ය වාසයෙහි විසීමෙන් ම කායවිවේකය ලබන්නේ ය. දැන් උපධි විවේකය කැමැත්තාට නිශ්‍රය භූත වූ චිත්ත විවේකය ලැබිය යුතු යයි'' ''පතන්නා වූ, නිදි වැරීමෙහි නියුක්ත වූවහුට'' යන අර්ථයයි. එනිසා ''අරඤ්ඤ සඤ්ඤිනො'' යන්න කියන ලදී. අරණ්‍ය වාසය ශාස්තෘන් වහන්සේ වර්ණිත, පසසන ලද්දකි. එහි යෙදීමෙන් සමථ විදර්ශනා භාවනාවන් පිරිපුන් (පරිපූර්ණවේද, එම භාවනා මගින් චිත්ත සමාධිය මගේ අතට පත්වූවක් කරන ලද්දෙමි. මෙසේ ආරණ්‍යගත වූ සඤ්ඤාවෙන් නෙක්ඛම්ම සංකප්පය බහුලවෙමි යන අර්ථයයි. ''ජනෙති'' යනු උපදවයි, පතුරුවයි, මෙහි ඒකවචනය යෙදී ඇත. ඇතම්හු මෙය ''ජනෙන්ති'' යනුවෙන් බහුවචනයෙන් අර්ථ කියති. ''භියෙෘ'' යනු භාවනාවට මතුමත්තෙහි, තමාම වෙනත් අයෙකු මෙන් දක්වයි. ''කල්‍යතං'' යනු සුදුසුබවට, සිත භාවනාවට යෝග්‍ය වූ කර්මණ්‍ය බවට පත්වූ, එහි අර්ථ ඉහත කියන ලදී තෙරුන් වහන්සේ මෙම ගාථාව පවසමින් ම විඳසුන් භාවනාව වඩා රහත් බවට පත්වූහ.

උන්වන්සේ සිය චරිතාපදනය මෙසේ දැක්වූහ.

''දෙව්පුතෙකුව සිටි මම සිබී බුදුරජාණන් වහන්සේට දිව මල් මාලාගෙන පූජා කළෙමි. සත් දිනක් මුලුල්ලෙහි ඒ දිව මල් බුදුරජාණන් වහන්සේට වියනක් මෙන් සිටියේය. ඒ දැක සියලු ජනයා එක්ව තථාගතයන් වහන්සේට නමස්කාර කළෝය. මෙයින් කල්ප තිස් එකකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් දසවන කල්පයේ සත් රුවනින් යුතු මහත් බලැති ජුතින්ධර නම් සක්විති රජ ව උපන්නෙමි. මව්සින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි''

ඉහතින් දැක්වූ ගාථාව ම උසභ තෙරණුවන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථාව ද විය.

උසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

එකොළොස්වන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

1.12.1

''දුජ්ජබ්බජ්ජං වෙ දුරධිවාසා ගෙහා'' යනු ආයුෂ්මත් ජෙන්ත තෙරුණුවන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද පූර්ව ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී නිවන්පතාගෙන කුසල් රැස්කරගත්හ. සිබි බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී දෙව් පුතෙකුව ඉපිද, දිනක් උන්වහන්සේ දක - පැහැදුණු සිතින් කිංකිරාත මලින් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයේ දී මගධ රට ''ජෙන්ත'' නම් ගම එක් මාණ්ඩලික (ප්‍රාදේශිය) රජෙකුගේ පුතුව උපන්නේය. ජෙන්ත නමින් ප්‍රකට වූ හෙතෙම වියපත් ව, තරුණකාලයේ දී ම හේතුසම්පත් බලයෙන් මෙහෙයවනු ලබන්නේ පැවිද්දට ඇලුණු සිතැතිව සිට නැවත මෙසේ සිතීය. ''පැවිද්ද නම් දුෂ්කර වුවකි, ගෘහ වාසය ද අතිදුෂ්කර වුවකි, ධර්මය ද ඉතා ගැඹුරුය. භෝග සම්පත් ලැබීම ද අසීරුය, මම කුමක් කළයුතු ද ?'' මෙසේ සිතමින් වෙසෙන කල් හි දිනක් ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්මය ඇසුවේය. ධර්මය ඇසූ දින පටන් පැවිද්දට ඇලුණු සිතැතිව, ශාස්තෘන් වහන්සේ සමීපයේ පැවිදි වූ උන්වහන්සේ කමටහන් ගෙන විදසුන් වඩා, සුව ප්‍රතිපදාවෙන් වහා අභිඥා උපදවා රහත් බවට පත්වූහ.

උන්වහන්සේ සිය චරිතාපදානය මෙසේ දක්වුහ.

''මම පෙර දෙව් පුතෙකුව ඉපිද කිංකිරාත මල් රැගෙන සිබී බුදුරජාණන් වහන්සේට පූජා කොට නමස්කාර කළෙමි. මෙයින් කල්ප තිස් එකකට පෙර එසේ යම් මල් පූජාවක් කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප පහකට පෙර සත්රුවනින් හෙබි මහ බලවත් සත්තුත්තම නම් සක්විති රජ ව උපන්නෙමි. දැන් මවිසින් සයලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ ජෙන්ත තෙරුණුවෝ තමාගේ ප්‍රතිපත්තිය විමසා බලා, ''මම ඒකාන්තයෙන්ම මා හට මුලදී උපන් විතර්කය සිද දැමීමට හැකියාව ලද්දෙමි'' යි සතුටට පැමිණ, විතර්කයේ උපන්දින ස්වභාවය ද එය මනාව සිඳ දැමීම ද දක්වමින්, මෙම ගාථාව වදළහ.

''දුප්පබ්බජ්ජං වෙ දුරධිවාසා ගෙහා
ධම්මෝ ගම්භීරෝ දුරධිගමා භොගා
කිච්ඡා චුත්‍ති නො ඉතරී තරෙනෙව
යුත්තං විනෙතුං සතත මනිච්චතං'' න්ති.

එහි ''දුප්පබ්බජ්ජං'' යනු අල්ප හෝ මහත් වූ සම්පත් මෙන් ම ඤාති සමූහයා ද අත්හැර මේ බුදුසසුනෙහි ඇල්ම උපදවා පැවිදිවන්නාට එය දුෂ්කර වූවක් බැවින් පැවිද්ද දුෂ්කරය. දුෂ්කර පැවිද්ද දුප්පබ්බජ්ජ නම් වේ. ''වෙ'' යනු නිපාතයක් පමණි. පැවිද්ද දැඩි වූවක් ද දුක්ගෙන දෙන්නක් ද වේ. ගිහි ගේ විසීමත් ''දුරධිවාසා ගෙහා'' ඉතා දුෂ්කරය. ගිහි ගේ වසන රජවරු රාජ්‍ය කටයුතු ද ප්‍රධානීහු ප්‍රධාන කටයුතු ද ගහපතියෝ ගහපති කටයුතු ද කළයුතුය. ඔවුහු තම පිරිවර ජනයාට ද මහණබමුනන්ට ද සංග්‍රහ කළයුතුවෙති. මෙම කටයුතු මැනවින් ඉටුකළත් ගිහිගේ විසීම නම් හිල් වූ කලයක් හෝ මහ මුහුද හෝ දියෙන් පිරවීම මෙන් සම්පුර්ණ නොවන්නකි. එනිසා ගිහිගේ විසීම ද අති දුෂ්කර වූවකි. දුෂ්කර වාසය කිරීම් ඇත්තකි. ඉදින් පැවිදිව සිටින්නේ නම් උගත යුතු ධර්ම ගැඹුරුය. පැවිද්දෙකු විසින් අවබෝධ කරගත යුතු වූ ප්‍රතිවේධ සද්ධර්මය ගැඹුරු බැවින් අවබෝධ කරගැනීමට අපහසුය. ඉදින් ගිහිගේ වසන්නේ නම් සම්පත් සෙවීම අපහසුවේ. සම්පත් නොමැතිව ගිහිගේ විසීමට නොහැක. ඒ හව භෝගාදී සම්පත් සෙවීම දුකින් ම කරදරවලින් ම කළයුතු බැවින් දුකසේ ලැබිය යුතුවේ. මෙසේ ඇති කල්හි ගිහිගේ හැර පැවිද්දෙහිම එකඟ වූ සිතින් පවතින්නේ නම් එය අන්‍ය කටයුතුවලට වඩා අපට දුෂ්කරය. මේ බුදුසසුනෙහි යථා ලාභ ප්‍රත්‍යයෙන් ම අපගේ ජීවිතය පවත්වා ගැනීම දුෂ්කර වූවකි. ගිහිගෙදර විසීමත් දුෂ්කර වාස ඇති බැවින් ද භෝගයන් දුකසේ ලැබිය යුතු බැවින් ද කිසියම් ප්‍රත්‍යයකින් යැපිය යුතු බැවින් ද අපට ඉතා දුෂ්කර ද අමාරු වූ දිවිපැවැත්මකි. මෙහි දී අප කුමක් කළයුතු ද ? යි සිතීමට සුදුසුය. නිතර අනිත්‍ය බව, මුලු දවසම රාත්‍රියට පෙරත් පසුවත් සියලු තෙභූමික වූ හටගත්, උපන් ධර්මයෝ අනිත්‍යයැයි දැකිය යුතුයි. ඉපිද නැසෙන බැවින් අනිත්‍ය ලෙස ගතයුතුයි. එමෙන් තාවකාලික බැවින් නිත්‍ය - ස්ථීර නොවේ යන අදහසින් අනිත්‍ය ලෙස සිතීමට විදර්ශනා වැඩීමට සුදුසු ය. අනිත්‍යානුපස්සනාව මගින් ම සෙසු අනුපස්සනා භාවනාවන් ඉටුවන බැවින්, මෙහිදී අනිත්‍ය පිළිබඳ මෙනෙහි කරන භාවනාවම අදහස් කරන ලදී. අනිත්‍යයේ දුක - අනාත්ම භාවයන් අභිභවා නොයන බැවින් ද සසුනෙහි සැප අල්ලා ගන්නා බැවින් ද අනිත්‍ය අනුපස්සනාව මෙහි දී අදහස් වේ. ''යමක් අනිත්‍ය නම් එය දුකකි, යමක්

දුක නම් එය අනාත්ම වේ'' යනුවෙන් එනිසා කියන ලදී. ''යම්කිසි හේතු ප්‍රත්‍ය සමවායෙන් හටගන්නා ධර්මයක් වේ නම් එය හේතු ප්‍රත්‍ය වෙන් වීමෙන් නිරුද්ධවන නැති ව ධර්මයක් වේ. සංස්කාරයෝ නැසෙන සුලුය.'' මෙසේ ''අනෙක්‍යන්‍ය වශයෙන් ප්‍රතිපක්ෂ වූ වෙන වෙනම උපන් විතර්ක දුරුකර, අනිත්‍යතාව ප්‍රමුඛ වූ විදසුන් භාවනාව ඇරඹූ මම දැන් කළයුතු කටයුතු නිමවූවෙමි'' යි දක්වයි. ඒ සඳහා තමාගේ පිළිවෙත ප්‍රත්‍යවේක්ෂා කරමින් යනාදී විස්තරය පවසන ලදී. මෙම ගාථාව ම ජෙන්ත තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථාව විය.

ජෙන්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.2

''තෙවිජ්ජොහං මහාඣායි'' යන ගාථාව ආයුෂ්මත් වච්ඡගොත්ත තෙරුන් විසින් වදාරණ ලදී. එහි උපත කෙසේ ද ? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භාවයන්හි දී නිවන් පතාගෙන කුසල බීජ රෝපණය කරනුයේ, විපස්සි බුදුරජානණින් වහන්සේ පහළ වූ සමයේ බන්ධුමතී නුවර සිටුගෙයක උපන්හ. වියටපත් වූ එම සිටුතුමා, දිනක් රජු ද නගර වැසියන් සමග ද එක් වී බුද්ධ පූජාවක් කර, ඉන් පසුව දෙවි මිනිසුන් අතර සැරි සරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවර සම්පත් ඇති බමුණු පුතෙක් ව උපන්නේ ය. ඔහුගේ පියා වච්ඡ ගෝත්‍රික බැවින් පුතුට ද ''වච්ඡගොත්ත''යන නාමය ම තබන ලදී. නිසි වයසට පැමිණි ඒ බමුණු කුමරු ත්‍රිවේද පාරගතව විමුක්තිය සොයනුයේ, වේදයෙහි හරයක් නොදැක පිරිවැජි පැවිද්දෙන් පැවිදි ව සැරිසරනුයේ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබීය. එසේ පැවිදිව විදසුන් කමටහන වඩමින් නොබෝ දිනකින් ම ෂඩ් අභිඥාලාභී වූ රහතන් වහන්සේ නමක් වූ වච්ඡගොත්ත තෙරණුවෝ තම චරිතාපදනය අපදනපාළියෙහි දී මෙසේ දක්වූහ.

''උදවන්නා වූ සුර්යයා මෙන් ද රන්වන් රැස් ඇති හිරු මෙන් ද පසොළොස්වක් දින පායන සඳුමෙන් ද තම අරමින් නික්මෙන ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි. හැට අට දහසක් වූ සියලු ක්ෂීණාස්‍රවයෝ ඒ ද්විපදෝත්තම නරශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ පිරිවරා

ගත්ත. මම බුදුරදුන් නික්මෙන කල් හි ඒ වීථිය නැමද පහන් සිතින් එහි ධජයක් එසවීමි. මෙයින් කල්ප අනූඑකකට පෙර එසේ ධජයක් පිදුවෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියකට පත්නොවුයෙමි. ධජ දනයේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප සතරකට පෙර මහත් බන ඇති, සවිප්‍රකාරයෙන් ම සම්පූර්ණ වූ සුධජ නමින් ප්‍රකට වූ රජෙක් ව උපන්නෙමි. දැන් මම සියළු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥාලාභී වූ චච්ඡගොත්ත තෙරණුවෝ තම පිළිවෙත ප්‍රත්‍යවේක්ෂා (නැවත සිහිපත් කර බලා) කර හටගත් ප්‍රීතියෙන් මෙම ගාථාව වදළහ.

''තෙවිජ්ජොහං මහාඣායී
චෙතෝ සමථකොවිදෝ
සදත්ථෝ මෙ අනුප්පත්තෝ
කතං බුද්ධස්ස සාසනං''

එහි ''තෙවිජ්ජොහං'' යනු පෙර මම ත්‍රිවේද පාර ගත වූ බැවින් තේවිජ්ජ බ්‍රාහ්මණ නාමයෙන් හැඳින්විණි. එය හැඳන්වීමක් පමණි, වේදයෙහි විද්‍යාමය කටයුතු නැති බැවින් දැන් මේ බුදුසසුනේ පැවිදි වූ මම පුර්වේනිවා සානුස්සති යනාදී ත්‍රිවිද්‍යාව අවබෝධ කළ බැවින් පරමාර්ථ වශයෙන් ම ''තේවිජ්ජ'' නම් වේ. ඉතිරි නොවනසේ මහත් වූ තණ්හාදී කෙලෙස් සමූහයා දවා වැනසීම් වශයෙන් ද මහත් වූ මාර්ගඵල ධ්‍යානයෙන් ද මහත් වූ උදර වූ ප්‍රණිත වූ නිවණ වැඩීම් වශයෙන් ද ''මහාඣායී'' මහත් ධ්‍යාන ඇත්තෙමි. ''චෙතෝ සමථ කොවිදෝ'' යනු සිත කළඹන්නා වූ කෙලෙස් දහම් සංසිදවීමෙන් සිත දමනය කර ගැනීමෙහි දක්ෂවුයෙමි. මෙයින් විද්‍යා බවට හේතුව දක්වන ලදී. සමාධියට සමවැදීමේ දක්ෂ බව සහිත වූ ආශ්‍රවක්ෂය කිරීමෙන් තේවිජ්ජ නම් වුයෙමි. හුදකලාව ආශ්‍රව ක්ෂය කළෙම් නොවෙමි. ''සදත්ථෝ'' යනු ස්වකීය අර්ථය සිද්ධකරගත් ''සකත්ථ'' නම් වේ. එහි 'ක' යන්නට 'ද' යන්න පැමිණීමෙන් ''අනුප්පත්තසදත්ථෝ'' යන තැන මෙන් ''සදත්ථ'' පද සිද්ධිය විය. ''සදත්ථෝ'' යන්නෙන් ස්ව අර්ථ සිද්ධිය වූ අර්හත්වය අදහස් වේ. එහි දී තමා හා ප්‍රතිබද්ධ වූ අරුතින් ද තමා අත්නොහැර යන අරුතින් ද තමාගේ පරමාර්ථ වශයෙන් ද තම යහපත - අර්ථය සිදුකරනුයේ ''සකත්ථ'' නම් වේ. ඒ මේ ස්වකීය අර්ථය, අර්හත්වය මවිසින් අවබෝධ කළෙමි, ඊට පැමිණියෙමි, මෙයින් මහත් වූ

ධ්‍යාන ඇති බව ආදී හැකියාවන් කුළුගන්වා දක්වයි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

වච්ඡගොත්ත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.3

''අඡ්ඣොදිකා පුථුසිලා'' යනු ආයුෂ්මත් වනවච්ඡ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ අර්හත්වය පිණිස ප්‍රාර්ථනා කරන ලදුව, ඒ ඒ භවයන්හිදී සසරින් මිදීම සඳහා කුසල් බීජ රෝපණය කරමින් පැමිණ, විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ සමයේ දී එක් සිටුගෙයක ඉපිද, වැඩිවියට පැමිණ අනුන්ගේ කටයුතු කරදෙමින් ජීවත් වූහ. දිනක් කිසියම් අපරාධයක් කොට මරණභයින් තැතිගෙන දුවයන ඔහු අතර මග දී බෝධි වෘක්ෂයක් දැක පැහැදුණු සිතින් එහි මුල පිරිසිදු කර මනාව පිපුණු අශෝක මල් පොකුරු පූජාවක් පවත්වා වැඳ, ඒ බෝරුක ඉදිරියේ නමස්කාර ගෙන ම පලක් බැඳගෙන හුන්නේ ය. තමා මැරීමට පැමිණි සතුරන් දැක, ඔවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා බෝ රුක පිළිබඳව ම සිතමින් හුන් ඒ සිටුපුත්‍රයා පසුව සතපෝරිස ප්‍රපාතයෙහි වැටී මළේය.

ඒ පින්කම නිසා දෙව් ලොව උපන් හෙතෙම තව තවත් පින්දහම් සිදුකොට දෙව් මිනිසුන් අතර සැරි සරා මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර මහත් සම්පත් ඇති බමුණු පුතෙක් ව උපන්නේ ය. ඔහුගේ නම වච්ඡ විය, තරුණ වියට පත් වූ වච්ඡ බමුණා බිම්බිසාර රජු බුදුරදුන් හමු වූ ප්‍රථම අවස්ථාවෙහි සසුනේ පැහැදී පැවිදිව රහත්භාවය ලබාගත්තේය.

අපදාන පාළියේ මෙසේ සිය චරිතාපදානය දක්වන ලදී.

''අනුනට බැලමෙහෙ කිරීමෙහි යෙදුනා වූ මම අපරාධයක් කෙළෙමි. එනිසා භයජනක අරමුණුවලින් තැති ගත් මම වනයට පලාගියෙමි. පොකුරු බැඳි මනාව සුපිපි අශෝක මල් ගසක් දැක, ඉන් තඹවන් මල් රැගෙන බෝධිය සමීපයට ඉසීමි. ඒ උතුම් පළොල් බෝ මුල හැම ද, ඒ බෝ මුලෙහි පලඟ බැඳ හුන්නෙමි. අපරාධය කර පලාගිය මා සොයමින් පැමිණි අය

මා ළඟට පැමිණියහ. ඔවුන් දුටු මම උතුම් වූ බෝධියම සිහිපත් කළෙමි. පහන් සිතින් බෝධිය වැඳ ඉදිරියට ගිය මම, බොහෝ තල් රුක් ගණනින් ගිණිය යුතු (අතිශය ගැඹුරු වූ) භයානක ගිරි දුර්ගයක වැටුණෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බෝධිපූජාවේ විපාක මෙබඳුය. මීට කල්ප තුනකට පෙර දී මම මහත් බලැති සත්රුවනින් හෙබි සත්තුසිත නම් සක්විති රජව උපන්නෙමි. දැන් මම සියළු කෙලෙස් දුවුයෙමි. බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ විවේකයෙහි ඇලී වනයෙහි ම වාසය කළහ. එනිසා වනවච්ඡ නාමයෙන් උන්වහන්සේ ප්රකටවූහ. ඉක්බිති කිසියම් කලෙක එම තෙරණුවෝ නෑ සමූහයාට අනුග්රහ පිණිස රජගහ නුවරට වැඩමවා එහි දී නෑයන්ගේ පුදසත්කාර ලබමින් සිට, නැවත පැමිණීමට සුදනම් වූහ. එය දුටු ඤාතීහු ''ස්වාමීනි අපට අනුග්රහ පිණිස ජීවිත කාලයම මෙහි වසනු මැනවි, අපි උපස්ථාන කරන්නෙමු'' යි ආරාධනා කළහ. තෙරණුවෝ ඔවුන්ට තමන්වහන්සේ පර්වත, ආරණ්ය සෙනසුන් ප්රිය කරන බවත් විවේකයෙහි කැමති බවත් දැනුම් දෙන සේක්, මේ ගාථාව වදළහ.

''අඵොදිකා පුථුසිලා ගොනඞ්ගුල මිගා යුතා
අම්බු සෙවාල සඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති මං''

එහි ''අඵොදිකා'' යනු පිරිසිදු, බහුල නොවූ, සියුම් වූ දියදහර ඇති බව අඵොදිකා යනු වේ. මෙහි ''අඵොදකා''යි කිවයුතු වුවත් ලිංග විපර්යාසවීමෙන් ''අඵොදිකා'' යනුවෙන් දක්වන ලදී. මෙයින් ඒ කඳුවල පැවති ජලසම්පත දක්වයි. ''පුථුසිලා''යනු පෘථුල, පැතිරුණු මෘදු සුව පහස් ඇති ගල්තලාවන් ඇති, මෙයින් හිදීමට නිදීමට සෙනසුන් සම්පත්තිය ඇති බව දක්වයි. ගුන්නයක් (වැලක්) මෙන් වූ වලිගයක්, නගුටක් ඇති බැවින් ගෝනඞ්ගුල නම් වූ කළු වදුරෝ, ස්වාභාවික වදුරෝ යැයි ද මතයකි. ''වදුරන්ගෙන් ද සිවුපා සතුන්ගෙන් ද ඒ ඒ තැන හැසිරෙන්නවුන්ගෙන් ද වනය යුක්තය. මිශ්රිතය'' යනුවෙන් ''ගොනඞ්ගුලමිගා යුතා'' පදයෙන් පවසයි. මේ වදනින් අමනුෂ්යයන් හැසිරෙන බව ආරණ්යයේ ලක්ෂ්යණයක් ලෙසින් දක්වයි. ''අම්බු සෙවාල සඤ්ඡන්නා'' ගලා බැසීම නිසා නිතර දිය වැගිරෙන ඒ ඒ තැනින් හටගත් දිය සෙවෙල් වලින් ගැවසුණු, වැසුණු, ''තෙ සෙලා රමයන්ති මං'' මම යම් තැනක වසම් ද එහි ඇති මෙබඳු ගල්

පවිත්‍ර විවේකයේ ඇලුණු මගේ සිත අලවයි. එනිසා ''එහි වාසය කිරීමට යමි'' යන අදහසයි. මෙම ගාථාව ම වනවච්ඡ තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථාව විය.

වනවච්ඡ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.4

''කාය දුඝුල්ලගරූනෝ'' යනු ආයුෂ්මත් අධිමුත්ත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? හෙතෙම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි බමුණු පවුලක ඉපිද වැඩිවිය පැමිණෙත්ම සියලු බමුණු ශිල්පශාස්ත්‍රයන්හි පරතෙරට ගියේය. කාමයෙහි ආදීනව දුටු මේ තරුණ බමුණා ගිහිගේ හැර තවුස් පැවිද්දෙන් පැවිදිව අරණ්‍යයෙහි වාසය කළේය. බුදුරදුන්ගේ පහළවීම ඇසූ තාපසතුමා මිනිස් වාසයට පැමිණ භික්ෂු සංඝයා පිරිවරා වඩින ශාස්තෘන් වහන්සේ දැක, පැහැදුණු සිතින් තමාගේ වැහැරි සිටුර විසූ උන්වහන්සේගේ පාමුල ඇතිරීය. ඔහුගේ අදහස දැනගත් ශාස්තෘන් වහන්සේ එහි වැඩ සිටියේය. එසේ සිටි භාග්‍යවතුන් වහන්සේට කාලෝචිත පරිදි සුවඳ දුම් පුද, ''සමුද්ධංසි මං ලොකං''යනාදී අපදානපාළියෙහි එන ගාථා දහයෙන් ස්තුති කළේය. එවිට ශාස්තෘන් වහන්සේ ''අනාගතයේ මෙයින් කල්ප ලක්ෂයකට පසුව ගෞතම නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සසුනේ පැවිදිවන මොහු ෂඩ් අභිඥා ලාභී වන්නේය.'' යනුවෙන් විවරණ දී වැඩියහ. ඒ පිංකමේ විපාක ලෙස දෙවිලොව උපන් තාපසතුමා අපගේ බුදුරජාණන් වහන්සේ පහළවීම දක්වාම දෙවි මිනිස් දෙගතියේ සැරිසරා, අවුත් සැවැත්නුවර බමුණු පවුලක ඉපිද ''අධිමුත්ත'' නමින් ප්‍රකට විය. වැඩිවියට පැමිණ බ්‍රාහ්මණ විද්‍යාවන්හි පරතෙරට ගිය හෙතෙම, එහි හරයක් (සාරයක්) නොදැක, පශ්චිම භවික බැවින් පිහිටක්, සසරින් මිදීමක් සොයමින් යන්නේ, ජේතවනාරාමය පිළිගැනීමේදී පැවති උතුම් බුද්ධානුභාවය දැක ලබන ලද ශ්‍රද්ධාවෙන් ශාස්තෘන් වහන්සේ සමීපයේ පැවිදි විය. පැවිදි වූ අධිමුත්ත තෙරණුවෝ විදසුන් භාවනාවේ සිත පිහිටුවා නොබෝ කලෙකින් ම රහත් බව ට පත්වූහ.

එනිසා අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''පිපුණු කිණිහිරි රුකක් මෙන් බබලන, පහන් ගසක් මෙන් දිළිසෙන ඔසධී තාරකාව මෙන ආලෝකවත් වූ අහසෙහි විදුලි එළියක් බඳු වූ බිය හා තැති ගැනීම් නොමැති කේශර සිංහරාජයෙකු වැනි වූ තීර්ථක සමූහයා මඩින්නාවූ ඤාණාලෝකය ප්‍රකට කරන, මෙම ලෝ වැසියන් දුකින් ගොඩලන සියලු සැක සිඳින ලද සිංහ රාජයකු මෙන් ගුගුරන ලෝකනායක වූ බුදුරදුන් දිටිමි.

එකල මම ජටා සහ අඳුන් දිවිසම් දරන්නෙක් වූයෙමි. වැඩෙන්නා වූ සෘජු වූ ප්‍රතාපවත් වූවෙක් වීමි. වැහැරි සිවුරු ගෙන ඒ බුදුරදුන්ගේ පාමුල ඇතුළෙමි. කසාවන් අගිල් (කළුවැල්) ගෙන බුදුරදුන්ගේ ශ්‍රී ශරීරයේ ආලේප කළෙමි. තථාගතයන් එසේ ආලේප කර ලෝකනායකයන් වහන්සේට ස්තුති කළෙමි.

''සමුද්ධරසි මං ලොකං පටිගණ්හ මහාමුනි
ඤාණා ලොකෙන ජොතෙසි පවරං ඤාණමුත්තමං''

චතුරෝඝය තරණය කළ උතුමාණෙනි ! මහාමුනීන්ද්‍රයාණෙනි! ඔබ මේ ලෝ වැස්සා සසරින් ගොඩලන්නාහුය. ඤාණාලෝකයෙන් ආලෝක කරන්නාහුය. ඔබගේ උතුම් ඤාණය ද අනාවෘතයි.

''ධම්ම චක්කං පවත්තෙසි
මඤ්ඤෙ පරහිතථියෙ
උසභෝ ජිතසඞ්ගාමෝ
සම්පකම්පෙසි මෙදිනිං''

ඔබ වහන්සේ දම්සක පැවැත්වූහ. අන්‍ය තීර්ථකයන් මැඩලන්නාහුය. දිනූ මාරසංග්‍රාම ඇති ශ්‍රේෂ්ඨ වූ ඔබ වහන්සේ පෘථිවිය කම්පා කරන්නාහුය.

''මහාසමුද්දෙ ඌමියො වෙලන්තං හි පහිජ්ජරෙ
තථෙව තව ඤාණම්හි සබ්බා දිට්ඨී පහිජ්ජරෙ''

මහ සමුදුරෙහි තරංගයෝ වෙරළෙහි ගැටී බිඳෙති. එමෙන් ම අන්‍ය මිසදිටු අදහස් ඔබ වහන්සේගේ නුවණෙහි ගැටී බිඳියයි.

''සුබුමඡ්ජිකෙ යථා ජාලෙ පාරම්හි සම්පසාරිතෙ
අන්තොජාලගතා පාණා පීළිතා හොන්ති තාවදෙ''

විලක් සියුම් ඇස් ඇති දැලකින් අතුළ කල්හි එකෙණෙහි ම දැළ තුලට ගිය ප්‍රාණීහූ පෙළණහු වෙත්ද

''තථෙව තිත්ථියා ලොකෙ පුථුපාසණ්ඩ නිස්සිතා
අඤ්ඤා ඤාණවරෙ තුය්හං පරිවත්තනති මාරිස''

එසේම ලෝකයෙහි අන්‍යාගමික පාෂණ්ඩ ධර්ම ඇසුරු කළ අන්‍ය තීර්ථකයෝ ඔබ වහන්සේගේ උතුම් නුවණ නම් දැලෙහි බැඳී පෙරළෙති.

''පතිධ්‍යාවුය්‍යතං ඔඝෙ ඣං හි නාථො අබන්ධුනං
භයද්දිතානං සරණං මුත්තත්ථීනං පරායණං''

චතුරෝඝ නම් වූ සැඩ පහරෙහි ගසාගෙන යන්නවුන්ට පිහිටවූ ඔබ වහන්සේ නො නැයන්ට ද පිහිට වූහ. භයින් පීඩිතයන්ට ද පිහිට වූහ. ලෝකයා අත්හැර දැමූ ආනාථයන්ට ද පිහිට වූහ.

''එකවීරෝ අසදිසෝ මෙත්තා කරුණා සඤ්චයෝ
අසමෝ සුසමෝ සන්තෝ වසී තාදී ජිතඤ්ජසෝ''

අසහාය වීර වූ අසදෘශ වූ කරුණා මෛත්‍රී සඤ්චය (එකතුවීම්) ඇති උතුම් සිල් ඇති අසම වූ ශාන්ත වූ ධ්‍යානයන් හි වශී වූ තාදී ගුණ ඇති දිනූ මාර්ග ඇති

''වීරෝ විගතසම්මොහෝ අනෙජෝ අකථංකථී
තුසිතෝ වන්තදොසොසි නිම්මලෝ පයතෝ සුචී''

වීර වූ පහකළ මෝහ ඇති, නිදොස් වූ සැක සංකා දුරුකළ, වැස නිමවූ බඹසර ඇති, නිර්මල වූ අශුචීන් දොවා හළ, එහෙයින්ම පිරිසිදු වූ ඔබවහන්සේ වැමෑරූ රාගාදී දොස් ඇති සේක.

''සඛාතිගෝ ගතමදෙ තෙවිජ්ජොසි භවන්තගෝ
සීමාතිගෝ ධම්මගරු කන්තෙතා හිතවප්පථෝ.''

කෙලෙස් ඇලීම් ඉක්ම වූ නැසූ මද ඇති ත්‍රිවිද්‍යා ඇති තුන් ලෝ මුදුන් පත් වූ සීමාව ඉක්මවා ගිය ධර්ම ගරුක වූ කෘත්‍ය වූ ඔබ වහන්සේ වෙත, ලෝකයාට හිත වූ මාර්ග ඇති සේක.

''කාරකෝ ඣං යථා නාවා නිධිව සාසකාරකෝ
අසම්හීතෝ යථා සීහෝ නාගරාජාව දම්මිතෝ.''

ඔබ වහන්සේ නැවකට මගපෙන්වන තරුවක් වැනිය. අස්වැසීම ගෙන දෙන නිධානයක් බඳුය. සිංහයකු මෙන් බිය රහිත වූවෙහිය. හස්ති රාජයකු මෙන් ගර්විත වූ වෙහිය.

එකල්හි මම මේ දස ගාථාවලින් මහත් යස ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට ස්තුති කොට, ඒ ශාස්තෘන් වහන්සේගේ පා වැඳ නිශ්ශබ්දව සිටියෙමි. එවිට ලෝ වැසියාගේ පූජා පිළිගන්නා වූ ශාස්තෘවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිද මේ ගාථාවන් වදළහ.

''යමෙක් මාගේ ශීලය ද ඥානය ද ධර්මය ද පැසසූවෙහි ද ඔහු කවරෙක් වන්නෙම් දැයි මම පවසමි. ඒ මාගේ වචනය අසව්, හෙතෙම කල්ප සැට දහක් දෙව්ලොව සෙසු දෙවියන් මැඩ ආධිපත්‍ය පතුරුවා සිත් අලවා වාසය කරන්නේ ය. පසුව ඔහු එම කුසල මූලයෙන් මෙහෙය වනුයේ ගෞතම බුදු සසුනෙහි දී පැවිදි වන්නේ ය. පැවිදිව කයින් පව්කම් දුරලා, සියලු ආශ්‍රව නසා, ආශ්‍රව රහිතව පිරිණිවන් පාන්නේ ය.

මේ වදන් ඇසූ මම, වැසි වලාවක් ගුගුරා වස්වමින් මේ පොළව තෘප්තිමත් කරන්නාක් මෙන් මහාවීරයණි! ඔබ වහන්සේගේ දෙසුමෙන් තුටුවූයෙමි. මම ශීලයද ප්‍රඥාව ද ධර්මය ද ලෝකනායකයන් වහන්සේ ද පසසා අමෘත පදය වූ නිවණ නැමැති ශාන්තියට පැමිණියෙමි. පසුස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ බොහෝ කල් වැඩ වසත් නම් මැනවි. සියල්ලෝම එවිට නොදත් දෙය දැනගනිති. නිවන් අවබෝධ කරගනිති. මේ මාගේ අවසන් ජාතියයි. (උපතයි) සියලු භව නැසුවෙමි. සියලු ආශ්‍රව දූන, ආශ්‍රව රහිතව වෙසෙමි. මීට කල්ප ලක්ෂයකට පෙර බුදුරජාණන් වහන්සේට යම් පැසසීමක් කළෙමි ද ඒ හෙතු වෙන් මේ දක්වා ම දුගතියක නූපන්නෙමි. බුදුගුණ පැවසීමේ විපාක මෙබඳුය. දුන් මම සියලු කෙලෙස් නැසුවෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මෙසේ රහත් ඵලයට පත්වූ උන්වහන්සේ, තමන් වහන්සේ සමග එකට වෙසෙන කය වැඩීමෙහි නියුක්ත භික්ෂූන්ට අවවාද කරමින් මේ ගාථාව වදළහ.

''කායදුට්ඨුල්ල ගරුනො හියමානම්හි ජීවිතෙ
සරීරසුඛගිද්ධස්ස කුතො සමණ සාධුතා ''

එහි ''කායදුට්ඨුල්ලගරුනො'' යනු නොමනා, නොගැලපෙන ආයෝග්‍ය බවයි. කයේ නොමනා හැසිරීම කායදුට්ඨුල්ලභාවය යි. කය වැඩීම් ආදිය ගරුකරන්නා ''කායදුට්ඨුල්ලගරු'' නම් වේ. සසරින් මිදීමේ ප්‍රඥාවෙන් දුරු වූ කය පෝෂණය කිරීමෙහි ම නියැලුණු'' යන අර්ථයයි.

ඒ කාය වැඩීම පමණක් ම ගරුකරන්නාට ''**හීයමානඤ්හි ජීවිතෙ**''වියලීගෙන යන දිය කඩතිවල දියමෙන් ජීවිත සංස්කාරය බොහෝ සෙයින් ක්‍ෂය වන කල්හි,''**සරීර සුඛ ගිද්ධස්ස**'' යනු ප්‍රණීත ආහාර පානාදියෙන් තම කායික සුවය ම පතමින් ගිජුබවට පැමිණි තැනැත්තාට ''**කුතො සමණ සාධුතා**'' මෙබදු පුද්ගලයාගේ ශ්‍රමණභාවයෙන් (මහණකමින්) යහපතක්, යහපත් ශ්‍රමණබවක් කොයින්ද ? කවර කරුණකින් ලැබේද? ඒකාන්තයෙන්ම කයේත් ජීවිතයේත් අපේක්ෂාවක් නොමැති, ලද දෙයින් තුටුවන ඇරඹූ වීර්ය ඇති භික්ෂුවගේම ශ්‍රමණභාවය අර්ථවත් වේ යන අදහසයි.

අධිමුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.5

''එසාව හීයාසෙ පබබතෙන'' යනු ආයුෂ්මත් මහානාම තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී පින් රැස් කරමින් අවුත් සුමේධ නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි එක් බමුණු පවුලක උපන්හ. සියළු බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන්හි කෙළවරට ගිය හෙතෙම ගිහිවාසය අතහැර එක්තර නදී තීරයක අසපුවක් කරවා බොහෝ බමුණන්ට වේද මන්ත්‍ර උගන්වමින් සිටියේය. එක් දිනක් සුමේධ බුදුරජාණන් වහන්සේ ඔහුට අනුග්‍රහ පිණිස ඒ අසපුවට වැඩි සේක. උන්වහන්සේ දක පැහැදුණු සිතින් අසුනක් පැනවූ තාපස බමුණා එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට ඉතා මිහිරි මී පැණි පූජා කළේය. එය වැළඳූ භාග්‍යවතුන් වහන්සේ ඉහත අධිමුත්ත තෙරුන් වහන්සේගේ කථාවෙහි පැවසූ ලෙසම අනාගතය පිළිබඳ විවරණදී වැඩියහ. ඒ පින්කමේ බලයෙන් දෙව්ලොව උපන් ඔහු, ඒ ඒ කාම සුගතීන්හිම සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ සැවැත්නුවර එක් බමුණු පවුලක ඉපිද ''මහානාම'' නමින් ප්‍රකටව විය. වියපත් මහානාම කුමරු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ධර්මය අසා ලැබූ ශ්‍රද්ධා ඇතුව සසුනේ පැවිදි වී කමටහන් රැගෙන නේසාදක නම් පර්වතයෙහි වාසය කළේය. මහානාම තෙරණුවෝ කෙලෙස් මුළුමණින්ම නසා දැමීමට අසමත් වූ සේක්, ''මේ මාගේ කෙලෙස් සහිත ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද?'' යි තම ජීවිතය පිළිබඳව කළකිරී උස් වූ පර්වතය මුදුනට ම නැඟ ''මෙයින් වැටී මැරෙන්නෙමි'' යි තමා වෙනත් අයෙකු මෙන් දක්වමින් මේ ගාථාව වදළහ.

''එසාව හීයාසෙ පබ්බතෙන බහුකූටජසල්ලකිතෙන
නෙසාදකෙන ගිරිනා යසඝ්සිනා පරිච්ජදෙන''

එහි ''එසාව හීයාසෙ'' යනු මහානාමය! නුඹ මේ පැවිද්දෙන් එකතැන නවතින්නේ ය. පිරිහෙන්නේ ය. ''පබ්බතෙන'' වාසය කරන්නාවූ මේ පර්වතයෙන්, ''බහුකූටජසල්ලකිතෙන'' බොහෝ වූ කෙළි ද ගසින්, ඉඳුසල් ගසින් යුක්ත වූ හෝ කෙළිද - ඉඳුසල් ගස්වලින් යුක්ත ''නෙසාදකෙන'' එනම් ඇති, නේ සාද නම් වූ, ''ගිරිනා'' පවිතයෙන්, ගල්පර්වතය වනාහී එකිනෙක ගැලපුණු පුරුක් (පබ්බ) වලින් යුක්තවූ බැවින් ''පර්වතය'' නම් වූත් පසෙක ඇති වනාන්තරාදියෙන් ද ජලාශ වලින් ද සාරවූ ද බෙහෙත් ද්‍රව්‍ය ආදියට නිවාස වූ බැවින් ''ගිරි'' නම් වූත් ස්ථානයකි. එම අර්ථ දෙකින් ම මෙහි ''පර්වතය'' යැයි ද ''ගිරි'' යැයි ද කියන ලදී. ''යසඝ්සිනා'' පර්වතයට අදළ වූ ගුණාංගවලින් ප්‍රකට වූ ප්‍රසිද්ධ වූ ''පරිච්ජදෙන'' යනු නානාවිධ වූ රුක්, ගොමු, ලතාදියෙන් යුක්ත වූ වැසුණු නුඹ වාසය කරන ස්ථානය මැනවින් වැසුණේය. මෙම ගාථාවේ අර්ථය මෙසේය.

''මහානාමය! ඉදින් නුඹ කමටහන් අතහැර විතර්ක බහුල වන්නෙහි නම් වේ. සෙවණ හා දිය සහිත වූ ඉතා සුදුසු වාසස්ථානයක් වූ නේසාදක පර්වතයෙන් පිරිහිණු අයකු නොවේවා'' යනුවෙනි. තෙරණුවෝ මෙසේ තමාට උපදෙස් දෙමින් සංවේගයට පත්වනවාත් සමගම විදසුන් වඩා රහත්බවට පත්වූහ.

එනිසා උන්වහන්සේ තම චරිතාපදනය අපදන පාළියේ මෙසේ දක්වූහ.

''සින්ධුනදී තීරයෙහි මැනවින් කරණ ලද මාගේ අසපුවේ දී මම ලක්‍ෂණ ශාස්ත්‍රය සහිත ඉතිහාසය සිසුන්ට ඉගැන්වූයෙමි. ධර්මය කැමති, විනීත වූ අනුශාසනය අසනු කැමති ඒ සිසුහු ෂඩංග වේදයෙහි (සය වැදෑරුම් වේදයෙහි) පරතෙරට ගියාහු සිඳු ගං ඉවුරෙහි වෙසෙති. භූතයන් පිළිබඳව විමසන උත්පාද ශාස්ත්‍රයෙහි ද අංග ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි ද දක්ෂ වූ උතුම් වූ අර්ථය සොයන්නාවූ ඔවුහු එම වනයේ වාසය කරති. සුමේධ නම් බුදුරජාණන් වහන්සේ අපට අනුකම්පාවෙන් එකෙණෙහිම අප වෙත එළඹියේය. එසේ එළඹි මහාවීර වූ සුමේධ නම් ලෝකනායකයන් වහන්සේ දුටු මම, උන්වහන්සේට තණ ඇතිරියක් සාද දුන්නෙමි. වනයෙන් මී ගෙනවුත් ලෝකයට ජ්‍යෙෂ්ඨයවූ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට පූජාකළෙමි. බුදුපියාණන් වහන්සේ එය වළඳ, මෙසේ වදළහ.

''මා කෙරෙහි පැහැදුණු යම් අයෙක් මෙසේ මා වෙත මී පැණි පූජා කළේ ද ඔහුගේ අනාගතය පිළිබඳව පවසන්නෙමි. ඒ මාගේ වචනය අසවු මේ මී පැණි දානය හා තණ ඇතිරිය පිදීම නිසා මෙතෙම කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. මෙයින් කල්ප තිස් දහසකට පසුව, ඔක්කාක කුලයේ උපදින්නාවූ ගෞතම ශාස්තෘහු ලොව පහළවෙති. මොහු උන්වහන්සේගේ ධර්මය දයාද කරගත් ධර්මයෙන් නිර්මිත වූ ඖරස බුද්ධ පුත්‍රයෙක් ව සියලු ආශ්‍රව සිඳ පිරිනිවන්නේය.''

ඒ මම දෙව් සැප විඳ මිනිස් මවුකුස පිළිසඳ ගත් කල්හි මී පැණිවලින් පොළව තෙමෙමින් මී පැණි වැස්සක් ඇතිවිය. මා ඉතා දුකසේ මවුකුසින් නික්මුණු කෙණෙහි ද නිරතුරුව මී පැණි වැසි ඇතිවිය. ඒ මම වැඩිවිය පත්ව ගිහිගෙයින් නික්ම සසුනේ පැවිදි වූයෙමි. මා හට ආහාර පාන සුලභ විය. මී පැණි දානයේ විපාකය මෙබඳුය. මම දෙව් මිනිස් දෙගතියෙහි සියලු කාම සම්පත් විඳ සමෘද්ධිමත් වූයෙමි මී පැණි දානයේ විපාක වශයෙන්ම ආශ්‍රව ක්ෂය නම්වූ නිවණටද පැමිණියෙමි. වැසි වසින කල්හිද සිව් අගලක් උස්ව වැඩුණු තණ බිම්හි ද පිපුණු මලින් බරවූ ගස්වලින් පිරුණු තැන්හි ද ජනශූන්‍ය වූ තැන, මණ්ඩපය, ගස්මුල් ආදියෙහි ද මම නිතර අනාශ්‍රවව වාසය කරමි. මහත් වූ ද මධ්‍යම වූ ද හීනවූ ද සියලු භව ඉක්ම වූයෙමි. අද මාගේ ආශ්‍රව ක්ෂය විය. දැන් නැවත ඉපදීමක් නැත. මෙයින් කල්ප තිස් දහසකට පෙර යම් දානයක් දුන්නෙම්ද ඒ හේතුවෙන් දුගතියක නූපපන්නෙමි. මී පැණි දානයේ විපාකය මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් නසන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. ''

මෙම ගාථාව මහානාම තේරුන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව ද විය.

මහානාම ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.6

''ඡ ඵස්සායතනෙ හිත්වා'' යනු ආයුෂ්මත් පාරාසරිය තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී කළ ප්‍රාර්ථනාව ඇතිව ඒ ඒ භවයන්හී දී පින් රැස්කර ගනිමින් පැමිණ,

පියදස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී වැදි කුලයෙහි උපන්න. වියපත් වූ ඒ වැදි තෙම හැසිරෙන එක්තරා වන ලැහැබකට, ඔහුට අනුග්‍රහ පිණිස වැඩම කළ, පියදස්සි බුදුරජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදුනහ. ඒ වැදි තෙමේ ද මුවන් සොයමින් එතැනට පැමිණ ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් උන්වහන්සේට සුවසේ වැඩ සිටීමට ආවරණය වන පරිදි කුළුගෙයක් වැනිවූ ගස් අතු මණ්ඩපයක් සාදා, නෙළුම් මලින් එය වසා මහත් වූ ප්‍රීති සොම්නසක් විඳින්නේ සත්දිනක් උන්වහන්සේට වැඳගෙන සිටියේය. දිනපතා මැලවෙන මල් ඔහු ඉවත් කරයි. අලුත් මලින් කූටිය වසයි. ශාස්තෘන් වහන්සේ සත්දින ගෙවුණු පසු නිරෝධ සමාපත්තියෙන් නැගී සිට, භික්ෂු සංඝයා පිළිබඳව සිහිපත් කළ සේක. එකෙණෙහිම අසූදහක් පමණ භික්ෂූහු ශාස්තෘන් වහන්සේ පිරිවරා ගත්හ. "මිහිරි දහම් කථාවක් අසමු"යි දෙවියෝ රැස්වුනහ. එවිට මහත් වූ සමාගමයක් විය. ශාස්තෘන් වහන්සේ පුණ්‍යානුමෝදනාව පවත්වා, ඒ වැදි පුරුෂයා ලබන දෙව් මිනිස් සැප හා මේ බුද්ධෝත්පාද කාලයේ දී ලබන ශ්‍රාවක බෝධිය පිළිබඳව විවරණ දී වැඩිසේක.

ඒ වැදිතෙම එසේ කරන ලද පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ නුවර බමුණු පවුලක ඉපිද වියපත්ව ත්‍රිවේද පාරගත වූයේ පරාසර ගෝත්‍රයේ බැවින් "පාරාසරිය" යනුවෙන් ප්‍රසිද්ධව බොහෝ බමුණන්ට වේද මන්ත්‍ර ඉගැන්වීය. ශාස්තෘන් වහන්සේ රජගහ නුවරට වැඩම වූ අවස්ථාවෙහි බුද්ධානුභාවය දැක ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වූ හෙතෙම විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් බවට පත් වූයේය.

උන්වහන්සේ අපදන පාළියේදී සිය චරිතය මෙසේ දක්වූහ. "තමන් වහන්සේ ම සියල්ල අවබෝධ කරගත්තා වූ ලෝකනායක වූ සර්ඒඳු වූ මුනිගුණයෙන් යුක්ත වූ සමාධියෙහි දක්ෂ වූ පියදස්සී භාග්‍යවතුන් වහන්සේ විවේකය කැමති වූහ. මහා මුනිවූ පුරුෂෝත්තම වූ ඒ පියදස්සි බුදුරජාණෝ වන ලැහැබට පිවිස පාංශුකූල සිවුර අතුරා සමවත් සුවයෙන් වැඩහුන්හ. එකල්හි මම වනයෙහි හැසිරෙන මුව වැද්දෙක් වූයෙමි. නිත් මුවෙකු සොයමින් වනයේ ඇවිද ගිය මම එහිදී චතුරෝඝයන් තරණය කළ ආශ්‍රව රහිත වූ පිපියා වූ සල් ගසක් බඳු වූ අහස මැදට පැමිණි සූර්යයා බඳු වූ සම්බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. දේවාතිදේව වූ මහත් යශස් ඇති ඒ පියදස්සී බුදුරජාණන් වහන්සේ දුටු මම ස්වාභාවිකම හටගත් විලකට බැස පියුම් රැගෙන ආවෙමි. සියක් පත් ඇති මනරම් වූ පියම් රැගෙන ආ මම,

කුළුගෙයක් සාද, එය පියුමින් වැසූවෙමි. පස් මරුන් ජයගත් සත්වයන්ට අනුකම්පා කරන කාරුණික මහාමුනීන්ද වූ පියදස්සී බුදුහු දවල් රෑ සතක් ඒ කුළුගෙයි වියූහ. පරණ පියුම් ඉවත් කළ මම අලුත් පියුම් වලින් කුළුගෙය සෙව්වි කළෙමි. එකෙණෙහිම ඇදිලි බැඳ සිටියෙමි. සමාධියෙන් නැගිට සිටි ලෝකනායක වූ පියදස්සී බුදුරජාණෝ, දස දෙස බලමින් වැඩහුන්හ. එවිට ම පියදස්සී බුදුරජාණන් වහන්සේගේ සුදස්සන නම් අග්‍ර උපස්ථායක භික්ෂුව බුදු සිත දැන, අසූදහක් භික්ෂූන් පිරිවරා වනයේ සුවසේ වැඩහුන් ලෝකනායකයන් වහන්සේ වෙත එළඹියේය. එවිට වන ලැහැබෙහි අධිගෘහිත සියලුම දෙවියෝ ද බුදුසිත දැන එතැනට රැස්වූහ. කුම්භාණ්ඩයන් ද රකුසන් සහිත යකුන් ද රැස්වූ කල්හි, භික්ෂු සංඝයාගේ ද වැඩම වූ කල්හි බුදුහු මෙසේ වදළහ.

''යමෙක් සතියක් පුරා මා පිදුවේ ද මට ආවාසයක් කරවූයේ ද ඔහු කවරෙක්වේදැයි මම පවසමි. එසේ පවසන මාගේ වදන් අසවු, ඉතා දුකසේ දැකිය හැකි වූ ඉතා සියුම් වූ ද ඉතා ගැඹුරු වූද ඒ පින්කම මැනවින් ප්‍රකාශිතය. එය නුවණින් බලා පවසන්නෙමි. ඒ මාගේ වචනය අසවු. මොහු දහතර කල්පයක් දිව්‍යරාජ්‍ය විචාරන්නේය. පියුමක් මෙන් වැසුණු මහත් වූ කුළුගෙයක් අහසේ සිට ඔහුට සෙවන දෙයි. මේ පින්කමේ විපාකය එයයි. මෙතෙම කල්ප දෙදහස් හාරසියයක් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරන්නේය. ඒ සියලු තැන්හිදී මල් මුවා වියනක් අහස් හි පහළ වන්නේය. පියුම් පතෙහි දිය නො තැවරෙන්නා සේ මොහුගේ සිතේ ද ක්ලේශයෝ නොතැවරෙති. මොහු පංචනීවරණ ධර්ම සිතින් දුරලා, සසුන් ගතවීමේ හි සිත් උපදවා ගිහිගෙයින් නික්ම පැවිදිවන්නේය. මල්මුවා විමනක් දරමින් ගිහිගෙන් නික්මෙන්නේය. ප්‍රාඥ වූ සිහියෙන් යුක්ත වූ රුක්මුල් හි වසන මොහුට පැවිදි වූ පසුද මල්වියනක් අහසෙහි දරන්නේය. මොහු චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලාන ප්‍රත්‍යය යන සිවුපසය භික්ෂු සංඝයාට පුද, අනාශ්‍රව වී පිරිනිවන් පාන්නේ ය.

ඒ මම කුළු ගෙයකින් පැවිද්දට නික්මුනෙමි. රුක්මුල් හි වසන කල ඒ කුළු ගෙය ද දරීමි. චීවර පිණ්ඩපාත ආදියෙහි අපේක්ෂාවක් මට නැත. කරන ලද පින්කම නිසා සිවුපසය අනූනව ලබමි. මවිසින් ගණන් කළ නොහැකි කල්ප ගණනක් ඉක්මවන ලද්දේය. ඒ කල්ප හිස් ලෙස ගෙවූ මම බුදුවරු රැසක් අතහැර දමූවෙමි. මෙයින් කල්ප එක්දහස් අටසියයකට පෙර පියදස්සී බුදුහු ලොව පහළවූහ. මම උන්වහන්සේ ඇසුරු කොට මේ ජන්මයට එළඹියෙමි. මෙහිදී පසැස් ඇති අනෝම නම් වූ බුදුරජාණන්

වහන්සේ දැක, එළඹි අනගාරි වූ සසුනෙහි පැවිදි වූ මා හට පස්මරුන් ජයගත් දුක් කෙළවර කළ බුදුහු පිළිවෙත් මග දෙසුවේක. ඒ ධර්මය ඇසූ මම නිවණට පැමිණියෙමි. ශාක්‍ය කුල තිලක වූ ඒ ගෞතම නම් බුදුරජාණන් වහන්සේ සියලු ආශ්‍රව සිඳ අනාශ්‍රව ව වෙසෙමි. මීට කල්ප එක්දහස් අටසියයකට පෙර බුදුරජුන්ට යම් පූජාවක් කළෙමි ද ඒ නිසා දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත් ව තම පිළිවෙත සිහිපත් කර බැලූ පාරාසරිය තෙරණුවෝ හටගත් සොම්නසින් තම ප්‍රීතිය පහළ කිරීම් වශයෙන් මේ ගාථාව වදළහ.

''ඡළජ්ඣායතනෙ හිත්වා ගුත්තද්වාරෝ සුසංවුතෝ
අඝමූලං වමිත්වාන පත්තෝ මෙ ආසවක්ඛයෝ''

එහි ''ඡළජ්ඣායතනෙ හිත්වා'' යනු චක්ෂු සම්ඵස්සාදී සයක් වූ සම්ඵස්සයන්ගේ ඉපදීමට කරුණු වූ බැවින් 'ස්පර්ශායතන' යැයි ලැබූ නම් ඇති චක්ෂු (ඇස) ආදී ආධ්‍යාත්මික ආයතන සය. ඒ හා බැඳුණු කෙලෙසුන් ප්‍රහාණ කිරීම් වශයෙන් අත්හැර, ''ගුත්තද්වාරෝ සුසංවුතෝ'' යනු එම චක්ෂුද්වාරාදිය මනාව වැසූ බැවින් ඒ හා බැඳී පවතින අභිධ්‍යාදී පාපධර්මයන් පිවිසීම වැලැක්වීම් වශයෙන්, සිහිය නැමැති දොර කවුළුව මනාව වසා සංවර වූයෙමි. නැනහොත් මනස සයවැනි කොට ඇති සදොර කියූ ආකාරයෙන්ම රක්ෂා කරනලද බැවින් වැසූ දොර ඇත්තේ, කායාදිය මනාව සංවර වූ බැවින් ''සුසංවුතෝ'' නම් වේ. මෙසේ මෙහි අර්ථ දත යුතුයි. ''අඝ මූලං වමිත්වාන'' සංසාරික දුකට මුල් වූ අවිද්‍යා, භවතණ්හාදී දෝෂ හෝ සියලුම කෙලෙස් දෝෂ, ආර්යමාර්ගය නම් විරේක පානය කිරීමෙන් වමාරා ස්ව සන්තානයෙන් බැහැර කොට ඉවත් කරන ලදුයේ, ''පත්තෝ මෙ ආසවක්ඛයෝ'' කාමාදි ආශ්‍රවයෝ ක්ෂය වන බැවින් හෝ එම ආශ්‍රව නැතිකිරීමෙන් පැමිණිය යුතු බැවින් නිවණ ද අර්හත්ඵය ද 'ආසවක්ඛය' නම් වේ. උන්වහන්සේ ''ආශ්‍රවක්ෂයට පැමිණියහ. අවබෝධ කරගත්හ'' යි උදන් ඇණීම් වශයෙන් රහත්බව ප්‍රකාශ කළසේක.

පාරාසරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.7

''සුවිලිත්තෙනා සුවසනො'' යනු ආයුෂ්මත් යස තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී සසරින් මිදීම සඳහා පින් රැස්කරමින් පැමිණ සුමේධ නම් භාග්‍යවතුන් වහන්සේ ලොව උපන් කාලයෙහි මහානුභාව නාගරාජයෙකු වී උපන්හ. නා රජු බුද්ධප්‍රමුඛ මහා සංඝරත්නය තම භවනට වඩමවාගෙන ගොස් මහදන් පැවැත්වීය. භාග්‍යවතුන් වහන්සේට මහත් අනර්ඝ තුන් සිවුරක් පූජාකළේය. එක් එක් භික්ෂුවට මහත් අනර්ඝ වූ වෙන් වෙන් වස්ත්‍ර යුගල බැගින් ද සියලු ශ්‍රමණ පිරිකර ද පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුපුතෙක් ව මහ බෝ මැඩට සත්විධ රත්නයන්ගෙන් පූජා කළේය. මෙසේ කාම සුගතින් හි ම සැරි සරමින් අවුත් මේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී මහත් සම්පත් ඇති සිටුවරයෙකුට දුව බරණැස් නුවර දී ඉපිද යස නමින් ප්‍රකට විය. ඔහු අතිශයින් සියුමැලිය.

ඔහුට මාලිගා තුනක් විය. මේ ආදී තොරතුරු බන්ධක විනයෙහි (මහාවග්ග පාළි - මහා බන්ධක) විස්තර වන පරිදිම දතයුතුයි. ඒ සිටුපුත් පෙර කුසල කම්බලයෙන් මෙහෙයවනු ලබන්නේ රාත්‍රියේ නිදගත් පිරිවර ජනයාගේ විප්‍රකාර දැක හටගත් සංවේගය නිසා රන්මිරිවැඩි සඟලකින් ගෙයින් නික්ම, දෙවියන් විසින් හැරදමූ නුවර දොරටුවෙන් පිටතට අවුත් ඉසිපතනය සමීපයට පැමිණියේය. ඔහු ''භවත්නි! ඒකාන්තයෙන් තණ්හාදිය විසින් පීඩා කරන ලද්දේය. තණ්හාදී ක්ලේශධර්මවලින් පීඩා කරන ලද්දේය.'' යනුවෙන් පැවසීය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ඉසිපතනයෙහි වැඩවසන සේක්, ඔහුට අනුග්‍රහ පිණිසම එළිමහනෙහි සක්මන් කරන සේක් ''යස! එන්න, මෙහි තණ්හාදී පීඩාවන් නැත. මෙහි තණ්හාදී උපදුවයන් නැත'' යි වදළහ. එය ඇසූ යස කුමරු ''පීඩා නැති උවදුරු නැති ජීවිතයක් ද ඇතැයි'' සතුටුව රන්පාවහන් ගලවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එකත් පසෙක සිටියේය. එසේ සිටි කුමරුට අනුපිළිවෙල කථාව වදළ බුදුරජාණන් වහන්සේ අනතුරුව චතුරාර්ය සත්‍ය දේශනා කළ සේක. එය අසා සෝවාන් ඵලයෙහි පිහිටි යස කුමරු, තමා සොයා පැමිණි පියාට භාග්‍යවතුන් වහන්සේ දෙසූ සත්‍ය පිළිබඳ දම් දෙසුම අසා රහත් ඵලයෙහි පිහිටියේය.

ඒ බව අපදන පාළියේ දී යස තෙරණුවෝ මෙසේ වදළහ.

''මහ සමුදුර සමීපයෙහි මට භවනයක් මැවිණි. සක්වාලිහිණි හඬ ඇති මඳුර, පියුම්, උපුල් මලින් ගැවසුණු පොකුණක් ඒ අසල මැවිණි. ඒ පෙදෙසෙහි සිත්කලු වූ මනා තොටුපල ඇති මස් කැසුබුවන් ගැවසුනු විහඟ සමූහයා රැස්වූ නදියක් ගලාබසී. මොණර, කොස්වාලිහිණි, කොවුල් ආදී පක්ෂි නාදයෙන් ඒ මතරම් නදී පෙදෙස දොඩමලුය. පරවි, රවිහංස, සක්වා ලිහිණි, නදීචර, දිය කිරල, සැළලිහිණි, උණහපුළු, ජීවංජීවක යන මොවුහු එහි රැස්ව සිටියහ. එහි නිති රැවිදෙන හංසයෝ, කොස්වා ලිහිණියෝ, බකමුහුනෝ, පිංගලයෝ යන පක්ෂීහු බොහෝ වූහ. සත්රුවනින් පිරි මිණිමුතු සහිත වැලිද නොයෙක් සුවඳ හමන හැම රන්මුවා වූ ගස් ද ඒ භවනය දිවා රෑ හැමකල්හි බබුලුවයි.

සැටදහක් තූර්යනාද උදේ සවස පැවැත්වෙයි. හැම කල්හිම සොළොස් දහසක් ස්ත්‍රීහු මා පිරිවරාගෙන සිටිති. භවනයෙන් නික්මුණු මම ප්‍රසන්න වූ සිතින් සතුටු සිතින් මහත් යශස් ඇති ලෝකනායක වූ ඒ සුමේධ බුදුරදුන් වැන්දෙමි. බුදුරදුන්ට වැඳ, සංඝයා සහිත උන්වහන්සේට දන් පිණිස ආරාධනා කළෙමි. ලෝකනායක වූ ප්‍රාඥවූ බුදුරජහු එය පිළිගත්හ. අනුතුරුව උන්වහන්සේ මා හට ධර්මකථාවක් කළහ. උන්වහන්සේ වැඳ මාගේ භවනට ගිය මම පිරිවර ජනයා අමතා, ''පෙරවරු කල්හි බුදුරජහු මාගේ භවනට වඩිනසේක. නුඹලා සැම රැස්වවු'' යි පැවසීමි. ඒ පිරිවර ජනයා'' ඔබ සමීපයෙහි විසීම අපට වූ ලාභයකි. යහපත් ලැබීමකි. අපිත් ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේට පූජාවක් කරන්නෙමු''යි පැවසූහ. ආහාරපාන පිළියෙල කළ මම බුදුරදුන්ට කාලය දන්වීමි. ලෝකනායක වූ උන්වහන්සේ ලක්ෂයක් රහතුන් පිරිවරා දනට වැඩිසේක. පසඟතුරු සහිත වූ මම පෙරගමන් කළෙමි. පුරුෂෝත්තම වූ බුදුරජාණන් වහන්සේ මුළුමනින් ම රනින් නිමවූ පුටුවෙහි වැඩහුන්හ. එවිට රනින්ම නිම වූ උඩුවියනක් විය. භික්ෂු සංඝයා අතරෙහි විජිනිපතින් පවන් සලන ලදී. බොහෝ වූ ආහාර පානයන්ගෙන් භික්ෂු සංඝයා සන්තර්පනය කළෙමි. වෙන් වෙන් වූ වස්ත්‍ර යුගල බැගින් මම භික්ෂු සංඝයාට වස්ත්‍ර පිදුවෙමි. ලෝකයාගේ පූජාවන් පිළිගන්නා වූ සුමේධ නම් බුදුපියාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ මෙසේ වදළසේක.

''මා ඇතුළු ශ්‍රාවකයන් ආහාරයෙන්, පානවර්ගවලින් තෘප්තිමත් කළ පුද්ගලයා පිළිබඳව පවසමි. ඒ මාගේ වචනය අසවු, හෙතෙම මින් මතු

කල්ප එක්දහස් අටසියයක් දෙව්ලොව සිත් අලවා වෙසෙන්නේ ය. දහස්වරක් සක්විති රජ වන්නේ ය. දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරන ඔහුට සැමද රන්වන් වියනක් ඇතිවන්නේ ය. මෙයින් තිස් දහස් කල්පයක් ගෙවීමෙන් ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවන සේක. මොහු, උන්වහන්සේගේ ධර්මය දයාද කරගත් ධර්මයෙන් නිර්මිත කළාවක් වැනි වූ බුද්ධපුත්‍රයෙක් වන්නේ ය. සියලු ආශ්‍රව දූන අනාශ්‍රව වූයේ පිරිනිවන් පාන්නේ ය. හෙතෙම භික්ෂු සංඝයා මැද හිඳ අභීත සිංහනාද කරන්නේය. මළ සිරුර මත පවා ඡත්‍රයක් දරන්නේය. ඡත්‍රය යටදී උන්වහන්සේගේ සිරුර ආදහනය වන්නේය. ''මම දූන් සෝවාන් ආදී මගඵල නුවණ ලබා සිදුකරගත් ශ්‍රමණ ඵල ඇත්තෙක්මි. මම සියලු කෙලෙස් දූවූවෙමි. මණ්ඩපයක හෝ රුක් මූලක සිටී මා හට සන්තාපයක් ඇති නොවේ. මෙයින් කල්ප තිස්දහසකට පෙර දුන් දානයේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. සියලු දේ දීමෙහි විපාකය මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි. ''

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් යස දෙසට දකුණු අත දිගුකොට ''මහණ ! මෙහි එව'' යි වදළසේක. එම වදන පිටවීමත් සමග ම කෙස් රවුල් දැගුල් පමණ වී අටපිරිකර දරණ සැට වයස් පිරි තෙරුන්වහන්සේ කෙනෙකු මෙන් පෙනී සිටි යස තෙරුණුවෝ තමාගේ පිළිවෙත් පිරීම නැවත සිහිකර බලා උදන් අනනසේක් ඒහිභික්ෂුභාවයට පෙර අවස්ථාව දක්වමින් මේ ගාථාව වදළහ.

''සුවිලිත්තෝ සුවසනෝ සබ්බාභරණභූසිතෝ
තිස්සෝ විජ්ජා අජ්ඣගමිං කතං බුද්ධස්ස සාසනං''

එහි ''සුවිලිත්තෝ'' යනු සුන්දරවූ කොකුම් සඳුන් ආලේප කරගැනීමෙන් සුවඳ වත් වූ ශරීරාවයව ඇති වූයෙමි. ''සුවසනෝ'' ඉතා යහපත් මහාර්ඝ වූ කසී සළු හඳින පොරවන අයෙක් වීමි. ''සබ්බාභරණභූසිතෝ'' ශීර්ෂාභරණාදී සියලුම ආභරණවලින් අලංකාරවත් වූ යෙමි. ''අජ්ඣගමිං'' යනු අවබෝධ කරගත්තෙමි. ත්‍රිවිද්‍යාව ලැබූවෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

යස තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.8

"**අහිසඤ්ඤාව නිපතති**" යනු ආයුෂ්මත් කිමිබිල තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ; පෙර කකුසඳ නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද තරුණ වියට පත්වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ධාතූන් වහන්සේ උදෙසා, එම සිටුතුමා විසින් හොර දඬුවලින් මණ්ඩපයක් කරවා පූජා කරන ලදී. ඒ පින්කමේ විපාක වශයෙන් තව්තිසා දෙව්ලොව උපන් හෙතෙම කාම සුගතීන්හිම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිලවත්තු නගරයේ ශාක්‍ය පවුලක උපන්නේය. කිමිබිල නමින් ප්‍රකට වූ ඒ කුමරු වැඩිවියට පත්ව කාමයෝගී සම්පතින් ආඪ්‍යව වාසය කළේය. ඔහුගේ නුවණ මුනුකුරා ගිය බව දුටු බුදුරජාණන් වහන්සේ ඔහුගේ සිතේ සංවේගය ඇතිකිරීමට අනුපිය අඹවනයේ දී ඉතා තරුණවියේ සිටි දැකුම් කළු ස්ත්‍රී රූපයක් මවා ඔහු ඉදිරියේ දිම ක්‍රමයෙන් ජරාවට පත්වන, රෝගාබාධයන්ට ලක්වන ආකාරය දැක්වූ සේක. එය දුටු කිමිබිල කුමරු දැඩි සේ සංවේගයට පත්ව මේ ගාථාව පැවසීය.

"අහිසඤ්ඤාව නිපතති
වයෝ රූපං අඤ්ඤමිව තථේව සන්තං
තඤ්ඤේව සන්තෝ අවිපාවසන්තෝ
අඤ්ඤඤ්ඤේව සරාමි අත්තානං"

එහි "**අහිසඤ්ඤාව**" 'නුඹ වහා ගෙවී යනුව' යි දෙවියන් විසින් අණකරන, නියෝග කරන ලද්දෙකු මෙන් "අහිසන්තොව" යන පාඨය ද යෙදේ, නුඹ වහා යව! කිසියම් ආශාවකින් දිව යන්නෙකු මෙන්, "**නිපතති**" වේගයෙන් වැටේ, වේගයෙන් ගතවේ. ක්ෂණයක් ක්ෂණයක් පාසා ක්ෂයභාවයට, ව්‍යය වන ස්වභාවයට පැමිණෙ ! යන අර්ථයයි. "**වයෝ**" බාල, තරුණ ආදී ශරීරයේ අවස්ථා විශේෂය දැක්වීමකි, මෙහි දී තරුණ අවස්ථාව අදහස් විය, ඒ තරුණ අවස්ථාව වහා වැටේ, වහා ක්ෂය වී යයි, "**රූපං**" යනු රූප සම්පත්තියයි. "රූප" යන්නෙන් ශරීරය අදහස් වේ. "ඇට, නහර මස් ආදියෙන් යුතු ආකාශයෙන් පිරිවරාගත් රූපයම මෙහිදී අදහස් වේ." ආදියේ දක්වන ලද්දක් මෙණි. "**අඤ්ඤමිව තථේව සන්තං**" මේ රූපය යම්සේ තමා ම ඒ ආකාරයෙන් ම පවතින, විද්‍යමානවන අනිකක් (වෙනත් දෙයක්) මෙන් මට වැටහේ, ඇතැමෙක් "තථේව සන්තං"

යනුවෙන් පමණක් දක්වති. ''**නසෙසව සතො**'' ඒ මාගේ අනිකකු නොවූ ආත්මයම, මාගේ ශරීරයම, ''**අච්ඡ වසතො**'', ''බොහෝ කාලයක් වෙන්ව විසුවේ නම් අනිකකු නොවූවත් අනිකකු මෙන් වැටහේ, ඒ කාරණය ද මෙහිදී මම නැත,'' යන අදහසයි. ''**අඤඤසෙසව සරාමි අත්තානං**'' මේ මාගේ ආත්මභාවය වෙනත් සත්ත්වයකු මෙන් සිහිකරමි, සළකමි, හැඳිනගනිමි, යන අර්ථයයි.

මේ අයුරින් රූපයේ අනිත්‍යබව මෙනෙහි කළ කිම්බිලි කුමරුට දැඩි වූ සංවේගයක් ඇතිවිය. උපත් සංවේග ඇති හෙතෙම ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ, ධම් අසා, ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදිවුයේ විදසුන් භාවනාවෙහි සිත පිහිටුවා නොබෝ කලකින් ම රහත්බවට පත්විය.

අපදන පාළියේ දී උන්වහන්සේ මෙසේ පවසන ලදී.

''විසූ බඹසර ඇති පාපධම් බහාතැබූ කකුසඳ බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි, උන්වහන්සේට මම හොරදඬුවලින් මණ්ඩපමාලයක් කරවුයෙමි. තව්තිසාවේ උපත් මම එහිදී උතුම් පහයක් ලැබුවෙමි. සෙසු දෙවියන් ඉක්මවා සිරි සැපතින් බැබලුනෙමි. මා කළ පින් කමේ විපාකය මෙබඳුය. දවල් රෑ සක්මන් කරන හා සිටගෙන සිටින මා නිතර සලල මලින් වැසුණෙමි. ඒ පින්කමෙහි විපාක මෙබඳුය. මේ කල්පයේ දී ම යම් බුදුකෙනෙකු පිදුවෙමි ද එනිසා දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ කිම්බිල තෙරණුවෝ තමාට මුලින් ගිහි අවස්ථාවේ උපත් අනිත්‍යතාව මෙනෙහි කරමින්, එය ප්‍රකටව දක්වනසේක් එම ගාථාවම නැවත වදළහ. එනිසා එම ගාථාව කිම්බිල තෙරණුවන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථාව ද විය.

කිම්බිල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.9

''**රුක්ඛමූලගහණං පසක්කිය**'' යනු ආයුෂ්මත් වජ්ජිපුත්ත තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ඒ ඒ භවයේ හි දී තව තවත් පින්දහම්

සිදුකරමින් අවුත්, මෙයින් කල්ප අනූ හතරකට පෙර දී එක් පසේ බුදුවරයන් වහන්සේ කෙනෙකුන් පිඬුපිණිස හැසිරෙනු දැක පැහැදුණු සිතින් කෙසෙල් ගෙඩි පූජාකළහ. හෙතෙම ඒ පින්කම නිසා දෙව්ලොව ඉපදී තව තවත් පින් රැස්කරමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරි සරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී විශාලා මහනුවර ලිච්ඡවී රජ පවුලක කුමරෙක් ව උපන්නේය. වජ්ජි රජ පුතෙකු බැවින් ''වජ්ජිපුත්ත'' යන නමින් ඔහු හැඳින්විණි. එකුමරු කුඩා කාලයේ දිම හස්ථශිල්පාදිය උගන්නා සමයෙ හි පූර්ව හේතු වශයෙන් ගිහිගෙන් නික්මීමේ ආශාවෙන් හැසිරෙනුයේ ශාස්තෘන් වහන්සේ ධර්මදේශනා කරන වේලාවෙහි විහාරයට ගොස් පිරිස කෙළවර හිඳ ධර්මය අසා ලැබූ ශ්‍රද්ධාවෙන් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදිවිය. වජ්ජිපුත්ත තෙරණුවෝ විදසුනෙහි සිත පිහිටුවා භාවනා කර, නොබෝ දිනකින් ම ෂඩ් අභිඥාලාභියෙකු වූහ.

අපදන පාළියෙහිදී උන්වහන්සේ තම අතීතය මෙසේ පැවසූහ.

''තමාම සත්‍යය අවබෝධ කරගත්, අපරාජිත වූ දහසක් රශ්මි ඇති භාග්‍යවතුන් වහන්සේ විවේකයෙන් නැගී සිට පිඬු පිණිස නික්මුණු සේක, අතින් ඵල රැගෙන මම උන්වන්සේ වෙත ගියෙමි, පැහැදුණු සිතින් සතුටින් යුක්තව මම උන්වහන්සේට නැටි සහිත වූ ඵල පිළිගැන්වූයෙමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර ඵලදනයක් දුන්නෙමි් ද එහි විපාකය වශයෙන් මේ දක්වා ම දුගතියක නූපන්නෙමි, මවිසින් දුන් සියලු කෙලෙස් දවන ලදී. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥාලාභී වූ උන්වහන්සේ, ඊට පසු කාලයක, ශාස්තෘන් වහන්සේ පිරිනිවි නොබෝ කලකින් ධර්මය සංගායනා කිරීමට සනිටුහන් කරගත් මහතෙරුන් වහන්සේලා ඒ ඒ තැන වාසය කරන කල්හි, එක් දිනක් සේඛයකු වූ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් මහත් වූ පිරිසක් සහිතව ධර්මදේශනා කරමින් සිටිනු දැක, ආනන්ද තෙරණුවන් ඉහළ මාර්ගඵල අවබෝධයට යොමුකරවීම සඳහා උත්සාහවන්ත කරවීමට මේ ගාථාව වදළහ.

''රුක්ඛමූලගහනං පසක්කිය
නිබ්බාණං හදයස්මිං ඔපිය
ඣාය ගොතම මා පමාදෝ
කිං තෙ බිලිබිලිකා කරිස්සති''

එහි ''රුක්ඛමූලගහනං'' යනු රුක් මූලයන්ගේ ගහනය, වනය වඳාළ බව දක්වයි. වන ගහන ඇති මුත් රුක්ඛ මූලයක් නැත. රුක්ඛ මූලයක් ඇත ගහනයක් නැත. ඒ ගහනයක් මෙන් වූ රුක් මුල්හි වූ වන වදුලේ සෙවණ සහිත බැවින් අවුවැසි ආදියෙන් උපද්‍රවයන්ගෙන් හා ජනයාගේ සම්බාධවලින් දුරු වූ බවද දක්වයි. ඒ දෙකම භාවනාවට යෝග්‍ය වේ. ''**පසකතිය**'' පැමිණ, එතැනට ගොස්, ''**නිබ්බානං හදයසම්ිං ඔපිය**'' මෙසේ මා විසින් පිළිපැද නිවණ අවබෝධ කරගත යුතු''යි යනුවෙන් නිවණ සිතේ තබාගෙන, හදවතෙහි තබාගෙන ''**සඛාය**'' අනිත්‍යාදී ලක්ෂණ මෙනෙහි කරමින් ධ්‍යාන වඩන්න. විදර්ශනාව සහිත වූ මාර්ග භාවනාව වඩන්න. ''ගෞතම'' යනුවෙන් ධර්ම භාණ්ඩාගාරිකයන් වහන්සේට ගෝත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි. ''**මා ච පමාදෝ**'' අධිකුසල දහම් හි පමා නොවන්න. දැන් තෙරුන්වහන්සේගේ ප්‍රමාද වීම ප්‍රතික්ෂේප කළයුතු බව දක්වමින් (ඊට විරුද්ධ බව දක්වමින්) ''කිං තෙ බිලිබිලිකා කරිස්සති'' යනුවෙන් ''බිලිබිලි හඬ කවර අර්ථයක් නුඹට සලසන්නේ ද?'' අසයි. එහි ''බිලිබිලිකා'' යනු බිලිබිලි ක්‍රියාවයි. බිලි බිලි යන හඬ පවතින නිරර්ථක වූ ක්‍රියාවකි. මෙබඳු නිරර්ථක වූ බිලිබිලි ශබ්ද නැගීමට ජනතාව සමඟ කරන කථා බහ සමානය. ''**කිං තෙ කරිස්සති**'' එම ක්‍රියාවෙන් නුඹට කුමන අර්ථයක් - යහපතක් ඉටුවේ ද? එනිසා ජනයා සමඟ කරන නිරර්ථක කතාබහ ඉවතලා ස්වාර්ථයෙහි ම යෙදෙන්නැයි අවවාද දෙයි. එය අසා අන්‍යයන් විසින් පැවසූ විදසුන් නම් සුවද පවනින් උපන් සංවේග ඇති වූ ආනන්ද තෙරණුවෝ විදසුන් භාවනාවෙහි ම උත්සාහවත්ව රෑ බොහෝ වේලාවක් සක්මණින් කල්යවා, සෙනසුනට පිවිසියහ. එහි පිවිස ඇදෙහි හොත් (දිගා වූ) ඇසිල්ලෙ හි ම රහත් බවට පත්වූහ.

වජ්ජිපුත්ත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

1.12.10

''**පඤ්චකඛන්ධා පරිඤ්ඤාතා**'' යනු ආයුෂ්මත් ඉසිදත්ත තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? පෙර බුදුවරු ඉදිරියෙහි දී නිවන් පතාගෙන කළ ප්‍රාර්ථනා හා පුණ්‍යසම්භාර ධර්ම රැස්කරගනිමින් පැමිණි මෙතෙම, විපස්සි භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද වැඩිවියට පත් ව සිටියේ ය. ඒ සිටුතුමා දිනක් භාග්‍යවතුන් වහන්සේ වීථියෙහි වඩිනු

දක පැහැදුණු සිතින් එක් මිහිරි ආමෝද ඵලයක් උන්වහන්සේට පිළිගැන්විය. ඒ පින්කමේ විපාක ලෙස දෙව් ලොව උපන් ඔහු, තව තවත් පින්දහම් සිදුකරමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරි සරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී අවන්තික රට වඩා නම් ගමේ එක් සාත්තුවාහකයකුගේ පුතු ව ඉපදුණෝය. ඉසිදත්ත නමින් ප්‍රකට වූ ඒ කුමරු තරුණවියට පත්ව, මච්ඡිකා සණ්ඩයේ චිත්ත ගෘහපතියාගේ නොදුටු මිතුරෙක් ව වාසය කළේය. චිත්ත ගහපති විසින් බුදුගුණ ලියා යැවූ හසුන කියවා බුදුසසුන කෙරෙහි හටගත් ප්‍රසාදයෙන් ඉසිදත්ත, මහා කච්චායන තෙරුන් සමීපයෙහි දී පැවිදි ව, විදසුන් වඩා නොබෝ දිනකින්ම ෂට් අභිඥා උපදවා ගත්තේය.

අපදන පාළියේ දී මෙසේ උන්වහන්සේගේ චරිතය දක්වන ලදී.

''ලෝකයාගේ පූජාවන් පිළිගත්නා වූ රන්වන් පාටින් බබළන විටියෙහි වඩින බුදුරජාණන් වහන්සේ දැක, උන්වහන්සේට අමෝද ඵලයක් පිදුවෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් ඵල දනයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා ම මම දුගතියක නුපන්නෙමි. ඵල දනයේ විපාකය වශයෙන් මේ දක්වා ම මම දුගතියක නුපන්නෙමි, ඵල දනයේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂට් අභිඥාලාභී වූ ඉසිදත්ත තෙරණුවෝ ''බුදු උවටැනට යන්නෙමි'' යි ස්වකීය ගුරු හිමියන්ගෙන් අවසර ගෙන අනුපිළිවෙලින් මධ්‍ය දේශයට පැමිණ ශාස්තෘන් වහන්සේ සමීපයට වැඩම කළහ. තමන් වහන්සේට වැඳ එකත් පසෙක සිටි ඉසිදත්ත තෙරුන්ගෙන් ශාස්තෘන් වහන්සේ ''මහණ! කෙසේද යැපිය හැකි ද? ඉවසිය හැකි ද?'' යනාදී වශයෙන් විමසා කරන ලද පිළිසඳර කථා ඇති සේක, ''භාග්‍යවතුන් වහන්සේ! නුඹ වහන්සේගේ සසුනට පිවිසි කාලයෙහි පටන්ම මගේ සියලු දුක් දුරු වුයේය. සියලුම උපද්‍රව සංසිදුණේය'' යනුවෙන් පැවසූ, ඉසිදත්ත තෙරුණුවෝ සිය රහත්බව ප්‍රකාශ කරන සේක් මේ ගාථාව වදළහ.

''පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා
තිට්ඨන්ති ඡින්නමූලකා
දුක්ඛක්ඛයෝ අනුප්පත්තෝ
පත්තෝ මේ ආසවක්ඛයෝ''

එහි ''පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා'' යනු මගේ මේ පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව විඳසුන් ප්‍රඥාව සහිත වූ මාර්ග ප්‍රඥාවෙන් ''මෙය දුකයි, මෙපමණක් ම දුක ඇත, මෙයින් මත්තෙහි දුක නොපවතී'' යනුවෙන් සියලුම ආකාරයෙන් පිරිසිඳ දැන, ඒ පිළිබඳව පඤ්චස්කන්ධය පිළිබඳ තවත් දතයුතු කිසිවක් නැත යන අදහසයි. ''**තිඨන්ති ඡින්නමූලකා**'' යනු සියලුම ආකාරයෙන් පිරිසිඳ දත් බැවින් ම ඒවායේ අවිද්‍යා, තණ්හා දී මුලයන් මුලුමණින් ම සිඳ ආර්‍ය මාර්ගයෙන් ප්‍රහීණ කරන ලද බැවින්, මේ පඤ්චස්කන්ධයෝ අවසන් සිත නිරුද්ධ වීම දක්වා පමණක් සිටිති. ''දුක්ඛක්ඛයෝ අනුප්පත්තෝ'' මුල් සිඳදමන ලද බැවින් ඒ පඤ්චස්කන්ධය ආශ්‍රිත සංසාරික දුක ක්ෂය කරන ලදී. නිමා කරන ලදී. නිර්වාණය අවබෝධ කරගත්තෙමි. ''**පත්තෝ මෙආසවක්ඛයෝ**'' කාමාශ්‍රවාදී සියලු ආශ්‍රව ක්ෂය කළ කල්හි, අවබෝධ කරගත යුතු බැවින් ''ආසවක්ඛය'' නම් වූ ''රහත්බවට පත්වූයෙමි. රහත් බව ලැබුවෙමි.'' යන අර්ථයයි. ඇතැමෙක් මෙතැන දී ''ආනන්තිමායං සමුස්සයෝ'' යන පාඨයක් දක්වති. නිවණ අවබෝධ කරගත් බැවින් මගේ මේ ආත්මභාවය අවසන් වූයේය. අවසන් ආත්ම භාවය ගතකරන මා හට පුනර්භවයක් නැත යනු එහි අර්ථයයි.

මෙම වර්ණනාවේදී යම් පදයක අර්ථ නොපැවසූයෙම් ද එම පදයන්ගේ අර්ථ ඉහතින් පැවසූ හෙයින් අර්ථාවබෝධය ඉතා පහසු වේ.

ඉසිදත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දෙළොස්වන වර්ගයේ අර්ථවර්ණනාව සමාප්තයි.

මේ පරමත්ථදීපනී නම් ථෙරගාථා අර්ථ වර්ණනාවෙහි එක සිය විස්සකට අධික වූ ථෙරගාථාවලින් යුක්ත ඒකනිපාතයේ අර්ථවර්ණනාව නිමියේ ය.

2.1.1

දුක නිපාතයෙහි "නත්ථි කොචි භවො නිච්චො" යනු ආයුෂ්මත් උත්තර තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? මෙතෙම පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව නිවන් පතාගෙන ඒ ඒ භවයේ දී පින් රැස්කරමින් අවුත් සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී විද්‍යාධරයෙක් ව ඉපිද අහසෙහි සැරිසරයි. එසමයෙහි ශාස්තෘන් වහන්සේ ඔහුට අනුග්‍රහ පිණිස ම වනයේ එක් රුකක් මුල හුන්සේක. අහසින් යමින් සිටි විද්‍යාධරයා සවණක් ගණ බුදුරැස් විහිදුවමින් සිටි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිත් ඇත්තේ, අහසින් බැස, ඉතා පිරිසිදු වූ මහත්වූ කිණිහිරි මලින් භාග්‍යවතුන් වහන්සේ පිදුවේය. බුද්ධානුභාවය නිසා එම මල් ශාස්තෘන් වහන්සේගේ මස්තකයෙහි ඡත්‍රයක් ලෙස පිහිටියේය. ඒ දුටු විද්‍යාධරයා බෙහෙවින් ප්‍රසන්න වූ සිත් ඇතිව, ඊට පසුකලෙක දී මියගොස් තව්තිසා දෙව්ලොව ඉපිද, මහත් වූ දිව්‍ය සැප සම්පත් විඳිමින් ආයු ඇතිතෙක් එහි සැපවිඳ, ඉන්වුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහ නුවර බමුණු මහසල් කුලයක උපන්නේය. උත්තර නමින් ප්‍රකට වූ මේ බමුණු කුමරු වැඩිවියට පත්වත්ම සියලු බ්‍රාහ්මණ ශිල්පශාස්ත්‍රයෙහි පරතෙරෙට ගොස්, ජාතියෙන් ද රූපයෙන් ද ඉගෙනීමෙන් ද වයසින් ද ශ්‍රේෂ්ඨ වූ හැසිරීමෙන් ද ලොව සම්භාවනීයත්වයට පත්විය. මේ උත්තර බමුණාගේ සම්පත් දුටු වයස්කාර නම් මගධ මහාමාත්‍යයා තම දුවණිය ඔහුට විවාහ කරදීමට කැමතිව, තම අදහස දන්වන ලදී. උත්තර බමුණාගේ සිත ගිහිගෙයින් නික්මීමෙහි ඇලී නිබූ බැවින් එම යෝජනාව ප්‍රතික්ෂේප කර, වරින් වර ධර්මසේනාපති සැරියුත් තෙරුන් ඇසුරුකරමින් උන්වහන්සේ සමීපයේ හිඳ ධර්මය ඇසීය. ධර්මශ්‍රවණයෙන් උපදවාගත් ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ උත්තර භික්ෂුව වත් පිළිවෙතින් යුක්තව සැරියුත් තෙරුන්ට උපස්ථාන කළේය.

එසමයෙහි සැරියුත් තෙරුන්ට එක්තරා ආබාධයක් ඇතිවිය. උන්වහන්සේට බෙහෙත් ගෙන ඒමට උදෑසනින්ම විහාරයෙන් නික්මුණු උත්තර සාමණේරයෝ පා සිවුරු රැගෙන වඩිනුයේ අතරමග එක් විල් තෙරක පාත්‍රය තබා ජලය ගෙන මුව සෝදමින් සිටියහ. මේ වේලාවෙහි ම එක්තරා උමං සොරකු රාජපුරුෂයන් විසින් ලුහුබඳිනුයේ ප්‍රධාන දොරටුවෙන් ම නගරයට පිවිස පලායන්නේ, තමන් විසින් සොරාගත් රන්බඩු විල්තෙර තිබූ පාත්‍රයේ දමා පලා ගියේය. මුව සෝදගත් සාමණේරයෝ පාත්‍රය සමීපයට පැමිණියහ. එවිටම රාජපුරුෂයෝ එතැනට පැමිණ, පාත්‍රයේ

වූ බඩු දැක, ''මේ සොරාය, මොහු විසින් සොරකම කරන ලද''යි සාමණේරයන් දැඩිව අල්ලා බැද වස්සකාර බමුණාට දුක්වූහ. එකළ වස්සකාර ඇමතියා රාජ නියෝගයෙන් අධිකරණ කටයුතු විමසයි. හෙතෙම උත්තර සාමණේරයන් හැඳිනගෙන, ''නුඹ පෙර මගේ වචනය පිළිනොගෙන පිරිසිදු පාසණ්ඩයන් කෙරෙහි පැවිදිවීයැ''යි බදින ලද වෛර ඇති බැවින් නඩුව නොවිමසාම'' මොහු දිවැස් නුළ තබව''යි නියෝග කළේය.

ඉක්බිති ඔහුගේ නුවණ මුහුකුරා ගිය බව දුටු භාග්‍යවතුන් වහන්සේ, එතැනට ගොස් සෙළවෙන්නා වූ නිය නම් මැණික් රැසින් ශෝභමාන වූ වැඟිරෙන දැහිගුල් රන් රස දහරක් වැනි වූ දැලින් බැඳුණු මෘදු - තරුණ දිගු ඇඟිලි සහිත බබලන ශ්‍රී හස්තය උත්තර සාමණේරයන්ගේ හිසෙහි තබා, ''උත්තරය! මේ නුඹගේ පෙර කර්මයක විපාකයයි. එහිදී නුඹ විසින් ප්‍රත්‍යවේක්ෂා බලයෙන් ඉවසාගැනීම කලයුතුයි'' යනුවෙන් වදරා සාමණේරයන්ගේ අදහසට අනුකූල වූ ධර්මයක් දේශනා කළසේක. උත්තර සාමණේරයෝ අමාවෙන් අභිෂේක කරන ලද්දක් මෙන් ශාස්තෘන් වහන්සේගේ හස්ත ස්පර්ශයෙන් හටගත් සතුටින් මහත් වූ ප්‍රීතියක් විඳිනුයේ නුවණ මුනුකුරා ගිය පරිදි විදසුන් මාර්ගය වඩා, ශාස්තෘන් වහන්සේ දෙසූ විලසින් ම මගපිළිවෙලින් සියලු කෙලෙස් ක්ෂය කොට අර්හත්ඵලාභී වූහ.

උත්තර තෙරුණ් විසින් අපදාන පාළියේදී මෙසේ පවසන ලදී.''දෙතිස් මහ පුරිස ලකුණින් හෙබි සුමේධ නම් බුදුරජාණන් වහන්සේ, විවේක සැප කැමතිව හිමවතට එළඹිසේක. පුරුෂෝත්තම වූ කරුණාවෙන් අග්‍ර වූ බුදුපියාණන් වහන්සේ හිමවතෙහි පලක් බැඳ වැඩහුන් සේක. එකල මම අහසෙහි හැසිරෙන විද්‍යාධරයෙක් වුයෙමි. මනාව සෑදූ ත්‍රිශූලයක් ගෙන අහසෙහි හැසිරුණෙමි. කඳු මුදුනක වූ ගින්නක් මෙන් ද පුන් පෝදා සඳ මෙන් ද මෙන් ද මනාව පිපුණු සල් ගසක් මෙන් ද බුදුරජානෝ වනයෙහි බබළති. ඒ සවණක් ගණ බුදුරැස් වනයෙන් නික්මෙයි. නළ වනයේ හටගත් ගින්නක් බදු බුදුරැස් දැක සිත පැහැදවුයෙමි. ඒ මේ අත බැලූ මම දිව සුවද හමන කිණිහිරි මල් දැක ඉන් මල් තුනක් ගෙන බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ පිදුවෙමි. ඒ පිදූ මල් තුන බුද්ධානුභාවයෙන් නැවි උඩට හා පෙති යටට සිටිනසේ අහසෙහි සිටිමින් බුදුරදුන්ට සෙවන සැපයුවේය. මැනවින් කළ ඒ කර්මය හා චිත්ත ප්‍රාර්ථනාව නිසා මිසිස් සිරුර හැර මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

එහි මැනවින් නිර්මිත මගේ විමානය ''කණිකාරි'' නමින් හැඳින්විණි, එය යොදුන් සැටක් උසය, තිස් යොදුනක් පුළුල් ය. භාග දහසක් ඇති එහි

ගෝලාකාර මුදුන් සීයකි. ධජ පතාකයන් ගෙන් පිරි නිල්වන් වූ ඒ මගේ විමානයෙහි ලක්ෂයක් ප්‍රධාන ශාලා පහළ විය. එහි කැමති තැනක කැමතිතාක් රන්මය, මැණික්මය, පද්මරාග මාණික්‍යමය, මිණිමය, රිදීමය ආසන පහළ වේ. එහි පුලුන් කොට්ට සහිත දෙදවටු එක්දවටු ඇතිරිලි හා කොට්ටවලින් පිරි මා හැඟි යහන් ද ඇත. යම් කලෙක භවනයෙන් නික්ම දිව්‍ය සමූහයා පිරිවරා යනුකැමතිව දිව්‍ය චාරිකාවට එළඹුණු කල්හිම මල් වියන් මා පිරිවරා ගනියි. මගේ මස්තකයේ හාත්පස සියක් යොදුන් ප්‍රදේශය කිණිහිරි මලින් වැසේ. හැටදහක් තූර්ය වාදකයෝ උදේ සවස මට උවටැන් කරති. රෑ දහවල් ඔවුහු මා පිරිවරා ගෙන සිටිති. එහි නැටුම් - ගැයුම් - වැයුම් - තාල - වාදන - ක්‍රීඩාදියෙන් සිත් අලවා වෙසෙන මම කාම සම්පත්තියෙන් මුදිත වූයෙමි. ඒ තව්තිසා භවනයේ වූ උතුම් විමානයේ ස්ත්‍රීන් පිරිවරා ගත් මම දිව සැප වින්දෙමි. පන්සිය වරක් දිව්‍යරාජව උපන් මම තුන්සිය වරක් සක්විති රජකම දරුවෙමි.

මා ලැබූ ප්‍රදේශ රාජ සම්පත් ප්‍රමාණය ගණන් කළ නොහැක. කුඩා මහත් භවනයන් හි සැරි සරූ මම මහත් වූ භෝග සම්පත් අනුභව වැළඳූයෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. දිව්‍ය හා මනුෂ්‍ය යන කාම සුගතීන් හිම සැරිසරා මම දුගතියක නූපන්නෙමි. මේ බුද්ධ පූජාවේ විපාකයයි. ක්ෂත්‍රිය හා බ්‍රාහ්මණ කුලයන්හි හැර අන් කුලයක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. එහි විපාක වශයෙන් ඇති, අස් රථ ද සිවිකා හා ස්‍යන්දන රථ ද ලැබූ මා වටා දැසි දස් සමූහයා ද මැනවින් සැරසුණු ස්ත්‍රීනු ද පිරිවරා ගනිති. කෝසෙය්‍ය, කම්බලි, කොමු හා සපුපිළි ද යන මේ සියල්ල ලැබුවෙමි. නව වස්ත්‍ර, නව ඵල, අභිනව අග්‍රරස භෝජන ලැබූ මම "මෙය කව, මෙය අනුභව කරව, මෙහි සැතපෙව" යනාදී වදන් නිතර ඇසීමි. සැමතන්හි පුදන ලද මාගේ කීර්තිය දසත පැතිරුණි. හැමකල්හි සමූහයා විසින් මා පිරිවරා සිටිත්, නොබෙදුණු සමගි පිරිස් පිරිවරා ගත් මම ඥාතීන් අතර උතුම් වූයෙමි. ගීත - උෂ්ණ නොදත් මා හට දවීමක් පිරිතැවීමක් නොවිණි. එමෙන්ම සිතේ දුක් දොම්නසක් ද නොවිණි. භවයෙන් භවයට රන්වන් සිරුරු ඇතිව සැරිසරූ මාගේ ශරීරය විවර්ණ බවට නොගියේය. බුද්ධ පූජාවේ විපාක ලෙස දෙව්ලොවින් චුත වූ මම සැවැත් නුවර ආඪ්‍යවූ බමුණු මහසල් කුලයක උපන්නෙමි. පස්කම් සැප හැරදැමූ මම සත් වියේදීම රහත් බවට පත් වූයෙමි. පසැස් ඇති බුදුරජාණන් වහන්සේ මාගේ ගුණ දැන මා උපසම්පද කරවූහ. බුද්ධ පූජාවේ විපාක වශයෙන් තරුණ වූ මම පිදිය යුත්තෙක් වූයෙමි.

මාගේ දිව ඇස පිරිසිදුය. සමාධියෙහි දක්ෂ වූ මම අභිඥාවන්හි කෙළ පැමිණියෙමි. සිවුපිළිසිඹියාපත් සෘද්ධිපාදයන් හි දක්ෂ වූ මම ධර්මය පිළිබඳ විශාරද වූයෙමි. බුද්ධ පූජාවේ විපාකය මෙබඳුය. මෙයින් කල්ප තිස් දහසකට පෙර බුදුකෙනෙකුන් පිදීමේ පිනින් මේ දක්වා ම මම දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. - පෙ - බුදුරදුන්ගේ අනුශාසනය ඉටුකළෙමි.''

දිවැස් නුළ හිඳගෙනම ෂඩ් අභිඥා උපදවාගත් උන්වහන්සේ අන්‍යයන්හට අනුකම්පාවෙන් ඉන් නැගී අහසෙහි හිඳ ප්‍රාතිහාර්යයක් දැක්වූහ. මහජනයා ආශ්චර්ය හා අද්භූත සිත් ඇත්තෝ වූහ. එකෙනෙහිම තුවාලය වැඩිවිය. උත්තර තෙරණුවෝ, භික්ෂූන් වහන්සේලාගේ '' ඇවැත්නි ! නුඹ වහන්සේ මෙබඳු දැඩි දුකක් විඳිමින් විඳසුන් වඩා රහත්වීමට හැකිවූයේ කෙසේද?'' යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, ''ඇවැත්නි! සංසාරයේ සැරිසැරූ මම එහි ආදීනව ද සංස්කාරයන්ගේ ස්වභාවය ද මැනවින් දුටුවෙමි. එනිසා සසර දුක් විඳි මම මෙබඳු ස්වල්ප දුකක් විඳිමින් විඳසුන් වඩා විශේෂ මඟඵල ලැබීම පිළිබඳව කියනු කිම?'' යනුවෙන් පිළිතුරු ගාථා දෙකක් වදළහ.

''නත්ථිකොවි භවො නිච්චො, සබ්බාරා වාපි සස්සතා
උප්පජ්ජන්ති ච තෙ බන්ධා, චවන්ති අපරාපරං
එතමාදීනවං ඤත්වා භවෙනම්හි අනත්ථිකො
නිස්සටො සබ්බකාමෙහි පත්තො මෙ ආසවක්ඛයො.''

එහි ''නත්ථිකොවි භවො නිච්චො'' යනු කර්ම භවය උත්පත්ති භවය, කාම භවය, රූප භවය, අරූප භවය, සඤ්ඤී භවය, අසඤ්ඤී භවය, නෙවසඤ්ඤී නාසඤ්ඤී භවය, ඒකවෝකාර භවය, චතුවොකාර භවය, පඤ්ච වෝකාර භවය යනාදී ලෙස මෙසේ භවයන්ගේ ප්‍රභේද වේ. ඒ භවයන් හි ද හීන, මධ්‍යම, උත්කෘෂ්ඨ, දීඝායුෂ, සැප බහුල, මිශ්‍ර වූ සුවදුක් ඇති ආදී වශයෙන් විවිධ ස්වභාව ඇත. මේ කිසිදු භවයක් නිත්‍ය, ස්ථීර, සදතනික නොවේ. ඒ ඒ හේතු කාරණා නිසා උපත් බැවිණි. මේ සෑම භවයක්ම සංස්කාරයෝ වන බැවින් ඒවායෙහි සදතනික ශාශ්වතභාවයක් නොමැත, හේතු ප්‍රත්‍යයන්ගෙන් සංස්කරණය කරන ලද බැවින් ''සංස්කාර'' යැයි ලැබූ නම් ඇති පඤ්චස්කන්ධය දැඩිව ගැනීමෙන් උපත් ''භව'' නම් වූ සංස්කාර ද ජරාමරණයන් ගෙන් ද විපරිණාමී ස්වභාවයට යන්නේ ය. අශාශ්වත (සදතනික නොවන) බැවින් විපරිණාම ධර්මී වේ. එසේම එම

භව හේතු ප්‍රත්‍ය සංස්කරණයෙන් හටගත් බැවින් ''සංඛත'' වූ ''සංස්කාර'' නම් වේ පංචස්කන්ධය ද දැඩිව ගෙන සංස්කාර යැයි කියයි. එනිසා ''**උපජ්ජන්ති ච තෙ බහූ චවන්ති අපරාපරං**'' යනුවෙන් ''නුඹගේ ඒ ස්කන්ධයෝ මතු උපදිති, ඒ ඒ භවයෙහි චුත වෙති'' යි කියන ලදී. නුඹගේ 'භව' නාමයෙන් කියන ලද පඤ්චස්කන්ධය ප්‍රත්‍යයන්ට අනුව ම නැවත නැවත උපදියි, උපදිනුයේ ද ජරාවෙන් පෙළී චුත වේ. බිඳේ. වැනසේ යන අර්ථයයි. මේ සංස්කාරයැයි නම් ලද භවයේ පඤ්චස්කන්ධය ඇතිවන නැතිවන ස්වභාවයෙන් යුක්ත වේ. සංස්කාරයන් සිහිකරන්නාට ත්‍රිලක්ෂණ අවබෝධයෙන් ත්‍රිවිධ භවය ගිනිගත්තාක් මෙන් සංඛත ධර්මයන්ගේ අදීනව, දෝෂ වැටහේ. විදසුන් ප්‍රඥාවෙන් යුක්තව අනිත්‍ය දී ලක්ෂණයන්ගෙන් දක්නා ලද සංස්කාර දුක්ඛයන්ගේ අනාත්ම ස්වභාවය ඉතා මැනවින් වැටහේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ - ''යමක් අනිත්‍ය නම් එය දුක් සහගතය. යමක් දුක් සහගත නම් එය අනාත්ම වේ'' යනුවෙන් වදළහ. මෙසේ ත්‍රිලක්ෂණ මෙනෙහි කරමින් සංස්කාර ධර්ම පිළිබඳ සිහි කරන්නාට ත්‍රිවිධ භවය ම ගිනිගත් ලෙස වැටහී ගිහිගෙය භය සහිත තැනක් ලෙස වැටහේ ද එනිසා ''**භවෙනම්හි අනත්ථිකො**'' යි ''මට භවයෙන් ප්‍රයෝජනයක් නැතැ'' යි කියන ලදී. මෙසේ සියලුම ආකාරයෙන් භවයන් හි නොඇලුණු සිත් ඇති, කාමයන් හි කිසිදු අපේක්ෂාවක් නොමැති තැනැත්තා නැවත නුපදින්නේම ය. එනිසා ''**නිස්සංසයො සබ්බකාමෙහි**'' යනුවෙන් කියන ලදී. මම මනුෂ්‍ය වූ ද දිව්‍යමය වූ ද සියලු වස්තුකාම, ක්ලේශ කාමයන් ගෙන් දුරුවූ - ඉවත් වූ සිත් ඇත්තෙමි යන අර්ථයයි. ''**පත්තො මෙ ආසවක්ඛයො**'' මෙසේ මනාව පිරිසිඳ දැනගත් සංස්කාරමය වූ භවයන්හි ද මනාවදුටු ආදීනව ඇති කාමයන් හි ද නොඇවරුණු සිත් ඇති බැවින් දිවැස් හුල මත සිටියත් මම ආශ්‍රවක්ෂය කිරීමෙන් උතුම් වූ නිර්වාණයට, රහත්බවට පත්වූයෙමි. උත්තර තෙරණුවෝ මේ ගාථාවෙන් සෙසු සබ්‍රහ්මචාරී භික්ෂූන් වහන්සේලා, අප්‍රමාදීව රහත්වීම සඳහා උත්සාහවත් වූවන් කරනු සඳහා අවවාද දුන්හ.

උත්තර ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

''නයිදං අනයෙන'' යනු ආයුෂ්මත් පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ සිංහ රාජයෙක් ව උපන් පිණ්ඩෝල භාරද්වාජ හිමි, එක් පර්වත ගුහාවක විසීය. භාග්‍යවතුන් වහන්සේ එම සිංහරාජයාට අනුග්‍රහ පිණිස, ඌ ගොදුරු පිණිස පිටතගිය වේලාවෙහි නිදන ගුහාවට වැඩමවා, නිරෝධ සමාපත්තියට සමවැදුන හ. සිංහයා ගොදුරු ගෙන ගුහාවට පැමිණ, ගුහා දොරකඩ දී භාග්‍යවතුන් වහන්සේ දැක සතුටු සිතින් දිය - ගොඩ හටගත් මලින් උන්වහන්සේ පුදු සිත්පහදවා ගෙන; උන්වහන්සේ ආරක්ෂා කරමින් සෙසු නපුරු වල් සතුන් ඵලවා දැමීම සඳහා තුන් වේලෙහිම සිංහ නාද පවත්වමින් බුදුගුණ මෙනෙහි කරමින් සිටියේ ය. පළමු දින මෙන් ම සත් දිනක් ම මෙසේ පූජා පැවැත් වූ පසු, සත්දින ගෙවියාමෙන් සමවතින් නැගිසිටි භාග්‍යවතුන් වහන්සේ ''මොහුට උපනිශ්‍රය සම්පත් සඳහා මෙපමණක්ම සැහේ'' යැයි දැන, සිංහයා බලා සිටියදීම අහසින් විහාරයට වැඩිසේක. පාරිලෙය්‍ය ඇතා මෙන් සිංහයාට ද බුදුරදුන්ගෙන් වියෝවීම ඉවසාගත නොහැකිව කළුරිය කළේය. මියගිය සිංහයා තිරිසන් භවයෙන් මිදී හංසවතී නුවර මහත් සම්පත් ඇති සිටු පවුලක ඉපිද වැඩිවියට පැමිණ නුවර වැසියන් සමග විහාරයට ගොස් ධර්මශ්‍රවණය කළේය. සත්දිනක් මහදන් පවත්වා දිවි ඇති තාක් පින්දහම් සිදුකළ හෙතෙම ඒ ඒ දිව්‍ය - මානුෂික වූ කාම භවයන් හි සැරිසරා අවුත්; අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී කොසඹෑවේ රජ වූ උදේනි රජුගේ පුරෝහිතයාගේ පුතුව ඉපදුණි. ඔහු ''භාරද්වාජ'' නමින් ප්‍රකට විය. වියටපත් ඒ බමුණු කුමරු, ත්‍රිවේද පාරගතව පන්සීයක් පමණ බමුණු කුමරුවන්ට වේදය උගන්වනුයේ, පිරිස මහත් බැවින් සමීපයේ විසීම අසීරුව, ඒ පිරිස හැරදමා රජගහනුවරට ගියේය. එහිදී භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු මහා සංඝරත්නයට උපන් ලාභ සත්කාර දැක සසුනේ පැවිදි වූ හෙතෙම භෝජනයෙහි පමණ නොදැක මංමුලාව හැසිරෙන කල් හි, ශාස්තෘන් වහන්සේ විසින් උපායෙන් ද භාරද්වාජ උපතින් ම නුවණැති බැවින් ද විඳසුනෙහි සිත පිහිටුවන ලදී. නොබෝ දිනකින් ම භාරද්වාජ හිමියෝ ෂඩභිඥාලාභී මහරහතන් වහන්සේ නමක් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේ දී මෙසේ පැවසූහ.

''පෙර මම මුව වැද්දෙක් වුයෙමි, වනයේ හැසිරෙමින් සිටි මම සියලු ධර්මයන් හි පරතෙරට ගිය කෙලෙස් දුවිලි පිසදැමූ බුදුරජාණන්

වහන්සේ දුටුවෙමි. පියල් ගෙඩියක් ගෙන පැහැදුණු සිතින් පින්කෙත වූ වීර වූ බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේට පිදුවෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් ඵල දනයේ විපාකය මෙබඳුය, දන් මම සියලු කෙලෙස් දුවුයෙමි, - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලාභිවූ භාරද්වාජ තෙරණුවෝ, භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි (හමුවෙහි) ''ශ්‍රාවකයන් විසින් පත්විය යුතු තත්ත්වයට (ඵලයට) මා පත්වුයෙමි. ශාසන බඹසරෙහි අග්‍රඵලය ලබාගත්තෙමි.'' යි පවසා භික්ෂු සංඝයාට ''යමකුට ආර්ය මාර්ගයෙහි හෝ ඵලයන්හි සැකයක් වේනම් ඔවුහු මා විමසත්වා ! මගෙන් ඒ පිළිබඳ අසත්වා!'' යි පවසමින් සිංහනාද පැවැත්වූහ. ඒ නිමිත්තකරගෙන භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි ! මාගේ භික්ෂු මහා ශ්‍රාවකයන් අතුරින් සිංහනාද කර භික්ෂූන් ගේ අග්‍රස්ථානයට මේ පිණ්ඩෝල භාරද්වාජ තෙරණුවෝ සුදුසු වෙති'' යි අග්‍රස්ථානයෙහි තැබුවේක. එක් දිනක් උන්වහන්සේ තමා ලගට පැමිණියා වූ පෙර ගිහිව සිටිය දී යහලුවෙකු වූ තද මසුරු මිසදිටුගත් බමුණකුට අනුකම්පා කරමින් දන කථාවෙන් ධර්මදේශනා කළසේක. ඒ දෙසුම ඇසු බමුණා, ''මොහු මගේ ධනය විනාශ කරනු කැමැත්තෙකි'' යි බැම හකුළුවා ගෙන ''නුඹ වහන්සේට එක බතක් දෙමි''යි කීවේය. එවිට තෙරණුවෝ ''ඒ බත සංඝයාට දෙන්න. මා හට නොදෙන්න''යි වදාරා සංඝයාට දන් පිරිනැමූහ. එය ඇසු බමුණා, නැවත ''මෙතෙම මගේ ධනය බොහෝ දෙනෙකුට දීමට කැමති වේ'' යැයි අප්‍රසාධය ප්‍රකාශ කළේය. දෙවැනි දිනයේ (ඊට පසු දින) ධර්ම සේනාපති සැරියුත් තෙරණුවෝ සංඝයාට පිරිනැමූ දක්ෂිණාවෙන් මහත් ඵල ලැබෙන බව පෙන්වා ඒ බමුණා පැහැදවූහ. පිණ්ඩෝල භාරද්වාජ තෙරණුවෝ ''මේ බමුණ මා ආහාරයට ඇති ගිජුබව නිසා දන් දීමට යොදවන ලදැයි සිතයි. ආහාරය පිළිබඳ මා යථා ස්වභාවයෙන් පිරිසිඳ දත් බව නොදනියි. එය ඔහුට පවසමි'' යි මේ ගාථා දෙක ප්‍රකාශ කළහ.

''නයිදං අනයෙන ජීවිතං
නාහාරෝ හදයස්ස සන්තිකෝ
ආහාරට්ඨිතිකෝ සමුස්සයෝ
ඉති දිස්වාන චරාමි එසනං

පඤ්ඤාති හි නං අවෙදයුං
යායං වන්දනපූජනා කුලෙසු
සුඛුමං සල්ලං දුරුබ්බහං
සක්කාරෝ කාපුරිසෙන දුජ්ජහෝ.''

එහි ''නයිදං අනයෙන ජීවිතං'' මේ මාගේ ජීවිත පැවැත්ම අන්‍යය වූ වේළුදන පුෂ්පදනාදී නුසුදුසු ආකාරයකින් නො සිදුවේ. ජීවිතය පිළිබඳ දැඩි ආශාවක් මට නැති බැවිණි. ''නාහාරෝ හදයස්ස සන්තිකෝ'' ආහාරය මා අවබෝධ කරගත් මගඵල නුවණ මෙන් සිතේ ශාන්තිය ඇති නොකරයි. හුදෙක් මහා බඩගින්න (කුසගින්න) නිවීම පමණක් ආහාරයෙන් සිදුවේ යන අදහසයි. නැතහොත් ''**නාහාරෝ හදයස්ස සන්තිකෝ**''යනු ආහාරය රස තෘෂ්ණා වශයෙන් මගේ හදවතට, සිතට අලීමක් ශාන්තියක් ඇති නොකරයි, මා හට රස තෘෂ්ණාවක් නැති හෙයිණි, ඇතැම්හු ''**සන්තිකෙ**'' යැයි ද කියති. ආහාරයට ගිජු වූ ගිහියෝ ලාභසත්කාරවලට ඇලී හැසිරේ, ඔවුන්ට ආහාරය සිතට ශාන්තිය එළවයි, සැප ගෙනදෙයි නිතර ඒ පිළිබඳ සිහිපත් කළයුතු හෙයිණි. යමෙක් ආහාරය ඔවුන්ගේ සිතට ශාන්තිය ඇති නොකරයි. කෙසේ නම් ආහාර ලබම්දැයි සිහිකිරීමක් ඔවුන්ට නොමැති බැවිණි, ''ඉදින් ජීවත්වීමේ දැඩි ආශාවක් ද තණ්හාවක් ද නැතිනම් කුමක් හෙයින් පිඬුපිණිස හැසිරේද ? යන චෝදනාව සිහිකර මෙසේ පවසයි. ''ආහාරට්ඨිතිකො සමුස්සයො ඉති දිස්වාන චරාමි එසනං'' මේ ශරීරය ආහාරය නිසා පවතිනුයි ''ආහාරට්ඨිතික'' (ආහාරස්ථිතික) නම් වේ. ''මේ ශරීරය ආහාරය සමග බැඳුණු පැවැත්මී ඇත්තකි'' යි දැක, දැක ''එම අදහස සිතේ තබාගෙන හැසිරෙමි. එලෙසින් භික්ෂා සෙවීම කරන්නෙමි'' යන අදහසයි. සිවුපසය නිමිත්තෙන් කුලයන් වෙත පැමිණෙන මා වැන්නෝ එහිදී සිදුවන වැඳුම් පිදුම් ලාභසත්කාර ආදියෙහි බැඳී - ඇලී සිටින්නෝ යැයි නොසිතිය යුතුයැයි දක්වමින් ''පඬෙකා'' යන ගාථාව පැවසුහ, එහි අර්ථය මෙසේය.

''ඒ මේ ප්‍රත්‍ය නිමිති කරගෙන පැමිණි පැවිද්දන්ට ගිහිගෙයි වසන්නෝ ගුණ සම්භාවනා පූජා දිය පවත්වන්නාහ, ඔවුහු සිත නොවැඩූ බැවින් ඒ ගුණ සම්භාවනාදියේ ගිලා බසිති, පැලීම් ආදියට පත්වෙති. එනිසා ''ලාභ සත්කාරාදිය මඩ වගුරකි'' යි බුද්ධාදී උතුමෝ පවසති, දන්වති, පෙන්වාදෙති, ඒ ආහාර තණ්හාව, සත්කාර පිළිබඳ ආශාව බුද්ධාදී සත්පුරුෂයන්ට සහමුලින් ම ප්‍රහීණ කළ බැවින් ඇති නොවේ. අසත්පුරුෂයන්ට ලාභ සත්කාර ආශාව පිළිබඳ යථාස්වභාවය නොවැටහෙන බැවින් ද පීඩා ඇතිකරන, ඇතුළත විදින - දැනෙන ස්වභාව ඇති, උදුරා දැමීමට අසමත් වන බැවින් ද සියුම් හුලකි, සැතකි, ඉවසිය නොහැක්කකි, දුරලිය නොහැක්කකි. එසේ ම ඒ සත්කාරය නින්දිත පුරුෂයන් විසින් ඉවත දැමීමට - දුරලීමට නොහැකි වේ. එම ආශාව ප්‍රහීණ කරන පිළිවෙත පිළිපැදීමෙන්, සත්කාරාශව ප්‍රහීණ කිරීමෙන් ම එය නැති කළ යුතුයි. මේ ගාථා දෙක අසා බමුණා තෙරුන් වහන්සේ කෙරෙහි වඩාත් පැහැදුනේය.

පිණ්ඩෝල භාරද්වාජ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.3

''මක්කටෝ පඤ්ඤාරාය'' යනු ආයුෂ්මත් වල්ලිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයෙන්හි දී පින්දහම් සිදුකරගත්හ. මෙයින් කල්ප තිස් එකකට පෙරදී සිටුගෙයක ඉපිද වැඩිවිය පත් වූ හෙතෙම, එක් දිනක් කිසියම් කටයුත්තකට ආරණ්‍යයට ගියේ එහි දී නාරද නම් පසේ බුදුරජාණන් වහන්සේ රුක් මුල වැඩහිඳුණු දැක පැහැදුණු සිතින් බටවලින් ශාලාවක් සාද තණපතින් එය වසා පූජා කළේය. සක්මන් කරන තැන ද සෝද පවිත්‍රකර, වැලි ඇතිරුවේය. ඒ පින්කම නිසා දිව්‍යමානුෂික කාමසුගතීන් හි ම සැරි සැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර බමුණු මහසල් කුලයක ඉපිද, ''වල්ලිය'' යන නමින් ප්‍රකට විය. වැඩිවියට පත් වල්ලිය බමුණු කුමරු යොවුන් බවින් මත් ව ඉඳුරන් පිනවමින් හැසිරෙන කල් හි කල්‍යාණමිත්‍රාශ්‍රය නිසා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ධර්මශ්‍රවණය කළේය. ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ වල්ලිය තෙරුන් නොබෝ කලකින් ම රහත්බවට පත්වූයේය.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පවසති.

''හිමවතට නුදුරෙහි හාරිත නම් පර්වතයක් විය. එකල්හි ලොව දතයුතු සියල්ල තමාම මැනවින් දැනගත් නාරද නම් පසේ බුදුරජාණන් වහන්සේ රුක්මූලක වැඩවිසූහ. උන්වහන්සේට බට වලින් කුටියක් කරවා, එය තනපතින් හා බට කොළ වලින් සෙවෙලි කොට වසා, සක්මන් මළුව ද පිරිසිදු කරවා පිදුවේමි. මැනවින් කරන ලද ඒ කර්මය හා ප්‍රාර්ථනා මහිමය නිසා මිනිස් කය හැර දෑමූ මම තව්තිසාවෙහි ඉපදුනෙමි. එහි මා හට පහළ වූ නළකිලිය නම් වූ විමානය සැට යොදුනක් උස් විය. එහි පළල යොදුන් තිසකි.

දෙව් ලොව කල්ප දාහතරක් සිත් ඇලවූ මම සැත්තෑ එක්වරක් දෙව් රජව උපන්නෙමි. සක්විති රජව තිස් හතර වාරයක් උපන්නෙමි. මහත් වූ ප්‍රදේශ රාජ සම්පත් අසීමිතව විත්දෙමි. ඒ මම දැන් සියලු ආකාරයෙන් උතුම් උපමා ඇති ධර්ම නම් ප්‍රාසාදයට නැගී ශාක්‍ය පුත්‍ර වූ බුදුරදුන්ගේ සසුනෙහි සුවසේ කැමති සේ වෙසෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් කුසල කර්මයක් කළෙමි ද එද සිට මේ දක්වා දුගතියක නූපන්නෙමි. නළ

කුටියක් පිදීමේ විපාක මෙබඳුය, ''දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ වල්ලිය තෙරණුවෝ, පෙර තමා පුහුදුන් අවස්ථාවෙහි තමාගේ සිතේ පැවති රූපාදී අරමුණුවල කැමති සේ ඇලීසිටීමේ ආශාව දැන් මේ ආර්ය මාර්ගයෙන් නැති කර, ඊට නිග්‍රහ කරනු පිණිසත් සිය රහත් බව ප්‍රකාශ කරනු පිණිසත් මෙම ගාථා දෙක වදළහ.

''මක්කටෝ පඤ්චද්වාරායං කුටිකායං පසක්කිය
ද්වාරෙන අනුපරියෙති සට්ඨයන්තෝ මුහුං මුහුං

තිට්ඨ මක්කට මාධාවි, නහිතෙ තං යථා පුරෙ
නිග්ගහිතොසි පඤ්ඤාය නෙව දුරා ගමිස්සසි''

එහි ''සට්ඨයන්තෝ'' යනු තමාගේ ලොල්බව නිසා ගසේ එක් අත්තක් හැර දමන විට ම තව අත්තක් අල්ලාගනිමින් නොයෙක් වර ඒ ගසේම එල්ලී සිටින ඵල කැමති වඳුරා මෙන් ඒ ඒ ඇස ආදී දොරටුවලින් රූපාදී අරමුණු එකක් මිදුන විට තව එකක් ගනිමින්, චිත්ත සන්තානයේ සමාධිගතවීම් වශයෙන් නිශ්චලව සිටීමට නොහැකිව, අසමත් ව නිතරම ගැටෙමින් - සැලෙමින් එම රූපාදී අරමුණුවල ම පෙරලෙමින් කැමතිසේ හැසිරෙයි. වර්තමානයට සමීප බැවින් මෙහි දී වත්තමාන විභක්තිය යොදන ලදී.

මෙසේ ''එහෙ - මෙහෙ යමින් ම සිටින වඳුර ! එක තැනක සිටුව, නොදුවන්න, සිත නම් වඳුර ! දැන් සිටුව, අරමුණු පසුපස නොදුවන්න, මෙතැන් සිට ඔබට දිවීමට නොහැකිය'', කුමක් නිසා ද? ''**නහි තෙ තං** යථා පුරෙ'' නුඹගේ ඒ කිළිය පෙර සේ නැත. ඒ ආත්මභාවය නම් ගෙය පෙර මෙන්, ඇසුරු කිරීමට නුඹට නොහැක්කෙහිය, එහි දොරටු වැසූ බැවිණි. කිසිවක් යටපත් කරන, නසන ලද්දෙහි තමා ම දැන් තම ප්‍රඥාවෙන් ද මාර්ග ප්‍රඥාවෙන් ද කෙලෙස් රැස්කිරීම - සංස්කරණය කිරීම නම් වූ උපාදනයන්ගේ සිදීමෙන්, අතිශයින් ම නිග්‍රහ කිරීමට පැමිණියෙහි ද එනිසා ඉතා දුර නො යන්නෙහි ! මේ ආත්ම භාවයෙන් දුරට හෙවත් දෙවැනි ආත්ම භාවයකට නොයන්නෙහිය. ''නුඹගේ ගමන මේ ජීවිතයේ අවසන් සිත පහළවීම දක්වා පමණි'' යන අර්ථය දක්වයි. ඇතැම් හු මෙම අර්ථය ම ඇති ''නෙතෙ දුරං'' යන පාඨය ද දක්වති.

වල්ලිය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.4

"නිණ්ණං මෙ තාලපත්තානං" යන මේ ගාථාව ආයුෂ්මත් ගංගාතීරිය තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්හ. වියපත් ඒ සිටුකුමරු බුදුසසුනෙහි දැඩිව පැහැදී භික්ෂු සංඝයාට පැන් පූජා කළේය. ඒ පින්කම් විපාක වශයෙන් දෙව්ලොව උපන් හෙතෙම, තව තවත් පින්දහම් සිදුකරමින් දෙව් මිනිස් දෙගතියෙහි ම සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර එක්තරා ගහපතියකුගේ පුතු ව ඉපිද, **"දත්ත"** නමින් ප්‍රකට විය. වැඩිවියට පත් එකුමරු ගිහිගෙයි වසන්නේ පරලොවක්, සසර ගමනක් ඇති බව නොදන සමාජ නීති ඉක්මවා හැසිරුනේය. නමුත් නැවත සසර ගමනක් ඇති බව දැන උපන් සංවේග ඇති දත්ත සිටුකුමරු බුදුසසුනේ පැවිදිව, තමාගේ පෙර ක්‍රියා පිලිකුල් කරමින් ඉතා දැඩි රූක්ෂ ප්‍රතිපත්තිවල පිහිටියේ ය. දත්ත හිමියෝ පාංශුකූල සිවුරු පමණක් ම පෙරවුහ. මිනීවලට දිය ඉසින බඳුනක් වැනි මැටි පාත්‍රයක් රැගෙන ගංගාතීරයට වැඩම කළ උන්වහන්සේ එහි තල් පත්‍ර තුනකින් කුටියක් සාදගෙන වාසය කළහ. එනිසා උන්වහන්සේ **"ගංගාතීරිය"** නමින් ප්‍රකට වුහ. උන්වහන්සේ "රහත් බවට පත්වන තෙක්ම මම කිසිවකු හා කථා නොකරමි" යි යන අධිෂ්ඨානයෙන්, වසරක් ම නිශ්ශබ්දව වැඩහේද නොකර ම විසූහ. දෙවැනි වසරේ දී පිඬුපිණිස යන ගමෙහි එක් ස්ත්‍රියක්, "මෙහිමියෝ ගොළුවුවෙක් ද ? යි විමසනු කැමැත්තී, පාත්‍රයට කිරි වත්කරන්නී අතින් සංඥා කළ මුත් පාත්‍රය උතුරායන තෙක් කිරි වත් කරන්නට විය. එවිට ගංගාතීරිය හිමියෝ, "නැගණියෙනි! දැන් ඇති" යි පැවසූහ. මෙසේ භික්ෂුණු උන්වහන්සේ තෙවැනි වසරේ වස්කාලය තුල දී වැයම් කර, උත්සාහ කර රහත්බවට පත්වුහ.

අපදන පාළියේ උන්වහන්සේ මෙසේ පැවසූහ.

"මම පුදුමුත්තර බුදුරදුන්ගේ අනුත්තර වූ භික්ෂු සංඝයා කෙරෙහි පහන් සිත් ඇත්තෙම්, සොම්නස් වූ යෙම් පැන්කළයක් පිදුයෙමි. පර්වත මුදුනෙහි හෝ ගස් මුදුනක හෝ අහසෙහි හෝ පොළවෙහි හෝ යම් කලෙක පැන් කැමති වූ මා හට පැන් ලැබේ. මීට කල්ප ලක්ෂයකට පෙර යම්බදු පැන් දනයක් දුන්නෙම් ද ඒ හේතුවෙන් මේ දක්වා ම දුගතියක නූපන්නෙමි. පැන් පිදීමේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දූවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි"

රහත් බවට පත් වූ උන්වහන්සේ, තමාගේ පූර්ව භාග ප්‍රතිපත්තිය ප්‍රකට කිරීම සඳහා රහත් බව ප්‍රකාශ කරන සේක්, මේ ගාථා දෙක වදළහ.

''තිණණං මෙ නාලපත්තානං ගංගාතීරෙ කුටී කතා
ඡටසිත්තොව මෙ පත්තො පංසුකූලං ච චීවරං

ද්වින්නං අනන්තරවස්සානං එකා චාචා මෙ භාසිතා
තතියෙ අනන්තරවස්සම්හි තමොක්ඛන්ධො පදළිතො''

එහි ''තිණණං මෙ නාලපත්තානං ගංගාතීරෙ කුටී කතා'' යනු තල් ගසින් වැටුණු තල් කොළ තුනකින් මාහට වැස්සෙන් වන උවදුරු, දුරුකර ගැනීමට ගඟ ඉවුරෙහි කුටියක් සාදගත්තෙමි. මේ ප්‍රකාශයෙන් තමාගේ සෙනසුන පිළිබඳ තෘප්තිමත් භාවය සතුටුවීම දක්වයි. දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ මෙසේ වදළහ.

''පල්ලඞ්කෙන නිසින්නස්ස ජන්තු කෙනාතිවස්සති
අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො''

''පලක් බැඳ හුන්නා වූ ධ්‍යාන වඩන භික්ෂුවගේ දණමඩල දක්වා වූ ප්‍රදේශය නොතෙමේ නම්, එය උන්වහන්සේට පහසු විහරණයකි.''

ඇතැම්හු ''නාලපත්තීනං'' යන පාඨය ද දක්වති. එහි ද මේ අර්ථයම ඇත ''ඡටසිත්තොව මෙ පත්තො'' යනු මගේ පාත්‍රය මිනිවලට දිය - කිරි ඉසින බඳුනක් වැනිය. මළචුන්ගේ සිරුරට කිරිදිය ඉසින කුඩා බඳුනක් වැනිය. ''පංසුකූලං ච චීවරං'' මේ මගේ සිවුර ද අතරමග, සොහොන් ආදියේ අත්හැර දැමූ රෙදිකඩවලින් සාදගත් පාංශුකූලයකි. මේ දෙපදයෙන් උන්වහන්සේගේ පිරිකර ආහාර - වස්ත්‍ර ලැබී මෙහි තෘප්තිමත් භාවය දක්වයි. ''ද්වින්නං අනන්තර වස්සානං'' පැවිදිව වසර දෙකක් තුල දී රහත්බවට පත් වූ වසරේදී ''එකා චාචා මෙ භාසිතා'' එකම වදනක් ''නැගණියෙණි ! ඇති'' යන කිරි ප්‍රතික්ෂේප කරීම සඳහා වූ එකම වචනයක් මවිසින් පවසන ලදී. මා හට වෙනත් කිසිදු වාගේ භේදයක් සිදුනොවිණි. මෙම ප්‍රකාශයෙන් උසස්බවට ගිය කාය - වාග් සංවරබව දක්වයි. ''තතියෙ අනන්තරවස්සම්හි'' තෙවැනි (පැවිද්දෙන්) වසර තුළදීම එය නිමවීමට පෙරදීම ''තමොක්ඛන්ධො පදළිතො'' යනු ''අර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් මම මෝහ නැමති කෙලෙස් කද බිඳ දැමුවෙමි. අවිද්‍යාදී අනුසයන් මුලිනුපුටා දැමුවෙමි'' යන අදහසයි. මේ පදයෙන් මුලුමනින් ම කෙලෙස් නසා අර්හත් ඵලය සාක්ෂාත් කළ බව පවසයි.

ගංගාතීරිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.4

''අපිචෙනොනි තෙවිජ්ජෝ'' යනු ආයුෂ්මත් අජින තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද ? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී පින් රැස් කරමින් පැමිණි උන්වහන්සේ, එක් බුද්ධශූන්‍ය වූ කාලයක (ලොව) සිටුගෙයක උපන්හ. වැඩිවියට පත් ඒ සිටුකුමරු කිසියම් කටයුත්තකට කැළයට ගියවිට, එහි දී ''සුචින්තිත'' නම් පසේ බුදුරජාණන් වහන්සේ අසනීප වී වැඩ හිඳිනු දැක - සමීපයට ගොස් වැඳ පැහැදුණු සිතින් බෙහෙත් සඳහා ගිතෙල් ස්වල්පයක් පිළිගැන්වීය ඒ පින්කමේ විපාක ලෙස දෙවි ලොව ඉපිද තව තවත් පින්දහම් සිදුකර කාමසුගතින් හි ම සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක් දිළිඳු බමුණකුට දව බැමිණියගේ කුස පිළිසිඳ ගත්තේය. එකුමරු බිහිවන මොහොතෙහි අදුන් දිවි සමකින් පිළිගත් බැවින් ''අජින'' නාමය තබනලදී. ඔහු භවභෝග ලැබීමට නිසි පිනක් නොකළ බැවින් දිළිඳු පවුලක ඉපදී, වැඩිවියට පත්වුවත් අල්ප වූ ආහාර පාන ඇති බැවින් ඔබිනොබ ඇවිදගියේය. එවිට ජේතවනාරාමය පිළිගන්නා අවස්ථාවෙහි බුද්ධානුභාවය දැකීමෙන් හටගත් ශ්‍රද්ධාව නිසා බුදුසසුනේ පැවිදිවූ හෙතෙම විදසුන් කමටහන් වඩා නොබෝ දිනකින් ම ෂඩ් අභිඥාලාභී විය.

අපදන පාළියේ අජින තෙරණුවෝ මෙසේ සිය චරිතාපදනය දක්වුහ. ''සුචින්තිත නම් (ලොවට ජ්‍යෙෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ) පසේ බුදුන් වහන්සේ වාතාබාධයකින් පීඩිතව මහ වනයේ වැඩ වසනු දුටු මම, සිත පහදවා පිරිසිදු ගිතෙල් ස්වල්පයක් පිළිගැන්වුයෙමි. මේ පින්කම කිරීමෙන් හා වැඩු සිත් ඇති බැවින් මෙම භගිරථී ගඟ ද සිවුමහ සමුදුරු ද මගේ අදහස අනුව මී සකුරු බවට පත්වේ. සිවුමහ දිවයිනට අයත් වූ මේ වෘක්ෂයෝ පවා මගේ අදහස අනුව කල්ප වෘක්ෂයෝ වෙති. මම වසර පනහක් දෙවි රජය කරවුයෙමි, පනස් එක් වාරයක් සක්විති රජව උපන්නෙමි, මා ලැබූ ප්‍රදේශ රාජ සම්පත්තිය පමණ කළ නොහැක. මෙයින් කල්ප අනූ හයකට පෙර යම් ගිතෙල් දනයක් දුන්නෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නුපන්නෙමි. පිරිසිඳු ගිතෙල් පිදීමේ විපාකය මෙබඳුය, දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකෙළෙමි.''

පෙර කර්ම නිසා රහත් බවට පත් වූවත් අල්ප ලාභ ඇතිව අප්‍රකට ව උන්වහන්සේ විසූහ. උදෙසන බත්, සලාක බත් ආදිය ද අල්පව ලැබේ. කර්ම බලය නිසා පුහුදුන් භික්ෂූහු හා සාමණේරාදීහු අජින තෙරුන්ට

''අප්‍රකට වූ වෙකු''යි අවමන් කළහ. උන්වහන්සේ එම භික්ෂූන්ට සංවේග උපදවමින් මේ ගාථා දෙක වදළහ.

''අපි වෙ හොති තෙවිජ්ජො මච්චුහායී අනාසවො
අප්පඤ්ඤාතොති නං බාලා අවජානන්ති අජානතා

යො ච බො අන්නපානස්ස ලාභී හොතීධ පුග්ගලො
පාපධම්මොපි වෙ හොති සො නෙසං හොති සක්කතො''

එහි ''අපි'' යනු සම්භාවනාර්ථයේ නිපාතයකි. ''වෙ'' යනු පරිකල්පනාර්ථයේ නිපාතයකි. ''හොති'' වේ මොහුට ත්‍රිවිද්‍යාව ඇත යන අරුතින් ''තෙවිජ්ජො'' නම් වේ. මරණය නවතාලුයේය යන අරුතින් ''මච්චුහායී'' නම් වේ. කාමාදී ආශ්‍රව නොමැති නිසා ''අනාසවො'' නම් වේ. මෙහි අරුත මෙසේ දතයුතුයි. දිව්‍ය චක්ෂුඥානය, ප්‍රබ්බේ නිවාසානුස්සති ඥානය, ආසවක්ඛය ඥානය යන මේ ත්‍රිවිද්‍යාව. අවබෝධ කරගත් බැවින් තේවිජ්ජ නම් වූ, එසේ ම සියලු කාමාදී ආශ්‍රව ක්ෂය කළ බැවින් අනාශ්‍රව නම් වූ නැවත අනාගත උත්පතියක් නොමැති බැවින් මරණාදියෙන් තෙරවූ නිසා මච්චුනායී නම් වේ. ඉදින් මෙසේ ගුණමහිම පැවතියත් මෝඩයෝ මැනවින් ගිහිගෙයින් නික්ම, අනගාරී සසුනෙහි පැවිදිවේ ද ඒ අර්ථයක් සඳහා කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙයින් නික්ම, අනගාරී සසුනෙහි පැවිදිවේ ද ඒ අර්ථයට මනාව පැමිණියා වූ උතුම් පුරුෂයා, ''ධුතවාදියෙකි'', ''බහුශ්‍රැතයෙකි'', ''ධර්මකථිකයෙකි'' යනුවෙන් කීර්ති ප්‍රසංසාදියක් නොමැති හෙයින් ''අප්‍රකටයෙකි'' ''සැඟවුණු කෙනෙකි'' යි බාලයෝ හා මෝඩ - අනුවණ පුද්ගලයෝ අවමන් කරති. කුමක් නිසා ද ? ''අජානනා'' නොදන්නා බැවිණි, ''ගුණයන්ගේ නොදැනීමෙන් ම මෙ කරුණ සිදුවේ'' යැයි දක්වයි. ඒ උතුමන්ගේ ගුණ නොදන්නා බැවින් බාලයෝ ලාභ - කීර්ති මත පිහිටා ගරු කළ යුත්තන්ට අවමන් කරති. මෙසේ ගුණ නොදැනීමෙන් ලාභාදිය ගරු කරන්නන්ට ම මෙසේ අවමන් කළ යුතු යැයි දක්වමින් දෙවැනි ගාථාව පවසන ලදී.

එහි ''යො'' යනු අනියමාර්ථ වචනයකි. යමෙක්, ''ච'' ශබ්දය වැඩි ශබ්දයකි. ඉන් මුලින් පැවසූ පුද්ගලයාම, ඒ පුද්ගලයා පිළිබඳව ම විශේෂයක් ඇති කරයි. ''බො'' යනු අවධාරණාර්ථයේ නිපාතයකි. ''අන්නපානස්ස'' යනු නිදසුනක් - දැක්වීම පමණි. ආහාර පානාදියක් ''ලාභී'' ලබන්නේ හෝ වේද, ''ඉධ'' මේ ලෝකයේ ජරාමරණ දෙකින් ඒ ඒ සත්තාවාසයන් පුරවන බැවින් වගුරුවන බැවින් ''පුග්ගල'' නම්වේ. ''පාපධම්මො'' ලාමක පව්ටු

දහම් ඇති, මෙහි අර්ථ මෙසේ දත යුතුයි, - '' යම් පුද්ගලයෙක් චිරා දී ප්‍රත්‍ය පමණක්ම ලබන්නේ ද ධ්‍යානාදියක් නොලබන්නේ ද, ඔහු පවිටු බැවින් ද දුසිල් බැවින් ද හීන වූ ධර්ම ඇති බැවින් ද මේ ලෝකයේ වෙසෙන මෝඩයන්ගේ ලාභගරු බවට, සත්කාර කිරීමට, ගරුකිරීමට පත්වේ. ලක්වේ.''

අජින ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.6

''යදහං ධම්මඤ්ඤාසිං'' යනු ආයුෂ්මත් මේළජින තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයන්හි දී පින් රැස් කරමින් පැමිණ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපදුනහ. වියපත් වූ සිටුකුමරු භාග්‍යවතුන් වහන්සේ පිඬුපිණිස වැඩම කරනු දැක, පැහැදුණු සිතින් එක් මිහිරි ආමෝද ඵලයක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරි සැරූ ඔහු මේ බුද්ධෝත්පාද කාලයෙහි බරණැස් නුවර ක්ෂත්‍රිය කුලයක ඉපිද, ''මේළජින'' යන නමින් හැඳින්විණි. සියලු විද්‍යා ශිල්ප ශාස්ත්‍රයන්හි කෙළවරට පැමිණි, පණ්ඩිත වූ විශාරද වූ හෙතෙම සියලු දිශාවන්හි ප්‍රකට විය. භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතනයේ වැඩවසන කල්හි එම විහාරයට ගිය මේළජින ධර්මශ්‍රවණ කිරීමෙන් ලැබූ ශ්‍රද්ධා ඇතිව බුදුසසුනේ පැවිදි විය. විදසුනෙහි සිත පිහිටවූ මේළජින තෙරණුවෝ පැවිදි වූ දිනම රහත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''තමාම අවබෝධ කරගත් සත්‍ය ඇති, අපරාජිත වූ දහසක් රැස් දරන්නා වූ සිද්ධත්‍ථ නම් බුදුරජාණන් වහන්සේ, විවේකයෙන් නැගී සිටිසේක් - පිඬු පිණිස නික්මුණු සේක. අතෙහි ඵල දරාගත් මම එකල්හි උන්වහන්සේ වෙත පැමිණියෙමි. පැහැදුණු සිතින් හා සතුටු සිතින් උන්වහන්සේට ආමෝද ඵලයක් පූජාකළෙමි. මෙයින් කල්ප අනූ හතරකට පෙරදී යම් ඵල දනයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඵලදනයාගේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ මේළජීන තෙරුන්ගෙන් මෑත කාලයකදී භික්ෂූහු මෙසේ ඇසූහ. ''ඇවැත්නි'' ! කිම නුඹ වහන්සේ කිසියම් උතුරු මිනිස් දහමක් අවබෝධ කරගත් සේක්ද?'' යනුවෙනි, ඊට පිළිතුරු වශයෙන් සිංහනාද පැවැත් වූ උන්වහන්සේ මේ ගාථා දෙක වදළහ.

යදහං ධම්ම මඤ්ඤාසිං භාසමානස්ස සත්ථුනෝ
න කඞ්ඛමභිජානාමි සඞ්ඛාසූ අපරාජිතෝ

සත්ථාහෙ මහාවීරෙ සාරථීනං වරුත්තමෙ
මඟෙ පටිපදායං වා කඞ්ඛා මයහං න විජ්ජති''

එහි ''යදා'' යනු යම් කලෙක ''අහං'' යනුවෙන් තමන්වහන්සේ දක්වයි. ''ධම්මං'' චතුරාර්ය සත්‍යය ධර්මය. ''අඤ්ඤාසිං'' ඇසුවෙමි. ''සත්ථුනෝ'' යනු දිට්ඨධම්මික වූ (ඉදිරියේම ප්‍රතිඵල ලැබෙන) අර්ථයන්හි හික්මෙන්නවුන් පිහිටුවන අර්ථයෙන් ශාස්තෘන්වහන්සේගේ. ''කඞ්ඛං'' සැකයක්, සංඛත අසංඛත යනාදී සියල්ලම දන්නා වූ අර්ථයෙන් ''සබ්බඤ්ඤූ'' සර්වඥ නම් වූ කිසිවෙකුට කිසිතැනකදී නොපැරදුණු බැවින් ''අපරාජිතෙ'' අපරාජිත වූ හික්මවන්නා වූ සත්ත්වයන් සසර කතරින් එතෙර කරවා නිවණට පමුණුවන බැවින් ''සත්ථාහෙ'' ශ්‍රේෂ්ඨ සාත්තුවාහකයෙක් වූ මෙහි අදහස් මෙසේ දත යුතුයි. - ''යම් දිනෙක මම ශාස්තෘන් වහන්සේගේ චතුරාර්ය සත්‍යය පිළිබඳ ධර්මය ඇසුවෙමි ද ශ්‍රෝත්‍රද්වාරයෙන් සළකා බැලුවෙමිද ධාරණය කරගත්තේමි ද එදා සිට ලොව සියලුම සංඛත, අසංඛත සම්මුති ධර්මයන් තමන්වහන්සේ විසින්ම දැනගත් හෙයින් උන්වහන්සේගේ සර්වඥත්වය මැනවින් අවබෝධ කරගත්තෙමි. පංච මාරයන් අභිභවනය කිරීමෙන් ද ඒ මාරයන්ට නොමැඩලිය හැකි වූ බැවින්ද දෙවියන් සහිත ලෝකයේ කිසිවකු විසින් නො පැවැත්වූ දම්සක් පැවතුම් පැවැත්වූ බැවින්ද අපරාජිත වූ වේනෙය්‍ය සත්ත්වයන් කාන්තාරාදියෙන් (සසර නැමති) එතෙර කරවන බැවින් සාත්තුවාහකයෙකු වූ මහත් වූ වික්‍රම ඇති බැවින් මහාවීර වූ, අන්‍ය දමනය කළ නොහැකි පුරුෂාදීන් දමනය කරවීමෙන්, ඔවුන්ට පිහිටවීමෙන් හා අතිශය වූ දමනය කිරීම්වලින් සත්ත්වයා දමනය කරන්නා වූ රියදුරන් අතර ශ්‍රේෂ්ඨ-උතුම් සාරථී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ''බුද්ධත්වයට පත්වී ද? නොවී ද?''යි සැකයක් නම් මා හට ඇති නොවිණි. එසේ සැක කිරීමට හේතුවක් නොමැති බැවිණි. එලෙසින් ම උන්වහන්සේ විසින් දෙසූ ආර්ය මාර්ගයෙහි ද ඊට උපකාර වූ සීලා දී ප්‍රතිපදාවෙහිද ''මෙම පිළිවෙත් පිරීමෙන් නිවණ ලැබේ ද? නොලැබේ ද?'' යි සැකයක් හෝ විචිකිච්ඡාවක් මා හට නැත. මෙහි ද ආර්ය

ධර්මයෙහි සැක රහිත බව පැවසීමෙන් ආර්ය සංඝයා කෙරෙහිද සැකයක් නොමැති බව අදහස් වී යැයි දත යුතුයි. එම ආර්ය සත් ධර්මයෙහි පිහිටි තැනැත්තාගේ (ස්ථිරව) වෙනස්වීමක් නම් නැති බැවිණි.

මේඝජින ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.7

''යථා අගාරං දුච්ඡන්නං'' යනු ආයුෂ්මත් රාධ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර සිටු ගෙයක ඉපදුණු උන්වහන්සේ වියපත්ව විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත් පසෙක සිටියහ. ඒ සිටුතුමා ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක් ප්‍රතිභාන ඇති භික්ෂූන් අතුරින් අග්‍රතනතුරෙහි පිහිටුවනු දැක, තමා ද ඒ තනතුර ප්‍රාර්ථනා කරගෙන මහාදානයක් පැවැත්වීය. ශාස්තෘන් වහන්සේට මහත් වූ පූජාවක් ද කළේය. මෙසේ කළ ප්‍රාර්ථනා ඇති ඔහු ඉන් චුතව, සසර ඒ ඒ භවයන්හි දී තව තවත් පින්දහම් රැස්කරමින් අවුත් විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්නේ ය. වැඩිවියට පත් හෙතෙම පිඬු පිණිස වැඩම වූ බුදුරජාණන් වහන්සේට පහන් සිතින් එක් මිහිරි අඹ ඵලයක් පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද තව තවත් පින්දහම් සිදුකරගනිමින් දෙව් මිනිස් දෙගතියේ සැරි සරා අවුත් අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහල වූ සමයෙහි රජගහ නුවර බමුණු ගෙදරක උපන්නේ ය. ''රාධ'' නමින් ප්‍රකට වූ ඒ බමුණු කුමරු වැඩිවියට පත්ව ගිහිගේ වසන්නේ, මහලු කාලයේ දී අග්‍රිදරුවන් විසින් නොසළකන ලද්දේ, ''මා හට ගිහිගේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් ද? පැවිදිවන්නෙමි''යි විහාරයට ගොස් ස්ථවිර භික්ෂූන් සමීපයට ගොස් පැවිද්ද ඉල්ලීය. උන්වහන්සේලා විසින් ''මේ බමුණා ඉතා මහලුවූවෙකි. වත් පිළිවෙත් පවා පිරීමට අසමර්ථයෙකි''යි ප්‍රතික්ෂේප කරන ලදී. ශාස්තෘන් වහන්සේ හමුවට ගිය රාධ බමුණා තම අදහස උන්වහන්සේට දැන්වීය. රාධගේ හේතු සම්පත් දුටු ශාස්තෘන් වහන්සේගේ අණ කිරීම මත දම් සෙනෙවි සැරියුත් තෙරුන් විසින් පැවිදි කරන ලද රාධ තෙරණුවෝ විදසුනෙහි සිත පිහිටුවා නොබෝ කලකින් ම රහත් ඵලයේ පිහිටියහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''ලොව දෙන්නවුන්ගේ දන් පිළිගන්නා වූ රන්වන් වූ බුදුජාණන් වහන්සේ පිඬු පිණිස වීථියට වැඩම වූ කල්හි මම අඹ ඵලයක් පිදුවෙමි. මීට කල්ප අනූ එකකට පෙර දී යම් ඵල දානයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ, ශාස්තෘන් වහන්සේ සමීපයේ ම හැසිරෙන්නේ, ශාස්තෘන් ධර්මදේශනාව වහා වටහාගන්නා වූ භික්ෂූන් අතර ප්‍රධාන වූහ. ඒ තෙරුන් වහන්සේට වනාහී දෘෂ්ඨි, සමුදය, ආචාරාදියට ද පැමිණි දසබලයන් වහන්සේගේ ධර්ම දේශනාව ඉන් තොරව අවබෝධ වේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන් අතර ප්‍රතිභාණ ඇති භික්ෂූන්ට මේ රාධ තෙරුන් අග්‍ර වේ'' යැයි වදාළ සේක. රාධ තෙරණුවෝ දිනක ''මේ සත්ත්වයෝ සිත නොවැඩීම නිසා රාගයෙන් මුලාවෙති. සිත වැඩීමෙන් යෙදුණේත් නැත''යැයි වැටහී භාවනාව පිළිබඳ උත්සාහය වඩමින් මෙම ගාථා දෙක වදාළහ.

''යථා අගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං රාගෝ සමතිවිජ්ඣති

යථා අගාරං සුඡ්ඡන්නං - වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං - රාගෝ න සමතිවිජ්ඣති''

එහි ''අගාරං'' යනු යම්කිසි ගෙයක් ''දුච්ඡන්නං'' නොවැසූ, තැනින් තැන වැසූ හා තැනින් තැන තෙමෙන සිදුරු ඇති ''**සමතිවිජ්ඣති**'' වැස්ස විනිවිද යන්නේ ද, ''අභාවිතං'' ඒ වැස්සෙන් තෙමෙන ගෙය මෙත් වැඩීමක් පුරුදු -පුහුණු නොකළ සිතට ''**රාගෝ සමතිවිජ්ඣති**'' රාගය පමණ නොව දෝෂ (තරහ) මෝහාදී සියලු කෙලෙස් වැදගනියි. එබඳු සිත විනිවිද යන්නේ මය. ''සුභාවිතං'' යනු සමථ-විදර්ශනා ආදි වශයෙන් මනාව වැඩූ සිත. මෙබඳු සිත මැනවින් සෙවිලි කළ ගෙයට වැස්ස නොපිවිසෙන්නාක් මෙන් රාගාදී කෙලෙසුන්ගෙන් පීඩා නොවේ. එබඳු සිත විනිවිද යෑමට නොහැකි වේ.

රාධ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.8

''**බීණා හි මයහං ජාති**'' යනු ආයුෂ්මත් සුරාධ තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයනහි දී පින්දහම් රැස්කරමින් පැමිණ ''**සිබී**'' නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටු ගෙයක උපන්හ. වැඩිවියට පත් සිටු කුමරු එම භාග්‍යවතුන් වහන්සේ දැක, පැහැදුණු සිතින් නාරන් ගෙඩියක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව උපන් හෙතෙම, තව තවත් පින්දහම් සිදුකරමින් කාම සුගතීන්හි ම සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේදී මුලින් විස්තර කළ රාධ බමුණාගේ බාල සෝයුරාව උපන්නේ ය. ඔහු ''සුරාධ'' නම් විය. වැඩිමල් සෝයුරු රාධ බමුණා පැවිදි වූ කල්හි, සුරාධ ද පැවිදි විය. සුරාධ තෙරණුවෝ විදසුන් කමටහනෙහි සිත පිහිටවූ සේක්, නොබෝ කලකින් ම රහත් ඵලයට පත්වූහ.

උන්වහන්සේ අපදාන පාළියේ දී මෙසේ පැවසූහ

''පුන්පෝ දිනයෙහි සඳ මෙන් බබලන්නා වූ කිණිහිරි රුක් වැනි වූ පහන් ගසක් මෙන් හෝහ මාන වූ ලෝක නායක වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. නාරන් ගෙඩියක් රැගත් මම දක්ෂිණාර්හ වූ මහා ප්‍රඥා වූ මහා වීර ශාස්තෘන් වහන්සේට පහන් සිතින් දෙ අතින්ම එය පූජා කළෙමි. එකල්හි මීට කල්ප තිස් එකකට පෙර දී යම් ඵල දානයක් පැවැත්වූයෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වාම දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාකය එබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත් වූ සුරාධ තෙරණුවෝ බුදු සසුනේ නෛයර්‍යාණික භාවය දැක්වීම පිණිස සිය රහත් බව ප්‍රකාශ කරමින් මේ ගාථා දෙක වදාළහ.

''**බීණාහි මයහං ජාති වුසිතං ජිනසාසනං**
පහීණෝ ජාලසංඛාතෝ - භවනෙත්ති සමූහතා''

''**යස්සත්ථාය පබ්බජිතෝ අගාරස්මා අනගාරියං**
සෝ මේ අත්ථෝ අනුප්පත්තෝ සබ්බසංයොජනක්ඛයෝ''

එහි ''බීණා'' යනු ක්ෂය වූ කෙළවරට ගිය. ''ජාති'' යනු භවයයි. භවෝත්පත්තියයි. ''වුසිතං ජින සාසනං'' යනු ජින නම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි බඹසර වැස නිමවූයෙමි. ''**පහීණෝ ජාල සඞ්ඛාතෝ**'' සත්ත්වයන්ගේ සන්තානය වසාගෙන, මිදීමට නිදහස් වීමට අවස්ථාවක් නොදෙන දැලක් වැනි වූ හෙයින් ''ජාල'' නම් වූ අවිද්‍යා දෘෂ්ඨි දෙක ප්‍රහීණ කරන ලදී. ආර්ය මාර්ගයෙන් මුලුමනින් ම සිඳ දමන දී. ''**භවනෙත්ති සමූහතා**'' කාමාදිභවයන්ට පමුණුවන, සංසාරික පැවැත්මට උපකාරවන තණ්හාව මුලිනුපුටා දමන ලදී. ''යම් අර්ථයක් සඳහා මම ගිහිගෙයින් නික්ම අනගාරි සසුනෙහි පැවිදිවූයෙමි ද ඒ සියලු ඔරම්භාගිය හා උද්ධම්භාගිය යන ප්‍රභේද ඇති දස සංයෝජනයෝම ප්‍රහීණ කළෙමි. අර්ථවත් වූ නිර්වාණ සංඛ්‍යාත පරමාර්ථය, අර්හත් සංඛ්‍යාත (තම යහපත්) ස්වාර්ථය ද මම ලබාගත්තෙමි. සලසා ගත්තෙමි'' යන අර්ථයයි.

සුරාධ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.9

''සුඛං සුපනති'' යනු ආයුෂ්මත් ගෝතම තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු කෙරෙහි සිත් පහදවා කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී නිවන් පතාගෙන බොහෝ පින් දහම් රැස්කරගත්හ. විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපදුණු හෙතෙම වැඩිවියට පත්ව, දිනක් මම භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදී ආමෝද ඵලයක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්ලොව ඉපදී තව තවත් පින්දහම් සිදුකරමින් කාම සුගතීන්හිම සැරිසරා ඔහු මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ නුවර බමුණු ගෙදරක උපන්නේය. ''**ගෝතම**'' නමින් ප්‍රකට වූ ඒ බමුණු කුමරු සත්වියේදී අපනයනය (බමුණු පූනනූල දැමීම) කර, රුවන් භික්ෂාවෙහි (මුදල් සිඟාකෑමෙහි) හැසිරුණේය. ඉන් කහවනු දහසක් ලබාගත් ඔහු එය ආරක්ෂිත තැනක තබා බඹසර සුරකිමින් ව්‍රත සමාදානය ආරක්ෂා කළේය. වයස අවුරුදු දාසයක්, දාහතක් වන කාලයෙහි අයහපත් මිතුරු ඇසුරට පත් වූ ගෝතම කුමරු කාම පීඩිත වූයේ එක් ගණිකාවක් දැක, තමා රැස්කර ගත් කහවනු දහස ඇයට දී බඹසර විනාශ කර ගත්තේය. ඇය ඔහුගේ බඹසර විනාශ වූ බව දැක කළකිරුණු ස්වභාවයක් දක්වූවාය. මේ දුටු බමුණු කුමරු ද ඇය හා එක් රැයක්

විසීමෙන් ම කළකිරුණේ, තමා ගේ බඹසර විනාශවීම ද ධනහානිය ද සිහිකර ''මවිසින් නුසුදුසුවූවක් කරන ලදී''යැයි විපිළිසර විය.

මෙම අවස්ථාවෙහි බුදුනුවණින් ගෝතම කුමරුගේ හේතුසම්පත් දුටු ශාස්තෘන් වහන්සේ, ඔහුගේ කාමයේ නොඇලුණු සිත ද දැක, ඔහු සමීපයේ තමන්වහන්සේගේ රූපය දැක්වූ සේක. ගෝතම කුමරු බුදුරුව දැක පැහැදී, සතුටු සිතින් උන්වහන්සේ වෙත එළඹ ධර්මශ්‍රවණය කළේය. ධර්මශ්‍රවණය කිරීමෙන් හටගත් ශ්‍රද්ධාව ඇති ඔහු සසුනේ පැවිදි වූයේ හිසකෙස් බාද්දීම රහත් ඵලයට පත්විය.

ගෝතම තෙරණුවෝ අපදාන පාළියේ දී මෙසේ පැවසූහ.

''දානමානාදි පුදපූජා පිළිගැනීමට යෝග්‍ය වූ රන්වන් පාටින් බබළන්නා වූ විරියට පිළිපන් බුදුරජාණන් වහන්සේ දැක, මම ආමෝද ඵලයක් පූජා කළෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් පැවැත්වූයෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා මම දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් වූ ගෝතම තෙරුන් ධ්‍යාන සුවයෙන් කල් යවන කල්හි එක් ගිහි කාලයේ සිටි යහලුවෙක් පැමිණ ''ඇවැත්නි! නුඹ විසින් ලබාගත් රුවන් භික්ෂාවට පැවිදිවන අවස්ථාවෙහි කුමක් කළේ ද?''යි විචාළේය. එය ඇසූ තෙරණුවෝ, ''මෙනම් දෙයක් කළෙමි''යි නොපවසා, ස්ත්‍රියගේ දොස් දක්වමින් ද තමන් වහන්සේගේ විතරාගී බව දක්වමින් ද සිය රහත් බව ප්‍රකාශ කරමින් ද මේ ගාථා දෙක වදාළහ.

''සුඛං සුපනති මුනයො යෙ ඉත්ථීසු න බජ්ඣරෙ
සදා වෙ රක්ඛිතබ්බාසු යාසු සච්චං සුදුල්ලභං

වධං චරිමහ තෙ කාම අණනා දානි තෙ මයං
ගච්ඡාමදානි නිබ්බාණං යත්ථ ගන්ත්වා න සොචති''ති

එහි ''සුඛං සුපනති මුනයො යෙ ඉත්ථීසු න බජ්ඣරෙ'' යනු යමෙක් ස්ත්‍රීන් කෙරෙහි විෂය වශයෙන් හෝ නිමිති වශයෙන් රාගයෙන් නොබැඳෙත් ද නො ඇලෙත් ද ඒ සේඛ මුනිවරු වූ තපස්වීවරු වූ සංයම වූ ඉඳුරන් ඇත්තෝ සුවසේ නිදති. සුවසේ වෙසෙති. ඔවුන්ට කිසිදු දුකක් නැත යන

අදහසයි. ''සුපනිති'' යනු නිදසුනක් දැක්වීම් පමණකි. ''**යදා වෙ රක්ඛිතබ්බාසු**'' යනු ඒකාන්තයෙන්ම සැමකල්හි රැකිය යුත්තෝය. ස්ත්‍රීහු වනාහී මහල් සතක් වූ පුරුෂයන්ගෙන් තොර වූ ප්‍රාසාදයක මතු මහලෙහිම වාසය කරවූවත් කුසේ තබාගත් නමුත් රැක ගැනීමට අපහසුවූයෝය. එහිසා ඔවුහු ගොයම් ආදිය මෙන් සෑම කල්හි ආරක්ෂා කරගත යුතු වෙති. බොහෝ ධනය ඇති සැමියන් විසින් අලංකාර වස්ත්‍රාභරණ දීමෙන් ආදි වශයෙන් ඇලා ගේ සිත වෙනත් පුරුෂයකු කරා ඇදී නොයන සේ රැකිය යුතුය. මුලු ශරීරයම මල් ගඳ විලවුන් ආදියෙන් වැසීම් වශයෙන් හෝ ආරක්ෂා කළ යුතු සිත් ඇති බැවින් ස්ත්‍රීහු නිතරම රැකිය යුත්තෝ වෙති. ''**යාසු සච්චං සුදුල්ලභං**'' ස්ත්‍රීන්ගෙන් සත්‍ය වචනයක් ලබාගැනීමට නොහැක. ස්ත්‍රීහු වනාහි ස්වභාවයෙන්ම ගින්නට වදිති, විස ද කති, සැනින් ගෙල කපා ගනිති, ගෙල වැලලා ගනිති, මෙසේ කළුරිය කලක් සත්‍යයේ පිහිටීමට අසමත් වෙති. එහිසා මෙබඳු ස්ත්‍රීහු හැරදමා සිටි මුනිවරු නම් සුවසේ වෙසෙන්නෝම බව දක්වයි.

දැන් යමක් ප්‍රහීණ නොකිරීමෙන් මෙබඳු ස්ත්‍රීන්ට බැඳීමට සිදුවේ ඒ කාමය රාගය තමන් වහන්සේට නොමැති බව, තමා එය ප්‍රහීණ කළ බව, අතිශයින්ම නිවීමට ගිය බව දක්වමින් දෙවන ගාථාව වදාරති. ''**වධං චරිඝාතෙ කාමා**'' එබ්බා කාමය! නුඹ නැසුවෙමි. නුඹ අතිශයින්ම මුලිනුපුටා දැමුවෙමි. ආර්ය මාර්ගයෙහි මම හැසිරෙමි. ''චරිඝාසෙ'' යන පාඨය ද යෙදේ. ''වධය පිණිස, ප්‍රහාණය පිණිස මග බඹසරෙහි හැසිරුනෙමි'' යන අර්ථය එහි ඇත. ''**අණනාදානි තෙ මයං**'' දැන් අග්‍ර මාර්ගයෙහි නියුක්ත වූ අවස්ථාවෙහි සිටම ණය බව ඇති කරන ධර්ම නැසූ බැවින් කාමය ! අපි නුඹට ණය නැත්තෝ වෙමු. නුඹගේ ණය ගෙවූයෙමු. අවීතරාගීවූවෝ රාගයට වසඟව පවතින බැවින් කාමයට දාස වූ ණය ගත්තෝ මෙනි. වීතරාගීහු වනාහී කාමය ඉක්මවා උතුම් වූ ප්‍රීතිමත්, ඉසුරුමත් භාවයෙන් යුතු බැවින් ණය නැත්තෝ වෙති. ''**අනිමිත්තා එව ගඣාම, දානි නිබ්බාණං යත්ථ ගන්ත්වා න සොචති**'' ''යම් නිවණකට ගමන් කිරීම නිසා සර්ව ප්‍රකාරයෙන් ම ශෝක හේතූන් නැසූ බැවින් ශෝක නොකරමු. ඒ අනුපාදිශේෂ වූ නිවණටම දැන් අපි ගියෙමු. පැමිණියෙමු'' යන අර්ථයයි.

ගෝතම තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.1.10

"**පුබ්බෙ හනති අත්තානං**" යනු ආයුෂ්මත් වසභ තෙරුන්ගේ ගාථාවයි. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයෙහිදී රැස් කරගත් පින්දහම් ඇතිව ලොවුතුරු බුදුවරුන්ගෙන් ලෝකය ශූන්‍ය වූ කාලයකදී බමුණු කුලයක උපන්හ. වියපත් ඔහු බමුණු ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට පැමිණ, ගිහිගෙයින් නික්මීමේ වැදගත්කම දුටු බැවින් ගිහි වාසය හැර තවුසු පැවිද්දෙන් පැවිදි ව, දාහතර දහසක් තවුසන් පිරිවරාගෙන, හිමවතට නුදුරෙන් වූ "**සමග්ග**" නම් පර්වතයේ අසපුවක විසීය. ධ්‍යානාභිඥා උපදවා තවුසන්ට අවවාද අනුශාසනා කරන හෙතෙම මෙසේ සිතීය. "මම දැන් මේ තවුසන් විසින් කරන සත්කාර, සම්මාන හා පූජාදියෙන් පිදුම් ලබමින් වෙසෙමි. මවිසින් පිදිය යුත්තෙක්, ගරු කළ යුත්තෙක් නොලබමි. මේ ලෝකයේ ගුරුවරයෙකු, ගරුකළයුත්තෙක් නොලබමි. මේ ලෝකයේ ගුරුවරයකු, ගරු කළයුත්තෙකු නොමැතිව විසීම දුකකි" මෙසේ සිතා පෙර බුදුවරු වෙත කරන ලද ප්‍රාර්ථනා ඇති බැවින්, පෙර බුදුවරුන්ගේ චෛත්‍යයන්ට තමා විසින් කරන ලද පූජා සත්කාර සිහිපත් කර, "ම පෙර බුදුවරු උදෙසා වැලිවලින් චෛත්‍යයක් සාදා පූජා කරන්නේ නම් මැනවි"යි ඉතා සතුටු සිතින් සෘද්ධියෙන් රන්වන් වූ වැලි සෑයක් මැවීය. එම සෑයට රන්මය වූ තුන්දහසක් පමණ මලින් දිනපතා ම පූජා පවත්වමින් ආයුෂ කෙළවර වනතෙක් නොපිරිහුණු ධ්‍යානයෙන් යුතුව සිට, කළුරිය කොට බඹලොව උපන්නේය. එහි ද පරමායුෂ විඳි හෙතෙම ඉන් චුතව තව්තිසා දෙවිලොව ඉපදුණි. පසුව ඒ කාම සුගති භවයන් සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී විශාලා මහනුවර ලිච්ඡවි රජකුලයෙහි උපන්නේය. "**වසභ**" නමින් ප්‍රකට වූ ඔහු වැඩිවියට පත්ව විශාලා මහනුවරට වැඩම වූ බුදුරදුන්ගේ ආනුභාවය දැකීමෙන් හටගත් ශ්‍රද්ධාව නිසා බුදුසසුනේ පැවිදි විය. විදසුන් භාවනාව වැඩූ වසභ තෙරණුවෝ නොබෝ කලකින්ම රහත් බවට පත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

"හිමවතට නුදුරෙහි '**සමග්ග**' නම් පර්වතයක් විය. එහි මනාව කරන ලද පන්සලක මම වාසය කළෙමි. එකල මම "**නාරද**" නම් වූ උග්‍ර තපස් ඇති ජටිලයෙක් වූයෙමි. දාහතර දහසක් ශිෂ්‍යයෝ මා පිරිවරා ගත්හ. විවේකීව සිටියා වූ මට මෙබඳු සිතුවිල්ලක් විය. "සියලු ජනයා මා හට පුදති. මම කිසිවකු නොපුදමි. මට ඔවා දෙන්නෙක් නැත. මම ආචාර්ය උපාධ්‍යායකු

නොමැතිව වන වාසයට පැමිණියෙමි. මම යමෙකු ඇසුරු කරන්නෙමි ද ගුරු සිත උපදවන්නෙමි ද එබඳු වූ ගුරුවරයෙක් මා හට නැත. මෙසේ වනයේ විසුම නිරර්ථකය. ම විසින් පිදිය යුතු වූ එසේම ගරුභාවනීය වූ උතුමෙකු සොයන්නෙමි. එබඳු උතුමෙකු ඇසුරු කරමින් වෙසෙමි. එවිට කිසිවෙක් මට නො ගරහන්නේ ය.''

නොගැඹුරු ඉවුරු ඇති මනා තොටුපල ඇති සුදෝසුදු වැලිතලාවෙන් ගැවසීගත් කුඩා ගඟක් මාගේ අසපුව සමීපයෙහි විය. එකල මම ''අපදික'' නම් වූ ඒ නදියට පිවිස වැලි එකතු කොට වැලි සෑයක් සෑදුවෙමි. ''භවය කෙළවර කළා වූ යම් ඒ සම්මා සම්බුදුවරු වැඩසිටියෝ නම් මේ සෑය උන්වහන්සේලා සඳහා ය. මෙය උන්වහන්සේලා අරමුණු කරගෙන මම සාදමි.'' මෙසේ සිතමින් වැලි සෑය සෑදූ මම සෘද්ධියෙන් රන් මවා ඉන් රන් කිකිණිමල් තුන් දහසක් පූජා කළෙමි. මෙසේ කරවූ සෑය වෙත උදේ සවස පැමිණි මම හටගත් සතුටින් බැඳැදිලිව නමස්කාර කළෙමි. සම්බුදුරජහු අභිමුවෙහි මෙන් සැමදා වැන්දෙමි. යම් කලෙක මා හට කාමාශ්‍රිත විතර්ක පහළ වේ නම් එකල්හි සර්වඥ ස්ථූපය සිහිකරමි. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළෙමි.

''නිදුකාණෙනි ! සාර්ත්‍රවාහක වූ විනායක වූ බුදුරජාණන් වහන්සේ ඇසුරු කොට පවතින නුඹ කෙලෙස් සමඟ වෙසෙහි නම් එය නුසුදුසුය'' මෙසේ සෑය සිහිකරන්නා වූ කෙණෙහිම මාගේ සිතෙහි බුද්ධ ගෞරවය ඇති වේ. කණමුලට අනිණ යවුලෙන් පෙලූ ඇතෙකු මෙන් මිත්‍යා විතර්ක දුරුකරමි.

මෙලෙස විසූ මම මාරයාට යටත් වූයෙමි. එහි කලුරිය කළ මම බඹලොව උපන්නෙමි. දිවිතාක් එහි විසූ මම තවිතිසා දෙව්ලොව උපන් මම අසූවාරයක් දිව්‍ය රාජව උපන්නෙමි. තුන්සිය වාරයක් සක්විති රජකම දැරූ මම ලබාගත් ප්‍රදේශ රාජ්‍ය ගණනින් ගිණිය නොහැක්කෙමි. මම ඒ කිංකිණි පුෂ්ප පූජාවෙහි විපාකය විඳිමි. භවයෙහි සිය දහසක් කිරිමවුවරු මා පිරිවරාගෙන සිටිති. සෑ රජුට පිදීම නිසා මගේ සිරුරෙහි දූවිලි නොවැකේ. ඩහදිය නොදමන මගේ ශරීරය ප්‍රභාවෙන් බැබලුණේය.

''අහෝ ! ආශ්චර්යයකි. ම විසින් මැනවින් කළ සෑයකි. නදිය එය වටකර ගෙන සිටී. වැලිසෑය සෑදූ මම අවල වූ නිවනට පැමිණියෙමි. කුසල් කරනු කැමති නිර්වාණ සාරය සොයන සත්ත්වයා විසින් ''මෙය කෙතය. මෙය නොකෙතයැ''යි වෙන්කර ගත යුත්තක් නැත. ප්‍රතිපත්තියම අර්ථසාධක

වන්නීය. බලවත් පුරුෂයෙක් සාගරය තරණය කිරීමට උත්සාහ කරන්නේ, කුඩා දඬුකඩක් ගෙන මහසයුරට පැන ''මම මේ දඬුකඩ නිසා මහසයුර තරණය කරන්නෙමි''යි උත්සාහයෙන්ද වීර්යයෙන් ද යුතු වූයේ කෙසේ හේ සාගරය තරණය කරන්නේ ද එලෙසින් ම මවිසින් යම් කුසල කර්මයක් කරන ලද නම් එය ඉතා කුඩාවූවකි. නමුත් ඒ සුළු පින්කම නිසා මම සසර ඉක්මවීමි.

ඒ කුසලයෙන් මෙහෙය වූ මම අන්තිම භවයේදී සැවැත් නුවර ආඪ්‍ය වූ මහාසාර කුලයක උපන්නෙමි. මගේ මවුපියෝ සැදැහැත්තෝය. බුදුරදුන් සරණ ගියෝය. ඒ දෙදෙනම දක්නා ලද නිවණ ඇතිව බුද්ධානු ශාසනයට අනුව පවතිති. ඔවුහු ශ්‍රී මහා බෝධියෙන් ගිලිහුණු පොතු ගෙන රන්සෑයක් කරවූහ. ශාක්‍යපුත්‍ර බුදුරදුන් හමුවෙහි මෙන් සිතා උදේ සවස ඊට නමස්කාර කළහ. පොහෝ දිනවල ඒ රන් ථූපය බැහැරට ගෙන බුදුගුණ ගයමින් තුන්යම් රැය ගෙවූහ. ඒ රන් ථූපය දුටු මා හට පෙර සෑදූ වැලි සෑය සිහිවුණි. ඒ අස්නෙහිම හිදී මම රහත් වූයෙමි.

ඒ උතුම් බුද්ධ වීරයන් වහන්සේ සොයන මා හට දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ හමු වී උන්වහන්සේ සමීපයේ පැවිදි වූයෙමි. උපතින් සත් වියැති වූ මම රහත් වූයෙමි. පසැස් ඇති බුදුරජාණන් වහන්සේ මගේ ගුණ මහිම දැන මා උපසපන් කරවූහ. ළදරු අවස්ථාවෙහිදීම මම කළයුතු කටයුතු නිමවූයෙමි. ශාක්‍ය පුත්‍රීය බුදු සසුනෙහි වෙනත් මවිසින් කළයුත්තක් නැත.

මහාවීර වූ ඍෂීන් වහන්ස! මම සියලු භය හා වෛර ඉක්මවූයෙමි. සියලු ක්ලේශයන් ඉක්ම වූයෙමි. ඔබ වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි. රන් මල් පූජාවේ මේ විපාකයයි. ම විසින් සියලු කෙලෙස් දවන ලදී. සියලු භවයෝ නසන ලදහ. ආශ්‍රව සිඳ ලූ මම ඇත් රජෙකු මෙන් වෙසෙමි. -පෙ- කෙලෙස් දවූ මම බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ වසභ තෙරණුවෝ දායකයන්ට අනුග්‍රහ කරන සේක් ඔවුන් විසින් පූජා කරන ප්‍රත්‍යයන් ප්‍රතික්ෂේප කරති. ලැබෙන අයුරින්ම ආහාර වළඳති. එය දුටු පුහුදුන් භික්ෂූහු ''මොහු කය වැඩිමෙහිම නියැලි නොරැක්නා ලද සිත් ඇත්තෙකි''යි අවමන් කරති. වසභ තෙරණුවෝ එම අවමන් නොසළකා වාසය කළහ. උන් වහන්සේ වසන තැනට නුදුරෙහි එක්තරා කුහක භික්ෂුවක් පවිටු සිතැතිව, තමා අල්පේච්ඡවූ ලද

දෙයින් සතුටුවන්නෙකු ලෙස ලෝකයා රවටමින් වාසය කළේය. මහජනයා මුලා වී උන්වහන්සේට රහතන් වහන්සේ කෙනෙකුන්ට මෙන් සත්කාර කරයි. මේ පුවත දුටු දෙවියන්ගේ ප්‍රධානියා වූ ශක්‍ර දේවේන්ද්‍රයා වසහ තෙරුන් වෙත පැමිණ "ස්වාමීනි! කුහකයා කුමක් නම් කරන්නේද?"යි විචාළේය. තෙරණුවෝ පාපියාට ගරහමින් මේ ගාථා දෙක වදාළහ.

"පුබ්බෙ හනති අත්තානං පච්ඡා හනති සො පරෙ
සුහතං හනති අත්තානං චිතං සෙනෙව පක්ඛිමා

න බ්‍රාහ්මණො බහිවණ්ණා අත්තො වණ්ණාහි බ්‍රාහ්මණො
යස්මිං පාපානි කම්මානි සබෙ කණ්හා සුජ්ඣති"

එහි "පුබ්බෙ හනති අත්තානං" යනු කුහක පුද්ගලයා තමාගේ කුහක දිවි පැවැත්මෙන් ලොව රවටනුයේ පවට කැමතිවීම් ආදි පාප ධර්ම නිසා පළමුව තමා නසා ගනියි. තමාගේ කුසලාභිවර්ධනය විනාශකර ගනියි. "පච්ඡා හනති සො පරෙ" ඒ කුහකයා පළමුව මුලින් පැවසූ අයුරින්ම තමා නසාගෙන පසුව අන්‍යයන් විසින් "මේ භික්ෂුව සිල්වතෙකි. ආයෂ්‍යන් වහන්සේ කෙනෙකි"යි ගරු සම්මාන කරන ලද්දේ ද, ඒ සැමදෙන ද විනාශ කරයි. සෙසු මහජනයා විසින් තමාට කරන ලද පූජාවන් මහත්ඵල-මහානිසංස නොකොට ප්‍රත්‍ය විනාශ කරයි. මෙසේ සිදුකරන කුහකයාගේ දෙපාර්ශ්වයම නැසීමෙහි, තමා නැසීමෙහි ඇති විශේෂත්වය දක්වමින් මෙසේ පවසයි. "සුහතං හනති අත්තානං" ඒ කුහකයා තමා නසාගනුයේ තමා සුරක්ෂිත කොට ගෙන නැසෙයි. විනාශවෙයි. ඒ කෙසේ ද? "චිතංසෙනෙව පක්ඛිමා" චිතංස යනු පක්ෂියෙකි. කුරුලේලෙකි. ඒ ලිහිණියන් මුලා කරන කුරුල්ලා විසින් "පක්ඛිමා" කුරුලු වැද්දා. යම් සේ ඒ ලිහිණියන් මුලා කරන පක්ෂියා විසින් අන්‍ය පක්ෂීන් රවටා නැසීමට පත් කරයි. ඌ මෙලොවදීම නුවණැත්තන් විසින් ගරහන, වරද දක්වනු ලබන්නේ දුකට පත්ව තමා නසා ගනියි. පරලොව දී දුක් පීඩා විඳිමින් නැසෙන්නේමය. ඒ පක්ෂීන් පසුව නැසීමට නොහැකි වේ. මෙසේ කුහකයා ද කුහකබවින් ලොව රවටා මෙලොවදීම විපිළිසරවීම්, නුවණැත්තන් විසින් ගැරහීම් ආදියෙන් දුකට පත් වේ. පරලොව දීම දුගතියට - පිරිතැබීමට පත් වේ. ඒ ප්‍රත්‍ය දායකයන් ද අපා දුකට පමුණුවයි.

නමුත් මෙහිදී කුහකයා දක්ෂිණාවේ මහත් ඵල බව නැසීම් පමණකින්ම දායයාට හානියක් කරයි. එම ප්‍රත්‍ය දානය නිෂ්ඵල වූවක් කිරීමට ඔහුට

නොහැක. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේ එහෙයිනි. - ''දුසිල් වූ මනුෂ්‍ය වූවෙකුට දන් දී දහස් ගුණ වූ දැකිණාවක් කැමතිවිය යුතුයි. පැතිය යුතුයි.'' එනිසා ''**සුහතං හනති ආතානං**'' 'තමා සුහතයෙකු කර නසයි' යනුවෙන් කියන ලදී. මෙසේ බාහිර පිරිමැදීම්, බාහිර හැසිරීම් වලින් පමණක් සංවර වූ පුද්ගලයෝ ''පිරිසිදුවූවෝ'' නොවෙති. අභ්‍යන්තරයෙන්ම ආධ්‍යාත්මික ගුණ වඩාගත් පුද්ගලයෝම පිරිසිදුවූවෝ යැයි දක්වමින් ''**න බ්‍රාහ්මණෝ**'' යනාදී දෙවැනි ගාථාව වදාළහ. එහි අර්ථ මෙසේය. ''ඉරියවු පිහිටවීම් ආදී බාහිර සම්පත්තියෙන් පමණක් බ්‍රාහ්මණයෙක් (රහතන් වහන්සේ කෙනෙක්) නොවේ. මෙහි ''වණණ'' යන ශබ්දයෙන් සම්පත්ති අර්ථය ගෙන දෙයි. (බහිවණණා - බාහිර සම්පත්තියෙන්, **අඤ්ඤා වණණා** - අභ්‍යන්තර සම්පත්තියෙන්) අභ්‍යන්තරික වූ සීලාදි ආධ්‍යාත්මික ගුණ සම්පත්තියෙන්ම බ්‍රාහ්මණයෙක් වේ. පවු බැහැර ලූ, ඉවත ලූ බ්‍රාහ්මණයෙකු - ආයදීයකු ලෙස තමා දක්වන්නා වූ පාපීලාමක ක්‍රියා ඇති පුද්ගලයා ඒකාන්තයෙන්ම ශක්‍ර දේවේන්ද්‍රයා! ''නිහීන වූ අකාර්ය පුද්ගලයෙකි''යි දැනගන්න. මෙය ඇසූ සක් දෙව්රජු කුහක භික්ෂුව වෙත ගොස්, ඔහු බියට පත් කර (තර්ජනය කර) ''ධර්මානුකූල වන්න''යි අවවාද දී සිය වාසස්ථානයටම ගියේ ය.

වසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දෙවැනි නිපානයේ පළමු වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

2.2.1

''සුසසුසා'' යනු ආයුෂ්මත් මහාචුන්ද තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයන්හි දී පින් රැස් කරමින් පැමිණ, විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී කුම්භකාර කුලයෙහි ඉපදුනහ. වැඩිවියට පත් ඔහු කුඹල් කර්මාන්තයෙන් ජීවත්වන සමයෙහි, දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් එක් මැටි පාත්‍රයක් මැනවින් සාදා උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කමේ බලයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී ''මගධ'' රට ''**නාලක**'' ගමෙහි **රූපසාරී** බැමිණියගේ පුතුව, සැරියුත් මහ තෙරුන්ගේ බාල සෝයුරාව උපන් ඔහු ''**චුන්ද**'' නමින් ප්‍රකට විය. වැඩිවියට පත් චුන්ද කුමරු දම්සෙනෙවි සැරියුත් තෙරුන් අනුවම පැවිදි වී, උන්වහන්සේ ඇසුරු කරමින් වෙසෙන්නේ විදසුනෙහි සිත පිහිටුවා උත්සාහ කර, වෑයම් කර නොබෝ කලකින්ම ෂඩ් අභිඥා උපදවා ගත්තේය.

චුන්ද තෙරණුවෝ අපදාන පාළියෙහි දී මෙසේ පැවසූහ.

''මම එකල්හි හංසවතී නුවර කුඹලෙක් ව උපන්නෙමි. චතුරෝඝයන් තරණය කළ, ආශ්‍රව රහිත වූ කෙලෙස් දූවිලි පිස දැමූ බුදුරදුන් දුටුවෙමි. මම මනාව සෑදූ මැටි පාත්‍රයක් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට පිදුවෙමි. සෘජු වූ තාදී ගුණැති උන්වහන්සේට පාත්‍රය පිදූ මම සසර භවයන්හි ඉපිද රන්තලී ලබමි. රිදීමය, රන්මය, මැණික්මය තැටි ද භාජන ද මම පරිභෝග කරමි. පාත්‍ර පිදීමේ පුණ්‍ය විපාකය මෙබඳුය. ඒ මම කීර්තියට ද දන ධාන්‍යාදී සැප ද ලැබුවෙමි.''

''යම් සේ සුන්දර තැනක රෝපිත ඉතා කුඩා වූත් බීජය, මැනවින් වැසිදිය ලබා ශස්‍ය ඵලයෙන් (අස්වැන්නෙන්) ගොවියාගේ සිත සතුටු කරයි ද එසේම බුද්ධ ක්ෂේත්‍රයේ රෝපිත මේ පාත්‍ර දානය නම් බීජය ප්‍රීති ධාරා වස්නා කල්හි එහි ඵලය මා සිත සතුටු කරන්නේ ය. සංඝයාගේ ද සමූහයාගේ ද යම්තාක් පින් කෙත් වේ නම් ඒවා උතුම් බුද්ධ ක්ෂේත්‍රය (බුද්ධ නම් කෙත) මෙන් සත්ත්වයන්ට සුව සෙත සැලසීමට සමත් නොවේ.''

''එනිසා පුරුෂ ශ්‍රේෂ්ඨයන්වහන්ස! ඔබ වහන්සේට නමස්කාර වේවා ! පුරුෂෝත්තමයන් වහන්ස! ඔබවහන්සේට නමස්කාර වේවා ! එකම

පාත්‍රයක් දුන් මම අචල වූ නිවණට පැමිණියෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පාත්‍රයක් දුන්නෙමි ද එදා සිට මේ දක්වා දුගතියක නූපන්නෙමි. පාත්‍ර දානයේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේ අනුශාසනය ඉටුකළෙමි.

ෂඩ් අභිඥා ලාභී වූ චුන්ද තෙරණුවෝ තමන් වහන්සේ ලබාගත් ගුණ සම්පත්තීන් ට හේතු භූත වූ ගුරු ඇසුර ද විවේකයෙහි ඇලීම ද ප්‍රකට කරන සේක්, මෙම ගාථා දෙක වදාළහ.

''සූසසූසා සුතවඩ්ඪනී, සුතං පඤ්ඤාය වඩ්ඪනං
පඤ්ඤාය අත්ථං ජානාති, ඤාතෝ අත්ථෝ සුඛාවහෝ

සෙවෙථ පන්ථානි සෙනාසනානි
චරෙය්‍ය සංයෝජන විප්පමොක්ඛං

සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථ
සඞ්ඝ වසෙ රක්ඛිතතෙතා සතීමා''

එහි ''සුසසූසා'' යනු ගුරු ඇසුරෙහි වසන්නා විසින් ඇසිය යුතුවූ අසා දැන ගත යුතු වූ දේ පිළිබඳ අසනු කැමැත්ත. දිට්ඨධම්මිකාදී (මෙලොවදී ඵල ලැබෙන) ප්‍රභේදයන්හි අර්ථය අසනු කැමැත්තා, කලණ මිතුරන් වෙත ගොස්, වත් පිළිවෙත් ආදියෙන් ඔවුන් ඇසුරු කරයි. එසේ ඇසුරු කිරීමෙන් ඔවුන්ගේ සිත සතුටු කර, මඳ වේලාවක් ඔවුන් සමීපයේ හිඳිනු කැමැති වේ. මෙසේ සමීපයේ හිඳ අවබෝධ කරගත යුතු බැවින් අසනු කැමති, යොමුකළ කන් ඇති බව අසනු කැමැත්තයි. ගුරු ඇසුරද ඇසීමට - ශ්‍රවණයට උපකාර වන බැවින් ''සූස්සූසා'' නම් වේ. ඒ මේ අසනු කැමැත්ත නිසා සත්‍ය, ප්‍රතීත්‍ය සමුත්පාදාදිය ප්‍රතිසංයුක්ත වූ ඥානවත්භාවයෙන් පුද්ගලයා පිරිපුන් වේ. ඥානයෙන් වැඩෙ යන අරුතින් ''සුතවඩ්ඪනී'' නම් වේ. හෙවත් බහුශ්‍රැත බව ඇති කරයි. ''සුතං පඤ්ඤාය වඩ්ඪනං'' යම් ඒ සුතධර වූ ඥානයෙන් යුක්ත වූ ඇතමෙක් මෙහි බහුශ්‍රැතයෙක් වේ. සූත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ දී වශයෙන් දේශිත නවංග සත්ථුශාසනය බහුශ්‍රැත බව ඇති කරයි. එය අකුසල් දුරු කර, කුසලාධිගමනයට හේතු භූත වන හෙයින් ප්‍රඥාව වඩයි. එනිසා ඇසීමෙන්, ඥානයෙන් ප්‍රඥාව වැඩේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''මහණෙනි! ඥානවත් (ඇසූපිරූ තැන් ඇති) ආර්ය ශ්‍රාවකයන් වහන්සේ අකුසල් දුරු කරයි. කුසල් වඩයි. සාවද්‍ය දේ බැහැරලයි. නිරවද්‍ය දේ වඩයි. පිරිසිදු වූ තමා (අභ්‍යන්තර - බාහිර වශයෙන්)

පරිහරණය කරයි.'' ''**පඤ්ඤාය අත්තානං ජානාති**'' බහුශ්‍රැතව සුතමය ඤාණයෙහි පිහිටා ඒ පිළිවෙත් පුරන්නා විසින් ශ්‍රැතානුසාරයෙන්, අර්ථ මෙනෙහි කරමින්, ධර්මාවබෝධය ලැබීමට එය වඩනුයේ, ලෞකික - ලෝකෝත්තරාදී භේද අති දිට්ඨධම්මිකා දී විභාග ද දුක්ඛා දී විභාග ද ඇති අර්ථයන් තත්ත්වාකාරයෙන් දැන ගනියි. අවබෝධ කරගනු ලබයි. එනිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. - ''අසන්නා වූ, අසා පිළිවෙත් පුරන්නාට අර්ථය මැනවින් වැටහී, ධර්මානුධර්ම පිළිවෙතට මනාව පිළිපන්නේ වේ.''

අසා ධාරණය කරගත් ධර්ම කරුණුවල අර්ථ මෙනෙහි කරන්නාට එම ධර්ම අවබෝධ වීමෙන් ඊට කැමැත්ත (ආශාව) ඇති වේ. කැමැත්ත නිසා උත්සාහ කරයි. උත්සාහ කරනුයේ සමාන කර බලයි. තුලනය කරනුයේ ආර්ය මාර්ගයේ ස්ථිරව පිහිටයි. තව තවත් උත්සාහ කරනුයේ කයින් මෙන්ම ප්‍රඥාවෙන් ද පරමාර්ථය, පරම වූ අර්ථය (යථාවබෝධය) සාක්ෂාත් කරගනියි. විනිවිද දකියි. ''**ඤාතෝ අත්ථෝ සුබාවහෝ**'' යම් සේ පවසන ලද දිට්ඨධම්මිකාදි අර්ථයෙන් ද දුක්ඛා දී අර්ථයෙන් ද යථාර්ථවත්ව දැන, අවබෝධ කරගෙන අනතුරුව, ''ලෞකික - ලෝකෝත්තරාදී භේද ඇති සුවයට පැමිණෙයි. සැප උපදවා ගනියි'' යන අර්ථයයි. අසන දේ ධාරණයෙන්, වැඩීම් සංඥාව ඇති ඇසීමෙන් පමණක් මෙය සිදු නොවේ. සත්‍යාවබෝධයට පිළිපැදීම අත්‍යවශ්‍ය බව දක්වමින් ''**සෙවෙථ -පෙ- විපපමොක්ඛං**'' යන ගාථාව වදාරා ඇත. එහි ''**සෙවෙථ පන්තානි සෙනාසනානි**'' යනුවෙන් කාය විවේකය පැවසිණි. වනයේ වන සෙනසුන් ඇසුරින් සංයෝජන ප්‍රහාණය කිරීම ද කියනු ලබන විවේකයේ හුදකලාවාසයෙන් ද මෙහිදී නොපැවසුණු සීල සංවරාදිය ද ඉටුවේ යැයි දත යුතුයි. ''**චරෙය්‍ය සංයොජන විප්පමොක්ඛං**'' යම්සේ සංයෝජනයනගෙන් සිත මුදවන්නේ ද එසේ වූ විදසුන් භාවනාවෙහි හා මාර්ග භාවනාවෙහි හැසිරෙන්නේය. පිළිපදින්නේ ය'' යන අර්ථයයි. ''**සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථා**'' යනු ඒ වනුයේ ඉතා දුර වූ සෙනසුන්හි ලැබෙන පරිදි අධිකුසල ධර්මයන්හි ඇලීම ද පූර්වාපර ගුණ විශේෂ නොලැබීමෙන් දඩි ඇලීම ද නොලබන්නේ නම්; භික්ෂු සමූහයා වෙති, සංඝයා වෙත පැමිණ ඉඳුරන් රැකගෙන කමටහන් පරීක්ෂා කරමින් රක්නා ලද සිත් ඇතිව, සදොර පිළිබඳව සිහිය පිහිටුවා, සිහියෙන් යුක්තව වාසය කරන්නේ ය. මෙසේ වාසය කරන භික්ෂුවගේ සන්තානයෙන් සංයෝජනයෙන් මිදී යෑම වන්නේ ය'' යන අදහසයි.

මහා චුන්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.2

''**යෙ බො තෙ**'' යනු ආයුෂ්මත් ජෝතිදාස තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදී පින් රැස් කරමින් අවුත්, සිබිනම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක උපන්හ. වියටපත් මේ සිටුකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස වැඩම කරනු දක, පැහැදුණු සිතින් කටු එරමිණිය ගෙඩියක් උන්වහන්සේට පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් - මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී පානීයපෝ ජනපදයේ මහත් සම්පත් ඇති බමුණකුගේ පුතුව ඉපිද ''**ජෝතිදාස**'' නමින් ප්‍රකට විය. වියටපත් ජෝතිදාස ගිහිගේ වසමින් සිටින කල්හි දිනක් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ තම ගමෙහි පිඬු පිණිස හැසිරෙනු දුටුවේය. පැහැදුණු සිතින් උන්වහන්සේ වළඳවා, සම්පයේ හිඳ ධර්ම ශ්‍රවණය කළ ජෝතිදාස, තම ගම සම්පයේ වූ පර්වතයක මහත් වූ විහාරයක් සාදවා, තෙරුන් වහන්සේ එහි වාසය කරවාගෙන සිවු පසයෙන් ඇප උපස්ථාන කරමින් නිතර බණ ඇසුවේය. තෙරුන්ගේ ධර්ම ශ්‍රවණය කිරීමෙන් ලැබූ ශ්‍රද්ධාව හා ගිහිගේ පිළිබඳ සංවේග ඇති ජෝතිදාස, විදසුන් භාවනාව වඩමින් නොබෝ දිනකින්ම ෂඩ් අභිඥා උපදවා ගත්තේය.

ජෝතිදාස තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''කඳු අතරෙහි වැඩ හුන්නා වූ සුපිපි කිණිහිරි රුකක් වැනි වූ රජස් විරහිත ලෝක ජ්‍යේෂ්ඨ වූ, නරශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. පහන් සිත් ඇති මම සතුටු සිතින් හිසෙහි ඇදිලි බැඳගෙන ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට කටු එරමිණිය ගෙඩියක් පිදුවෙමි. මෙයින් තිස් එක් කල්පයකට පෙර යම් ඵල පූජාවක් කෙළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලාභී වූ ජෝතිදාස තෙරණුවෝ ත්‍රිපිටකය උගෙන විශේෂයෙන් විනය පිටකයෙහි ඉතා දක්ෂ බවට පත්ව, දස වසරක් සිවු පිරිසට උපස්ථාන කළහ. අනතුරුව බොහෝ භික්ෂූන් පිරිවරා භාග්‍යවතුන් වහන්සේට වැඳීම සඳහා සැවැත් නුවර බලා වැඩම කරන අතර මගදී, ගමන් වෙහෙස නිවා ගැනීමට එක් අන්‍ය තීර්ත්‍යකාරාමයකට පිවිසි

උන්වහන්සේ, එහි එක් පසෙක හුන්නා වූ පංචතාපනයෙන් තමන් තවන්නා වූ බමුණෙකු දැක මෙසේ වදාළහ. ''බමුණ! කිම තමා තවනුයේ යැයි අනිකක් තවනුයේ ද?'' එය අසා කිපුණු එම බමුණා ''එම්බා මුඩු තැනැත්ත!, අනික් තැවිය යුතු දේ කවරේ ද?' යි විචාළේය. ඊට පිළිතුරු දෙන තෙරණුවෝ

''කොධොච ඉසසාච පරමොදනා ච
මානො ච සාරම්භමදෝ පමාදෝ

තණ්හා අවිජ්ජා භවසංගතී ච
තෙ තපනීයා හි රූපකඛන්ධෝ''

''ක්‍රෝධය ද ඊර්ෂ්‍යාව ද මානය ද එකටෙක කියා ගැනීම ද මදය ද ප්‍රමාදය ද තණ්හාව ද අවිද්‍යාව ද භව පැවැත්ම ද යන මේවා රූප ස්කන්ධයාගේ තැවීම් වේ.''

යන ගාථාවෙන් ධර්ම දේශනා කළහ. එම දේශනාව ඇසූ බමුණා ප්‍රධාන එම තීර්ත්‍යකාරාම වැසි සියළු අන්‍ය තීර්ත්‍යකයෝ තෙරුන් සමීපයේ පැවිදි වූහ. තෙරුන් වහන්සේ ඔවුන් සමඟ සැවැත් නුවරට ගොස්, භාග්‍යවතුන් වහන්සේට වැඳ දින කිහිපයක් එහි වාසය කළහ. පසුව තම උපන් බිමට ම වැඩම වූ ජෝතිදාස තෙරුන් දැකීමට පැමිණියා වූ නානාවිධ පිළිගැනීම් හා යාග-ශ්‍රද්ධීන් පිළිගත් ඥාතීන්ට අවවාද දෙමින් මේ ගාථා දෙක වදාළහ.

**යෙ ඛො තෙ වෙසම්සෙසන නානත්‍ථෙන ච කම්මුනා
මනුසෙස උපරුන්ධනති එරුසුපකකමා ජනා
තෙපි තත්‍ථෙව කිරනති නහි කම්මං පනස්සති**

**යං කරොති නරො කම්මං කල්‍යාණං යදි පාපකං
තස්ස තස්සෙව දායාදො යං යං කම්මං පකුබ්බති**

එහි ''යෙ'' අනියමින් දැක්වීමකි. ''තෙ'' යනු නියම වශයෙන්ම නැවත දැක්වීමයි. පද දෙකෙහි සබඳතාව දක්වන ''ඛො'' යන්න නිපාතයකි. යම්කෙනෙක්, ''වෙසම්සෙසන'' වරපට, කඩරෙදි ආදියෙන් හිස ආදී ශරීරාවයව වෙලීමෙන්, ''වෙඨම්ස්සෙන'' යන්න ද පාළියෙහි යෙදේ. මෙම අරුතම ඇත. ''**නානත්‍ථෙන ච කම්මුනා**'' නසන, ඝාතනය කරන, අත් පා සිඳින කුදු බවට ශරීරය පත්වන සේ වෙලීම් ආදි නානා විධ අනුන් නසන

ක්‍රියාවලින්. ''**මනුස්සෙ**'' යනු නිදසුන් ලෙස දැක්වීමක් පමණි. කිසියම් සත්ත්වයෙකුන්ට යන අර්ථයයි. ''**උපරුන්ධනති**'' පෙළති. පීඩා කරති. ''**එරුසූපක්කමා**'' දරුණු වූ ප්‍රයෝග ඇති, කුරිරුකම් ඇති. ''**ජනා**'' යනු සත්ත්වයෝ. ''**තෙපි තථෙව කීරන්ති**'' මෙසේ අනුන්ට විපත් කරන්නා වූ, අන්‍යයන්ට උගුල් අටවන්නා වූ ඔවුහු, තමන්ම ඊට හසුව විපතට පත්වෙති. හෙළනු ලැබෙති. නැතිනම් ඊට සමාන හෝ දුකකට පත්වෙති යන අර්ථයයි. ''තථෙව කීරන්ති'' යන පාඨය ද යෙදේ. ''තමා අනුන්ට යම් දුක් පැමිණවීද එලෙසින් ම අනුන් තමන්ට ද දුක් එළවති, දුකට පමුණුවති'' යන අර්ථයයි. කුමක් නිසාද? කර්මය විපාක නොදී නොනැසෙන හෙයිනි. ''**නහි කම්මං පනස්ස**'' **කම්** අනිවාර්යයෙන්ම විපාක දෙයි. රැස්වූ කර්ම, ඉතිරිවූ ප්‍රත්‍යයන්ගේ එකතුවීම ඇති කල්හි විපාක නොදී අහෝසි නොවේ. දැන් ''කර්මය විපාක නොදී නොනැසේ'' යැයි සංක්ෂිප්තව පැවසූ අර්ථය බෙදා දක්වමින් (විග්‍රහ කරමින්) සත්ත්වයන්ගේ කර්ම කිරීම ප්‍රකට කරමින් ''**යං කරොති**'' යන දෙවන ගාථාව වදාළහ. එහි අරුත මෙසේය. යම් කර්මයක් කුසල හෝ පාපී අකුසලයක් සත්ත්වයා කරයි ද කරවන්නේ ද එහි යම් කුසලා කුසල කර්මයක් විපාකදීමට සමත්වේද එබඳු වූ කර්ම රැස්කරයි. එය දායාද කරගනියි. ''**තස්සතස්සෙව දායාදො**'' ඒ ඒ කර්ම ඵලයේ ගැනීම් වශයෙන් ඒ ඒ කර්මයෙන් දෙනු ලබන විපාකයට භාජන වෙයි. ලක් වේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ ''මානවය! සත්ත්වයා කර්මය විසින් කරන ලදී. ඔවුහු කර්මය දායාද කර ඇත්තාහ''යි වදාළහ. මේ ගාථාවන් ප්‍රතිඵලයෙකැ''යි පිළිගත්හ. ''මේ වර්තමාන ජීවිතය අපගේ පෙර ක්‍රියාවල ප්‍රතිඵලයෙකැ''යි පිළිගත්හ. මේ ගාථාවන් අසා තෙරුන්ගේ ඥාතිවරු කුසල් රැස් කිරීමෙහි පිහිටියාහුය.

ජෝතිදාස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.3

''**අචයනති අහොරත්තා**'' යනු ආයුෂ්මත් හේරඤ්ඤකානි තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි දී හංසවතී නුවර කුලගෙයක උපන්හ. වියටපත් හෙතෙම අනුන්ගේ මෙහෙකරුවෙක්ව නුවර හැසිරෙනුයේ, දිනක් සුජාත නම් බුද්ධශ්‍රාවකයන් වහන්සේ පාංශුකූලයක්

සොයමින් වඩිනු දැක, උන්වහන්සේට රෙදි කැබැල්ලක් පූජා කළේය. ඒ පින්කම හේතුවෙන් තව්තිසාවෙහි උපන් ඔහු අනතුරුව ඒ ඒ දිව්‍ය-මනුෂ්‍ය භවයන්හි හැසිර මේ බුද්ධෝත්පාද කාලයේ දී කොසොල් රජුගේ ග්‍රාම භෝජක වූ චෝරඝාතකයාගේ පුතුව උපන්නේ ය. හේරඤ්ඤික නමින් ප්‍රකට වූ හෙතෙම තම පියා කළුරිය කළ පසුව රජු විසින් එම තනතුරෙහිම හෙවත් ගම්පති තනතුරෙහිම තබන ලදී. ජේතවනාරාමය පිළිගන්නා දින උතුම් බුදු සිරිය දුටු හෙතෙම ලැබූ ශ්‍රද්ධා ඇතිව තම බාල සෝයුරාට ග්‍රාමභෝජක තනතුර දී, රජුට ද දන්වා පැවිදි විය. පැවිදි කිස මැනවින් සැපිරූ හේරඤ්ඤික හිමියෝ නොබෝ කලකින්ම රහත් වූහ. අපදානපාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

එකල පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ සුජාත තෙරුන් වහන්සේ සිවුරු පිණිස පාංශුකූල රෙදිකඩක් සොයමින් කසල ඇතිතැන්හි හැසිරුණහ. මම හංසවතී නුවර අනුන්ගේ මෙහෙකරු වූයෙමි. උන්වහන්සේට රෙදි කඩක් පිදූ මම හිස නමා වැන්දෙමි. මැනවින් කළ ඒ කර්මය නිසාත්, චිත්තප්‍රණිධිය නිසාත් මිනිස් සිරුර හැර දෑමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. තිස් තුන්වරක් දෙව්රජව උපන් මම සැත්තෑ සත් වරක් සක්විති සම්පත් වින්දෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ්‍ය සම්පත් ගිණිය නොහැක. අඩ වස්ත්‍රයක් පිදුවෙමි හය විරහිතව සතුටු වෙමි.

අද මම කැමති නම් පර්වත සහිත වූ මේ මුළු පෙදෙසම කොටු පිළියෙන් වැසීමේ හැකියාවෙන් යුක්ත වෙමි. අඩ වතක් පිදීමේ විපාක එබඳුය. මෙයින් කල්ප ලක්ෂයකට පෙර දුන් දානයේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත්බවට පත් වූ උන්වහන්සේ තම බාල සෝයුරා ඒ ගිහි කටයුතුවලින් වලක්වාගනු කැමතිව, ගිහි කටයුතුවලම තදින් ඇලුණු ඔහුට චෝදනා කරමින් මේ ගාථා දෙක වදාළහ.

''අචිරයනති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති
ආයු ඛීයති මච්චානං කුනනදීනං ව ඔදකං

අථ පාපානි කම්මානි කරං බාලොන බුජ්ඣති
පච්ඡාසස කටුකං හොති, විපාකො හිසස පාපකො''

එහි ''**අවචයනති**'' ඉක්මවා යති, 'වහ වහා ඉවත්වයති'' යන අර්ථයයි. ''**අහොරත්තා**'' රෑ දාවල් දෙක ''**ජීවිතං උපරුජ්ඣති**'' ජීවිතින්ද්‍රිය ද ක්ෂණිකව නිරුද්ධවීම් වශයෙන් නිරුද්ධ වේ. මෙසේ පවසන ලදී. ''මහණ! නුඹ ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදින්නෙහිය, දිරායන්නෙහිය, චුතවන්නෙහි, උපදින්නෙහිය. ''**ආයු ඛියති මච්චානං**'' මැරෙන ස්වභාවයෙන් යුතු බැවින් ''මච්ච'' (සත්ත්ව) නම් වූ මේ සත්වයන්ගේ ආයුෂ - ''යමෙක් වර්ෂ සීයක් හෝ ඊට මදක් අඩු හෝ වැඩිව චිරාත් කාලයක් ජීවත් වේ'' යනුවෙන් පිරිසිඳ දක්වන ලද පරමායුෂ ක්ෂය වේ. ගෙවීමට බිඳීයාමට පත් වේ. කුමක් මෙන්ද යත් - කුඩා නදීන්හි දිය මෙනි. යම් සේ පර්වතයේ සිට ගලා බසින කුඩා දිය පහරවල ජලය බොහෝ කාලයක් නොසිටින්නේ ද, වහාම ක්ෂය වේද, ගලාගෙන පැමිණි මොහොතෙහි ඉවත්වේ ද සත්වයන්ගේ ආයුෂ ද එසේම වහා ගෙවී යයි. වහා ක්ෂය වේ. මෙහි ද ජලය ම ''ඔදකං'' යනුවෙන් අදහස් කෙරුණි. ''මන'' නම් සිත ම ''මානස'' වන්නාක් මෙනි. ''උදක'' නම් ජලය ''ඔදක'' වේ. ''**අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති**'' මෙසේ සංසාරය, ජීවිතය අනිත්‍ය වුවත් මෝඩයා, අනුවණයා, ලෝභයෙන් හෝ ක්‍රෝධයෙන් පව් කම් කරයි. පව් කම් කරමින් මේ පිළිබඳව අවබෝධ කර නොගනියි. පව්කම් කරන්නා තමා කරන්නේ පාපී වූ කටයුතු බව නොදන්නේ නොවේ. ඔහු එය දනියි. නමුත් මේ කර්මයට, මේ පාප ක්‍රියාවන්ට මේ මේ ප්‍රතිවිපාක දුක් පීඩා ලැබෙය යන කරුණ ඔහු නොදනියි. අවබෝධ කර නො ගනියි. ''**පච්ඡාසස කටුකං හොති**'' ඉදින් පාප කර්ම රැස්කරන මොහොතෙහි මේ ක්‍රියාවට මෙබඳු විපාක ලැබේ යැයි නොසිතියි. ඉන් පසුව නිරයාදියෙහි ඉපිදුණු එම පව් කම් කළ මෝඩයාට කටුක, අකමැති දුක්ම පිදීමට සිදු වේ. ඒ පාපියාට හිමි විපාක ලැබේ. මේ පාපකර්මවල විපාක නම් පාපිය, නිහීනය, අකමැති වූ දුක්දෙන්නාහුම වෙති. මෙම අවවාදය ඇසූ හේරඤ්ඤකානි තෙරණුවන්ගේ බාල සොහොයුරා රජුට දන්වා පැවිදි ව, නොබෝ කලකින්ම ස්ව අර්ථ සිද්ධිය ඉටුකර ගත්තේය. (රහත් වූයේය)

හේරඤ්ඤකානි ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.4

''පරිත්තං දාරුං'' යනාදී ගාථා ආයුෂ්මත් සෝමමිත්ත තෙරණුවෝ වදාළහ. එම ගාථාවල උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ පූර්ව බුදුරජාණන් වහන්සේලා ඉදිරියෙහි දී ඒ ඒ භවයන්හි ඉපිද පින් රැස් කරමින් අවුත් ''සිඛි'' නම බුදුරජාණන් වහන්සේ ගේ කාලයේ දී සිටුගෙයක උපන්හ. වියපත් සිටුකුමරු බුදුගුණ අසා පැහැදුණු සිතින් දිනක් පිපිණු එරබදු ගසක් දැක, ඉන් මල් නෙලාගෙන ශාස්තෘන් වහන්සේ උදෙසා අහසට දමා පූජා කළේය. ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳි ඔහු, මේ බුද්ධෝත්පාද කාලයේ දී බරණැස් නුවර බමුණු පවුලක ''**සෝම මිත්ත**'' යන නමින් උපන්නේ ය. ත්‍රිවේද පාරගත වූ ඔහු විමල නම් තෙරුන් වහන්සේ ඇසුරු කරමින් නිතර උන්වහන්සේගෙන් ධර්මය අසයි. ධර්ම ශ්‍රවණයෙන් උපදවාගත් ශ්‍රද්ධා ඇති සෝමමිත්ත බමුණා බුදුසසුනේ පැවිදි උපසම්පදා බව ලබා වත් පිළිවෙත් සපුරමින් වාසය කළේය. විමල තෙරණුවෝ කුසීතව, කම්මැලිව නිදිමත බහුල වූයේ දිවා රෑ නිදාගනිමින් කල් ගෙවූහ. සෝමමිත්ත හිමියෝ ''කුසීතයා සමඟ විසීමෙන් කවර ගුණයක් උපදී ද?''යි විමල තෙරුන් අත්හැර මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වෙත පැමිණ, උන්වහන්සේගේ අවවාදයන්හි පිහිටා විදසුන් වඩා නොබෝ දිනකින්ම රහත් ඵලයෙහි පිහිටියහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''පිපිඟිය කැලෑගසක් දැක ඇදිලි බැඳගෙන බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ සිහිපත් කොට අහසෙහි එම මල් තිබියදීම පූජා කළෙමි. මැනවින් කරන ලද එම කර්මය නිමිති කරගෙන හා චිත්ත ප්‍රණිධිය නිසා මිනිස් කය අත්හළ මම දෙව්ලොව උපන්නෙමි. මීට කල්ප තිස් එකකට පෙර කරන ලද පින්කම හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය.'' මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් සෝමමිත්ත තෙරණුවෝ, විමල තෙරුන්ට අවවාද දෙමින් තර්ජනය කරන සේක් මේ ගාථා දෙක වදාළහ.

''පරිත්තං දාරුමාරුය්හ යථාසීදෙ මහණ්ණවෙ
එවං කුසීතමාගම්ම සාධුජීවී විසීදති

නසමා නං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං''
''පච්චිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි
නිච්චං ආරද්ධවීරියෙහි පණ්ඩිතෙහි සහාවසෙ''

එහි **''පරිත්තං දාරුමාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ''** සුපේශල ශික්ෂාකාමී කුලපුත්‍රයා ද කුසීත අලස පුද්ගලයෙකු ඇසුරු කිරීමෙන් සසරෙහි ගිලේ (වැටේ) නිවණ නම් වූ පරතෙරට පැමිණීමට නොහැකි වේ. මෙලෙසින් ඒ අකුසල් දහම් වශයෙන් හිස නොඔසවාම කුසෙහි ගිලා බසී. කුසීත වූ වීර්යාරම්භ කිරීමෙන් දුරු වූ හීන වීර්ය ඇති පුද්ගලයා සියලුම ආකාරයෙන් වර්ජනය කරන්නේ ය. එබඳු පුද්ගලයා දිට්ඨානුගතියට (අනකරණයට) සුදුසු බවට පත් නො වන්නේය.'' යන අර්ථයයි. මෙසේ පුද්ගල අධිෂ්ඨාන වශයෙන් කුසීත බවෙහි ආදීනව මුල් ගාථාවෙන් දක්වා, දැන් වීර්යාරම්භයෙහි ආනිසංස දක්වීමට **''පච්චිත්තෙහි''** යනාදී ගාථාව වදාළහ. එහි අර්ථ-යමෙක් කාය විවේකයෙන් හටගත් අතිශය වූ විවේකයෙන් ම කෙලෙසුන් දුරු කිරීමෙන් ආර්ය වූ නිර්වාණයට යැවූ සිත් ඇති බැවින් ආරම්මණ හා ලක්ෂණයන්ගේ මෙනෙහි කිරීම් වශයෙන් ධ්‍යාන වඩන්නා වූ, සියලු කාලයම එසවූ වීර්ය ඇති බැවින් අරඹන ලද වීර්ය ඇති, ලෞකික ලෝකෝත්තර භේද ඇති ප්‍රඥාවෙන් යුක්ත වූ බැවින් හෙතෙම පණ්ඩිතයෙකි. එබඳු වූ පණ්ඩිතයන් සමඟ වසන්නේ ය. ස්වාර්ථය ඉටුකරගනු කැමති පුද්ගලයෝ එබඳු උතුමන් හා එක්ව වසන්නේය. මෙය ඇසූ විමල තෙරණුවෝ සංවේගයට පත් සිතැත්තේ විදසුන් වඩා ස්වාර්ථ සාධනය කරගත්හ. ස්වාර්ථය වූ නිර්වාණාවබෝධයට පැමිණියහ.

සෝමමිත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.5

''ජනො ජනම්හි සම්බද්ධො'' යනු ආයුෂ්මත් **සබ්බමිත්ත** තෙරුන් වහන්සේ වදාළ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී පින්දහම් රැස් කරමින් අවුත්, මෙයින් කල්ප අනූ දෙකකට පෙර තිස්ස භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි වැදි කුලයේ උප න්හ. වනයේ හැසිරෙන වැද්දෙකු වූ ඔහු වනයේ මුවන් මරා මස් කමින් ජීවත් විය. පසුව භාග්‍යවතුන්

වහන්සේ ඔහුට අනුග්‍රහ පිණිස වසන තැනට නුදුරෙන් පා සලකුණු තුනක් දක්වා වැඩි සේක. පෙර සිටම සම්මා සම්බුදුවරුන් කෙරෙහි කරන ලද පුහුණුවීම් ඇති ඒ වැදිතෙම, පා සලකුණේ සක් ලකුණු දැක පැහැදුණු සිතැත්තේ කරඬු මලින් පූජා කළේය. ඒ පින්කම හේතුවෙන් තව්තිසා භවනයෙහි ඉපිද සැප විඳි ඔහු ඒ ඒ කාම සුගතීන්හිම උපදිමින් සසර සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත්නුවර බමුණු කුලයක උපන්නේය. ''**සබ්බමිත්ත**'' නමින් ප්‍රකට වූ ඔහු වියට පැමිණ ජේතවනාරාමය පිළිගන්නා උත්සවයේදී පැවති බුද්ධානුභාවය දැක ලබන ලද ශ්‍රද්ධාවෙන් පැවිදි විය. ශ්‍රද්ධාවෙන් පැවිදි වී කමටහන් ගෙන ආරණ්‍යයට වැඩම කළ සබ්බමිත්ත තෙරණුවෝ වස් නිමවා භාග්‍යවතුන් වහන්සේට වැඳීම් සඳහා සැවැත් නුවර බලා පිටත් වූහ. අතරමඟ මුව වැද්දෙකු ඇටුවූ උගුලකට හසු වූ මුව පොවුවකු දුටු උන්වහන්සේ එහි මඳක් නතර වූහ. උගුලට හසු නොවුනත් දරු සෙනෙහස නිසා මව වූ මුවැත්තිය ඉතා දුර නොගොස්, මරණ භය නිසා උගුල සමීපයට ද නොගොස් පෙනෙන තෙක් මානයේ සිටියාය. මුව පැටියා ද බියවී එහෙ මෙහෙ පෙරලෙන්නේ බැගෑපත් හඬින් හඬයි. මෙය දුටු තෙරණුවෝ ''අනේ සත්ත්වයින්ගේ සෙනෙහසින් බැඳීම නිසා ඇතිවූ දුකක තරම''යි පවසා ඉදිරියට වැඩම කළහ. තවත් තැනකදී බොහෝ සොරු එක්ව එක් පුරුෂයෙකු ජීවග්‍රහයෙන් අල්ලාගෙන ඔහුගේ මුළු සිරුරම පිදුරුවලින් වසා දවනු දුටුවේය. ඒ මිනිසා ද මහ හඬින් කෑගැසීය. මේ සිදුවීම් දෙකම දැකීමෙන් හටගත් සංවේග ඇති සබ්බමිත්ත තෙරණුවෝ සොරුන්ට ඇසෙන සේ මේ ගාථා දෙක වදාළහ.

> ජනෝ ජනමහි සම්බද්ධෝ ජන මෙවසසිතෝ ජනෝ
> ජනෝ ජනෙන හෙඨියති හෙඨෙති ච ජනෝ ජනං
>
> කොහි තසස ජනෙනතථෝ ජනෙන ජනිතෙන වා
> ජනං ඔහාය ගචඡනතං හෙඨියිසසා බහුං ජනං

එහි ''ජනෝ'' යනු අදබාල ජනයායි. ''**ජනමහි**'' අන්‍ය ජනයා විසින් ''**සම්බද්ධෝ**'' තණ්හා බැඳීමෙන් බඳින ලදී. ''මේ මගේ දරුවා''යැයි මාපියවරු දරුවාට බැඳී සිටිති. ''මොවුහු මා පෝෂණය කරන්නේ ය. මම ජීවත්වන්නේ මොවුන් නිසාය'' යනුවෙන් දරුවා ද මාපියාදීන්ට බැඳී සිටියි. ''**ජනමෙවසසිතෝ ජනෝ**'' - මේ මගේ පුතාය, දුවය ආදි වශයෙන් අන්‍ය ජනයා අන්‍යවූම ජනයා සමඟ තණ්හාවෙන් ඇලී - බැඳී සිටිති. ''**ජනෝ ජනෙන හෙඨියති හෙඨෙති ච ජනෝ ජනං**'' කර්ම කල බැවින් ද තත් වූ

පරිදි සත්‍ය වශයෙන් අවබෝධ නොකළ බැවින් ද මධ්‍යස්ථ නොවී ලෝභයෙන් ඇලීමෙන් ජනයා අන්‍ය ජනයාට ඇලී සිටිති. ''මෙහි ඵලවිපාක මතු මත්තෙහි මා වෙත පැමිණේයැ''යි නොදන්නා බවින් ද්වේෂයෙන් ජනයා අන්‍ය ජනයා පෙළති. අන්‍යයන්ට පීඩා කරති. ''**කොහි තසස ජනෙනතෝ**'' එසේ ජනයා අන්‍යජනයා විසින් තණ්හාවෙන් ඇලී සිටීමෙනුත් ද්වේෂයෙන් පීඩාවට පත් කිරීමෙනුත් කවර ප්‍රයෝජනයක් ද? ''**ජනෙන ජනිතෙන වා**'' මවුපියවරු වී ඒ අන්‍යජනයා ඉපදවීමෙන් කවර ප්‍රයෝජනයක් ද? ''**ජනං ඔභාය ගච්ඡතනං හෙඨයිත්වා බහුං ජනං**'' සසර සැරිසරන සත්ත්වයාට මෙම පිළිවෙත් දෙකම ඇති බැවින ඒ ජනයා තුළ තණ්හාව ද ද්වේෂය ද වැඩි වීමෙන් ඔවුන්ම පෙළෙමින් සිටිති. එනිසා එම ලෝභ-දෝස දෙක මුළුමනින්ම සිඳ දමා, අත්හැර යා යුතුයි. එසේ යන්නෝ උපද්‍රව රහිත වූ ක්ෂේම භූමියට යන්නෝය. පැමිණෙන්නෝය. මෙසේ ගාථා දේශනාව පැවැත් වූ තෙරණුවෝ එකෙනෙහිම විදසුන් වඩා රහත් බවට පත්වූහ.

අපදාන පාළියේ උන්වහන්සේ මෙසේ පැවසූහ.

''පෙර මම පිය මුතු පරපුරින් වනයේ දඩයම කරනුයේ සිවුපාවුන් මැරීමෙන් ජීවත්වූයෙමි. මට කුසලයක් රැස් නොවිණි. තිස්ස නම් බුදුරජාණන් වහන්සේ මගේ අසපුව අබියසට වැඩ පසැස් ඇති ලෝකනායකයානන් වහන්සේගේ පියවර තුනක් දක්වූ සේක. එම පා සටහන් දැක හඳුනාගත් මම සතුටුව සතුටු සිතින් පා සටහනෙහි සිත පැහැදවූයෙමි. පිපී ගිය කරඬු ගසක් දුටු මම ඉන් කොපු සහිත මල් ගෙන ඒ ශ්‍රේෂ්ඨ ශ්‍රී පාද ලාංඡනය පිදුවෙමි. මැනවින් කරන ලද එම කුසල කර්මය නිසාත් චිත්ත ප්‍රණිධිය නිසාත් මිනිස් සිරුර හැර දමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. දිව්‍ය-මනුෂ්‍යාදී යම් අත්බවෙක උපනෙමි ද එකල මාගේ ශරීරය කෝරණ්ඩ පුෂ්ප වර්ණයෙන් බබලන්නේය. කරඬු මල් පාට සමක් මට ලැබෙන්නේය. මීට කල්ප අනූ දෙකකට පෙර යම් කර්මයක් කළෙමි ද ඒ නිසාවෙන් දුගතියක නූපන්නෙමි. පා සටහන් පිදීමේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.

සබ්බමිත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.6

''කාලී ඉත්ථී'' යනු ආයුෂ්මත් මහාකාල තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදී පින් රැස් කරමින් අවුත් මෙයින් කල්ප අනූ එකකට පෙර, කුලගෙයක ඉපිද වියට පත් වූහ. කිසියම් කටයුත්තකට ආරණ්‍යයට ගිය ඒ ගහපතියා අරණෙහි එක් ගසක් මුල වූ අත්තක එල්ලෙන පාංශුකූල චීවරයක් දැක ''අර්ය ධ්වජයක් ලබන ලදී''යි සතුටුව කිණිහිරි මලින් එම සිවුර පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්-මිනිස් දෙගතියේ සැරි සැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී සේතව්‍ය නුවර ගැල්වලින් බඩුගෙන ගොස් විකුණන කුලයක ඉපිද ''මහා කාල'' නමින් ප්‍රකට විය. වියපත්ව ගිහිගේ වසන මහාකාල පන්සීයක් ගැලින් බඩුගෙන ගොස් වෙළඳාම් කරමින් සැවැත් නුවරට පැමිණ, එහි එක් තැනෙක ගැල් බහා සිය පිරිස සමඟ දිගු ගමන් වෙහෙස නිවා ගනිමින් සිටියේය. සවස් වේලෙහි සුවඳ තෙල් මල් ගෙන ජේතවනාරාමයට යන උපාසකයන් දුටු මහාකාල ද ඔවුන් සමඟ විහාරයට ගියේය. ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම අසා ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වූ මහාකාල තෙරණුවෝ සොසානිකාංගය සමාදන්ව සොහොනේ වාසය කළහ. එක් දිනක් කාලී නම් කුලියට මිනී දවන ස්ත්‍රියක් තෙරුන්ට කමටහන සඳහා අලුත රැගෙන ආ මළ සිරුරක අත් පා සිඳ හිස ද දී සැලියක් මෙන් සිඳ එම සියලු අංග ප්‍රත්‍යංග සම්බන්ධ කරමින් තෙරුන්ට බලා සිටීමට සුදුසු තැනක තැබුවාය. එසේ තැබූ ඇය එකත් පසෙක සිටියාය. මේ මළසිරුර දුටු තෙරණුවෝ තමාටම අවවාද කර ගනිමින් මේ ගාථා දෙක වදාළහ.

''කාලි ඉත්ථී බ්‍රහති ධඤ්ඤරූපා
සත්ථිඤ්ච හෙත්වා අපරං ච සත්ථිං

බාහං ච හෙත්වා අපරං ච බාහුං
සීසඤ්ච හෙත්වා දධිථාලිකංව
එසා නිසින්නා අභිසන්ධිහිත්වා

යො වෙ අවිදිවා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො

තස්මාඋපධිං උපධිං න කයිරා
මාහං පුන භිනනසංඛා සයිස්සන්ති

එහි ''කාලි'' යනු ඇගේ නමයි. ඇගේ ශරීරය කළු බැවින් මේ නම යෙදුණි. ''බ්‍රහතී'' මහත් ශරීර ඇති, ආරෝහ පරිනාහ ඇති. ''ධඤ්ඤ රූපා'' කළුපාට බැවින් කපුටකුට බඳු රූව ඇති ''සත්තීං ව හෙට්ඨා'' මළ සිරුරේ කලවයක් දණ මඩලින් බිඳ. ''අපරඤ්ඤ සත්තීං'' අනිත් කලවයත් බිඳ ''බාහඤ්ඤ හෙට්ඨා'' අත් බාහු ඇට ද උරහිසින්ම බිඳ ''සීසඤ්ඤ හෙට්ඨා දධිථාලිකං වා'' මළසිරුරේ හිස බිඳ, දී සැළිය බිඳි කල්හි වැගිරෙන්නාක් මෙන් දඬු මුගුරු ආදියෙන් ගැසීම නිසා වැගිරෙන මොළ කැලි අති හිස'' යන අර්ථයයි. ''එසා නිසිනනා අභිසඤ්ඤිත්ථා'' සිදින බිදින ලද ඒ මල සිරුරේ ඒ ඒ අවයවයන් නියමිත තැනම තබමින් සංවිධානය කර, ගලපා මස් වෙළඳාමක් ඇරඹූ තැනැතතියක මෙන් මෙහි සිටින්නීය. ''**යො වෙ අවිඳ්‍වා උපධිං කරොති**'' යමෙක් මෙසේ ඔසවා තබන ලද කමටහන දැක දැකත් අඥාන අදක්ෂයෙකු බැවින් එම කමටහන අත්හැර අයෝනිසෝ මනසිකාරයෙන් (නුවණින් මෙනෙහි කරමින්) කෙලෙස් උපධීන් උපදවයිද ඔහු මෝඩයෙකි. මද නුවණ ඇත්තෙකි. සසර ගමන නොනැවැත්වීම නිසා නැවත නැවත නිරයාදී දුක්ඛයන්ට පැමිණේ ! ''**නඤ්ඤා පජානං උපධිං නකයිරා**'' එනිසා නුවණැති පුද්ගලයා මේ සිරුර පිළිබඳව හටගන්නා දුක් යෝනිසෝ මනසිකාරයෙන් සිහිකර බලා කෙලෙස් උපධීන් ඇතිකර නොගත්තේය. කෙලෙස් නූපදවන්නේය. කුමක් නිසාද? ''**මාහං පුන හිනනසිරො සයිස්සං**'' යනු යම් සේ මළසිරුර සිදී බිඳී මෙහි ශයනය කරන්නේ ද එලෙසින්ම කෙලෙස් උපධීන් නිසා සසර නැවත නැවත උපදිමින් ශරීරය වඩන්නෙකු වී සිදුණු බිඳුණු ශරීර ඇති බවට පත්ව මම සයනය නොකරම්වා. මෙසේ පවසමින් ම විදසුනෙහි සිත පිහිට වූ තෙරුන් වහන්සේ රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ

''හිමවතට නුදුරින් 'උරුගණ' නම් පර්වතයක් විය. එහි ගස් මුදුනක එල්ලූ පාංශුකූල සිවුරක් දුටුවෙමි. කිංකිණි මල් තුනක් නෙලා ගත් මම සතුටු සිතින් යුතුව ඒ උතුම් සිරුරට පූජා කළෙමි. මැනවින් කරන ලද එම කුසල කර්මය හා චිත්ත ප්‍රණිධිය නිසා මිනිස් කය හැර දමා දෙවිලොව උපන්නෙමි. මෙයින් කල්ප අනූඑකකට පෙර යම් කුසල කර්මයක් කළෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. අර්හත් ධ්වජය පිදීමේ පින මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

මහාකාල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.7

''බහූ සපත්තෙ ලභති'' යනාදී ගාථා ආයුෂ්මත් **තිස්ස** තෙරණුවෝ වදාළහ. එම ගාථාවන්ගේ උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදී සසරින් මිදීම සඳහා පින් දහම් රැස්කර ගනිමින් පැමිණි උන්වහන්සේ පියදස්සී භාග්‍යවතුන් සමයේදී බමුණු කුලයක උපන්හ. වැඩිවිය පත් බමුණු කුමරු ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගොස් කාමයේ ආදීනව දැක, ගිහිගෙයින් නික්ම තවුස් පැවිද්දෙන් පැවිදිව සල්වනයේ - අසපුවක් කරවාගෙන එහි වාසය කළේය. භාග්‍යවතුන් වහන්සේ එම තවුසාට අනුග්‍රහ පිණිස අසපුව නුදුරෙහි වූ සල් වනයේ නිරෝධ ඵල සමවතට සම වැදුනහ. අසපුවෙන් නික්ම ඵලවැල නෙලීමට ගිය තවුසා භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතැතිව දඬු සතරක් සිටුවා උන්වහන්සේ මත්තේ සුපිපි සල් අතුවලින් ශාඛා මණ්ඩපයක් සාදා සත් දිනක් වර්ණවත් සල් මලින් බුදුරදුන් පුදමින් බුද්ධාලම්බන ප්‍රීතියෙන්ම කල් ගත කළේය. සත්දින ඇවෑමෙන් නිරෝධ ඵල සමවතින් බුදුරජාණන් වහන්සේ නැගී සිට භික්ෂු සංඝයා පිළිබඳව සිහිපත් කළ සේක. එකෙණෙහිම ලක්ෂයක පමණ රහතන් වහන්සේලා ශාස්තෘන් වහන්සේ පිරිවරා ගත්හ. භාග්‍යවතුන් වහන්සේ තවුසාට ලැබෙන සම්පත් පිළිබඳ සඳහන් පුණ්‍යානුමෝදනාවක් පවත්වා භික්ෂු සංඝයා පිරිවරා වැඩි සේක. ඒ පින්කමේ විපාක ලෙස දෙව්ලොව උපන් තවුසාණෝ කාම සුගතීන්හිම සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහනුවර බමුණු පවුලක ඉපිද **තිස්ස** නමින් ප්‍රකට විය. වැඩිවියට පත්ව ත්‍රිවේද පාරගත වූ තිස්ස බමුණා පන්සීයක් පමණ තරුණයන්ට වේදය උගන්වමින් කීර්ති, ප්‍රශංසා, ලාභාදියෙන් අග්‍රප්‍රාප්ත විය. රජගහ නුවරට වැඩම කළ මුල් දිනයේ උතුම් බුදුසිරි දුටු තිස්ස බමුණා ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි විය. විඳසුන් කමටහනෙහි සිත පිහිට වූ තිස්ස තෙරණුවෝ නොබෝ කලකින්ම රහත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ

''සල්වනයට පිවිසි මා විසින් එහි මැනවින් අසපුවක් කරන ලදී. සල්මලින් ගැවසීගත් වනයේ වාසය කරන සමයෙහි සියලු දෙය තමන් වහන්සේ විසින්ම අවබෝධ කළා වූ භාග්‍යවත් පියදස්සී සම්බුදුරජාණෝ විවේක සැප කැමතිව සල්වනයට එළඹි සේක. එකල්හි ම අසපුවෙන් නික්ම වනයට ගොස් එහි මුල් හා ඵල සොයමින් ඇවිද්දෙමි. ඒ මහා

වනයෙහි මනාව වැඩහුන්නා වූ සමාධියට සමවැදුණු බබලන මහත් යසස් ඇති පියදස්සී බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. මුදනෙන් එකට බැඳ දඩු සතරක් තැබූ මම බුදුරදුන් මතුයෙහි සෙවන පිණිස මනා මඬුවක් සාදා එය සල්මලින් වැසුවෙමි. සල් මල් සෙවිලි කල එම මණ්ඩපය සත් දිනක් දරා සිටි මම එහි සිත පහදවා බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට වැන්දෙමි. පුරුෂෝත්ත වූ භාග්‍යවතුන් වහන්සේගේ සමාධියෙවන් නැගිට වියදඬු පමණ දුර බලමින් වැඩ හුන්හ. එකල්හි උන්වහන්සේගේ වරුණ නම් ශ්‍රාවකයාණෝ ලක්ෂයක් රහතුන් පිරිවරාගෙන බුදුරදුන් සමීපයට වැඩම කළහ. පස්මරුන් දිනූ ලෝක ජ්‍යෙෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ පියදස්සී භාග්‍යවත්හු භික්ෂු සංඝයා මැද හිඳ සිනා පහළ කලහ. පියදස්සී බුදුරදුන්ගේ අනුරුද්ධ නම් උපස්ථායක තෙරණුවෝ සිවුර ඒකාංශ කොට බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසූහ. ''භාග්‍යවතුන් වහන්ස!, ශාස්තෘන් වහන්සේ සිනා පහළ කිරීමට හේතු කවරේද? ශාස්තෘන් වහන්සේලා කරුණක් ඇතිවිටම සිනා පහළ කරති.'' එවිට බුදුපියාණන් වහන්සේ ''යම් මානවකයෙක් මා හට සතියක් පුරා මල් හෙවනක් දරුවේ ද ඔහුගේ කුසල කර්මය දැක මම සිනා පහළ කළෙමි. එම පින විපාක දේ නම් ඊට අවකාශ ඇති තැනක් මම නොදකිමි. දිව්‍ය මනුෂ්‍ය ලෝකයන් ඊට නොසෑහේ. පිනින් පිරුණු දෙවි ලොව වසන ඔහුගේ සියලු පිරිස ද සල් සෙවනින් වැසුනාහු වෙති. මේ පින් විපාක විඳින ඔහු දිව්‍යමය වූ නෘත්‍ය, ගීත, වාදිනාදියෙන් හැම කල්හි දෙව් ලොව සිත් අලවා වෙසේ. ඔහුගේ සියලු පිරිස ද සුවදින් සුවඳවත් වන්නේය. එකෙණෙහි සල් මල් වැසි ද වසින්නේ ය. මොහු දෙව් සැප විඳ මිනිස් ලොව උපදින කල්හි ද මනුලොව සැම කල්හි සල් සෙවෙණ දරන්නේය. කයිතාලම්, නැටුම්, ගැයුම් හා වැයුම් නිතරම ඔහු පිරිවරාගෙන සිටියි. හිරු උදාවන කල්හි සල් මල් වැසි වසී. මේ බුද්ධ පූජාවේ විපාකයයි.

මෙයින් කල්ප අටළොසකට පසුව ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්මයේ දායාද වූ ධර්මයෙන්ම නිර්මිත වූ ඖරස බුද්ධ පුත්‍රයෙකු වන මෙතෙම සියලු ආශ්‍රව ක්ෂය කොට පිරිනිවන් පාන්නේය. ධර්මාවබෝධය ලැබූ මෙතෙම සල්මල් සෙවෙනියක් ලබන්නේය. පිරිනිවී චිතකය දැවෙන කල්හි ද ඒ මත සල් මල් සෙවෙනියක් වන්නේය.''

මහාමුනි වූ පියදස්සී බුදුහු මෙසේ කරන ලද පින්කමේ විපාක වදාරා දහස් වැසි වස්වන සේක්. රැස්වූ පිරිසට දහම් දෙසූහ. ඒ මම කල්ප නිහක්ම දෙව් සැප විඳිමින් දිව්‍ය රාජ්‍යය කරවීමි. සැට සත්වරක් සක්විති

රජුට උපන්නෙමි. දෙවි ලොවින් මෙහි උපන් මම මහත් සැප ලැබුවෙමි. සදාකාලික වූ සල්මල් සෙවෙනියක් මෙහි ද මට විය. ශාක්‍ය කුල ශ්‍රේෂ්ඨ වූ ගෞතම බුදුරදුන් සතුටු කළ මම ජය පරාජය අත්හැර අචල ස්ථානය වූ නිවනට පැමිණියෙමි. මෙයින් කල්ප අටලොසකට පෙර කරන ලද බුද්ධ පූජාවේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් වූ තිස්ස තෙරණුවෝ විශේෂ වූ ලාභයෙන් හා යසසින් අග්‍රප්‍රාප්ත වූහ. එවිට ඇතැම් පුහුදුන් භික්ෂූහු තෙරුන්ගේ ලාභ සත්කාර දැක අඳ බාල බැවින් නොඉවසන බව දැන්වූහ. තෙරුන් වහන්සේ එය දැන ලාභ සත්කාරයන්හි ආදීනව ද එහි තමන් වහන්සේගේ නොඇලීම ද පවසන සේක් මේ ගාථා දෙක වදාළහ.

''පනූ සපතෙත ලභති මුණ්ඩා සඞ්ඝාටිපාරුතො
ලාභී අනනසස පානසස වත්ථසස සයනසසච

එතමාදීනවං ඤත්වා සක්කාරෙසු මහබ්භයං
අපපලාභො නවසසුතො සතො භික්ඛු පරිබ්බජෙ'' ති.

එහි අර්ථ මෙසේය. - හිස කෙස් ගසක්වත් ඉතිරි නොවන සේ මුඩු කළ කෙස් නොමැති බැවින් ''මුණ්ඩ' නම් වූ. සඟල වූ කශාය වස්ත්‍ර දරන බැවින් ''සඟල සිවුර පෙරවියා'' වූ, මෙසේ විවර්ණ (වෙනස්) බවට පැමිණි අනුන් නිසා ජීවත්වෙන පැවිද්දා, ඉදින් ආහාරපානාදිය බහුලව ලබන්නේ නම් ඔහුට බොහෝ සතුරෝ ලැබෙති. එම පැවිද්දාට ඊර්ෂ්‍යා කරන්නෝද බොහෝ වෙති. එනිසා මෙසේ වූ ලාභ සත්කාර විෂයෙහි මහත් වූ භයක් ද ආදීනව ද යන දොස් දැන, අල්පේච්ඡ බව, ලද දෙයින් සතුටු වන බව හදවතෙහි තබාගෙන සිටිය යුතු වේ. මෙසේ නිවැරදි සේ සිවුපසය ලැබීමෙන් ද උපත් ලාභ ප්‍රයෝජන දුරු කිරීමෙන් ද අල්පලාභී වේ. ඒ ප්‍රත්‍යලාභාදිය කෙරෙහි තණ්හාව ක්ෂය කරගැනීමෙන් ''අනවස්සුත'' නම් වේ. සසර භය දක්නා බැවින් ද සිඳින බිඳින ලද කෙලෙස් ඇති බැවින් ද ''භික්ඛු'' නම් වේ. ලද දෙයින් තුටුවන හා සිහි ඇතිව වෙසෙන බැවින් ''සතො'' නම් වේ. මෙසේ වූ ස්වභාවයෙන් රහතන් වහන්සේ ''පරිබ්බජේ'' හැසිරෙන්නෝය. වාසය කරන්නෝය. මෙම ගාථා දෙක ඇසූ පුහුදුන් භික්ෂූහු එකෙණෙහිම තිස්ස හිමියන්ගෙන් සමාව ඉල්ලා ගත්හ. (ක්ෂමා කරවා ගත්හ)

තිස්ස තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.8

''**පාචීනවංස දායමහි**'' යනු ආයුෂ්මත් **කිම්බිල** තෙරුන්ගේ ගාථාවන් ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේගේ පෙර කථා පුවත; සංවේග උපදවා ගැනීම හා පැවිද්ද ඒක නිපාතයේ ''**අභිසන්තෙතා**'' යනාදී ගාථාවේ අර්ථ වර්ණනාවේදී* පැවසූ පරිදිම දත යුතුයි. එම ගාථාවේදී කිම්බිල තෙරණුවෝ තමාගේ විශේෂාධිගමයන්ට හේතුව දක්වන ලදී. මෙහිදී විශේෂාධිගම ලබා තමාගේත් ආයුෂ්මත් **නන්දිය** හිමියන්ගේත් සමඟි වාසය නිමිති කරගෙන මෙම ගාථා දෙක දක්වන ලදී. සමඟිව වාසය කරනු කැමැත්තෝ කෙසේ විසිය යුතු ද? යන්න මෙම ගාථාවන්හි පැවසේ.

''පාචීනවංසදායමහි සක්‍යපුත්තා සහායකා
පහායානපපකෙ භොගෙ උඤ්ඡ පත්තාගතෙ රතා

ආරද්ධවීරියා පහිතත්තා නිච්චං දළ්හ පරක්කමා
රමන්ති ධම්මරතියා නිබ්බාන ලොකියං රතිං''

මෙම ගාථාවන්හි ''**පාචීනවංසදායමහි**'' යනු ප්‍රාචීනවංස නම් වූ රක්ෂිත, සුරක්ෂිත උවදුරු දුරලූ වනයෙහි. එහිදී ද ගමට නැගෙනහිරින් (පාචීන) පිහිටි බැවින් සහ උණගොමු ආදියෙන් ආරක්ෂිත වූ බැවින් ''ප්‍රාචීනවංසදාය'' යැයි කියන ලදී. නැතිනම් එක්ව වසන බැවින් ''වංසදාය'' යැයි කියන ලදී. ''**සක්‍යපුත්තා**'' අනුරුද්ධාදි ශාක්‍ය රජ කුමාරවරු ''**සහායකා**''යනු සංවේග උපදවා එකට පැවිදි වී එකටම මහණදම් පුරමින් එක්ව වසන, සමඟිව යන, එන, පවතින අර්ථයෙන් සහායක වූ යහළුවෝ. ''**පහායානපපකෙ භොගෙ**'' මහත් වූ පුණ්‍යානුභාවයෙන් ද කුල පරපුරින් ද හිමි වූ මහත් වූ සම්පත් රාශිය හැර දමා, පාළියෙහි ''සහායානපපකෙ'' යනුවෙන් ද යෙදේ. ''**උඤ්ඡපත්තාගතෙ රතා**'' පිඬුසිඟායෑමෙන් පමණි. පිඬුසිඟා පාත්‍රයට ලැබුණු බැවින් ''පත්තාගත' නම් වූ පාත්‍රයට ලැබුණු දෙයින් තෘප්තිමත් වූ, සතුටු වූ, නිර්වාණාවබෝධයට පෙර දී සඟබත් ආදී අතිරේක ලාභ පිළිකෙව් කර, කෙණ්ඩා (පාවල) ශක්තියෙන් ඇවිද, භික්ෂාවේ හැසිර තබන ලද මිශ්‍ර වූ බතින්ම සතුටු වූ'' යන අර්ථයයි. ''**ආරද්ධ වීරියා**'' උතුම් අර්ථය වූ අධිගමය වූ නිර්වාණාවබෝධයට මුලින්ම, පූර්වයේ සිට ම සන්සුන් වූ වීර්ය ඇති, ''**පහිතත්තා**'' බෑවුම් තැනිතලා කඳුහෙල් නොමැති හෙයින් කලින් කලට නිවණට සමවැදීම් වශයෙන් නිවණ කෙරෙහිම යෙදවූ සිත් ඇති, ''**නිච්චං දළ්හ පරක්කමා**'' වත් පිළිවෙත්හි දිට්ඨධම්මික

සුබ විහරණයෙන් මුලු කාලයම ලිහිල් නොවූ වීර්යයෙන්, පරාක්‍රමයෙන් ගත කරන. නිතර දැඩි වීර්ය ඇති, ''**රමනති ධම්මරතියා හිත්වාන ලොකියං රතිං**'' ලෝකයේ දැනගත්, ප්‍රකට වූ බැවින් ද ලෝකයට අයත් වූ බැවින් ද ලෞකික නම් වූ රූපාදි අරමුණුවල ඇලීම මාර්ග ප්‍රඥාවෙන් දුරුකර, ඉවත ලා ලෝකෝත්තර දහමිහි ඇලීමෙන් ද අග්‍රඵලය වූ නිර්වාණයෙහි ඇලීමෙන් ද සතුටු වේ. නිවණෙහි වෙසෙසින් ඇලෙමි.

කිම්බිල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.9

''අයොනිසො මනසිකාරා'' යනු ආයුෂ්මත් **නන්ද** තෙරුන්ගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? නන්ද තෙරණුවෝ පෙර **පදුමුත්තර** භාග්‍යවතුන්ගේ කාලයේ හංසවතී නුවර සිටුගෙයක ඉපිද වියපත්ව නිතර එම භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය අසති. දිනක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් ඉන්ද්‍රියසංවර භික්ෂූන්ගෙන් අගතනතුරෙහි තබනු දුටු ඔහු, ''මම ද එම තනතුර ලබමි''යි පතා භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු මහා සංඝරත්නයට ද පූජා සත්කාර කරමින් මහදන් පැවැත්වීය. දන් දී ''මම ද අනාගතයේ පහළවන ඔබ වැනි ම වූ ලොව්තුරු බුදුවරයන් වහන්සේ කෙනෙකු හමුවේ මෙබඳු වූ ශ්‍රාවකයෙක් වෙමි''යි ප්‍රාර්ථනා කොට, එතැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත්, **අත්‍ථදස්සි** බුදුරදුන් ගේ කාලයේදී විනතා නම් නදියේ මහත් කැස්බෑවෙකුව උපන්නේය. දිනක් ශාස්තෘන් වහන්සේ එතෙරවනු කැමතිව ගං ඉවුරෙහි සිටිනු දුටු කැස්බෑවා උන්වහන්සේ එතෙර කරවනු කැමතිව බුදු පාමුල හොත්තේය. ඔහුගේ අදහස දුටු ශාස්තෘන් වහන්සේ කැස්බෑවාගේ පිටට නැගි සේක. දැඩි සේ සතුටට පත් කැස්බෑවා ඉතා වේගයෙන් දිය පහර සිඳගෙන වහාම උන්වහන්සේ එතෙර කරවීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට පුණ්‍යානුමෝදනා කර, ලැබෙන සම්පත් වර්ණනා කර වැඩි සේක. මේ උතුම් පින්කම් නිසා කාමසුගතීන්හිම සැරිසැරූ ඔහු, අපගේ බුදුරජාණන් වහන්සේ පහළවන සමයෙහි කපිලවස්තුවේ සුද්ධෝදන මහරජුගේ පුතු ව මහාප්‍රජාපතී ගෞතමියගේ කුසෙහි ඉපදුණි. ඔහුට නම් තබන දවසේ ''සියලු නෑ සමූහයා සතුටු කරමින් නන්දනය කරමින් උපන් බැවින්'' ''**නන්ද**'' යැයි නම් තැබූහ. නන්ද කුමරු වියපත්වූ සමයේ දී ශාස්තෘන් වහන්සේ දම්සක් දෙසුම

පවත්වා, ලෝකයාට සෙත සලසමින් කපිලවස්තුවට වැඩම වූහ. නෑයන් එකතු වූ අවස්ථාවෙහි වූ මල් වැස්ස අර්ථෝත්පත්ති කරගෙන වෙස්සන්තර ජාතකය දේශනා කළ තථාගතයන් වහන්සේ දෙවැනි දින පිඬුපිණිස හැසිරෙමින් ''**උනතිංයෙ නපපමජ්ජෙය්‍ය**'' ගාථාවෙන් පියාට දහම් දෙසා ඔහු සෝවාන් ඵලයෙහි පිහිට වූ සේක. රජ මැඳුරට පිවිසි උන්වහනසේ ''**ධම්මං චරෙ**'' යන ගාථාවෙන් දහම් දෙසා මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් ඵලයෙහිද සුදොවුන් රජ සකෘදාගාමී ඵලයෙහිද පිහිට වූහ. තෙවැනි දින නන්ද කුමරුගේ අභිෂේකය, ගෘහ ප්‍රවේශය, විවාහය යන මංගල්‍ය තුනක් යෙදී තිබෙන කල්හි පිඬු පිණිස වැඩම කළ බුදුපියාණන් වහන්සේ නන්ද කුමරුට පාත්‍රය දී ''සුභ මංගල්‍යයක් වේවා!''යි වදාරා, ඔහුගේ අතින් පාත්‍රය නොගෙනම විහාරයට වැඩි සේක. නන්ද කුමරු ද පාත්‍රය රැගෙන විහාරයට ම පැමිණි පසු ඔහු නොකැමැත්තෙන් ම පැවිදි කරවූ සේක. එසේ පැවිදි වූ නන්ද හිමි පැවිද්ද පිළිබඳව කළකිරී සිටි බව දුටු තථාගතයන් වහන්සේ උපායකින් එය දුරු කළ සේක. සිහිනුවණින් විමසා බලා විදර්ශනාවෙහි සිත පිහිටුවා ගත් නන්ද හිමියෝ නොබෝ කලකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''සියල්ල තමන් වහන්සේම අවබෝධ කළා වූ ලෝකනාය වූ භාග්‍යවත් වූ අපරාජිත බුදුරජාණන් වහන්සෙ විනතා නදී තෙරට වැඩම කළහ. එකල මම ජලයේ හැසිරෙන කැසුබුවෙක් වූයෙමි. උන්වහන්සේ ගඟින් එතෙර කරවනු කැමති වූ මම ලෝක නායකයන් වහන්සේ වෙත එළඹ මෙසේ සිතුවෙමි. ''මහාමුනි වූ බුදුරජාණෙනි මාගේ පිටට නගීවා. ඔබ වහන්සේ ම තරණය කරන්නෙමි. ඔබ වහන්සේ ලෝකයාගේ දුක් කෙළවර කරන්නෙහිය.

මගේ අදහස් දත් මහත් යසස් ඇති අපරාජිත බුදුපියාණෙනි මා පිටට නැඟි සේක. යම් අත්භවෙක සිට මා පිළිබඳව සිහිකරම් ද යම් තැනක සිට නැණවත් බවට පැමිණියෙමිද ඒ කිසිදු තැනෙක ඔබවහන්සේගේ පාද ස්පර්ශය ලද මොහොතේ මා හට දුනුණු සුවය නම් නොදැණුණි. එබඳු සුවයක් නොලදිමි. මහත් යශස් ඇති බුදුහු ගඟින් එතෙර වී මේ ගාථාවන් වදාළහ. ''මේ ගඟ තරණය කරමි යි මා සිතූ මොහොතෙහි මේ ඥානවන්ත කැසිබුවා මා එතෙර කරවීය. මෙතෙම ඒ පිනින් ද මෙත් සිත් ඇති බැවින් ද කල්ප දහ අටක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ ''දෙව්ලොවින් මෙහි පැමිණ හුනස්නෙහි ම සැක නම් සැඩපහර තරණය කරන්නේය.''

සරු කෙතක රෝපිත ස්වල්ප වූ බීජුවට මනාව වැසි වස්නා කල්හි ශස්‍ය ඵලය ගොවියා තුටු කරන්නාක මෙන් මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් දෙසූ පරිදි බුදුන් වෙත කරන ලද පූජාව පිළිබඳ වූ දහම් වැස්ස වස්වන කල්හි ඒ පින් ඵල මා සතුටු කරවිය. ප්‍රධන් වීර්යයෙහි මෙහෙයූ සිතැත්තෙමි. උපශාන්ත වූයෙමි. උපධි රහිත වූයෙමි. සියලු ආශ්‍රව ප්‍රහීන කොට දැන් අනාශ්‍රවව වෙසෙමි. මීට **කල්ප** දහ අටකට පෙර කරන ලද පින්කම නිසා එතැන් පටන් දුගතියක නූපන්නෙමි. බුදුරදුන් එතෙර කිරීමේ පින මෙබඳුය දැන් මම කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහනසේගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත්ව විමුක්ති සුව විඳින නන්ද තෙරණුවෝ ඒ පිළිබඳ සිහිකරමින් ''ශාස්තෘන් වහන්සේගේ උපායෙහි දක්ෂ බව පුදුමයි ! මම භව, සංසාර නම් මඩ ගොහොරුවෙන් උඩට ගෙන නිවන් නම් ගොඩබිමෙහි පිහිටුවීම ඉතා පුදුම සහගතයි'' යනුවෙන් තමන්වහන්සේ කෙලෙස් ප්‍රහීණ කර ලැබූ සුවය සිහිපත් කිරීමෙන් හටගත් සොම්නසින් මේ ගාථා දෙක වදාළහ.

''අයොනිසොම නසිකාරා මණ්ඩනං අනුයුඤ්ජිසං
උද්ධතෝ චපලොචාසිං කාමරාගෙන අට්ටිතෝ

උපාය කුසලෙනාහං බුද්ධෙනාදිච්චබන්ධුනා
යොනිසෝ පටිපජ්ජිත්වා භවෙ චිත්තං බුදබ්බහිං'' තී.

එහි ''අයොනිසෝ මනසිකාරා'' උපාය රහිතව සිහිපත් කිරීමෙන් අසුභ වූ කය සුභ වශයෙන් සිහිපත් කර සුභ වශයෙන් ගනියි. සිහිපත් කිරීම නිසා අසුභ වූ කය පිළිබඳව සුභ සඤ්ඤා උපදවා ගනියි. ''**මණ්ඩනං**'' අත් පා ආදියේ පළඳින ආභරණ වලින් මෙන්ම මල් ගඳ විලවුන් ආදියෙන් ශරීරය අලංකාර කර ගැනීම. ''**අනුයුඤ්ජිසං**'' යෙදුනෙමි. ශරීරය සැරසීමෙහි ම යෙදුනෙමි. ''**උද්ධතෝ**'' ජාති, ගෝත්‍ර, රූප, යෞවන, මද ආදියෙන් නොසන්සුන් වූ, නොසන්සිදුණු සිතැති, ''**චපලෝ**''යනු වල් වඳුරෙකු මෙන් නො රක්නා ලද සිත් ඇති බැවින් ලොල් වූ. කය සැරසීම්, අත් පා සැරසීම් ආදි චපල කටයුතුවල යෙදුණු බැවින් චපල වූ. ''**ආසිං**'' වූයෙමි. ''**කාමරාගෙන**'' වස්තු කාමයන්හි ඡන්ද රාගයෙන් මැඩුනේ පෙළුණේ, බාධිත වූයෙමි. ''**උපාය කුසලෙන**'' යනු හික්මවිය හැකි පුද්ගලයන් දමනය කිරීමේ උපායෙහි දක්ෂ වූ සමර්ථ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින්

මෙහි හේතු අර්ථයේ කරණ විභක්තිය යෙදුණි. දාගිය වැඳිරි රුව හා දිව්‍යාංගනාවන් පෙන්වා උසුළු විසුළු කිරීම්, චෝදනා කිරීම් ආදියෙන් තමාගේ කාමරාගය දුරුකිරීම සිහිගැන්වීමට මෙසේ පවසති.

භාග්‍යවතුන් වහන්සේ පළමුව නන්ද තෙරුන්ට ජනපද කල්‍යාණිය දැඩිව ගැනීම නිසා ''මේ දෙවඟනන් දුටු පසු දාගිය වැඳිරිය ජනපද කල්‍යාණිය මෙනි' යැයි වැටහෙන පරිදි, මහ ඇණයකින් කුඩා ඇණයක් ගලවන වඩුවකු නේ ද තෙල් පානයක් සමඟ ශරීරයට කිරි පොවා වමන විරේචන මගින් සිරුරේ දොස් කිපීම් නසන වෛද්‍යවරයකු මෙන් ද දිව්‍යාංගනාවන් දක්වා ජනපද කල්‍යාණියට ඇලුණු සිත බැහැරට ගෙන, චෝදනා කිරීම් ආදියෙන් දිව්‍යාංගනාවන්ට ඇලුණු සිත ද විරාගී බවට පමුණුවා, මනාව සමථ-විදර්ශනා භාවනාවන්ට යොමු කරවා ආර්ය මාර්ගයෙහි පිහිට වූ සේක. ''**යෝනිසො පටිපජ්ජිත්‍වා හවෙ චිත්තං උදබ්බහී**'' උදයව්‍යය (ඇතිවන - නැතිවන) දන්නා නුවණින් මනාව සමථ විදර්ශනාදී විසුද්ධ ප්‍රතිපදාවට අවතීර්ණවීමෙන් භව සංසාර මඩෙහි ගිලුණු මගේ සිත ආර්ය මාර්ගය නම් අතින් ගෙන ගොඩට දමන ලදී. නිවන නම් ගොඩබිමෙහි පිහිටුවන ලදී. මෙසේ උදන් අණන්නා වූ නන්ද හිමියෝ දෙවැනි දිනයේ දී භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ වදාළහ.

''ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්සේ මා හට ඉතා සුන්දර පන්සියක් දෙවඟනන් ලබාදීමට යම් ඇපයක් වූ සේක් ද, මම එම ඇපයෙන් ඔබ වහන්සේ මුදවමි''යි යනුවෙන් පැවසූ වදන් ඇසූ බුදුරජාණන් වහන්සේ ද ''නන්දය! යම් මොහොතක නුඹගේ සිත මිදුනේ ද එතන් පටන් මම ඒ ඇපයෙන් මිදුනෙමි''යි වදාළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්ද තෙරුන් සුවිශෙෂී ලෙස ඉන්ද්‍රිය සංවරයෙහි නියුතු වූ බව දැන, එම ගුණය ප්‍රකට කරන සේක්; මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් ඉන්ද්‍රිය සංවරයෙහි නියැලි භික්ෂූන් අතර අග්‍රස්ථානයට මේ නන්ද තෙරණුවෝ පත්වෙති''යි අගතනතුරෙහි තැබූ සේක. නන්ද තෙරුන් වහන්සේ තමන් ම ''මම ඉන්ද්‍රිය සංවර නොකර ගැනීම නිසා මෙබඳු විප්‍රකාරයකට පත්වීමි. එනිසා ඊට මනාව නිග්‍රහ කරන්නෙමි''යි උත්සාහ වඩා අතිශයින් ලැජ්ජා - බිය ඇතිව, ඉන්ද්‍රිය සංවර බව පතාගෙන පෙරුම් පිරූ බැවින් ද ඉන්ද්‍රිය සංවර වූ භික්ෂූන් අතර අග්‍රස්ථානයට පත් වූහ.

නන්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.2.10

''**පරෙව නං පසංසන්ති**'' ආයුෂ්මත් **සිරිම** තෙරණුවන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදු වීද? පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ඒ ඒ භවයන්හිදී පින්දහම් රැස්කරමින් අවුත්; **පදුමුත්තර** බෝසතණන් වහන්සේ පාරමී සම්පූර්ණ කර තුසිත භවනයේ සිටින කල්හි බමුණු පවුලක උපන්හ. වියපත් බමුණු තරුණයා ත්‍රිවේද පාරගතව, නිඝණ්ඩු - කෙටුභ - සහිත අක්ෂර ප්‍රභේදාදිය ද පස්වන වේදය වූ ඉතිහාසය ද පද ව්‍යාකරණාදියද ලෝකායන මහා පුරුෂ ලක්ෂණාදී ශාස්ත්‍ර ද හදාරා ගිහිගෙයින් නික්මීමේ අදහස් ඇතිවිය. කාම සම්පත් හැර තවුස් පැවිදුමෙන් පැවිදි වූ ඔහු, අසූහාරදාහක් පමණ තාපස සමූහයක් පිරිවරාගෙන හිමවතෙහි දෙවියන් මැවූ අසපුවක ධ්‍යාන අභිඥා උපදවා ගෙන වාසය කළේය. නායක තාපසයාණෝ පෙර බුදුවරු කෙරෙහි කළ ප්‍රාර්ථනා ඇති බැවින් ලක්ෂණ ශාස්ත්‍රයේ දක්වෙන අයුරින්ම බුදු ගුණ සිහිකර, අතීත බුදුවරු උදෙසා එක්තරා ගං තෙරක වැලි සෑයක් සාදා ඊට පූජා සත්කාර කළහ. එය දුටු ශිෂ්‍ය තාපසවරු ''මේ පූජා සත්කාර කරන්නේ කවුරු උදෙසාද?'' ඇසූහ. එවිට නායක තවුසා ඔවුන්ට ලක්ෂණ ශාස්ත්‍රය ගෙන හැර දක්වා, එහි දක්වෙන මහා පුරුෂ ලක්ෂණ බෙදා දක්වමින් ඒ අනුසාරයෙන් තම ශක්ති පමණින් බුදු ගුණ පැවසීය. එය අසා පහන් සිත් ඇති වූ ඒ ශිෂ්‍ය තාපසවරු ද එතැන් පටන් සම්මා සම්බුදුරජාණන් වහන්සේ උදෙසා ථූප පූජා පවත්වමින් විසූහ. මේ කාලයේ දී පදුමුත්තර බෝසත්හු තුසිත දෙව්ලොවින් චුතව මවුකුස පිළිසිඳ ගත්හ. ඒ අවසන් භවයේදී දෙතිස් පූර්ව නිමිත්ත සියලු ආශ්චර්ය අද්භූත ධර්ම ද පහළ විය. එම අසිරිමත් ලක්ෂණ සෙසු තවුසන්ට පෙන්වා සම්මා සම්බුදුවරු පිළිබඳ අධික ප්‍රසාදයක් ඇති කරවූ නායක තවුසාණෝ මියගොස් බඹලොව උපන්හ. තම ශරීරය දවමින් පුද පූජා කරන ශිෂ්‍ය සමූහයා වෙත පැමිණි ඒ බ්‍රහ්මයා, ''මම නුඹලාගේ ගුරුවරයා වෙමි. සෑයට පූජා කිරීමෙන් මම බඹලොව උපන්නෙමි. නුඹලා ද අප්‍රමාදී වවු.''යි පවසා බඹලොවටම ගියේය. හෙතෙම මෙසේ දෙව් මිනිස් දෙගතියේ සැරිසරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත්නුවර ගහපති නිවසක උපන්නේය. ඔහු උපන් දිනයේ පටන් ඒ නිවසේ ශ්‍රී සම්පත් වැඩුණේය. එබැවින් ඔහුට ''**සිරිමා**'' යන නම තබන ලදී. සිරිම කුමරු පා තබා ඇවිදින අවස්ථාවෙහි ඔහුට බාල සොහොයුරෙක් උපන්නේය. එකුමරුට ''මොහු සිරි වඩන්නේය. ශ්‍රී වඩමින් උපන්නේය''යි ''**සිරිවඩ්ඪ**'' යන නම තබන ලදී. ඒ දෙසොහොයුරෝම ජේතවනාරාමය පිළිගත් දින පැවති බුදුසිරි දැක පැහැදීමෙන් බුදු සසුනේ පැවිදි වූහ. ඒ දෙදෙනාගෙන් සිරිවඩ්ඪ හිමියෝ

උතුරු මිනිස් දම් උපදවා ගැනීම දක්වා ම ගිහි පැවිදි සමූහයා විසින් සත්කාර සම්මාන කරන ලද්දාහු සිවුපසය ද බොහෝ ලබන්නෙක් වූහ. සිරිමා තෙරණුවෝ පැවිදි වූ දින පටන් එබඳු පින් දහම් සිදු නොකළ බැවින් සිවුපසය අල්පව ලබන්නෙක්ව මහජනයා විසින් නොපුදන ලද්දේ වූහ. උන්වහන්සේ සමථ-විදර්ශනා කමටහන්හිම සිත පිහිට වූ සේක් නොබෝ දිනකින්ම ෂඩභිඥා උපදවා ගත්හ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''එකල මම හිමවතෙහි දේවල නම් තවුසෙක් වූයෙමි. දෙවියෝ මාගේ සක්මන මවා දුන්හ. එකල්හි ජටා දරන මම, පැන් කෙණ්ඩියක් ගෙන උතුම් අර්ථය සොයමින් වනයෙන් නික්මුණෙමි. එසමයේ මට අසූහාරදාහක් ශිෂ්‍යයෝ උවටැන් කළහ. ඔවුහු සිය කටයුතු කරමින් වනයේ විසූහ. අසපුවෙන් නික්මුණු මම වැලි සෑයක් සෑදුවෙමි. නොයෙක් මල් ගෙන එයට පිදුවෙමි. එහි සිත පහදවා අසපුවට පිවිසියෙමි. සියලු සිසුහු රැස් මාගෙන් මෙසේ විමසූහ.

''නුඹ වහන්සේ වැලි වලින් කළ සෑයෙහි පුදන දෙවියා පිළිබඳ අපි ද දැනගනු කැමැත්තෙමු. ඒ පිළිබඳව විචාළ අපට එය පවසනු මැනවි'' එවිට මම මෙසේ පැවසුවෙමි. ''අපගේ වේද මන්ත්‍රවල දක්වෙන මහත් යසස් ඇති බුදුවරු වෙති. මම ඒ මහත් වූ ශ්‍රේෂ්ඨ බුදුවරු නමදිමි.'' සිසුහු නැවතත් මෙසේ විචාළහ. ''ඒ මහා වීර වූ සර්වඥ වූ ලෝකනායකවරු කෙබඳුද? කෙසේ වූ පා සටහන් ඇත්තෝ ද? කෙසේ වූ ස්වභාව ඇත්තෝ ද?'' මම මෙසේ පැවසුවෙමි. ''බුදුවරු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇත්තෝය. සාළිසක් (40) දත් ඇත්තෝය. තථාගතයන්ගේ වස්සකුගේ වැනි ඇස් පිහාටු ඇති නේත්‍රයෝ ඔලිඳ ඵල වැනි පැහැ ඇති වෙති. උන්වහන්සේලා වියදඬු පමණ දුර බලමින් වැඩම කරති. උන්වහන්සේගේ දණහිස, අත් පා සන්ධි හඬ නොනගයි. පළමු කොට දකුණු පය පෙරට තබා ගමන් ඇරඹීම උන්වහන්සේලාගේ සිරිතකි. ඒ බුද්ධ ධර්මතාවෝය. ඒ බුදුවරු කේසර සිංහරාජයන් මෙන් නිර්භීතයහ. තම් උසස් කරමින් සෙසු සත්ත්වයන් හෙළා නොදකිති. මාන අවමාන දෙකින් මිදුනු බුදුවරු සව් සතුන් කෙරෙහි සම සිත් ඇත්තෝය. තමා හුවා නොදක්වීම බුද්ධ ධර්මතාවකි. උන්වහන්සේලා මනුලොව පහළවන කල්හි ආලෝක දක්වති. ආකාර සයකින් මුළු පොළොවම කම්පා කරති: උන්වහන්සේලා නිරය ද දකිති. එවිට එහි ගිනි නිවී යයි. මහවැසි වසී. මේ බුද්ධ ධර්මතා වේ. අසම වූ මහත් යශස්

ඇති අතිශ්‍රේෂ්ඨ ඒ බුදුවරු රූපකායෙන් නොඉක්මවනු හැක්කෝය. තථාගතවරුන්ගේ ගුණ අපමණය.''

ඒ සියලු සිසුහු මගේ වදන් ගෞරවයෙන්, සතුටින් පිළිගත්හ. වචනයට අනුව ශක්ති හා බල පමණින් පිළිපැද්දාහ. ස්වාර්ථ සාධනයට කැමති වූ ඔවුහු මගේ වචනය පිළිගෙන බුද්ධත්වයට නැමුණු සිතින් වැලිසෑය පිදූහ. එකල මහත් යසස් ඇති බෝසත් දිව්‍යපුත්‍ර තෙම තුසිතයෙන් චුතව මවුකුස උපන්නේය. දහදාහක් ලොක ධාතු කම්පා විය. අසපුවට නුදුරු සක්මනෙහි සිටි මා වෙත සියලු ශිෂ්‍යයෝ පැමිණියහ. ''පෘථිවිය වෘෂභයෙකු මෙන් නාද කරයි. සිංහයකු මෙන් ශබ්ද පවත්වයි. සුංසුමාර නම් ජලජ මත්සයා මෙන් සැලෙයි. මෙහි ප්‍රතිඵල කවරේද?''යි ඇසූහ. ''වැලි සෑයෙහි යම් බුදුවරයෙකු පිදුවෙම් ද ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් මවුකුසට එළඹියේය'' යනුවෙන් පිළිතුරු දුන් මා ධර්ම කථා පවත්වා, මහාමුනි බුදුපියාණන් වහන්සේට ප්‍රශංසා කර, සිසුන් යවා පලක් බැඳ ගත්තෙමි. එකල මගේ කාය බලය ක්ෂය විය. බලවත් ව්‍යාධියකින් මම පීඩාවීමි. බුද්ධ ශ්‍රේෂ්ඨයන් සිහිකරමින්ම මම කළුරිය කළෙමි. ශිෂ්‍යයෝ රැස්ව සෑයක් සාදා මගේ දේහය ඊට නැංවූහ. හිස ඇදිලි බැඳ සෑය පිරිවරා ගත් ඔවුහු ශෝකයෙන් පීඩිතව හැඬූහ. ඔවුන් විලාප දෙමින් හඬද්දී දෙව්ලොව උපන් මා ඔවුන් වෙත ගියෙමි.

''මම තොපගේ ගුරුවරයා වෙමි. ශෝක නොකරවු. මනා නුවණින් යුතුව දිවා රෑ දෙක්හි අනලස් ව ස්වාරථයෙහිම උත්සාහ කරවු. අප්‍රමාදී වුවහොත් තොපට ක්ෂණ සම්පත්තිය ලැබී ඇත.'' මෙසේ සිසුන්ට පවසා දෙව්ලොව ගිය මම එහි දහ අට කල්පයක් විසුවෙමි. සක්විතිව පන්සිය වරක් උපන් මම සිය වාරයක් දේවරාජව උපන්නෙමි. දෙව් මිනිස් දෙගතියෙහි පමණක් සැරි සැරූ මම දුගතියකට නොගියෙමි. වැලි සෑය පිදීමෙහි විපාක මෙබඳුය. ඉල් මාසයේ බොහෝ වෘක්ෂවල මල් පිපෙන්නාක් මෙන් මහර්ෂී වූ බුදුරජාණන් වහන්සේ විසින් මම පුබුදුවන ලද්දෙමි. යෝගක්ෂේම නම් නිවණටම මා ගෙන යන ධුර වාහනය නම් වීර්යයයි. ඇත් රජෙකු මෙන් බැඳුම් සිදී මා අනාශ්‍රමව වෙසෙමි. මීට කල්ප ලක්ෂයකට පෙර බුදුගුණ පැවසුයෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

ෂඩභිඥා ලාභී ආයුෂ්මත් සිරිම තෙරුන් 'ආර්යයෙකි' යි නොදන්නා පුහුදුන් භික්ෂූහු ද සාමණේරවරු ද අල්ප ලාභ ඇති බැවින් ද ලෝකයාගේ

ගරු කිරීම් නොලැබූ බැවින් ද අගරු කරන්නාහු යම් කිසිවක් කියා ගරහති. සිරිවඩ්ඪ තෙරුන්ට ප්‍රත්‍ය ලැබෙන් බැවින් සහ ලෝකයා සත්කාර සම්මාන කරන බැවින් උන්වහන්සේලා නිතර පසසති. සිරිමා තෙරණුවෝ මෙය දැක ''නුසුදුස්සාට ප්‍රශංසා කිරීමත් සුදුස්සාට ගැරහීමත් යන මේ දෙක පුහුදුන් බවේ ලක්ෂණ වේ'' යැයි පුහුදුන් බවට ගරහමින් මේ ගාථා දෙක වදාළහ.

''**පරෙ** ච නං පසංසන්ති - අත්තා වෙ අසමාහිතො
මොඝං පරෙ පසංසන්ති - අත්තාහි අසමාහිතො

පරෙච නං ගරහන්ති - අත්තා වෙ සුසමාහිතො
මොඝං පරෙ ගරහන්ති - අත්තා හි සුසමාහිතො''

එහි ''**පරෙ**'' නමාගෙන් අන්‍යවූවෝ ''පර'' (පරෙ) නම් වෙති. මෙහිදී පණ්ඩිත වූ ආර්යයන්ගෙන් අන්‍ය වූ මෝඩයෝ ''පරෙ'' යනුවෙන් අදහස් කරන ලදී. ඔවුහු නොදන්නා බැවින්, සම්පූර්ණයෙන් කරුණු අවබෝධ නොකළ බැවින් ගැරහිය යුත්තාට අප්‍රමාණව පසසති. ''**පසංසන්ති**'' අදක්ෂ බැවින් ද තණ්හා වසඟ වූ බැවින් ද බොරු - වංචාකාරයන්ටම ''අසුවල් භික්ෂුව ධ්‍යාන ලාභියෙකි''යි අසත්‍ය ගුණ ආරෝපණය කිරීමෙන්, ප්‍රකට කිරීමෙන් ස්තුති කරති. යමෙකු දොස් සහිත ද ඉන්ද්‍රිය දනයක්, සන්සිඳීමක් නොමැති ද පුහුදුන් ජනයා එබඳු පුද්ගලයාම පසසති. අගයති. ඒ පැසසීම හිස් වූවකි. එම පැසසීම්වලින් ප්‍රයෝජනයක් නැති බව මෙසේ පවසති. ''**අත්තා වෙ අසමාහිතො**'' අනුන්ගේ පැසසුම් ලබන අසමාහිත වූ මාර්ග සමාධියෙන් හෝ ඵලසමාධියෙන් හෝ උපචාර, අර්පණා සමාධියෙන් හෝ නොසන්සිඳුණු එම පුද්ගලයා, සින්සිඳීමට සමාහිත බවට විරුද්ධ වූ කෙලෙස් ප්‍රහීණ නොකළ බැවින් වික්ෂිප්ත බවට පත් වේ. සිවුරු හැර යන බවට පත් වේ. ''අසමාහිත වූ'' යන්නෙන් සමාධි නිමිති කරගත් ආර්ය ගුණ රහිත බව දක්වයි. ''**මොඝං**'' භාව නපුංසක නිර්දේශයකි. 'විෂමව සඳහිරු පෙරළේ'' යන තැන යෙදුණු ''විසමං'' පදය මෙනි. ''**පරෙ පසංසන්ති**'' යමෙක් අසමාහිත පුද්ගලයාට පසසත් ද ඔවුහු මෝඝයෝය. මුග්ධයෝය. බොරුවෙන් ප්‍රශංසා කරති. කුමක් හෙයින් ද? තමා ද අසමාහිත බැවිනි. ඒ පුද්ගලයාගේ සිත ද අසමාහිත බැවිනි. දෙවන ගාථාවේ ''**ගරහන්ති**'' යනු තමාගේ අදක්ෂ බව නිසා මෝඩ ජනයෝ දොස් රහිත, ආර්ය ධ්‍යානලාභී වූ සමාහිත වූ භික්ෂුව දැක; ''අසුවල් භික්ෂුව නිදි වැරීමෙහි නොයෙදේ. යටත් පිරිසෙන් ගඩුවක්, පිලිකාවක් නසන පමණක් වූ කාලයක්වත් නිදි නොමරයි. හුදෙක් කය වැඩීමෙහි ම නිරත වෙමින් නිදා ගැනීම, නන් දෙඩවීම, සමූහ සාකච්ඡා

වලින්ම කල් ගෙවයි'' යනුවෙන් නොපිළිපදින දේ ප්‍රකට වීමෙන් උන්වහන්සේ ගරහති. නින්දා කරති. ආක්‍රෝශ පරිභව කරති. ඉතිරි පදයන්ගේ අර්ථ පළමු ගාථාවේ දැක්වූ පරිදිම දත යුතුයි.

මෙසේ සිරිම තෙරණුවෝ තම ගාථා වලින් තමන් වහන්සේගේ නිකෙලෙස් භාවයත්, සිරිවඩ්ඪ තෙරන්ගේ සකෙලෙස් බවත් ප්‍රකාශ කළ කල්හි, සංවේගයට පත් සිරිවඩ්ඪ තෙරුන් විදසුන් භාවනාවෙහි සිත පිහිටුවා නොබෝ දිනකින්ම ස්වාර්ථ සාධනය කර ගත්තේය. ගැරහූ තෙරවරු සිරිම තෙරුන්ගෙන් සමා ගත්හ.

සිරිම ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දුක නිපාතයේ දෙවන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

2.3.1

''බහුධා මයා පරිඤ්ඤාතා'' යන ගාථා දෙක ආයුෂ්මත් **උත්තර** තෙරණුවෝ වදාළහ. ඒවායේ උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවෙහි කළ පැතුම් ඇති උන්වහන්සේ ද සසර ඒ ඒ භවයන්හි දී කුසල් රැස් කරගනිමින් නිවන් පතාගෙන අවුත්, මෙයින් කල්ප අනූ දෙකකට පෙර පහළ වූ **සිද්ධස්ස** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටු ගෙයක උපන්හ. තරුණ වියටපත් සිටුතෙම බුදු සසුනේ පැහැදී උපාසකයකුව උපස්ථාන කළේය. බුදුහු පිරිනිවි කල්හි තම ඤාතීන් පිරිවරාගෙන අවුත්, බොහෝ පූජා ද්‍රව්‍ය රැස්කර ධාතු පූජා පැවැත්වූහ. ඒ පින්කම නිසා දෙවි මිනිස් දෙගතියෙහි සැරි සැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී සාකේත නුවර බමුණු පවුලක ඉපිද ''**උත්තර**'' නමින් ප්‍රකට විය. තරුණ වියපත් **උත්තර** බමුණා දිනක් කිසියම් කටයුත්තකට සැවැත් නුවරට ගියේ ගණඩම්බ රුක් මූල පැවැත්වූ යමක මහා ප්‍රාතිහාර්ය දුටුවේය. නැවත කාලාකාරාම සූත්‍ර දේශනාව අසා වර්ධනය වූ ශ්‍රද්ධාව ඇති ඔහු සසුනේ පැවිදි විය. ශාස්තෘන් වහන්සේ සමඟ රජගහ නුවරට වැඩම වූ උත්තර තෙරුන් එහිදී උපසපන්ව, රජගහ නුවරම වෙසෙමින් විදසුනෙහි සිත පිහිටුවා නොබෝ කලකින්ම ෂඩ් අභිඥාලාභී මහරහතන් වහන්සේ නමක් බවට පත් විය.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''ලොවට එකම පිහිටවූ සිද්ධස්ස ලෝක නායකයන් වහන්සේ පිරිනිවි කල්හි මගේ ඤාතීන් කැඳවා උතුම් ධාතු පූජාවක් මම කරවූවෙමි. මෙයින් කල්ප අනූ හතරකට පෙර යම් ධාතු පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ධාතු පූජාවේ විපාක මෙබඳු ය. දැන් මම සියලු කෙලෙස දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

ෂඩ් අභිඥා ලාභීව සැවැත් නුවර ශාස්තෘන් වහන්සේ සමඟ වෙසෙන උත්තර තෙරුන්ගෙන්, රජගහ නුවර සිට සැවැත් නුවරට බුද්ධෝපස්ථානය සඳහා පැමිණි භික්ෂූහු මෙසේ විමසූහ. ''ඇවැත්නි ! කිම නුඹ පැවිද්දෙහි කටයුතු මස්තකප්‍රාප්ත කරගත්තෙහිද?'' එවිට තම රහත්භාවය ප්‍රකාශ කරන උත්තර තෙරණුවෝ මේ ගාථා දෙක වදාළහ.

බන්ධා මයා පරිඤ්ඤාතා, තණ්හා මේ සුසමූහතා
භාවිතා මම බොජ්ඣඞ්ගා, පත්තෝ මේ ආසවක්ඛයෝ

යොහං බන්ධෙ පරිඤ්ඤාය අබ්බූහිත්වාන ජාලිනිං
භාවයිත්වාන බොජ්ඣඞ්ගෙ නිබ්බායිසසං අනාසවෝ

එහි ''බන්ධා'' යනු පඤ්චඋපාදානස්කන්ධයෝය. ''**පරිඤ්ඤාතා**'' ''මෙය දුක වේ. මෙයින් අන්‍යවූවක් නැතැ''යි පිරිසිඳ දැන ගත්තෙමි. එයින් දුක්ඛාර්ය සත්‍යයේ පිරිසිඳ දැනීම පවසන ලදී. ''**තණ්හා**'' ආශා කරයි. (තසති) වඩාත් ආශා කරයි යනු තණ්හාවයි. ''**සුසමූහතා**'' මනාව උදුරා දමන ලදී. මෙම වැකියෙන් සමුදය සත්‍යය ප්‍රහාණය කරන ලද බව දක්වයි. ''**භාවිතා මම බොජ්ඣඞ්ගා**'' ''බෝධි'' නම් වූ සති ආදී ධර්මයන්ගෙන් යුක්තවීම නිසා හෝ බෝධි නම් වූ ආර්ය පුද්ගලයාගේ අංග බැවින් බොජ්ඣංග නම් වූ - සතිය, ධම්ම විචය, විරිය, පීතිය, පස්සද්ධිය, සමාධිය හා උපේක්ෂාව යන ආර්ය මාර්ගයට අයත් ධර්ම මවිසින් වඩන ලදී. උපදවන ලදී. භාවිත කරන ලදී. මෙහිදී බොජ්ඣංග නාමයෙන් ඒ හා සමඟම සියලු මාර්ග ධර්ම ද සියලු බෝධි පාක්ෂික ධර්මද අදහස් කරන ලදැයි දත යුතුයි. මේ වැකියෙන් මාර්ග සත්‍යය වැඩීම දක්වයි. ''**පත්තෝ මෙ ආසවක්ඛයෝ**'' කාමාශ්‍රවාදී ආශ්‍රව ක්ෂය කිරීම, ''ආශ්‍රවක්ෂය'' නම් වේ. ආශ්‍රවක්ෂය නම් අසංඛත ධර්මයට, නිවණට මම පැමිණියෙමි, නිවණ අවබෝධ කළෙමි. මෙයින් නිරෝධ සත්‍යය සාක්ෂාත් කරගැනීම අදහස් කරයි. මෙපමණකින් තමන් වහන්සේගේ සෝපාදිසේස නිර්වාණ ධාතුවට සමවැදි බව දක්වයි. දැන් අනුපාදිසේස නිර්වාණ සම්පත්තිය ද තමාට ඇති බව දෙවන ගාථාවෙන් පවසයි. ''**යොහං**'' ඒ මම, මෙසේ ඉහත පැවසූ ලෙස පස්කඳ මැනවින් දැන, එසේ තත්ත්වාකාරාවබෝධයෙන් සිය අත්බවට, පර අත්බවට අයත් ආධ්‍යාත්මික හා බාහිර වූ සෑම දෙයක් පිළිබඳවම ඇති, අතීත-අනාගතාදී භේද ඇති නැවත නැවත මහන්නා වූ ආකාර ඇති - නැවත නැවත උපදිමින් මැරෙන කාරණයට හේතුවූ දැලක් වැනි හෙයින් ''ජාලිනී'' නම් තණ්හාව මාගේ සිතින් උපුටා දමා මම මැඩලූයෙමි. එසේ මැඩලූ මගේ සිතේ බෝජ්ඣංග ධර්ම වැඩුවෙමි. ඒ ඉහත දැක්වූ ප්‍රභේද සහිත බොජ්ඣංග ධම් වඩා, එහි සම්පූර්ණත්වයට පත්වූයෙම් එහිදීම අනාශ්‍රව වූයෙමි. දැන් අවසන් වූ චුති සිත නිරුද්ධ වීමත් සමඟම උපාදාන රහිත වූයෙමි, ගිනි සිළුවක් නිවී යන්නාක් මෙන් නිවෙමි. පිරිනිවෙන්නෙමි.

උත්තර තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.2

"පනාදෝ නාම සෝ රාජා" යනු ආයුෂ්මත් භද්දජී තෙරුන්ගේ ගාථාවන් ය. එහි උපත කෙසේ සිදුවී ද? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි බමුණු කුලයක ඉපිද වැඩිවියට පත්වූහ. බමුණු ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගිය හෙතෙම, කාමුක සම්පත් හැරදමා තවුස් පැවිද්දෙන් පැවිදිව ආරණ්‍යයෙහි අසපුවක් සාදාගෙන වෙසේ. දිනක් ශාස්තෘන් වහන්සේ අහසින් වඩිනු දුටු එම තවුසා පහන් සිතින් ඇඳිලි බැඳගෙන සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ අදහස දැන අහසින් බැස වැඩ හිඳ සේක. එසේ වැඩසිටි භාග්‍යවතුන් වහන්සේට මීහිරි වූ මී පැණි ද නෙළුම් අල හා දඹු ද ගිතෙල් ද කිරි ද පිළිගැන්වූ පසු, එම තවුසාට අනුකම්පාවෙන් ඒවා පිළිගත් භාග්‍යවතුන් වහන්සේ පුණ්‍යානුමෝදනා කොට වැඩි සේක. ඒ පින්කම නිසා තුසිතයේ උපන් ඔහු, එහි පරමායුෂ විඳ නැවත කාම සුගති ලෝකවල ම උපදිමින් සසර සැරිසරා අවුත්, විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී මහධන සිටුවරයෙක් ව උපන්නේය. එකල හැට අට දාහක් භික්ෂූන්ට දානය පූජා කළ ඔහු තුන් සිවුරු පූජා කළේය. මෙසේ බොහෝ පින්දහම් කළ සිටුතුමා දෙව්ලොව ඉපදී ආයු කෙළවර දක්වා එහි සැප විඳ, බුද්ධ ශූන්‍ය කාලයක මනු ලොව උපන්නේ ය. පසේ බුදුවරු පන්සීයකට සිවුපසයෙන් උපස්ථාන කළේය. ඉන් චුත ව රජ කුලයේ ඉපිද රාජ්‍ය කරන සමයෙහි තම පුතු පසේ බුදුවරයකු වූ කල්හි උන්වහන්සේට උපස්ථාන කළේය. උන්වහන්සේ පිරිනිවි කල්හි ධාතු ගෙන සෑයක් කරවා පූජා පැවැත්වීය. මෙසේ ඒ ඒ භවයන්හිදී නානා විධ පින්දහම් සිදුකරගත් හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී භද්දිය නුවර අසූ කෙළක් සම්පත් ඇති භද්දිය සිටුගේ එකම පුතු ව උපන්නේය. "භද්දජී" නමින් ප්‍රකට වූ එකුමරු ඉසුරු සම්පත්, පිරිවර හා භෝග සම්පත් ලබාගෙන අවසන් ආත්මභාවය ගෙවන බෝසත්වරයකු මෙන් සැප වින්දේය. එකල්හි ශාස්තෘන් වහන්සේ සැවතෙහි වස් වැස භද්දජී කුමරුට අනුග්‍රහ පිණිස මහත් වූ සඟ පිරිසක් පිරිවරා ගෙන භද්දිය නුවරට වැඩ ස්වාභාවික වන පෙතක විසූහ. කුමරුගේ නුවණ මුහුකුරා යෑම බලමින් මෙසේ වැඩ සිටින සමයේ, දිනක් මතු මහලෙහි සිටි ඔහු, සීමැදුරු කවුළුව හැර බලනුයේ භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය ඇසීමට යන මහජනතාව දුටුවේය. "මේ ජනයා කොහි යන්නේ ද?"යි ඇසූ කුමරු ධර්මශ්‍රවණයට යන බව අසා, මහත් පිරිසක් පිරිවරාගෙන ධර්මශ්‍රවණයට බුදුන් වෙත ගියේය. ධර්මදේශනාවසානයෙහිදී සර්වාභරණයන්ගෙන් සැරසී සිටගෙන ම සියලු කෙලෙස් නසා රහත් බවට පත්විය.

අපදාන පාළියේදී හද්දජී තෙරණුවෝ මෙසේ වදාළහ.

''එකල මම නානාවිධ හස්තීන් ඇසුරු කළ පොකුණකට බැස සාදුක නිසා නෙළඹු අල උදුරමි. එවිට කසට වස්තු දරන්නා වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පාංශුකූල සිවුර කම්පා කරමින් අහසින් වැඩම කළ සේක. ඒ ශබ්දය ඇසූ මම උඩ බලන්නෙමි, ලෝක නායකයාණන් වහන්සේ දුටුවෙමි. එහිම සිටි මම මෙසේ ආයාචනා කළෙමි. ''මගේ නෙළඹු අල සහිත වූ මී ද කිරි ද ගිතෙල් ද නෙළඹු දැලි ද පසැස් ඇති බුදුරජාණන් වහන්සේ පිළිගනිත්වා'' එය ඇසූ ඉතා කාරුණික වූ, මහත් යසස් ඇති සර්වඥයන් වහන්සේ මාගේ භික්ෂාව මා හට අනුකම්පාවෙන් පිළිගෙන පුණ්‍යානුමෝදනා කළ සේක.

''මහ පින්වත! සුවපත් වන්න. ඔබගේ ගතිය සමෘද්ධිමත් වේවා. මේ නෙළඹු අල දානය හේතුවෙන් මහත් සැප ලබත්වා.'' පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරා අහසින් වැඩි සේක. ඉක්බිති මම නෙළඹු අල ගෙන මගේ අසපුවට පැමිණ, ඒවා ගසක එල්ලා මාගේ දානය පිළිබඳව සිහිකළෙමි. එවිට මහා වාතයක් නැඟී වනය කම්පා කළේය. හෙණ පුපුරමින් අහස ගිගිරුම් දුණි. එවිට ම හෙණ පහරක් මගේ හිස මත වැටුණේය. ඉන් හළු වූ මම කළුරිය කොට, පින්කම පිළිබඳවම සිතූ බැවින් තුසී දෙව්ලොව උපන්නෙමි. සිරුර හැර දමූ මම දෙව් සැපයෙහි සතුටුවීමි. මනාව සැරසුණු අසූහයදාහක් ස්ත්‍රීහු උදේ සවස මට උවටැන් කරති. මිනිසත් බව ලද මම සැමදා සුව විඳිමි. මාගේ භෝග අඩු නොවිණි. තාදී ගුණැති ඒ දේවාතිදේව වූ බුදුපියාණන් වහන්සේ විසින් අනුකම්පා කරන ලද මම සියලු ආශ්‍රව ක්ෂය කළෙමි. දැන් නැවත ඉපදීමක් මට නැත. මීට කල්ප ලක්ෂයකට පෙර යම් භික්ෂාවක් දුන්නෙම් ද එහි විපාක ලෙස දුගතියක නූපන්නෙමි. නෙළඹු දානයෙහි විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහනසේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ඔහු රහත් වූ පසුව ශාස්තෘන් වහන්සේ **භද්දිය** සිටු අමතා ''නුඹගේ පුතා ආභරණවලින් සැරසී සිටිමින්ම ධර්මය අසා රහත් විය. එනිසා දැන් ඔහු පැවිදි කිරීම සුදුසුය. ඉදින් පැවිදි නොකරන්නේ නම් පිරිනිවෙන්නේ යැ''යි වදාළහ. සිටුතුමා ''මගේ පුතු ළදරු කලම පිරිනිවීමෙන් කවර ප්‍රයෝජනයක් ද? ඔහු පැවිදි කරන්න''යි පැවසීය. ශාස්තෘන් වහන්සේ ඔහු පැවිදි කරවා උපසම්පදා කරවූහ. සත් සතියක් එහි විසූ උන්වහන්සේ

කෝටිග්‍රාමයට වැඩම කළහ. ගංගාතීරයේ වූ ඒ කෝටිග්‍රාමයේ වැසියෝ බුදුපාමොක් මහ සඟනට මහදන් පැවැත්වූහ. භද්දජී තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ සතුටු කරනු සඳහා ගමෙන් පිටතට වැඩ, මාර්ග සමීපයේ ගං ඉවුරෙහි හිඳ ''ශාස්තෘන් වහන්සේ වැඩි මොහොතෙහිම සමවතින් නැගිටිමි''යි නිරෝධ සමවතට සමවන්හ. මහතෙරුන් වහන්සේලා පැමිණි නමුත් නොනැගිටි භද්දජී තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ වැඩම වූ මොහොතෙහිම ඉන් නැගී සිටියහ. පුහුදුන් භික්ෂූහු මෙකරුණ දැක ''මොහු දැන් පැවිදි වූවෙකි. මහතෙරුන් වහන්සේලා වැඩම වන විට මානයෙන් දැඩිව සිටිමින් නැගිට ගෞරව නොකළේය''යි පරිභව කළහ.

කෝටිග්‍රාමවාසීහු ශාස්තෘන් වහන්සේට හා භික්ෂු මහා සංඝරත්නයට ගමට වැඩීම සඳහා බොහෝ නැව් පහුරු ආදිය බැන්දහ. ''මොහුගේ ආනුභාව දක්වන්නෙමි''යි සිතා නැවෙහි වැඩහුන් ශාස්තෘන් වහන්සේ ''භද්දජිය! නුඹ කොහිද?''යි විචාළ සේක. එවිට භද්දජී හිමියෝ, ''ස්වාමිනි! මම මෙහි වෙමි''යි වදාරා සමීපයට අවුත් භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳගෙන සිටියහ. ''භද්දජිය එන්න. අප සමඟ එකම නැවකට නගින්න''යි ශාස්තෘ අවසරය ලද භද්දජී තෙරණුවෝ, ශාස්තෘන් වහන්සේ වැඩසිටි නැවට නැංගහ. නැව ගඟ මැදට ගිය කල්හි බුදු පියාණන් වහන්සේ ''භද්දජිය! නුඹ **මහාපනාද** නම් රජව සිටියදී විසූ රත්න ප්‍රාසාදය කොහිද?''යි විචාළ සේක. ''ස්වාමීනි! එය මෙතැන ගිලී ඇත'' යනු භද්දජී හිමිගේ පිළිතුර විය. ''එසේ නම් භද්දජිය, සබ්‍රහ්මචාරීන්ගේ සැක සංකා දුරු කරව''යි භාග්‍යවතුන් වහන්සේ වදාළ කල්හි, උන්වහන්සේට වැඳ අවසර ගත් භද්දජී හිමියෝ එකෙණෙහිම ඍද්ධියෙන් ගං පතුලට වැඩ, ප්‍රාසාදයේ කොත තම පයේ ඇඟිලිවලින් රැගෙන යොදුන් විසිපහක් පමණ වූ මුළු ප්‍රාසාදයම අහසට නැංවූහ. උඩට එසවෙත්ම එය පනස් යොදුන් වූ මහා ප්‍රාසාදයක් විය. පෙර භවයේදී භද්දජී තෙරුන්ගේ ඥාතීහු ප්‍රාසාදයට වූ ලෝභය නිසා එහිම මත්ස්‍ය, කැසිබු, මැඩියෝ වී ඉපිද සිටියහ. ප්‍රාසාදය උඩට ඔසවන විට ඔවුහු පෙරලෙමින් දියට වැටුනහ. එය දුටු ශාස්තෘන් වහන්සේ ''භද්දජිය! නුඹගේ නෑයෝ වෙහෙසට පත්වෙති''යි වදාළහ. එය ඇසූ භද්දජී තෙරණුවෝ ප්‍රාසාදය අත්හළහ. එය ගොස් පෙර තිබූ තැනම පිහිටියේය. එතෙරට ගිය කල්හි පුහුදුන් භික්ෂූහු ''ශාස්තෘන් වහන්ස! කවර කලෙක භද්දජී තෙරුන් මේ රත්න ප්‍රාසාදයෙහි විසූ සේක් ද?''යි විමසූහ. එවිට ශාස්තෘන් වහන්සේ මහාපනාද ජාතක දේශනාව පවත්වා මහජනයාට දහම් අමාව පෙවූ සේක. තමා පෙර විසූ රත්න ප්‍රාසාදය මහජනයාට දක්වූ භද්දජී තෙරණුවෝ මේ ගාථා දෙක වදාරමින් සිය රහත්බව පළකළහ.

''පනාදො නාම සො රාජා යස්ස යූපො සුවණ්ණයො
තිරියං සොළසපබ්බෙධො උද්ධමානු සහස්සධා

සහස්ස කණ්ඩා සතහෙණ්ඩු ධජාලු හරිතාමයො
අනවඤ්ඤා තත්ථ ගන්ධබ්බා ඡසහස්සානි සත්තධා''

එහි ''පනාදො නාම සො රාජා'' යනු ''අතීතයේ පනාද නම් රජකෙනෙක් විය.'' යනුවෙන් ආත්මභාවයෙන් වැසුණු බැවින් තමා වෙනත් අයෙකු මෙන් දක්වයි. ඔහු රජ වූ දින සිටම උත්සාහ සම්පත්ති ආදියෙන් ද මහත් රාජානුභාවයෙන් ද මහත් වූ කීර්ති ශබ්දයෙන් ද යුතු වූ බැවින් ''මහාපනාද රජු'' යැයි ප්‍රකට විය. ''**යස්ස යූපො සුවණ්ණයො**'' යම් රජකුගේ මේ යූපය, ප්‍රාසාදය රන්වන් වූයේ ද එයයි. ''**තිරියං සොළස පබ්බෙධො**'' එහි පළල සර පතන සොළසකි. (දාසයකි) හෙවත් අඩ යොදුනකි. ''**උද්ධමානු සහස්සධා**'' මෙබඳු වූ ප්‍රාසාදයේ උස සරපතන දහසකි. එය යොදුන් විසිපහක් පමණ උස් වේ. ඇතැම්හු මෙම ගාථාව සුබෝච්ඡාරණය පිණිස ''ආනු'' යි දීර්ඝ කර කියති. නමුත් ඉන් ''අනු''-විය'' යන අරුතම ප්‍රකට වේ. ''සහස්ස කණ්ඩා'' සර දහසකි. හෙවත් මහල් දාහකි. ''**සතහෙණ්ඩු**'' මුදුන් ගෙවල් සිය ගණනකි. ''ධජාලු'' ඒ ඒ මුදුන් ගෙවල්, මුදුන් හිස්හි පිහිට වූ, බඳින ලද කොඩි කණුවල එල්ලූ ධජ පතාක ඇති. ''**හරිතාමයො**'' ස්වර්ණමය, රන්මය වූ. ඇතැම්හු ''රන් සිරියල් හා සමාන වූ පැහැ ඇති'' යැයි කියති. ''ගන්ධබ්බා'' යනු නළුවෝ. ''**ඡසහස්සානි**'' සයදාහක් නළුවෝ. ''**සත්තධා**'' ඒ ප්‍රාසාදයේ තැන්, ස්ථාන හතක සිටිමින් රජුගේ දැඩි සතුට සඳහා නටති යන අර්ථයයි. ඔවුහු මෙසේ නැටුම් ගැයුම් පැවැත්වූවත් රජු සතුටු කිරීමට අසමත් වූහ. ඉක්බිති සක්දෙව් රජු දිව්‍ය නළුවන් යවා නාටයෙහ්ත්සවයක් කරවීය. එය දුටු රජු සිතාසුණේය.

භද්දජී තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.3

''**සතිමා පඤ්ඤවා**'' යනු ආයුෂ්මත් **සෝභිත** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී පින් දහම් රැස් කරමින් අවුත්, **පදුමුත්තර** භාග්‍යවතුන්

වහන්සේගේ කාලයේ හංසවතී නුවර සිටුගෙයක උපන්හ. වැඩිවිය පත් සිටුකුමරු දිනක් ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසමින් සිටියදී, ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් පුබ්බේනිවාස ඤාණය ලබන භික්ෂූන්ගෙන් අග්‍රස්ථානයෙහි තබනු දුටුවේය. ඔහු ද එම තනතුර සඳහා ප්‍රාර්ථනා කොට, පින්දහම් කරමින් සුගතීන්හිම සැරිසරා අවුත් සුමේධ නම් බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි බමුණකු වී උපන්නේය. වැඩිවිය පත් බමුණු කුමරු සියළු බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන් කෙළවරටම උගත්තේය. ගිහි ගේ කළකිරුණු ඔහු තවුස් පැවිද්දෙන් පැවිදි වී හිමවත සමීප ආරණ්‍යයක, අසපුවක් කරවා, වන මුල් ඵල වලින් යැපෙමින් විසීය. බුදුරදුන්ගේ පහළවීම ඇසූ තාපසතුමා සෑම තැනකම එක් රැයක් පමණක් වාසය කරමින් වහා බන්ධුමතී නුවරට ගොස් ශාස්තෘන් වහන්සේ වෙත එළඹ, පැහැදුණු සිතින් ''තුවං සත්ථාච කෙතුව.....''යනාදී ගාථා සයකින් උන්වහන්සේට ප්‍රශංසා කළේය.

ශාස්තෘන් වහන්සේ ඔහුට ලැබෙන සැප සම්පත් පිළිබඳව මෙසේ වදාළ සේක. ඒ පින්කමේ විපාක විඳිමින් හෙතෙම දෙව්මිනිසුන් අතර සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත්නුවර බමුණු කුලයක උපන්නේ ය. සැවැත් නුවර බමුණු කුලයක උපන්නේ ය. ''සෝභිත'' නමින් ප්‍රකට වූ ඔහු පසුකලෙක අප භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ බණ අසා පැහැදී සසුනේ පැවිදි විය. නොබෝ දිනකින්ම විදසුන් භාවනාව වැඩූ උන්වහන්සේ ෂඩ් අභිඥා ලබා පෙරකඳ පිළිවෙල සිහිකරන නුවණෙහි වශී භාවයට පත්වූහ.

සෝභිත තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''හිමවතට දකුණු දෙස මැනවින් කරන ලද අසපුවක් මට විය. එකල මම උතුම් වූ අර්රය සොයමින් වනයෙහි විසුවෙමි. ලාභාලාභ දෙකින් ද මුල්-ඵල වැලින් ද සතුටු වූ මම ආචාර්යවරයකු සොයමින් හුදකලාවම විසුවෙමි. එකල සුමේධ නම් සම්බුදු රජ ලොව පහළ වූ සේක. මහජනයා සසරින් ගොඩලමින් උන්වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කළහ. නමුත් උන්වහන්සේ පිළිබඳව මම නො ඇසුවෙමි. කිසිවකු උන්වහන්සේ පහළ වූ බව මට නොපැවසීය. වසර අටකට පසු මම බුදුරදුන් පිළිබඳව ඇසීමි. අසපුවේ ගිනි-දර බැහැරලා පවිත්‍ර කළ මම පිරිකර ද ගෙන වනයෙන් නික්මුණෙමි. ගම් නියම්ගම්හි එක් රැයක් විසූ මම පිළිවෙළින් චන්ද්‍රවතී ගඟ වෙත ගියෙමි. එකල සුමේධ භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන් සසරින්

ගොඩලමින් අමෘතපදය දේශනා කළහ. ජනසමූහයා ඉක්මවමින් ඉදිරියට ගිය මම ගුණසාගර වූ ජිනේන්ද්‍රයන් වහන්සේට වැඳ, අඳුන් දිවි සම ඒකාංශ කරගෙන බුදුපියාණන් වහන්සේට ස්තුති කළෙමි.

''ද්විපදෝත්තම වූ ඔබ වහන්සේ සත්ත්වයන්ට ශාස්තෘ ද කේතුව ද ධ්වජය ද යාගස්තම්භය ද පරායණය ද පිහිට ද ප්‍රදීපය ද වෙති. චතුරාර්ය සත්‍යය දර්ශනයේ නිපුණ බව ඇති වීර වූ ඔබ වහන්සේ, ජන සමූහයා සසරින් එතෙර කරවූහ. මුනීන්ද්‍රයන් වහන්ස! ලොව නුඹවහන්සේට වඩා උතුමෙක් නැත. ඒකාන්තයෙන් මහ සයුර කුස තණ අගින් ප්‍රමාණ කළ නොහැකි වුවත්, ඔබ වහන්සේගේ සර්වඥතාඥානය කිසිසේත් ප්‍රමාණ කළ නොහැක. පසැස් ඇති උතුමාණෙනි! තරාදියේ තබා පොළව ප්‍රමාණ කිරීමට හැකිවන්නේ ය. නමුත් ඔබ වහන්සේගේ ප්‍රඥාව ප්‍රමාණ කිරීමට නොහැකි වේ. සමුද්‍රයෙහි දියද අහසද පොළවද යන මේ මහා වස්තූහු ප්‍රමාණ කළ හැකි වුවත් ඔබ වහන්සේ ප්‍රමාණ කළ නොහැක.''

එකල මම මෙසේ ගාථා සයකින් මහත් යශස් ඇති සර්වඥයන් වහන්සේට ඇදලි බැඳගෙන ස්තුති කර, නිහඬ වූයෙමි. මහා ප්‍රඥා ඇති, මහා නුවණ අති යමෙකුට සුමේධ යැයි ලෝ වැසියා කියත් ද ඒ උතුමන් වහන්සේ භික්ෂුසංඝයා මැද වැඩහිඳ මේ ගාථාවන් වදාළහ.

''යමෙක් පැහැදුණු සිතින් මගේ නුවණ පැසසුවේ ද ඔහු ලබන සම්පත් පවසමි. ඒ මගේ වදන් අසවු. හෙතෙම කල්ප සැත්තෑ සතක් දෙව්ලොව සිත් අලවා වසයි. දහස් වරක් ශක්‍ර දේවේන්ද්‍රව දෙවි රජය කරවයි. නොයෙක් වර සක්විති රජ වන්නේ ය. ඔහු ලබන මහත් ප්‍රදේශ රාජ්‍ය සම්පත් ගණන් කළ නොහැක. මේ කුසල කර්මය නිසා දෙවි වුවත් මිනිස් වුවත් අනූන වූ චිත්ත සංකල්පනා ඇතිව නියුණු ඥානවන්තයෙක් වන්නේය.''

''මින් කල්ප තිස් දහසකට පසුව ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. ගිහිගෙන් නික්ම බන්ධන නැතිව සසුනේ පැවිදි වන මෙතෙම සත්වියේදී ම රහත් බව ලබන්නේය.''

''යම් තැනක පටන් මා ගැන සිහිකරම් ද යම් තැනක දී බුදුසසුනේ පැවිදිවූයෙම් ද ඒ ආත්මභාව අතර මාගේ මනෝඥ නොවූ සිතක් පිළිබඳව නොදනිමි. සියලු භවයන් හි හැසිර සම්පත් අනුභව කළ මම භෝගයෝ අනූනව ලැබුවෙමි. සර්වඥතා ඥානය පැසසීමේ විපාකය මෙබඳුය. ලෝභ,

දෝස, මෝහ යන තුන් ගිනි නිබා නිවුනෙමි. සියලු භව ඉපදීම් නැසුවෙමි. සියලු ආශ්‍රව ක්‍ෂය කළෙමි. දැන් මට මතු ඉපදීමක් නැත.ත මම මීට කල්ප තිහකට පෙර යම් බුදු නුවණක් පැසසී ද එහි විපාක වශයෙන් මා ලැබූ සම්පතෙහි අඩුවක් නැත. මීට කල්ප තිහට පෙර යම් බුදු නුවණක් පැසසුවෙමිද එතැන් සිට මේ දක්වා දුගතියකට නොගියෙමි. දැන් මම සියලු කෙලෙස් දූවුයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව තමාගේ පෙර විසූ කඳ පිළිවෙල සිහිකළ සෝභිත හිමියෝ අසංඥභවයෙහි අචිත්තක (සිත නැති) ප්‍රතිසන්ධිය දක්වා ම ආත්මභාව දුටුවහ. ඉන් එහා කල්ප පන්සීයක් මුලුල්ලෙහි සිතේ පැවැත්මක් නොදක, ඉන් අවසන් වන බව දක, ''මේ කිමෙක්ද?''යි සිහිකර බලා ''න්‍යාය වශයෙන් අසංඥභවය වන්නේය'' යි නිශ්චයට ගියේය. එනිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''මහණෙනි අසංඥ සත්ත්ව නම් දීර්ඝායුෂ්ක දෙවිවරු ඇත.'' ඉන් චුත වූ සෝභිත හිමි මේ මිනිස් ලොව උපන්නේ ය. මේ භවය මෙසේ දැනගනියි. සෝභිත තෙරුන් එය සිහිපත් කර බලයි. මෙසේ න්‍යාය වශයෙන් සිහිකරන්නා වූ සෝභිත තෙරුන්ගේ මෙනෙහි කර බැලීමේ කුසලත්වය දුටු ශාස්තෘන්වහන්සේ සෝභිත තෙරුන් පෙර විසූ කඳ පිළිවෙල සිහිකරන භික්ෂූන් අතුරින් අගතැන්පත් කළ සේක. ඉක්බිති මේ ආයුෂ්මතුන් වහන්සේ සුවිශේෂීව තම පෙරවිසූ කඳ පිළිවෙල දන්නා නුවණ ද ඊට හේතු භූත වූ ප්‍රතිපත්තිය ද ප්‍රත්‍යවේක්‍ෂා කර බලා සොම්නසට පත් වූ සේක්, එම අර්ථ ප්‍රකට කිරීම සඳහා උදන් අණන සේක් මේ ගාථා දෙක වදාළ සේක.

''සතිමා පඤ්ඤවා භික්ඛු ආරද්ධබල වීරියෝ
පඤ්ච කප්ප සතානාහං එකරත්තිං අනුස්සරිං

චතුත්තාරෝ සතිපට්ඨානෙ සත්ත අට්ඨ ච භාවයං
පඤ්ච කප්ප සතානාහං එකරත්තිං අනුස්සරිං''

එහි ''සතිමා'' තමා ම හටගැනීම, පහළවීම දුටු බැවින් ද සතිපට්ඨානයන් වැඩූ බැවින් ද සිහියෙහි විපුලත්වයට පත් වූ බැවින් ද සිහි ඇති. ''පඤ්ඤවා'' ඔඩ අභිඥාවන්හි පරතෙරට හා ප්‍රඥාවේ විපුලත්වයට පත්වූ බැවින් නුවණ ඇති. කෙලෙස් සිඳ බිඳ දැමූ බැවින් ''භික්ඛු'' භික්ෂු නම් වූ. ශ්‍රද්ධාදී බලයෝ ද චතුර්විධ සම්‍යක් ප්‍රධාන වීර්යය ද සම්පූර්ණ කරගත් බැවින් ''ආරද්ධ වීරියෝ'' නම් වේ. පටන් ගත් බල හා වීර්ය ඇති. මෙහි ''බල'' යන්නෙන් ශ්‍රද්ධාදි පංච බලයද ගන්නා ලදී. සිහියේ බලය ඤාණ

සමූහයේ බලය යි. ''**පඤ්ච කප්ප සතානාහං එක රත්තිං අනුසඤ්ඤරිං**'' එක් රැයක් මෙන් සිහිපත් කරමි. මෙහි ''විය'' යන උපමා දෙපෝතක නිපාතය ලොප් ඇත. මෙම පාඨයෙන් පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණ පිළිබඳව තමාගේ දක්ෂ භාවය ප්‍රකට කරයි. දැන් යම් ප්‍රතිපත්තියකින් තමාගේ සිහි ඇති බව ද අතිශයින් පෙර විසූ කඳ පිලිවෙල දන්නා නුවණ ද ලැබුනේ ද එය දැක්වීමට ''**චත්තාරෝ**'' යනාදී දෙවැනි ගාථාව පවසන ලදී. එහි ''**චත්තාරෝ සතිපට්ඨානෙ**'' කායානුපස්සනාදී ප්‍රභේදයන්ගෙන් සිවුවැදෑරුම් වූ ලෞකික-ලෝකෝත්තර මිශ්‍ර වූ ''සති'' නම් වූ සතිපට්ඨානයන්හි (සිහිය පිහිටුවීම් හි) ''**සත්තා**'' යනු සත් බොජ්ඣංග ධර්මයෝය. ''අයා'' යනු අටක් වූ මාර්ගාංගයන්හි. සතිපට්ඨානයන්හි මනාව පිහිට වූ සිත් ඇත්තහුට, සත් බොජ්ඣංග ධර්මයෝ වැඩීමෙන් පිරිපුන් බවට ගියාහුම වෙති. එසේම ආර්ය අෂ්ඨාංගික මාර්ගය පරිපූර්ණවූයේ වේ. දම්සෙනෙවි සැරියුත් තෙරුන් එනිසා මෙසේ වදාළහ. ''සතරසතිපට්ඨානයන් හි මනාව පිහිට වූ සිත ඇත්තෝ සත් බොජ්ඣංග ධර්ම තත් වූ පරිදි වඩා.'' ආදී වශයෙන් කොටස් සතකින් යුතු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්හි එක කොටසක පිරිපුන් බවට යන කල්හි සෙසු කොටස් හිද පිරිපුන් බව ලබන්නේම ය. එක් කොටසක පමණක් පිරිපුන් බව ලැබීම නම් සිදු නොවේ. ''**භාවයං**'' වැඩීමෙන්, වැඩීම හේතුවෙන්, සෙසු පදයන් අර්ථ ඉතා ප්‍රකටය.

සෝභිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.4

''යං කිඤ්චං දළ්හවීරියෙන'' ආයුෂ්මත් **වල්ලිය**'' තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි පින් රැස් කරමින් අවුත්, **සුමේධ** නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී බමුණු කුලයක ඉපිද වැඩිවියට පත්වූහ. බමුණු සිප් සතරෙහි නිෂ්පත්තියට ගිය හෙතෙම අසූ කෙළක් වූ ධන සම්පත් හැර දමා තවුස් පැවිද්දෙන් පැවිදි වී පර්වත පාදයක වූ අරණ්‍යායතනයක් වූ එක් ගං ඉවුරක අසපුවක් සාදාගෙන වාසය කළේය. දිනක් තමාට අනුග්‍රහ පිණිස වැඩම කළ ශාස්තෘන් වහන්සේ දැක, පැහැදුණු සිතින් අඳුන් දිවි සම අතුරා දුන්නේය. එහි වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේට මලින් ද සඳුන්වලින් ද පූජා කර, අඹ ඵල පිළිගන්වා පසඟ පිහිටුවා

වැන්දේය. භාග්‍යවතුන් වහන්සේ ඒ තාපසතුමාට ආසන පූජාවේ විපාක දක්වමින් පුණ්‍යානුමෝදනා පවත්වා වැඩි සේක. ඒ පින්කම නිසා දෙවි මිනිසුන් අතර සැරිසරා පැමිණි හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී විශාලාවෙහි බමුණු කුලයක ඉපිද "**ගණ්ඩමිත්ත**" නමින් ප්‍රකට විය. තරුණ වියට පත් වූ ගණ්ඩමිත්ත බමුණා විශාලාවට වැඩම වූ ශාස්තෘන් වහන්සේගේ උතුම් බුදුසිරි දැක ලැබූ ශ්‍රද්ධාවෙන් මහා කච්චායන තෙරුන් සමීපයේ පැවිදි විය. මඳ නුවණැති උන්වහන්සේ දැඩි වීර්යයෙන් යුක්තව නුවණැති සබ්‍රහ්මචාරීන්ගේ ඇසුරෙහි බොහෝ කාලයක් විසූහ. භික්ෂූහු "යම් සේ වැල්, ගස් ආදී ස්ථිර දෙයක් නොමැතිව වැඩීමට අසමත් වේද එසේම පඬිවරු, නුවණැත්තන් නොමැතිව මොහුට විසිය නොහැක"යි **වල්ලිය** නමින් ඇමතූහ. ඊට පසු කාලයෙහි වේනුදත්ත තෙරුන් වෙත එළඹුණු වල්ලිය තෙරණුවෝ, උන්වහන්සේගේ අවවාද අනුව සිටිමින් සිහි ඇතිව, විමසන නුවණැතිව වාසය කළහ. වල්ලිය තෙරුන්ගේ නුවණ මුහුකුරා ගිය අවස්ථාවෙහි උන්වහන්සේ නිවන් මඟ විමසමින් වේනුදත්ත තෙරුන්ට මේ ගාථා දෙකෙන් ආරාධනා කළ සේක.

"**යං කිඤ්චං දළහවීරියෙන යං කිඤ්චං බොද්ධුමිච්ඡතා**
කරිස්සං නාවරුජ්ඣිස්සං පඤ්ඤවීරියං පරක්කමං

"**ත්වංච මෙ මඟමක්ඛාහි අඤ්ඤස්සං අමතොගධං**
අහං මොනෙන මොනිස්සං ගංගාසොතොව සාගරං"

එහි "**යං කිඤ්චං දළ්හවීරියෙන**" දැඩි වීර්යයෙන්, ස්ථිර වූ දැඩි වීර්යයෙන් හෝ පුරුෂ වීර්යයෙන් යම් කිසිවක් කළ යුතු ද පිළිපැදිය යුතු ද එය "**යං කිඤ්චං බොද්ධුමිච්ඡතා**" නිර්වාණය සඳහාම වූ හෝ සත්‍යාවබෝධය සඳහා වූ චතුරාර්ය සත්‍ය දැන ගැනීමට, අවබෝධ කර ගැනීමට කැමැත්තා විසින් යමක් කළ යුතු වේද එය "**කරිස්සං නාවරුජ්ඣිස්සං**" එය මම දැන් කරන්නෙමි. ධර්ම මාර්ගය වළකන්නා වූ පිළිවෙතක නො යෙදෙන්නෙමි. "**පඤ්ඤ වීරියං පරක්කමං**" එසේ පිළිපදින්නා වූ ක්‍රමය දක්වීම් වශයෙන්. වීර්ය විදහා දක්වන බැවින් "පරාක්‍රමය" යැයි ලැබූ නම් ඇති සම්මා වායාමය බලව. මෙයින් තමාගේ ආයෘ මාර්ගයෙහි හැසිරීමේ කැමැත්ත දක්වන ලදී. "**ත්වං ච**" කමටහන් දෙන කලණ මිතුරාට ආමන්ත්‍රණය කරයි. "**මෙ**" මාහට. "**මඟමක්ඛාහි**" ආයෘ මාර්ගය කියන්න. ලොකෝත්තර මාර්ගයට යන චතු සත්‍ය කමටහන පවසන්න. "**අඤ්ඤස්සං**" සෘජු වූ මාර්ගය. මධ්‍යම ප්‍රතිපදාව වැඩීමෙන් අන්ත දෙකට නොවැටීමෙන් අමෘතය වූ නිවණම අවබෝධ

කරවන බැවින් ''අමතොගධං'' නම් වූ නිවන් මාවත. ''මොනෙන'' මාර්ග ප්‍රඥාවෙන්. ''මොනිසසං'' දැන ගන්නෙමි. නිර්වාණය අවබෝධ කර ගැනීමට පැමිණෙන්නෙමි. ''ගංගාසොතොව සාගරං'' යම් සේ ගංදිය පහර සාගරය, සමුද්‍රය නොඉක්මවා ඒ වෙතම යන්නේ ද එලෙසින්ම කමටහනෙහි යෙදෙන්නා වූ මම මාර්ග ඥාණයෙන් නිවණ අවබෝධ කර ගන්නෙමි.'' එනිසා මා හට ඊට යෝග්‍ය කමටහන වදාළ මැනව'යි වේනුදත්ත තෙරුන්ගෙන් ඉල්ලීය. එය ඇසූ උන්වහන්සේ කමටහනක් දුන් සේක. වල්ලිය තෙරුන් ද ඒ කමටහන වඩන්නේ නොබෝ දිනකින්ම විදසුනෙහි සිත පිහිටුවා රහත් බවට පත්වූයේය.

අපදාන පාළියේ දී වල්ලිය තෙරණුවෝ මෙසේ පවසති.

''ප්‍රිය ස්වරූප වූ මනරම් පස්කම් ගුණයන් ද අසූ කෙළක් ධනය හැර දමා පැවිදි වූයෙමි. පැවිදි වූ මම කයින්, වචනයෙන් පව්කම් වළකා ගං ඉවුරෙහි විසූයෙමි. නුදුකලාව වසන මා වෙත බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ එළඹි සේක. ''බුදු රජු'' යැයි නොදත් මම පිළිසඳර කථා කළෙමි. පිළිසඳර කථා කොට නම් ගොත් විචාළෙමි. ''ඔබ වහන්සේ දෙවියෙක් ද? නැතිනම් ශක්‍රයෙක් වේද? ඔබ කවුද? කාගේ පුත්‍රයෙක් ද? මහා බ්‍රහ්මයා මෙහි පැමිණියේ ද? උදාවන හිරුමෙන් සියලු දිශා බබුළුවන්නෙහිය. නිදුකාණෙනි! ඔබ පාදයේ දැවි දහසක් අති චක්‍රයෝ වෙති. ඔබ කවුද? කාගේ පුතෙක් ද? එය අපි කෙසේ දැනගත්තෙමුද? නම් ගොත් පවසා මාගේ සැකය දුරු කරන්න.''

''මම දෙවි නොවෙමි. ගාන්ධර්වයෙක් ද නොවෙමි. පුරිඳද නම් ශක්‍රයා ද නොවෙමි. මට බ්‍රහ්මත්වයක් ද නැත. ඔවුනට වඩා මම ශ්‍රේෂ්ඨ වෙමි. ඔවුන්ගේ විෂය ඉක්මවූයෙමි. කාම බන්ධනය ප්‍රදානය කළෙමි. සියලු කෙලෙස් දවා උතුම් වූ සම්බෝධියට පැමිණියෙමි.'' උන්වහන්සේගේ මේ වදන් ඇසූ මම මෙසේ පැවසුවෙමි. ''ඉදින් ඔබවහන්සේ සර්වඥ බුද්ධ නම් වෙහි. මහාමුනිවරය! වැඩහිඳිනු මැනවි. ඔබ වහන්සේ පුදන්නෙමි. ඔබ දුක් කෙළවර කරන්නෙහිය.''

අඳුන් දිවිසම ඇතිරූ මම එය ශාස්තෘන් වහන්සේට දුන්නෙමි. ගිරිගුහාවක සිංහයකු මෙන් උන්වහන්සේ එහි වැඩ සිටි සේක. පර්වතයට වහා නැගි මම අඹ සමූහයක් ද සල් කලණමල් ද මා හැඟි සඳුන් ද ගෙන ලෝකනායක වහන්සේ වෙත එළඹ පූජා කළෙමි. පහන් සිතැති මම සතුටු

සිතින් මහත් වූ ප්‍රීතියෙන් සඳුන් අලෙවි කොට බුදුපියාණන් වැන්දෙමි. එකල්හි අඳුන් දිවිසමෙහි වැඩ හුන් බුදුපියාණන් වහන්සේ මාගේ කුසල කර්මයේ විපාක මෙසේ වදාළහ;

''සුවඳ මල් දෙවර්ගයක් සහිත වූ මේ අඹ ඵල පූජාව නිසා නුඹ කල්ප එකසිය විස්සක් දෙව්ලොව සිත් අලවා වසන්නෙහි ය. සම්පූර්ණ වූ චිතත සංකල්පනා ඇති වසවත් දෙවියකු වන්නේය. කල්ප එකසිය විස්සක් මිනිසත් බව ලබන්නේ ය. සිවු සයුරු හා සිවුමහා දිවයින් කෙළවර කර ඇති, පෘථිවියට අධිපති වූ මහත් ඍද්ධි ඇති සක්විති රජෙකු වන්නේය. විස්කම් විසුන් මැවූ වේහාර නම් නගරයක් ඇති වේ. නන් රුවනින් සැරසුණු එනුවර මුලුමනින් ම රන්වන් වේ. මෙසේ සැප විඳිමින් සැරිසරන මෙතෙම දිව්‍ය අත්බව ද යළි මිනිසත් බව ද ලබා සෑම තැන්හි පූජිතව පශ්චිම භාවයට පැමිණ බමුණෙක්ව උපදින්නේය. ගිහිගෙයින් නික්ම පැවිදි වන මෙමෙ අභිඥාවන්හි පරතෙරට පැමිණ, ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය.'' මෙසේ වදාළා වූ සුමේධ බුදුරජාණන් වහන්සේ මා බලා සිටියදීම අහසින් වැඩම කළහ.

මැනවින් කළ ඒ කුසල කර්මයේ ද චිත්ත ප්‍රණිධිය නිසා ද මිනිස් සිරුර හැර දෑමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. තුසිතයෙන් චුතව මවුකුස උපන් මාගේ භෝගයෙහි අඩුවක් නැත. මවුකුස හොත් මාගේ සිතැඟි අනුව මගේ මවුට කැමතිතාක් ආහාර පාන භෝජනාදිය පහළ විය. උපතින් පස්වියේදී සසුනේ පැවිදි වූ මම කෙස් බාද්දීම රහත් ඵලයට පත් වීමි. පූර්ව කර්මය පිරික්සා බැලූ මම එය ලඝු සේ නොදුටුවෙමි. මීට කල්ප තිස් දාහකට පෙර කළ කර්මය දුටුවෙමි. පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස ! නුඹ වහන්සේට නමස්කාර වේවා. පුරුෂෝත්තමයන් වහන්ස ! ඔබ වහන්සේට නමස්කාර වේවා. ඔබ වහන්සේගේ සසුනට පැමිණ අවල පදය වූ නිවන ලැබුයෙමි. මෙයින් කල්ප තිස් දහසකට පෙර යම් බුදුවරයකු පිදුවෙම්ද එතන් සිට දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. මවිසින් දැන් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.'' රහත් බවට පත් වල්ලිය තෙරණුවෝ සිය රහත් බව ප්‍රකාශ කරන සේක්, මුලින් වදාළ ගාථා දෙකම නැවත වදාළ සේක.

වල්ලිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.5

''කෙසෙ මෙ ඔලිච්සසනති'' යනාදී ගාථා **චිතසෝක** තෙරුන් විසින් වදාරන ලදී. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හිදී පින්දහම් රැස් කරගෙන අවුත් **සිද්ධත්ථ** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී බමුණු කුලයක ඉපිද බමුණු විද්‍යා ශිල්පයන්හි පරතෙරට ගිය බමුණෙක් වූහ. කාමයන් හැර දමා ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ ඔහු මහත් ඍෂි සමූහයක් පිරිවරාගෙන අරණ්‍යයෙහි විසීය. බුදු උපත අසා තුටු පහටුව, බුදුවරු නම් දිඹුල් මල් මෙන් දුලභ දසුනකි. ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් පහළ වී සිටිති'' යි මහත් පිරිවරක් සමඟ ශාස්තෘන් වහන්සේ වෙත යන අතර මඟදී යොදුන් එකහමාරක් තිබියදී රෝගාතුර වූ තාපසතුමා බුදු ගුණ මෙනෙහි කරමින්ම කළුරිය කළේය. දෙව්ලොව උපන් හෙතෙම තව තවත් පින් දහම් සිදුකරමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේදී බුදු පිරිණිවනින් වසර දෙසිය දහ අටකට පසුව ධර්මාශෝක රජුගේ බාල සහෝදරයාව උපන්නේ ය. ඔහු **චිතසෝක** නමින් ප්‍රකට විය. වැඩිවිය පත් ඔහු ක්ෂත්‍රිය කුමරුන් විසින් උගත යුතු සිප් සතර හදාරා එහි කෙළවරට ගොස් ගිරිදත්ත තෙරුන් ඇසුරෙහි සිටිමින්, සූත්‍රාන්ත පිටකයේ ද අභිධර්ම පිටකයේ ද විශාරද බවට ගිහිව සිටියදී ම පත් විය. එක් දිනක් රැවුල කපන අවස්ථාවේ දී කපුවාගේ අතින් කැපපත ගෙන තම රුව බැලූ චිතසෝක සිය සිරුර රැළි ගැසීම හා ඉදුණු කෙස් දක හටගත් සංවේගයෙන් විදසුනට සිත යොමු කළේය. අනිත්‍යාදී ධර්ම මෙනෙහි කළ ඔහු, එම අසුනෙහි හිඳගෙනම සෝවාන් වී ගිරිදත්ත තෙරුන් සමීපයේ පැවිදිව නොබෝ දිනකින් රහත් ඵලයට පැමිණියේ ය.

චිතසෝක තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''එකල මම ලක්ෂණ ශාස්ත්‍රය, ඉතිහාසය, නිඝණ්ඩු - කෙටුභ සහිත ත්‍රිවේදයෙහි පාරගතව මන්ත්‍ර හදාරන මන්ත්‍රධරයෙක් වීමි. එකල ගඟ සැඩවතුරක් මෙන් ශිෂ්‍යයෝ මා වෙත පැමිණෙති. දිවා රෑ දෙක්හි අනලස් වූ මම ඔවුන්ට මන්ත්‍ර ඉගැන්වූයෙමි. එකල සිද්ධත්ථ නම් සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූහ. උන්වහන්සේ මෝහ ගනදුර නසා ඥානාලෝකය පැතිරවූහ. එකල මාගේ එක් ශිෂ්‍යයකු සෙසු ශිෂ්‍යයන් පැවසූ පුවතක්, ඔවුහු පැමිණ මා හට මෙසේ දැන්වූහ.

''සර්වඥ වූ ලෝකනායක වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූහ. ජනයා උන්වහන්සේ වෙත ඇදී යති. අපට වන්නා වූ ලාභයක් නැත.'' මහත් යසස් ඇති බුදුවරයෝ දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ උපදේශයක් නොමැතිව ලොව පහළ වෙති. ඒ උතුම් ලෝක නායකයන් වහන්සේ දකින්නෙම් නම් මැනවැයි මම සිතුවෙමි. එසේ සිතූ මම අඳුන් දිවි සමඳ වැහැරී සිවුරු ද පැන්කෙණ්ඩිය ද ගෙන අසපුවෙන් නික්ම සිසුන් ඇමතුවෙමි. ''දිඹුල් මල් මෙන් ද සඳෙහි හාවා මෙන් ද කපුටන්ගේ කිරි මෙන් ද බුදුවරයෝ දුර්ලභ වෙති. එබඳු දුර්වල බුදුරදහු දැන් පහළව සිටිති. මිනිසත් බව ද දුලබය. ඒ දෙකම ඇති කල්හි සද්ධර්ම ශ්‍රවණය අතිශයින් දුර්ලභය. බුදු රජ ලොව පහළ වූ සේක. පින්වතුනි! අපගේ දහම් ඇස ලබමු. එවු. සියලු දෙනම උන්වහන්සේ වෙත යමු.''

එකල්හි සියලු දෙනම පැන්කෙන්ඩි ගෙන, කුර සහිත අඳුන් දිවි සම් දරමින් දළමඩුලු බරින් බර වූවාහු වනයෙන් නිකමුනහ. ඒ මගේ සිසුවෝ වියදඬු පමණ දුර බලන්නාහු, උත්තමාර්ථය සොයන්නාහු ඇලීමේ දෝෂ රහිතවූවාහු නිර්භය කේශර සිංහයන් සේ වූවාහු, අල්ප කටයුතු ඇත්තාහු, ලොල් නොවූවාහු ප්‍රඥා ඇත්තාහු සන්සුන් පැවතුම් ඇත්තාහු පිණ්ඩපාත චර්යාවෙහි හැසිරෙන්නාහු බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ වෙත එළඹියහ. එසේ යන අතරමගදී යොදුන් එකහමාරක් නිබියදී මට රෝගයක් වැළඳුණි. බුදු පියාණන් සිහිපත් කරමින් ම මම කළුරිය කළෙමි. මෙයින් කල්ප අනූනතරකට පෙර යම් බුද්ධ සංඥාවක් උපදවා ගත්තෙමි ද එදා මෙදා තුර දුගතියක නූපන්නෙමි. බුද්ධ සංඥාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත්ව ඒ බව පළකරන විතසෝක තෙරණුවෝ මේ ගාථා දෙක වදාළ සේක.

''කෙසෙ මෙ ඔලිබිසඤති කපපකො උපසංකමි
තතො ආදාසමාදාය සරීරං පචචවෙකඛිසං

තුචෙඡා කායො අදිසසිත්ථ, අඤකාරො තමො බ්‍යගො
සබබෙ චොළා සමුචඡිනනා නත්ථිදානි පුනබභවො'' තී.

එහි ''**කෙසෙ මෙ ඔලිබිසඤති කපපකො උපසංකමි**'' යනු ගිහි කාලයේ දී රැවුල් කපන අවස්ථාවේ ''මගේ කෙස් කපන්නෙමි''යි, කෙස් ආදිය සිදින කපන අරුතින් කරණවැමියා නම් වූ හිස රැවුල් කපන්නා මා

වෙත පැමිණියේය. රැවුල් කැපූ කල්හි ''**සරීරංපඨවෙකඛිය**'' කැඩපතින් සියලු ම කයෙහි වූ රැළිවැටීම්, කෙස් ඉදීම් ආදි නිමිති දැක ''මගේ කය දිරායෑමෙන් මඬනා ලදි'' යැයි තමාගේ ශරීරය ජරාවට පත්වූවක් මෙන් විමසා බලා, එසේ විමසන විට මේ කය හිස්ය. නිත්‍ය, සදාකාලික, සුවදායි බවින් මිදුණු හිස්වූවක් මෙන් මේ කය වැටහේ. කුමක් නිසා එසේ වැටහේ ද? **අඤ්ඤාරෝ තමෝ බ්‍යගෝ**'' අවිද්‍යාව නම් අඳුර පලවා හැරි බැවිණි. යම් හෙයකින් අනුවණින් මෙනෙහි කිරීම නම් වූ අඳුරෙන් තම කය බැලීමේදී අඳුරු සහගත බැවින්, කයේ සත්‍ය වශයෙන්ම ඇති අසුභ බව නොපෙනේ. කයේ නොමැති සුබ-යහපත් ආකාර පෙනේ. අඳුරෙහිදී නුවණ අඳුරු කරන බැවිණි. නුවණින් කය පිළිබඳව මෙනෙහි කර බැලීමේදී පහළ වූ ඤාණ නම් ආලෝකයෙන් අවිද්‍යාව නම් අඳුර දුරුකරන ලදී. එවිට ම සියලුම කෙලෙස් නම් කඩමාලු සිඳ දමන ලදි. ''**සබ්බෙ ථොළා සමුච්ඡින්නා**'' ක්ලේශයෝ නම් සොරු මෙන් කුසල් නම් බඩු සිඳ දමති. වනසති. සාධූන්, සත්පුරුෂයන් විසින් නොගතයුතු, රැස් නොකළයුතු වූ සසර නමැති කුණුගොඩෙහි දැමූ රෙදි කඩක් වැනි වෙති. ඉසුරුමත් ආර්ය ජනයා විසින් පිළිකුල් කටයුතු බැවින් ''ථෝළ'' නම ලද රෙදි කඩක් බඳු වූ කෙලෙස් මුලුමනින් සිඳ දමන ලදී. ආර්යමාර්ගයෙන් නැසූ කෙලෙස් ඇති රහතුන්ට නැවත ඉපදීමක් නැත. අනාගත ඉපදීමක් නැත.

වීතසෝක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.6

''පඤ්ච නීවරණෙ හිත්වා'' යන ගාථා ආයුෂ්මත් පුණ්ණමාස තෙරුන්ගේය. ඒවායේ උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි ඉපිද පින් රැස් කරමින් අවුත්, **නිස්ස** නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද වැඩිවිය පත්වූහ. එක් දිනක් ශාස්තෘන් වහන්සේ ආරණ්‍යයෙහි වසන සමයෙහි පාංශුකූල චීවරයක් ගසක අත්තක එල්ලා ගඳ කිළියට වැඩියහ. දුනුගෙන විහාරයට පිවිසි සිටු කුමරු ශාස්තෘන් වහන්සේගේ පාංශුකූල සිවුර දැක පහන් සිත් ඇතිව, දුනුදිය බැහැරලා බුදු ගුණ මෙනෙහි කරමින් ඊට වැන්දේය. ඒ පින්කමේ විපාක ලෙස දෙව් මිනිසුන් අතර සැරිසැරූ ඔහු මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර කෙළෙඹි පවුලක උපන්නේය.

ඔහු උපන් දින ඒ ගෙදර සියළු භාජන රත්මය මසුවලින් පිරී ගියේය. එනිසා පුතුට "පුණ්ණමාස" යන නම තබන ලදී. වැඩිවියට පත් එකුමරු විවාහ වී එක් පුතෙකු උපන් කල්හි ගිහි ගේ අත්හැර පැවිදි වී ගම් සෙනසුනක වසමින් උත්සාහවත්ව, වැර වැයම් කොට ෂඩ් අභිඥාලාභී මහතෙරනමක් බවට පත් විය.

අපදාන පාළියේදී පුණ්ණමාස තෙරණුවෝ මෙසේ වදාළහ.

"සියල්ල තමාම දත් අග්‍ර පුද්ගල වූ තිස්ස නම් බුදුරජාණන් වහන්සේ සිය පංශුකූල සිවුර ගසක තබා විහාරයට පිවිසි සේක. නමන ලද දුන්න ගෙන අහර පිණිස වනයේ හැසිරුණු මම කඩුව ද ගෙන වනයට පිවිසියෙමි. එකල එක් ගසක එල්ලූ පාංශුකූල සිවුර දුටු මම එතැන දුන්න දමා හිසෙහි ඇඳිලි බැඳ ගෙන පහන් සිතින් සතුටට පත්ව, ප්‍රීතියෙන් යුතුව බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේගේ පාංශුකූල චීවරයට වැන්දෙමි. මෙයින් කල්ප අනූ දෙකකට පෙර පාංශුකූල සිවුරට වැඳීමේ පිනෙන් මේ දක්වාම දුගතියක නූපන්නෙමි. වන්දනාවේ විපාකය මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. - පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

ෂඩ් අභිඥා උපදවා ගත් පුණ්ණමාස තෙරණුවෝ සැවැත් නුවරට පැමිණ ශාස්තෘන් වහන්සේට වැඳ සොහොනෙහි විසූහ. උන්වහන්සේ පමිණි නොබෝ කලකින්ම ගිහි කල ලැබුණු පුතු මළේය. දරුවාගේ මව තෙරුන්ගේ පැමිණීම අසා "මා දැන් අස්වාමිකය. අපුත්‍රකය. අපුත්‍රක වූ මගේ ධනය රජු ගෙනයන්නේ ය"යි කියමින් තෙරුන් වහන්සේ සිවුරු හරවා ගැනීමට මහත් පිරිවරක් රැගෙන උන්වහන්සේ වසන තැනට පැමිණියාය. නානාවිධ ක්‍රමෝපායන් මඟින් තෙරුන් පොළඹවා ගැනීමට උත්සාහ කළ ඇගේ ක්‍රියාව දුටු පුණ්ණමාස තෙරණුවෝ තමන් වහන්සේගේ වීතරාගී බව දක්වමින් අහසෙහි සිට තම පිළිවෙත ප්‍රකාශ කරන සේක්; ඇයට ධර්ම දේශනා කරමින් මේ ගාථා දෙක වදාළහ.

"පඤ්චනීවරණෙ හිත්වා යොගක්ඛෙමස්ස පත්තියා
ධම්මාදාසං ගහෙත්වාන ඤාණදස්සන මත්තනො

පච්චවෙක්ඛිං ඉමං කායං සබ්බං සන්තරබාහිරං
අජ්ඣත්තං ච බහිද්ධා ච, තුච්ඡෝ කායෝ අදිස්සථ"

එහි ''පඤ්චනීවරණෙ හිත්වා'' කාමච්ඡන්දාදී පඤ්ච නීවරණයන් අත්හැර, ඤානාධිගමනයෙන් විද්වසනය කර ''**යොගක්ඛෙමස්ස පත්තියා**'' කාමාදී සතර යෝගයන් ක්ෂය කරන, ඉන් පීඩානොවන නිවණට, යෝගක්ෂේම නම් නිවණට පැමිණීම සඳහා ''**ධම්මාදාසං**'' ධර්මය නම් කැඩපත. යම් සේ කැඩපතින් බලන්නාගේ රූපකායෙහි ගුණාගුණ පෙන්වා දෙයි ද එලෙසින්ම විදර්ශනා නම් ධර්මයන්හි ශ්‍රමණඵලට අදාළ විශේෂාවබෝධයෙන් ද ඤාණදර්ශනයට උපකාරී වූ ධර්ම නම් කැඩපතින් බලන්නාගේ කෙලෙස් වලින් කිලිටි, නොකිලිටි බව ප්‍රකට කිරීමෙන් ද කෙලෙසුන් ප්‍රහාණයට විශේෂයෙන් උපකාර කිරීමෙන් ද නාම කයෙහි (සිතේ) ගුණ ප්‍රකට කරයි. එනිසා කියන ලදී.

''ධම්මාදාසං ගහෙත්වාන ඤාණදස්සන මත්තනො
පච්චවෙක්ඛිං ඉමං කායං සබ්බං සන්තරබාහිරං''

''ධර්මය නැමති කැඩපත ගෙන තමාගේ ඥාන දර්ශනයෙන් සිය සිරුරේ සියලුම අභ්‍යන්තර බාහිර කෙලෙස් ධර්ම පිළිබඳව විමසා බැලිය යුතුයි''

මේ නාමකයේ ධර්ම සමූහය, මගේ ආත්මභාවයේ ආධ්‍යාත්මික බාහිරායතන වැඩීමෙන් ඇතුලත පිටත වූ සියලුම කෙලෙස් ධර්ම පිළිබඳව ධර්මය නම් කැඩපතින් බලා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සිහිපත් කර බැලුවෙමි. නුවණැසින් දුටුවෙමි. මෙසේ දකින්නා වූ මවිසින් ''**අජ්ඣත්තං ච බහිද්ධා ච**'' ස්ව සන්තානයෙහි ද පර සන්තානයෙහි ද තුච්ඡ වූ (හිස් වූ) කය දුටුවෙමි. දක්නා ලද්දෙමි. නිත්‍ය, සාර නොවූ හිස් වූ ස්කන්ධ පඤ්චකය නම් වූ ආත්ම භාවය නුවණැසින් තත්ස්වාකාරයෙන්ම දුටුවෙමි. මේ සියලුම පඤ්චස්කන්ධය, ''මහණෙනි, අවිද්‍යාවෙන් වෙලුණු මෝඩයාගේ තණ්හාවෙන් යුක්ත වූ කය මේ ආකාරයෙන් හටගනියි'' ආදි වශයෙන් ''කය'' නමින් හඳුන්වයි. ''**අදිස්සථ**'' යන මෙයින් යම් අයුරකින් කය දෙස බැලිය යුතු ද එසේම බලා යථාර්ථය දුටුවෙමි. ''දැන් මවිසින් නුඹගේ කයෙහි බැලිය යුත්තක් නැත. මා කළයුතු කටයුතු නිමවන ලදී.'' යැයි රහත් වූ බව ප්‍රකාශ කරන ලදී. මෙසේ පුණ්ණමාස තෙරණුවෝ තම ගිහිකළ භාර්යාවට මේ ගාථාවලින් ධර්මදේශනා කොට ඇය තිසරණයෙහි ද පංචශීලයෙහි ද පිහිටවූ සේක. ආර්ය මාර්ගයෙහි ගමන් කිරීමට උත්සාහවත් කළ සේක.

පුණ්ණමාස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.7

"යථාපි භද්දෝ ආජඤ්ඤෝ" යනාදී ගාථා ආයුෂ්මත් **නන්දක** තෙරුන් වහන්සේ විසින් වදාරණ ලදී. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් සිදු කරමින් අවුත්, **සිබි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී ප්‍රත්‍යන්ත ප්‍රදේශයක ඉපිද වැඩිවියට පත් වූ වැද්දෙක් වූහ. ඒ වැදිතෙම දිනක් ශාස්තෘන් වහන්සේගේ සක්මන් කරන මළුව දැක පහන් සිතින් එහි වැලි විසුරුවීය. ඒ පින්කම නිසා දෙව් මිනිසුන් අතර සැරිසැරූ ඔහු මේ බුද්ධෝත්පාද කාලයේ දී චම්පාවේ ගහපත් පවුලක උපන්නේ ය. **නන්දක** නමින් ඔහු ප්‍රකට විය. නන්දකගේ වැඩිමල් සෝයුරා **භරත** නම් විය. ඔහු පිළිබඳව ඊළඟ කථාවේදී විස්තර කෙරේ. මේ දෙදෙනාම වැඩවියට පත්ව සොණ කෝළි වීස පුත්‍රයාගේ පැවිදිවීම අසා, "මේ ඉතා සියුමැලි වූ සෝණ කුමරුද පැවිදි විය. අපි කුමක් නිසා ගිහිව සිටිමු ද?"යි පැවිදි වූහ. ඒ දෙනමගෙන් භරත තෙරුන් වහන්සේ නොබෝ දිනකින්ම විදසුන් වඩා ඉඩ අභිඥා උපදවා ගත්හ. නන්දක තෙරුන්ගේ සිතේ කෙලෙස් බලවත් වූ බැවින් විදසුනට සිත යොමුකිරීම අපහසු විය. විදසුන් භාවනාව සඳහා පුහුණුවීම පමණක් කළේය. මේ බව දුටු භරත තෙරණුවෝ "මොහුට උපකාර කළ යුතුය"යි උන්වහන්සේ සමඟ විහාරයෙන් නික්ම මහා මාර්ගය අසලින් වැඩහිඳ විදර්ශනාව පිළිබඳ සාකච්ඡා කළහ. එවිට එම මාවතින් ගැල් සාත්තුවක් පැමිණියේය. එහි එක් ගැලක යෙදූ ගොනෙකු මඩ වගුරකින් ගැල ගෙන යා නොහැකිව වැටුණේය. එවිට ගැල් කරුවා ඌ ගැලෙන් මුදා තණ ද දිය ද දී වෙහෙස නිවා නැවත ගැලෙහි යෙදවීය. එවිට ඒ ගොනා වෙහෙස සන්සිඳීමෙන් ලැබූ බලයෙන් ඒ ගැල මඩවගුරෙන් උඩට ගෙන ගොඩබිම පිහිටුවීය. ඉක්බිති භරත තෙරණුවෝ නන්ද හිමිගෙන්, "ඇවැත්නි! නන්දකයා! නුඹ මේ ගොනාගේ ක්‍රියාව දුටුවෙහි ද?" ඇසූහ. එම සිදුවීම දුටු නන්දක තෙරණුවෝ "දැක්කෙමි"යි පැවසූහ. භරත හිමියෝ, "එසේ නම් එය මනාව හිතට ගනුව"යි වදාළහ. එවිට නන්දක තෙරණුවෝ, "යම් සේ මේ ගොනා වෙහෙස සන්සිඳුණු පසුව මඩවලින් ගැල එගොඩ කරවූවේ ද එලෙසින් ම මම ද සසර නම් මඩවලින් තමා ඔසවා තැබිය යුතුයි" යනුවෙන් එම සිදුවීම ම අරමුණු කොට විදසුන් කමටහන වඩන්නේ නොබෝ දිනකින්ම රහත් බවට පත්වූහ.

නන්දක තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''පෙර මම මහ වනයෙහි මුව වැද්දෙක් වූයෙමි. වාත මුවෙකු සොයමින් ගිය මම සක්මන් මළුවක් දුටිමි. ඇකයෙන් (ඔඩොක්කුවෙන්) වැලි රැගෙන පැමිණි මම පහන් සිතින් සතුටු වූයෙම් සිරිමත් වූ සුගතයන් වහන්සේගේ සක්මනෙහි විසුරුවිමි. මීට කල්ප තිස් එකකට පෙර කරන ලද වැලි විසිරවීමේ පින හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. වැලි දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් වූ නන්දක තෙරණුවෝ සිය වැඩිමහල් සොහොයුරා වූ භරත තෙරුන් ඉදිරියේ සිය රහත් බව ප්‍රකාශ කරනු සඳහා මේ ගාථා දෙක වදාළහ.

''යථාපි හද්දෝ ආජඤ්ඤා ඛලිත්වා පතිතිට්ඨති,
හීයෝ ලද්ධාන සංවෙගං අදීනෝ වහතෙ ධුරං

එවං දස්සන සම්පන්නං සම්මා සම්බුද්ධසාවකං
ආජානීයං මං ධාරෙථ පුත්තං බුද්ධස්ස ඔරසං''

එහි ''හීයෝ ලද්ධාන සංවෙගං අදීනෝ වහතෙ ධුරං'' ''මාගේ ජාති, බල, විරියාදියට ''මෙ බර ඇදගෙන නොයාම'' අවනම්බුවකි''යි සංවේග උපදවාගෙන, නොපසුබට සිතින්, අදීන වූ සිතින්, වීර්යවන්ත සිතින්, ''අලීනෝ'' යන පාඨය ද මෙහි යෙදේ. ''අදීන'' ''අලීන'' යන පද දෙකෙහිම ඇත්තේ එකම අරුතකි. ''හීයෝ'' බොහෝ සෙයින් නැවත නැවත අධිකව තම ගැල්බර ඔසවයි. ගෙනයයි. ඉතිරි පදයන්ගේ අර්ථ ඉහත **රමණීය විහාර** තෙරුන්ගේ ගාථා අර්ථවර්ණනාවේදී දැක්වූ පරිදි දත යුතුයි.

නන්දක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.8

''එහි නන්දක ගච්ඡාම'' යන ගාථා ආයුෂ්මත් **භරත** තෙරුන්ගේය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර **අනෝමදස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. දිනක් ඉතා ලස්සන, මුදු සුවපහස් ඇති පාවහන් යුවලක් රැගෙන යන මේ සිටුකුමරු

ශාස්තෘන් වහන්සේ සක්මන් කරනු දුටුවේය. පැහැදුණු සිතින් පාවහන් යුවළ පිළිගැන්වූ ඔහු ''ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මාහට බොහෝ කලක් හිතසුව පිණිස මේ පාවහන් යුවළ පිළිගන්නා සේක්වා''යි පැවසීය. ඔහුට අනුග්‍රහ පිණිස භාග්‍යවතුන් වහන්ස එම පාවහන් යුවල පරිභෝග කළ සේක. ඒ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරි සැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී චම්පා නුවර ගහපති පවුලක උපන්නේ ය. ''**භරත**'' නමින් ප්‍රකට වූ ඒ කුමරු, **සෝණ** තෙරුන්ගේ පැවිදිවීමේ පුවත අසා, ''සෝණත් පැවිදි වුණා'' යැයි සංවේග උපදවාගෙන පෙර කළ පුරුදුතාවය නිසා විදසුන් කමටහන වඩා නොබෝ දිනකින්ම ෂඩ් අභිඥා උපදවා ගත්තේ ය.

භරත තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''ලොවට ජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ පසැස් ඇති අනෝම දස්සි බුදුරජාණන් වහන්සේ දිවා විහරණයෙන් නික්ම සක්මනට පිළිපන්සේක. එකල මම මනාව සෑදූ පාවහන් යුවලක් ගෙන මගට පිළිපන්නෙමි මනෝඥ වූ දර්ශන ඇති පා ගමනින් වඩින බුදුපියාණන් වහනසේ දුටුවෙමි. සිත පහදවා ගත් මම පාවහන් යුවල ගෙන උන්වහන්සේගේ පාමුල තබා මෙසේ කීවෙමි. ''විනායකයන් වහන්ස! සුගතයන් වහන්ස! මහාවීරයන් වහන්ස! නැඟුන මැනව. මේ පාවහන් පරිභෝග කිරීමෙන් මාගේ අභිමතාර්ථ ඉටු කළ මැනව'' යනුවෙනි.

පාවහන් යුවළට නැඟුණු ලෝකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ අනෝමදස්සී බුදුනු මෙසේ වදාළහ. ''යමෙක් පහන් සිත් ඇතිව මට සියතින්ම පාවහන් යුවලක් පිදුවේද ඔහුගේ විපාක මම කියමි. එම වදන් අසවු.'' බුදුපියාණන් වහන්සේගේ ඒ හඬ ඇසූ දෙවිවරු ඔද වැඩුණු සිතින්, සතුටින්, ප්‍රීතිමත්ව බැඳදලිව රැස්වූහ. ''වහන් යුවල පිදූ හෙතෙම සුව ඇත්තෙක් වන්නේය. පනස් පස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. සක්විතිව දහස් වරක් උපදින්නේය. ඔහු ලබන ප්‍රදේශ රාජ්‍ය සම්පත්තිය ප්‍රමාණ කළ නොහැක. මෙයින් අපරිමෙය්‍ය වූ කල්පයෙහි ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්මය දායාද කරගත්, ධර්මයෙන් නිර්මිත වූ ඖරස බුද්ධ පුත්‍ර වූ සියලු ආශ්‍රවයන් දන අනාශ්‍රවව පිරිනිවන් පාන්නේය. පින්වත් වූ මොහු උපදින දිව්‍ය, මනුෂ්‍ය අත්බවේදී දිව්‍ය යානා වැනි යානා ලබන්නේය.''

දෙව්-මිනිස් අත්බැව්හිදී ප්‍රාසාද, සිවිකා, මනාව සැරසූ ඇත්තු හා අජානේය අසුන් යෙදූ රථ සැමකල්හි මට පහළ විය. ගිහිගෙන් නික්මුණු මම රථයෙන් පැමිණියෙමි. කෙස් සිඳින කල්හිම මම රහත් වූයෙමි. මා හට මහත් ලාභ ලැබුණි. එය මනා වූ වෙළඳාමක් විය. එකම වහන් සඟලක් පුදා අචල පදය වූ නිවණට පැමිණියෙමි. මෙයින් අප්‍රමාණ කල්පයකට පෙර යම් පාවහන් යුවලක් පිදුවෙමි ද එහි විපාක ලෙස දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

ඩේ අභිඥා උපදවාගත් හරත තෙරණුවෝ ඉහත දැක්වූ පරිදි සිය සෝයුරු නන්දක තෙරුන් විසින් රහත් බව ප්‍රකාශ කළ කල්හි, "දැන් නන්දක ද රහත් විය. එනිසා අපි දෙන මම ශාස්තෘන් වහන්සේ වෙත ගොස් විසූ බඹසර දන්වන්නෙමු නම් මැනවි" යි යනුවෙන් උපන් සිතුවිල්ල නන්දක තෙරුන්ට පවසමින් මේ ගාථා දෙක වදාළහ.

"එහි නන්දක, ගච්ඡාම උපජ්ඣායස්ස සන්තිකං
සීහනාදං නදිස්සාම බුද්ධසෙට්ඨස්ස සම්මුඛා

යාය නො අනුකම්පාය අම්හෙ පබ්බාජයී මුනී
සො නො අත්ථෝ අනුප්පත්තෝ සබ්බසංයොජනක්ඛයෝ" ති.

එහි "නන්දක" යනු ඇමතීමයි. "එහි" තමාගේ සමීපයට ඔහු කැඳවයි. "ගච්ඡාම" දෙදෙනා වහන්සේ විසින්ම එකට කළයුතු ක්‍රියාව දක්වීමකි. "උපජ්ඣායස්ස" යනු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ. සම්මා බුදුරජාණන් වහන්සේ වනාහි සියල්ල දන්නා ඇසින් ද බුදු ඇසින් ද සත්ත්වයන්ගේ ප්‍රකට අප්‍රකට චරිතාදිය තත්ත්වාකාරයෙන්ම දැන, දෙවියන් සහිත ලෝකයාගේ වැරදි නිවැරදි නැවත නැවත විශේෂයෙන් පෙන්වා දෙන සේක. එබැවින් "උපජ්ඣාය" නාමයට සුදුසුය. මේ යන ගමන යම් අර්ථයක්, ප්‍රයෝජනයක් සඳහා වේද එය දක්වමින් **"සීහනාදං නදිස්සාම** බුද්ධසෙට්ඨස්ස **සම්මුඛා**" යනුවෙන් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ අභිමුවෙහි සිංහ නාද පවත්වමු"යි වදාළහ.

"සත්‍ය වූ බුද්ධ ගුණ දැක්වීම් වශයෙන් අභීත නාදයක් වූ බැවින් සිංහ නාදයකි. සියල්ලන්ටම උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ බුදුවරු, පසේබුදුවරු හා බුද්ධ ශ්‍රාවකාදී ශ්‍රේෂ්ඨයන්ගේ ඉදිරියෙහි පවත්වමු"යන අර්ථයයි. යම් සිංහනාදයක් පැවැත්වීමට කැමතිවේද එය දක්වනු සඳහා **"යාය"** යන ගාථාව වදාළහ.

එහි "**යාය**" යම් අර්ථයකට, යම් ප්‍රයෝජනයක් සඳහා "**නො**" අප දෙදෙනාට "**අනුකම්පාය**" අනුග්‍රහ පිණිස අප දෙදෙන පැවිදි කරවූ සේක් ද, "**මුනී**" භාග්‍යවතුන්. "**සො නො අත්ථො අනුප්පත්තො**" ඒ අර්ථය, ප්‍රයෝජනය වූ සියලුම සංයෝජනයන් දුරුකර ලබන අර්හත් ඵලය අප විසින් ලබා ගන්නා ලදී. අවබෝධ කරගන්නා ලදී.

භරත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.9

"**නදනති එවං සපඤ්ඤා**" යනු ආයුෂ්මත් **භාරද්වාජ** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ පෙර බුදුවරු හමුවෙහි තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස් කරමින් අවුත්, මීට කල්ප තිස් එකකට පෙර සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. එක් දිනක් සුමන නම් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වඩිනු දැක පහන් සිතින් වල්ලිකාර ගෙඩියක් පූජා කළ ඔහු ඒ පින්කමේ විපාක ලෙස කාම සුගතින්හිම සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර බමුණු පවුලක උපන්නේය. ගෝත්‍ර නාමය වූ "**භාරද්වාජ**" නමින් ම ඔහු ප්‍රකට විය. වැඩිවියට පත් ඔහු විවාහ වී එක් පුතෙකු ලැබුවේය. ඒ පුතු **කණ්හදින්න** නම් විය. එම දරුවා වැඩිවිය පැමිණි කල්හි, "දරුව, අසුවල් ආචාර්යන්ගෙන් ශිල්ප ඉගෙන එව"යි කියා තක්සලාවට යැවීය. ඒ දරුවා තක්සලාවට යන අතර මඟදී ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවක වූ එක්තරා කල්‍යාණ මිත්‍ර මහතෙර නමක් හමුවී ධර්මශ්‍රවණය කළේය. ධර්මශ්‍රවණයෙන් ලැබූ ශ්‍රද්ධා ඇති කණ්හදින්න කුමරු බුදුසසුනේ පැවිදි වී කරන ලද පූර්ව කටයුතු ඇත්තේ, විඳසුන් කමටහන වඩා නොබෝ දිනකින්ම රහත් විය.

ඔහුගේ පියා වූ භාරද්වාජ ද වේළුවනාරාමයේ වෙසෙන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ සද්ධර්මය ශ්‍රවණය කර පැවිදි විය. නොබෝ දිනකින්ම උන්වහන්සේ ද රහත් වූහ. භාරද්වාජ තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

"එකල **සුමන** නම් බුදුරජාණන් වහන්සේ තක්කරා නුවර වැඩ විසූහ. මම සියල්ල දත් බුදුරජාණන් වහන්සේට වල්ලිකාර ඵලයක් පූජා කළෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එහි

විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. එල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

ඉක්බිති කණ්හදින්න හිමියෝ, ශාස්තෘන් වහන්සේට වැඳීම සඳහා රජගහ නුවරට පැමිණ, උන්වහන්සේ සමීපයේ සිටි තම පියා දැක සතුටු සිතැතිව, ''මගේ පියා ද පැවිදි විය. ඔහු විසින් පැවිදි කිස නිමවන ලද්දේද?''යි විමසා බැලූසේක්, රහත් වූ බව දැනගත් සේක. තම පියා ලවා සිංහනාද පවත්වනු කැමති කණ්හදින්න හිමියෝ, ''නුඹ විසින් බුදුසසුනේ පැවිදිවීමෙන් යහපතක් කරන ලදී. පැවිද්දේ කටයුතු නුඹ විසින් මස්තකප්‍රාප්ත කර ගත්තෙහි ද?''යි විචාළහ. තම පුතුට තමා ලැබූ අධිගමයන් පවසනු සඳහා භාරද්වාජ තෙරණුවෝ මේ ගාථා දෙක වදාළහ.

''නදනති එවං සපඤ්ඤා සීහාව ගිරිගබ්හරෙ
වීරා විජිත සංගාමා ජෙත්වා මාරං සවාහනං

සත්ථා ච පරිචිණ්ණෝ මෙ, ධම්මෝ සංඝොච පූජිතෝ
අහං ච විත්තෝ සුමනෝ පුත්තං දිස්වා අනාසවං''

එහි ''නදනති'' සත්‍ය වූ බුදුගුණ ප්‍රකට කිරීම් වශයෙන් අභීත වූ සිංහනාද පවත්වති. ''එවං'' දැන් පැවතිය යුතු ආකාරය දැක්වීමයි. මෙසේ ''සපඤ්ඤා'' අග්‍ර මාර්ගය වූ ප්‍රඥාව අවබෝධයෙන් සියලු ප්‍රඥාවෙහි විපුලත්වයට පත් වූ. ''වීරා'' චතුර්විධ සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුතු බැවින් වීරයෝ නම් වූ. එසේම කෙලෙස් ඉතිරි නොවන සේ මැඩලන, වනසන ලද බැවින් ද සේනා සහිත කෙලෙස්, අභිසංඛාර හා දේවපුත්ත යන මාරයන් පරදා ජයගත් බැවින් ද සියලුම ආකාරයෙන් දිනූ යුද්ධ ඇති බැවින් ද වීරයෝ නම් වූ ප්‍රඥාවන්තයෝ නද දෙති. මෙසේ කෙලෙස් ජය ගැනීමෙන් සිංහනාදය දක්වා දැන් සිත් සතුටු කිරීමෙන් අපේක්ෂිත අර්ථ සිද්ධිය ඉටුවූ බව දැක්වීමට ''සත්ථා ච පරිචිණ්ණෝ'' යන දෙවන ගාථාව වදාළහ. එහි ''සත්ථා ච පරිචිණ්ණෝ මෙ'' යනු මගේ ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙන ලද අවවාද අනුශාසනා අනුව ක්‍රියාකළ මවිසින් උන්වහන්සේ මැනවින් ඇසුරු කරන ලදී. ''විවාද, දොස්කීම්, ආදියකට භාජනය නොවීමි'' යන අදහසයි. ''ධම්මෝ සංඝෝ ච පූජිතෝ'' නවවිධ ලෝකෝත්තර ධර්මයෙන් යුත් පිළිවෙත් මගෙහි ගමන් කිරීමෙන් ද ශ්‍රමණ බවට යෝග්‍ය සීල, දිට්ඨි ගුණ වැඩීමෙන් ආර්ය සංඝයා ද මවිසින් පුදන ලදී. ගරු කරන ලදී. ''අහඤ්ච විත්තෝ සුමනෝ පුත්තං දිස්වා අනාසවං'' මගේ පුතා

අනාශ්‍රව, සියලු ආශ්‍රව සිඳ දමා රහත්ව සිටිනු දැකීම නිසාත්, මම ද අනාශ්‍රව වූ බැවින් මගේ සිත නිරාමිස ප්‍රීතියෙන් සතුටට පත්වූයෙමි. ඒ නිරාමිස ප්‍රීතියෙන් සතුටු - සොමිනස් වූ සිත් ඇත්තෙමි.

භාරද්වාජ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.3.10

"උපාසිතා සපුරිසා" යනු ආයුෂ්මත් කණ්හදින්න තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ දී කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස් කරගෙන අවුත්, මීට කල්ප අනූහතරකට පෙරදී සිටුගෙයක ඉපිද වැඩිවිය පත්වූහ. දිනක් සෝභිත නම් පසේ බුදුරජාණන් වහන්සේ දැක පැහැදුණු සිතින් දොඹ මලින් පූජා පැවැත් වූ ඒ සිටුකුමරු ඒ පින්කමේ විපාක ලෙස දෙවිමිනිස් දෙගතියේ සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ නුවර බමුණු පවුලක ඉපිද කණ්හදින්න නමින් ප්‍රකට විය. පෙර වාසනා මහිමයෙන් මෙහෙයවන ලද ඔහු වැඩිවියට පත් වූ කල්හි දම් සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ වෙත එළඹ, ධර්ම ශ්‍රවණය කිරීමෙන් ශ්‍රද්ධාව උපදවාගෙන සසුනේ පැවිදි විය. විදසුන් භාවනාව වැඩූ උන්වහන්සේ නොබෝ දිනකින්ම රහත් ඵලයෙහි පිහිටියහ. අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

"එකල්හි සෝභිත නම් බුදුරජාණන් වහන්සේ මෙසේ පැවසූහ. මම ගිරිපුන්නාග මලක් ගෙන බුදුරදුන් පිදුවෙමි. මීට කල්ප අනූ හතරකට පෙර යම් පුෂ්ප පූජාවක් කළෙමි ද මේ දක්වා ම මම දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දන් මම සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටුකළෙමි."

රහත් වූ කණ්හදින්න තෙරණුවෝ ඒ බව ප්‍රකාශ කරනු සඳහා මේ ගාථා දෙක වදාළහ.

"උපාසිතා සපුරිසා, සුතා ධම්මා අභිණ්හසෝ
සුත්වාන පටිපජ්ජිසං අඤ්ඤං අමතොගධං

භවරාගහතස්ස මෙ සතො භවරාගො පුන මෙ න විජ්ජති
නවාහු නව මෙ භවිස්සති නව මෙ එතර හිපි විජ්ජති''

එහි ''උපාසිතා'' ඇසුරු කරන ලදී. පිළිවෙත් පිරීම්, ඇසුරු කිරීම් ආදියෙන් (ආශ්‍රය කිරීම) පයුරු පාසනය කරන ලදී. ''**සප්පුරිසා**'' ශාන්ත වූ සීලාදි ගුණ මහිමයෙන් යුක්ත වූ සාරිපුත්‍රාදී ආර්ය පුද්ගලයෝ. සත්පුරුෂයෝය. මෙයින් තමන් වහන්සේගේ පූර්ව සම්පත්ති දෙක දක්වයි. සත්පුරුෂ ආශ්‍රය සුදුසු පෙදෙසක වාසය කිරීමෙන් තොරව නොලැබෙන්නේ ම ය. (සත්පුරුෂාශ්‍රය හා සුදුසු පෙදෙස විසීම යන පූර්ව සම්පත් ලැබීම මෙහිදී අදහස් වේ.) ''**සුතාධම්මා**'' චතුරාර්ය සත්‍යය, ප්‍රතීත්‍ය සමුත්පාදී ප්‍රතිසංයුක්ත ධර්ම ශ්‍රෝතද්වාරයෙන් සිතෙහි ධාරණය කරගත්තෙමි. මෙයින් තමන් වහන්සේගේ සද්ධර්ම ශ්‍රවණය හා බහුශ්‍රැතභාවය යන චක්‍රසම්පත් දෙක සිද්ධ වූ බව දක්වයි. ''අභිණ්හසො'' නිතර ම, බොහෝ වශයෙන්, කලින් කලට නොවේ. මේ පදය ''සත්පුරුෂයෝ නිතරම ඇසුරු කළෙමි'' යනුවෙන් ද ''නිතරම ධර්මය ඇසුවෙමි'' යනුවෙන් ද යෙදිය යුතුයි. ''**සුචාන පටිපජ්ජිස්සං අඤ්ඤං අමතොගධං**'' ඒ ධර්මය අසා, එහි කියැවෙන රූප, අරූප ධර්මයන්හි ලක්‍ෂණ වශයෙන් ගෙන අනුක්‍රමයෙන් විදසුන් භාවනාව වඩා නිවණට පැමිණියෙමි. නිවණෙහි පිහිටියෙමි. නිවණට පැමිණෙන මාර්ගය වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කළෙමි. ''**භවරාගහතස්ස මෙ සතො**'' භව රාගයෙන්, භව තණ්හාවෙන් අනාදිමත් කාලයක් සසර මම නැසුනෙමි. උපද්‍රවයට පත්වීමි. ඊට හේතු වූ භවරාගය මවිසින් දුන් ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් නැසුවෙමි. ''**භවරාගො පුන මෙන විජ්ජති**'' එනිසාම නැවත භවරාගය මගේ සිතේ නූපදී. නැවත භවරාගය ඇති නොවේ. ''**න චාහු න මෙ භවිස්සති න ච මෙ එතරහි විජ්ජති.**'' ඉදින් පෙර පුනුදුන් කාලයේ මට භව රාගය විය. ආර්ය මාර්ගයේ අවබෝධයත් (රහත්වීම) සමඟ ම එය නැති විය. අනාගතයේ ද මට භවරාගය ඇති නොවන්නේ ය. දැන් ද භවරාගය මා තුල විද්‍යමාන නොවේම ය. එය ප්‍රහීණ කරන ලද්දෙමි. මෙහි භවරාග යන වචනයෙන් ඒ හා සමඟම යෙදෙන මානාදී සංයෝජන ද ප්‍රහීන කරන ලද බව පැවසේ. සියලුම ආකාරයෙන් දස සංයෝජන ධර්මයෝම ක්‍ෂය කරන ලද බව මෙහිදී දැක් වේ.

කණ්හදින්න තෙරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

තෙවන වර්ගයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

2.4.1

''යතො අහං පබ්බජිතො'' යනු ආයුෂ්මත් **මිගසිර** තෙරුන් වහන්සේගේ ගාථාවයි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී පින් දහම් රැස්කරමින් අවුත් **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී බමුණු කුලයෙහි ඉපදුණහ. වැඩිවියට පත් බ්‍රාහ්මණ තෙම දිනක් ශාස්තෘන් වහන්සේ දැක, පහන් සිතින් ලහබත් අටක් දුන්නේ ය. ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාදයේදී කොසොල් රට බමුණු පවුලක පිළිසිඳ ගෙන මිගසිර (මුවසිරස) නැකතින් උපන් බැවින් **මිගසර** නමින් ප්‍රකට විය. තුරුණුවියට පත්වත්ම සියලු බ්‍රාහ්මණ විද්‍යාශිල්පයන්හි පරතෙරට ගිය ඔහු, මිනීඔළු මන්ත්‍රය නම් වූ ශික්ෂාව වෙසෙසින් ප්‍රගුණ කර මීට වසර තුනකට පෙර මැරුණු පුද්ගලයන්ගේ වුවත් හිසට නියපිටින් තට්ටුකර ''මෙතෙම අසුවල් තැන ඉපදුණේය''යි දැනගැනීමට සමත් විය. ගිහි ගේ විසීමට නොකැමති වූ මිගසර බමුණා පිරිවැජි අරමක පැවිදිව මේ ශිල්පය නිසා ජනයාගේ සත්කාර සම්මාන ලබමින් වාසය කළේය. දිනක් සැවැත් නුවරට පැමිණි ශාස්තෘන් වහන්සේ හමුවට ගොස් සිය ආනුභාවය ප්‍රකාශ කරමින් ''පින්වත් ගෞතමය! මම මළවුන් උපන් තැන දන්නෙමි''යි පැවසීය. එවිට බුදුරජාණන් වහන්සේ, ''නුඹ කෙසේ දැනගන්නෙහිද?''යි ඔහුගෙන් ඇසූ සේක. ''මම මිනී හිස් ගෙන, මන්ත්‍රය පිරිවහා නියෙන් හිසට තට්ටුකරන විට නිරයේ පටන් ඔවුනොවුන් උපන් තැන දැනගන්නෙමි''යි බමුණු පිරිවැජි තෙම පිළිතුරු දුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිරිනිවියාවූ රහතන් වහන්සේ නමකගේ හිස් කබලක් ගෙන්වාගෙන, ''මොනු උපන් තැන කියන්න''යි වදාරා හිස බමුණාට දුන් සේක. ඔහු ඒ හිස් කබල ගෙන මන්ත්‍ර පිරිවහා නියෙන් හිසට තට්ටුකළත් අන්තයක්, කෙළවරක්, උපන් තැනක් නොපෙණුණි. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ''පිරිවැජිය! නොහැකි ද?''යි විමසූ විට ''යළිත් උත්සාහ කර බලමි''යි නැවත නැවත උත්සාහ කළත් උපන් තැනක් නොපෙනෙන්නේම ය. බාහිර වූ මන්ත්‍ර බලින් රහතන් වහන්සේගේ ගතිය කෙසේ දැන ගන්නේද? එවිට පිරිවැජියාගේ හිසින් ද කිසිලිවලින් ද දහඩිය නිකුත් විය. ඔහු ලැජ්ජාවට පත්ව නිශ්ශබ්දව සිටියේය. එවිට ශාස්තෘන් වහන්සේ ''පිරිවැජිය! වෙහෙසට පත්වූවෙහි ද?''යි විමසූහ. හෙතෙම ''එසේය. වෙහෙසට පත්වීමි. මම මොනු උපන් තැන නොදනිමි''යි පවසා ''නුඹවහන්සේ එය දනිහිද?''යි බුදුරදුන්ගෙන් විමසීය. එවිට භාග්‍යවතුන් වහන්සේ, ''මම එය දනිමි. ඊට වැඩි වූවක් ද දනිමි''යි වදාරා ''ඔහු නිවණට ගියේය''යි පැවසූ සේක. එය ඇසූ පිරිවැජියා,

''මේ ශිල්පය මට දෙන්න''යි ඉල්වීය. එසේ නම් බුදුසසුනේ පැවිදි වන්න යැයි වදාරා ඔහු පැවිදි කරවූ තථාගතයන් වහන්සේ පළමුව සමථ කමටහන් දී ධ්‍යානාභිඤ්ඤා උපදවා ගත් පසුව විදර්ශනා කමටහන් ලබා දුන් සේක. විදසුන් කමටහන වැඩූ මිගසර තෙරණුවෝ නොබෝ දිනකින් ම රහත් වූහ.

අපදාන පාළියේ උන්වහන්සේ මෙසේ පැවසූහ.

''වැස නිම වූ බඹසර ඇති බ්‍රාහ්මණ වංශයෙහි උපන් කාශ්‍යප බුදුරජාණන් වහන්සේට පහන් සිත් ඇති මම සතුටින් ලහබත් අටක් දුන්නෙමි. මේ මහා භද්‍ර කල්පයෙහි ම ලහබත් අටක් දුන් පිනින් මේ දක්වා දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කළෙමි.''

රහත් වූ උන්වහන්සේ ඒ බව ප්‍රකාශ කරමින් මේ ගාථාවන් වදාළහ.

''යතො අහං පබ්බජිතො සම්මා සම්බුද්ධස්ස සාසනෙ
විමුච්චමානො උගඝඤ්ච කාමධාතුං උපච්චගං''

බ්‍රහ්මුනො පෙක්ඛමානස්ස තතො චිත්තං විමුච්චි මෙ
අකුප්පා මෙ විමුත්ති නි සබ්බසංයොජනක්ඛයා''

එහි ''යතො අහං පබ්බජිතො සම්මා සම්බුද්ධ සාසනෙ'' යම් තැනක පටන් මම සම්බුදු සසුනෙහි පැවිදිවූයෙමි ද එතැන් පටන්. ''**විමුච්චමානො උගඝඤ්ච**'' කෙලෙස් සහිත බැවින් පළමුව සමථ විදර්ශනා භාවනා වැඩීමෙන් ඉන් නිදහස් වූයෙමි. ධර්ම ශ්‍රවණයෙන් කෙලෙසුන් කෙරෙන් පිරිසිදුවූයෙමි. මෙසේ නැගී සිටින්නෙම් කාමධාතුව ඉක්මවා ගියෙමි. අනාගාමී මාර්ගයෙන් අතිශයින්ම කාමධාතුව ඉක්මවූයෙමි. ''**බ්‍රහ්මුනො පෙක්ඛමානස්ස තතො චිත්තං විමුච්චි මෙ**'' සදෙව් ලොවටම අග්‍ර වූ බැවින් ශ්‍රේෂ්ඨ වූ බැවින් ''බ්‍රහ්මුනො'' නම් වූ බුදුරජාණන් වහන්සේ මහා කරුණාවට සමවැදී ''මේ කුල පුතු මගේ සසුනෙහි පැවිදි වී කෙසේ ජීවත්වෙන්නේද?'යි බලන සේක්; මගේ සිත ඒ අනාගාමී මාර්ගාවබෝධයෙන් හා පසුව ආර්ය මාර්ගාවබෝධයෙන් සියලු කෙලෙසුන්ගෙන් අතිශයින් ම (වඩාත් ම) මිදුනේය. **අකුප්පා මෙ විමුත්ති නි සබ්බසඤ්ඤොජනක්ඛයා**'' එසේම මිදුණු සිත් ඇති බැවින්, සියලුම සංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් ලබාගත් ''මාගේ විමුක්තිය අකෝප්‍යය''ස්ථිරමය'' යනුවෙන් රහත් බව ප්‍රකාශ කළ සේක.

මිගසිර තේරගාථා අර්ථ විවරණාව නිමියේය.

2.4.2

"අනිච්චානි ගහකානි" යනු ආයුෂ්මත් සීවක තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි දී ඒ ඒ භවයන්හි ඉපිද පින් රැස් කරමින් අවුත්, විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක උපන්හ. තුරුණුවිය පැමිණි සිටුකුමරු දිනක් පිඬු පිණිස හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතින් පාත්‍රය රැගෙන පිටිටුවලින් පුරවා පිළිගැන්වීය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි ඔහු; මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර බමුණු පවුලක ඉපිද සීවක නමින් ප්‍රකට විය. නිසිවියට පත්ව සියලු විද්‍යා ශිල්පයන්හි පරතෙරට ගිය සීවක ගිහි ගෙය හැර දමා පිරිවැජි අරමක පැවිදි විය. දිනක් ශාස්තෘන් වහන්සේ වෙත පැමිණි ධර්ම ශ්‍රවණය කළ ඔහු, ශ්‍රද්ධාවෙන් බුදුසසුනේ පැවිදි විය. විදසුන් කමටහනෙහි සිත පිහිටුවා නොබෝ දිනකින්ම රහත් ඵලයෙහි පිහිටි සීවක තෙරණුවෝ අපදාන පාළියෙහි මෙසේ වදාරා ඇත.

"පිඬු සිඟා හැසිරෙන විපස්සි බුදුරජාණන් වහන්සේගේ සිස් වූ පාත්‍රය දුටු මම එය පිටිටුවලින් පුරවා පූජා කළෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර යම් පිටිටු දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් එතැන් සිට මේ දක්වා ම දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

රහත් බවට පත්ව ඒ බව ප්‍රකාශ කිරීම සඳහා සීවක තෙරණුවෝ මේ ගාථා දෙක වදාළහ.

"අනිච්චානි ගහකානි තසා තසා පුනපපුනං
ගහකාරකං ගවෙසනෙතා දුක්ඛා ජාති පුනපපුනං"

"ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසී
සබ්බා තෙ ඵාසුකා භග්ගා ථූණිකා ච විදාළිතා
විපරියාදිකතං චිත්තං ඉධෙව විධම්සසති" ති.

එහි "අනිච්චානි ගහකානි තසා තසා පුනපපුනං" ඒ ඒ භවයෙහි නැවත නැවත උපදවන්නා වූ ගෙවල් නම් ආත්මභාව (ශරීර) අනිත්‍ය වේ. ස්ථිරව නොපවතියි. සුලු කාලයක් පවතියි. "ගහකාරකං ගවෙසනෙතා"

මේ ආත්මභාව නම් ගෙය සාදන තණ්හාව නම් වඩුවා සොයමින් මෙපමණ කාලයක් හැසිරුණෙමි. ''**දුක්ඛා ජාති පුනප්පුනං**'' නැවත නැවත ඉපදීම දුකකි'' යනුවෙන් ගෙය සාදන්නා සෙවීමට හේතුව දක්වයි. මේ ජරාව, ව්‍යාධිය, මරණය යන තුනින් යුක්ත ජාතිය (ඉපදීම), නැවත නැවත සිදුවීම දුකකි. මේ දුක නොදුටු කල්හි එය නොනවතියි. එනිසා ඒ දුකට හේතුව සෙවූවෙමි.

''**ගහකාරක දිට්ඨොසි**'' දැන යමකින් ජාතියට හේතුව සෙවූයෙම් ද ඒ ආර්යමාර්ග ඥාණයෙන් ආත්මභාව නම් ගෙය සාදන වඩුවා දුටුවෙමි. ''පුනගෙහං'' නැවත මේ සසරෙහි ආත්මභාව නම් වූ ගෙය නොසාදන්නෙහි. ''**සබ්බා තෙ ඵාසුකා භග්ගා**'' නුඹගේ සියලු කෙලෙස් නම් පරාල (ගෙය සාදන) මවිසින් සිඳ දමන ලදී. ''**ථූණිකා ච පදාළිතා**'' දැන් නුඹ සාදන ආත්මභාව නම් ගෙදර අවිද්‍යාව නම් වූ කැණිමඩල ද බිඳින ලදී. ''**විපරියාදිකතං චිත්තං**'' යනු මගේ සිත ඉවත්වූවක් කරන ලදී. නැවත අනාගතයේ නූපදින බවට පමුණුවන ලදී. එය එසේමය. ''**ඉධෙව විධමිස්සති**'', ''මේ භවයේදී ම විද්වංසනය කරන ලදී. අවසන් චුති සිත නිරුද්ධ වීමත් සමඟ නිවීමට පත්වන්නෙමි'' යන අර්ථයයි.

සීවක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.3

''අරහං සුගතො'' යනු ආයුෂ්මත් **උපවාන** තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී දිළිඳු කුලයක ඉපිද තුරුණුවියට පැමිණියහ. එම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ධාතුගෙන මිනිස්, දෙවි, නා, ගරුඬ, යක්ෂ, කුම්භාණ්ඩ හා ගාන්ධර්වයන් විසින් සත් රුවන්මය සත් යොදුනක් පමණ වූ ස්තූපයක් සාදවන ලදී. එකල්හි එතැනට පැමිණි දිළිඳු පුද්ගලයා තම ඉතා පිරිසිදු වූ උතුරු සළුව ගෙන උණ ගසක කොඩියක් සේ බැඳ චෛත්‍යයට පූජා කළේය. දෙවියන් විසින් සෑයේ පූජාවන් ආරක්ෂා කිරීමට යෙදූ වූ **අභිසම්මතක** නම් යක්ෂයා නොපෙනෙන කයක් ඇතිව, එම කොඩිය ගෙන අහසේ සිටිමින් තෙවරක්ම සෑය ප්‍රදක්ෂිණා කළේය. මෙය දුටු දිළිඳු මිනිසා අතිශයින් සතුටු විය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්

මිනිසුන් අතර සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර බමුණු කුලයක ඉපිද "උපවාන" නමින් ප්‍රකටව තුරුණුවියට පැමිණියේය. ජේතවනාරාමය පිළිගන්නා දින අසිරිමත් බුදු සිරි දුටු උපවාන බමුණා පැහැදී ශ්‍රද්ධාවෙන් බුදුසසුනේ පැවිදි විය. විදසුන් කමටහනට සිත් යොමුකළ උපවාන තෙරණුවෝ නොබෝ දිනකින් ම ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් බවට පත්වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

"සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය, පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ගිනිකඳක් මෙන් බබළමින් පිරිනිවන් පෑ සේක. මහජනයා එක් රැස්ව තථාගතයන් වහන්සේ පූදා මැනවින් සෑයක් කරවා සර්වඥ දේහය එහි නැංවූහ. එහි ශරීරය ආදාහනය කොට ධාතු ගෙනවුත්, ඒ සියලු දිව්‍ය මනුෂ්‍යාදීහු බුද්ධ ස්තූපයක් සෑහූහ. ඒ උතුම් සෑයෙහි පළමු නිම් වලල්ල රන්මය වේ. දෙවැන්න මිණිමය වේ. තෙවැන්න රිදීමුවා ය. සිවුවැන්න පළිඟු මුවාය. පස්වන නිම්වළල්ල පද්මරාග මාණික්‍යමය වේ. සයවැන්න මැසිරිගල්මය වේ. වේදිකාව රන්මුවා වේ. සෑය සියලුම රත්නයන්ගෙන් කරන ලදුව යොදුනක් උස විය. එවිට දෙවියෝ සාකච්ඡා කළහ. "තාදී ගුණ ඇති සර්වඥයන් වහන්සේට අප ිද සෑයක් කරමු. උන්වහන්සේගේ ධාතු වෙන් නොවූහ. මුළු සිරුරම එකට කැටිව තිබේ. එනිසා අපි මේ සෑයටම කඤ්චුකයක් කරමු." මෙසේ සාකච්ඡා කළ දෙවියෝ සත් රුවනින් යොදුනක් උස සෑයක් ඒ මත්තෙහි කරවූහ. මෙසේ යොදුන් දෙකක් උස වූ සෑයෙන් අඳුර ද දුරුකරන ආලෝකයක් නිකුත් විය.

නාගයෝ ද රැස්වී සාකච්ඡා කළහ. "මිනිස්සු ද දෙවියෝ ද බුදුරජාණන් වහස්සේට සෑ කරවූහ. අපි ද පමා නොවෙමු. දෙවියන් සහිත ලෝ වැස්සා ද පමා නොවෙති. තාදී ගුණ ඇති ලෝක නාථයන් වහන්සේට අපි ද සෑයක් කරවන්නෙමු." මෙසේ කථා කළ නාගයෝ ඉහැනීල, මහානීල හා ජෝතිරස යන මාණික්‍යයන්ගෙන් යොදුනක් උස කඤ්චුක සෑයක් කරවූහ. එවිට සියල්ල මැණිකෙන් කළ බැවින් ආලෝකය විහිදුවන එම සෑය යොදුන් තුනක් උස විය. ගුරුළෝ ද රැස්ව "මනුෂ්‍ය-දිව්‍ය-නාග සමූහයා නොපමාව සෑ කරවූහ. අපි ද අප්‍රමාදීව සෑයක් කරවමු"යි සාකච්ඡා කළහ. ගුරුළෝ ද ස්වර්ණමය වූ කඤ්චුකයක් කරමින් සෑයෙහි උස යොදුන් සතරක් කළහ. සිවුයොදුන් වූ එම සෑය උඩට නැගුණු සූර්යයා මෙන් සියලු දිශාවන් ආලෝක කරයි. එකල්හි කුම්භාණ්ඩයෝ ද එලෙසින්ම එක්ව

සාකච්ඡා කළහ. ''දිව්‍ය-මනුෂ්‍ය-නාග-ගුරුළාදීහු වෙන වෙනම බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට උතුම් සෑ කළහ. අපි ද අප්‍රමාදී වෙමු. දෙවියන් සහිත ලෝ වැසියා ද පමා නොවෙති. තාදී ගුණැති බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට අපි ද සෑයක් කරමු. උස් වූ බුද්ධස්තූපය අපි ද රත්නයන්ගෙන් වසමු.'' මෙසේ කථා කළ ඔවුහු උතුම් බුද්ධ ස්තූපයේ පස්යොදුනක් කළහ. පස්යොදුන් එම සෑය අතිශයින් බබලයි.

මෙලෙසින්ම සාකච්ඡා කළ යක්ෂයෝ ඒ උතුම් බුද්ධ ස්තූපය සය යොදුනක් උස්වන සේ තැනූහ. ගාන්ධර්වයෝ ද එසේම සාකච්ඡා කොට, වේදිකා සතක් කරවා මතුයෙහි ඡත්‍රයක් ද නැංවූහ. ගාන්ධර්වයෝ එම සෑය සර්ව ස්වර්ණමය (මුලුමනින්ම රත්තරනින් වැසූහ) කළහ. එකල රෑ දාවල් වෙනස නොපෙනෙන සේ සත් යොදුන් සෑය බබලයි. තරු සහිත සඳ හිරු දෙදෙන ද ඒ චෛත්‍යයේ ශෝභාව මැඩලීමට නොහැකි වේ. හාත්පස යොදුන් සීයක් පමණ තැන්හි පහනකුදු නොදැල්වුණි. එකල යම් මනුෂ්‍යයෙක් සෑයට කිසිවක් පූජා කරයි නම් ඒ මතට නොනැඟ, එම පූජාව අහසෙහි දමයි. සෑයෙහි ආරක්ෂාවට දෙවියන් විසින් යෙදවූ අභිසම්මත යක්ෂ සෙන්පති එසේ දමූ වස්තුය හෝ මල්දම රැගෙන සෑ මුදුනෙහි තබයි. එම යක්ෂයා නොපෙනේ. ඔහු ගෙන යන පූජාව පමණක් දකින සැදැහැවත්හු සිත පහදවා දෙව් ලොව ඉපිදෙති.

ත්‍රිපිටක සද්ධර්මයෙහි සැදැහැ නැත්තෝ ද සසුනෙහි පහන් සිත් ඇත්තෝ ද යන සියලු මිනිස්සු ප්‍රාතිහාර්ය දකිනු කැමැත්තෙන් ස්තූපය මල්දමින් පුදති. මම එදවස හංසවතී නුවර මෙහෙකරුවෙක් වූයෙමි. සතුටු සිතැති මම එසේ සෑ පූජාවෙහි නිරත ජනයා දැක මෙසේ සිතුවෙමි.

''මේ පුදලබන බුද්ධ ස්තූපයෙහි ධාතු අයත් ඒ භාග්‍යවතුන් වහන්සේ ඉතා උදාර අයෙක් වෙති. මේ ජන සමූහයා සතුටින් ඊට පූජා කරති. මම ද තාදී ගුණැති ලෝකනාථයන් වහන්සේට පූජාවක් කරන්නෙමි. අනාගතයේ උන්වහන්සේගේ ධර්මයෙහි කොටස්කරුවෙක් වන්නෙමි'' මෙසේ සිතූ මම රජකයකු විසින් මැනවින් සෝදා පිරිසිදු කළ මාගේ උතුරු සලුව උණ දඬුවක අග එල්ලා ධ්වජයක් කොට අහසේ ඔසවා තැබුවේය. අභිසම්මත යක්ෂයා මගේ ධජය ගෙන අහසෙහි එල්ලා තැබීය. සුලඟින් සෙලවෙන ධජය දුටු මම බොහෝ සේ සතුටු වූයෙමි. එහි සිත පහදවා ගත් මම භික්ෂූන්ට වැඳ ධජ දානයේ ආනිසංස ඇසූවෙමි.

එක් භික්ෂුවක් මහත් ප්‍රීතියෙන් කරන ලද මාගේ පූජාව බලා ''නුඹ සසර සැම කල්හිම ධජ දානයේ විපාක විඳින්නෙහිය. ඇත්, අස්, රිය, පාබල යන සිවුරඟ සේනාවෝ නිතර ඔබ පිරිවරා සිටිති. සැට දහසක් තූර්යයෝ ද මනාව අලංකාර කළ බෙර ද නිතර ඔබ පිරිවරා සිටිති. සැරසුණු අසූ දහසක් ස්ත්‍රීහු විසිතුරු අබරණ පැළඳ. මිණිකොඩොල් ඇතිව දිගු ඇසිපිය ඇතිව ඉතා මොළොක් ශරීරාවයව ඇතිව, සිහිනිඟ සහිත වූවාහු නිතර නුඹ පිරිවරා සිටිති. කල්ප තිස් දහසක් පුරා දෙව්ලොව වෙසෙන නුඹ අසූවරක් ශක්‍ර දේවේන්ද්‍රව උපදියි. දහස් වරක් සක්විති රජ වන්නේය. නුඹ ලබන මහත් වූ ප්‍රදේශ රාජ්‍ය සම්පත් ගිණිය නොහැක. මේ ධජ දානයේ විපාකයයි. මෙයින් කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. මේ කුශල මූලයෙන් මෙහෙයූ නුඹ දෙව්ලොවින් චුතව බ්‍රාහ්මණයෙක් ව, අසූ කෙළක් ධනය ද දැසි කම්කරුවන් ද හැරදමා ගෞතම බුදුසසුනෙහි පැවිදි වන්නෙහි ය. ශාක්‍ය කුල ජ්‍යෙෂ්ඨ වූ ගෞතම බුදුනු සතුටු කරන නුඹ උපවාන නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නෙහි ය.''

මෙසේ කල්ප ලක්ෂයකට පෙර මවිසින් කරන ලද කුසල කර්මය මට විපාක දුන්නේය. මැනවින් මිදුණු හීයක වේගය මෙන් මගේ කෙලෙස් දවන ලදී. සිවු මහා දිවයිනට අධිපති වූ සක්විති රජ වූ මා හට හැම කල්හි හාත්පස යොදුන් තුනක් ධජ ඔසවති. එදා සිට මේ දක්වා එම කුශල කර්මයේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ධජ දානයේ විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූවෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

ඉක්බිති ආයුෂ්මත් උපවාන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයෙක් වූහ. එ සමයේ භාග්‍යවතුන් වහන්සේට වාතාබාධයක් උපන්නේය. තෙරුන්ගේ ගිහිකල යහලු වූ දේවහිත නම් බමුණෙක් සැවැත් නුවර වසයි. ඔහු තෙරුන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කරයි. රෝගය හටගත් කල්හි උපවාන හිමියෝ පාසිවුරු ගෙන ඒ බමුණාගේ ගෙදරට වැඩියහ. බමුණා ''තෙරුන් වහන්සේ කිසියම් ප්‍රයෝජනයක් සඳහා වැඩම කරන ලද''යි දැන; ''ස්වාමීනි! වැඩම කරන ලද්දේ කුමක් නිසාද?''යි ඇසීය. තෙරණුවෝ තමා පැමිණි කරුණ දක්වමින් මේ ගාථා දෙක වදාළහ.

''අරහං සුගතො ලොකෙ වාතෙහාබාධිකො මුනී
සචෙ උණ්හොදකං අත්ථි, මුනිනො දෙහි බ්‍රාහ්මණ

පූජිතො පූජනියානං සකකරෙය්‍යාන සකකතො
අපචිතො අපචනියානං තසස ඉචඡාමි භාතවෙ'' ති.

එහි අර්ථ මෙසේ ය. ''යමෙක් මේ ලෝකයෙහි පිදිය යුත්තන් විසින්, ශක්‍ර දේව බ්‍රහ්මාදීන් විසින් පූදන ලද්දාහු ද, සත්කාර ලබන්නාහු බිම්බිසාර කෝසල ආදීන් විසින් සත්කාර කරන ලද්දාහු ද, වැඳිය යුතු වූ ක්ෂීණාසුව රහතන් වහන්සේලා විසින් වඳින ලද්දාහු ද කෙලෙස් දුරලූ ''අරහං'' නම් වූ ද, සෝභන වූ ගමන් ඇති හෙයින් සුගත නම් වූ ද ඒ සර්වඥයන් වහන්සේ මාගේ ශාස්තෘවරයා වෙති. දෙවියන්ට දෙවි වූ ශක්‍රයනට ශ්‍රක වූ බ්‍රහ්මයන්ට බ්‍රහ්ම වූ උන්වහන්සේ දන් වාතය නිසා, වාතය කිපීමෙන් වූ ආබාධයකින් පෙළෙන සේක. ඉදින් බමුණ! උණුදිය වේ නම්; ඒ ආබාධය සන්සිඳවීමට, නැසීමට උණුදිය ගෙනයනු කැමැත්තෙමි.'' එය ඇසූ බමුණා උණුදිය ද ඒ වාතාබාධයට යෝග්‍ය බෙහෙත් ද්‍රව්‍යය ද රැගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වීය. එයින්ම ශාස්තෘන් වහන්සේගේ රෝගය සන්සිඳුණි. භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණාට පුණ්‍යානුමෝදනාවක් සිදු කළ සේක.

උපවාන තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.4

''දිට්ඨා මයා'' යනු ආයුෂ්මත් **ඉසිදින්න** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේදී ඒ ඒ භවයේදී පින්දහම් සිදුකරමින් අවුත්, **විපස්සි** භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද නිසිවියට පත් වූහ. දිනක් ඔහු විජිනිපතක් (වටා පතක්) ගෙන බෝධියට පූජා කළේය. ඒ පින්කමේ විපාක ලෙස දෙව්ලොව උපන් හෙතෙම; කාම සුගතීන්හි සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී සුනාපරන්ත ජනපදයේ සිටුගෙයක ඉපිද ''ඉසිදින්න'' නමින් ප්‍රකට විය. තුරුණුවියට පත් වූ ඔහු ශාස්තෘන් වහන්සේ සඳුන් මල් පිළිගත් අවස්ථාවෙහි වූ පෙළහර දැක පැහැදීමෙන්, උන්වහන්සේ වෙත පැමිණ ධර්මශ්‍රවණය කළේය. දේශනාව අවසන් හි ඉසිදින්න සෝවාන් විය. ගිහිගෙයි වසන ඔහුගේ දියුණුව කැමති දෙවියෙක් මේ ගාථා දෙකින් ඔහුට චෝදනා කළේය.

''දිට්ඨා මයා ධම්මධරා උපාසකා
කාමා අනිච්චා ඉති භාසමානා

සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච තෙ අපෙක්ඛා

අදධා න ජානන්ති යථාව ධම්මං
කාමා අනිච්චා ඉති චාපි ආහු

රාගංච තෙසං න බලවතී ඡෙත්තුං
තස්මා සිතා පුත්තදාරං ධනඤ්චා'' ති.

මෙහි ''දිට්ඨා මයා ධම්මධරා උපාසකා කාමා අනිච්චා ඉති භාසමානා'' මේ බුදු සසුනෙහි ඇතැම් පර්යාප්ති ධර්මය දරාගත් උපාසකයෝ මවිසින් දක්නා ලදහ. පර්යාප්තිය දරණ බැවින් ම ඔවුහු; ''කාමය නම් අනිත්‍ය වූවකි. දුක් ගෙන දෙන්නකි. වෙනස්වන ස්වභාව ඇත්තකි'' යනුවෙන් කාමයන්හි ආදීනව දක්වෙන (ප්‍රතිසංයුක්ත) ධර්මය පවසති. දෙසති. නමුත් තමා ම මිණිකොඩොල් ආභරණ වල ද අඹු දරුවන් කෙරෙහි ද විශේෂයෙන් ඇලී අපේක්ෂා සහිතව සිටිති. බහුල වූ රාගයෙන් යුක්තව මාණික්‍යමය වූ මිණිකොඩොල් ආදී ආභරණ කෙරෙහි ද අඹුදරුවන් කෙරෙහි ද අධික ප්‍රේමයෙන්-සෙනෙහසින් ඇලී ගැලී අනිකක් කරති. අනිකක් කියති. මෙබඳු උපාසකවරු මවිසින් දක්නා ලදී. ''යතො'' ඒ උපාසකවරු මිණිකොඩොල් ආභරණයන්හි සහ අඹුදරුවන් කෙරෙහි අපේක්ෂා සහගත වන බැවින් මේ බුදුසසුන තත්ත්වාකාරයෙන්, ඒකාන්තයෙන් අවබෝධ කර නොගනිති. එනමුත් ''කාමයෝ අනිත්‍යයහ'' යනාදී ලෙස පවසති. ''ස්වභාවයෙන්ම ඇලුණා වූ චිත්ත ස්වභාවයෙන් යුතු වෙති'' යන අදහසයි. ''**රාගඤ්චතෙසං න බලවතී ඡෙත්තුං**'' ඒ උපාසකවරුන්ට රාගය සිඳ දැමීමට සමත් වූ ඥාන බලයක් නැත. එනිසා ඔවුහු තණ්හාවෙන් ඇලී-ගැලී, බදාගෙන අඹුදරුවන් ද ධනය ද අත්නොහරිති. මේ සියල්ල ඒ දෙවියා විසින් අන්‍යාකාරයකින් ඒ උපාසකයා සඳහාම පවසන ලදී. මෙම වදන් ඇසූ ඉසිදින්න, සංවේග උපදවාගෙන සසුනේ පැවිදි වී නොබෝ දිනකින්ම රහත් විය.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''ඒ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධත්වය සඳහා මහෝපකාරී වූ උතුම් බෝධියට සතුටු සිතින් වටාපතක් ගෙන මම පූජා කළෙමි. මීට කල්ප අනූ එකකට පෙර එසේ උතුම් බෝධිය පිදුවෙමි ද එතැන් පටන් මම දුගතියක නූපන්නෙමි. දැන් මවිසින් කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මෙසේ රහත්බවට පත්වූ ඉසිදින්න තෙරණුවෝ සිය අර්හත්ඵල ප්‍රකාශ කිරීම සඳහා එසේ දෙවියා විසින් පැවසූ ගාථාම නැවත වදාළහ.

ඉසිදින්න ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.5

''දෙවො වා'' යනු ආයුෂ්මත් **සම්බුල කච්චායන** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒඒ භවයන්හිදී පින් රැස් කරමින් අවුත්, මීට කල්ප අනූ හතරකට පෙර දී සිටුගෙයක උපන්හ. නුවණැති බවට පත්වූ ඔහු දිනක් **සතරංසි** නම් පසේ බුදුරජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගී සිට, පිඬු පිණිස හැසිරෙනු දුටුවේය. දැක තල්ගෙඩියක් උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි සැරි සැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී මගධ රට ගහපති කුලයක ඉපිද සම්බුල යන නම ලැබීය. කච්චායන ගෝත්‍රයේ වූ බැවින් සම්බුලකච්චායන යැයි ඔහු ප්‍රකට විය. වැඩිවියට පත්ව ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළ සම්බුල කච්චායන තෙමේ ශ්‍රද්ධාවෙන් පැවිදිව හිමවත සමීපයේ හේරව නම් පර්වත ගුහාවෙහි වසමින් විදසුන් කමටහන වැඩුවේය. එක් දිනක් මහත් වූ අකාල මේඝයක් සිය දහස් වර ගුගුරමින්, ගර්ජනා කරමින් විදුලිය ගසමින් ගඩ ගඩ හඬින් පහළට වසින්නට පටන් ගත්තේය. හෙන පිපිරුවේය. ඒ ශබ්දය ඇසූ දිවි, වලස්, වන මී, ඇත් ආදී සත්තු බියපත්ව මහ හඬින් ශබ්ද කළහ. තෙරුන් වහන්සේ අරඹන ලද විදසුන් භාවනා ඇතිව කයේත් සිතේත් අපේක්ෂාවක් නොමැති හෙයින් දුරු වූ ලොමුඩැහැ ගැනීම් ඇති වූහ. වැස්ස පිළිබඳ නොකැමතිව විදසුනෙහි සිත පිහිටුවා ගත් උන්වහන්සේගේ ශරීරය ග්‍රීෂ්මය දුරු වී යෝග්‍ය සෘතු ලැබීමෙන් සංයම

විය. සන්සුන් වූ සිත එකෙණෙහිම විදසුනට නංවා ෂඩ් අභිඥා සහිතව රහත් ඵලයෙහි පිහිටියේය.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

"තමන් වහන්සේ විසින් සත්‍යාවබෝධ කරගත් අපරාජික වූ සතරංසි නම් පසේ බුදුරජාණන් වහන්සේ සමවතින් නැගිට පිඬු පිණිස හැසිරුණු සේක. තල් ගෙඩි අතේ තබාගෙන සිටි මම ඒ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ දැක, සම්පයට ගියෙමි. මම පැහැදුණු සිතින් තල් ගෙඩියක් පූජා කළෙමි. මීට කල්ප අනූ හතරකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳු ය. දැන් මම කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

මෙසේ රහත් බවට පත් වූ උන්වහන්සේ තම පිළිවෙත සිහිපත් කර බලා සතුටට පත් වූසේක්, ප්‍රීතිය පහළ කරමින් සිය රහත් බව මෙම ගාථා දෙකෙන් වදාළහ.

"දෙවො ච වස්සති දෙවො ච ගළගළා යති
එකකොවාහං හෙරවෙ බිලෙ විහරාමි

තස්ස මයාහං එකකස්ස හෙරවෙ බිලෙ විහරතො
නත්ථි භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා"

"ධම්මතා මමෙසා යස්ස මෙ
එකකස්ස හෙරවෙ බිලෙ විහරතො
නත්ථි භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා"

මෙහි "**දෙවො ච වස්සති දෙවො ච ගළගළා යති**" යනු වර්ෂාව, මේඝය වසියි. ගළ ගළ හඬින් ගලා යයි. ඒ ගර්ජනාවෙහි අනුකරණය දැක්වීමයි. "**එකකොවාහං හෙරවෙ බිලෙ විහරාමි**" මම ද හුදකලාව, තනිව, බියක් නොමැතිව මේ පර්වත ගුහාවෙහි වසමි. මෙසේ වූ සිහිව ඇතිව වෙසෙන මා හට "**නත්ථි භයං වා ඡම්භි තත්තං වා ලොමහංසො වා**" සිතේ තැතිගැනීම, භයක් ආදියක් හෝ ඒ නිමිති කරගෙන ශරීරයේ තැති ගැනීමක්, ලොමු දහ ගැනීමක් හෝ නැත. "**තස්මා**" යනුවේ ඒ කාරණය - හේතුව දක්වයි. "ධම්මතා මමෙසා" මේ භය පිළිබඳ පිරිසිඳ නොදත් තැනැත්තාට

ප්‍රහීන නොවූ ඡන්ද රාග ඇති බැවින් භය විය යුතුයි. මම වනාහී සියලු අයුරින්ම භය පිරිසිඳ දත්තෙමි. එහි ඡන්දරාගය මුළුමනින්ම සිඳ දැමුවෙමි. භයවීම් ආදිය නොමැති හෙයින් ''මෙය මාගේ ධර්මතාවකි. මෙය මාගේ ධර්ම ස්වභාවයකි'' යනුවෙන් රහත් බව ප්‍රකාශ කරයි.

සම්බුල කච්චායන තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.6

''**කස්ස සෙලූපමං චිත්තං**'' යනු ආයුෂ්මත් **බිතක** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේ දී පින් කමින් අවුත් **විපස්සි** නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී බන්ධුමති නුවර ආරාම ආරක්ෂකයෙක් ව ජීවත් විය. එක් දිනක් ඔහු භාග්‍යවතුන් වහන්සේ අහසින් වඩිනු දැක පැහැදුණු සිතින් පොල් ගෙඩියක් පූජා කරනු කැමති විය. ශාස්තෘන්වහන්සේ ඔහුට අනුග්‍රහ පිණිස අහසෙහි වැඩ හිඳම එම පූජාව පිළිගත් සේක. එය දුටු ආරාම ආරක්ෂකයා මහත් වූ ප්‍රීති ප්‍රමෝදයට පැමිණියේය. ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියේ සැරි සැරූ හෙතෙම මේ බුද්ධෝත්පාදයේදී කොසොල් රට බමුණු පවුලක **බිතක** නමින් ඉපද වැඩිවියට පත්ව ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළේය. ඉන් ලබන ලද ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ ඔහු කමටහන් ගෙන ආරණ්‍යයට වැඩමවා උත්සාහ කර, නොබෝ දිනකින්ම රහත් ඵලය ලබා ගත්තේය.

අපදාන පාළියේ දී බිතක තෙරණුවෝ මෙසේ පැවසූහ.

''එකල මම බන්ධුමති නුවර ආරාමිකයෙක් වීමි. අහසෙහි වඩින කෙලෙස් රජස් විරහිත බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. මම නාළිකේර ඵලයක් (පොල් ගෙඩියක්) ගෙන උන්වහන්සේට පිදුවෙමි. මහත් යශස් ඇති බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ අහසේ වැඩහිඳ ම එය පිළිගත් සේක. මට ප්‍රීතිය උපදවන්නා වූ මෙලොවදී ම සුව ඵළවන්නා වූ ඵලය පහන් සිතින් බුදුරදුන්ට පූජා කළෙමි. ඉන් මහත් වූ ප්‍රීතියටද උතුම් සැපයටද පැමිණියෙමි. ඒ ඒ තැන උපන්නා වූ මා හට රුවන් පහළ වේ. මීට කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් මේ දක්වාම දුගතියක නූපන්නෙමි. ම විසින් දැන් දිවැස පිරිසිදු කරන ලදී. මම සමාධියට සම වැදීමෙහි දක්ෂ වෙමි. ෂඩ් අභිඥාවන් හි පරතෙරට පැමිණියෙමි. ඵල

දානයේ විපාක මෙබඳුය. දන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ බිනක තෙරණුවන් එල සමවතින් වූ සැපයෙන් හා නිවන් සැපයෙන් යුක්තව වෙසෙන කල්හි ප්‍රදාන පරිග්‍රාහක තෙරණුවෝ එම ආරණ්‍යායතනයට වැඩම කළහ. එහි වසන භික්ෂූන් පිළිබඳ විමසීම සඳහා උන්වහන්සේ මේ පළමු ගාථාව වදාළහ.

''**කස්ස සෙලූපමං චිත්තං යීතං නානුපකම්පති**
විරත්තං රජනීයෙසූ කුප්පනීයෙ න කුප්පති
යස්සෙවං භාවිතං චිත්තං කුතො නං දුක්ඛමෙස්සති''

මෙහි ''**කස්ස සෙලූපමං චිත්තං යීතං නානුපකම්පති**'' යනු මේ අරණ්‍යායතනයේ වෙසෙන කවර භික්ෂුවකගේ සිත මගඵල අවබෝධයෙන් ඒකඝන වූ ගල් පර්වතයක් මෙන් පවතී ද? සියලු ආශාවන්ගේ අභාවයෙන් වශීභාවයට පත් වූ බැවින් ද සියලුම ආකාරයේ ලෝක ධර්මතාවන්ගෙන් (අටලෝ දහමින්) කම්පා නොවී නොසැලී පවතීද? දන් එවැනි භික්ෂුවගේ අකම්පිත බවට හේතු දැක්වීම් වශයෙන් ''**විරත්තං**'' යනාදිය වදාළහ. ''**විරත්තං රජනීයෙසු**'' විරාග නම් වූ ආර්ය මාර්ගයෙන් සිත් අලවන රාගය ඉපදීමට හේතුවන තෙත්හුමික ධර්මයන්හි නොඇලුණු, 'ආර්ය මාර්ගයෙන් මුලුමණින්ම සිඳ දමූ රාග ඇති'' යන අර්ථයයි. ''**කුප්පනීයෙ**'' හැපීම්-ගැටීම් ඇති සියලු ක්‍රෝධ සහිත වස්තූන්හි නොකිපේ. සිත දූෂ්‍ය නොවේ. විකාරයට -වෙනසට නොපැමිණේ. ''**යස්සෙවං භාවිතං චිත්තං**'' යම් ආර්ය පුද්ගලයෙකුගේ සිත, මනස මෙසේ තාදි භාවයෙන් (කෙළෙස් දුරුකර) වඩන ලද ද ''**කුතො නං දුක්ඛමෙස්සති**'' ඒ උතුම් පුද්ගලයාට ඇලීම් වශයෙන් හෝ සංස්කාර වශයෙන් හෝ කෙසේ නම් දුකක් පැමිණෙන්නේද? ''මෙවන් පුද්ගලයන්ට දුකක් නොමැත'' යන අරුතයි. මෙසේ අනියම් වශයෙන් විවාළ අර්ථය බිනක තෙරණුවෝ තමා වෙත සමීප කරගනිමින් පිළිතුරු දීම් වශයෙන් මේ දෙවන ගාථාව වදාරා සිය රහත් බව ප්‍රකාශ කළහ.

''**මම සෙලූපමං චිත්තං යීතං නානුකම්පති**
විරත්තං රජනීයෙසු කුප්පනීයෙ න කුප්පති
මමෙවං භාවිතං චිත්තං කුතො මං දුක්ඛ මෙස්සති'' **නී.**

මෙම ගාථාවේ අර්ථ ඉහතින් ද පැවසෙන බැවින් ඉතා ප්‍රකට ය.

බිනක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.7

''න තාව සුපිතුං හොති'' යනු ආයුෂ්මත් **සෝණ සෙට්ඨිපුත්ත** තෙරුන්ගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ පැතුම් ඇතිව අවුත්; **සිබි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී වැද්දෙකු වී ජීවත් වනුයේ දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් කුරුඤ්ජිය ඵලයක් ගෙන උන්වහන්සේට පිදූහ. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී කපිලවස්තුවේ සෙලිස්සරිය නම් ග්‍රාමභෝජකයාගේ පුතු ලෙස උපන්නේ ය. ඔහු ''**සෝණ**'' නාමයෙන් ප්‍රකට විය. තරුණවියට පැමිණි සෝණ භද්දිය ශාක්‍ය රජුගේ සේනාපති විය. ඉහතින් පැවසූ පරිදි භද්දිය ශාක්‍ය රජු පැවිදි වූ කල්හි ''රජුත් පැවිදි වුණා. මම ගිහිගෙයි සිටීමෙන් කවර ප්‍රයෝජනයක් ද?''යි සිතා සෝණ පැවිදි වූ නමුත්, භාවනාවෙහි නො ඇලී, නින්දෙහිම ඇලී වාසය කළේය. භාග්‍යවතුන් වහන්සේ අනුපිය නම් අඹ වනයෙහි වැඩ වසන කල්හි සෝණ වෙත තමන් වහන්සේගේ ශරීරාලෝකය පතුරුවා ඔහුට සිහි උපදවා මේ පළමු ගාථාවෙන් අවවාද කළ සේක.

''න තාව සුපිතුං හොති රත්ති නකඛත්තමාලිනී
පටිජගිතු මෙවෙසා රත්ති හොති විජානතා''

හත්ථිකඛන්ධාවපතිතං කුඤ්ජරෝ වෙ අනුක්කමෙ
සංගාමෙ මෙ මතං සෙය්‍යා යං වෙ ජීවෙ පරාජිතෝ'' **ති.**

මෙහි ''න තාව සුපිතුං හොති **රත්ති නකඛත්ත මාලිනී**'' අයෝග්‍ය අවස්ථා අටක් බැහැරලා නව වන ක්ෂණය ලැබ (යෝග්‍ය අවස්ථාවට පැමිණ) සිටියත් නුවණැති පුද්ගලයා විසින් රහත් වන තෙක්ම මේ තරු ඇති රාත්‍රියෙහි නිදාගැනීම නුසුදුසුයි. නිදීමට සුදුසු කාලයක් නොවේ. මේ රාත්‍රිය වනාහි නුවණැත්තන් විසින් පිළිවෙත් රැකීමට ම යෝග්‍ය වූවකි. මේ රාත්‍රිය නම් මිනිසුන්ගේ ද මෘගපක්ෂීන්ගේ ද නින්දට යෑමෙන් විශේෂයෙන්ම නිශ්ශබ්ද වූ නිසසල රාත්‍රියකි. එනිසා පිළිවෙතින් තමා මනාව ආරක්ෂා කර ගැනීම සඳහා නුවණැත්තන් විසින් මේ රාත්‍රියේ නිදි වැරීම ඉතා කැමතිවූවකි. ඒ ඇසූ සෝණ තෙරණුවෝ සංවේග උපදවාගෙන, ලැජ්ජා බිය පෙරටු කරගෙන, අබ්භෝකාසිකංගය නම් ධුතාංගය අධිෂ්ඨාන කරගෙන නිදිවරා විදසුන් කමටහන වඩමින් ම ''**හත්ථිකඛන්ධාව පතිතං**'' යන දෙවන ගාථාව වදාළ සේක.

එහි ''අවපතිතං'' යනු යටිකුරුව වැටේ. පා උඩට සිටින සේ මුව යටට සිටින සේ වැටුණි. ''**කුසූජරෝ වෙ අනුසක්ක මෙ**'' ඉදින් ඇතා පෑගුවේ නම්. මෙහි අදහස මෙසේ දත යුතුයි. - ''යම් කලෙක මම ඇතා පිට නැඟී සංග්‍රාමයට පිවිසියෙමි. ඉදින් සටනේදී ඇත් කදින් වැටුනහොත්, එකල්හි මම ඒ සංග්‍රාම භූමියේදී ඇතාටම පැගී මිය යන්නෙමි. එම මරණය මා හට උතුම් වේ. දැන් මෙසේ කෙලෙසුන්ට පැරදී (කෙලෙස් බරිතව ජීවත්වීම නොහොඬි.'' මේ ගාථාව දේශනා කරද්දීම විදසුන් වැඩූ සෝණ තෙරණුවෝ රහත් බව ලබාගත්හ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''පෙර මම වනයේ හැසිරෙන මුව වැද්දෙක් වීමි. එකල සියලු දහම්හි පරතෙරට පත්වූ කෙලෙස් දූවිලි ඉවත ලූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. පහන් සිත් ඇති මම කුරුඤ්ජිය ඵලයක් ගෙන, වීර වූ පින්කෙතක් වූ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට පිදුවෙමි. එදා මීට කල්ප තිස් එකකට පෙර යම් ඵලදානයක් දුනිමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත්බවට පත් සෝණ තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ වදාළ ගාථාව සහ තමන් වහන්සේ වදාළ ගාථාව යන දෙකම ''හත්ථිකඛන්ධාවපතිතං...'' යනාදී වශයෙන් නැවත වදාළහ. එයම උන්වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම විය.

සෝණ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.8

''**පඤ්චකාම ගුණෙ හිත්වා**'' යනාදී ගාථා ආයුෂ්මත් **නිසභ** තෙරුන් විසින් පවසන ලදී. එහි උපත කෙසේ ද? නිසභ තෙරුන් ද පෙර බුදුවරු හමුවේ කරන ලද පුරුදුතා හා ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේ දී පින්දහම් රැස් කරමින් පැමිණ **විපස්සි** නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි කුලගෙයක උපන්නේ ය. වැඩිවියට පත් හෙතෙම දිනක් ශාස්තෘන් වහන්සේ

පිඬු පිණිස හැසිරෙනු දැක පැහැදුණු සිතින් දිවුල් ගෙඩියක් පූජා කළේය. ඒ පින්කම නිසා කාමසුගතීන්හිම සැරිසැරූ ඔහු; මේ බුද්ධෝත්පාද කාලයේදී කෝලිය ජනපදයේ සිටුගෙයක ඉපිද **නිසභ** නමින් ප්‍රකට විය. තුරුණු වියට පත් නිසභ කුමරු ශාක්‍ය කෝලිය යුද්ධාවස්ථාවෙහි දී උතුම් බුද්ධශ්‍රීය දැක, ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි ව, එදිනම රහත් විය.

අපදාන පාළියේදී නිසභ තෙරණුවෝ මෙසේ පවසා ඇත.

''ලෝකයාගේ පූජාවන් පිළිගන්නා වූ රන්වන් වූ වීථියට පිළිපන් සම්බුදු රජාණන් වහන්සේ දුටු මම එක් දිවුල් ගෙඩියක් පිදුවෙමි. එකල මීට කල්ප අනූ එකකට පෙර යම් ඵලයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම කෙලෙස දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ තම සහායක භික්ෂූහු ප්‍රමාදීව වසනු හා කල් යවනු දැක, මේ පළමු ගාථාවෙන් ඔවුන්ට අවවාද කළහ.

''පඤ්චකාම ගුණෙ හිත්වා පියරූපෙ මනොරමෙ
සද්ධාය අභිනික්ඛම්ම දුක්ඛස්සන්තකරො භවෙ''

එහි අර්ථ මෙසේය- ''බාල පුහුදුන් පුද්ගලයාගේ ඇලිය යුතු ස්වභාව ඇති, ප්‍රියරූපාදියෙහි මනෝඥ ස්වභාව ඇති, මනරම් වූ රූපාදී පංචකාමයන්, කාම ලෝක පැවැත්මට හේතුවන ධර්මතා අත්හැරියෙමි. ඒවා අත්හැර කර්මඵල පිළිබඳ විශ්වාසයෙන් ද රත්නත්‍රය පිළිබඳ ශ්‍රද්ධාවෙන් ද ගිහිගෙයින් නික්ම පැවිදි වූ නුවණැති පුද්ගලයා පැවිදි වූ දින සිටම උත්සාහ කරමින්, වෑයම් කරමින් සංසාර දුකින් මිදෙන්නේ ය. සසර දුක කෙළවර කරන්නේ ය'' මෙසේ භික්ෂූන්ට අවවාද දුන් නිසභ තෙරණුවෝ, ''මෙතෙම අනුන්ටම අවවාද දෙමින් සිටී. තමා වනාහි එය නො කරන්නෙකියි නො සිතාවා'' යනුවෙන් සිතා තමන්වහන්සේ අර්හත් මාර්ගයට පිළිපන් බව ප්‍රකාශ කරමින් මේ දෙවන ගාථාව වදාළහ.

''නාභිනන්දාමි මරණං - නාභිනන්දාමි ජීවිතං
කාලඤ්ච පටිකංඛාමී - සම්පජානො පතිස්සතො'' **තී.**

මෙහි ''නාභිනන්දාමි මරණං'' යනු මම මරණය නොකැමැත්තෙමි. මරණය නො පතමි. ''**නාභිනන්දාමි ජීවිතං**'' මෙය වනාහී ඊට හේතු දැක්වීමකි.

යම්හෙයකින් මම ජීවිතය පිළිබඳ ආශාවක් නොමැත්තෙම් ද එනිසාම මරණය ද නො පතමි. එහි ද ආශාවක් නැත. යමෙක් අනාගත ජාති-ජරා-මරණාදී කිලිටි දහම් නැවත නැවත සංස්කරණය කරයිද රැස්කරයි ද ඔහු නැවත නැවත ඉපදීම කැමති වේ. ප්‍රාර්ථනා කරයි. ජීවිතය අවසන් කරන මරණය නො කැමති වේ. නොපතයි. ඒ කෙලෙස් දහම් ප්‍රහීන නොකළ බැවිනි. රහතන් වහන්සේ සියලුම ආකාරයෙන් රැස්කිරීම් ස්වභාව අත්හැර දමා රැස් කළ දේ වැනසීමෙහි (නිවන් මගෙහි) පිහිටි සේක. සියලුම ආකාරයෙන් ජීවිතය පිළිබඳ පිරිසිඳ දත් බැවින් ජීවිතයද මරණය ද උන්වහන්සේ නො පතති. කැමති නො වෙති. ඒ කෙලෙස් දහම් මනාව ප්‍රහීන කළ බැවිණි. නිසා මෙසේ වදාළහ - ''ජීවිතය ද නො පතමි. මරණය ද නො පතමි'' මෙසේ රහතන් වහන්සේගේ පිරිනිවීමේ කැමැත්තන්, පිරිනිවන දක්වා වැඩ සිටීමෙන් කියන ලදී. **කාලඤ්ච පටිකංඛාමි සම්පජානො පතිස්සතො**'' කෙලෙස් පිරිනිවීම සිදු වූ කල්හි, ප්‍රඥාවේ විපුලත්වයට පැමිණ, සිහි ඇතිව කල්පනා කාරී වූ මම හුදෙක් ස්කන්ධ පිරිනිවීමේ අවස්ථාව කැමති වෙමි. අපේක්ෂා කරමි. එය පැමිණෙනු බලමින් සිටිමි. මාහට මරණයේ හෝ ජීවිතයේ හෝ විශේෂ ඇලීමක් නැත. අර්හත් මාර්ගයෙන් ඒ සියලු ආශාවන් මුලුමනින්ම සිඳ දැමූවෙමි.

නිසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.9

''**අම්බපල්ලවසංකාසං**'' යනු ආයුෂ්මත් **උසභ** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උසභ තෙරුන් ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් සිදුකරමින් අවුත්, **සිඛි** නම් භාග්‍යවතුන් වහස්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්නේ ය. වැඩිවියට පත් සිටුකුමරු දිනක් ඒ ශාස්තෘන් වහන්සේ පිඬුපිණිස හැසිරෙනු දැක පැහැදුණු සිතින් කෝසම්බ ගෙඩියක් දුන්නේ ය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි ඔහු, මේ බුද්ධෝත්පාද කාලයේ දී කපිල වස්තුවේ ශාක්‍ය රජ පවුලක **උසභ** නමින් උපන්නේ ය. වැඩිවියට පත් උසභ කුමරු කිඹුල්වතට වැඩම වූ බුදුරදුන්ගේ උතුම් බුදුසිරි දැකීමෙන් උපන් ශ්‍රද්ධාවෙන් පැවිදි විය. පැවිදි වූ දින පටන් ම මහණ දම් නොපිරූ උසභ හිමියෝ දිවාකාලයේ සමූහ සාකච්ඡාවෙහිද මුලු රැයම නිදාගනිමින්

ද කල්ගත කළහ. උන්වහන්සේ දිනක් මුලා වී අසිහියෙන් නිදාගත් කල්හි සිහිනයක් දුටු සේක. ''කෙස් රවුල් බා අඹ දලු පාට වූ සිවුරක් පොරවා ගෙන ඇතකු පිට නැඟී නුවර පිඬු පිණිස පිවිසි උන්වහන්සේ මිනිස්සු පැමිණි කල්හි ලැජ්ජාවෙන් ඇතා පිටින් බසිනු'' සිහිනෙන් දැක එවේලෙහිම පිබිදුණහ. පිබිද ''මම මෙබඳු සිහිනයක් දුටුවේ මුළාව සිහිකල්පනාවෙන් තොරව නිදාගත් බැවිණි''යි උපන් සංවේග ඇති උසහ හිමියෝ විඳසුනෙහි සිත පිහිටුවා නොබෝ වේලාවකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''කුඹුක් රුකක් මෙන් බබළන දේවාති දේව වූ නරශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ මාර්ගය පිවිසි කල්හි මම කෝසම්බ ඵලයක් පිදුවෙමි. මීට කල්ප අනූ එකකට පෙර කරන ලද ඒ මහා ඵලදානයේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ඉක්බිති උසහ තෙරණුවෝ තමා දුටු සිහිනයම අංකුසයක් කරගනිමින් රහත් බවට පත්වූ හෙයින්, ඒ සිහිනය ප්‍රකාශ කරමින් සිය රහත්භාවය මෙසේ ගාථා දෙකකින් දක්වූහ.

''අම්බපල්ලවසඞ්කාසං අංසෙ කත්වාන චීවරං
නිසිනෙනා හත්ථිගීවායං ගාමං පිණ්ඩාය පාවිසිං

හත්ථිකබන්ධතෝ ඔරුය්හ සංවෙගං අලභිං තදා
සොහං දිත්තෙනා තදා සන්තෙනා, පත්තෙනා මෙ ආසවක්ඛයෝ''

එහි ''අම්බපල්ලවසංකාසං අංසෙ කත්වාන චීවරං'' යනු අඹ දළු පාට මෙන් පබළු වන් සිවුරක් උතුරු සළුවක් ලෙස පොරවාගෙන, ''ගාමං'' ඇතුල් නුවරට ඇතුපිට නැඟී පිඬු පිණිස පිවිසියෙමි. පිවිසි කල්හිම මහජනයා විසින් බලනු ලබන්නේ ඇත් කඳෙන් බසින ලද මම නින්දෙන් පිබිදියෙමි. පිබිදි කෙණෙහිම සංවේගයට පත්වීමි. එකල මුලා වී අසිහියෙන් නින්දට පිවිසීම නිසා මෙම සිහිනය දුටුවෙමි. ඇතමෙක් වනාහී උසහ රජකුමරකුට සිටියදී මේ සිහිනය රාත්‍රියේදී දැක, උදෑසන ඇතුපිට නැඟී නුවර වීථියෙහි හැසිරෙමින් රෑ දුටු සිහිනය සිහිකොට, ඇතුපිටින් බැස සංවේග උපදවා ගෙන ශාස්තෘන් වහන්සේ සමීපයේ පැවිදි වී, රහත් බවට පත්ව උදන් අනමින් මේ ගාථා වදාළ බව පවසති. ''දිත්තෙනා'' ඒ රජ කුමරකුට සිටි

කාලයේ ජාති මදයෙන් භෝග මද ආදියෙන් ආඩම්බරව සිටියෙමි. ඒ පිළිබඳව සංවේගයට පැමිණියෙමි.

උසභ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.4.10

"අයමිනි කප්පටො" යනු ආයුෂ්මත් **කප්පට කුර** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයේ දී පින්දහම් රැස්කරගනිමින් අවුත් **විපස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. දිනක් එම භාග්‍යවතුන් වහන්සේ විනතා නදී තීරයේ එක්තරා රුකක් මුල වැඩහිඳුණු දුටු ඔහු සතුටු සිතින් කේතකී මලින් බුදුන් පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරමින් සැප විඳි හෙතෙම මේ බුද්ධෝත්පාදයේදී දුප්පත් පවුලක ඉපිද තරුණවියට පත්වන තෙක්ම වෙනත් උපායක් නොදන්නේ දිරාගිය වස්ත්‍ර හැඳගෙන නැඹිලියක් රැගෙන ඒ ඒ තැන බත් හුළු සොයමින් ඇවිද්දේය. එනිසා ඒ දරුවා "කප්පට කුර" යැයි ප්‍රකට විය. වැඩිවයසට පත් ඔහු තණ විකුණා ජීවත් විය. දිනක් තණ කැපීමට කැළයට ගිය ඔහු, එහි එක් රහතන් වහන්සේ නමක් සිටිනු දැක උන්වහන්සේ වෙත පැමිණ වැඳ එකත් පසෙක සිටියේය. රහතන් වහන්සේ ඔහුට දහම් දෙසූහ. ධර්මශ්‍රවණයෙන් ලැබූ ශ්‍රද්ධාව ඇති ඔහු "මේ දුෂ්කර ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද?" යි සිතා පැවිදිව තමා එතෙක් හැඳ සිටි කිළිටි කඩමාල්ල එක් තැනක සැඟවීය. යම් විටෙක උන්වහන්සේට පැවිද්ද පිළිබඳ නො ඇල්මක් උපදී ද එවිට ඒ කිළිටි කඩ බලා සංවේග උපදවා ගනියි. මෙසේ සංවේග උපදවා ගත්විට නො ඇලීම දුරු වේ. මෙසේ කරමින් සිටි කප්පට කුර තෙරණුවෝ සත් වරක් උපැවිදි වූහ. මෙම කරුණ සෙසු භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. දිනක් කප්පටකුර භික්ෂුව ධර්ම සභාවේ පිරිස කෙළවර හිඳ නිදාසිටිනු දුටු භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙකින් චෝදනා කළ සේක.

"අයමිනි කප්පටො කප්පටකුරො අචඡාය අනිහරිතාය
අමතඝටිකායං ධම්මකතමතෙතා කතපදං ඣානානි ඔවෙතුං

මා බො තවං කප්පට පවාලෙසි මා තං උපකණ්ණකම්හි තාළෙසසං
නහ තවං කප්පට මත්තමඤ්ඤාසි සංඝ මජ්ඣම්හි පවලායමානො''

එහි ''අයම්පි **කප්පටො කප්පටකුරෝ**'' කප්පටකුර මහණ ''මේ මාගේ දිරාගිය වස්ත්‍රයයි. එය පොරවාගෙන පෙර සේම ජීවත්වෙමි''යි උපන් මිත්‍යා කල්පනා ඇත්තෙකි. අතිශයින් පවිත්‍ර වූ පරිපූර්ණ වූ අමත සටය (කළය) ඇති කල්හි, මගේ අමෘත සටයෙන් ඒ ඒ තැන්හි දහම් වැසි වස්වන කල්හි ඒ අමෘතය අවබෝධ කරගත යුතුයි. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. ඉම් අදබාල ලෝකයේ කෙලෙස් නැමති ග්‍රීෂ්මය නසමින් අමාබෙර වයමින් මවිසින් දහම් වැසි වස්වන කල්හි; මේ සස්නේ ධ්‍යාන වැඩීමට මාර්ග ඇතිව ලෞකික ලෝකෝත්තර ධ්‍යාන වැඩීමට කරන ලද මාර්ග හෙළිකිරීම්, වැඩිය යුතු මාර්ග දක්වා ඇති කල්හි; කප්පටකුරය නුඹ ඉන් වැලකී සිටියි. කරන ලද දහම් මග ඇති මගේ ශාසනය පිළිබඳ කළකිරුණු සිතැති, ඒ ආයෘ මාර්ගයෙන් පහ වූ සිතැතිව නුඹ වෙසෙන්නෙහිය. මෙසේ නැවතත් බඩුත් සමගම සොරා අල්ලා දක්වන්නාක් මෙන් පමා වී වාසය කිරීමේ දොස් දක්වන භාග්‍යවතුන් වහන්සේ **''මා බො තවං කප්පට පවා ලෙසි**'' යන ගාථාව වදාළහ.

එහි ''**මා බො තවං කප්පට පවාලෙසි**'' යනු ''එම්බා කප්පටකුරය! නුඹ මාගේ දම් අසන්නෙමි''යි මෙහි හිඳ නිදා නොගනුව. නින්දට නොයව. නිකරුණේ කල් ගත නොකරව. ''**මා තං උපකණ්ණකම්හි තාළෙසසං**'' මෙසේ නිදා සිටින නුඹගේ කන් මුල, කණ සමීපයේ දේශනා නැමැති අතින් මම නුඹට නො තළන්නෙමි. එහි අරුත නම් -''මින් පසුවවත් මගේ අවවාද අනුව පිළිපදව'' යන්නයි. ''**නහ තවං කප්පට මත්තමඤ්ඤාසි**'' කපපටකුරය! නුඹ සග මැද නිදමින් නුඹ තමාගේ ප්‍රමාණය නොදන්න සිටින්නෙහිය. ''මේ ක්ෂණ සම්පත්තිය ඉතා දුර්ලභ වූවකි. ඒ ක්ෂණ සම්පත්තිය මට ලැබුණි'' යන මෙකරුණවත් නුඹ නො දන්නෙහිය. ''නුඹගේ මේ මහත් අපරාධය දෙස නැවත හැරී බලව''යි චෝදනා කළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගාථා දෙකකින් ඉතා දැඩිව ඒ තෙරුන්ට නිග්‍රහ කර චෝදනා කළ සේක්, අවීඩීවේධ දුන්නෙන් විද චණ්ඩ ඇතෙකු මාර්ගයට බස්වන්නාක් මෙන් කප්පටකුර තෙරුන්ට සංවේග ඉපද වූ සේක. වහා විදසුනෙහි සිත පිහිට වූ කප්පටකුර තෙරණුවෝ නොබෝ කලකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''පුරුෂෝත්තම වූ බුදුරජාණන් වහන්සේ විනතා නදී තීරයේ වැඩ හුන් සේක. මනාව සන්සුන් වූ ඔකඟ සිත් ඇති කෙලෙස් දුවිලි හැර ලූ බුදුරදුන් දුටුවෙමි. උන්වහන්සේ දැක පහන් සිත් ඇති වූ මම සතුටින් මධු සුවඳ වැගිරෙන වැටකේ මලින් බුදුපියාණන් වහන්සේට පූජා පැවැත්වීමි. මීට කල්ප අනූ එකකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දැන් මම කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කළෙමි.''

රහත් වූ උන්වහන්සේ ශාස්තෘන් වහන්සේ වදාළ ගාථා දෙකම තමාගේ රහත්වීමට අංකුසයක් වූ බැවින් නැවත එම ගාථා වදාළහ. ඉන් උන්වහන්සේ තමන් වහන්සේ නිර්වාණය අවබෝධ කරගත් බව ප්‍රකාශ කළහ.

කප්පටකුර ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සිවුවන වර්ගයේ අර්ථවර්ණනාව සමාප්තයි.

2.5.1

''අහො බුද්ධා අහො ධම්මා'' යනු ආයුෂ්මත් **කුමාර කාශ්‍යප** මහ රහතන් වහන්සේගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ඒ ඒ භවයේදී පින් දහම් කරගනිමින් අවුත් **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ බමුණු පවුලක ඉපිද තුරුණුවියට පත් වූහ. අංගුත්තර අටුවාවේ පැවසෙනුයේ සිටු ගෙයක උපන් බවයි. ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්මශ්‍රවණය කරමින් සිටි ඔහු දිනක් එක් භික්ෂුවක් විචිත්‍ර කථික වූ භික්ෂූන්ගෙන් අග තනතුරෙහි පිහිටුවනු දැක තමා ද ඒ තනතුර කැමති විය. ඒ සඳහ චිත්තාධිෂ්ඨානයක් සිදුකරගත් ඔහු ඊට අනුරූප වූ පින් දහම් රැස්කරමින් අවුත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී ශ්‍රමණ ධර්ම මැනවින් සපුරා කාම සුගතීන්හිම සැරිසැරීය. අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ රජගහ නුවර සිටු දියණියකගේ කුස පිළිසිඳ ගත්තේය. ඒ සිටු දුව ළදරු කාලයේ සිටම පැවිදිවනු කැමති වුවත් දෙමාපියන්ගෙන් අවසර නොලැබුවාය. විවාහ වූ පසුව ගැබ පිහිටි බව නොදත් ඇය කෙසේ හෝ සැමියා සතුටු කරගත්හී ඔහුගේ අනුමැතිය ලබා භික්ෂුණී අරමක පැවිදි වූවාය. ඇයගේ ගැබ මුහුකුරා ගිය විට සෙසු භික්ෂුණීහු ඇය ගැබිණියක් බව දෙව්දත් තෙරුන්ට දන්වූහ. දෙව්දත් තෙරුන් ''ඇය භික්ෂුණියක් නොවේ''යැයි පැවසීය. නැවත භික්ෂුණීහු මේ පිළිබඳව දසබලයන් වහන්සේට දැනුම් දුන්හ. ශාස්තෘන් වහන්සේ මේ පිළිබඳව විනිශ්චය කිරීමට උපාලි තෙරුන්ට නියම කළ සේක. තෙරණුවෝ සැවැත් නුවර චැසියෝ ද විශාඛා මහෝපාසිකාව ද කැඳවා රජු සහිත වූ පිරිස් මැද හිඳ, ''මැයගේ ගැබ පැවිද්දට පෙර පිහිටියේ ද? නැතිනම් පැවිද්දට පසුව පිහිටියේ ද?''යි විනිශ්චය කළහ. ගැබ පැවිද්දට පෙර පිහිටියක් බැවින් පැවිද්ද පිරිසිදු යැයි තීන්දුව ප්‍රකාශ කළ පසු ශාස්තෘන් වහන්සේ ''අධිකරණය (නඩුව) මැනවින් විසඳන ලදී''යැයි උපාලි තෙරුන්ට සාධුකාර දුන් සේක. ඒ භික්ෂුණිය පසුකලෙක රන් පිඬක් හා සමාන පුතකු වැදුවාය. ඒ දරුවා පසේනදි කොසොල් රජු විසින් පෝෂණය කරන ලදී. ඔහු ''කාශ්‍යප'' නාමයෙන් ප්‍රකට විය.

පසුකලෙක සර්වාභරණයෙන් සරසා ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ වූ කාශ්‍යප කුමරු පැවිදි කරවීය. ඉතා ළදරු අවස්ථාවෙහි පැවිදි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ ''කාශ්‍යප කැඳවන්න. මේ ගෙඩිය හෝ කන දය කාශ්‍යපට දෙන්න''යි වදාරති. එවිට සෙසු භික්ෂූහු ''කවර

කාශ්‍යපටද?'' යි විමසති. ''කුමාර කාශ්‍යපට'' යැයි බුදුහු පවසති. මෙසේ බුදුරදුන්ගෙන් ද රජු විසින් කුමාරයකු මෙන් පෝෂිත බැවින් ද ලත් ''**කුමාර කාශ්‍යප**'' යන නාමය උන්වහන්සේට වයෝවෘද්ධ අවස්ථාවෙහිත් භාවිත විය. කුමාර කාශ්‍යප හිමියෝ පැවිදි වූ දින පටන් ම විදසුන් කමටහන ම වඩති. බුදුවදන් උගනිති.

කාශ්‍යප බුදුන් දවස උන්වහන්සේ සමග පර්වතයකට නැගී එකට මහණදම් පුරා ශුද්ධාවාසයේ උපන් මහා බ්‍රහ්මයා, කුමාර කාශ්‍යප තෙරුන් විදසුනට සිත යොමු කළ බව දැන, ''මාර්ග ඵල උපදවා ගැනීමට උපායක් කරමි''යි ප්‍රශ්න පහළොවක් සාදා ගෙනවුත් අන්ධවනයේ විසූ කුමාර කාශ්‍යප හිමිට දී ''මේ ප්‍රශ්න ශාස්තෘන් වහන්සේගෙන් විමසන්න''යැයි පවසා ගියේය. උන්වහන්සේ එම ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේගෙන් විමසූහ. භාග්‍යවතුන් වහන්සේ ද ඒවා විසඳූ සේක. තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේ විසඳූ මොහොතේම ඒවා ඉගෙන විදසුනට සිත යොමුකළ සේක් රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''මෙයින් කල්ප ලක්ෂයකට පෙර මුලු ලොවටම හිතවත් වූ වීර වූ පදුමුත්තර නම් ලෝකනායකයන් වහන්සේ ලොව පහළ වූ සේක. මම එකල වේද පරාගත බමුණෙක් වූයෙමි. ප්‍රකටව විසූ මම දිනක් දිවා විහරණයෙහි යෙදුනෙමි, චතුරාර්ය සත්‍ය ධර්මය දෙසන්නා වූ සදේව ලෝකයාට දහම් අවබෝධ කරවන්නා වූ මහජනයා ඉදිරියේ විචිත්‍ර කථිකයන්ට අගතැන්පත් සව්වකු වර්ණනා කරන්නා වූ ලෝකනාථයන් වහන්සේ දුටුවෙමි. ඒ දැක ප්‍රමුදිත සිත් ඇති මම තථාගතයන් වහන්සේට ආරාධනා කර, නත් රුවනින් බබළන මණ්ඩපයක් නානා වර්ණ ඇති වස්ත්‍රවලින් සරසා එහි සතියක් ම බුද්ධ ප්‍රමුඛ සංඝ රත්නයට අග්‍ර රස භෝජන වැළඳවූයෙමි. නානා වර්ණ ඇති මලින් ශ්‍රාවකයන් සහිත බුදුන් පිදූ මම උන්වහන්සේගේ පාමුල වැඳ වැටී එම තනතුර පැතුවෙමි.''

එකල කරුණා රසයට එකම නිධානය වූ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක. ''පියුමකට බඳු මුහුණ හා ඇස් ඇත්තා වූ ප්‍රීති ප්‍රමෝද්‍ය බහුල වූ හෙයින් නැගුණු ලොම් ඇති හර්ෂයෙන් දැල්වුණු විශාල ඇස් ඇති, මාගේ සසුනෙහි ඇලුම් ඇති, මාගේ පාමුල වැටුනා වූ, එකම අරමුණට හැරුණු මනා සිත් ඇති මේ බමුණා දෙස බලවූ. මෙතෙම විචිත්‍ර කථිකත්වය නම් වූ මේ තනතුර පතයි. මෙයින් කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ

උපදින ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස පුත්‍ර වූ **කුමාර කාශ්‍යප** නම් ශ්‍රාවකව මෙතෙම උපදින්නේය. පිදූ විසිතුරු වස්ත්‍රයන්ගෙන් ද රත්නයන්ගෙන් ද බබළන හෙතෙම විචිත්‍ර කථික භික්ෂූන් අතුරින් අග්‍ර බවට පැමිණෙන්නේ ය.''

මෙසේ විවරණ ලද මා ඒ මනා වූ පින්කම නිසාත් චිත්ත ප්‍රාර්ථනාව නිසාත් මිනිස් සිරුර හැර තව්තිසාවේ උපන්නෙමි. රඟ මැද නළුවෙකු මෙන් භව නැමති අහසෙහි පරිභ්‍රමණය කරමින් ශාඛා නම් මුවාගේ පුත්‍රව මුවදෙනගේ කුස පිළිසිඳ ගතිමි. එකල මා කුසෙහි වසන කාලයේ මාගේ මවුට මරණ වාරය එළඹිණි. ශාඛා මුවා විසින් අත්හළ මාගේ මව්තොමෝ න්‍යග්‍රෝධ මුව රජු වෙත ගියාය. එවිට ඒ න්‍යග්‍රෝධ මුවරජු සිය පණ පරිත්‍යාග කරමින් මගේ මව මරණයෙන් මිදුවේය. මරණයෙන් මිදුණු මගේ මවු පසුව මට මෙසේ අවවාද කළාය.

''න්‍යග්‍රෝධ මුව රජු ම සේවනය කරව. ශාඛා මුවා වෙත නොයව. න්‍යග්‍රෝධ සමීපයේ වැස මියයෑම ශාඛා මුවා සමඟ ජීවත්වීමට වඩා වටනේය'' ඒ න්‍යග්‍රෝධ මුව රජුගේ අවවාද අනුව කටයුතු කළ මම ද මගේ මවු ද සෙසු මුවෝ ද දුරු රටක සිටියකු සිය ගෙදරට එන්නාක් මෙන් රම්‍ය වූ තුසිත දෙව්ලොව උපන්නෙමු.

යළිත් කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ සසුන පිරිහී යන විට ගලක් මුදුනට නැඟ ජනසාසන පිළිවෙත් පිරුවෙමි. දැන මම රජගහ නුවර සිටු ගෙයක උපන්නෙමි. ගැබිණි බව නොදත් මගේ මවු අනගාරික නම් වූ උතුම් පැවිද්ද ලැබුවාය. ගැබ සහිත ඇය දෙව්දත් තෙර වෙත ගෙන ගිය භික්ෂුණීන්ට ''මේ පාපී භික්ෂුණිය සිවුරු හැර යවවු''යි අණ ලැබුණි. දැනුත් මුනීන්ද්‍ර වූ බුදුරජාණන් වහන්සේ විසින් අනුකම්පා කරන ලද මාගේ මව සුඛිත වූවාය. භික්ෂුණී අරමේ සිට මා වැඳුවාය. නමින් කාශ්‍යප නම් වූ මම පසේනදි කොසොල් රජු විසින් කුමර පෝෂණයෙන් සත්කාර කරන ලද්දෙමි. මහා කාශ්‍යප තෙරුන් නිසා කුමාර කාශ්‍යප නමින් ප්‍රකට වූ මම කය තුඹසකට සම කොට බුදුරදුන් දෙසූ වම්මික සූත්‍රය ඇසුවෙමි. ඉන් මාගේ සිත උපාදාන රහිතව හැම ලෙසින්ම ආශ්‍රවයන්ගෙන් මිදුනි. **පායාසි** රජු දමනය කළ මම විචිත්‍ර කථික භික්ෂූන් අතුරින් අග්‍ර වූයෙමි. දැන් මාගේ සිත කෙළෙසුන්ගෙන් මිදුණේය. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් වූ කුමාර කාශ්‍යප තෙරණුවෝ විචිත්‍ර කථිකයන්ගෙන් අග්‍රස්ථානයට ශාස්තෘන් වහන්සේ විසින් පත් කරන ලදහ. තම පිළිවෙත සිහිපත් කර බැලූ උන්වහන්සේ රතනත්‍රයේ ගුණ පැවසීම් වශයෙන් සිය රහත් බව ප්‍රකාශ කරනු සඳහා මේ ගාථා දෙක වදාළහ.

"අහො බුද්ධා! අහො ධම්මා! අහො නො සත්‍ථු සම්පදා!
යත්‍ථ එතාදිසං ධම්මං සාවකො සච්ඡිකාහිති

අසං බෙය්‍යෙසු කපෙපසු සකකායාධිගතා අහු
තෙසමයං පච්ඡිමකො චරිමොයං සමුස්සයො
ජාතිමරණ සංසාරො නත්‍ථිදානි පුනබ්භවො" ති.

මෙහි "අහො" යනු ආශ්චර්ය බව හඟවන නිපාතයකි. "බුද්ධා" යනු සර්වඥ බුදුරජාණන් වහන්සේය. ගෞරව වශයෙන් බහුවචනය යොදන ලදී. "සම්බුදුරජාණන් වහන්සේ අහෝ ආශ්චර්යමත්ය" යන අරුතයි. "ධම්මා" යනු පර්‍යාප්ති ධර්මය සමඟ නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයයි. "අහො නො සත්‍ථු සම්පදා" අපගේ ශාස්තෘන් වහන්සේගේ දශබල ආදී සම්පත් අහෝ පුදුම සහගතය. "යත්‍ථ" යම් ඒ ශාස්තෘන් වහන්සෙ සමීපයේ බඹසර වෙසෙන "එතාදිසං ධම්මං සාවකො සච්ඡිකාහිති" මෙබඳු වූ ඉතා පිරිසිදු ධ්‍යානාභිඥා සහිත පරිවාර ශ්‍රාවකයෝ; කෙලෙස් ඉතිරි නොකරම ක්ෂය කිරීමෙන් ශාන්ත වූ ප්‍රණීත වූ අනුත්තර ධර්මය සාක්ෂාත් කරගනිති. එනිසා මෙසේ "විවිධ වූ ගුණ විශේෂ අවබෝධ කරගැනීමට පිහිටාධාර වූ බුදුරජාණන් වහන්සේ අහෝ ඉතා අසිරිමත්හ. දහම් ගුණයෝ ඉතා අසිරිමත්ය. අපගේ ශාස්තෘන් වහන්සේගේ සම්පත් ඉතා අසිරිමත් ය" යනුවෙන් රතනත්‍රයේ ගුණාධිමුක්තිය ප්‍රකාශ කරයි. ධර්මයේ සම්පත් ප්‍රකාශ කිරීමෙන් සංඝයාගේ සුපටිපන්නාදී ගුණ ද අදහස් කරන ලදී. මෙසේ සාධාරණ වශයෙන් දැක්වූ ධර්මයේ සාක්ෂාත් කරගැනීම දැන් තමා උපමාවට ගෙන දක්වන තෙරණුවෝ "අසංඛෙය්‍යෙසු" යන ගාථාව වදාළහ.

එහි "අසංඛෙය්‍යෙසු" ගණන් කිරීමේ හැකියාවක් නොමැති මහා කල්පයන්හි. "සකකායා" පඤ්ච උපාදානාස්කන්ධයයි. ඒ පස්කඳ පරමාර්ථ වශයෙන් විද්‍යමාන වන ධර්ම සමූහයක් ඇති බැවින් "සක්කාය" යැයි කියනු ලැබේ. "අහු" යන මෙහි කියූ ලෙසම චතුරාර්ය සත්‍යාවබෝධය නොකර පුහුදුන්ව විසුවෙමි. "තෙසමයං පච්ඡිමකො චරිමොයං සමුස්සයො" මේ මාගේ අවසන් ශරීරයයි. එසේම අවසන් උපතයි. එනිසා මා හට ජාති මරණ සහිත ස්කන්ධාදියෙන් පිළිවෙලින් බැඳුණු මේ සංසාරයේ නැවත

ඉපදීමක් (පුනර්භවයක්) නොමැත. දැන් මම අවසන් දේහය දරමි. මේ මාගේ අවසන් උපතයි.

කුමාර කස්සප තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.2

''යො හවෙ දහරො භික්ඛු'' යනු ආයුෂ්මත් **ධම්මපාල** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයේදී පින්දහම් රැස් කරගෙන අවුත් **අත්‍යදස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. කිසියම් කටයුත්තකට වනයට පිවිසි සිටුකුමරු ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් පුලිල ඵලයක් පූජා කළේය. ඒ පින්කම නිසා දෙව්මිනිසුන් අතර සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී අප තථාගතයන් වහන්සේගේ පිරිනිවණින් පසුව අවන්ති රට බමුණු පවුලක **ධම්මපාල** නමින් ඉපිද, වැඩිවිය පැමිණ තක්සිලා නුවරට ගොස් සිප්සතර හැදෑරීය. සිප් ඉගෙන තම නිවස බලා එන කල්හි අතර මඟ වූ එක්තරා රමණීය විහාරයක් දැක එහි ගොස් එක්තරා තෙරනමක් දැක, වැඳ උන්වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළේය. ඉන් ලැබූ ශ්‍රද්ධා ඇති ධම්මපාල කුමරු බුදුසසුනේ පැවිදි වී විදසුන් වඩා ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් බවට පත් විය.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''වනයෙහි දී මහත් කීර්ති ඇති අත්‍යදස්සි බුදුරජාණන් වහන්සේ දැක පහන් සිත් ඇති මම සතුටු සිතින් පුලිල ගෙඩියක් උන්වහන්සේට පිදුවෙමි. මීට කල්ප එක් දහස් අටසීයකට පෙර කළ එම ඵල දානයේ විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම කෙළෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

ෂඩ් අභිඥා ලාභීව සමාපත්ති සුවයෙන් කල් යවන උන්වහන්සේ එක් දිනක් ඒ විහාරයේ සාමණේර දෙනමක් ගස් අග සිට මල් කඩනු බලා සිටියහ. එක් නමක් නැග සිටි අත්ත එක්වරම බිඳී බිම වැටෙනු දුටු තෙරණුවෝ ඍද්ධි ආනුභාවයෙන් වහාම අතින් අල්ලාගෙන නිරුපද්‍රිතව ම බිම තබා ඒ දෙදෙනාටම ධර්ම දේශනා කරමින් මේ ගාථා දෙක වදාළහ.

''යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධ සාසනෙ
ජාගරො පති සුත්තෙසු අමොඝං තස්ස ජීවිතං

තස්මා සද්ධං ච සීලඤ්ච පඤ්ඤං ධම්මදසඤනං
අනුයුඤ්ජථ මෙධාවී සරං බුද්ධානුසාසනං'' තී.

එහි ''යො'' යනු අනියම් වචනයකි. ''හවෙ'' දැඩි අර්ථයේ නිපාතයකි. ''දහරො'' තරුණ, ළා බාල, පිඬු සිඟායන්නේ නුයි (භික්ඛනීති) ''භික්ඛු'' නම් වේ. යම් තරුණ භික්ෂුවක් ඒකාන්තයෙන්. ''යුඤ්ජති'' උත්සාහ කරයි. වෑයම් කරයි. ''ජාගරො'' නිදිවරණ ස්වභාවයෙන් යුක්තව. නිදන්නන් අතර ශ්‍රද්ධාදි සිත් එලින් යුතුව නිදි වරන්නේද. මේ පාඨයේ අර්ථය මෙසේ දත යුතුයි. ''යම් තරුණ භික්ෂුවක්; ''ඒ මම වයසට ගොස් ධර්මය අවබෝධ කරගනිමි''යි නොසිතා බුදුන්ගේ සාසනයෙහි අප්‍රමාදීව පිළිවෙත්හි යෙදෙයි. සමථ විදර්ශනා භාවනාවන්හි අභ්‍යාස කරයි. එබඳු භික්ෂුව අවිද්‍යා නින්දට වැටුණු ප්‍රමාදී වූ නිදාගන්නන් අතරින් ශ්‍රද්ධා ආදී නිදිවැරීම් දහම්හි සිත පිහිටුවා නිදි වරයි. එසේම ආත්මාර්ථ පරාර්ථ සාධනය කරගත් උන්වහන්සේ හිස් නොවූ, වඳ නොවූ ජීවිතයක් ගත කරති. උන්වහන්සේට ශ්‍රද්ධාව ඇත. ''කර්ම විපාක ඇත.''ආදි වශයෙන් පවත්නා කර්මඵල ශ්‍රද්ධාවද ඇත. ශ්‍රද්ධාව හා බැඳුණු සීලය ද ඒ ආශ්‍රිත චතුපාරිශුද්ධි ශීලය ද උන්වහන්සේට ඇත. ''භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධයහ. ධර්මය මැනවින් දේශිතය. සංඝයා මනා පැවතුම් ඇත්තෝය'' යනුවෙන් තුණුරුවන් කෙරෙහි පවතින අචල වූ ප්‍රසාදය ඇත. විදර්ශනා ප්‍රඥාව සහිත මාර්ග ප්‍රඥාව පිරිසිඳ දැනීම් වශයෙන් චතුරාර්ය සත්‍ය ධර්මය දැකීමට ද හැකියාව ලබයි. නුවණැතිව ධර්මයෙන් හටගත් ප්‍රඥාවෙන් යුක්ත වූ භික්ෂුව බුදුවරුන්ගේ අනුශාසනාව අනුව සිටීමින්, එය නිතර සිහිකරමින් ඇවිලගත් තම හිස මධ්‍යස්ථ මාර්ගයෙහි යොදවයි. මැදුම් පිලිවෙතේ යෙදී ඒ සඳහා වීර්ය කරන්නේය'' යන අර්ථයයි.

ධම්මපාල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.3

''කසසිනදියානි සමථං ගතානි'' යනු ආයුෂ්මත් බ්‍රහ්මාලි තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේදී නිවන් පතාගෙන

කුසල් රැස් කරමින් පැමිණ, **විපස්සි** බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි සිටුගෙයක උපන්හ. වැඩිවියට පත් සිටුකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස වැඩම කරනු දැක පැහැදුණු සිතින් උන්වහන්සේට වැඳ වාර ඵලයක් පූජා කළේය. ශාස්තෘන් වහන්සේ පුණ්‍යානුමෝදනා කර වැඩම වූ සේක. ඒ පින්කමේ විපාක වශයෙන් දෙවි මිනිසුන් අතර සැරිසැරූ තෙම මේ බුද්ධෝත්පාද කාලයේදී කොසොල් රට බමුණු පවුලක ඉපිද, "බ්‍රහ්මාලි" නමින් ප්‍රකට විය. වැඩිවියට පත් බ්‍රහ්මාලි බමුණා පූර්ව හේතු සම්පත් මගින් මෙහෙයවනු ලබන්නේ, සසර පිළිබඳව හටගත් සංවේග ඇතිව, එබඳුම අදහස් ඇති කල්‍යාණ මිත්‍ර ඇසුරින් උපකාර ලැබ බුදුසසුනේ පැවිදි විය. තම චරිතයට ගැලපෙන කමටහනක් ගෙන එය වඩමින් අරණ්‍යායතනයක වැඩ සිටි උන්වහන්සේ, ඤාණය මුහුකුරා ගොස් නොබෝ කලකින්ම විදසුන් වඩා ෂඩ් අභිඥා ලාභී වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

"දායකයන්ගේ අනේක පූජාවන් පිළිගන්නා වූ රන්වන් පාටින් බබළන බුදුරජාණන් වහන්සේ වීථියට පිඬු සිඟා වැඩම කළ සේක. මම උන්වහන්සේට වාර ඵලයක් පිළිගැන්වූයෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් ඵලදානයක් දුන්නෙමි ද එදා සිට මේ දක්වා මම දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටු කළෙමි."

ෂඩ් අභිඥා ලාභී වූ උන්වහන්සේ මාර්ග හා ඵල සුවයෙන් කල් යවන උන්වහන්සේ, දිනක් තමා විසූ අරණ්‍යායතනයේ භික්ෂූන්ගේ අධ්‍යාත්මික ගුණධර්ම විමසන පධාන පරිග්‍රාහක තෙරුන්වහන්සේ විසින් එම ආරණ්‍යායතනයේ භික්ෂූන් සඳහා දෙසූ වීර්ය අනුව යෙදුණු ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මෙම ගාථා දෙක වදාළහ.

"කසසින්ද්‍රියානි සමථං ගතානී
අසසා යථා සාරථිනා සුදනතා
පහීණමානසස අනාසවසස
දෙවාපි කසස පිහයනති තාදිනො"?

මයහින්ද්‍රියානි සමථං ගතානි
අසසා යථා සාරථිනා සුදනතා
පහීණමානසස අනාසවසස
දෙවාපි මයහං පිහයනති තාදිනො" නී.

එහි අර්ථ මෙසේය. - ''මේ අරණ්‍යායතනයේ වසන භික්ෂූන් අතරින් කවර නම් ථේර, නවක, මධ්‍යම භික්ෂුවක් දක්ෂ වූ රියදුරෙකු විසින් අශ්වයන් මනාව දමනය කරගන්නාක් මෙන්, මනස සය වැනි වූ ඉඳුරන් සය සන්සිඳුණු බවට, දමනය කරගත් බවට, නිර්විෂ ඇති බවට පැමිණියේ ද? කවර නම් භික්ෂුවක් නව වැදෑරුම් මානය දුරුකර සිටි බැවින් දුරු කළ මාන ඇතිව, සිවු ආශ්‍රව ධර්ම අභාවයෙන් අනාශ්‍රව වූයේ, මනෝඥ වූ තාදී ගුණයන්ට පැමිණියේ, තාදී ගුණ නිසා දෙවියන්ටද ප්‍රියවූවෙක්, යහපත් පිළිවෙත් දක්වීමෙන් ද ආදරයෙන් ද වැඩෙන බැවින් මිනිසුන්ට ප්‍රියවූවෙක් වන්නේ ද?'' මෙම ගාථාවේ පූර්ව අර්ධයෙන් අනාගාමී මාර්ගඵලෝධය පිළිබඳව විමසන ලදී. අනාගාමී පුද්ගලයාට ද ඉඳුරන් මගින් ප්‍රහීණ කළ කාමරාග ව්‍යාපාද ඇති බැවින් සමථය නිර්විෂ බවට පැමිණියේ වේ. සෙසු පාද දෙකින් අර්හත් මාර්ගඵලෝධය පිළිබඳව විමසන ලදී. රහතන් වහන්සේට මානය ප්‍රහීණ වූයේ අනාශ්‍රව වූයේ තාදීභූ යැයි පවසති. ඉක්බිති බ්‍රහ්මාලි තෙරුන් පධාන පරිග්ගාහක තෙරුන් විසින් වදහළ ගාථාව වන ''කසිණින්‍ද්‍රියානි'' යන ගාථාව නැවත ප්‍රකාශ කළේය. එහි අර්ථ තමාවෙත ඇති බව දක්වමින් ඉන් පසුව ''මයිණින්‍ද්‍රියානි'' යනාදී දෙවැනි ගාථාව ප්‍රකාශ කරමින්, උන්වහන්සේ සිය රහත්බව විදහා දක්වූහ. එහි ''**මයිණින්‍ද්‍රියානි**'' යනු මගේ ඇස් ආදි ඉඳුරන් සයයි. ඉතිරි පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

බ්‍රහ්මාලි ථේරගාථා අර්ථ විස්තරය නිමියේය.

2.5.4

''**ඡවි පාපක චිත්ත හදාකා**'' යනු ආයුෂ්මත් **මෝඝරාජ** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. දිනක් ශාස්තෘන් වහන්සේ සමීපයේ හිඳිමින් ධර්මශ්‍රවණය කරන ඔහු; ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් රූක්ෂ සිවුරු දරන භික්ෂූන් අතර අග්‍රස්ථානයෙහි තබනු දැක, ඒ තනතුර පතාගෙන ඒ ඒ භවයේදී කුසලතා සම්පූර්ණ කළේය. අපරිදස්සි භාග්‍යවතුන් වහන්සේගේ දවස බමුණු කුලයක ඉපිද බ්‍රාහ්මණ ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගොස් බමුණු කුමරුවන්ට සිප්සතර ඉගැන්වූ හෙතෙම දිනක් **අපරිදස්සි** භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා වැඩම වනු දුටුවේය. උන්වහන්සේ කෙරෙහි සිත පහදවා පසඟ පිහිටුවා වැඳ හිස්

ඇදිලි බැඳගෙන, ''යාවතා රූපිනෝ සත්තා'' යන ගාථා සයෙන් උන්වහන්සේට ස්තුතිකොට බඳුනක් පුරවා මී පැණි පිළිගැන්වීය. මී පැණි පිළිගත් ශාස්තෘන් වහන්සේ පුණ්‍යානුමෝදනා කළ සේක. මේ පින්කම්වල බලයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා පැමිණි ඔහු කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී කාෂ්ඨවාහන නම් රජුගේ ඇමතියකුව ඉපිද, එරජු විසින් ශාස්තෘන් වහන්සේ කැඳවාගෙන ඒම සඳහා පුරුෂයන් දාහක් සමඟ ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්ම ශ්‍රවණය කොට, ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වී වසර විසි දාහක් මහණ දම් පුරා ඉන් චුතව එක් බුද්ධාන්තරයක්ම දෙව්ලොව සැප විඳ්දේය. පසුව මේ බුද්ධෝත්පාද කාලයේ දී මෝඝරාජ නමින් බමුණු පවුලක උපන් හෙතෙම බාවාරි නම් බ්‍රාහ්මණ පඬිවරයා සමීපයේ ශිල්ප උගත්තේය. හටගත් සංවේගයෙන් ගිහිගේ කළකිරී තාපසයකු ලෙස පැවිදි වූ මෝඝරාජ, තවුසන් දාහක් පිරිවරා ගෙන අජිතාදී තවුසන් සමඟ ගුරුවරයා විසින් ශාස්තෘන් වහන්සේ සමීපයට යවන ලද්දේ, ඒ පිරිසේ පහළොස් වැනියාව සිට බුදුරදුන්ගෙන් ප්‍රශ්න විමසා එය විසඳා දුන් කල්හිම රහත් බවට පත් විය.

අපදාන පාළියේ මෝඝරාජ හිමියෝ මෙසේ පවසති.

''සියල්ල තමන් වහන්සේ ම අවබෝධ කරගත්තා වූ, අපරාජිත වූ අසාදෘස්සි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුව වීථියට පිළිපන් සේක. ශිෂ්‍යයන් විසින් පිරිවරා ගත් මම ගෙදරින් නික්මුණෙමි. නික්ම යන්නා වූ මම ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි. සිරසෙහි ඇඳිලි බැඳ බුදුරදුන්ට වැඳි මම සිත පහදවා ගෙන ලෝක නාථයන් වහන්සේ සමඟ පිළිසඳර කථා කළෙමි.

''යම් පමණ රූපාවචර බ්‍රහ්මයෝ වෙත් ද එසේම අරූපාවචර බ්‍රහ්මයෝ වෙත් ද අසංඥතල වැසි බ්‍රහ්මයෝ වෙත් ද ඒ සියලු දෙන ඔබ වහන්සේගේ ඤාණයෙහි ඇතුළත් වෙති. ඔබ නුවණට ඔවුහු පෙණෙති. යමෙක් කුඩා සිදුරු ඇති දැලක් දියේ ඔබන්නේ නම් දියේ කිසියම් ප්‍රාණියෙක් වෙත් ද ඒ සියලු දෙන දැස තුලට වැදගනිති. රූපී සත්ත්වයන්ගේ ද අරූපී සත්ත්වයන්ගේ ද යම් චේතනාවක් වේ නම් සියළුම ඒ චේතනාවෝ ඔබ වහන්සේගේ නුවණෙහි ඇතුලත් වෙති.''

''ඔබ වහන්සේ අදුරෙන් වැසුණු මේ ලෝකයා නඟා සිටුවන සේක. ඔවුහු ඔබ වහන්සේගේ ධර්මය අසා සැකය නම් සැඩපහර තරණය කරති. ලෝකවාසී සත්ත්වයෝ අවිද්‍යාවෙන් වසාගත්හ. මෝහන්ධකාරයෙන් වෙලී

පවතියි. ඔබවහන්සේගේ නුවණ බැබළෙන කල්හි ලෝවැසියෝ නැසූ මෝහන්ධකාර ඇත්තෝ වෙති. ඔබ වහන්සේ සැම දෙනාගේම මහා මෝහන්ධකාරය දුරු කරන්නා වූ ඇසක් වන සේක. බොහෝ ජනයා ඔබවහන්සේගේ ධර්මය අසා කෙලෙස් ගිනි නිවාගනිති.'' මෙසේ යාවතා රූපිනො සත්තා'' ආදී ගාථා භයකින් බුදුගුණ වැනූ මම; පිරිසිදු දඩුවෙල් බෑ මී පැණි සැළියක් පුරවා දෝතින්ම ගෙන ගොස් බුදුරජාණන් වහන්සේට පිදුවෙමි. ''මී වැළඳූ මහර්ෂී වූ මහා වීර වූ බුදුරජාණන් වහන්සේ අහසට නැඟී වැඩම කළ සේක. අහසෙහි සිටි නරශ්‍රේෂ්ඨ වූ අෂ්ටදස්සි ශාස්තෘහු මගේ සිත පහදවමින් මෙසේ වදාළහ.

''මෙසේ බුදුනුවණ යමෙකු විසින් පසසන ලද ද යමෙක් බුද්ධ ශ්‍රේෂ්ඨයන්ට ස්තුති කළේ ද ඔහු චිත්ත ප්‍රසාදය කරණ කොට ගෙන දුගතියකට නො යන්නේය. ඔහු දෙව්ලොව දාහතර වරක් දෙවිරජය කරන්නේය. පෘථිවි රජකම අටසිය වරක් කරමින් පොළවෙහි වෙසෙන්නේය. සක්විති රජව පන්සිය වරක් උපදින්නේය. පෘථිවියේ ලබන ප්‍රදේශ රාජ සම්පත් ගණන් කළ නොහැක. එසේ සැප විඳින මෙතෙම වේද හදාරන, මන්ත්‍රධර වූ වූ වේදතුයේ පරතෙරට ගියා වූ බමුණෙක්ව ගෞතම බුදුරදුන්ගේ සසුනෙහි පැවිදි වන්නේ ය. ගැඹුරු වූ සියුම් අර්ථ නුවණින් දැනගන්නා වූ මෙතෙම මෝඝරාජ නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේ ය. උතුම් සාත්තුවාහකයකු වැනි වූ ගෞතම බුදුපියාණන් වහන්සේ ත්‍රිවිද්‍යාවන්ගෙන් යුක්තව කොට නිම වූ බඹසර ඇති ව අනාශ්‍රව වූයේ අගතනතුරු ලබන්නේය.

''මම දැන් සියලු මානුෂීය ආකල්ප හැර භව බැඳුම් සිඳ සියලු ආශ්‍රව ප්‍රහාණය කොට අනාශ්‍රව ව වෙසෙමි. සියල්ල පිරිසිඳ දනිමි. දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටු කළෙමි.''

රහත්බවට පත්ව සෘජු, සුත්ත, රජන යනාදී රූක්ෂ ප්‍රතිපදා තුනෙන් යුක්ත වූ පාංශුකූල සිවුරු පෙර වූ බැවින් ශාස්තෘන් වහන්සේ දිනක් මෝඝරාජ හිමියෝ රූක්ෂ සිවුරු දරණ භික්ෂූන්ගෙන් අග්‍ර ස්ථානයට පත්කර වදාළහ.

ඊට පසු කාලයක පෙර කර්මයක් නිසා ශරීරයේ රුකවරණ නිසි පරිදි නොකළ හෙයින් තෙරුන්ගේ සිරුරේ දද පිළිකාදිය ඉපිද වර්ධනය විය. උන්වහන්සේ ''සෙනසුන කිළිටි වේ'' යැයි සිතා හේමන්ත ඍතුවේ පවා මගධ ක්ෂේත්‍රයේ පිදුරු ඇතිරිල්ලක් අතුරාගෙන වෙසෙති. මෝඝරාජ හිමියෝ දිනක් උපස්ථානය සඳහා ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ, වැඳ

එකත් පසෙක සිටියහ. පිළිසඳර කථාකිරීම් වශයෙන් එවිට ශාස්තෘන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

"ඡවිපාපක චිත්තහදයක මොඝරාජ සතතං සමාහිතො
හෙමන්තික සීතකාල රත්තියො භික්ඛු තුවංසි කථං කරිඝස සී" ති.

එහි "ඡවිපාපක" යනු දද කඩු, පිළිකාදියෙන් බිඳුණු සිරුරු ඇති බැවින් හීන වූ දුර්වල වූ නපුරු සම් ඇති. "**චිත්ත හදයක**" යනු ඉතිරි නොකොට කෙලෙස් ප්‍රහීණ කරන ලද බැවින්, බ්‍රහ්ම විහරණ ඇසුරු කිරීමෙන් හද වූ සුන්දර වූ සිත් ඇති. "මොඝරාජ" යනු ඒ භික්ෂුවට ඇමතීමයි. "**සතතං සමාහිතො**" අග්‍රඵල සමාධියෙන් නිතරම, සෑම කල්හි ම සන්සුන් සිත් ඇති ව, "**හෙමන්තික සීතකාල රත්තියො**" හේමන්ත කාලයේ (ඍතුවේ) සීතලින් බර වූ කළුම කළු වූ රාත්‍රීන්හි. මෙහි අත්‍යන්ත සංයෝගයේ දුතියා විභක්තිය යෙදී ඇත. "**හෙමන්තිකා සීතකා රත්තියො**" යනුවෙන් ද පිටක ග්‍රන්ථවල මෙය දක් වේ. එහි "**හෙමනිකා**" යනු හේමන්ත ඍතුවට අයත් වූ, හේමන්ත ඍතුවට ඇතුලත් වූ යන අර්ථයයි. "භික්ඛු තුවං සි" නුඹ පැවිදි වූවාහු. මෙසේ වූ නුඹට අන්‍යයන් සෙනසුන් කරවා නොදෙන කල්හි, නුඹ සංඝයාට අයත් (සාංඝික) සෙනසුන්වල නොපිවිස. "**කථං කරිඝසසී**" ගන්නෙහි ද?"යි ශාස්තෘන්හු විමසූහ. මෙසේ විමසූ කල්හි මෝඝරාජ හිමියෝ ඊට පිළිතුරු දෙමින් මෙම ගාථාව වදාළහ.

"සමපඤ්ඤ සඤ්ඤා මගධා කෙවලා ඉති මෙ සුතං
පලාලඵඤ්ඤකො සෙය්‍යං යථඤ්ඤෙ සුබජීවිනො" ති.

එහි "**සම්පඤ්ඤසඤ්ඤා**" සමෘද්ධ වූ ශස්‍ය ඇති, පැසුණු ගොයම් ඇති. "මගධා" මගධ රටෙහි. "මාගධා" නම් ජානපදීන් ගේ රජකුමරුවෝ මෙහි විසූ බැවින් එක ජනපදයක් වුවත් ආරූඪ වීම් වශයෙන් "මගධා" යැයි බහුවචනයෙන් තබන ලදී. "**කෙවලා**" මුලුමනිත්ම, සියලු. "**ඉති මෙ සුතං**" මෙසේ මවිසින් අසන ලදී. එහි මගධයෙහි යම් නොදක්නා ලද ප්‍රදේශයක් වේ නම් ඒ සඳහා අසන ලදුයි පවසන ලදී. ඉන් මෙම කාලයේ දී මගධයෙහි ඕනෑම තැනක විසීමට මා හට හැකි යැයි අදහස් වේ. "**පලාලඵඤ්ඤකො සෙය්‍යං යථඤ්ඤෙ සුබ ජීවිනො**" යම් සේ අනිත් භික්ෂූහු සැපසේ ජීවත් වෙමින්, සුදුසු සෙනසුන් ලබා, සුන්දර වූ ඇතිරිලි පොරෝනා සහිතව සැපෙන් නිදන්නාහු ද එසේම මම ද යටට පිදුරු ඇතිරිල්ල පමණක් ම අතුරා, මත්තෙහි ද හරහට ද පිදුරු සෙවිලි වලින් ම සිරුර වසා ඇති බැවින් පිදුරු සෙවූ සිරුරු ඇතිව. "**සෙය්‍යං**" හිඳීම, සයනය කිරීම කරන්නෙමි. තමන් වහන්සේගේ යථාලාභ සන්තෝෂය මෙහිදී ප්‍රකට කරන ලදී.

මෝඝරාජ ථේරගාථා අර්ථ විවරණාව නිමියේය.

2.5.4

"න උකඛිපෙ නො ච පරිකඛිපෙ පරෙ" යනු ආයුෂ්මත් **විසාඛ පංචාලිපුත්ත** තෙරුන්ගේ ගාථාවන්ය. ඒවා යේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන පින්දහම් රැස්කර ගත් සේක්, මීට කල්ප දාහතරකට පෙර දී ප්‍රත්‍යන්ත ගමක දිළිඳු කුලයක ඉපිද වැඩිවියට පත් වූහ. දිනක් එල වැල සොයමින් හැසිරෙන ඒ ගමේ මිනිසුන් සමඟ අරණ්‍යයට ගොස්, එහි දී එක් පසේ බුදුවරයකු දැක පැහැදුණු සිතින් උන්වහන්සේට වල්ලි එල දුන්නේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී මගධ රටෙහි මාණ්ඩලික රාජ කුලයක ඉපිද "**විසාඛ**" නමින් ද පංචාලි රජ දුවගේ පුතු බැවින් **පංචාලි පුත්ත** යනුවෙන් ද ප්‍රකට විය. පියා මියගිය කල්හි රජ වූ ඔහු ශාස්තෘන් වහන්සේ තම සමීපයට වැඩම කළ කාලයේදී උන්වහන්සේ වෙත ගොස්, ධර්ම ශ්‍රවණය කොට ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වී උන්වහන්සේ සමඟම සැවැත් නුවරට ගොස් විදසුන් වඩා නොබෝ කලකින්ම ෂඩ් අභිඥා උපදවා ගත් මහරහතන් වහන්සේ නමක් විය.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

"එකල සියලු ජනයා සමඟ පැමිණි මම වනයට ගියෙමි. එලවැල සොයමින් වනයේ හැසිරුණු අපි බොහෝ එලවැල නෙලා ගත්තෙමු. තමන් වහන්සේම සත්‍ය අවබෝධ කරගත්, අපරාජිත වූ පසේ බුදුවරයන් වහන්සේ කෙනෙකු දැක, පැහැදුණු සිත් ඇති මම සතුටු සිතින් වල්ලි ගෙඩියක් පිදුවෙමි. මීට කල්ප දාහතරකට පෙර යම් එල දානයක් දුන්නෙම් ද එදා සිට ම දුගතියක නූපන්නෙමි. එලදානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

ෂඩ් අභිඥා ලාභී වූ තෙරුන් වහන්සේ ඥාතීන්ට අනුකම්පාවෙන් නැවත උපන් බිමට වැඩම කළහ. එහි මිනිස්සු වරින් වර තෙරුන් වහන්සේ වෙත පැමිණ ධර්මශ්‍රවණය කිරීමට පුරුදු වූහ. එක් දිනක් "ස්වාමිනි! ධර්මකථිකයා කවර අංගයන්ගෙන් සමන්විත වූයේ ද?" යි මිනිස්සු ධර්මකථිකයාගේ ලක්ෂණ විමසූහ. තෙරුන් වහන්සේ ඔවුන්ට ධර්මකථිකයාගේ ලක්ෂණ පැවසීමට මේ ගාථා දෙක වදාළහ.

"න උකඛිපෙ, නොච පරිකඛිපෙ පරෙ
න ඔකඛිපෙ, පාරගතං න එරයෙ

න චත්තවණ්ණං පරිසාසු බ්‍යාහරෙ
අනුද්ධතො සමිතභාණී සුබ්බතො

සුසුඛමනිපුණත්ථං දෙසිනා
මතිකුසලෙන නිවාත වුත්තිනා

සංසෙවිත බුද්ධසීලිනා
නිබ්බාණං නහි තෙන දුල්ලභං'' නී.

මෙහි ''න උක්කිපෙ'' තමා හුවා නො දක්වන්නේය. ජාති ආදියෙන් ද බහුශ්‍රැත භාවාදියෙන් ද තමා උසස් කර දක්වීම නො කරන්නේය. **''නො ච පරික්කිපෙ පරෙ''** අන්‍ය පුද්ගලයන් ද එලෙසින්ම ජාති ආදියෙන් හෙළා නොදකින්නේය. ගුණ විනාශ කිරීම් වශයෙන් පහත් කර නො සලකන්නේ ය. අනුන් පහත් කොට නො බලන්නේය යන අරුත් ඇති **''න ඔක්කිපෙ''** යන්න මෙයටම සම්බන්ධය. ''අන්‍යයන්ට දොස් නො කියන්නේය'' යන අර්ථයයි. ඇතැම්හු මෙය **''න උක්කිපෙ''** යැයි කියති. එහි ද එම අර්ථයම ය. ''පාරගතං'' සංසාරයේ පරතෙරට මෙන් අභිඥාවන්හි පරතෙරට ගිය, ක්ෂීණාස්‍රව වූ ත්‍රිවිද්‍යාපත් ෂඩ් අභිඥාලාභී වූ රහතන් වහන්සේ නො ගටන්නේය. කම්පා නො කරන්නේය. පහර නො දෙන්නේය. **''න චත්තවණ්ණං පරිසාසු බ්‍යාහරෙ''**, තමාගේ වර්ණනාව, ගුණ ආදිය ලාභ සත්කාර කීර්ති අපේක්ෂාවෙන් ක්ෂත්‍රීය පිරිස් ආදියෙහි නො කියන්නේය. ''අනුද්ධතො'' යනු නොවිසිරුණු සිත් ඇතිව, නොසන්සුන් සිත් ඇත්තාගේ වචන නො පිළිගනියි. **''සමිතභාණී''**, මනාව පමණ දන කථා කරන්නේය. සුදුසු කාලයෙහි, කරුණු සහිත වූ මුල මැද අග යහපත් වූ අර්ථවත් වූ වචනම කථා කරන ස්වභාව ඇත්තේ යන අර්ථයයි. මෙයින් බැහැර වූ කථිකයාගේ වදන් නොපිළිගත යුත්තේය. **''සුබ්බතො''** යනු මනා වූ පැවතුම් ඇති සිල්වතෙක් වේ. **''සියා''** යන ක්‍රියාපදය රැගෙන මෙතැනට යෙදිය යුතුයි. මෙසේ ධර්ම කතිකයාගේ ලක්ෂණ ඉතා සංක්ෂිප්තව වදාළ තෙරණුවෝ එම ගුණ මහිම තමා කෙරෙහි ඇති බැවින්, ඒවායේ ස්ථිරව පිහිටා මහජනයා බොහෝ සේ පැහැදුණු බව දැන - ''මෙබඳු ගුණමහිම ඇති ධර්ම කථිකයාට සසරින් මිදීම අරමුණු කරගත්තහුට නිවණ දුර්ලභ නොවේ. ඉතා සුලභම වේ''යැයි දක්වමින් මේ **''සුසුඛුමනිපුණත්ථදසිනා''** යන දෙවන ගාථාව වදාළහ. එහි අර්ථ ඉහත පැවසූ පරිදිම දත යුතුයි.

විසාඛ පංචාලිපුත්ත තෙරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.6

''නදනති මොරා සුසිඛා සුපෙඛුණා'' යනු ආයුෂ්මත් චූලක තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කවරේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කල ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් රැස් කරමින් අවුත්, මෙයින් කල්ප තිස් එකකට පෙර පහළ වූ සිඛි නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටු කුලයේ ඉපිද වැඩිවියට පත් වූහ. ඔහු දිනක් ශාස්තෘන් වහන්සේ දැක, පැහැදුණු සිතින් ඡත්තපණ්ණි ඵලයක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර බමුණු පවුලක ''චූලක'' නමින් ඉපිද වැඩිවියට පත් විය. ධනපාල (නාලාගිරි) ඇතු දමනයේදී ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වූ චූලක හිමියෝ ඉන්දසාල ගුහාවෙහි වෙසෙමින් මහණදම් පිරූහ. උන්වහන්සේ දිනක් ගුහා දොරකඩ මේඝයක් ගැඹුරු - මිහිරි හඬ නංවමින් (ගොරවමින්) සිය දහස් ගණන් විදුලිය ගසමින්, කුඹුක් ගසක මුදුන මෙන් අහස පුරවා වැසි වැසීමට පටන් ගත්තේය. මොණර සමූහයා ද මේඝයේ ගර්ජනාව අසා තුටු පහටුව කේකාර හඬ නංවමින් ඒ ඒ දෙස නටමින් හැසිරුණහ. තෙරුන්ගේ ද ආවාසය තුළට වැසි සුලං හමාවිත් ටුරු වූ ග්‍රීෂ්මය ඇතිව, සන්සිඳුණු කරජකාය, සුසුසු වූ ඍතු සම්පත්ති ලැබීමෙන් යෝග්‍ය බවට පැමිණියේ සිත එකඟ විය. එනිසා සිත කමටහන් මාර්ගයට බැස ගත්තේය. මේ බව දැනගත් තෙරණුවෝ කාල සම්පත්තිය ප්‍රකටව දැක්වීම් වශයෙන් තමා භාවනාවට උත්සාහවත් කරමින් මේ ගාථා දෙක වදාළහ.

''නදනති මොරා සුසිඛා සුපෙඛුණා
සුනීලගීවා සුඛුමා සුගජ්ජිනො

සුසද්දලා චා පි මහාමහී අයං
සුඛ්‍යාපිතම්බු සුවලාහකං නභං

සුකල්ලරූපො සුමනස්ස ඣාය තං
සුනිඛ්ඛමො සාධු සුබුද්ධ සාසනෙ

සුසුඛක සුඛකං නිපුණං සුදුද්දසං
ඵුසාහි තං උත්තම මච්චුතං පදං'' ති.

මෙහි ''නදනති මොරා සුසිඛා සුපෙඛුණා සුනීලගීවා සුඛුමා සුගජ්ජිනෝ'' හිසෙහි උස්ව පිහිටි සුන්දර වූ ශිඛාවකින් සමන්විත බැවින් ''සුසිඛා'' නම් වූ, මනා සිළු ඇති. නානාවිධ වර්ණයන්ගෙන්, නොයෙක් සුන්දරත්වයන්ගෙන් යුක්ත හඳ වූ පිල්කළඹකින් යුතු බැවින් ''සුපෙඛුණා'' නම් මනා පිල් කළඹක් ඇති. රාජීව වර්ණයට සමාන වූ සුන්දර නිල්වන් ගෙලකින් සමන්විත වූ බැවින් ''සුනීලගීවා'' නිල්වන් මනා ගෙල ඇති, මුවක් (හොටයක්) ඇති බැවින් ''සුමුඛා'' මනා මුවතුඩු ඇති. මනෝඥ වූ නාද ඇති බැවින් ''සුගජ්ජිනෝ'' මනහර නාද ඇති. මයුරයෝ ඝඩිජ සංඛාදන සහිත කේකාර ශබ්දයෙන් නාද කරති. ගායනා කරති. ''**සුසඳ්ලාඛාපි මහාමගී අයං**'' මේ මහා පොළොව මනා වූ සුන්දර වූ නිල් තණ ඇත්තීය. ''**සුබ්‍යාපිතම්බූ**'' අභිනවයෙන් වැසි ලැබුණු බැවින් ඒ ඒ තැන මනාව ඉසී ගිය -පැතිර ගිය දිය ඇත්තීය. මනාව දිය වැල් ගලා ප්‍රදේශයම ප්‍රාණවත් කර ඇත. ''සුසුද්ධතම්බූ'' යන පාඨය ද යෙදේ. එහි අර්ථය ඉතා පිරිසිඳු දිය දහරා පැතිරී යන්නයි. ''**සුවලාහකං නභං**'' දක් වේ. අහස නිල් උපුල් ඇලි හා සමාන වූ හාත්පස මනාව පුරවා සිටි සුන්දර වළාවන්ගෙන් මේඝයන්ගෙන් පිරුණු, ''**සුකල්ල රූපෝ සුමනස්ස ඣාය තං**'' දන් යෝග්‍ය ඍතු සම්පත්තිය ලැබීමෙන් මනාවූ සිත් ඇතිව අතිශයින් යෝග්‍ය වූ භාවනාවට සුදුසු වූ ශරීර ඇත. එනිසා ධ්‍යාන වඩව. පංචනීවරණයන්ගෙන් දුරු වූ - නොමැඩලූ සිත් ඇති බැවින් සුන්දර සිත් ඇති යෝගාවචරයා ඒ ඒ ආරම්මණ හා ලක්ඛණාදි වශයෙන් ඇති කමටහනක් ගෙන ඒ අනුව ධ්‍යාන වඩව. ''සුනික්ඛමෝ - පෙ- අඩවුතං පදං'' මෙසේ ධ්‍යාන කරන්නෙක් ව මනා වූ, යහපත් වූ සම්මා සම්බුද්ධ ශාසනයෙහි, ගිහි ගෙන් යහපත්ව නික්මවූත් පැවිදිව ඉතා යහපත් වූ සිල් ඇතිව, යහපත් වූ පිරිසිඳු භාවයෙන් සියලුම කෙලෙස්වල වසඟතාවයට නොපැමිණි බැවින් යහපත් වූ, තීක්ෂණ වූ ප්‍රඥාවටම ගෝචර වන බැවින් තියුණු වූ, ඉතා ගැඹුරු බැවින් යහපත් වූ තීක්ෂණ වූ ප්‍රඥාවටම ගෝචර වන බැවින් තියුණු වූ, ඉතා ගැඹුරු බැවින් දැකීමට අපහසු වූ, ප්‍රණීත භාවයෙන් හා ශ්‍රේෂ්ඨ භාවයෙන් උතුම් වූ, නිත්‍ය වූ ස්වභාව ඇති බැවින් අමරණීය වූ නිර්වාණ ධර්මය ස්පර්ශ කරව! තමාම ප්‍රත්‍යක්ෂව අවබෝධ කර ගැනීමෙන් යහපත් පිළිවෙත සාක්ෂාත් කරගනුව !''

තෙරුන් වහන්සේ මේ අයුරින් තමන්ටම උපදෙස් දෙමින්, යෝග්‍ය වූ ඍතු සම්පත් ලැබීමෙන් සන්සුන් වූ සිත් ඇතිව විදසුනෙහි සිත පිහිටුවා රහත් බවට පත්වූහ. උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''පසළොස්වක් පුන් පෝදින සඳ මෙන් ද බබළන කිරිණිහිරි රුකක් මෙන් ද දිළිසෙන පන් ගසක් මෙන් ද බබළන්නා වූ ලෝක නායකයන්

වහන්සේ දුටුවෙමි. එකල මම ඡත්තපණ්ණි ඵලයක් ගෙන ශාස්තෘන් වහන්සේට පිළිගැන්වූයෙමි. මීට කල්ප තිස් එකකට පෙර මම යම් ඵල දානයක් දුන්නෙමි ද එතැන් පටන් මේ දක්වා මම දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ තෙරණුවෝ තම පිළිවෙත සිහිපත් කිරීමෙන් උපන් ප්‍රීති සොම්නස්භාව ඇතිව, ''**තදනන්‍ති මොරා**'' ආදී ගාථා දෙක නැවත වදාළහ. එනිසා මෙම ගාථා දේශනාවම උන්වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම ද විය.

චූලක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.7

''**නන්‍දමානාගතං චිත්තං**'' යනු ආයුෂ්මත් අනූපම තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කවරේ ද? පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේදී නිවන් පතාගෙන පින් දහම් රැස් කරගෙන පැමිණ, මීට කල්ප තිස් හතකට පෙර දී සිටු කුලයක උපන් උන්වහන්සේ; තුරුණුවියට පත්ව දිනක් පදුම නම් පසේ බුදුරජාණන් වහන්සේ වීථියෙහි පිඬු පිණිස හැසිරෙනු දැක - පහන් සිතින් රැක් අඟන මලින් (ආකුලි පුප්ඵ) උන්වහන්සේ පිදූහ. ඒ පින්කමේ විපාක ලෙස දෙව් මිනිස් දෙගතියේ සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේ දී කොසොල් රට ධනවත් පවුලක ඉපිද අපමණ වූ රූප සම්පත් ලැබීමෙන් අනූපම යන නම ලබා නිසිවියට පත්වත්ම උපනිශ්‍රය සම්පත් නිසා කාමයන් හැර දමා පැවිදිව විදසුන් කමටහන් වඩමින් අරණ්‍යයෙහි විසූහ. උන්වහන්සේගේ සිත බාහිර අරමුණුවල දුවයි. කමටහනෙහි සිත බිඳ වැටේ. අනූපම තෙරණුවෝ ඔබිනොබ දුවයන සිතට නිග්‍රහ කරමින් මේ ගාථා දෙකින් අවවාද කළහ.

''නන්‍දමානාගතං චිත්තං සූලමාරොපමානකං
තෙන තෙනෙව චජසි යෙන සූලං කලිංගරං

නාහං චිත්තකලිං බ්‍රූමි, තං බ්‍රූමි චිත්ත දුබ්භකං
සත්‍ථා තෙ දුල්ලභො ලද්ධො, මානසෙ මං නියොජයී'' ති.

මෙහි ''නඤ්ඤමානාගතං චිත්තං'' සතුටුවෙමින් ආවාවූ, ඒ ඒ භවයෙහි සතුටුවෙමින් යම් තණ්හාවක් නිසා ආවා වූ ඒ ඒ තැන ඇලෙමින් සතුටුවෙමින් පැවති සංසාරික වූ සිත. මේ භවයට ද සතුටුවෙමින් ප්‍රීතිවෙමින් පැමිණියේය. උපන්නේ ය. ''සූලමාරොපමානකං'' සත්ත්වයා දුකෙහි පිහිටුවන බැවින් හුලක් බඳු වූ. කර්මක්ලේෂයන් විසින් ඒ ඒ භවයෙහි මෙපමණ කාලයක් හට නමැති හුලට නැංවූයෙමි. ''**තෙන තෙනෙව වජසි යෙන සූලං කලිංගරං**'' හුල නම් වූ භවය යම් යම් තැනකට යයි ද ඒ ඒ තැනට දම්ගෙඩිය නම් වූ කාමගුණද පැමිණේ. ඒ ඒ තැන්වලට පාපී සිත ගමන් කරයි. ඒ ඒ භවයට යෑමෙන් තමාට වන අනර්ථය නොසලකයි.

''නාහං චිත්ත කලිං බ්‍රූමි'' එනිසා, ප්‍රමාදී වන බැවින් ''එම්බා චිත්තය ! නුඹ කාලකණ්ණියෙකි''යි මම කියමි. නැවත ද මම එය කියමි. ''එම්බා චිත්ත ද්‍රෝහිය ! සිත නැමති තමාට බොහෝ උපකාර කරන සන්තානයට අනර්ථ ඇති කරන බැවින් නුඹ ද්‍රෝහියෙකි''යි මම කියමි. ''**චිත්ත දුබ්භකං**'' යනුවෙනි. මෙය ''**චිත්ත දුබ්භගා**'' ලෙස ද යෙදේ. ''සිත නම් වූ අභාග්‍ය සම්පන්න, අල්ප පින් ඇත්ත'' යන අර්ථයයි. මෙසේ කුමක් නිසා කියමි ද? ''**සත්ථා තෙ දුල්ලභෝ ලද්ධා මානත්තෙ මං නියොජයී**'' කල්ප අසංඛ්‍ය ගණනක් ලෝකය බුදුවරුන්ගෙන් ශූන්‍යව පවතී. ශාස්තෘන් වහන්සේ පහළ වූ කල්හි දු මිනිසත් බව ලබාගැනීම් ආදිය ද අතිශයින් දුර්ලභම වේ. මිනිසත් බව ලැබුවත් ඔවුන්ට ශාස්තෘන් වහන්සේ දැකීම - ධර්මශ්‍රවණය දුර්ලභ වේ. ''මෙසේ දුර්ලභ වූ ශාස්තෘන් වහන්සේ දැකීමට නුඹට හැකි විය. එය ලත් අවස්ථාවෙහි, දැන් මෙම අවස්ථාවෙහි මම අනර්ථයෙහි, අහිත දෙයෙහි යොදවා අනාගතයේ ද මාහට අනර්ථ වූ දුක් වූ අකුසල ධර්මයන්හි මා නොයොදව !'' තෙරණුවෝ මෙසේ තම සිතට අවවාද දී, සිත දමනය කර විදසුනෙහි සිත වඩා රහත් බවට පත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''එකල චිත්‍රකූට පර්වතයේ පදුම නම් පසේ බුදුහු වැඩ විසූහ. සියල්ල තමන් වහන්සේම අවබෝධ කරගත්, අපරාජිත වූ බුදුපියාණන් වහන්සේ දුටු මම පිපුණු රුකඟුන ගසකින් මල් නෙලාගෙන, පස්මරුන් දිනූ පදුම බුදුරදුන් වෙත ගොස් ඒ මල් පිදුවෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. මල් පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

අනූපම ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.8

''**සංසරං දීඝමද්ධානං**'' යනු ආයුෂ්මත් වජ්ජිත තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ඒ ඒ භවයේදී නිවන් පතාගෙන පින්දහම් රැස්කරමින් අවුත්, මීට කල්ප හැටපහකට පෙර එක් ප්‍රත්‍යන්ත ගමක උපන්හ. වැඩිවියට පත්ව වනයේ හැසිරෙන්නෙක් වූ ඔහු දිනක් උපශාන්ත නම් පසේ බුදුරදුන් පර්වත ගුහාවක වෙසෙනු දුටුවේය. උන්වහන්සේ සන්සුන් පැවතුම් දැක පැහැදුණු සිත් ඇති වැදි තෙම සපුමලින් බුදුන් පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්මිනිස් දෙගතියේ සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේදී කොසොල් රට ධනවත් පවුලක උපන් එකුමරු, උපන් දිනයේ පටන්ම ස්ත්‍රියකගේ අතට ගියවිට හඬයි. බඹලොවින් චුතව මෙහි උපන් බැවින් ස්ත්‍රී ස්පර්ශය නො ඉවසයි. ඒ කුමරා ස්ත්‍රී ස්පර්ශය වර්ජිත වූ බැවින් ''**වජ්ජිත**'' නම් තබන ලදී. තුරුණුවියට පත්ව ශාස්තෘන් වහන්සේගේ යමා මහ පෙළහර දුටු වජ්ජිත, ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි විය. විදසුන් වඩා එදිනම ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් වූ උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''එකල උපශාන්ත නම් පසේ බුදුරජාණන් වහන්සේ පර්වත ගුහාවක වාසය කළහ. ඒ නරෝත්තමයන් වහන්සේ සමීපයට එක් සපුමලක් ගත් මම ගියෙමි. අපරාජිත වූ තථාගතයන් වහන්සේට දෝතින්ම ඒ මල පිදුවෙමි. මීට කල්ප හැටපහකට පෙර යම් පුෂ්ප පූජාවක් ම විසින් කළෙමි ද එදා සිට අද දක්වා මම දුගතියක නූපන්නෙමි. මල් පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලාභී වූ උන්වහන්සේ තම පෙර විසූ කඳ පිළිවෙල සිහිපත් කර බලා ධර්ම සංවේගයට පත් වූ සේක්, මේ ගාථා දෙක වදාළහ.

''සංසරං දීඝමද්ධානං ගතීසු පරිවත්තියං
අපස්සං අරිය සච්චානි අන්ධභූතෝ පුථුජ්ජනෝ

තස්ස මේ අපපමත්තස්ස සංසාරා විනළීකතා
ගති සබ්බා සමුච්ඡින්නා, නත්ථි දානි පුනබ්භවෝ'' ති

මෙහි ''**සංසරං**'' යනු ඒ ඒ භවයෙහි සැරිසරමින් දැඩිව ගැනීම්, බැඳගැනීම් වශයෙන් නැවත නැවත ඒ ඒ භවයේ හැසිරුණෙමි. ''**දීඝමද්ධානං**''

බොහෝ කාලයක්, අනාදිමත් සසර, අප්‍රමාණ කාලයක්. ''**ගතීසු**'' සැප දුක් කර්මයන්ගේ විපාක වශයෙන් සුගති දුගති ආත්ම භාවයන්හි. ''**පරිවත්තිසං**'' ගැටෙන්නාක් මෙන් පෙරළෙමින් චුති-උප්පත්ති වශයෙන් නැවත නැවත පෙරළෙනෙමි. ඉපදුනෙමි. එසේවීමට හේතු මෙසේ දක්වයි. ''**අපස්සං අරිය සච්චානි අන්ධභූතො පුථුජ්ජනො**'' දුක්ඛාදි චතුරාර්ය සත්‍ය ධර්මය නුවණැසින් නුදුටු, අවබෝධ නොකළ බැවින් ම අවිද්‍යාවෙන් අන්ධ වූ හෙයින් අන්ධ වූ. වෙන්ව සිතමින්, වෙන්වීම් ජනනය කරන බැවින් ''**පුථුජ්ජන**'' නම් වූ පුහුදුන්-නූගත් වූ බැවින් සසර ඒ ඒ ගතිවල සැරිසැරුවෙමි. මෙනිසා බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ. ''මහණෙනි! මම ද නුඹලා ද මේ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ නොකළ, ප්‍රත්‍යක්ෂ නොකළ බැවින් මේ දීර්ඝ සංසාරයෙහි සැරිසැරුවෙමු.'' ඉහතින් පැවසූ ලෙසම පෙර පුහුදුන්ව සසර සැරිසැරූ මම දැන් ශාස්තෘන් වහන්සේ පෙන්වූ මාර්ගය අනුගමනය කිරීමෙන් අප්‍රමාදීව - අප්‍රමාදී පිළිවෙතින් කටයුතු කර සමථ-විදර්ශනා භාවනාවන් මස්තකප්‍රාප්ත කොටගෙන සිටියෙමි. ''**සංසාරා විනළීකතා**'' මෙහි සත්ත්වයෝ සැරිසරනුයි ''**සංසාර**'' නම් වූ සංසාරික පැවැත්මට හේතුවන කර්ම ක්ලේෂයන් අග්‍රමාර්ගයෙන් මුළුමනින්ම සිඳලූයෙමි. ක්‍ෂය කෙළෙමි මුල් නැති කළෙමි. ''**ගති සබ්බා සමුච්ඡින්නා**'' මෙසේ සසර පැවැත්මට හේතුවන කර්ම ක්ලේෂයන් මුලිනුපුටා දැමූ හෙයින් නිරය ආදී වූ සියලුම ගතිවල මතු ඉපදීම නැති කළෙමි. විද්වංසනය කළෙමි. එසේ ම ''මා හට මතු නැවත පුනර්භවයක් නැත''. මෙම ප්‍රකාශයම තෙරුන්ගේ රහත් බව පැවසීම විය.

වජ්ජිත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

2.5.9

''අසසතෙ හරිතොහාසෙ'' යනු ආයුෂ්මත් සඤ්ඣිත තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති උන්වහන්සේ ද ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් පැමිණ, මින් කල්ප තිස් එකකට පෙර පහළ වූ **සිබි** නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී එක් ගොපල්ලෙක් ව උපන්හ. ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි එක්තරා තෙර නමකගෙන් බුදුගුණ ඇතුළත් ධර්ම දේශනාවක් ශ්‍රවණ කළ ගොපලු තෙම පහන් සිතින් ''භාග්‍යවතුන් වහන්සේ කොහිද?''යි

ඇසීය. උන්වහන්සේ පිරිනිවි බව අසා ''මෙසේ මහානුභාව සම්පන්න බුදුවරු පවා අනිත්‍ය ධර්මයට පත්වෙති. අහෝ සංසාරය අස්ථිරය. අනිත්‍යය'' යනුවෙන් අනිත්‍ය සංඥාව උපදවා ගත්තේය. ධර්මදේශනා කළ තෙරණුවෝ ඔහු බෝධි පූජාවට යොමුකළහ. ඉන්පසු ඔහු වරින් වර බෝ ගස සමීපයට පැමිණ බුදුගුණ සිහිකරමින් බෝධියට වන්දනා මාන කළේය.

මේ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී කොසොල් රට ධනවත් පවුලක ඉපිද, ''**සඤ්ඡිත**'' යැයි ප්‍රකට විය. වැඩිවියට පත්ව අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම කථාවක් අසා සංවේග උපදවා ගෙන පැවිදි වූ සඤ්ඡිත හිමියෝ විදසුනෙහි සිත පිහිටුවා, ඤාණයේ මුහුකුරායෑමක් සමඟ නොබෝ දිනකින් ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් වූහ. තම පෙර විසූ කඳ පිළිවෙල සිහිපත් කළ උන්වහන්සේ සිබි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ සිදුකළ බෝධි වන්දනාව, බුද්ධ පූජාව හා අනිත්‍ය සංඥා ප්‍රතිලාභය සිහිපත් ව, ඒ ආශ්‍රයෙන් දැන් තමන්වහන්සේගේ විශේෂාධිගමය ප්‍රකාශ කිරීමට මේ ගාථා දෙක වදාළහ.

''අසසතෝ හරිතොහාසෙ සංවිරූළහම්හි පාදපෙ
එකං බුද්ධගතං සඤ්ඤං අලභිතෝං පනිසසතො

එකනිංසෙ ඉතො කපෙ යං සඤ්ඤං අලභිං තදා
තස්සා සඤ්ඤාය වාහසා පත්තෙතා මෙ ආසවක්ඛයෝ'' තී.

මෙහි ''**අසසතෝ**'' සැනසීම (අශ්වත්ථ) ලැබූ තැන, දැන් අපගේ භාග්‍යවතුන් වහන්සේගේ බෝධි වෘක්ෂය වූ ඇසතු ගස තිබෙන තැන එදා සිබි භාග්‍යවතුන් වහන්සේගේ ඇටඹි බෝ රුක විය. එය සැනසීම ලබාදෙන (සියලු බුදුවරුන්ටම) ස්ථානයේ පිහිටි හෙයින් '**අස්වත්ථ**'' නම් විය. සත්ත්වයන්ට ආශ්වාස (සැනසීම) උදාකර දෙන බැවින් අස්සත්ථ නම් වේ. ඇතැම්හු ඇසතු බෝ රුක මූල හිඳ එදා බුද්ධානුස්සතිය වැඩූ බැවින් තෙරුන් වහන්සේ ''**අසසතෝ**'' යැයි පැවසූ බව කියති. ''**හරිතොහාසෙ**'' කොළපාට වූ ස්ඵටික මාණික්‍යමය වර්ණයෙන් බබළන ''**සංවිරූළහම්හි**'' මනාව වැඩුණු, මනාව පිහටි, සත විචිත්‍ර කොළ, දළු වලින් වැඩී වැසීගත් යන අර්ථයයි. ''**පාදපෙ**'' වෘක්ෂයේ ''**එකං බුද්ධගතං සඤ්ඤං අලභිතෝං පනිසසතො**'' බුද්ධාරම්මණය, අරමුණේ එකම ස්වභාව ඇති බැවින් එකම අරමුණකි. ''**ඉතිපිසො භගවා**'' ආදී වශයෙන් බුද්ධානුස්සති සංඥාව බුදුගුණ හෝ බුදුවරු පිළිබඳ පිහිට වූ සිතැති බැවින් ඒ පිළිබඳ සිහියෙන් යුක්තව.

එම බුද්ධ සංඥාව කවර දිනෙක උපදවා ගත්තේ ද? යන්න දැක්වීමට ''එකනිංසෙ ඉතො කප්පෙ'' යනුවෙන් මේ මහා භද්‍ර කල්පයට පෙර ආරෝහණ වශයෙන් තිස් එක් වන කල්පයේදී ය. ''යං සඤ්ඤං'' යම් ඒ බුද්ධානුස්සති සහගත වූ සංඥාවක්. යම් ඒ බුදුවරුන්ගේ පවා අනිත්‍යතාව දැක, එය සිහිපත් කිරීමෙන් සියලු සංස්කාරයන් පිළිබඳව අනිත්‍ය සංඥාව ලැබුවෙමි. ''තසසා සඤ්ඤාය වාහසා'' මෙසේ දැක්වූ සංඥාව හේතුවෙන්, එය උපකාරීවීමෙන් දැන් මම ආශ්‍රවයන් ක්‍ෂය කළෙමි. දැන් මම අනාශ්‍රව වූයෙමි නිවණ අවබෝධ කළෙමි. මේ තෙරුන්ගේ අපදාන පාළියේ එන ගාථා දෙක ද මෙය ම වේ.

''පළාවන් පැහැ ඇති මනාව වැඩුණු බෝ රුක් මුල සිහියෙන් යුතුව හුන්නෙමි මේ බුද්ධානුස්සති සංඥාව ලැබුවෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් බුද්ධානුස්සති සංඥාවක් ලැබුවෙමි ද, එහි බලයෙන් මම ආශ්‍රවයන් ක්‍ෂය කළෙමි. මීට කල්ප දහතුනකට පෙර දී සත් රුවනින් බබළන මහත් බල ඇති ධම්මික නම් ක්‍ෂත්‍රියෙක් වීමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය කරන ලද්දෙමි.

සන්ධිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

පස්වන වර්ගයේ ගාථා වර්ණනාව සමාප්තයි.

දුක නිපාතයේ අර්ථ වර්ණනාව නිමියේය.

3.1.1

''අයොනිසුදධිමන්වෙසං'' යනු ආයුෂ්මත් අංගණික භාරද්වාජ තෙරණුවන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම සඳහා පින්දහම් රැස්කරගෙන අවුත්, මීට කල්ප තිස් එකකට පෙර පහළ වූ සිඛී නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද වැඩිවියට පත් වූහ. දිනක් ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස හැසිරෙනු දැක පහන් සිතින් පසඟ පිහිටුවා උන්වහන්සේට වැඳ ඇඳිලි බැඳගෙන සිටියේය. ඔහු ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරමින් පැමිණ මේ බුද්ධෝත්පාද කාලයේ දී හිමවත සමීපයේ වූ ''උක්කට්ඨ'' නම් නුවර මහත් ධනවත් බමුණු ගෙයක ඉපිද **අංගණික භාරද්වාජ** යැයි ප්‍රකට විය. වැඩිවියට පත් ඒ බමුණු කුමරු සිප් සතර හදාරා අවසන, ගිහිගෙන් නික්මීමේ අදහස් ඇති වූ බැවින් පිරිවැජියෙකු ලෙස පැවිදිව පඤ්චතාපනාදී අමර තපස් කරමින් ඒ බමුණු කුමරු සිප් සතර හදාරා අවසන, ගිහිගෙන් නික්මීමේ අදහස් ඇතිවූ බැවින් පිරිවැජියෙකු ලෙස පැවිදිව පඤ්චතාපනාදී අමර තපස් කරමින් ඒ ඒ තැන හැසිරුණේය. දිනක් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ජනපද චාරිකාවේ හැසිරෙනු දැක පැහැදුණු සිතින් උන්වහන්සේ වෙත පැමිණ ධර්ම්ශ්‍රවණය කළ පිරිවැජි තෙම, මිසදිටු ගැනීම් අත්හැර සසුනේ පැවිදි විය. විදසුන් කමටහන වැඩූ උන්වහන්සේ නොබෝ දිනකින්ම ඔඩ අභිඥා ලාභී වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''ශ්‍රේෂ්ඨ උතුම් වූ ධීර වූ මහර්ෂී වූ කෙලෙස් සතුරන් ජයගන්නා සුලු වූ ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට සතුටු සිතින්, පැහැදුණු සිතින් මම වැන්දෙමි. මීට කල්ප තිස් එකකට පෙර දී යම් බුදුවරයෙකුට මම වැන්දෙමි ද එතැන් සිට මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුද්ධ වන්දනාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ඔඩ අභිඥා ලාභීව විමුක්ති සුව විඳිමින් විසූ උන්වහන්සේ ඤාතීන්ට අනුකම්පා පිණිස තම උපන් බිමට වැඩමවා දහම් දෙසමින් බොහෝ ඤාතීහු සරණ සිල්හි පිහිටුවා, ඉන්පසු කුරු රට කුණ්ඩිය නම් නියම් ගම සමීපයේ වූ අරණ්‍යයක විසූහ. කිසියම් කටයුත්තකට උග්ගාරාමයට ගිය

උන්වහන්සේට උත්තරා පථයෙන් පැමිණි, පෙර දැක පුරුදු හිත මිත්‍ර බමුණු පිරිසක් හමු විය. ඔවුහු තෙරුන් හැඳිනගෙන, ''පින්වත් භාරද්වාජය! නුඹ කුමක් දැක බමුණු දහම හැර දමා මේ බුදුසමය පිළිගත්තෙහි ද?''යි විචාළහ. එවිට ඔවුන්ට ''මේ බුදු සසුනින් පිටත් වෙනත් දහමක සංසාර ශුද්ධියක් නැත''යි පවසමින් තෙරණුවෝ මේ පළමු ගාථාව වදාළහ.

''අයොනි සුද්ධිමන්වෙසං අගහිං පරිචරිං වනෙ,
සුද්ධිමගගං අජානන්තා අකාසිං අමරං තපං'' ති.

එහි ''අයොනි'' අනුවණින්, අනුපායයෙන් ''**සුද්ධිං**'' සංසාර ශුද්ධිය, භවයෙන් මිදීම. ''**අන්වෙසං**'' සොයමින්, පරීක්ෂා කරමින්. ''**අගහිං පරිචරිං** වනෙ'' මේ ශුද්ධි මාර්ගය'යි යන අදහසින් වනයේ ගිනි ශාලාවක්, ගිනි ගෙයක් කොට යාග ද්‍රව්‍ය ගිනිදෙවියා පිදුවෙමි. වේද ග්‍රන්ථයන්හි පැවසූ පරිදි ගිනි දෙවි පිදුවෙමි. ''**සුද්ධිමගගං අජානන්තා අකාසිං අමරං තපං**'' සසරින් මිදෙන නිවන් මග නොදත් මම ගිනි පිදීම මෙන්ම ''පඤ්ච තාපන ආදී ශරීරයට දැඩි දුක් දෙන ක්‍රියාමාර්ගවලින් (අත්තකිලමථානුයෝගයෙන්) පිරිසිදු වන මඟ යැ''යි යන අදහසින් හැසිරුණෙමි. එම ඉගැන්වීම් පිළිපැද්දෙමි. මෙසේ මේ තෙරණුවෝ අසපුවෙන් අසපුවට යන්නාක් මෙන් වේදයෙහි කී පරිදි ගිනි පිදීම් ආදී දෙයින් සංසාරික ශුද්ධියක් නොලැබූ බව දක්වා, බාහිර සමයන්හි මිදීමක් නොමැති බව පෙන්වා දී දැන් ''මේ බුදුසසුනෙහි දී ම විසින් සංසාරික ශුද්ධිය අවබෝධ කළෙමි''යි දක්වමින් මේ දෙවන ගාථාව වදාළහ.

''තං සුඛෙන සුඛං ලද්ධං පස්ස ධම්ම සුධම්මතං
තිසෙස්සා විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධස්ස සාසනං'' ති.

එහි ''තං'' යම් ඒ අර්ථයක් සඳහා වූ සංසාරික ශුද්ධියක් සොයමින්, එය ලබා ගන්නා නිවැරදි මඟ නොදැන ගිනිපිදීම්, අමර තපස් කරන ලද්දෙමි ද, ඒ නිවන් සැපය සමථ විදර්ශනාදී සුවය සඳහා වූ ප්‍රතිපදාවෙන් අත්තකිලමථානුයෝගයට නොපැමිණි ම විසින් ලැබුවෙමි. පැමිණියෙමි. අවබෝධ කළෙමි. ''**පස්සධම්ම සුධම්මතං**'' ශාස්තෘන් වහන්සේගේ ශාසන ධර්මයේ සුධර්මත්වය හෙවත් විපරීත නොවූ නෛයර්‍යාණික ධර්ම ස්වභාවය බලවු. දැනගනිවු. යනුවෙන් ධර්මයට ඇමතීම් වශයෙන් කියයි. නැතිනම් තමාටම ආමන්ත්‍රණය කරයි. එම උතුම් නිවන් සැපත හෙවත් සංසාරික ශුද්ධි තමා ලබාගත් බව දක්වමින්, ''**තිසෙස්සා විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං**''යි ''ත්‍රිවිද්‍යා ලැබුවෙමි. බුදුරදුන්ගේ අවවාදය කරන ලදී''

පැවසූහ. එහි අර්ථ ඉතා ප්‍රකටය. මෙසේ විමුක්තිය අවබෝධ කරගත් බැවින්, ''එතැන් පටන් මම පරමාර්ථ වශයෙන්ම බ්‍රාහ්මණයෙක් වීමි''යි දක්වමින් මේ තෙවන ගාථාව වදාළහ.

''බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං, ඉදානි බොමහි බ්‍රාහ්මණෝ
තෙවිජ්ජා නහාතකෝ චම්හි සොත්ථියෝ චම්හි වෙදගූ''

මෙහි අර්ථ මෙසේ ය - මීට පෙර මම ජාති මාත්‍රයෙන්, ප්‍රඥප්ති වශයෙන් බ්‍රාහ්මණයෙක් වූයෙමි. බ්‍රාහ්මණයන්ගේ හැඳින්වීම් අනුව ''බ්‍රහ්ම බන්ධු'' නම් වූයෙමි. දැන් පාප ධර්ම බැහැර ලූ බැවින් අර්හත් මාර්ගාවබෝධයෙන් පරමාර්ථ වශයෙන්ම ''**බ්‍රාහ්මණයෙක්**'' වීමි. මීට පෙර භව රැස් කරන ත්‍රිවේද නම් විද්‍යාවන් අධ්‍යයනය කිරීමෙන් ප්‍රඥප්ති වශයෙන් ''**තේවිජ්ජ**'' නම් වූයෙමි. දැන් භව ක්ෂය කරන්නා වූ විද්‍යාවන්ගේ වශයෙන් ත්‍රිවිද්‍යා අවබෝධ කරගත් බැවින් පරමාර්ථ වශයෙන් ම ''**තේවිජ්ජ**'' නම් වෙමි. එසේම මීට පෙර දී භවාශ්වාදයේ ගැලුණු බැවින් නහාතක වූතය සමාදන් වූ බැවින් ප්‍රඥප්ති වශයෙන් '**ස්නාතක**' නම් වූයෙමි. දැන් ආර්ය අෂ්ඨාංගික මාර්ග නම් ජලයෙහි මනාව සෝදා හළ කෙලෙස් මල ඇති බැවින් පරමාර්ථ වශයෙන්ම ''නහාතක'' නම් වෙමි. මීට පෙර දී භවාශ්වාදයේ අධිකව ඇලී මන්ත්‍රධර වූ බැවින් ප්‍රඥප්ති වශයෙන් සොත්ථිය නම් බ්‍රාහ්මණයෙක් වූයෙමි. දැන් මනාව මිදුණු භවාශ්වාද ඇති ධර්මධර වූයෙමි පරමාර්ථ වශයෙන්ම සොත්ථිය නම් වෙමි. මීට පෙරදී පාප ධර්ම අත් නොහැරම වේදත්‍රය ඉගෙනගත් (හදාළ) පමණින් ''වෙදගූ'' නම් වූයෙමි. දැන් වේද නම් වූ ආර්ය මාර්ග ඤාණයෙන් සංසාර මහෝඝයේ පරතෙරට චතුරාර්ය සත්‍යාවබෝධයෙන් ගිය බැවින්, අවබෝධ කරගත් බැවින්, දැනගත් බැවින් පරමාර්ථ වශයෙන්ම වෙදගූ නම් වෙමි. මේ ගාථාත්‍රය ඇසූ බමුණෝ බුදුසසුන පිළිබඳව සිය මහත් වූ ප්‍රසාදය පළකළහ.

අංගණික භාරද්වාජ ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.2

''**පඤ්චාහාහං පබ්බජිතො**'' යනු ආයුෂ්මත් පච්චය තෙරුන්ගේ ගාථාවන් ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ

කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස් කරමින් අවුත්, මීට කල්ප අනූ එකකට පෙර විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද වැඩිවියට පත් වූහ. එක්දිනක් ශාස්තෘන් වහන්සේ චිනකා නම් නදී තීරයේ වැඩම කරනු දැක පහන් සිතින් ඉතා රසවත් වූ මහත් දිඹුල් ඵලයක් ගෙන පූජා කළේය. හෙතෙම ඒ පින්කමේ විපාක වශයෙන් කාම සුගතීන්හි ම සැරි සරා මේ මහා භද්‍ර කල්පයේ දී කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව, පැවැත්වූ දම්සක් දෙසුම් ඇතිව හික්මවිය යුතු ජනයාට අනුග්‍රහ කරන කල්හි උන්වහන්සේගේ සසුනේ පැවිදි විය. පැවිදි වී විදසුනෙහිම සිත පිහිටුවා භාවනාවෙහි නිරත වූයේ, දිනක් උන්වහන්සේ සසර දුක් සිහිකර, අතිශයින්ම සංවේගයට පත්වූයේ විහාරයේ හිඳගෙන ම "රහත් නොවී මෙතැනින් නික්ම නොයමි" යි දැඩි අධිෂ්ඨානයෙන් වෑයම් කළ නමුත් ඤාණය (නුවණ) මුහුකුරා නොගිය බැවින් සිත විදර්ශනාවට නංවා ගැනීමට අපොහොසත් වූහ. ඉන් කලුරිය කර දෙව් මිනිසුන් අතර සැපවිඳි ඔහු මේ බුද්ධෝත්පාද කාලයේදී රෝහිණී නුවර ක්ෂත්‍රිය රජ කුලයේ ඉපිද, පච්චය නමින් ප්‍රකට විය. වැඩිවියට පත්ව පියාගේ ඇවෑමෙන් රාජ්‍යයේ පිහිටි පච්චය තෙමේ දිනක් මහාරාජ බලියක් කරවීමට පටන් ගත්තේය. එහි උත්සවය බැලීමට මහාජන සන්නිපාතයක් විය. ඒ මහා සමාගමයේදී ඔහුට ප්‍රසාදජනනය කිරීම සඳහා ශාස්තෘන්වහන්සේ මහජනයාට පෙනෙමින්ම අහසෙහි වෛශ්‍රවණ විසින් මැවූ රුවන්මය කුළුගෙයි රුවන්මය සිංහාසනයේ වැඩහිඳ දහම් දෙසූ සේක. එහිදී මහත් ජනකායක් ධර්මාවබෝධ කරගත්හ. එසේ දෙසූ දහම් ඇසූ පච්චය රජු ද රජකම හැරදමා පූර්ව හේතුසම්පත් ඇති බැවින් සසුනේ පැවිදි විය. ශ්‍රද්ධාවෙන් පැවිදි වූ පච්චය තෙරණුවෝ එදා කාශ්‍යප බුද්ධ ශාසනයේ ප්‍රතිඥා කලාක් මනේම ප්‍රතිඥා තබා විහාරයට පිවිස විදසුන් භාවනාව වැඩූහ. එවිට උන්වහන්සේගේ ඤාණය මුහුකුරා ගොස් තිබූ බැවින් එකෙණෙහිම රහත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේ දී මෙසේ වදාළහ.

"පුරුෂෝත්තම වූ බුදුරජාණන් වහන්සේ විනතා ගංතෙර වැඩ විසූහ. මම එකල සන්සුන් වූ කෙලෙස් දූවිලි පිසලූ එකඟ සිතින් හුන් උන්වහන්සේ දුටුවෙමි. කෙලෙස් මල සෝදාහල උන්වහන්සේ කෙරෙහි පහන් සිත් ඇති මම දිඹුල් ඵල ගෙන බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට දුන්නෙමි. මෙයින් කල්ප අනූ එකකට පෙර මම යම් ඵල දානයක් දුන්නෙම් ද ඒ හේතුවෙන් දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාක මෙබඳුය"

''මේ මහා භද්‍ර කල්පයේදී පහළ වූ කාශ්‍යප බුදුරදුන්ගේ සසුනෙහි සංවේගයට පත් සිතැති මම පැවිදිවූයෙමි. එසේ පැවිදි වූ මම භාවනාවට සිත් යොමු කළෙමි. ''උතුම් වූ අර්ථයට හෙවත් රහත් බවට පත්නොවී විහාරයෙන් නික්ම නොයමි'' යන දැඩි අධිෂ්ඨායෙන් භාවනා කළත් එකළ මාගේ පැතුම ඉටු නොවිණි. දැන් වනාහි නුවණ මුහුකුරා ගියෙමි අවල වූ නිවනට පත්වූයෙමි. ස්ථිර වූ අච්චුත පදය නම් වූ නිවන් අවබෝධ කරගත් මම දැන් සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව තම පිළිවෙත් මඟ ප්‍රකාශ කිරීම් වශයෙන් සිය රහත් බව ප්‍රකාශ කරන පච්චය තෙරණුවෝ මේ ගාථා තුන වදාළහ.

''**පඤ්ඣාභාහං පබ්බජිතෝ - සෙඛෝ අපපත්තමානසෝ**
විහාරං මෙ පවිට්ඨස්ස - චෙතසෝ පණිධී අහු''

''**නාසෙසසං, න පිවිසසාමි - විහාරතෝ න නික්ඛමෙ**
නපි පසසං, න නිපාතෙසසං - තණ්හා සල්ලෙ අනූහතෙ''

''**තස්ස මෙවං විහරතෝ - පසස විරියපරක්කමං**
තිසෙසා විජ්ජා අනුප්පත්තා - කතං බුද්ධස්ස සාසනං'' ති.

මෙහි '**පඤ්ඣාභාහං පබ්බජිතෝ**'' මම පැවිදි වී දින පසක් ගතවීමි. පැවිදි වූ දින පටන් දින පහක් මේ වනවිට ගෙවී අවසන්ය. ''**සෙඛෝ අපපත්ත මානසෝ**'' අධිශීල ශික්ෂාදියේ හික්මීම් වශයෙන් **සේඛ** නම් වීමි. ඉතිරි නොවනසේම මානය මුලුමනින්ම සිඳ දැමීම් අර්ථයෙන් ''මානස'' නම් වූ අර්හත්වයට ඔහු නොපැමිණියේ නුයි ''**අපපත්තමානසෝ**'' (නොපැමිණි අග්‍රමාර්ග අනියෙමි). ''**විහාරං මෙ පවිට්ඨස්ස මෙතසෝ පණිධී අහූ**'' මෙසේ සේඛයකු වූ මට වසන්නා වූ විහාරයට පැමිණි විට මෙබඳු වූ - දැන් මතු පවසන්නා වූ චිත්ත ප්‍රාර්ථනාවක් ඇති විය. මෙබඳු සිතක් මාහට විය. ''**නාසෙසසං**'' ආදී වශයෙන් එම චිත්ත ප්‍රණිධිය දැක් වේ. එහි ''**නාසෙසසං**'' යම් කිසි භෝජනයක් නොවළඳමි. නොවළඳන්නෙමි. ''තණ්හා නම් සැතින් මගේ හදවත විදිනා තෙක්ම, උපදුව කරන තෙක්ම'' යනුවෙන් සෑම පදයකම යෙදිය යුතුයි. ''**න පිවිසසාමි**'' පානය කළයුතු දෑ පානය නොකරන්නෙමි. ''**විහාරතෝ න නික්ඛමෙ**'' දැන් මේ මම වසන කුටියෙන් නික්ම නොයන්නෙමි. ''**නපි පසසං න නිපාතෙසසං**'' මගේ ශරීරයේ පැති දෙකින් එක පසෙකිනුදු කයෙහි වෙහෙස දුරු කරගනු සඳහා සයනය නො

කරන්නෙමි. එක් පැත්තකිනිදු නිදා නොගන්නෙමි. "**තසස මෙවං විහරතො**" ඒ මම මෙසේ දැඩිව සිතාගෙන, දැඩි වීර්යයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව විදසුන් භාවනාව වඩමින් වාසය කරන විට, "**පසස වීරිය පරක්කමං**" ඉහත කියූ ලෙසින්ම වීර්යයෙන් උතුම් ස්ථානය නොඉක්මවන බැවින් "**පරාක්‍රම**" නම් වූ ඒ මාගේ උත්සාහයත් වූ අධික වෑයම බලවු. එය දැනගවු. එම දැඩි වීර්ය නිසා මම ත්‍රිවිද්‍යාවන් අවබෝධ කළෙමි. බුදුරදුන්ගේ අනුශාසනය කොට නිමවූයෙමි. මෙහි අර්ථ ඉහත දක්වන ලදී.

පච්චය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.3

"යො පුබ්බෙ කරණීයානි" යනු ආයුෂ්මත් **බක්කුල** තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර, මෙයින් අසංඛ්‍ය කල්ප ලක්ෂයකටත් අධික වූ කාලයෙහි පහළ වූ අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේ පහළවීමට පෙරදී ම, බමුණු කුලයක උපන්හ. නිසිවියට පත්ව ත්‍රිවේදය හදාළා වූ ඒ බ්‍රාහ්මණ තෙමේ එහි හරයක් නොදැක, "පරලොවට අර්ථයක් සොයන්නෙමි" ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පර්වත පාදයෙහි සිටිමින් පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගත්තේය. එසේ වෙසෙන සමයේ බුද්ධෝත්පත්තිය අසා උන්වහන්සේ සොයා ගොස් ධර්මශ්‍රවණය කොට, සරණ සිල්හි පිහිටියේය. එවක ශාස්තෘන් වහන්සේට උදරාබාධයක් ඇති විය. කැළයට ගිය බමුණා බෙහෙත් ගෙනවුත් ඒ රෝගය සන්සිඳවීය. එසේ කළ පින්කමෙන් නිරෝගී සැප ලබාගැනීමට මුහුකුරවමින් ඉන් චුතවූ ඔහු බඹලොව ඉපිද එක් අසංඛ්‍යයක් දෙවි මිනිසුන් අතර සැරිසරා අවුත් පදුමුත්තර බුදුන් පහළ වූ සමයේ හංසවතී නුවර සිටුගෙයක ඉපදුණි. දිනක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් අල්පාබාධ ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රස්ථානයෙහි තබනු දැක පැහැදී තමා ද එම තනතුර පතාගෙන චිත්ත ප්‍රණිධිය කොට දිවි ඇති තාක් පින්දහම් කොට කාමසුගතීන්හිම සැරිසැරිය. නැවත විපස්සී බුදුහු පහළවීමට පෙර දී බන්ධුමතී නුවර බමුණු පවුලක ඉපි ද පෙර ලෙසින්ම ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානාභිඥා උපදවාගෙන පර්වත ප්‍රාන්තයෙහි විසීය. බුදු උපත අසා උන්වහන්සේ වෙත ගොස් ධර්මය අසා සරණ සිල්හි පිහිටා භික්ෂූන්ට තිණ පුප්ඵක (තණමල්වලින් හටගන්නා) රෝගය උපන් කල්හි, එය සන්සිඳුවා

ආයු පමණින් සිට ඉන් චුතව බඹලොව උපන්නේ ය. මීට කල්ප අනූ එකකට පෙර දී ඉන් චුතව දෙව් මිනිසුන් අතර සැරිසරනුයේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි බරණැස සිටු ගෙයක ඉපිද ගිහි වාසයේ සිටිමින් එක් දිරා වැනසී යන මහාවිහාරයක් දැක එහි වූ උපෝස්ථාගාර ආදී සියලු ආරාමික ගොඩනැගිලි පිළිසකර කරවා, එහි විසූ භික්ෂු සංඝයාට සියලුම බෙහෙත් ද්‍රව්‍ය සපයා දී දිවි ඇතිතාක් කුසල් කළේය. ඉන් චුතව එක් බුද්ධාන්තරයක් දෙව් මිනිසුන් අතර සැරිසරමින් අවුත්, අපගේ බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙරදීම කොසඹෑ සිටුනුවගේ ගෙයි උපන්නේ ය. පෙර පින් බලයෙන් ඔහු නිරෝගී විය. මහා යමුනා නදියේ දිය නානා විට කිරිමවගේ අතින් ගිලිහුණු ඒ දරුවා මත්ස්‍යයකු විසින් ගිලින ලදී. මත්ස්‍යයා මාළු බාන්නන්ට හසුව, අල්ලා බරණැස සිටුදේවියට විකුණූහ. සිටුදේවිය මාළුවා කපද්දී පින් බෙලෙන් නීරෝගී වම දරුවා ලැබුණි. ඇය "පුතෙක්" යැයි රැගෙන ආදරයෙන් පෝෂණය කළාය. මේ පුවත ඇසූ දරුවා බිහිකළ දෙමාපියෝ "මේ අපගේ පුතාය. අපට පුතා දෙන්න"යි යෙදුණු කල්හි රජතුමා "මේ දරුවා පවුල් දෙකටම අයත් ය"යි කුල දෙකටම දායාද කළ බැවින්, එසේ විනිශ්චය දුන් බැවින් "**බක්කුල**" නමින් දරුවා ප්‍රකට විය. වැඩිවියට පත් බක්කුල කුමරු මහත් සැප සම්පත් විඳිමින් අසූ වයස් දක්වා සිට ශාස්තෘන් වහන්සේ සම්පයට ගොස් දහම් ඇසීය. දහම් ඇසීමෙන් ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ බක්කුල හිමියෝ දින හතක්ම පුනුදුන්ව සිටියහ. අටවන දින අරුණ නැගෙත්ම සිටුපිළිසිඹියා පත් මහරහත් තෙරනමක් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

"හිමවතට නුදුරෙහි සෝභිත නම් පර්වතයක් විය. එහි මට මනාව සෑදූ අසපුවක් විය. එය මාගේ ම සිසුන් විසින් සාදන ලද්දකි. ඒ අසපුවේ බොහෝ මණ්ඩප විය. පිපුණු සිඳුවාර, පිපුණු ජිවංජීවක, දිවුල් යන වෘක්ෂ සමූහයෙන් ඒ අසපුව අලංකාර විය. නික - ඩෙබර - නෙල්ලි - උගුරැස්ස ගස් වලින් ලබූ වැලින් ද පිපුණු සුදු නෙළුම්වල ආලක බෙලි, කෙසෙල්, උගුරැස්ස ගස් වලින් ලබූවැලින් ද පිපුණු සුදු නෙළුම්වල් ද ආලක බෙලි, කෙසෙල්, නාරන්, උක්, කුඹුක්, පුවක් ආදී ගසින් ද යුක්ත විය. කොහොඹ, හොර, කොළොම්, නුග, ගිවුළු යන ගස්වලින් සැරසුණු ඒ අසපුවේ ශිෂ්‍යයන් සමඟ මම සතුටින් විසූවෙමි.

"සියල්ල තමන් ම අවබෝධ කරගත් ලෝක නායක වූ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ විවේකය සොයමින් මගේ අසපුවට වැඩම කළහ.

මහත් යශස් ඇති උන්වහන්සේට වාතාබාධයක් ඇති විය. අරණෙහි හැසිරුණු මම උන්වහන්සේගේ ස්වභාවය දැක නිසැකයෙන්ම මහත් යශස් ඇති, පසැස් ඇති ලෝකනාථයන් වහන්සේ ව්‍යාධියෙන් පෙළෙන බව දැනගතිමි. වහා අසපුවට ගිය මම සිසුන් අමතා බෙහෙතක් සෑදීමට පැවසුවෙමි. ඔවුහු සැම එක්ව ගෞරව සහිතව බෙහෙත පිළියෙල කිරීමට සහාය වූහ. ශාස්තෘ ගෞරවය නිසා වහා පර්වතයට නැගුණු මම ඖෂධ සොයා බෙහෙත සාදා බුදුරදුන්ට පිළිගැන්වූයෙමි. එය වැළඳූ කල්හි මහාවීර වූ සර්වඥ වූ ලෝකනාථයන් වහන්සේගේ වාතාබාධය සන්සිඳුණි.''

''ක්ලාන්තය සන්සිඳුණු **අනෝමදස්සි** බුදුහු සිය අසුනේ හිඳ මේ ප්‍රකාශය කළ සේක. ''යමෙක් මට බෙහෙත් දුන්නේ ද මාගේ රෝගය සන්සිඳවීද ඔහුගේ අනාගතය පිළිබඳව පවසමි. එම වදන් සැමදෙන අසවු. මෙතෙම කල්ප ලක්ෂයක් දෙව් ලොව සැප විඳින්නේය. දිව්‍ය වාද්‍ය - නෘත්‍යයන්හි සතුටු වන මෙතෙම කුශල මූලයෙන් මෙහෙයවා මනුලොවට පැමිණ දහස් වරක් සක්විති රජ වන්නේය. මීට කල්ප පනස් පහකට පසුව සිවුමහ දිවයින්ට හා සිවු සයුරු සහිත පෘථිවියට අධිපති වූ සත්රුවන් පිරි මහ බල ඇති අනෝම නම් ක්ෂත්‍රිය සක්විති රජව තව්තිසාව ද කළඹා රාජ්‍ය කරන්නේය. දෙව් හෝ මිනිස් හෝ මොහු නිරෝගී බව ම ලබන්නේය. අවසන ගිහිගෙය හැර දමා ව්‍යාධි දුක්ඛය ද නසන්නේ ය. මෙයින් අප්‍රමාණ කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ ගෞතම නම් ශාස්තෘහු ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්ම දායාද වූ ඖරස පුත්‍ර වූ ධර්මයෙන් නිර්මිත වූ ආශ්‍රව ක්ෂය කළ බුද්ධ පුත්‍රයෙක් වන මෙතෙම කෙලෙස් ගිනි නිවූ, තෘෂ්ණා සැඩ පහර තරණය කළ ''**බක්කුල**'' නම් අග්‍රශ්‍රාවකයෙක් වන්නේ ය. මේ සියල්ල දත් ගෞතම බුදුරජහු සඟ මැද වැඩ හිඳ මෙතෙම අග තනතුරෙහි පිහිටුවන සේක.''

''සියල්ල තමන්ම අවබෝධ කරගත් අනෝමදස්සි භාග්‍යවත්හු විවේකය කැමතිව මගේ අසපුවට වැඩම කළහ. එළඹියා වූ මහාවීර වූ ලෝකනායකයන් වහන්සේට පහන් සිතින් සියලු ඖෂධයන්ගෙන් පූජා කළෙමි. ඒ මැනවින් කළ මාගේ පින්කම සාර කෙතක වපුළ බීජු මෙන් අස්වැන්න ඉතා සරු වූවකි. ඒ පුණ්‍ය විපාකය අවසන් කළ නොහැක්කෙමි. ලෝකනායකයන් වහන්සේ දැකීම මට මහත් ලාභයකි. මට වූ යහපත් ලැබීමකි. ඒ පුණ්‍ය කර්මයේ ඉතිරි විපාක වශයෙන් නිවණ නම් අචල පදයට පත්වීමි. ශාක්‍යකුල ශ්‍රේෂ්ඨ වූ ගෞතම බුදුහු මේ සියල්ල දැන සඟ මැද හිඳ මා අග්‍රස්ථානයෙහි පිහිටුවූහ.''

''මීට කල්ප ලක්ෂයකටත් අධික වූ කාලයේදී කළ කුසල කර්මය නිසා මේ දක්වාම දුගතියක නූපන්නෙමි. බෙහෙත් දානයේ විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටු කළෙමි.''

රහත් බවට පත්වූ බක්කුල තෙරණුවෝ දිනක් තම ශ්‍රාවකයන් පිළිවෙලින් අග තනතුරෙහි පිහිට වූ ශාස්තෘන් වහන්සේ විසින් අල්පාබාධ භික්ෂූන්ට අග්‍රස්ථානයෙහි තැබූහ. පිරිනිවණ සමයේදී බක්කුල තෙරණුවෝ අන්‍ය භික්ෂූන්ට අවවාද දීම් වශයෙන් සිය රහත් බව පළකරන්නාහු මේ ගාථා තුන වදාළහ.

''යො පුබ්බෙ කරණීයානී පච්ඡා සො කාතුමිච්ඡති
සුඛා සො ධංසතෙ ඨානා පච්ඡා ච මනුතපපති

යක්‍ඛහි කයිරා තක්‍ඛහි වදෙ, යං න කයිරා න තං වදෙ
අකරොන්තං භාසමානානං පරිජානන්ති පණ්ඩිතා

සුසුඛං වත නිබ්බාණං සම්මා සම්බුද්ධ දෙසිතං
අසොකං විරජං ඛෙමං යත්‍ථ දුක්ඛං නිරුජ්ඣතී''

මෙහි ''යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති'' යම් පුද්ගලයෙක් පෙර, අතීතයේදී ජරාරෝගාදියෙන් නොමැඩුණු කාලයෙහිම කළ යුතු, තමාට හිත සුව එළවන කටයුතු පමාවීමෙන් නොකර සිට, පසුව කළයුතු කාලය ඉක්මවා කිරීමට සිතයි ද ඔහු. ''සො'' යනු නිපාතයකි. එසේ සිතුවත් ජරා රෝගාදියෙන් මැඩුණු බැවින් ඔහුට පසුව එම කටයුතු කළ නො හැකි වේ. නොහැකිවනුයේ ද ''සුඛා සො ධංසතෙ ඨානා පච්ඡා ච **මනුතපපති**'' ඒ පුද්ගලයා ස්වර්ගයෙන් ද නිවණින් ද යන සැප ස්ථානවලින් පිරිහී යයි. ඊට අවශ්‍ය කටයුතු සිදු නොකළ බැවිනි. ''මවිසින් යහපත් දේ නොකරන ලදී'' යැයි පසුව තැවේ. විපිළිසර බවට පත් වේ. මෙහි ''ම'' කාරය පද සන්ධි කරන්නකි. ''**අනුතප්පතී**'' විය යුතුයි. ''මෙසේ නුඹලාට අවවාද දෙන මම කළ යුතු දේ කොට නිමවූවෙක් මී''යි පවසන සේක් උන්වහන්සේ ''**යං හි කයිරා**'' යන දෙවන ගාථාව වදාළහ.

එහි ''**පරිජානන්ති**'' යනු ''මොහු මෙබන්දෙකි'' යි වෙන්කර දනගනිති. හඳුනාගනිති. බුහුමන් නොකරති. යන අර්ථයයි. යහපත් පිළිවෙත් පිරීම් (ප්‍රතිපත්ති) වශයෙන් කියන ලෙසම කරන්නා බබලයි. ඉන් බැහැර වූවෝ නොබබලති. කළයුතු ආකාරය දැක්වීමෙන් සාධාරණව දැක්වූ අර්ථය, දැන් සරූප වශයෙන් දැක්වීමට ''සුසුඛං වත'' යනාදී තෙවන ගාථාව පැවසූහ.

එහි අර්ථ මෙසේය. - ''මනාව තමා විසින්ම සියලු ධර්ම අවබෝධ කරගත්තා වූ සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ, සියලුම ශෝක කරන හේතු නැසූ බැවින් ශෝක රහිත වූ, දුරු කළ රාගාදී කෙලෙස් ඇති, සතර ඕඝයන්ගෙන් උපද්‍රව නොවූ බැවින් ක්ෂේම වූ නිවණට, ඒකාන්ත සැපයට පැමිණියෙමි. ඒ නිර්වාණාවබෝධයේදී සියලුම සංසාරික දුක් අතිශයින්ම නිරුද්ධ වේ. සන්සිඳේ.

බක්කුල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.4

''සුඛං වෙ ජීවිතුං ඉච්ඡෙ'' යනු ආයුෂ්මත් **ධනිය** තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත් **සිබි** නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සිටුගෙයක ඉපිද වැඩිවියට පත්වූහ.

දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් බට මලක් ගෙන පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ නුවර කුඹල් පවුලක ඉපිද ධනිය නමින් ප්‍රකට විය. තරුණවියට පත් කුඹල් කර්මාන්තයෙන් ජීවත් විය. එක් සමයක ශාස්තෘන් වහන්සේ ධනිය කුම්භකාරයාගේ ශාලාවේ වැඩහිඳ **පුක්කුසාති කුලපුත්‍රට** ඡධාතුවිභංග සූත්‍රය දේශනා කළ සේක. පුක්කුසාති එය අසා රහත් ඵලයට පත් විය. (කතකිච්චො) ඒ කුලපුත්‍රයාගේ පිරිනිවීම ඇසූ ධනිය ''මේ බුද්ධ ශාසනය ඒකාන්තයෙන්ම නෛයර්‍යානිකය. එක් රැයක් පුරුදු කිරීමෙන් වුවත් සසර දුකින් මිදීමට හැකි වේ''යැයි ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි විය. පැවිදි වූ පසුව කුටිය අලංකාර කිරීමෙහිම යෙදුණු නිසා කුටි කිරීම පිළිබඳව භාග්‍යවතුන් වහන්සේගේ ගැරහුමට ද පාත්‍ර වූ ධනිය හිමියෝ සංඝයාට අයත් සෙනසුනක වසමින් විදසුන් වඩා රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''රන්වන් පාටින් බබළන දායකයන්ගේ පූජා පිළිගන්නා වූ වනමතුයෙහි අහසින් යන්නා වූ ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි. එකෙණෙහි මම බටමලක් ගෙන නික්මුණෙමි. චතුරෝඝයන් තරණය කළා

වූ ආශ්‍රව රහිත වූ සම්බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. පහන් සිත් ඇති සොමනස් වූ මම දක්ෂිණාර්හ වූ මහාවීර වූ සියලු ලොවට අනුකම්පා කරන්නා වූ බුදුපියාණන් වහන්සේට ඒ මල පිදුවෙමි. මෙයින් තිස් එක්වන කල්පයේදී යම් මල් පූජාවක් කෙළම් ද එයින් පසු දුගතියක නො උපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දැන් මවිසින් සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව, යම් භික්ෂු පිරිසක් ධූතාංග සමාදානයෙන් තමා උසස් කරමින්, සඟබත් ආදිය ඉවසන අතින් භික්ෂූන්ට අවමන් කරත්ද ඒ භික්ෂූන්ට අවවාද දීම් වශයෙන් සිය රහත්බව ප්‍රකාශ කරන ධනිය හිමියෝ මේ ගාථා තුන වදාළහ.

සුඛං වෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤසම්මං අපෙකඛවා
සංඝිකං නාතිමඤ්ඤෙය්‍ය චීවරං පාන භොජනං

සුඛං වෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤසම්මං අපෙකඛවා
අභිමූසිකසොඛ්‍යංව සෙවෙථ සයනාසනං

සුඛා වෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤසම්මං අපෙකඛවා
ඉතරීතරෙන තුසෙසය්‍ය එකධම්මං ච භාවයෙ''

මෙහි ''**සුඛං වෙ ජීවිතුං ඉච්ඡෙ සාමඤ්ඤසම්මං අපෙකඛවා**'' යන ශ්‍රමණ භාවයෙහි - මහණ කමෙහි අපේක්ෂාවෙන්, ශික්ෂාවන්හි තියුණු ගෞරව ඇතිව සුවසේ වසනු කැමති නම්, ඉදින් නුසුදුසු ජීවිකාවන් හැර දමා පැවිදි සුව විඳිනු කැමති නම්. ''**සංඝිකං නාතිමඤ්ඤෙය්‍ය චීවරං පාන භොජනං**'' සංඝයාට පැමිණියා වූ සිවුරු, ආහාර සඳහා අවමන් නොකරන්නේ ය. සංඝයාට උපදින ලාභ නම් පරිසුද්ධුප්පාද නම් වේ. ''එය පරිභෝජනය කරන්නාගේ දිවි පැවැත්ම පිරිසිදුවීමෙන් ස්වභාවයෙන් ශ්‍රමණ සැප අතට පත්වේමය'' යන අදහසයි. ''**අභිමූසික සොඛ්‍යං වා**'' මීයකු විසින් සාරන ලද බිලයේ වසන සර්පයකු මෙන් සෙනසුන් ඇසුරු කරන්නේය. යම් සේ සර්පයා තමාම තමාට නිවාසස්ථානයක් සාදා නොගෙන මී ආදී අනිකකු විසින් සෑදූ බිලයෙහි වැස, කැමති තැනකට යන්නේද, එලෙසින්ම භික්ෂුවද තමා සෙනසුන් නිසා කිලිටිබවට නොපැමිණ යම් කිසි (ඕනෑම) තැනක වැස, ඉන් වෙනත් තැනකට යන්නේය. දැන් ''**කී නොකී ප්‍රත්‍යයන්ගේ** යථාලාභ සන්තෝෂයෙන්ම ශ්‍රමණබවේ සැප ඇති වේ. වෙනත් දෙයකින් ඒ සැප ඇති නොවේ'' යැයි දක්වනු සඳහා. ''**ඉතරීතරෙන තුසෙසය්‍ය**''

''යම් කිසි ගීත වූ හෝ ප්‍රණීත වූ හෝ යම් සේ ලද ප්‍රත්‍යයෙන් සන්තෝෂයට පැමිණෙන්නේ ය'' යන අර්ථයයි. ''**එකධම්මං**'' අප්‍රමාද ධර්මයෙහි යෙදුනහුට නිරවද්‍ය වූ සියලු ලෞකික සුවයන් ද ලෝකෝත්තර සුවයන්ද අතට පත්වූයේමය. එනිසා භාග්‍යවතුන් වහන්සේ ''**අප්පමත්තො හි ඣායනෙනා පපොනි විපුලං සුඛං**'' යනුවෙන් අප්‍රමාදී වූ ධ්‍යාන වඩන්නා විපුල වූ සැපයට පැමිණේ යැයි වදාළහ.

ධනිය තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.5

''අතීසිතං'' යනු ආයුෂ්මත් මාතංග පුත්ත තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ වනාහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී හිමවත සමීපයේ වූ මහත් ඉබේ හටගත් විලක් යට මහත් වූ නාග භවනයක, මහානුභාව ඇති නා රජෙකු වී ඉපදුණහ. දිනක් භවනයෙන් නික්ම හැසිරෙන කල්හි ශාස්තෘන් වහන්සේ අහසින් වැඩම කරනු දැක පහන් සිතින් තම කණ්ඨක මාණික්‍යය පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි හෙතෙම මේ බුද්ධෝත්පාදයේදී කොසොල් රට මාතාංග නම් කෙළෙඹියාගේ පුතු ලෙස ඉපිද, මාතංග පුත්ත නමින් පතල විය. වැඩිවියට පත් ඔහු අලසයෙක්ව, කිසිදු කාර්යයක් නොකරන්නෙක් බවට පත් විය. නෑයන් හා අන්‍යයන් විසින් ගරහන ලද මාතංග පුත්ත, ''මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සැපයේ ජීවත්වෙති''යි සැපසේ ජීවත්වනු කැමතිව භික්ෂූන් වෙත පැමිණ, හුරුපුරුදු ඇසුර ඇතිව ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළේය. ඉන් ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ උන් වහන්සේ, සෙසු භික්ෂූහු සෘද්ධිමය හැකියා පෙන්වනු දැක, ඒ පිළිබඳ ආශාවෙන් සෘද්ධිබල පතාගෙන, ඊට අවශ්‍ය කමටහන් ශාස්තෘන් වහන්සේගෙන් ලබාගෙන භාවනාවෙහිම සිත යෙදූ සේක්, ෂඩ් අභිඥාලාභී වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''**පදුමුත්තර** නම් වූ සියලු ධර්මයන්හි පරතෙරට ගිය පස්මරුන් ජයගත් විවේක සැප කැමති බුදුරජාණන් වහන්සේ අහසින් වැඩම කළ

සේක. හිමවතට නුදුරින් ස්වයංජාත මහවිලක් විය. මගේ පෙර පිණින් පහළ වූ භවන එහි විය. භවනෙන් නික්මුණු මම නිලුපුල් මෙන් දිලිසෙන ඇවිලගත් ගින්නක් බඳු ලෝක නායකයන් වහන්සේ දුටුවෙමි. බුදුරදුන්ට පිදීමට මලක් සෙවූමුත් හමුනොවිණි. සිය සිත පැහැද වූ මම ශාස්තෘන් වහන්සේට වැන්දෙමි. මගේ හිසෙහි වූ මැණික ගෙන, ''මේ මැණික පිදීමේ විපාක යහපත් වේවා''යි සිතා පූජා කළෙමි. ලෝකයාගේ පූජාවන් පිළිගැනීමට යෝග්‍ය වූ බුදුරජාණන් වහන්සේ අහසෙහි හිඳ මෙසේ වදාළ සේක.''

''නුඹගේ ඒ අදහස සමෘද්ධිමත් වේවා. සසර මහත් සැප ලබත්වා. මෙම මැණික් පූජාවෙන් මහත් යශස් අනුභව කරව'' යනුවෙන් වදාළ භාග්‍යවත්වූ පදුමුත්තර බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ අහසින් වැඩි සේක. මගේ පැතුම ලෙසම සසර දී මම කර්ම සිහිකරන දෙවි වූ මා හට මාගේ ම මැණික් පහළ වේ. මගේ පිරිවර වූ සුවාසු දහසක් ස්ත්‍රීනු විසිතුරු වස්ත්‍රාභරණ හා පැළඳි මිණිකඩොලින් අලංකාරව, දිග ඇසිපිය ඇතිව, සිනාසෙමින්, මනාවූ තන හා සිහින් කටි ප්‍රදේශ ඇතිව නිතර මා පිරිවරාගෙන සිටිති. මැණික් පූජාවේ විපාක මෙබඳුය.''

''රන්මය, මැණික්මය හා පද්ම රාග මාණික්‍යමය මාගේ භාණ්ඩයෝ මැනවින් කරන ලද්දාහුය. මනාව නිර්මිත වූ පළඳනාවෝ මට පහළ වෙති. රම්‍ය වූ කූඩාගාරද ගුහා ද මාහැඟි සයනාසන ද මාගේ අදහස් දැන ඒ අනුව පහළ වේ. යමෙක් මිනිසුන්ට පින්කෙතක් සවිසත්තට බෙහෙතක් වූ ධර්ම ශ්‍රවණය ලබත් නම් එය ඔවුනට මහත් ලාභයකි. මනාවූ ලාභයකි. යම් බඳු වූ මම බුදුරදුන් දිටිමි ද මා විසිනුදු මනා වූ කර්මයක් කරන ලදී. එයින් දුගතියෙන් මිදුනෙමි. අචල පදය වූ නිවනට ද පැමිණියෙමි. දෙවි හෝ මිනිස් හෝ යම් යම් යෝනියෙක උපදිමි ද, හැමකල්හි හාත්පස සත්රියනක් මාගේ ආලෝකය පැතිර සිටී. එම මැණික් පූජාවෙහි විපාක ලෙස සම්පත් අනුභව කොට, මා විසින් ඥානාලෝකය දක්නා ලදී. අචල වූ ශාන්ති පදයට පැමිණියෙමි. මෙයින් කල්ප ලක්ෂයකට පෙර යම් බුද්ධ පූජාවක් කෙළම් ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. මැණික් පූජාවේ විපාක මෙබඳුය. දන් මවිසින් සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනය ඉටු කළෙමි.''

ෂඩ් අභිඥා ලාභී වූ උන්වහන්සේ පුද්ගල අධිෂ්ඨාන වශයෙන් කුසීත බවට ගරහමින් තමාගේ වීර්යාරම්භය ප්‍රකට කරන සේක් මේ ගාථා තුන වදාළහ.

''අතිසීතං අතිඋණ්හං අතිසායමිදං අහු
ඉති විස්සට්ඨකම්මන්තෙ බණා අවෙචනති මානවෙ

යො ච සීතඤ්ච උණ්හඤ්ච තිණා භියේ‍යා න මඤ්ඤති
කරං පුරිස කිච්චානි සො සුඛා න විහායති

දබ්බං කුසං පොටකිලං උසීරං මුඤ්ජබබ්බජං
උරසා පනුදහිස්සාමි විවේකමනුබ්‍රූහයං''

මෙහි ''අතිසීතං'' යනු හිම වැටීම්, වැහි වලා පිරීම් ආදියෙන් අතිශය සීතලය. ''දැන් ඉතාශීත වේ. යනුවෙන් සම්බන්ධ කර අර්ථ ගත යුතුයි. ''අතිඋණ්හං'' ග්‍රීෂ්ම පිරිතැවීම් ආදියෙන් අතිශයින් උණුසුම්ය. මේ සෘතු සම්පත් දෙකින්ම කුසීත බවට හේතු කියන ලදී. ''**අතිසායං**'' දවස අවසන ''දැන් ඉතා හවස් විය.'' සවස පැවසූ විට මෙහිදී ''දැන් ඉතා උදේ'' යැයි සිතීම ද අදහස් වේ. ඒ දෙකින්ම කාල වශයෙන් කුසීත බවට හේතු දක්වන ලදී. ''**ඉති**'' මේ ආකාරයෙන්, මෙයින් ''මහණෙනි !, මේ සස්නෙහි භික්ෂුව විසින් යායුතු මාර්ගය මෙසේ ය''යි ආදී වශයෙන් දක්වන ලද කුසීත හේතු අදහස් කරයි. ''**විස්සට්ඨකම්මන්තෙ**'' හැර දැමූ කර්මාන්ත ඇති කල්හි. ''**බණා**'' කෘෂණ සම්පත්තියයි. බුද්ධෝත්පාදය හා බඹසර වාසයට අවසර ඇති බව පැවතීම. ''**අවෙචනති**'' ඉක්මවා යති. ''**මානවෙ**'' සත්ත්වයිනි! ''**තිණා භියේ‍යා නමඤ්ඤති**'' තණපතකට වඩා නොසිතයිද, තණපතක් මෙන් සීතෝෂ්ණ දෙක මැඩලා තමා විසින් කළයුතු කටයුතු කරයි. ''**කරං**'' එසේ කරන්නා වූ ''**පුරිසකිච්චානි**'' වීර පුරුෂයකු විසින් තමාට හා අනුන්ට වැඩදායක ලෙස කළ කටයුතුවලින් ''**සුඛා**'' සුවයෙන්, නිවන් සුවයෙන් යන අදහසයි. තෙවන ගාථාවේ අර්ථ ඉහත දී පවසන ලද්දේමය.

මාතාංග පුත්ත තේරගාථා අර්ථ විවරණාව නිමියේය.

3.1.6

"**යෙ චිත්තකථී බහුස්සුතා**" යන ගාථා ආයුෂ්මත් **බුජ්ජසෝභිත** තෙරුන් වහන්සේගේය. ඒවායේ උපත කවරේද? උන්වහන්සේ පෙර **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. දිනක් ඔහු මහත් භික්ෂු සංඝයා සමඟ වඩින බුදුරජාණන් වහන්සේ දැක, පැහැදුණු සිතැතිව දස ගාථාවකින් උන්වහන්සේ වර්ණනා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්මිනිස් දෙගතියේ සැප විඳි හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී පාටලීපුත්‍ර නගරයෙහි බමුණු කුලයක ඉපිද සෝභිත නමින් පතළ විය. ඔහුගේ ශරීරය මදක් කුදු වූ බැවින් **බුජ්ජසෝභිත** නමින් හැඳින්විණි. තරුණ පත් ඒ බමුණු කුමරු ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි ආනන්ද මහරහතන් වහන්සේ සමීපයෙහි පැවිදි වී ෂඩ් අභිඥා උපදවා ගත්තේය.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

"බබළන කුඹුක් ගසක් වැනි වූ දේවාති දේව වූ නරශ්‍රේෂ්ඨ වූ වීථියට පිළිපන්නා වූ බුදුරදුන් දැක කවරෙක් නම් නොපහදී ද? මෝහ ගනඳුර නසා බොහෝ දෙන සසරින් එතෙර කොට, ඥානාලෝකයෙන් බබළන බුදුරදුන් දැක කවරෙක් නොපහදී ද? රහතුන් ලක්ෂයක් සමඟ වඩින්නා වූ ලෝකනායක වූ බොහෝ සත්ත්වයන් දුකින් මුදවන්නා වූ බුදුරදුන් දැක කවරෙක් නොපහදී ද? දහම් බෙරය ගසන්නා වූ තීර්ත්‍යක සමූහයා මඩින්නා වූ සිංහනාද කරන්නා වූ බුදුරදුන් දැක කවරෙක් නොපහදී ද? බඹලොව තෙක් දෙවියෝ බඹුන් සහිත වූවාහු අවුත් සියුම් පැන විචාරත් ද ඒ බුදුන් දැක කවරෙක් නොපහදී ද? දෙවියන් සහිත ලෝ වැසියෝ යම් උතුමෙකුට ඇඳිලි බැඳ අයදිත්ද එයින් ඔහුට පින් ලැබේද ඒ බුදුරදුන් දැක කවරෙක් නොපහදී ද? සියලු දෙන රැස්ව බුදුරදුන් පවසත්. එසේ ආරාධිත වූයේ ද නොසැලෙන බුදුරදුන් දැක කවරෙක් නොපහදී ද? නුවරට පිවිසෙන යමෙකුට බොහෝ බෙර නාද කරයි ද මත් ඇත්තු කුඤ්චනාද කරත් ද එබඳු වූ බුදුරදුන් දැක කවරෙක් නම් නොපහදී ද? හැමකල්හි වීථියෙහි වඩින්නා වූ සැමකල්හි සිරුර සියලු පැහැයෙන් බබළන්නා වූ බිම උස් තැන් පා තබන විට සම වන්නා වූ බුදුරදුන් දැක කවරෙක් නම් නොපහදී ද? බුදුරදුන් දහම් දෙසන කල්හි සක්වලටම ඇසේ. හැම සතුන්ට ම එය අවබෝධ වේ. ඒ බුදුරදුන් දැක කවරෙක් නම් නොපහදී ද?"

මීට කල්ප ලක්ෂයකට පෙර යම් බුදුවරයකු මෙසේ මම වරණනා කළෙමි ද ඒ හේතුවෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. බුදුරදුන් පැසසීමේ විපාක මෙබඳු ය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

ඡඩ අභිඥා ලාභීව පළමු මහා සංගීතිය පවත්වන සමයේදී රජගහනුවර සප්ත පර්ණිගුහාවට රැස් වූ මහා සංඝයා විසින් ''ආයුෂ්මත් ආනන්ද තෙරුන් කැඳවව''යි අණ කරනු ලැබූ බුජ්ජසෝභිත හිමියෝ, පොළවෙහි කිමිදී තෙරුන්ගේ ඉදිරියේ සිට සංඝයා ගේ හසුන පැවසූහ. එසේ පවසා අහසින් තමා පළමුව සප්ත පර්ණිගුහාද්වාරයට පැමිණියේය. මෙසමයෙහි මාරයාගේ ද මාරසහායකයන්ගේ ද උවටුරු වළකනු සඳහා දේව සමූහයා විසින් එවන ලද එක්තරා දේවතාවෙක් ගුහා දොරකඩ සිටියාය. ඇයට තමන් වහන්සේගේ පැමිණීම දැනුම් දෙන බුජ්ජසෝභිත හිමියෝ මේ පළමු ගාථාව වදාළහ.

යෙ චිත්තකථී බහුසසුතා සමණා පාටලිපුත්ත වාසිනො
තෙසඤ්ඤතරො යමායුවා දවාරෙ තිට්ඨති බුජ්ජසොභිතො

මෙහි ''චිත්තකථී'' යනු විසිතුරු ධර්ම කථාවන්ය. සංක්ෂේප කිරීම, විස්තර කිරීම, ගැඹුරු කිරීම, ප්‍රකට කිරීම, සැක දුරු කිරීම, දහම්හි පිහිටීම යනාදී නානාවිධ නයායන්ගෙන් අනුන්ගේ අදහස් අනුව දහම් දෙසීමෙ හැකියාව ලබයි'' යන අර්ථයයි. ''බහුසසුතා'' යන පර්යාප්ති, ප්‍රතිවේධ, බහුශ්‍රැත බව යනාදියෙන් පිරිපුන්-බොහෝ ඇසූ පිරූ තැන් ඇති. සියලු අයුරින්ම සංසිඳවූ පාපධර්ම ඇතිබැවින් ''සමණා'' ශ්‍රමණයෝ නම් වේ. පාටලී පුත්‍ර නම් නුවර වසන බැවින් ''පාටලීපුත්තවාසිනො'' නම් වේ. ''තෙසඤ්ඤතරො'', ''පාටලිපුත්‍රයේ වසන එබඳු භික්ෂූන් අතුරින් එක්තරා අයෙක්මි. දීර්ඝායු සම්පත් ඇති මේ ආයුෂ්මත්තෙම සප්තපර්ණිගුහාද්වාරයේ සිටියි. ගුහාවට පිවිසීමට සංඝයාගේ අවසරය ලැබේවා''යනුයි. මෙය ඇසූ දෙවිදුව තෙරුන්ගේ පැමිණීම සංඝයාට දැනුම් දෙමින් මේ දෙවන ගාථාව පැවසුවාය.

''යෙ චිත්තකථී බහුසසුතා සමණා පාටලිපුත්තවාසිනො
තෙසං අඤ්ඤතරො යමායුවා දවාරෙ තිට්ඨති මාලුතෙරිතො''

එහි ''මාලුතෙරිතො'' සෘද්ධිමය සිතින් ජනිත වායුවෙන් මෙහෙයවා පැමිණ, සෘද්ධි බලයෙන් ආවා වූ. මෙසේ ඇයගේ දැන්වීමෙන් සංඝයා

විසින් දෙන ලද අවසර ඇති තෙරණුවෝ සංඝයාගේ සමීපයට යමින් මේ තෙවන ගාථාවෙන් සිය රහත් බව ප්‍රකාශ කළ සේක.

''සුයුද්ධන සුයිට්ඨෙන සංගාම විජයෙන ච
බ්‍රහ්මචරියානුචිණ්ණෙන එවායං සුඛමෙධති''

එහි ''සුයුද්ධන'' පූර්ව භාගයෙන් තදංග, විෂ්කම්භණ, ප්‍රහාණ වශයෙන් කෙලෙසුන් සමඟ මනාව යුද්ධ කිරීමෙන්. ''සුයිට්ඨෙන'' අතරින් පතර කළණ මිතුරන් විසින් දෙන ලද යෝග්‍ය වූ ධර්ම දානයෙන්. ''සංගාම විජයෙන ච'' මුළමනින්ම සියලු කෙලෙස් ප්‍රහාණය කිරීමෙන්, මැඩලීමෙන් ලැබූ සංග්‍රාම ජය ඇතිව. බ්‍රහ්මචරියානු චිණ්ණෙන පුරුදු පුහුණු කළ අග්‍ර මාර්ග නම් බඹසරින් යුතුව. ''එවායං සුඛමෙධති'' මෙසේ කියන ලද ක්‍රමයෙන් ''මේ බුජ්ජසෝභිත තෙමේ නිවන් සුවය ඵල සමවත් සුවය ද ලබයි. ඊට පැමිණෙයි. එම සුවයන් අනුභව කරයි.' යන අර්ථයයි.

බුජ්ජසෝභිත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.7

''යොධ කොචි මනුසෙසසු'' යනු ආයුෂ්මත් චාරණ තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත්, මීට කල්ප අනූදෙකකට පෙර දී තිස්ස බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙරදී සුමේධ නමින් බමුණු කුලයෙහි ඉපිද වේද ශිල්පයන්හි පරතෙරට ගොස්, ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූහ. එසමයේදී තිස්ස බෝධිසත්ත්වයෝ තුසිත දෙව්ලොවින් නික්ම අවසන් භවයේ දී මවුකුස පිළිසිඳ ගන්නා අවස්ථාවෙහි මහ පොළොව කම්පා විය. ඒ දුටු මහජනයා, භය වී ත්‍රස්ත වී, ඒ ඍෂිවරයා වෙත පැමිණ පොළොව කම්පාවීමට හේතු විචාළේය. ඔහු එවිට ''මහබෝසත්හු මවුකුස පිළිසිඳගත්හ. එනිසා මේ පොළෝ කම්පාව සිදුවිය. නුඹලා බිය නොවවු''යි බුදුවරයකුගේ උපතේ පූර්ව නිමිති පිළිබඳව පවසා මහජනයා අස්වැසීය. බුද්ධාරම්මණයෙහි සිය ප්‍රීතියද පළ කළේය. මේ පින්කමේ විපාක විඳිමින් ඔහු දෙව්-මිනිස් දෙගතියෙහි සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේදී කොසොල් රට බමුණු

කුලයක උපන්නේ ය. වාරණ නමින් ප්‍රකට වූ ඒ බමුණා නිසිවියට පත්ව දිනක් එක්තරා තෙරනමකගෙන් දහම් අසා, ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදිව මහණදම් පිරිය. එක්දිනක් බුද්ධෝපස්ථානයට යන අතර මඟදී උන්වහන්සේ මුගටියකු හා නයෙකු ඔවුනොවුන් හා කලහ කොට මැරී සිටිනු දැක, ''මේ සත්ත්වයෝ ඔවුනොවුන්ට විරුද්ධවීමෙන් ජීවිතක්ෂයට පත්වෙති''යි සංවේග පත් සිතින්ම භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. භාග්‍යවතුන් වහන්සේ වාරණ තෙරුන්ගේ සිත දැන ඊට අනුරූප වූ ම අවවාදයක් දෙන සේක්, මේ ගාථා තුන වදාළහ.

''යොධ කොචි මනුසෙසසු පරපාණානි හිංසති
අසමා ලොකා පරම්හා ච උභයා ධංසතෙ නරො

යොව මෙත්තෙන චිත්තෙනන සබ්බපාණානුකම්පති
බහුං සො පසවති පුඤ්ඤං තෙන තාදිසකො නරො

සුභාසිතස්ස සික්ඛෙථ සමණූපාසනස්ස ච
එකාසනස්ස ච රහො චිත්තවූපසමස්ස චා'' නී.

එහි 'යොධ කොචි මනුසෙසසු'' මෙලොව මිනිසුන් අතර යම් කිසිවෙක්, ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ යන ඕනෑම මිනිසෙක්. මෙහි ''**මනුසෙසසු**'' ශබ්දයෙන් උත්කෘෂ්ඨ සත්ත්වයෙකු දක්වන ලදුයි දතයුතුයි. ''**පරපාණානි හිංසති**'' අනිකුත් සතුන් මරයි. පීඩාවට පත්කරයි ද ''**අසමාලොකා**'' මේ ලෝකයෙන්. ''**පරම්හා**'' පරලෝකයෙන්. ''**උභයාධංසතෙ**'' මෙලෝ පරලෝ දෙකින්ම පිරිහේ. දෙලොවටම අයත් හිතසුව පිරිහී යන්නේය යන අර්ථයයි. ''නරො'' යනු සත්ත්වයා. මෙසේ අනුන් පෙළන පාපධර්ම හා විපාක දක්වා දැන් අනුන් පෙළීමෙන් වැලකීමෙන් ලැබෙන කුසල්දහම් දක්වනසේක් ''යොව මෙත්තෙන'' යන දෙවන ගාථාව වදාළහ.

එහි ''මෙත්තෙනන චිත්තෙනන'' මෛත්‍රී සම්ප්‍රයුක්ත සිතින්, අර්පණාධ්‍යානයට හෝ ඊට වඩා ඉහළ ධ්‍යානයකට සමවැදුණු සිතින්, ''සබ්බපාණානුකම්පති'' සියලු සතුන් තම ඖරස පුත්‍රයන් මෙන් සලකා මෛත්‍රී කරයි. ''බහුං හි සො **පසවති පුඤ්ඤං තෙන තාදිසකො නරො**'' ඒ මෛත්‍රී විහරයෙන් යුක්ත පුද්ගලයා බොහෝ වූ අනල්ප වූ මහත් කුසල් රැස්කරයි. ලබයි. පත්වෙයි. දැන් ඔහු පරිවාර සහිත සමථ විදර්ශනා දහම්හි යොදවන සේක්, ''**සුභාසිතස්ස**'' යනාදී තෙවන ගාථාව වදාළහ.

එහි ''**සුභාසිතසස සිකෙඛථ**'' අල්පේච්ඡාදී කථාවන්හි, සුභාෂිත වූ පර්යාප්ති ධර්මය ඇසීම, දැරීම, පුනුණුව, විචාරීම යනාදී වශයෙන් හික්මෙන්නේ ය. ''**සමණුපාසනසස ච**'' සන්සිඳුවූ පාප ඇති ශ්‍රමණයන්ගේ, කළණ මිතුරන්ගේ, උපාසකයන්ගේ කලින් කලට පැමිණ ඇසුරු කිරීම මෙන්ම ඔවුන්ගේ පිළිවෙත් පිරීම. ඔවුන් අනුව හැසිරෙමින් හික්මෙන්නේය. ''**එකාසනසසව රහො චිතතූපසමසසව**'' එකම අසහාය වූ කායවිවේකය වඩන්නාට රහසිගතව කමටහනෙහිම සිත පිහිටුවා අසුනෙහි ම හිඳ හික්මෙන්නේ ය. මෙසේ කමටහන් අනුව යෙදෙන්නා භාවනාවෙහි ද මස්තක ප්‍රාප්ත වී මුලුමනින්ම සිතේ පවතින කෙලෙස් ධර්ම වනසා දමා හික්මෙන්නේ ය. අධි ශීල ශික්ෂාදියෙහිදී කෙලෙස් අතිශයින්ම සන්සිඳී ප්‍රහීණවේමය. මාර්ගඵල ශික්ෂාවෙහි හික්මෙන්නහුගේ අතිශයින්ම සන්සිඳුණේ නම් වේ. එම ගාථා දේශනාව අවසන්හිම තෙරණුවෝ විදසුන් වඩා රහත් වූහ.

අපදාන පාළියේදී වාරණ තෙරණුවෝ මෙසේ වදාළහ.

''මම එකල්හි හිමවතට පිවිස මන්ත්‍ර කියවීමි. පනස් සතර දාහක ශිෂ්‍යයෝ මට උපස්ථාන කළහ. ඒ සැමදෙනම වේද හදාළහු. වේදය දත්තාහු ඝඩංගවේදයේ පරතෙරට ගියාහු. ස්වකීය විද්‍යාවන්හි පරතෙරට ගියාහු හිමවතෙහි විසූහ. එකල්හි මහත් යසස් ඇති බෝසත් තෙම උපදනා කල්හි දසදහස්සී ලෝකධාතුව කම්පා විය. ලෝකනායකයන් වහන්සේ උපදනා කල්හි අඬයෝ ඇස් ලැබූහ. මේ සම්පූර්ණ පෘථිවිය හැමලෙසින්ම කම්පා විය. ඒ මහත් හඬ අසා මහජනයා නොසන්සුන් විය. සියලු දෙන එකතුව මාගේ සමීපයට පැමිණියාහුය. ''මේ පොළොව කම්පා විය. එහි විපාක කවරේ ද?''යි මගෙන් විමසූහ. මම එකල්හි ඔවුනට මෙසේ කීවෙමි.

''බිය නොවවු. තොපට බියෙක් නැත. සියල්ලෝම සැක නැත්තෝ වවු. මෙය සැප ඇති උපතෙකි. හේතු අටක් නිසා මේ මහපොළොව කම්පා වෙයි. එබඳු නිමිති ප්‍රකට වේ. මේ අතිමහත් ආලෝකයකි. පසැස් ඇති බුදුරජාණන් වහන්සේ නිසැකවම උපදිති''යි ජනයාට දන්වූ මම ඔවුන්ට පන්සිල් දුන්නෙමි. පන්සිල් ගැනීමෙන් ද බුදු උපත ඇසීමෙන් ද සතුටු වූ ඔවුහු හටගත් උදවේග ඇත්තෝ වූහ. මීට කල්ප දෙකකට පෙරදී යම් නිමිත්තක් විවරණය කර දුන්නෙමි ද එහි ආනිසංස වශයෙන් මම දුගතියක නූපන්නෙමි. බුද්ධ නිමිති විවරණ කිරීමේ පින මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

වාරණ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.8

''එකොපි සද්ධා මෙධාවී'' යනු ආයුෂ්මත් පස්සික තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේ ඉපිද පින් කරමින් අවුත් අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. දිනක් ශාස්තෘන් වහන්සේ දැකීමෙන් හටගත් ප්‍රසන්න වූ සිතින් ඔහු පුලිල ගෙඩි පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාදයේදී කොසොල් රට බමුණු පවුලක ඉපිද පස්සික නමින් ප්‍රකට වැඩිවියට පත්ව අප ශාස්තෘන් වහන්සේගේ යමාමහපෙළහර දැක ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි විය. මහණ දම් පුරමින් සිටි පස්සික හිමියෝ වරෙක රෝගාතුර වූහ. ඉක්බිති උන්වහන්සේ ඤාතීහු වෙදෙකු ගෙන්වා බෙහෙත් කරවීම් ආදියේ රෝගය දුරු කළ. ඒ ආබාධයෙන් සුවපත් වූ පස්සික හිමියෝ හටගත් සංවේගයෙන් භාවනාවට සිත යොදවා ෂඩ් අභිඥා ලාභී වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''මහත් වූ යසස් ඇති **අත්‍යදස්සි** බුදුරජහු අහසෙහි වඩිනු දැක පැහැදුණු සිත් ඇති වූ මම; සතුටින් යුතුව උන්වහන්සේට පුලිල ගෙඩියක් පිදුවෙමි. මීට කල්ප එක්දහස් අටසීයකට පෙර යම් ඵල පූජාවක් කළෙම් ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. ඵලදානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුද්ධානුසාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලාභී උන්වහන්සේ අහසින් නෑයන් වෙත වඩමවා අහසේ හිඳ දහම් දෙසා ඔවුන් සරණ සිල්හි පිහිටවූහ. ඔවුන් අතරින් ඇතමෙක් කළුරිය කොට සරණ සිල්හි පිහිටි බැවින් දෙව්ලොව උපන්හ. ඉක්බිති බුද්ධෝපස්ථානයට පැමිණි පස්සික තෙරුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ''පස්සික ! නුඹ ගේ නෑයෝ සුවසේ වෙසෙත් ද?'' විමසූහ. තෙරණුවෝ තමා නෑයන්ට කරන ලද උපකාර ශාස්තෘන් වහන්සේට පවසමින් මේ ගාථා තුන වදාළහ.

''එකොපි සද්ධා මෙධාවී අසඝදධානිධ ඤාතිනං
ධම්මඤ්ඤා සීලසම්පන්නෝ හොති අත්‍යාය බන්ධුනං

නිගඝෝ අනුකම්පාය වොදිතා ඤාතයෝ මයා
ඤාති බන්ධව පෙමෙන කාරං කත්වාන භික්ඛූසූ

තෙ අඛහනීතා කාලකතා පතතා තෙ නිදිවං සුඛං
භාතරෝ මය්හං මාතා ච මොදනති කාමකාමිනෝ''

එහි පළමු ගාථාවේ අර්ථ මෙසේ ය. යමෙක් කර්ම ඵල පිළිබඳ විශ්වාසයෙන් ද රතනත්‍රය පිළිබඳ විශ්වාසයෙන් ද යුක්ත වූයේ ''සද්ධා'' සැදහැ ඇතිව, එසේම කර්මයෙන් කළ ඤාණාදී යෝග වශයෙන් ''මෙධාවී'' නුවණ ඇතිව, ශාස්තෘන් වහන්සේගේ අවවාද අනුව ක්‍රියා කිරීමෙන් ලෝකෝත්තර ධර්මයෙහි පිහිටි බැවින් ''ධම්මට්ඨෝ'' ලොවුතුරු දහම් පිහිටියේ, ආචාර සීලයෙන් ද මාර්ග සීලයෙන් ද ඵල සීලයෙන් ද යුක්තව **''සීල සම්පන්නෝ''** සීල සම්පන්න වූයේ. මෙසේ දැක්වූ ශ්‍රද්ධාදී ගුණමහිමයෙන් යුතු එකම පුද්ගලයා පවා එම ගුණ විරහිත වූ **''අසඤ්ඤතානං''** අශ්‍රද්ධාවන්ත ''ඉධ'' මේ ලෝකයෙහි ''මොවුනු අපගේ යැයි දැනගත (ඤාතබ්බ) යුතු හෙයින් ''ඤාතී'' නම් ඤාතීන්ට, එසේම ප්‍රේම බන්ධනයෙන් බැඳුණු බැවින් ''බන්ධු'' යැයි ලැබූ මී අති ඤාතිහිතමිත්‍රාදීන්ට ''අත්ථායහොති'' හිතවැඩ පිණිස වේ. මෙසේ සැමට සාධාරණව පැවසූ ගුණ මහිම තමා තුළ වේ යැයි (අත්තූපනායික) තමා මුල් කොට දක්වනු සඳහා දෙවන, තෙවන ගාථාව කියන ලදී.

එහි **''නිගඝෝ අනුකම්පාය වොදිතා ඤාතයෝ මයා''** ''දැනුත් දුක්පත් බැවින් කුසලයක් නොකර, අනාගතයේ දුගතියට, පිරිතැවීමට නොපැමිණෙව''යි යනුවෙන් ඥාතීන්ට නිග්‍රහ කරමින් මවිසින් අවවාද දෙන ලදී. **''ඤාති බන්ධව පෙමෙන''** - ''මොහු අපගේ ඤාතියෙකි''යි මෙසේ පැවති ප්‍රේමය නිසා මගේ අවවාද ඉක්මවීමට අසමත් වූ ඔවුහු, **''කාරං කත්වාන භික්ඛූසූ''** පැහැදුණු සිත් චීවරාදී සිවුපසය පරිත්‍යාග කිරීමෙන් ද උපස්ථාන කිරීමෙන් ද භික්ෂූන් වහන්සේ කෙරෙහි සත්කාර සම්මාන කොට, **''තෙ අඛහනීතා කාලකතා''** ඒ මගේ ඥාතීහු කළුරිය කළාහු, මේ ලෝකය ඉක්මවූවාහු. නැවත **''තෙ''** යනු නිපාත මාත්‍රයකි. **''නිදිවං සුඛං''** දෙව්ලොවට අයත් සියලු සැප හෝ පැතූ දෙව් සැප ලබාගත්හ. ''ඒ කවර ඤාතීහුද?''යි දක්වීමට - **''භාතරෝ මය්හං මාතා ච මොදනති කාම කාමිනෝ''** මගේ සෝයුරෝ ද මෑණියෝ ද කළුරිය කළාහු තමා විසින් පැතුවාවූ වස්තු කාම සම්පත්තීන්ගෙන් යුක්තව සතුටුවෙති. ප්‍රීතිවෙති.

පස්සික ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.9

''**කාල පබ්බඛසංකාසෝ**'' යනු ආයුෂ්මත් **යසෝජ** තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ පැතුම් ඇතිව, ඒ ඒ භවයේදී පින් රැස්කරමින් අවුත් විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී ආරාමය ආරක්ෂාකරන පවුලෙහි උපන්හ. දිනක් ඒ කුමරු වැඩිවියට පත්ව සිටියේ, විපස්සි භාග්‍යවතුන් වහන්සේ අහසින් වඩිනු දුටුවේය. ඔහු පහන් සිතින් රට දෙල් ගෙඩියක් පිදීය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිසුන් අතර සැරි සැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාදයේදී සැවැත් නුවර දොර කෙවුල් ගමෙහි පන්සීයක් පවුල්වලට නායකයා ගේ පුතු ව උපන්නේ ය. යසෝජ නාමය තැබූ ඔහු වැඩිවියට පත්වම තම යහලු වූ කෙවුල් පුතුන් සමග මසුන් ඇල්ලීමට අචිරවතී නදියට ගොස් දැලක් දමීය. ඒ දැල තුලට එක් රන්වන් මහා මත්ස්‍යයෙක් ඇතුළු විය. යසෝජ ඒ මාළුවා ගෙන ගොස් පසේනදී කොසොල් රජුට දක්වීය. රජතුමා ''මේ මාළුවගේ රන්වන් වීමට හේතුව භාග්‍යවතුන් වහන්සේ දන්නේයැ''යි කියා මාළුවාත් ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන ගොස් දක්වීය. භාග්‍යවතුන් වහන්සේ ''මෙතෙම කාශ්‍යප බුදුරදුන්ගේ සසුන පිරිහෙන කාලයේ දී පැවිදිව, වැරදි පිළිවෙත් වලින් සසුන පිරිහවා නිරයේ උපන්නේ ය. එක් බුද්ධාන්තරයක්ම නිරයේ පැසී ඉන් චුතව අච්චරවතියේ මත්ස්‍යයෙක් ව උපන්නේ ය. ඔහුගේ නැගනිවරු ද නිරයේ උපන් බවත් සොහොයුරු වූ තෙරුන්ගේ පිරිනිවීමත් යන සියලු කථාන්තරය කපිල සූත්‍රය ඇසුරින් දක්වන ලදී. එම ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව ඇසූ යසෝජ සංවේගයෙන් තම යහලුවන් සමඟම බුදු සසුනේ පැවිදිව යෝග්‍යස්ථානයක වෙසෙනුයේ, දිනක් පිරිවර සහිතව භාග්‍යවතුන් වහන්සේට වැඳීම සඳහා ජේතවනාරාමයට ගියේය. උන්වහන්සේගේ පැමිණීමත් සමඟ සෙනසුන් පැනවීම් ආදියෙන් විහාරයේ මහත් කලබල බවක්, මහත් ශබ්දයක් අති විය. ඒ හඬ ඇසූ භාග්‍යවතුන් වහන්සේ ''පිරිවර සහිත වූ යසෝජ හිමියන් එලවා දමවු'' යි යනාදී ලෙස උදාන පාළියේ දැක් වූ පරිදි එළවා දැමූ සේක. එළවා දැමූ ආයුෂ්මත් යසෝජ තෙරුන් කස පහර ලද භද්‍ර වූ අජානීය අශ්වයකු මෙන් සංවේගපත් සිතින් පිරිස සමඟ වග්ගුමුදා නදී තෙර වෙසෙමින් වීර්ය වඩා, උත්සාහ කර විදසුනට සිත් යොමුකර වස් කාලය ඇතුලතදී ම ෂඩ් අභිඥා ලාභී විය.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''එකල මම බන්ධුමතී නුවර ආරම වතාවත් කරන්නෙක් වූයෙමි. අහසෙහි වඩින කෙලෙස් විරහිත බුදුරදුන් දුටුවෙමි. දෙල් ගෙඩියක් ගෙන බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට පිළිගැන්වීමි. මගේ ප්‍රීතිය ඇතිකරවන, මෙලොවදී ම සැප ගෙන දෙන, මහත් යසස් ඇති බුදුරජාණන් වහන්සේ අහසේ වැඩ හිඳිමින්ම එය පිළිගත් සේක. ඵල පූජාව කිරීමෙන් මහත් වූ ප්‍රීතිය ද උතුම් වූ සැපය ද ලැබූ මම ඒ ඒ භවයේ ඉපිද රත්රුවන් ලැබුවෙමි. මීට කල්ප අනූ එකකට පෙර යම් ඵල දානයක් දුන්නෙමි ද එහි විපාක වශයෙන් මේ දක්වා ම දුගතියක නූපන්නෙමි. -පෙ- දැන් ම විසින් බුද්ධානුශාසනාව කරන ලදී.''

ෂඩ් අභිඥා ලාභී වූ පිරිස සහිත ආයුෂ්මත් තෙරණුවන් කැඳවූ ශාස්තෘන් වහන්සේ අකම්පිත පිළිසඳර කථා කළ සේක. උන්වහන්සේ සියලුම ධූතාංග ධර්ම සමාදන්ව සිටියහ. එනිසා යසෝජ තෙරුන්ගේ සිරුර ඉතා කෘෂ, දුර්වර්ණ, රළු වූවක් විය. භාග්‍යවතුන් වහන්සේ ඒ පරම අල්පේච්ඡතාවය පසසන සේක් මේ පළමු ගාථාව වදාළහ.

''**කාල පබ්බංග සංකාසෝ - කිසෝ ධමනිසන්ථතෝ**
මත්තඤ්ඤූ අන්නපානස්මිං අදීන මනසෝ නරෝ''

එහි ''**කාල පබ්බංගසංකාසෝ**'' මස් රුධිරකිරීම, වර්ධනය කිරීම දුරලූ බැවින් කෘශ වූ නපුරු වූ ශරීරාවය ඇති, කළුවැල් පුරුක් බඳු වූ ශරීරාංග ඇති, එනිසා කියන ලදී. ''**කිසෝ**' මොනෙය්‍ය ප්‍රතිපදාව පිරීමෙන් කෘෂ වූ ශරීර ඇති, ''**ධමනිසන්ථතෝ**'' අල්ප වූ මස් ලේ ඇති ශරීරයේ ප්‍රකට වූ ඉල්පුණු නහරවැලින් පිරී ගිය සිරුරු ඇතිව මහ නහර, ශිරා පැතිරී ශරීරය ඇතිව, ''**මත්තඤ්ඤූ**' සොයන,පිළිගන්නා, පරිභෝග කරන, අත්හරින භෝජනයෙහි පමණ දන්නා. ''**අදීනමනසෝ**'' කුසීත බව ආදියෙන් නොමැඩලූ බැවින් ස්ථීර සිත් ඇති. කම්මැලි නොවූ පැවැත්ම. ''**නරෝ**'' පුරුෂයා. සාමාන්‍ය පුරුෂයකුගේ බර ඉසිලීමට සමත් වූ පුරුෂ ලක්ෂණයේ, පුරුෂ වීර්යෙන් යුතු. මෙසේ යසෝජ තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේ විසින් පසසන ලද ඒ ගුණ මහිම තමා තුළ වේ යැයි වීර්යාරම්භය, විවේකයේ ඇලීම ආදි ගුණ ප්‍රකට කිරීම් වශයෙන් භික්ෂූන්ට දහම් දෙසමින් මේ ගාථා දෙක වදාළහ.

''**ථූථෙය්‍යා ඩංසෙහි මකසෙහි, අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ**
නාගෝ සංගාම සීසෙව, සතෝ තත්‍රාධිවාසයෙ

යථා බ්‍රහ්මා තථා එකෝ, යථා දෙවෝ තථා දුවේ
යථා ගාමෝ තථා තයෝ, කොලාහලං තතූතතරිං''

එහි ''නාගෝ සංගාමසීසෙවා'' යම් සේ ආජානෙය්‍ය ඇත් රජු යුධ මැද දී කඩු, හී, තෝමරාදී පහර ඉවසමින් සතුරු සෙනඟ විද්වංසනය කරන්නේ ද එසේම කැළයෙහි වෙසෙන භික්‍ෂුව ද ආරණ්‍යක වූ මැසිමදුරු ආදී උපද්‍රව සිහි ඇතිව ඉවසන්නේ ය, එසේ ඉවසමින් භාවනා බලයෙන් මාර බලය සුණුවිසුණු කරන්නේ ය. ''යථා බ්‍රහ්මා'' බ්‍රහ්මයා හුදකලාව සිත් කෝපවීම් විරහිතව නිරන්තරව ධ්‍යාන සුවයෙන්ම සුවපත් ව වසන්නේ යම් සේද එසේම ''එකෝ'' භික්‍ෂුව ද තනිව, හුදකලාව විවේක සැපය විඳිමින් සැප විඳියි. හුදකලා වූ ශ්‍රමණයාගේ සැපය ඉතා උසස් යැයි කියන ලදී. මේ ප්‍රකාශයෙන් හුදකලාව වෙසෙන භික්‍ෂුව බ්‍රහ්මයකු වැනි යැයි අවවාද දෙයි. ''යථා දෙවෝ තථා දුවේ'' දෙවියන් අතර සිත් කෝපවීම් ආදිය ඇතිවන්නාක් මෙන් භික්‍ෂූන් දෙදෙනෙකු සිටින විට, එක්ව විසීමේ දී ගැටුම් ද ඇති වේ. එනිසා දෙදෙනෙකු සමඟ විසීම දෙවියන් හා සමවූවකි. ''යථා ගාමෙ තථා තයෝ'' මෙය අප පාඨයකි. තිදෙනෙක් වූ භික්‍ෂුව එක්ව විසීම ගමක විසීම හා සමය. විවේක වාසයක් නොවේ යන අදහසයි. ''කොලාහලං තතූතතරිං'' තිදෙනෙකුට වඩා වූ බොහෝ පිරිසක් සමඟ විසීමෙන්, කෝලාහලයක්, මහත් - උස් ශබ්ද ඇති මහාජන සන්නිපාතයක් හා සමාන කලබලයක් ඇති වේ. ''එනිසා හුදකලා වාසය කිරීම අගනේය'' යන අදහසයි.

යසෝජ තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.10

''අනු තුඣං පුරෙ සඬා'' යනාදී ගාථා ආයුෂ්මත් සාටිමත්තිය තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේ දී පින් රැස් කරමින් අවුත් සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්හ. නුවණැති බවට පත් ඒ සිටු කුමරු දිනක් ශාස්තෘන් වහන්සේ දැක පැහැදුණු සිතින් තල් අත්තක් (වටාපතක්) දුන්නේ ය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව්-මිනිස් දෙගතියේ සැරි සැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී මගධ රට

බමුණු කුලයක ඉපිද **සාටිමත්තික** නමින් ප්‍රකට විය. ඔහු තුරුණුවියට පැමිණ පූර්ව හේතු සම්පත් ඇති බැවින් ආරණ්‍යයක භික්ෂූන් සමීපයේ පැවිදි වී විදසුන් කමටහන වඩා ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් විය.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''මම සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට රන් රුවනින් වසන ලද තල් වටක් දුන්නෙමි. එයින් මහත් යසස් දරමි. මීට කල්ප අනූ හතරකට පෙර මම තල් අත්තක්, වටාපතක් පිදුවෙමි ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥා ලාභී වූ උන්වහන්සේ භික්ෂූන්ට අවවාද දෙති. අනුශාසනා කරති. බොහෝ සත්ත්වයන්ට ධර්මය දෙසමින් සරණ සිල්හි පිහිටුවති. එක්තරා ශ්‍රද්ධාව නැති අප්‍රසාද වූ පවුලක් බුදුසමයෙහි විශේෂයෙන් පැහැදුණු බවට පත් කළහ. එනිසා එම පවුලට අයත් මිනිස්සු තෙරුන් වහන්සේ කෙරෙහි විශේෂයෙන්ම පැහැදුණහ. එම පවුලේ එක් රූමත් දැකුම්කළු දැරිවියක් පිඬුපිණිස වැඩම කළ තෙරුන්ට මැනවින් සකසා දානය පූජා කරන්නීය. දිනක් මාරයා ''මෙසේ කිරීමෙන් මේ තෙරුන්ගේ අපකීර්තිය වැඩේ. සසුනේ පිහිටක් නොලැබේ'' යැයි සිතා තෙරුන්ගේ රුව මවාගෙන ගොස් ඒ දැරියගේ අත අල්ලා ගත්තේය. දැරිය ''මේ මනුෂ්‍ය ස්පර්ශයක් නොවේ''යැයි සිතා දැනගත්තී අත මුදාගත්තීය. මෙය දුටු ඒ ගෙදර වැසියෝ තෙරුන් පිළිබඳව අප්‍රසාදයක් ඇතිකර ගත්හ.

දෙවැනි දිනයේ සාටිමත්තිය තෙරුන් එම කාරණය සිහි නොකරම ඒ ගෙදරට පිඬුසිඟා වැඩි නමුත් ඒ ගෙදර මිනිස්සු අනාදර-අප්‍රසාද බවක් දක්වූහ. එවිට තෙරණුවෝ ඊට හේතු විමසා බැලූහ. පෙරදින මාරයාගේ ක්‍රියාව දුටු තෙරණුවෝ ඔහුගේ බෙල්ලෙන්ම බලුකුණ ඉවත්කරමි අධිෂ්ඨාන කොට, ඒ දුෂ්ට ක්‍රියාවෙන් තෙරුන් මුදවා ගැනීමට පැමිණි මාරයා ලවා පෙරදින සිදු වූ පුවත තත්වාකාරයෙන්ම ප්‍රකාශ කරවා, මාරයා බිය කරවා, තර්ජනය කර අත්හැරියහ. ඒ දුටු ගෙදර ප්‍රධානියා, ''ස්වාමීනි! වරදට සමාවනු මැනවි''යි තෙරුන්ගෙන් සමාව ගෙන, ''ස්වාමීනි ! මම අද පටන් ඔබ වහන්සේට උපස්ථාන කරමි''යි පැවසීය. තෙරණුවෝ ඔහුට දහම් දෙසන සේක් මේ ගාථා තුන වදාළහ.

''අනුතුයඞං පුරෙ සද්ධා - සාතෙ අජ්ජ න විජ්ජති
යං තුයඞං තුයඞමෙවෙතං - නත්ථි දුචරිතං මම

අනිච්චා හි චලා සද්ධා - එවං දිට්ඨාහි සාමයා
රජ්ජනති පි විරජ්ජනති - තත්‍ර කිං ජීය්‍යතෙ මුනි

පවෙචති මුනිනො හතතං - ථොකථොකං කුලෙ කුලෙ
පිණ්ඩිකාය චරිසසාමි - අත්ථි ජංඝා බලං මම''

එහි ''අනු තුයඞං පුරෙ සද්ධා සා තෙ අජ්ජ න විජ්ජති'' උපාසකය, මීට පෙර නුඹ මා කෙරෙහි, ''මේ ආර්යයන් වහන්සේ ධර්මයෙහි හැසිරෙන්නෙකි. ධාර්මිකව හැසිරෙන්නෙකි''යි ආදී වශයෙන් ශ්‍රද්ධාවෙන් යුතු විය. ඒ ශ්‍රද්ධාව දැන්, අද නුඹ හට නැති විය. එනිසා මේ දෙය නුඹහටම වේවා. සිවුපස දීම හෝ නොදීම නුඹගේම කටයුත්තකි. ඉන් මා හට වන අර්ථයක්, ලාභයක් නැත. යහපත් වූ පැහැදුණු සිතින්ම දන් දිය යුතුයි'' යන අදහසයි. නැතහොත් ''නුඹලා කරගත් දෙය නුඹලාටම ලැබේ. නුඹ අද මා කෙරෙහි අගෞරව දැක්වී ද එය ද නුඹටම අයත් ය. එහි විපාක නුඹ විසින්ම අනුභව කළ යුතු වේ. ම විසින් නොවේ'' යන අර්ථයයි. ''**නත්ථි දුචරිතං මම**'' යනු මගේ දුශ්චරිතයක් නම් නැත. ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන්ම දුශ්චරිතයට හේතු වූ කෙලෙස් දහම් මුලිනුපුටා හළ බැවිණි. ''**අනිච්චා හි චලා සද්ධා**'' පුහුදුන් ශ්‍රද්ධාව, චල ශ්‍රද්ධාව අනිත්‍ය වූවකි. එය ස්ථිරව නොපිහිටියි. එනිසාම ''**චල**'' නම් වේ. අසුපිට තැබූ මැටි බඳුනක් මෙන් ද දහයියා ගොඩේ සිට වූ කණුවක් මෙන් ද අස්ථිරය. චංචලය. ''**එවං දිට්ඨාහි සා මයා**'' මෙසේ වූ ඒ ශ්‍රද්ධාව ම විසින් නුඹ කෙරෙහි ඇති බව ප්‍රත්‍යක්ෂයෙන්ම දැනගන්නා ලද්දේය. ''**රජ්ජනති පි විරජ්ජනති**'' මෙසේ වූ ඒ අස්ථිර භාවය නිසාම මේ සත්ත්වයෝ ඇතැම් දිනෙක, ඇතැම් තැනෙක මිත්‍ර පැවතුම් වශයෙන් ඇලෙති. සෙනෙහස දක්වති. ඇතැම් දිනෙක විරුද්ධ වෙති. නොඇලුණු සිත් ඇත්තෝ වෙති. ''**තත්‍ර කිං ජීය්‍යතෙ මුනී**'' ඒ පුහුදුන් පුද්ගලයන්ගේ ඇලීමෙහිදීත් ගැටීමෙහිදීත් මුනිවරයාට, පැවිද්දාට පිරිහීමක් වේ ද? ඔහුට කුමන හානියක් සිදුවේද? හානියක්, පිරිහීමක් නොවේ යන අර්ථයයි. ''ඉදින් මාගේ සිවුපසය නොගන්නෙහි නම් නුඹ වහන්සේ කෙසේ නම් යැපෙන්නෙහිද?'' යනුවෙන් නොසිතිය යුතු බව දක්වමින්, ඊට පිළිතුරු ලෙස ''පවෙචති'' යන තෙවන ගාථාව වදාළහ.

එහි අර්ථ මෙසේ ය. ''පැවිදි වූ මුනිවරයාට ආහාර ගෙයක් ගෙයක් පාසා දිනපතාම ටික ටික පැසෙයි. නුඹේ ගෙයිම පමණක් එසේ පැසෙන්නේ

නොවේ. ''**පිණ්ඩිකාය චරිස්සාමි අහඤ් ජංඝාබලං මම**'' මාගේ ජංඝා (කෙණ්ඩ) ඉතා ශක්තිමත් ය. බිඳුණු කුදු වූ හෝ රෝග සහිත පා මට නැත. එනිසා පිඬු පිණිස, මිශ්‍රාහාර පිණිස හැසිරෙන්නෙමි. ''බඹරා මල්වලින් රොන් ගන්නාක් මෙන්'' ආදී වශයෙන් ශාස්තෘන් වහන්සේ වදාළ ආකාරයෙන් ගමෙහි හැසිර යැපෙන්නෙමි''යි දක්වයි.

සාටිමන්තිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.11

''**සද්ධාය අභිනික්ඛමම**'' ආයුෂ්මත් **උපාලි** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේදී හංසවතී නුවර සිටුගෙයක ඉපිද, දිනක් ශාස්තෘන් වහන්සේගේ දහැමි කථාව අසමින් සිටිය දී එක් භික්ෂුවක් විනයධාරීන් අතරින් අග තනතුරෙහි තබනු දක, එම තනතුර කැමතිව ප්‍රාර්ථනා කළ සේක. දිවි ඇති තාක් පින් දහම් කළ හෙතෙම දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේ දී කරණවෑම් කුලයේ ඉපිද උපාලි නමින් ප්‍රකට විය. වැඩිවියට පත් ඔහු අනුරුද්ධ ආදී ක්ෂත්‍රිය කුමාරවරු සදෙනාට ඉතා ප්‍රියමනාපව සිටියේය. අප තථාගතයන් වහන්සේ අනුපිය අඹුවනයේ වෙසෙන කල්හි පැවිදිවීම පිණිස නික්මුණු ඒ ක්ෂත්‍රිය කුමරු සදෙනා සමඟ නික්මී පැවිදි විය. ඔහුගේ පැවිදිවීම පිළිබඳ තොරතුරු ත්‍රිපිටක පෙළෙහි ඇත. පැවිදි වූ උපාලි හිමියෝ උපසම්පදාව ලබා භාග්‍යවතුන් වහන්සේගෙන් කමටහන් ගෙන, ''ස්වාමීනි, මා හට ආරණ්‍යවාසය අනුදත්තා සේක්වා''යි ඉල්වූහ. ''මහණ ! නුඹට අරණ්‍ය වාසයෙන් එකම ධුරයක් වර්ධනය වේ. අපගේ සම්පයේ විසීමෙන් නුඹට විපස්සනා ධුරයත්, ග්‍රන්ථ ධුරයත් යන දෙකම සම්පූර්ණ වන්නෙහිය'' යනුවෙන් වදාළ ශාස්තෘන් වහන්සේගේ වදන් පිළිගත් උපාලි තෙරණුවෝ විදසුන් වඩා නොබෝ කලකින්ම රහත් බවට පත්වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''හංසවතී නුවර රැස් කරගත් අසූ කෙළක් ධනය ඇති, සමෘද්ධිමත් ධන ධාන්‍ය ඇති වේද හදාරන්නා වූ, මන්ත්‍ර ධරන්නා වූ, වේදත්‍රයෙහි

පරතෙරට ගිය, ලක්ෂණ ශාස්ත්‍රයේ ද ඉතිහාසයෙහි ද බමුණු ධර්මයේ ද පරතෙරට ගිය සුජාත නම් බමුණෙක් වීමි. එකල එක් සිළුවක් ඇති ඒකසිඛයෝ ද පිරිවැජියෝ ද ගෝතමඍෂිහුගේ ශ්‍රාවකයෝ ද චරකයෝ ද තවුසෝ ද පොළොවෙහි හැසිරෙති. ඔවුහු ද ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙකැයි මා පිරිවරති. බොහෝ දෙන මට පුදති. මම කිසිවෙකු නො පුදමි. තථාගතයන් ලොව පහළ නොවනතාක්ම ''බුද්ධ'' යන වචනය පවා ලෝකයේ නැත. එකල මම මානයෙන් තදවූයෙමි පිදිය යුත්තෙකු නොදුටුවෙමි.''

''බොහෝ දිවා රාත්‍රී පසුවීමෙන් පසැස් ඇති පදුමුත්තර නම් වූ ලෝකනායකයන් වහන්සේ ලොව පහළ වූහ. ලොව සියලු අඳුරු දුරුකොට, බුදුසසුන පැතිරුණු කල්හි මැනවැයි සම්මතව අභිවෘද්ධියට පැමිණි කල්හි බුදුපියාණන් වහන්සේ හංසවතී නුවරට වැඩම කළහ. පසැස් ඇති බුදුපියාණන් වහන්සේ පියාණන්ට වැඩ පිණිස දහම් දෙසූහ. එකල්හි පිරිසද හාත්පස යොදුනක් පමණ තැන්හි පැතිරුණේය''

''මිනිසුන් අතර සුනන්ද නමින් ප්‍රකට තවුස්තෙම බුදුපිරිස වැසෙන සේ මල් වලින් පූජා කළේය. මල් මඩුවෙහි (පූජ්‍ය මණ්ඩපයෙහි) හිඳිමින් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ චතුස්සත්‍යය දේශනා කළ කල්හි කෙළ ලක්ෂයක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය ලැබුණි. පස්මරුන් දිනූ බුදුරජාණෝ සතියක්ම දහම් වැසි වස්වා අටවන දින සුනන්දට මෙසේ වදාළහ.

''මෙතෙම සසරෙහි දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරන්නේ ය. භවයන්හි සියල්ලනටම උතුම්ව හැසිරෙන්නේ ය. කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයේ උපදින ගෝතුයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලොව පහළ වෙති. ඒ උතුම් ගෞතම බුදුසසුනේ ධර්මයට දායාද වූ බුදුරදුන්ගේ ඖරස පුත්‍ර වූ ධර්මයෙන්ම මවන ලද වැනි වූ පුණ්ණමන්තානි පුත්ත නම් බුද්ධ ශ්‍රාවකයා වන්නේ ය.'' එකල සම්බුදුරජාණෝ සියලු දෙනා සතුටු කරමින් තම බලය ද දක්වමින් සුනන්ද තවුසාට පැවසූ මේ වදන් ඇසූ ජනයෝ ඇදලි බැඳගෙන, ''බුදුරජාණන් කෙරෙහි පින්කම් කොට තම ගතිය පිරිසිදු කළේය'' යි සුනන්ද තවුසාට නමස්කාර කළහ.''

''බුදුපියාණන් වහන්සේගේ වදන් ඇසූ මට ද මෙසේ සිතුණි. ''යම් පින්කමක් කිරීමෙන් ගෞතම බුදුහු දකිය හැකිවේ ද මම ද එබඳු පින්කමක් කරමි''යැයි සිතූ මම ''ඒ සඳහා කළ යුතු පින්කම කුමක් ද?''යි සෙවූවෙමි. ඉතා උතුම් වූ පින්කෙතක් වූ තුණුරුවනට මම කවර පූජාවක් කරමි ද?''යි සිතුවෙමි.

''පදුමුත්තර බුදුරජාණෝ පාඨීක නම් භික්ෂුව බුදුසසුනේ සියලු මධුස්වර පාඨකයන් අතුරින් ද විනයෙහි ද අග්‍රස්ථානයෙහි තැබූහ. මම ඒ තනතුර පැතිමි. මාගේ මේ අපමණ සම්පත් සයුර මෙන් නොකැළඹිය හැකිය. ඒ මාගේ ධනයෙන් බුදුරදුනට ආරාමයක් කරවීමි. නගරයට නැගෙනහිරින් වූ සෝභන නම් උයන ලක්ෂයකට මිලදී ගෙන එහි සංඝාරාමයක් කරවීමි. එහි කුළු ගෙවල් ද ප්‍රාසාද ද මණ්ඩප ද සඳලු සහිත ගෙවල් ද දොර නොලූ ගුහාවන් ද සක්මන් මළු ද මනාව සැකසූවෙමි. ජන්තාඝරය ද ගිනිගෙය ද පැන් කල තබන ගෙය ද නහන ගෙය ද කරවා සංඝයාට පිදුවෙමි. දික්සඟලා පුටු ද කුඩා පුටු ද පරිභෝග භාජන ද ආරාමිකයන්ට දෙන බෙහෙත් ද යන සියල්ල දුන්නෙමි. සන්සුන් සිත් ඇති, අකම්පා වූ ගුණ ඇති උතුමන්ගේ ගුණයන්ට කිසිවෙකු පීඩා නොකෙරෙත්වා යි ආරක්ෂාව දැඩිකොට තබා පවුරක් කරවීමි. ලක්ෂයක් ධන වියදමින් ඒ සංඝාරාමයේ කරවූ ආවාසය ඉතා උසස් බවට පමුණුවා බුදුරදුන්ට පිදුවෙමි.''

''මවිසින් ආරාම සාදා නිමවන ලදී. තථාගතයන් වහන්ස! ඔබවහන්සේ මෙය පිළිගත මැනවි. වීරයන් වහන්ස, මෙය ඔබවහන්සේට දෙන්නෙමි. පසැස් ඇති උතුමාණෙනි, මෙය පිළිගත මැනව.''යි යන මාගේ අදහස දත්; පූජාසත්කාර පිළිගැනීමට සුදුසු වූ ලෝකනායක වූ පදුමුත්තර බුදුපියාණෝ ඒ අරම ඉවසූ සේක. මහර්ෂීන් වහන්සේ එය පිළිගත් බව දුටු මම භෝජනය පිළියෙල කර, කාලය ආරෝචනය කළෙමි. කල් දන්වූ විට පදුමුත්තර බුදුහු දහසක් රහතුන් පිරිවරා මාගේ ආරාමයට වැඩම කළහ. සුදුසු කාලය දැන වැඩ හුන්නා වූ උන්වහන්සේ ආහාර පානයෙන් තෘප්තිමත් කෙළෙමි. වළඳා අවසන් වූ උන්වහන්සේට සුදුසු අවස්ථාව බලා මෙසේ පැවසූවෙමි.

''සෝභන උයන ලක්ෂයක් මිල ගෙවා මිලදී ගත්තෙමි. එපමණම මුදලකින් සෙසු කටයුතු සිදු කළෙමි. බුදුරජාණන් වහන්සේ එය පිළිගත් සේක. මේ ආරාම පූජාවෙන් ද චිත්ත පුණ්ඩියෙන් ද භවයේ උපදින මාහට පැතු සියල්ල ලැබේවා'' මනාව නිමවූ ඒ සංඝාරාමය පිළිගත් බුදුපියාණන් වහන්සේ බික් සඟන මැද හිඳ ඒ ආරාම පූජාවෙහි අනුසස් මෙසේ දක්වූ සේක. ''යමෙක් මේ සංඝාරාමය මනාව කරවා බුදුරජාණන් වහන්සේට පූජා කළේ ද, ඒ ආරාම පූජා ආනිසංස දක්වන මාගේ වචන මනාව අසවු. ඔහු පිළිබඳ පවසන මේ වදන් සැම දෙන අසවු.''

''ඇත්-අස්-රිය- පාබළ සේනා නිරන්තරව මොහු පිරිවරා සිටියි. මෙය සංඝාරාම පූජාවේ ආනිසංසයි. සැට දහසක් තූර්ය නාදයෝ ද මනාව සැරසූ බෙරවයන්නෝ ද නිතර මොහු පිරිවරා සිටිති. මනාව විසිතුරු ආභරණයන්ගෙන් සැරසීගත්, එල්වූ මිණිකොඩොල් ඇති මහත් වූ දිගු ඇස් ඇති, සතුට උපදන ලීලා විලාස ඇති, මනාවූ ශරීරාවයව ඇති, සිහින් ඉඟ ඇති, සොළොස් දහසක් ස්ත්‍රීහු නිරතුරුව මොහු පිරිවරා සිටිති. සංඝාරාම පූජාවේ විපාක මෙබඳුය. කල්ප තිස් දහසක් මුලුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. ශක්‍රව දහස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දෙවිරජව සියලු සැප සම්පත් ලබා දිව්‍ය රාජ්‍යය කරන්නේ ය. සක්විති රජව දහස් වරක් උපදින්නේ ය. මොහු පෘථිවි රාජ්‍ය සම්පත් පමණ කළ නොහැක. මීට කල්ප ලක්‍ෂයකට පසුව ඔක්කාල කුලයේ ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ ඖරස පුත්‍ර වූ ධර්මයෙහි හිමිකම් ඇති, ධර්මයෙන් නිර්මිත වූ උපාලි නම් බුද්ධ ශ්‍රාවකයා වන්නේ ය. විනයෙහි කෙළ පැමිණ කටයුතු-නොකටයුතු මනාව දන්නා වූ හෙතෙම ත්‍රිපිටක ධර්මය දරමින් අනාශ්‍රවව වෙසෙන්නේ ය. ශාක්‍යකුල ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණෝ සියල්ල දැන මෙතෙම සඟ මැද හිඳ අග්‍රස්ථානයෙහි තබන්නාහ.''

''අපමණ කලක සිට ඔබගේ සසුනෙහි විනයධාරීන් අතර අග තනතුර පැතුවෙමි. සියලු සංයෝජන ක්‍ෂය කිරීම නම් වූ ඒ අර්ථය මාවිසින් ලබන ලදී. රාජ දණ්ඩනයෙන් තැති ගත් පුරුෂයා හුලෙහි හිඳුවා සැපයක් නොවිඳින්නේ ඉන් මිදීම කැමති වන්නාක් මෙන් මහාවීරයන් වහන්ස ! මම ද භව දණ්ඩනයෙන් තැතිගෙන කර්මය නම් හුලෙහි ඇමිණී තෘෂ්ණාවෙන් මඬනා ලද්දෙමි. රාගාදී ත්‍රිවිධ ගින්නෙන් දැවෙමින් භවයේ සැපතක් නොවින්දෙමි. රජ දඬුවමින් තැතිගත්තකු මෙන් මිදීම සොයමි. සර්පයකු විසින් දෂ්ට කළ පුරුෂයෙක් ඉන් පෙළෙමින් විෂ නසන ආයුෂ රකින බෙහෙතක් සොයන්නේ, ඒ බෙහෙත ලැබ ඉන් මිදීම පිණිස බෙහෙත බී සුවපත් වන්නාක් මෙන් මහාවීරයන් වහන්ස ! මම ද විෂයෙන් නැසීම මෙන් අවිද්‍යාවෙන් පෙළුණෙමි. සදහම් බෙහෙත සෙවූවෙමි. සියලු ඖෂධයන්ට අග්‍ර වූ සියලු හුල් දුරු කරන ඒ බුද්ධ ශාසන නම් සදහම් ඔසුව දුටුවෙමි. ඒ සදහම් ඔසුව බිවූ මම සියලු අවිද්‍යා විෂ නැසුවෙමි. අජරාමර වූ සිසිල් වූ නිවණ ප්‍රත්‍යක්‍ෂ කළෙමි.''

''භූතයෙකු විසින් පෙලූ මිනිසෙක් භූත ග්‍රහණයෙන් පීඩිත වූයේ භූතයාගෙන් මිදීම පිණිස භූත වෛද්‍යවරයෙකු සොයයි. සෙවූ ඔහුට භූත විද්‍යාවෙහි දක්‍ෂ වෛද්‍යවරයකු හමු වේ. ඒ වෙදතුමා ඔහුගේ භූතයා

නසන්නේය. සහමුලින්ම වනසන්නේය. එලෙසින් මම ද මහාවීරයන් වහන්ස, ක්ලේශාන්ධකාරයෙන් පෙළුනෙම් අඳුරින් මිදීමට ඥාණාලෝකය සොයමි. ඉක්බිති කෙලෙස් අඳුර දුරලන්නා වූ ශාක්‍ය මුනින් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ භූත වෛද්‍යවරයා භූතයා දුරුකළාක් මෙන් මාගේ කෙලෙස් අඳුර දුරු කළ සේක. භූත වෛද්‍යවරයා බඳු බුද්ධ ඉගැන්වීම් අනුගමනයෙන් මම සසර සැඩ පහර සින්දෙමි. තණ්හා සැඩ පහර වැළැක්වූයෙමි. සියලු භව මුලිනුපුටා දැම්මි.''

''ගුරුළා තම ගොදුර වූ නාගයා වෙත වේගයෙන් බසී ද මහසමුදුර හාත්පස යොදුන් සීයක් පමණ තැන් කළඹා ද නාගයා ගෙන හිස යටිකුරු කර පෙළන්නේ රිසි තැනකට ගෙන යයි. මහාවීරයන් වහන්ස, එසේම මම ගුරුළා බිලි සොයන්නාක් මෙන් අසංඛත නම් වූ නිවණ සොයන්නෙම් කෙලෙස් දෝෂ සමුච්ඡේද වශයෙන් සෝදා හැරියෙමි. නිරන්තර ශාන්තපදය වූ උතුම් නිර්වාණ ධර්මය දක්නා ලද මම ගුරුළා නාගයා ගත්තාක් මෙන් ධර්මය ගෙන වෙසෙමි.''

''චිත්‍ර ලතා වනයෙහි හටගත් ආසාවතී නම් වැලක් ඇත. ඒ වැලේ අවුරුදු දහසකින් එක් මලක් පිපෙයි. එතෙක් දිගු කලක් ගොස් මල ඇති වූ කල්හි ඒ වැල දෙවියෝ ඇසුරු කරති. ඒ ආසාවතී නම් උතුම් වැල මෙසේ දෙවියන්ට ප්‍රිය වෙයි. කල්ප ලක්ෂයක පටන් මම ඒ බුදුරජාණන් වහන්සේ ඇසුරු කරමි. උදේ හවස නමදිමි. දෙවියන් ආසාවතී වැල ඇසුරු කරන්නාක් මෙනි. බුදුරදුන්ට උපස්ථාන කිරීම වඳ නොවන්නකි. නමස්කාර කිරීම සිස් නොවූවකි. සසර බොහෝ දුර සිට ආවා වූ මට ඇති වූ මේ බුද්ධෝත්පාද ක්ෂණය මා ඉක්මවා නො ගියේය. පරීක්ෂාකර බැලූ මම භවයෙහි මතු ප්‍රතිසන්ධියක් නො දකිමි. මම බඹ - කෙලෙස් උපධි විරහිත වූයෙමි කෙලෙසුන්ගෙන් මිදුනෙමි සන්සිදුනෙමි හැසිරෙමි.''

''පියුම් හිරු රැසින් පිපෙන්නාක් මෙන් මහාවීරයන් වහන්ස, මම ද බුදු රැසින් පිපුනෙමි වෙමි. කොක් ජාතියෙහි හැම කල්හි පිරිමි සත්තු විද්‍යමාන නොවෙති. ඒ කෙකණියෝ හැමදා මේඝ ගර්ජනා කරන කල්හි ගැබ් ගනිති. යම්තාක් කල් වැසි නොවසීද ඒ තාක් කල්ම ඒ කෙකණියෝ ගැබ් දරති. වැසි වසින කල්හිම ගැබ් බරින් මිදෙති. ඒ ආකාරයෙන්ම ධර්මය නම් මේඝ ගර්ජනා පැවැත් වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ නැමති ධර්ම මේඝයාගේ ශබ්දය අසා මම දහම් ගැබ් ගත්තෙමි. කල්ප ලක්ෂයක පටන් මම ඒ පින් නැමති ගැබ දරූයෙමි. ධර්මය නම් මේඝ ගර්ජනාව නොමැති කල්හි ඒ ගැබ් බරින් මම නොමිදුනෙමි. ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස,

යම් කලෙක්හි ඔබ රම්‍ය වූ කපිලවත්තු නගරයේ ධර්ම මේඝයෙන් ගර්ජනා පවත්වා දහම් වැසි වැස්වීද එවිට මම ගැබ්බරින් මිදුනෙමි.''

''ශූන්‍ය වූ නිමිති නොමැත්තා වූ තෘෂ්ණා උපධි රහිත වූ සසරි මිදෙන විමෝක්ෂ ධර්මයද චතුර්විධ ශ්‍රමණ ඵල ද යන මේ සියලු දහම් උපදවා ගත්තෙමි. පමණ කළ නොහැකි කාලයක සිට ඔබ වහන්සේගේ සසුන පැතීමි. ඒ පැතුමට අනුව මම අර්හත්වයට පැමිණියෙමි. ශාන්ත පදය වූ නිවණට පැමිණියෙමි. පදුමුත්තර බුදුසසුනේ පාඨික භික්ෂුව මේ චිනයෙහි පරතෙරට පත් මාහට සමානයකු නැත. මම ඔවාද සාසනය දරමි. චිනයෙහි උභතෝ විභංගයෙහි ද බන්ධකයෙහි ද තික සංඝාදිසේස-තික පාචිත්තියාදියෙහි ද පස්වන පරිවාරයෙහි ද අකුරකවත්, ව්‍යඤ්ජනයකවත් මාගේ සැකයක් නොමැත. පාපීන්ට නිග්‍රහ කිරීමෙහි ද සාපත්තික භික්ෂූනට ප්‍රතිකර්ම දීමෙන් ද කරුණෙහි හා නොකරුණෙහි දක්ෂ වූයෙම් නැවත සසුනට ඇතුළු කර ගැනීමෙහිද ඇවතින් නැගිටුවා ලීමෙහි ද යන මේ සියලු කාරණයන්හි පරතෙරට ගියෙමි. චිනයෙහි ද බන්ධකයෙහිද සුසුදු පද බහා විභංග බන්ධක දෙකින් නිරවුල් කොට ක්‍රම දක්වා කෘත්‍ය වශයෙන් සුදුසු අදහස් ඇතුලත් කරමි. නිරුක්තියෙහි ඉතා දක්ෂ වූයෙම් අභිවෘද්ධි පරිහානි ධර්මයන්හිද දක්ෂ වූයෙමි. ත්‍රිපිටකයෙහි මා නොදන්නා දෙයක් නැත. බුදු සසුනේ අසහාය වූ අග්‍රචිනයධරයා වූයෙමි. මම අද ශාක්‍ය පුත්‍ර වූ බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි චිනය විනිශ්චය දර්ශනයෙහි සියලු සැක දුරලමි. සියලු කුකුස් සිඳ දමමි.''

''පෙර පසු පද අකුරු ද දශවිධ ව්‍යඤ්ජන විධානය ද නිදානය ද නිගමනය ද යන මේ සියල්ලෙහිම මම දක්ෂ වෙමි. යම් සේ බලවත් රජෙක් සතුරු රජුගේ සෙනඟ පහකොට යුද්ධය ජයගෙන එහි නුවරක් ඉදි කරන්නේ ද පවුරද දිය අගල ද ඉඟුබිලය ද දොරටුව ද විවිධ අටලු ද යන බොහෝ දෙය එහි ඉදි කරන්නේ ය. සිවු මංසන්ධිය ඇතුළු වීථිද මැනවින් බෙදන ලද ආපණශාලාවන් ද එහි වරද - නිවරද කරන අධිකරණ ශාලාව ද කරවන්නේ ය. හෙතෙම සතුරන් නැසීම පිණිස ද නිදොස් දැනගැනීම පිණිස ද හට සමූහයා රැකීම පිණිස ද සෙන්පතියකු තබයි. ඒ රජු ''මගේ බඩු විනාශ නොවේවා''යි කියා රාජ භාණ්ඩයන්ගේ ආරක්ෂාව පිණිස ධන තැන්පත් කරන දක්ෂ පුරුෂයකු භාණ්ඩාගාරාරක්ෂකයා කර තබයි. යමෙක් රජුට මමත්වය කරන්නේ ද යමෙක් ඒ රජුගේ අභිවෘද්ධිය කැමැත්තේ ද ඒ මිත්‍රයාට පිළිපැදීමට අධිකරණයේ නායකත්වය දෙයි. ඔහු උත්පාත ශාස්ත්‍රයෙහි ද නිමිති ශාස්ත්‍රයෙහි ද ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද දක්ෂ වූ වේද හදාරන්නා වූ

මන්තු දරන්නා වූ පුරුෂයකු පුරෝහිත තනතුරෙහි තබයි. මේ අංගයන්නේ යුක්ත වූයේ ක්ෂත්‍රියයා යැයි කියනු ලැබේ. මේ සේනාව ස්ව ඤාතීන් වූ දුක්ඛිතයන් රකින සක්වාලිහිණියා මෙන් හැම කල්හි රජතුමා රකියි. මහාවීරයන් වහන්ස! එසේම ඔබ වහන්සේ නසන ලද සතුරන් ඇති රජෙකු මෙන් දෙවියන් සහිත ලෝකයෙහි ''ධර්ම රාජ'' නම් වන සේක. ඔබ වහන්සේ නිර්ඝාතයන් ද සේනා සහිත මාරයා ද නසා සත මෝහාන්ධකාරය දුරුකොට ධර්මනගරය මැවූ සේක.

''ප්‍රාඥයන් වහන්ස! ඒ ධර්ම නගරයෙහි ප්‍රාකාරය ශීලයයි. දොර කොටුව ඔබවහන්සේගේ ඥානයයි. ඉඳුකීලය ඔබවහන්සේගේ ශ්‍රද්ධාවයි. ද්වාර පාලකයා නම් සංවරයයි. අටල්ල සතිපට්ඨානයයි. සර්වඥයන් වහන්ස! ඇතුළු වීථිය ඔබවහන්සේගේ ප්‍රඥාවයි. සතරමං සන්ධිය සෘද්ධි පාදයයි. සත්තිස් බෝධිපාක්ෂික දහම් නැමති වීථීන්ගෙන් මැනවින් නිර්මිතය. සූත්‍ර අභිධර්ම විනය යන සියලු නවංග බුද්ධ වචනය ඔබගේ නගරයේ ධර්මාධිකරණ සභාවයි. සුඤ්ඤත විහාරය ද අනිමිත්ත විහාරය ද අප්පණිහිත විහාරය ද අනේජ විහාරය ද නිර්වාණය ද යන මේ ගුණධර්ම ඔබවහන්සේගේ ධර්ම කුටීහු වෙති.''

''ප්‍රඥාවෙන් අග්‍ර ස්ථානයෙහි තබන ලද, වැටහීමෙහි ද දක්ෂ වූ, නමින් ශාරිපුත්‍ර වූ ශ්‍රාවකයන් වහන්සේ ඔබ වහන්සේගේ ධර්ම සේනාපති වෙති. සර්වඥයන් වහන්ස! චූතූපාපත ඤාණයෙහි දක්ෂ වූ සෘද්ධියෙහි පරතෙරට පැමිණි නමින් කෝලිත නම් ශ්‍රාවකයන් වහන්සේ ඔබගේ පුරෝහිතයා වෙති. මුනීන්ද්‍රයන් වහන්ස! පෞරාණික වංශය දරන්නා වූ, උග්‍ර වූ තේජස් ඇති, ලංවිය නොහැක්කා වූ ධුතවාදී වූ ධුතගුණයෙන් අග්‍ර වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඔබ වහන්සේගේ අක්ඛදස්ස හෙවත් විවාද විනිශ්චයෙහි ප්‍රධානියා වෙති. බුදුරජාණන් වහන්ස! ශාසනයෙහි බහුශ්‍රැත වූ ධර්මධර වූ සියලු ධර්ම අධ්‍යයනය කරන්නා වූ නමින් ආනන්ද නම් ශ්‍රාවකයන් වහන්සේ ඔබගේ ධම් ආරක්ෂකයා වෙති. භාග්‍යවතුන් වහන්සේ මේ සියලු ශ්‍රාවකයන් ඉක්මවා මා පමණ කළ සේක. විනයෙහි විනය දත් නැණවතුන් විසින් ප්‍රකාශ කරන ලද දෝෂ විචාරණය මට ම පැවරූ සේක. යම්කිසි බුද්ධ ශ්‍රාවකයෙක් විනය පිළිබඳ ප්‍රශ්නයක් විචාරා ද එහි මාගේ විමතියක් නැත. මම ඒ විචාළ අර්ථය කියමි. බුද්ධ ක්ෂේත්‍රය යම් පමණ තැනක පැතිරේ නම් එපමණ තැන්හි ඒ බුදුරජාණන් වහන්සේ හැර විනය පිටකයෙහි දක්ෂ වූ මා වැනි කෙනෙක් නැත. මට වැඩි කෙනෙක් කෙසේ ඇති වේද?'' ගෞතම බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ

''විනයෙහි ද බන්ධකයෙහි ද උපාලි තෙරුන් හා සම කෙනෙක් නැත''යි සිංහනාද කරන සේක.

''බුදුරජාණන් වහන්සේ වදාළ නවාංග සත්‍ථු ශාසනය මුළුමනින්ම විනයෙහි ඇතුලත්ය. විනය මුල්කොට ඇත්තේ යයි දකින්නා වූ මාගේ පූර්ව ප්‍රාර්ථනා කර්මය ගෞතම නම් වූ ශාක්‍ය මුනීන්‍ද්‍රයන් වහන්සේ සිහිකොට භික්‍ෂු සංඝයා මැද වැඩ හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබූ සේක. කල්ප ලක්‍ෂයක පටන් මේ තනතුර පැතුවෙමි. පැමිණෙන ලද එම අර්ථ ඇත්තෙම් විනයෙහි පරතෙරට පත්වූයෙමි.''

''මම පෙර ශාක්‍යයන් සතුටු කරන කපුවෙක් වූයෙමි. ඒ කුලය හැර මහර්ෂී වූ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෙක් වූයෙමි ශාක්‍ය පුත්‍ර වෙමි. මීට කල්ප දෙකකට පෙරදී මම අපමණ තෙද ඇති අනන්ත වූ පිරිවර ඇති මහා ධනවත් පෘථිවි පාලක වූ අඤ්ජස නම් රජුගේ පරිවාර, භෝග, ජාති යනාදී මදයන්ගෙන් මත් වූ, චන්දන නම් පුත්‍රයාව උපන්නෙමි. ඇත් කුලයෙහි උපන් සියලු ඇත් අබරණින් සැරසුණු ලක්‍ෂයක් පමණ ත්‍රිමද ගලිත ඇත්තු නිතර මා පිරිවරාගනිති. තම හට සෙනඟ විසින් පිරිවරන ලද මම උයනට යනු කැමැත්තෙම් සිරික නම් ඇතුපිට නැඟී නුවරින් නික්මුණෙමි. එකල පසළොස්වරණ ධර්මයන්ගෙන් යුතු වසන ලද ඉන්‍ද්‍රිය ද්වාර ඇති මනාව රැකි කය හා සිත් ඇති දේවල නම් පසේ බුදුරජාණෝ මා ඉදිරියට පැමිණි සේක. එකල සිරික ඇතු යවා බුදුන් හා ගැටවීමි. ඉන් හටගත් කෝප ඇති ඇතා නිශ්චලව සිටියේය. දූෂ්‍ය සිත් ඇති මම ඇතු ගේ ස්වභාවය දැක බුදුන්ට කෝප කළෙමි. බුදුන් වහන්සේ පෙළා උයනට පිවිසියෙමි.

ඒ කර්ම විපාකය නිසා හිස ඇවිල ගත්තෙකු මෙන් සුවයක් නොවිඳිමි. බිළිය ගිලි මසෙකු මෙන් දැවිල්ලෙන් තැවෙමි. සයුර කෙළවර කොට ඇති පෘථිවියම ඇවිළ ගත්තාක් මෙන් වැටහුණි. පියාගේ සමීපයට ගිය මම ''කිපුණු සර්පයකු මෙන් ද පැමිණි ගිනි කඳක් මෙන් ද දළ ඇති මතෑතෙකු මෙන් ද යම් පසේ බුදුවරයකු හා මා ගැටුනෙම් ද, සෙස්සන්ට නොගැටිය හැකි බැවින් සෝර වූ උග්‍ර තපස් ඇති පස්මරුන් දිනූ පසේ බුදුන් හා ගැටුනෙම් ද ඉන් අප සියලු දෙනා වැනසී යා හැක. ඊට පෙර උන්වහන්සේගෙන් සමාව ගනිමු''යි කීවෙමි. ඉදින් එකඟ සිත් ඇති ඒ පසේ බුදුරජාණන් වහන්සේ ක්‍ෂමා නොකරන්නෙමු නම්, ඇත් දිනකින් මෙපිට මාගේ රට විනාශ වන්නේ ය. **සුමෙබල, කෝසිය, සිග්ගව, සත්තුක** යන රජවරු සිවුදෙන සෘෂීන්ට කරදර කොට තම රටත් සමඟම දුකට පත් වූහ.

කාය සංයමයෙන් යුතු බ්‍රහ්මචාරී වූ ඍෂීහු යම් කලෙක්හි කිපෙත් ද, එවිට සාගර පර්වත සහිත වූ දෙවියන් සහිත ලෝකය වනසති. එසමයේ මම තුන් දහසක් යොදුන් ප්‍රදේශයේ ජනයා රැස් කරවූයෙමි. වරද පැවසීම සඳහා බුදුරදුන් වෙත එළඹුනෙමි. තෙත් වූ වස්ත්‍ර ඇතිව, තෙත් වූ කෙස් ඇතිව සියලු දෙන ම බැඳි ඇඳිලි ඇතිව බුදුරදුන් පාමුල වැටී, ''මහාවීරයාණෙනි! සමාවුව මැනවි. ජන සමූහයා විශේෂයෙන් එය ආයාචනය කරයි. දෑවිල්ල දුරු කළ මැනවි. අපේ රට නොනසනු මැනවි. දෙවි මිනිසුන් සහිත වූ අසුර-රාක්ෂයන් සහිත වූ සැම දෙනම හැම කල්හි යකුලින් මාගේ හිස පළන්නාහුය''යැයි පැවසීමි.

''දියෙහි ගිනි නොසිටී. ගලෙහි බීජ පැල නොවේ. බෙහෙතේ කෘමීහු නොසිටිති. එසේම බුදුරදුන් කෙරෙහි (තුල) කෝපය නොපිහිටයි. හට නොගනියි. පොළොව නොසෙල්විය හැකි වෙත් ද මහසයුර පමණ කළ නොහැකි වෙත් ද අහස කෙළවරක් නැත්තේ ද එසේම බුදුවරු නොකැළඹිය හැක්කෝය. මහාවීර වූ බුදුවරයෝ හැම කල්හි කමා කළාහුය. තපස්වීහු කමා කරණ ලද්දාහු වෙති. කමා කළවුන්ගේ ද කමා කරණු ලැබුවන්ගේ ද ඡන්දාදී අගති ගමනක් නොවේමය.''

මෙසේ වදහළ පසේ බුදුරජාණෝ ජනයාගේ සෝ තැවුල් දුරලා අහසට නැඟ වැඩම කළ සේක. ප්‍රඥයන් වහන්ස!, ඒ අකුසලය නිසා කරණවැම්යෙකු වූ මම ඒ කුලය හැර දමා අභයපුර නම් නිවණට පැමිණියෙමි. මහාවීරයන් වහන්ස!, එකල්හි ද දවෙන්නා වූ මැනවින් වරද පිළිගෙන සිටියාවූ මාගේ සන්තාපය දුරු කළ සේක. ඒ පසේ බුදුරජාණෝ ක්‍ෂමා කොට මාගේ වරද ඉවසූහ. මහාවීරයන් වහන්ස! අදත් ත්‍රිවිධාග්නියෙන් දෑවෙන්නා වූ මා නිවූ සේක. ත්‍රිවිධා (රාගාදී)ග්නිය සිසිල් බවට පත්කළ සේක. යම් බඳු වූ තොපගේ කන් යොමු කිරීමක් ඇත්නම් ඒ මාගේ වදන් අසවු. නිර්වාණ පය මා දක්නා ලද පරිදි තොපටද පවසමි. ශාන්ත වූ සිතැති එකඟ වූව ඒ පසේ බුදුරදුන්ට අවමන් කළ නිසා මම පහත් කුලයෙහි උපන්නෙමි. නුඹලා මේ බුද්ධෝත්පාද ක්‍ෂණය වරදා නොගනිවු. ක්‍ෂණ සම්පත ඉක්මවූවෝ ශෝක කරත්මය. ස්ව අභිවෘද්ධියෙහි වැයම් කරවු. තොප බුද්ධෝත්පාද ක්‍ෂණය ලැබුවෙහු.''

''කිසිවෙකුට වමනය ද කිසිවෙකුට විරේචනය ද එසේම කිසිවෙකුට හලාහල විෂය ද ඖෂධ වේ යයි ඇතැම්හු කියති. මාර්ගස්ථ පුද්ගලයන්ට වමනය ද ඵලස්ථයන්ට විරේචනය ද ඵල ලබා සිටියවුන්ට නිර්වාණය ද දිව්‍ය, මනුෂ්‍ය, නිවන් සම්පත් සොයන්නන්ට පින් කෙත වූ සංඝයා ද ඖෂධ

යැයි වදාළ සේක. සසුනට විරුද්ධ වූවන්ට එය හලාහල විෂ මෙන් විපත් ගෙන දෙයි. ආශීවිෂ, දෘෂ්ට විෂ සර්පයා මෙන් ඒ විරුද්ධතාව ඒ පුද්ගලයා වනසා දමයි. වරක් පානය කළ හලාහල විෂය එක් ජීවිතයක් විනාශ කරයි. සසුන හා විරුද්ධ වීමේ පාපය ඒ පාපීයා කප් කෙළ ගණනක් දවයි. ක්ෂාන්තියෙන් ද අවිහිංසාවෙන් ද මෙත් සිතින් ද ඒ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත ලෝකයා සසරින් එතෙර කරන සේක. එනිසා තොප උන්වහන්සේට එරෙහි නොවිය යුත්තේය. බුදුවරයෝ මහපොළොව වැනි වෙති. ලාභ අලාභ දෙක්හි ද සම්මානන අවමානන දෙක්හි ද නො ඇලෙති. නොගැටෙති. එසෙයින් උන්වහන්සේලා තොප විසින් විරුද්ධ නොකළ යුත්තෝය.''

''බුදුරජාණන් වහන්සේ වධක වූ දේවදත්තයාය, චෞර වූ අංගුලිමාලයා ය, මත් වී ඉදිරියට ආ ධනපාල හස්තියාය, ඖරස පුත්‍ර රාහුල තෙරය යන මේ සියලු දෙනාහට සම මෙත් ඇති සේක. ඔවුන් පිළිබඳ පටිඝ නම් තරහවක් නැත. එසේම රාගයක්, ඇලීමක් ද නැත. සර්වඥ තෙම වධකයාට ද තම ඖරස සුත්‍රයාට ද සමාන වූ මෙත් ඇත්තේය. මග අතහැර දුමු අශුචි වැකුණු කසාවත ද දක සෘෂි ධ්වජය යැයි මුදුනෙහි ඇදිලි බැඳ වැඳිය යුතුයි. අතීතයේ වූ ද වර්තමානයේ වූ ද අනාගතයේ වූ ද යම් බුදු කෙනෙක් වෙත් නම්, මේ සිවුරෙන් පිරිසිදු වෙත්. එහෙයින් මේ බුදුවරයෝ වැඳිය යුත්තාහුය.''

''බුදුරජාණන් වහන්සේ වැනි වූ සුන්දර වූ විනය පිටකය මම හදවතින් දරමි. හැමකල්හි විනයට නමස්කාර කරමින් වසන්නෙමි. මාගේ වාස භවන විනයයි. සිටින තැන සක්මන් කරන තැන ද විනයයි. විනයෙහි දැඩි-පැවැත්වීම් වශයේ වෙසෙමි. විනය මාගේ ගෝචරයයි. මහාවීරයන් වහන්ස, විනය පිටකයෙහි පරතෙරට පැමිණි, අධිකරණ සමථයෙහි දක්ෂ වූ උපාලි නම් භික්ෂුව ශාස්තෘ වූ ඔබවහන්සේගේ දෙපා වඳියි. ඒ මම ධර්මයේ සුන්දර බව දැන ඒ ධර්මයටද සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට ද වඳිමින් ගමින් ගමටද නගරයෙන් නගරයට ද යමි. දැන් මම සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

එසේ ම ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේම උපාලි තෙරුන්ට විනය පිටකය ඉගැන්වූ සේක. උපාලි තෙරණුවෝ ඊට පසු කාලයෙහි භාරුකච්ඡවස්තුව, අජ්ජක වස්තුව, කුමාර කස්සප වස්තුව යන මේ ත්‍රිවිධ වස්තූහි විනිශ්චය කළහ. ඒ එක් එක් වස්තුව විනිශ්චය කළ කල්හි සාධුකාර

දුන් බුදුපියාණෝ වස්තු තුනම විචාල කල්හි, එය අර්ථෝත්පත්ති කරගෙන උපාලි තෙරුන් විනයධාරීන් අතුරින් අග තනතුරට පත් කළහ. මෑත කාලයේ දී උන්වහන්සේ එක් පොහෝ දිනෙක ප්‍රාතිමෝක්ෂය උදෙසන කල්හි සෙසු භික්ෂූන්ට අවවාද දෙමින් මේ ගාථා තුන වදාළහ.

''සද්ධාය අභිනික්ඛම්ම නව පබ්බජිතෝ නවෝ
මිත්තෙන හජෙය්‍ය කල්‍යාණෙ සුදධාජීවෙ අතන්දිතෙ

සද්ධාය අභිනික්ඛම්ම නව පබ්බජිතෝ නවෝ
සංඝස්මිං විහරං භික්ඛු සික්ඛෙථ විනයං බුධෝ

සදධාය අභිනික්ඛම්ම නව පබ්බජිතෝ නවෝ
කපපා කපෙපසු කුසලෝ විහරෙය්‍ය අපුරක්ඛතෝ''

එහි ''**සදධාය**'' ශ්‍රද්ධාව නිමිති කොට, ජීවත්වීම සඳහා නොවේ. කර්ම ඵල තෙරුවණෙහි ගුණ අදහමින් - විශ්වාස කරමින්. ''**අභිනික්ඛම්ම**'' ගිහි ගෙදර වාසයෙන් නික්මී අවුත්. ''නව පබ්බජිතෝ'' අලුත පැවිදි වූ, තරුණ කාලයේදීම පැවිදි වූයේ. ''**නවෝ**'' සසුනේ හික්මෙණුයේ නවක පැවිද්දෙකු වූයේ. ''**මිත්තෙන හජෙය්‍ය කල්‍යාණෙ සුදධාජීවෙ අතන්දිතෙ**'' ''ප්‍රිය වූයේ ගරු සම්භාවනා කටයුතු වූයේ'' යනාදී ලෙස සඳහන් වන ලක්ෂණ සහිත කලණ මිතුරන්, වැරදි දිවි පැවතුම් ඉවත ලූ පිරිසිදු සම්මා ආජීවයෙන් යුතු අරඹන වීර්යය ඇති බැවින් මැලිබවක් නොමැති වූවන් ඇසුරු කරන්නේය. වෙත, සම්පයට එළඹෙන්නේය. ඔවුන්ගේ අවවාද අනුශාසනා පිළිගැනීම් වශයෙන් ඇසුරු කරන්නේ ය. ''**සංඝස්මිං විහරං**'' භික්ෂු සංඝයා, සමූහයා වෙත සිටිමින් වත් පිළිවෙත් පිරීම් වශයෙන් වෙසෙන්නේය. ''**සික්ඛෙථ විනයං බුධෝ**'' සම්බෝධි ඥාණයෙහි දක්ෂයෙකු වී විනය පර්යාප්තිය උගන්නේය. විනය යනු සසුනේ ආයුෂයි. විනය මනාව සුරැකුණු කල්හි සසුන ස්ථාවර වූයේ වේ. මෙහි ''බුධෝ'' යන පදය ''බුදෙධා'' යනුවෙන් ද කියති. එම අර්ථයමය. ''**කපපාකපෙපසු**'' කැප අකැප දෙක්හි දක්ෂව, සූත්‍ර වශයෙන් ද සූත්‍රානුලෝම වශයෙන් ද නිපුණ වූයේ, දක්ෂ වූයේ. ''**අපුරක්ඛතෝ**'' තණ්හාදිය පෙරටු කර, එසේම බලාපොරොත්තු අපේක්ෂාවන්ගෙන් යුක්තව නොවෙසෙන්නේය.

උපාලි ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.12

''පණ්ඩිතං වත ම සන්තං'' යනු ආයුෂ්මත් උත්තරපාල තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ පැතුම් ඇතිව, ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත් විපස්සි නම් භාග්‍යවතුන් වහන්සේ වඩින මග ඒදණ්ඩක් කරවූහ. හෙතෙම ඒ පිනේ විපාක විඳිමින් දෙවි මිනිසුන් අතර සැරිසරා, මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර බමුණු කුලයක ඉපිද උත්තරපාල නමින් ප්‍රකට විය. බුදුපියාණන් වහන්සේගේ යමා මහ පෙළහර දැකීමෙන් ලැබූ ශ්‍රද්ධා ඇති ඒ බමුණා පැවිදිවී මහණදම් පිරුවේය. උත්තරපාල තෙරුන්ට දිනක් අනුවණින් සිහිපත් කළ පෙර අත්විඳි අරමුණක් නිසා කාමරාගය උපන්නේය. උන්වහන්සේ වහාම එය දැන බඩු සහිත සොරෙකු අල්ලාගත්තාක් මෙන් තම සිතට දැඩි සේ නිග්‍රහ කොට, සංවේගයට පත් ව ප්‍රතිවිරුද්ධ අරමුණු සිහිපත් කරමින් කෙලෙස් යටපත් කළහ. විදසුන් කමටහන වඩමින් සිත භාවනාවට යොමුකළ උන්වහන්සේ රහත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''එකල මම විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ මාර්ගය ඉදිරියෙහි පහන් සිතින්, සතුටින් යුතුව ඒදණ්ඩක් කරවූයෙමි. මීට කල්ප අනූ එකකට පෙර සෑදූ ඒ සේතු පූජාවේ අනුසස් වශයෙන් මම දුගතියකට නොගියෙමි. ඒදඬු පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් තෙරණුවෝ තම පිළිවෙත් මඟ නැවත සිහිපත් කර බලා සිංහ නාද පවත්වන සේක්, මේ ගාථා තුන වදාළහ.

''පණ්ඩිතා වත මං සන්තං අලමත්ථ විචින්තකං
පඤ්ඤවකාම ගුණා ලොකෙ සම්මොහා පාතයිංසු මං

පකබනෙනා මාරවිසයෙ දළ්හසල්ල සමප්පිතෙ
අසකඛිං මච්චුරාජස්ස අහං පාසා පමුච්චිතුං

සබ්බෙ කාමා පහීණා මෙ, භවා සබ්බෙ විදාළිතා
විකඛිණෙ ජාති සංසාරෙ, නත්ථිදානි පුනබ්භවෙ''

එහි **''පණ්ඩිතං වත මං සන්තං''** සුතමය හා චින්තාමය ප්‍රඥා වශයෙන් වූ නුවණැති භාවයෙන් යුක්ත මා වැනි වූ. **''අලමත්ථවිචින්තකං''** තමාගේ ද අනුන්ගේ ද හිත වැඩ සැලසීමෙහි, ඒ පිළිබඳ සිතීමෙහි සමත් වූ. නැතහොත් **''අලං''** යනු පර්යාප්ති සද්ධර්මයයි. එහි අර්ථ සෙවීමෙහි, කෙලෙසුන් මුලිනුපුටා දැමීමෙහි, අර්ථ දැකීමෙහි දක්ෂ වූ. තෙරණුවෝ මේ තමාගේ අන්තිම භවය බැවින් මේ සියලුම ප්‍රකාශයන් සිදු කළහ. **''පඤ්චකාමගුණා''** රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස්කම් සැපයෙහි. **''ලොකෙ''** ඒ පංචකාමයන්ගේ පවතින ස්ථානය දක්වයි. මොලොව. **''සම්මොහා''** මුලාවට නිමිති වූ හේතු වූ. අනුවණින් මෙනෙහි කිරීමේ හේතුවෙන්. මුලාවූ, මුලාව ඇති කරන. **''පාතයිංසු''** වීරභාවයෙන් එය හෙළා දැමුවෙමි. ''ලෝකයෙන් මිදෙනු කැමති මම ලෝකයට අයත් (ලෞකික) ධර්මතා දුරලූයෙමි'' යන අර්ථයයි.

''පඤ්ඣනෙනා'' පිවිසියෙ. බැසගතිමි. **''මාරවිසයෙ''** කෙලෙස් මාර විෂයෙහි. ''කෙලෙස් මරුට ගෝචර වූ ස්ථානයෙහි. ඔහුගේ වසඟයට ගිය නැන්හි.'' යන අර්ථයයි. නැතහොත් දේවපුත්‍ර මාරයාගේ පාලනයට පිවිස සිටියෙමි. ඇතුලත් වූයෙමි. **''දළ්හසල්ලසමප්පිතො''** දැඩි ස්ථිර, දැඩි වූ සිතින් යුක්තවූයෙමි. දැඩි රාග නම් සැතින් හදවත දැඩි සේ විදිනා ලද්දෙමි. **''අසක්කිං මච්චුරාජස්ස අහං පාසා පමුච්චිතුං''** ආර්ය මාර්ගය නම් අඩුවෙන් රාග ආදී කෙලෙස් හුල් ඉතිරි නොකරම උදුරා දමමින් ම, රාග භව බන්ධන නම් වූ මරුගේ පාශයෙන් (උගුලෙන්) මාහට මිදීමට හැකි විය ඉන් තමා මුදවා ගත්තෙමි. එසේම සියලු කාමයෝ ප්‍රහීණ කළෙමි. මාගේ සියලු භවයෝ නසන ලද්දෙමි. වස්තු ආරම්මණාදී නොයෙක් ප්‍රභේද සහිත සියලු කෙලෙස් කාමයන් ආර්ය මාර්ගයේ උපකාරයෙන් මවිසින් සමුච්ඡේද වශයෙන් ම මුලිනුපුටා දමන ලද්දෙමි. කෙලෙස් කාමයන් ප්‍රහීණ වූ විට වස්තුකාමයන් ද ප්‍රහීණ වූයේමය. එසේම කාම, භව, කර්ම භවාදී සියලු භවයෝ මග නුවණින් නැසුවෙමි. විද්වංසනය කළෙමි. කර්ම භව නැසූ විට උත්පත්ති භව ද නැසුවේම වේ. මෙසේ කර්ම භව නැසූ බැවින් ම ක්ෂය වූ සංසාරික ඉපදීම ඇති බැවින් දැන් මා හට පුනර්භවයක් නැත. එහි අර්ථ ඉහත දී පවසන ලද පරිදි දත යුතුයි. මෙම ගාථාවන්ම තෙරුන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථා ද විය.

උත්තරපාල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.13

''සුනාථ ඤාතයො සබ්බෙ'' යනු ආයුෂ්මත් අභිභූත තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් රැස් කරමින් අවුත් වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. ඒ සිටුකුමරු තමාට ගැලපෙන කළණ මිතුරන් ඇසුරු කළ හෙයින් බුදුසසුනෙහි වඩාත් ප්‍රසන්න වූවෙක් විය. හෙතෙම ශාස්තෘන් වහන්සේ පිරිනිවීමෙන් පසු ධාතු ගැනීමට මහජනයා උත්සාහවත් වූ විට, සියල්ලටන්ටම පළමුව සුවඳ දියෙන් චිතකය නිවූයේය. ඒ පින්කම නිසා දෙව් මිනිසුන් අතර සැරිසරා පැමිණි හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී වේඨීපුර නුවර රජගෙයි ඉපිද අභිභූත නමින් පියාගේ ඇවෑමෙන් පසුව රජකමට පත්විය. ජනපද චාරිකාවෙහි යෙදුණු බුදුපියාණන් වහන්සේ මෙසමයේ දී අනුපිළිවෙලින් ඒ නගරයට වැඩම කළ සේක''යි අසා ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ ධර්ම ශ්‍රවණය කළේය. දෙවැනි දින මහා දානයක් දුන්නේය. වළඳා අවසන භාග්‍යවතුන් වහන්සේ රජුගේ අදහස්වලට ගැලපෙන සේ පුණ්‍යානුමෝදනා කරමින් විස්තරාර්ථ සහිත ධර්ම දේශනාවක් කළ සේක. එයට සවන්දුන් රජු ලැබූ ශ්‍රද්ධා ඇතිව, පැහැදීම් ඇතිව රජකම හැර දමා සසුනේ පැවිදිව අරහත් ඵලය සාක්ෂාත් කරගත්තේය.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''වෙස්සභූ බුදුරජාණන් වහන්සේගේ ශරීරය චිතකයේ දැවෙන කල්හි සුවඳ දිය ඉසූ මම, ඒ චිතකය නිවූයෙමි. මීට කල්ප තිස් එකකට පෙර දී මම යම් චිතකයක් නිවූයෙමි ද ඒ සුවඳ දිය ඉසි පිනින් දුගතියක නූපපන්නෙමි. දැන් කෙලෙස දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව විමුක්ති සුව විඳිමින් හුන් උන්වහන්සේ වෙත පැමිණි ක්ෂත්‍රිය ඤාතිහු ද ඇමතියෝ ද පිරිවර ජනයා ද නගර-ජනපද වාසීහු ද යන සියලු දෙනම ''ස්වාමීනි!, නුඹ වහන්සේ කුමක් නිසා අප අනාථකර පැවිදිවූයෙහි ද?යි විමසමින් අඬා වැලපුනහ. තෙරණුවෝ තම නෑයන් ඇතුළු ජනයා හඬා වැලපෙනු දැක ඔවුන්ට තමන්වහන්සේගේ පැවිදිවීමේ හේතුව ප්‍රකාශ කිරීම් වශයෙන් දහම් දෙසමින් මේ ගාථා තුන වදාළහ.

''සුණාථ ඤාතයෝ සබ්බෙ යාවන්තෙත්‍ථ සමාගතා
ධම්මං වෝ දෙසයිස්සාමි, දුක්ඛා ජාති පුනප්පුනං''

''ආරභථ නික්කමථ යුඤ්ජථ බුද්ධසාසනෙ
ධුනාථ මච්චුනෝ සෙනං නළාගාරංව කුඤ්ජරෝ

යෝ ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තෝ විහෙස්සති
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සති''

එහි ''සුණාථ'' යනු අසවු. ''දැන් මවිසින් පවසන දෙය යොමු කළ කන් ඇතිව, ශ්‍රෝත ද්වාරයේ සිත පිහිටුවා සිතට ගනිවු'' යන අර්ථයයි. ''ඤාතයෝ'' ඤාතීන් ප්‍රමුඛ කරගෙන සියල්ලන්ටම ආමන්ත්‍රණය කරයි. එනිසා ''**සබ්බෙ යාවන්තෙත්‍ථ සමාගතා**'' යනුවෙන් ''මෙහි රැස්වූ තාක් ඔබ සියල්ලෝම. මාගේ පැවිදිවීම නිසා මෙහි පැමිණි සියලුදෙනම'' යන අර්ථයයි.

දැන් ''අසවු'' යැයි යමක් සඳහා කියන ලද ද ඒ ඇසිය යුතු වදන් පිළිබඳව පවසමින් ''**ධම්මං වෝ දෙසයිස්සාමි**'' යැයි නුඹලාටම දහම් දෙසන්නෙමි''යි අනුදනියි. ''**දුක්ඛා ජාති පුනප්පුනං**'' ආදි වශයෙන් දම් දෙසුම ඇරඹූහ. එහි ''**දුක්ඛා ජාති පුනප්පුනං**'' යන්නෙහි ''**ජාති**'' යනු ගැබට බැස ගැනීම, ඉපදීම් සඳහා මුල් වූ හේතු ද ජරාවට පත්වීම් ආදි ලෙස ද අනේක විධ දුක්ඛයන්ට හේතුවන බැවින් ඉපදීම දුකකි. එය නැවත නැවත පැවතීම අතිශය දුකකි. එනිසා ඉපදීම නැති කිරීමට උත්සාහ කළයුතු යැයි දේශනාව අරඹා ''ආරභථ'' යනාදි ගාථා වදාළහ.

එහි ''**ආරභථ**'' යනු ආරම්භ ධාතු නම් වූ වීර්යය කරවු. ''**නික්කමථ**'' **කුසීත බවින් නික්මීම** වශයෙන් නික්ඛම ධාතු නම් වූ දැඩි වීර්යය කරවු. අරඹවු. නික්මවු. ''**යුඤ්ජථ බුද්ධ-සාසනෙ**'' යම්හෙයකින් **සීල** සංවරයෙන් යුතු වූයේ, ඉඳුරන්හි **සුරැකි** ද්වාර (දොරටු) ඇතිව, භෝජනයෙහි පමණ දනිමින්, සිහි කල්පනාවෙන් යුක්තව මේ ධර්මයන්හි පිහිටියවුන්ට නිදුවැරීමෙහි නිරතවීම් වශයෙන් ආරම්භ, කික්ඛම ධාතු සම්පූර්ණ වේ. එනිසා මෙසේ වූ සමථ විදර්ශනා නම් වූ, අධිසීල ශික්ෂාදි වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනයෙහි නිරත වවු. ඊට අනුව හැසිරෙවු. ''**ධුනාථ මච්චුනෝ සෙනං නළාගාරංව කුඤ්ජරෝ**'' මෙසේ පිළිපදින්නෝ, **ත්‍රිවිධ** ධාතු වලට ප්‍රධාන වූ මාරයාගේ වසඟයට සත්වයන් පමුණුවන බැවින් මාරයාගේ සේනාව නම් වූ අබල දුබල වූ කෙලෙස් ධර්ම; කාය බලයෙන්

පිරිපුන් හස්ති රාජයෙකු බටවලින් සෑදූ ගෙයක් මොහොතින් වනසන්නාක් මෙන් වනසා දමවු. දුරුකරවු. විද්වංසනය කරවු යන අර්ථයයි. මෙසේ බුදුසසුනේ උත්සාහවත් වූ පුද්ගලයා ඒකාන්තයෙන්ම ජාති (ඉපදීම) ආදී දුකින් මිදෙන බව දක්වමින් ''යො ඉමසඞ්ං'' යනාදී තෙවන ගාථාව වදාළහ. එහි අර්ථ ඉතා පහසුවෙන් අවබෝධ වේ.

අභිභූත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.14

''සංසරං'' යනු ආයුෂ්මත් ගෝතම තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් කරමින් අවුත්; සිබි භාග්‍යවතුන්වහන්සේ පිරිනිවි කල්හි, උන්වහන්සේගේ සෑයට දෙවිමිනිසුන් විසින් පූජා පවත්වනු දැක තමා ද සපුමල් අටකින් පූජා පැවැත්වූහ. ඒ පින්කමේ විපාක විඳිමින් දෙවි මිනිසුන් අතර සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී ශාක්‍ය රජකුලයේ ඉපිද ගෝතම යැයි සෝතු වශයෙන් ලබන ලද නම් ඇතිව වැඩිවියට පත් විය. ශාස්තෘන් වහන්සේ කිඹුල්වතට වැඩම කළ ඤාති සමගමයේදී ලැබූ ශ්‍රද්ධා ඇති ගෝතම කුමරු සසුනේ පැවිදිව, විදසුන් කමටහන් වඩනුයේ ෂඩ් අභිඥා ලාභී මහතෙරනමක් විය.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''භාග්‍යවත් වූ ලෝකබන්ධු වූ සිබි නම් බුදුරජාණන් දවනු ලබන චිතකයට සපුමල් අටකින් පූජාකළෙමි. මීට කල්ප තිස් එකකට පෙර දී යම් මල් පූජාවක් කළෙමි ද ඒ මල් පූජාවේ විපාක වශයෙන් දුගතියක නූපපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ෂඩ් අභිඥාලාභීව විමුක්ති සුවයෙන් වැඩවෙසෙන උන්වහන්සේගෙන් දිනක් නෑයෝ ''ස්වාමීනි!, කුමක් නිසා අප හැර දමා පැවිදිවූයෙහිද?''යි ඇසූහ. සසර දී තමා අත්විඳි සියලු දුක්ඛ දෝමනස්සයන් ද දැන් විඳින නිවන්සුවය ද ප්‍රකාශ කරන උන්වහන්සේ මේ ගාථා තුනෙන් ඔවුන්ට දහම් දෙසූහ.

1. ''සංසරං හි නිරයං අගඤ්ඡි සසං
පෙතලොකමගමං පුනපපුනං
දුක්ඛමම්හි පි තිරච්ඡානයොනියං
නෙකධා වුසිතං චිරං මයා

2. මානුසොපි ච හවො හිරාධිනො
සග්ගකාය මගමං සකිං සකිං
රූප ධාතු සු අරූපධාතුසු
නෙව සඤ්ඤීසු අසඤ්ඤීසු ඨිතං

3. සමභවා සුවිදිතා අසාරකා
සංඛතා පචලිතා සදෙරිතා
තං විදිත්වා මහ මතුන සමභවං
සනතිමෙව සතිමා සමජ්ඣගං'' තී.

එහි ''සංසරං'' යනු අනාදිමත් සංසාරයෙහි සැරිසරමින් කර්ම ක්ලේශයන් නිසා පංචගතින්හි මැරි මැරි ඉපදීම් වශයෙන් ඒ ඒ භවයෙහි සැරි සරන්නේ යන අර්ථයයි. ''හී'' යනු නිපාතයක් පමණි. ''**නිරයං අගඤ්ඡිසසං**'' සංජීවකාදි අට වැදෑරුම් මහා නිරයන්හි ද කුක්කුලාදි සොළොස් (16) වැදෑරුම් උස්සද නිරයන්හි පිළිසිඳ ගැනීම් වශයෙන් උපන්නෙමි. ගියෙමි. ''**පුනපපුනං**'' නැවත නැවත යන මේ පදය සෙසු ප්‍රකාශයන්ට ද යෙදිය යුතුයි. ''**පෙතලොකං**'' ප්‍රේත විෂය, සා පිපාසාදි ඝේද ඇති ප්‍රේත භාවය යන අර්ථය යි. ''අගමං'' පිළිසිඳ ගැනීම් වශයෙන් ප්‍රේත ලෝකයට ගියෙමි. පැමිණියෙමි. ''**පුනපපුනං**'' නැවත නැවත ඒ ඒ භවයෙහිදී ''**දුක්ඛමම්හිපී**'' ඔවුනොවුන් තියුණු කස, කෙවිටි ආදියෙන් තැලීමෙන් - ගැසීමෙන් ඇති වූ ඉවසිය නොහැකි දුකින්, ලිංග විපාර්යාසයෙන්ම දුකින් යුක්ත වූයෙමි. ''**තිරච්ඡාන යොනියා**'' මුව-පක්‍ෂි ආදී ප්‍රභේද ඇති තිරිසන් යෝනියෙහි. ''**නෙකධාහි**'' ඔටු, ගෝනු, කොටළු ආදී වශයෙන් ද කපුටු, කෙකිණි, උකුසා ආදී වශයෙන් වූ ද නොයෙක් තිරිසන් ආත්මභවයන්හි නොයෙක් වර ඉතා දිගුකලක් ඉපිද මැරෙමින් විසුවෙමි. එසේ උපන් මම නැතිගැනීම්-බියවීම් ආදී වශයෙන් නේකදුක් වින්දෙමි. තිරිසන් යෝනියෙහි උපන් සත්ත්වයෝ මහත් මුලාවට පැමිණෙන බැවින් බොහෝ කාලයක් එහිම නැවත නැවත ඉපිද මැරෙමින් සිටින බව දැක්වීමට මෙහි ''**චිරං**'' යන්න දැක්වීණි. ''**මානුසොපි ච හවොහිරාධිනො**'' මවිසින් මනුෂ්‍යාත්ම භාවයන් ද ඊට සුදුසු වූ කුසල කර්මයන්ගේ එකතුවීමෙන් ලබන ලද්දෙමි.

මිනිසත් බවට පැමිණියෙමි. මෙහිදී කාණකච්ඡූපම සූත්‍රය (කණ කැස්බෑ උපමා සූත්‍රය) ගෙනහැර දැක්විය යුතුයි. ''**සඟකාය මගමං සකිං සකිං**'' ස්වර්ග නම් වූ කාමාවචර දේව ලෝකවලට ද වරින්වර ඉපදීම් වශයෙන් ගියෙමි. ''**රූපධාතුසු**'' පුහුදුන් භවයන්හි කෙළවර, අවසානයේ වූ රූප භවයන්හිද ''**අරූපධාතුසු**'' අරූප භවයන්හිද ''**නෙවසඤ්ඤීසු අසඤ්ඤීසු යීනං**'' හුදෙක් රූපාරූපාදී සංඥා භවයන්හි පමණක් නොව නේවසංඥාසංඥික භවයෙහිද අසංඥ භවයෙහි ද ඉපදුනෙමි. ''ඒවායෙහි ද මම සිටියෙමි''යි අර්ථ ගත යුතුයි. මෙහි නේවසංඥායතනය ගැනීමෙන් නේවසංඥිනාසංඥී භවය ගන්නා ලදී. ඉදින් මෙම භව දෙකද රූපාරූප භවයන්ට ම අදාළ වුවත්, මේ සසුනින් බැහැර වූ දර්ශනවාදයන්හි නිත්‍ය සංඥීහු ද භවවිමෝක්ෂ සංඥීහු ද ඇති බැවින් ඔවුන්ගේ ඒ සංඥාවේ වැරදි (සාවද්‍ය) බව දක්වීමට මෙසේ වෙන වෙනම සංඥී, අසංඥී භව දක්වන ලදයි දත යුතුයි. මෙසේ මුල් ගාථා දෙකින් භව මූල හේතූන් මුලිනුපුටා නොදමූ බැවින් අනාදිමත් සංසාරයෙහි තමා විඳි සසර දුක් සමූහය දක්වා, දැන් ඒ භවමූල හේතූන් මුලිනුපුටා දැමීමෙන් තමා විඳින සසරින් මිදීමේ නිවන් සැපය දක්වමින් මේ ''සම්භවා'' යන තෙවන ගාථාව වදාළහ.

එහි ''**සම්භවා**'' කාම භවාදියෙහි ම. හේතු ප්‍රත්‍ය සම්වායෙන් (එතුවීමෙන්) හටගන්නා බැවින් මෙහිදී කාම භවාදිය සම්භවයෝ යැයි කියන ලදී. ''**සුවිදිතා**'' යනු විදර්ශනා ප්‍රඥාවෙන් යුක්ත මාර්ග ප්‍රඥාවෙන් මනාව දැනගත්. ''**අසාරකා**''ආදී වශයෙන් සංසාර භවයන් පිළිබඳ දැනගත් ස්වභාවයන් දක්වයි. එහි ''**අසාරකා**'' යනු නිත්‍ය වූ සාර වූ ස්වභාවයෙන් දුරු වූ- අසාර වූ (හරයක් නැති) ''**සංඛතා**'' හේතු ප්‍රත්‍ය සම්වායෙන් (එක්වීමෙන්) කරන ලද්දා වූ. ''**පවලිතා**'' සංඛත වූ බැවින් ම ඉපදෙන දිරායන ස්වභාවය නිසා සෙලවෙන, අස්ථීර වූ. ''**සදෙරිතා**'' සැම කල්හිම කැඩී බිඳී යන බැවින්, ස්වල්ප වශයෙන් භංගයට පත්වන බැවින් පභංගුර වූ - කම්පිත වූ යන අර්ථයයි. ''**තං විදිත්වා මහමත්තසමභවං**'' ඉහතින් කියන ලද පරිදි සංඛ්‍යා ස්වභාවයෙන් යුතු තමාට ලැබුණු, තමා කෙරෙහි හටගත්, තමා අයත් වූ ආත්මභාවය පිළිබඳව ඉසුරු බව, ප්‍රධානත්වය දැක්වීම් වශයෙන් ද අනුන් අයත් ආත්මභාව පිළිබඳව පිරිසිඳ දැනගැනීම් වශයෙන් ද මම මනාව දැනගෙන, ඊට විරුද්ධ වූ ශාන්ත වූ නිවණටම මාර්ග ප්‍රඥාවෙන් සිහි ඇතිව පැමිණියෙමි. නිවන අවබෝධ කළෙමි. ආර්ය මාර්ග භාවනාවෙන් (වැඩීමෙන්) නිවණට පැමිණියෙමි. මෙසේ ගෝතම තෙරණුවෝ සිය ඥාතීන්හට ධර්මදේශනා කරමින් ම සිය රහත් බව ප්‍රකාශ කළ සේක.

ගෝතම තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය..

3.1.15

"**යො පුබ්බෙ කරණීයානි**" යනාදී ගාථා ආයුෂ්මත් **හාරිත** තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේ ද? උන්වහනසේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද සිටියහ. නුවණැති බවට පත් වූ ඒ සිටු කුමරු ශාස්තෘන්වහන්සේ පිරිනිවී කල්හි ඒ චිතකයට පූජා පවත්වමින් සුවඳ දුම් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර බමුණු පවුලක උපන්නේ ය. **හාරිත** නම් වූ ඒ බමුණු කුමරු වැඩිවියට පත්ව, ජාති මානයෙන් මත්ව සෙස්සන්ට "**වසලයෝ**" යැයි අමතමින් කල් ගත කළේය. හෙතෙම භික්ෂූන් සමීපයට ගොස් ධර්ම ශ්‍රවණය කිරීමෙන් ලැබූ ශ්‍රද්ධා ඇතිව පසුකලෙක පැවිදි වුවත්, ඉතා දිගු කලක් පුරුදු වූ වසල වාදයෙන් ඇමතිමේ පුරුද්ද අත් නොහළේය. එක් දිනක් ශාස්තෘන් වහන්සේ සමීපයේදී ධර්ම ශ්‍රවණය කළ **හාරිත** තෙරණුවෝ, හටගත් සංවේග ඇතිව වහා සිත විඳසුන් භාවනාවෙහි පිහිට වූහ. තම සිතේ පැවැත්ම පිළිබඳව පරීක්ෂා කර බලා මානයෙන් විසිරීගිය සිත හඳුනාගෙන ඊට නිග්‍රහ කරමින්, එම සිතුවිලි බැහැර කර, විදසුනෙහි සිත පිහිටුවා රහත් බවට පත්වූහ. උන්වහන්සේ ආපදාන පාළියේදී මෙසේ වදාළහ.

"නොයෙක් **සුවඳ** ද්‍රව්‍යයන්ගෙන් චිතකය සාදනු ලබන කල්හිමම පහන් සිතින් ඉතා සතුටුව සුවඳ මීටක් පූජා කළෙමි. මීට කල්ප ලක්ෂයකට පෙරදී යම් චිතකයට සුවඳ ද්‍රව්‍ය පිදුවෙමි ද ඒ චිතක පූජාවේ විපාක වශයෙන් මම මේ දක්වාම දුගතියකට නොගියෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි."

රහත් බවට පත්වූ හාරිත තෙරණුවෝ විමුක්ති සුවය විඳින සේක්, භික්ෂූන්ට අවවාද දීම සඳහා "**යො පුබ්බ කරණීයානි - පච්ඡා සො කාතු මිච්ඡති**" යනාදී ගාථා තුන වදාළහ. මෙම ගාථා සහ එහි අර්ථ විස්තරය ඉහතින් දැක්වූ බක්කුල තෙරුන් වහන්සේගේ (3.1.3) ගාථා අර්ථ වර්ණනාවේ සඳහන් වේ. මේ ගාථා දේශනා කිරීමත් සමඟම හාරිත තෙරුන්ගේ රහත් බව ද ප්‍රකාශ විය.

හාරිත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

3.1.16

''පාපමිත්තෙ'' යනු ආයුෂ්මත් විමල තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයෙහි සසරින් මිදීම සඳහා පින් රැස් කරමින් අවුත් **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. ශාස්තෘන් වහන්සේ පිරිනිවීමට පත්ව ආගමික උත්සව පවත්වන දිනයන් ඉක්ම ගිය කල්හි උපාසකයෝ ඒ උතුම් බුදුසිරුර ගෙන දවන තැනට ගෙන ගියහ. එසේ ගෙන යන පෙරහැර දැක සිටුකුමරු බුදුගුණ සිහිපත් කරමින් සතුටු සිතින් දැසමන් මලින් බුදුසිරුර පිදුවේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී බරණැස බමුණු පවුලක ඉපිද, විමල නමින් ප්‍රකට විය. වැඩිවියට පත් ඔහු **සෝමමිත්ත** තෙරුන් නිසා සසුනේ පැවිදිව උන්වහන්සේගේම මෙහෙයවීමෙන් විදසුන් වඩා නොබෝ කලකින් රහත් බවට පත්විය.

විමල තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''ශරීරය ආදාහනය සඳහා ගෙනයමින් බෙර වයද්දී පහන් සිත් ඇති මම සතුටු සිතින් දෑ සමන් මලින් බුදුසිරුරට පූජා කළෙමි. මීට කල්ප ලක්‍ෂයකට පෙර දී යම් මල් පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ තම සහායක භික්‍ෂුවට අවවාද දෙමින් මේ ගාථා තුන වදාළහ.

''පාපමිත්තෙ විවජ්ජෙත්වා භජෙය්‍යුත්තම පුග්ගලෙ
ඔවාදෙ වසෙ තිට්ඨෙය්‍ය පත්ථෙන්තො අචලං සුඛං''

''පරිත්තං දාරුං ආරුය්හ යථා සීදෙ මහණ්ණවෙ
එවං කුසීතං ආගම්ම සාධුජීවී වි සීදති

තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං''
''පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි
නිච්චං ආරද්ධවීරියෙහි පණ්ඩිතෙහි සහාවසෙ'' ති.

එහි ''**පාපමිත්තෙන**'' අයහපත් මිතුරන්, අසත්පුරුෂයන්, අලස පුද්ගලයන්. ''**විවජ්ජෙත්වා**'' ඔවුන් ඇසුරු නොකර දුරින්ම දුරු කර. ''**භජෙය්‍යුත්තම පුග්ගලෙ**''. සත්පුරුෂ, නුවණැති, කලණ මිතුරන්ම ඇසුරු කරමින්, ඔවුන්ගේ අවවාද - අනුශාසනා පිළිගනිමින් සේවනය කරන්නේය. ''**ඔවාදෙ වසෙ නිච්චෙය්‍ය**'' ඒ කලණ මිතුරාගේ අවවාදයෙහි පිහිටා එය පිළිපැදීම් වශයෙන් සිටින්නේය. කටයුතු කරන්නේය. ''**පජ්ජොතා**'' පතනුයේ කැමති වනුයේ. '**අචලං සුඛං**' උතුම් නිවන් සුවය. නිවන නොවෙනස්වන බැවින් අචල, ස්ථිර වූවකැයි කියනු ලැබේ. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

විමල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

නික නිපාතයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

4.1.1

''අලංකනා'' යනාදී ගාථා සතර ආයුෂ්මත් **නාගසමාල** තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. ඔහු දිනක් ග්‍රීෂ්ම සමයේ සූර්ය තාපයෙන් තැවුණු බිම වැඩම කරන ශාස්තෘන් වහන්සේ දැක පහන් වූ සිතින් කුඩයක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාදයේදී ශාක්‍ය රජ කුලයේ ඉපිද නාගසමාල නමින් ප්‍රකට විය. වැඩිවියට පත් වූ එකුමරු කිඹුල්වත් පුරට වැඩම වූ බුදුරදුන්ගේ ඥාති සමාගමයෙහි දී ලැබූ ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදිව මද කලක් බුදුරජාණන් වහන්සේගේ උපස්ථායකයා ලෙස ද කටයුතු කළේය. නාගසමාල තෙරණුවෝ දිනක් පිඬුපිණිස නගරයට පිවිසි සේක්, අලංකාරව සැරසුණු එක් නිළියක් මහා මාර්ගයේ තූර්යවාදන පවත්වන විට නටනු දුටු සේක. ඒ දැක, ''මේ සිතේ ක්‍රියාව අනුව වායෝ ධාතුවේ මෙහෙයවීමෙන් මැගේ සිවුමහා භූතමය කය ඒ මේ අත පෙරළේ. අහෝ සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ''යි ක්ෂයවීම - වැයවීම පිළිබඳව සිහිපත් කරමින් විදසුනෙහි සිත පිහිට වූ උන්වහන්සේ රහත් බවට පත්වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''පොළව අඟුරු මෙන් විය. මිහිකත උණු අළු සහිත විය. පදුමුත්තර බුදුරජාණන් වහන්සේ එළිමහනෙහි සක්මන් කළ සේක. කුඩයක් ගත් මම එකල මඟට පිවිසියෙමි. අතරමඟදී බුදුරජාණන් වහන්සේ දක සතුටට සත් වූ මම, භූමිය මිරිඟුවෙන් වැසුණේය. මේ පොළොව රත් වූ අඟුරු මෙනි. ශරීරයේ ප්‍රාණය නසන මහ සුලං හමන්නේය. ශීතල හා උණුසුම නසන, වාතය හා අව්ව වලකන මේ ඡත්‍රය පිළිගනු මැනවි. ඒ හේතුවෙන් මම නිවන් දකින්නෙමි''යි පවසා බුදුරදුන්ට කුඩය පිළිගැන්වූයෙමි. එකල අනුකම්පා සිත් ඇති කාරුණික වූ මහර්ෂි වූ පදුමුත්තර බුදුරජාණෝ මාගේ අදහස දැන, එය පිළිගත් සේක.

කල්ප තිහක් පුරා ශක්‍ර දේවේන්ද්‍රව දෙව්රජය කරවූ මම පන්සිය වාරයක් සක්විති රජව උපන්නෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ සම්පත් පමණ කළ නොහැක. පෙර ම විසින්ම කළ මනා වූ පින්කමේ විපාක අනුභව කරමි. මේ මාගේ අවසන් ආත්ම භාවයයි. අවසන් සිරුර දරණ මාහට සැමකල්හිම

සේසතක් ඇරෙයි. මීට කල්ප ලක්ෂයකට පෙර දී යම් ඡත්‍ර දානයක් පැවැත්වූයෙම් ද ඒ හේතුවෙන් මේ දක්වාම දුගතියක නො ගියෙමි. ඡත්‍ර දානයේ විපාක මෙබඳුය. දන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් නාගසමාල තෙරණුවෝ සිය පිළිවෙත් මග ප්‍රකාශ කිරීම් වශයෙන් රහත් බව විවරණය කරමින් මේ ගාථා සතර වදාළහ.

''අලංකතා සුවසනා මාලිනී චන්දනුස්සදා
මඤ්ඤ මහාපථෙ නාරී තූරියෙ නච්චති නට්ඨකී

පිණ්ඩිකාය පවිට්ඨොහං ගච්ඡනෙතා නං උදකඛිසං
අලංකතං සුවසනං මච්චුපාසං ව ඔඩ්ඩිතං

තතො මෙ මනසීකාරෝ යොනිසෝ උදපජ්ජථ
ආදීනවෝ පාතුරහු නිබ්බිදා සමතිට්ඨථ

තතෝ චිත්තං විමුච්චි මෙ, පස්ස ධම්ම සුධම්මතං
තිස්සෝ විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං''

එහි ''අලංකතා'' යනු අත්පා අබරණවලින් අලංකාර වූ ශරීරාවයව ඇති, ''සුවසනා'' යහපත් වස්ත්‍ර ඇඳි, ශෝභන මනස්කාන්ත ඇඳුමින් සැරසුණු. ''මාලිනී'' මල් දම් පැලඳි, මල් දමින් සැරසුණු. ''චන්දනුස්සදා'' සඳුන් ආලේප කරගත් සිරුරු ඇතිව, ''මඤ්ඤ මහපථෙ නාරී තූරියෙ **නච්චති නට්ඨකී**'' නලඟනක්, නිළියක් මාවත මැද හිඳ පසඟතුරු නද පවත්වන කල්හි නටන්නීය. පටන්ගත් මොහොතේ සිටම නටයි. ''පිණ්ඩිකාය'' පිඬු පිණිස. ''පවිට්ඨොඃ'' නුවරට පිවිසියෙමි. ''**ගච්ඡනෙතා නං උදකඛිසං**'' නුවර වීථියෙහි පිඬු සිඟා ගිය මම උපද්‍රව වළකා ගැනීම සඳහා පාර දෙස බැලුවෙමි, ඒ නිළිය දුටුවෙමි. කුමක් මෙන් ද? ''**මච්චුපාසංව ඔඩ්ඩිතං**'' මාරයාගේ, මෘත්‍යුරාජයාගේ උගුලක් මෙන්. රූපාදී අරමුණු උගුලක් මෙන් ලොව සැරිසරන සත්ත්වයන්ට ඒකාන්තයෙන්ම අයහපත සලසයි. ඒ නිළිය ද අනුවණ පුහුදුන් අන්ධ පුද්ගලයන්ට ඒකාන්තයෙන්ම අයහපත, අනර්ථය කැඳවන නිත්‍ය මාරපාශයක් හා සමානය. ''තතෝ'' එසේ මාර උගුලක් බදු වූ හෙයින්. ''මෙ'' යනු මාහට. ''**මනසිකාරෝ යොනිසෝ උදපජ්ජථ**'' මේ ඇට සැකිල්ල නහරවලින් සම්බන්ධ වූයේ, මසින් තවරන ලද්දේ- පිරුණේ, සමින් වැසුනේය. මේ සිරුර අශුචියෙන්

පිරි, දුගඳ හමන ඉතා පිළිකුල් වූවකි. අනිත්‍ය වූ අස්ථිර වූවකි. ඇඟ ඉලීම්, පිරිමැදීම්, බිඳීම්, වෙන්වීම් ආදී විකාරයන්ට පත්වෙයි.'' යනුවෙන් ශරීරය පිළිබඳ යථාර්ථාවබෝධය නුවණින් මෙනෙහි කිරීමෙන් ලැබුවෙමි. ''ආදීනවො පාතුරහූ'' මෙසේ කයට සාධාරණ වූ ස්වභාව දූක්වීම් වශයෙන් කය ඇසුරු කරගත් චිත්ත චෛතසිකයන්ගේ ඉපිද නැසී යාම, ක්‍ෂණ භංගුරත්වය, මොහොතක් පාසා වෙනස්වන බව සිහිපත් කරන මාහට ඒවා පිළිබඳව යක්‍ෂරාක්‍ෂාදීන් දුටු කලෙක මෙන් භයක් උපන්නේය. එවිට මා හට මේ පංචාරම්මණයන්ගේ ආදීනව පිළිබඳ නානාප්‍රකාර දෝෂයන් අවබෝධ විය. ඊට විරුද්ධ වූ නිර්වාණයේ ආනිසංසද අවබෝධ විය. **''නිබ්බදා සමතිට්ඨථ''** සංවේගයට පැමිණ ආදීනව පිළිබඳව සිහිපත් කර බැලීමෙන් හටගත් නිර්වේද ඤාණය මාගේ හදවතෙහි පිහිටියේය. මොහොතක් හෝ ඒ ඒ රූපාරූප ධර්මයන්ගේ ගැනීම පිළිබඳ සිතක් නූපන්නේය. ඒකාන්තයෙන් මිදෙනු කැමති (කාමුකත්‍වයෙන්) බවට පත් වූ උදාසීන සිතුවිලි උපන්නේය යන අර්ථයයි. ''තතො'' ඒ විදර්ශනා ඥානයෙන් **''චිත්තං විමුචචි මෙ''** ලෝකෝත්තර සිත් වැඩීමෙන් පවතින මාර්ග සිත් පිළිවෙලින් සියලු කෙලෙසුන්ගෙන් මගේ සිත මිදුනේය. ඉන් ඵලයන්ට පැමිණීම දක්වයි. මාර්ග ක්‍ෂණයෙහි දීම ''සිත කෙලෙසුන්ගෙන් මිදෙයි'' නම් වේ. ඵලක්‍ෂණයෙහි ''සිත කෙලෙසුන්ගෙන් මිදුණේය'' නම් වේ. සෙසු පදයන්ගේ අර්ථ ප්‍රකටය.

නාගසමාල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.2

''අහං මිදෙධන'' යනු ආයුෂ්මත් භගු තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී කුල ගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ධාතූන්ට මලින් පූජා පැවැත් වූ ඒ සිටුකුමරු පසුව එම කුසලානුභාවයෙන් නිම්මාණරතියෙහි ඉපදුනේය. ඒ ඒ කාම සුගතීන්හි සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී ශාක්‍ය රජකුලයේ ඉපිද භගු නාමයෙන් ප්‍රකට විය. පසුව අනුරුද්ධ, කිම්බිල ආදී ශාක්‍ය කුමරුන් සමඟම ගිහිගෙන් නික්ම පැවිදි වූ භගු තෙරණුවෝ බාලකලෝණක ග්‍රාමයේ වසන සේක්, දිනක් නිදිමත දුරු කිරීම සඳහා

විහාරයෙන් නික්ම සක්මනට නැංගහ. එහිදී පෙරලී වැටුණු විට එයම අංකුසයක් කරගෙන කය සිත මැලි බව (ථීනමිද්ධ නීවරණය) දුරින්ම දුරු කොට විඳසුන් වඩා රහත් වූහ.

භගු තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

මහත් යශස් ඇති **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි මම දෑසමන් මලින් මුදුන් මල් කඩක් කොට බුද්ධ දේහයට පිදුවෙමි. එහි සිත පහදවාගත් මම නිර්මාණරති දෙවිලොව උපන්නෙමි. එහිදී මා කළ පින්කම සිහිකළෙමි. හැමකල්හි මා හට අහසින් මල් වැසි වසියි. ඉදින් මම මිනිස් ලොව සැරිසරම් නම් මහත් යශස් ඇති රජෙක් වෙමි. සියල්ල දක්නා වූ බුදුරදුන්ට කළ මල් පූජාවේ අනුභසින් මා හට මිනිස් ලොවදී ද මල් වැසි වසී. මේ මාගේ අවසන් භවයයි. අන්තිම භවය දරන මා හට අද පවා හැමකල්හිම මල් වැසි වසී. මීට කල්ප ලක්ෂයකට පෙරදී යම් මල් පූජාවක් කළෙමි ද ඒ පින්කමෙහි විපාක වශයෙන් මේ දක්වාම දුගතියක නූපපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව ඵල සුවයෙන් ද නිවන් සුවයෙන් ද කල් යවන උන්වහන්සේ වෙත වැඩම වූ ශාස්තෘන් වහන්සේ ඒක විහාර වාසයේ වැදගත්කම ප්‍රකට කරවනු සඳහා ''මහණ! නුඹ අප්‍රමාදීව වෙසෙන්නේ කෙසේ ද ?''යි විචාළ සේක්, තමාගේ අප්‍රමාදී වූ විහරණය ප්‍රකට කරමින් මේ ගාථා සතර වදාළහ.

අහං මිදෙධන පකතො විහාරා උපනික්ඛමිං
චඞ්කමං අභිරුහනෙතා තපෙවව පපතිං ඡමා

ගතතානි පරිමජජිත්වා පුනපාරුයා චඞ්කමං
චඞ්කමෙ චංඞ්කමිං සොහං අජඣතතං සුසමාහිතො

තතො මෙ මනසීකාරෙ යොනිසො උදපජජථ
ආදීනවෙ පාතුරහු, නිබබිදා සමතිථථ

තතො චිතතං විමුචචි මෙ, පසස ධමමසුධමමතං
තිසෙසා විජජා අනුපපතතා, කතං බුදධසස සාසනං'' ති.

එහි ''මිදෙධන පකතො'' කයෙහි අලස බව නම් වූ සිතේ කරදරකාරී බවක් නොමැති කල්හි ඇතිවන නිදිමතින්, කයේ මැලිබවින් මඬනා ලද්දෙමි. ''විහාරා'' විහාරයෙන්, සෙනසුනින්. ''**උපනික්ඛමි**'' සක්මන් කිරීමට නික්මුනෙමි. ''**තතෝව පපතිං ඡමා**'' එහිම, ඒ සක්මන් මළුවෙහිම නිදිමත නිසා වැටුනෙමි. බිම පෙරලුනෙමි. ''**ගත්තානි පරිමජ්ජිත්වා**'' බිම වැටීමෙන් අවයවයන්හි තැවරුණු පස් දුවිලි පිසදමා ශරීරාංග පිරිමැද, ''**පුනපාරුය්‍හ චඞ්කමං**'',''මම වැටුනෙමි''යි හැකිලීමට-පසුබෑමට නොගොස් නැවත සක්මනට නැග. ''**අජ්ඣත්තං සුසමාහිතො**'', ගෝචර නම් වූ අධ්‍යාත්මයෙහි වැඩූ කමටහනින් නීවරණ ධර්ම මුලිනුපුටා දමා මනාව සංසිඳුණු එකඟ සිත් ඇත්තෙකුව සක්මන් කළෙමි''යනු අදහසයි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. මේ සිවුගාථා හඟු තෙරණුවන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා ද විය.

හඟු තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.3

''**පරෙව**'' යනු ආයුෂ්මත් සභිය තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත්, කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්හ. නුවණැති බවට පත් ඒ සිටුකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ විහාරයෙන් නික්ම වැඩම කරනු දැක පහන් සිතින් පාවහන් යුවලක් පිදීය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා අවුත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කාලයේ දී රන්වන් සෑයෙහි කුලපුතුන් සයක් සමඟ තමා සත්වැනියාව පැවිදි විය. ඒ සත්දෙන කමටහන් ගෙන ආරණ්‍යයෙහි වෙසෙමින් උත්සාහ කළත් ගුණ විශේෂයක් උපදවා ගත නොහැකි විය. ඔවුන්ගෙන් කෙනෙක් මෙසේ කීහ. ''අපි පිණ්ඩපාතයේ යමින් ජීවිතය පිළිබඳ අපේක්ෂා සහිතව වෙසෙමු. ජීවිතයේ අපේක්ෂා සහිතව ලෝකෝත්තර දහම් ඉපදවීම අසීරුය. එය කල නොහැක. පුහුදුන්ව කළුරිය කිරීම ද දුකකි. එනිසා අපි හිණිමගක් බැඳ පර්වතයට නැගී කයෙහිත් ජීවිතයෙහි ත් අපේක්ෂා රහිතයෝ වී මහණදම් පුරමු.'' එය ඇසූ ඒ සත්දෙන පර්වතයට නැංගහ. ඔවුන්ගෙන් වැඩිමල් තෙරණුවෝ උපනිශ්‍රය සම්පත් ඇතිව එදිනම ෂඩ් අභිඥාලාභී මහ

තෙරනමක්ව, උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය රැගෙන පැමිණියහ. සෙසු සඳෙන, ''ස්වාමීනි! නුඹ වහන්සේ කළයුතු දෙය කර අවසන් වූවෙහිය. නුඹවහන්සේ සමඟ කථා සල්ලාපයත් අපට බාධාවකි. අපි මහණදම් පමණක්ම පුරමු. නුඹවහන්සේ තමන්ගේ දිවියධම්ම සුඛ විහරණයෙහි ම නියැලුණු මැනව''යි පැවසූහ. පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කළවිට එය කෙසේවත් පිළිගැන්වීමට නොහැකි වූ රහතන් වහන්සේ වෙනත් තැනකට වැඩම කළහ. ඒ සඳෙනාගෙන් තවත් හිමිනමක් දෙතුන් දිනකින් පංචාභිඥා සහිතව අනාගාමී ඵලයට පත්ව රැගෙන ආ පිණ්ඩපාතයද සෙස්සන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බැවින් වෙනත් තැනකට ගියේය. ඒ සත්දෙනාගෙන් රහතන් වහන්සේ පිරිනිවියහ. අනාගාමී තෙරණුවෝ ශුද්ධාවාසයෙහි උපන්හ. ඉතිරි පස්දෙන පුහුදුන්වම මියගොස් සඳෙවි ලොව්හි අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙව් සැප විඳ, අපගේ බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ ඉන් චුතව එක් අයෙක් මල්ල රජ කුලයෙහි ද තවත් අයෙක් ගන්ධාර රාජ කුලයෙහි ද තවත් අයෙක් බාහිය රටේ ද තව අයෙක් රජගහනුවර එක් සිටු දුවකගේ කුසෙහි ද පිළිසිඳ ගත්හ. ඉතිරි පුද්ගලයා එක් පරිබ්‍රාජිකාවකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ඇය එක් ක්ෂත්‍රියක රජෙකුගේ දුවකි. ඇගේ මාපියෝ, ''අපගේ දුව වෙනත් ආගම් දන්නියක් වේවා''යි එක් පිරිවැජියෙකුට ඇය භාරදුන්හ. ඉක්බිති එක් පිරිවැජියෙක් ඇය සමඟ වරදේ බැඳුණි. ඉන් ඇය ගැබ් ගත්තාය. ඇගේ ගැබ දුටු පිරිවැජියෝ ඇය අරමින් ඉවත් කළහ. ඇය වෙනත් තැනකට යන්නී අතර මඟ වූ රැස්වීමකදී (සභාවකදී) දරුවා වැදුවාය. එනිසා පුතුට සභිය යන නම තැබීය. සභිය කුමරු වැඩී පිරිවැජියෙකු වී නානා විධ ශාස්ත්‍රයන් ඉගෙන මහාවාදියෙකු විය. වාද කරමින් ඒ මේ තැන හැසිර තමා හා සමානයකු නොදක නුවර දොර ළඟ අසපුවක් සාදවා ගෙන, ක්ෂත්‍රිය කුමාරාදීන්ට ශිල්ප උගන්වමින් සිටියේය. සභියගේ මව ස්ත්‍රී භාවය පිළිබඳ කළකිරී එය පිළිකුල් කරන්නී ධ්‍යාන උපදවාගෙන බඹලොව ඉපිද සකසා ගත් ප්‍රශ්න විස්සක් සභියට දුන්නීය. සභිය ඒ ප්‍රශ්ණ රැගෙන ඒ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් විචාළ නමුත් ඒවා විසඳීමට කිසිවකුට නොහැකි විය. සභිය සූත්‍ර වර්ණනාවෙහි ''ශුද්ධාවාස'' වැසි බ්‍රහ්මයෝ මේ ප්‍රශ්න සාදා දුන්නේයැ''යි කියැවේ.

මෙම කාලයේ දී පැවැත් වූ උතුම් දම්සක් පැවතුම් ඇති අප භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙලින් රජගහ නුවරට වැඩමවා වේළුවනාරාමයේ වෙසෙන සේක. එකල සභිය එහි ගොස් ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ, ඒ ප්‍රශ්න විමසීය. ශාස්තෘන් වහන්සේ එම ප්‍රශ්න විසඳූ සේක. ඒ සියල්ල සභිය සූත්‍රයේ පැමිණි අයුරින් දත යුත්තේය.

ඒ පැන විසඳුම් අසා පැහැදුණු සභිය ශ්‍රද්ධාව උපදවාගෙන සසුනේ පැවිදි ව, විදසුනේ සිත පිහිටුවා රහත් ඵලයට පැමිණියේය.

සභිය තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''වැස නිම වූ බඹසර ඇති බ්‍රාහ්මණ වංශයෙහි උපන් දිවා විහරණයෙහි හැසිරෙන කකුසඳ බුදුරජාණන් වහන්සේට මම පය ලෑමට, පා පුවරුවක් පිදුවෙමි. මේ මහා භද්‍ර කල්පයේදීම දෙන ලද එම දානයේ විපාක වශයෙන් මේ දක්වා දුගතියක නූපන්නෙමි. පාවහන් දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් වූ සභිය තෙරණුවෝ සංඝභේදයට උත්සාහ කරන දේවදත්තගේ පක්ෂය ගත් භික්ෂූන්ට අවවාද දෙමින් මේ ගාථා සතරින් දහම් දෙසූහ.

''පරෙ චන විජානන්ති මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා

යදාච අවිජානන්තා ඉරියන්ත්‍යමරා විය
විරජානන්ති ච යෙ ධම්මං ආතුරෙසු අනාතුරා

යං කිංචි සිථිලං කම්මං සංකිලිට්ඨං ච යං චතං
සංකස්සරං බ්‍රහ්මචරියං නතං හොති මහප්ඵලං

යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති
ආරකා හොති සද්ධම්මා නභං පුථුවියා යථා''

එහි ''පරෙ'' පණ්ඩිත, නුවණැත්තන් හැර අන්‍යයෝය. ''ධර්මය අධර්මය'' ආදී වශයෙන් භේද කරන වාද විවාදයන්හි නියැලුණු අනුවණයෝ ''අන්‍යයෝ'' නම් වෙති. ඔවුහු ''මෙහි වාද විවාද කරන අපි වැනසෙමු. නො ඇලෙමු. නැසෙමු. නිරන්තරව මාරයා සමීපයට නොනැවතී යන්නෙමු''යි නොදනිති. ''**යෙ ච තත්ථ විජානන්ති**'' යම් පණ්ඩිත, නුවණැති අයෙක් ''අපි මාරයා සමීපයට යන්නෙමු''යි දනිත් නම්. ''තතො සම්මන්ති මෙධගා'' මෙසේ දැනගත් ඔවුහු නුවණැස මෙහෙයවා, උපදවා වාද විවාද කලහ සන්සිඳවීමට කටයුතු කරති. ඔවුන්ගේ මේ පිළිවෙත නිසා, එමගින් කලහයෝ සන්සිඳෙත්. නැතහොත් ''**පරෙ ච**'' යනු - ශාස්තෘන් වහන්සේගේ අවවාද අනුශාසනා නොපිළිගන්නා බුදුසසුනින් බැහැර වූවෝ අන්‍යයෝ

නම් වෙති. ඔවුනු ''අපි මිසදිටු අදහස් පිළිගෙන, මෙහි මෙලොවදීම බුදුසසුන ප්‍රතික්ෂේප කිරීමෙන් වැනසීමට වෑයම් කරමු''යි යම්තාක් කල් නොඳනිත් ද ඒතාක් කල්ම විවාදයෝ නො සන්සිඳෙති. යම් කලෙක ඒ ගත් වැරදි අදහස් ඉවත ලා, ඒ වාද විවාදයන්හි යෙදුනවුන් අතුරින් ධර්මාධර්ම භේද බැහැරලා ධර්මය තත් වූ පරිද්දෙන්ම දැනගනිත්ද එකල්හි ඒ සත්පුරුෂ පණ්ඩිත පුරුෂයන් නිසා විවාද නම් වූ කලහයෝ සන්සිඳෙති. මෙසේ ද මෙහි අර්ථ දත යුතුයි. ''යදා'' යම් කලෙක. ''**අවිජානන්තා**'' වාද විවාද සන්සිඳුවන උපාය වූ ''ධර්මය හා අධර්මය පිළිබඳ තත්වූ පරිද්දෙන් දැනගැනීම'' නොමැත්තෝ ද ''**ඉරියනන්‍යමෙරාචිය**'' නොමැරෙන්නවුන්, ජරා මරණ ඉක්මවූවන් මෙන් උඩඟුව, ආඩම්බරයෙන්, මුඛරිව, විසිරුණු වදන් ඇතිව, වපලව පවතින්නාහු ද වසන්නාහු ද ඔවුන් නිසා විවාදයෝ කිසිදා නො සන්සිඳෙති. ''**විජානන්ති ච යෙ ධම්මං ආතුරෙසු අනාතුරා**'' යමෙක් වනාහී ශාස්තෘන් වහන්සේගේ ශාසන ධර්මය තත්වාකාරයෙන් දනිත් ද ඔවුහු කෙලෙස් රෝගයෙන් පීඩාවූවන් මැද නිරෝගීව, කෙලෙස් නොමැතිව, දුක් පීඩා විරහිතව වෙසෙති. ඔවුන්ගේ පැවතීම් වශයෙන් වාද විවාදයෝ අතිශයින්ම සන්සිඳෙති''යන අදහසයි.

''**යං කිංචි සිථිලං කම්මං**'' පසුබැසීම්, හීන වීර්ය වශයෙන් ලිහිල්ව ගැනීමෙන් කරන ලද, ලිහිල් වීර්ය ඇතිව කරන ලද කුසල කර්මය. ''**සංකිලිට්ඨං**'' වෙසඟනන් ආදී නුසුදුසුවූවන් හා හැසිරීමෙන් හෝ නැතිගුණ පෙන්වීම් ආදී කුහක වැරදි ජීවනයන්ගෙන් කිලිටි වූ ව්‍රත සමාදානයන්ගෙන් ද, ''**සංකස්සරං**'' සැකයෙන් සිහිකළ යුතු, විහාරයෙහි කිසියම් නුසුදුසු හැසිරීමක් අසා, ''එය ඒකාන්තයෙන්ම අසුවලා විසින් කරන ලද''යි අන්‍යයන් විසින් සැක කළ යුතු, උපෝසථ කර්මාදී විනය කර්ම කිරීමට රැස් වූ මහා සංඝයා දැක ''ඒකාන්තයෙන්ම මොවුහු මාගේ හැසිරීම් දැන මා එළවීමට රැස්වූවාහුයැ''යි මෙසේ තමා විසින් හෝ සැක සංකා සහිතව සිහිකරන, විපරමින් වඩ වඩාත් සැකයෙන් ජීවත්වන. ''**න තං හොති**'' මෙබඳු වූ බඹසර හැසිරීම හෝ මහණදම් පිරීම ඒ පුද්ගලයාට මහත්ඵල පිණිස හේතු නොවේ. ඔහුට මග ඵල නූපදින බැවින් ඒ භික්ෂුවගේ ප්‍රත්‍ය දායකයන්ට ද මහත් පින් ඵල නොලැබේ. ''එනිසා සැහැල්ලු වූ, කෙලෙස් දුරු කරන ජීවන පැවැත්මම වාද විවාදයන්ට අවසරයක් නොලබන්නකි'' යන අදහසයි.

''**ගාරවො නූපලබ්භති**'', අවවාද අනුශාසනා දෙන බැවින් ද අල්ප වූ දක්ෂිණා ඇති බැවින් ද ගරු කටයුතු සබ්‍රහ්මචාරීන් කෙරෙහි යම් පුද්ගලයෙකු තුළ ගෞරවයක්, ගරු සත්කාර කිරීමක් නොමැත්තේ ද ''ආරකා හොති සද්ධම්මා'' එබඳු පුද්ගලයා ප්‍රතිවේද සද්ධර්මයෙන් ද ප්‍රතිපත්ත

සද්ධර්මයෙන් ද දුරුවේ. ඉවත් වේ. එබඳු පුද්ගලයාට ගුරුවරු මැනවින් නූගන්වති. විනයෙන් තොරවූයේ ශික්ෂාකාමීත්වයෙන් දුරුවූයේ විනය සිකපද නොපිළිපදියි. පිළිවෙත් නො සපුරන්නාට කෙසේ නම් සද්ධර්මය අවබෝධ වේද? එනිසා **''ආරකා හොති සද්ධම්මා''** සද්ධර්මයෙන් දුරුවේ යැයි කියන ලදී. කෙසේද යත්? **''නහං පුථුවියා යථා''** අහස පොළවෙන් දුරුවීම ස්වාභාවිකවම සිදු වේ. කිසිකලෙකත් අහස හා පොළොව එකතු නොවේ. වැරදි පිළිවෙත් ඇත්තා සද්ධර්මයෙන් දුරුවීමද එබඳුම යැයි මෙහිදී දැක් වේ.

එනිසා කියන ලදී -

''නභං ච දූරෙ පඨවිච දූරෙ - පාරං සමුද්දස්ස තදාහු දූරෙ
තතො හවෙ දූරතරං වදනති - සතං ච ධම්මං අසතං ච රාජා'' ති.

''රජතුමනි ! අහස හා පොළව ඉතා දුරින් පිහිටියේය. මුහුදෙහි කෙළවර ඊටත් වඩා දුරය. මේ සියලුම වස්තූන්ගේ දුරට වඩා අසත්ධර්මය හා සත් ධර්මය අතර ඇති දුර අතිමහත්ය.

සහිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.4

''ධීරත්ථු'' යනාදී ගාථා සතර ආයුෂ්මත් **නන්දක** තෙරුන් වහන්සේගේ ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර මහත් සම්පත් ඇති සිටුවරයෙක් ව උපන්හ. ඔහු සැමදාම ශාස්තෘන් වහන්සේ සමීපයේ සිට ධර්ම ශ්‍රවණය කරයි. දිනක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් භික්ඛුණෝ වාදක භික්ෂූන්ගෙන් අග්‍ර භාවයට පත් කරනු දැක, තමා ද ඒ තනතුර පැතීය. ලක්ෂයක් අගනා වස්ත්‍ර භාග්‍යවතුන් වහන්සේට පිදූ ඔහු සිය ප්‍රාර්ථනාව ප්‍රකාශ කළේය. ඒ ශාස්තෘන් වහන්සේගේ බෝධි වෘක්ෂයට පහන් පූජාවක් ද පැවැත්වූ සිටුතුමා, මෙම පින්කම්වල විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳිදේය. කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී කොවුලෙක්ව ඉපිද මිහිරිව හඬ නගමින් උන්වහන්සේ පැදකුණු කළ

හෙතෙම පසුකාලෙක මොණරෙක්ව උපන්නේය. එසේ බුදුරජාණන් වහන්සේ කෙනෙකුන් වසන ගුහා ද්වාරයක සිට පහන් සිතින් දිනපතාම තුන්වාරයක් මිහිරිව නාද පූජා පැවැත්වීය. මෙසේ ඒ ඒ අත්බවෙහිදී පින්දහම් රැස් කරගත් හෙතෙම, අපගේ භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි සැවැත් නුවර සිටුගෙයක ඉපිද නන්දක නමින් ප්‍රකට විය. වැඩිවියට පත් ඔහු; ශාස්තෘන් වහන්සේ සමීපයෙහි බණ අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි වී විදසුන් වඩා රහත් විය.

අපදාන පාළියේදී නන්දක තෙරණුවෝ මෙසේ වදාළහ.

''ඉතා සතුටින් යුතු පහන් සිත් ඇති මම පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ උතුම් බෝධි වෘක්ෂය වෙත ගොස් පන්දම් තුනකින් පූජා කළෙමි. පන්දම් ගිනිසිළු දරමින් මීට කල්ප ලක්ෂයකට පෙර දී යම් පූජාවක් කෙළෙමි ද එහි විපාක වශයෙන් දුගතියකට නොගියෙමි. පහන් ආලෝක පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත්ව විමුක්ති සුවයෙන් කල් යවන නන්දක තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් භික්ෂුණෝවාදක තනතුරෙහි යොදවන ලදහ. එක් පොහෝ දිනක පන්සීයක් භික්ෂුණීහු නන්දක තෙරුන්ගේ එක් අවවාදයක් අසා රහත් වූහ. එනිසා භාග්‍යවතුන් වහන්සේ භික්ඛුණෝවාදක භික්ෂූන්ගේ අග්‍රභාවයට නන්දක තෙරණුවන් පත් කළහ. දිනක් උන්වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙන කල්හි පෙර ගිහි කල භායඃවක් වූ ස්ත්‍රියක ක්ලේශ වසඟව උන්වහන්සේ දෙස බලා සිනාසුනීය. නන්දක තෙරණුවෝ ඇගේ ඒ විප්‍රකාරය දැක ශරීරයේ පිළිකුල් බව ප්‍රකාශ කරමින් මේ ගාථා සතරින් ධර්ම දේශනා කළහ.

''ඨිරත්ථු පූරෙ දුග්ගන්ධෙ මාරපක්ඛෙ අවස්සුතෙ
නව සොතානි තෙ කායෙ යානි සන්‍ධන්ති සබ්බදා

මා පුරාණං අමඤ්ඤිත්ථො, මා සාදෙසි තථාගතෙ
සග්ගෙපි තෙ න රජ්ජන්ති කිමංග පන මානුසෙ

යෙ ච බො බාලා දුම්මෙධා දුම්මන්නි මොහපාරුතා
තාදිසා තත්ථ රජ්ජන්ති මාරක්ඛිත්තසමිං බන්ධනෙ

යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා
නාදී නසා න රජ්ජන්ති ඛීනාසවසුත්තා අබන්ධනා''

එහි ''ධී'' යනු පිළිකුල් කිරීම් අර්ථයෙ නිපාතයකි. ''**අත්‍රු**'' වේවා, ර කාරය පද දෙක සන්ධි කරන්නකි. ''පිළිකුල් වූ නුඹට නින්දා වේවා! නුඹගේ ක්‍රියාව නින්දා සහගතය'' යන අර්ථයයි. ''**පූරෙ**'' ආදී වශයෙන් ඇගේ නින්දනීය බවට ආමන්ත්‍රණය කරන ආලපන වදන් යොදා ඇත. එහි ''පූරෙ'' යනු අතිශය පිළිකුල්, නානාප්‍රකාර කුණුපයන්ගෙන්, නානාවිධ අශුචීන්ගෙන් පිරුණු ''දුග්ගන්ධෙ'' කුණුපයන්ගෙන් පිරි බැවින් ම ස්වභාවයෙන්ම දුගඳ හමන. ''**මාරපක්ඛෙ**'' විභාග වස්තුවක් වූ ස්ත්‍රී රූපය අඳබාල පුහුදුන් පුද්ගලයන්ට අනුවණින් සිහි කිරීමට නිමිති වන බැවින් කෙලෙස් මාරයන්ගේ වැඩීමට උපකාර වේ. දේව පුත්‍ර මාරයාට ද පිවිසීමට ඉඩ අවස්ථා සලසා දෙයි. එනිසා මාර පාක්ෂික වූවකැයි කියන ලදී ''**අවස්සුතෙ**'' සැමකල්හි කෙලෙස් වැසි වැසීමෙන් ද ඒ ඒ තැන අශුචි ගලා යෑමෙන් ද කාමාශාවෙන් තෙත් වූ. දැන් ඇගේ ''**නව සොතානි තෙ කායෙ යානි සන්ධනති සබ්බදා**'' නව දොරකින් අශුචි වැගිරෙන බව කියයි. ඇසෙන් කඳුලු නම් වූ අශුචි ආදි වශයෙන් අශුචීන්ගේ වැගිරීම් ස්ථාන දත යුතුයි. මෙසේ නව දොරකින් නිති මල වෑහෙන, අශුචියේ පිරි කයේ දොස තත්ත්වාකාරයෙන් මම දනිමි. පෙර මා එය නොදන්නා බැවින් නුඹ සමඟ සිනා කෙළි කවටකම් පැවැත්වූයෙමි. දැනුත් එසේ නුඹ හා හැසිරෙතියි නො සිතව. ''**මා සාදෙසි තථාගතෙ**'' යම් සේ උපනිශ්‍රය සම්පත්තියෙන් පෙර වූ බුද්ධ ශ්‍රාවකයෝ නිවණට පැමිණියාහු ද එසේ වූ යහපත් ප්‍රතිපත්තියෙන් පැමිණි, අවබෝධ කළ නිවන් සැප ඇති; රූප ධර්මයන්ගේ තථ ලක්ෂණය, යථාස්වභාවය ද චතුරාර්ය සත්‍ය ධර්මය ද අවබෝධ කරගත්තා වූ, දන ගත්තා වූ ද; මේ තථාගත ආර්ය ශ්‍රාවකයන් කෙරෙහි වෙනත් පුහුදුන් පුද්ගලයන්ට මෙන් කෙලෙස් වසඟව අවඥා නොකරව. සම්පයට පැමිණ හිරිහැර-අපහාස නොකරව. ඇලීම් නොකර සිටීමට හේතු දක්වයි. ''**සඟෙ පි තෙ නරජ්ජන්ති කිමංග පන මානුසෙ**'' සර්වඥ වූ සියල්ල දත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට පවා කියා නිම කළ නොහැකි සැප ඇති දිව්‍ය ලෝකවල පවා ඒ බුද්ධ ශ්‍රාවකයෝ නො ඇලෙති. සංස්කාර ධර්මයන් හි ආදීනව මනාව දක්නා ලද බැවින් දෙවඟනන් දුටුවත් රාගයක් උන්වහන්සේලාට ඇති නොවේ. අශුචි ගොඩක් වැනි වූ මේ මනුෂ්‍ය ලෝකයේ ස්ත්‍රීන් දැක පංච කාමයන්හි උන්වහන්සේලාගේ නොඇලීම පිළිබඳව කියනු කිම? එය කිවයුත්තක් නොවේ. ''**යෙ ච බොා**'' යමෙක් අඳබාල බවට සුදුසු ද ඒ ''**බාලා**'' මෝඩයෝ, ධර්මයේ රස විඳින ප්‍රඥාව

නැති බැවින් ''දුම්මේධා'' දුෂ්ප්‍රාඥ වූවෝ; නපුරු සිතුවිලි සිතන බැවින අසුභ දෙය සුභ වශයෙන් දකිති. ''**දුම්මන්තිනො**'' වරදවා සිතති. මෝඩකමින් පිරී, අනුවණ බවින් සියලුම ආකාරයෙන් වැසුණු සිත් ඇති බැවින් ''**මොහපාරුතා**'' මෝහයෙන් වැසුණු. මේ ලක්ෂණයන්ගෙන් යුක්ත අද පුහුදුන් පුද්ගලයෝ ඒ ස්ත්‍රී සංඥා ඇති. මාරයාගේ බන්ධනයෙහි - මාරයා ඇටවූ උගුලෙහි ඇලෙති. අතිශයින් ගිජුව මුලාව ඊට බැසගෙන සිටිති. ''**විරාජිතා**'' යම් ඒ ක්ෂීණශ්‍රවයන් වහන්සේලා, තෙල්වල ඇලුණාක් මෙන් මිදීම අපහසු වූ රාගය ද, ඉඩ ලද වහා දූෂිත කටයුතු කරන සතුරෙක බඳු ද්වේෂය ද, චතුරාර්ය සත්‍ය නොදන්නා වූ අවිද්‍යාව ද ආර්ය මාර්ගය නම් විරාගී ඖෂධයෙන් සර්වප්‍රකාරයෙන්ම ප්‍රහීණ කළහ. මුලිනුපුටා දැමූහ. දුරු කළහ. එබඳු වූ ආර්ය මාර්ගය නම් ආයුධයෙන් සිදි ''**භව උජ්ජන්නි**'' නම් තණ්හා නුල කෙසේවත්, කිසිවකුටත් නැවත බැඳිය නොහැක. එනිසා කෙලෙස් බන්ධන රහිතය. එනිසා ඒ රහතන් වහන්සේලා මුලින් දක් වූ මාරයාගේ උගුලෙහි නො ඇලෙති. මෙසේ ඒ ස්ත්‍රියට දහම් දෙසූ තෙරුන් වහන්සේ විහාරයට වැඩි සේක. එම ගාථා දේශනාව උන්වහන්සේගේ රහත් බව ප්‍රකාශ කිරීම විය.

නන්දක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.5

''**පඤ්ච පණ්ණාස**'' යනාදී ගාථා සතර ආයුෂ්මත් ජම්බුක තෙරුන් වහන්සේගේය. උන්වහන්සේ ද පෙර බුදුවරුන් ඉදිරියේ තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් සිදුකරමින් අවුත්, තිස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත් වූහ. ඔහු දිනක් ශාස්තෘන් වහන්සේගේ සම්මා සම්බෝධිය සිහිකරමින් බෝධිවෘක්ෂයට වැඳ විජිනි පතකින් පූජා පැවැත්වීය. ඒ පින්කමේ විපාක විඳිමින් දෙවි මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත්, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී ඉපිද නුවණැති බවට පත්ව, සසුනේ පැවිදි වී එක්තරා උපාසකයකු විසින් කරවා දුන් ආරාමයක නේවාසිකයකු වූ හෙතෙම ඒ උපාසකයාගේ උපස්ථාන ලබමින් වාසය කළේය. දිනක් එක් රහතන් වහන්සේ නමක් දිරාගිය සිවුරක් පොරවාගෙන කෙස් බෑම සඳහා ආරණ්‍යයේ සිට ගම දෙසට එනු දුටු ඒ උපාසකයා; උන්වහන්සේගේ ඉරියවු දැක පැහැදී

කරණවැමියකු ලවා උන්වහන්සේගේ කෙස් රැවුල් කැපවීය. ප්‍රණීත භෝජන වළඳවා සුන්දර සිවුරක් දී ''ස්වාමීනි! මේ විහාරයේම වසනු මැනවි''යි තමා සෑදූ අරම පෙන්වීය. මෙය දුටු එතෙක් ආවාසයේ සිටි භික්ෂූව රර්ෂ්‍යා මසුරු බවින් යුක්ත වූයේ රහතන් වහන්සේට ''මහණ! මේ පාපී උපාසකයාගේ උපස්ථාන ලබමින් මෙහි විසීමට වඩා ඇඟිලිවලින් කෙස් උගුල්ලා අඹේල නාපසයකු වී මළමුත්‍රාහාරයෙන් ජීවත්වීම උතුම් වේ''යැයි පැවසීය. එසේ කියූ එම පුහුදුන් භික්ෂුව එකෙණෙහිම වැසිකිළියට පිවිස කිරිබතක් වඩන්නාක් මෙන් අතින් මළ ගුලි වඩා ඇතිතෙක් කෑවේය. මූත්‍ර ද බීවේය. මේ ක්‍රමයෙන් දිවි ඇති තෙක් කල්යවා, මැරී ගොස් නිරයේ පැසී, නැවත ගුරු නිරයෙහි මළමුත්‍රාහාරයෙන් වැස, ඒ කර්මයේ විපාක වශයෙන්ම මිනිසුන් අතර උපන්නත්, පන්සීයක් ආත්ම භවයන්හි නිගණ්ඨකුව මළ අනුභව කළේය. නැවත මේ බුද්ධෝත්පාදයේදී මිනිස් යෝනියෙහි උපන්නත් ආර්යයන් වහන්සේට අපවාද කිරීම නිසා දුප්පත් පවුලක ඉපදුණි. ඒ දරුවාට තනකිරි හෝ කිරි හෝ ගිතෙල් හෝ පොවන විට එය හැරදමා මුත්‍රම බොයි. බත් කවන විට එය ඉවත දමා අශුචිම කයි. මෙසේ මළමුත්‍රාහාරයෙන් වැඩෙන ඒ දරුවා වැඩිවියට ත් වුවත් ඒවාම අනුභව කළේය. ඔහු ඉන් වළක්වා ගැනීමට අපහසු වූ පසු නෑයෝ ඔහු එළවා දැමූහ. නිර්වස්ත්‍ර පැවිද්දෙන් පැවිදි වූ ඔහු නොනායි. බැඳුණු කුණු තට්ටු ඇතිව කෙස් රැවුල් උගුලා දැමූ ඔහු වෙනත් ඉරියවු බැහැර ලා එක් පයකින් සිටගෙන සිටියි. ආරාධනා නො ඉවසයි. මාසයක්ම ආහාර නොගෙන උපවාස කරයි. මාසයක් මාසයක් පාසා පින් කැමැත්තන් විසින් පිළිගන්වන ආහාර එක්වරක් කුස තණ අගකින් ගෙන දිවේ තබා ගනියි. රාත්‍රියට අමු අශුචි ප්‍රාණීන් සහිත යැයි නොකා, වියළි අශුචි ම කයි. මෙසේ ජනයා රවටමින් වසර පනස් පහක් ඉක්මවීය. මහජනයා ''මොහු මහා තාපසයෙකි. අතිශයින් ම අල්පේච්ඡයෙකි''යි සිතමින් වඩ වඩාත් ගරුසත්කාර කරන ලදී. ඉක්බිති අප භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ චිත්තාභ්‍යන්තරයෙහි කළයක් තුළ වූ පහනක් මෙන් පැවති රහත්වීමේ හේතු සම්පත් දිළිසෙනු දුටු සේක්. තමන් වහන්සේම එතැනට වැඩම කොට දහම් දෙසා සෝවාන් ඵලයෙහි පිහිට වූ සේක. ඒහි භික්ෂු මහණ උපසම්පදාව ලබාගෙන සසුනට පිවිසි ජම්බුකාජීවක තෙමේ විදසුනෙහි සිත පිහිටුවා රහත් ඵලයෙහි පිහිටියේ ය. මේ දක්වන ලද්දේ සංක්ෂිප්තවයි. විස්තර වශයෙන් ධම්මපද පාළියේ ''මාසෙ මාසෙ කුසග්ගෙන'' යන ගාථාවට ලියූ වර්ණනාවෙහි කියූ පරිද්දෙන් දත යුතුයි. රහත් බවෙහි පිහිටි ජම්බුක තෙරණුවෝ පිරිනිවෙණ අවස්ථාවෙහි තමා මුල සිටම වැරදි පිළිවෙතින් යුක්ත වූවත්, සම්මා සම්බුදුරජාණන් වහන්සේ නිසා බුද්ධ ශ්‍රාවක භාවය මවිසින් ලබන ලදී''යි දක්වමින් මේ සතර ගාථා වදාළහ.

''පඤ්ච පඤ්ඤාස වස්සානි රජෝජල්ලමධාරයිං
භුඤ්ජනෙනා මාසිකං භත්තං කෙසමස්සුං අලොචයිං

එකපාදෙන අට්ඨාසිං, ආසනෑ පරිවජ්ජයිං
සුඛගුරූනි ච බාදිං, උදේදසං ච න සාදියිං

එතාදිසං කරිත්වාන බහුං දුගහතිගාමිනං
වුය්හමානො මහොඝෙන බුද්ධං සරණමාගමං

සරණාගමනං පස්ස, පස්ස ධම්මසුධම්මතං
නිස්සෝ විජ්ඣා අනුප්පත්තා, කතම්බුධස්සසාසනං''

එහි ''පඤ්ච පඤ්ඤාස වස්සානි රජෝජල්ලමධාරයිං'' නිර්වස්ත්‍ර පැවිද්දට පැමිණ නෑම ප්‍රතික්ෂෙප කර, පනස් පස් වසරක් පුරාම ශරීරයේ ඇලුණු පිටතින් ගසාගෙන පැමිණි රජස්, දූවිලි ද ශරීර කුණු නම් වූ දූලි කුණු ද දරා සිටියෙමි. ''භුඤ්ජනෙනා මාසිකං භත්තං'' රෑට අශුචි කමින් ලෝකයා රවටනු පිණිස මාසික උපවාසයෙන් යුක්ත වීමි. පින් කැමැත්තන් විසින් දෙනු ලබන ආහාරය මාසයකට එකවර බැගින් දාවල දිවඟ තැබීම් වශයෙන් අනුභව කළෙමි. ''ආලොචයිං'' නුණු අළු දැමීමෙන් ලිහිල් වූ මුල් ඇනි කෙස් රවුල් ඇඟිලිවලින් ගලවා, උදුරා දැමුවෙමි. ''එකපාදෙන අට්ඨාසිං ආසනං පරිවජ්ජයිං'' සර්ව ප්‍රකාරයෙන් ම සියළු වැඩ හිඳින, හිඳගන්නා ආසන ඉවත් කළෙමි. සිටගෙනම දෑත් ඔසවා ගෙන එක පයින් සිටියෙමි. ''උදේදසං'' දානමාන දී ආරාධනා, උදෙසා කළ ඇරයුම් යැයි ඇතැමෙක් කියති. ''න සාදියි''නොපිළිගත්තෙමි. ප්‍රතික්ෂෙප කළෙමි. යන අර්ථයයි. ''එතාදිසං කරිත්වාන බහුං දුගහතිගාමිනං'' මෙසේ මෙබඳු වූ විපාක දෙන, දුගතියට පමුණුවන බොහෝ පව්කම් පෙර ජාතිවල ද මේ ආත්මභාවයේදී ද සිදුකොට, ''වුය්හමානො මහොඝෙන'' කාමාදී මහත් වූ සතර ඕඝයෙන් විශේෂයෙන් ම දිට්ඨි ඕඝයෙන් අපාය නම් මහමුහුදට අදිනු ලබන්නෙමි. ''බුද්ධං සරණමාගමං'' එබඳු වූ පින්කම් නම් සිදුරකින් දුක සේ මනුෂ්‍යාත්ම භාවයක් ලැබ, දැන් පෙර පින් බලයෙන් බුදුසරණ ගියෙමි. ''ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය''යි අවල වූ ශ්‍රද්ධාවෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුනෙමි. ''සරණාගමනං පස්ස, පස්ස ධම්මසුධම්මතං'' වාසයට පැමිණි මාගේ සරණාගමනය බලව, ශාසන ධර්මයේ මනාවූ ධර්මතාවය බලව, යම් කලෙක මම වැරදි පිළිවෙත් හි නිරතව සිටියෙමි ද එකල ශාස්තෘන් වහන්සේ විසින් එකම අවවාදයකින් මම මෙවැනි මහත් සැපතකට පමුණුවන ලද්දෙමි. ''නිස්සෝ විජ්ඣා'' යනාදී වශයෙන් එම සම්පත් දැක් වේ.

එක ජම්බුක තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''මම තිස්ස බුදුරදුන්ගේ බෝධි වෘක්ෂයට වැන්දෙමි. විඤ්ඤාපනක් ගෙන එහි සිහසුනට පවන් සැලීමි. මිට කල්ප අනූ දෙකකට පෙර සිහසුනට පවන් සැලූයෙමි ද ඒ නිසා දුගතියක නූපන්නෙමි. පවන් සැලීමේ විපාක මෙබඳුය. මා විසින් සියලු කෙලෙස් දහන ලදි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.''

ජම්බුක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.6

''සඞ්ගහං වන'' යනු ආයුෂ්මත් සේනක තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් රැස් කරමින් අවුත් සිබි නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන්හ. නුවණැති බවට පත්ව දිනක් ඒ ශාස්තෘන් වහන්සේ දුටු සිටු කුමරු මොණර පිල් කළඹක් උන්වහන්සේට පහන් වූ සිතින් පූජා කළේය. හෙතෙම ඒ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් භවයන්හි සැරිසරා අවුත් මේ බුද්ධෝත්පාද කාලයේදී බමුණු පවුලක, උරුවේල කාශ්‍යප තෙරුන්ගේ නැඟණියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ''සේනක'' නාමයෙන් ඉපිද වැඩිවියට පත් එකුමරු බමුණු ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගොස් ගිහිගෙයි විසීය. එසමයේ මහජනයා වසරක් වසරක් පාසා මැදින් මස උත්තර ඵග්ගුන (උතුරුපල්) නැකතින් උත්සවයක් අරඹා ගයාවේ තීර්ත්‍රාභිෂේකය සිදු කරයි. එනිසා එම මහෝත්සවයට ''ගයා ඵග්ගුනී'' යැයි කියති. එබඳු උත්සව සමයකදී නික්මවිය හැකි ජනයා කෙරෙහි අනුකම්පාවෙන් අප භාග්‍යවතුන් වහන්සේ ගයා තීර්ත්‍රය සමීපයේ වාසය කළහ. මේ කාලයේ සේනක බමුණා ද තීර්ත්‍රාභිෂේකය සඳහා ගයාවට පැමිණ, ශාස්තෘන් වහන්සේ දහම් දෙසනු දැක එතැනට එළඹ ධර්ම ශ්‍රවණය කළේය. ඉන් ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි වූ සේනක තෙරණුවෝ විදසුන් වඩා නොබෝ දිනකින්ම රහත් ඵලයෙහි පිහිටියහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''මොණරපිල් චැටියක් ගත් මම පහන් සිහින්. සතුටට පත්වූයෙමි ලෝක නායක වූ බුදු රදුන් වෙත එළඹුනෙමි. එළඹ මොණරපිල් කළඹි පිදුවෙමි. මේ මොණර පිල් චැටි දානයෙන් ද චිත්ත ප්‍රණිධිය නිසාද රාග, ද්වේෂ, මෝහ යන තුන් ගිනි නිවී මාගේ සිත සුවපත් විය. ඉන් සැප ලබමි. බුදුවරයෝ අසිරිමත් වෙති. ධර්මය ද අසිරිමත් ය. අපගේ ශාස්තෘ සම්පත්තිය ද අසිරිමත් ය. මොණර පිල් කළඹි පිදූ මම මහත් සුව ලබමි. මාගේ රාගාදි තුන් ගිනි නිවුණි. සියලු භව නැසුණි ආශ්‍රව ක්ෂය කරන ලද්දෙමි. දැන් නැවත ඉපදීමක් නැත. මීට කල්ප තිස් එකකට පෙර දී යම් දානයක් දුන්නෙමි ද ඒ හේතුවෙන් දුගතියක් නොදකිමි. මොණර පිල් දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත්ව තම පිළිවෙත් සිහිපත් කර බලා හටගත් සොම්නස් ඇති වූ සේනක තෙරණුවෝ මේ සතර ගාථා වදාළහ.

''ස්වාගතං වත මෙ ආසි ගයායං ගයා එගූයා
යං අද්දසාසිං සම්බුද්ධං දෙසෙනතං ධම්මමුත්තමං

මහපභං ගණාචරියං අගඵපත්තං විනායකං
සදෙවකස්ස ලොකස්ස ජිනං අතුල දස්සනං

මහානාගං මහාවීරං මහාජුතිමනාසවං
සබ්බාසවපරික්ඛීණං සත්ථාරමකුතොභයං

චිරසංකිලිට්ඨං වත මං දිට්ඨිසන්දාන සන්ධිනං
විමොචයී යො භගවා සබ්බගත්තෙහි සෙනකං'' ති.

එහි ''ස්වාගතං වත මෙ ආසි'' ඒකාන්තයෙන්ම මම මනාව පැමිණියෙමි. නැතහොත් මාගේ පැමිණීම ඉතා සුන්දර වූවකි. ''ගයායං'' ගයා නිර්ථය සමීපයට ''ගයාඵගූයා'' ගයාඵල්ගු නම් ලද මැදින් මස උතුරුපල් නැකතෙහි. ''යං'' යනුවෙන් පැමිණීම යහපත්වීමට හේතු වූ කරුණ දක්වයි. එහි ''යං'' යනු යම්හෙයකින් ද, ''අද්දසාසිං'' දුටුවෙමි. ''සම්බුද්ධං'' මනාව සියලු දහම් අවබෝධ කරගත් බැවින් සම්බුද්ධ නම් වේ. ''දෙසෙනතං ධම්මමුත්තමං'' උතුම් වූ අග්‍ර වූ සියල්ලට ශ්‍රේෂ්ඨ වූ ඒකාන්තයෙන් නෛයර්‍යාණික වූ ධර්මය හික්මෙන ජනයාගේ අදහස් අනුව දේශනා කරන ''මහපභං'' මහත් වූ ශරීර ප්‍රභාවෙන් ද ඥාණ ප්‍රභාවෙන් ද යුක්ත වූ.

''ගණාචරියං'' භික්ෂු පිරිස ආදී සිවුපරිසක් පිරිස ම උතුම් දමනයෙන් ආචාර ශික්ෂා ඉගැන්වීමෙන් සමූහයාගේ ආචාරී වූ, ගණාචාර්ය වූ, සදේව ලෝකයාට සීලාදී ගුණයන්ගෙන් අග්‍ර භාවයට පත් වූ ''අගඵප්පත්තං'', ''විනායකං'' දෙව් මිනිසුන් උතුම් වූ හික්මවීමෙන් හික්මවන බැවින් ද තමන් වහන්සේට නායකයකු නැති බැවින් ද විනායක වූ. ''සදෙවකස්ස ලොකස්ස ජිනං'' මුලු ලොවම අභිභවා සිටි බැවින්, පස් මරුන් දිනූ බැවින්, දෙවියන් සහිත ලෝකයාට අසහාය පුද්ගලයා වූ, දෙවියන් සහිත ලොවේ අග්‍ර පුද්ගලයා වූ ''අතුලදසනං'' දෙනිස් මහපරිස් ලකුණින් ද අසූවක් අනු ව්‍යඤ්ජනයන්ගෙන් ද අලංකාර වූ රූපකායක් ඇති බැවින් ද දශබල චතුර් වෛශාරද්‍ය ගුණයන්ගෙන් අලංකෘත ධර්මකායක් ඇති බැවින් ද දෙවියන් සහිත ලෝකයා විසින් අප්‍රමාණ දැකුම් ඇති බැවින් ද අසදෘශ දර්ශන ඇති බැවින් ද අසම වූ දර්ශන ඇති. ''මහානාගං'' ගමන, බල පරාක්‍රමාදී සම්පත්වලින් මහා හස්තිරාජයකු හා සමාන වූ බැවින් ද ක්ෂීණාස්‍රව මහානාගයන් අතර මහානුභාවසම්පත් වූ බැවින් ද මහා නාග වූ ''මහාවීරං'' මහත් වූ වික්‍රමයෙන් මරසෙනඟ පලවා හැරි බැවින් මහාවීර වූ. ''මහාජුතිං'' මහත් ප්‍රතාප ඇති, මහත් තේජස් ඇති. 'මොහුට සතරක් වූ ආශ්‍රවයෝ නැත'' යන අරුතින් අනාශ්‍රව වූ ''අනාසවං''. සියලු වාසනා සහිතව ආශ්‍රව ඉතිරි නොවන සේ ක්ෂය කළ බැවින් ''සබ්බාසවපරික්ඛීණං'' නම් වූ. ඒකාන්තයෙන් ශ්‍රාවක බුදුවරු ද පසේ බුදුවරු ද ක්ෂීණාස්‍රවයෝ මය. නමුත් සර්වඥ බුදුවරුම වාසනා ගුණ සහිත වූ ආශ්‍රම ක්ෂය කරන බව දක්වීමට ''අනාසවං'' යැයි පවසා නැවත ''සබ්බාස වපරික්ඛීණං'' යනුවෙන් සියලුම ආශ්‍රව ක්ෂය කරන ලදුයි කියන ලදී. එනිසා සියලුම ආශ්‍රව වාසනා සහිතව ම මොහු ක්ෂය කළේනුයි ''සබ්බාස වපරික්ඛීණං'' නම් වේ. සුදුසු පරිදි මෙලෝ පරලෝ පරම අර්ථයෙහි පිහිටුවා හික්මවිය හැකි පුද්ගලන්ට අනුශාසනා කරන බැවින් ''සත්‍ථාරං'' ශාස්තෘ වූ. චතුර් වෛශාරද්‍ය ඥානයෙන් විශාරද වූ හෙයින් කිසි නැනකිනුත්, කිසිවකුගෙනුත් බිය නොවන බැවින් ''අකුතෝභයං'' අකුතෝභය වූ. කෙසේවත් බිය නොවන. යන මේ ගුණමහිම සහිත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්නා ලද බැවින් ගයාවට පැමිණි මාගේ ගමන ඒකාන්තයෙන්ම ඉතා යහපත් වූ ගමනකි.

දැන් ඒ ශාස්තෘන් වහන්සේ දැකීමෙන් තමා ලැබූ ගුණමහිම දක්වනු සඳහා මේ සිවුවන ගාථාව වදාරති. එහි අර්ථ මෙසේය. ''කැඳ පිරුණු ලබු ගෙඩියක් මෙන් ද මෝරු පිරුණු කළයක් මෙන් ද වුරුණු තෙල් උරාගත රෙදි කඩමාල්ලක් මෙන් ද කිලිටි සහිත වස්තූන්ගෙන් පිරි ඉමක් කොණක්

නොපෙනෙන සසර බොහෝ කාලයක් කිලිටි වූ මම, ලැබුණු දම්වලින් බදිනා ලද බල්ලකු මෙන් සක්කාය (තම කය සාරවශයෙන් ගැනීම) නම් වැඹෙහි මිසදිටු නම් දම්වැලින්, මිසදිටු බැඳුම්වලින් බදිනා ලද්දෙමි. වෙලනා ලද්දෙමි. ඒ සේනක නම් වූ මා ඒ බැඳීම් වලින් මුදමින් ද අභිඤ්ඤා දී (දැඩි ලෝභය) සියලු ගැටවලින් (සසරට බැඳ තබන කෙලෙස් වලින්) මා ගලවමින් ද ආර්ය මාර්ගය නම් වූ අතින් මා මුදවා ගත් සේක්, ඒ භාග්‍යවතුන් වහන්සේය. ''උන්වහන්සේ මාගේ ශාස්තෘහුය''යි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දැඩි පැහැදීම ප්‍රකාශ කරයි.

සේනක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.7

''යො දන්ධ කාලෙ'' යන ගාථා සතර ආයුෂ්මත් **සම්භූත** තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා අනිව ඒ ඒ භවයේදී පින්දහම් සිදුකරමින් අවුත්, බුදුවරුන්ගෙන් ලෝකය ශූන්‍ය වූ කාලයක චන්‍ද්‍රභාගා නම් නදී තෙර කිඳුරු යෝනියේ ඉපිද, දිනක් එක් පසේ බුදුවරයකු දැක සිත් පහදවාගෙන, උන්වහන්සේට වැඳ ඇදිලි බැඳගෙන කුඹුක් මලින් පූජා කළහ. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී සිටුගෙයක **සම්භූත** නමින් ඉපිද වැඩිවියට පැමිණියේය. අප භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවණින් පසුව ධර්මභාණ්ඩාගාරික මහ තෙරුන්ගේ ධර්ම දේශනාවක් ඇසූ සම්භූත; ඉන් උපන් ශ්‍රද්ධාවෙන් උන්වහන්සේ වෙත පැවිදිව, මහණදම් පුරා විදසුනෙහි සිත පිහිටුවා රහත් විය.

අපදාන පාළියේදී සම්භූත තෙරණුවෝ මෙසේ වදාළහ.

''එකල චන්‍ද්‍රභාගා නදීතෙර කිඳුරෙක්ව උපන් මම කෙලෙස් රජස් විරහිත සියල්ල තමාම දැනගත් පස්මරුන් දිනූ බුදුරදුන් දුටුවෙමි. පහන් සිත් ඇති මම සතුටුව හටගත් ප්‍රීති ඇතිව බැඳැදිලිව කුඹුක් මල් ගෙන බුදුරදුන්ට පිදුවෙමි. මැනවින් කළ ඒ කුසල කර්මයෙන් හා චිත්ත ප්‍රණිධියෙන් මම තව්තිසාවේ උපන්නෙමි. ශක්‍ර දේවේන්ද්‍රව තිස් හයවරක් දෙව් රජය කළෙමි. දස වරක් සක්විති රජව උපන්නෙමි. මා ලැබූ ප්‍රදේශ රාජ සම්පත් ගණන් කළ නොහැක. ස්වයම්භූ වූ ඒ මහා පින්කෙතේ වපුල බීජුවටෙහි ඵල මහත්

අසිරිමත් විය. මාගේ ඒ කුශලය තවමත් විද්‍යමාන වේ. අනගාරී නම් පැවිද්දට පැමිණි මම අද නාකං පුත්‍ර වූ බුදුරදුන්ගේ සසුනෙහි පිදිය යුත්තෙක් වෙමි. දැන් මම සියලු කෙලෙස් දුවූයෙමි. -පෙ- බුදුරදුන්ගේ අනුශාසනාට ඉටු කළෙමි.''

රහත් බවට පත්ව විමුක්ති සුව විඳිමින් විසූ සම්භූත තෙරණුවෝ; සම්බුදු පිරිනිවණින් වසර සියක් ඉක්ම ගිය තැන විශාලාවේ වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස වස්තුව කාකණ්ඩපුත්ත යස මහ රහතන් වහන්සේ සමඟ එක්ව බිඳ දැමූහ. යස තෙරුන්ගේ මූලිකත්වය ලැබූ හත්සියයක් මහ රහතන් වහන්සේලා ඒ මිත්‍යා මත බිඳ දමා සද්ධර්මය බබුළුවමින් ධර්ම විනය සංගායනා කළහ. ඒ වජ්ජිපුත්‍රක භික්ෂූන්ගේ ධර්ම විනයට විරුද්ධ වූ දස වස්තුක ඉගැන්වීම අසා ධර්ම සංවේගයට පත් සම්භූත තෙරණුවෝ මේ ගාථා සතර වදාරමින් තම රහත්භාවය ප්‍රකාශ කළහ.

''යෝ දන්ධ කාලෙ තරති තරණියෙ ච දන්ධයෙ
අයොනි සංවිධානෙන බාලෝ දුක්ඛං නිගච්ඡති

තසසත්‍යා පරිහායනති කාලපක්ඛෙව චන්දිමා
ආයසස්‍යංඤ්ඤව පපෙපාති මිත්තෙහි ච විරුජ්ඣතීති.''

''යෝ දන්ධකාලෙ දන්ධති තරණියෙව තාරයෙ
යොනිසෝ සංවිධානෙන සුඛං පාපෙපාති පණ්ඩිතෝ

තසසත්‍යා පරිපූරෙනති සුක්ඛපක්ඛෙව චන්දිමා
යසොකිතත්තිඤ්ඤව පපෙපාති මිත්තෙහි න විරුජ්ඣති''

එහි ''යෝ දන්ධකාලෙ **තරති**'' කිසිවකුට කළයුතු කටයුත්තක් පිළිබඳව ''මෙය කැපවේද, අකැපවේද?''යි විනය පිළිබඳ කුකුස් උපන් කල්හි එය ව්‍යක්ත විනයධර තෙරනමකගෙන් විමසා කුකුස් අත්නොහැර ගනියි ද ඉක්මන් නොවී, එම කටයුතු පිළිබඳව නොවිමසා, පමාවිය යුතු අවස්ථාවෙහි ඒ ගැන ඇල්ම මැඩ වේගවත්ව කල්යවයි ද ''**තරණියෙ ච දන්ධයෙ**'' ගිහියන්ගේ සරණාගමන සීල සමාදානාදියේ ද පැවිද්දන්ගේ වත්පිලිවෙත් පිරීම්, සමථ විදර්ශනා භාවනාවන්හි හැසිරිය යුතු, පැමිණිය යුතු, අවස්ථාවේ වහා එය නොකර; අනාගත මාසයේ හෝ පක්ෂයේ හෝ කරන්නෙමියි පමාවේද, ඒ වහා කළයුතු කටයුත්ත නොකරමින් කල් යවයිද. ''**අයොනි සංවිධානෙන**'' මෙසේ පමා වී, ඉවසා සිටිය යුතු කටයුත්තෙහි වේගවත්ව

ද වහ වහා කළයුතු කටයුත්තෙහි පමාවෙමින් ද උපාය රහිතව, අයපත් සංවිධානයන්ගෙන් බැහැරව ක්‍රියා කරන ,බාල අව්‍යක්ත මන්ද බුද්ධික පුද්ගලයා සම්පත් විරහිතව, මතු දුකට අනර්ථයට පත් වෙයි. ''**නඤ්ඤථා පරිහායනති**'', මෙබඳු වූ පුද්ගලයාගේ මෙලොව, පරලොව ආදී භේද ඇති අර්ථයෙන් අව පස සඳ මෙන් පිරිහී යති. දිනපතා ඔහුගේ සම්පත් ක්‍ෂය වේ. වැනසීමට යයි. එසේම ''අසුවල් පුද්ගලයා ශ්‍රද්ධාව නැත්තෙකි. ප්‍රසන්න නොවූවෙකි. කුසීතයෙකි. හීන වූ වීර්ය ඇත්තෙකි.'' යනුවෙන් නුවණැත්තන්ගේ අපකීර්තියට, ගැරහුමට ලක්වෙයි. පැමිණෙයි. ''**මිත්තෙනිව විරුජ්ඣති**'', ''මෙසේ ක්‍රියා කරන්න. මෙසේ ක්‍රියා නොකරන්න''යි අවවාද දෙන කළණ මිතුරන් විසින් මා බැහැර කරනු ලබයි. අවවාද නොදෙන කල්හි එය මිතුරන්ගේ විරුද්ධවීමක් ම වේ. මෙසේ දැක්වූ පරිදිම ඉතිරි ගාථා දෙකෙහි අර්ථ ද දත යුතුයි.

ඇතැමෙක් මෙහිදී ''තරති දන්‍ධයෙ'' යන පදයන්ගේ අර්ථයෙන් භාවනා නිමිත්ත ඔසවා තබා ගැනීම හා ඊට නිග්‍රහ කිරීම යන අර්ථ ගෙනහැර දක්වති. එය අවසන් ගාථා දෙකට ගැලපේ. මුල් ගාථා දෙකින්- ''පැවිදි දින පටන් සපුරාගත යුතු මහණකම් නොසපුරා, කුකුස් කරමින් දස වස්තුවක් දක්වා සංසයාගෙන් බැහැර වූ, නෙරපා දමුණු වජ්ජිපුත්තක භික්ෂූන්ට ''චෝදනා කරයි. ඒ සඳහා මුල් ගාථා දෙක වදාළහ. අවසන් ගාථා දෙකින් තමන් වහන්සේ වැනි වූ යහපත් පිළිවෙත් සපුරා ස්වාර්ථ සාධනය සිදුකරගත් ආර්යයන් පිළිබඳව කියැවේ.

සම්භූත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.8

''**උභයෙන**'' යනු ආයුෂ්මත් **රාහුල** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස් කරමින් අවුත් **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත් වූහ. දිනක් ධර්ම ශ්‍රවණය කරමින් සිටී ඔහු ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක් ශික්ෂාකාමීන් අතර අග තනතුරෙහි තබනු දැක තමාද එම තනතුර ප්‍රාර්ථනා කරමින් සෙනසුන් පිරිසිදු කිරීම්, බැබලවීම් ආදියෙන් මහත් වූ පින්කම්

කළේය. ඉන් චුතව දෙව් මිනිස් දෙගතියේ සැරිසරමින් අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී අපගේ බෝසතුන් නිසා යසෝදරා දේවියගේ කුස පිළිසිඳ ගෙන, ''රාහුල'' යන නම් ලැබ මහත් ඍද්ධිය ආරක්ෂා විධිවිධාන යටතේ වැඩුනේය. රාහුල කුමරුගේ පැවිදිවීම් මහා බන්ධකයේ පැමිණි ලෙසම දත යුතුයි. පැවිදි වූ රාහුල තෙරණුවෝ, අප ශාස්තෘන් වහන්සේගේ සමීපයේදී නොයෙක් සූත්‍ර දේශනා මගින් ලැබූ අවවාද ඇතිව නුවණ මුහුකුරා ගොස්, විදසුනෙහි සිත පිහිටුවීමෙන් රහත් බවට පත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ පැවසූහ.

''ලෝක ජ්‍යෙෂ්ඨ වූ තාදී ගුණ ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට සත්මහල් ප්‍රාසාදයක කැඩපතක් මෙන් ශෝභාමත් ඇතිරියක් අතුරා පූජා කළෙමි. දෙපා ඇත්තවුන්ට අග්‍ර වූ මහාමුනි වූ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ රහතුන් දහසක් පිරිවරා ගෙන ගඳ කිළියට පිවිසි සේක. දෙවියන්ට දෙවි වූ නරශ්‍රේෂ්ඨ වූ ශාස්තෘන් වහන්සේ ගඳකිළිය බබුළුවමින් බික් සඟන මැද වැඩ හිඳ මෙසේ වදාළහ. ''යමෙකු විසින් මේ සෙනසුන බබුළුවන ලද ද කැඩපතක් මෙන් ප්‍රභාමත් ඇතිරිල්ලක් මනාව මෙහි අතුරන ලද්දේද මම ඔහුගේ අනාගතය පවසමි. ඒ මාගේ වදන් සාවධානව අසවු. මොහුට සිත සතුටු කරන රන්, රිදී, වෙරළුමිණිවලින් කළ කැඩපත් පහළ වේ. ශක්‍ර දේවේන්ද්‍ර සැට සතර වරක් දෙවිරජය කරන මෙතෙම දහස් වරක් සක්විති රාජ්‍යය කරන්නේය. මෙයින් විසි එක්වන කල්පයේදී සිවුමහා දිවයින හා සිවුමහා සාගරය සහිත පෘථිවියම පාලනය කරන, සතුරු රජුන් ජයගන්නා වූ විමල නම් සක්විති රජව උපදින්නේය. ඔහුගේ ගඩොලින් කළ නගරය රේණුවති නම්. එය දිගින් යොදුන් තුන්සියකි. හතරස් හැඩයෙන් යුක්තය. උතුම් වූ කුළු ගෙවලින් යුත් සත් රුවනින් අලංකාර කරන ලද විශ්ව කර්මයා විසින් මැවූ සුදර්ශන නම් ප්‍රාසාදයක් මොහුට පහළ වේ. නිති විද්‍යාධරයන් ගැයෙසී එය දශවිධ ශබ්දයන්ගෙන් ගැයෙසී ගත් දෙවියන්ගේ සුදර්ශන නගරය මෙන් ශෝභාමත්ය. එම ප්‍රසාදයේ ශෝභාව හිරු උදාවන කල්හි විහිදේ. එය නිරතුරුව හාත්පස අටයොදුන් තැන බබළන්නේය. මීට කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ ගෞතම නම් ශාස්තෘහු ලොව පහළ වෙති. කුසල බල මහිම ඇති මෙතෙම තුසී පුරයෙන් නික්ම, උන්වහන්සේගේ ඖරස පුත්‍රව උපදින්නේය. ඔහු ඉදින් ගිහි ගේ වෙසේ නම් සක්විති රජ වන්නේය. තාදී ගුණ සහිතයෝ ගිහිගෙයි ඇලීමට යාම සිදු නොවන දෙයකි. සුශික්ෂිත වූ මෙතෙම ගිහිගෙන් නික්ම පැවිදි වන්නේය. ඔහු රාහුල නමින් රහත් වන්නේය.'' ඒ විවරණය එසේම සිදු විය. රාහුල තිමියෝ මෙසේ වදාළහ.

''මහාමුනි වූ ගෞතම බුදුරජාණන් වහන්ස! කිරලා බිජුවට රකින්නාක් මෙන් ද සෙමෙර මුවා වලිගය රකින්නාක් මෙන් ද ශීලයෙන් යුක්ත වූ මම මනාව එය ආරක්ෂා කළෙමි. මම ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය දැන සසුනෙහි ඇලුනෙමි සියලු ආශ්‍රව ප්‍රහාණය කොට, අනාශ්‍රවව වෙසෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ රාහුල තෙරණුවෝ තම පිළිවෙත් මඟ සිහිපත් කරමින්, සිය රහත් බව ප්‍රකාශ කරන සේක් මේ ගාථා සතර වදාළහ.

''උභයෙනෙව සම්පන්නා රාහුලභද්දෝති මං විදූ
යඤ්චමහි පුත්තෝ බුද්ධස්ස යඤ්චව ධම්මෙසු චක්ඛුමා

යඤ්චව මෙ ආසවා ඛීණා යං ච නත්ථි පුනබ්භවෝ
අරහා දක්ඛිණෙය්‍යොමහි තෙවිජ්ජෝ අමතද්දසෝ

කාමච්ඡා ජාල පළිච්ඡන්නා තණ්හාඡදන ඡාදිතා
පමත්ත බන්ධුනා බද්ධා මච්ඡාව කුම්නාමුඛෙ

තං කාමං අහමුජ්ඣිත්වා ඡෙත්වා මාරස්ස බන්ධනං
සමූලං තණ්හං අබ්බුය්හ සීතිභූතොස්මි නිබ්බුතෝ''

එහි ''උභයෙනෙව සම්පන්නෝ'' ජාති (උසස් කුලයක ඉපදීමෙන්) සම්පත්තියෙන් ද ප්‍රතිපත්ති සම්පත්තියෙන් ද යන උභය සම්පත්තීන්ගෙන් යුක්ත වූයෙමි. ''**රාහුලභද්දෝති මං විදූ**'' සබ්‍රහ්මචාරී තෙරවරු ''රාහුල භද්‍ර'' යැයි මා අමතති. ඒ කුමරුගේ උපත ඇසූ සිදුහත් බෝසත්හු ''රාහුලයෙක් උපන්නා, බන්ධනයක් ඇතිවුණා''යි කියූ වදන් ගෙන සුදොවුන් මහරජතුමා ''රාහුල'' යන නාමය සිය මුණුබුරාට තැබීය. එසේ උපතේ සිටම පිය ආදීන් විසින් තමා ඇමතූ නමම ගෙන - ''නුවණැත්තෝ ''රාහුල භද්‍ර'' යැයි මා අමතති''යි පැවසූහ. එහි ''භද්‍රෝ'' යනු ප්‍රශංසාත්මක වදනකි. යහපත් වූ. භද්‍ර වූ. දැන් තමා ලැබූ උභය සම්පත් දැක්වීමට ''**යඤ්චමහි**'' යනාදී පදය පැවසූහ. එහි ''**යං**'' යනු යම් හෙයකින්. ''ච'' ශබ්දය සමුච්චයාර්ථයේ නිපාතයකි. ''**අමහි පුත්තෝ බුද්ධස්ස**'' මම සම්මා සම්බුදුරදුන්ගේ ඔරස පුත්‍රයා වෙමි. සිදුහත් කුමරුට දාව උපන්නෙමි. ''**ධම්මෙසු**'' ලෞකික-ලෝකෝත්තර ධර්මයන්හි. චතුරාර්ය සත්‍ය ධර්මයන්හි. ''**චක්ඛුමා**'' මාර්ග ප්‍රඥා ඇස ඇති, සිවුසස් දහම්හි මහ නුවණැති. යැයි යෙදිය යුතුයි.

නැවතත් වෙනසත් කුමයකින් තමාගේ උභය සම්පත් දක්වීමට "**සං ච මේ ආසවා ඛීණා**" යනාදි දෙවන ගාථාව වදාළහ.

එහි "**දක්ඛිණෙය්‍යා**" යනු දක්ෂිණාවට සුදුසුය. "**අමතඥ්ඤෝ**" නිවණ නම් වූ අමෘතය දනුවෙමි. ඉතිරි පදයන්ගේ අර්ථ ගැනීම ඉතා පහසුය. දැන් යම් විද්‍යා සම්පත්තියකින් හා විමුක්තියකින් යුතුව. කෙමණෙහි බැඳි මසුන් මෙන් සසර බැඳි පවතින සත්ව කායක් නොමැතිව, ඒ සම්පත් දෙකම තමා කෙරෙහි ඇති බව දැක්වීමට "**කාමන්ධා**" යන ගාථා දෙක වදාළහ. එහි "**කාමන්ධ**" යනු කාමයෙහි අන්ධවූවෝ කාමන්ධයෝය. ඡන්‍දය රාගය, ආදී විභාග ඇති කෙලෙස් කාමයන්හිද රූපාදි වස්තු කාමයන්හිද ආදීනව නොදැකීම් නම් වූ අන්ධභාවයෙන් යුක්ත වූ. "**ජාලපඤ්ඤතා**" සියලු භවතුයෙහි පැතිරී සිටි තණ්හා නමැති දැලින් සම්පූර්ණයෙන්ම වැසුණු, හාත්පසින් වැසූ "**තණ්හා ජඳනඡාදිතා**" එසේම තණ්හාව නම් වහලයෙන් වැසූ, සෙවිලි වූ, සර්වප්‍රකාරයෙන්ම යටි අතට හරවා වැසූ. "**පමත්ත බන්ධුනා බද්ධා මච්ඡාව කුම්නා මුඛේ**" කෙමණෙහි මුවේ බැඳුණු මාළුවෝ මෙන්, මාළු අල්ලන පසුම්බියෙහි මුවේ බැඳුණු මාළුවෝ මෙන් ප්‍රමාදයේ ඇති වූ මාරයා විසින් යම් කාමබන්ධනයකින් බැඳුණාහු ද, මේ සත්ත්වයෝ ඉන් නොමිදෙති. බන්ධනයට ඇතුලත්ව සිටිති. "මෙබඳු වූ ඒකාන්තයෙන් මාරයාගේ බණ්ධනයක් වූ කාමයෝ ඉවත ලා පූර්වභාග ප්‍රතිපත්තියෙන් අත්හැර, නසා නැවත ආර්ය මාර්ගය නම් සැනින් ඉතිරි නොවන සේ නසා, එම අවිද්‍යාව නම් මුල් සහිත කාමය, තණ්හාව උදුරා දමා, ගලවා දමා, සියලු කෙලෙස් නැමති දැවිල්ලෙන්, දාහයෙන් මිදුණු හෙයින් සිසිල් වූයෙමි. සෝපාදිසේස නිර්වාණ ධාතුවෙන් මම නිවුණෙමි ඒ මම උතුම් වූ නිවණින් සැනසුනෙමි" යන අර්ථයයි.

රාහුල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.9

"**ජාතරූපෙන**" යනු ආයුෂ්මත් චන්දන තෙරුන්ගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස්කරමින් අවුත්, මීට කල්ප තිස් එකකට පෙර දී බුද්ධ ශූන්‍ය වූ ලෝකයෙහි රුක් දෙවියෙක්ව උපන්හ.

සුදස්සන නම් පසේ බුදු රජාණන් වහන්සේ එක් පර්වත පාදයක වෙසෙනු දැක. පහන් සින් ඇතිවූ ඒ දෙවියා උන්වහන්සේට කෙළින්ද මලින් පූජා කළේය. ඒ පින්කමේ බලයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර මහ සම්පත් ඇති පවුලක ඉපිද චන්දන නාමයෙන් ප්‍රකට විය. වැඩිවියට පත් චන්දන කුමරු ගිහිගේ වසමින්ම ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කොට සෝවාන් ඵලයෙහි පිහිටියේය. එක් පුතෙකු ලැබුණු පසු ගිහිගෙයින් නික්ම පැවිදි වූ ඔහු විදසුන් කමටහනෙහි සිත පිහිටුවා අරණ්‍යයෙහි විසීය. දිනක් ශාස්තෘන් වහන්සේ වැඳ පුදා ගැනීමට සැවැත් නුවරට පැමිණි චන්දන තෙරණුවෝ සුසාන භූමියේ විසූහ. උන්වහන්සේ එහි වෙසෙන බව දැනගත් පැරණි (ගිහි කල) භාර්යාව තම එකම පුතු ද රැගෙන ඉතා අලංකාරව සැරසී මහත් පිරිවරින්, "මොහු ස්ත්‍රී මායම්වලින් රවටාගෙන සිවුරු හරවා ගන්නෙමි"යි තෙරුන් සමීපයට පැමිණියාය. තෙරණුවෝ ඇයගේ පැමිණීම දුරදීම දැක "දැන් මැයට වසඟ නොවන්නෙක් වන්නෙමි"යි උත්සාහවත්ව විදසුනෙහි සිත පිහිට වූ සේක් රහත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

"හිමවතට නුදුරෙහි වසල නම් පර්වතයක් ඇත. සුදස්සන නම් පසේ බුදුරජාණන් වහන්සේ එහි පර්වත අතුරෙහි විසීය. හිමවතේ හටගත් මල් ගෙන අහසින් යන මම කෙලෙස් දූවිලි නැති ඕසයන් තරණය කළ ආශ්‍රව විරහිත බුදුරදුන් දුටුවෙමි. එකල මම කෙළින්ද මල් හිසෙහි තබාගෙන මම ම සියල්ල බුදුරදුන්ට පිදුවෙමි. මීට කල්ප තිස් එකකට පෙර සියල්ල නමාම අවබෝධ කළ, මහර්ෂී වූ බුදුරජාණන් වහන්සේට යම් මල් පූජාවක් කළෙම්ද ඒ බුදුපුදෙහි විපාක ලෙස මම දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි."

ෂඩ් අභිඥා ලාභී වූ උන්වහන්සේ අහසේ සිට ඇයට දහම් දෙසා සරණ සිල්හි පිහිටුවා, තමන් වහන්සේ පෙර විසූ තැනටම ගියහ. එහි විසූ සහායක භික්ෂූහු "ඇවැත්නි! නුඹගේ ඉඳුරියයෝ ප්‍රසන්නයහ. කිම නුඹ විසින් චතුරාර්ය සත්‍ය අවබෝධ කළ සේක් ද?"යි විචාළහ. එවිට චන්දන තෙරණුවෝ

ජාතරූපෙන පජ්ජනා දාසී ගණ පුරක්ඛතා
අංකෙන පුත්තං ආදාය භරියා මං උපාගමී

නංව දිස්වාන ආයතිං සකපුත්තසස මාතරං
අලංකතං සුවසනං මවවපාසංව ඔඩ්ඩිතං

තතො මෙ මනසීකාරො යොනිසො උදපජ්ජථ
ආදීනවො පාතුරහු, නිබ්බිදා සමතිථයථ

තතො චිත්තං විමුචචි මෙ, පසස ධම්ම සුධම්මතං
තිසෙසා විජ්ජා අනුපපත්තා, කතං බුද්ධසස සාසනං

යන ගාථා සතරින් තම පිළිවෙත් මඟ පහදමින් සිය රහත්භාවය ප්‍රකාශ කළ සේක.

එහි ''ජාතරූපෙන පඣනතා'' රන්රිදී වලින් කළ හිස, ගෙල ආදියේ පළඳින අලංකාර වූ ආභරණයනගෙන් වැසුණු ශරීර ඇති, සර්වාභරණවලින් සැරසුණු. ''**දාසී ගණපූරකඛතා**'' ඉතා සුදුසු සේ අලංකාරව සැරසුණු සිය දාසී සමූහයා විසින් පෙරටු කරගත්, දාසී සමූහයා පිරිවරාගත්, ''**අංකෙන පුත්තං ආදාය**'' මොහු පුතු දැකවත් ගිහිගේ වාසයට නැවත එනු ඇත'' යන හැඟීමෙන් පුතු තම ඇකයේ රැවාගෙන, ''**ආයන්තිං**'' එන්නාවූ. ''**සකපුත්තසස මාතරං**'' මගේ එකම ඖරස පුත්‍රයාගේ මව වූ, මගේ ගිහිකල භාර්යාව යන අර්ථයයි. මෙම ගාථා දෙකින්ම තෙරුන් වහන්සේ සිය කාමරාගය මුලිනුපුටා දැමූ බව කියැවේ. ''**යොනිසො උදපජ්ජථ**'' ඒ ස්ත්‍රියගේ ස්වරූපය දුටු මට නුවණැස පහළ විය. මෙබඳු සම්පත්තියෙන් අනූන මේ ස්ත්‍රීහුද ජරාවට, ව්‍යාධියට, මරණයට පත්වෙති. අහෝ! ඒකාන්තයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. එහි ආශ්වාදයක් සැනසීමක් නොමැත. මෙසේ නුවණින් විමසා බැලීමෙන් යථාර්ථය අවබෝධ විය. ඉතිරි පදයන්ගේ අර්ථ ඉහතින් පැවසූ ලෙසම දත යුතුයි.

චන්දන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.10

''ධමෙමා හවෙ'' යනු ආයුෂ්මත් **ධම්මික** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් කෙරෙහි

නැබූ ප්‍රාර්ථනා මහිම ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත් ''සිබි'' නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ මුව දැද්දෙක්ව උපන්හ. දිනක් ශාස්තෘන් වහන්සේ ආරණ්‍යයේ වෙසෙමින් දෙව්පිරිසකට දහම් දෙසනු දුටු මේ වැදි පුරුෂයා ''මෙතෙම ධර්ම දේශනා කරන්නේය' යනුවෙන් දහම් දෙසුම පිළිබඳව සිත පහදවා ගත්තේය. ඒ පින්කමේ විපාක විඳිමින් දෙව්-මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී කොසොල් රට බමුණු පවුලක ඉපිද ධම්මික නමින් ප්‍රකටව වැඩිවියට පත්විය. අප තථාගතයන් වහන්සේ ජේතවනාරාමය පිළිගත් උන්සවශ්‍රීය දැකීමෙන් පහන් සිත් ඇතිව ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වූ ඔහු එක්තරා ග්‍රාමවාසියෙකුව ගමක වූ ආවාසයක විසීය. ධම්මික හිමියන් ආගන්තුක භික්ෂූන්ගේ වතාවත් කිරීමෙහි දොස් පටසමින් උන්වහන්සේලාට බණිමින් කල් යැවූ නිසා ඒ භික්ෂූහු විහාරය හැර දමා ගියහ. උන්වහන්සේ තනිවම එහි විසූහ. විහාරය කරවා දුන් උපාසකයා එකරුණ අසා භාග්‍යවතුන් වහන්සේට එපුවත දන්වීය. ශාස්තෘන් වහන්සේ ධම්මික හිමියන් කැඳවා, මෙය සත්‍යද?යි විමසූහ. ''එසේය ස්වාමීනි!''යි වරද පිළිගත් කල්හි තථාගතයෝ, ''මොහු අනුන්ට දොස් කියන්නෙකු වූයේ දැන් පමණක් නොව පෙරත් එසේම වීය''යි වදාරා භික්ෂූන්ගේ ඇරයුම අනුව රුක්ඛධම්ම ජාතකය දේශනා කළ සේක්. ධම්මික හිමියන්ට අවවාද කරමින් මේ සතර ගාථා වදාළහ.

ධම්මෝ හවෙ රක්ඛති ධම්මචාරී ධම්මෝ සුචිණ්ණෝ සුඛමාවහාති
එසානිසංසෝ ධම්මෙ සුචිණ්ණෝ, න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී

නහි ධම්මෝ අධම්මෝච උභෝ සම විපාකිනෝ
අධම්මෝ නිරයං නෙති, ධම්මෝ පාපෙති සුගතිං

තස්මාහි ධම්මෙසු කරෙය්‍ය ඡන්දං
ඉති මොදමානෝ සුගතෙන තාදිනා
ධම්මෙයිනා සුගතවරස්ස සාවකා
නියන්ති ධීරා සරණ වරග්ග ගාමිනෝ

විපෙච්ඨිතෝ ගණ්ඩමූලෝ
තණ්හාජාලෝසමූහතෝ
සෝ බ්‍රහ්මසංසාරෝ න වත්‍ථි කිඤ්චනං
වන්තෝ යථා දෝසිනා පුණ්ණමාසියා'' ති.

එහි ''ධම්මෝ'' යනු ලෞකික - ලෝකෝත්තර සුචරිත ධර්මයයි. ''රක්ඛති'' අපායේ අපාය දුකින් ද සසරින් මිදීම වූ නිවණින් සංසාර දුකින් ද ආරක්ෂාව ලබාදෙයි. ''ධම්මචාරී'' ධර්මය අනුව හැසිරෙන, පිළිපදින පුද්ගලයා ධර්මයෙන් ආරක්ෂා වේ. ''**සුච්ණෙණා**'' මනාව රැස්කළ, කර්මඵල අදහාගෙන මනාව සකසා සිතෙහි රැස්කළ. ''**සුඛං**'' ලෞකික - ලෝකෝත්තර සුවය. එහි ලෞකික සැපය නම් ඔබ් කාමාවචර (සදෙව්) ලෝකයන්හි විඳින සුවයයි. ස්වකීය සුවය දිවියධම්මිකව (මෙලොවම) හෝ ලැබේ. වෙනත් ක්‍රමයකින් එළැවයි. උපදියි. අනාගතයන්ට සසරින් මිදීම නම් නිවණෙහි පිහිටා සිත් පරපුරින් අවබෝධ කර ගැනීමෙන් සැප ගෙන දෙයි. උපනිශ්‍රය සම්පත් නැත්තන්ට ලෞකික සැප ලැබේ. උපනිශ්‍රය සම්පත් ඇත්තන් නිවන් සැප (ලෝකෝත්තර) ලැබේ. ''**එසානිසංසෝ ධම්මෙ සුච්ණෙණ න දුගතිං ගච්ඡති ධම්මචාරී**'' ධර්මයේ හැසිරෙන පුද්ගලයා, ධර්මය මනාව රැස් කරන ලද්දේ, ඒ හේතුවෙන් දුගතියට නොයන්නේය. ''මෙය ධර්මය ඇසීමේ ආනිසංසය'' යන අර්ථයයි. ධර්මයේ හැසිරීමෙන් දුගතියටම යන්නේය. අධර්මයෙන් පුද්ගලයා දුගතියට පමුණුවයි. එනිසා ධර්මයේ හා අධර්මයේ අමිශ්‍ර වූ, වෙන් වෙන් වූ විපාක ඇති බව දැක්වීමට ''**නහි ධම්මෝ**'' යන දෙවන ගාථාව වදාළහ.

එහි ''අධම්මෝ'' ධර්මයට විරුද්ධ වූ දුශ්චරිතය. ''**සම්විපාකිනෝ**'' සමාන වූ විපාක, සම ප්‍රතිඵල. ''**තඤ්ඤා**'' යම් හෙයකින් ධර්ම අධර්මයන්ගේ මෙසේ කියන ලද ආකාරයෙන් එකිනෙකට වෙනස් විපාක ඇත්තේ ද. එහෙයින්. ''ඡන්දං'' කරනු කැමැත්ත. ආශාව. ''**ඉති මොදමානෝ සුගතෙන** නාදිනා'', මෙසේ කියන ලද ආකාරයෙන් අවවාද දීමෙන් මනාවූ ගමන් ඇති, මනාව නිවණට පිළිපන්නා වූ සුගතයන් වහන්සේ නිසා සිතට මනාප වූ අරමුණු පිළිබඳ කෙලෙස් දුරු කිරීමට පැමිණි, තාදි ගුණමහිම හේතුවෙන් සතුටුවෙමින්, සතුටට-ප්‍රීතියට පත්ව, ධර්මයෙහි ආශා කරන්නේය'' යන අර්ථයයි. මෙපමණකින් සසර පැවැත්ම දක්වා දුන් නිවණ- සසරින් මිදීම දක්වමින ''**ධම්මෙ යීනා**'' යන දෙපදය දැක්වූහ.

එහි අර්ථ- ''යම් හෙයකින් උතුම් වූ මනා වූ ගමන් ඇති හෙයින් සුගත නම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ, උන්වහන්සේ දෙසූ දහමෙහි පිහිටා අතිශයින්ම අග්‍ර වූ සරණයෙහි පිහිටියා හුදු එම සරණයෑමෙන් ද එම සරණාගමන නම් වූ ධර්මයෙහි පිහිටි බැවින් ද සියළුම සංසාර දුක්ඛයෙන් ඔවුහු මිදෙත් ද එහෙයින් ධර්මයෙහි ඇලීම - ආශාව කරන්නේය'' මෙසේ ශාස්තෘන් වහන්සේ තුන් ගාථාවකින් ධම්මික තෙරුන්ට දහම් දෙසූ කල්හි; ඒ දේශනාවේ උපකාරයෙන් හුන් තැනම හිඳ විඳසුන් වැඩූ උන්වහන්සේ රහත් වූහ.

අපදාන පාළියේදී ධම්මික තෙරණුවෝ මෙසේ වදාළහ.

''මම පෙර ජනයාගේ නොර වූ මහා වනයේ වෙසෙන මුව වැද්දෙක් වීමි. එහි දී දිවා සමූහයා විසින් පිරිවරන ලදුව චතුරාර්ය සත්‍ය ධර්ම දේශනා පවත්වන, නිර්ණ පෙන්වාදෙන්නා වූ කෙලෙස් රජස් දුරලූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. සිබි නම් වූ ලෝක බන්ධු වූ බුදුරජාණන් වහන්සේගේ මිහිරි කටහඬ ඇසුවෙමි. බ්‍රහ්ම ස්වරය ඇති උන්වහන්සේගේ ශබ්දයෙහි සිත පහදවා ගත් මම, ඉතා දුෂ්කර වූ සසර තරණය කළෙමි. මීට කල්ප නිස් එකකට පෙර දී යම් ධර්ම සංඥාවක් ලැබුවෙමි ද එදා සිට ම මම දුගතියක නූපන්නෙමි. ධර්ම ඝෝෂා හඬ ඇසීමෙහි විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

එසේ රහත් ඵලයෙහි පිහිටි ධම්මික රහතන් වහන්සේ, තමා ලැබූ විශේෂාධිගමය ශාස්තෘන් වහන්සේට දන්වා සිටිමින් මේ අවසන් වූ සතරවන ගාථාවෙන් සිය රහත්භාවය ප්‍රකාශ කළ සේක.

එහි ''**විපාටිතො**'' විනාශ කොට, ආර්ය මාර්ග ඤාණයෙන් දුරුකළ, ''**ගණ්ඩමූලො**'', ''මහණෙනි, ඉන් අවිද්‍යාව වහනටය වේ නුයි. ''ගණ්ඩ'' නම් වේ යන බුද්ධ වචනයට අනුව ''ගණ්ඩ'' යනු පංචස්කන්ධයට තවත් සමාන වචනයකි. මෙසේ ශාස්තෘන් වහන්සේ වදාළ දුකට හුලක් බඳු වූ, කෙලෙස් නම් අශුචි වගුරුවන, ඉපදීම-දිරා යෑම හා (භංග) වැනසීම නම් වූ ඉදිමුණු, පැසුණු, බිඳෙනසුළු බැවින් ''ගණ්ඩ'' නම් වූ උපාදානස්කන්ධ පහට මුල හේතුව. ''**තණ්හාජාලො සමූහතො**'' තණ්හාව නම් දැල ආර්ය මාර්ගයෙන් මුලිනුපුටා දැමූ ''**සො ඛීණසංසාරො න චත්ථි කිඤ්චනං**'' ඒ මම මෙසේ ප්‍රහීණ කළ තණ්හාව ඇති බැවින්, ක්ෂය කළ - ගෙවා දැමූ සසර ඇත්තෙමි. ක්ෂය කළ භව මුල් ඇති බැවින්, රාගාදී කිසිදු ක්ලේශයක් මා හට නැත. මා තුල නූපදී. ''**වන්තො යථා දොසිනා පුණ්ණමාසියා**'' යම් සේ සඳ මීදුම්-වළාකුළු ආදී දෝෂ රහිතව බබළන්නේ ද එසේම මම ද නැති කළ තණ්හාව ඇතිව, ආශාවන්ගෙන් දුරුව පුන්පෝදා පිරුණු සඳ මෙන් අරහත් ඵල අවබෝධයෙන් දුරුකළ රාගාදී කෙලෙස් ඇති බැවින් ද දහම් කොටස් වලින් පරිපූර්ණ වූ බැවින් ද පිරිපුන්ව බබලමි.

ධම්මික ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.11

''යදා බලාකා'' යනු ආයුෂ්මත් **සප්පක** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයන්හිදී පින් දහම් රැස්කරමින් අවුත් මීට කල්ප තිස් එකකට පෙර දී මහානුභාව සම්පන්න නාගරාජයකුව උපන්හ. සම්භවක නම් පසේ බුදුරජාණන් වහන්සේ එළිමහනේ සමවත් සුවයෙන් සිටිනු දැක, උන්වහන්සේගේ හිස මත මහත් වූ පියුමක් දරමින් බුද්ධ පූජාවක් සිදු කළ ඒ නා රජු එම පින්කමේ බලයෙන් දෙව් මිනිස් යන කාම සුගතීන්හිම ඉපිද සැප විඳ්දේය. මේ අපගේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර බමුණු පවුලක සප්පක නමින් ඉපිද නුවණැති බවට පත් හෙතෙම, අප භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසා ලැබූ ශ්‍රද්ධා ඇතිව සසුනේ පැවිදි විය. සප්පක තෙරණුවෝ කමටහන් රැගෙන අජකරණී නම් නදී තෙර වූ ලෙන් විහාරයේ වෙසෙමින් විදසුන් වඩා නොබෝ දිනකින්ම උතුම් රහත් ඵලයෙහි පිහිටියහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''හිමවතට නුදුරෙහි රෝමස නම් පර්වතයක් ඇත. එකල එහි සම්භව නම් පසේ බුදුරජාණන් වහන්සේ එළිමහනෙහි වැඩ සිටි සේක. භවනයෙන් නික්ම පැමිණි මම උන්වහන්සේට පියුමක් දැරීමි. එක දිනක් එය දරූ මම නැවත භවනයට ගියෙමි. මීට කල්ප තිස් එකකට පෙර යම් බුද්ධ පූජාවක් කළෙමි ද එහි විපාක වශයෙන් දුගතියකට නොගියෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් සප්පක තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ වැඳ පුදා ගැනීමට සැවැත් නුවරට පැමිණියහ. ඥාතීන්ගේ පුද සත්කාර සම්මාන විඳිමින් එහි දින කිහිපයක් විසූ උන්වහන්සේ දහම් දෙසා ඥාති සමූහයා සරණ සිල්හි පිහිටුවා, පෙර විසූ තැනට ම යනු කැමැති වූහ. ඒ ඥාතීහු ''ස්වාමීනි! මෙහිම වසනු මැනවි. අපි සත්කාර කරන්නෙමු''යි ආරාධනා කළහ. යායුතු බවම හඟවමින් සප්පක තෙරණුවෝ තමා පෙර විසූ ස්ථානය ද විවේක සුවය ද වර්ණනා කරමින් සිය ඥාතීන්ට මේ ගාථා සතර දෙසූහ.

''යදා බලාකා සුවිපණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස හයෙන තජ්ජිතා
පලෙහති ආලයමාලයෙසිනී
තදා නදි අජකරණී රමෙති මං

යදා බලාකා සුවිසුද්ධපණ්ඩරා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පරියෙසති ලෙනමලෙන දූසිනි
තදා නදී අජකරණී රමෙති මං

කන්නු නත්ථ න රමෙනති ජම්බුයෝ උභතෝ තහිං
සොහෙනති ආපගා කූලං මම ලෙනස්ස පච්ඡතෝ

නාම තම දූසංඝසුපහීණා හෙකා මඤ්ඤති පනාදයනති
නාජ්ජ ගිරිනදිහි විප්පවාසසමයෝ ඛෙමා අජකරණී සිවා සුරම්මා''

එහි ''යදා'' යනු යම් කලෙක ''බලාකා'' කෙකනියෝ, ''සුවිපණ්ඩරච්ඡදා'' ඉතා පිරිසිදු සුදුපාට පියාපත් ඇති, ''**කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා**'' ජල සමූහයක් දරන බැවින් කළු පාට වූ අඳුන් ගිරි සමූහයක් වත් වැහිවලාවන්ගේ මේඝ ගර්ජනාවෙන්, දැන් වැසි වසීය යන බියෙන්, තැති ගත්, ''**පලෙහිති**'' මෙතෙක් ආහාර ගනිමින් සිටි ගොඳුරු බිම් හැර දමා යති. ''ආලයං'' වාසස්ථානයන්ට, තමාගේ කැඳලිවලට, සිය වාසස්ථානයේ හිදිති. එහි විසීම කැමති වේ යන අර්ථයයි. ''තදා නදී **අජකරණීමෙති** මං'' ඒ වැසි කාලයේ අජකරණී නම් ලද නදිය නව දිය පිරී, උතුරා යමින්, ඉවුරු තෙමා දමමින් මා සතුටු කරයි. මගේ සිත පිනවයි. විශේෂයෙන් සෘතු සම්පත්තිය පැවසීමෙන් සප්පක තෙරුන්ගේ විවේකයේ කැමති බව ප්‍රකාශ වේ. ''**සුවිසුද්ධපණ්ඩරා**'' ඉතා පිරිසිදු සුදුපාට, පඬුවන් වෙනත් පාටක් හා මිශ්‍ර නොවූ සියළුම ශරීරය සුදුපාට වූ. ''**පරියෙසති**'' සොයයි. ''**ලෙනං**'' විසීමට තැන් ''**අලෙනදූසිනි**'' වාසයට සුදුසු තැනක් නොදක්නී, පෙර නිතරම වසන තැනක් නොමැති හෙයින් සැඟවෙන තැනක් නොදක්නී. දැන් වැසි කාලයේ මේඝ ගර්ජනාවෙන් භූපන් ගැබ් ඇති බැවින් ''**පරියෙසති ලෙනං**'' සැඟවෙන තැන් සොයයි. නිතරම වෙසෙන තැන කැදැල්ලක් සාදයි යන අරුතයි. ''**කන්නු නත්ථ**-පෙ- **පච්ඡතෝ**'' මා වෙසෙන මහ ලෙන පිටිපස, පසුපස ජලය පිරි, අජකරණී නදියෙන් දෙඉවුරම ඉතා විසිතුරුව දියෙන් පුරවා ශෝභමාන කරන කල්හි, නිතර ඵලබරින් නැමුණු අතුපතරින් සිසිල් වූ සෙවණින් යුතු ජම්බු ගස් සමූහය, ඒ ප්‍රදේශයෙහි කවරෙක්ගේ සිත නොපිනවන්නේද? ''සියල්ලන්ගේ සිත් පිනවන්නේමය'' යන අරුතයි. ''**තාමනමදසංඝසුපහීණා**'' අමතං යනු බෙහෙත්ය. ඖෂධය. බෙහෙත් වලින් මඩිනු ලබනුයේ ''අමතමද'' නම් වේ. එනම් සර්පයෝය. ඔවුන්ගේ සමූහය, ''අමතමද සංඝ'' නම් වේ. ඒ සර්ප

සමූහයාගෙන් මනාව දුරු වූ ඉවත් වූ ''සුපජාගිණා'' නම් වේ. සර්ප සමූහයාගෙන් දුරු වූ පෙදෙසේ ඒ මැඩියෝ - හෙම්බෝ නැදෑනි. මිහිරි නාද පතුරුවති. ඒ ස්ථානය මිහිරි හැඩීමෙන් - නාදයෙන් නින්නාද කරවයි. ''**නාජ්ජ ගිරිනදීහි විප්පවාසසමයෝ**'' අද, මේ දැන් අනික් පර්වත, ගිරි, නදීන්ගෙන් පෙන්ව විසිය යුතු කාලය නොවෙයි. විශේෂයෙන්ම දරුණු මත්ස්‍ය කිඹුල් ආදීන්ගෙන් දුරු වූ ක්ෂේම වූ (සැක බිය රහිත) අජකරණී නදිය, රසවත් ඵලඵල්වයනගෙන් පිරී ගස් සහිත සුදුවැලි තලාවෙන් යුක්තව ඉතා රමණීයව ගලා බසී. මගේ සිත එහිම ඇලේ යන අදහසයි. මෙසේ පැවසූ සප්පක හිමියෝ නෑ සමූහයා හැර දමා, තමා පෙර විසූ ස්ථානයටම වැඩම කළහ. උන්වහන්සේ ශූන්‍යාගාර වාසයේ කැමැත්ත ප්‍රකාශ කළ මේ ගාථාවලින්ම, සිය රහත්භාවය ද විවරණය කළ සේක.

සප්පක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

4.1.12

''පබ්බජිං'' යනු ආයුෂ්මත් **මුදිත** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත්, **විපස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී සිටුගෙයක ඉපිද නුවණැති බවට පැමිණියහ. දිනක් ඒ ශාස්තෘන් වහන්සේ දැක සිත පහදවාගත් ඒ සිටුකුමරු එක් පැසක් පූජා කළේය. ඒ පින්කම නිසා දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි ඔහු, මේ බුද්ධෝත්පාද කාලයේදී කොසොල් රට ගහපති පවුලක **මුදිත** නමින් ඉපිද නුවණැති බවට පැමිණියේ ය. ඒ කාලයේ දී එම ගහපති පවුල කිසියම් කරුණක් නිසා රජුගේ කෝපයට ලක්ව පළිගැනීම් සිදුවිය. ඊට බියවූ මුදිත එනුවරින් පලාගොස් එක් අරණ්‍යයකට පිවිස, එක්තරා රහත් තෙර නමක් වසන තැනකට පිවිසියේය. ඔහුගේ බියසුළු බව දුටු තෙරණුවෝ ''දරුව, බිය නොවව''යි ඔහු අස්වසාලූහ. ඔහු ස්වාමිනි! මේ භය කවර කාලයකින් සන්සිඳේද''යි විමසූ විට තෙරණුවෝ ''සත් අට මසකින් සන්සිඳේ''යැයි වදාළහ. ''එපමණකල් ඉවසා සිටීමට නොහැක. මම පැවිදි වන්නෙමි. ස්වාමිනි! මා පැවිදි කළ මැනව''යි ජීවිත ආරක්ෂාව සඳහා පැවිද්ද ඉල්ලීය. තෙරණුවෝ ඔහු පැවිදි කළහ. පැවිදිව බුදුසසුන පිළිබඳ උපදවාගත් ශ්‍රද්ධා ඇති මුදිත හිමියෝ රාජභය සන්සිඳුණු කල්හි ද මහණකමෙහිම ඇලී

කමටහන් ගෙන විදසුන් භාවනාව වඩමින්, ''රහත් නොවී මේ මම වසන කුටියෙන පිටතට නො නික්මෙමි''යන ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්තව, විදසුනෙහිම සිත පිහිටුවා නොබෝ දිනකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''ලොවට එකම ජේෂ්ඨ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිත් ඇති මම සියතින්ම එක් පැසක් පූජා කළෙමි. එහි විපාක වශයෙන් සසරදී මා හට ඇත්, අස්, දිව යානා පහළ විය. ගී නැටුම් ආදී උත්සව ශ්‍රීයෙන් සැප විඳි මම දැන් සියලු ආශ්‍රව ක්ෂය කළෙමි. මීට කල්ප අනූ එකකට පෙර දී යම් පැසක් පූජා කළෙමි ද එහි විපාක වශයෙන් මම දුගතියකට නොගියෙමි. පැස දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. -පෙ-බුද්ධානුශාසනය ඉටු කළෙමි.''

රහත් බවට පත්ව විමුක්ති සුව විඳිමින් කල්යැවූ මුදිත තෙරුන්ගෙන් යහළු භික්ෂූහු, අවබෝධ කල මාර්ගඵල පිළිබඳව විමසූහ. එවිට තමන් වහන්සේ පිළිපැදි ආකාරය හා අවබෝධ කළ අර්හත්භාවය පෙන්වා දෙමින් මේ සිවු ගාථා වදාළහ.

පබ්බජිං ජීවිකත්ථාය ලද්ධාන උපසම්පදං
තතෝ සද්ධං පටිලභිං, දළ්හවීරියෝ පරක්කමිං

කාමං භිජ්ජතුයං කායෝ මංසපෙසී විසීයරුං
උභොජණ්ඩුකසන්ධීහි ජංඝායෝ පපතන්තු මෙ,

නාසිසසං න පිවිසසාමි විහාරා ච න නික්ඛමෙ
නපි පසසං නිපාතෙසසං තණ්හාසලලෙ අනූහතෙ

තසසමෙවං විහරතෝ පසස විරියපරක්කමං,
තිසෙසා විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධසස සාසනං''

එහි ''**ජීවිකත්ථාය**'', ජීවිතය සඳහා ජීවිතයෙන් ප්‍රයෝජන ඇතිව, මෙහි පැවිදි වී බිය නොමැතිව සුවසේ වෙහෙසට පත් නොවී ජීවත්වෙමියි යනුවෙන් ජීවත්වීම සඳහාම පැවිදිවී යන අර්ථයයි. ''**ලද්ධාන උපසම්පදං**'' පළමුව සාමණේරයකු පැවිදි වී, පසුව ඤත්ති චතුත්‍ථ කර්මයෙන් උපසම්පදාව ලැබ, ''**තතෝ සද්ධං පටිලභි**'' එසේ උපසපන් වූ කාලයේ සිටම කළණ

මිතුරු ඇසුර ලැබීමෙන් උභය ප්‍රාතිමොක්ෂය, ත්‍රිවිධ අනුමෝදනා සහිත එක් සූත්‍රයක්, සමථ -විදසුන් ආදී කම්ටහන් විදි උගෙන බුද්ධාදි මහෝත්තමයන් මහානුභාවය දැක, ''භාගෘවතුන් වහන්සේ සම්මා සම්බුද්ධයහ. ධර්ම මනාව දේශනා කරන ලදහ. සංඝයා මනාවූ පිළිවෙත් ඇත්තෝය'' යනුවෙන් තුණුරුවන් විෂයෙහි ශ්‍රද්ධාව උපදවා ගත්තෙමි. ''දළහවිරියො පරකකමිං'' මෙසේ ලැබූ ශ්‍රද්ධාවෙන් විදසුන් භාවනා කම්ටහනෙහි දැඩි වීර්යයෙන්, ස්ථිර වීර්යයෙන් නොබෝ දිනකින්ම චතුරාර්ය සත්‍ය අවබෝධය පිණිස උත්සාහ කළෙමි. අකුසල් දහම් ප්‍රහාණයටත් කුසල් දහම් වැඩිදියුණු කර ගැනීමටත් මනාව උත්සාහ කළෙමි. ඒ පරාක්‍රම වීර්යයේ ආකාරය පැවසීම සඳහා ''කාමං'' යන ගාථාව වදාළහ. එහි ''කාමං'' ඒකාන්තයෙන්, අනිවාර්යයෙන්ම, ''**හිජ්ජතුයං කායො**'' මේ මාගේ කුණුකය, මේ වීර්ය උපක්‍රමයෙන් බිඳී යේවා, සිඳී-බිඳී වැනසී යේවා. ''මංසපෙසී විසියරුං'' මේ දැඩි වීර්ය හේතුවෙන් මගේ මේ කයින් මාශ පේශී විසිරී යේවා, ඔබ්නොබ පැතිරීයේවා. ''**උහො ජණ්ණුක සන්ධිහි** ජංඝායො පපතනතු මෙ'' දෙදණ සන්ධියෙන් මගේ දෙකළවා, කෙන්ඩාබිඳී බිම වැටේවා. ''මං'' යන පාඨය ද යෙදේ. එහි අර්ථය ද එයම වේ. සෙසු පදයන්ගේ අර්ථ ඉහත පැවසූ පරිදිම දත යුතුයි.

මුදිත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

චතුක්ක නිපාතයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

5.1.1

''භික්ඛු සීවථිකං ගන්ත්වා'' යනු ආයුෂ්මත් රාජදත්ත තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම පිණිස පින්දහම් සිදුකරමින් අවුත්, මීට කල්ප දාහතරකට පෙරදී බුද්ධ ශූන්‍ය වූ ලෝකයේ සිටු ගෙයක ඉපිද වැඩිවියට පත්වූහ. දිනක් කිසියම් කටයුත්තකට වනයට ගිය ඒ සිටුකුමරු එහි එක්තරා ගසක් මුල වැඩහුන් පසේ බුදුරජාණන් වහන්සේ නමක් දැක පැහැදුණු සිතින් උන්වහන්සේට ඉතා පිරිසිදු ඇඹරුල්ල ගෙඩියක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳිමින් සසර සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර සත්තුවාහක පවුලක උපන්නේය. වෙසවුණු මහරජු සතුටු කිරීමෙන් ඔහු ලත් බැවින් දෙමාපියෝ ''රාජ දත්ත'' යැයි නම් තැබූහ. වැඩිවියට පත් එකුමරු පන්සීයක් කරත්ත ගෙන වෙළඳාම් පිණිස බඩු පටවාගෙන රජගහ නුවරට ගියේය. එසමයේ රජගහ නුවර සිටි ඉතා රූමත් දර්ශනීය රූ සපුවකින් හෙබි එක්තරා ගණිකාවක් දිනපතා කහවනු දහස බැගින් උපයන්නීය. මේ සත්තුවාහක සිටු පුතා ද දිනකට දහස බැගින් දෙමින් ඇය හා සංවාසයෙහි යෙදුණේ නොබෝ දිනකින්ම සියලු ධනය වියදම් ව දුප්පත් බවට පත්වීය. කෑම් ඇඳීම් පමණවත් නොලබමින් ඔබිනොබ ඇවිදිමින් දැඩි සංවේගයට පත් වූ රාජදත්ත; දිනක් උපාසකවරු සමඟ එක්ව වේළුවනාරාමයට පැමිණියේ ය. ඒ අවස්ථාවෙහි ශාස්තෘන් වහන්සේ මහත් පිරිසක් පිරිවරා ගෙන දහම් දෙසති පිරිසේ කෙළවර හුන් ඔහු ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා, උපන් ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි විය. ධුතාංග සමාදන් වූ රාජදත්ත හිමියෝ සොහොනෙහි විසූහ.

ඒ කාලයෙහි ද තවත් සත්තුවාහක වෙළඳ පුතුයෙක් රැයකට දහස බැගින් දෙමින් ඒ ගණිකාව සමඟ වෙසෙයි. ඔහුගේ අත පැළඳි ඉතා වටිනා මැණික දුටු ගණිකාව, ඊට ලෝභයෙන් වෙනත් තමා වෙත එන පුරුෂයන් ලවා ඔහු මරවා ඒ මැණික ගත්තීය. ඉක්බිති ඒ වෙළඳ පුතුගේ පිරිවර ජනයා මේ පුවත අසා ඇය වෙත ඔත්තුකාරයන් යැවීය. ඒ ඔත්තුකාරයෝ ගණිකාවගේ ගෙට රාත්‍රියේ පිවිස සමට හානියක් නොවන සේ ඇය මරා, සොහොනට ගෙනගොස් දැමූහ. සොහොනේ විසූ රාජදත්ත තෙරණුවෝ අසුභ නිමිත්තක් සොයමින් යන්නාහු, ඒ ගණිකාවගේ සිරුර පිළිකුල් භාවනාවට යෝග්‍යයැයි ගෙන, කිහිපවරක් නුවණින් මෙනෙහි කළහ. නමුත් අලුත මැරුණු බැවින් ද බලු සිවල් ආදින්ගෙන් උපද්‍රව නොවූ සම්

ඇති බැවින් ද විභාග වස්තුවක් වන හෙයින් ද අනුවණින් මෙනෙහි කිරීම නිසා ඒ සිරුර කෙරෙහි කාමරාගය උපදවාගත් උන්වහන්සේ. ඒ පිළිබඳව දැඩි සංවේගයට පත්ව තම සිතට දැඩිව නිග්‍රහ කළහ. මොහොතක් ඉන් බැහැරව සිත යොමු කළ තෙරණුවෝ නැවත මුලින් සිහිකළ අසුභ නිමිත්තම ගෙන නුවණින් මෙනෙහි කරමින් ධ්‍යාන උපදවා ගත්හ. ඒ ධ්‍යානයම පාදක කරගෙන, විදසුනෙහි සිත පිහිටවූ උන්වහන්සේ එකෙණෙහිම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''තමන් වහන්සේම අපරාජිතව චතුරාර්ය සත්‍ය අවබෝධ කළා වූ පසේබුදුරජාණන් වහන්සේ නමක් දුටු මම ඇඹරුල්ල ගෙඩියක් පූජා කළෙමි. මිට කල්ප දාහතරකට පෙර යම් ඵල පූජාවක් කෙළේ ද එහි විපාක වශයෙන් දුගතියකට නොගියෙමි. ඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත් වූ රාජදන්ත තෙරණුවෝ සිය පිළිවෙත් මග සිහිපත් කර බැලීමෙන් හටගත් ප්‍රීති සොම්නස විඳිමින් මෙම ගාථා වදාළහ.

''භික්ඛු සීවථිකං ගතත්වා අද්දසං ඉත්ථිමුජ්ඣිතං
අපවිද්ධං සුසානසම්මිං බජ්ඣන්තිං කිමීහි ඵුටං

යංහි එකෙ ජිගුච්ඡන්ති මතං දිස්වාන පාපකං
කාමරාගෙ පාතුරහූ, අන්ධොව වසති අහූ

ඔරං ඔදානපාකම්හා තම්හා ඨානා අපක්කමිං
සතිමා සම්පජානොහං එකමන්තං උපාවිසිං

තතො මෙ මනසිකාරෝ යොනිසෝ උදපජ්ජථ
ආදීනවෝ පාතුරහූ, නිබ්බිදා සමතිට්ඨථ
තතෝ චිත්තං විමුච්චි මෙ, පඤ්ඤ ධම්මසුධම්මතං
නිසෙසා විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධස්ස සාසනං'' නී.

එහි ''භික්ඛු සීවථිකං ගතත්වා'', සසර භය දක්නා බැවින් ''භික්ඛු'' නම් වූ භික්ෂුව, අසුභ කමටහනක් සොයමින් අමු සොහොනට ගොස්; මෙහි

නමා සඳහාම ''භික්ඛු'' යන්න රාජ දත්ත තෙරුන් විසින් යොදා ඇත. ''ඉත්ථී'' මෙහි ''ථී'' යනු ස්ත්‍රියයි. සත්ව සන්තානයෙන් ශුක්‍ර-ලේ ආදිය ගලා යවන බැවින් මාගමට ''ථී'' ස්ත්‍රිය යැයි කියනු ලැබේ. එක්ව විසීම්-සහවාස ඇති බැවින් ද ඉත්ථී නම් වේ. වඳ ස්ත්‍රීනු ද මොවුනට සමාන එක්ව විසීම් ඇති බැවින් ''ඉත්ථී'' යන ව්‍යවහාරය එම ශරීරයන්ට පවතියි. ''උජ්ඣිතං'' අත්හැර දැමූ. වැඩකට නැති බැවින් බැහැර ලූ. අපේක්ෂා රහිතව ඉවත ලූ. ''බජ්ඣනිං කම්ගී ථුථං'' පණුවන් විසින් පිරිවරාගෙන කනු ලබන. ''යං හි එකෙ ජිගුච්ඡනති මනං දිස්වාන පාපකං'' පහ වූ ආයුෂ, උණුසුම හා විඤ්ඤාණය ඇති මළ සිරුර, ඒ පවිටු නිහීන ළාමක වූ සිරුර, ඇතැම් මිදිමට, නිවණට යන නුවණැත්තෝ පිළිකුල් කරති. බැලීමටවත් අකමැති වෙති. ''කාමරාගො පාතුරහූ'' එවැනි කුණු ශරීරය පිළිබඳව අනුවණින් මෙනෙහි කළ මාහට කාමරාගය උපන්නේය. ඒ කෙරෙහි ඇල්මක් ඇති විය. ''අන්ධොව වසති අහූ'' ඒ නව දොරකින් අශුචි වැහෙන මළ සිරුරෙහි ඇති අශුභ-පිළිකුල් ස්වභාවය නොදැකීමෙන් මම අන්ධයකු වැනි වූයෙමි.

එනිසා කියන ලදී.

''රත්තෝ අත්ථං න ජානාති, රත්තෝ ධම්මං න පස්සති
අන්ධන්තමං තදා හොති, යං රාගෝ සහතෙ නරං'' ති.

රාගයෙන් යුක්ත පුද්ගලයා අන්ධයකු මෙන් අඳුරෙන් වෙලී පවතියි. රාගිකයා යථාර්ථය නොදනී. රාගිකයා ධර්මය නිවැරදිව නොදකියි.

''බ්‍රාහ්මණය! කාමච්ඡන්දය - කාමයෙහි ඇලී ගැලී සිටීම පුද්ගලයාගේ අන්ධභාවයකි.'' යන තැන්හිද එයම දක්වේ. ඇතැමෙක් මෙහි දී ''න'' කාරාගමය කොට (වසති - අවසති) කෙලෙස් නැගී සිටීමෙන්, වසඟ වූ බැසගත් කෙලෙස් වලින් යුක්තව විසුවෙමි''යි අර්ථ කියති. සෙස්සෝ (අපරෙ) ''අන්ධොව අසති අහූ'' යනුවෙන් පාලි පාඨය දක්වා කාමරාගයෙන් අන්ධයෙක් ම වී සිහිය නැතිවූයෙමි. අසිහියෙන් විසුවෙමි''යි අර්ථ කියති. මේ අර්ථ දෙකම පෙළෙහි නැත. පෙළ දහමෙහි නැත. ''ඔදං ඔදන පාකම්හා'' බතක් පැසෙන කාලයෙන් අඩක දී. යම් කලකදී මනාව සෙදූ තෙත් සහලින් බතක් පැසේ ද ඊට අඩු කාලයකදී. ඉතා කෙටි කලකින් උපන් රාගය, කාමුක සිත දුරු කිරීම පිණිස හුන් තැනින් නික්මුණෙමි. යම් තැනක සිටීමෙන් මට රාග සිතක් උපන්නේ ද එතනින් නික්මුණෙමි. ඉවත් වන්නා වූ මම ''සතිමා සම්පජානොහං'' සිහි නුවණ ඇත්තෙමි. ''මම ශ්‍රමණයෙකි''යි යන සිත උපදවාගෙන, සිහි කල්පනා ඇති කරගෙන

සිහියෙන් මනාව ධර්මයන්ගේ ස්වභාවය දැනගැනීමෙන් නුවණැතිව යථාර්ථාවබෝධය ලබමින් වෙනත් තැනකට පිවිසියෙමි. ''**එකමන්තං උපාවිසිං**'' එකත් පසෙක පලක් බැඳ සිටියෙමි. එසේ සිටි මා හට යෝනිසෝ මනසිකාරය පහළ විය. ආදී වශයෙන් දක්වන ලද සෙසු අර්ථ ඉහත පවසන ලදී.

රාජදත්ත තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.2

''අයොගෙ'' යනාදී ගාථා ආයුෂ්මත් **සුභූත** තෙරුන් වහන්සේගේ ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේදී පින් රැස් කරමින් අවුත් **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි බරණැස මහධනවත් පවුලක උපන්හ. නුවණැති වූ ඒ බමුණු කුමරා දිනක ශාස්තෘන් වහන්සේගෙන් දහම් අසා පහන් සිත් ඇතිව සරණ සිල්හි පිහිටා, මාසයකට අට වාරයක් සුවඳ ද්‍රව්‍ය සතරක් මිශ්‍රකර ශාස්තෘන් වහන්සේගේ ගඳකිළිය පිරිබඳ ගැන්වීය. ඔහු ඒ පින්කමේ විපාක වශයෙන් උපනුපන් ආත්මභාවයන්හි සුවඳ ශරීර ඇතිව ඉපිද සැප විඳ්දේය. මේ බුද්ධොත්පාද කාලයේදී මගධ රට ගහපති කුලයේ ඉපිද ''සුභූත'' යන නමින් **ප්‍රකට**ව, වැඩිවියට පත් හෙතෙම කාමුක සම්පත්හි නොඇලී ගිහිගේ හැර තීර්ථකයන් වෙත පැවිදි විය. එම සස්නෙහි හරයක් නොදුටු ඔහු, අප ශාස්තෘන් වහන්සේ වෙත උපතිස්ස, කෝලිත, සේල ආදී බොහෝ මහණ බමුණෝ පැමිණ, පැවිදි වී ශ්‍රමණඵල විඳිනු දැක; බුදුසසුන පිළිබඳව උපන් ශ්‍රද්ධාවෙන් පැවිදි විය. ආචාර්ය උපාධ්‍යායයන් සතුටු කිරීමෙන් කමටහන් ගත් හෙතෙම විවේක වාසයේ ඇලී වෙසෙමින් විදසුන් වඩා රහත් විය.

සුභූත තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''මෙම භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණ වංශයේ උපන්, මහත් යසස් ඇති, වාදීන්හට අග්‍ර වූ දෙතිස් මහා පුරුෂ ලකුණින් හෙබි අසූවක් අනුව්‍යඤ්ජන සහිත බ්‍යාමප්‍රභා කේතුමාලාවලින් නිකුත් රැස් දරන්නා වූ සඳු මෙන් ලෝවැසියාට සැනසිල්ල දෙන්නා වූ හිරු මෙන් ප්‍රභාලෝකය විහිදුවන්නා

වූ වැහිවළාවක් මෙන් සත්‍වයන්ගේ ග්‍රීෂ්මය නිවන්නා වූ සයුර මෙන් ගුණයන්ට ආකරයක් වූ, ශීලයෙන් මහපොළොව වැනි වූ, සමාධියෙන් හිමවත් පව්ව වැනි වූ, ප්‍රඥාවෙන් අහස වැනි වූ, සුළඟ මෙන් කිසිතැනෙක නො ඇලෙන්නා වූ, නමින් කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. එකල මම බරණැස් නුවර මහත් ධන ධාන්‍ය ඇති, විවිධ රත්න සමූහ ඇති මහා කුලයක උපන්නෙමි. මහත් පිරිවරින් යුතුව වැඩහුන් බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ අමෘතය වැනි වූ ධර්මය ශ්‍රවණය කළෙමි.''

''තරු සහිත සඳ මෙන් දෙතිස් මහා පුරිස් ලකුණ දරන, අසූ අනු ව්‍යඤ්ජනයෙන් යුතු, පිපුණු සල් රුකක් වැනි වූ, රැස් සමූහයෙන් වට කළ දීප්තිමත්, රන් පවුවක් වැනි වූ බ්‍යාම ප්‍රභා රශ්මියෙන් පිරිවරාගත් සරත් කාලයේ හිරු වැනි වූ, රන් වන් ශරීරයෙන් මැණික් පර්වතයක් වැනි වූ, මරුන් දිනා උතුම් ජිනවර වූ පිරුණු කරුණාවෙන් යුතු හදක් ඇති, ගුණයේ සාගරය වන්, ලොව ප්‍රකට කීර්ති ඇති, මහමෙර වැනි වූ යසසින් පැතිරුණා වූ, වීර වූ ආකාශය හා සම වූ මුනි වූ සුලඟ මෙන් සියලු තැන නොඇලෙන්නා වූ සිත් ඇති, නායක වූ, මහපොළොව මෙන් සව්සත්හට පිහිට වූ සත්වන මුනි වූ ජලය නොතැවරෙන පියුම මෙන් ලොව නො තැවරෙන්නා වූ, මිසදුටුවාද නම් පැලෑටි දවන ගින්නක් වැනි ඒ කාශ්‍යප බුදුහු බබළති. ඒ කාශ්‍යප බුදුහු සියලු කෙලෙස් විස නසන බෙහෙතක් වැනියහ. ගුණ සුවඳින් සැරසුණු ගඤ්ධමාදන පවුව මෙනි. ඒ වීර වූ බුදුපියාණෝ රත්නයන්ට සයුර මෙන් ගුණයන්ට ආකරයකි. වන රාජීන්ගේ කසල පිස දමන සිඤ්ඣු නදිය මෙන් සියලු සතුන්ගේ කෙලෙස් දූවිලි පිස හරිනාහ.'' ''සතුරන් දිනූ මහා යෝධයෙකු මෙන් මරසෙනඟ මැඩ, සක්විති රජෙකු සත්රුවන්ට අධිපති වන්නාක් මෙන් සත් බොජ්ඣංග ධර්මයන්ට අධිපති වූ ඒ බුදුරජාණෝ; කෙලෙස් දෝෂ නම් ව්‍යාධියට පිළියම් කරන මහා වෛද්‍යවරයෙක් වෙති. මිසදිටු නම් ගෙඩිය නසන ශල්‍ය වෛද්‍යවරයෙකි. එකල දෙවි මිනිසුන් ගරු කරන, ලොව බබුළුවන්නා වූ මිනිසුන්ට හිරු වූ ඒ බුදුහු පිරිස් මැද හිඳ දහම් දෙසති.''

''දන් දී මහත් භෝග සම්පත් ලබන්නේය. සීලය රැකීමෙන් සුගතියට යන්නේ ය. භාවනාවෙන් කෙලෙස් පිරිනිවෙන්නේය.'' යනුවෙන් අනුශාසනා කරන්නා වූ මහත් ආශ්චාද ජනක වූ රසවත්-මුල මැද අග යහපත් වූ ඒ දහම් දෙසුම සැම දෙනම අමෘතයක් මෙන් අසති. ඉමිහිරි දහම් අසා බුදුසසුනෙහි පැහැදුණු මම දිවිඇති තෙක් බුදුන් සරණ ගියෙමි; උන්වහන්සේට නමස්කාර

කළෙමි. එකල මම දුගඳ ශරීරයේ සුවඳ ලැබෙටායි පතා බුදුරදුන්ගේ ගඳකිලියේ පොළොව මසකට දින අට බැගින් සිව්ගඳින් පිරිබඩ ගැන්වීමි. එවිට මා සසර සුවඳවත් සිරුරක් ලබන බව බුදුහු වදාළහ. 'යමෙක් මේ ගඳකිලි බිම නොයෙක් වර සුවඳ ගල්වා ද එහි විපාක වශයෙන් උපනුපන් අත්බැව්හිදී මෙතෙම් සුවඳ ශරීර ලබන්නේය. ගුණ සුවඳින් යුතු අවසන් අත්බැව්හි ආශ්‍රව දුරලා පිරිනිවෙන්නේය.'' මනාව කළ ඒ පින්කමේ හා චිත්ත ප්‍රාර්ථනාව අනුව මම මේ මිනිස් කය හැරදමා දෙව්ලොව උපන්නෙමි.''

''ඒ මම අවසන් අත්බැව්හි බමුණු මහසල් කුලයක උපන්නෙමි. මවුකුස වසන මා නිසා මගේ මවු ඉතා සුවඳවත් වූවාය. මා කුසින් නික්මෙන කල මුළු සැවැත් නුවරම ඉතා සුවඳවත් වූවාය. මා කුසින් නික්මෙන කල මුළු සැවැත් නුවරම ඉතා සුවඳවත් වූයේය. මනරම් වූ සුමිහිරි දිව්‍යමය සුවඳ ඇති මල්වැසි වැස්සේය. මාහැඟි සුවඳ දුම් දස දෙස පැතිරුණේය. මා උපන් ගෘහය දෙවියන් විසින් සියලු සුවඳ දුම් හා මලින් සරසන ලද්දේය.''

''මා හදා වූ තරුණ අවස්ථාවෙහි සිටි තරුණයෙක් වූ සමයෙහි පිරිස් සහිත සේල බමුණා බුදුරජාණන් වහන්සේ වෙත පැවිදි විය. ඒ සියල්ලන් සමඟ සැවැත් පුරයට පැමිණි කල්හි උතුම් බුද්ධානුභාවය දුටු මම උන්වහන්සේ වෙත පැවිදි වූයෙමි. ඉතා උතුම් ශීල, සමාධි, ප්‍රඥා හා විමුක්ති යන සිවුදහම් වැඩූ මම ආශ්‍රව ක්ෂය කොට නිවන් දුටුවෙමි. මා පැවිදි වූ කල්හි ද රහත් වූ අවස්ථාවෙහි ද මතු පිරිනිවෙන අවස්ථාවෙහි ද ඉතා සුවඳවත් මල් වැසි පැවතියේය. මා හැඟි සඳුන්, සපු, උපුල් මල් සුවඳ මිශ්‍ර වූ මාගේ ශරීර සුවඳ හැමකල්හි හමයි. මා ගිය ගිය තැන පවතින සුවඳ මැඩ බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් සුභූත තෙරණුවෝ, තීර්ත්‍යකයන් වෙත පැවිදිව පෙර තමා විඳි අත්තකිලමථානුයෝගී දුක් ද දැන් බුදුසසුනේ පැවිදිව තමාම ලැබූ ධ්‍යානාදී සැපය ද ප්‍රකටව දක්වමින්, තමාගේ පිළිවෙත් මඟ නැවත සිහිපත් කරමින්, සිය රහත්බවද ප්‍රකාශ කරමින් මේ ගාථා දෙසූහ.

''අයොගෙ යුඤ්ජමත්තානං පුරිසෝ කිච්ච මිච්ඡතෝ
චරඤ්චව නාධිගච්ඡෙය්‍ය, තමේම දුබ්භග ලක්ඛණං

''අබ්බූළ්හං අසගතං විජිතං - එකං වෙ ඔඝසජෙය්‍ය කලීව සියා
සබ්බානිපි වෙ ඔඝසජෙය්‍ය අඤ්ඤාව සියා - සම්විසමඝස අදඝසනතෝ

''යංහි කයිරා නංහි වදෙ - යං න කයිරා න නං වදෙ
අකරොනනං හාසමානානං - පරිජානනති පණ්ඩිතා

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවනතං අගන්ධකං
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවනතං සගන්ධකං
එවං සුභාසිතා වාචා සඵලා හොති සකුබ්බතො'' ති.

එහි ''අයොගෙ'' නොයෙදිය යුතු - සේවනය නොකළ යුතු අන්ත දෙකෙහි. මෙහිදී අත්තකිලමථානුයෝගය අදහස් වන බව දත යුතුයි. ''**යුඤ්ජං**'' එහි තමා යොදමින්, නිරතවෙමින්, එය පිළිපදිමින්. ''**කිච්චමිච්ඡතො**'' දෙලොවටම හිතවැඩ දායක වූ කටයුතු කැමැතිව, රට විරුද්ධ වූ නොයෙදිය යුතු වූ ප්‍රතිපදාවන්හි නිරත වූයෙමි. ''**නාධිගච්ඡෙය්‍ය**'' ''ඔහු තමා කැමති වූ හිත වූ සුවයට නොපැමිණෙන්නේය'' යන අර්ථයි. මෙසේ යම් කලෙක අන්‍ය නිර්ථක ඉගැන්වීම්වලින් රැවටුණු මම, නොයෙදිය යුතු කටයුත්තෙහි යෙදුනෙමි ද, ඒ මාගේ දුර්භාග ලක්ෂණයකි. පින් නොකළ බවෙකි. පෙර කර්ම නිසා ''අඝගතිං විජිතං'' වැළැක්වීම, පීඩා කිරීම ස්වභාව කරගත් බැවින් ''අඝ'' නම් වේ. රාගාදිය ද ''අඝ'' නම් වේ. සංසාර පැවැත්ම ඇති කරන රාගාදී කෙලෙස් දහම් පැරදවීම හෙවත් ඒ කෙලෙස් දහම් කුසල් දහම් මගින් අභිභවනය කර ජයගැනීම ''අඝගතානං විජිතං - **අඝගතං විජිතං**'' නම් වේ. මෙහි අනුනාසිකය, නිග්ගහිතය ලොප් නොකර තබන ලදී. ඒ කෙලෙස් දහම් ජයගැනීම නොකොට, ඊට උත්සාහ නොකොට යනු ''**අබ්බූළ්හං**'' නම් වේ. මෙසේ කෙලෙස් මුලිනුපුටා දැමීමෙන් තොර වූ මම, ''එකං වෙ ඔඝසාජෙය්‍යා'' දෙවැන්නකු නැතිවද වීර්ය වඩමින් ද එකම අප්‍රමාදයේ යෙදීම, යහපත් උත්සාහයෙහි යෙදීම යම් පුද්ගලයකු හරනේ නම්; ඉවතට දමන්නේ නම්, ඒකාන්තයෙන් ඔහු 'කලීව' කාලකන්නියෙකු මෙන් වන්නේය. ''**සබ්බානිපි වෙ ඔඝසා ජෙය්‍ය**'' විමුක්තිය, සියලු පැසී - මුහුකුරා යන්නා වූ වීර්යය, සිහිය, සමාධිය, ප්‍රඥාව යන ඉන්ද්‍රියයන් අත්හරින්නේය. නොවැඩීමෙන්, වර්ධනය නොකර ඉවත දමන්නේය. ඔහු සම්විඹම බව නොදක්නා බැවින් අන්ධයෙක් ම වන්නේය. ''**යථා**'' යනු උපමාදෝත්තක නිපාතයකි. ''**රුචිරං**'' ශෝභන වූ. ''**වණ්ණවනතං**'' වර්ණවත්භාවයෙන් යුක්ත වූ. ''**අගන්ධකං**'' සුවඳ නැති එරමුදු, කටරොලු, බඳුවද ආදි මල් වර්ග, ''**එවං සුභාසිතා වාචා**'' යනු වර්ණාදියෙන් ශෝභමාන මල් වැනි වූ ත්‍රිපිටක බුද්ධ වචනය 'සුභාෂිත' නම් වේ. යම් සේ සුවඳ නැති

මල් පැළඳගත් නැනැත්තා ගේ ශරීරයේ සුවඳ නො පැතිරෙන්නේ ද, එසේම මේ සුභාෂිත දහම් යමෙක් සකසා මැනවින් නො අසයි ද එහි නොයෙක් දේ ද ඔහුගේ දහම් ඇසීම ද එබඳු ය. සකසා දහම් නො අසා ද කළ යුතු දේ නොකරයි ද දහම් ශ්‍රවණාදිය නොකරයි ද සුත සුවඳ, ත්‍යාග සුවඳ, ප්‍රතිපත්ති සුවඳ යන සුගන්ධයන් ඔහුගෙන් නොහමයි. ඔහු දහමින් ලබන ඵලයක් නැත. එනිසා කියන ලදී. - ''මෙසේ සුභාෂිත වචනය ක්‍රියාත්මක නොකරන්නාට නිෂ්ඵල වේ. ''**සගන්ධකං**'' සමන්, සපු, නිලුපුල් ආදී සුවඳවත් මල්. ''එවං'' යම් සේ ඒ සුවඳවත් මල් දරන්නාගේ ශරීරයෙන් සුවඳ පැතිරේ ද එසේම ත්‍රිපිටක බුද්ධ වචනය නම් සුභාෂිත වචනය, යමෙක් මනාව දහම් ඇසීම් වශයෙන් කළයුතු දේ ඉටුකරයි ද ඒ පුද්ගලයාට ඒ ධර්මය ඵල සහිත වේ. සුත, ත්‍යාග, ප්‍රතිපත්ති සුවඳවලින් යුක්ත වූ ඒ පුද්ගලයා ඉන් මහත්ඵල මහානිසංස විඳියි. ත්‍යාගශීලීභාවයත් පුරුදු කරන ඒ පුද්ගලයා කියන ලෙසම කරන්නෙකු ද වේ. (යථාවාදී තථාකාරී) සෙසු පදයන්ගේ අර්ථ ඉහත පැවසූ පරිදි දත යුතුයි.

සුභූත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.3

''වසති දෙවො'' ආයුෂ්මත් **ගිරිමානන්ද** තෙරුන්වහන්සේගේ ගාථාවකි. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස්කරමින් අවුත් **සුමේධ** නම් භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී කුලගෙයක ඉපිද වැඩිවියට පැමිණ ගිහිගේ විසූහ. තම බිරිය සමඟ පුතු නැති වූ අවස්ථාවෙහි දැඩි ශෝකයට පත් වූ ඔහු අරණ්‍යයට පිවිස, ශාස්තෘන් වහන්සේ වෙත ගොස්, දහම් ඇසීය. ඉන් ශෝක ගින්න නිවාගත් ඔහු පැහැදුණු සිත් ඇතිව සුවඳ මලින් බුදුන්ට පූජා කළේය. පසඟ පිහිටුවා උන්වහන්සේට වැඳ හිසෙහි ඇඳිලි බැඳගෙන බුදුගුණ පැවසීය. ඒ පින්කමෙහි විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී බිම්බිසාර රජුගේ පුරෝහිතයාගේ පුතුව උපන්නේය. ''**ගිරිමානන්ද**'' නම් වූ ඔහු නුවණැති බවට පත්වූ අවස්ථාවෙහි රජගහ නුවරට වැඩම වූ බුදුරජාණන් වහන්සේගේ අසිරිය දැක උපන් ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි විය. කිහිප දිනක් ගම් සෙනසුනක විසූ ගිරිමානන්ද තෙරණුවෝ, ශාස්තෘන් වහන්සේට

වැඳීම සඳහා රජගහ නුවරට වැඩියහ. උන්වහන්සේගේ පැමිණීම ඇසූ බිම්සර රජු, උන්වහන්සේ වෙත පැමිණ, ''ස්වාමීනි, මෙහිම වසන්න. මම සිවුපසයෙන් උවටැන් කරන්නෙමි''යි ආරාධනා කොට ගියේය. රාජකටයුතු බොහෝ බැවින් රජුට මෙය අමතක විය. තෙරණුවෝ එළිමහනෙහිම විසූහ. දෙවියෝ තෙරුන් ''තෙමේය'' යන බිය නිසා වැසි නොවැස්සූහ. නොවසින කරුණ විමසූ රජු, තම දෝෂය දැක ගිරිමානන්ද තෙරුන්ට කුටියක් කරවා දුන්නේය. එම කුටියෙහි විසූ තෙරුන් වහන්සේ සුදුසු සෙනසුනක් ලද බැවින් සමාධිගත වූ සිත් ඇතිව වීර්යයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව - විදසුනට සිත යොමු කළ සේක් රහත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''මගේ බිරිය ද පුතු ද මළේය. මව ද පියා ද සෝයුරා ද එකම චිතකයක දැවෙන්නෝය. එම ශෝකයෙන් පීඩා වූ මම තැවුනෙමි. කෘශ වූයෙමි. සිත් විකෘති වූයෙමි තැන තැන ඇවිද්දෙමි. ශෝක හූලින් පීඩා වූ මම වනගත වීමි. ඉඹේ වැටුණු ගෙඩි මුල් කමින් රුක්මුල්හිම විසුවෙමු. පස්මරුන් දිනූ දුක් කෙළවර කර ගත්තා වූ සුමේධ නම් බුදුපියාණෝ මා සසරින් ගොඩගනු කැමතිව මාගේ සමීපයට වැඩම කළහ. උන්වහන්සේගේ පා හඬ ඇසූ මම හිස ඔසවා බැලුවෙමි. මහාවීරයන් වහන්සේ මා වෙත වැඩම කළහ. ප්‍රීතියට පත් මම උන්වහන්සේ දැකීමෙන් එකඟ වූ සිත් ඇත්තෙමි වූයෙමි. සිහිය ලැබූ මම උන්වහන්සේට කොළ මිටක් පිදුවෙමි. ඒ කොළ ඇතිරූ අසුනෙහි මා හට අනුකම්පා කළ බුදුහු වැඩහුන් සේක. මාගේ ශෝකය නසනු සඳහා උන්වහන්සේ දහම් දෙසූහ.

''මරණයට පත්වූ අඹුදරු ආදීහු කැඳවීමක් නොමැතිව අතීත භවයෙන් මේ භවයට පැමිණියහ. එසේම දැනුම් නොදී ඔවුහු පරලොව ගියහ. යම් සේ ආවාහුද එසේම ගියහ. එහි කවර නම් වැලපීමක් ද? හැඬීමක්ද? වැසි වස්නා කල්හි මගී ජනයා බඩු සහිතව ම නොතෙමෙන තැනකට යන්නාක් මෙන් ද, වැසි නැවති කල්හි කැමති තැනකට යන්නේද එමෙන් ඔබගේ දෙමාපියාදීහු පැමිණ ගියහ. වැලපෙනුයේ කුමකට ද? ලෝකවාසී සැම මෙලොවට අමුත්තෝය. ආගන්තුකයෝය. සැලෙන කම්පා වෙනස්වන ස්වභාව ඇති ඔබගේ දෙමාපියෝ ද එබඳුමය. සර්පයෙක් සිය දිරාගිය හැව හැරයන්නාක් මෙන් නුඹගේ දෙමාපියෝ ද තම සිරුර හැර ගියහ.''

''ඒ උතුම් බුදුවදන් ඇසූ මම ශෝකය මැඩ පවත්වා ගත් මම, සතුටු වූයෙමි තථාගතයන් වහන්සේට වැන්දෙමි. උන්වහන්සේට දිව්‍යමය සුවඳින්

යුතු ගිරිනිල් මල් කළඹක් පිදුවෙමි. ලෝකනායක වූ සුමේධ බුදුරදුන්හට සිරසෙහි ඇදිලි බැඳ අග්‍ර වූ ගුණ සිහිකරමින් පැසසීමි.'' ''මහා වීරයන් වහන්ස, ලෝක නායකයන් වහන්ස, ඔබ හට තරණය කළාහුය. මහා මුනින් වහන්ස, ඔබ නුවණින් සව්සතුන් දුකින් ගොඩලන්නෙහිය. මහාමුනීන් වහන්ස, ඔබ විමතිය ද සැකය ද සිදින්නෙහිය. පසැස් ඇති උතුමන් වහන්ස, ඔබ ඔබගේ නුවණින් මාගේ මාර්ගය පෙන්වූ සේක. ක්ෂණයකින් ධ්‍යාන උපදවා ගත්, ෂඩභිඥා උපදවාගත්, මහත් ඍද්ධි ඇති, මහා ප්‍රාඥ වූ ආකාශචාරී රහත්හු ඔබවහන්සේ පිරිවරා ගනිති. ආයර්‍ය මාර්ගයට පිළිපන්නෝ ද සත් සේඛයෝ ද රහත්වූවෝ ද ඔබ පිරිවරති. ඔබ ශ්‍රාවකයෝ හිරු උදාවන කල්හි පියුම් මෙන් ප්‍රබෝධ වෙති. පසැස් ඇත්තාණෙනි ! සමුදුර නොකැළඹිය හැකි, සමකළ නොහැකි වන්නාක් මෙන් නුඹ වහන්සේ නුවණ ද ඉතා ගැඹුරුය. නොකැළඹේ. අසම සමය. අපමණය.'' මෙසේ පැවසූ මම සියලු දිශාවන්හි ම හිඳ තුන්ලොව දිනූ කීර්තිමත් වූ යශස් ඇති, බුදුපියාණන් වහන්සේට වඳිමින් නැමුනෙමි.

''කුදු මහත් භවයන්හි සැරි සැරූ මම දෙව්ලොවින් චුත ව යහපත් සිහියෙන් හා ප්‍රඥාවෙන් යුතුව මවුකුසින් බිහිවූයෙමි. ගිහිගෙයින් නික්මුණු මම සසුනෙහි පැවිදි වූයෙමි. කෙලෙස් තවන වීර්යයෙන් යුතුව ප්‍රඥාවන්ත වූයෙම් ධ්‍යාන වඩමින් විවේක සෙනසුන් ඇසුරු කළෙමි. වීර්යවන්ත වූ මම බුදුරදුන් තුටු කරමින් වැහිවළාවෙන් මිදුණු සඳ මෙන් හැමකල්හි වෙසෙමි. සන්සුන්ව, උපධි රහිතව, විවේකයෙහි ඇලුණු මම ආශ්‍රව රහිතව වෙසෙමි. මීට කල්ප තිස් දහසකට පෙර දී යම් බුදුවරයකු මනා කොට පිදුවෙමි ද එතැන් සිට දුගතියක නූපන්නෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.

ඉක්බිති තෙරණුවන්ගේ රහත්වීම නිසා සතුටට පත්වූවාක් මෙන් වැසි වැසීමට පටන්ගත් කල්හි; ඒ වැස්සට තව තවත් වසින ලෙස දැන්වීම් වශයෙන් ද සිය රහත්බව ප්‍රකාශ කිරීම් වශයෙන් ද මේ ගාථා පහ වදාළහ.

''වස්සති දෙවෝ යථා සුගීතං ඡනනා මෙ කුටී සුඛා නිවාතා
තස්සං විහරාමි ඵුසනෙනා - අථ වෙ පජ්ජයසි පවස්ස දෙව''

''වස්සති දෙවෝ යථා සුගීතං ඡනනා මෙ කුටී සුඛා නිවාතා
තස්සං විහරාමි සතනවිත්තෙනා - අථ වෙ පජ්ජයසි පවස්ස දෙව''

''වසති දෙවො යථා සුගීතං ඡනනා මෙ කුටී සුඛා නිවාතා
තස්සං විහරාමි චිතරාගො - අථ වෙ පස්සයසි පවස්ස දෙව''

''වසති දෙවො යථා සුගීතං ඡනනා මෙ කුටී සුඛා නිවාතා
තස්සං විහරාමි චිතදොසො - අථ වෙ පස්සයසි පවස්ස දෙව''

''වසති දෙවො යථා සුගීතං ඡනනා මෙ කුටී සුඛා නිවාතා
තස්සං විහරාමි චිතමොහො - අථ වෙ පස්සයසි පවස්ස දෙව''

මෙහි ''යථාසුගීතං'' යනු මනහර ගීයක් වැනි වූ, සුන්දර වූ වැස්ස ගීයක් සේ පවතී යන අර්ථයයි. වැස්ස වනාහි නොගොරවා හුදෙක් වැසිදිය පමණක් වැටේ නම් නොහොඳි. එසේම ලක්ෂගණනින් ගොරවමින් - නාද කරමින් විදුලිය ගසමින් හෙනහඬ නංවා නොවසී නම් එයද නොහොඳි. විදුලිය ගසමින් ගෙරවීමත්, වැසි වැසීමත් පවතින වැස්සම ශෝභමාන වූ සුන්දර වර්ෂාවයි. එබඳු වැස්ස ''මනා ගැයුමක් මෙන් වැසි වසී''යැයි කියන ලදී. එනිසා ''වර්ෂාව! ගොරවමින්, නාදකරමින්, තැනිගන්වමින් වර්ෂාව පවත්වන්න''යි කියන ලදී. ''**තස්සං විහරාමි**'' ඒ කුටියේ මම ආර්ය විහරණයෙන්, ඉරියවු පවත්වමින් වාසය කරමි. සන්සුන් සිතින් යුක්තව අග්‍රඵල සමාධියෙන් මනාව සන්සිඳුණු සිතැතිව වෙසෙමි. මෙසේ තෙරුන් වහන්සේ විසින් අනේකවාරයක් කරන ලද උනන්දු කිරීම් ඇති වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා එම අණ හිස් මුදුනින් පිළිගනිමින්; වල ගොඩැලි පුරවා මහා වර්ෂාවක් වැස්සවිය.

ගිරිමානන්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.4

''යං පස්සයානො'' යනු ආයුෂ්මත් සුමන තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් පැමිණියහ. මීට කල්ප අනූ පහකට පෙර ලොව බුදුවරුන්ගෙන් ශූන්‍ය වූ කාලයක සිටුගෙයක උපන් හෙතෙම නුවණැති බවට පත්විය. දිනක් එක් පසේ බුදුවරයකු ආබාධිත වී සිටිනු දැක අරළු ගෙඩියක් පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් කාම සුගතීන්හි සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද

කාලයේ දී කොසොල් රට - බමුණු පවුලක ඉපිද සුමන නමින් ප්‍රකට සැපසේ වැඩුණේය. ඔහුගේ මාමා පැවිදිව රහත් බවට පත්වී අරණ්‍යයේ වාසය කරනුයේ, නිසි වයසට එළඹී සුමන පැවිදි කරවා චරිතයට ගැලපෙන කමටහන් දුන්නේය. සුමන හිමියෝ ඒ කමටහන් වඩා සතර ධ්‍යානයන් ද පඤ්ච අභිඥාවන් ද උපදවා ගත්හ. අනතුරුව මාමා වූ තෙරණුවෝ උන්වහන්සේට විදසුන් කමටහන් දේශනා කළහ. ඒ විදසුන් භාවනාවෙහි නිරත වූ සුමන හිමියෝ නොබෝ කලකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''අරළු, නෙල්ලි, අඹ, දඹ, බුළු, ඩෙබර, බදුළු, බෙලි යන පළතුරු මම ම රැස් කළෙමි. කඳු බෑවුමක වැඩහුන් ධ්‍යාන වඩන ධ්‍යානයෙහි ඇලුණු අසමසම වූ බුදුපියාණන් වහන්සේ ආබාධයකින් පෙළෙනු දුටු මම, අරළු ගෙන පූජාකළෙමි. බෙහෙත් කළ කෙණෙහි රෝගය සන්සිඳුණි. කයෙහි විඩාව සන්සිඳුණු පසු බුදුපියාණෝ මාහට පුණ්‍යානුමෝදනා සිදුකළහ. ''මෙම බෙහෙත් දානය හා රෝගය සන්සිඳවීම නිසා ලැබූ පින හේතුවෙන් නුඹ දෙව්ව හෝ මිනිස්ව හෝ අන් අත්භවෙක හෝ උපන්නේ සියලු තැන්හි සැප ඇත්තෙක් වේවා. කිසිකලෙක නුඹට ව්‍යාධියක් නොපැමිණේවා.''

''සියල්ල තමාම අවබෝධ කරගත් පස්මරුන් දිනූ බුදු පියාණෝ මේ වදන් පවසා අහසේ යන හංස රාජයකු මෙන් අහසට නැඟ වැඩි සේක. යම් අත්භවෙකදී සියල්ල තනිව අවබෝධ කළ බුදුරදුන්ට අරළු දානයක් දුනිම් ද එදා සිට මේ දක්වාම මාහට ව්‍යාධියක් - ලෙඩක් දුකක් නොවිණි. මීට කල්ප අනූ පහකට පෙර දී යම් ඖෂධ දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් දුගතියක නූපන්නෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ සුමන තෙරණුවෝ දිනක් මාමා වූ තෙරුන්ට උපස්ථාන කිරීමට උන්වහන්සේ වෙත ගියහ. එහිදී මාමා වූ තෙරණුවෝ ''නුඹගේ අධිගමයන් කවරේද?''යි විමසූහ. එවිට මේ ගාථා පහෙන් සිංහනාද පවත්වන සුමන හිමියෝ, සිය රහත්බව ප්‍රකාශ කළහ.

''යං පත්‍ථයානෝ ධම්මෙසු උපඣ්ඣායෝ අනුග්ගහී
අමතං අභිකඞ්ඛතං කතං කත්තබ්බකං මයා

අනුපත්තෝ සවාහිකතෝ සයං ධම්මෝ අනීතිහෝ
විසුද්ධ ඤාණෝ නික්කඞ්ඛෝ බ්‍යාකරොමි තවන්තිකෙ

පුබ්බේනිවාසං ජානමි, දිබ්බචක්ඛු විසෝධිතං
සදත්ථා මේ අනුප්පත්තා, කතං බුද්ධස්ස සාසනං

අප්පමත්තස්ස මේ සික්ඛා සුසුසූතා තව සාසනේ
සබ්බේ මේ ආසවා ඛීණා, නත්ථිදානි පුනබ්භවෝ

අනුසාසිං මං අරියවතා අනුකම්පී අනුග්ගහී
අමොඝෝ තුයහං මොවාදෝ අනේතවාසිම්හි සික්ඛිතෝ'' ති.

මෙහි ''යං පත්ථයානෝ ධම්මේසු උපජ්ඣායෝ අනුග්ගහී අමතං අභිඤ්ඤාතං'' යනු සමථ විදර්ශනා ආදී නිරවද්‍ය වූ ධර්මයන්හි, යම් දහම් අවබෝධයක් පතන, කැමති වූ මා හට, අමාමහ නිවණ කැමැත්තා වූ මාහට අවවාද දීම් වශයෙන් උපාධ්‍යාය වූ ඔබවහන්සේ අනුග්‍රහ කළෙහිය. ''කතං කත්තබ්බකං මයා'' ඒ නිවණ අවබෝධ කරගැනීම සඳහා කළයුතු පිරිසිඳ දැනීම් ආදී දහසය වැදෑරුම් කටයුතු මවිසින් කොට නිමවූයෙමි. එසේම සතරක් වූ මාර්ග ධර්මයන් මවිසින් අවබෝධ කළෙමි. ඊට පැමිණියෙමි. ''**සච්ඡිකතෝ සයං ධම්මෝ අනීතිහෝ**'' තමා විසින්ම නිර්වාණ ධර්මය ද ඵල දහම ද අනුන්ගේ උපදෙසක් නොමැතිවම ප්‍රත්‍යක්ෂ කරන ලද්දෙමි. අවබෝධ කළෙමි. ''මෙසේය'' ''මෙසේ වීලු'' යනාදී වශයෙන් අනුන්ගෙන් අසන ලද ''ඉතිහ'' නම් වූ සැක සංකාවෝ ආර්ය මාර්ගයෙන් සහමුලින්ම නසා දැමුවෙමි. එනිසා කියන ලදී. ''විසුද්ධ වූ පිරිසිඳු වූ ඥාන ඇතියෙම් නිසැකව ම' යන අර්ථ ඇති ''**විසුද්ධඤ්ඤාණෝ නිත්තණ්හෝ**'' එහි සියලුම කිලිටිබව ඇතිකරන දහම් වලින් පිරිසිදුවීම විසුද්ධ ඥාණ නම් වේ. ''**විසුද්ධඤ්ඤාණෝ**'' ''**තවනතිකෙ**'' යනු නුඹ වහන්සේගේ සමීපයේදී. ''**සදත්ථා**'' යනු රහත් භාවයයි. ''**සික්ඛා**'' යන්නෙන් අධි සීල ශික්ෂාදී ශික්ෂා අදහස් කරන ලදී. ''**සුසසූතා**'' පර්‍යාප්ති බහුශ්‍රැතභාවය හා ප්‍රතිවේධ බහුශ්‍රැතභාවය යන බොහෝ ඇසූපිරූ තැන් සම්පූර්ණ වීම් වශයෙන් මනාව අසන ලද්දෙමි. ''තව සාසනෙ'' නුඹවහන්සේගේ අවවාදයෙහි මනාව පිහිටියා වූ මා විසින්. ''**අරියවතා**'' ඉතා පිරිසිඳු ශීලාදී ව්‍රත සමාදන් වූයෙමි. ''**අනේතවාසිම්හි සික්ඛිතෝ**'' නුඹ වහන්සේ සමීපයෙහි බොහෝ කාලයක් වැස නිමවූ බඹසර ඇති ව අතවැසිව අධිසීලාදී ශික්ෂාවන්හි හික්මුනෙමි.

සුමන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.5

''සාධුහි'' යනු ආයුෂ්මත් වඩ්ඪ තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථානා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම සඳහා පින්දහම් රැස්කරමින් අවුත් මේ බුද්ධෝත්පාදයේදී භාරුකච්ඡ නුවර ගහපති පවුලක ඉපිද වඩ්ඪ නමින් ප්‍රකට වූහ. වඩ්ඪ කුඩා කාලයේදීම සසර පිළිබඳව කළකිරුණු ඔහුගේ මව, තම පුතු ඥාතීන්ට පවරා භික්ෂුණී ශාසනයේ පැවිදි වූවාය. විඳසුන් කමටහන් වැඩූ ඕ තොමෝ දිනකින්ම රහත් වූවාය. පසු කලෙකදී සිය පුතු ද නුවණැති බවට පත්ව සිටිනු දුටු ඇය, චේළුදත්ත තෙරුන් සමීපයේ තම පුතු පැවිදි කරවූවාය. පැවිදි වූ වඩ්ඪ තෙරුන් වහන්සේ තෙවළා බුදුදහම් ඉගෙන බහුශ්‍රැත ධර්මකථිකයෙක්ව ගුජා ධුරය පුරමින් සිටියහ. දිනක් හුදකලාවම ඉතා වේගවත්ව ''සිය මව දකිමි''යි භික්ෂූණී අසපුවට වැඩි වඩ්ඪ තෙරුන් දුටු මවු මෙහෙණිය; ''නුඹ කුමක් හෙයින් තනිවම ඉතා වහා මෙහි පැමිණියෙහි ද?''යි චෝදනා කළාය. සිය මව විසින් චෝදිත උන්වහන්සේ ''මම නුදුසුදු දෙයක් කළෙමි''යි සංවේගයට පැමිණි සේක්, තමා වසන වෙහෙරට ගොස් දවල් වසන තැන හිඳ, විඳසුන් වඩා රහත්වූහ. මවගේ අවවාද සම්පත්තිය ප්‍රකාශ කිරීම් වශයෙන් උන්වහන්සේ සිය රහත් බව පළකරමින් මේ ගාථා පහ වදාළහ.

''සාධුහි කිර මෙ මාතා පතොදං උපදංසයී
යසසාහං වචනං සුත්වා අනුසිට්ඨා ජනෙත්තියා''

''ආරද්ධ විරියෝ පහිතත්තෝ පත්තෝ සම්බොධි මුත්තමං
අරහා දක්ඛිණෙය්‍යොමහි නෙවිජ්ජා අමනද්දසෝ''

''ජෙත්වා නමුචිනෝ සෙනං විහරාමි අනාසවෝ
අඤ්ඤතඤ්ඤව බහිද්ධා ච යෙ මෙ විඤ්ඤූ ආසවා''

''සබ්බෙ අසෙසා උච්ඡින්නා නව උපජ්ජරෙ පුන
විසාරදා බෝ භගිනි එතමත්ථං අභාසයී''

අපිහා නූන මයිපි වනථෝ තෙන විජ්ජති
පරියන්තකතං දුක්ඛං අන්තිමොයං සමුස්සයෝ
ජාතිමරණ සංසාරෝ නත්ථිදානි පුනබ්භවෝ'' ති.

මෙහි ''සාධු හි කිර මේ මාතා පතොදං උපදංසයි'' ඒකාන්තයෙන් මගේ මව මනාව අවවාද නම් වූ කෙවිට දැක්වූවාය. ඉන් උත්සාහවත් වූ මම වීර්ය වඩා සිරසින් ප්‍රඥා නම් හිස විද්දෙමි. ප්‍රඥාව අවබෝධ කළෙමි. ''යසසා'' ඒ මාගේ මව විසින් ''සම්බොධිං'' රහත් බව. මෙහි අර්ථය මෙසේ දත යුතුයි. ''අවවාද කරන මවගේ, ඒ අවවාද අනුශාසනා ඇසූ මම ඇරඹූ වීර්ය ඇතිව, උත්සාහයෙන් වාසය කළෙමි, අග්‍රඵලය වූ අර්හත් වූ නිර්වාණාවබෝධය ලැබුවෙමි. එසේම කෙලෙස් දුරලූ බැවින් මම ''අරහා'' අර්හත් වෙමි. පින්කෙතක් වූ බැවින් ''දක්ඛිණෙය්‍යා'' දක්ෂිණාවට සුදුසු වෙමි. පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණ ආදී කොට ඇති ත්‍රිවිද්‍යා අවබෝධකරගත් බැවින් ''තෙවිජ්ජා'' ත්‍රිවිද්‍යා ඇත්තෙමි. නිවණ සාක්ෂාත් කරගත් බැවින් ''අමතද්දසෝ'' නිවන් දුටුවෙමි. කෙලෙස් මර සෙනඟ, කෙලෙස් නම් සතුරන් බෝධිපාක්ෂික ධර්ම නම් සේනාව ලවා නැසුවෙමි. එසේ දිනූ බැවින් ම ආශ්‍රව රහිතව සුවසේ වෙසෙමි.'' දැන් ''අනාසවෝ'' ආශ්‍රව රහිතව වෙසෙමියි කියූ කරුණ අභිඥයින් ප්‍රකට කිරීමට ''අඤ්ඤතනං'' යන ගාථාව වදාළහ. එහි අර්ථය මෙසේය. ''ආධ්‍යාත්මික වූ ද ආධ්‍යාත්මික වස්තූන්හි පිහිටියාවූ ද බාහිර වූ ද බාහිර වස්තූන්හි පිහිටියාවූ ද ඒ ආශ්‍රව සමූහය ම විසින් ආර්ය මාර්ගාවබෝධයට පෙර දිම විද්වංසනය කළෙමි. දුරු කළෙමි. ඒ සියලුම ආශ්‍රව ඉතිරි නොවන සේ ආර්ය මාර්ගයෙන් ම මුලිනුපුටා දැමුවෙමි. ප්‍රහීණ කළෙමි. නැවත කිසිදු ආශ්‍රවයක් නූපදින්නේය. ඇතිනොවන්නේමය. දැන් මවගේ වදන් හෙණ්ඩුවක් මෙන් ගෙන තමා රහත් වූ බැවින් ඒ මවුට ස්තුති කරන තෙරණුවෝ ''විසාරදා'' යන ගාථාව වදාළහ. එහි ''විසාරදා'' ඒකාන්තයෙන්ම පැතිර ගිය නුවණැති, විශාරද වූ, මෙසේ තමා ද මවු ද රහත් වූ හෙයින් තමා දැන් ශාස්තෘන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ බව හඟවනු සඳහා මවට ''නැගණිය'' යනුවෙන් අමතයි. ''එතමත්ථං අභාසි'' මේ මට අවවාද වශයෙන් මේ අර්ථය නුඹ කීවෙහි. මෙසේ මට අවවාද දුන් නුඹ හුදෙක් විශාරද වූ නැනැත්තියක් පමණක් නොවන්නේහි. ඔබතුමිය මාගේ මවුද වන්නිය. මේ අදහසින් කවර ප්‍රයෝජනයක් ද? නුඹ කෙරෙහි කෙලෙස් වනය නැත. අවිද්‍යාදී කෙලෙස් ධර්ම නුඹගේ සන්තානයෙහි නොමැත්තේමය. යම් සිතකින් මා භවක්ෂය කිරීමෙහි යොදවන ලද ද ඒ සිත කෙලෙසුන්ගෙන් මිදුණකි යන අදහසයි. දැනු නුඹ යම් අර්ථයක් සඳහා මා යෙදවුවෙහිද එම අර්ථය මවිසින් ලබන ලදුයි දක්වීමට ''පරියන්තකතං'' යන අවසාන ගාථාව වදාළහ. එහි අර්ථය ඉතා සරලය. එහා වැටහෙන්නේ ය.

වඩිස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.6

''අභාය වත මෙ'' යනු ආයුෂ්මත් නදී කාශ්‍යප තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒ ගාථාවේ උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම සඳහා කුසල් රැස් කරමින් අවුත්, පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. දිනක් ඔහු ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස හැසිරෙනු දක, පහන් සිතින් තමාම සිටවූ අඹ ගසක පළමුව හටගත් රත්සිරියල් පැහැ ඇති එක් අඹ ගෙඩියක් උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී මගධ රට බමුණු පවුලක උරුවේල කාශ්‍යපගේ සොහොයුරා වී උපන්නේය. වැඩිවියට පැමිණි ඔහු ගිහිගෙයින් නික්මීමේ අදහස් ඇතිව ගිහිගේ හැරදමා තවුස් පැවිද්දෙන් පැවිදිව තුන්සීයක් ශිෂ්‍ය තවුසන් පිරිවරාගෙන නේරංජා නදී තෙර අසපුවක් සාදාගෙන විසීය. නදී තෙර විසූ බැවින් ද කාශ්‍යප ගෝත්‍රයේ උපන් බැවින් ද ඔහු **නදී කාශ්‍යප** නමින් ප්‍රකට විය. අප භාග්‍යවතුන් වහන්සේ පිරිවර සහිත වූ ඔහුට ඒහි භික්ෂු මහණ උපසම්පදාව ලබාදුන් සේක. ඒ සියලු තොරතුරු මහා බන්ධකයෙහි දැක්වුණු පරිදි දත යුතුයි. ආදිත්ත පරියාය සූත්‍ර දේශනාව ඇසූ නදී කාශ්‍යප තෙරණුවෝ රහත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ පැවසූහ.

''පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරෙනු දුටු මම, ඒ ලොවට අසහාය නායක වූ නාදී ගුණ ඇත්තා වූ උතුම් යසස් දරන්නා වූ ශාස්තෘන් වහන්සේට අග්‍රඵලයක් පූජා කළෙමි. ඒ පින්කමේ බලයෙන් ශක්‍ර දේවේන්ද්‍රව, ලොවට නායකව, මිනිසුන්ට ප්‍රධානව සැප විඳි මම දැන් ජය පරාජ දෙකම දුරලූ අචල වූ නිර්වාණය අවබෝධ කළෙමි. මීට කල්ප ලක්ෂයකට පෙර දී යම් ඵල දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් දුගතියකට නොගියෙමි. අග්‍රඵල දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවෙහි පිහිටි නදී කාශ්‍යප තෙරණුවෝ, පසුකලෙක තම පිළිවෙත් මඟ සිහිකර බලා මිසදිටු බව මුලිනුපුටා දැමූ බව ප්‍රකාශ කිරීම් වශයෙන් සිය රහත් ඵලාවබෝධය ප්‍රකට කරමින් මේ ගාථා පහ වදාළහ.

''අත්‍රාය වත මේ බුද්ධා නදිං නෙරංජරං අගා
යඤ්ඤාහං ධම්මං සුත්වාන මීඝජාදිධිං විවජ්ජයිං''

''යජිං උච්චාවචේ යඤ්ඤේ අගිහුනතං ජුහිං අහං
එසා සුදධිති මඤ්ඤනෙනා අඤ්ඤහුතෝ පුථුජ්ජනෝ''

''දිධිගහන පකබනෙනා පරාමසෙන මොහිතෝ
අසුදධිං මඤ්ඤිසං සුදධිං අඤ්ඤහුතෝ අවිදදසු''

මීඝජා දිධිං පහිණා මෙ හවා සබබෙ විදාළිතා
ජුහාමි දකඛිණෙය්‍යගගිං, නමඤ්සාමි තථාගතං''

''මොහා සබබෙ පහීණා මෙ, භවතණහා පදාළිතා
විකඛිණෙ ජාතිසංසාරෝ, නත්ථිදානි පුනබභවෝ'' හි.

එහි ''අත්‍රාය වත මේ'' ඒකාන්තයෙන්ම මාගේ හිත වැඩ සඳහා. ''බුදෙධා'' සර්වඥ වූ බුදුරජාණන් වහන්සේ. ''නදිං නෙරංජරං අගා'' නේරංජරා නම් වූ නදියට වැඩම කළහ. ඒ නදී තීරයේ මගේ සෝයුරු උරුවෙල් කාශ්‍යපගේ අසපුවට වැඩම වූහ යන අදහසයි. දැන් ඉහතින් කියූ අර්ථය - යහපත කුමක්දැයි විවරණය කර දක්වනු සඳහා ''යඤ්ඤාහං'' යනාදිය වදාළහ. ''යඤ්ඤ'' යනු යම් ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කෙනෙකුන්ගේ ''ධම්මං සුත්වා'' චතුරාර්ය සත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම ශ්‍රවණයක් අසා, ශ්‍රෝතද්වාර යට (කණට) අරමුණු වී. ''මීඝජාදිධිං විවජ්ජයි'', ''යාගාදී නිරර්ථක දෙයින් සංසාර ශුද්ධිය ලැබෙය''යි ආදී වශයෙන් පැවති විපරීත දැක්ම - අමනෝඥ අදහස් දුරු කළෙමි. ''මීඝජාදිධිං විවජ්ජයි'' කියන ලද අර්ථයම - කරුණම විස්තර කොට දක්වනු සඳහා, ''යජිං'' යන දෙවන ගාථාව වදාළහ. එහි ''යජිං උච්චාවචේ යඤ්ඤේ'' සෝමයාග, වාජපෙය්‍ය දී නානාවිද යාගයන් සිදුකළෙමි. ''අගිහුනතං ජුහිං'' ඒ යාගයන් පැවැත්වීමට, යැදීමට හෝම ද්‍රව්‍යගෙන ගිනි පිදුවෙමි. ''අගිහුනතං ජුහිං'' ඒ යාගයන් පැවත්වීමට, යැදීමට හෝම ද්‍රව්‍යගෙන ගිනි පිදුවෙමි. ''එසා සුදධිති මඤ්ඤනෙනා'' මේ යාග ක්‍රියාවෙන්, ගිනි පිදීමෙන් පිරිසිදුභාවයට කාරණ වූ සංසාරික පාපයන්ගෙන් පිරිසිදුවීම ලැබෙයැයි සිතුවෙමි. ''අඤ්ඤහුතෝ පුථුජ්ජනෝ'' ප්‍රඥා ඇස විකල් වූ හෙයින් අවිද්‍යා අන්ධකාරයෙන් වෙලී අන්ධ වූ පුහුදුන් පුද්ගලයෙක්ව; වන පර්වත ගිරි දුර්ග ගහන වූ මාවතකට පිවිසි අන්ධයෙකු මෙන් මිසදිටුගත් බැවින් හසර නොදැන වල්මත්ව පැකිලෙමින්, වැටෙමින් සිටියෙමි. ''පරමාසෙන'' ධර්ම ස්වභාවය ඉක්මවා

''මේයම් සතෘ වේ'' යැයි දැඩිව ගැනීමෙන් පරාමර්ශනය නම්, මිසදිටු අදහස් දැඩිව ගැනීමෙන් මුලාවූයෙමි. මෝඩකම නිසා පාපී වූ අශුද්ධි මාර්ගය ශුද්ධ-පිරිසිදු මාර්ග යැයි සිතා සිටියෙමි. ඊට හේතු මෙසේ දක්වයි. ''අන්ධභූතෝ අවිද්දසු'' අවිද්‍යාව නිසා අන්ධවූයේ ධර්ම අධර්මද සුදුසු නුසුදුසු දේ ද නොදත් හෙයින්, එසේ මෝඩ සිතුවිලි ඇතිව සිටියෙමි. ''මිච්ඡාදිට්ඨි පහීණා මේ'' මෙසේ විසූ මම ශාස්තෘන් වහන්සේ ගේ ඉදිරියේදී චතුරාර්ය සත්‍යය ගැබ් වූ දහම් දෙසුමක් අසා නුවණින් මෙනෙහි කර ඒ ආයර්ය මාර්ගයෙහි යහපත් දැක්මකින් යුතුව ගමන් කිරීමෙන්, ඒ අනුව පිළිපැදීමෙන් එතෙක් මාගේ සන්තානයේ පැවති සියලුම මිසදිටු අදහස් මුලිනුපුටා දැමුවෙමි. සම්පූර්ණයෙන් ම ප්‍රහීණ කළෙමි. ''භවා'' කාමාදී සියලු භවයෝ ආර්ය මාර්ගය නැමති සැනින් විද්වංසනය කළෙමි. දුරු කළෙමි. ''ජුහාමි දක්ඛිණෙය්‍යග්ගිං'' යාග කිරීම්, ගිනි පිදීම් අත්හැර දෙවියන් සහිත ලෝකයේ අග්‍ර දක්ෂිණාවට සුදුසු වූ බැවින් සියලු පවු දවන-ක්ෂය කරන බැවින් දක්ෂිණෙය්‍යග්ගි වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ පුදමි. පරිචරණය කරමි. ඒ මාගේ දක්ෂිණෙය්‍යග්ගි පරිචරණය පටන් ගැනීමෙන් කන බොන ගිතෙල් ආදී දෙය අපේක්ෂා නොකරමි. එය හුදෙක් ශාස්තෘන් වහන්සේට වන්දනා කිරීම පමණකි. ''නමස්සාමි තථාගතං''. නැතහොත් ''ජුහාමි දක්ඛිණෙය්‍යග්ගිං'' යනු දායකයන්ගේ ආමිෂ දානාදිය මහත්ඵල ඇත්තක් කරන බැවින් ද පව් දහනය කරන බැවින් ද දක්ෂිණාමය ගින්නක් (දක්ෂිණෙය්‍යග්ගියක්) වූ මම යාග කරමි. පූජා කරමි. එසේ කොට හැසිරෙමි. එසේ කොට තමා රැකගනිමි. පවත්වා ගනිමි. පෙර මම ගිනිදෙවියාට නමස්කාර කළෙමි. දැන් තථාගතයන් වහන්සේට නමස්කාර කරමි. ''මොහා සබ්බෙ පහීණා මේ'' දුකෙහි නොදැනීම ආදී ප්‍රභේද ඇති සියලුම ආකාරයේ මෝහය මවිසින් දැන් ප්‍රහීන කරන ලදි. මුලිනුපුටා දමන ලදි. එසේම භවය පිළිබඳ ආශාව (භව තණ්හාව) බිඳ දැමුවෙමි. දෙකඩ කළෙමි. ''විකඛිණෝ ජාති සංසාරෝ'' සසර ඉපදීම ක්ෂය කළෙමි. ''නත්ථිදානි පුනබ්භවෝ'' දැන් පුනර්භවයක් නැත. අවසන් ගාථාවේ මුල් පදයේ එන ''මේ'' (මාගේ - මාහට යන අර්ථ ඇති) ශබ්දය සෙසු පද තුනෙහි ද සුදුසු පරිදි යෙදිය යුතුයි.

නදී කාශ්‍යප ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.7

''පාතෝ මජ්ඣන්හිකං'' යනාදී ගාථා ආයුෂ්මත් ගයා කාශ්‍යප තෙරුන් වහන්සේගේ ය. ඒවා යේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේ දී සසරින් මිදීම සඳහා කුසල් රැස් කරමින් අවුත්, මීට කල්ප තිස් එකකට පෙර සිබි නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි කුලගෙයක උපන්හ. නුවණැති බවට පත් එකුමරු කාම සම්පත් කෙරෙහි නො ඇලුණු බැවින් ගිහිගේ හැර දමා තවුස් පැවිද්දෙන් පැවිදි වී ආරණ්‍යයක ආශ්‍රමයක් කරවාගෙන වනමුල් ඵල වැලින් යැපෙමින් ජීවත් විය. එසමයේ දිනක් භාග්‍යවතුන් වහන්සේ හුදෙකලාවම ඒ අසපුව සමීපයෙන් වැඩම කළහ. තාපස තෙම බුදුරජාණන් වහන්සේ දැක පහන් සිතින් සම්පයට පැමිණ, උන්වහන්සේට වැඳ එකත්පසෙක සිටියේය. කල්වේලා බලා මනහර වූ ඩෙබර ගෙඩි උන්වහන්සේට පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා සැප විඳි හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේදී බමුණු පවුලක ඉපිද වැඩිවියට පත් විය. කාමයෙන් වෙන්වීමේ සිත නිසා ගිහිගේ හැර දැමූ ඔහු තවුස් පැවිද්දෙන් පැවිදිව දෙසීයක් තවුසන් පිරිවරාගෙන ගයාවේ වාසය කළේය. ගයාවේ විසූ බැවින් ද කාශ්‍යප ගෝත්‍රයේ උපන් බැවින් ද ඒ තාපස තුමා ''ගයාකාශ්‍යප'' නාමයෙන් හැඳින්විණි. පිරිස සමඟම අප භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණි හෙතෙම, ඒහි භික්ෂු මහණ උපසම්පදාව ලබා, අනතුරුව ආදිත්ත පරියාය සූත්‍ර දේශනාව අසා රහත් විය.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''එකල්හි අඳුන් දිවිසම් ඇඳි මම දිරාගිය සිවුරු දරමින් තවුස් පිරිකර කද ද ඩෙබර ගෙඩි ද ගෙන තම අසපුවට පැමිණියෙමි. එසමයේ ශ්‍රේෂ්ඨ පුද්ගල වූ අසභාය නායක වූ සිබි බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. හැම කල්හි සිදු වන දේ දක්නා වූ උන්වහන්සේ මාගේ අසපුවට වැඩම කළහ. සිත පහදවා ගත් මම උන්වහන්සේට වැඳ දෝතින්ම ඩෙබර ගෙඩි රැගෙන පූජා කළෙමි. මීට කල්ප තිස් එකකට පෙර දී යම් ඵල දානයක් දුන්නෙම් ද එහි විපාක වශයෙන් මම දුගතියකට නොගියෙමි. ඩෙබර ගෙඩි දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.''

රහත් බවට පත්වූ උන්වහන්සේ තම පිළිවෙත් මග සිහිපත් කර බලා පාපී දිවි පෙවෙත දුර ලූ බව ප්‍රකට කර දක්වමින් සිය රහත් බව ප්‍රකාශ කරනු සඳහා මේ ගාථා පහ වදාළහ.

''පානෝ මජ්ඣන්හිකං සායං නික්ඛන්තුං දිවසසහං
ඔතරිං උදකං සොතං ගයාය ගය ඵග්ගුයා''

''යං මයා පකතං පාපං පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු
තං දානි ඔපවාහෙමි එවං දිට්ඨි පුරෙ අහූ''

''සුත්වා සුභාසිතං වාචං ධම්මත්ථ සහිතං පදං
තථං යථාවකං අත්ථං යොනිසෝ පච්චවෙක්ඛිසං''

''නිණ්හාත සබ්බ පාපොම්හි නිම්මලෝ පයතෝ සුචී
සුද්ධෝ සුද්ධස්ස දායාදෝ පුත්තෝ බුද්ධස්ස ඔරසෝ''

''ඔගය්හාථංගිකං සොතං සබ්බං පාපං පවාහයිං
තිසෙසා විජ්ජා අජ්ඣගමිං, කතං බුද්ධස්ස සාසනං'' ති.

මෙහි පළමු ගාථාවේ 'සංඛිප්ත අර්ථය මෙසේය- ''උදෑසන සූර්යයා උදාවන වේලාවෙහි ද මධ්‍යාහ්න වේලාවෙහි ද සවස සන්ධ්‍යාකාලයෙහි ද යනුවෙන් දිනකට තුන්වරක් බැගින් මම දියෙහි බැස්සෙමි. කිමිදුනෙමි. එසේ කිමිදෙන ම මම එකම තැනක සැමදා නොකිමිදෙමි. ඉක්බිති මම ගයාවේ ''මහජනයාගේ පව් සෝදා හරින්නේයැ''යි සම්මත වූ ගයා තීර්ථයෙහි ''ගයාඵග්ගු'' නම් වූ මැදින් මස උතුරුපල් නැකතෙහි වාර්ෂිකව පැවති ජලයට බැසීම සම්බන්ධ වූ ''උදකෝරෝහන'' උත්සවයෙහි නියුක්ත වූයෙමි. යම් අදහසකින් ඒ දියට බැසීම සිදු කළේ ද ඒ අදහස දක්වනු සඳහා දෙවන ''යං මයා'' යන ගාථාව වදාළහ.

එහි අර්ථ මෙසේය. - පෙර, මේ ආත්මභාවයට මුලින් වූ අන්‍ය ආත්මභාවයන්හිදී මවිසින් සිදුකළ පාප කර්ම, රැස්කළ පව්කම්; දැන් ගයා තීර්ත්‍රයෙහි දී මේ ගයාඵල්ගු නම් දියට බසින උත්සවයේදී සෝදා හරිමි. දුරු කරමි. පහ කරමි. ''පුරේ'' යනු ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාව ඇසීමට පෙර දී. මෙබඳු වැරදි අදහස් - විපරීත දැක්මක් මා හට විය. ''ධම්මත්ථසහිතං පදං'' යනුවෙන් විභක්ති ලොප් නොකර දැක් වූ ධර්ම අර්ථ සහිත වූ ත්‍රිපිටක සද්ධර්මය, මුල මැද අග යන තුන් ස්ථානයම ධර්ම අර්ථ

දෙකින් යුක්ත වූ. මනාව දෙසූ. ඒකාන්තයෙන්ම නිවණ අරමුණු කොට දෙසූ බැවින් සුභාෂිත වූ. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ වදන් අසා, උන්වහන්සේ වදාළ පරමාර්ථ සහිත යථාර්ථ වූ සත්‍ය වූ, සුදු සේ පැවැත්ම - නැවැත්ම - පිළිවෙල ඇති වැරදි ස්වභාව හා හැසිරීම් නැත්තා වූ තත්ත්‍වාකාරයෙන් දුකෙහි ස්වභාවය චතුරාර්ය සත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි කිරීමෙන් පිරිසිඳ දැනීම් වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කළෙමි. ''දුක පිරිසිඳ දන්නේය. සමුදය නම් තණ්හාව ක්ෂය කළ යුතුයි. නිරෝධය - නිවණ ප්‍රත්‍යක්ෂ කළ යුතුයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතුයි.'' මෙසේ නිතර සිහි කළෙමි. නුවණැසින් දුටුවෙමි. අවබෝධ කළෙමි. ''**නිණ්හාන සබ්බපාපොමිහි**'' සෝදා හළ සියලු පව් ඇත්තෙමි යි මෙසේ අවබෝධ කරගත් සත්‍ය ඇති බැවින් ම ආර්ය මාර්ගය නම් ජලයෙන් සෝදාහළ සියලු පවු ඇත්තෙමි. එසේම රාගාදී කිලිටි නැති බැවින් ''**නිම්මලෝ**'' නිර්මල වූ. නිර්මල වූ බැවින් ම ඉතා පිරිසිදු කායික හැසිරීම් ඇති බැවින් ''**පයතෝ**'' පිරිසිදු වූ. ''**සුචි**'' පිරිසිදු වාග් හැසිරීමෙන් ද මනෝ හැසිරීමෙන් ද යුතු මම මෙසේ තිදොරින් ම පාරිශුද්ධ වූයෙමි. පූර්ව පුරුදු සහිත සියලු කෙලෙස් මළ දුරලා ඉතා පිරිසිදු භාවයට පත් වූ භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ලෝකෝත්තර ධර්මය පිළිගෙන ඒ අනුව හැසිරීමෙන්, උන්වහන්සේගේ ධර්මයට දායාද වූයෙමි. ඒ දෙසූ දහම ස්කන්ධාණයෙහි පිහිටුවා, හදවතින් දරා ක්‍රියාත්මක කිරීමෙන් බුදුරදුන්ගේ ඖරස පුත්‍රයෙක් වූයෙමි. නැවත ද තමාගේ පරමාර්ථ වශයෙන් වූ ස්නානයම වැදගත් බව ප්‍රකට කරනු සඳහා ''**ඔගය්හ**'' යන අවසාන ගාථාව වදාළහ. එහි ''**ඔගය්හ**'' යනු බැසගෙන; පිවිස ''**අට්ඨංගික සොතං**'' යහපත් දැක්ම ආදී අංග අටකින් යුතු ආර්ය මාර්ගය නම් වූ ජල පහරට. ''**සබ්බං පාපං පවාහයිං**'' පාප මළ ඉතිරි නොවන සේ සෝදා දැමුවෙමි. ආර්ය මාර්ගය නම් ජලයෙන් පරමාර්ථ වශයෙන් නෑවෙමි. ස්නානය කරන්නෙක් වූයෙමි. එසේම ත්‍රිවිද්‍යාවන්ට පැමිණියෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකෙළෙමි.

ගයා කාශ්‍යප ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.8

''වාත රොගාභිනිනෝ'' යනු ආයුෂ්මත් **චක්කලි** තෙරුන්ගේ ගාථාවන්ය. ඒ්වායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත් **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර, කුලගෙයක උපන්හ. නුවණැති බවට පත් එකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ හමුවට යන උපාසකවරුන් සමඟ විහාරයට ගොස් පිරිස් කෙළවර හිඳ ධර්ම ශ්‍රවණය කළේය. එවිට ශාස්තෘන් වහන්සේ එක් භික්ෂූන් වහන්සේ කෙනෙකුන් සද්ධාමුත්ත තෙරවරුන්ගෙන් අග්‍රභාවයට පත්කරනු දුටු සිටුකුමරු ද එම තනතුර ප්‍රාර්ථනා කළේය. සත් දිනක් බුදුපාමොක් මහ සඟනට මහ දන් දුන් හෙතෙම ඒ සඳහා ප්‍රණිධානය කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ අනාගතය දැන විවරණ දුන් සේක. දිවි ඇති තාක් පින්දහම් සිදුකොට දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරමින් සැප විඳි හෙතෙම, අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන කාලයෙහි බමුණු කුලයේ උපන්නේ ය. **''චක්කලී''** නමින් ප්‍රකට වූ ඔහු නිසිවියට පත්ව ත්‍රිවේදයේ පරතෙරට ගොස්, බමුණු ශිල්ප ශාස්ත්‍රයන් සියල්ල ඉගෙන, ශාස්තෘන් වහන්සේගේ අතිශය ශෝභාසම්පන්න ශරීර ශෝභාව දැකීමෙන් තෘප්තියට පත් නොවී උන්වහන්සේ වෙතම රැඳුණේය. ගිහිගේ විසීමෙන් නිතරම ශාස්තෘන් වහන්සේ දැකීමට නොලැබෙයැයි සිතූ ඔහු ශාස්තෘන් වහන්සේ ලඟ පැවිදි වී, ආහාර ගන්නා වේලාවෙහි හැර සෙසු මුළු කාලයම යම් තැනෙක හිඳ දසබලයන් වහන්සේ මනාව දැක බලා ගත හැකිවන්නේ ද එබඳු තැන් වලම හිඳිමින්, වෙනත් සෑම කටයුත්තක්ම බැහැර ලා, බුදුකය දෙස බලමින්ම වාසය කළේය. මෙසේ විසූ චක්කලී තෙරුන්ගේ ඤාණයේ මුහුකුරා යෑම බලමින් බුදුරජාණන් වහන්සේ ද කිසිවක් නොපවසා සිටි සේක. සුදුසු අවස්ථාවෙහි දී දිනක් ''චක්කලිය! මේ කුණු කය දැකීමෙන් කවර ප්‍රයෝජනයක් ද? චක්කලිය! යමෙක් දහම් දකින්නේ ද ඔහු මා දකින්නේ ය. යමෙක් මා දකින්නේ ද ඔහු ධර්මය දකින්නේය. ''චක්කලිය! ධර්මය නිසි පරිදි වටහාගන්නාම මා දකින්නේය. මා නිවැරදිව දකින්නා දහම දකින්නේය''යි වදාළහ. ශාස්තෘන් වහන්සේ මෙසේ දෙසූවත් චක්කලී තෙරුන් උන්වහන්සේගේ දර්ශනයෙන් වෙන්ව වෙනතක යෑමට, ඉවතට යෑමට අසමත් විය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ''මේ භික්ෂුව සංවේගයට පත් නොවී සත්‍ය අවබෝධ කර නොගන්නේයැ''යි දැන එස් එළඹෙන දිනයෙහි ''චක්කලී, මෙතැනින් ඉවත්ව යන්නැයි'' වදාරා ශ්‍රී හස්තය දිගු කළ සේක. ශාස්තෘන් වහන්සේ විසින් බැහැර කරන ලද චක්කලී තෙරුන්, උන්වහන්සේ

ඉදිරියෙහි සිටීමට අසමත්ව, ''ශාස්තෘන් වහන්සේ දක්නට නොලැබෙන මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද?''යි සිතා ගිජුකුළු පවුවෙහි ප්‍රපාතස්ථානයට නැංගේය. ශාස්තෘන් වහන්සේ එහිමියන්ගේ එම හැසිරීම දැක, ''මේ භික්ෂුව මාගේ සමීපයේදී පිහිටක් නොලැබ දැන් මාර්ගඵලාවබෝධයට ඇති හේතු සම්පත් ද නසා ගන්නේ ය''යි තමන් වහන්සේ දැක්වීමට ආලෝකයක් විහිදුවා

''පාමොජ්ජබහුලෝ භික්ඛු පසන්නෝ බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං සංඛාරූපසමං සුඛං'' ති.

''බුදුසසුනේ පැහැදුණු සිත් ඇති ප්‍රමෝදයෙන් - සතුටින් යුක්ත භික්ෂුව ශාන්ත වූ නිර්වාණපදය අවබෝධ කරගන්නේ ය. සංස්කාරයන්ගේ සන්සිඳීම සැපයකි.''

යන ගාථාව වදාරා, ''එන්න, චක්කලී''යි ශ්‍රී හස්තය දිගු කළසේක. තෙරණුවෝ ''දසබලයන් වහන්සේ මා දැක ඇත. එන්න යැයි මා හට පැවසූ සේක''යි බලවත් ප්‍රීතියට සතුටට පැමිණියහ. ''කොහි යන්නේද?''යි තමාගේ ගමන පිළිබඳව අමතක වූ චක්කලී හිමි භාග්‍යවතුන් වහන්සේ දෙස බලාගෙනම අහසට පැන්නේය. එක පයක් පර්වතයේ පිහිටා තිබියදීම ශාස්තෘන් වහන්සේ වදාළ ගාථාව ආවර්ජනය කරමින් සිටි චක්කලී හිමියෝ අහසේදීම ප්‍රීතිය මැඩ පවත්වාගෙන, සිවුපිළිසිඹියා පත් මහරහත් බවට පත් වූ සේක. මෙසේ අංගුත්තර අටුවාවේ ද ධම්මපද වර්ණනාවේද පැවසෙන නමුත් මේ ථේරගාථා අටුවාවෙහි මෙසේ පැවසේ.

''චක්කලිය! මේ ශරීරය දැකීමෙන් කවර ප්‍රයෝජනයක් ද?''යි ආදී වශයෙන් ශාස්තෘන් වහන්සේ අවවාද දුන් කල්හි, ගිජුකුළු පවුවෙහි වෙසෙමින් චක්කලී තෙරණුවෝ විදසුන් භාවනාව වැඩූහ. උන්වහන්සේගේ සිතේ ශ්‍රද්ධාව ඉතා බලවත් බැවින් නිසි සේ සිත විදසුන් වීථියට නො බසී. නො වැටේ. එකරුණ දුටු භාග්‍යවතුන් වහන්සේ නැවත කමටහන පිරිසිඳු කර දුන් සේක. නැවතද විදසුන් භාවනාව මස්තක ප්‍රාප්ත කරගැනීමට නො හැකිවූයේම ය. ඉක්බිති උන්වහන්සේට ආහාර විපරිතවීමෙන් වාතාබාධයක් උපන්නේ ය. චක්කලී හිමියන් වාතාබාධයෙන් පෙළෙනු දුටු භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩමවා ඒ පිළිබඳව මෙසේ විමසූ සේක.

''වාතරොගාභිනීතෝ ත්වං විහරං කානනෙ වනෙ
පවිට්ඨ ගොචරෙ ඒඛෙ කච්චං භික්ඛු කරිස්සසී'' ති.

එය ඇසූ තෙරණුවෝ ඊට පිළිතුරු ලෙස මේ ගාථා සතර වදාළහ.

''පීති සුඛෙන විපුලෙන ඵරමානො සමුස්සයං
ඒඛමපි අබ්භිසමෙහානෙනා විහරිස්සාමි කානනෙ

''භාවෙනෙනා සතිපට්ඨානෙ ඉන්ද්‍රියානි බලානි ච
බොජ්ඣඞ්ගානි ච භාවෙනෙනා විහරිස්සාමි කානනෙ''

''ආරද්ධවිරියො පහිතත්තො නිච්චං දළ්හ පරක්කමො
සමගෙ සහිතෙ දිස්වා විහරිස්සාමි කානනෙ''

''අනුස්සරනෙනා සම්බුද්ධං අගඟං දනනං සමාහිතං
අතන්දිතො රත්තිංදිවං විහරිස්සාමි කානනෙ'' ති.

මෙහි ''වාතරොගාභිනීතො'' වාතාබාධයෙන් පෙළී ශරීරය තමාට අවසඟභාවයට පත් වූයෙහි ද? වාත රෝගයෙන් පීඩිත වූයෙහි ද? ''**කඵං**'' යනුවෙන් තෙරුන්ට ආමන්ත්‍රණය කරයි. ''**විහරං**'' ඒ ඒ ඉරියවු පවත්වමින් වාසය කරමින් ''**කානනෙ වනෙ**'' කැලෑවක් වූ වනයෙහි. මහා වනයක් යන අරුතයි. ''**පවිට්ඨගොචරෙ**'' හැර දැමූ ගොදුරු ඇති, දුලබ වූ ප්‍රත්‍ය ඇති, වාතරෝගයට සුදුසු වූ ගිතෙල් ආදී බෙහෙත් නොමැති බැවින් ද කර්කශ භූමිභාගයක සිටින බැවින් ද රූක්ෂ වූ රළු ස්ථානයක. ''**කථං භික්ඛු කරිස්ස සී**'', ''මහණ නුඹ කෙසේ වෙසෙන්නේ ද?''යි භාග්‍යවතුන් වහන්සේ විමසූ සේක. මෙය ඇසූ තෙරණුවෝ නිරාමිස ප්‍රීති සොම්නසින් යුක්ත වූවාහු, තමා විඳින සැප විහරණය ප්‍රකාශ කරනු සඳහා ''**පීතිසුඛෙන**'' යන ගාථා සතර වදාළහ. **පීති සුඛෙන** උද්වේග ලක්ෂණයෙන් ද පැතිරයන ලක්ෂණයෙන් ද යුතු ප්‍රීතිමය සුවයෙන් යුක්ත වූ. ''**විපුලෙන**'' මහත් වූ. ''**ඵරමානො සමුස්සයං**'' ඉහත කියූ පරිදිම ප්‍රීතිසුවයෙන් යුක්තව, ප්‍රණීත වූ රූපයෙන් මුළු කයම පතුරුවමින්, නිරන්තරව ඒ සුවය ස්පර්ශ කරමින්, ''**ඒඛම්හි අභිසමෙහානෙනා**'' අරණ්‍යයෙහි විසීමෙන් හටගත් සැහැල්ලු පැවැත්ම නිසා ඉවසිය නොහැකි, ප්‍රත්‍යයන්ගේ රූක්ෂ බව අභිභවනය කරමින්, ඉවසමින්. ''**විහරිස්සාමි කානනෙ**'' ධ්‍යාන සුවයෙන් ද විදසුන් සුවයෙන් ද අරණ්‍යයෙහි වෙසෙන්නෙමි යන අර්ථයයි. එනිසා ''කායික සුවය ද වින්දනය කළෙමි''යි කියන ලදී.

''යතො යතො සම්මසති බන්ධානං උදයබ්බයං
ලහති පීතිපාමොජ්ජං අමතං තං විජානතං'' ති.

ස්කන්ධයන්ගේ ඉපදීම හා නැතිවීම යම් යම් තැනකදී සන්සිඳේ ද ඒ ඒ උතුම් නිවණ අවබෝධ කරගත් නැනැත්තා අතිශය ප්‍රීති ප්‍රමෝදයක් අත් විඳියි.

''භාවෙනෙනා සතිපට්ඨානෙ'' ආර්ය මාර්ගයට ඇතුලත් වන කායානුපස්සනාව ආදී සතර සතිපට්ඨානයන් වඩමින් ද ''**ඉන්ද්‍රියානි**'' ආර්ය මාර්ගයට ඇතුලත් වූ මම ශ්‍රද්ධාදී පඤ්ච ඉන්ද්‍රියන් ද ''**බලානි**'' එසේම ශ්‍රද්ධා දී බල පස ද ''**බොජ්ඣංගානි**'' සති සම්බොජ්ඣංගය ප්‍රධාන වූ සත් බොජ්ඣංග දහම් ද, ''ච'' කාරයෙන්, සමුච්චාර්ථයේ නිපාතයෙන් සම්‍යක් ප්‍රධාන, ඉර්ධිපාද, මාර්ගාංග ද අදහස් කරයි. චකාරය යෙදීමෙන් ඒ සියලුම ධර්මතාවෝ ම අදහස කරන ලද්දේමය. ''**විහරිස්සාමි**'' ඉහත විස්තර කළ අයුරින් ම බෝධිපාක්ෂික ධර්ම වඩමින් ආර්ය මාර්ග සුවයෙන් ද එම දහම් අවබෝධයෙන් ජනිත ඵල සුවයෙන් ද නිවන් සුවයෙන් ද වාසය කරන්නෙමි. ''**ආරද්ධවිරියෝ**'' සිවුවැදෑරුම් යහපත් වීර්යයෙන් (සම්මා වායාම) උත්සාහයෙන්, ඇරඹූ වීර්යයෙන්, නිවණ ලබාගැනීම දක්වා ම මෙහෙය වූ වීර්ය සහගත සිතින්, ''**නිච්චං දළ්හ පරක්කමෝ**'' සියලු කාලයේ ම ලිහිල් නොවූ වීර්යයෙන් යුතුව, විවාද නොකර කායික, වාචසික සමඟි භාවයෙන් දෘෂ්ටි, සීල ආදියෙන් සමාන වූ සබ්‍රහ්මචාරීන් සමඟ විසීමෙන්, මෙහිදී කල්‍යාණ මිත්‍ර සම්පත්තිය දක්වයි. ''**අනුස්සරනෙනා සම්බුද්ධං**'' තමන් වහන්සේම සියලු දහම් මනාව අවබෝධ කරගත් බැවින් ද සියලු සත්ත්වයන්ටම උතුම්, අග්‍ර වන බැවින් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ දමනයෙන් දමුණු, අනුත්තර වූ සමාධියෙන් සන්සිඳුණු සිතැතිව, අප්‍රමාදිව අනලස්ව රෑ දාවල් සැම කල්හි ''ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය....'' ආදී වශයෙන් නව අරහාදී බුදුගුණ සිහි කරමින් වාසය කරන්නෙමි. මේ බුද්ධානුස්සති භාවනාවෙන් තමන්වහන්සේ වඩන ලද සියලුම භාවනා කමටහන් දක්වන ලදී. රහත්වීමට පෙර සම්පූර්ණ කරන ලද කමටහන් පිළිබඳව අදහස් කරන ලදී. මෙසේ වදාළ චක්කලී තෙරණුවෝ විදසුනෙහි සිත පිහිටුවා රහත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''මෙයින් කල්ප ලක්ෂයකට පෙර ලෝකනායක වූ අනෝම නම් අපමණ ගුණ ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේගේ මුහුණ පියුමක් බඳු, පියුමක් සේ නිමල වූ ඉතා යහපත් සිවියක් ඇත. ජලයේ නොගැටෙන පියුම මෙන් එතුමෝ ලෝකයා සමඟ නො ගැටෙති. වීර වූ උන්වහන්සේට පියුම් පෙති බඳු ඇස් ඇත. පියුමක්

මෙන් ඒ ඇස් කාන්තිමත්ය. උතුම් පියුම් මෙන් උන්වහන්සේගේ ශරීරයෙන් සුවඳ හමයි. එනිසා උන්වහන්සේ පදුමුත්තර නම් වන සේක.

ලෝකජ්‍යෙෂ්ඨ වූ මාන රහිත වූ අඤ්ඤයන්ට ඇසක් වැනි වූ ශාන්ත වූ ගුණයන්ට නිධාන වූ කුළුණු නැණ සයුරක් වැනි වූ බඹසුර අසුරයන් විසින් පිදුවා වූ දෙවි-මිනිසුන් විසින් පිරිවරා ගත්තා වූ අතිඋත්තම මහාවීර වූ ඒ බුදුරජාණෝ; කිසියම් දිනෙක ජනමධ්‍යයේ හිඳ සුවඳවත් මුවින් මිහිරි වූ හඬින් සියලු පිරිස අමතා සිය ශ්‍රාවකයෙකු මෙසේ වර්ණනා කළ සේක.

''ශ්‍රද්ධාව පිහිටි සිතැති මනා නුවණැති මා දැකීමෙහි ලොල් වූ මේ වක්කලී භික්ෂුව බඳු අන් භික්ෂුවක් මාගේ සසුනෙහි නැත.

එකල මම හංසවතී නුවර බමුණු පුතෙකු ව සිට ඒ වචන අසා එම තනතුර ලැබීමට ආශා කළෙමි. එකල්හි ශ්‍රාවක සංඝයා සහිත ඒ නිර්මල බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට සතියක් සිවුපසයෙන් උපස්ථාන කළෙමි. උන්වහන්සේගේ අනන්ත වූ ගුණ සයුරෙහි සිරසින් වැටී ගිලී ප්‍රීතියෙන් සම්පූර්ණව මේ වදන් පැවසුවෙමි.

''මුනීන්‍ද්‍රයන් වහන්ස! මෙයින් සත්වන දිනයේ යම් භික්ෂුවක් සැදැහැ ඇත්තන්ට අග්‍රයයි ඔබවහන්සේ විසින් පසස්නා ලද සේක් ද මම ද එබඳු භික්ෂුවක් වන්නෙමි.''

මාගේ ඒ වදන් ඇසූ අනාවරණ ඥාන දර්ශන ඇති, මහාවීර වූ බුදුරජාණෝ පිරිස මැද හිඳ මෙසේ වදාළහ. ''රන්වන් පූන නූලක් දෑරූ සිරුරු ඇති ජනයාගේ නෙත් සිත් ඇද ගන්නා වූ කසාවත් හැඳි මේ මානවකයා දෙස බලවු. මෙතෙම මතුයෙහි ගෞතම බුදුසසුනේ ශ්‍රද්ධාධිමුත්තයන්ට අග්‍ර වූ ශ්‍රාවකයා වන්නේ ය. ''දෙවි ව- මිනිස්ව සියලු සන්තාපයන්ගෙන් දුරුව හැම භෝග සම්පත්තියක්ම විඳිමින් සුවපත්ව සසර සැරිසරන්නේය. මීට කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්මයේ දායාද වූ ධර්මයෙන් නිර්මිත වූ ඖරස පුත්‍ර වූ මෙතෙම වක්කලී නම් ශාස්තෘ ශ්‍රාවකයා වන්නේය.''

ඒ කර්ම විශේෂය නිසා ද චිත්ත ප්‍රණිධිය නිසා ද මිනිස් සිරුර හැර දැමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. සියලු තන්හි සැප විඳිමින් කුඩා මහත් භවයන්හි සැරිසැරූ මම සැවැත් නුවර එක් කුලයක උපන්නෙමි.

වෙඬරු මෙන් සියුමැලි වූ අශෝක දළු මෙන් මුදු මොළොක් වූ ළදරු උඩුකුරුවට හෝනා වූ මම එක් පිසාචියක් දැක බියවුනෙමි. දුකට පත් සිතැති මගේ මාපියෝ ''තථාගතයන් වහන්ස, ඔබවහන්සේට මේ දරුවා දෙන්නෙමු. නායකයාණෙනි! මොහුට පිහිටවනු මැනවැ''යි පවසා බුදුරදුන්ගේ පාමුල මා තැබූහ. එවිට බියට පත් වූවන්ට පිහිට වන්නා වූ ඒ බුදුපියාණෝ ජාලාංගුලි ඇති සක්කුණින් හෙබියා වූ මුදු මොළොක් හස්තයෙන් මා පිළිගත්හ. මම එතැන් පටන් වෙනත් කෙනෙකු විසින් නොරැකිය යුතු වූ තථාගතයන් විසින් ආරක්ෂිත වූයෙමි සියලු සතුරන්ගෙන් මිදී සුවසේ වැඩුනෙමි. මොහොතක් හෝ බුදුරදුන්ගෙන් වෙන්ව විසීම නො ඉවසූවෙමි. උපතින් සත් හැවිරිදි වූ මම බුදුසසුනේ පැවිදි වූයෙමි.

සියලු පාරමිතා බලයෙන් හටගත්, උතුම් වූ ශ්‍රී සම්පත්තියට වාසස්ථාන වූ, වර්ණාදියෙන් සියලු ආකාරයෙන්ම ශුභ වූ බුදුරජාණන් වහන්සේගේ රූපයෙහි ඇලුණු සිත් ඇති මම එය දැකීමෙහි ම ලොල් වූයෙමි. එසේ ආසක්ත වූ මා දුටු කෙලෙස් දිනූ බුදුරජාණෝ, ''චක්කලිය, කම් නැත. බාලයන් තුටුවන්නා වූ රූපයෙහි ඇලෙන්නේ කිම?''යි මා හට අවවාද කළ සේක. ''යමෙක් සදහම් දක්නේ ද ඒ නුවණැති පුරුෂයා මා දක්නේය. සදහම් නොදක්නා මා දුටුවත් නොදුටු නැත්තෙක්මය. රූප කය අපමණ දොස් ඇත්තකි. විෂ වෘක්ෂයක් බඳුය. සියලු රෝගයන්ට නිවාසයෙකි. හුදෙක් දුක් පිඬකි. එබැවින් රූපයෙහි කළකිරී ස්කන්ධයන්ගේ ඇතිවීම නැතිවීම දෙස බලව! එවිට නුඹ සියලු කෙලෙසුන්ගෙන් අන්තයට සුවසේ පැමිණෙන්නෙහි ය.''

මෙසේ හිත වැඩ සලසන ලෝකනායකයන් වහන්සේගේ අනුශාසනාව ඇසූ මම ගිජුකුළු පවුවට නැගී ගිරිකඳුරෙහි සිට බුදුරුව නොදැකීමේ වියෝගයෙන් පෙළුනෙමි, මැරෙන්නට සිතුවෙමි. ඒ පස්මරුන් දිනූ බුදුහු කඳුබෑවුමෙහි පෙනී සිට 'චක්කලී'' යැයි මා ඇමතූහ. එවදින් ඇසූ මම සතුටුව, නොයෙක් සිය ගණන් පුරුෂ ප්‍රමාණයන්ගෙන් ගැඹුරු වූ පර්වත ප්‍රපාතයට පැන්නෙමි. බුද්ධානුභාවයෙන් සුවසේ ම මම පොළොවට වැටුනෙමි. නැවතත් ඒ බුදුරජාණෝ මාහට ස්කන්ධයන්ගේ ඇතිවීම-නැතිවීම පිළිබඳව දහම් දෙසූහ. ඒ දහමට සිත යොමු කළ මම රහත් වූයෙමි. එසේ නිවන් දුටු, මරණයේ කෙළවර දුටු මහා ප්‍රාඥයන් වහන්සේ බලවත් සැදහැ ඇති භික්ෂූන්ගෙන් අග්‍ර භාවයට මා පත්කළ සේක. මීට කල්ප ලක්ෂයකට පෙරදී යම් කුශල කර්මයක් සිදුකෙළෙම් ද එතැන් පටන් අද දක්වා දුගතියකට නොපැමිණියෙමි. මේ බුද්ධ පූජාවේ විපාකයයි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වක්කලී තෙරණුවෝ සිය රහත් බව ප්‍රකාශ කිරීම සඳහා ඉහත දැක්වූ ගාථා පහ නැවත වදාළහ. ඉක්බිති භික්ෂු මහා සංඝරත්නය මැද සිටි බුදුපියාණන් වහන්සේ, බලවත් සැදහැ ඇති භික්ෂූන්ගෙන් අග්‍රභාවයට වක්කලී තෙරණුවෝ පත් කළහ.

වක්කලී තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.9

''ඔලඟෙසසාමි'' යනු ආයුෂ්මත් **විජිත සේන** තෙරුන්ගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් දහම් රැස්කරමින් පැමිණ, අතීදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී කුලගෙයක ඉපිද නුවණැති බවට පත්වූහ. ගිහි ගේ හැර දැමූ ඒ කුල කුමරු සෘෂි පැවිද්දෙන් පැවිදිව අරණ්‍යයෙහි වෙසේ. දිනක් අහසින් වැඩම කරන භාග්‍යවතුන් වහන්සේ දුටු හෙතෙම සිත පහදවාගෙන ඇඳිලි බැඳ වැඳගෙන සිටියේය. ඔහුගේ අදහස් දුටු තථාගතයෝ අහසින් බැස ඔහු ඉදිරියේ වැඩහුන්හ. එවිට ඒ තවුසා රසවත් පළතුරු උන්වහන්සේට පිළිගැන්වීය. එම දානය පිළිගත් බුදුපියාණෝ ඔහුට පුණ්‍යානුමෝදනා කළහ. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැප විඳිමින් සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී කොසොල් රට ඇතුන් මෙහෙයවන කුලයක ඉපිද **විජිතසේන** නමින් ප්‍රකටව නුවණැති බවට පත්විය. ඔහුගේ මාමාවරු වූ සේන හා උපසේන යන හස්තාචාරීහු දෙදෙන ශාස්තෘන් වහන්සේ වෙතින් ධර්ම ශ්‍රවණය කිරීමෙන් ලැබූ ශ්‍රද්ධාව නිසා සසුනේ පැවිදි වූහ. ඔවුහු පැවිදිව විදර්ශන ධුරය පිරීමෙන් රහත් බවට පැමිණියහ. විජිතසේන ද හස්ති ශිල්පයේ කෙළවරට ගොස්, කාමුක සම්පත් කෙරෙහි ඇල්මක් නොවූ බැවින් ගිහිගේ හැර දමා, ශාස්තෘන් වහන්සේගේ යමාමහ පෙළහර දැකීමෙන් උපන් ශ්‍රද්ධාව නිසා මාමාවරුන් වූ තෙරුන් වහන්සේලාගේ සමීපයේ පැවිදි විය. උන්වහන්සේලාගේ අවවාද අනුශාසනා අනුව විදසුන් කමටහන වැඩූ විජිතසේන හිමියෝ බාහිර විවිධ අරමුණු වෙත දිවයන තම සිතට අවවාද කරමින් මෙම ගාථා පහ වදාළහ.

''ඔලගෙසසාමි තෙ චිත්ත ආණිදවාරෙව හත්ථිනං
න තං පාපෙ නියොජෙසසං කාමජාල සරීරජ

තවං ඔලගෙහා න ගඤ්ඡිසි දවාරච්චරං ගජොව අලහනෙතා
න ච චිත්තකලී පුනපපුනං පසහං පාපරතො චරිසසසි

යථා කුඤ්ජරං අදනතං නවගහනං අංකුසගහනො
බලවා ආවතෙතති අකාමං, එවං ආවතතයිසසං තං

යථා වරහයදමකුසලො සාරථිපවරෝ දමෙති ආජඤ්ඤං
එවං දමයිසසං තං පතිටඨිතො පඤ්ඤබබලෙසු

සතියා තං නිබනධිසසං පයතතෙතා වො දමෙසසාමි
විරිය ධුරනිගහගහීතො නයිතො දූරං ගමිසසසෙ චිත්තා'' ති.

එහි ''ඔලගෙසසාමි'' සංවර කරගන්නෙමි. වළකන්නෙමි. ''තෙ'' ඒ. මෙහි කර්ම විභක්ති අර්ථයේ ඡට්ඨී විභක්තිය යෙදී ඇත. ''ඒ මාර්ගයෙන්'' යන අදහසයි. ''හත්ථිනං'' ඇතෙකු යන අර්ථයයි. ''චිත්තා'' තමාගේ සිතට ආමන්ත්‍රණය කරයි. යමකින් එය වළකනු කැමැත්තේද ඒ දෙය දක්වමින් ''ආණිදවාරෙව හත්ථිනං'' යනුවෙන් කියන ලදී. ආණි ද්වාරය නම් මහාප්‍රාකාරයකින් වටකළ නගරයේ ඇතුලට යා හැකි කුඩා දොරයි. එකට බැඳි සිදුරු ඇති කුරු බිලියෙහි දැමූ කල්හි එහි ඇතුලේ වූවන්ට උත්සාහයෙන් තොරව පිටතට පැමිණීමට නොහැක. මනුෂ්‍ය, ගව, මහිෂාදීන්ට ඉන් පිටවීමට නොහැක. නගරයෙන් පිටතට නික්මෙණු කැමති වූ ඇතා, කුරුබිලයට පොළඹවන හස්ත්‍යාචාරීහු උඟගේ ගමන වලක්වති. නැතිනම් ආණිද්වාර යනු දොර පොලු සහිත දොරයි. එහි හරහට දොර පොලු දමා, ගස් කුරු වලින් කරන ලද, බාධා සහිත දොර ''පාපෙ'' රූපාදී අරමුණු කෙරෙහි ඇතිවන දැඩි ලෝභ ආදී පාප ධර්මයන්හි. ඒ පවිටු සිත්වලින් සිත වළක්වමි. ඒ සිත් නොවඩමි. ''කාමජාලා'' කාමය දැලක් බඳුය. මසුන්, මුවන් බඳිනු ලබන්නේ දැලෙනි. සිහිකල්පනාවෙන් තොරවූ මත්ස්‍යාදීහු දැලේ බැඳී වැනසෙන්නාක් මෙන් අනුවණින් සිත යොමුකිරීම නිසා ඒ පාපී සිත මාරයාගේ කැමැත්ත ඉටුකරයි. මරු වසඟ වේ. එනිසා එබඳු සත්ත්වයෝ වැනසීමට දුකට පත්වෙති. ''සරීරජා'' ශරීරයෙන් උපදින පඤ්චවෝකාර භවයන්හි සත්වයන්ගේ (කාමාවචර භූමි එකොළොස හා රූපාවචර භූමි පසළොස යන විසිනය භූමිය) සිත රූපය හා බැඳී පවතියි. එනිසා ශරීරජ නම් වේ. ''ඔලගෙහා න ගඤ්ඡිසි'' එම්බා, කාලකණ්ණි සිත! ම විසින් සිහිය නම් කෙවිටෙන්, ප්‍රඥාව නම් අංකුසයෙන් වළක්වන ලද නුඹ දැන් තමාට

රිසි සේ නොමහැසිරෙන්නෙහි. අනුවණින් මෙනෙහි කිරීම් වශයෙන් කැමති සේ පැවතීමට, සිටීමට ඉඩ නො ලබන්නෙහිය. ඒ කෙසේ ද? දොරටුවෙන් නික්මීමට නොහැකි ඇතෙකු මෙනි. නගරයෙන් පිටතට නික්ම යෑමට දොරටුව විවෘත කරගත නොහැකි ඇතෙකු මෙනි. ''**චිත්තකලී**'' යනු කාලකණ්ණි සිත. ''**පුනප්පුනං**'' නැවත නැවත. ''**පසහං**'' සරහ නම් මුව සමුහයා නපුරු ක්‍රියා ඉවසන්නාක් මෙන් පාපයේ ඇලී, පවිටු ක්‍රියාවල යෙදෙමින් පෙර මෙන් නො හැසිරෙන්නෙහිය. එසේ හැසිරීට ඉඩ නොදෙමි. යන අර්ථයයි. ''**අදන්තං**'' දමනය නොවූ, හස්ති ශික්ෂණයෙන් නොහික්මුණු. නවගහඹං අලුත අල්වාගත්, ''**අංකුසග්ගහො**'' ඇත්ගොවුවා. ''**බලවා**'' කාය බලයෙන් ද ඤාණ බලයෙන් ද බලවත් වූ. ''**ආවත්තෙතනි අකාමං**'' නොකැමතිවම, සේවනය නොකිරීමෙන් වලකයි. ''**එවං ආවත්තයිස්සං**'' ඉහත කියූ පරිදි ඇත්ගොවුවා ඇතා හසුරුවන්නාක් මෙන්, එම්බා කාලකණ්ණි සිත! මම ද නුඹ දුශ්චරිතයෙන් වළක්වමි. ''**වරහයදම කුසලො**'' උතුම් වූ අශ්ව දමනයෙන්, අසුන් දමනයට දක්ෂ වූ, එසේම උතුම් රියැදුරෙක් වූ, අශ්ව දමනයෙහි ප්‍රකට වූ අස්ගොවුවකු දේශකාලානුරූපී වූ මෘදු පරුෂ වදනින් අශ්වයන් දමනය කරයි. හික්මවයි. වැරදි දෙයින් වළක්වයි. මෙසේ ඔහු අජානීය අශ්වයින් හික්මවයි. ''**පතිට්ඨිතො පඤ්චබලෙසු**'' ශ්‍රද්ධාදී පඤ්ච බලයන්හි මනාව පිහිටා, අශ්‍රද්ධාවාදී දෙයින් සිත වළක්වමින් දමනය කරන්නෙමි. ''**සතියා තං නිබන්ධිස්සං**'' ගොදුරු ගැනීම් ආදිය සඳහා පිටත යෑමට නොදී සිහිය නම් යොතින් කමටහන් නම් ටැඹෙහි නුඹ තබා බඳින්නෙමි. නුඹ එහි යොදවන්නෙමි. ''**පයතන්තො වොදපෙස්සාමි**'' එහි බැඳ තැබීමෙන්ම, සිහියෙන් කමටහනෙහි සිත යෙදවීමෙන්ම සිත පිරිසිදු කරන්නෙමි. කිලිටි පාප දහම්වලින් සිත පවිත්‍ර කරන්නෙමි. ''**විරියධුර නිගහිතො**'' ඉහත කී අයුරින් දක්ෂ වූ අශ්වයන් දමනය කරන්නකු විසින් වියදණ්ඩෙහි යෙදූ, මනාව හික්මවූ වියදඬු අතරෙහි හුන් අශ්වයා සකසා - මැනවින් කටයුතු කරන්නේ ය. අන් අයුරකින් පැවතීමට ඉඩ නොලබන්නේය. ගොදුරු ගැනීමට ඉන් බැහැරට නො යන්නේ ය. එමෙන් භාවනා කමටහනෙහිම යෙදුණ සිතට ඒ කමටහනින් බැහැර වූ ආසන්න වූ ලක්ෂණය පවා ඉතා දුරවූවක් ම ැ මෙසේ සිත දමනය කරගනිමින්, තම සිතට නිග්‍රහ කළ තෙරණුවෝ විදසුන් වඩා රහත්ඵලයට පත්වූහ.

අපදාන පාළියේදී විජිතසේන තෙරණුවෝ මෙසේ වදාළහ.

''මහවන හිසින් වඩින්නා වූ උතුම් වූ දෙතිස් මහ පුරිස් ලකුණින් හෙබියාවූ පිපුණු සල් රුකක් බඳු රන්වන් වූ සම්බුදුරජාණන් වහන්සේ දුටු මම, තණ ඇතිරියක් පනවා උන්වහන්සේට ආරාධනා කළෙමි. ''බුදුරජාණන්

වහන්ස! මට අනුකම්පා කරන්වා! භික්ෂාව දෙන්නට කැමැත්තෙමි. එය පිළිගනිත්වා!''යි පැවසූ මාගේ වදන් ඇසූ, කාරුණික ලෝකයාට අනුකම්පා කරන, මහත් යසස් ඇති අපරිමිත බුදුහු මාගේ අදහස දැන, අහසින් වැඩමවා තණ ඇතිරියෙහි වැඩහුන් සේක. බුදුළඟෙඩි රැගත් මම උන්වහන්සේට ඒවා පිදුවෙමි. මා බලා සිටියදීම මගේ සැක දුරුකරමින් බුදුහු ඒවා වැළඳූහ. සිත පැහැද වූ මම බුදුරදුන්ට වැන්දෙමි. එදා මීට කලප දහ අටකට පෙර යම් ඵල දානයක් පැවත්වූයෙම් ද එහි විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. ඵල දානයේ විපාකය මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් තෙරණුවෝ ඒ බව ප්‍රකාශ කරමින් ද මෙම ගාථා පහම නැවත වදාළහ.

විජිතසේන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.10

''උපාරම්භ චිත්තෝ'' යනු ආයුෂ්මත් **යසදත්ත** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒ ගාථාවන්ගේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම සඳහා පින් රැස් කරගනිමින් අවුත් **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයෙහි බමුණු පවුලක ඉපිද සියළු බමුණු ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට පත්වූහ. පස්කම් සැප කෙරෙහි කළකිරුණු ඒ බමුණා සෘෂි පැවිද්දෙන් පැවිදිව කැළයෙහි වසනුයේ දිනක් ශාස්තෘන් වහන්සේ දැක, පහන් සිතින් ඇදිලි බැඳගෙන උන්වහන්සේට ස්තුති කළේය. ඒ පින්කමේ විපාක විඳිමින් සසර සැරිසරා දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳි හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ දී මල්ල රට, මල්ල රජ පවුලක ඉපිද **යසදත්ත** යැයි ප්‍රකට විය. නිසිවියට පැමිණි ඔහු තක්සලාවට ගොස් සිප්සතර උගත්තේය. මනාව සිප් සතර හදාළ යසදත්ත; **සභිය** නම් පිරිවැජියා සමඟ ම හැසිරෙමින් අනුපිළිවෙළින් සැවැත් නුවරට පැමිණ භාග්‍යවතුන් වහන්සේ හමුවට ගියේය. සභිය පිරිවැජියා ඇසූ ප්‍රශ්න ඉතා විසිතුරුව බුදුපියාණන් වහන්සේ විසඳන කල්හි මනාව ඒ සාකච්ඡාවටම සිත් යොමුකළ ශ්‍රසදත්ත; ''ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ වාග් දෝෂයක් සොයමි''යි එය අසා සිටියේය. භාග්‍යවතුන් වහස්සේ ඔහුගේ සිත දැන, සභිය සූත්‍ර දේශනාවසානයේදී යසදත්තට අවවාද දෙන සේක්; මේ ගාථා පහ වදාළ සේක.

''උපාරම්භචිත්තෙනා දුම්මේධෝ සුණාති ජිනසාසනං
ආරකා හොති සද්ධම්මා නභසෝ පයවී යථා

උපාරම්භචිත්තෙනා දුම්මේධෝ සුණාති ජිනසාසනං
පරිහායති සද්ධම්මා කාලපක්ඛව චන්දිමා

උපාරම්භචිත්තෙනා දුම්මේධෝ සුණාති ජිනසාසනං
පරිසුස්සති සද්ධම්මෙ මච්ඡෝ අප්පොදකෙ යථා

උපාරම්භචිත්තෙනා දුම්මේධෝ සුණාති ජිනසාසනං
න විරූහති සද්ධම්මෙ බෙත්තෙ බීජංව පූතිකං

යොච තුට්ඨෙන චිත්තෙන සුණාති ජිනසාසනං
බෙපෙච්චා ආසවෙ සබ්බෙ සච්ඡිකත්වා අකුප්පතං
පප්පුය්‍ය පරමං සන්තිං පරිනිබ්බාති අනාසවෝ'' තී.

එහි ''උපාරම්භචිත්තෙනා'' එකට එක කරන සිත, දෝෂාරෝපණය කරන සිත් ඇති. ''දුම්මේධෝ'' දුෂ්ප්‍රාඥ. ''ආරකා හොති සද්ධම්මා'' එබඳු අනුවණ පුද්ගලයා අහසට පොළොව මෙන් ප්‍රතිපත්ති සද්ධර්මයෙන් පවා දුරු වේ. ඈත් වේ. ප්‍රතිවේධ සද්ධර්මයෙන් ඈත්වන බව අමුතුවෙන් කිවයුතු නොවේ. ''නුඹ මේ දහම් විනය නො දන්නෙහිය'' ආදී කලහ විවාද මූලික කථාවෙන් යුක්ත තැනැත්තාට කෙසේ නම් දහම් විනයේ අර්ථ වැටහේ ද? ''පරිහායති සද්ධම්මා'' නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයෙන් ද පූර්වභාගී වූ ශ්‍රද්ධාදී සද්ධර්ම සම්පත්තියෙන් ද පිරිහේ. ''**පරිසුස්සති**'' වියැලෙයි. කය හා සිත පිනවන්නා වූ ප්‍රීතිය, ප්‍රමෝදය ආදී කුසල දහම්හි රසවත්භාවය නොලබයි. ''න විරූහති'' අභිවෘද්ධියට, වැඩිදියුණු බවට නොපැමිණෙයි. ''පූතිකං'' රැකීම්, සැළකීම් ආදියෙන් දුරු වූ බැවින් කුණු වූ බවට ගිය. ''තුට්ඨෙන චිත්තෙන'' ඉසුම්භූතාර්ථයේ තනියා විභක්ති වචනයකි. තම සිතින් සතුටුවෙමින්, ප්‍රීතියෙන්. ''බෙපෙච්චා'' මුළුමනින්ම නසා, ක්ෂය කොට. ''අකුප්පතං'' රහත් බවට, ස්ථිරත්වයට, ''පප්පුය්‍ය'' පැමිණ. ''පරමං සන්තිං'' අනුපාදිසේස නිර්වාණය අවබෝධ කෙරේ. හුදෙක්ම සන්සිඳීමට පත් වේ. ''කවරාකාරයෙන් ද?'' යන්න දැක්වීමට ''**පරිනිබ්බායිස්සති** අනාසවෝ'' ආශ්‍රව රහිතව පිරිනිවෙන්නේ ය''යි වදාළහ. මෙසේ වදාළ ශාස්තෘන් වහන්සේගේ අවවාදය ඇසීමෙන් උපන් සංවේග ඇති යසදත්ත කුමරු බුදුසසුනේ පැවිදිව විදසුන් භාවනාවේ සිත පිහිටුවා නොබෝ කලකින්ම කෙලෙස් නසා රහත් විය.

යසදත්ත තෙරණුවෝ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''කිණිහිරි රුකක් මෙන් දිළිසෙන, පහන් ගසක් වැනි වූ බබලන රන් රැසක් මෙන් රැස් පතුරුවන දෙපා ඇත්තන් අතර ප්‍රධාන වූ බුදුරදුන් දුටු මම; කමැඬලාව ද වැහිරි සිවුර ද පැන් කෙණ්ඩිය ද පසෙක තබා අඳුන් දිවි සම ඒකාංශ කර පොරවා උන්වහන්සේට ස්තුති කළෙමි. ''මහා මුනීන්වහන්ස! මෝහ ජාලයෙන් අවුල් වූ ගණුදුර නසමින් ඥානාලෝකය දක්වා සසර සයුරින් එතෙර වූහ. නිරුත්තර වූ තථාගතයන් වහන්ස! සියලු සත්වයන් සහිත මේ ලෝකයා සසරින් ගොඩලනු මැනවි. ලෝකය මුළුල්ලෙහිම ඔබවහන්සේගේ නුවණ පිළිබඳ උපමාවක් නම් නැත. ඒ අනුපම වූ ඥානයෙන් සර්වඥ වූ ඔබ වහන්සේ ''බුද්ධ'' නම් වන සේක. මහාවීරයන් වහන්ස! ආවරණ නොමැති ඒ සර්වඥතා ඥානයට මම වඳින්නෙමි.''

මීට කල්ප ලක්‍ෂයකට පෙර දී මම ඒ පදුමුත්තර බුදුපියාණන් වහන්සේට ස්තුති කළෙමි ද ඒ පින හේතුවෙන් දුගතියකට නොගියෙමි. බුදුනුවණ පැසසීමේ විපාකය මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ යසදත්ත තෙරුන් වහන්සේ සිය රහත් බව ප්‍රකාශ කරමින් මෙම ගාථාවන්ම නැවත වදාළ සේක.

යසදත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.11

''**උපසම්පදා ච මෙ ලද්ධා**'' යනාදී ගාථා ආයුෂ්මත් සෝණ කුටිකණ්ණ තෙරුන් වහන්සේ විසින් වදාරණ ලදී. එම ගාථාවල උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර **පදුමුත්තර** බුදුරජාණන් පහළ වූ සමයෙහි හංසවතී නුවර මහත් සම්පත් ඇති සිටුවරයෙක් ව මහත් වූ ඉසුරු සම්පත් විඳිමින් සැප වින්දේය. ඔහු දිනක් ලක්‍ෂයක් මහරහතුන් පිරිවරා මහත් වූ බුද්ධ ලීලාවෙන්, මහත් වූ බුද්ධානුභාවයෙන් නුවරට වැඩමවන ශාස්තෘන් වහන්සේ දුටුවේය. එම දර්ශනයෙන් පැහැදුණු සිතැති ඔහු බුද්ධ ප්‍රමුඛ මහා

සංසරත්නයට වැඳගෙන සිටියේය. පසුබත් කල උපාසකවරුන් සමඟ විහාරයට ගිය හෙතෙම ශාස්තෘන් වහන්සේ වෙතින් ධර්ම ශ්‍රවණය කළේය. එසේ බණ අසන විට ශාස්තෘන් වහන්සේ එක් භික්ෂු නමක් මිහිරි කටහඬ ඇති භික්ෂූන්ගෙන් අග්‍රස්ථානයට පත් කළ සේක. ඒ දුටු සිටුතුමා ද එම තනතුර පතමින් මහදන් දී අධිෂ්ඨාන කරගත්තේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ සිතැඟි දැන, එය ඉටුවන බව දුටුසේක්; ''මෙතෙම අනාගත ගෞතම බුද්ධ ශාසනයේ දී මිහිරි කටහඬ ඇති භික්ෂූන්ගෙන් අග්‍රවන්නේය''යි විවරණ දුන් සේක. දිවි ඇතිතාක් පින්දහම් සිදුකළ හෙතෙම, එපින් බෙලෙන් කාමසුගතින්හි සැප විඳිමින් සැරිසරා පැමිණ, **විපස්සි** භාග්‍යවතුන් වහන්සේගේ සසුනේ පැවිදි භූමියට පත්ව, වත් පිලිවෙත් පුරනුයේ දිනක් එක් භික්ෂුවකගේ සිවුරක් මසා දුන්නේය. නැවත බුද්ධශූන්‍ය වූ ලොවෙහි බරණැස් නුවර රෙදි වියන්නෙක්ව උපන් ඔහු, පසේ බුදුවරයෙකුට දිරාගිය කොණවල් බැහිරලා ගැළපූ සිවුරක් පූජා කළේය. මෙසේ ඒ ඒ භවයෙහි පින්දහම් රැස්කරගත් ඔහු; මේ බුද්ධෝත්පාද කාලයේ දී අවන්ති රට කුරරඝරයේ මහා ධනවත් සිටු පුතෙක් ව උපන්නේය. ''**සෝණ**'' යන නමින් ප්‍රකට වූ ඔහුට, කොටියක් අගනා කුණ්ඩලාභරණයක් දරු බැවින් ''කොටිකණ්ණ'' යැයි කිවයුතු තැන ''කුටිකණ්ණ'' යැයි වහරන ලදී. අනුපිළිවෙලින් වැඩුණු සෝණ කුටිකණ්ණ කුමරු, මනාව පවුල් රක්ෂණයෙහි යෙදුණේය. ආයුෂ්මත් මහා කච්චාන රහතන් වහන්සේ කුරර ඝරයෙහි පැවති පර්වත විහාරයේ විසූ බැවින් උන්වහන්සේගෙන් දහම් අසා සරණ සිල්හි පිහිටි සෝණකුමරු නිති සිවුපස දානයෙන් උන්වහන්සේ පිදුවේය.

ඊට පසු කාලයක සසර බිය දැක හටගත් සංවේග අති ඔහු තෙරුන් ළඟ පැවිදි විය. ඉතා අමාරුවෙන්, දුක්විඳ දසවර්ග සංඝයා රැස්කරවාගත් සෝණ තෙරණුවෝ උපසම්පදාව ලබාගත්හ. කිහිප දිනක් ආචාර්යයන් වහන්සේ ළඟ විසූ සෝණ හිමියෝ ගුරු අවසරය ලැබ, ශාස්තෘන් වහන්සේට වැඳීම සඳහා සැවැත් නුවරට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ සමඟ එක ගඳකිළියෙහි විසීමට අවසර ලද උන්වහන්සේ, ඉතා අලුයම් කාලයෙහි අට්ඨක වර්ගයේ (සුත්ත නිපාත) සූත්‍ර දහසය ම මධුර ස්වරයෙන් ගායනා කළහ. එය ඇසූ භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දී වදාරන ලද; ''දිසවා ආදීනවං ලොකෙ'' යනාදී උදාන ගාථාව අවසන විදසුන් වැඩූ සෝණ හිමියෝ රහත් වූහ.

උන්වහන්සේ අපදාන පාළියේදී මෙසේ වදාළහ.

''එකල්හි ලෝකයාගේ පූජාවන් පිළිගැනීමට යෝග්‍ය වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ රහතුන් ලක්‍ෂයක් පිරිවරාගෙන නුවරට වැඩම කළ සේක. තාදී ගුණ ඇති උපශාන්ත වූ උන්වහන්සේ නුවරට පිවිසෙන කල්හි රත්නයෝ තමාම බැබළුණහ. එකෙණෙහිම මහා සෝෂාවක් ද ඇති විය. නගරයට පිවිසෙන බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි බුද්ධානුභාවයෙන් නොගැලූ බෙර ස්වයංවම නාද විය. වීණා ද තමාම වැයුණේය. මහාමුනි වූ පදුමුත්තර බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ නොදකිමි. මේ ප්‍රාතිහාර්ය දැක උන්වහන්සේ කෙරෙහි සිත පැහැද වූයෙමි.

''බුදුරජාණෝ ඉතා අසිරිමත් යහ. ධර්මය ආශ්චර්යජනකය. අපගේ ශාස්තෘ සම්පත්තිය ද ආශ්චර්යය. අචේතනික වූ ගායන වාදන භාණ්ඩ ස්වයංවම නාද විය.'' මෙසේ මීට කල්ප ලක්‍ෂයකට පෙර දී යම් බුද්ධ සංඥාවක් ලැබුවෙමි ද එතැන් පටන් දුගතියක නූපන්නෙමි. බුද්ධ සංඥාවේ විපාක මෙබඳුය. දැන් මම සියළු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ, තමාගේ උපාධ්‍යායන් වහන්සේ වදාළ අයුරින්ම ප්‍රත්‍යන්ත ජනපදයන්හිදී විනයධර භික්‍ෂුවක් පස්වැනි වූ සංඝයාගෙන් උපසම්පදාව ලැබීම ද දිනපතා නෑම ද සම් ඇතිරිළි ද පට කිහිපයක් ඇති පාවහන් දෑරීමද අමතර සිවුරු ඉවසීම ද යන පංචවරය ඉල්ලා, භාග්‍යවතුන් වහන්සේගේ අනුමැතිය ලබාගත්හ. එසේ අනුමැතිය ලබාගෙන නැවතත් පෙර තමා සිටි තැනට වැඩම කළ සෝණ කුටිකණ්ණ හිමියෝ මේ බව තම උපාධ්‍යායන් වහන්සේට දනුම් දුන්හ. මේ දක්වූයේ ඉතා සංක්‍ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් උදානට්ඨකථාවේ පැමිණි අයුරින් දතයුතුයි. අංගුත්තරට්ඨකථාවෙහි වනාහී ''උපසපන්වීමෙන් අනතුරුව සිය උපාධ්‍යායන් වහන්සේ ළඟදීම කමටහන් ගෙන, විදසුන් වඩා රහත් වූයේය''යි කියැවේ. ඊට පසුකාලයකදී විමුක්ති සුවය විඳිමින් වැඩවසන උන්වහන්සේ තමාගේ පිළිවෙත් මඟ දෙස නැවත හැරී බලා හටගත් සතුටින් ප්‍රීතිය පහළකිරීම් වශයෙන් මේ ගාථා පහ වදාළහ.

''උපසම්පදා ච මෙ ලද්ධා. විමුත්තො චම්හි අනාසවො
සො ච මේ භගවා දිට්ඨෝ, විහාරෙව සහාවසිං''

''බහුදෙවරත්තිං භගවා අබ්භොකාසෙ'තිනාමයි
විහාර කුසලෝ සත්‍ථා විහාරං පාවිසී තදා''

''සන්‌ථරිත්‌වාන සංඝාටිං සෙය්‌යං කප්‌පෙසි ගොතමො
සිහො සෙලගුහායංව පවිණ හය භෙරවො''

''තතො කල්‌යාණවාක්‌කරණෝ සම්‌මා සම්‌බුද්‌ධසාවකෝ
සොණෝ අභාසි සදධම්‌මං බුද්‌ධසෙට්‌ඨස්‌ස සම්‌මුඛා''

''පඤ්‌චක්‌ඛන්‌ධෙ පරිඤ්‌ඤාය භාවයිත්‌වාන අඤ්‌ජසං
පපප්‌පුය්‌ය පරමං සන්‌තිං පරිනිබ්‌බායිසසත්‌ථානාසවෝ'' ති.

එහි ''උපසම්‌පදාව මෙ ලදධා'' යම් ඒ උපසම්‌පදාවක් ඉතා දුකසේ දස නමක් වූ මහා සංඝරත්‌නය රැස්‌කරවා තමා විසින් ලබන ලද ඒ උපසම්‌පදාවත්, ප්‍රත්‍යන්ත ජනපදයන්හිදී විනයධර තෙරනමක් සහිත පස්‌නමක් වූ මහා සංඝයාගෙන් යම් උපසම්‌පදාවක් කිරීමට බුද්‌ධානුමැතිය ලබන ලද ද ඒ උපසම්‌පදාවත් යන දෙකම මෙහිදී අදහස් වේ. ''ච'' ශබ්‌දය සමුච්‌චාර්‌ථයේ නිපාතයකි. ඉන් සෝණකුටිකණ්‌ණ හිමියන් ශාස්‌තෘන් වහන්සේ වෙතින් ලබාගත් සෙසු චරප්‍රසාද අදහස් කරයි. ''විමුත්‌තො චම්‌හි අනාසංවා'' ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් සියලු කෙලෙස් වස්‌තූන්ගෙන් මිදුණෙමි වෙමි. එසේම කාමාදී ආශ්‍රවයන්ගෙන් ද මිදුණෙමි. ''සොච මෙ භගවා දිට්‌ඨොා'' යම් අර්‌ථයක් සඳහා අවන්ති රටේ සිට මම සැවැත්නුවරට ගියෙමි ද පෙර නොදුටු නොවිරූ ඒ භාග්‍යවතුන් වහනසේ ම විසින් දක්‌නා ලද්‌දෙමි. ''විහාරෙ ච සහාවසිං'' හුදෙක් මම ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීම පමණක් නොලැබුවෙමි. උන්වහන්සේ දැකීමත්, කථාබහ කිරීමත් මෙන්ම කරුණු සලකා බැලූ ශාස්‌තෘන් වහන්සේ සමඟ එක කුටියෙහි විසීමද මම ලැබුවෙමි. ''විහාරෙ'' යනු ඇතමෙක් විහාරය සමීපයෙහි යැයි කියති. ''බහුදෙවරත්‌තිං'' රෑ පළමුයාමය හික්‌ෂූන්ට දහම් දෙසීම් වශයෙන් ද කමටහන් පිරිසිඳු කරදීම් වශයෙන් ද මැද යාමය දෙව් බමුන්ගේ සැක සිඳීම් වශයෙන් ද ගත කළ භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් එළිමහනෙහි කල් යැවූ සේක. වැඩසිටි සේක. ''විහාර කුසලො'', දිව්‍ය බ්‍රහ්මාදී උසස් පැවතුම්හි, ආර්ය විහාරණයන්හි යන සිටුවාසයෙහි දක්‍ෂ වූ ''විහාරං පාවිසි'' බුදුපියාණන් වහන්සේ බොහෝ වේලාවක් හිඳීම්, සක්‌මන් කිරීම් ආදියෙන් උපන් වෙහෙස දුරුකරගනු සඳහා ගඳකිළියට පිවිසි සේක. ''සන්‌ථරිත්‌වාන සංඝාටිං සෙය්‌යං කප්‌පෙසි'' සඟල සිවුර හතරට නවා පැනවූ සයනයෙහි සැතපුණු සේක. එනිසා කියන ලදී - ''දුරුකළ භය හා භයවන අරමුණු ඇති ගෞතමයන් වහන්සේ ගල් ගුහාවක වෙසෙන සිංහයකු මෙන් සැතපුණු සේක.'' යනුවෙන් කියන ලදී. එහි ''ගොතමො'' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට ගෝත්‍රයෙන්

ආමන්තුණය කරයි. ''**සීහෝ සෙලගුහායං වා**'',''ගල් පර්වතයක වූ ගුහාවක වෙසෙන සිවුපාවුන්ගේ රජ වූ සිංහයා පිරුණු තේජසින් දුරුකළ භය හා භයවන අරමුණු ඇතිව දකුණු ඇළයෙන් පයින් පය පැහැර නිදන්නේ ද එමෙන් සිත් තැතිගැනීම්, ලොමුඩැහැගැනීම්, තැතිගැනීම් ආදී කෙලෙසුන් සම්පූර්ණ සිද දැමූ බැවින් ප්‍රහීණ වූ භය හා සයවන අරමුණු ඇති ගෞතම නම් භාග්‍යවතුන් වහන්සේ සැහපුණු සේක'' යන අර්ථයයි. ''**තතො**'' පසුව, සිංහ සෙය්‍යාවෙන් සැතපී සිට ඉන් නැගිට සිටි භාග්‍යවතුන් වහන්සේ විසින් මහණ ! නුඹට ධර්මය පැවසීමට වැටහේවා''යි ආරාධනා කරන ලද්දේ, ''**කල්‍යාණ වාක්කරණෝ**'' මිහිරි කටහඬ ඇති, මිහිරි ලක්ෂණයෙන් අනූන වදන් ඇතිව ''**සොණෝ අහාසි සදධම්මං**'' සොළොසක් වූ අට්ඨක වර්ගයේ සූත්‍ර සොණ කුටිකණ්ණ තෙරණුවෝ සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිට වදාළහ. තෙරණුවෝ මේ ගාථාවේදී තමා අනිකකු මෙන් දක්වති. ''**පඤ්චක්ඛන්ධෙ පරිඤ්ඤාය**'' පඤ්ච උපාදානස්කන්ධය ත්‍රිවිධ පරිඥාවන්ගෙන් පිරිසිඳ දැන, එය දැනගැනීම් වශයෙන් ම ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩා පරම ශාන්ති දායක වූ නිර්වාණයට පැමිණියෙමි. නිවන් අවබෝධ කර ගත්තෙමි. දැන් අනාශ්‍රවයෙක්මි වෙසෙමි. එනිසාම දැන් පිරිනිවෙන්නෙමි. අනුපාදිසේස නිර්වාණ ධාතුවට සමවදින්නෙමි.

සෝණ කුටිකණ්ණ රේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

5.1.12

''**යො වෙ ගරූනං**'' යනු ආයුෂ්මත් **කෝසිය** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී සසරින් මිදීම පිණිස කුසල් දහම් රැස්කරමින් පැමිණ, **විපස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී කුලවත් ගෙයක උපන්හ. නුවණැති බවට පත්වූ ඒ සිටුකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ දැකීමෙන් හටගත් පහන් සිත් ඇතිව, උන්වහන්සේට උක් කඬක් දුන්නේය. ඒ පින්කමේ විපාක වශයෙන් හෙතෙම දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී මගධ රට බමුණු කුලයක උපන්නේ ය. ඔහුට **කෝසිය** යන නම ගෝත්‍ර වශයෙන් ලැබුණේය. නුවණැති බවට පත් කෝසිය බමුණා නිතරම ආයුෂ්මත් ධර්ම සේනාපතීන් වහන්සේ ඇසුරු කළේය. වෙත පැමිණ බණ අසයි. සාකච්ඡා කරයි. උන්වහන්සේ

නිසා සසුනේ පැහැදි ඒ බමුණා උපන් ශ්‍රද්ධාවෙන් පැවිදිව කමටහන් ගෙන, ඒ අනුව ක්‍රියා කරනුයේ නොබෝ දිනකින්ම රහත් විය.

අපදාන පාළියේ දී කෝසිය තෙරණුවෝ මෙසේ වදාළහ.

''මම පෙර බන්ධුමති නුවර දොරටුපාලකයෙක් වූයෙමි. සියලු දහම්හි පරතෙර දුටුවා වූ ඒ කෙලෙස් දුරලූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. උක් දණ්ඩක් ගෙන උන්වහන්සේ වෙත පැමිණි මම එය ශාස්තෘන් වහන්සේට පිදුවෙමි. මීට කල්ප අනූ එකකට පෙරදී යම් උක් දඬු දානයක් පැවැත්වූයෙම් ද එහි විපාක වශයෙන් මම දුගතියක නූපන්නෙමි. උක් දඬු දානයේ විපාක මෙබඳුය. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි.

රහත් බවට පත් වූ උන්වහන්සේ තමා ලද සම්පත් පිළිබඳව නැවත හැරී බලා ගුරුවරුන්ගෙන් ඇසුරත් සත්පුරුෂ ආශ්‍රයත් ප්‍රශංසාවට ලක්කරමින් මේ ගාථා පහ වදාළහ.

යොවෙ ගරූනං වචනඤ්ඤූ ධීරෝ
වසෙ ච තම්හි ජනයෙථ පෙමං
සෝ හතනිමා නාම ච හොති පණ්ඩිතෝ
ඤත්වා ච ධම්මෙසු විසෙසි අසස

යං ආපදා උපපතිතා උළාරා
නික්ඛමභයනෙත පටිසංඛයනතං
සෝ ඨාමවා නාම ච හොති පණ්ඩිතෝ
ඤත්වා ච ධම්මෙසු විසෙසි අසස

යෝ වෙ සමුදෙඋාව ධීතෝ අනෙජෝ
ගම්භීර පඤ්ඤා නිපුණත්ථදසසී
අසංහාරියෝ නාම ච හොති පණ්ඩිතෝ
ඤත්වා ච ධම්මෙසු විසෙසි අසස

බහුසසුතෝ ධම්මධරොච හොති
ධම්මසස හොති අනුධම්මචාරී
සෝ තාදිසෝ නාම ච හොති පණ්ඩිතෝ
ඤත්වා ච ධම්මෙසු විසෙසි අසස

අත්ථඤ්ච යෝ ජානාති භාසිතස්ස
අත්ථඤ්ච ඤත්වාන තථා කරොති
අත්ථනෙරෝ නාම සහොති පණ්ඩිතෝ
ඤත්වාව ධම්මෙසු විසෙසි අස්සා'' නි.

එහි ''යෝ'' ඛත්තියාදි සිවුපිරිසෙන් යම් කිසිවෙක්. ''වෙ'' ඒකාන්තයෙන්. ''ගරූනං'' සීලාදී ගරු කටයුතු ගුණයන්ගෙන් යුතු පඬුවරුන්ගේ. ''වචනඤඤෑ'' ඔවුන්ගේ අනුශාසනා මනාව දැන, එහි පිහිටා පිළිපැදීමෙන් ප්‍රතිඵල ලබන බව දන්නා. ''ධීරෝ'' ධෛර්ය, උත්සාහයෙන් යුතු. ''වසෙ ච තම්හි ජනයෙථ පෙමං'' ඒ ගුරුවරුන්ගේ වචනයෙහි, අවවාදයෙහි පිහිටා ඒ අනුව වෙසෙන්නේ ය. පිළිපදින්නේ ය. ''මේ ජාති ආදී දුක් කෙළවර කළ යුතුය'' යන අවවාදය අසා එහි ප්‍රේමය, ගෞරවය උපදවන්නේ ය. මෙසේ ගරුකටයුත්තන්ටත්, ඔවුන්ගේ ගරු කටයුතු වචනයන්ටත් යන දෙකටම ප්‍රේම කරන, ගරු කරන ධෛර්යවත් වූවෙකු වීමි.'' යනුවෙන් අර්ථ ගත යුතුයි. ''සො'' යනු ගුරුවරුන්ගේ වචන දන්නා වූ, පිළිගන්නා වූ ධෛර්යවත් වූ පුද්ගලයා එසේ ක්‍රියා කිරීමෙන්, ඒ වදන් අනුව පිළිපැදීමෙන් භක්තිමත් පුද්ගලයෙක් වේ. සිය දිවි ගියද ඊට පටහැනි වූ ක්‍රියාවක් නොකරන හෙයින් ''පණ්ඩිත'' නම් වේ. ''ඤත්වා ච ධම්මෙසු **විසෙසි අස්සා**'' එසේ පිළිපැදීමෙන්, එම ප්‍රතිපත්තියෙන් චතුරාර්ය සත්‍ය ධර්මයන් දැනගෙන, අවබෝධ කළ නිසාත්; ලෞකික ලෝකෝත්තර ධර්මයන්හි විද්‍යාමානවීම් වශයෙන් ත්‍රිවිද්‍යාලාභියෙක්, ෂඩ් අභිඥාලාභියෙක්, පටිසම්භිදාවන්ට පත්වූවෙක් යනුවෙන් විශේෂාධිගමයන්ට පත්වූයෙමි. ''යං'' යම් පුද්ගලයෙක්. ප්‍රතිපත්තියට අනතුරක් කරන බැවින් ''ආපදා'' ආපදාවෝ යැයි ලබන ලද ව්‍යවහාර ඇති, සීතල උණුසුම සාපිපාසාදී ප්‍රකට උපද්‍රව මෙන්ම රාගාදී සැඟවුණු උපද්‍රව ද බලවත්ව, ඉතා මහත්ව පැමිණියත්, ඊට වහල්ව නොකැළඹී කිසිසේත්ම නොසැලෙමි. කම්පා නොවෙමි. කුමක් නිසාද? ''**පටිසංඛයනතං**'' නුවණින් විමසා බලනුයේ, නුවණින් විමසා බැලීමෙහි යෙදුනේ. ''සො'' යමෙක් ඉතා දැඩි වූ ආපදාවන්ගෙන් පවා නොමැඩලිය හැකිවේද ඔහු වීර්යවන්තයෙකි. ධෛර්යවන්තයෙකි. දැඩි පරාක්‍රම වීර්ය ඇත්තෙකි. ඉතිරි නොවූ කෙළෙස් පක්‍ෂය ඇති ඔහු කෙලෙස් අභිභවනය කිරීමේ ප්‍රඥා බලයෙන් යුතු වූ බැවින් ''පණ්ඩිත'' නම් වේ. එසේම වන්නෙමි. ''**ඤත්වා ච ධම්මෙසු විසෙසි අස්ස**'' මෙහි අරුත් ඉහතින් කියූ පරිදිම දත යුතුයි. ''**සමුද්දොව ථිතො**'' මුහුද මෙන් ස්ථිර, අකම්පිත ස්වභාවයෙහි පිහිටි. අසූහාර දහසක් යොදුන් ගැඹුරැති, මහමෙර පාමුල පිහිටි මහා සමුද්‍රය අට දිසාවෙන් නැගි ස්වභාවික සුළඟින් කම්පා නොවී

සිටියි. නොකැළඹේ. ඉතා ගැඹුරුය. මෙසේම කෙලෙස් වාතයෙන් ද, අනාදී වීරිත්කවාදයන්ගෙන් ද, කම්පා නොවී සිටින, තණ්හා ඇලීම් රහිත වූ, ගැඹුරු වූ, නොරැස්කළ ඥාන සම්භාර ධර්මයෙන් යුතු, නොගැලුණු, නිපුණ වූ, සියුම් වූ, සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදාදී අර්ථය අවබෝධ කරගැනීමෙන් ගැඹුරු ප්‍රඥාව ඇත්තා වූ, නිපුණ වූ සියුම් අර්ථ දකින්නා වූ ඒ උතුම් පුද්ගලයා කෙලෙස්වලින් දේවමාරාදී කිසිකෙනෙකුන් විසින් හෝ පැහැරගත නොහැකි බැවින් **''අසංහාරිය''** නම් වේ. එම අර්ථය නිසාම පණ්ඩිත නාමය ද ඔහුට යෙදේ. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. **''බහුස්සුතො''** පරියාප්ති ශ්‍රී සද්ධර්මය බොහෝ කොට ඇසීම් පිරීම් වශයෙන් බහුශ්‍රැත නම් වේ. සූත්‍ර ගෙය්‍ය යනාදී නවාංග සත්ථු ශාසනය බොහෝ කොට අසන ලද තැනැත්තා බහුශ්‍රැතයායි. ඔහුට ධර්මය රන් බඳුනක දැමූ සිංහ තෙල් මෙන් නොනසමින්, අගය අඩු නොකරමින්ම දරනුයේ **''ධම්මධර''** නම් වේ. නව ලොවුතුරු දහමට අනුධර්ම වූ, අනුව හැසිරෙන්නා වූ, ඇසූ පරිදි උගත් පරිදි ධර්මයේ අර්ථ දැනගෙන ධර්මය දැනගෙන හැසිරෙන්නා වූ පුද්ගලයා නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයට අනුරූප ධර්ම වූ පූර්වභාග ප්‍රතිපදාව නම් වූ චතුපාරිශුද්ධි ශීලය, ධූතාංග, අසුභ කමටහන් ආදියෙහි හැසිරෙයි. එය මනාව අවබෝධ කරගනියි. ධර්මය අනුව හැසිරෙන්නෙකු වේ. අද අදම මේ දහම අවබෝධ කරගනිමියි කැමතිව, එය පතමින් හැසිරෙයි. මෙබඳු පුද්ගලයා **''පණ්ඩිතො''** පඬිවරයෙකි. යම් ගුරුවරයෙකු ඇසුරු කිරීමෙන් ඒ පුද්ගලයා බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මයෙහි නියුක්ත පුද්ගලයෙක් වේද ඒ ගුරුවරයා ද එලෙසින්ම පණ්ඩිතයෙකි. ධර්මධරයෙකි. අනුධර්මචාරියෙකි. ගුරුවරයාට සමාන වූ බැවින් ද පණ්ඩිත නම් වේ. ප්‍රතිපත්තියෙන් සමාන බැවින් ඒ ගුරුවරයා මෙන්ම දහම දැන ඒ දහමෙහි විශේෂඥයෙක් වන්නෙමි. මෙහි අර්ථ ඉහත කියන ලදී.

අවසන් ගාථාවේ **''අත්ථඤ්ඤව සො ජානාති භාසිතස්ස''** ඒ පුද්ගලයා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද පර්යාප්ති ශ්‍රී සද්ධර්මයේ අර්ථ දනියි. දැනගත්තේ ද මේ ශීලයයි, මේ සමාධියයි. මේ ප්‍රඥාවයි යනුවෙන් ඒ ඒ තැන කියන ලද අර්ථය දැන එසේ ක්‍රියා කරයි. ශාස්තෘන් වහන්සේගෙන් අනුශාසනා ලද පරිදිම පිළිපදියි. **''අජ්ඣත්තරො නාම සඅොහොති පණ්ඩිතො''** ඒ මෙබඳු වූ පුද්ගලයා ''අජ්ඣත්තර'' නම් වේ. අභිවෘද්ධියට හේතු වූ සීලාදී ධර්මයන්ගේ අර්ථය දැනගැනීම් පමණකින්ම එය උපනිශ්‍රය (මූලාධාර) කරගෙන පණ්ඩිතයෙක් වේ. සෙසු පදයන්ගේ අර්ථ කියන ලද්දේමය.

''මෙහි දී පළමු ගාථාවෙන් ''**යො වෙ ගරූනං**'' ආදී වශයෙන් ශ්‍රද්ධාව මූලාධාර වීමෙන් ලබන ගුණ විශේෂ පැවසුණි. දෙවන ගාථාවෙන් ''**ආපදා**'' ආදී වශයෙන් වීර්ය මූලාධාර වීමෙන් ලබන ගුණ විශේෂ පවසන ලදී. තෙවන ගාථාවෙන් ''**යො වෙ සමුදෙදාව ඨිතො**'' ආදී වශයෙන් සමාධිය මූලාධාර වී ගුණ විශේෂ උපන් බව කියයි. සතරවන ගාථාවෙන් ''**යො බහුස්සුතො**'' ආදී වශයෙන් සතිය මූලාධාර වී ගුණවිශේෂ උපන් බව කියයි. පස්වන ගාථාවෙන් ''**අත්ථඤ්ච යො ජානාති**'' ආදී වශයෙන් ප්‍රඥාව මූලාධාර වීමෙන් ගුණ විශේෂ ඇති වූ බව කියැවේ''යැයි දත යුතුයි.

කෝසිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

පස්වන නිපාත වර්ණනාව සමාප්තයි.

6.1.1

සයවන නිපාතයේ "දිසවාන පාටිහීරානි" ආයුෂ්මත් උරුවේල කාශ්‍යප තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ සිදුවී ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව සසරින් මිදීම සඳහා කුසල් දහම් රැස් කරන්නාහු, පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ සමයේදී කුලගෙයක උපන්හ. වැඩිවියට පත් ඒ සිටුතුමා ශාස්තෘන් වහන්සේගෙන් නිතරම බණ අසයි. දිනක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් මහත්වූ පිරිස් ඇත්තන්ගෙන් අග්‍රභාවයට පත්කළ සේක. එය දුටු සිටුතුමාද ඒ තනතුර පතා මහදන් පවත්වා අධිෂ්ඨානයක් කළේය. භාග්‍යවතුන් වහන්සේගේ ඔහුගේ ඊළඟ හේතු සම්පත් දැක, "මෙතෙම අනාගතයේ ගෞතම බුදු සසුනේදී මහ පිරිස් ඇත්තවුන්ගෙන් අග්‍රවන්නේය"යි විවරණ දුන් සේක. දිවි ඇතිතාක් පින්දහම් කළ හෙතෙම ඉන් චුතව දෙව් මිනිසුන් අතර සැරිසරා අවුත්, මෙයින් කල්ප අනූ දෙකකට පෙර දී ඵුස්ස නම් බුදුරජාණන් වහන්සේගේ පියාට දාව වෙනත් මවුකුසක බාල සොහොයුරෙක්ව උපන්නේ ය. ඔහුට තවත් බාල සහෝදරයෝ දෙදෙනෙක් වූහ. මේ තිදෙනාම බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට ඉතා උතුම් වූ පූජාවන්ගෙන් පූජාකරමින් දිවි ඇතිතාක් පින්දහම් සිදුකළහ. ඒ කුසල් බලයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ ඒ තිදෙන අප භාග්‍යවතුන් වහන්සේ පහළවීමට පෙරදී ම බරණැස බමුණු කුලයක සොහොයුරන්ව ඉපිද අනුපිළිවෙලින් වැඩුනාහ. උපන් ගෝත්‍ර නාම වශයෙන් ඔවුන් තිදෙනාම "**කස්සප**" නාමයෙන් හැඳින්විණි. වැඩිවියට පත් ඔවුහු ත්‍රිවේදය උගත්හ. ඔවුන්ගෙන් වැඩිමලාට තරුණයෝ පන්සීයක් පිරිවර වූහ. දෙවැනියාට පිරිවර තුන්සීයකි. තෙවැනියාට පිරිවර දෙසීයකි. තමන් හදාළ වේද ග්‍රන්ථයන්හි සාරයක් නොදුටු ඔවුහු මෙලොවම විඳිය යුතු සැප කැමතිව පැවිදිවූහ. ඒ තිදෙනාගෙන් වැඩිමල් සෝයුරා තම පිරිවර සමඟ උරුවෙල් ජනපදයට ගොස් **ඍෂි** ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව **උරුවේල කාශ්‍යප** නාමයෙන් ප්‍රකට විය. දෙවැනියා මහාගංගාව හැරී යන නදී වංකයක පැවිදිව හුන් බැවින් **නදී කාශ්‍යප** නමින් ප්‍රකට විය. ගයාවෙහි පැවිදි වී සිය පිරිස සමඟ සිටි බාල සෝයුරා **ගයා කාශ්‍යප** නම් විය. මෙසේ ඒ ඒ තැන ඔවුහු **ඍෂි** ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ඒ තැන විසූහ.

මෙසේ වෙසෙමින් බොහෝ කලක් ගතවූ පසුව අපගේ බෝධිසත්වයෝ මහබිනික්මන් කොට, අවබෝධ කරගත් සර්වඥ ඥාණ ඇතිව, අනුපිළිවෙලින් පැවැත් වූ දම්සක් පැවතුම් දෙසුම් ඇතිව, පස්වග

මහණුන් අර්හත් ඵලයෙහි පිහිටුවා, යස ප්‍රධාන පනස් පහක් වූ යහලු පිරිස හික්මවා ලොව ප්‍රථම රහත් සැටනම ඇතිකරවා ''මහණෙනි! දහම් චාරිකාවෙහි හැසිරෙවු'' යනුවෙන් ඔවුන් පිටත් කර යැවූහ. ඉන්පසුව බුදුපියාණන් වහන්සේ භද්‍රවර්ගිය කුමාරවරුන් හික්මවා ඔවුන් ද සදහම් චාරිකාවෙහි පිටත්කර යවා, උරුවේල කාශ්‍යප වසන තැනට වැඩමවා රාත්‍රී වාසය සඳහා ගිනිහල් ගෙට වැඩ එහිදී නාගදමනාදියෙන් ප්‍රාතිහාර්ය තුන්දහස් පන්සීයක් දැක්වූහ. මෙසේ පිරිවර සහිතව උරුවෙල් කසුප් තවුසා දමනය කර පැවිදි කරවූ භාග්‍යවතුන් වහන්සේ වෙත සෙසු දෙසොහොයුරෝ ද සිය පිරිස සමඟ' පැමිණ පැවිදි වූහ. ඒ සියලු දෙනම ඒහිභික්ෂු මහණ උපසම්පදාව ලැබූහ. ඒ සියු දහසකට වැඩි වූ පිරිස සමඟ ගයා ශීර්ෂයට වැඩම කළ ශාස්තෘන් වහන්සේ එහිදී ආදිත්ත පරියාය සූත්‍රය දේශනා කළ සේක. ඒ සැමදෙනා වහන්සේම ඒ සූත්‍රදේශනාවසානයේදී රහත් වූහ.

අපදාන පාළියේදී උරුවේල කාශ්‍යප තෙරණුවෝ මෙසේ වදාළහ.

''පසැස් ඇති, සියලු ලෝකයන් තත් වූ පරිදි දැනගත්තා වූ පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජාණෝ මීට කල්ප ලක්‍ෂයකට පෙර ලොව පහළ වූහ. සියලු සත්වයන්ට අවවාද දෙන, දහම් අවබෝධ කරවන, සත්වයන් සසරින් එතෙර කරවන, දම් දෙසුමෙහි දක්‍ෂ වූ බුදුරජාණෝ බොහෝ ජනයා සසරින් එතෙර කරවූහ. සියලු සත්තට අනුකම්පා කරන කාරුණික වූ අන්‍යයන්ගේ යහපත කැමති උන්වහන්සේ තමා වෙත පැමිණි සියලු තීර්ත්‍යකයන් සරණ සිල්හි පිහිටවූහ. මෙසේ ඒ කාලය තීර්ත්‍යකයන්ගෙන් හිස් වූ නිරුවුල් වූ තාදී ගුණ ඇති පඤ්ච වශීතාවයෙන් යුතු රහතුන්ගෙන් පිරුණු සමයක් විය. උන්වහන්සේගේ උස රියන් පනස් අටකි. රන් ඇඟයක් වැන්න. දෙනිස් මහ පුරිස් ලකුණින් හෙබි සේක. එකල මිනිසුන්ගේ ආයුෂ අවුරුදු ලක්‍ෂයකි. එපමණ කල් වැඩහුන් ඒ සර්වඥයන් වහන්සේ ජන සමූහයා සසරින් එතෙර කරවූ සේක.

එකල මම හංසවතී නුවර යහපත් යැයි සමාජය පිළිගත් බ්‍රාහ්මණයෙක් වූයෙමි, ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දහම් ඇසුවෙමි. එකල මම මහත් පිරිස් ඇත්තන් අතරින් අග්‍ර වූ තෙරනමක් අග තනතුරු ලවනු දුටුවෙමි. සතුටු වූ මම බමුණන් දහසක් පිරිවරාගෙන'වුත් ආරාධනා කොට බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට මහ දන් පැවැත්වූයෙමි. ඉන්පසු වැඳගෙන මෙවදන් පැවසුවෙමි.

''වීරයන් වහන්ස, මව්සින් ඔබවහන්සේට සැදැහැයෙන් කළ පූජා සත්කාර නම් අධිකාර ගුණ හේතුවෙන් ඒ ඒ උපනුපන් ජාතියෙහි දී මා හට මහ පිරිස් ඇතිවේවා.'' එය ඇසූ ශාස්තෘන් වහන්සේ මේඝ ගර්ජනාවක් බඳු මනා වූ ගැඹුරු ස්වර ඇති කුර කෙවිල්ලකට බඳු කටහඬින් මුළු පිරිස අමතා මෙසේ වදාළහ.

''රන්වන් වූ මහත් බාහු ඇති, පියුමකට බඳු මුහුණ හා ඇස් ඇති, ඌර්ධ රෝමයක් ඇති, ප්‍රීතියෙන් මාගේ ගුණයන්හි සැදැහැවත් වූ මේ බමුණා දෙස බලවු. මෙතෙම මහ පිරිස් ඇත්තන්ට අගතැන්පත් වූ සිංහඝෝෂ නම් භික්ෂුහුගේ තනතුර පතයි. මතුමත්තෙහි ඔහුගේ පැතුම ඉටුවන්නේය. මෙයින් කල්ප ලක්ෂයකට පසුව එක්කාක කුලයේ උපදින ගෞතම නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළවෙති. උන්වහන්සේගේ ධර්මයේ දායාද වූ, ධර්මයෙන් නිර්මිත කළා වූ ඖරස පුත්‍ර වූ කාශ්‍යප නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.''

ඊට පසුව මීට කල්ප අනූ දෙකකට පෙර ලොව උපමා රහිත වූ අසමසම වූ දුස්ස බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේ සියලු මෝහාන්ධකාරය නිසා තණ්හා අවුල්ජාලා බිඳදමමින්, දෙවියන් සහිත ලෝකයා පිනවමින් දහම් වැසි වැස්වූහ. එකල අපි බරණැස් නුවර රජ පුතුන්ව උපන්නෙමු. එසේම අපි තිදෙනම ඔවුනොවුන්ට සොහොයුරෝ වූයෙමු. රජුගේ විශ්වාසය අප ම විය. එකල කිපුණු පසල් දනවුවක් පිළිබඳව දූනගත් රජතුමා, රූපශ්‍රීයෙන් දෙවියන් වැනි වූ වීර්ය නිසා පැරදුණු යුද්ධ නැත්තා වූ අප අමතා මෙසේ පැවසීය.

''දරුවෙනි, යවු. ගොස් පසල් දනව්වෙහි සොර බල බිඳලා මාගේ රට නිර්භය කොට එවු''යි යනුවෙනි. එවිට අපි මෙසේ කීවෙමු. ''අපට ලෝකනායක වූ බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීමට ඉඩනොදෙන්නේ නම් අපි යුද්ධය ජයගන්නෙමු.'' යනුවෙනි. එසේ ලැබූ වර ඇති අපි රාජානුග්‍රහය ලැබ කුපිත වූ පසල් දනවුව, සාමයෙහි පවත්වා කලිකලහ සන්සිඳුවා පැමිණ, රජුගෙන් බුද්ධෝපස්ථානයට අවසර ලැබ ලෝකනායකයන් වහන්සේට දිවි ඇතිතාක් පූජා පැවැත්වූයෙමු. දැහැමින් ඉපයූ මාහැඟි වස්ත්‍ර ද ප්‍රණීත රසවත් අහර ද මනරම් සෙනසුන් ද හිත වූ බෙහෙත් ද සංඝයා සහිත බුදුරදුන් ට පිදුවෙමු. සිල් සමාදන් වූ අපි කාරුණික සිත් උපදවා ගෙන, භාවනාවෙහි යෙදී හැම කාලයෙහි ම මෙත් සිතින් ලෝකනායකයන් වහන්සේට වතාවත් කළෙමු. උන්වහන්සේ පිරිනිවි

කල්හි හැකි පමණින් ධාතු පූජා පැවැත්වූ අපි මරණින් පසු තුසිත දෙව්ලොව ඉපිද මහත් වූ සැප විත්දෙමු. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය.

මායාකාරයෙකු රඟමඩලේ බොහෝ විසුලු දක්වන්නාක් මෙන් භවයෙන් භවයට සැරිසැරූ මම විදේහ රටෙහි අධිපතියාව උපන්නෙමි. ගුණ නම් අවේලකයාගේ වචනයෙන් මිසදිටු බැව්හි පිහිටි සිතැනි, වැරදි මඟ ගිය රුජා නම් මගේ දුවණියගේ අවවාද නොපිළිගත් මම නාරද බ්‍රහ්මයා විසින් නොයෙක් අයුරින් අනුශාසනා කරන ලද්දෙමි. මිසදිටු බව හැර දශ කුසල කර්ම පථයන් පුරා, මිනිස් සිරුර හැර සිය ගෙදරට යන්නාක් මෙන් ස්වර්ගයට ගියෙමි.

අන්තිම භවයේ දී මම බමුණෙක්ව උපන්නෙමි. සමෘද්ධ වූ බරණැස් නුවර බමුණු මහසල් කුලයක උපන්නෙමි. මරණය, ව්‍යාධිය, ජරාව යන මෙයින් බිය වූ මම මහත් ධනය හැර නිවණ සොයමින් ජටිලයන් වෙත පැවිදි වූයෙමි. එකල මාගේ දෙබෑයෝ ද මා සමඟ පැවිදි වූහ. උරුවේලාවෙහි වසන මම ගෝත්‍රයෙන් කස්සප නම් වීමි. ඉත් මාහට උරුවෙල කස්සප යන නාමය ලැබුණි. මාගේ දෙටු සෝයුරා ගංගා නදිය සමීපයේ විසූ බැවින් නදී කස්සප නම් විය. ගයාවෙහි විසූ කස්සප බාල සෝයුරා ගයාකස්සප විය.

බාල සෝයුරාට දෙසීයක් ද දෙවැනි නදී කාශ්‍යපට තුන්සීයක් ද මට නො අඩු වූ පන්සීයක් ද යනුවෙන් දහසක් පිරිවර මා අනුව ගියහ. එකල පුරිසදම්ම සාරථී වූ ලෝකාග්‍ර වූ බුදුරජාණෝ මාගේ සමීපයට පැමිණ නානාවිධ ප්‍රාතිහාර්ය දක්වා මා හික්මවූහ. එසේම දහසක් පිරිස සමඟම මම ඒහිභික්ෂුභාවයෙන් මහණෝපසම්පදාව ලැබුවෙමි. පසුව සැමදෙනම රහත් වූහ. ඒ ශිෂ්‍යයෝ ද සෙසු බොහෝදෙන ද මා පිරිවරාගත්හ. මම ඔවුනට අනුශාසනා කිරීමට සමත් වෙමි.

ඉන්පසු විපස්සි බුදුරජුන් දවස සිට සත්වැනි සෘෂි වූ ගෞතම බුදුපියාණන් වහන්සේ මහ පිරිස් ඇති භික්ෂූන්ගේ අග්‍රභාවයෙහි මා තැබූ සේක. අසිරියකි. බුදුරදුන් කෙරෙහි කරන ලද මාගේ සත්කාරය සඵල විය. දැන් මාගේ කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්වූ උන්වහන්සේ තම පිළිවෙත් මඟ දෙස හැරී බලා, නැවත සිහිපත් කර බලා හටගත් සතුටින් සිංහනාද පවත්වන සේක්, මේ ගාථා සය වදාළ සේක.

''දිසවාන පාටිහීරානි ගොතමසස යසසසිනො
න තාවාහං පණිපතිං ඉසසාමානෙන වඤචිතො

මම සංකපප මඤඤාය චොදෙසි නරසාරථී
තතො මෙ ආසි සංවෙගො අබභුතො ලොමහංසනො

පුබෙබ ජටිල භූතසස යා මෙ ඉදධි පරිතතිකා
තාහං තදා නිරංකත්වා පබබජිං ජිනසාසනෙ

පුබෙබ යඤඤෙන සනතුටඨො කාමධාතු පුරකඛතො
පහිණා රාගඤච දොසඤච මොහඤචාපි සමූහනිං

පුබෙබ නිවාසං ජානාමි, දිබබ චකඛුං විසොධිතං
ඉදධිමා පරචිතතඤඤූ දිබබසොතං ච පාපුණිං

යසස චත්ථාය පබබජිතො අගාරසමා අනගාරියං
සො මෙ අත්ථො අනුපපතතො සබබ සංයොජනක්ඛයො'' තී.

එහිදී ''දිසවාන පාටිහීරානි'' යනු නාගරාජ දමන ආදී ප්‍රාතිහාර්ය තුන්දහස් පන්සීයක් දැක, පාටිහීර, පාටිහෙර, පාටිහාරිය යන වදන් තුනම ඒකාර්ථවත්ය. ඛඤ්ජනයන්ගෙන් ම නානාවිධ වේ. (අර්ථයෙන් සමානය. රූපයෙන් වෙනස් ය.) ''යසසසිනො'' සදෙව් ලොව ප්‍රමුඛ වූ තුන් ලොවෙහිම තත්වූ පරිදි පතළ කීර්ති ශබ්දය ඇති. ''න තාවාං පණිපතිං'' යම්තාක් භාග්‍යවතුන් වහන්සේ ''කාශ්‍යපය, නුඹ රහත් කෙනෙකුන් නොවේ. රහත් මඟට පිළිපන් අයෙකු ද නොවේ. රහත් මඟට පමුණුවන, ප්‍රතිපදාවක් ද නුඹට නැත''යි තර්ජනය නොකළ සේක් ද ඒතාක් ම මම වැඳිය යුත්තකුට නොවැන්දෙමි. කුමන කරුණක් නිසා ද? ඊර්ෂ්‍යාවෙන් හා මානයෙන් වංචා රකන ලද්දෙමි. ''මම මොහුගේ ශ්‍රාවකයෙකු වූ කල්හි මගේ ලාභ සත්කාර පිරිහෙන්නේ ය. මොහුගේ ලාභ සත්කාර වැඩෙන්නේ ම ය.'' යනුවෙන් අනුන්ගේ සැප සම්පත් නො ඉවසන ස්වභාවයෙන් ඊර්ෂ්‍යාවෙන් යුතුවීමි. එසේම මම දන් සමූහයක නායක වෙමි. බොහෝ ජනයාගේ සම්මානයට පත් වූවෙමි. මෙසේ ඉතා උස්ව නැඟි ලක්ෂණ සහිත ඒ වැරදි අදහස් දැන, භාග්‍යවතුන් වහන්සේ මා හට උතුරු මිනිස් දම් පෙළහර දැක්වූ සේක් ද (මනුෂ්‍යභාවය ඉක්ම වූ ප්‍රාතිහාර්ය දැක්වූ සේක් ද?) ඒ ප්‍රාතිහාර්යයන් දුටු මම ''මේ මහා ශ්‍රමණයා මහත් ඍද්ධි ඇත්තෙකි. මහත් අනුභව ඇත්තෙකි''යි සිතා ''නමුත් මම මෙන් රහත් නොවූවෙකි''යි සිතුවෙමි. මෙසේ පැවති

මාගේ ඒ වැරදි අදහස (සිතුවිල්ල) දැන දැනත් මගේ නුවණ මුනුකුරායෑම බලමින් සිටි භාග්‍යවතුන් වහන්සේ නේරංජනා නදිය මැද හාත්පස ජලය පිරී තිබියදී දූවිලි වැකුණු බිම සක්මන් කරමින් සිට, එතැනින් නැඟී නැවෙහි වැඩ සිටි සේක් ද, එය දුටු මම නැවත ද ''මේ මහා ශ්‍රවණයා මහත් සෘද්ධිමතෙකි. නමුත් මා මෙන් රහත් නැත''යි යන වැරදි සිතින් යුතු බව දැන. ''**වොදෙසි නරසාරථී**'' එම අවස්ථාවෙහි මගේ නුවණ මුනුකුරා ගිය බව දුටු පුරුෂයන් දමනය කිරීමෙහි රියදුරෙක් මෙන් දක්ෂ වූ ශාස්තෘන් වහන්සේ මා හට චෝදනා කළ සේක. ''නුඹ රහත් කෙනෙකු හෝ රහත් මඟට පිළිපන්නෙකු හෝ නොවේ''යනාදී ලෙස නිග්‍රහ කළ සේක. ''**තනෝ මෙ ආසි සංවෙගෝ අඛහුතෝ ලොමහංසනෝ**'' එසේ කරන ලද චෝදනාව නිසා මෙපමණ කාලයක් නොවූ විරූ ලෙස අද්භූත වූ ලොමු ඩැහැ ගැනීමක්, රහත් නොවී සිට රහත් නමකැයි සිතා සිටීම පිළිබඳව සංවේගයක්, තැනිගැනීමක් හා ඤාණය පහළවීමක් මා හට ඇති විය.

''**ජටිල භූතස්ස**'' ජටිල තාපසයෙකු වූ. ''**ඉද්ධි**'' ලාභ සත්කාර ලැබීමේ භාග්‍යයක්, සෘද්ධියක්. ''**පරිත්තිකා**'' අල්පමාත්‍ර වූ. ''**තාහං**'' තං අහං, ඒ මම ''**තදා**'' භාග්‍යවතුන් වහන්සේ චෝදනා කර, සංවේග ඉපදවූ කල්හි. ''**නිරං කත්වා**'' පහකර, හැරදමා, අපේක්ෂා රහිතව යන අර්ථයයි. ඇතැම්හු මෙහිදී ''සෘද්ධි'' නිබ්බ බව කියති. එය නුසුදුසු ප්‍රකාශයකි. එකල උරුවෙල කාශ්‍යප ධ්‍යානලාභියෙක් නොවූ බැවිණි. ''**කාමධාතු පුරකඛතෝ**'' යනුවෙන් පැවසුහෙයිණි. ''**යඤ්ඤදන සනතුටෝ**'' යාග කිරීමෙන් (ස්වර්ග) දිව සුව අනුභව කරන්නෙමි''යි, ඊට මෙයම ප්‍රමාණවත් වේ'', යනුවෙන් යාග කිරීමෙන් ම සතුටු වූයෙමි. යාගයෙහි කටයුතු නිම කළෙමි. ''**කාමධාතු පුරකඛතෝ**'', කාම සුගතිය අරඹයා උපන් තණ්හාව නිසා යාග කිරීමෙන් කාමලෝක සැප පෙරටු කරගෙන සිටියෙමි. ඒ යාගයේ දී ප්‍රාණඝාතයෙන් යුක්ත බැවින් ඉන් සුගතිගාමී වීමක් අපේක්ෂා කළ නොහැක. අකුසල් සඳහා යහපත්වූ කාන්ත වූ ප්‍රීතිජනක වූ විපාක නුපදින්නේමය. යම් ක්‍රියාවකින් දානාදී කුසල් සිත් උපදින්නේ ද ඊට හේතුප්‍රත්‍ය වශයෙන් සමාන වූ සුගතීන්ට පත්වන්නේය. ''**පඤ්ඤා**'' තවුස් පැවිද්දට පසුව. ශාස්තෘ අවවාදයෙන් තාපස පිළිගැනීම් අත්හැර චතුරාර්ය සත්‍යාවබෝධය පිණිස යොමු වූ කාලයෙහි දී. ''**සමූහනිං**'' විඳසුන් භාවනාවේ සිත පිහිටුවා ආර්ය මාර්ගය අනුගමනය කිරීමෙන් රාගය ද ද්වේෂය ද මෝහය ද ඉතිරි නොකරම ක්ෂය කළෙමි. ඒ තෙරණුවෝ ආර්ය මාර්ගයෙන් රාගාදිය මුලිනුපුටා දැමූ කල්හි ම ඡඩ අභිඥාලාභී වූහ. ''තෙරණුවෝ එනිසාම තමාගේ ඡඩ ඤභිඥාලාභී බව දැක්වීම සඳහා **පුබ්බෙනිවාසං ජානාමී**'' යනාදී ගාථාව පැවසූහ. එහි

''පුබ්බේනිවාසං ජානාමි'' යනු තමාගේ ද අනුන්ගේ ද පෙරවිසූ ආත්මභාව පිළිබඳව උපන් ස්කන්ධයන් ද ඒ ආශ්‍රිත වූවන් ද පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණින් අතැඟිලක් සේ ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දනිමි. ''දිබ්බචක්ඛු විසොධිනං'' දිවැස් නුවණ පිරිසිදු කළෙමි. පියවි ඇසට නොපෙනෙන, ඉතා දුරින් පිහිටි, ඉතා සියුම් වූ රූප මනාව දැක ගැනීමට සමත් වූ පියවි ඇස ඉදිරියට පැමිණි ප්‍රකෘති රූපයක් මෙන් දිව්‍යමය වූ මනුෂ්‍යභාවය ඉක්ම වූ ඇසින් දැකීමට සමත් වූවෙමි. භාවනාවෙන් මවිසින් මේ හැකියාව ලබාගත්තෙමි. ''ඉද්ධිමා'' අධිෂ්ඨාන, විකුබ්බන (සෘද්ධිමය මැවීම්) ආදි සෘද්ධිමත්, සෘද්ධිවිධ ඥානයන් ලැබුවෙමි. ''රාග සහිත ආදී වශයෙන් ප්‍රභේද වූ අනුන්ගේ සිත් දැනගැනීමේ හැකියාව ඇති, අනුන්ගේ සිත් දන්නා වූ චේතෝපරිය ඥානය ලබාගත්තෙමි''යැයි කියන ලදී. ''**දිබ්බසොතඤ්ච පාපුණි**'' දිවකන් ලැබීමේ නුවණ ලැබුවෙමි. ''**සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො**'' යමෙක් සියලුම සංයෝජනයෙන් ක්ෂය කිරීමෙන් ලබාගත යුතු වූ ඒ ස්වාර්ථය, පරමාර්ථය මවිසින් ආර්යමාර්ගාධිගමයෙන් ලබා ගත්තෙමි. මෙම ගාථාවන්ම තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා ද විය.

උරුවේල කස්සප ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.2

''අනිහිතා වීහි'' යනාදී ගාථාවන් ආයුෂ්මත් **තේකිච්ඡකානි** තෙරණුවන්ගේ ය. උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් පැමිණියේක්, මීට කල්ප අනූ එකකට පෙර දී **විපස්සි** භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයෙහි වෙද පවුලක උපන්හ. තරුණවියට පැමිණ වෛද්‍ය ශිල්පයෙහි පරතෙරට ගිය හෙතෙම විපස්සි බුදුරජාණන් වහස්සේගේ උපස්ථායක වූ අශෝක නම් තෙරුන්ගේ රෝගාබාධය දුරු කළේය. සෙසු රෝගාබාධිත සත්ත්වයන්ට ද අනුකම්පාවෙන් බෙහෙත් කළේය. මෙම පින්කම්වල විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයේ දී සුබහු නම් බමුණාගේ පුතකු ලෙස උපන්නේය. ඔහු ගැබේ වසන සමයේ සිටම වෛද්‍යවරු විසින් කරන ලද ආරක්ෂා සංවිධාන ඇතිව පාලනය වූ බැවින් **තෙකිච්ඡකානි** යැයි නම් තැබිණ. එකුමරු තම කුලයට යෝග්‍ය වූ විද්‍යා

ශිල්ප ශාස්ත්‍ර මනාව උගනිමින් වැඩුණේය. එකල චාණක්‍ය ඇමතියා මේ සුබාහුගේ ප්‍රඥාවේ විපුලබවත්, ක්‍රියාවන්හි උපාය කෞශල්‍ය බවත් දැක; ''මොහු මේ රජකුලයේ පිහිට ලැබ මා අභිභවනය කරන්නේය'' යනුවෙන් ඊර්ෂ්‍යාවෙන් වසඟව, චන්ද්‍රගුප්ත රජු ලවා සුබාහු බන්ධනාගාර ගත කළේය. තේකිච්ඡාකානි කුමරු පියා බන්ධනාගාර ගතවූ බව දැන බියෙන් පලාගොස් වනවාසී තෙරනමක් වෙතට පැමිණියේය. තමාගේ බිය, සංවේගයට හේතු වූ කරුණ තෙරුන්වහන්සේට දැන්වූ හෙතෙම; එතැන පැවිදි වී කමටහන් ගෙන, අබ්භොකාසිකාංගය (එළිමහනෙහිම විසීම) හා නේසජ්ජිකංගය (හිඳගෙනම සිටීම) යන ධුතාංග පුරමින් කෙලෙස් දුරු කිරීමෙහි නිරත විය. සීතල හා උණුසුම නොසලකා මහණදම් පමණක් ම පිරුවේය. විශේෂයෙන් බ්‍රහ්ම විහාර සිත් වැඩීමෙහි ද නිරත විය. මෙය දුටු පාපී මාරයා, ''මොහුට මාගේ විෂය ඉක්මවීමට ඉඩ නොදෙමි''යි කලබල ඇතිකරනු කැමතිව, කුඹුරු වැඩ නිම වූ කල්හි කෙත් රකින්නා වූ පුද්ගලයකු ලෙසින් තෙරුන් වහන්සේ සමීපයට ගොස්, උන්වහන්සේ තැතිගන්වමින් - මෙසේ පැවසීය.

'අනිහිතා විහි, බලගතා සාලි,
නවලහෙ පිණ්ඩං කථමහං කසසං''

''වී කොටුගුළෙහි තැබුවෙමි. සහල් කල විටෙහි රැස්කර තැබුවෙමි. පිඬු නොලබමි. මම කෙසේ නම් සී සාන්තේ ද?''

මෙය ඇසූ තෙරුන් වහන්සේ මේ ගාථා තුන වදාළහ.

''බුද්ධමපපමෙය්‍යං අනුසසර පසනනා,
පීතියා ඵුටසරීරෝ හොහිසි සතතමුදගෝ''
''ධම්ම මපප මෙය්‍යං - පෙ - සඞ්ඝ මපපමෙය්‍යං

එය ඇසූ පාපී මාරයා මේ ගාථාව පැවසීය.

''අඛෙභාකාසෙ ච විහරසි සිතා හෙමනතිකා ඉමා රතතියෝ
මා සීතෙන පරෙතෝ විහඤඤිත්ථෝ, පවිස තවං විහාරං ඵුසිතගහලං''

නැවත තෙරුන් වහන්සේ මේ ගාථාව වදාළහ.

''ඵුසසිසසං චතසෙසා අපපමඤඤායෝ තාහි ච සුඛිතෝ විහරිසසං
නාහං සීතෙන විහඤඤිසසං අනිඤජිතෝ විහරනෙතා'' හී.

මෙහි මුල් ගාථාවේ ''**අනිහිතා වීහි**'' වී ආදි ධාන්‍ය කෝෂ්ඨාගාරයට පමුණුවා නැන්පත් කරන ලදී. එහි ස්වාමීන් (හිමියන්) විසින් ගොයම් කපන නැනින් ගෙදරට ගෙන ගොස් තබන ලදී. ''වී'' ගැනීමෙන් මෙහිදී සෙසු ධාන්‍ය වර්ගද අදහස් විය. හාල් යනු බොහෝ සෙයින් වී වලින් පසුව ලැබෙන්නකි. ''**බලගනා සාලි**'' කලවිටට, ධාන්‍ය සහල් කරන තැනට ගිය සහල් ඇති, එහි රාශිවීම් වශයෙන් මැඩීම්, දිවීම් වශයෙන් පැවති. ප්‍රධාන ධාන්‍ය වර්ගය වූ වී සහ සහල් වෙනම ගැනීමෙන් ඒ ප්‍රධාන ධාන්‍යවලින් ගම් නියම්ගම් ද ඉන් පිටත ප්‍රදේශයන්ද පිරී පැවති බව දක්වයි. ''**නවලහෙ පිණ්ඩං**'' මෙසේ ධනධාන්‍යයන්ගෙන් පිරී, සුහික්ෂ කාලයක පවා මා හට ආහාර පිණ්ඩයක් (පිඬක්) පමණවත් නො ලැබේ. ''දැන් මම කෙසේ නම් සී සාන්තෙම් ද?'' ''මම කෙසේ ජීවත්වන්නෙම් ද?'' යනුවෙන් කෙලි කවටකම් කළේය.

මෙය ඇසූ තෙරුන් වහන්සේ, ''මේ අසරණයා තමාගේ දුක්ඛිතභාවය මා හට පැවසීය. මවිසින් මොහුට කිසිවක් නොකිව යුතුයි. මම මා හටම අවවාද කරගත යුතුයි''යනුවෙන් සිතා ත්‍රිවිධ රත්නයේ ගුණ සිහිකිරීමට තමා යොදවමින් ''බුද්ධමපපමෙය්‍යං'' ආදී ගාථා තුන වදාළ සේක. එහි ''**බුද්ධමපප මෙය්‍යං අනුසසර පසනෙනා**'' පෙර පුරුදු සමඟ අවිද්‍යාව සම්පූර්ණයෙන් ම දුරුකළ බැවින් ද බුද්ධියේ වූ විකසිත භාවයෙන් ද බුද්ධ වූ භාග්‍යවත් බව ප්‍රමාණකරන රාගාදී සියලු කෙලෙස් නැතිකිරීමෙන් ලද අප්‍රමාණ ගුණ සමුදායෙන් යුක්ත වූ පමණ කළ නොහැකි පින්කෙතක් වූ අප්‍රමාණ විශ්වාසවන්ත (ශ්‍රද්ධාව ඇති කරන) වඩ වඩාත් පහදවන, ප්‍රසන්න වූ, ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ''ඒ භාග්‍යවත්හු අර්හත්ය. සම්මා සම්බුද්ධයහ.'' ආදී වශයෙන් ගුණ සිහි කරමින් බුද්ධානුස්සති භාවනාව වඩන්න. ''**පීතියා ඵුටසරීරො හොහීසි සතතමුදගෙහා**'' එසේ සිහිකරන්ම ශරීරයේ පැතිර යන ස්වභාව ඇති ප්‍රීතිය, නිරතුරුව සැමකල්හි ස්පර්ශ කරන ලද ශරීරය ඇතිව, ප්‍රීතියෙන් නැගුණු උසස් රූපයන්ගෙන් වසා පැතිරගත් ශරීර ඇතිව, උද්වේගයට පත්ව උබබේග ප්‍රීතියෙන් නැගුණු උසස් රූපයන්ගෙන් වසා පැතිරගත් ශරීර ඇතිව, උද්වේගයට පත්ව උබබේග ප්‍රීතියෙන් ඔදවැඩී අහසෙහි පැන නැගීමට සමත්වූවෙක් වන්නේ ය. බුද්ධානුස්සතියෙන් බුද්ධ රත්නය අරමුණු කරගෙන මහත් වූ ප්‍රීතියක් සතුටක් විඳින්නේ ය. ඒ හේතුවෙන් සීතෝෂ්ණ දෙක ඉවසන්නාක් මෙන්ම සාපිපාසා දෙක ද ඉවසන්නෙක් වැන්න. ඒ දෙකට යටත්වන්නෙක් නොවන්න. ''ධම්මං'' ආර්ය වූ ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ''**සංඝං**'' ආර්ය වූ පරමාර්ථ සංඝරත්නය ඇසූ ඈදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. ''**අනුසසර**''

යන මෙහිදී (දෙවන ගාථාවේදී) ''භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මනාව දෙසන ලදී'' ආදී වශයෙන් ධර්මය ද ''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපිළිපන්නයහ'' ආදී වශයෙන් සංඝරත්නය ද සිහිකරව'' යනුවෙන් අදහස් ගත යුතුයි.

මෙසේ තෙරුන් වහන්සේ තමා රත්නත්‍රය ගුණ සිහිකිරීමෙහි යොදවමින් තමාට ම අවවාද කරගත් කල්හි, උන්වහන්සේගේ විවේකයේ ඇලුණු සිත විවේචනය කරමින්, ඉතා හිතවත් වූවෙකු මෙන් මාරයා **''අඛොකාසෙව විහරසි''** යන පස්වන ගාථාව පැවසීය. එහි අර්ථ මෙසේය.

''මහණ, නුඹ එළිමහනෙහි කිසියම් නොසෙවුණු තැනක, විවෘත වූ තැනෙක වෙසෙන්නෙහිය. ඉරියවු පවත්වන්නෙහිය. දැන් මේ හේමන්ත කාලයේ හිම වැටෙන සමයයි. මෙකල රාත්‍රිය ඉතා ශීතලය. එනිසා ශීතලෙන් පීඩිතව, මැඩී වෙහෙසට පත්නොවන්න. විඩාවට පත්නොවන්න. ක්ලාන්ත නොවන්න. වැසූ දොරකවුළු, වා කවුළු ඇති සෙනසුනකට හෝ කුටියකට පිවිස සුවසේ වසන්න.'' මේ මාරයාගේ ප්‍රකාශය ඇසූ තේකිච්ඡාකානි තෙරණුවෝ, ''මා හට සෙනසුන්හි විසීමෙන් ප්‍රයෝජනයක් නැත. මෙහිම (එළිමහනෙහි ම) මම සුවසේ වෙසෙමි''යි දක්වමින් සයවන ''ඵුසිසසං'' යන ගාථාව වදාළහ.

එහි **''ඵුසිසසං වනසෙසා අපපමඤඤායො''** අපමණ වූ අරමුණු ඇති බැවින් අප්‍රමාණ්‍ය, අප්‍රමඤඤ නම් වූ සිවුබඹ විහරණ සහිතව වෙසෙමි. කලින් කලට ඒ සිතුවිලිවලට සමවදින්නෙමි. **''නාහි ච සුඛිතො විහරිසසං''** ඒ අප්‍රමාණ්‍ය චෛතසිකයන් නිසා සුවපත්ව, හටගත් සුවයෙන් යුතුව වෙසෙන්නෙමි. සතර ඉරියවු පවත්වන්නෙමි. එනිසා මා හට සැම කාලයම සැපගෙන දෙයි. කිසි කලෙක දුකක් නැත. එහෙයින් ම මම ශීතලෙන් නොඑහෙසෙමි. විඩාවට පත් නොවෙමි. හිමවැටෙන නවම්-මැදින් දෙපෝය අතර වූ දින අටෙහි මම ශීතලෙන් ක්ලාන්ත නොවෙමි. එහෙයින් නොසැලී වෙසෙමි. සිතේ කම්පාවට, සැලීමට හේතුවන ව්‍යාපාදා දී පාපධර්ම මනාව ප්‍රහීණය කළ බැවින් ද පසුව දැඩිව ගැනීම් වශයෙන් සැලීමට පත් නොවන බැවින් ද මම සමවත් සුවයෙන් ම සුවසේ වෙසෙමි. උන්වහන්සේ මේ ගාථාව වදාරමින් ම විදසුන් වඩා රහත් ඵලයෙහි පිහිටි සේක.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''පෙර මම බන්ධුමතී නුවර, ලෙඩ වූ ජනයා සුවපත් කරන, මහජනයාගේ දුක් දුරලා සැප ගෙන දෙන මනාව දක්ෂ වෛද්‍යවරයෙක් වූයෙමි. ඉතා සිල්වත් වූ මහත් සේ බබළන රෝගාබාධයකින් පෙළෙන භික්ෂුනමක් දුටු මම පහන සිතින්, සතුටින් යුක්තව උන්වහන්සේට බෙහෙත් කළෙමි. සංයත වූ ඉඳුරන් ඇති ඒ ශ්‍රමණයන් වහන්සේ එයින් ම සුවපත් වූහ. විපස්සි බුදුරජාණන් වහන්සේ ගේ අශෝක නම් උපස්ථායක තෙරුන්ට, මීට කල්ප අනූ එකකට පෙර දී යම් බෙහෙතක් දුන්නෙම් ද, ඒ ඖෂධ දානයේ බලයෙන් මා මෙතෙක් දුගතියකට නොගියෙමි. මීට කල්ප අටකට පෙරදී ප්‍රබුද්ධ වූ සුවව නම් සත්රුවනින් හෙබි, මහත් බලැති සක්විති රජකුව සැප වින්දෙමි. දැන් මම සියලු කෙලෙස් දවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මේ තෙරුන් වහන්සේ බින්දුසාර රාජසමයෙහි වැඩසිටි බැවින්, උන්වහන්සේ වදාළ ගාථා සය, තෙවැනි ධර්ම සංගීතියේදී ථේරගාථා පාළියට ඇතුලත් කර සංගායනා කරන ලදුයි දත යුතුයි.

තේකිච්ඡාකානි ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.3

''යසස සබ්‍රහ්මචාරිසු'' යනු ආයුෂ්මත් **මහානාග** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් රැස් කරමින් පැමිණියහ. **කකුසඳ** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී සිටුගෙයක උපන් හෙතෙම නුවණැති බවට පත්ව, දිනක් කකුසඳ භාග්‍යවතුන් වහන්සේ අරණ්‍ය වාසයට වැඩ එක්තරා රුක්මුලක ධ්‍යාන සුවයෙන් වැඩසිටිනු දැක, පහන් සිතින් බුළු ඇට මද පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාදයේදී සාකේත නුවර මධුවාසෙට්ඨ නම් බමුණාගේ පුතුව උපන්නේ ය. එකුමරුට **''මහානාග''** යන නම තබන ලදී. නුවණැති බවට පත් එකුමරු අප භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවර අඳුන් වනයේ වැඩවසන සමයෙහි දී, ආයුෂ්මත් **ගවම්පති** තෙරුන් වහන්සේගේ ප්‍රාතිහාර්ය දැකීමෙන් හටගත් ශ්‍රද්ධාව නිසා ඒ තෙරුන් ළඟම පැවිදි ව, ඒ තෙරුන්ගේ අවවාද අනුව ක්‍රියා කොට රහත් භාවය ලබා ගත්තේය.

මහානාග තෙරණුවෝ අපදාන පාළියේ දී මෙසේ වදාළහ.

''සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය, ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ සමූහයා කෙරෙන් වෙන්ව වන වාසයට පැමිණි සේක. මම බුළු ඇට මදගෙන වැලක ඇමිණුවෙමි. භාග්‍යවතුන් වහන්සේ එකල්හි පර්වත අතර ධ්‍යාන වැඩූ සේක. උන්වහන්සේ දුටු මම පහන් සිතින් වීර වූ දක්ෂිණාර්හ වූ ඒ උත්තමයන් වහන්සේට බුළු ඇට මද පූජා කළෙමි. මේ මහා භද්‍ර කල්පයෙහිම කරන ලද ඒ ඵල පූජාවේ විපාක වශයෙන් මම අද දක්වාම දුගතියකට නොගියෙමි. ඵල පූජාවේ විපාක මෙබඳුය. දැන් මම කෙලෙසුන්ගෙන් මිදුණෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත්ව විමුක්ති සුව විඳිමින් සිටි මහානාග තෙරණුවෝ, ඡබ්බග්ගිය භික්ෂූහු එකට මහණදම් පුරණ භික්ෂූන්ට ගරු නොකර වෙසෙනු දැක, ඔවුන්ට අවවාද වශයෙන් මේ ගාථා සය වදාළහ.

යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ නූපලබ්භති
පරිහායති සද්ධම්මා මච්ඡෝ අප්පෝදකෙ යථා''

යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ නූපලබ්භති
න විරූහති සද්ධම්මෙ බෙත්තෙ බීජංව පූතිකං''

''යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ නූපලබ්භති
ආරකා හොති නිබ්බාණා ධම්මරාජස්ස සාසනෙ''

''යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ උපලබ්භති,
න විහායති සද්ධම්මා මච්ඡෝ බහෝදකෙ යථා''

''යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ උපලබ්භති
සෝ විරූහති සද්ධම්මෙ බෙත්තෙ බීජංව භද්දකං''

''යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවෝ උපලබ්භති
සන්තිකෙ හොති නිබ්බාණං ධම්මරාජස්ස සාසනෙ''

එහි ''සබ්‍රහ්මචාරීසු'' සමාන වූ බ්‍රහ්මචර්යාවෙහි සීලාදී ධර්මයන්හි හැසිරෙන්නේය යන අරුතින් ''සබ්‍රහ්මචාරී'' නම් ව, සීල -දෘෂ්ටි ආදයෙන්

සමාන වූ බැවින් ''සහධම්මික'' නම් වන. සබ්‍රහ්මචාරීන් කෙරෙහි. ''ගාරවෝ'' ගරුභාවයෙන් ශීලාදී ගුණ නිමිත්තකරගෙන ගරු කරන්නා වූ. ''**නූපලබ්භති**'' නොපවතියි. විද්‍යමාන නොවේ. සමීපයේ නොසිටියි. ''**නිබ්බාණා**'' කෙලෙසුන් නිවන බැවින්, කෙලෙස් ක්‍ෂය කිරීම, නිර්වාණාවබෝධය. ''ධම්මරාජස්ස'' ශාස්තෘන් වහන්සේගේ; උන්වහන්සේ ''දෙවියන් සහිත ලෝකයාට සුදුසු පරිදි ලෞකික ලෝකෝත්තර ධර්මයන්ගෙන් සතුටු කරවයි, සිත් අලවයි, දේශනා කරයි'' යන අරුතින් ''ධර්මරාජ'' නම් වන සේක. මෙහි ''**ධම්මරාජස්ස සාසනෙ**'' යනු මේ නිවණ නම් ධර්ම රාජ වූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහිම ලැබෙන්නකි. වෙනත් සසුන නොලැබෙන්නකි. එහි යමෙක් සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගරුකිරීම් රහිතව වෙසේ ද ඔහු නිවණින් ඉතා දුරට ගිය තැනැත්තෙකි. එසේම ධර්මරාජයන් වහන්සේගේ ශාසනයෙන් ද බැහැර වූවෙකි. ''**බ්‍යොහාදකෙ**'' දිය පිරුණු විලෙහි. ''**සන්තිකෙ හොති නිබ්බාණං**'' නිවණ ඔහුගේ සමීපයේම වේ. ළඟම තිබේ. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. මෙම ගාථා සයම මහානාග තෙරුන්ගේ රහත්බව ප්‍රකාශ කරන ගාථා විය.

මහානාග ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.4

''**කුලෙලා සීවථිකං**'' යනු ආයුෂ්මත් **කුල්ල** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ සිදුවී ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් සිදුකරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර කෙළෙඹියෙක් ව උපන්හ. කුල්ල නම් වූ හෙතෙම වැඩිවියට පත්ව, ශාස්තෘන් වහන්සේගෙන් දහම් අසා ලැබූ ශ්‍රද්ධාව ඇතිව සසුනේ පැවිදි විය. උන්වහන්සේ රාගචරිතයෙක් වූ බැවින් තියුණු රාග ඇත්තෙක් වූහ. එනිසා උන්වහන්සේගේ සිත නිරතුරුවම කෙලෙස් වසඟව පැවතුණි. උන්වහන්සේගේ මේ සිතේ හැසිරීම දැනගත් ශාස්තෘන් වහන්සේ අසුභ කර්මස්ථානය දී, ''කුල්ලය! නුඹ නිතරම සොහොනේ හැසිරීම කළ යුතුයි'' නියම කළ සේක. සොහොන් බිමට වැඩම කළ කුල්ල තෙරණුවෝ, උද්ධුමාතකාදී ඒ ඒ අසුභයන් දැක ඒ පිළිබඳව මොහොතක් අසුභය සිහිපත් කරති. නමුත් සොහොනෙන් බැහැරවනවාත් සමඟම නැවත කාමරාගෙන් සිත වෙලීයයි. නැවත ද භාග්‍යවතුන් වහන්සේ මේ පුවත දැනගත් සේක්, කුල්ල තෙරුන් සොහොනට

වැඩම කළ අවස්ථාවකදී එක් තරුණියකගේ රූවක් දැන් මැරුණාක් මෙන්, පිරුණු අංගප්‍රත්‍යංගයන්ගෙන් යුක්තව මවා පෙන්වූ සේක. ඒ රූව දුටු වහාම, ජීවත්වන තරුණියක් දුටු කලක මෙන් තෙරුන්ගේ සිත වහා රාගයෙන් මුසපත් විය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ, කුල්ල තෙරුන් ඒ රූව කෙරෙහි ඇලී බලා සිටියදීම, එහි නව දොරින් වැගිරෙන අශුචි මිශ්‍ර පණු ආදීන්ගෙන් යුක්ත වූ අතිශය පිළිකුල් ජනක දුගඳ හමන, භයානක ස්වරූපයක් මවා පෙන්වූ සේක. එය දුටු තෙරුන්ගේ සිත ඒ රූව අප්‍රිය කරන, නොඇලෙන ස්වභාවයට පත්වූ අයුරු නුවණැසින් දත් භාග්‍යවතුන් වහන්සේ මහත් වූ ආලෝකයක පතුරුවා, කුල්ල තෙරුන්ට සිහි ඉපිද වූ සේක.

''අතුරං අසුචිං පූතිං පස්ස කුලල සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දනං''

''කුල්ලය, දුකින් පීඩිත වූ අපවිත්‍ර වූ කුණු වූ උඩින් යටින් නව දොරින් අශුචි වැගිරෙන්නා වූ පුහුදුන් බාලයන්ගේ තණ්හාමානාදියෙන් දැඩි ඇලී පවතින්නා වූ මේ සිරුර දෙස බලන්න.''

එය ඇසූ තෙරණුවෝ, එකෙණෙහිම ශරීරයේ සැබෑ තත්ත්වය සලකා බලා, අසුභ සංඥාව උපදවා ගත්හ. ඒ අසුභ සංඥාවෙහිම පළමු ධ්‍යානය උපදවා ගත් උන්වහන්සේ එය ම පාදක කරගෙන විදසුන් වඩා රහත් ඵලය ලබාගත්හ. ඒ තම පිළිවෙත් මග සිහිකරමින් ප්‍රීතිය පහළ කිරීම් වශයෙන් මේ ගාථා සය වදාළ සේක.

''කුලෙලා සීවථිකං ගන්ත්වා අද්දසං ඉත්ථිමුජ්ඣිතං
අපවිද්ධං සුසානස්මිං බජ්ඣනතිං කිමිහී ථුටං

''ආතුරං අසුචිං පූතිං පස්ස කුලල සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං''

''ධම්මා දාසං ගහෙත්වාන ඤාණුදසනපත්තියා
පච්ච වෙක්ඛිං ඉමං කායං තුච්ඡං සන්තරබාහිරං''

''යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං,
යථා අධෝ තථා උද්ධං, යථා උද්ධං තථා අධෝ,''

''යථා දිවා තථා රත්තිං, යථා රත්තිං තථා දිවා,
යථා පුරෙ තථා පච්ඡා, යථා පච්ඡා තථා පුරෙ.''

''පඤ්චංගිකෙන තූරියෙන න රතී හොති තාදිසී,
යථා ඒකග්ග චිත්තස්ස සම්මා ධම්මං විපස්සතො'' තී.

එහි ''කුලෙලා'' තෙරුන් තමාටම වෙනත් අයකුට මෙන් අමතයි. ''ආතුරං'' නානාවිධ දුක්ඛයන්ගෙන් නිරන්තරව පෙළෙන්නා වූ. ''අසුචිං'' පිරිසිඳුභාවයෙන් තොර වූ ජුගුප්සාජනක වූ පිළිකුල් වූ. ''පූතිං'' දුගඳ හමන, කුණු වූ. ''පස්ස'' ස්වභාවය බලව. යථාර්ථ වශයෙන් බලව. ''කුලල'' යනු තෙරුන්ට අවවාද දෙන අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ ආමන්ත්‍රණයයි. එම වදනම උදන් අණන අවස්ථාවේ තමන් වහන්සේම පවසයි. ''සමුස්සයං'' ශරීරය. ''උග්ඝරන්තං'' උඩින් ඇති වණ, තුවාලවලින්, දොරටුවලින් මළ වැගිරෙන. ''පග්ඝරන්තං'' යටින් වූ වණ මුඛයන්ගෙන් මළ වැගිරෙන, ''බාලානං අභිනන්දිතං'' බාල වූ අඳ බාල පුහුදුන් අය විසින් දෘෂ්ඨී, තණ්හා, මානා දී වශයෙන් ''මමය, මගේ යැ'' යි ඇලී සිටින. සතුටුවන. ''ධම්මාදාසං'' ධර්ම නම් කැඩපත. යම්සේ සත්වයෝ කැඩපතින් තමාගේ මුහුණේ හෝ කයේ හෝ ඇති ගුණ දොස් බලත් ද, එසේම යෝගාවචරයා යම් ආත්මභාවයකදී කිලිටි කරන හා පිරිසිදු බව ඇතිකරන ධර්ම යථා ස්වභාවයෙන් දකියි ද ඒ විදසුන් නුවණ මෙහි ධර්මය නම් කැඩපත යැයි කියන ලදී. ඒ ඤාණ දර්ශනය වූ මාර්ග ඤාණ නම් වූ දහම් ඇස අවබෝධ කරගෙන, ඒ දහම් ඇස තම සන්තානයේ උපදවාගෙන, ''පච්චවෙක්ඛිං ඉමං කායං'' මේ සිවුමහා භූතමය කය, නිත්‍ය-සාරවත් ආදී ගුණයන්ගෙන් දුරු වූ බැවින් හිස් වූ තමාගේ හා අන්‍යයන්ගේ සන්තානයන් විභාග වශයෙන් දැක, අභ්‍යන්තර-බාහිර වූ නුවණැසින් ප්‍රත්‍යවේක්ෂා කළෙමි. සිහිකර බැලුවෙමි. යම්සේ ප්‍රත්‍යවේක්ෂා කළෙමි ද ඒ බව දැක්වීමට, ''යථා ඉදං'' යන ගාථාව වදාළහ. එහි ''යථා ඉදං තථා එතං'' යම් සේ මේ මගේ ශරීරය නම් වූ අසුභ කයින් ආයුෂ, උණුසුම, විඤ්ඤාණය පහ නොවී තිබෙනතාක් නානා විධ වූ මායාවක් වැනි ක්‍රියා දක්වයිද එසේම මේ මළ සිරුර ද පෙර ඒ ආයුෂ, උණුසුම ආදී ධර්ම පහනොවී පැවතුණි. දැන් මේ මළසිරුරින් ඒ ධර්ම පහවූ බැවින්, කිසිදු ක්‍රියාවක් නොදක්වන්නාක් මෙන් මේ මාගේ ශරීරයෙන් ද මේ ධර්ම පහවූ අවස්ථාවේ මෙසේම අක්‍රිය වන්නේ ය. මගේ කය දැන් සොහොනේ නොදමා, නොමැරී, සයනය නොකර, උද්ධුමාතකාදී තත්ත්වයන්ට නොපැමිණ පවතින්නාක් මෙන් මීට මොහොතකට පෙර මේ මළ සිරුරද පැවතුණි. දැන් මේ සොහොනේ

හොවන, උද්ධුමාතකාදි තත්ත්වයන්ට පැමිණියා වූ මළසිරුර මෙන්ම මගේ සිරුර ද අනාගතයේ පත්වන්නේ ය. නැතහොත් අශුචියෙන් පිරී, දුගඳ හමන, පිළිකුල් ජනක, අනිත්‍ය-දුක්ඛ-අනාත්ම භාවයන්ට පැමිණි මේ මළසිරුර මෙන් වූ තත්ත්වයකට මගේ සිරුර ද පත්වන්නේ ය. ''**යථා අඩෙ**'' මේ මළ සිරුරේ නාභියෙන් යට කොටස යම් සේ අශුචියෙන් වැකි, දුගඳ හමන අප්‍රිය, පිළිකුල් සහගත තත්ත්වයට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තත්වයට පත්වූයේද එලෙසින්ම නාභියෙන් උඩ ශරීර කොටස් ද අශුචි වැකි පිළිකුල් සහගත තත්ත්වයටම පත්වන්නේ ය. ''**යථා දිවා තථා රත්තිං**'' මේ කයින් දහවල් කළ කළුළු ආදි අශුචි ඇසින් වැගිරේද එලෙසින්ම රාත්‍රියේදී ද අශුචි වැගිරේ. ''**යථා රත්තිං තථා දිවා**'' රෑ යම්සේ අශුචි වැගිරේ ද දාවල ද එසේම අශුචි වැගිරේ. මෙහි කාලය වෙනස් වීමකින් ශරීරයේ අශුචි වැගිරීම නොනවතින බව පෙන්වාදෙයි. ''**යථා පුරෙ තථා පච්ඡා**'' මේ කය පෙර තරුණ අවස්ථාවේ යම්සේ අශුචි වැගිරුවිද පසුව මහලුව ජරාජීර්ණ වුවත් මේ කයින් එලෙසින්ම අශුචි වැගිරේ. දුගඳ පිලිකුල් සහගත අප්‍රිය වූවෙක්ම වේ. නැතහොත් පෙර, අතීතයේ විඤාණය සහිත කාලයේ දී මේ කය අශුචි ආදි ස්වභාවයන්ට ද අනිත්‍යාදි ධර්මතාවලට ද පත්වූවාක් මෙන්; අනාගතයේ පසුකාලීනව මේ කයින් විඤාණය පහවී ගියත් එලෙසින්ම පිළිකුල් බවට පත් වේ. අසුභ, අනිත්‍යාදි දහම් සවිඤාණික වූ ද අවිඤාණික වූ ද ශරීරයේ එක හා සමාන බව දත යුතුයි. ''**පඤ්චංගිකෙන තූරියෙන**'' ආතතය, විතතය, ආතතවිතතය, ඝනය, සුසිරය යනුවෙන් දැක්වෙන අංග පසකින් යුතු පසඟතුරු නාදයෙන් පිරිවරාගත් කම්සුව විඳින ඉසුරුමත් ජනයාට මෙබඳු වූ ඇලීම් ආශ්වාදයක් නැත. ''**යථා එකඟචිත්තසස සම්මා ධම්මං විපස්සතො**'' සමථය හා විදර්ශනාව මාරුවෙන් මාරුවට වඩා ඉන්ද්‍රියයන්ගේ එකම රසයක් ඇති ස්වභාවයෙන් යුතු, විදසුන් වීථියට පිළිපන්, මේ ලෝකයේ සංඛත ධර්මතා ඇතිව නැතිවන අයුරු දැක්නා වූ යෝගාවචරයාට යම් බඳු දහමේ ඇලීමක් වේද, ඒ ධර්මරතියෙන් දහසයෙන් පංගුවක් වූ හෝ ඇලීමක් කාමුක සුවය කෙරෙහි කාමුකයන්ට ඇති නොවේ. භාග්‍යවතුන් වහන්සේ ඒ බව වදාළ සේක්මය.

''**යතො යතො සම්මසති ඛන්ධානං උදයව්‍යයං**
ලභති පීති පාමොජ්ජං අමතං තං විජානතං''

ස්කන්ධ ධර්මයන්ගේ ඇතිව නැතිවී යෑම යම් යම් සේ දකින්නේ ද ඒ ඒ ආකාරයෙන් ම ප්‍රීතිප්‍රමෝදභාවයට ඒ අමාමහ නිවන් දුටු උත්තමයා පත් වේ.

මෙම ගාථා සය කුල්ල තෙරුන්ගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා ද විය.

කුල්ල තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.5

''මනුජසස'' යනාදී ගාථා ආයුෂ්මත් මාලුංක්‍යපුත්ත තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයෙහිදී පින්දහම් රැස්කරමින් අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර, කොසොල් රට රාජ්‍ය අයකැමියාගේ පුතුව උපන්නේය. ඔහුගේ මව මාළුංක්‍යා නම් වූ බැවින් ඇගේ පුතා යන අරුතින් ''මාලුංක්‍ය පුත්ත'' යැයි ඔහුට නම් තැබුණි. තරුණවියට පත් එකුමරු කාමුක සම්පත් කෙරෙහි නොඇලුණු අදහස් ඇති බැවින්, ගිහි ගේ හැර දමා පිරිවැජි පැවිද්දෙන් පැවිදිව හැසිරෙන කල්හි ශාස්තෘන් වහන්සේ වෙතින් දහම් අසා, බුදුසසුනෙහි පැහැදී ශ්‍රද්ධාව උපදවාගෙන පැවිදි විය. විදසුන් කමටහන් වඩමින් භාවනා කළ මාලුංක්‍යපුත්ත තෙරණුවෝ නොබෝ දිනකින් ම රහත් වූහ. උන්වහන්සේ දිනක් ඥානීන් කෙරෙහි කරුණාවෙන් සිය නෑ කුලයන් වෙත එළඹුනහ. උන්වහන්සේ දුටු නෑ සමූහයා සතුටුව ඉතා ප්‍රණීත ආහාර පානයන්ගෙන් උන්වහන්සේට උවටැන් කර, ධනය පෙන්වා පොළඹවාගනු කැමතිව, මහත් වූ ධන රැසක් ඉදිරියෙහි රැස්කරවූහ. ''මේ ධනය නුඹට ම අයත් වේ. සිවුරු හැර අවුත් මේ ධනය රැගෙන අඹුදරුවන් පෝෂණය කරමින් පින් රැස් කරගන්න''යි උන්වහන්සේගේ ඥාතීහු ඉල්ලා සිටියහ. තෙරණුවෝ ඒ නෑයන්ගේ අදහස් පෙරළා ඉවත දමමින් අහසෙහි වැඩ හිඳ මේ ගාථා සයෙන් ඔවුන්ට දහම් දෙසූ සේක.

''මනුජසස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාළුවා විය
සො පලවති හුරාහුරං ඵල මිච්ඡංව වනසම්ං වානරො''

''යං එසා සහතෙ ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ටංව බීරණං''

''යො වෙ නං සහති ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං
සොකා තම්හා පපතන්ති උදබින්දුව පොක්ඛරා''

''තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා
තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං''

''මාවො නළංව සොතොව මාරො භඤ්ඤි පුනප්පුනං
කරොථ බුද්ධවචනං ඛණෙ වො මා උපච්චගා''

''ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා
පමාදො රජො, පමාදානුපතිතො රජො
අප්පමාදෙන විජ්ජාය අබ්බහෙ සල්ලමත්තනො'' ති.

එහි ''**මනුජස්ස**'' යනු සත්වයාගේ. ''**පමත්තචාරිනො**'' සිහිමුළාවීමෙන් ප්‍රමාද වූ ප්‍රමාදීව හැසිරෙන, ධ්‍යාන - විදර්ශනා-මාර්ග ඵලාදිය නොවඩන. ගසක් වසාගෙන, හාත්පසින් වෙළාගෙන එහි විනාශය සලසමින් මාලුවා වැලක් වැඩෙන්නාක් මෙන්, ඇස් කන් ආදී ඉඳුරන් සය නිසා මෙබඳු ප්‍රමාදී පුද්ගලයාගේ සිතේ නැවත නැවත උපදින තණ්හාව වැඩේ. එසේ වැඩෙන මාලුවා වැල, තමාට වැඩීමට පිහිටාධාර වූ ගස වසාගෙන එය බිමට ඇද දමන්නාක් මෙන් ම තණ්හාවට වසඟව, ඉන් වෙලී ගත් පුද්ගලයා අපායේ හෙලයි. ''**සො පලවති**'' ඒ තණ්හාවට වසඟවූ පුද්ගලයා නැවත නැවත කුදුමහත් භවයෙහි පැන පැන දුවයි. කෙසේ ද? ගෙඩි කැමතිව වනයේ ඒ ඒ ගසට පැන පැන යන වඳුරෙකු මෙනි. ''**ඵලම්ච්ඡංව වනසම්මි වානරො**'' ගෙඩි කැමති ඒ වඳුරා වනයේ ගසක එක් අත්තක් අල්ලා ගනියි. ඒ වඳුරා අත්තක් නොඅල්වාගෙන සිටීමට අසමත් වේ. නිතරම කවර හෝ අත්තක් අල්වාගෙන සිටියි. තණ්හාවට වසඟ වූ පුද්ගලයා ද භවයෙන් භවයට දුවමින්, තණ්හාවෙන් අරමුණු අල්ලාගෙනම සිටියි. තණ්හාවෙන් අරමුණක් අල්ලා නොගෙන සිටීමකට නම් නො පැමිණෙයි. ''**යං**'' යම් පුද්ගලයෙක්, මෙසේ වූ ලාමක භාවයෙන් පහත් නීච බවට පැමිණ, විෂ සහගත ආහාර, මල්,ගෙඩි, ආදි විෂ සහිත ද්‍රව්‍ය පරිභෝග කරන බැවින් ද රූපාදි අරමුණු කෙරේ ඇලී, ගැලී, සිටින බැවින් ''විසත්තික'' නම් වූ සයක් වූ ඉඳුරන් හි හටගත් තණ්හාවෙන් ද වැඩී ගිය ඒ පුරුෂයා තණ්හාවෙන් මැඩී සිටියි. නැවත නැවත වැසි වටකල්හි බෙරු, සවැන්න තණ වහා වැඩෙන්නාක් මෙන් තණ්හාවෙන් වෙලුණු සසර පැවැත්මට මූලික වන ශෝකයෝ වැඩෙති. අභිවෘද්ධියට පැමිණෙති. ''**යො චෙතං -පෙ- දුරච්චයං**'' යම් පුද්ගලයෙක් මෙසේ දැක් වූ ආකාර ඇති, ඉක්මවීමට දුරු කිරීමට අපහසු

වූ තණ්හාව යටපත් කරයි ද මැඩ පවත්වයි ද ඒ පුද්ගලයාගෙන් තණ්හාවට මූලික වූ ශෝකයෝ දුරු වෙති. ඉවත් වෙති. ඒ නෙළුම් කොළයට, පියුම් පතට වැටුණු දිය බිඳු නොරැඳී බිම වැටෙන්නාක් මෙනි. එසේ ම තණ්හාව සිතින් පහ වේ. "**නං වො වදාමි**" එකරුණින්, ඒ හේතුවෙන් මම නුඹලාට මෙසේ කියමි. "**භද්දං වො**" නුඹලාට යහපතක් වේවා. "තණ්හාවට වසඟ වූ පුද්ගලයා මෙන් විනාශයට, අනර්ථයට නුඹලා නොපැමිණේවා" යන අර්ථයයි. "**යාවඤ්හ සමාගතා**" මේ ස්ථානයේ යම් පමණ රැස්වූවාහු ද ඒ සැමට, ඉදින් කුමක් කියන්නේ ද? "තණ්හා නම් භව මූලය නසා දමවු. මේ සදොරින් උපදින තණ්හාවට මූල හේතු වූ අවිද්‍යා දී කෙලෙස් නම් වල් පැල සමූහය අර්හත් මාර්ග ඤාණය නම් උදැල්ලෙන් ගලවා දමවු. මුලිනුපුටා දමවු. කෙසේ ද? සවැන්න මුල් අවශ්‍ය අයෙකු "**උසීරත්ථොව බීරණං**" මහත් උදැල්ලක් ගෙන සවැන්න ගස් උදුරා දමන්නාක් මෙනි. එසේම තණ්හාවේ මුල් උදුරා දමවු. "**මා වො නළං ව සොතොව මාරෝ භඤ්ජි පුනප්පුනං**" නදී තීරයක වූ හටගත් උණ පඳුරක් ඉතා වේගයෙන් පැමිණි ගංදිය පහරකින් වනසන්නාක් මෙන් නුඹලා කරා එන කෙලෙස් මාරයා, මෘත්‍යුමාරයා හා දේවපුත්ත මාරයා නැවත නැවත නුඹලා නොම පොළාවා. එනිසා බුද්ධ වචනය ඉටු කරන්න. "මහණෙනි! ධ්‍යාන භවනා වඩවු. නොපමාවවු." යනුවෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ වචනය ඉටුකරවු. අනුශාසනා කළ පරිදි ප්‍රතිපත්තියෙහි නියැලෙවු. "**ඛණෙ වො මා උපච්චගා**" යමෙක් බුදුවරුන්ගේ වචන ඉටු නොකරයි ද ඒ පුද්ගලයා මේ බුද්ධෝත්පාද ක්ෂණය, සුදුසු ප්‍රදේශයක වාසය. මිනිස් භවයක උප්පත්තිය ලැබීම, සම්‍යක් දෘෂ්ටිය පහළවීම, ආයතන සය විකල් නොවී පැවතීම යනාදී මේ ක්ෂණ සම්පත්තිය නුඹලා ඉක්මවා නොයත්වා. "**ඛණාතීතා**" යමෙක් ඒ ක්ෂණය ඉක්මවූවා ද, යමෙක් ඒ ක්ෂණ සම්පත්තිය අතහැර ගත්තාහු ද ඔවුහු නිරයේ උපදිති. එහි ඉපිද බොහෝ කාලයක් ශෝක කරති. "**පමාදෝ රජෝ**" රූපාදී අරමුණු කෙරෙහි සිහිමුර්ජාවීමෙන් ප්‍රමාදව, කිලිටි බව ඇති කරන බැවින් ද රාගාදී දූවිලිවලින් මිශ්‍ර වූ බැවින් ද "රජෝ" නම් වූ "**පමාදානුපතිතෝ රජෝ**" යම් ඒ රජස් නම් වූ රාගාදී දූවිලි ප්‍රමාද වූ පුද්ගලයාගේ සිතෙහි ප්‍රමාද වීමෙන් ම උපදියි. "**අප්පමාදෙන**" අප්‍රමාදයෙන්, පමානොවන ප්‍රතිපත්තියෙන්. "**විජ්ජාය**" ආර්ය මාර්ග විද්‍යාවෙන්. "**අබ්බහෙ සල්ලමත්තනෝ**" තමාගේ හදය ආශ්‍රය කරගත්, හදවතේ පිහිටි රාගාදී හුල් මුලිනුපුටා දමන්නේය. මුලුමනින්ම නසා දමන්නේ ය.

මාලුංක්‍ය පුත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.6

''පණ්ණවීසති'' යනු ආයුෂ්මත් අපර සප්පදාස තෙරුන්ගේ ගාථාවන්ය. උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් දහම් රැස්කරමින් පැමිණ, මේ බුද්ධෝත්පාදයේදී කපිලවත්තු පුරයේ සුදොවුන් මහ රජුගේ පුරෝහිත බමුණාගේ පුතු ලෙස උපන්හ. එකුමරු **සප්පදාස** යැයි නම් කරන ලදී. තරුණවියට පත් වූ සප්පදාස; උපන් බිමට වැඩ ම වූ ශාස්තෘන් වහන්සේගේ ඥාති සමාගමය දැකීමෙන් හටගත් ශ්‍රද්ධා ඇතිව පැවිදි වී බඹසර හැසිරුණු නමුත් කෙලෙස් මැඩපැවැත්වීමෙන් චේතෝ සමාධිය ලබාගත නොහැකි විය. මේ පිළිබඳව සංවේගයට පත් උන්වහන්සේ, පසුව කැපෙන ආයුධයක් ගෙන නුවණින් මෙනෙහි කිරීමෙන් කමටහන් වඩා රහත් බවට පත්වූහ.

අනතුරුව රහත් බව ප්‍රකාශ කරමින් උන්වහන්සේ මේ ගාථා සය වදාළ සේක.

''පණ්ණවීසතිවස්සානි යතො පබ්බජිතො අහං
අචිරා සංඝාතමත්තමපි චෙතො සනතිං අනජ්ඣගං''

''අලද්ධා චිත්තසෙසකගහං කාමරාගෙන අද්දිතො
බාහා පගය්හ කන්දන්තො විහාරානුපනික්ඛමිං''

''සත්ථං වා ආහරිස්සාමි කො අත්ථෝ ජීවිතෙන මෙ
කථං හි සික්ඛං පච්චක්ඛං කාලං කුබ්බෙථමාදිසෝ''

''තදාහං ඛුරමාදාය මඤ්චකම්හි උපාවිසිං
පරිනීතො ඛුරෝ ආසි ධමනිං ඡෙත්තමත්තනෝ''

''තතෝ මෙ මනසීකාරෝ යොනිසෝ උදපජ්ජථ,
ආදීනවෝ පාතුරහූ, නිබ්බිදා සමතිට්ඨථ''

''තතෝ චිත්තං විමුච්චි මෙ, පස්ස ධම්මසුධම්මතං
තිස්සෝ විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං''

එහි ''පණ්ණවීසති වස්සානි යතො පබ්බජිතො අහං'' යම් තැනෙක පටන් මම පැවිදි වූයෙම් ද එතැන් පටන් ගත වූ වසර විසිපහ තුල, ''අචිරා

සංඝාතමන්තමටි චෙතො සනතිං අනජ්ඣගං '' ඒ මම බඹසර හැසිරෙමින් මෙතරම් කාලයක් ඇසුරු සනත් පමණකුදු, ඇඟිලි දෙකක් එකට ගසන මොහොතක් පමණකුදු ක්ෂණයක් චිත්ත සමාධියක්, සිතේ එකඟවීමක් නොලැබුවෙමි. මෙසේ චිත්ත ඒකාග්‍රතාව නොලැබීමට හේතුව මෙසේ දක්වයි. ''**කාමරාගෙන අද්ධිතො**'' යනුවෙන්. මෙහි ''**අද්ධිතො**'' යනු පෙළනෙමි. මැඩුනෙමි. ''**බාහාපගඝඤ්ච කඤ්ඤෙනා**'' මෙසේ ''කාමුක සිතින් විසීම ඉතා නුසුදුසු වූවකි. මේ නෛර්යාණික සසුනේ පැවිදි වී තාමගේ සිත කෙලෙස් මඩින් උඩට ගැනීමට නොහැකිවූයෙමි.'' මෙසේ සිතූ මම දෙඅත් මුදුනෙහි බැඳගෙන හඬමින් විහාරයෙන් නික්මුණෙමි. වසන්නා වූ විහාරයෙන් පිටතට ගියෙමි. එසේ නික්මුණේ යම් අදහසකින් ද ඒ අදහස දක්වීමට ''සත්‍ථං වා අහරිස්සාමි'' යන ගාථාව කියන ලදී. එහි ''**සත්‍ථං වා ආහරිස්සාමි**'' මෙහි ''වා'' ශබ්දය විකල්පාර්ථයේ යෙදේ. ප්‍රපාතයකින් හෝ පතමි, බෙල්ලේ වැලලා හෝ ගනිමි. ආදී වශයෙන් මැරෙන ආකාරයක් දක්වයි. ''**සික්ඛං**'' අධිශීල ශික්ෂාව, ''**පච්චක්ඛං**'' ප්‍රතික්ෂේප කරමින්, අත් හරිමින් ''**පච්චක්ඛා**'' යන පාඨය ද යෙදේ. ප්‍රතික්ෂේප කරයි යන අර්ථයයි. ''**කාලං**'' මරණයට. ''කෙසේ නම් මා වැන්නෙක් ගිහි බවට පත්ව මැරෙමි ද?'' යන අර්ථයයි. ශික්ෂා ප්‍රතික්ෂේප කර ගිහිවීම ආර්ය චිතයෙහි මරණයට පත්වීමකි. ''මරණ'' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''මහණෙනි! යමෙක් මේ සස්නෙහි ශික්ෂා ප්‍රතික්ෂේප කර හීන බවට (ගිහි බවට) පත්වන්නේ ද එය මරණයෙකි'' යනුවෙනි. ''**සික්ඛං පච්චක්ඛා**'' යන පාඨය ගත් විට ''කෙසේ නම් මා වැන්නකු ශික්ෂා ප්‍රතික්ෂේප කර මරණයට පත්වන්නෙම් ද? අධිශීල ශික්ෂාවෙන් යුක්තවම කළුරිය කරන්නෙමි. එනිසා ''ආයුධයක් හෝ ගෙන දිවි තොරකර ගන්නෙමි. මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද?'' යනුවෙන් අර්ථ ගත යුතුයි. ''**තදාහං**'' කෙලෙස් වලින් මැඩුණු හෙයින් මහණ දහම් කිරීමට අසමත්ව ජීවිතය පිළිබඳව කළකිරුණු වී මම, ''බුරං'' බාබර්ගේ කරයක්, දැලිපිහිය වැනි ආයුධයක්. ''**මඤ්චකම්හි උපාවිසිං**'' අනුන් විසින් වලක්වාලයි යන බියෙන් කුටියකට පිවිස ඇඳෙහි හොත්තෙමි. ''**පරිනීතො**'' එළවූයෙමි. බෙල්ලෙහි තැබුවෙමි යන අදහසයි. ''ධමනිං'' ගෙලෙහි ධමනිය. ගෙලේ ධමනියට ''ගලනහරය'' යැයි ද කියති. ''**ඡෙත්තුං**'' සිඳීමට. ''**තතො මෙ මනසිකාරෝ යොනිසො උදපජ්ඣථ**'' මම යම් කලෙක ''මැරෙන්නෙමි''යි ගලනහරය සිඳීමට දැලි පිහිය තබාගත්තෙම් ද, ඊට පසුව ''මගේ ශීලය නිරුපද්‍රිත ද?''යි සිහිපත් කර බැලූ මා හට මාගේ ශීලය නොකැඩුණු, නොසිඳුණු ඉතා පිරිසිදු වූවක් බව දැකගැනීමෙන් ප්‍රීතියක් උපන්නේය. ප්‍රීතියට පත් සිතැති මාගේ කය සන්සිඳුණි. සන්සුන් කයින් නිරාමිෂ වූ සුව අනුභව කරන එකඟ වූ සිතැති මා හට විඳසුන් වැඩීම්

වශයෙන් නුවණින් මෙනෙහි කිරීම නම් වූ යෝනිසෝ මනසිකාරය උපන්නේය. නැතහොත් ''නතො'' දැලි පිහියෙන් බෙල්ලේ කරන ලද තුවාලය ඇති වූ කල්හි, ඉන් උපන් වේදනාව දුරුකරමින් විදර්ශනා වශයෙන් යෝනිසෝ මනසිකාරය උපන්නේය. දැන් ඊට පසුව මාර්ග ඵල ප්‍රත්‍යවේක්ෂණ ඥානය උපන් බව දැක්වීමට ''ආදීනවො පාතුරහු'' යන ගාථාව වදාළහ. එහි අර්ථ ඉහත දී විස්තර කරන ලද්දේමය.

අපර සප්පදාස තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.7

''උට්ඨෙහි'' යනු ආයුෂ්මත් **කාතියාන** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයෙහි පින්දහම් රැස්කරමින් පැමිණියහ. මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර එක් කෝසිය ගෝත්‍රික බ්‍රාහ්මණයෙකුගේ පුතු ලෙස උපන් හෙතෙම, මවගේ ගෝත්‍ර නාම වශයෙන් ''**කාතියාන**'' නමින් ප්‍රකට විය. තරුණවියට පත් එකුමරු සාමඤ්ඤකානි තෙරුන් වහන්සේගේ ගිහිකළ සහායක ව (යහලුවකුව) සිටි බැවින් තෙරුන් වහන්සේ නිසා බුදු සසුනේ පැවිදි විය. මහණදහම්, වත් පිළිවෙත් පිරූ කාතියාන තෙරණුවෝ දිනක් ''රාත්‍රියේ නිදිමත දුරුකරන්නෙමි''යි සක්මන් කිරීම ඇරඹූහ. සක්මන් කරන උන්වහන්සේ නින්දෙන් මඩනා ලදුව පය පටලැවී, පෙරලී එහිම බිම වැටුනහ. එම සිදුවීම දුටු ශාස්තෘන් වහන්සේ එතැනට වැඩමවා අහසේ වැඩහිඳ ''කාතියාන'' යැයි ඇමතූ සේක. ශාස්තෘන් වහන්සේ දැක නැගී සිටි කාතියාන තෙරණුවෝ තම ක්‍රියාව පිළිබඳව සංවේගයට පත්වූහ. අනතුරුව ශාස්තෘන් වහන්සේ මේ ගාථා සයෙන් කාතියාන තෙරුන්ට දහම් දෙසූ සේක.

''උට්ඨෙහි නිසීද කාතියාන
මා නිද්දාබහුලො අහු ජාගරසසු
මා තං අලසං පමත්ත බන්ධු
කුටෙනෙව ජිනාතු මච්චුරාජා''

''ස යථාපි මහා සමුද්ද වෙගො
එවං ජාතිජරානිවත්තතෙ තං

සො කරොහි සුදීපමත්තනා තථං
නහි තාණං තව විජ්ජතෙව අඤ්ඤං''

''සත්ථාහි විජෙසි මගගමෙතං
සංගා ජාතිජරාභයා අතීතං
පුබ්බාපරරත්තමප්පමත්තෙතා
අනුයුඤ්ජසසු දඞ්ගං කරොහි යොගං''

පුරිමානි පමුඤ්චව බන්ධනානි
සංසාටි බුරමුද්ධභිකඛ භොජී,
මා බිඩ්ඩාරතිඤ්චව නිද්දං
අනුයුඤ්ජිත්ථ කාතියාන''

''ඣායාහි ජිනාහි කාතියාන
යොගකෙඛමපථෙසු කොවිදොසි
පපපුය්‍ය අනුත්තරං විසුද්ධිං
පරිනිබ්බාහිසි වාරිනාව ජොති''

''පජ්ජොතිකරො පරිත්තරංසො
වානෙන විනම්‍යතෙ ලතාව
එවම්පි තුවං අනාදියානො
මාරං ඉඤ්ඣසගොත්ත නිද්ධුනාහි
සො වෙදයිතාසු වීතරාගො
කාලං කංඛ ඉධෙව සීතිභූතො'' හී.

මෙහි ''උට්ඨෙහි'' නිදාගෙන සිටින සයනයෙන්, හොත් ඉරියවුවෙන් නැගී සිටීමට උට්ඨාන වීර්යය කරව. නිදාගෙන සිටීම, සයනය කිරීම කුසීත පක්‍ෂයට බරවූවක් බැවින් නො නිදන්න. ''**නිසීද**'' පලක් බැඳගෙන, කය සෘජුව තබාගෙන, සතිය ඉදිරියෙ පිහිටුවාගෙන හිඳගන්න. ''**කාතියාන**'' මෙනෙමින් කාතියාන තෙරුන් ඇමතූ සේක. **මා නිද්‍දා බහුලො අහූ**'' නිදන සුළුව, බොහෝ කාලයක් නිදමින් සිටීම, නින්දෙන් මැඩි විසීම නොකරව. නිදි වැරීමෙහි, නින්ද දුරු කිරීමෙහිම යෙදෙව. ''**මා තං අලසං**'' නිදි වැරීමෙහි යෙදීමෙන් ඒ අලස වූ කුසීත වූ ප්‍රමාදීන්ට ඥාති වූ මාර නම් මෘත්‍යුරාජයා වංචාවෙන් වැද්දකු - මුවන් හෝ කුරුල්ලන් බැඳගන්නාක් මෙන් ජරා මරණ රෝගයන්ගෙන් නො පෙලේ වා. අභිභවනය නොකරාවා. මැඩපවත්වා විනාශ නොකරාවා. ''**සයථාපි**'' යම්සේ ''**මහා සමුද්දවෙගො**'' මහා මුහුදේ රළ වේගය. ''**එවං**'' එසේ. යම්සේ මහමුහුදේ රළ එකපිට එක

නැගෙමින් පැමිණේද එය ඉක්මවා යෑම අපහසුවේද ඒ වෙත යන පුරුෂයා මැඩලා අභිභවා රළ පහර පැනිර යන්නේද එලෙසින්ම ජාතිජරාදී දුක් ද කුසීත කම්මැලි පුද්ගලයා වසාගෙන මැඬගෙන සිටියි. නැවත නැවත ඔහු මැඩපවත්වයි. ''**සො කරොහි**'' කාතියානය! ඒ නුඹ, සතර ඕඝයන්ගෙන් මැඬපැවැත්විය නොහැකි වූ අර්හත් ඵලය නම් වූ සුරක්ෂිත දිවයිනක් බවට තමා පත්කර ගනුව. එම අර්හත් ඵලය ස්ව සන්තානයේ උපදවා ගනුව. ''**නහි තාණං තව විජ්ජතෙව ඇඤ්ඤං**'' මෙහි ''හි'' යනු හේතුවර්ථයේ නිපාතයකි. යම් හෙයකින් ද ? යත්. ඒ ආර්ය වූ රහත් බව නම් අග්‍රඵලයෙන් අන්‍ය වූ වෙනත් පිහිටක් මෙලොව හෝ පරලොව නොලැබේ. එනිසා ඒ අර්හත් බවෙහි, උතුම් පිහිටෙහි පිහිටන්නේ ය. යම්හෙයකින් ද ඒ ශාස්තෘන් වහන්සේ යම් මාර්ගයක ගමන් කිරීමෙන් මැඩලීමට අපහසු වූ මාරයා පරදා දිනූ සේක් ද ඒ අන්‍ය තීර්ත්‍යක බොහෝ දෙනා පැරදූ සේක් ද ඒ මේ පිහිටට, ආර්ය මාර්ගයේ පිහිටීමට හේතුව මෙසේ දක්වයි. පස් වැදෑරුම් රාගාදී සංගයන්ද ජාතිජරා දී භය ද ඉක්මවා ඉන් මිදී, දේවපුත්‍ර - ක්ලේශාදී පස්මරුන් පරදා උතුම් ආර්යමාර්ගයට නුඹගේ ශාස්තෘන් වහන්සේ පත් වූ සේක. ජයගත් සේක. එනිසාම උන්වහන්සේගේ ශ්‍රාවක වූ නුඹලා විසින් ද එය කළ යුතුයි. අත්නොහැරිය යුතුයි. ඒ අර්හත්ඵලය සාක්ෂාත් කරගැනීම පිණිස රෑ පෙරයමෙහි හා රෑ පසුයමෙහි එකලෙසින්ම අප්‍රමාදීව සිහියෙන්, නුවණින් යුක්තව කමටහන් වඩව. යෝග භාවනාවෙහි දැඩි වීර්යයේ යෙදෙව. ''**පුරිමානි පමුඤ්ච බන්ධනානි**'' පෙර ගිහි කාලයේ තිබූ කාමුක බන්ධන, ගිහි බන්ධන, ගිහි බැඳීම් දුරු කරව. ඉන් මිදෙව. එහි අපේක්ෂා රහිතයකු වන්න. **සංඝාටිබුර - මුණ්ඩ හිකඛහොජී**'' ''සඟල සිවුර දරාගෙන, කරයෙන් මුඩුකළ කෙස් ඇතිව පිණ්ඩපාතයෙන් යැපෙන්න. මෙසේ ත්‍රිවිධ පිළිවෙත්හි යෙදීමෙන් පෙර ගිහිකල පැවති බන්ධන වූ ක්‍රීඩා රතියෙහි ඇලීම, නිදා සිටීම දුරු කිරීමට හේතු දක්වීමයි. නුඹ සඟල සිවුර දරීමෙන් ද හිස මුඩුකර ගැනීමෙන් ද පිණ්ඩපාතයෙන් යැපීමෙන් ද ජීවත්වන්නෙහිය. එවිට නුඹ කම්සුව විඳින්නෙක් රාත්‍රි ක්‍රීඩා දියේ නියැලුණෙක් නොවන්නෙහිය. ඒ පෙර වූ රාගාදී පස් වැදෑරුම් බන්ධනවලින් ද රති ක්‍රීඩා, නිදන සුළු බව යන මේවායින් ද වෙන්වන්න. එම ගිහි කටයුතුවල නොයෙදෙන්න'' යන අර්ථයයි. ''**ඣායාහි**'', ධ්‍යාන කරව. අරමුණක සිත නැවත නැවත පිහිටුවා සිහි කරව. එසේ සම සතලිස් කමටහන් හා විදසුන් භාවනා අරමුණුවල පිහිටා ධ්‍යාන වැඩීමෙන් සියලු කෙලෙසුන්ම ජයගත් බවට පැමිණේ. ''ඒ ලක්ඛණ සහිත ධ්‍යාන වැඩීමෙහි යෙදෙන්න''යැයි දක්වමින් ''**ඣායාහි**'', ''ධ්‍යානවඩව'',''**ජිනාහී**'', ''කෙලෙසුන් දිනව'' යනුවෙන් කියන ලදී. ''**යොගඤ්ඤෙම පථෙසු කොවිදොසි**'' සතර ඕඝයෙන් මිදී ක්ෂේම වූ නිවණට

යන මාර්ගය වූ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්හි දක්ෂයෙක්, නිපුණයෙක් වන්න. එනිසා භාවනාවෙහි සිත උත්සාහවත් කරවා, අනුත්තර වූ, ඊට වැඩිවූවක් නොමැති, විශුද්ධ වූ නිවණට, අර්හත් මාර්ගයට පැමිණෙන්නේ ය. නිවණට පැමිණ ජලයෙන් ගිනි නිවීයන්නාක් මෙන් පිරිනිවෙන්නෙහි. මහත් ජල වර්ෂාවක් වැටීමෙන් ගිනි කඳක් මෙන් ආර්ය මාර්ගය නම් වැසි වැටීමෙන් පිරිනිවෙන්නෙහි. "**පඤ්ඤාති කරො**" පහනක් කරගන්න. ප්‍රදීපයක් කරගන්න. "**පරිත්තරංසො**" මඳ වූ කුඩා ගිනි සිළුව, "**විනමෘතෙ**" වැනසී යයි. පහවී යයි. "ලතාව" වැලක් මෙන්. මෙහි අර්ථය මෙසේ ය. යම් සේ පහන්තිර, තෙල් ආදී ප්‍රත්‍ය විකල් වීමෙන් මඳ වූ සිළුවක් ඇති, ප්‍රභාව නැසී ගිය පහනක අල්ප වූ ගිනිසිළුව වැලක් මෙන් සුලඟින් නිවී යන්නේ ද වැනසී යන්නේ ද, එලෙසින් ම නුඹ ද කෝසිය ගෝත්‍රයේ බැවින් ඉඳුයාට, ශක්‍රයාට සමාන වූ ගෝත්‍ර ඇති මාරයාට වසඟ නොවී, යටත් නොවී පංචාරම්මණයන් උපාදාන කර නොගෙන මාරයා විනාශ කරන්න. වනසා විද්වංසනය කර දමන්න. මෙසේ මරු පැරදූ, විද්වංසනය කළ ඒ නුඹ, විඳිය යුතු වූ සියලු චින්දනයන්හි දුරු කළ ඡන්දරාග ඇතිව, මේ ආත්මභාවයේදීම මෙලොවදීම සියලු කෙලෙස් දැවීම්, පරිළාහයන් දුරුකර නිවීගියෙහි. සිසිල් වූයෙහි. මෙලොවදීම පරිනිර්වාණයට පත්වෙන්නෙහිය. මෙසේ ශාස්තෘන් වහන්සේ විසින් අනුපාදිශේෂ නිර්වාණය දක්වාම පමුණුවන ලද අදහස් ඇති කාතියාන තෙරණුවෝ; මේ ධර්ම දේශනාව අවසානයේදී විඳසුන් වඩා රහත් වූහ. රහත් වූ පසුව ශාස්තෘන් වහන්සේ වදාළ පරිද්දෙන්ම මෙම ගාථා සය නැවත වදාළහ. එම ගාථාව උන්වහන්සේගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා විය.

කාතියාන තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.8

"සුදෙසිතො" යනු ආයුෂ්මත් මිගජාල තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව සසර ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරගෙන වුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර විශාඛා මහ උපාසිකාවගේ පුතකු ලෙස උපන්හ. ඔහුගේ නම මිගජාල නම් විය. නිතරම විහාරයට යන ඔහු ධර්මශ්‍රවණය කොට, ලැබූ ශ්‍රද්ධාව නිසා සසුනේ පැවිදි විය. නොබෝ

දිනකින්ම විදසුන් වඩා රහත් වූ මිගජාල තෙරණුවෝ සිය රහත් බව ප්‍රකාශ කරමින් මේ ගාථා සය වදාළ සේක.

''සුදෙසිතො චක්ඛුමතො බුද්ධෙනාදිච්චබන්ධුනා
සබ්බසංයොජනාතීතො සබ්බවට්ට විනාසනො''

''නියාානිකො උත්තරණෝ තණ්හාමූලවිසොසනො
විසමූලං ආසාතනං ජෙත්වා පාපෙති නිබ්බුතිං''

''අක්ඛන්ධාණමූලභෙදාය කම්මයන්ත විඝාටනෝ
විඤ්ඤාණානං පරිගහෙ ඤාණවජිරනිපාතනෝ''

''වෙදනානං විඤ්ඤාපනෝ උපාදානපමොචනෝ,
භවං අංගාරකාසුංව ඤාණෙන අනුපස්සකෝ''

''මහාරසෝ සුගම්භීරෝ ජරාමච්චුනිවාරණෝ
අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ දුක්ඛූපසමනෝ සිවෝ''

කම්මං කම්මනති ඤත්වාන විපාකා ච විපාකතෝ
පටිච්චුප්පන්නධම්මානං යථා වා ලොකදස්සනෝ
මහාඛෙමංගමෝ සත්‍ථා පරියොසාන හද්දකෝ'' ති.

මෙහි ''සුදෙසිතො'' මනාව දෙසන ලදී. හික්මවිය යුතු ජනයාගේ අදහස් අනුව මෙලෝ පරලෝ දහම්, පරමාර්ථ දහම් යථාස්වභාවයෙන් දක්වමින් දෙසන ලදී යන අර්ථයයි. නැතහොත් ''සුදෙසිතො'' යනු මනාව දෙසන ලද පැවැත්ම, නැවැත්ම ද ඒ දෙකටම හේතූන් ද නොවෙනස්ව ප්‍රකාශ කිරීම් වශයෙන් දක්වන ලද, මනාව දෙසූ ස්වාක්ඛාත වූ. ''චක්ඛුමතා'' පසැස් ඇති; මසැස, දිවැස, ප්‍රඥා ඇස, බුදු ඇස හා සමතැස(සමන්ත චක්ෂු) යන පසැසින් යුතු. ''බුද්ධෙන'' සර්වඥ බුදුරජාණන් වහන්සේ විසින්. ''ආදිච්ච බන්ධුනා'' සූර්ය වංශික වූ. ලෝකයේ ක්ෂත්‍රිය වංශ දෙකකි. ආදිත්‍ය (සූර්ය) වංශය හා සෝම (චන්ද්‍ර) වංශය යනුවෙනි. මේ දෙකින් ආදිත්‍ය වංශය ඔක්කාක රජුගෙන් ඇරඹුණි. එම ඔක්කාක රජුගෙන් ඇරඹී ශාක්‍ය වංශය ද ආදිත්‍ය ගෝත්‍ර වේ. එනිසාම භාග්‍යවතුන් වහන්සේ ආදිත්‍ය බන්ධු වේ. නැතහොත් සූර්යයාගේ නෑ වූ බැවින් භාග්‍යවත්හු ආදිත්‍ය බන්ධු වෙති. මේ අර්ථය ඉහතින් කියන ලද්දේමය. කාමරාගා දී සියලුම සංයෝජන මුලිනුපුටා දමූ හෙයින් උන්වහන්සේ ''සබ්බසංයොජනාතීතො'' නම් වෙති. කර්ම,

ක්ලේශ, විපාක ඇති සසර පැවතීම නම් වෘතය වනසන ලද, විද්වංසනය කරන ලද හෙයින් ''**සබ්බවට්ටවිනාසනො**'' නම් වෙති. සංසාරය නැමති දූලෙන් මුදවන හෙයින් නිවණ නෙයාණික ''**නියාානිකො**'' නම් වේ. සංසාර මහෝඝයෙන් සත්වයා එතෙර කරවන හෙයින් ''**උත්තරණො**'' නම් වේ. කාම, තණ්හාදී සියලු ඇලීම් වලට මුල් වූ අවිද්‍යාවද අයෝනි සෝ මනසිකාරය ද (අනුවණින් මෙනෙහි කිරීම) වියලවා දමයි, වේලවා දමයි යන අරුතින් ''**තණ්හාමූල විසෙසනො**'' නම් වේ. ත්‍රිවිද්‍යා මනාව අවබෝධ කරගත් පුද්ගලයාගෙන් දුරුවන බැවින්, විෂවූ දුකට හේතුභූත - මූලාධාර වූ බැවින් සත්වයන්ට විෂ මුලක් වූ ''විසමූලං'' ව්‍යසනයන්ට උත්පත්තිස්ථාන වූ බැවින් ''ආසානනං'' සතුන් හෝ මිනිසුන් මරණ තැනක් වූ කර්ම, කර්මක්ලේශ මුලිනුපුටා දමා ''**නිබ්බුතිං**'' නිවීමට, නිවණට පැමිණෙයි.

තෙවන ගාථාවේ නොදැනීමට හේතු වූ බැවින් ''**අඤ්ඤාණමූල**'' නම් වූ, අයොනිසෝ මනසිකාරය ද ආශ්‍රවයෝ ද අඥාන බවේ මූලයන්ය. ''ආශ්‍රව ඇතිවීමෙන් අවිද්‍යාව ඇති වේ'' යැයි කියන ලදී. ඒ අවිද්‍යාව බිඳ දැමීමට වජ්‍රයක් වැනි ඥානය යොදාගෙන, නැතිනම් ''අවිද්‍යා ප්‍රත්‍ය හේතුවෙන් සංස්කාර ඇති වේ'' යනාදී දේශනාව නිසා අවිද්‍යාවට, අඥාන බවට මුල් වූ බැවින් ''**අඤ්ඤාණ මූලං**'' නම් වන භව චක්‍රය, ආර්ය මාර්ග නම් වූ වජ්‍රයෙන් සිඳ බිඳ දැමීමට දෙසන ලද බැවින් ''**අඤ්ඤාණමූල භෙදාය**'' නම් වේ. ''**කම්මයනතවිඝාටනො**'' කර්මය හා ගැළපූ ආත්මභාවය නම් යන්ත්‍රය විද්වංසනය කර දමන, ''**විඤ්ඤාණානං පරිගහෙ**'', ''කර්මභවාදියෙහි තම තමාට අයත් පරිදි කර්මය විසින් දැඩිව විඥානය අල්ලා ගැනීමට පැමිණි කල්හි.'' යනුවෙන් සෙසු වදන් මීට ගලපාගත යුතුයි. ඒ ඒ භවයෙහි පිළිසිඳ ගත් බැවින් ඒ ඒ භවයට නියමිත වූ විඤ්ඤාණස්ථිතිය, විඤ්ඤාණයේ පැවැත්ම මෙහිදී ගන්නා ලද්දේමය. ''ඤාණවජිරනිපාතනො'' ප්‍රඥාව නම් වජ්‍රයේ වැටීමෙන්, ඤාණය නැමැති වජ්‍රායුධය හෙළා, ඒ අවිද්‍යාදී අඥාන මූලයන් නසා දැමීමෙන්, ලෝකෝත්තර ධර්මය වනාහි සත්වයන් උපදින සප්ත භවයන්හි ඉපදීමට සුදුසු වූ විඥානය නසමින් ම උපදියි, ''**වෙදනානං විඤ්ඤාපනො**'' සුබ දුක්ඛාදී ත්‍රිවිධ වේදනාවන් පිළිවෙළින් දුක් නුල්, අනිත්‍යාදී වශයෙන් තත්වූ පරිද්දෙන් දැනුම් දෙන, පවසන. ''**උපාදානපපමොචනො**'' කාමාදී සිව් උපාදානයන්ගෙන් තම චිත්ත සන්තානය මුදවන. ''**භවං අංගාරකාසුංව ඤාණෙන අනුපසසකො**'' කාමාදී නවවිධ භවයන්හි එකොළොස් ගින්නෙන් දැවෙන බැවින්, ඒ කාමාදීභවයන්ට ඇලුණු පුද්ගලයා අඟුරුවලක සේ දැවෙන බව මාර්ග ඥානයෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දැන දක්වන ලද. ශාන්ත ප්‍රණීත භාවයෙන් අතෘප්තිකර අර්ථයෙන් මහාරස ඇති, නැතිනම් පරිඥාදී

මහත් වූ කටයුතු ඇති බැවින් ද ශ්‍රමණබවේ ඵල ලැබීම් වශයෙන් මහත් වූ සම්පත් විඳින බැවින් ද "**මහාරසො**" මහා රස ඇති, රැස් නොකළ උපකරණ ඇති බැවින් අල්ලාගැනීම ඉතා අපහසු, පිහිටක් නොලබන බැවින් ඉතා ගැඹුරු වූ "**සුගම්භීරො**" අතිගැඹුරු. "**ජරාමච්චුනිවාරණො**" අනාගතයේ භවයන්හි ඉපදීම වැලකීම නිසා ජරාවෙන්ද මරණයෙන් ද මුදවන, ජරාමරණ වලකන. දැන් මෙසේ වර්ණනා කරන ලද ධර්ම රත්නයේ ස්වරූපය, ආකාරය දක්වමින් "**අරියො අට්ඨංගිකො මග්ගො**" යනුවෙන් පවසා නැවත එහි ගුණ කිහිපයක් විවරණ කිරීමට "**දුක්ඛූපසමනො**" යනාදිය පැවසූහ. එහි අර්ථ මෙසේය. ඉතා පිරිසිදු අර්ථයෙන් "අරියො" ආර්ය වූ. සම්මා දිට්ඨිය ආදී අංග අටක එකතුවක් බැවින් "අට්ඨංගිකො" අට්ඨංගික වූ. නිවණ සොයා යෑම් අර්ථයෙන් "**මග්ගො**" මාර්ගයක් වූ. සියලු සසර දුක් සින්සිඳුවන හෙයින් "**දුක්ඛූපසමනො**" නම් වූ. ක්ෂේම නිර්භය ස්ථානයක් වූ බැවින් "**සිවො**" නම් වූ.

මේ සස්නෙන් බැහැර සමයක සම්මා සම්බුද්ධ නොවූවත් විසින් දෙසන ලද පරිදි කර්ම විපාකයෝ විපර්යාස වේ. වෙනස් වේ." යැයි කියන්ද එසේ වෙනස් නොකර ප්‍රත්‍යෝත්පන්න ධර්ම "ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්" ලෙස කර්මය "කර්මය" යැයි ද විපාක "විපාක" වශයෙන් දැන, පූර්වභාග ඥානයෙන් දැනගැනීම් හේතුවෙන්, ශාශ්වත-උච්ඡේද යන දෘෂ්ටි දුරුකර, තත්වාකාරයෙන් ආලෝකය දක්නා වූ, ඒ අරි අටඟ මඟ යෑමෙන් ලෝකෝත්තර ඤාණාලෝකය දක්නා වූ. නිවන් දුටු කිසිවකුට කිසිතැනෙක, කිසිදාක උපද්‍රවයක් නොවන බැවින් "**මහාඛෙමං**" මහා ක්ෂේම භූමියක් වූ නිවණට සත්‍වයන් කැඳවාගෙන යන බැවින් "**මහා ඛෙමංගමො**" නම් වූ; සියලු කෙලෙස් දැවීම්, තැවීම්, පිරිතැවීම් සන්සිඳුවන්නා වූ හෙයින් "**සන්තො**" ශාන්ත වූ; නොවෙනස්වන චෙතෝ විමුක්තියෙන් අනුපාදිසේස නිර්වාණ ධාතුවට පැමිණීමෙන් අවසානය ඉතා යහපත් වූ, "**පරියොසානභද්දකො**" ආර්ය අෂ්ඨාංගික මාර්ගය පසැස් ඇති බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලදී.

මෙසේ මිගජාල තෙරණුවෝ නානාප්‍රකාරව, නානාවිධව ආර්ය සද්ධර්මයට ප්‍රශංසා කරන සේක්; ඒ උතුම් දහම තමන් වහන්සේ අවබෝධ කරගත් බව ද සිය රහත් බව දක්වීම් වශයෙන් ද මේ ගාථා වදාළ සේක.

මිගජාල ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.9

''ජානිමදෙන මනෙනාහං'' යනු ආයුෂ්මත් **ජෙන්ත** තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයෙහි පින් දහම් රැස් කරමින් අවුත් මේ බුද්ධෝත්පාදයේ දී කොසොල් රජුගේ පුරෝහිතතුමාට දාව උපන්හ. පුරෝහිතතුමා සිය පුතුට **ජෙන්ත** යන නම තැබීය. තරුණවියට පත් එකුමරු ජාති මදයෙන් ද භෝග මදයෙන් ද ඉසුරුමත් රූප මදයෙන් මත් වී අන්‍යයන් හෙළා දකිමින්ම ගරු කළයුත්තන්ට අගරු කරමින්, පිදිය යුත්තන් නොපුදමින් මානයෙන් වැඩී හැසිරෙයි. දිනක් ජෙන්ත මහත් වූ පිරිසක් පිරිවරාගෙන දහම් දෙසමින් සිටින ශාස්තෘන් වහන්සේ දුටුවේය. දැක උන්වහන්සේ වෙත යමින් ''ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයෝ මා දැක පළමුව පළමුව කථා නොකළේ නම් මම ඔහු සමග කථා නොකරන්නෙමි''යි යන සිතින් සමීපයට ගොස් සිටගෙන සිටියේය. භාග්‍යවතුන් වහන්සේ පළමුව කථා නොකළ හෙයින් තමා ද උඩඟුව කථා නොකර සිට දේශනාවසානයෙහි යන බවක් දැක්වීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ ඔහුට වදාළ සේක.

''න මානං බ්‍රාහ්මණ සාධු අත්ථිකසසිධ බ්‍රාහ්මණ
යෙන අත්ථෙන ආගඤ්ඡි තමෙව මනුබ්‍රූහයා'' **ති.**

''බ්‍රාහ්මණය! මානය යහපත් දෙයක් නොවේ. මේ බුදුසසුනින් ප්‍රයෝජනයක් ලබාගැනීමට මෙහි පැමිණි නුඹ, ඒ මානයම තව තවත් වඩා වර්ධනය කරන්නෙහි ය'' යන ගාථාව වදාළහ. එය ඇසූ ජන්ත බමුණා ''මගේ සිත ශ්‍රමණ භවත් ගෞතමයෝ දැනගත්හ''යි වඩාත් ප්‍රසන්න වූයේ අප භාග්‍යවතුන් වහන්සේගේ දෙපා මුල හිසින් වැඳ වැටී අතිශයින් යටහත් බවක් දැක්වීය. මේ ගාථාවෙන් ජෙන්ත තම ප්‍රශ්නය ඇසීය.

''කෙසු න මානං කයිරාථ - කෙසු අසස සගාරවො
කසසස අපචිතා අසසු - කසසසු සාධු සුපූජිතා'' **ති**

කවරකු කෙරෙහි මානය නොපැවැත්විය යුතු ද? ගරු කටයුත්තෝ කවරහු ද? අපචායනය කළ යුත්තෝ කවරහුද? මනාව පිදිය යුත්තෝ කවරහුද? ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

''මාතරි පිතරි චාපි - අථෝ ජෙට්ඨම්හි භාතරි
ආචරියෙ චතුත්ථම්හි - නෙසු න මානං කයිරාථ

නෙසු අසස සගාරවෝ - නෘසස අපචිනා අසසු
නෘසසු සාධු පූජිනා''

''අරහනෙත සීතිභූතෙ - කතකිච්චෙව අනාසවෙ
නිහච්ච මානං අත්ථදෙධා - තෙ නමසස අනුත්තරෙ''

මෙසේ ප්‍රශ්නය විසඳමින් ඔහුට දහම් දෙසූහ. ''මවුට පියාට මාන නොකළ යුතුයි. වැඩිමල් සොයුරු සොයුරියන්ට ද සිටුවැනිව ගුරුවරුන්ටද මත් නොඉපදවිය යුතුයි. ඔවුන් කෙරෙහි ගරු කරන්නේය. ඔවුන්ට අපචායනය කරන්නේ ය. ඔවුන් මැනවින් පිදිය යුතු වේ.''

''එමෙන්ම අනුත්තර සිසිල් වූ නිවණ අවබෝධ කරගත්තා වූ අනාශ්‍රව වූ කටයුතු කොට නිමියා වූ මානය නැසුවා වූ ස්වාර්ථ සාධනය කරගත් රහතන්වහන්සේලාට ද නමස්කාර කරන්න.''

ඒ ධර්ම දේශනාවසානයේදී ජෙන්ත කුමරු සෝවාන් විය. බුදු සසුනේ පැවිදි වූ ඔහු විදසුන් භාවනාව වඩා නොබෝ දිනකින්ම රහත් ඵලයෙහි පිහිටියේය. රහත් වූ ජෙන්ත තෙරණුවෝ තමාගේ පිළිවෙත් මග දැක්වීම් වශයෙන් මේ ගාථා සය වදාළහ.

''ජාතිමදෙන මතෙනාහං භොග ඉසසරියෙන ච
සණ්ඨාන වණණ රූපෙන මදමතෙනා අවාරිහං''

''නාතතනො සමකං කඤඤි අතිරෙකඤඤ මඤඤිසං
අතිමානහතො බාලො පත්ථදෙධා උසසිතදධජෝ''

''මාතරං පිතරං චාපි අඤඤ ච ගරු සම්මතෙ
න කඤඤි අභිවාදෙසිං මානත්ථදෙධා අනාදරෝ''

''දිසවා විනායකං අගහං සාරථිනං වරුත්තමං
තපනතම්ව ආදිච්චං භික්ඛුසංඝ පුරකඛතං''

''මානං මදං ච ඡඩෙඩත්වා විපසසනෙතන චෙතසා
සිරසා අභිවාදෙසිං සබබ සතතාන මුත්තමං''

''අතිමානෝ ච ඔමානෝ පහීණා සුසමූහතා
අසම්මානෝ සමුච්ඡින්නෝ, සබ්බෙ මානවිධා හතා'' නී.

මෙහි ''ජාතිමදෙන මත්තොහං'' යනු මම ඉතා උසස් බමුණු කුලයේ උපන්නෙමි. මා වැනි වූ උභය කුල පාරිශුද්ධ උසස් කුලවතෙක් නැතැ''යි කුලමානයෙන් මත්ව මානාධිකව විසුවෙමි යන අර්ථයයි. ''**භොග ඉස්සරියෙන ච**'' සම්පත්තියත් අධිපතිභවයත් නිසා, භෝග **සම්පත්තියත්** ඓශ්වර්ය සම්පත්තියත් නිසා උපන් මදයෙන් මත්වූයෙමි. මම එසේ මත්ව හැසිරුණෙමි. ''**සණ්ඨාන වණ්ණ රූපෙන**'' රූප, වර්ණ සටහනින්, ආරෝහ පරිනාහ සම්පත්තියෙන්, සුදු කළු ආදී ඡවි සම්පත්තියෙන්, ශෝභාසම්පන්න අඟපසඟ සහිත රූපශ්‍රීයෙන් යුතු වූයෙමි යනුවෙන් පෙර **කී** ලෙසම අර්ථ ගත යුතුයි. ''මදමත්තො'' ඉහත පැවසූ ලෙසින්ම වෙනත් මදයන්ගෙන් ද මත්වූයෙමි. ''**නා තතනො සමකං**;'' තමාහට, මාහට සමාන වූ ගැලපෙන, ජාති ආදී ලක්ෂණයන්ගෙන් සම වූ, වෙනත් දෙයින් සම වූ වෙනත් **කිසිවකු** නොදුටුවෙමි. මාහට සමානයකු නුදුටු බැවින් මට වඩා **ජාති** ආදියෙන් වැඩි, උස්වූවෙකු කෙසේ දක්නෙමි ද? යන අදහසයි. ''**අතිමානනතො** බාලො'', ඉක්බිති අඳ බාල වූ බැවින් අතිමානයෙන් යුතු වූ මම සාරා උගුලා දැමූ කුසල් හැසිරීම් ඇත්තෙමි, එමෙන්ම තද මන් ඇතිව එස වූ ධ්වජ ඇත්තෙමි, සිතේ තද ගතිය නිසා ගුරුවරුන්ට ද යටහත් පැවතුම් නොකරන්නෙමි, බොහෝ සෙයින් තද වූයෙමි, නොනැමෙන තද ගති ඇතිව එසවූ මාන නැමති ධ්වජ ඇත්තෙමි. මෙසේ කියන ලද අර්ථයම මෙහිදී නවත් ඉතා ප්‍රකට වූවක් කිරීමට ''**මාතරං**'' යනාදිය පැවසූහ. එහි ''**අක්කොසෙ**'' වැඩිමහල් සොයුරු ආදීන්ට ද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ද ''**ගරු සම්මතෙ**'', ගෞරව කළ යුතු යැයි සමාජ සම්මත වූ ගෞරවනීය තනතුරු දරුවන් කෙරෙහි ද ''අනාදරෙ'' ආදර රහිත වූයෙමි. **දිසවා විනායකං** අගහං'' මෙසේ මානයෙන් දැඩිව හැසිරෙන මම, මෙලෝ පරලෝ යන උභයාර්ථ සිද්ධියෙහි හික්මවිය හැකි ජනයා හික්මවන, තමන් වහන්සේ ම අවබෝධ කරගත් බැවින් ද, ලෝකයාට අසහාය නායක බැවින් ද, ''**විනායකං**'' විනායක නම් වූ, දෙවියන් සහිත ලෝකයේ ශීලාදී ගුණයන්ගෙන් ශ්‍රේෂ්ඨ වූ බැවින් ද, ''අගං'' අග්‍ර වූ, පුරුෂයන් දමනය කරමින් අතිශයින් හික්මවන බැවින් සාරථී නම් වූ, පුරුෂයන් දමනය කරමින් අතිශයින් හික්මවන බැවින් සාරථී නම් වූ, පුරුෂයන් දමනය කරන්නන් අතරින් ඉතා උතුම් වූ - ''**සාරථීනං වරුත්තමං**''. බ්‍යාම ප්‍රභා දී ආලෝකයෙන් සූර්යයා මෙන් බබළන, දිලිසෙන - ''**තපනත්තමිව ආදිච්චං**''. භික්ෂු සංඝයා පිරිවරාගෙන දහම් දෙසන, ''**භික්ඛු සංඝ පුරක්ඛතං**'' සියලු සතුන්ටම උතුම් වූ ශාස්තෘන් වහන්සේ දුටුවෙමි. බුද්ධානුභාවයෙන් දුටුමතින්ම තැතිගත්තෙමි ''මම

ශ්‍රේෂ්ඨ වෙමි. අනෘයෝ හීනයෝය'' යනුවෙන් පැවති මානය ද භෝග සම්පත් ආදිය නිසා පැවති මදය ද අත්හැර දමා, ඉවත දමා ''**විප්පසන්නෙන චෙතසා සිරසා අභිවාදෙසිං**'' පහන් සිතින් යුතුව සිරසින් වැන්දෙමි. අභිවාදනය කළෙමි.

මෙසේ දැඩි වූ තද වූ මානයකින් යුක්ත වූ ජෙන්තගේ මානය ශාස්තෘන් වහන්සේ දැකීම් පමණකින් දුරුවූයේ කෙසේ ද? මෙසේ දුරුවූයේ යැයි නොසිතිය යුතුයි. ඒ මානය ශාස්තෘන් වහන්සේ දැකීම් පමණිනු දුරු නොවූයේය. ''තිමෙව අනුබ්‍රූහය'' යනාදී ''ඒ මානයම වඩින්නෙහි'' යනුවෙන් පැවැත්වූ ශාස්තෘධර්ම දේශනාවෙන් ඔහුගේ මානය දුරු විය. ඒ සඳහා ''**මානං මදඤ්ච ඡඩ්ඩෙත්වා**'' යන පස්වන ගාථාව වදාළහ. එහි ''**විප්පසන්නෙන චෙතසා සිරසා අභිවාදෙසිං**'' යන මේ පහන් වූ පැහැදුණු සිතින් යන තැන්හි ඉත්ථම්භූතාර්ථයේ තතියා විභක්තිය යෙදී ඇත. (කරණ විභක්තිය). ''මම ම ශ්‍රේෂ්ඨ වෙමි'' යනුවෙන් පැවති මානය, ''**අතිමානෝ**'' අතිමානයකි. හෙවත් සෙය්‍ය මානයකි. ''මොවුහු මට වඩා නිහීනයෝය'' යනුවෙන් අනෘයන් පහත් කර සැළකීම ''**ඔමානෝ**'' හීන මානයකි''යි කියති. ''මම ශ්‍රේෂ්ඨ වෙමි''යි අනෘයන් ඉක්මවා තමා උතුම් වූවෙකියි අදහමින් පැවති සෙය්‍ය මානය අතිමානයකි. ''මම පහත් වූවෙක්මි''යි පවත්නා හීනමානය ''ඔමාන'' නම් වේ. ''**පහීණා සුසමාහිතා**'' සෝවාන් ආදී මාර්ගඵල වලින් ප්‍රහීන කරගත් මානය අග්‍ර මාර්ගය වූ අර්හත් ඵලය අවබෝධ කරගැනීමෙන් මනාව මුලිනුපුටා දැමූවෙමි. ''**අස්මිමානෝ**'' අසම්මානය නම්, ''මේ මම වෙමි''යි ස්කන්ධයන් මම ය, මාගේ ය යනුවෙන් ගැනීම් වශයෙන් පවත්නා මානයයි. ''**සබ්බෙ**'' යනු හුදෙක් මේ ඉහතින් දැක්වූ අතිමාන, ඔමාන හා අස්මිමාන යන තුන පමණක් නොවේ. උසස් පුද්ගලයාට සෙය්‍යමානාදී වශයෙන් මානය නවවිධ වේ. අතුරු බෙදීම් වශයෙන් අනේකවිධ වේ. අග්‍ර වූ අර්හත් මාර්ගයෙන් මම සියලුම ඒ මානයෝ, මාන කොට්ඨාසයෝ නැසුවෙමි. මුලිනුපුටා දැමුවෙමි.

ජෙන්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.10

"යදා නවො පබ්බජිතො" යනු ආයුෂ්මත් **සුමන** තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී පින්දහම් රැස් කරමින් අවුත්, සිබි නම් භාග්‍යවතුන් වහන්සේගේ සමයෙහි කුලගෙයක උපන්හ. නුවණැති බවට පත් මේ කුලපුතු දිනක් සිබි බුදු රජාණන් වහන්සේ දැක පහන් සිතින් දැසමන් මලින් පූජා කළේය. ඒ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී එක්තරා උපාසකයෙකුගේ ගෙදර පිළිසිඳ ගත්තේය. ඒ උපාසකතුමා ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වහන්සේගේ උපස්ථායකයෙක් විය. එතුමා මීට පෙර ලැබුණු දරුවෝ සියලු දෙනම මිය ගියහ. එනිසා හෙතෙම "ඉදින් මට තව එකම පුතෙකු හෝ ලැබේ නම්, ආර්ය වූ අනුරුද්ධ තෙරුන් වහන්සේ සමීපයේ පැවිදි කරන්නෙමි"යි යන සිතින් දරුවෙකු පැතීය. ඒ අනුව දසමසක් ඇවෑමෙන් උපන් මේ කුමරු නීරෝගීව ම වැඩි සත්වියට පා තැබීය. ඔහුගේ පියා ඒ දරුවා තෙරුන් වහන්සේ ලඟ පැවිදි කරවීය. පැවිදි වූ මේ කුමරු මුහුකුරා ගිය නුවණ ඇති බැවින්, විදසුන් කමටහන වඩන්නේ නොබෝ දිනකින් ම ෂඩ් අභිඥාලාභී මහරහතන් වහන්සේ නමක් විය. මේ සුමන සාමණේරයෝ සිය ගුරුදේවයන්ට උපස්ථාන කරන සේක්; දිනක් "පැන් ගෙනෙන්නෙමි" යි කළයක් රැගෙන ඍද්ධියෙන් අනෝතප්ත විලට වැඩියහ. එහි විසූ එක් මිසදිටු නාග රාජයෙක් අනෝතප්ත විල වැසෙන සේ සත්වරක් දරණුවැලින් වසාගෙන, ඒ මත පෙනය තබාගෙන සුමන සාමණේරයන්ට පැන් ගැනීමට අවසර නොදුන්නේ ය. එවිට ම සුමන හිමියෝ ගුරුළු වෙසක් මවාගෙන, නාරජු මැඩපවත්වා පැන් ගෙන සිය ගුරු දේවයන් වසන තැන බලා වැඩම කළහ. අහසින් වඩින උන්වහන්සේ දුටු අප ශාස්තෘන් වහන්සේ දම්සෙනෙවි **සැරියුත්** තෙරුන් අමතා, "සාරිපුත්‍රය! මොහු දෙස බලව"යි යනාදී වශයෙන් සිවු ගාථාවකින් සුමන හිමියන්ගේ ගුණයන් වදාළ සේක. ඉක්බිති සුමන සාමණේරයෝ මේ ගාථා සය සිය රහත්භාවය ප්‍රකාශ කිරීම් වදාළහ.

"යදා නවො පබ්බජිතො ජාතියා සත්තවස්සිකො
ඉද්ධියා අභිභොත්වාන පත්තගිඤ්ඤං මහිද්ධිකං"

"උපජ්ඣායස්ස උදකං අනොතත්තා මහාසරා
අහරාමි, තතො දිස්වා මං සත්ථා එතදබ්‍රවී"

''සාරිපුත්ත ඉමං පස්ස ආගච්ඡන්තං කුමාරකං
උදකුම්භකමාදාය අජ්ඣත්තං සුසමාහිතං''

''පාසාදිකෙන වත්තෙන කල්‍යාණ ඉරියා පථෝ
සාමණේරොනුරුද්ධස්ස ඉද්ධියා ච විසාරදෝ''

''ආජානියෙන ආජේඤ්ඤා සාධුනා සාධුකාරිතෝ
විනීතෝ අනුරුද්ධෙන කත කිච්චෙන සික්ඛිතෝ''

''සෝ පත්වා පරමං සන්තිං සච්ඡිකත්වා අකුප්පතං
සාමණේරෝ සසුමනෝ මා මං ජඤ්ඤාති ඉච්ඡති'' ති.

මෙහි මූලින් දැක්වූ ගාථා දෙක සුමන තෙරුන් විසින්ම වදාරණ ලදී. ඉතිරි ගාථා සතර උන්වහන්සේව ප්‍රශංසාවට ලක්කරමින් ශාස්තෘන් වහන්සේ විසින් වදාරණ ලදී. එම ගාථා සයම එකතුකර පසුව සුමන තෙරණුවෝ සිය රහත්බව දැක්වීම් වශයෙන් වදාළහ.

මෙහි ''**පනගිඤ්ඤ**'' යනු නාගරාජයායි. ''**තනෝ**'' එකල්හි, යම් කලෙක අලුත පැවිදි වූ උපතින් සත් හැවිරිදි වූ ඒ මම, ඍද්ධි බලයෙන් මහත් ඍද්ධි ඇති නාරජු මැඬපවත්වා අනෝතත්ත විලින් පැන් රැගෙන උපාධ්‍යායන් වහන්සේ වෙත ගියෙමි ද එම කාලයේ යන අර්ථයයි. මා නිමිති කරගෙන, මා සඳහා ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළහ. ඒ ශාස්තෘ ප්‍රකාශය ''**සාරිපුත්ත ඉමං පස්ස**'' යනාදී වශයෙන් දක් වේ. එම තෙවන ගාථාවේ ''**අජ්ඣත්තං සුසමාහිතං**'' යනු අධ්‍යාත්මික විෂය ඇතිව අග්‍ර ඵලය වූ අර්හත් ඵල සමාධියෙන් මනාව සන්සුන් සිතැතිව. ''**පාසාදිකෙන වත්තෙන**'' යනු බලා සිටින අයගේ ප්‍රසාදය ගෙනදෙන හැසිරීමෙන්, මෙය කරණාර්ථයේ යෙදුණු තතියා විභක්ති පදයකි. ''**කල්‍යාණ ඉරියාපථෝ**'' ආවර සම්පන්න ඉරියවු ඇති; නැතහොත් ''**පාසාදිකෙන වත්තෙන**'' යනු ඉර්ථම්භූත ලක්‍ෂණයේ තතියා විභක්ති වචනයකි. ශ්‍රමණයාගේ ස්වභාවය ''**සාමඤ්ඤ**'' ශ්‍රමණ බවයි. ''**සාමඤ්ඤං**'' ශ්‍රමණ බව යන අර්ථයයි. එම අර්ථය, ශ්‍රමණ බව පෙන්වයි. ඒ අනුව පවතියි යන අර්ථයෙන් ''සාමණේර'' නම් වේ. සාමණේර බවයි. ''**ඉද්ධියා ච විසාරදෝ**'' ඍද්ධියෙහි ව්‍යක්ත, විශාරද, ඉතා දක්ෂයෙකු වූයෙමි. ''**ආජානියෙන**'', ''ශ්‍රේෂ්ඨ පුරුෂ වූ, ආත්මාර්ථ පරාර්ථ යන උභයාර්ථයම ඉටු කරන්නා වූ, යහපත් වූ, කළයුතු කටයුතු නිම වූ, අනුරුද්ධ තෙරුන් විසින් ඉතා යහපත්ව උභයාර්ථ සිද්ධිය ගෙනදීම සඳහා මනාව හික්ම වූ, ශ්‍රේෂ්ඨ බව ඇති කරන, මනාව දමනය

වූ, අග්‍ර විද්‍යාවෙන් මනාව හික්මුණු, අසේඛ භාවයට පත්කිරීම් වශයෙන් මනාව හික්මුණු - හික්ම වූ'' යන අර්ථයයි. ඒ සුමන සාමණේරයෝ පරම ශාන්තිය වූ නිවණට පැමිණ අග්‍ර මාර්ගය වූ අර්හත්භාවය අවබෝධ කරගැනීමෙන්, නිර්වාණය සාක්ෂාත් කරගෙන, එය ආත්ම ප්‍රත්‍යක්ෂ කරගෙන, ස්ථීර වූ නොවෙනස්වන අර්හත් ඵලයට අල්පේච්ඡ බව නිසා පැමිණ, ඉතා උතුම් බවට පැමිණි හෙයින් ''මා මං ජඤ්ඤා'', ''මා පිළිබඳව'' ''මෙතෙම ෂඩ් අභිඥාලාභි රහතන් වහන්සේ නමකැ''යි කිසිවෙකුත් නොදනීවා'' යන සිත කැමති වේ. එසේ ප්‍රාර්ථනා කරයි.

සුමන තෙරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.11

''වාතරොගාභිනීතෝ'' යනු ආයුෂ්මත් **නහාතක මුනි** නම් තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින් දහම් රැස් කරමින් අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර බමුණු පවුලක ඉපිද, තුරුණුවියට පැමිණ විද්‍යා ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගියේය. නිතර පුණ්‍ය තීර්ථයන්හි නාන්නා වූ නිසා හෙතෙම **නහාතක** යැයි ප්‍රකට විය. තවුස් පැවිද්දෙන් පැවිදි වූ නහාතක, රජගහ නුවර තුන් යොදුනක් පමණ තැන්හි පැතිර ගිය අරණ්‍යායතනයක වෙසෙමින්, ධාන්‍ය වර්ගවලින් යැපෙමින් ගිනි පුදමින් සිටියේය. මොහුගේ හදවත තුල දිලෙන අර්හත්භාවයට සුදුසු වූ හේතු සම්පත් ඇති බව කළයක් තුල වූ පහනක් මෙන් දුටු ශාස්තෘන් වහන්සේ ඒ අසපුවට වැඩම කළ සේක. භාග්‍යවතුන් වහන්සේ දුටු නහාතක ඉතා සතුටට පත්ව තමාට ලැබෙන ආකාරයෙන් දානය පිළිගැන්වීය. භාග්‍යවතුන් වහන්සේ එම දානය වැළඳූ සේක. මෙසේ දින තුනක්ම දන් වැළඳූ බුදුරදුන් වෙත සිවුවැනි දින පැමිණි නහාතක, ''භාග්‍යවතුන් වහන්ස! නුඹ වහන්සේ ඉතා සියුමැලි වූ ශරීර ඇත්තෙකි. මේ කටුක ආහාරයෙන් යැපෙන්නේ කෙසේද?''යි විචාළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට ආර්යයන් වහන්සේලාගේ ලද දෙයින් සන්තෝෂවන ගුණය ප්‍රකාශ කරමින් දහම් දෙසූ සේක. ඒ ධර්ම දේශනාව ඇසූ තාපසතුමා සෝවාන් විය. ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි වූ හෙතෙම රහත් බවට පත්විය. රහත් ඵලයෙහි පිහිටි ඒ තෙරුන් දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ අරමින්

වැඩම කළ සේක. ඒ අසපුවෙහිම විසූ නහාතක තෙරුන්ට ඊට පසු කාලයක දී වාතාබාධයක් ඇති විය. නැවත ශාස්තෘන් වහන්සේ එහි වැඩමවා පිළිසඳර කථා කිරීම් වශයෙන් උන්වහන්සේගේ විහරණය පිළිබඳව මෙසේ විමසූ සේක.

''වාතරොගාභිනීතෝ තවං විහරං කානනෙ වනෙ
පවිද්ධ ගොචරෙ එෑබෙ කථං භික්ඛු කරිස්සසී'' ති.

එවිට තෙරණුවෝ පිළිතුරු වශයෙන් මේ ගාථා පසෙන් සිය පහසු විහරණය පිළිබඳව බුදුරජාණන් වහන්සේට දැනුම් දුන්හ.

''පීතිසුඛෙන විපුලෙන එරිත්‍යාන සමුස්සයං
එෑඛමිහි අභිසමෙහානෙතා විහරිස්සාමි කානනෙ''

''භාවෙනෙතා සත්තබොජ්ඣංගෙ ඉන්‍ද්‍රියානි බලානි ච
ඣාන සෝ බුම්ම සම්පනෙතා විහරිසසං අනාසවෝ

''විප්පමුතං කිලෙසෙහි සුද්ධ චිත්තං අනාවිලං
අභිඤ්ඤං පච්චවෙක්ඛනෙතා විහරිසසං අනාසවෝ''

''අජ්ඣත්තං ච බහිද්ධා ච යෙ මෙ විජ්ජිංසු ආසවා
සබ්බෙ අසෙසා උච්ඡින්නා න ච උපපජ්ජරෙ පුන''

පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා තිට්ඨන්ති ඡින්නමූලකා
දුක්ඛක්ඛයෝ අනුප්පත්තෙතා, නත්ථිදානි පුනබ්භවෝ'' ති.

එහි ''ඣාන සොඛුම්මසම්පනෙතා'' ධ්‍යානයන්හි සූක්ෂ්ම භාවයෙන් යුක්තව, ධ්‍යානයන්හි සූක්ෂ්මභාවය නම් අරූපධ්‍යානයන්ට සමවැදීමයි. එනිසා ''අෂ්ට සමාපත්ති ලබන ලද්දෙක් වීමි''යැයි මෙහිදී පැවසේ. ඒ ප්‍රකාශයෙන් තමන් වහන්සේගේ උභතොභාග විමුක්තිය අදහස් කරයි. ඇතැම්හු මෙසේ පවසති. ''සොඛුම්ම යනුවෙන් අග්‍ර මාර්ග ඵලයන්හි අධි ප්‍රඥා ශික්ෂාව අදහස් කරන ලදී යනුවෙනි. එයින් ද ''ඣාන'' යන්නෙන් ද තමන් වහන්සේගේ භතෝ භාග විමුක්තිය ප්‍රකට කරයි. ''විප්පමුත්තං කිලෙසෙහි'' විමුක්තියෙන් සංසිඳුණු, සියලු කෙලෙසුන්ගෙන් මිදුණු, එසේම පිරිසිදු වූ ඒ සිත සංකල්පයන්ගෙන් නොකැළඹුණු ''අනාවිලං'' කෙලෙසුන්ගෙන් මිදුණු, නොකැළඹුණු හා ශුද්ධ චිත්තය යන පද තුනින්ම

අර්හත් ඵල චිත්තයම අදහස් කරයි. සෙසු පදයන්ගේ අර්ථ ඉහතින් විස්තර කරන ලදී. මෙම ගාථාවන්ම නහාතකමුනි තෙරුන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කරන ගාථා ද විය.

නහාතකමුනි තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.12

"අකෙකාධසස" යනු ආයුෂ්මත් බ්‍රහ්මදත්ත තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර කොසොල් රජුගේ පුතුව උපන්නේය. ඔහු බ්‍රහ්මදත්ත නම් විය. නිසිවියට පත් එකුමරු ජේතවනාරාමය පිළිගන්නා මහෝත්සවයේදී සිදු වූ බුද්ධානුභාවය දැකීමෙන් හටගත් ශ්‍රද්ධාවෙන් පැවිදිව විදසුන් කමටහන වඩා සිවුපිළිසිඹියාපත් අඩි අභිඥාලාභී මහතෙර නමක් විය. එක් දිනක් ඒ බ්‍රහ්මදත්ත තෙරණුවෝ සැවැත් නුවර පිඬුසිඟා වඩින කල්හි එක් බමුණෙක් උන්වහන්සේට අක්‍රෝශ පරිභව කළේය. එය ඇසූ තෙරණුවෝ නිශ්ශබ්දව ම පිඬු පිණිස හැසිරුණහ. බමුණා නැවතත් අක්‍රෝශ පරිභව කළේය. තෙරණුවෝ ද ඒ බැණුම් අසමින් ම නිශ්ශබ්දව පිඬු සිඟා වැඩියහ. බමුණා "නැවතත් අක්‍රෝශ පරිභව කළත් මේ තෙරණුවෝ කිසිවක් නොකියති"යි පැවසීය. ඒ ප්‍රකාශය ඇසූ තෙරුන් වහන්සේ ඒ බමුණා ප්‍රධාන පිරිසට දහම් දෙසමින් මේ ගාථා සය වදාළ සේක.

"අකෙකාධසස කුතො කොධො දනතසස සමජීවිනො
සම්මදඤ්ඤා විමුත්තසස උපසනතසස තාදිනො"

"තසෙසව තෙන පාපියො යො කුදධං පටිකුජඣති
කුදධං අපපටිකුජඣනෙතා සංගාමං ජෙති දුජජයං"

"උභිනනමසථං චරති අතතනො ච පරසස ච
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති"

"උභිනනං තිකිචඡනතං නං අතතනො ච පරසසච
ජනා මඤ්ඤනති බාලොති යෙ ධම්මසස අකොවිදා"

''උපජ්ඣේ තෙ සචෙ කොධො, ආචජ්ඣ කකවූපමං,
උපජ්ඣේ චෙ රසෙ තණ්හා, පුත්තමංසූපමං සර

''සචෙ ධාවති චිත්තං තෙ කාමෙසු ච භවෙසු ච
බ්‍රහ්මං නිගණ්හ සතියා කිඨාදං විය දුප්පසුං'' තී.

මෙහි ''**අකෙකොධස්ස**'' යනු ක්‍රෝධ, වෛර රහිතයාට. ආර්‍ය මාර්ගයෙන් මුලිනුපුටා දැමූ ක්‍රෝධ සිත් ඇත්තහුට ක්‍රෝධයක් කෙසේ උපදින් ද? ඒ ඒ ක්‍රෝධ සිත ඉපදීමට බලපාන හේතු නැත යන අර්ථයයි. ''**දනතස්ස**'' යනු උතුම් වූ දමනයෙන්, ආර්‍ය මාර්ග දමනයෙන් දමුණු පුද්ගලයාට. ''**සමජීවිනො**'' කාය විෂම වූ සියලු පැවතුම් අතහැර සම වූ දිවි පැවතුම් වශයෙන් ශාන්ත වූ දිවි පැවතුම් ඇත්තහුට. උපශාන්ත වූ මනා නුවණැති බවින් මනාව සිය ඉරියවු පවත්වන්නහුට. ''**සම්මාදඤ්ඤා විමුත්තස්ස**'' මනාව අර්හත්ඵය, අභිඥාදි ධර්ම දැන සියලු ආශ්‍රවයන්ගෙන් සිත මුදවා ගත් පුද්ගලයාට, එසේම සියලු කෙලෙස් දාහ, පරිළාහයන්ගෙන් සිත මුදවා ගත්, ඉෂ්ටාදි අරමුණු පිළිබඳව නො ඇලෙන, තාදි ලක්ෂණයන්ගෙන් යුක්ත වූ රහතන් වහන්සේට. ''**කුතො කොධො**'' ක්‍රෝධයක් කොයින් ද?

මෙසේ සිය රහත් බව දක්වූ තෙරණුවෝ තමාගේ සිතේ ක්‍රෝධ රහිත බව ද ඊට හේතූන් ද පවසා; දැන් ක්‍රෝධයේ ආදීනව හා අක්‍රෝධයේ ආනිසංස දක්වමින් දහම් දෙසන සේක්, ''**තසෙසව**'' යන දෙවන ගාථාව වදාළහ. එහි ''**යො කුද්ධං පටිකුජ්ඣති**'', යම් පුද්ගලයෙක් තමාට කිපුණු, දොස් කියන පුද්ගලයාට නැවත කිපේ ද දොස් කියයි ද ඉන් පසුව කිපෙන්නාට ම, පසුව අක්‍රෝශ පරිභව කරන්නාටම අයහපත වේ. මෙලොවදීම නුවණැත්තනගේ ගැරහීම් ආදී දුකට ද පරලොව දී නිරයේ දුක් විඳීම් ආදියට ද ඉතාම අයහපත්, කල්‍යාණ නොවූ දුක්ඛයන්ට පත් වේ. ''කිපීමෙහි දී කෝපාන්විත පුද්ගලයාට පාපයක්, අයහපතක් වන්නේය'' යන්න කිවයුත්තක් නොවේ. ඇතැම්හු ''යමෙක් නොකිපී සිට නැවත කිපෙන්නා නිසා ඔහුට කිපෙයි'' යනුවෙන් අර්ථ කියයි. ''**කුද්ධං අප්පටිකුජ්ඣනෙතා**'', යමෙක් ''මේ පුද්ගලයා කිපියේය, ''මේ පුද්ගලයා කිපියේය. ක්‍රෝධ පරවශ වූවෙකි''යි දන ඔහුට නැවත නොකිපෙයි ද ඉවසයි ද, ඔහු ජය ගැනීම අසිරු කෙලෙස් සංග්‍රාමය ජයගන්නේය. ඉක්බිතිව දෙදෙනාටම හිත වැඩ සලසන, යහපත් පිළිවෙත ද දක්වමින් මේ තෙවන ගාථාව වදාළහ. ''**එතිනතමත්ථං -පෙ- උපසම්මති**'' යමෙක්, අනෙක් පුද්ගලයා

කෝපාන්විත වූ බව දැක, ''මොහු දැඩි සේ කෝප වසඟ වූවෙකි''යි දැන ඔහුට මෙත් සිත පතුරුවමින් හෝ මධ්‍යස්ථශීලීව හැසිරෙමින් සිහි ඇතිව කල්පනාවෙන් ඉවසයි ද ක්‍රියා කරයි ද, ද්වේෂය නොපතුරුවයි ද; ඔහු තමාටත් අනිකාටත් යන දෙදෙනාට ම මෙලොව පරලෝව යන උභයාර්ථ සිද්ධිය ගෙනදෙමින් හැසිරෙයි. ''**උභිනනතිකිච්ඡනතං**'' තමාගේ ද අනිකාගේ ද යන දෙදෙනාගේම ක්‍රෝධ ව්‍යාධියට පිළියම් කරන, වෛරය ඉවසන ඒ පුද්ගලයා දෙස; ''මේ බාලයෙකි''යි උතුම් හැසිරීම් පිළිබඳ නිපුණ නොවූ අදක්ෂ අදබාලයෝ බලති. ''තමාට අක්‍රෝශ පරිභව කරන, පහරදෙන විට කිසිවක් නොකර සිටින මොහු මෝඩයෙකි''යි සිතති. ඔවුහු එසේ සිතනුයේ යෝනිසෝ මනසිකාරය (නුවණින් මෙනෙහිකර බැලීම) නැති බැවිණි. ''**තිකිච්ඡනතං**'' යන්න ''**තිකිච්ඡනති**'' යනුවෙන් ද දක්වති. ''පිළියම් කරන ස්වභාවය'' යන අර්ථයයි.

මෙසේ තෙරුන් වහන්සේ විසින් දෙසන ලද දහම් ඇසූ අක්කෝසක බමුණා (බැණවැදුණු බමුණා) සංවේගයට පත් ව, සිය තරහ සිත අත්හැර ප්‍රසන්න භාවයට පැමිණ, තෙරුන්ගෙන් සමාව ඉල්ලීය. උන්වහන්ගේ කමාකරවා ගෙන, උන්වහන්සේ ලඟම පැවිදි විය. ඔහුට කමටහන් දෙනවිට ''මොහුට මෛත්‍රී කමටහනම සුදුසුය''යි දුන් බ්‍රහ්මදත්ත තෙරණුවෝ, ක්‍රෝධය සිතට නැඟුණු විට සිහිපත් කර බැලිය යුතු ආකාරය දක්වමින්, ''**උපජෙජ තෙ**'' යන පස්වන ගාථාව වදාළහ. ''**උපජෙජ තෙ සචෙ**'', ඉදින් නුඹට කමටහන් වඩමින් සිටින විට කිසියම් පුද්ගලයකු නිසා බොහෝ කලක් පුරුදු කළ ක්‍රෝධ සිත උපන්නේ නම්, ඒ සිත සන්සිඳවීම පිණිස, ''ඉදින් මහණෙනි! පහත් ළාමක හැසිරීම් ඇති සොරු දෙපැත්තෙහිම දඬු ඇති (දෙපසට ඇදීමෙන් කැපෙන) කියතකින් ඔබගේ ශරීරය කපන්නාහු ද, එවිට සිත දූෂ්‍ය කරගන්නා වූ යමෙක් වේ නම් හෙතෙම මාගේ අනුශාසනය ඉටු කරන්නෙක් නොවේ'' යනාදී වශයෙන් බුදුපියාණන් වහන්සේ කකචූපම සූත්‍රයේ දී වදාළ උපමාව හා අවවාදය සිහිපත් කරගන්න. ''**උපජෙජ චෙ රසෙ තණහා**'', ඉදින් නුඹට මිහිරි, රසවත් ආදී වශයෙන් රස තෘෂ්ණාව, ආහාරයේ දැඩි ආශාව ඇති වේ නම් ඒ ආහාර ගිජු සිත සංසිඳවීම සඳහා පුත්‍රමාංසෝපමාව ගත යුතුයි. කාන්තාරයේ ගිය දෙමාපිය දෙදෙන මරණයට පත් තම පුතුගේ ශරීර කොටස් කමින් කාන්තාරයෙන් එතෙර වූවාක් මෙන් ආහාර තණ්හාවෙන් වැලකී, රස තෘෂ්ණාව බැහැරලා සසුනේ පැවිදි වූ කුලපුත්‍රයා විසින් පිණ්ඩපාතය වැළඳිය යුතුයි. එසේ සැපවිහරණයෙන් යුක්ත වන්න''යි වදාළ පුත්‍ර මාංස උපමාව හා අවවාදය සිහිපත් කරගන්න. ''**සචෙ ධාවති තෙ චිත්තං**'' අනුවණින් මෙනෙහි කිරීමෙන් නුඹගේ සිත

පංචකාම ගුණයන්හි කැමැත්තෙන්, ආශාවෙන් ඇලේ. කාමභවාදියෙහි ඇලී භවයන් පැතීම් වශයෙන් දුවයි. ඇලෙයි. හැසිරෙයි. ''**බිජපං නිගඝණ්ඩ සත්තියා කිඤ්චාදං විය දුජ්පසුං**'' එසේ දිවීමට නොදෙමින්, ගොයම් කෑමට ලොල් වූ දුෂ්ඨ, නපුරු කුළු මීමකු යොතින්, රැහැනින් දැඩිව බැඳ තමාට අවශ්‍ය පරිදි හසුරුවා ගන්නා දක්ෂ පුරුෂයකු මෙන් තම සිත ද සතිය නම් රැහැනින් සමාධි නම් ටැඹෙහි බැඳ වහා ම, ක්ෂණිකව නිග්‍රහ කරව. යම්සේ කෙලෙස් දුරලා, කෙලෙස් රහිත වූවක් කරන්නේ ද එසේ සිත දමනය කරව. ඇතැම්හු මේ බ්‍රහ්මදත්ත තෙරුන් පුහුදුන්ව සිට තමාට කළ අක්‍රෝශ පරිභව ඉවසා, ඒ මිනිසුන්ට ආර්යගුණ ප්‍රකාශ කරමින් දහම් දෙසා, පසුව අවසානයට දැක්වූ දෙකින් තමන් වහන්සේටම අවවාද කරගනිමින් විදසුන් වඩා රහත් ව, ඒ බව ප්‍රකාශ කිරීම සඳහා මේ ගාථා සය ම නැවතත් වදාළ බව කියති.

බ්‍රහ්මදත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.13

''**ජනනමනි වස්සති**'' යනු ආයුෂ්මත් **සිරිමන්ද** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේ දී පින්දහම් රැස්කරමින් ඇවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී සුංසුමාර ගිරියේ බමුණු පවුලක උපන්හ. **සිරිමන්ද** නමින් ප්‍රකට වූ මේ බමුණු තරුණයා තුරුණුවියට පත්ව, භේසකලාවනයේ වෙසෙන බුදුරදුන් වෙත එළඹ ධර්මශ්‍රවණය කළේය. ඉන් ජනිත වූ ශ්‍රද්ධාව නිසා බුදුසසුනේ පැවිදි උපසම්පදාව ලැබූ සිරිමන්ද තෙරණුවෝ, මහණදම් පුරමින් සිටියහ. එක් උපෝසථ දිනයක පාමොක් උදෙසන ස්ථානයෙහි වැඩසිටි උන්වහන්සේ; නිදාන උදෙසීම අවසන් වූ කල්හි, ''මේ ඇවැත් ප්‍රකට කළ පුද්ගලයාටම පහසුවක් වේ'' යනුවෙන් පෙළෙහි අරුත් සලකා බලමින්, විමසමින් ''තමා පැමිණි ඇවැත නොපවසා සඟවන්නාට ඒ මත තව තවත් ඇවැත් ඇති වේ. එය ඔහුට මහණදම් පිරීමට පහසුවක් නොවේ. තම සිදු වූ ඇවැත් හෙළිකරමින් ඊට අවශ්‍ය පිළියම් කරන්නාටම පහසු ඇති වේ'' යනුවෙන් සිතූහ. මෙසේ අර්ථ විමසා බලන්ම ''පුදුමයි! මේ ශාස්තෘ ශාසනය ඉතා පිරිසිදු වූවකි''යි යන පහන් සිත උන්වහන්සේට ඇති විය. එසේ උපන් ප්‍රීතිය මැඩපවත්වා ගනිමින් විදසුන් වැඩූ උන්වහන්සේ රහත්

වූහ. තමාගේ ශාසනික පිළිවෙත් මග සිහිපත් කර බලමින් ඒ පිළිබඳව පහන් සිත් ඇති සිරිමන්ද රහතන් වහන්සේ, සෙසු පුහුදුන් භික්ෂූන්ට අවවාද දෙමින් මේ ගාථා සය වදාළහ.

''ඡනනමතිවස්සති, විවටං නාතිවස්සති,
තස්මා ඡනනං විවරෙථ එවනනං නාතිවස්සති''

''මච්චුනාබ්භාහතෝ ලොකෝ ජරාය පරිවාරිතෝ,
තණ්හා සල්ලෙන ඔතිණ්ණෝ ඉච්ඡාධූපායිතෝ සදා''

''මච්චුනාබ්භාහතෝ ලොකෝ, පරිකිඛිත්තෝ ජරාය ච,
හඤ්ඤති නිච්චමත්තාණෝ පත්තදණ්ඩාව තක්කරෝ''

''ආගච්ඡනතගගිකඛන්ධාව මච්චුබ්‍යාධිජරා තයෝ
පච්චුගගනතුං බලං නත්ථි, ජයෝ නත්ථි පලායිතුං

අමෝඝං දිවසං කයිරා අපෙපන බහුකෙන වා
යං යං විහරතෙ රත්තිං තදූනං තස්ස ජීවිතං''

''චරතෝ තිට්ඨතෝ වාපි ආසීන සයනස්ස වා
උපෙති චරිමා රත්ති, නතෙ කාලෝ පමජ්ජිතුං''නී

මෙහි ''ඡනනං'' වයන ලද, විවෘත නොකළ, ප්‍රකාශ නොකළ දුශ්චරිතයයි. ඇවැතයි. ''අතිවස්සති'' අපත්ති වැස්සක් එකතු වී අතිශයින් වසියි. ඇවැත්සැඟ වීම; අලජ්ජී, ලැජ්ජා නැති බවට හේතු වේ. එසේ ඇවැත් සඟවීමෙන්, ඊටත් වඩා වැඩි වූ අතිශය පාපී ක්‍රියා ලැජ්ජාව නොමැති කමින් සිදු කරයි. ඇවැත් වලට පැමිණෙයි. ඇවැත් සැඟවීම ඇවැත් වර්ෂාවට හේතුවන බව කියන ලදී. ''විවටං'' නොවැසුණු. විවෘත වූ. ''නාති වස්සති'' මෙහි ''අති'' යනු උපසර්ගයකි. ''නොවසියි'' යන අර්ථයයි. මෙහි කෙලෙස්, ඇවැත් වර්ෂාව නොපැවතීම ඉහත විස්තර කළ ක්‍රමයෙන් දතයුතුයි. චිත්ත සන්තානයේ ඉතා පිරිසිදු බව නිසා කෙලෙස්, ඇවැත් වර්ෂාව නොපවතියි. ''තස්මා'' යනු මුලින් කියූ අර්ථයම හේතු කාරණා වන බැවින් ''එනිසා'' යැයි දක්වයි. සැඟවූ දුශ්චරිතය නිසා ඇවැත් කෙලෙස් අධික වර්ෂාව ඇති වේ. දුශ්චරිත හෙළි කිරීමෙන් ඒ වර්ෂාව නොපවතියි යන අර්ථයයි. ''ඡනනං විවරෙථ'' පුහුදුන් බව නිසා ඇවැත් සැඟවීමේ අදහස උපන්නත්, ඒ සිතේ නොපිහිටා ඇවැත (වරද) හෙළි

කරන්නේය. ප්‍රකට කරන්නේය. සුදුසු පරිදි පිළියම් කරන්නේ ය. ''එවං'' සුදුසු පරිදි ධර්මානුකූලව පිළියම් කරමින් ඇවැත හෙළිකිරීමෙන්, ''නං'' යනු ඒ සැඟවූ ඇවැත, ''**නාතිවත්තති**'' කෙලෙස් හා ඇවැත් වර්ෂාව නොපවත්වයි. ඒ පුද්ගලයා පිරිසිදු භාවයෙහි පිහිටුවයි. දැන් ''ඒකාන්තයෙන්ම, වහාම සිය සිත පිරිසිදු කළ යුතුයි. අප්‍රමාදීව මහණ දම් පිරිය යුතුයි.'' යන්නට හේතුවන සංවේග වස්තුව දක්වමින්, ''**මච්චුනාබ්භාහතො ලොකො**'' යන දෙවන ගාථාව වදාරති. එහි ''**මච්චුනාබ්භාහතො ලොකෝ**'' යනු මේ සියලු සත්ව ලෝකය; සොරෙකු මෙන්, චෞර ඝාතකයෙකු නියමිත සියලු සොරු නසන්නාක් මෙන්, මාරයා විසින් මරණයෙන් නසනු ලැබේ. කිසිවකු ඔහුගේ අතින් නොමිදේ. ''**ජරාය පරිවාරිතො**'' මේ ලෝකයා උපතින් පසුව මරණයට පත්වන තුරුම දිරායෑමෙන් පිරිවරාගෙන ඇත. ජරාවෙන් මැඬගෙන ඇත. ජරා රාශියෙන් නොමිදුණේය යන අර්ථයයි. ''**තණ්හාසල්ලෙන ඔතිණ්ණෝ**'', තණ්හාව නම් සැත, ශරීරයේ ඇතුලතින් ඇනීගිය විෂ පිරි ඊතලයක් මෙන් උපාදාන ලක්ෂණයෙන් බැස ගත්තේය. හදවතේ ඇතුලතට බැස ගත්තේය. තණ්හාවෙන් පෙලීම්, විඩාවීම් ඇති කරමින් අධ්‍යාත්මයට පීඩා කරන බැවින් ද අධ්‍යාත්මය උදුරා දමන බැවින් ද සැනක් යැයි කියන ලදි. ''**ඉච්ඡාධූපායිතො**'' යනු අරමුණු පතන ලක්ෂණයෙන් ආශාවෙන් තවන ලද්දේය. ඒ ඒ විෂය අරමුණු කැමැත්තා වූ පුද්ගලයා තමා කැමති වූ අරමුණ ලැබුවත්, නොලැබුවත්; ඒ ආශාව නිසාම දැවේ. තැවේ. ආශාවෙන් සංත්‍රාසයට පරිදාහයට පැමිණේ. ''**සදා**'' යනු සැමදාම. මේ පදය ඉහත කී සෑම පදයක් සමඟම යෙදිය යුතුයි

තෙවන ගාථාවේ ''**පරිකිඛ්තෙතා ජරාය ච**'' යනු හුදෙක් මාරයා විසින් පමණක් ලෝක සත්වයා මඬින ලද්දේ නොවේමය. ''ලෝක සත්වයා ජරාවෙන් ද මඩනා ලද්දේය. ජරාවෙන් පෙලෙන්නේය. ජරාව නැමති පවුරින් වටකරන ලද්දේ එය ඉක්මවා නොයන්නේය'' යන අර්ථයයි. ''**හඤ්ඤති නිච්චමන්තනාණෝ**'' තමා නිතරම පිහිටක් නැතිව අසරණ කරමින් ජරා මරණ දෙක අපට බාධා කරයි. පීඩා කරයි. ඒ කෙසේ ද? පැමිණි දඬුවම් ඇති වරද කරුවෙක්, සොරෙක්, කළ අපරාධ ඇත්තෙක්, වදයට පත්වූවෙක් රාජාඥාවෙන් පිහිටක් නැත්තෙකු කර නසන්නාක් මෙනි. එලෙසින්ම මේ ලෝක සත්වයා ජරා මරණ දෙක නිසා අසරණ වේ යැයි දක්වයි. ''**ආගච්ඡන්තගගිකඛන්ධාව**'', මහ වනය ගිනිගත් කල්හි, ඒ මහවනය විනාශ කරමින් නැගී එන ඉතා විශාල ගිනිකඳක් මෙන් මරණ, ව්‍යාධි, ජරා යන දැවීම් තැවීම් කරන හෙයින් ''ගිනි කඳු'' නම් වූ මේ ධර්මතා තුන සත්ව ලෝකයා මැඩලමින්, වනසමින් පැමිණේ. ඊට විරුද්ධව නැගී සිටීමට

පෙරට ගොස් ඒ ධර්මතා මැඩ පැවැත්වීමට සමත් වූ බලයක්, උත්සාහයක් නැත. එබඳු ජවයක් මේ ලෝක සත්ත්වයාට නැත. මේ ජරා මරණ ව්‍යාධි යන ධර්මතා බැහැර දමා ඒවා ඉක්මවා පලායෑමට සමත් කාය බලයක් ද මේ ලෝක සත්ත්වයාට නැත. ''**පවඩුගහනතුං**'' පෙරට යන්නට ''**බලං නත්ථි**'' බලයක් නැත. ''**ජවෝ නත්ථි පලායිතුං**'' පලා යෑමට ශක්තියක් ද නැත. චිත්ත සමාධි ආදී කුසලාභිවර්ධනයේ අසමත් වේ නම්, **ප්‍රතිකාර** නොලබන මේ මරණව්‍යාධීහු බලවත් වේ. මේ නිතර නැගී සිටින්නා වූ පසමිතුරන්ගේ බල බිඳීමට ඉදින් කුමක් කළ යුතු ද? ''**අමොඝං දිවසං කයිරා අපෙපන බහුකෙන වා**'' යටත් පිරිසෙන් කිරිදෝනා පමණ වූ හෝ කාලයක්, ඊට වැඩි වූ කාලයක් හෝ මුලු රෑ දාවල් දෙකෙහිම හෝ විඳසුන් භාවනාව වඩමින්, විදසුන් මනසිකාරයෙන් නොසිස්ව, නොවඳව දවස ගතකරන්නේය. කාලය ගෙවන්නේය. ''**යං යං විහරතෙ රත්තිං තදූනං තස්ස ජීවිතං**'' මේ සත්ත්වයා යම් යම් රාත්‍රියක් වෙසේ ද ගත කරයි ද ඉක්මවයි ද ඒ ඒ රාත්‍රියක්, රාත්‍රියක් පාසා එම සත්ත්වයාගේ ජීවිතය අඩු වේ. ක්‍ෂය වේ. රෑ ඉක්මවීම යනු ජීවිතය ඉක්මවීමයි. නොනැවතී රෑ ගෙවී යාමත් ජීවිතය ගෙවී යාමත් සිදු වේ.

''**යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මානවො**
අබ්භුටයිත්ථොව සයති සගච්ඡං න නිවත්තති'' **ති.**

''යම් ඒ මානවයෙක් පළමුව එක් රෑයක් ගැබෙහි වෙසේ ද නොනැගිටීම නිදයි ද නමුත් ඔහුගේ දිවි ගමන නොනවතියි.''

හුදෙක් රාත්‍රී ඉක්ම යෑමෙන් පමණක් නොව ඉරියවු පැවැත්වීම් වශයෙන් ද ජීවිතය ක්‍ෂය වීම සැළකිය යුතුයැයි ''**චරතො**'' යන අවසන් ගාථාව වදාරන ලදී. එහි ''චරතො'' යන්නා වූ තැනැත්තාට ''**තිට්ඨතො**'' සිටගෙන සිටින්නාට ''**ආසීනසයනස්ස වා**'' හිඳගත්තහුට හෝ නිදාගත් තැනැත්තාට යන අර්ථයයි. ''ආසීදනං'' යන පාඨය ද යෙදේ. එය ඡට්ඨී විභක්ති අර්ථයේ දුතියා විභක්ති වචනයක් බව දත යුතුයි. ''**උපෙති චරිමා රත්ති**'' චුති සිත, භවයේ අවසන් සිත සහිත වූ අවසන් රාත්‍රිය එළඹෙයි. මෙහි රාත්‍රිය ගැනීමෙන් දේශනාවේ මුඛ්‍යාර්ථය, අවසානය දක්වයි.

යෑම්, ඊම් අදී යම් කිසි ඉරියවුවකින් යුක්තව සිටින්නාට ජීවිතාවසානය මරණකාලය වන්නේ ම ය. එනිසා ඔහුට ඉරියවු ඉක්මවීමත් සමඟම ජීවිතය ක්‍ෂය වියෑමත් එක්විටම සිදුවෙයි. එනිසා නුඹලාට පමාවීමට කාලයක් නොමැත. නුඹලා ප්‍රමාදයට නොපැමිණෙවු. මේ අවස්ථාවෙහි මරණය සිදු නොවේ යැයි නො දත හැකි බව කියන ලදී.

''අනිමිත්තමනඤ්ඤාතං මච්චානමිධ ජීවිතං
කසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුක්ඛේන සංයුතං'' තී.

මෙලොව සත්ත්වයන්ගේ ජීවිතය පිළිබඳව පූර්ව නිමිති නොදත හැකිය. කර්කශ වූද ඉතා කුඩා වූ ද ඒ සියලු දෙන (සැමදෙන) දුකින් යුක්තවූවෝ වෙති.

එනිසා මේ අයුරින් තමා, තම තමන්ටම අවවාද දී අප්‍රමාදීව ත්‍රිශික්ෂාවෙහි යෙදී නිර්වාණාවබෝධය කරගත යුතුය යන අදහසින් මේ ගාථා වදාළහ.

සිරිමන්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

6.1.4

''දිපාදකෝ'' යනාදී ගාථා ආයුෂ්මත් **සබ්බකාමී** තෙරුන්වහන්සේ විසින් පවසන ලදී. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයේ ඇති වූ අර්බුදයක් පිරිසිඳු කර, නැවත මුල් ස්වභාවයට ගෙනවුත් (දුර්මත බැහැර ලා පිරිසිඳු බුදු දෙසුමම හෙළිකර) තැබූ එක් මහතෙරනමක් දැක; ''මම ද අනාගතයේ එක් බුදුවරයෙකුගේ සසුනේ පහළවන අර්බුද බැහැරලා නැවත නියම බුදු දෙසුම පිරිසිඳු කර දක්වීමට සමර්ථයෙක් වේවා''යි පැතූහ. ඒ ප්‍රාර්ථනාවට අනුකූල වූ පින් දහම් සිදුකරමින් දෙව් මිනිසුන් අතර සැරිසැරූ හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේ දී අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීමට පෙරදීම විශාලා මහනුවර ක්ෂත්‍රිය පවුලක ඉපිද ''**සබ්බකාමී**'' නමින් ප්‍රකට විය. නිසි වයසට එළඹි ඒ රජකුමරුට නෑයන් විසින් සුදුසු මනාලියක් ගෙනවුත් පාවාදෙන ලදී. නමුත් කාමුක සම්පත්හි නොඇලුණු සිතැති සබ්බකාමී කුමරු ගිහිගේ පිළිකුල් වූ බැවින් ගිහිසැප හැරදමා ගොස්, ධර්මභාණ්ඩාගාරික ආනන්ද තෙරුන් වහන්සේ සමීපයේ පැවිදි විය. මහණදම් පුරමින් සිය උපාධ්‍යායන් වහන්සේ සමඟ විශාලාවට පැමිණ; සිය ඥාතීන් බැලීමට වැඩම වූ සබ්බකාමී තෙරුන් වෙත; උන්වහන්සේගේ ගිහිකල භාර්යාව ස්වාමි විප්‍රයෝගය නිසා කෘශ වූ දුර්වර්ණ සිරුරින් ද අලංකාර නොවූ කිලිටි වස්ත්‍රවලින් ද යුතුව අඬමින් පැමිණ තෙරුන්ට වැඳ එකත් පසෙක සිටියාය. ඇය දුටු

සබ්බකාමී තෙරණුවෝ කරුණාව පෙරටුකරගත් මෙත් සිත ඇය කෙරෙහි පැතිරවූහ. නුසුදුසු අරමුණ පැතිර වූ මේ මෙත් සිත අනුවණින් මෙනෙහි කිරීම නිසා (අයෝනිසෝ මනසිකාරයෙන් යුතු හෙයින්) උන්වහන්සේගේ සිතේ වහා කෙලෙස් දහම්, රාගී හැඟීම් වර්ධනය විය. ඉන්පසු එකරුණ දුටු තෙරුන් වහන්සේ කසපහර ලද උසස් කුලයේ (අජානීය) අශ්වයකු මෙන් වහා සොහොනට වැඩමවා අසුභ නිමිත්තක් ලැබ, එය සිහිකිරීමෙන් ලබනලද ධ්‍යානය පාදක කරගෙන විදසුන් සිහිකිරීමෙන් ලබන ලද ධ්‍යානය පාදක කරගෙන විදසුන් වඩා රහත් වූහ. එවිට උන්වහන්සේගේ මාමණ්ඩිය (බිරිඳගේ පියා) තම දුවණියන් ඉතා අලංකාරවත්ව සරසා ගෙන මහත් වූ පිරිවරින් තෙරුන් සිවුරු හරවා ගැනීමේ අදහසින් විහාරයට පැමිණි අවස්ථාවෙහි; සබ්බකාමී තෙරණුවෝ ඔවුන්ගේ අභිප්‍රාය දැන, තමන් වහන්සේ කාමයන්හි නොඇලුණු බවත්, සෑම තැනකම නො ඇලෙන බවත් ප්‍රකාශ කරමින් මේ ගාථා සය වදාළහ.

''දිපාදකොයං අසුචි දුගන්ධෝ පරිහීරති
නානා කුණප පරිපූරෝ විසසවනෙත්තා තතෝ තතෝ''

''මිගං නිලීනං කූටෙන බලිසෙනෙව අම්බුජං
වානරං විය ලෙපෙන බාධයන්ති පුථුජ්ජනං''

''රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනෝරමා
පඤ්චකාම ගුණා එතෙ ඉත්ථී රූපසම්ං දිසසරෙ''

''යෙ එතා උපසෙවන්ති රත්තචිත්තා පුථුජ්ජනා
වඩ්ඪන්ති කටසිං සොරං ආචිණන්ති පුනබ්භවං''

''යෝ වෙතා පරිවජ්ජෙති සපපසෙසව පදාසිරෝ
සොමං විසත්තිකං ලොකෙ සතෝ සමතිවත්තති''

''කාමෙසවාදීනවං දිසවා නෙකඛම්මං දඨඨු ඛෙමතෝ
නිසසටෝ සබ්බකාමෙහි පත්තෝ මෙ ආසවක්ඛයෝ'' ති.

මෙහි ''දිපාදකෝ'' පා ඇති, නැති සෑම සත්ත්වයකුගේම කය අශුචියෙන් පිරුණේම ය. මෙහි ''දෙපා ඇති'' යනුවෙන් අධිකාර වශයෙන් හෝ ඉතා උසස් වෙන්කිරීම් වශයෙන් විශේෂ කර දක්වන ලදී. අනෙකුත් අශුචියෙන් පිරි සත්වයන්ගේ ශරීර ලුණු, ඇඹුල් දමා මනුෂ්‍යයන්ගේ භෝජනය

සඳහා ගනිති. නමුත් මිනිස් ශරීර කොටස් එසේ නොගනියි. එනිසා එසේ මිනිස් ශරීරය ඉතාමත් අශුචි සහගත බව දැක්වීමට මෙසේ ''දෙපා ඇති'' යනුවෙන් කියන ලදී. ''අයං'' මේ, ඒ ඖතානීන් විසින් ඉදිරියේ තැබූ ස්ත්‍රී රූපය සඳහා මෙය කියන ලදී. ''**අසුචි**'' අසුචි, අපවිත්‍ර වූවක් මය. මේ ශරීරයේ කිසිදු පිරිසිදු, පවිත්‍රභාවයක් නොමැත. ''**දුගන්ධො පරිහීරති**''. ඉතා දුගඳ පිළිකුල් වූ මේ ශරීරය මල් ගඳ විළුවුන්වලින් සකසාගෙන පරිහරණය කරනු ලැබේ. ''**නානා කුණපපරිපූරෝ**'' කෙස්, ලොම්. ආදී අනේකප්‍රකාර කුණුපයන්ගෙන් පිරිපුන්ය. ''**විසඤ්චෙතෙනා තනෝ තනෝ**'' මල් ගඳ විළුවුන් ආදියෙන් පිළිකුල් බව වසා ගැනීමට වැයම් කළත්, ඒ උත්සාහය නිෂ්ඵල කරමින් මේ නව දොරින් කෙළ, සෙම්, සොටු ආදි අශුචිත්, රෝම කූපයන්ගෙන් දහඩියත් වැගිරෙන්නේ ම ය. එසේ වගුරුවමින් පරිහරණය කරයි. මෙසේ ඉතා පිළිකුල් සහගත වූ මේ කය උගුල් ආදියෙන් මුවන් බැඳගන්නාක් මෙන්, රූපාදී ප්‍රිය අරමුණු අඳබාල පුහුදුන් පුද්ගලයන් රවටා විපතට පමුණුවන්නේයැයි දක්වමින් ''**මිගං නිලීනං**'' ආදි දෙවන ගාථාව වදාළහ. ''**මිගං නිලීනං කුටෙන**'' වැදිපුත්‍රයා දුල්, උගුල් ආදියෙන් සැඟවී සිටින, මුවහ වී සිටින මුවකු අල්ලාගන්නාක් මෙන්, මෙහි අර්ථ පවසන විට ''**ඉව**'' ශබ්දය යොදා අර්ථ ගතයුතුයි. ''ඉව'' මෙන්. ''**බලිසෙනෙව අමඞ්ගං**'' බිලී කටුවෙන් ආහාරයේ ලොල් වූ මාළුවකු අල්ලා ගන්නා මසුන් මරන්නකු මෙන් ''**වානරං විය ලෙපෙන**'' ගල්, ගස්, අතුවල ගැල් වූ වඳුරු මලයෙන්, වඳුරු ආලේපයෙන් වඳුරකු අල්ලා ගන්නා මුව වැද්දකු මෙන් මේ අඳබාල පුහුදුන් පුද්ගලයා රවටා විපතට පත්කර ගනියි. කවරකු විසින් එසේ විපතට පත් කරත් ද? එය දැක්වීමට ''**රූපා සද්දා**'' යන ගාථාව දැක්විණි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස් කම් සැප ගෙන දෙන විෂයාභාග අරමුණු ඇසුරු කිරීමෙන්, විපර්යාසයට පත්ව අනුවණින් මෙනෙහි කිරීමෙන්, ඒ විෂයාභාග අරමුණු පිනවීමට යොමු වූ අඳබාල පුහුදුන් පුද්ගලයන්ගේ සිත අලවමින්, කෙලෙස් පිරි වස්තු වූ ඒ පංචාරම්මණයන් අනර්ථය පිණිසම හේතුවන බැවින් ''බාධාකරයි'', ''පීඩාකරයි'' නම් වේ. එනිසා ''**රූපා සද්දා රසා ගන්ධා.....ඉත්ථී රූපසම්මං දිසසරෙ**'' යි මේ සියලු පංචකාම සම්පත් ස්ත්‍රී රූපයේ ඇතැයි කියන ලදී. මෙහි ස්ත්‍රිය ගැනීම අධිකාර වශයෙන් සිදු කළ බව දත යුතුයි. ඒ ස්ත්‍රී රූව සේවනයේ ආදීනව ''**යෙ එතා උපසෙවන්ති**'' යනාදී වශයෙන් දක්වන ලදී. එහි අරුත් මෙසේ ය. ''යම් පුහුදුන් පුද්ගලයෙක් ඒ ස්ත්‍රීරූව කෙරෙහි ඇලුණු සිතින්, රාගික වූ සිතින් පරිභෝග වස්තුවක් මෙන් සලකා ඇසුරු කරයි ද ඔහුට ''**වඩ්ඪනති කටසිං සොරං**'' ජාති ආදී භවයන්හිත් නිරයාදියෙහිත් ඉතා බිහිසුණු දුක් පැමිණේ. ඒ අඳබාලයන්ට මේ පංචකාමයන්හි ඇලීම නිසා සුසාන නම් වූ

සංසාරයේ නැවත නැවත ඉපදීමත් මැරීමත් වර්ධනය වේ. එනිසා කියන ලදී. ''ආචිණ්ණනිපුනබ්භවං'' පුනර්භවය රැස් කරති. ''යොවෙතා'' යම් ඒ පුද්ගලයෙක් මේ ස්ත්‍රීන් කෙරෙහි හටගත් ආශාව ඡන්දරාගය මුලිනුපුටා දැමීමෙන් හෝ විෂ්කම්භනය කිරීමෙන් හෝ තම පයින් සර්පයකුගේ හිසක් ඉවත දමන්නාක් මෙන් දුරු කරයි ද, ඔහු මුලු ලෝකයම අල්ලාගෙන සිටින බැවින් ඇලීම් ඇති කරන, ''විසත්තිකා'' නම් වූ තණ්හාව සිහියෙන් යුක්තව ඉක්මවා සිටියි. ''කාමෙසාදීනවං දිස්වා'', ''මේ කාමයෝ ඇටසැකිල්ලක් බඳුය. බොහෝ වදබන්ධන ඇති වේ'' යනාදී ලෙස වස්තු කාම, ක්ලේශ කාමයන්හි අනේකප්‍රකාර වූ ආදීනව, දොස් දැකීමෙන්, ''නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො'' කාමයෙහිත් භවයෙහිත් නික්මීම ඇති කරන බැවින් නෛෂ්ක්‍රම්‍ය පැවිද්දත් ක්ෂේම වූ නිවණත් උපද්‍රව රහිත බව දැක; ඒ මම තෙහුමික වූ මේ සියලුම කාමයන්ගෙන් නික්මුණෙමි. ඉවත්ව ගියෙමි. සියලුම ඒ තෙහුමික වූ ධර්මයෝ ප්‍රිය, කමනීය බව ඇති කරන බැවින් ''කාම'' නම් වේ. ඒ කාමලෝකයන්ගෙන් මේ තෙරණුවෝ මිදුණු බව මෙසේ කියන ලදී. කාම, රූප, අරූප සියලු ලෝකයන්හි උපත දුරුකළ බව ''පත්තො මෙ ආසවක්ඛයො'' යන්නෙන් කියන ලදී. මෙසේ මුලින් දැක්වූ ගාථා පහෙන් ධර්ම දේශනා කළ සබ්බකාමී තෙරණුවෝ අවසන් සය වන ගාථාවෙන් සිය රහත් බව ප්‍රකාශ කළහ.

මේ ගාථා ඇසූ මාමණ්ඩිය ''මොහු සැමතැන්හිම ඇලීම දුරුකළ අයෙකි. මොහුට කාමුක සම්පත්තිය කෙරෙහි ඇලීමක් ඇති කිරීමට නොහැක''යි සිතා පැමිණි මාර්ගයෙන්ම නැවත හැරී ගියේය. සබ්බකාමී තෙරණුවෝ ද භාග්‍යවතුන්වහන්සේ පිරිනිවි කල්හි, උපසම්පදාව ලැබ එක්සිය විසි අවුරුද්දක් මහතෙරනමක්ව ජීවත්ව සිටිමින්; විශාලාවේ වජ්ජිපුත්තකයන් විසින් ඉපද වූ ශාසනික අර්බුදය විසඳා පිරිසිදු බුදු දහම බබුළුවමින් දෙවැනි ධර්ම සංගායනාවට සහාය වූහ. ඉන්පසුව ''අනාගතයේ ධර්මාශෝක රජ දවස උපදින්නා වූ ශාසනික අර්බුදය දුරුකර සසුන පිරිසිදු කරව''යි තිස්ස මහා බ්‍රාහ්මණයාට අණකර, අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් උන්වහන්සේ පිරිනිවන් පෑ සේක.

සබ්බකාමී තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සයවැනි නිපාතයේ ගාථාවන්හි අර්ථ වර්ණනාව සමාප්තයි.

7.1.1

සත්වන නිපාතයේ ''**අලංකතා**'' යන ගාථා ආයුෂ්මත් සුන්දර සමුද්ද තෙරුන් වහන්සේ විසින් පවසන ලදී. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින් පැමිණියහ. මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර එක්තරා මහත් සමක් ඇති සිටුවරයෙකුට දාව උපන් අතර හේ ''**සමුද්ද**'' නාමයෙන් ප්‍රසිද්ධ විය. ඉතා ශෝභාමත් කඩවසම් රූපයක් තිබූ බැවින් ඒ කුමරු ''**සුන්දර සමුද්ද**'' නාමයෙන් ජනයා අතර ප්‍රකට විය. ඉතා තරුණ වියෙහි සිටි සිටුකුමරු බුදුරජාණන් වහන්සේ පළමුව රජගහ නුවරට වැඩම වූ මහා උත්සවයේදී බුද්ධානුභාවය දැක, හටගත් ශ්‍රද්ධාවෙන් ගිහි සැප හැර දමා සසුනේ පැවිදිව උපසම්පදාව ලැබීය. ධුතාංග ධර්ම සමාදන් වූ සුන්දර සමුද්ද තෙරණුවෝ, රජගහ නුවරින් නික්ම සැවැත් නුවරට ගොස් කල්‍යාණමිත්‍රයකු වෙතින් විදසුන් භාවනාව ඉගෙන, කමටහනෙහි සිත යොමුකරගෙන එහි විසූහ.

උන්වහන්සේගේ මව රජගහ නුවර උත්සව දිනයක අනිකුත් සිටුපුතුන් සිය බිරින්දන් පිරවරාගෙන අලංකාරව සැරසී උත්සව ක්‍රීඩාවන්හි යෙදෙනු දැක, තම පුතු සිහිපත් කරමින් අඬමින් සිටියාය. ඇයගේ හැඬීම දුටු එක්තරා ගණිකාවක් හැඬීමට හේතුව විමසුවාය. තෙරුන්ගේ මව ඊට හේතුව පැවසුවාය. එය ඇසූ ගණිකාව ''මම ඔහු මෙහි රැගෙන එන්නෙමි. මගේ ස්ත්‍රීභාවය දෙස බලන්න''යි කීවාය. ඉදින් ඔහු රැගෙන පැමිණියහොත් නුඹ ඔහුට පාවාදී මේ සිටු සම්පත්තියට හිමිකාරිය කරන්නෙමි''යි පැවසූ තෙරුන්ගේ මව, ඒ ගණිකාවට බොහෝ ධනය දී පිටත්කර හැරියාය. මහත් පිරිවරින් සැවැත් නුවරට ගිය ඇය, ඒ තෙරුන් වහන්සේ පිඬු පිණිස වැඩමවන වීථියක ගෙයක් මිලදී ගෙන එහි වසමින්, දිනපතාම ඉතා රසවත් ආහාර තෙරුන්ට පූජා කළාය. ඉතා අලංකාරව සැරසීගෙන රන් පාවහන් පැළඳ නිතරම තෙරුන් ඉදිරියේ හැසිරුණාය. දිනක් තම ගෙදර සමීපයෙන් වැඩමවන තෙරුන් දුටු ඇය, රන් පාවහන් මුදා ඇඳිලි බැඳ වැඳගෙන තෙරුන් ඉදිරියෙන් යන්නී, නානාප්‍රකාරව තෙරුන්ට කම්සැප විඳීම සඳහා ආරාධනා කළාය. මේ ස්ත්‍රියගේ කාමුක ආරාධනාවන් ඇසූ තෙරුන් වහන්සේ. ''පුනුදුන් සිත නම් චංචල වූවකි. එනිසා මම දැන්මම උත්සාහවත් විය යුතුයැ''යි එතැනම හිඳ විදසුන් භාවනාවට සිත යොමු කළ සේක් ෂඩ් අභිඥාලාභී වූහ. රහත් බවට පත් තෙරුන් වහන්සේ ගණිකාවගේ ක්‍රියාව නිමිති කරගෙන මේ ගාථා සත වදාළ සේක.

''අලංකතා සුවසනා මාලහාරී විභූසිතා
අලත්තකකතාපාදා පාදුකාරුයහ වෙසිකා''

''පාදුකා ඔරුහිත්වාන පුරතො පඤ්ජලිකතා
සා මං සඤ්ඤාන මුදුනා මිහිතපුබ්බං අහාසථ''

''යුවාසි ත්වං පබ්බජිතො, තිට්ඨාහි මම සාසනෙ
භුඤ්ජමානුසකෙ කාමෙ, අහං විත්තං දදාමි තෙ''

''සච්චං තෙ පටිජානාමි, අගහිං වා තෙ හරාමහං
යදා ජිණණා භවිසසාම උභො දණ්ඩ පරායනා

උභොපි පබ්බජිසසාම උභයත්ථ කටගහො''
''තංව දිසවාන යාවනතිං වෙසිකං පඤ්ජලිකතං

අලංකතං සුවසනං මච්චුපාසංව ඔඩ්ඩිතං''
''තතො මෙ මනසිකාරො යොනිසො උදපජ්ජථ,

ආදීනවො පාතුරහු, නිබ්බිදා සමතිට්ඨථ''
''තතො චිත්තං විමුච්චි මෙ, පසස ධම්මසුධම්මතං
තිසෙසා විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධසස සාසනං'' තී.

මෙහි ''මාලහාරී'' යනු මල් මාලා දරන්නී වූ, මල් මාලාවලින් අලංකෘත වූ, ''විභූසිතා'' අඩුතැන් පිරවීම් වශයෙන් මල්වලින් මෙන්ම සුවඳ විලේපන, ආලේපනාදියෙන් ද අලංකාර කරන ලද. ''**අලංකතා**'' යනු මෙසේ අත්පා නිසි වූ ආභරණවලින් අලංකාර කරගෙන යන අදහසයි. ''අලත්තකකතාපාදා'' මනාව සුපිපි දෑසමන් මල් බඳු ලාක්ෂාරසයෙන් අලංකාර කළ, රඤ්ජිත පා යුවල ඇති. මෙය සමාස පදයකි. ''**අලත්තකකත පාදා**'' යැයි කිවයුතු වුවත් මෙහිදී ගාථාව සුඛෝච්චාරණය පිණිස ''**තා**'' යනුවෙන් දීර්ඝ කර කියන ලදී. සමාස නොවූ කල්හි ''තසසා'' ඇගේ යැයි වචනශේෂය ගත යුතුයි. ''**පාදුකාරුයහා වෙසිකා**'' රූපය විකුණා ජීවත්වන එක් ස්ත්‍රියකි. ''ඉහත කී පරිදි සැරසුණු ඒ වෙසඟන රන් මිරිවැඩි සඟලක් පැළඳ සිටියාය.'' යනුවෙන් අර්ථ ගත යුතුයි. ''**පාදුකා ඔරුහිත්වාන**'' රන්මිරිවැඩි ගලවා, පාවහන්වලින් බැහැර වී. ''**පඤ්ජලිකතා**'' ඒ වෙසඟන ඇදිලි බැඳගෙන, මා වෙත හැරී තමන්ම මේ වදන් කීවාය. ''**සඤ්ඤාන**'' මටසිලුටු මුදු මොළොක්. ''වදනින්'' යන්න මේ ගාථාවේ නොපැවසුනත්

එය ගත යුතුයි. **අභාසථ**'' කීවාය. ''**යුවාසි තුවං පබ්බජිතො**'' නුඹ ඉතා ළදරු, තරුණ, නවයොවුන් අවස්ථාවෙහිම පැවිදි වූයෙහි. පැවිදි වන්නන් විසින් සත්වැනි දසකය පැමිණි කල්හිම ගිහි ගේ හැර පැවිදි විය යුතුයැයි මේ ප්‍රකාශයෙන් දක්වයි. ''**නිටයාහි මම සාසනෙ**'' මගේ වචනයෙහි පිහිටන්න. මගේ වදන් පිළිගන්න. ඒ වචනය නම් - ''**භුඤජ මානුසකෙ කාමෙ**'' කම්සැප වළඳනු කැමැත්තාට රූප සම්පත්තිය, පරිවාර සම්පත්තිය හා භෝග සම්පත්තිය ද අත්‍යවශ්‍යය. පැතිය යුතුයි. ''ඉදින් මට භෝග සම්පත් කොයින්ද?'' යන ප්‍රශ්නයට පිළිතුරු ලෙස ''**අහං විත්තං දදාමි තෙ**'' මම නුඹට සම්පත් දෙමි යි කීවාය.

''ඇගේ වදන් කෙසේ ඇදහිය යුතු ද?''යි සිතන්නේ ය යන අදහසින් ඒ වදන් අදහවනු සඳහා ''**සචෙං තෙ පටිජානාමි අගඡිං වා තෙ හරාමහං**'' යන්න පැවසුවාය. ''මානුෂික වූ පස්කම් සුව විඳින්න. මම නුඹට ඒ සඳහා සම්පත් දෙමි'' යනුවෙන් යම් ප්‍රතිඥාවක් මවිසින් සිදුකරන ලද්දී ද එය ඒකාන්තයෙන්ම සත්‍යයකැයි ප්‍රතිඥා දෙමි. ඉදින් මා කෙරෙහි විශ්වාසයක් නොමැති නම් නුඹ ඉදිරියට ගිනි හෝ ගෙනෙන්නෙමි. ගිනි දල්වා ගින්දර සාක්ෂි කොට සපථ කරමි'' යන අර්ථයයි. ''**උභයෙසං කටගහණෙ**'' ''අප දෙදෙනාම වයසට ගිය කල්හි දෙලොවම යහපත් කරගනිමු. දෙලොවම ජයගනිමු. අපි මහලුව සැරයටියෙන් යෑම දක්වාම කම්සුව විඳිමු. මෙසේ මෙලොව සැප උපරිමව විඳින්නෙමු. ඉන්පසුව අපි පැවිදිවන්නෙමු. මෙසේ පරලෝක සම්පත්තියට ද හිමිකාරයෝ වෙමු'' යන අදහසයි. ''**තතො**'' ඒ නිමිති කරගෙන. කම්සුව විඳීමට ඇරයුම් කරමින් ''නුඹ නවයොවුන් වියෙහි වූවෙහි'' ''යම්කලෙක වයස්ගත වන්නෙමු ද?'' යනාදී තෙවන, සිවුවන ගාථාවලින් පැවසූ ඒ වෙසඟනගේ වදන් ඇසූ මම, ඒ පිළිබඳව නුවණැස යොමුකර, ඒ වදන්ම අංකුසයක් කරගෙන කම්සුව විඳීමේ ආදීනව මෙනෙහි කළෙමි. මෙසේ තෙරණුවෝ මහණ දහම් සපුරා ස්වාර්ථ සාධනය කරගත්හ. ඉතිරි පාදයන්ගේ අර්ථ ඉහතින් පැවසූ පරිදි දත යුතුයි.

සුන්දර සමුද්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

7.1.2

''පරෙ අමබාටකාරාමෙ'' යනු ආයුෂ්මත් **ලකුණ්ටක භද්දිය** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර මහ සම්පත් ඇති පවුලක ඉපිද වැඩිවියට පැමිණ, ශාස්තෘන් වහන්සේ **සමීපයේ** සිට ධර්ම ශ්‍රවණය කළහ. එසේ සිටින අවස්ථාවක ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් මිහිරි හඬ ඇති (මංජුස්සරභාණී) භික්ෂූන් අතරින් අග්‍රස්ථානයෙහි තැබූ සේක. සිටු පුත්‍රයාද එම අගතනතුර පතාගෙන බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝරත්නයට මහදන් පවත්වා, ''අහෝ! මම ඒකාන්තයෙන් ම අනාගතයේ එක් බුදු සසුනකදී මේ භික්ෂුව මෙන්ම මංජුස්සරභාණී භික්ෂූන්ට අග්‍රවේවා''යි අධිෂ්ඨාන කළේය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහු එම තනතුර ලබන බව දැක, ඔහු ලබන සම්පත් දේශනාකර වැඩි සේක. ඒ සිටුපුත් දිවි ඇතිතාක් පින්දහම් සිදුකර, ඉන් චුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා සැප විඳිමින් පැමිණ; **ඵුස්ස** නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කාලයේ දී විසිතුරු පියාපත් ඇති කොවුලෙක්ව, රජුගේ උයනින් මිහිරි අඹයක් තුඩින් රැගෙන යන්නේ ශාස්තෘන් වහන්සේ දැක පහන් සිත් උපදවා ''මෙය දෙන්නෙමි''යි සිතිය. ඒ පක්ෂියාගේ සිත දැනගත් ශාස්තෘන් වහන්සේ පාත්‍රය රැගෙන එළිමහනෙහි හුන් සේක. කොවුලා දසබලයන් වහන්සේගේ පාත්‍රයෙහි අඹ ගෙඩිය තැබීය. ශාස්තෘන් වහන්සේ එය වැළඳූහ. ඒ කොවුලා එම ප්‍රීති ප්‍රමෝදයෙන් ම පහන් සිත් උපදවාගෙන දින හතක් කල් ගෙවීය. ඒ පින්කම නිසාත් ඔහු මිහිරි කටහඬ ඇත්තෙක් විය. **කාශ්‍යප** බුදුරජාණන් වහන්සේගේ සෑය කරවීම අරඹයා ඇති වූ සාකච්ඡාවේදී ''සෑය කවර ප්‍රමාණයකින් සාදමු ද?'' ඇසූ කල්හි; එතැන සිට ප්‍රධාන වඩුවා වූ මෙතෙම ''යොදුන් සතක් උසට කරමු''යි කී කල්හි ''එය ඉතාමහත්ය'' ''එසේ නම් යොදුන් සයක් උසට සාදමු'', ''එයත් ඉතා වැඩිය'' ආදී වශයෙන් පස්යොදුන්, සතර යොදුන්, තුන් යොදුන්, යොදුන් දෙකෙ[illegible]දක්වා සෑයේ උස අඩුකොට; අනාගතයේ සුවසේ පරිහරණය කිරීමට හැකියාව ලැබෙන පරිදි සෑය බැඳිමු''යි පැවසීය. එසේ පවසා රැහැනක් ගෙන වටකරමින් ගවුවක් පමණ තැන සිට එක් එක් පැත්තට ගවුව බැගින් වූ සෑයක සැලැස්ම පෙන්වා, ''මෙසේ සෑදූ විට සෑය තුන්යොදුන්, සිවුයොදුන්, උස වූවක් වන්නේය''යි කීවේය. ජනයා ඔහුගේ වදන් පිළිගත්හ. මෙසේ ''අප්‍රමාණ වූ බුදුරජාණන් වහන්සේගේ ප්‍රමාණයක් දක්වූ බැවින්; ඒ කර්මයේ විපාක වශයෙන් එතැන් පටන් උපනුපන් ආත්මභවයෙහි අන්‍යයන්ට වඩා මිටි වූ ශරීර ඇතිව ඉපදුණේය.

හෙතෙම අපගේ ශාස්තෘණ් වහන්සේ ලොව පහළ වූ සමයෙහි මහත් සම්පත් ඇති සිටු පවුලක උපන්නේ ය. ඔහුගේ නම **භද්දිය** විය. ඉතා මිටි සිරුරක් තිබූ බැවින් **"ලකුණ්ටක භද්දිය"** නමින් ප්‍රකට විය. හෙතෙම ශාස්තෘන් වහන්සේ වෙතින් ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන් උපන් ශ්‍රද්ධා ඇතිව, සසුනේ පැවිදි බව ලැබීය. බහුශ්‍රැත ධර්ම කථිකයකු බවට පත්වූ ලකුණ්ටක භද්දිය තෙරණුවෝ ඉතා මිහිරි හඬින් අනුන්ට දහම් දෙසූහ. එක් උත්සව දිනයක එක්තරා බමුණකු සමඟ රථයක නැඟී ගිය එක් ගණිකාවක් තෙරුන් දැක දත් විළිස්සමින් සිනාසුනාය. තෙරණුවෝ ඇගේ දත් ඇට නිමිති කරගෙන අට්ඨි සඤ්ඤාව වඩා ධ්‍යාන උපදවාගෙන, එම ධ්‍යානය පාදක කරගෙන විදසුනට සිත යොමු කොට අනාගාමී ඵලයට පත්වූහ. නිතරම කායගතා සතිය වඩමින් විසූ ලකුණ්ටක භද්දිය හිමියෝ, දිනක් දම්සෙනෙවි **සැරියුත්** මහතෙරුන් විසින් අවවාද අනුශාසනා කරනු ලබන කල්හි රහත්බවෙහි පිහිටියහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

"මීට කල්ප ලක්ෂයකට පෙර දී **පදුමුත්තර** නම් සියලු ධර්මයන් විනිවිද දක්නා ඇස් ඇති, ලෝක නායක වූ බුදුහු ලොව පහළ වූහ. එකල්හි මම **හංසවතී** නුවර මහධනවත් සිටුපුතෙක් වූයෙමි. සක්මන් කරමින් සිටි මම බුදුරදුන් වැඩ සිටි විහාරයට ගියෙමි. එකල ලොවට පහනක් වූ ලෝකනායකයන් වහන්සේ දහම් දෙසමින් සිට, මධුරස්වර ඇති ශ්‍රාවකයකු අගතනතුරෙහි තැබූ සේක. එය අසා සතුටට පත් මම මහර්ෂී වූ බුදුපියාණන් වහන්සේට සත්කාර කොට, එම අගතනතුර පැතුවෙමි. එකල ශ්‍රේෂ්ඨ නායක වූ බුදුපියාණන් වහන්සේ සඟ මැද හිඳ "අනාගතයේ නුඹගේ මනෝරථය ඉටුවන්නේය"යි විවරණ දුන් සේක. "මීට කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ උපදින, ගෞතම නම් ශාස්තෘහු ලොව පහළ වෙති. උන්වහන්සේගේ ධර්මයට දායාද වූ ධර්මයෙන් නිර්මිත කළා වූ ඖරස පුත්‍ර වූ භද්දිය නම් ශාස්තෘ ශ්‍රාවකව මෙතෙම උපදින්නේ ය.

මෙසේ විවරණ ලද මම මනාව සිදුකළ චිත්ත ප්‍රාර්ථනාව හා චිත්ත ප්‍රණිධියත්, පුණ්‍ය කර්මයනුත් නිසා මිනිස් සිරුර හැර දමූ මම තව්තිසා දෙව්ලොව උපන්නෙමි. මීට කල්ප අනූ දෙකකට පෙර දී කිසිවකුට ගැටිය නොහැකි වූ මැඬලිය නොහැකි වූ සව්ලෝ මුදුන් වූ පස්මරුන් දිනුවා වූ පසළොස් චරණ දහමින් යුතු වූ මහත් සෘජු ප්‍රතාප ගුණ ඇති **ඵුස්ස** නම් බුදුහු ලොව පහළ වූහ. සවම්සතුන්ටම හිත වැඩ සැලසූ උන්වහන්සේ

බොහෝ ජනයා සසර බැඳුමෙන් මුදාලූහ. උන්වහන්සේ විසූ නන්දාරාම නම් රජ උයනෙහි ඵුස්ස නම් කෝකිලයෙක්ව උපන් මම ගඳකිළිය සමීපයේ වූ අඹ රුකෙහි විසුවෙමි. පිඬු පිණිස වඩින්නා වූ දක්ෂිණාර්හ වූ බුදුරදුන් දැක සිත පහදවා මිහිරි නදින් හැඬුවෙමි. රජ උයනට ගිය මම රන්වන් වූ සිවි ඇති මනාව ඉදුණු අඹ ගෙඩියක් සම්බුදුරදුන්ට පිදුවෙමි. මගේ අදහස දත් ලෝකනායක වූ මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ, සිය උපස්ථායක හිමියන් අතින් පාත්‍රය ගත් සේක. සතුටු සිතැති මම අඹගෙඩිය බුදුරදුන්ට පිදුවෙමි. අඹගෙඩිය පාත්‍රයේ තැබූ මම, පියාපතින් ඇඳිලි බැඳ වැඳ, සිත් අලවන, මිහිරි ඇසීමට ප්‍රිය වූ නාදයෙන් බුද්ධ පූජා කරමින් කැදැල්ලට ගොස් වැදහොත්තෙමි. බුද්ධාලම්භන ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත් සිතින් විසූ මා වෙත වහා පැමිණි දුෂ්ට සිත් ඇති උකුස්සෙකු මා මැරීය.

ඒ ආත්ම භාවයෙන් චුත වූ මම කුසල් බලයෙන් තුසිත දෙව්ලොව ඉපිද මහත් සම්පත් විඳ, මනුෂ්‍ය ලෝකයේ උපන්නෙමි. මේ මහා භද්‍ර කල්පයේ බ්‍රාහ්මණ වංශයේ මහත් වූ යශස් ඇති, වැඳීන් අතර ශ්‍රේෂ්ඨ වූ කාශ්‍යප නම් බුදුහු ලොව පහළ වූහ. තම සසුන බැබළ වූ උන්වහන්සේ; මිසදිටුවන් මැඩ, විනේය ජනයන් හික්මවා, ශ්‍රාවකයන් සහිත බුදුසසුන් ඇති කරවා පිරිනිවියහ. උන්වහන්සේ කෙරෙහි පැහැදුණු බොහෝ දෙන, ඒ ශාස්තෘන් වහන්සේට පූජා පිණිස සෑයක් කරවන කල්හි, ''මහර්ෂී වූ බුදුරදුන්ට සත් රුවනින් අලංකාර වූ සත් යොදුන් සෑයක් කරන්නෙමු''යි සාකච්ඡා කළහ. එකල මම කිකී නම් කාසි රජ සේනාවේ සේනාධිපතිව හිඳ චෛත්‍යයේ ප්‍රමාණය ඉතා විශාල යැයි කීවෙමි. මගේ වදන් පිළිගත් ඒ සැමදෙනා එකතුව බුදුරදුන්ගේ චෛත්‍යය යොදුනක් උසට නොයෙක් රත්නයන්ගෙන් අලංකාර කර නිමවූහ. ඒ කුසල කර්මයට සම්බන්ධවූ මම, මැරී ගොස් තුසී දෙව්ලොව උපන්නෙමි.

අවසන් භවයෙහි මම සැවැත් නුවර මහධනවත් පවුලක සිටු කුමරෙක් ව උපන්නෙමි. නුවර දොරටුවෙහි දී උතුම් බුදුසිරි දුටු මම විශ්මය පත් සිතින් පැවිදිව නොබෝ කලකින්ම රහත් වූයෙමි. චෛත්‍යයේ විශාලත්වය අඩු කරන ලෙස දුන් උපදෙස නිසා මාගේ ශරීරය, නින්දාවට යෝග්‍ය පරිදි මිටි විය. මාගේ මිහිරි කටහඬින් බුදුන් පිදූ මම, මංජුස්සර භික්ෂූන්ගෙන් අග්‍රඵවට පැමිණියෙමි. බුදුරදුන්ට අඹ ඵලයක් පිදීමෙන් ද බුදුගුණ සිහිකිරීමෙන් ද ලබාගත් ශ්‍රමණ ධර්මයන්ගෙන් යුක්ත වූ මම ආශ්‍රව රහිතව වෙසෙමි.''

''දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

ඊට පසු කාලයක සිය රහත් බව ප්‍රකාශ කරමින් මේ ගාථා තුන වදාළහ.

''පරෙ අම්බාටකාරාමෙ වනසණ්ඩම්හි භද්දියො
සම්මූලං තණ්හං අබ්බුය්හ තප්ප හද්දො ඣියායති''

''රමනෙතකෙ මුතිංගෙහි වීණාහි පණවෙහි ච
අභඤ්ඤව රුක්ඛමූලසම්ං රතො බුද්ධසස සාසනෙ''

''බුද්ධො ච මෙ වරං දජ්ජා සො ච ලබ්භෙථ මෙ වරෙ
ගණ්හෙහං සබ්බ ලොකස්ස නිච්චං කායගතාසතිං'' නති.

මෙහි ''පරෙ'' යනු ශ්‍රේෂ්ඨ වූ උසස් වූ විශිෂ්ට වූ යන අර්ථයයි. මෙහි ''පර'' ශබ්දය ''පරං විය අත්තානං'' ආදි තැන්වල මෙන් ''උසස්ය'' යන අර්ථයේ යෙදේ. අම්බාටකාරාමෙ'' එනම් වූ අරමෙහි, ඒ උයන දිය, සෙවණ යන සම්පත්වලින් අලංකාර වූ රමණීය වන ලැහැබකි. ඊට ''ශ්‍රේෂ්ඨ'' යනුවෙන් සුවිශේෂී කර දක්වූ කල්හි, ''අඹ වලින් ඉතා අලංකාර වූ අම්බාටක නම් වනයේ'' යනුවෙන් ද අර්ථ කියති. ''වන සණ්ඩම්හි'' වන ගහනයෙහි. එක්රැස් වූ ගස්, වැල් සමූහයෙන් යුතු වනයෙහි. ''භද්දියො'', භද්දිය නම් තෙරුන් තමාට වෙනත් අයකුට මෙන් කියයි. ''සම්මූලං තණ්හං අබ්බුය්හ'' තණ්හාවේ මුල නම් අවිද්‍යාවයි. එනිසා ඒ අවිද්‍යාව, තණ්හාව ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් (රහත් වීමෙන්) මුලිනුපුටා දමුවෙමි. ''තප්ප හද්දො ඣියායති'' ලෝකෝත්තර වූ ශීලාදියෙන් හදුවූයේ, සුන්දර වූයේ, එම වනලැහැබෙහිම වැඩහිඳ; කළයුතු කටයුතු නිම වූ බැවින් මෙලොව සැප විඳීම් වශයෙන්, අග්‍රඵල ධ්‍යානයෙන් යුතුව ධ්‍යාන වඩයි. ඵල සුවයෙන් ද ධ්‍යාන සමාපත්තියෙන් ද කල් ගෙවයි. මෙසේ තමන් වහන්සේ විවේකයේ ඇලුණු බව දක්වා ''රමනෙත කෙ'' යන ගාථාවෙන් ද එය තවත් පැහැදිලි කරමින් එම අර්ථයම දක්වයි. එහි ''මුතිංගෙහි'' මිරිඟු බෙර වලින් ද ''වීණාහි'' නන්දන ආදී වීණාවන්ගෙන් ද ''පණවෙහි'' පණා බෙරයෙන් ද ඇතැම් කාමභෝගීහු සිත් අලවා ප්‍රීති වෙති. ඔවුන්ගේ ඒ ඇලීම අනාර්යවූවකි. අනර්ථය පිණිසම හේතුවන්නකි. මම වනාහි හුදකලාව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සසුනේ ඇලුණෙමි. එමෙන්ම මේ රුක් මුල ඇලී, සතුටින් වෙසෙමි. මෙසේ තමන් වහන්සේ විවේකයෙහි ඇලුණු ආකාරය ප්‍රකාශ කළ තෙරණුවෝ; දැන් යම් කායගතාසති කමටහනක් වඩා රහත් බවට පත්වූසේක් ද ඒ භාවනාව වර්ණනා කරමින් ''බුද්ධොපි මෙ'' යන තෙවන ගාථාව වදාළහ. එහි අර්ථ මෙසේය - ''ඉදින් භාග්‍යවත් බුදුපියාණන්

වහන්සේ, 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේගෙන් මම එක් වරයක් ඉල්ලමි''යි මම උන්වහන්සේගෙන් වරයක් ඉල්ලූ කල්හි. ''මහණ! තථාගතවරු වර ඉක්මවූවෝය'' යනුවෙන් පවසා මාගේ වරය ප්‍රතික්ෂේප නොකර, මා ඉල්ලූ වරය ඉදින් මට දෙන සේක් නම්, ඒ වරය මගේ අදහස් අනුව, මනදොළ සපුරමින් ලැබේද, ඉදින් මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත වේද'' යනුවෙන් තෙරුන් පරිකල්පනයක්, උපකල්පනයක් කරයි. ''ස්වාමීනි, **මේ මුළු ලෝක සත්ත්වයා සැම කල්හිම කායගතාසති කමටහන වඩත්වා'' යනුවෙන් හෝ මේ මුළු ලෝක සත්ත්වයා සැම කල්හි ම කායගතාසති කමටහන වඩත්වා''** යනුවෙන් හෝ මේ මුළු ලෝක සත්වයා නිතරම කායගතාසතිය වැඩිය යුතුයි'' යනුවෙන් හෝ පවසා; ''**වරං ගණ්හෙය්‍ය අහං**'' මම වරයක් ගන්නේ නම් මැනවි. මම මේ කායගතා සතිය ම සම්බන්ධ වූ වරයක් ගනිමි.

දූන් අපරීක්ෂාකාරීන්ට ගරහමින් ද පරීක්ෂාකාරී විමසන්නවුන්ට පසසමින් ද උන්වහන්සේ දෙසූ මේ සතර ගාථාවෝ දක්වනු ලැබේ.

''**යෙ මං රූපෙන පාමිංසු යෙ ච සොසෙන අඤ්ඤ**
ඡන්දරාගවසූපෙතා න මං ජානන්ති තෙ ජනා''

''**අජ්ඣත්තඤ්ඤව න ජානාති බහිද්ධා ච න පස්සති**
සමන්තාවරණෝ බාලෝ සවෙ සොසෙන වුය්හති''

අජ්ඣත්තඤ්ඤව න ජානාති බහිද්ධා ච විපස්සති
බහිද්ධා ඵල දස්සාවී, සොපි සොසෙන වුය්හති''

''**අජ්ඣත්තඤ්ඤව පජානාති බහිද්ධා ච විපස්සති**
අනාවරණදස්සාවී, නසෝ සොසෙන වුය්හති''

මෙහි ''**යෙ මං රූපෙන පාමිංසු**'' යම් අයෙක් අඥාන බැවින් මගේ බාහිර රූව දෙස බලා අප්‍රසාදයට පත්ව, නිහීන වූ ආකාරයෙන් මට ගැරහී ද ප්‍රකට වූ ධර්ම ශරීර ඇති මා වෙත මිටි ස්වභාවය නිසා, ''මොහු පහත් වූවෙකි. මිටි වූවෙකි'' යනුවෙන් ලැජ්ජා කරමින්, පිළිකුල් කරමින් මා වෙන්කර සලකන ලද්දාහු වෙත් ද'' යන අර්ථයයි. ''**යෙ ච සොසෙන අඤ්ඤ**,'' යම් අයෙක් මිහිරි ස්වරයෙන් බණ කියන මා වෙත ගරු කිරීම් වශයෙන් අනුගතවූවාහු, බුහුමන් කරන්නාහු වෙත් ද'' යන අර්ථයයි. ඔවුන්ගේ ඒ මිත්‍යා අදහසකි. මම රූප මාත්‍රය නිසා අවමන් කළ යුත්තෙකු ද මිහිරි කටහඬක් ඇති පමණින් බුහුමන් කළ යුත්තෙකු ද නොවෙමි.

එනිසා ''**ඡන්දරාගවසූපෙතා න මං ජානන්ති**'' මේ දෙපිරිසම ඡන්ද රාගයේ වසඟයට පැමිණ, ප්‍රහීන නොවූ ඡන්ද රාග ඇති බැවින්, ප්‍රහීණ කළ ඡන්ද රාග ඇති මා නොහඳුනති. මොවුන්ට මා වැනි අයෙකුගේ අභ්‍යන්තරයත් බාහිර හැසිරීමත් පිරිසිඳ දත නොහැක. අවිෂය වේ. ඒ බව දැක්වීමට ''**අජඤ්ඤතං**'' යන ගාථාව වදාළහ. ''**අජඤ්ඤතං**'' යනු තමාගේ සන්තානයේ පවත්නා ස්කන්ධායතනාදී ධර්ම. ''**බහිද්ධා**'' අනුන්ගේ සන්තානයේ පවත්නා ස්කන්ධායතනාදී ධර්ම. නැතහොත් ''**අජඤ්ඤතං**'' යනු මගේ අභ්‍යන්තරයේ පවත්නා අශේඛ වූ සීලස්කන්ධාදියයි. ''බහිද්ධා'' මගේම ආකල්ප සම්පත්ති ආදියෙන් යුතු බාහිර රූප ධර්මයන්ගේ පැවතීමත්, චක්ඛු විඤ්ඤාණාදියේ පැවතීමත් ය. ''**සමන්නාවරණෝ**'' මෙසේ අධ්‍යාත්මයත්, බාහිර ධර්මයනුත් (ඇතුළතත්, පිටතත්) නොදැනීමෙන් හාත්පසින්ම ආවරණ වූ - මුවහ වූ අඥාන ස්වභාව ඇති බාලයා ''**සවෙ සොසෙන වුය්හති**'' එබඳු පුද්ගලයා අනුන් විසින් මඟ පෙන්විය යුතු බුද්ධි ඇති, බාලයෙක් වූයේ, මිහිරි කටහඬට, අනුන්ගේ වචනවලට ඇදී යයි. ගෙන යයි. ආකර්ශනය වේ. ''**බහිද්ධාව විපස්සති**'' යමෙක් පෙර කී ලෙසම අධ්‍යාත්මය නොදනිති. නමුත් ඔහු ශ්‍රැතියෙන් (ඇසූ පරිද්දෙන්) හා ආකල්ප සම්පත්ති ආදිය සළකා බැලීමෙන් පිටත මැනවින් දකියි. ''මෙතෙම ආර්ය ගුණ උපදවා ගන්නෙක් වන්නේය''යි සිතයි. එබඳු වූ අභ්‍යන්තරය නොදකිත් බාහිරින් පමණක් මා අවබෝධ කරගත්, ''**බහිද්ධා ඵලදස්සාවී**'' පිටත ඵල පමණක් දක්නා වූ න්‍යායානුකූලව ඵලය පමණක් ගන්නා වූ මේ පුද්ගලයාත් මා පිළිබඳව ''**සොසෙන වුය්හති**'' මැනවින් නොදනියි. ඔහු ද මිහිරි කටහඬට පමණක් ඇලී ආවෙකි.

යමෙක් ''**අජඤ්ඤතං ච පජානාති**'', ක්ෂීණාස්‍රවයන් වහන්සේගේ අධ්‍යාත්මයේ අභ්‍යන්තරයේ වූ අශේඛ ශීලාදී ගුණ මහිමයන් දන්නේ ද පිටත, බාහිර පැවති ආකල්ප, සම්පත්ති, ප්‍රතිපත්ති ආදී ලක්‍ෂණ විශේෂ ඥානයෙන් දක්නේ ද ඔහුම මැනවින් මා පිළිබඳව දත්තෙකි. ''**අනාවරණදස්සාවී**'' කිසිම ආවරණයක් රහිතව ආර්ය ගුණ දැකීමට, දැනගැනීමට සමර්ථ වූ හෙතෙම ''**සොසෙන වුය්හති**'' මිහිරි කටහඬට නොඇලෙන්නෙකි. ඝෝෂයෙන් ඇදගෙන නොයන්නෙකි.

ලකුණ්ටක භද්දිය ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

7.1.3

''එකපුත්තෝ'' යනු ආයුෂ්මත් භද්ද තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ පෙර **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂු සංඝයාට ලක්ෂ ගණනින් සිවුරු ආදී සිවුපසයෙන් පූජා කළහ. ඒ පින්කමේ විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණ, මේ බුද්ධෝත්පාද කාලයේ දී සැවැත් නුවර සිටු පවුලක උපන්නේය. ඔහු ඉපදීමට ප්‍රථම ඔහුගේ දෙමාපියෝ දරුවන් නොමැතිව දුකින් සිට, දෙවියන් යැදීමෙන් ද දරුඵල නොලැබ, ශාස්තෘන් වහන්සේ වෙත ගොස්, ''ස්වාමීනි! ඉදින් අපි එක පුතෙකු ලබන්නෙමු නම්, ඔහු ඔබ වහන්සේට දාසයකු කර දෙන්නෙමු''යි පැවසූහ. මෙසේ ආයාචනා කර ඔවුහු ගිය කල්හි ශාස්තෘන් වහන්සේගේ අදහස දත් සක්දෙව් රජු, එක්තරා ගෙවී ගිය ආයු ඇති දෙවියකු කැඳවා ''අසුවල් පවුලෙහි පිළිසිඳ ගන්න''යි අණකළ බැවින් ඒ සිටුදේවියට දාව උපන්නේය. ඒ කුමරුට (භද්‍ර) ''**භද්ද**'' යන නම තැබීය. භද්ද කුමරු ඉපිද සත් වසක් ගෙවුණු පසු, ඔහුගේ දෙමාපියෝ අත්‍යලංකාරයෙන් කුමරු සරසා භාග්‍යවතුන් වහන්සේ වෙත රැගෙනවුත්, ''ස්වාමීනි! මේ දරුවා ඔබවහන්සේට ආයාචනා කිරීමෙන් ලැබූ දරුවෙකි. මොහු ඔබ වහන්සේට පවරා දෙන්නෙමු''යි පැවසූහ. ශාස්තෘන් වහන්සේ ආනන්ද තෙරුන් කැඳවා ''මේ දරුවා පැවිදි කරන්න''යි අණ කළ සේක්, ගඳකිළියට පිවිසියහ. ආනන්ද තෙරණුවෝ පැවිදි කොට, සංක්ෂිප්තව විදසුන් භාවනා කමටහන දුන්හ. භද්ද තෙරණුවෝ උපනිශ්‍රය සම්පත් ඇති බැවින් විදසුන් කමටහන වඩා ඉර බැස යෑමට පෙරදීම භාවනාව උත්සාහවත් කර, ෂඩ් අභිඥා උපදවා ගත්හ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''සියලු ලෝකයෙහි අසහාය නායක වූ මෙත් සිත් ඇති මහා මුනි වූ පදුමුත්තර බුදුරදුන් වෙත සියලු ජනසමූහයා එළඹෙයි. සියල්ලෝ නිරුත්තර වූ පුණ්‍ය ක්ෂේත්‍රයෙහි ශාස්තෘන් වහන්සේට හා භික්ෂු මහා සංඝයාට වස්ත්‍ර ද සෙනසුන් ද ආහාර පාන ද පිළිගැන්වූහ. ''මම ද බුදුරජාණන් වහන්සේ හා අනුත්තර ව සංඝයාද ආරාධනා කොට, දෙවියන්ට දෙවි වූ තාදී ගුණැති බුදුරජාණන් වහන්සේට දානයක් දෙන්නෙමි''යි පැවසූ විට මගේ අණ පිළිගත් පුරුෂයෝ තථාගත ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළහ.''

''කොඳු පලස් අතුරන ලද, පුළුන් ඇතිරිලි හා ඝන පුප් එළු ලොම් ඇතිරි අතුරණ ලද, කොමු ඇතිරි හා කපු ඇතිරි සහිත වූ රන්මය පාද ඇති

මාහැඟි අසුනක් බුදුරදුන්ට පැනවූයෙමි. දෙවියන්ට දෙවි වූ නරශ්‍රේෂ්ඨ ව පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන මගේ ගෙදරට වැඩම කළ සේක. ලෝකනාථ වූ යශස් ඇති සම්බුදුරජාණන් වහන්සේට පෙර ගමන් කොට, පහන් සිත් ඇත්තෙමි සතුටුව තම ගෙදරට වැඩමවාගෙන ආවෙමි. පහන් සිහින් බුද්ධ ප්‍රමුඛ ලක්ෂයක් පමණ වූ මහසඟනට කිරිබත් පූජා කළෙමි. පූජාවන් පිළිගන්නා වූ, පූජාවන්ට ගෙයක් බඳු වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද වැඩ හිඳ මෙසේ වදාළ සේක.

''යමකු විසින් මේ කොඳු පළස් ඇතිරූ රන්මය ආසනය දෙන ලද ද ඔහුගේ අනාගතය පිළිබඳව මම පවසමි. ඒ මාගේ වදන් අසවු. මෙතෙම මින් මතුව සැත්තෑ සතර වරක් දෙව් රජව උපන්නේය. දෙවගනන් පිරිවරා දෙව්සැප විඳින්නේය. දහස් වරක් පෘථිවි රාජ්‍ය කරන්නේය. පනස් එක් වරක් සක්විති රජව උපදින්නේය. සියලු භව යෝනීන්හි උසස් කුලිකව උපදින්නේය. කුශල මූලයෙන් මෙහෙයවන ලද මොහු භද්දිය නමින් පැවිදිව කෙලෙසුන් නසන්නේය.''

''මම දැන් විවේකයේ ඇලී සිටිමි. අරණ්‍යයෙහි දුර සෙනසුන්වල හැසිරෙහිමි. මවිසින් සියලු ශ්‍රමණ ඵල ලබන ලදී. අද මම දුරුකළ කෙලෙස් ඇත්තෙමි. ලෝකනායක වූ සර්වඥයන් වහන්සේ මා පිළිබඳ සියල්ල දැන භික්ෂු සංඝයා මැද හිඳ මා අග්‍රස්ථානයෙහි තැබූ සේක. මම සිවුපිළිසිඹියාපත් වූයෙමි. අෂ්ඨ විමෝක්ෂයෝ ලැබුවෙමි. ෂඩ් අභිඥා සාක්ෂාත් කරගත්තෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

භාග්‍යවතුන් වහන්සේ භද්ද තෙරුන් ෂඩ් අභිඥා ලාභී බව දැන ''භද්ද, එන්න''යි වදාළ සේක. භද්ද හිමියෝ එකෙණෙහිම ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ වැඳ ඇදිලි බැඳගෙන ශාස්තෘන් වහන්සේ සමීපයේ සිටියහ. එයම භද්ද සාමණේරයන්ගේ උපසම්පදාව විය. මේ උපසම්පදාව ''බුද්ධුපසම්පදා'' නම් වේ. භද්ද තෙරණුවෝ උපතේ පටන් තම පැවැත්ම ප්‍රකාශ කිරීම් වශයෙන් සිය රහත් බව ප්‍රකට කරමින් මේ ගාථා සත වදාළහ.

''එකපුත්තෝ අහං ආසිං පියෝ මාතු පියෝ පිතු
බහූහි වතචරියාහි ලද්ධා ආයවනාහි ච''

''තෙව මං අනුකම්පාය අත්ථකාමා හිතෙසිනෝ
උභෝ පිතා ච මාතා ච බුද්ධසස උපනාමයුං''

''කිච්ඡාලද්ධා අයං පුත්තෝ සුබුමාලෝ සුබෙධිතෝ
ඉමං දදාම තෙ නාථ ජිනස්ස පරිචාරකං''

''සත්ථා ච මං පටිග්ගය්හ ආනන්දං එතදබ්‍රවි
පබ්බාජෙහි ඉමං ඛිප්පං හෙස්සත්‍යාජානියෝ අයං''

''පබ්බාජෙත්වාන මං සත්ථා විහාරං පාවිසී ජිනෝ.
අනොගතස්මිං සුරියස්මිං තතෝ චිත්තං විමුච්චි මෙ''

''තතෝ සත්ථා නිරංකත්වා පටිසල්ලාන වුට්ඨිතෝ
එහි භද්දා'ති මං ආහ, සාමෙ ආසූපසම්පදා''

''ජාතියා සත්ත වස්සෙන ලද්ධා මෙ උපසම්පදා
තිස්සො විජ්ජා අනුප්පත්තා, අහො ධම්මසුධම්මතා'' තී.

එහි ''වතවරියාහි'' මෙසේ කොට පුතෙකු ලබන්නෙහිය'' යනුවෙන් දැක්වෙන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වදන් අසා කිරි පෙවීම් ආදී අනේක ප්‍රකාර ව්‍රත චර්යාවන්ගෙන් ද ආයාචනාවන්ගෙන් ද ලබන ලද, මෙහිදී තමා ලැබීමේ හේතුව, කාරණය දැක් වේ. ඉතිරි පදයන්ගෙන් මවුපිය දෙදෙනා තමන් වහන්සේට ආදරයෙන් කටයුතු කළ ආකාරයත්, තමා දුකසේ ලත් බවත් දක්වයි. ''තෙ'' යනු ඒ මවුපිය දෙදෙනා. ''උපානාමයුං'' එළවූහ. පැමිණවූහ. ''සුබෙධිතෝ'' සුවසේ වඩන ලද්දේය. ''තෙ'' යනු නුඹ වහන්සේට, ''පරිචාරකං'' සේවකයකු කොට. ''හෙස්සත්‍යාජානියෝ අයං'' ''මේ දරුවා මගේ සසුනේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වන්නේ ය. එනිසා වහාම අදම පැවිදි කරන්න'' මෙය වදාළ සේක. පැවසූහ. ''පබ්බාජෙත්වාන'' ආනන්ද තෙරුන් විසින් පැවිදි කරවා ''විහාරං'' විහාරයට, ගන්ධ කුටියට. ''අනොගතස්මිං සුරියස්මිං'' සූර්යයා අස්තයට නොගිය කල්හිම. ''තතෝ චිත්තං විමුච්චි මෙ'' ඉක්බිති විදර්ශනා භාවනාව ඇරඹීමේ පටන් නොබෝ වේලාවකින්ම මගේ සිත සියලු ආශ්‍රවයන්ගෙන් මිදුණේය. එකෙණෙහිම මම ක්ෂීණාශ්‍රවයෙක් වූයෙමි. ''තතෝ'' මගේ ආශ්‍රව ක්ෂය කිරීමෙන් පසුව. ''නිරංකත්වා'' තමන් වහන්සේ විසින් සමවැදුණු ඵල සමවත හැරදමා, ඵලසමවතින් නැගිට. ඒ සඳහා ''පටිසල්ලානවුට්ඨිතෝ'' යි කියන ලදී. ''සා මෙ ආසූපසම්පදා'' මා උදෙසා ශාස්තෘන් වහන්සේ ''භද්දේ! එන්න''යි යම් වදනක් පැවසූ සේක්ද එයම මාගේ උපසම්පදාව විය. ''ජාතියා සත්තවස්සෙන ලද්ධා මෙ උපසම්පදා'' මෙහිදී ශාස්තෘන් වහන්සේ තමන්ට ඇරඹියෙන් දැක්වූ අනුග්‍රහයක් බුද්ධ ශාසනයේ නෛයර්‍යාණික භාවයක් දක්වයි. එනිසා

''අහො ධම්මසුධම්මතා''යි කියන ලදී. මෙහිදී ද ''මගේ සිත මිදුණේය'' යනුවෙන් රහත් බව ප්‍රකාශ කර නැවතත් ''ත්‍රිවිද්‍යා ලබන ලද්දෙමි''යි දැක්වූයේ ලෞකික අභිඥා දර්ශනය, ඔබ අභිඥා භාවය ප්‍රකට කර දැක්වීමටයි. අපදාන පාළියේ දී ද මෙනිසාම ''ඡළභිඤ්ඤා සච්ඡිකතා'', ''ඔබ අභිඥා සාක්ෂාත් කරගත්තෙමි''යි කියන ලදී.

හද්ද ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

7.1.4

''දිස්වා පාසාදඡායාය'' යනාදී ගාථා ආයුෂ්මත් **සෝපාක** තෙරුන් වහන්සේගේය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරු හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් සිදුකරගෙන පැමිණියහ. **සිද්ධත්ථ** භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ සමයේ බමුණු කුලයේ ඉපිද වැඩිවිය පැමිණි ඔහු; බ්‍රාහ්මණ විද්‍යා ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට ගියේය. කාමයන්හි ආදීනව දුටු හෙතෙම, ගිහිගේ හැර තවුස් පැවිද්දෙන් පැවිදිව එක් පර්වතයක විසීය. සමීප වූ මරණ කාලය ඇති ඒ තවුසා දුටු බුදුපියාණන් වහන්සේ එතැනට වැඩම වූ ේෂ්ණ. භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිත් උපදවාගෙන මහත් වූ ප්‍රීති ප්‍රමෝදයට පත් තවුස්තුමා, උන්වහන්සේට මල් අසුනක් පනවා පූජා කළේය. එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනිත්‍ය ප්‍රතිසංයුක්ත දහම් කථාවක් පවත්වා, තවුසා බලා සිටියදීම අහසින් වැඩම කළ සේක. හෙතෙම පෙර දැඩිව ගත් දෘෂ්ටිය බැහැර ලා අනිත්‍ය සංඥාව සිතේ ඇබාගෙන ම කළුරිය කොට දෙව්ලොව උපන්නේ ය. නැවත සසර ඒ ඒ භවයන්හිදී දෙව් මිනිස් දෙගතියෙහිම සැරිසැරූ ඔහු මේ බුද්ධෝත්පාද කාලයේදී රජගහ දැ ාර සොහොන් පාලක පවුලක උපන්නේ ය. ජාති (උපන් ගෝත්‍ර) වශයෙන් ම **''සෝපාක''** නමින් ප්‍රකට විය. ඇතමෙක් වෙළඳ කුලයේ උපන් බවත් **සෝපාක** යනු නාම මාත්‍රයක් බවත් පවසති. ඒ මතය අපදාන පාළියට විරුද්ධය. ''පච්ඡිමෙ ච භවෙ සම්පත්තෙ සොපාකං යොනුපාගමිං'' යන අපදාන පාළි ප්‍රකාශයට අනුව ''අවසන් භවයේදී ''සපාක'' නම් සැඩොල් කුලයේ උපන්නෙමි''යැයි දැක්වේ.

සෝපාක ඉපදී සිවු මසකින් ඔහුගේ පියා කළුරිය කළේය. සුළු පියා විසින් ඔහු පෝෂණය කෙරුණි. අනුක්‍රමයෙන් සත්වියට පත් සෝපාක, තම

පුතු සමඟ කලහ කරනු දුටු සුළු පියා, ඊට කිපී සෝපාක සොහොනට ඇදගෙන ගියේය. අත්දෙක ලණුවකින් එකට තබා බැඳ, එම ලණුව ම මළ සිරුරක තද කොට තබා බැඳ ''මොහු සිවල් ආදීන් විසින් කනු ලැබේවා''යි සෝපාක සොහොනේ දමා ගියේය. අවසන් භවය බැවින් සෝපාකගේ පින් බලයෙන් ඔහු මරා දැමීමට නොහැක. සිවල් ආදීන්ට ද ඒ දරුවා මැඬලිය නොහැක. දරුවා රෑ මැදියමේ මෙසේ වැලපෙයි.

''කාහි මෙ අගති අසස කොවා බන්ධු අබන්ධුනො
සුසානමජ්ඣෙ බද්ධසස කො මෙ අභයදායකො'' තී.

ශාස්තෘන් වහන්සේ එම වේලාවෙහි පිහිට විය යුතු අසරණයන් සොයන සේක්; ''මගේ නොමඟ යෑම, වරද කුමක් ද? මගේ නෑයෝ නොනෑයෝ කවුද? සොහොන මැඳ බැඳ සිටින මා ගලවාගන්නේ කවුද?'' යන හඬ අසා; සෝපාකගේ හදවත තුල බබළන රහත්වීමට නිසි හේතු සම්පත් දුටු සේක. එකල්හි ආලෝකයක් පැතිර වූ බුදුපියාණෝ ඔහුට සිහිය උපදමින් මෙසේ වදාළහ.

''එහි සොපාක, මා භායි, ඔලොකසසු තථාගතං
අහං නං තාරයිසසාමි රාහුමුඛෙව චන්දිමං'' තී.

''එන්න, සෝපාක! බිය නොවන්න. තථාගතයන් දෙස බලන්න. රාහුට අසු වූ සඳු මෙන් මම නුඹ ද ගලවාගන්නෙමි''යි වදාළ ගාථාව අවසන ඔහුගේ සියළු බැඳුම් බුද්ධානුභාවයෙන් සිදී ගියේය. සෝවාන් ඵලයෙහි සිත පිහිටියේය. සෝපාක ගන්ධකුටිය අභිමුව නිරුජ්ඣිතව සිටියේය. සෝපාකගේ මව තම දරුවා නොදැක, ඒ පිළිබඳව සුළු පියාගෙන් විමසුවත් කිසිවක් නොකී බැවින්, ඒ ඒ තැන දරුවා සොයමින් දිවයන්නී; ''බුදුවරු නම් අතීත, අනාගත හා වර්තමාන යන තුන් කල්ම දන්නෝය. මම උන්වහන්සේ වෙත පැමිණ මගේ පුතුගේ තොරතුරු දැනගන්නෙමි නම් යෙහෙකි''යි සිතා ශාස්තෘන් වහන්සේ සමීපයට ගියාය. ශාස්තෘන් වහන්සේ ඍද්ධියෙන් සෝපාක නොපෙනෙන සේ ඉටු සේක. මව පැමිණ ''ස්වාමීනි, මගේ පුතා පෙනෙන්න නැහැ. භාග්‍යවතුන් වහන්සේ ඔහු පිළිබඳව දන්නේ නම් මැනවි''යි විමසන ලද්දීය. බුදුපියාණන් වහන්සේ ඇයට මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

''න සන්ති පුත්තා තාණාය න පිතා න පි බන්ධවා
අන්තකෙනාධිපන්නසස නත්ථි ඤාතිසු තාණතා''

''දරුවෝ අපේ පිහිටට නොසිටිති. පියා, නෑයෝ අපට පිහිට නොවෙති. මරු වසඟයට පත්වන්නහුට ඤාතිමිත්‍රාන්ගෙන් කිසි පිහිටක් නොලැබේ.'' මේ දහම් ඇසූ මව සෝවාන් වූවාය. සෝපාක රහත් විය.

අපදාන පාළියේදී සෝපාක තෙරණුවෝ මෙසේ වදාළහ.

''වනයක වූ උතුම් පර්වතයක ගුහාවක් පිරිසිදු කරමින් සිටි මාවෙත සිද්ධත්‍ථ නම් භාග්‍යවතුන් වහන්සේ වැඩම කළ සේක. තාදී ගුණ ඇති, ලෝකයාට ජ්‍යෙෂ්ඨ වූ ශාස්තෘන් වහන්සේට ඇතිරියක් අතුරා මල් අසුනක් සාදා පූජා කළෙමි. ඒ බුදු පියාණන් වහන්සේ මල් අසුනෙහි වැඩහුන් සේක. මාගේ අනාගත භව උපත දුටු උන්වහන්සේ අනිත්‍ය පිළිබඳ දහම් දෙසුමක් පැවැත්වූ සේක.''

''ඒකාන්තයෙන් සංස්කාර ධර්මයෝ අනිත්‍ය වෙති. හේතු ප්‍රත්‍ය සමවායෙන් (එක්වී) හටගත් සෑම සංඛත වස්තුවක්ම ඉපදීම හා විනාශය ස්වභාව කරගෙන ඇත. ඉපදුණු සියල්ල නැති වේ. මේ සංස්කාර ධර්මයන්ගේ සන්සිඳීම සැපයකි.

''ලෝක ජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ මෙසේ වදාරා අහසෙහි යන හංසරාජයකු මෙන් අහසින් වැඩම කළ සේක. මම එතෙක් පැවති ආත්ම සංකල්පනාව බැහර ලා අනිත්‍ය සංඥාව වැඩුවෙමි. දිනක් භාවනා කළ මම ඒ අත්බවින් මිදී, කුශල මූලයෙන් පිහිට ලැබ දෙව්ලොව උපන්නෙමි. දෙව් මිනිස් සැප විඳි මම අවසන් භවයේදී, තමා විසින් පිසූ බත අනුන් අනුභව නොකරන බැවින් ''සපාක'' (ස්වපාක) නම් වූ සැඩොල් කුලයේ උපන්නෙමි. ගිහිගෙයින් නික්ම අනගාරි වූ බුදුසසුනෙහි පැවිදි වූයෙමි. උපතින් සත් හැවිරිදි වූයෙමි රහත්වූයෙමි. ඇරඹූ වීර්ය ඇති මම නිවණටම මෙහෙයූ සිත් ඇතිව, ශීලයෙහි මනාව හික්මුණෙමි. එසේ බුදුපියාණන් වහන්සේ සතුටු කළ මම උපසම්පදාව ලැබුවෙමි. මීට කල්ප අනූහතරකට පෙර යම් කුසල කර්මයක් කළෙමි ද, එතැන් සිට දුගතියක නූපන්නෙමි. මේ මල් ආසන පූජාවේ විපාකයයි. මීට කල්ප අනූහතරකට පෙරදී යම් අනිත්‍ය සංඥාවක් වැඩුවෙමි ද ඒ සංඥාව වැඩීමේ පුරුදුතාවය නිසා මාහට අශ්‍රවක්ෂය ඥානය පහළ විය. දැන් මම සියලු කෙලෙස් දූවූයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සෘද්ධිය අත්හළ සේක. ඇය තම පුතු දැකීමෙන් ඉතා සතුටුවූවාය. තම පුතු රහත් වූ බව ඇසූ ඇය, පුතු පැවිදි

කරවා ගෙදර ගියාය. සෝපාක තෙරණුවෝ, ශාස්තෘන් වහන්සේ ගඳකිළි සෙවණෙහි සක්මන් කරනු දැක එතැනට පිවිස, උන්වහන්සේට වැඳ පසුව සක්මන් කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන්ට උපසම්පදාව දෙනු කැමතිව "එක නම් කුමක්ද?" ආදී වශයෙන් ප්‍රශ්න දහයක් විමසූ සේක. ඒ සෝපාක තෙරණුවෝද ශාස්තෘන් වහන්සේගේ අදහස් අනුව, සර්වඥ ඥානය සමඟ සසඳා බලමින් "සියලු සත්ත්වයෝ ආහාරයෙන් පවතින්නෝය" යනාදී වශයෙන් ඒ දස පැණ විසඳූහ. එනිසාම ඒ ප්‍රශ්න "කුමාර ප්‍රශ්න" නාමයෙන් ප්‍රකට විය. ශාස්තෘන් වහන්සේ ඒ පැන විසඳුම්වලින් සතුටු වූ සේක්; සෝපාක තෙරුන්ගේ උපසම්පදාව අනුදත් සේක. එනිසා ඒ උපසම්පදාව "පඤ්හව්‍යාකරණෝපසම්පදා" නම් විය. මෙසේ උපසම්පදාව ලත් සෝපාක තෙරණුවෝ තම පැවැත්ම ප්‍රකාශ කරමින්, සිය රහත්භාවය ප්‍රකට කරමින් මේ ගාථා සත වදාළහ.

"දිසවා පාසාද ඡායායං චංකමනතං නරුත්තමං
තසථ නං උපසංකම්ම වන්දිසං පුරිසුත්තමං"

"එකංසං චීවරං කත්වා සංහරිත්වාන පාණයෝ
අනුචංකමිස්සං විරජං සබ්බසත්තාන මුත්තමං"

"තතෝ පඤ්හ අපුච්ඡි මං පඤ්හානං කොවිදෝ විදූ
අච්ඡමහි ච අහිතෝ ච ව්‍යාකාසිං සත්ථුනෝ අහං"

"විසඡජිතෙසු පඤ්හසු අනුමොදි තථාගතෝ
භික්ඛුසංඝං විලොකෙත්වා ඉමමත්ථං අභාසථ"

"ලාභා අංගානමගධානං යෙසායං පරිභුඤ්ජති
චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං

පච්චුට්ඨානං ච සාමීචිං තෙසං ලාභාති වබ්‍රැවී"
"අජ්ජදගෙ මං සොපාක දසසනායොපසංකම

එසා චෙව තෙ සොපාක භවතු උපසම්පදා"
"ජාතියා සත්තවස්සොහං ලදධාන උපසම්පදං
ධාරෙමි අන්තිමං දෙහං අහො ධම්මසුධම්මතා"ති.

මෙහි ''පාසාදඡායායං'' ගන්ධකුටියේ සෙවණැල්ලෙහි ''වන්දිසං'' මනාව වැන්දෙමි. ''**සංහරිත්වාන පාණියො**'' දෑත පියුම් පොහොට්ටුවක් මෙන් එකතු කර, ඇඳිලි බැඳ යන අර්ථයයි. ''අනුවංකම්සසං'' ඒ ශාස්තෘන් වහන්සේ අනුගමනය කරමින් පිටුපසින් අනුව සක්මන් කළෙමි. ''**විරජං**'' දුරු කළ දූවිලි ඇති. ''**පඤ්හං**'' කුමාර ප්‍රශ්නයෙහි. ''විදූ'' දතයුතු සියල්ල දත්, සර්වඥ වූ යන අර්ථයයි. ''ශාස්තෘන් වහන්සේ මගෙන් ප්‍රශ්න විචාරයි'' යනුවෙන් උපදින්නා වූ තැතිගැනීම්, භයවීම් යනාදියම මූල වූ (හේතු වූ) කරුණු ප්‍රහීණ කළ බැවින් තැති නොගෙන, නොබියව පිළිතුරු දුන්නෙමි. ''**යෙසායං**'' අංග මගධ වැසි යමෙකුගේ, මේ සෝපාක ''**පචචයං**'' ගිලන් පස, බෙහෙත් ආදිය. ''**සාමිචිං**'' මිත්‍ර කථාබහ, ගෞරව දැක්වීම්, පවත් සැලීම් ආදී නිවැරදි ක්‍රියාවන්ට, සාමීචිකර්මයන්ට සුදුසු වූ. ''**අජජදගෙ**'' ද කාරය පද සන්ධි කරන්නකි. අජජ + අගෙ යනු විසන්ධියයි. ''අද පටන්'' යන අර්ථයයි. අජජතගෙ යන පාඨය ද සුදුසුය. අද මුල් කොට, අදින් පසුව. ''**දසසනායොපසංකම**'' හීන කුලයක උපන් බැවින් හෝ වයසින් ඉතා බාල වියෙහි වූ බැවින් හෝ ඒ පිළිබඳව නොසිතා මා දැකීමට එන්න. ''**එසාවෙව**'' නුඹ විසින් මගේ සර්වඥ ඥානය සමඟ සසඳමින් කරන ලද පැන විසඳුම ම නුඹගේ උපම්පදාව වේවා'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළහ. ''**ලද්ධාමෙ උපසම්පදං**'' මවිසින් උපසම්පදාව ලබන ලදී. ''ලද්ධාන උපසම්පදං'' යනුවෙන් ද එය කියති. ''**සත්තවසෙසානං**'' සත් වසක් වන මම, අවුරුදු සතක් වන මම. නැතහොත් සත් වසක් පිරුණු මම. මෙහි යම් පදයක අර්ථ නොදක්වීද එම පදයන්ගේ අර්ථය ඉතා ප්‍රකටය.

සෝපාක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

7.1.5

''**සරෙ හඤ්ඤහි**'' යනු ආයුෂ්මත් **සරහංග** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේදී සසරින් මිදීම සඳහා කුසල් රැස් කරමින් පැමිණියහ. මේ බුද්ධෝත්පාද කාලයේදී ර ාහ නුවර එක්තරා බමුණු පවුලක උපන් හෙතෙම කුලවංසයෙන් පැමිණ නාම යෙන් ''අඟිලක්ඛිත'' නම් විය. වැඩිවියට පත් ඒ බමුණු කුමරු, ඍාමුක සම්පත් හැර දමා තවුස් පැවිද්දෙන් පැවිදි වී තමන්ම සරණ් ගිය ාන වුත් පන්සලක් සාදාගෙන

වාසය කළේය. එනිසා ඔහුගේ නම **''සරභංග''** (සර නම් බට වර්ගය බිඳි හෙයින්) නම් විය. ඔහු තුළ පැවති රහත් වීමට හේතු වාසනා බුදු ඇසින් දුටු භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩමවා ඔහුට දහම් දෙසූ සේක. ලැබූ ශ්‍රද්ධාව ඇති හෙතෙම ධර්ම ශ්‍රවණයෙන් පසු සසුනේ පැවිදි විය. විඳසුන් කමටහන් වැඩූ ඒ සරභංග තෙරණුවෝ නොබෝ කලකින්ම රහත් වූහ. උන්වහන්සේ මුලින් තමන් සිටි පන්සලේම වාසය කළහ. උන්වහන්සේ තාපසව සිටි කාලයේ කරන ලද පන්සල පසුව ජරා ජීර්ණව ගියේය. ඒ දුටු මිනිස්සු ''ස්වාමීනි! කිම මේ කුටිය පිළිසකර කර නොගන්නේ මන්ද?''යි ඇසූ තෙරුන් වහන්සේ ''තාපස කාලයේ කරන ලද මේ කුටිය, පිළිසකර කර ගැනීමට දැන් නොහැක''යි පවසමින් මේ ගාථා දෙක වදාළහ.

''සරෙ හත්‍ථෙහි භඤ්ජිත්වා කත්‍වාන කුටිමච්ඡිසං,
තෙන මෙ සරභංගොති නාමං සම්මුතියා අහූ''

''න මය්‍හං කප්පතෙ අජ්ජ සරෙ හත්‍ථෙහි භඤ්ජිතුං,
සික්ඛාපදා නො පඤ්ඤත්තා ගොතමෙන යසස්සිනා''

එහි ''සරෙ හත්‍ථෙහි භඤ්ජිත්වා'' පෙර තාපසව සිටි කාලයේ දී ඊතණ, සර නම් බට මගේ අතින්ම කඩා ගෙනවුත් තණ කුටියක් සාදා එහි විසුවෙමි. වාසය කළෙමි. එසේම එහි හුන්නෙමි. හොත්තෙමි. (පරිහරණය කළෙමි) ''තෙන'' ඒ කුටිය කිරීමට ඊතණ බිඳීමෙන්. **''සම්මුතියා''** එනිසා මට අන්වර්ථ සරභංග යන නාමය විය. **''න මය්හං කප්පතෙ අජ්ජ''** දැන් උපසපන් වූ මට ඊතණ, සර බට අතින් සිඳීම නොවටී. අකැපය. කුමක් හෙයින් ද? **''සික්ඛා පදා නො පඤ්ඤත්තා ගොතමෙන යසස්සිනා''** අපගේ ශාස්තෘන්වහන්සේ විසින් යම් ශික්ෂාපදයක් පනවන ලද්දේද, එය මගේ ජීවිතය නැතිවූවත් නොසිදිමි. නොකඩමි'' යන අර්ථයයි. මෙසේ එක් ආකාරයකින් තණ කුටිය පිළිසකර නොකිරීමේ හේතුව දක්වා, දැන් වෙනත් ආකාරයකින් ද ඒකාරණය දක්වයි. ඒ සඳහා තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**''සකලං සමත්තං රොගං සරභංගො නාද්දසං පුබ්බෙ,
සොයං රොගො දිට්ඨො වචන කරෙනාති දෙවසස්‍ය'' හි.**

එහි **''සකලං''** යනු සියලු. ''සමත්තං'' සම්පූර්ණ වූ, නිරවශේෂව, ඉතිරි නොවී පවතින සේඛභාවය නිසා සම්පූර්ණ වූ **''රොගං''** දුක්සහගත, දුක් පීඩා සහිත ආදී වශයෙන් වේදනා විඳීම් අර්ථයෙන් රෝගී වූ. උපාදාන

ස්කන්ධ පස සඳහා මෙය කියන ලදී. ''නාදදසං පුබ්බෙ'' ශාස්තෘන් වහන්සේ අවවාද ලැබීමට පෙර දී නොදුටුවෙමි. ''**සොයං රොගො දිට්ඨො වචන කරෙනාති දෙවසස**'' සම්මුති දේව, උත්පත්ති දේව, විසුද්ධි දේව යන සියලුම දෙවියන් තම සීලාදී ගුණමහිමයෙන් ඉක්මවා සිටි බැවින් දේවාතිදේව වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අවවාද ලැබ, ඒ අනුව හැසිරීමෙන්, සරභංගයෙන්, ඒ මම පඤ්චස්කන්ධ නම් වූ රෝගය විඳසුන් ප්‍රඥාවෙන් යුක්ත වූ මාර්ග ප්‍රඥාවෙන් ස්කන්ධ පහක් වශයෙන් බෙදා දුටුවෙමි. අවබෝධ කරගත්තෙමි යන අර්ථයයි. මේ ප්‍රකාශයෙන් මෙසේ තම ශරීරය නම් වූ කුටිය කෙරෙහි පවා අපේක්ෂාවක් රහිත වූ මම බාහිර වූ තණ කුටිය කෙසේ නම් පිළිසකර කරන්නේද''යි දක්වයි.

දැන් යම් මාර්ගයක් පිළිපැදීමෙන් මම මේ ශරීරය නම් ආත්මභාවරෝගය තත්ත්වාකාරයෙන් දුටුවෙම් ද ඒ උතුම් මාර්ගය සියලු බුදුවරු විසින්ම දේශනා කරන ලදී. කුමක් හෙයින් ද? ඒ උතුම් බුදුවරුන්ගේ අවවාදය ද මැදින් බිඳුණු රන් කැබැල්ලක් මෙන් සර්වප්‍රකාරයෙන් පිරිසිදුය. ඒ උතුම් අවවාදයෙහි පිහිටියා වූ මම දුක ක්ෂය කරගැනීමට පැමිණියෙමි. මෙසේ තමන් වහන්සේගේ රහත් බව ප්‍රකාශ කරමින් සරභංග මේ ගාථාවෙන් වදාළහ.

''යෙනෙව මගෙන ගතො විපසසී
යෙනෙව මගෙන සිඛීච වෙසසභූ
කකුසන්ධ කොනාගමනො ච කසසපො
තෙනංජසෙන අගමාසි ගොතමො''

''විතතණ්හා අනාදානා - සත්තබුද්ධා බයොගධා
යෙහයං දෙසිතො ධම්මො ධම්මභූතෙහි තාදිහි''

''චත්තාරි අරියසච්චානි අනුකම්පාය පාණිනං
දුක්ඛං සමුදයො මගො නිරොධො දුක්ඛසංඛයො''

''යසමිං නිවත්තතෙ දුක්ඛං සංසාරසමිං අනන්තකං
භෙදා ඉමසස කායසස ජීවිතසසච සංඛයා
අඤ්ඤා පුනබ්භවො නත්ථි සුවිමුත්තොමහි සබ්බධී'' ති.

මෙහි ''යනෙව මගෙන'' යම් ඒ පූර්ව භාග වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන්. 'ගතො'' පිළිපන්නෙමි. නිවණ අවබෝධ කරගත්තෙමි. ''**විපසසී**''

විපස්සී නම් බුදුරජාණන් වහන්සේ. ''**කකුසන්ධ**'' විහක්ති රහිතව දැක්වීමකි. කකුසඳ බුදුරජාණන් වහන්සේ. ''**කකුසන්ධකොනාගමනා**'' යන පාඨය ද සුදුසුය. ''**තෙනංඡසෙන**'' ඒ ආර්ය මාර්ගයෙන්ම. ''**අනාදානා**'' උපාදාන රහිත වූ, ප්‍රතිසන්ධියක් නොමැති වූ. ''**බයොගධා**'' නිවණෙහි පිහිටි. නිවණට බැසගත්. ''යෙහයං දෙසිතො ධම්මො'' ඒ සත් සම්මා සම්බුදු රජාණන් වහන්සේලා විසින් මේ ශාසන සද්ධර්මය දෙසන ලදී. ප්‍රකාශ කරන ලදී. ''**ධම්මභූතෙහි**'' ධර්මකාය බැවින්, ධර්ම ස්වභාවයෙන් යුතු, නවලෝකෝත්තර ධර්මයෙන් හෝ උපන් හටගත්, ධර්මයෙන් පැමිණි. ''**තාදිහි**'' මනෝඥ වූ තාදී භාවයන්ට පත් වූ, උන්වහන්සේලා විසින් මේ ශ්‍රී සද්ධර්මය දෙසන ලදී.

''**චත්තාරි අරියසච්චානි**'' යන ගාථාවෙන් උන්වහන්සේලා දෙසූ ධර්මය දක්වයි. එහි ''**චත්තාරි**'' යනු සංඛ්‍යා දැක්වීමයි. සතරක් වූ. ''**අරිය සච්චානි**'' සීමා කළ, බෙදා දහම් දැක්වීමයි. වචනාර්ථ වශයෙන් - ආර්යයන් විසින් භාවිත වූ අත් නොහළ සත්‍යයන් බැවින් ආර්ය සත්‍ය නම් වේ. නැතහොත් ආර්ය භාවයට පමුණුවන බැවින්, හෝ ආර්යයන් විසින් දෙසූ බැවින් හෝ ආර්යභාවය සිදුකරන බැවින් හෝ මේ ධර්ම සතර ''ආර්ය සත්‍ය'' නම් වේ. නින්දාසහගත, තුච්ඡ, හීන භාවයෙන් ''**දුක්ඛං**'' දුකය. දුක නම් ස්කන්ධ පංචය (පංචස්කන්ධය) උපාදාන (දැඩිව) කරගැනීමයි. ඒ දුක උපදවයි. (සමුදෙති) යන අරුතින් ''**සමුදයො**'' නම් වේ. ඒ තණ්හාවයි. ''කෙලෙස් නසමින් යයි'' ''නිවන් කැමැත්තවුන් විසින් යායුතු මාර්ගය'' යන අර්ථ ඇති ''**මග්ගො**'' මාර්ගයයි. සම්මා දිට්ඨි ආදී ධර්ම අටයි. සසර හැසිරීමක් නැත. එහි ''**රෝධ**'' නම් හිරකිරීමක් නැත. මේ ආයර්‍ය මාර්ගයේ ගමන් කර නිවන් අවබෝධ කරගත් පුද්ගලයා ''රෝධ'' නම් අවහිරයකට නොපත් වේ. දුක නිරුද්ධ වේ. යන අරුතින් නිවණ ''**නිරොධො**'' - ''නිරෝධ'' නම් වේ. එනිසා මෙසේ කියන ලදී. - ''දුක් මනාව ක්‍ෂය වූවකි. නිවණ.'' මේ අර්ථ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් විශුද්ධි මාර්ගයේ පැවසූ පරිදි දත යුතුයි. ''**යඤ්ඤං**'' යම් ඒ නිවණක්, නිරොධයක් අවබෝධ කරගත් කල්හි. ''**නිවත්තතෙ**'' ආර්ය මාර්ගය වැඩීම නිසා නැවත සසර නූපදී. අනන්ත වූ අප්‍රමාණ වූ මේ සංසාරයේ ඉපදීම් ආදී දුක්ඛයන්ට නැවත නොපැමිණේ. ඒ සියල්ල සිඳ දමන ලදී. ඒ උතුම් නිවණ මේ දහමින් උපන් සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් දෙසන ලදී'' යන අර්ථයයි. ''**හෙදා**'' ආදී ගාථා පාඨයෙන් ''දැන් නීරෝගී වෙමි. දුක පිරිසිඳ දක්නා ලද්දෙමි.'' යනාදී ලෙස රහත් වූ තමන් වහන්සේගේ ස්වරූපය, ස්වභාවය දක්වයි. ''**යඤ්ඤං නිබ්බත්තතෙ දුක්ඛං**'' යන පාඨයෙන් ඇරඹෙන මේ මුළු

ගාථාවේම අර්ථ මෙසේ දත යුතුයි. ''යම් ඒ ස්කන්ධ පිළිවෙලින් පවත්නා මේ අනන්ත, අප්‍රමාණ සංසාරයේ ජාති ආදී අනේක දුක් ඇති වේ. හටගනියි. මේ දුක නිසා පවත්නා අනික් ධර්මය නම් නැවත නැවත හටගන්නා පුනර්භවයයි. මේ ජීවිතේන්ද්‍රිය නම් වූ, ශරීරය නම් වූ පංචස්කන්ධයේ බිඳී යෑමෙන් නැවත මාහට උපතක් (පුනර්භවයක්) නැත. එනිසා සෑම තැනකින්ම, සෑම ක්ලේශයකින්ම, සෑම භවයකින්ම මම මනාව මිදුණෙමි. සසරින් මනාව වෙන් වූයෙමි.

සරභංග ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

සත්වන නිපාතයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

8.1.1

අටවන නිපාතයේ ''**කම්මං බහුකං**'' යන ගාථාවන් ආයුෂ්මත් මහා කච්චාන තෙරුන් විසින් දේශනා කරන ලදී. උන්වහන්සේ ද පෙර බුදුවරුන් කෙරෙහි තැබූ ප්‍රාර්ථනා ඇතිව පවුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී ගහපති මහාසාර කුලයක ඉපදුනහ. තුරුණුවියට පත් එකුමරු දිනක් ශාස්තෘන් වහන්සේ හමුවේ ධර්ම ශ්‍රවණය කරමින් සිටියේය. එහිදී ශාස්තෘන් වහන්සේ සංක්ෂිප්තව දෙසූ දහම් කරුණු ඉතා විස්තර වශයෙන් දේශනාකිරීමේ දක්ෂ භික්ෂූන් අතුරින් අග තනතුරට එක් භික්ෂූන් වහන්සේ කෙනෙකු පත් කරනු දුටු ගහපති කුමරු; එම තනතුරම පතාගෙන නොයෙක් පින්දහම් කළේය. එපින් බෙලෙන් දෙව් මිනිස් දෙගතියෙහි උපන් හෙතෙම සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී විද්‍යාධරයෙක්ව ඉපිද අහසින් යන කල්හි; ශාස්තෘන් වහන්සේ හිමවත එක් පර්වතයක වූ වන ලැහැබක වැඩහුන් අයුරු දක, පහන්සිත් උපදවා කිණිහිරි මලින් පූජා කළේය. ඒ පින්කම්වල විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි ඔහු, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ ඉපිද, පිරිනිවි භාග්‍යවතුන් වහන්සේගේ රන්සෑය කරන තැනට ගොස් ලක්ෂයක් වටිනා රන් ගඩොලින් පූජා පවත්වා, ''මම මතු උපනුපන් ආත්මභවයන්හිදී මගේ සිරුර රන්වන් වේවා''යි ප්‍රාර්ථනා කළේය. පසුව තවත් පින් දහම් සිදුකළ ඔහු ඉන් චුතව එක් බුද්ධාන්තරයක් දෙව්ලොව ඉපිද සැප විඳ, අපගේ බුදුරදුන් ලොව පහළ වූ සමයේදී උදේනියේ රජ වූ චණ්ඩපජ්ජෝත රජුගේ පුරෝහිත බමුණාගේ පුතුව උපන්නේ ය. ඔහුට නම් තබන දින ඔහුගේ මව, ''මගේ පුතා රන්වන්ය. තමාගේ නම රැගෙනම මෙහි ආවේය''යි පවසා කාඤ්චන මානවක යැයි නම් තැබුවාය. වැඩිවියට පත් ඒ බමුණු කුමරු ත්‍රිවේද පාරගතව පියාගෙන් පසුව පුරෝහිත තනතුරද දැරීය. හෙතෙම ගෝත්‍ර නාම වශයෙන් කච්චායන යැයි ප්‍රකට විය. ''බුද්ධ'' රත්නයේ පහළවීම ඇසූ ඒ චණ්ඩපජ්ජෝත රජු, ''ගුරුතුමනි, නුඹ එහි ගොස් ඒ ශාස්තෘන් වහන්සේ මගේ රාජ්‍යයට වඩමවා ගෙන එන්නයි'' පුරෝහිත බමුණා යැවීය. ඒ පුරෝහිත බමුණා තවත් සත් දෙනෙකු සමඟ ශාස්තෘන් වහන්සේ වෙත ගියේය. ශාස්තෘන් වහන්සේගෙන් දහම් ඇසූ ඒ කච්චායන බමුණා ප්‍රධාන දූත පිරිසම (අටදෙනම) සිවුපිළිසිඹියාපත් මහරහත් භාවයෙහි පිහිටියහ.

අපදාන පාළියේදී කච්චායන තෙරණුවෝ මෙසේ වදාළහ.

''දෙනිස් මහපුරිස් ලකුණින් බබළන සර්වඥ වූ පදුමුත්තර නම් භාග්‍යවතුන් වහන්සේ විවේක සැප කැමතිව හිමවතට වැඩම කළහ. එහි වැඩි පුරුෂෝත්තම මහා කාරුණිකයාණෝ පලක් බැඳ වැඩ සිටියහ. එකල මම අහසින් යන විද්‍යාධරයෙක් වූයෙමි. මනාව සැදූ ත්‍රිශූලායුධයක් ගෙන අහසින් ගිය මම කඳු මුදුනේ ගින්නක් මෙන් ද පුන්පෝදා සඳ මෙන් ද පිපී ගිය සල් රුකක් මෙන් ද බබළන බුදුරදුන් දුටුවෙමි. වත අගින් නික්ම බුදුරැස් පැහිරේ. නල (බට) වනයේ ගින්නක් මෙන් බබලන බුදුන් වෙත සිත් පැහැදවීමි. ඒ මේ අත බලා, දිව සුවඳහමන කිණිහිරි මල් තුනක් ගෙන බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට පිදුවෙමි. ඒ බුද්ධානුභාවයේ මා පිදූ මල් නැටි උඩුකුරුව හා පෙති යටිකුරුව පිහිටා බුදුන්ට සෙවන දුනි. මැනවින් කළ මේ උතුම් පින්කම හා චිත්ත ප්‍රාර්ථනා අනුව මිනිස් සිරුර හැර දෑමූ මම තව්තිසාවේ උපන්නෙමි. එසේ මනාව කළ පින්කමෙන් පහළ වූ මාගේ විමන ''කණිකාරී'' නම් විය. එහි උප යොදුන් සැටකි. පළල යොදුන් තිහකි. දහසක් භාග ඇත. ගෝලාකාර ගෙමුන් සීයකි. (කණිකාරපුප්ඵීය ථෙරාපදානයේ මෙම කොටස දැක්වේ. අපදාන පාළි II භාගය - පි. 238)

''මා විසින් සංක්ෂිප්ත කර දෙසූ ධර්මය විස්තර වශයෙන් දේශනා කරන මේ කච්චායන තෙරුන් මම ද සිවු පිරිස ද සතුටු කරයි. මෙබඳු අන් කිසි ශ්‍රාවකයකු මම නොදකිමි. මහණෙනි! එනිසා මෙතෙම සවිස්තරව දහම් දෙසන්නවුන්ගෙන් අග්‍ර වේ. එය මෙසේ දරවු''යි බුදුපියාණන් වහන්සේ පැවසූහ. එම බුදුවදන් ඇසූ මම හිමවතට ගොස් මල් රැසක් ගෙනවුත්, ලොවට පිහිට වූ බුදුරදුන්ට පුදා එම තනතුර පැතුවෙමි. කෙලෙසුන් දුරු කළ ඒ පදුමුත්තර බුදුහු මා අදහස් දැන මෙසේ වදාළහ.''

''පිරිසිදු කළ රන් බඳු පැහැයෙන් යුතු, අග් උඩුකුරුව ගිය ලොම් ඇති, පිරුණු මසින් යුතු උරහිස් ඇති, නිශ්චලව බැඳදිළිව සිටියා වූ සතුටු කඳුලින් පිරී ගිය ඇස් ඇති, බුදු ගුණ වැනුමෙහි පෙළඹුණු සිත් ඇති අමාවෙන් ඉසින ලද්දාක් බඳු මූර්තිමත් ධර්මය වැනි උතුම් සිරුරක් ඇති මේ සෘෂිවරයා බලවු. මෙතෙම කච්චානයන්ගේ ගුණ අසා ඒ තනතුර පතමින් සිටියේය. ගෞතම මහාමුනීන්ද්‍රයන් වහන්සේගේ අනාගත සසුන පවත්නා සමයේදී උන්වහන්සේගේ ධර්මයට දායාද වූ, ධර්මයෙන් මවන ලද්දාක් වැනි ඖරස පුත්‍ර වූ කච්චාන නම් බුද්ධශ්‍රාවක වන මෙතෙම එසමයේදී බහුශ්‍රැතව, මහානුභාවසම්පන්නව බුදුරදුන්ගේ අදහස් දන්නෙක්ව ඒ උතුම් තනතුර ලබන්නේ ය.''

''මීට කල්ප ලක්‍ෂයකට පෙර දී යම් කර්මයක් කළෙමි ද එහි විපාක විඳිමින් දුගතියකට නොපැමිණියෙමි. බුද්ධ පූජාවේ විපාක මෙබඳුය. ක්‍ෂත්‍රිය හා බ්‍රාහ්මණ කුලයන්හි පමණක් ඉපදුනෙමි. නීච කුලයේ නූපදිමි. දැන් පශ්චිම භවයේදී උදේනි නගරයේ ඉපිද චණ්ඩපජ්ජෝත රජුගේ තිදිවවිඡ නම් පුරෝහිතයාගේ පුත්‍රව උපන් මම සියුම් නුවණැතිව වේදයෙහි පරතෙරට ගියෙමි. මගේ මවු චන්‍දපදුමා නම් වූවාය. මනා සිවි ඇති මම කච්චායන නම් වීමි. බුදුරදුන් විමසනු පිණිස රජු විසින් යැවූ මම ගුණ සමූහ ඇති ලෝකනායකයන් වහන්සේ ද නිර්මල වචනය ද අසා සෙසු සත්දෙන සමඟම ශාන්ත වූ නිවනට පැමිණියෙමි. මහාමුනි වූ බුදුරදුන්ගේ අදහස් දන්නා වූ මම සම්‍යක්ද්ධ වූ මනදොළ ඇතිව ඒතදග්‍රස්ථානයෙහි තබන ලද්දෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි. (අපදාන පාළි II භාගය, පි. 292 - මහාකච්චායන තෙරාපදානය)

ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ''මහණෙනි, එවු''යි අත දිගුකර වදාළහ. එකෙණෙහිම ඔවුහු දෑගුලක් පමණ වූ කෙස් රවුල් ඇතිව, සෘද්ධිමය පාසිවුරු දරා සියවස් පිරී මහ තෙරවරු මෙන් පෙනී සිටියහ. මෙසේ කච්චායන තෙරණුවෝ ස්වාර්ථ සාධනය කරගෙන, ''ස්වාමීනි, පජ්ජෝත රජු ඔබවහන්සේගේ ධර්මය ඇසීමටත්, ඔබවහන්සේගේ පා වැඳීමටත් කැමති වේ'' යැයි ශාස්තෘන් වහන්සේට ආරාධනා කළහ. එවිට ශාස්තෘන් වහන්සේ, ''කච්චානය, නුඹම එහි යන්න. නුඹ ගිය විට රජු පහදින්නේය''යි පැවසූහ. තෙරණුවෝ ද ශාස්තෘ නියමය පරිදි තවත් සත්දෙනෙකු සමඟ උදේනි නුවරට වැඩ, රජු පහදවා අවන්තියේ බුදුසසුන පිහිටුවා නැවත ශාස්තෘන් වහන්සේ වෙතම වැඩම කළහ. එක් දිනක් බොහෝ භික්‍ෂූහු ශ්‍රමණ ධර්ම හැර, විවිධ කටයුතු-කර්මාන්තවල ද රංචු ගැසී කථාවෙහි ද රස තණ්හාවෙහි ද ඇලී ප්‍රමාදවෙමින් සිටිනු දුටු කච්චායන තෙරණුවෝ ඒ භික්‍ෂූන්ට අවවාද දෙමින් මෙසේ වදාළහ.

''කම්මං බහුකං න කාරයෙ, පරිවජ්ජයය්‍ය ජනං න උය්‍යමෙ,
සො උසසුකො රසානුගිද්ධො, අත්‍ථං රිඤ්චති යො සුබාධිවාහො''

''පංකොති හි නං අවෙදයුං යායං වන්‍දනපූජනා කුලෙසු
සුඛුමං සල්ලං දුරබ්බහං, සක්කාරො කාපුරිසෙන දුජ්ජහො'' තී.

මෙහි ''කම්මං බහුකං න කාරයෙ'' නව කර්මාන්ත කරවීම් ආදිය ශ්‍රමණධර්ම පුරන්නන්ට බාධාවකි. උවදුරකි. මහත් වූ නව කර්මාන්තයන්හි

පිහිටිය යුතු නොවේ. කුඩා වූ අල්ප වූ ආරම්භ කිරීම් ඇති කැඩුණු බිඳුණු නැන් පිළිසකර කිරීම් ද ශාස්තෘ වචනය ඉටුකිරීම ද කළ යුත්තේමය. "**පරිවජ්ජෙය්‍ය ජනං**" සමූහ සාකච්ඡාවල යෙදීමෙන් වැලකීම් වශයෙන් ජනයාගෙන් දුරුවිය යුතුයි. යමෙකු සේවනය, භාජනය, පයිරු පාසනය කිරීමෙන් කුසල් දහම් පිරිහී යයි ද අකුසල දහම් වැඩෙන්නේ ද එබඳු වූ අයහපත් පවිටු ජනයා දුරුකළ යුතුයි. "**න උය්‍යමෙ**" සිවුපසය ලබා ගැනීමට කුලයන්හි ඇලීම් වශයෙන් වෑයම් නො කරන්නේ ය. යමෙක් සුව ගෙනදෙන රසයන්හි ගිජු වී, රස තණ්හාවෙන් යුක්ත වූයේ ද මේ සඳහා උත්සාහවත් වන ඔහු අර්ථයෙන් හිස් වේ. යම් භික්ෂුවක් සිවුපසය ඉපයීමට උත්සාහවත් වී කුලයන් වෙත ගොස්, රැස්ව සමූහ සාකච්ඡාවෙන් යුතුව, තමාට සැප දුක් එළඹි කල්හි කළයුතු කටයුතු පිළිබඳව උත්සාහවත්ව යෙදෙන්නේ ද ඒ භික්ෂුව සැපගෙන දෙන සමථ, විදර්ශනා, මගඵල නිවන් සුවයෙන් විදින ශීලාදී අර්ථයන්ගෙන් හිස් වේ. දුරු වේ. ඒකාන්තයෙන්ම තමන් මේ කරුණුවලින් මුදවාගත යුතුය යන අර්ථයයි.

මෙසේ පළමු ගාථාවෙන් "කර්මාන්තවලම යෙදී සිටීම, සමූහ සාකච්ඡාවන්හි නිරතව සිටීම හා සිවුපසයේ ගිජු බව අත්හරින්න"යැයි අවවාද දී දැන් ලාභ සත්කාරයන්හි ගිජු බවට ගරහමින් දෙවන ගාථාව වදාරති. එහි අර්ථ මෙසේය. "යම් ඒ භික්ෂාව පිණිස පැමිණියා වූ පැවිද්දන්ට කුලයන්හි ගෘහවාසීන් විසින් ගුණ සලකා කරනු ලබන වන්දනා පූජාවන්; ඒ ගුණ රහිතයන් අපායේ ගිල්වන, හෙළන අරුතින් ද කිළිටි බව ඇති කරන හෙයින් ද පංකයක් වේ. මඩ ගොහොරුවක් වේ"යැයි බුද්ධාදී ආර්යයෝ වදාළහ. දෙසූහ. එසේම "අවබෝධ නොකළ ස්කන්ධ දැරීම ඇති අඳබාල පුහුදුන් පුද්ගලයන්ගේ ලාභසත්කාර ලෝලත්වය, දනගැනීම අසිරු හෙයින් ද පීඩා - පෙළීම් ගෙන දෙන බැවින් ද ඇතුලතින් අභ්‍යන්තරයෙන් අනින, පීඩාදෙන බැවින් ද උඟුලුවා ලිය නොහැකි සියුම් හුලකි"යි උන්වහන්සේලා පැවසූහ. එසේම ලාභසත්කාරයෝ ළාමක පුරුෂයන් විසින් අත්හළ නොහැක්කහ. අත්හැරීම ඉතා අපහසුය. ඒ ලාභසත්කාර දුරු කරන පිළිවෙත අනුගමනය නොකිරීමෙන් ලාභසත්කාරයේ ගිජු බව ප්‍රහීණ නොවේ. එනිසා ඒ ලාභ සත්කාරයේ ගිජු බව ප්‍රහාණය කිරීමට උත්සාහ කළයුතු යැයි එහි යෙදීම දක්වන ලදී. කච්චායන තෙරණුවෝ

"**නපරසසූපනිධාය කම්මං මචචසස පාපකං**
අත්තනා තං න සෙවෙය්‍ය, කම්මබන්ධූ හි මාතියා"

''න පරෙ වචනා චොරෝ, න පරෙ වචනා මුනි
අත්තනානඤ්ච යථා වෙත්ති දෙවාපි නං තථා විදූ''

''පරෙව න විජානන්ති මයමෙත්ථ යමාමසෙ
යෙව තඤ්ච විජානන්ති තතෝ සම්මන්ති මෙධගා''

''ජීවිතෙ වාපි සප්පඤ්ඤා අපි චිත්තපරිඤ්ඤයෝ
පඤ්ඤාය ච අලාභෙන චිත්තවා'පි න ජීවති''

''සබ්බං සුණාති සොතෙන, සබ්බං පස්සති චක්ඛුනා
න ච දිට්ඨං සුතං ධීරෝ සබ්බං උජ්ඣිතුමරහති''

''චක්ඛුමස්ස යථා අන්ධෝ සොතවා බධිරෝ යථා
පඤ්ඤාවස්ස යථා මූගෝ බලවා දුබ්බලොරිව,
අථ අත්ථෝ සමුපපන්නෙ සයෙථ මතසායිකං''ති

මේ ගාථා සය චණ්ඩපජ්ජෝත රජුට අවවාද වශයෙන් වදාළහ. ඒ රජු බමුණු මත පිළිගෙන සත්ථශාසන යාගහෝමාදිය කරවයි. කටයුතු නොවිමසා සොරකම් නොකළ පුද්ගලයන්ට ''සොරුය'' යන හැඟීමෙන් දඬුවම් කරයි. ධනයට නිසි හිමිකරුවන් ඊට අහිමි කරයි. නුසුදුසු පුද්ගලයන් ධනයට හිමිකරුවන් කරයි. මෙම අමනෝඥක්‍රියා විවේචනය කරමින් ඉහත දැක්වූ ගාථා සය තෙරණුවෝ වදාළහ.

එහි ''න පරස්සුපනිධාය කම්මං මචවස්ස පාපකං'' අන්‍ය සත්වයන්ට සමාන කර බලා, ගලපා බලා, කාරකයකු කොට පවිටු වද බන්ධන නොකරන්න. අනුන් ලවා ද නො කරවන්න යන අර්ථයයි. ''**අත්තනා නං** න සෙවෙය්‍ය'' තමා විසින් ද ඒ පාප කර්ම නොකරන්න. කුමක් නිසාද? ''කම්මබන්ධූහි මානියා'' සත්ත්වයෝ කර්මය බන්ධු කරගෙන, ඥාති කරගෙන, දායාද කරගෙන ඇති බැවිනි. එනිසා තමා විසින් ද කිසිදු පාප කර්මයක් නො කරන්නේ ය. අනුන් ලවා ද පව්කම් නො කරන්නේ ය. ''**න පරෙ වචනාවොරෝ**'' තමා සොරකම් නොකළ පුද්ගලයෙකුට අනුන් ''සොරෙක්'' යැයි කී පමණින් ඔහු සොරෙකු නොවේ. එමෙන්ම අනුන් කී පමණින් ''න පරෙ වචනාමුනී'' ඉතා පිරිසිඳු කායවාග් හැසිරීම් නැති පුද්ගලයා මුනිවරයකු ද නොවේ. මෙහි ''පරෙ'' යන්න විභක්ති ලොප් නොකර දක්වන ලදී. ඇතැමෙක් ''පරෙසං'' යැයි කිවයුතු තැන ''පරෙ'' යනුවෙන් සකාරය ලොප් කර, දක්වන ලදැයි පවසති. ''**අත්තානංච යථා වෙත්ති**'' ඒ සත්ත්වයා

තමන්ගේ සිතින් ''මම පිරිසිඳු වූවෙක්මි'' හෝ ''අපිරිසිඳු වූවෙක්මි''යි තත්වාකාරයෙන්, ඇති සැටියෙන් දනියි. ''**දෙවාපි පරචිත්තවිදූ**'' විසුද්ධි දෙවියෝ ද උත්පත්ති දෙවියෝ ද එසේම තත්වාකාරයෙන් දනිති. එනිසා තමාගේ පිරිසිඳු අපිරිසිදු බව දැනීමෙහි දෙවියෝද ප්‍රමාණ වෙති. ඊර්ෂ්‍යා, දෝෂ සහිත සත්ත්වයෝ ප්‍රමාණ නොවෙති යන අදහසයි. ''**පරෙ**'' නුවණැති - පඬිවරුන් හැර අන්‍ය වූ කුසලාකුසල දහම්, වැරදි නිවැරදි දහම් කර්ම හා කර්මඵල, කයේ අසුභත්වය හා සංස්කාරයන්ගේ අනිත්‍ය බව නොදක්නා අනුවණයෝ. ඔවුහු ''අපි මේ ජීවිතයෙන් වෙන්ව පරලොව යන්නෙමු. නිතරම අපි මරණය වෙත ලංවන්නෙමු''යි නොදනිති. ''**යෙ ච තත්ථ විජානන්ති**'' යම් ඒ පඬිවරු වෙත් ද ඔවුහු ''අපි මරණයට පත්වන්නෙමු''යි දනිති. ''**තතො සම්මන්ති මෙධගා**'' මෙසේ මැරෙන බව දන්නා නුවණැත්තෝ අනුන්ට හිංසා කිරීමෙන් වැළකෙති. තමා විසින් ද අනුන් ලවාද කිසිවකුටත් පීඩා, හිංසා නොකරති. බාධා නොකරති යන අර්ථයයි. නුඹ වනාහි ජීවිතය නිමිති කරගෙන, නොසොරු සොරු කරමින් දඬුවම් කරන්නෙහිය. වස්තු හිමියන්ට වස්තු අහිමි කරමින් ධන හානි කරන්නෙහිය. ප්‍රඥා විකලත්වයෙන් එසේ නොකරමින් ජීවත්වන නුවණැති පුද්ගලයා සම්පත් පිරිහී ගියත්, ධනය ක්‍ෂය වුවත් නුවණැතිව උපන් බැවින්, ලද දෙයින් සතුටුවෙමින් නිවැරදි ජීවිකාවෙන් ජීවත්වන්නේ ම ය. ඔහු ''ජීවත්වෙනවා'' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේ එබැවිණි. ''ප්‍රඥාවෙන් ජීවත්වීම ශ්‍රේෂ්ඨතම ජීවත්වීමයි'' අනුවණ පුද්ගලයා ප්‍රඥාව නොඇති හෙයින් මෙලෝ පරලෝ යහපත වසාගනියි. සම්පත් නිසාවත් ජීවත් නොවේ. ගැරහුම්, නින්දා අපහාස ලබන ඔහුගේ ජීවිතය, ජීවත්වීමක් නො වේ. මුහුකුරා නොගිය ප්‍රඥාව ඇති බැවින් තමාට ලැබෙන ධනය වනසමින් සිටින්නා ජීවත්වීම නොකඩවා පවත්වාගෙන යෑමට ද අසමත් වේ. මෙම ගාථා සතර තෙරුන් වහන්සේ සිහිනෙන් පෙනී සිට රජුට වදාළහ. උදෑසන තෙරුන්ට වඳිමින්ම අවදි වූ රජතුමා, තෙරුන් වහන්සේ එම සිවු ගාථා නැවත වදාරා, ''**සබ්බං සුණාති**'' යන අවසන් ගාථා දෙක වදාරමින් රජුට අවවාද දුන් සේක.

එහි ''**සබ්බං සුණාති සොතෙන**'' මෙලොව ඇසිය යුතු ශබ්ද, කණට වැටෙන සියලු සුභාෂිත වූ ද දුර්භාෂිත වූ ද ශබ්ද මිහිරි නොවූවෝ කණින් අසති. එසේම සියලුම සුන්දර, අසුන්දර රූප අක්ඛිනොවූවෝ සිය ඇසින් දකිති. ඉන්ද්‍රියයන්ගේ ස්වභාවය මෙබඳුය. එහි ''**නව දිට්ඨං සුතං ධීරො සබ්බං උජ්ඣිතුං**'' මෙය නිදර්ශන දක්වීමකි. උදාහරණයකි. දුටු, ඇසූ, විඳි සියල්ලම මෙහිදී අදහස් වේ. ප්‍රඥාවන්ත නුවණැත්තා අත්හල යුතු, ඉවත්

කළ යුතු නුසුදුසු දේ අත්හරියි. ගැනීමට සුදුසු දේ පමණක් හොඳ-නරක, ගුණාගුණ විමසා ගනියි. අත්හළ යුතු දෙය පමණක් ඉවත් කිරීමත්, ගත යුතු දේ පමණක් ගැනීමත් සුදුසුය. එනිසා ඇස් ඇති නමුත් නුසුදුසු දෙයක් දුටුවිට අන්ධයකු මෙන් එය නොදක්නා බවට පත්විය යුතුයි. නුසුදුසු දෙයක් ඇසෙන විට බිහිරෙකු මෙන් එය නොඇසුණු ලෙස හැසිරිය යුතුය. නොකිවයුතු තැන දී විමසුම්ශීලී ප්‍රඥාවෙන් යුතු, නුවණැති වූවත් ගොළුවකු මෙන් හැසිරිය යුතුයි. යම් නොකටයුත්තක් පැමිණි කල්හි බල වීර්ය ආදියෙන් සමන්විත වුවත් දුර්වලයකු මෙන්, අසමත් අයෙකු මෙන් හැසිරිය යුතු යි. ''දුබ්බලෝවිව'' දුර්වලයකු මෙන් ''ර'' යන්න පද සන්ධි කරන්නකි. ''අථ අඤ්ඤෝ සමුප්පන්නෙන සයෙථ මතසායිකං'' තමා විසින් කළයුතු කටයුත්තක් එළඹි කල්හි මරනින්දෙහි යෙදුණෙකු මෙන් එම කටයුත්ත තීරණය කළයුත්තේමය. කළ යුතුමය. අතරමඟ නැවැත්විය යුතු නොවේ. නැතහොත් ''අථ අඤ්ඤෝ සමුප්ප නෙන'' තමා විසින් නොකළයුතු කටයුත්තක් එළඹි කල්හි, පැමිණිවිට මරනින්දේ නිදවු. මරනින්දේ නිදා එය නොකළ යුතුයි. කිසිසේත්ම නුවණැත්තන් විසින් නුසුදුසු දෙයක් කිරීම සුදුසු නොවේ. මෙසේ කච්චායන තෙරුන්ගේ අවවාද ලැබූ රජතුමා නොකළ යුතු දේ අත්හැර සුදුසු කටයුතුවලම නියුක්ත වූයේය.

මහා කච්චායන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

8.1.2

''අකෙකාධනො'' ආයුෂ්මත් සිරිමිත්ත තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි තැබූ ප්‍රාර්ථනා අනුව, ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් දහම් රැස් කරමින් පැමිණ, මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහනුවර මහධනවත් කෙළෙඹියෙකුට දාව උපන්හ. එකුමරු සිරිමිත්ත නමින් ප්‍රකට විය. ඒ කුමරුගේ මව සිරිගුත්ත උපාසකගේ නැගණියයි. සිරිගුත්ත පිළිබඳව ධම්මපද වර්ණනාවේ කියැවේ. ඒ සිරිගුත්තගේ බෑණා වූ සිරිමිත්ත ශාස්තෘන් වහන්සේ ධනපාල ඇතු (නාලාගිරි) දමනය කිරීම දැකීමෙන් උපන් ශ්‍රද්ධාවෙන් සසුනේ පැවිදි විය. විදසුන් කමටහනෙහි සිත යොමු කළ සිරිමිත්ත තෙරණුවෝ නොබෝ දිනකින්ම රහත් වූහ. දිනක් පාමොක් උදෙසන වේලාවෙහි පාමොක් දෙසීමට විසිතුරු විජිනිපතක් රැගෙන ආසනාරූඪ

වූ සිරිමිත්ත තෙරණුවෝ භික්ෂූන්ට දහම් දෙසූහ. දහම් දෙසමින් ඉතා උසස් ගුණයන් බෙදා දක්වමින්, විස්තර කරමින් මේ ගාථා අට දේශනා කළහ.

''අකෙකාධනො අනුපනාහී අමායො රිත්ත පෙසුනො,
සවෙ නාදිසකො භික්ඛු එවං පෙච්ච න සොචති''

''අකෙකාධනො අනුපනාහී අමායො රිත්තපෙසුනො
ගුත්තදාරො සදා භික්ඛු එවං පෙච්ච න සොචති''

''අකෙකාධනො අනුපානා හී අමායො රිත්තපෙසුනො
කල්‍යාණ සීලො සො භික්ඛු එවං පෙච්චන සොචති''

''අකෙකාධනො අනුපනාහී අමායො රිත්තපෙසුනො
කල්‍යාණමිත්තො සො භික්ඛු එවං පෙච්ච න සොචති''

''අකෙකාධනො අනුපනාහී අමායො රිත්තපෙසුනො,
කල්‍යාණපඤ්ඤා සො භික්ඛු එවං පෙච්ච න සොචති''

''යස්ස සද්ධා තථාගතෙ අචලා සුපතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං''

''සංඝෙ පසාදො යස්සත්ථි උජුභූතඤ්ච දස්සනං,
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං''

''තස්මා සද්ධඤ ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජථ මෙධාවී සරං බුද්ධාන සාසනං'' ති.

එහි **අකෙකාධනො''** නොකිපෙන ස්වභාවය ඇති, කෝපවන නිමිත්තක් එළඹී කල්හි එය ඉවසාගෙන, ක්‍රෝධ සිත් නූපදවා සිටින. **''අනුපානාහී''** අනුන් විසින් කරන ලද අපකාරය, අවැඩ කටයුත්ත නිසා අනුන් කෙරේ වෛර නූපදවා, ''අසුවලා මට බැන්නා, අසුවලා මට ගැසුවා යැයි කියමින්'' ආදී වශයෙන් ක්‍රෝධ සිත්, වෛර සිත් නූපදවන ස්වභාව ඇතිව. විඩාවීම්, වෙහෙසීම් දෝෂ ලක්ෂණයන්ගෙන්, මායාවන්ගෙන් දුරු වූ බැවින් **''අමායො''** මායා රහිත වූ. **''රිත්ත පෙසුනො''** කේලාම් කීමෙන් වෙන්වූ. **''සවෙනාදිසකෙ භික්ඛු''** මෙසේ දැක්වූ ගුණයන්ගෙන් යුතු, මේ ගුණ උපදවාගත් භික්ෂුවම තම ඉහත දැක්වූ පිළිවෙත් මඟ යෑමෙන් පරලොව

ශෝක නොකරයි. ශෝකාදී නිමිති දුරුකළ බැවින් ඒ භික්ෂුවගේ ඇස්, කන් ආදී කායික ඉඳුරන් මනාව සංවර වූයේය. ''**ගුත්තඳවාරෝ**'' වැසූ, පියූ ඉඳුරන් ඇත. ''**කල්‍යාණසීලෝ**'' සුන්දර, ඉතා පිරිසිදු, යහපත්, සිල් ඇත. ''**කල්‍යාණමිත්තෝ**'', කළණ මිතුරා -

''පියෝ ච ගරුභාවනීයෝ වත්තා ච වචනක්ඛමෝ
ගම්භීරඤ්ච කථං කත්තා නෝචට්ඨානෙ නියෝජයෙ'' **ති.**

යනාදී වශයෙන් දක්වූ ප්‍රිය වූ, ගරුකටයුතු බව ඇති කරන, වත්තාවත්හි යෙදුණු, පැවසූ දේ ඉවසන, ගැඹුරු කථා ඇතිව සුදුසු කටයුතුවලම අනුන් යොදවන කලණ මිතුරන් ඇත්තෙකි. ''**කල්‍යාණපඤ්ඤෝ**'' සුන්දර ප්‍රඥාවෙන් යුතු. ප්‍රඥාවේ අසුන්දර බවක් නම් නැත. නිවණට මෙහෙයවන යහපත් ප්‍රඥාවට මෙසේ කියන ලදී. මෙසේ ක්‍රෝධ සිත් මැඬ, මුලිනුපුටා දැමූ, ක්‍රෝධ නොකිරීම මූලික කරගත් පුද්ගලාධිෂ්ඨාන කථාවෙන් යහපත් පිළිවෙත් මඟ දක්වා අනතුරුව, විරාගී සිත ලෞකික ශ්‍රද්ධාවෙන් ගෙන, ලෝකෝත්තර ශ්‍රද්ධාවෙහි පිහිටුවීම සඳහා ම වූ යහපත් පිළිවෙත් මඟ දක්වමින් සයවන ගාථාව වදාරන ලදී. එහි අර්ථ මෙසේය. ''**යස්ස සද්ධා තථාගතෙ**'' යම් පුද්ගලයෙකු ගේ සිතේ, තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳව ගුණ මෙනෙහි කිරීම් වශයෙන් ''**ඉතිපි සො භගවා**'' යන ලෙස සිහිකර, ආර්ය මාර්ගයෙන් උපදවාගත් අචල වූ ශ්‍රද්ධාවෙන් යුතුව, කම්පා නොවී මනාව පිහිටි ශ්‍රද්ධාව ඇති යනුවෙන් ''**අත්ථි**'' යන පදය යොදා අර්ථ ගත යුතුයි. ''**අරියකන්තං**'' ආර්යයන්ගේ කාන්ත වූ ප්‍රිය වූ, භවත්තරයෙහි ද අත්නොහරින්නා වූ ''**පසංසිතං**'' බුද්ධාදීන් විසින් පසසන ලද, වර්ණනා කරන ලද, ස්තුති කරන ලද යන අර්ථයයි. ''**සීලං**'' මෙම ශීලයේ කොටස් දෙකකි. ගෘහස්ථ ශීලය හා පැවිදි ශීලය යනුවෙනි. එහි ගෘහස්ථ ශීලය නම් ගිහියන්ට රැකිය හැකි පංචශීලයයි. දශශික්ෂාවන්හි සිට චතුපාරිශුද්ධි ශීලය දක්වා ඇති ශීලය පැවිද්දන්ගේ ශීලයයි. මේ ශික්ෂාවන් නොකඩා, නොසිදී, කිලිටි නොවූ බැවින් ''**කල්‍යාණ**'' යැයි දත යුතුයි. ''**සංඝෙ පසාදො යස්සත්ථි**'', භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපිළිපන්නයහ'' ආදී වශයෙන් ආර්ය සංඝයා විෂයෙහි පැහැදීමක්, ශ්‍රද්ධාවක් යමෙකුට ඇත්ද ඒ ශ්‍රද්ධාව අචලව මනාව පිහිටියේ ද යනුවෙන් අර්ථ ගත යුතුයි. ''**උජුභූතඤ්ච යස්සඤං**'' දෘෂ්ටියෙන් හා කෙලෙස්වලින් වංකභාවයෙන් දුරු වූ බැවින් ඍජු වූ. ඍජු වූ කර්මයෙන් කරන ලද දර්ශනය හා ප්‍රත්‍ය සහිත නාමරූපයන්ගේ දර්ශනය යනුවෙන් දෙයාකාර වූ දර්ශනය යමකු තුළ ස්ථිරව මනාව පිහිටියේ ද යන අර්ථයයි. ''**අදළිද්දොති නං ආහු**'' ශ්‍රද්ධා ධනය, සීල ධනය, සුත ධනය, චාග

ධනය, ප්‍රඥා ධනය යන ඉතා පිරිසිදු ධනයන්ගෙන් යුතු බැවින්; එබඳු පුද්ගලයා ''දිළිඳු නොවූවෙකි'' යි බුද්ධාදී ආර්යයෝ පැවසූහ. ඔහුගේ ජීවිතය හිස් නොවූවකි. ''**අමොඝං තස්ස ජීවිතං**'' මෙලොවදීම අර්ථය, යහපත ලබන බැවින් ඔහුගේ ජීවිතය සාර්ථක වූවකි. වඳ නොවූවකි. සඵල වූවකි. ''**තස්මා**'' ඉහත දැක්වූ පරිදි ශ්‍රද්ධාදී ගුණමහිම සහිත පුද්ගලයා දිළිඳු නොවූ, නොසිස් ජීවිතයක් ඇත්තෙක් වන හෙයින් මම ද එබඳුම කෙනෙක් වන්නෙමි. ''**සද්ධං -පෙ- සාසනං**'' ''සියලු පව් නොකළ යුතුයි'' ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ පැවැත්වූ අනුශාසනාව සිහිකරන කුල පුත්‍රයා, ඉහත දක්වූ ශ්‍රද්ධා, ශීල, ප්‍රඥේදව ඇති, දහම් දකිමින්, ධර්මයෙහි මනාව යෙදීමෙන් විමෝක්ෂය ද ප්‍රසාදය ද ලැබීමෙහි උත්සාහවත් වන්න. දහම් මඟ ගමන් කරන්න. මෙසේ සිරිමිත්ත තෙරණුවෝ භික්ෂූන්ට දහම් දෙසමින්, තමන් වහන්සේ තුළ විද්‍යමාන ගුණ ප්‍රකාශ කරන සේක්, සිය රහත් බව ප්‍රකාශ කළහ.

සිරිමිත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

8.1.3

''**යදා පඨමමඥකඞං**'' යනු ආයුෂ්මත් මහාපන්ථක තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර **පදුමුත්තර** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර මහත් ධනවත් කෙළෙඹි පුත්‍රයෙක්ව ඉපදුනහ. දිනක් ශාස්තෘන් වහන්සේගෙන් ධර්මය අසමින් සිටි ඔහු; ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක් අරූප ධ්‍යානයෙන් නැගිට රහත්වූවන්ගෙන් අග්‍රභාවයෙහි තබනු දැක, එම තනතුරම පතා බුදුපාමොක් මහ සඟනට සතියක් මහ දන් දී ''පෙර යම් භික්ෂුවක් අරූපධ්‍යානයට සමවැදීමේ සමත් භික්ෂූන්ගෙන් අග්‍රස්ථානයෙහි තැබූ සේක් ද මම ද අනාගතයේ බුදුසසුනකදී එම තනතුරම ලබම්වා''යි ප්‍රාර්ථනා කළේය. ඔහුගේ බාල සෝයුරා ද එසේම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි තැබූ ප්‍රාර්ථනා අනුව, මනෝමය කාය නිර්මාණයෙහි ද රූපාවචර ධ්‍යානයන්ට සමවැදීමෙහි ද යන දෙ අංගයෙන් අග්‍රභාවය ලබම්වායි පැතීය. භාග්‍යවතුන් වහන්සේ මේ දෙසෝයුරන්ගේ ප්‍රාර්ථනා ඉටුවනු දැක; ''අනාගතයේ දී මීට කල්ප ලක්ෂයකට පසුව ගෞතම බුද්ධ ශාසනයේදී නුඹලාගේ ප්‍රාර්ථනා ඉටුවන්නේ ය''යි විවරණ දුන් සේක. දෙසොයුරෝ දිවි ඇතිතාක් පින්දහම්

රැස්කර, ඉන් චුතව දෙව්ලොව උපන්හ. ඉන් **මහාපන්ථක** ගේ සසර අතරතුරදී කළ යහපත් ක්‍රියාවක් පිළිබඳව නොකියවේ. **කාශ්‍යප** බුදුරදුන්ගේ සසුනේ පැවිදි වූ **චුල්ල පන්ථක** හිමියෝ වසර විසි දාහක් ඔදාත කසිණ කමටහන වඩා දෙව්ලොව උපන්හ. ඇතැමෙක් ''මේ චුල්ල පන්ථක පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී තාපසයෙකුව ඉපිද හිමවතේ වෙසෙමින්, එහි වැඩම වූ තථාගතයන් වහන්සේට මල් සේසතකින් පූජා පැවැත්වීයැ''යි කියති. ඔවුහු දෙදෙන මේ ආකාරයෙන් දෙව් මිනිස් දෙගතියේ සැප විඳිමින් කල්ප ලක්ෂයක් ඉක්මවූහ. එකල අපගේ බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පැමිණ, පැවැත් වූ උතුම් ධම්සක් දෙසුම් ඇතිව, රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වෙසෙති. එසමයේ රජගහ නුවර සිටුතුමාගේ දුවණිය, තම දාසයකු හා යහළුව, ඥාතීන්ට බිය වී අතට හසු වූ දෙය රැගෙන ඔහු සමඟ පලාගියාය. පිටිසර ගමක විසූ ඇයට දාව එම දෙදෙනා මෙලොව ඉපදුණි. ඇය පළමු ගැබ මුහුකුරා ගිය කල්හි, ''ඥාතීන්ගේ ගෙදරකට ගොස් වදිමි''යි යන්නී අතරමඟදී ම පුතෙකු වැදුවාය. මාර්ගයේ උපන් බැවින් ''පන්ථක'' යැයි පුතුට නම් තබා තම සැමියා සමඟ නැවත හැරී ආවාය. ඒ දරුවා දුවපැන ඇවිදින වියේ දී එම දාසයාටම දාව සිටුදියණි කුස තව දරුවකු පිළිසිඳ ගත්තේය. එම ගැබ මුහුකුරා ගිය විටද පෙර මෙන්ම ඥාතීන් හමුවට වැදීම පිණිස යන්නී අතරමඟදී දරුවා වැදුවාය. ඔහුට ''**චුල්ලපන්ථක**'' යැයි ද වැඩිමලාට ''**මහා පන්ථක**'' යැයි ද නම් තබා නැවත පෙර විසූ නැනටම ඇය පැමිණියාය. දාසයා සමඟ ඒ පිටිසරම වසන ඇයගෙන් හැදී වැඩුණු දරු දෙදෙන ''අම්මේ, අපගේ ආත්තාමුත්තා ආදීනු අපට පෙන්වන්න''යි අයැදූහ. එවිට ඇය දරු දෙදෙන තම පියා සමීපයට යැවුවාය. එතැන් සිට දරුවෝ රජගහ සිටු සමීපයේ වැඩුනහ. චුල්ලපන්ථක ඉතාම කුඩා වූවෙකි. මහාපන්ථක සීයා සමඟ භාග්‍යවතුන් වහන්සේ දැකීමට ගොස්, උන්වහන්සේ දැකීමෙන්ම ලැබූ ශ්‍රද්ධාව ඇතිව, ධර්ම ශ්‍රවණය කළේය. පෙර සසර පුරුදුනාවය හා නිවන් දැකීමේ හේතු සම්පත් ඇති බැවින්, පැවිදිවනු කැමති මහාපන්ථක සීයාගෙන් අසා, අවසර ලැබ ශාස්තෘන්වහන්සේ සමීපයේ පැවිදි විය.

පැවිදි වූ මහාපන්ථක සාමණේරයෝ බෙහෝ බුදුවදන් ඉගෙන පිරිපුන් විසිවයස් ඇතිව උපසපන් වූහ. යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කළ උන්වහන්සේ, විශේෂිත වූ සතර අරූපධ්‍යානයන් උපදවාගෙන, ඉන් නැඟිට විදසුනෙහි සිත පිහිටුවා රහත් වූහ. උන්වහන්සේ මෙසේ අරූපධ්‍යානයන්ට සම වැදීමෙහි දක්ෂ වූ භික්ෂූන්ගෙන් අග්‍රව, ධ්‍යාන හා ඵල සුවයෙන් කල් යවනුයේ, දිනක් තම පිළිවෙත් මඟ දෙස නැවත හැරී බලා, ලබන ලද

සම්පත් නිසා හටගත් සතුටු සිත් ඇතිව සිංහනාද කරමින් මේ ගාථා අට වදාළහ.

''යදා පඨමමද්දක්ඛිං සත්ථාරමකුතොභයං,
තතො මෙ ආහු සංවෙගො පසසිත්වා පුරිසුත්තමං''

''සිරිං හත්ථෙහි පාදෙහි යො පනාමෙය්‍ය ආගතං,
එතාදිසං සො සත්ථාරං ආරාධෙත්වා විරාධයෙ''

''තදාහං පුත්ත දාරඤ්ච ධනධඤ්ඤංච ඡඩ්ඩියිං,
කෙසමස්සූනි ඡෙදෙත්වා පබ්බජිං අනගාරියං''

''සික්ඛා සාජීව සම්පන්නා ඉන්ද්‍රියෙසු සුසංවුතො,
නමස්ස මානො සම්බුද්ධං විහාසිං අපරාජිතො''

''තතොමෙ පණිධි ආසි චෙතසො අභිපත්ථිතො,
න නිසීදෙ මුහුත්තම්පි තණ්හාසල්ලෙ අනූහතෙ''

''තස්ස මෙවං විහරතො පස්ස විරිය පරක්කමං,
තිස්සො විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධස්ස සාසනං''

''පුබ්බෙ නිවාසං ජානාමි, දිබ්බචක්ඛු විසොධිතං,
අරහා දක්ඛිණෙය්‍යොම්හි, විප්පමුත්තො නිරූපධි''

''තතො රත්‍යා විවසනෙ සූරියස්සුග්ගමනං පති,
සබ්බං තණ්හං විසොසෙත්වා පල්ලංකෙන උපාවිසිං'' ති.

මෙහි ''යදා'' යම් කාලයක, ''පඨමං'' පළමුව ''අද්දක්ඛිං'' දුටුවෙමි ද ''සත්ථාරං'' ශාස්තෘන්වහන්සේ. ''අකුතොභයං'' භය නැතිව. මෙහි අර්ථ මෙසේය. ''සියලු භය හේතු බෝමැඩදීම ප්‍රහීණ කළ බැවින්, කිසිසේත්ම භය නොවේ. බිය සහමුලින් දුරලූ චතුර්වෛශාරද්‍ය ව මෙලෝ පරලෝ පරමාර්ථ සාධනයෙහි හික්මවිය හැකි ජනයාට සුදුසු පරිදි අනුශාසනා කරන බැවින් ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත, මගේ සීයා සමඟ ගොස් සවස් වේලෙහි දී ඒ පුරුෂෝත්තම දෙවියන් සහිත ලෝකයේ අග්‍ර පුද්ගලයා පළමුවාරයේ ම දුටුවෙමි. ඒ දර්ශනයෙන්ම ප්‍රසන්න වූයෙමි. මෙපමණ කලක් ශාස්තෘන්වහන්සේ දැකීමටවත් දහම් ඇසීමටවත්

නොලැබීම පිළිබඳව මට සංවේග ඇතිවී, බියත් සමඟම සම්‍යක් ඥානය පහළ විය. උපන් සංවේග ඇති මට මෙසේ සිතුණි. ''**සිරිං හෙට්ඨි**'' යනු එම ගාථාවයි. එහි අර්ථ මෙසේය. -''යම් සැප සම්පත් කැමති පුරුෂයෙක් නැගිට; ''නුඹ සමීපයේ වෙසෙන්නෙමි''යි සමීපයට විත් පැමිණ, පිරිස සමඟ සයනයේ හොත් ශ්‍රියාකාන්තාවට, අතින් පයින් ගසා එළවා දමන, බැහැර කරන අවාසනාවන්ත කාලකණ්ණියෙක් වේද, මෙබඳු වූ සම්මා සම්බුදුවරයකු සතුටු කරමින්, මේ මනුෂ්‍යාත්මභාවය ලබා ක්‍ෂණ සම්පත් ලැබූ මොහොතෙහි, ඒ බුදුරදුන්ගේ අවවාද ඉටුනොකර ඊට එරෙහිවීමත් ඒ හා සමානය. මම එසේ කාලකණ්ණියෙක් නො වෙමි'' යන අදහසයි.

එනිසා තමා කරන දෙය ''**තදාහං -පෙ- අනගාරියං**'' යනුවෙන් දක්වන ලදී. එහි ''**ඡඩ්ඩයි.**'' අත්හළෙමි. දුරුකළෙමි. ''**ඡඩ්ඩියා**'' යන පාඨය ද සුදුසු ය. මේ තෙරණුවෝ අඹුදරුවන් නොලබා ඉතා කුඩා වියේදී පැවිදිවූයේ නොවේද? කුමක් හෙයින් ''**පුත්තදාරංච ඡඩ්ඩයිං**'' යැයි කියන ලද්දේ ද? යම් සේ පුරුෂයෙකු හටනොගත් ගෙඩි ඇති ගසක් සිදින්නේ ද, එවිට එය නොකපා තැබීමෙන් ලැබෙන ඵලයන්ගේ පිරිහීමක්, නැතිවීමක් සිදුවන්නාක් මෙන් කුඩා කළ පැවිදි වූ බැවින් අඹුදරුවන් ලැබීමට තිබූ අවස්ථාව අත්හල බව මෙහිදී පවසයි. ''**සික්ඛාසාජීව සමාපන්නො**'', අධිශීල ශික්ෂාවෙන් ද යම් තැනක භික්ෂූන් වහන්සේ සමඟිව එකට ජීවත්වන්නේ ද ඒ සභාගපැවැත්ම සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් පැනවූ ශික්ෂාපද නම් වූ සාජීවයෙන් ද යන දෙඅංශයේම ශික්ෂිත භාවයෙන් යුක්තව, සිකපද සම්පූර්ණ කරමින්. මේ පාඨයෙන් තමන් වහන්සේ ඉතා පිරිසිදු වූ ප්‍රාතිමෝක්ෂ ශීලයෙහි පිහිටි බව දක්වයි. ''**ඉන්ද්‍රියෙසු සුසංවුතො**'' මනස සයවැනි වූ ස ඉන්ද්‍රිය සංවර කරගෙන, රූපාදී අරමුණු නිසා උපදින අභිධ්‍යා (දැඩි ලොභ) දී අකුසල සිත් ඉපදීම වැලැක්වීම් වශයෙන් සතිය නම් තිරයෙන් මනාව වැසූ චක්‍ෂු ආදී ඉඳුරන් ඇති මෙසේ ප්‍රාතිමෝක්ෂ සංවරශීලයෙන් ද ඉන්ද්‍රිය සංවර ශීලයෙන් ද යුතු බව දක්වීමෙන් චතුපාරිශුද්ධි ශීලයෙන් ම සමන්විත වූ බව අදහස් කරයි. ''**නමස්සමානො සම්බුද්ධං**'' බුදුධානුස්සති භාවනාව වැඩූ බව කියයි. ''**විහාසිං අපරාජිතො**'' ක්ලේශ මාරාදීන් පරදා, අපරාජිතවම විසුවෙමි. අර්හත්භාවයේ සිටම කෙලෙස් මාරාදීන් විසින් නොමැඩලිය හැකිව, ඔවුන් මැඩලා, අභිබවා විසුවෙමි. ''**තතො**'' එහෙයින්. ඉතා පිරිසිදු ශීලයෙන් යුතුව ශාස්තෘන් වහන්සේ කෙරෙහි වඩාත් ප්‍රසන්නව කෙලෙස් මුලිනුපුටා දමන පිළිවෙත් මඟ වැඩූ හෙයින්. ''**පණිධී**'' ප්‍රණිධානයක්, චිත්ත ප්‍රාර්ථනාවක්, අධිෂ්ඨානයක් ''**ආසි**'' විය. ''**චෙතසො අභිපත්ථිතො**'' මගේ සිතින් කැමති වූ. පැතූ ඒ ප්‍රාර්ථනාව කුමක් ද? ''**න නිසීදේ මුහුත්තම්පි**

තණ්හාසල්ලෙ අනූහතෙ'' ආයෘ මාර්ගය නම් අඹුවෙන් මගෙ හදවතින් තණ්හා නම් හුල නොම ඉගිලූ කල්හි මොහොතකුදු නොහිඳිමි. හිඳ නොගන්නෙමි. මෙබඳු වූ චිත්ත ප්‍රාර්ථනාවක් මට විය. මෙසේ අධිෂ්ඨාන කර, සිත භාවනාවට යොමුකර, සක්මනින් ම රාත්‍රිය ගෙවා අරූපධ්‍යාන සමවතින් නැගිට, ධ්‍යානාංගයෙන් විදර්ශනාවෙහි සිත පිහිටුවා රහත් බවට පත්වූ උන්වහන්සේ ''**තසස මෙ**'' යන ගාථාවෙන් එය පැවසූහ. ''**නිරූපධී**'' කෙලෙස්, උපධි ආදිය රහිත වූ බැවින නිරූපධී නම් වූ. ''**රත්‍යා විවසනෙ**'' රාත්‍රිය ගෙවී සූර්ය උදාවත් සමඟම ''**සබ්බං තණ්හං**'' කාම තණ්හාදී සියලු තෘෂ්ණා ස්‍රෝතස, දියපහර ආර්ය මාර්ගයෙන් වියලවා, සන්සිඳවා හුන්නෙමි. ''තණ්හා හුල නුගුලුවා නොහිඳින්නෙමි'' යන ප්‍රතිඥාවෙන් නොමිදුණු බැවිණි. ''**පල්ලංකෙන උපාවිසිං**'' පළක් බැඳ හුන්නෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

මහාපන්ථක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

අටවෙනි නිපාතයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

9.1.1

නවවන නිපාතයේ ''යදා දුක්ඛං'' යනාදී ගාථා ආයුෂ්මත් **භූත** තෙරුන් විසින් දේශනා කරන ලදී. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී නිවන් පතාගෙන පින් දහම් රැස්කරමින් පැමිණ, **සිද්ධත්ථ** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී බමුණු කුලයේ උපන්හ. ඒ බමුණු කුමරු සේන නාමයෙන් ප්‍රකට විය. නුවණැති බවට පත් **සේන** බමුණා දිනක් ශාස්තෘන් වහන්සේ දක පැහැදී ''උසභං පවරං'' යනාදී ගාථා සතරකින් ස්තුති කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණි ඔහු, මේ බුද්ධෝත්පාද කාලයේදී සාකේත නුවර මහධනවත් සිටුවරයකුට දාව ඉපදුණේය. ඒ සිටුවරයා සමඟ බැඳගත් වෛර ඇති එක් යක්ෂයෙක් සිටුවරයාට උපදින සෑම දරුවෙක්ම කෑවේය. නමුත් මේ කුමරු පශ්චිමභවිකයෙකු බැවින් ඔහු උපන් කෙණෙහිම අමනුෂ්‍යයන් විසින් අරක්ගන්නා ලදී. ඒ යක්ෂයාටද මේ කාලයේ වෛශ්‍රවණ දිව්‍ය රාජයාට උපස්ථාන කිරීට යෑමට සිදුවූ බැවින් නැවත ඒමට නොහැකි විය. කුමරුට නම් තබන දින, ''මොහු මෙනමින් හැඳින් වූ කළ අමනුෂ්‍යයෝ මොහු රකිති''යි සලකා ''**භූත**'' යන නම තැබූහ. තම පෙර පින් බෙලෙන් භූත කුමරු අනතුරක් නොමැතිව වැඩුණේය. ඔහුට ද ප්‍රාසාද තුනක් තිබුණි. ඒ සියලු සැප සම්පත් විස්තර **යසකුල පුත්‍රයා** මෙන් වී යැයි දත යුතුයි. නුවණැති බවට පත් භූත සිටුකුමරු සාකේත නුවර වෙසෙන කල්හි, උපාසකවරුන් සමඟ විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේ වෙතින් ධර්මය අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි විය. අජකරණී නම් නදී තෙර වූ ලෙනෙහි විසූ භූත හිමියෝ විදසුනෙහි සිත පිහිටුවා නොබෝ කලකින්ම රහත් වූහ.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ වීර වූ මහර්ෂී වූ කෙලෙස් සතුරන් ජය ගත්තා වූ රන්වන් බුදුපියාණන් වහන්සේ දක කවරෙකු නම් නොපහදී ද? ප්‍රමාණ කළ නොහැකි හිමවත් පවුව බඳු, තරණය කළ නොහැකි සාගරය බඳු බුදුරජාණන් වහන්සේගේ ධ්‍යානය ද අපමණය. උන්වහන්සේ දක කවරකු නොපහදී ද? විසිතුරු වන ආරාම නම් මුදුන් මල් කඩ ඇති මහපොළාව ප්‍රමාණ කළ නොහැකි මෙන් බුදුරජාණන් වහන්සේගේ ශීලය ද ප්‍රමාණ කළ නොහැක. උන්වහන්සේ දක කවරෙකු නොපහදී ද? නොකැළඹිය හැකි සයුර යම් සේ ද පමණ කළ නොහැකි අහස යම් සේ ද බුදුරජාණන්

වහන්සේගේ ඤාණයද එසේමය. උන්වහන්සේ දැක කවරෙකු නොපහදී ද?''

''මෙම ගාථා සතර පවසමින් සේන බමුණා පස්මරුන් දිනූ සිද්ධත්ථ නම් බුදුරජාණන් වහන්සේට ස්තුති කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් අනූනතර කල්පයක් පුරා, දුගතියක නූපන් මම කාම සුගතීන්හි බොහෝ සම්පත් වින්දෙමි. බුදුරදුන්ට පැසසීමෙහි විපාක මෙබඳුය. මීට කල්ප දාහතරකට පෙරදී සත් රුවනින් යුතු මහත් බලසම්පන්න උග්ගත නම් සක්විති රජවරු සිවුදෙනෙක්ව උපන්නෙමි. මවිසින් සියලු කෙලෙස් දවන ලදී. -පෙ- බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටු කළෙමි'

රහත්බවට පත්වූ භූත තෙරණුවෝ පසුව ඥාතීන් කෙරෙහි අනුකම්පාවෙන් සාකේත නුවරට වැඩමවා, ඒ ඥාතීන්ගේ උපස්ථාන ලැබ, අඤ්ජන වනයේ වසූහ. පසුව තමන්වහන්සේ මුලින් සිටි තැනටම යනු කැමති වූහ. නෑයෝ, ''ස්වාමීනි, මෙහිම වෙසෙනු මැනවි. එවිට ඔබවහන්සේ ද නොවෙහෙසේ. අපි ද පිනින් වැඩෙන්නෙමු''යි තෙරුන්ට එහි වසන ලෙස ආරාධනා කළහ. තෙරණුවෝ තමාගේ විවේකයේ ඇලුණු සිතත්, නගරයෙහි විසීම අපහසුබවත් ප්‍රකාශ කරමින් මේ ගාථා නවය දෙසූහ.

''යදා දුක්ඛං ජරාමරණන්ති පණ්ඩිතෝ - අවිද්දසු යත්ථ සිතා පුථුජ්ජනා,
දුක්ඛං පරිඤ්ඤාය සතොව ඣායති - තතෝ රතිං පරමතරං න වින්දති''

''යදා දුක්ඛස්සාවහනිං විසත්තිකං - පපඤ්චසංඛාට දුක්ඛාධිවාහිනිං,
තණ්හං පහත්‍යාන සතොව ඣායති- තතෝ රතිං පරමතරං න වින්දති''

''යදා සිවං දෙව චතුරංගගාමිනං - මගඵුත්තමං සබ්බකිලෙසසොධනං,
පඤ්ඤාය පසස්සිත්‍වා සතොව ඣායති - තතෝ රතිං පරමතරං න වින්දති''

''යදා අසොකං විරජං අසංඛතං - සන්තං පදං සබ්බකිලෙස සොධනං
භාවෙති සංයෝජනබන්ධනච්ඡිදං - තතෝ රති පරමතරං න වින්දති''

''යදා නහෙ ගජ්ජති මෙඝදුන්දුභි - ධාරාකුලා විහගපථෙ සමන්නතෝ,
භික්ඛූ ච පඛ්‍යාරගතෝ'ව ඣායති - තතෝ රතිං පරමතරං න වින්දති''

''යදා නදීනං කුසුමාකුලානං - විචිත්තවානෙය්‍යවටංසකානං,
තීරෙ නිසිනෙනා සුමණෝ'ව ඣායති - තතෝ රතිං පරමතරං න වින්දති''

''යදා නිසීථේ රහිතම්හි කානනෙ - දෙවෙ ගළන්තම්හි නදන්හි දාඨිනෝ
භික්ඛු ච පඛාරගතොව ඣායති - තතො රතිං පරමතරං න විඳති''

''යදා විතක්කෙ උපරුන්ධියත්තනෝ - නගන්තරෙ නගවිවරං සමස්සිතෝ
වීතද්දරෝ විගතබ්බලෝ'ව ඣායති - තතො රතිං පරමතරං න විඳති''

''යදා සුබී මලබ්බලසොකනාසනෝ - නිරගහළෝ නිබ්බනථෝ විසල්ලෝ,
සබ්බාසවෙ ව්‍යන්තිකතෝ'ව ඣායති - තතො රතිං පරමතරං න විඳති''

එහි පදයන්ගේ අර්ථ දැක්වීම මෙසේය. පළමු ගාථාවේ අර්ථ මෙසේය. ස්කන්ධයන්ගේ මුහුකුරායෑම ''ජරා'' නම් වේ. ස්කන්ධයන්ගේ බිඳී යෑම ''මරණ'' යයි. මෙහි ජරාමරණ ශීර්ෂයෙන් ජරාමරණයන්ට පත්වීම අදහස් වේ. ''ජරාමරණ දෙක දුකකි'යි අඥාන බැවින් තත්ස්වභාවයෙන් නොදන්නා වූ පුහුදුන් පුද්ගලයා යම් පංචස්කන්ධයක් දැඩිව ගෙන, එහි ඇලී සිටින්නේ ද, ''එයම දුකය. උපාදාන පංචස්කන්ධයෙන් බැහැර වෙනත් දුකක් නැත'' යනුවෙන් විදර්ශනා ප්‍රඥා සහිත මාර්ග ප්‍රඥාවෙන් පිරිසිඳ දත් මේ සසුනෙහි පැවිදි වූ භික්ෂුවෙන් යුතු නුවණැති භික්ෂුව යම් කලෙක ලක්ෂණ සළකා බලමින්, මෙනෙහි කරමින් ධ්‍යාන කරන්නේ ද උන්වහන්සේ; ඒ විදර්ශනා රතියටත් මාර්ගඵල රතියටත් ඉතා වැඩි වූ රතියක් නොලබයි. නොවිඳියි.'' භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේ එබැවිණි.

''යතො යතො සම්මසති ඛන්ධානං උදයව්‍යයං,
ලභතී පීතිපාමොජ්ජං අමතං තං විජානතං''

''පථව්‍යා එකරජ්ජෙන සගසස්ස ගමනෙන වා,
සබ්බලොකාධිපච්චෙන සොතාපත්ති ඵලං වරං'' කී.

ස්කන්ධයන්ගේ ඉපදීම හා නැතිවීම යම් යම් සේ සන්සිඳෙත් ද ඒ ඒ පමණට ප්‍රීති ප්‍රමෝදය ලබයි. ඒ අමාමහ නිවන් සැප ලබයි. පෘථිවියේම පාලකයා හෙවත් සක්විති රජකවීමටත් වඩා, දෙව්ලොව යෑමටත් වඩා, මුලු ලොවටම අධිපතිවීමටත් වඩා සෝවාන් ඵලය උතුම් වේ.

මෙසේ පිරිසිඳ දැනගැනීම් වශයෙන් නිවණෙහි ඇලුණු බව දක්වා, පසුව ප්‍රහාණය කිරීම් වශයෙන් එය දැක්වීමට දෙවන, තෙවන, සිවුවන ගාථා තුන වදාළහ. එහි ''දුක්ඛසඤ්ඤාවහනිං'' දුක අනාගතයේ පැවැතීම,

දුකෙහි හටගැනීම ඇතිකරන. ''**විසත්තිකං**'' තණ්හාවයි. එය පැතිරයන බැවින් ''විසත්තික'' නම් වේ. විෂ වේ. ''නිවණට විෂ වේ.'' යන අරුතින් ''විසත්තික'' නම් වේ. විෂ පෝෂණය කරන බැවින් 'විසත්තික'' නම් වේ. විෂ ගෙනයයි යන අරුතින් ද ''විසත්තික'' නම් වේ. විෂ වූ මුල් ඇති බැවින් ද විෂ පලාගිය බැවින් ද විෂ වූ පරිභෝග ඇති බැවින් ද ඒ රූප. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පංචාරම්මණයන්හි විපරීතව පැතිර ගිය බැවින් ද තෘෂ්ණාව ''විසත්තිකා'' නම් වේ. ''**පපඤ්චසංඝාටදුක්ඛාධිවාහිනිං**'' ''සත්ව සන්තානයන්ගේ රාග මානාදී වශයෙන් සංසාරිකව ප්‍රපංචකරයි, පතුරුවයි.'' යන අරුතින් ප්‍රපංච නම් වූ රාගාදිය ද මානාදිය ද, ඒවායෙහි ම පවත්නා දුක සමඟ එකට යෙදේ. ගැටෙයි යන අරුතින් ''සංඝාට'' නම් වූ දැවීම් පිරිතැවීම් ස්වභාවය කරගත් දුක ''**පපඤ්චසංඝාටදුක්ඛං**'' නම් වේ. ඒ දුක ප්‍රහානය නොකර තව තවත් උපදවන බැවින් ඒ තණ්හාව ''**පපඤ්චසංඝාටදුක්ඛාධිවාහිනිං**'' නම් වේ. ''**පහාතවා**'' ආර්ය මාර්ගයෙන් මුලිනුපුටා දමා. ''**සිවං**'' ක්ෂේම වූ. ශාන්ත නොවූ කෙලෙස් මුලිනුපුටා දැමූ හෙයින් නිර්භය ස්ථානයක් වූ, සම්මාදිට්ඨි ආදී වශයෙන් සතරේ කොටස් දෙකක් වූ (අංග අටක් වූ) ආර්ය නිර්වාණය ගෙන දෙන්නා වූ ''**දෙවචතුරංගගාමිනං**'' ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගය. ගාථාව සුබෝච්චාරණය සඳහා මෙහිදී විභක්තිය ලොප් නොකළ බව දත යුතුයි. රූප, අරූප ලෝක උත්පත්ති ගෙන දෙන සියලු මාර්ගයන් අතර උතුම් වූ මාර්ගය ''**මඟුත්තමං**'' වූ. භාග්‍යවතුන් වහන්සේ ''මාර්ග අතුරින් අරි අටඟිමග'ම ශ්‍රේෂ්ඨ වේ'' යැයි වදාළ බැවින්. සියලු කෙලෙස් මලයන්ගෙන්, කිලිටිවලින් සත්ත්වයන් සෝදා පවිත්‍ර කරන බැවින් ''**සබ්බකිලෙසසොධනං**'' නම් වූ. ප්‍රඥාවෙන් දක ''**පඤ්ඤාය පසසිත්වා**'' ප්‍රතිවේධ ප්‍රඥාව වැඩීමෙන්, ශෝක හේතූන් මනාව අවබෝධ කරගෙන, ශෝක හේතු නැතිකල බැවින් පුද්ගලයාගේ ශෝක නොකරන බව. මෙහි ශෝකයක් නැත යන අරුතින් ''**අසොකං**'' නම් වූ. එසේම පහවූ රාගාදී රජස් ඇති. ''**විරජං**'' කිසිම හේතු ප්‍රත්‍යයකින් නොසැදුණු බැවින් ''**අසංඛතං**'' නම් වූ. සියලු කෙලෙසුන් ද සියලු දුක් ද සින්සිඳුවන බැවින්, සංසාර දුක්ඛයන්ගේ පෙළීම් දුරු කරන බැවින්, ශාන්ත වූ නිවන් පදයට පමුණුවන බැවින්, සංසාර දුක්ඛයන්ගේ පෙළීම් දුරුකරන බැවින්, ශාන්ත වූ නිවන් පදයට පමුණුවන බැවින්, සත්ත්වයන් චිත්ත සන්තානයන් සියලු කෙලෙසුන්ගෙන් සෝදා හැරීමට උපකාරීවන බැවින් ''**සබ්බකිලෙස සොධනං**'' නම් වූ. ''**භාවෙති**'' සාක්ෂාත් කරගැනීම, අවබෝධ කරගැනීම සඳහා බොහෝ වරක් උත්සාහ කිරීමයි. නොලැබූ විශේෂාධිගමයන් ලැබීම සඳහා වූ නිවන් නොදුක පුනුදුන් කාලයේ සිටි අවස්ථාව අරඹයා මෙය කියන ලදී. සංයෝජන නම් වූ බන්ධන සිඳ දමන්නා වූ, ඊට උපකාර වූ,

නිමිති ''**සංයොජනබන්ධනවජ්ජිදං**'' නිවණ මෙහිදී කර්තෘභාවයෙන් දක්වයි. ''ආර්යභාවය ඇති කරන බැවින්,'' ''ආර්යයන්ත්වයට හේතුවන බැවින්''. යම් සේ මුල් ගාථාවෙහි, ''යම් කලෙක ධ්‍යාන වඩත් ද එකල ''ලැබෙන රතිය හා සමාන චින්දනයක් වෙන කිසිවක ඇලීමෙන් නොලැබේ ද, මේ ආර්ය මාර්ග වඩන කල්හි ද ඊට වැඩි වූ උතුම් වූ රතියක් නොමැත'' යනුවෙන් සිදුවන ගාථාවේ අර්ථ ගත යුතුය.

තෙරුන් වහන්සේ මෙසේ ගාථා සතරකින් තමන් වහන්සේ චතුරාර්ය සත්‍යාවබෝධයට නොපැමිණි කාලයේ දී ක්‍රියාකළ අයුරු දක්වා, සිය රහත් බව ප්‍රකාශ කළ සේක්, ඉන්පසුව තමන් වහන්සේ වාසය කරන තැන සුවපහසු බව ''**යදානහෙ**'' යනුවෙන් දක්වයි. එහි ''**නහෙ**'' යනු අහසේ, සිනිඳු ගැඹුරු හඬ පතුරන බැවින් මේඝ ගර්ජනාවම දිව්‍යඛෙරයක් වැනිය. හාත්පසින්ම වැසිදහර වගුරුවන, වැසිදහරින් ගැවසුණු බැවින් ''**ධාරාකුලා**'' පක්ෂීන්ගේ ගමන් මඟ බැවින් අහසට ''**විහඟපථෙ**'' යන නම යෙදේ. ''**නතො**'' ඒ ධ්‍යානයන්හි ඇලීමෙන් ''**කුසුමාකුලානං**'' ගස්වලින් ගිලිහී වැටුණු මල්වලින් ගැවසුණු. ''**විචිත්තවානෙය්‍යවටංසකානං**'' වනයේ හටගත් බැවින් ''**වානෙය්‍ය**'' නම් වේ. ඉතා විසිතුරු මුදුන් මල් කඩක් බඳු වන මල් සමූහ ඇති. ''විචිත්තවානෙය්‍යවටංසකා'' නම් වේ. ඒ නානාවිධ වන මලින් ගැවසීගත්තා වූ යන අර්ථයයි. උතුරු මිනිස් දහම් වශයෙන් සුන්දර වූ මනසක් ඇතිව ''**සුමනො**'' ධ්‍යාන වඩයි. ''**නිසීථෙ**'' යනු රාත්‍රියේ ''**රහිතම්හි**'' ජන සමූහයෙන් තොර වූ. විසිතුරු වූ. ''**දෙවෙ**'' වැසිවන්නා කල්හි ''**ගලන්තම්හි**'' වැසිදහරා වගුරුවමින් වැසිවස්වන කල්හි. ''**දාඨීනො**'' සිහ, වග, වලස් ආදීහු. ඉතා දරුණු සත්ත්වයෝ උල් දත්වලින් ආහාර කඩා කන බැවින් ''දාඨීනො'' නම් වේ. ''**නදන්ති** දාඨීනො'' යන මෙය ජනයා ශූන්‍ය බව දක්වීමටම යොදන ලද්දකි. ''**චිතකෙක උපරුඤ්ඤියත්තනො**'' තමාගේ සන්තානයේ ඇතුලත් වූ කාමාදී මිත්‍යා විතර්කයන්, ඊට ප්‍රතිවිරුද්ධ සිත් වැඩීමෙන් මැඩපවත්වා, ''**අත්තනො**'', ''තමාගේ'' යැයි හෝ ''මෙය හිඳියි'' යනුවෙන් අර්ථ ගෙන යෙදිය යුතුයි. ඊට වැඩි ශ්‍රේෂ්ඨම වූ සැපයක් තම විසින් නොවිඳියි. ''**නගන්තරෙ**'' පර්වත අතර දී. ''**නාගව්වරං**'' පර්වත ගුහා, ගල් ගුහා. ''**සමසිසිනො**'' ඇසුරු කෙළ, ඒවායේ වෙසෙනුයේ ''**චිත්තදරෙ**'' දුරු කළ කෙලෙස් දැවිම් ඇත්තේ. ''**විගතබ්බිලො**'' ප්‍රහීණ කළ සිතේ කරදර ඇතිව. ''**සුබි**'' ධ්‍යානාදී සුවයෙන් සුවපත් වූයේ. ''**මල බිල සොකනාසනො**'' රාගාදී පංචමලයන්, සිතේ දුක් කරදර, ඤාති වියෝගාදිය නිසා ඇතිවන ශෝකය දුරු කළේ. ''**නිරගහලො**'' අග්ගල යනු අවිද්‍යාවයි. නිවන් නම් පුරයට පිවිසීම වළකන අඟුල අවිද්‍යාවයි. ඒ අවිද්‍යාව නැති පුද්ගලයා

''නිරග්ගල'' නම් වේ. ''**නිබ්බනථො**'' තණ්හා රහිතව. ''විසල්ලො'' දුරු වූ රාගාදී හුල් ඇතිව. ''**සබ්බාසවෙ**'' කාමාශ්‍රවාදී සියලුම ආශ්‍රව. ''**ව්‍යනතීකතො'ව**'' දුරු කරන ලදුව, ආර්ය මාර්ගයෙන් දුරුකර, ලැබූ දිට්ඨධම්ම (මෙලොවම ලැබූ) සුඛ විහරණයෙන් යුතුව ධ්‍යාන කරන කල්හි. ඒ ධ්‍යාන සුවයට වඩා ශ්‍රේෂ්ඨ වූ රතියක්, සුවයක් නොවිඳිමි. මෙසේ තම ඥාතීන්ට වදාළ තෙරුන් වහන්සේ අජකරණී නදී තීරයටම වැඩම කළ සේක.

භූත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

නව්වෙනි නිපාත අර්ථ වර්ණනාව සමාප්තයි.

10.1.1

දසවන නිපාතයේ ''අංගාරිනෝ'' යනු ආයුෂ්මත් **කාළුදායි** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. එහි උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී හංසවතී නුවර කුලගෙයක ඉපිද, ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසමින් සිටියහ. ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් කුල පහදවන භික්ෂූන්ගෙන් අග්‍රභාවයට පත් කරනු දුටු හෙතෙම; ''අනාගත බුදුසසුනකදී මටත් එම තනතුරම ලැබේවා''යි පැතීය. දිවි ඇතිතාක් පින් දහම් සිදුකළ ඒ සිටුතුමා ඉන් චුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා පැමිණ, අපගේ බෝසතාණන් වහන්සේ මවුකුස පිළිසිඳ ගන්නා දිනම කපිල වස්තුවේ ඇමති පවුලක, ඇමති බිරිඳ කුස පිළිසිඳ ගත්තේ ය. ''බෝසතුන් සමඟ එකම දින උපන්නේය''යි පවසා ඒ ඇමතියා තම පුතු එදිනම ඉතා සිනිඳු වස්ත්‍රවලින් සෑදූ කොට්ටයක තබා, බෝසතුන්ගේ උපස්ථානයට ගෙන ගියේය. අප මහ බෝසත් සමඟ බෝරුක, රාහුල මාතාව, සතර නිධානය, අරොහනිය ඇතු, කපටක අසු, ඡන්න හා කාළුදායි යන කුමරුන් ඇතුළු සත්දෙන එකම දින උපන් බැවින් ''සහජාත'' නම් වේ. ඒ කුමරුට නම් තබන දවසේ දී ''මුළු නුවර වැසියන් ම සතුටින් ඔදවැඩී ගිය දිනෙක උපන් බැවින් ''**උදායී**'' යන නාමය තබන ලදී. මදක් සම කළු පැහැයෙන් යුතු නිසා ''**කාළුදායි**'' යන නමින් ප්‍රකට වූ එකුමරු බෝසත් සමගම කුමාර ක්‍රීඩා කරමින් වැඩිවියට පත් විය. ඊට පසුකලෙක සිදුහත් කුමරු අභිනික්මන් කර, අනුපිළිවෙලින් සම්බුද්ධත්වය ලබා, දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව පවත්වා, රජගහ නුවර වේළුවනාරාමයේ වැඩවසන බව සුදොවුන් මහරජුට දැනගැනීමට ලැබුණි. දහසක් පිරිවර ඇති එක් ඇමතියකු කැඳවූ මහරජු, ''මගේ පුතා මෙනුවරට කැඳවාගෙන එව''යි පවසා පිටත්කර හැරියේය. ශාස්තෘන් වහන්සේ දහම් දෙසමින් සිටි අවස්ථාවේ වේළුවනාරාමයට පැමිණි ඒ ඇමති තෙම පිරිස් කෙළවර හිඳ දහම් අසා සිය පිරිස සමඟම රහත් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන් දෙසට ශ්‍රී හස්තය දිගුකර ''මහණෙනි, එව''යි වදාළ සේක. එකෙණෙහිම ඒ පිරිස සියවස් පිරි මහතෙරවරුන් මෙන් සෘද්ධිමය පා සිවුරු ලබා භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියේ පෙනී සිටියේය. රහත් වූ තැන් පටන් ආර්යයෝ මැදහත් සිත් ඇත්තෝ වෙති. එනිසා පිය රජුගේ පණිවුඩය බුදුරදුන්ට නොපැවසූහ. සුදොවුන් රජු ''ගිය තැනැත්තෝ නොම එති. පණිවුඩය පැවසූ බවක් ද නොපෙනේ''යැයි පවසා තවත් ඇමතියකු දහසක් පිරිවර සමඟ පෙරසේම යැවීය. ඔහු ද පළමු ඇමතියා මෙන් රහත්ව නිශ්ශබ්දව සිටියේය. මෙසේ නව වරක් ඇමතිවරු නව දෙනෙක් පිරිවර

නව දහසක් සමඟ යැවීය. සැමදෙනම රහත්ව මැදහත්ව නිහඬව සිටියහ. ඉක්බිති රජතුමා ''මෙපමණ දෙනෙක් යවාත් ඔවුනු මා කෙරෙහි ආදරයක් නොමැති බැවින් දසබලයන් වහන්සේ මෙනුවරට වැඩමවා ගැනීමට ආරාධනා නොකළහ. මේ උදායි ඇමති දසබලයන් වහන්සේ හා සමවයස් ඇත. වැලිකෙළියේ පටන් එකට වැඩුණේය. මා කෙරෙහි ද අපමණ සෙනෙහස් දක්වයි. මොහු යවා බලන්නෙමි''යි සිතා උදායී කැඳවීය. කැඳවා ''දරුව, නුඹ පුරුෂයන් දාහක් පිරිවරාගෙන රජගහ නුවරට ගොස් දස බලයන් වහන්සේ වැඩමවාගෙන එව'' යි පැවසීය. උදායී ඇමති ''ඉදින් ඔබවහන්සේ මා හට පැවිදිවීමට අවසර දෙන්නේ නම් මම බුදුරජාණන් වහන්සේ මෙහි වැඩමවා ගෙන එන්නෙමි''යි රජුට පැවසීය. රජු ''ඕනෑම දෙයක් කොට මාගේ දරුවා මාහට දක්වන්න''යි පැවසීය. රාජ නියෝජගයෙන් රජගහ නුවර ගිය උදායී ඇමති, පිරිසත් සමඟම, පිරිස් කෙළවර හිඳ ධර්ම ශ්‍රවණය කර, රහත් බව ලැබ ඒහි භික්ෂු මහණෝපසම්පදාව ලැබීය.

අපදාන පාළියේදී උන්වහන්සේ මෙසේ වදාළහ.

''එකල මම ලෝකජ්‍යෙෂ්ඨ වූ තාදී ගුණ ඇති, මහමඟට පිළිපන්, චාරිකාවේ හැසිරෙන ශාස්තෘ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට මැනවින් පිපුණු පියුම් ද උපුල් ද බෝලිද්ද ද කිරිබත් ද රැගෙන ගියෙමි. මහාවීර වූ බුදුරජාණෝ ඒ භෝජනය වැළඳූහ. මල් රැගෙන මහජනයාට දක්වමින් මෙසේ වදාළහ.

''ලොව ඉෂ්ට වූ මනවඩන ප්‍රිය වූ උතුම් ජලජ පුෂ්පයෝ වෙති. ඒ මලින් මා පිදූ මෙතෙමේ ඉතා අමාරු කටයුත්තක් කළේය. මාහට මල් පිදූ, උතුම් ආහාර පිදූ මොහු අනාගතයේ කවරෙකු වන්නේ දැයි පවසමි. ඒ මාගේ වචනය සාවධානව අසවු. මෙතෙම දහඅට වරක් දෙව්රජව උපදින්නේ ය. ඔහුගේ පුණ්‍ය විපාකයෙන් දිවමය සුවඳින් යුතු උපුල්, පියුම්, බෝලිද්ද ආදී මල් අහසේ වියනක් මෙන් සිටින්නේය. සක්විති රජව විසිපස්වරක් උපදින මෙතෙම පෘථිවි රාජ්‍යය පන්සිය වරක් දරන්නේය. මීට කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ ගෞතම නම් ශාස්තෘ හු ලොව පහළ වෙති. කුශල මූලයෙන් මෙහෙයූ සතුටු සිතැති මෙතෙම ශාක්‍යයන්ගේ සතුට ඇති කරන ඥාතියෙක් වන්නේය. පසුව පැවිදිව ආශ්‍රව ප්‍රහීණ කරන මෙතෙමේ පිරිනිවන් පාන්නේය. ලෝකබන්ධු වූ ගෞතම බුදුරජාණන් වහන්සේ සිවුපිළිසිඹියා පත් වූ, කොටැ නිමැවූ කටයුතු ඇතිවූ, ආශ්‍රව රහිත වූ මෙතෙම අගතනතුරේ පිහිටුවන සේක. වීර්ය වැඩූ, නිවණට මෙහෙයූ

සිතැනි, උපශාන්ත වූ උපධි රහිත වූ මෙතෙම නමින් උදායී බුද්ධ ශ්‍රාවකයා වේ.''

''රාගය ද ද්වේෂය ද මෝහය ද ගුණමකු බව ද විනාශ කරන ලද්දෙමි. සියලු ආශ්‍රව ප්‍රහාණ පරිඥා වශයෙන් දැන, අනාශ්‍රවව වෙසෙමි. දැන් මම සියලු කෙලෙස් දැවූයෙමි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

මෙසේ ලබන ලද අර්හත් භාවය ඇති උදායී තෙරණුවෝ, ''තවම දසබලයන් වහන්සේට තම උපන් නුවරට වැඩීමට කල් නොපැමිණියේය. වසන්ත කාලයේ වනය මලින් බර වේ. තණපිටි කොළපාටින් බබළයි. ගස්වැල් ආදියෙන් සෙවණ ගෙන දෙන බිමෙහි ගමන සුදුසු වේ'' යනුවෙන් සිතූහ. සුදුසු කාලය බලා වසන්ත සමයේ දී ශාස්තෘන් වහන්සේට උපන් නුවරට යන මාර්ගය වර්ණනා කරමින් මේ ගාථා නවය වදාළහ.

''අංගාරිනොදානි දුමා හදනෙන ඵලෙසිනො ඡදනං විපහාය,
තෙ අච්චිමනෙනාව පහාසයන්ති සමයො මහාවීර භාගීරසානං''

''දුමානි ඵුල්ලානි මනොරමානි සමන්තතො සබ්බදිසා පවන්ති
පත්තං පහාය ඵලමාසසනා කාලො ඉතො පක්කමනාය වීර''

''නෙවා තිසීතං නපනාති උණ්හං සුඛා උතූ අද්ධනියා හදනෙන
පස්සන්තු තං සාකියා කොලියා ච පච්ඡාමුඛං රොහිණිං තාරයන්තං''

''ආසාය කසතෙ ඛෙත්තං, බීජං ආසාය වප්පති,
ආසාය වාණිජා යන්ති සමුද්දං ධනහාරකා,

යාය අසාය තිට්ඨාමි සා මෙ ආසා සමිජ්ඣතු''
''පුනප්පුනංවෙව වපන්ති බීජං, පුනප්පුනං වස්සති දෙවරාජා

පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා, පුනප්පුනං ධඤ්ඤං මුපෙති රට්ඨං''
''පුනප්පුනං යාචනකා චරන්ති - පුනප්පුනං දානපතී දදන්ති,

පුනප්පුනං දානපතී දදිත්වා - පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං''
''වීරෝ හවෙ සත්තයුගං පුනෙති - යස්මිං කුලෙ ජායති භූරිපඤ්ඤා

මඤ්ඤාමහං සක්කති දෙවදෙවෝ, තයාහි ජාතෝ මුනිසච්චනාමෝ'
''සුද්ධෝදනෝ නාම පිතා මහෙසිනෝ, බුද්ධස්ස මාතා පන මාය නාමා

යා බොධි සත්තං පරිහරිය කුච්ඡිනා, කායස්ස භෙදා තිදිවමහි මොදති''
''සා ගොතමී කාලකතා ඉතොචුතා, දිබ්බෙහි කාමෙහි සමංගිභූතා
සා මොදති කාමගුණෙහි පඤ්චහි පරිචාරිතා දෙව ගණෙහි තෙහි'' ති.

මෙහි ''අංගාරිනෝ'' අඟුරු වැනි වූ, රතු පබළු මෙන් ගස්වල ලා දළු, මල්, බබලයි. රතු ලාදළු වලින් යුක්ත වූ බැවින් ''අංගාරිනෝ'' නම් වේ. තද රතුපාට මල්, ලාදළු ආදිය අඟුරු වැස්සක් මෙන් බබලයි යන අර්ථයයි. ''**ඉදානි**'' මේ කාලයේදී ''**දුමා**'' ගස්, වෘක්ෂයෝ. ''**හදනෙත**'' (හද්ද වූ) හඳ වූ කෙළවර ඇති ''හඳනෙත'' වේ. එහි එක් දකාරයක් ලොප් කර ''හදනෙත'' යැයි ගුණ විශේෂයන්ගෙන් යුතු, ගුණවිශේෂයන්ගෙන් යුතු පුද්ගලයන් අතරින් අග්‍ර වූ ශාස්තෘන් වහන්සේට ආමන්ත්‍රණය කරයි. මෙහි එකාරය පඨමා විභක්තියෙන් යෙදී ඇත. ''සුකටෙ පටිකකමෙම සුබෙ දුකෙඛ'' ආදියේ මෙනි. මෙහි සම්බෝධනාර්ථයේ පඨමා විභක්තිය යෙදී ඇත. භදනෙත යනුවෙන්, ස්වාමීනි! වහන්ස! යනුවෙන් ආමන්ත්‍රණය කරයි. ඇතැමෙක් භද්ද ශබ්දයෙන් සමානාර්ථ වූ එක් පදාන්තරයක් ලෙස ''හදනෙත'' යන්න දක්වති. ඵලයන්ගෙන් පිරි ''**ඵලෙසිනෙ**'' ඵල ගැනීමට ලං වූ. අචේතනික වුවත් සචේතනික ක්‍රියාවකට ආරෝපණය කර දක්වන ලදී. කුලයන්ට එළඹෙනු කැමැත්තාක් මෙනි. ඵල හටගැනීමට ආරම්භ කළ, ඵල හට ගැනීමට සුසුසු කාලයයි යන අර්ථයයි. ''**ඡදනං විප්පහාය**'' පරණ කොළ වැටී, වේළුණු වියළි කොළ හැලී ගොස්. ''**තෙ**'' ඒ වෘක්ෂයෝ. ''**අචචිමනෙනාව පභාසයන්ති**'' පහන්සිළු මෙන් ද දැල්වෙන ගිනි මෙන් ද බබලයි. සියළු දිසා හොබවයි. ''**සමයො**'' සුදුසු කාලය හඟවා ගමනට ආරාධනා කරයි. ''**මහාවීර**'' මහත් වික්‍රම ඇති උත්තමයාණනි! ''**භගීරසානං**'' අර්ථ රසාදියට භාජන වන බැවින් භාගී නම් වේ. ධර්මසේනාපති තෙරණුවෝ ''භාගෘවතුන් වහන්සේ අර්ථය යහපත ගෙන දෙන බැවින් භාගී නම් වේ.''යැයි වදාළහ. මහාවීර, භාගී යන මේ වචන දෙකම ආලපන විභක්ති වචන සේ දත යුතුයි. ''**භගීරථානං**'' යන පායය ද යෙදේ. භගීරථ ආදී රජවරුයි. ඔවුන් හා සමාන වූ ජාති ඇති බැවින් ශාක්‍යයෝ භගීරථ නම් වෙති. ඒ ශාක්‍යයන්ට උපකාර පිණිස යන අදහසයි. ''**ඵුමානි**'' ලිංග විපර්යාස වීමෙන් යොදන ලදී. මහ ගස් යන අරුතයි. ''**සමනනතො සබබාදිසා පවනති**'' හාත්පසම, සෑම පැත්තක් ම, සෑම දිසාවක්ම පිපුණු මල් සුවඳ පතුරුවයි. සුවඳවත් කරවයි. ''**ආසසානා**'' කැමති වෙමින්, ඵල ගැනීමට

කැමැත්තෙන්. මෙසේ ගස්වැල් වලින් යන මාර්ගය ශෝභාමත් වූ බව දක්වා, අනතුරුව තෙවන ගාථාවෙන් සෘතුසම්පත්තිය දක්වයි.

''සුඛා'' අධික ශීතල හා උෂ්ණ නොමැති බැවින් සුවදායක, ප්‍රිය වූ. ''**උතු අද්ධනියා**'' දිගු ගමනයට සුදුසු සෘතුවකි. ''**පස්සතු තං සාකියා කොලියා පච්ඡාමුඛං රොහිණිං තාරයන්තං**'' රෝහිණී නම් නදිය ශාක්‍ය කෝලිය ජනපද දෙක අතරින් උතුරු දෙස සිට දකුණු දෙසට ගලා යයි. රජගහ නුවර ද ඒ රෝහිණී නදියට පෙරදිගින් පිහිටියේය. එනිසා රජගහ නුවර සිට කපිල වස්තුවට යන විට ඒ රෝහිණී නදිය තරණය කිරීමේදී භාග්‍යවතුන් වහන්සේ පශ්චිම (බටහිර) දිසාවට මුහුණ ලා වැඩම කළ යුතුය. මෙසේ ''පැසුළු දිගට මුහුණ ලා රෝහිණී නදිය තරණය කරන බුදුපියාණන් වහන්සේ ශාක්‍යකෝලිය ජනපදවාසිහු දකිත්වා'' යන ප්‍රකාශයෙන් කිඹුල්වත් පුර ගමනට භාග්‍යවත්හු උත්සාහවත් කරවති. තම ආයාචනාත්මක ප්‍රාර්ථනාව දැන් උපමාවකින් මෙසේ දක්වති. ''**අසාය කසතෙ බෙත්තං**'' ගොවියා කෙත සීසානුයේ ද බීජ වපුරනුයේ ද හොඳ අස්වැන්නක් බලාපොරොත්තු වෙමිනි. ''**ආසාය වාණිජායනති**'' ධන උපයනු කැමති වෙළෙන්දෝ ධනාශාවෙන් මුහුදු තරණය කර විදේශයන්ට යෑමට නැව් නැගෙති. ''**යාය අසාය තිටයාමි**'', මම ද මෙහි ආශාවක්, ප්‍රාර්ථනාවක් ඇතිව, ඔබ වහන්සේගේ කපිලවත්පුරට වැඩවීමට කැමැත්තෙන් සිටිමි. ''**සා මෙ අසා සමිජ්ඣතු**'' යන්නෙන් ''නුඹවහන්සේ කපිලවත්පුරට වැඩිවිය යුතු වේ'' යන අදහස ගෙන දෙයි. එම ක්‍රියාව කරවනු කැමති සිත මෙහි දී ''ආසාය'' කැමැත්තෙන් යනුවෙන් අදහස් වේ. එය ආශ්‍රවයක් නොවේ. ගමන් මඟ වර්ණනා කරමින් නොයෙක්වර ආරාධනා කිරීමට සිදු වූ බව හේතුව ''පුනප්පුනං'' යනාදී ගාථාවලින් කියැවේ. එහි අර්ථ මෙසේය.

''එක්වරක් වපුරා සම්පූර්ණ නොවූ කල්හි ගොවියෝ දෙවනුව ද තෙවනුව ද බීජ වපුරති. වැසි දෙවියෝ ද එක්වාරයක් ම වැසි නොවස්වති. කලින් කලට, වරින් වර, නැවත නැවත වැසි වස්වති. ගොවියෝ ද සීසානුයේ එක්වරක් නොවෙති. මහත් අස්වැන්නක් ලැබීමට පස, මඩ මෘදු කිරීමට කෙත නැවත නැවත සීසාති. එක්වරක් ධාන්‍ය ගෙනවුත් කොටුගෙවල් පිරවීම ප්‍රමාණවත් නොවේ. නැවත නැවත කොටුගෙවල් පිරවීම් වශයෙන් සහල් ආදි ධාන්‍ය රට තුලට නැවත නැවත ගෙනෙයි. යාචකයෝ ද යදිමින් නැවත නැවත පවුල් වෙත පැමිණෙති. එක්වරක් යැද පිටත නොයති. දානපතියෝ ද නැවත නැවත දන් දෙති. එක් වරක් දී නොසෑහෙති. දිය යුතු දේ දන්දෙන දානපතීහු දානාදී පින්කම් නැවත නැවත සිදුකර නැවත

නැවත සර්ගයේ උප දිනි. ප්‍රතිසන්ධි වශයෙන් දෙව්ලොවම ඉපදෙති. එනිසා මම නැවත නැවත ඔබවහන්සේට ආරාධනා කරමි. භාග්‍යවතුන් වහන්ස, මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත කරනු මැනවි.''

දැන් යම් අර්ථයක්, යහපතක් සඳහා ශාස්තෘන් වහන්සේ කපිල වස්තුවට යායුතු වේද එම කාරණය ''**වීරෝ හවෙ**'' යන ගාථාවෙන් දක්වයි. එහි අර්ථ මෙසේය. ''යම් කුලයක වීර වික්‍රමාන්විත, මහා ප්‍රඥාවන්ත, ඥානවන්ත පුද්ගලයෙක් උපදින්නේ ද, ඒ උතුම් පුද්ගලයා නිසා ඒකාන්තයෙන්ම පරම්පරා සතක, පියා, සීයා ආදී ලෙස, සත් පරම්පරාවක්, සත්වන පියා දක්වාම පිරිසිඳු වේ. නින්දා අපහාස සෝදා හරියි'' මෙසේ ලොව අදහසක් පවතියි. භාග්‍යවතුන් වහන්සේ ලොව සියලු දෙවියන්ටම වඩා උසස් වූ ''දෙවොතිදෙව''යන වහන්සේය. පාපයෙන් වැලකීමෙන් ද යහපතෙහි පිහිටීමෙන් ද යුතු ඔබවහන්සේට වඩා පවිත්‍ර වූ උතුමෙක් ලොව නැතැයි සිතමි. කුමක් නිසාද? ''**තයාභිජාතො මුනි සචවනාමො**'' ඔබවහන්සේ ආයෂ්‍ මරණයෙහි උපන් බැවින් ලැබූ ''මුනි'' නම් ඇති සේක. මුනිවරයෙක්ව ආත්මාර්ථ පරාර්ථ සාධනයන් මෙලෝ පරලෝ සුගතියන් ගෙන දෙන බැවින් ද චතුරාර්ය සත්‍ය තනිවම අවබෝධ කරගත් බැවින් ද ''මුනි'' නම් වන සේක. ''මුනි''නාමය සත්‍ය වූ, ඔබ වහන්සේටම සුදුසු වූ නාමයකි. එනිසා සත්ත්වයන්ට ඒකාන්තයෙන් ම උභයාර්ථ සිද්ධිය සැලසීම සඳහා ඔබවහන්සේගේ ගමන උපකාරී වේ. එබැවින් කිඹුල්වතට වඩිනු මැනවි. මෙහි ''**සත්තයුගං**'' යනුවෙන් පැවසූ හෙයින් දැන් පිය පරපුර දක්වන සඳහා ''**සුද්ධොදනො නාමා**'' දී ගාථාව වදාළහ. පිරිසිදු වූ බතක් වැනි ජීවිතයක් මොහුට ඇත යන අරුතින් සුද්ධෝදන නම් වේ. බුදුරජාණන් වහන්සේගේ පියාට ඒකාන්තයෙන්ම ඉතා පිරිසිඳු කාය වාග්, මනෝ හැසිරීම් ඇත. ඔහුට ඉතා පිරිසිඳු දිවි පෙවෙතක් ඇත. ඊට සුදුසු ප්‍රාර්ථනා හේතු සම්පත් ඇති බැවිනි. ''**මායා**'' කුල රූප, සීලාදී හැසිරීම්වලින් පිරුණු බැවින් 'මායා' යන නම් ලද. ''**පරිහාරියා**'' කුසින් දරා. ''**කායසස හෙදා**'' දෙවියන් සහිත ලෝකයාට චෛත්‍යයක් බඳු වූ තමාගේ කය වැනසී ගිය පසුව. මැරුණු පසුව. ''**නිදිවමහි**'' තව්තිසා දෙව්ලොව. ''**සා**'' ඒ මායාදේවිය ''**ගොතමී**'' ගෞතම ගෝත්‍රයේ බැවින් මෙනමින් අමතයි. ''**දිබෙබහි කාමෙහි**'' තුසිත භවනයට අයත් දිව්‍යමය වස්තු කාමයන්ගෙන් ''**සමංගීහුතා**'' යුක්ත වූවාය. ''**කාමගුණෙහි**'' කාම කොට්ඨාසයන්ට ''**කාමෙහි**'' යනුවෙන් පවසා, කාමගුණයන්ගෙන් යැයි මේ දක්වන ලද්දේ ඒ ඒ පස්විද කාම ගුණයන්ගෙන් පිරිපුන් වූ බවයි. ''**තෙහි**'' ඒ දෙව්ලොව ඉපිදුණු, තව්තිසා වැසි දෙවියන් සමඟ පස්කම් සුව විඳිමින් ''**පරිවාරිතා**'' යන ස්ත්‍රී ලිංග රූපය පෙර අත්බව

සලකා හෝ දැන් ලැබූ ආත්ම භාවය සලකා හෝ කියන ලදී. මායා දේවියගේ දේවෝත්පත්තිය පුරුෂ භාවයෙන්ම යුක්තය. මෙසේ තෙරුන් වහන්සේගේ ඇරයුම ලද භාග්‍යවතුන් වහන්සේ; කිඹුල්වත් පුර ගමනින් බොහෝ දෙනාට සිදුවන විශේෂාධිගමයන් දක විසිදහසක් රහතුන් පිරිවරාගෙන රජගහ නුවරින් නික්ම අතුරිත චාරිකාවෙන් (පා ගමනින්) කපිල වස්තුවට යන මාවතට එළඹුණු සේක. කාළුදායි තෙරණුවෝ සෘද්ධියෙන් වහා කපිල වස්තුවට වැඩ, රජු ඉදිරියේ පෙනී සිටියහ. පැවිදි වූ පසුව නොදැක තිබූ බැවින් රජු, ''නුඹ කවුද?''යි විමසීය. එවිට තෙරණුවෝ, ඇමති පුත් වූ නුඹ විසින් භාග්‍යවතුන් වහන්සේ වඩමවාගෙන ඒමට යැවූ මා නොහඳුනන්නෙහි නම් මා කවුදැයි මෙසේ දැනගන්න''යි පවසමින් මේ අවසාන ගාථාව වදාළහ.

''බුද්ධස්ස පුත්තොමහි අසයහසායිනො
අංගීරසස්ස පපටිමස්ස තාදිනො
පිතු පිතා මය්හං තුවංසි සක්ක
ධම්මෙන මෙ ගොතම අය්‍යකොසී''ති

මෙහි ''බුද්ධස්ස පුත්තොමහි'' සර්වඥ බුදුරජාණන් වහන්සේගේ හදවතින් උපන් බැවින් ඖරස පුත්‍ර වෙමි. ''අසය්හසායිනො'' සම්බුද්ධත්වයට පෙර දී පවා, මහා බෝධිසත්වයන් හැර අනිකකු විසින් ඉවසීමට, ඉසිලීමට අසමත් වූ බෝධිසම්භාර ධර්මයන්ගෙන් යුක්ත වූ බැවින් ද මහා කරුණාවෙන් පැතූ ප්‍රාර්ථනා ඇති බැවින් ද බෝධි සම්භාර ධර්ම ඉසිලීමට, ඉවසීමට සමත් වූ බැවින් ද; වෙනත් කිසිවෙකුට මැඩලිය, අභිභවනය කළ නොහැකි පංචමාරයන් මැඩලූ, අභිභවනය කළ බැවින් ද; අන්‍යයන්ට නොහැකි සේ ඒ ඒ චරිත විභාග වශයෙන් දැන සුදුසු පරිදි ජනයා හික්මීමෙහි, මෙලෝ පරලෝ පරමාර්ථයන්හි යෙදවීමෙහි අනුශාසනා කිරීමෙහි සමත් වූ බැවින් ද; අනුන් විසින් ඉසිලිය නොහෙන බුද්ධ කෘත්‍ය ඇති බැවින් ද, නැතහොත් යහපත සිදුකරන බැවින් ද තථාගතයන් වහන්සේ ''අසය්හසායී'' නම් වෙති. ''අංගීරසස්ස'' ශීලාදී ගුණ සම්පත් අංග කරගත් හෙයින්, අංග ප්‍රත්‍යයන්ගෙන් ආලෝකය පතුරන හෙයින් යැයි ඇතැමෙක් කියත්. ඇතැමෙක් අංගීරස, සිද්ධත්ථ යන නම් දෙකම සුදොවුන් විසින් තබන ලදැයි කියති. ''අපපටිමස්ස'' උපමා රහිත වූ, ඉෂ්ටානිෂ්ට අරමුණු පිළිබඳ තාදී ගුණයෙන් යුතු වූ බැවින් ''**තාදිනො**'' ''**පිතු පිතා මය්හං තුවංසි**'' ආර්ය ජාතියේ ඉපදීමෙන් මගේ පියා වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝක ව්‍යවහාරය අනුව නුඹගේ පුතු වේ. උන්වහන්සේගේ පියා නුඹය. ''**සක්ක**''

ජාති වශයෙන් මහ රජුට අමතයි. ''ධම්මෙන'' ස්වභාවධර්මයෙන්. ආර්ය ජාතියෙන් ද ලෞකික ජාතියෙන් ද යන ජාති ධර්මතා දෙක අනුව. ''**ගෞතම**'', රජුට ගෝත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි. ''**අය්‍යකොසි**'' මුත්තණුවන් වෙති. මෙහිදී ''මම බුදුරදුන්ගේ පුතා වෙමි''යි පැවසීමෙන්ම තෙරණුවෝ තම රහත් බව පැවසූහ. මෙසේ තමන් වහන්සේ කවුද?යි දන්වූ පසු සතුටු වූ රජතුමා ඉතා අනගි අසුනක තෙරුන් වඩා හිඳුවා, තමාට පිළියෙල කල නානා රසමසවුලෙන් පිරි රාජභෝජනයෙන් පාත්‍රය පුරවා පිළිගැන්වීය. තෙරුන් වහන්සේ වැඩමවන බවක් දැක්වූහ. ''යන්නේ කුමකට ද ? මෙහිම වැඩහිඳ වැළඳුව මැනවි''යි පැවසූ රජතුමාට, ''මහරජතුමනි, ශාස්තෘන් වහන්සේ වෙත ගොස් වළඳමි''යි තෙරණුවෝ වදාළහ. එවිට රජු ''ඒ ශාස්තෘන් වහන්සේ කොහි වෙසේද?''යි විමසීය. ''උන්වහන්සේ දැන් විසිදාහක් මහරහතුන් පිරිවරාගෙන ඔබ දැකීමට මඟට පිළිපන් සේක''යි තෙරණුවෝ වදාළහ. ඉමහත් සතුටට පත් රජු ''නුඹ වහන්සේ මේ දානය වළඳන්න. මගේ පුතා මෙනුවරට වැඩමවන තෙක්ම රජගෙදරින් උන්වහන්සේට පිණ්ඩපාතය ගෙන යන්න''යි ආරාධනා කළේය. තෙරණුවෝ දන් වළඳා රජුට ද රජ පිරිසට ද දහම් දෙසූහ. ශාස්තෘන් වහන්සේ වැඩීමට පළමුවම මුළු රජමාළිගයේ විසූ සැමදෙනම තුණුරුවන් කෙරෙහි වඩාත් ප්‍රසන්න වූවන් බවට පත්කළ කාළුදායි තෙරණුවෝ, ඔවුන් බලා සිටියදීම ශාස්තෘන් වහන්සේගේ පිණ්ඩපාත පාත්‍රය අහසින් ගෙනගොස් උන්වහන්සේගේ ශ්‍රී හස්තයේ තැබූහ. ශාස්තෘන් වහන්සේ එම පිණ්ඩපාතය වැළඳූහ. මෙසේ සැටයොදුන් මාවත නිමාවන තෙක් දිනකට යොදුන බැගින් වැඩමවන බුදුරජාණන් වහන්සේට දිනපතාම රජගෙදරින් කාළුදායි තෙරණුවෝ පිණ්ඩපාතය රැගෙන ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, ''මාගේ පියරජු ඇතුළු රජ පවුලම තෙරුවන් කෙරෙහි පැහැදවීය''යැයි සතුටුව කුල පහදන භික්ෂූන්ගෙන් අග්‍රභාවයට කාළුදායි මහරහතන් වහන්සේ පත්කළ සේක.

කාළුදායි තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.01.02

''පුරතො පච්ඡතො වාපි'' යනු ආයුෂ්මත් **ඒක විහාරික** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ තැබූ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරගෙන අවුත් **කාශ්‍යප** බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයේ සිටුගෙයක උපන්හ. නුවණැති බවට පත් ඒ සිටුකුමරු ශාස්තෘන් වහන්සේගෙන් දහම් අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදිව, අරණ්‍යගතව විවේක වාසයේ ඇලී මහණදම් පිරිය. ඒ පින්කම්වල බලයෙන් එක් බුද්ධාන්තරයක් කාමසුගතීන්හි සැපවිඳි හෙතෙම, මේ බුද්ධෝත්පාද කාලයේ අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සමයේ **ධර්මාශෝක** රජතුමාගේ බාල සොහොයුරාව උපන්නේය. අශෝක මහ රජතුමා සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහ අටවන වර්ෂයේදී මුළු දඹදිවම එක්සේසත් කොට, තම බාල සෝයුරු වූ තිස්ස කුමරු උපරාජ තනතුරේ තබා රට පාලනය කළේය. ඒ තිස්ස කුමරු කවර උපායකින් සසුනේ අතිශයින් පැහැදුණේද? එක් දිනක් මුව දඩයමට ගිය තිස්ස කුමරු කැළයේදී **යෝනක මහ ධම්මරක්ඛිත** තෙරුන් වහන්සේට මහ ඇත්රජෙකු සල් අත්තකින් පවන් ගසමින් සිටිනු දැකීමෙන් හටගත් ප්‍රසාද ඇතිව ''අහෝ මමත් ඒකාන්තයෙන් මේ මහතෙරුන් මෙන් පැවිදි වී ආරණ්‍යයේ වාසය කරන්නෙමි මැනවි''යි සිතීය. තෙරණුවෝ කුමරුගේ එම සිත දැන, ඔහු බලා සිටියදීම අහසට පැන නැඟී අශෝකාරාමයේ පොකුණේ දියෙහි නොගෑවෙමින් වැඩ හිඳ, සිවුරත් උතුරු සළුවත් අහසේ එල්වා නෑමට පටන් ගත්හ. කුමරු ඒ තෙරුන්ගේ මහානුභාව බව දැකීමෙන් අතිශයින් පැහැදී අරණ්‍යයෙන් නික්ම රජගෙට ගොස් ''මම පැවිදි වන්නෙමි''යි මහරජුට පැවසීය. අශෝක රජු නානාප්‍රකාරයෙන් කරුණු දැක්වූවත් පැවිදිවනු කැමති සිත වළකාලන්නට නොහැකි විය. උපාසක බවට පත් තිස්ස කුමරු පැවිදි සුව පතමින් මේ ගාථා සය ප්‍රකාශ කළේය.

''පුරතො පච්ඡතොවාපි අපරො චෙන විජ්ජති
අතීව ඵාසු භවති එකස්ස වසතො වනෙ''

''හන්ද එකො ගමිස්සාමි අරඤ්ඤං බුද්ධවණ්ණිතං
ඵාසු එකවිහාරිස්ස පහිතත්තස්ස භික්ඛුනො''

''යොගී පීතිකරං රම්මං මත්ත කුංජරසෙවිතං
එකො අජ්ඣාවසී බ්‍රහ්මං පවිසිස්සාමි කානනං''

සුපුප්ඵිතෙ සීතවනෙ සීතලෙ ගිරිකන්දරෙ
ගතතානි පරිසිඤ්චිත්වා චංකමිස්සාමි එකකො''

''එකාකියො අදුතියො රමණියෙ මහාවනෙ
කදාහං විහරිස්සාමි කතකිච්චො අනාසවො''

''එවමෙම කතතුකාමස්ස අධිප්පායො සමිජ්ඣතු
සාධයිස්සාම්‍යහං යෙව, නාඤ්ඤා අඤ්ඤස්ස කාරකො'' ති.

එහි ''**පුරතො පච්ඡතො වා**'' තමාගේ ඉදිරියෙන් හෝ පසුපසින් වෙසෙන්නකු නැති, දක්නට නොමැතිව, වෙනත් කිසිදු පුද්ගලයෙක් තමා සමීපයේ නොමැති නම් එයින් තම සිතට ඒකාන්තයෙන් ම සුබ විහරණයක්, සැපයක් ගෙනදෙයි. එසේ තනිව, හුදකලා වුවහුට ''**වනෙ වසතො**'' බොහෝ කාලයක් පුරුදු කළ විවේකයේ ඇලුණු, විවේක වාසයට ඇදගත් සිතැති, රෑදාවල් මහජනයාගෙන් තොරවූයේ සමූහ සාකච්ඡාවල නොයෙදී, විවේක සුවයට බුහුමන් කරයි. ''**හන්ද**'' වචස්සග්ගාර්ථයේ නිපාතයකි. ඉන් දැන් සිදුකරන ආරණ්‍යයට පිවිසීමේ ක්‍රියාවේ නිශ්චිත බව පවසයි. ''**එකො ගමිස්සාමි**'', ''ගහපතිය, ශූන්‍යාගාරය තථාගතයන්ගේ සිත වෙසෙයින් අලවයි'' යනාදී ලෙස බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කළ, පැසසූ අරණ්‍යවාසයට තනිවම, හුදකලාව පහසු විහරණයෙහි, තනිව විසීමෙහි යෙදී, නිවණටම මෙහයු සිත් ඇති බැවින්, අධිශීල ශික්ෂා දී ත්‍රිවිධ ශික්ෂාවන්ගෙන් හික්මුණු භික්ෂුවට අරණ්‍යයේ සුව පහසුවිහරණය ඒකාන්තයෙන් සැප ගෙන දෙයි'' යන අර්ථයයි. ''**යොගි පීතිකරං**'' යෝගී, ධ්‍යාන භාවනාවෙහි යෙදුණු සිත් ඇත්තන්ට, එහි අල්පවූ ශබ්ද ඇති බැවින් ධ්‍යාන විදර්ශනාදී ප්‍රීතිය ගෙනදෙයි. භාවනාවට බාධාකරන අරමුණුවලින් දුරුව, විවේකයට යෝග්‍යභාවයෙන් රම්‍ය වූ ''**මත්තකුඤ්ජර සෙවිතං**'' උතුම් මතෑතු විසින් හැසිරෙන ලද, මේ වදනින් මහ කැළයේ ජන ශූන්‍ය බවම, විවේකයම දක්වයි. ''**අපථවසී**'' අර්ථය නම් මහණකමයි, ශ්‍රමණධර්මයයි, කෙසේ නම් මම ශ්‍රමණධර්මයේ වසඟයට යන්නෙම් නම් මැනවි. ''**සුපුප්ඵිතෙ**'' මනාව පිපුණු, ''**සීතවනෙ**'' සෙවණැලි, දිය පහර ඇදී සම්පත්තියෙන් ගීතල වූ වනයේ, මේ වදන් දෙකින් ම වනයේ සුන්දරත්වය දක්වයි. ''**ගිරිකන්දරෙ**'' ගිරි කඳුරෙහි, පර්වත අතුරෙහි ජල පහර සහිත නම්නස්ථාන කඳුරු නම් වේ. ඒ සොඳුරු නිම්නයන් හි ශ්‍රීෂ්මය, වෙහෙස, සන්සිදුවාගෙන, තම අතපය සොදා දිය නා. ''**චංකමිස්සාමි එකකො**'' කිසිවකුට අයත් නොවූ පැවැත්මෙන්, හුදකලාවම, ''**එකාකියො**'' හුදකලාව,

තනිවම, ''දුතියෝ'' තණ්හාව නම් දෙවැන්නෙකු නැති බැවින් අදුතිය වූ, දෙවැන්නකු නැති, සැමදාම පුද්ගලයා සමඟම පවතින, සිටින බැවින් තණ්හාව ''දුතිය'' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ, ''තණ්හාව නම් දෙවැන්නෙකු නැති බැවින් අදුතිය වූ, දෙවැන්නකු නැති, සැමදාම ප්‍රද්ගලයා සමඟ ම පවතින, සිටින බැවින් තණ්හාව ''දුතිය'' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ''තණ්හාව දෙවැන්නා කරගත් පුද්ගලයා මේ දිගු සසර සැරිසරයි.'' ''**එවමේ කත්තුකාමස්ස**'', ''ඒකාන්තයෙන්ම හුදකලාව වනයට යන්නෙමි'' යි ආදී වශයෙන් පැවසූ අයුරින් ම අරණ්‍යයෙහි භාවනා කරනු කැමති මාගේ, ''**අධිප්පායො සමිජ්ඣතූ**'' අදහස සමෘද්ධ වේවා, ''**කදාහං විහරිස්සාමි කතකිච්චො** අනාසවො'' මෙසේ පවතින අදහස, මනෝරථය ඉටුවේවා, සමෘද්ධ වේවා, මා විසින් ම ආශාවෙන්, කැමැත්තෙන් මෙය කළයුතුය. අනිකකු විසින් මේ කටයුත්ත නොකරන්නේය එනිසා ''**සාධයිස්සාමහං යෙව නාඤ්ඤා අඤ්ඤස්ස කාරකො**'' යි කියන ලදී, සසර ගමන නිමකිරීම මවිසින් ම කළ යුතුය. අනිකකු එය මට සිදුකර නොදේ.

මෙසේ උපරාජ තිස්සගේ පැවිද්දට දඩිව ඇලුණු සිත දුටු ධර්මාශෝක මහරජු අශෝකාරාමයට යන මාර්ගය අලංකාර කරවා, කුමරු සර්වලංකාරයෙන් සරසවා මහත් වූ රාජානුභාවය පෙන්වන මහාසේනාවක් පිරිවරාගෙන විහාරයට රැගෙන ගියේය. පධාන සරයට (ප්‍රධාන ශාලාවට) ගිය කුමරු මහාධම්මරක්ඛිත තෙරුන් සමීපයේ ම පැවිදි විය. ඔහු අනුවම නොයෙක් සියගණනක් මිනිස්සු පැවිදි වුහ. රජුගේ බෑණා වූ සංඝමිත්තාවගේ සැමියා අග්ගිබ්‍රහ්ම කුමරු ද ඔහු අනුව ම පැවිදි විය. පැවිදි වූ තිස්ස උපරාජ තමා විසින් දැන් කළයුතු දේ දැඩි සතුටින් යුක්තව මෙසේ ගාථා තුනකින් පවසයි.

''එස බන්ධාමි සන්නාහං, පවිස්සාමි කානනං
තතො න නික්ඛමිස්සාමි අප්පත්තෙනා ආසවක්ඛයං''

''මාලුතෙ උපවායන්තෙ සීතෙ සුරභිගන්ධිකෙ
අවිජ්ඣං දාළයිස්සාමි නිසින්නෙනා නගමුද්ධනි''

''වනෙ කුසුමසඤ්ඡන්නෙ පබ්භාරෙ නූන සීතලෙ
විමුත්ති සුඛෙන සුඛිතො රමිස්සාමි ගිරිබ්බජෙ'' තී.

එහි ''**එසබන්ධාමි සන්නාහං**'' ඒ මම වීර්ය නම් සන්නාහය බඳිමි, කය, ජීවිතය පිළිබඳ ආශාවක් නැතිව වීර්ය සන්නාහයෙන් සන්නද්ධ වෙමි. මෙහි අදහස මෙසේ දතයුතුයි. - යම්සේ ශූර සෙබළෙකු සතුරන් පැමිණිවිට, ඔවුන් පරදනු කැමැතිව අනිත් සියලු කටයුතු නවතා, යුධ ඇඳුමෙන් වහා සැරසී, යුධ බිමට ගොස්, සතුරන් පරදා මිස නොනවතින්නේ ද එසේ ම මම ද කෙලෙස් සතුරන් පැරදීමට හිස ගිනිගත්තකු මෙන් මධ්‍යස්ථ වී සිවුවැදෑරුම් සම්‍යක් ප්‍රධාන වීර්ය සන්නාහයෙන් සන්නද්ධ වෙමි. කෙලෙස් ජය නොගෙන, කෙලෙස් නොවනසා විවේකස්ථානයෙන් නොනැගිටිමි, කෙලෙස් ජය නොගන, කෙලෙස් නොවනසා විවේකස්ථානයෙන් නොනැගිටිමි. එනිසා ''**පිවිසාමි කානනං**'', ''වනයට පිවිසෙන්නෙමි'' යි කියන ලදී. ''එයින් ආශ්‍රවයන් ක්‍ෂය නොකර නො නික්මන්නෙමි'' යි කියන ලදී. ''**මාලුතෙ උපවායන්තෙ**'' යන ගාථාවෙන් ආරණ්‍යය භාවනාවට ඉතා යෝග්‍ය ස්ථානයක් බව පෙන්වාදෙයි. ''**රමිස්සාමි නුග ගිරිබ්බජෙ**'' පර්වත, කඳු බැවුම්වලින් වට වූ, කඳු වලල්ලෙන් වට වූ වනයේ ඇලෙන්නෙමි, සතුටුවන්නෙමි, වෙනත් කාමුක පරිකල්පනයන්ට නොපැමිණ සක්මන් කරන්නෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

මෙසේ වදාළ තෙරණුවෝ අරණ්‍යයට පිවිස, මහණදම් පුරන්නේ උපාධ්‍යායන් වහන්සේ සමඟ කලිගුරුට වැඩියහ. එහි දී තිස්ස තෙරුන්ගේ පාදයේ වර්ම රෝගයක් ඇතිවිය. එය දුටු වෙදෙක් ''ස්වාමිනි ! ගිතෙල් සොයාදෙන්න මම වෙදකම් කරන්නෙමි'' යි පැවසීය. ගිතෙල් සොයාගෙනවුත් රෝගයට පිළියම් කළේය, නීරෝගී වූ තෙරණුවෝ නොබෝ දිනකින් ම රහත්වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''මේ මහා භද්‍රකල්පයේ බ්‍රාහ්මණ වංශයේ උපන්, මහත් යසස් ඇති, අපි බුදුවරුයැයි කියන්නන් අතර ශ්‍රේෂ්ඨ වූ ගෝතුයෙන් කස්සප නම් වූ බුදුරජාණෝ ලොව පහළවූහ. තණ්හා දී ප්‍රපංච රහිත, එල්බගැනීම් රහිත අහස වැනි සම සිතැති, ශූන්‍යතාව බහුල කර වෙසෙන, ලාභාලාභ ඉවසන තාදී ගුණැති අනිමිත්ත නම් නිවණෙහි ඇලුණු, තමාට වසඟ කරගත් ඉඳුරන් ඇති, රාගාදියේ නොඇලුණු සිතැති, කෙලෙස් රහිත වූ, කුලයන් වෙතය ගණයා වෙත ද නො ඇලුණු මහත් කරුණා ඇති වීරවූ, සත්වයන් හික්මවන උපායේ නිපුණ වූ, පරවැඩෙහි උත්සුක වූ සදේවක ලෝකයා හික්මවන, ලෝකයා සසරින් එතෙර කරවන, ඒ බුදුපියාණන් වහන්සේ මහ පිරිස් මැද වැඩ හිඳ, නිවන් ගමනට මාර්ග වූ, පංච ගති නම් මඩ වියලවන,

පරම ආශ්වාදය වූ, ජරාමරණ වලකන නිවන් නම් අමාව දැක්වූසේක. ඒ කොවුලන්ට බැඳුනාද ඇති ලෝක නාථ වූ බ්‍රහ්ම ඝෝෂ ඇති තථාගතයන් වහන්සේ, නායකයන් නැතුව වැරදී ගිය මාර්ග ඇති සත්ත්වයන් සංසාර දුර්ගයෙන් නගාලමින් මාර්ගය (නිවන්) දක්වනු දුටුවෙමි. බුදුපියාණන් වහන්සේගේ දහම් ඇසු මම බුදුසසුනේ පැවිදිවුනෙමි. මම ඒ කාලයේ ද පැවිදිව සමුහවාසයේ කළකිරී, බුදු සසුන ගැන ම සිතමින් හුදකලාව සිත්කලු වනයේ විසුවෙමි. සමුහවාසයේ බිය දකින, ස්ව කාය විවේකය ප්‍රිය කරන මාගේ සිතට හුදකලා වාසය මහත් විවේකයක් ගෙන දුන්නේය. දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත්ව ඒ වනයේ වෙසෙන තිස්ස තෙරුන්ට මහරජතුමා කෝටියක් ධනය වියදම් කර, **භෝජකගිරි** නම් විහාරය කරවා පූජා කළේය. එහි විසු තෙරණුවෝ පිරිනිවන් සමයේ දී මේ අවසාන ගාථාව වදාළහ.

''සොහං පරිපුණ්ණසංකප්පො වනෙ‍්‍රාපණ්ණරසෝ යථා
සබ්බා සවපරික්ඛීණා නත්ථිදානි පුනබ්භවෝ'' **ති.**

පිරිපුන් සංකල්පනා ඇති මම පුන්පෝදා සඳ මෙන් සියලු ආශ්‍රව ක්ෂය කළෙමි. මතු මාහට නැවත උපතක් නැත. මේ ගාථාවේ අර්ථ ඉතා ප්‍රකටය. මේ ගාථාවම තෙරුන්ගේ රහත්බව ප්‍රකාශ කරීම ම විය.

ඒකවිහාරික තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.1.3

''**අනාගතං සෝ පටිගච්ච පස්සති**'' යනු ආයුෂ්මත් **මහා කප්පින** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද? උන්වහන්සේ ද පෙර **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ **හංසවතී** නුවර කුල ගෙයක ඉපිද වැඩිවියට පත්ව ශාස්තෘන් වහන්සේ සමීපයේ හිඳ ධර්ම ශ්‍රවණය කළහ. එකල බුදුරජාණන් වහන්සේ එක් භික්ෂුවක් භික්ෂුන්ට අවවාද කරන්නන්ගෙන් අග්‍රභාවයට පත් කරනු දුටු හෙතෙම, ඒ තනතුර පතා බුදුරදුන්ගෙන් විවරණ ලබාගත්තේය. දිවි ඇතිතාක් එම භවයේ පින් දහම් සිදුකර, ඉන් චුතවූ ඔහු දෙව්මිනිස් දෙගතියේ සැරිසාරා අවුත්,

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී **බරණැස** සිටු ගෙයක ඉපිද නුවණැති බවට පැමිණියේය. මිනිසුන් දාහකට ප්‍රධාන නායක වූ හෙතෙම කුටි දහයකින් අලංකාර වූ මහත් පිරිවෙණක් කරවා පූජාකළේය. ඒ සැමදෙන ම ඒ උපාසකතුමාගේ නායකත්වයෙන් බොහෝ කුසල් රැස්කර, දෙව් ලොව ඉපිද එක් බුද්ධාන්තරයක් සැපවින්දහ. ඔවුන්ගේ නායක පුරුෂයා අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළවීමට පෙර කාලයේ ම ප්‍රත්‍යන්තයක වූ **කුක්කුට** නම් නුවර රජගෙදර ඉපිද **කප්පින** නාමයෙන් ප්‍රකට විය. සෙසු පුරුෂයෝ එනුවරම ඇමතිගෙවල් දාහක උපන්හ. ඔවුන්ගෙන් කප්පින කුමරු පියාගේ ඇවෑමෙන් රජවී **මහාකප්පින** රජතුමා නමින් ප්‍රකට විය. හේ අසනු කැමති සිත් ඇති බැවින් උදෑසන ම සතර දොරින් වහා දූතයෝ සතර දෙනෙක් පිටත් කර යැවීය. ''යම් තැනක බහුශ්‍රැතයෙක් හමුවේ නම් ඔහු මා වෙත වහා එවන්න'' යි ඔවුන්ට අණකළේය. මේ කාලයේ දී අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ සේක සැවැත් නුවර වෙසෙති. සැවැත්නුවර වෙළෙන්දෝ වටිනා බඩු රැගෙන ඒ කුක්කුට නුවරට ඒ බඩු විකුණා, ''රජු දැකගනිමු'' යි තෑගි පඬුරු ගත් අතැතිව රජුවෙත ගියහ. රජුගේ අවසර ලැබ, රජුවෙත පැමිණි ඔවුහු පුද පඬුරු පිරිනමා වැඳ පසෙක සිටි කල් හි., රජතුමා ''නුඹලා කොහි සිට ආවාහු ද ?'' යි ඇසීය. වෙළෙන්දෝ ''රජතුමනි ! සැවැත්නුවර සිට'' යි පැවසුහ. ''කිම නුඹලාගේ රට ආහාරපාන සුලබ ද ? රජු ධාර්මික ද ? '' යි ඇසු රජුට ''එසේය, දේවයන් වහන්ස'' යි වෙළෙන්දෝ පිළිතුරු දුන්හ. ''නුඹලාගේ දැන් කවරාකාර දහමක් පවතී ද ?'' යි ඇසූවිට වෙළෙන්දෝ ''රජතුමනි ! ඒ පිළිබඳව මේ කිළිටි මුවින් කිව නොහැකි යි පැවසූහ. රජු රන් කෙන්ඩියෙන් පැන් දුන්නේය. වෙළෙන්දෝ මුව සෝදාගෙන, දසබලයන් වහන්සේ දෙසට හැරී ඇඳිලි බැඳගෙන ''දේවයන්වහන්ස, අපගේ රටේ බුද්ධරත්නය පහළවූ සේක''යි පැවසූහ. ඒ ''බුද්ධ'' යන වචනය ඇසු පමණින් ම රජුගේ මුළු ශරීරයම විනිවිද යන සතුටක් පහළ විය. ඉක්බිති රජු ''දරුවනි ! නුඹලා බුද්ධ යැයි කීවෙහි ද ?'' යි ඇසීය. එවිට වෙළෙන්දෝ ''මහරජ, බුද්ධය බුද්ධ '' යැයි තෙවරක් පවසුහ. ''බුද්ධ යන පද පමණ කළ නොහැක'' යි පැවසූ රජු ඒ වචන කෙරෙහි පැහැදී වෙළෙන්දන්ට කහවනු ලක්‍ෂයක් දී ''අනිකක් කියව'' යි පැවසීය. වෙළෙන්දෝ ''මහරජ, ලෝකයේ ධර්මරත්නය පහළවිය'' යි පැවසූහ. එය ද අසා සතුටුව ලක්‍ෂයක් දී ''අනිකක් කියව'' යි පැවසූ විට වෙළෙන්දෝ ''දේවයන් වහන්ස, ලොව සංඝරත්නය පහළවිය'' යි පැවසූහ. ඒ වදන අසා සතුටුව නැවත ලක්‍ෂයක් දී, ''මම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සමීපයේ පැවිදිවන්නෙමි'' යි රාජ්‍යයෙන් නික්මුණි. ඇමතියෝ ද රජු අනුව ම නුවරින් නික්මුණහ.

ඇමතියන් දහස සමග ගංගාතීරයට පැමිණ, ''ඉදින් ශාස්තෘන් වහන්සේ සම්මාසම්බුද්ධ වනසේක් නම් මේ අසුන්ගේ කුර පමණකුදු නොතෙමේවා'' යි සත්‍යක්‍රියා කොට, ජලය මතින් ම පිරී යන ගඟ තරණය කළ රජතුමා තවත් අඩ යොදුනක් පළල නදියක් ද පෙරසේම තරණය කළේය. තුන්වැනිව චන්දභාග නම් මහා ගංගාව ද එසේම සත්‍යක්‍රියාවෙන් තරණය කොට ඉදිරියට ම ගියේය. ශාස්තෘන් වහන්සේ ද එදින අළුයම මහාකරුණා සමවතින් නැගී සිටියේක්., ලෝකය දෙසබලා , ''අද මහා කප්පිත තුන්සිය යොදුනක් පැතිරුණු රාජ්‍ය හැර දමා ඇමතිවරුන් දාහක් පිරිවරා ගෙන මා සමීපයේ පැවිදිවීමට එන්නේය. මවිසින් ඔවුන්ට පෙරගමන් කළයුතුය'' යි සිතා උදසනම සිරුර පිළිදගුම් කොට, භික්ෂු මහා සංඝයා පිරිවරා සැවැත් නුවර පිඬුපිණිස හැසිර, පසුබත් කල පිණ්ඩපාතයෙන් වැලකී තමන්වහන්සේ තනිව ම අහසින් වැඩමවා චන්‍දභාග නදී තීරයේ ඒ රජ පිරිස එතෙරවන තොටුපලෙහි ඉදිරියෙන් වූ මහා නුගරුකක් මුල සවණක් ගණ බුදුරැස් විහිදුවමින් පළක් බැඳ වැඩහුන් සේක. එම තොටුපලින් එතෙර වූ මහාකප්පින රජු, දසදෙස ඒකාලෝක කරමින් විහිදෙන බුදුරැස් දෙස බලා සිටිනුයේ භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. ''යම් ශාස්තෘවරයෙක් උදෙසා රාජ්‍ය හැර මා පැමිණියේ ද, ඒකාන්තයෙන් මේ ඒ ශාස්තෘනුම වේ'' යැයි නිශ්චයට ගොස්, උන්වහන්සේ දුටු ස්ථානයේ සිටම නැමී අතිශය ගෞරවාදර දක්වමින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණි රජතුමා; උන්වහන්සේගේ ගොප්මස, වළලු කර අල්ලාගෙන වැඳ එකත්පසෙක සිටියේය. ඇමතියෝ ද එසේම කළහ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට දහම් දෙසුහ. දේශනාවසානයේදී පිරිස සමඟම රජතුමා රහත් ඵලයෙහි පිහිටියේය.

මහකප්පින තෙරණුවෝ අපදාන පාළියේ දී මෙසේ වදාළහ.

''සියලු දහම්හි පරතෙරපත් ඒ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ සරත් ආකාශයේ සූර්යයා මෙන් ලෝකය නම් අහසේ උදාවිය. ඒ ලෝකනායකයන් වහන්සේගේ වචන නම් රශ්මියෙන් විනේයජන නම් පියුම් පුබුදු කළහ. නුවණ නම් රශ්මියෙන් කෙලෙස් මඬ වියලවූහ. හිරු කණාමැදිරියන් පැරදු සේ අන්‍ය තීර්ත්‍යකයන්ගේ යසස් නැසූහ. සූර්යයා රත්න ප්‍රකාශ කරන්නාක් මෙන් සත්‍යාර්ථ ප්‍රකාශ කළහ. රත්නයන්ට සයුර මෙන් ගුණයන්ට ආකරයක් වූහ. වැසිවලාවක් මෙන් ලොවට දහම් වැසි වැස්වූහ.''

''එසමයේ මම හංසවතී නුවර නීති විශාරද ආචාර්යවරයෙක් වූයෙමි. භික්ෂූන්ට අවවාද දෙන භික්ෂූන්ගෙන් අග්‍රභාවයට පත් රහත් ශ්‍රාවකයකුගේ ගුණ පවසන, මා සිත සතුටුව බුද්ධ ප්‍රමුඛ සංඝයාට සතුටින් ආරාධනා කොට, මහදන් පවත්වා මම ද ඒ තනතුර පැතුවෙමි. ඒ කල්හි හංස බෙර හඬට බඳු මනා ස්වර ඇති මහත් භාග්‍ය ඇති බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක. ''මනාව නැගි උත්‍තර රෝමරාජි ඇති මාගේ පාමුල වැටුනා වූ, මෙසවර්ණ වූ, පිරිපුන් උරහිස් ඇති, පැහැදිළි ඇස් හා මුහුණ ඇති මේ මහාමාත්‍යයා දෙස බලවූ. මහ පිරිවරින් යුතු මහත් යශස් ඇතිව මාගේ සසුන බබුළුවන ප්‍රමුදිත සින් ඇති, කළකටයුතු ඇති ඒ ශ්‍රාවකයාගේ තනතුර මොහු ප්‍රාර්ථනා කරයි. මේ ආහාර දානය හා චිත්ත ප්‍රාර්ථනාව අනුව මෙතෙම, මින් කල්ප ලක්‍ෂයක් ම දුගතියේ නූපදී. දෙවියන් අතර දිවමය සෞභාග්‍යය ද මිනිසුන් අතර මහත් සැප ද අනුභව කරන මෙතෙම නිවන් දක්නේය. මීට කල්ප ලක්‍ෂයකට පසුව ඔක්කාක කුලයේ ගෝතුනාමයෙන් ගෞතම නම් බුදුරජ ලොව පහළ වේ. උන්වහන්සේගේ ධර්මයේ දායාද වූ ධර්මයෙන් නිර්මිත කළ, ඖරස පුත්‍ර වූ කප්පින ශ්‍රාවකයා ලෙස මොහු උපදින්නේය.''

ඒ සර්වඥ ශාසනයෙහි මේ මහා පින්කම් සිදුකළ මම මිනිස් සිරුර හැර තුසිත දෙව්ලොව උපන්නෙමි. දහැමිව සියක් වර දිව්‍ය රාජ්‍ය හා ප්‍රදේශ රාජ්‍ය කළ මම බරණැස සමීපයේ පේශකාර කුලයේ උපන්නෙමි. භාර්යාව සහිත දහසක් පිරිවර සමඟ පන්සීයක් පසේ බුදුවරුන්ට උපස්ථාන කළෙමි. තෙමසක් උන්වහන්සේලාට දන් දී අවසන් තුන් සිවුරු දුනිමු. අපි සියල්ලෝ ඉන් චුතව තව්තිසා දෙව්ලොවට ගියෙමු. යලි ඉන් චුතව මිනිස් බව ලැබ හිමවතේ පසෙක වූ කුක්කුට පුරයේ උපන්නෙමු. මම රජ කුලයේ ඉපිද මහාකප්පින රජ පුතු වීමි. සෙසු සැම ඇමති කුලවල ඉපිද මා පිරිවරාගත්හ. සියලු කාම සුවයන්හි ඇලී සිටි මහරජ වූ මම වෙළඳුන් පැවසූ පරිදි බුදු උපත ඇසුවෙමි. ''අසම වූ අසහාය පුද්ගල වූ බුදුරජ ලොව පහළ ව උතුම් අමාසුව ගෙන දෙමින් සදහම් දෙසයි. උන්වහන්සේගේ ශිෂ්‍යයෝ ද මනාව දහමෙහි හැසිරෙති. මනාව ආශ්‍රවයන්ගෙන් මිදුනෝය.'' මේ වෙළඳ බස් ඇසූ මම ඔවුන්ට සත්කාර කළෙමි. රාජ්‍ය හැර දමා ඇමතිවරු සමඟ තථාගතයන් දැකීමට නික්මුනෙමි. මුවවිට දක්වා පිරුණු චන්‍ද්‍රභාගා නදිය දුටු අපි පිහිටක් නැති, එල්ලීමට කිසිවක් නැති, අතිදුෂ්කර වූ වේගයෙන් ගලා බසින ඒ නදිය බුදුගුණ සිහිකොට මැනවින් තරණය කළෙමු. ලෝකයේ අන්තයට ගියා වූ සියල්ල දන්නා වූ සර්වඥයන් වහන්සේ, භව සැඩ පහර තරණය කළේ නම්, ඒ සත්‍ය වචනයේ බලයෙන්

මාගේ ගමන සමෘද්ධ වේවා. ඉදින් ආයුෂ් සංඝරත්නය තරණය කළ භව කාන්තාර ඇති නම්, නිරුත්තර වූ පින්කෙතවේ නම් ඒ සත්‍ය වචනයේ බලයෙන් මාගේ ගමන සමෘද්ධ වේවා යි මම සත්‍ය ක්‍රියා කළෙමි. මේ උතුම් සත්‍ය ක්‍රියාව සිදුකළ කෙනෙහිම මාර්ගයෙන් ජලය ඉවත් විය. සුවසේ ගඟින් එතෙර වූ යෙමි. ගංතීරයෙහි උදාවන හිරු සේ, දිලිසෙන හිමාල පර්වතය සේ, බබළන පහන් ගසක් වැනි වූ, තරු සහිත සඳු මෙන් ශ්‍රාවකයන් පිරිවරා ශෝභාමත් ව වැසිවස්වන මේඝයක් සේ දහම් දෙසන බුදුරජාණන් වහන්සේ දුටුවෙමි. ඇමතියන් සමඟ උන්වහන්සේට වැඳ මම එකත් පසෙක සිටියෙමි. අප අදහස් දත් බුදුහු අපට දහම් දෙසූහ. නිර්මල දහම් ඇසූ අපි මෙසේ කීවෙමු. ''මහාවීරයන් වහන්ස ! අපි භවයේ කළකිරුනෝ වෙමු. අපි පැවිදිකරවනු මැනවි.''

සත්වන මුනි වූ බුදුහු ''මහණෙනි, ධර්මය ස්වාක්ඛාතය, තොපගේ දුක් කෙළවර කිරීමට බඹසර හැසිරෙවු'' යි දෙසූහ. ඒ වදන පිටවූ විට ම අපි සියල්ලෝ භික්ෂුවෙස් ගෙන සසුනේ උපසපන් වූ සෝවාන් වූ පැවිද්දෝ වීමු. දෙවිරම් වෙහෙරට වැඩම වූ අපට බුදුරදහු අනුශාසනා කළසේක. ඒ ඇසූ මම රහත්වුනෙමි. මගේ දහසක් පිරිවර භික්ෂූන්ට මම අනුශාසනා කළෙමි. මාගේ අනුශාසනා ඇසූ ඔවුහු සැම රහත්වූහ. මේ ගුණයෙහි සතුටු වූ බුදුරජාණන් වහන්සේ මහජනයා ඉදිරියේ සිට කප්පිත භික්ෂුව මාගේ සසුනෙහි භික්ෂූන්ට අවවාද දෙන්නන් අතුරින් අග්‍රයැයි මා එතදග්‍රස්ථානයෙහි තැබුසේක. මීට කල්ප ලක්ෂයකට පෙර මා කළ ක්‍රියාවේ ඵලය මෙසේ මවිසින් ලබන ලද්දෙමි. දුන්නෙන් මනාව මිදුණු හීයක් මෙන් මගේ කෙලෙස් සියල්ල දවිණි. දැන් මම සියලු කෙලෙස් දවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත් බවට පත් ඒ සැම දෙනා වහන්සේම ශාස්තෘන් වහන්සේගෙන් පැවිද්ද ඉල්ලූහ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ''මහණෙනි ! මෙහි එව්'' යි වදාළසේක. එය ම ඒ සැමගේ පැවිදි උපසම්පදාව විය. ශාස්තෘන් වහන්සේ ඒ භික්ෂූන් දහස ද ගෙන අහසින් ම දෙව්රම් වෙහෙර වැඩම කළසේක. එක් දිනක් භග්‍යවතුන් වහන්සේ මහාකප්පින තෙරුන්ගේ අන්තේවාසික භික්ෂූන් ගෙන් ''මහණෙනි ! කිම මහාකප්පින තෙරුන් නුඹලාට දහම් දෙසන්නේ ද ?'' යි විමසූසේක. එවිට එම භික්ෂූහු ''භාග්‍යවතුන් වහන්ස ! උන්වහන්සේ අපට දහම් නො දෙසති. අල්ප උත්සාහයෙන් දිට්ඨධම්ම (මොලොවදී ලැබූ) සුඛ විහරණයේ ම යෙදී සිටිති. අවවාදයක් පමණකුදු නොදෙති'' යි පැවසූහ. එවිට ශාස්තෘන් වහන්සේ තෙරුන් කැඳවා,

''කප්පිනය, නුඹ අන්තේවාසිකයන්ට අවවාදයක් පමණකුදු නොදෙන්නෙහිය යන මේ ප්‍රකාශය සත්‍යක් ද ?'' යි විමසූ සේක. ''භාග්‍යවතුන් වහන්ස, එය සත්‍යයකි'' යි තෙරණුවෝ පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ ''බ්‍රාහ්මණය, එසේ නොකරන්න. අද පටන් තමා වෙත පැමිණෙන අන්තේවාසිකයන්ට ධර්මය දෙසන්න'' යි වදාළසේක. තෙරණුවෝ ''එසේය, ස්වාමීනි.'' යි ශාස්තෘ අවවාදය හිසින් පිළිගත්හ. කප්පින තෙරුන් වහන්සේ දුන් පළමු අවවාදයෙන් ම, භික්ෂූහු දහසක් රහත්වූහ. එනිසා ශාස්තෘන් වහන්සේ පිළිවෙලින් තම ශ්‍රාවක දක්ෂ තෙරවරුන් අග්‍රස්ථානයන්හි පිහිටුවන අවස්ථාවෙහි මහා කප්පින තෙරුන් භික්ෂූන්ට අවවාද දෙන්නන්ගෙන් අගතනතුරෙහි පිහිට වූ සේක.

එක් දිනක් මහා කප්පින තෙරණුවෝ භික්ෂුණීන්ට අවවාද දෙමින් මේ ගාථා වදාළහ.

''අනාගතං යෝ පටිගච්ච පස්සති
හිතඤ්ච අත්ථං අහිතඤ්ච තං ද්වයං
විඥූසිනෝ තස්ස හිතෙසිනෝ වා
රත්තිං න පස්සන්ති සමෙක්ඛමානා''

''ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා,
සොමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා''

''ඔදාතං වත මෙ චිත්තං අප්පමාණං සුභාවිතං
නිබ්බිද්ධං පගහිතඤ්ච සබ්බා ඔභාසතෙ දිසා''

''ජීවිතෙ වා පි සප්පඤ්ඤා අපි චිත්තපරික්ඛයා
පඤ්ඤාය ච අලාභෙන චිත්තෙවාපි න ජීවති''

''පඤ්ඤා සුනවිනිච්ඡිනී, පඤ්ඤා කිත්තිසිලෝකවඩ්ඪනී
පඤ්ඤා සහිතෝ නරෝ ඉධ අපි දුක්ඛෙසු සුඛානි වින්දති
නායං අජ්ඣතනෝ ධම්මෝ නචෙජරෝ නපි අබ්භුතෝ
යත්ථ ජායෙථ මීයෙථ, තත්ථ කිං විය අබ්භුතං''

''අනන්තරං හි ජාතස්ස ජීවිතා මරණං ධ්‍රුවං
ජාතා ජාතා මරන්තීධ, එවං ධම්මා හි පාණිනෝ.''

''න හෙතදත්ථාය මතඤ්ඤ හොති
යං ජීවිතඤ්ච පරපොරිසානං
මතම්හි රුණ්ණං, න යසො න ලොකඤ්ං
න වණ්ණිතං සමණ බ්‍රාහ්මණෙහි.''

''චක්ඛුං සරීරං උපහන්ති රොණ්ණං, නහීයති වණ්ණබලං මනී ච
ආනඤ්දිනො තඤ්ඤ දිසා භවන්ති, හිතෙසිනො නාඤ්ඤ සුඛී භවන්ති''

''තඤ්මාහි ඉච්ඡෙය්‍ය කුලෙ වසන්තො
මෙධාවිනොවෙව බහුස්සුතෙ ච
යෙසං හි පඤ්ඤා විභවෙන කිච්චං
තරන්ති නාවාය නදිං ච පුණ්ණං'' නති.

එහි ''අනාගතං'' න ආගතං, නොපැමිණි, නොවැඩූ, ''පටිගච්ච'' පළමු ව ම, ''පඤ්ඤති'' බලයි. ''අත්ථං'' කටයුතු ''තං ඳ්‍යං'' හිත හා අහිත යනුවෙන් දෙකකි. ''විඤ්ඤිනො'' සතුරෝ ''රඤ්ඤං'' සිදුරක්, ''සමෙක්ඛමානා'' සොයමින්, මෙහි අර්ථ මෙසේය. - ''පුද්ගලයා තමාට හිත ඵලවන, අහිත ඵලවන, ඒ දෙකම ගෙනදෙන අර්ථවත් කටයුත්ත., නොපැමිණ, නො ඵළඹ සිටියදී ප්‍රථමයෙන් ම ප්‍රඥා ඇසෙන් මම මෙන් දකිමි ද විමසා බලයි ද විචාරය කරයි ද අහිතවත් සිත් ඇති ඔහුගේ සතුරෝ හෝ හිතවත් සිත් ඇති මිතුරෝ හෝ ඔහුගේ සිදුරක් සොයන්නාහු නොදකිති. එබඳු ප්‍රඥාවන්ත පුද්ගලයාගේ ජීවිතයේ සිදුරු නැත. එනිසා නුඹලා ද එසේ වුවෝ වියයුතුය.

පසුව ආනාපානසති භාවනාවේ ගුණමහිම දක්වමින් ඒ භික්ෂූන්හු එහි යෙදවීම සඳහා ''**ආනාපානසතී යඤ්ඤ**'' යන දෙවන ගාථාව වදාළහ. එහි ''ආනං'' ආශ්වාස කිරීම යි. ''පානං'' ප්‍රාශ්වාස කිරීමයි. ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙහි පිහිටවූ සිත් ඇති. මෙහි දී ආනාපානසති ශීර්ෂයෙන් එය අයත් වන සමාධි භාවනාව අදහස් කරන ලදී ''**යඤ්ඤ**'' යම් යෝගියකු විසින් ''පරිපුණ්ණා සුභාවිතා'' සතර සති පට්ඨානයන්ගේ ද සොළොස් ආකාරයන්ගේ ද සම්පූර්ණත්වයෙන්, සර්වප්‍රකාරයෙන් පිරීමෙන්., සත් බොජ්ඣංග දහම් ද විද්‍යා විමුක්ති ආදිය ද පිරීමෙන්, මනාව වැඩීමෙන් ආනාපානසතිය අනුපූර්වයෙන් වඩා, ''**යථා බුද්ධෙන දෙසිතා**'' ඔහු සිහි ඇතිව ආශ්වාස කරයි'' අදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ පිළිවෙල අනුව වඩන ලදී. සේවනය කරන ලදී, වඩන ලදී, ''**සොමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා**'' ඒ යෝගාවචරයා වලාකුළු

ආදී බාධාවලින් මිදී සද රැසින් මේ ලොව ආලෝකමත් තමාගේ හා අනුන්ගේ සන්තානයේ වැටුණු සංස්කාර ලෝකය බබුළුවයි. ආලෝකමත් කරයි. එනිසා නුඹලා විසින් ආනාපාන සති භාවනාව වැඩිය යුතුය යන අදහසයි.

තෙවනුව තමා උපමාවට ගෙන භාවනාවේ යෙදුණු පුද්ගලයාට ලැබෙන ප්‍රතිඵල දක්වමින් **''ඔදානං වතමෙ චිත්තං''**යන තෙවන ගාථාව වදාළහ. එහි අර්ථ - පංචනීවරණ කිලිටිනැති කිරීමෙන් මගේ සිත ඒකාන්තයෙන් ඉතා පිරිසිදු විය. විශුද්ධ විය. පමණ කළහැකි රාගාදි කෙලෙස් ප්‍රහීණ කර අප්‍රමාණ වූ නිවණ ප්‍රත්‍යක්ෂ කළෙමි. එසේම වැඩූ සිත් ඇති බැවින් අප්‍රමාණ වූ වෙන වෙනම වැඩුවාවූ ඒ චතුරාර්ය සත්‍යයන් ම ප්‍රතිවේධ කළෙමි. සියලු කෙලෙස් සතුරන්ට නිග්‍රහ කළෙමි. දුක් ආදිය අවබෝධ කළෙමි. පුර්වාන්තාදී දිශා සැක දුර ලු බැවින් ද සියලු ධර්මයන් හිමි අනවබෝධය දුර ලු බැවින් ද බබුළුවන ලදී. එනිසා නුඹලා ද මෙසේ සිත වැඩිය යුතුයැයි දක්වයි.

භාවනාමය ප්‍රඥාව සිතේ කිලිටි සෝදා හරිමින් පුද්ගලයාට බොහෝ උපකාරවන්නාක් මෙන් ම අනිකුත් ප්‍රඥාවන් ද එසේම හිතවැඩ සලසන බව **''ජීවිතෙවාපි සපඤ්ඤා''** යන සිවුවන ගාථාවෙන් දක්වන ලදී. එහි අර්ථ - ධනය වැයවී ගියත් ප්‍රඥාවන්ත පුද්ගලයා තමාට ලැබෙන දෙයින් සතුටුව, නිවැරදි ජීවිකාවෙන් ජීවත් වන්නේමය. ඔහුගේ ජීවත් වීම ''ජීවිතය'' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ ''ජීවත්වන්නවුන් අතරින් ප්‍රඥාවන්තව ජීවත්වීම ශ්‍රේෂ්ඨ යැයි කියමි'' යි වදාළේ එබැවිණි. මෝඩ පුද්ගලයා ප්‍රඥාව නැතිහෙයින් මොලෝ පරලෝ යහපත වරදවා ගෙන, ධනය සහිත වුවත් ඔහු ජීවත් නොවන්නෙකි. ගැරහුම්, නින්දා, අපහාස ලබමින් සිටීම ''ජීවත්වීම'' නම් නොවේ. උපාය රහිත බැවින් යම්සේ ලැබූ ධනයක් වේ ද එය නොනසා ජීවත්වීමට ද ඔහු සමත් නොවේමය. එනිසා නුඹලා පාරිහාරික ප්‍රඥාව ද අප්‍රමාදීව සම්පාදනය කළ යුතුයි'' යන අදහසයි.

අනතුරුව ප්‍රඥාවේ ආනිසංස දක්වීමට **''පඤ්ඤා සුත විනිච්ඡිනී''** යන පස්වන ගාථාව වදාළහ. එහි **''පඤ්ඤා සුතවිනිච්ඡිනී''** යනු මේ ප්‍රඥාව ශ්‍රුතය (ඇසීම) විනිශ්චය කරයි. ඇසු පරිදි කර්ණේන්ද්‍රිය මගින් ලද ධර්මයන් පිළිබඳව මෙය අකුසල්ය, මෙය සාවද්‍යය, මෙය කුසල් ය. මෙය නිරවද්‍යය ආදී වශයෙන් විනිශ්චය කරයි. **''කිත්ති සිලොකවඩ්ඪනී''** කීර්ති, ප්‍රශංසාදිය දස දෙස පතුරුවමින් වර්ධනය කරයි. පාරිහාරිය ප්‍රඥාවෙන් ද විදර්ශනා

ප්‍රඥාවෙන් ද යන ප්‍රඥාවන් ගෙන් යුක්ත බැවින් ම කීර්තිය ද නුවණැත්තන්ගේ ප්‍රශංසාව ද ලැබෙයි. **''අපි දුක්ඛසු සුඛානි විඳති''** ඒකාන්ත දුක්ඛ ස්වභාව ඇති ස්කන්ධ, ආයතනාදියෙහි මනාව පිළිපැදීමෙන්, ඒවායේ යථාස්වභාවය අවබෝධ කරගැනීමෙන් නිරාමිෂ වූ සැප ලබයි. අනතුරුව ඒ භික්ෂුණීන්ට අනිත්‍ය ප්‍රතිසංයුක්ත, ධීරබව ගෙනදෙන ධර්ම දේශනාවක් පවත්වමින් ''නායං අජ්ජතනෝ ධම්මෝ'' ආදී ගාථා දෙකක් වදාළහ. එහි සංක්ෂිප්ත අර්ථ මෙසේය. ''ඉදින් මේ සත්ත්වයන්ගේ ඉපදෙන, මැරෙන ස්වභාවය, මේ ස්වභාව ධර්මය අද ඇතිවුවක් නොවේ. දැන් පැමිණි දෙයක් නොවේ. නිතරම සිදුවන මේ ධර්ම ආශ්චර්යමත්, අද්භූතජනක ද නොවේ. **''නපි අබ්භූතෝ''** එනිසා **''යත්‍ථ ජායෙථ මීයෙථ''** යම් ලෝකයක මේ සත්ත්වයා උපදිනම් ඔහු අනිවාර්යයෙන් ම මැරෙන්නේය. **''තත්‍ථ කිං විය''** එහි කවර ආශ්චර්යමත්, අද්භූතජනක ද නොවේ. **''නපි අබ්භූතෝ''** එනිසා ''යත්‍ථ ජායෙථ මීයෙථ'' යම් ලෝකයක මේ සත්ත්වයා උපදිනම් ඔහු අනිවාර්යයෙන් ම මැරෙන්නේය. **''තත්‍ථ කිං විය''** එහි කවර ආශ්චර්යක් ද ? මරණය ස්වාභාවික ධර්මතාවකි. ක්ෂණික මරණය සිදුනොවීමට කිසිදු හේතුවක් නොමැත. උපතට අනතුරු ම මරණය ඒකාන්තයෙන් සිදුවේ. උපන් තැනැත්තාගේ උපතත් සමඟ ම, උපන්නහුගේ ස්කන්ධ අනිවාර්යයෙන් ම බිඳීයාම් වශයෙන් මරණය ඒකාන්තයෙන් සිදුවේ. ''යමෙක් මෙලොව ජීවත් වේ''යනු ලෝකව්‍යවහාරයකි. ඔහු උපන් ස්කන්ධ උපදාන කරගෙන, නොයෙක් ප්‍රත්‍ය උපදවයි. අනේකප්‍රකාරව හේතු ප්‍රත්‍ය සමවායෙන් පවතියි. එනිසා මෙසේ කියන ලදී, - ''මෙලොව උපන් සත්ත්වයා මැරේ. මෙය සත්ත්වයන්ගේ ධර්මතාවකි.''උපන් සත්ත්වයන්ට මරණය, ජරාමරණ ලුහුබැඳ පැවතීම ස්වභාවයක් ම වේ.

ඉන්පසුව ඒ භික්ෂුණීන් අතරින් යම් තැනැත්තියකට ශෝකයට පත් සිතක් හෝ වෙත් ද ඒ ශෝක සිත දුරු කිරීමට **''න හෙතදත්‍ථාය''** යනාදී ගාථා දෙසන ලදී. එහි **''න හොති තදත්‍ථාය මනස්ස හෙතු''** යම් මරුණු සත්ත්වයකුගේ ජීවිතය සඳහා, ජීවත්වීම පිණිස අන්‍ය පුද්ගලයන්ගේ හැඩීම් ආදිය ඒ මැරුණු පුද්ගලයාගේ ජීවිතය පිණිස හේතු නොවේ. එය තිබේවා. යමෙක් හඬයි ද වැළපෙයි ද එය ඒ හඬන පුද්ගලයන්ට පවා යහපත පිණිස හේතු නොවේ. මළ පුද්ගලයා වෙනුවෙන් හැඩීම **''න යසෝ''** කීර්තිය පිණිස හේතු නොවේ. **''න ලොකස්මිං''** විශුද්ධිය පිණිස ද හේතු නොවේ. **''න වණ්ණිතං සමණ බ්‍රාහ්මණෙහි''** නුවණැති මහණ බමුණන් විසින් ද පසසනු නොලැබේ. මළවුන්ට හැඩීම නුවණැත්තන් විසින් ගරහනු ලබන්නක්මය. මළවුන්ට හැඩීමේ ආදීනව මෙපමණක් නොවේ. තවත්

ඇත. ඒවා නම් "**චක්ඛුං සරීරං උපහනති**" ආදී වශයෙන් දක්වා ඇත. හැඩීම ශරීරය ද ඇස ද පෙළයි. ආදී වශයෙණි. ඒ හේතු පවසා අනතුරුව ශෝකාදී අනර්ථදායක කෙලෙස් සෝදා හැරීමටත්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රයටත් ඒ භික්ෂුණීනු යොමු කරමින් "**තඤ්ඤා**" යන අවසාන ගාථාව වදාළහ. එහි "**තඤ්ඤා**" යනු එහෙයින්, එනිසා හඬන දොඩන පුද්ගලයාගේ ඇස ද ශරීරය ද පෙළේ, පීඩාවේ ආබාධිත වේ. එසේම හැඩීමෙන් වර්ණය, ශරීර බලය හා නුවණ ද පිරිහේ. ක්ෂය වේ. ඒ හඬන පුද්ගලයාගේ සතුරෝ සතුටුවෙති. ප්‍රමාදීනු ප්‍රීති වෙති. හිතකැමති මිත්‍රයෝ ද දුක්වෙති. එහෙයින් ස්වභාව ධර්ම ස්වභාවය දත් ප්‍රඥාවෙන් යුක්තව, නුවණැතිව මෙලෝ පරලෝ අර්ථයන් ද බොහෝ ඇසූ පිරුතැන් ඇති බව ද සම්පූර්ණ කරගෙන තමාගේ "**කුලෙ වසනෙන ඉච්ඡෙය්‍ය**" කුලයේ විසීම, පැවත්ම කරගන්නේය "**යෙසං**" යම්හෙයකින් නුවණැති බහුශ්‍රැත පඬිවරුන්ගේ ප්‍රඥා සම්පත්යෙන්, ප්‍රඥා බලයෙන් උපකාර ලබා සැඩ පහරකින් පිරුණු නදියක් නැවකින් තරණය කරන්නාක් මෙන් නුවණැති කුලපුත්‍රයෝ තමාගේ අර්ථවත් කටයුතු සිදුකරගනිති. සංසාර සාගරය ඉක්මවා පරතෙරට පත්වෙති. කුලයේ වසන්නා වූ නුඹලා විසින් ද එසේ කිරීමට සිතා ගත යුතුයි. මෙසේ කප්පින තෙරණුවෝ ඒ භික්ෂුණීන්ට ධර්මානුශාසනා පවත්වා පිටත් කර හැරියහ. තෙරුන්ගේ අවවාදයේ පිහිටි ඔවුහු ශෝක දුරුකර නුවණැස මෙහෙයවා සිහිනුවණින් කටයුතු කර, ස්වාර්ථ සාධනය කරගත්හ.

මහා කප්පින ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.1.4

"**දන්ධා මයාහං ගනී**" යනාදී ගාථා ආයුෂ්මත් **චුල්ලපන්ථක** තෙරුන් විසින් දේශනා කරන ලදී. ඒවායේ උපත කෙසේ ද ? මෙහි කිව යුතු විස්තර අටවන නිපාතයේ **මහාපන්ථක** තෙරුන්ගේ කථාවස්තුවේ දී පැවසූ පරිදිම දතයුතුයි. මෙහි ඇති විශේෂත්වය නම් මහාපන්ථක තෙරණුවෝ රහත්ව අග්‍රඵල සුවයෙන් කල්යවමින් සිටිසේක., "චුල්ලපන්ථක ද මේ සුවයෙහි පිහිටුවීමට කෙසේ නම් හැකි වේ ද ?" යි යනුවෙන් සිතූහ. උන්වහන්සේ තම මුත්තණුවන් වූ සිටුවරයා වෙත ගොස් "ඉදින් මහසිටුතුමා අනුදන්නේ නම් මම චුල්ලපන්ථක පැවිදින්නෙමි" පැවසූහ. "ස්වාමීනි, ඔහු පැවිදි කරනු

මැනවි''යි සිටුවරයාගෙන් අවසර ලැබුණි. තෙරුන් වහන්සේ තම මළනුවන් පැවිදි කළහ. දස සාමණේර ශීලය සමාදන්ව පැවිදිවූ චුල්ලපන්ථක තෙරණුවෝ, තම සෝයුරු හිමියන් සමීපයේ සිට

''පදුමං යථා කොකන දං සුගන්ධං
පාතෝ සියා ඵුල්ලමවීතගන්ධං
අංගීරසං පස්ස විරොචමානං
තපන්ත මාදිච්ච මිවන්තලික්ඛෙ'' ති

යන ගාථාව පාඩම් කිරීමට මාස සතරක් ගතවුවත් නොහැකිවිය. පාඩම් කරන, කරන පදය හදවතේ නො පිහිටයි. ඉක්බිති මහාපන්ථක තෙරණුවෝ ''චුල්ලපන්ථකය, නුඹ මේ බුද්ධශාසනයෙහි අන්ධයෙකි. සතර මාසයක් ගියත් එක ගාථාවකුදු පාඩම් කිරීමට නොහැකි වූ වෙහිය. පැවිදි කිස, මහණකම කෙසේ මස්තකප්‍රාප්ත කර ගන්නෙහි ද ? මෙතැනින් නික්මෙව'' යි පැවසුහ. සිය සහෝදර තෙරුන් විසින් බැහැර කළ චුල්ලපන්ථක හිමියෝ දොරටුවේ වූ ගෙය සමීපයේ අඬමින් සිටියහ. එසමයේ ශාස්තෘන් වහන්සේ ජීවක අඹ උයනෙහි වැඩ වෙසෙති. ජීවක වෛද්‍යවරයා තම සේවක පුරුෂයකු ''දහවල් බතට ශාස්තෘන් වහන්සේ සමඟ පන්සියක් භික්ෂූන්ට ආරාධනා කරව'යි අඹ උයනට යැවීය. එසමයේ මහා පන්ථක හිමියෝ ''භත්තුද්දේසක'' තනතුර දරුහ. පුරුෂයා ''ස්වාමීනි, පන්සීයක් භික්ෂූන්ට දහවල් දානයට ආරාධනා කරමි. එය පිළිගන්න'' යි තෙරුන් හමුවේ පැවසීය. මහාපන්ථක තෙරණුවෝ, ''චුල්ලපන්ථක හැර සෙසු භික්ෂූන් සඳහා ආරාධනාව පිළිගනිමි'' යි පැවසූහ. ඒ ප්‍රකාශය ඇසුණු චුල්ලපන්ථක හිමියෝ අතිශයින් ම අසතුටට, දොම්නසට පත්වූහ. ඒ ශෝකී සිත දුටු ශාස්තෘන් වහන්සේ, ''මවිසින් කළ උපායෙන් චුල්ලපන්ථක සත්‍යවබෝධ කරලන්නේය'' යි දූන, චුල්ලපන්ථක හිමියෝ, ''ස්වාමීනි, මගේ සොහොයුරා මා එළවා දැමීය'' යි පැවසුහ. එවිට බුදුහු ''පන්ථක, ඒ පිළිබඳව නො සිතන්න. නුඹ පැවිදිවූයේ මගේ සසුනෙහිය. එන්න, මේ රෙදි කඩ ගෙන, මෙතැන හිඳිමින් ''රජොහරණං'', ''රජොහරණං'' යනුවෙන් කියමින් සිටින්න'' යි වදාරා, ඍද්ධියෙන් පිරිසිදු සුදු රෙදිකඩක් මවා දුන්නේය. චුල්ලපන්ථක හිමියෝ, ශාස්තෘන් වහන්සේ විසින් දෙන ලද සුදුරෙදිකඩ ගෙන ''රජොහරණං'' යැයි කියමින් එය අතින් පිරිමදිමින් එතැන හුන්හ. ඒ රෙදිකඩ පිරිමදින තෙරුන්ගේ අතින් එම රෙදි කඩ කිළිටි විය. තව තවත් පිරිමදින විට එය වළං පිසදමන රෙද්දක් මෙන් කිළිටි විය. ඒ මොහොතෙහි නුවණ මුහුකුරා ගොස් සිටි චුල්ලපන්ථක හිමියෝ., ''මේ රෙදි කඩ

ස්වභාවයෙන් ම ඉතා පිරිසිදු වූ වක් විය. මේ මගේ යැයි තණ්හාවෙන් බැඳගත් ශරීරය නිසා එය කිළිටි විය. රෙදිකඩ වෙනස් වුවක් විය. සිත ද මෙසේය, සියලු සංස්කාර ධර්ම අනිත්‍ය වේ'' යනුවෙන් ක්ෂයවීම, ව්‍යයවීමෙහි සිත පිහිටුවා ගෙන, ඒ අනිත්‍ය සංඥාව ම පාදක කරගෙන ධ්‍යාන උපදවා, ඒ ධ්‍යාන පාදක කරගෙන විදසුනෙහි සිත පිහිටුවා සිවුපිළිසිඹියාපත් මහරහතන් වහන්සේ නමක් බවට පත්වූහ.

අපදාන පාළියේ දී චුල්ලපන්ථක තෙරණුවෝ මෙසේ වදාළහ.

''එකල් හි පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ගණයා කෙරෙන් ඉවත් වූ සේක් හිමවතෙහි විසූ සේක. එකල මම ද හිමවතේ අසපුවක විසුවෙමි. අලුත පැමිණියා වූ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි මම., මල් කුඩයක් රැගෙන, එය උන්වහන්සේට දරාගෙන සිටියෙමි. සමවතට සමවැදි උන්වහන්සේගේ සමාධියට අනතුරක් නොකළෙමි. පසුව සමාධියෙන් නැගිටි බුදුරදුන්ට මල් කුඩය පිදුවෙමි. උන්වහන්සේ එය පිළගත් සේක. ''පසැස් ඇති බුදුහු පුණ්‍යානුමෝදනා කරන්නේය'' යි සතුටු වූ දෙවිවරු හිමවතට එළඹුනහ. මාගේ පියුම් සත අහසෙහි දරන්නා වූ උතුම් නරශ්‍රේෂ්ඨයන් වෙත ඔවුහු එළඹියහ. බුදුහු මෙසේ වදාළහ.''

''මේ පියුම් සතක් මට පිදූ මොහු පිළිබඳව මම ප්‍රකාශ කරමි. ඒ මාගේ වචනය අසවු, මෙතෙම විසිපස්වරක් දිව්‍ය රාජ්‍ය කරන්නේය. තිස් හතර වරක් සක්විති රජව උපදින්නේය. දිව්‍ය, මනුෂ්‍ය යම් යෝනියක සැරි සරයි ද අභ්‍යවකාශයේ හිද පියුමක් කුඩයක් මෙන් දරන්නේය.කල්ප ලක්ෂයකට පසුව ඔක්කාක කුලයේ උපදින ගෞතම නම් ශාස්තෘහු ලොව පහළවෙති. පිටකතුය ධර්මය දෙසූ කල් හි ඕනිසත් බව ලබන මෙතෙම මනෝමය ශරීර නිර්මාණයේ ධර්මය දෙසූ කල් හි ඕනිසත් බව ලබන මෙතෙම මනෝමය ශරීර නිර්මාණයේ අග්‍රවන්නේය. සොහොයුරෝ දෙදෙනෙක් වෙති. දෙදෙනම ''පන්ථක'' නම් ලබා, උත්තමාර්ථය වූ නිවන් ප්‍රතිවේධ කරගෙන සසුන බබුළුවන්නාහු'' ය

''ඒ මම අටළොස් වියැත්තේ අනගාරී සසුනෙහි පැවිදි වීමි. ශාක්‍යපුත්‍ර බුදුන්ගේ සසුනෙහි මම විශේෂාධිගමයක් නොලැබුවෙමි. මම ස්වභාවයෙන්ම මෝඩ වීමි. ප්‍රථමයෙන් මම ගර්හා ලැබුවෙමි. ''දැන් තමාගේ ගෙදරට යවයි'' මගේ සෝයුරා මා එළවා දැමීය. නෙරපා දැමූ මම ආරාම දොරටුවේ නැවතී දොම්නස් වුයෙම් පැවිද්දෙහි ඇලී, අපේක්ෂා සහිතව සිටියෙමි.''

''ශාස්තෘන් වහන්සේ මා වෙත වැඩම කළහ. මා හිස පිරිමැදි සේක. මගේ අතින් අල්ලාගෙන ආරාමයට පිවිසිසේක. පිරිසිදු වූ රෙදිකඩක් ගෙන, ''එකත්පසෙක හිඳ මනාකොට සිහිකරව'' යි කියා දුන්නේ ය. එය දෝතින් පිළිගත් මම පියුම සිහිකළෙමි. එවිට මගේ සිත කෙලෙසුන් ගෙන් මිදුණි. රහත්බවට පැමිණියෙමි. සියලු තන්හි මනෝමය ශරීර මැවීමෙහි පරතෙරට පැමිණියෙමි. දැන් මම සියලු කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන්ගේ අනුශාසනාව ඉටුකළෙමි.

රහත්වීමත් සමඟ ම උන්වහන්සේ ත්‍රිපිටකධාරී වූහ. පංචාභිඥාලාභී බවට ද පත් වූහ. ශාස්තෘන් වහන්සේ භික්ෂූන් වහන්සේලා හාරසිය අනුනවයක් සමඟ ගොස් **ජීවක** වෛද්‍යවරයාගේ නිවසේ පැන වූ ආසනවල වැඩහුන්සේක. චුල්ලපන්ථක තෙරණුවෝ තමා උදෙසා දානාරාධනාව නොපිළිගත් බැවින් ම නොගියහ. ජීවක වෛද්‍යවරයා කැඳ පිළිගැන්වීම ඇරඹීය. ශාස්තෘන් වහන්සේ පාත්‍රය අතින් වැසුසේක. ''ස්වාමීනි! කුමක් හෙයින් නොපිළිගන්නේ ද ? '' යි විමසූ ඔහුට, භග්‍යවතුන් වහන්සේ, ''ජීවකය, විහාරයේ එක් භික්ෂුවක් ඇත'' යි වදාළහ. ජීවක තම සේවක පුරුෂයකු කැඳවා, ''යන්න, විහාරයේ සිටින ආර්යයන් වහන්සේ කැඳවාගෙන එන්න'' යි විහාරයට යැවීය. මේ සාකච්ඡාව දිව කණින් ඇසූ චුල්ලපන්ථක හිමියෝ ද රූපයෙන් ද කටයුතුවලින් ද එකිනෙකාට අසමාන වූ භික්ෂූන් දහසක් මවා ගෙන වැඩ හුන්හ. ඒ පුරුෂයා විහාරයේ බොහෝ භික්ෂූන් සිටිනු දැක, වහා දිවගොස් ජීවකට ඒ බව දන්වීය. ''ස්වාමීනි, මේ නිවසේ සිටින භික්ෂූන්ට ද වඩා භික්ෂූහු විහාරයේ වැඩ වෙසෙති. කැඳවාගෙන පැමිණිය යුතු ආර්යයන් වහන්සේ කවරෙක්දැයි මම නොදනිමි'' යි පැවසීය.

ජීවක ශාස්තෘන් වහන්සේගෙන්, ''ස්වාමීනි, විහාරයේ සිටින භික්ෂුවගේ නම කුමක් ද ?'' යි විමසීය. ''ජීවකය ඒ භික්ෂුව චුල්ලපන්ථක නම් වේ'' යැයි බුදුහු වදාළහ. එවිට ජීවක නැවත පුරුෂයා කැඳවා, ''කොල යව, චුල්ලපන්ථක තෙරුන් කවු ද ? යි අසා උන්වහන්සේ කැඳවාගෙන එව'' යි විහාරයට යැවීය. විහාරයට ගිය එම පුරුෂයා, ''ස්වාමීනි, චුල්ලපන්ථක තෙරුන් කොහි ද ? යි විමසීය. එවිට ඒ භික්ෂූන් වහන්සේලා දහසම ''මම චුල්ලපන්ථක වෙමි,'' ''මම චුල්ලපන්ථක වෙමි'' යි පැවසූහ, නැවත හැරී ගිය ඒ පුරුෂයා මේ බව ජීවකට දන්වීය. ජීවක වෛද්‍යවරයා සත්‍යාවබෝධ කරගෙන සිටි බැවින්, ''මේ තෙරණුවෝ මහත් සෘද්ධි ඇත්තෙකි'' යි න්‍යාය වශයෙන් දැන, ''යව, පළමුව මම චුල්ලපන්ථක යැයි පවසන තෙරුන්ගේ සිවුරු කොන ගෙන ''නුඹවහන්සේට ශාස්තෘන් වහන්සේ කථාකරන සේක'' යි පවසා මෙහි කැඳවා ගෙන එව'' යි නැවතත් එම පුරුෂයාම

යැවීය. විහාරයට ගිය ඔහු එලෙසම කළේය. එකෙණෙහි ම නිර්මිත භික්ෂුහු අතුරුදහන් වුහ. ඒ පුරුෂයා තෙරුන් වහන්සේ නිවසට වැඩමවාගෙන ආවේය. ඉන්පසු ශාස්තෘන් වහන්සේ කැඳ පිළිගත්සේක. දන් වළඳා අවසන දසබලයන් වහන්සේ විහාරයට වැඩි කල්හි, දම්සබාවෙහි ''අහෝ ! බුදුරජාණන් වහන්සේගේ ආනුභාවය පුදුම සහගතය. සිවුමසක් ගතවීත් එක ගාථාවක් පාඩම් කරගත නොහැකි වූ චුල්ලපන්ථක මොහොතකින් මහත් සෘද්ධිමතෙක් කළසේක'' යන කථාව ඇතිවිය. ශාස්තෘන් වහන්සේ එම භික්ෂූන්ගේ කථා සල්ලාපය ඇසූ සේක්., එහි වැඩමවා බුද්ධාසනයේ වැඩහිඳ, ''මහණෙනි, චුල්ලපන්ථක විසින් මාගේ අවවාදයේ පිහිටා ක්‍රියා කොට දැන් ලෝකෝත්තර සම්පත් ලැබුවාක් මෙන් ම අතීතයේ දී මගේ බසෙහි පිහිටා, උත්සාහවත් වීමෙන් ලෞකික සම්පතින් ආඪ්‍ය වූවේය'' යි වදාළ සේක.එම භික්ෂූන්ගේ ආරාධනාවෙන් ඒ අතීත පුවත දක්වෙන චුල්ලසෙට්ඨි ජාතකය දේශනා කළ බුදුපියාණන් වහන්සේ., පසු කාලයකදී ආයුෂ්මත් සංඝයා පිරිවරාගෙන ධර්මාසනයෙහි හුන්සේක් මනෝමය කාය නිර්මාණයේ දක්ෂ තෙරවරුන්ගෙන් ද රූපධ්‍යානයන් සමවැදීමේ දක්ෂ තෙරුවරුන්ගෙන් ද අග්‍රස්ථානයෙහි චුල්ලපන්ථක තෙරුන් තැබුසේක.

ඊට පසු කාලයක දී භික්ෂු හු ''නුඹවහන්සේ මෝඩ ස්වභාවයෙන් ඉපිද කෙසේ නම් චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත්තෙහි ද ? යි චුල්ලපන්ථක තෙරුන්ගෙන් විමසු හ. ඊට පිළිතුරු වශයෙන් උන්වහන්සේ තම සහෝදර තෙරුන් විසින් බැහැර කළ අවස්ථාවේ පටන් තම පිළිවෙත් මඟ දක්වමින් මේ ගාථා වදාළසේක.

''දන්‍ධා මය්‍හං ගති ආසි, පරිභූතො පුරෙ අහං,
භාතා ච මං පණාමෙසි, ගච්ඡදානි තුවං සරං''

''සොහං පණාමිතො භාතා සංඝාරාමස්ස කොට්ඨකෙ
දුම්මනෝ තත්‍ථ අට්ඨාසිං සාසනස්මිං අපෙඛවා''

''භගවා තත්‍ථ ආගඤ්ඡි, සීසං මය්‍හං පරාමසි
බාහාය මං ගහෙත්‍වාන සංඝාරාමං පවෙසයී.''

''අනුකම්පාය මෙ සත්‍ථා අදාසි පාදපූඤ්ඡනිං
එතං සුද්ධං අධිට්ඨෙහි ඒකමන්තං සඩ්ඩිට්ඨිතං''
''තස්සාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො
සමාධිං පටිපාදෙසිං උත්තමත්‍ථස්ස පත්තියා''

''පුබ්බෙනිවාසං ජානාමි, දිබ්බචක්ඛු විසොධිතං
තිස්සෝ විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.''

''සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිණිත්වාන පඤ්චකෝ
නිසීදම්බවනෙ රම්මෙ යාව කාලප්පවෙදනා.''

''තතෝ මෙ සත්ථා පාහෙසි දූතං කාලප්පවෙදකං
පවෙදිතම්හි කාලම්හි වෙහාසාදුපසංකමිං''

''වන්දිත්වා සත්ථුනෝ පාදෙ එකමන්තං නිසීදහං,
නිසින්නං මං විදිත්වාන අථ සත්ථා පටිග්ගහී.''

''ආයාගෝ සබ්බ ලොකස්ස ආහුතීනං පටිග්ගහෝ,
පූජෙය්‍යෙකෙත්තෝ මනුස්සානං පටිගණ්හිත්ථ දක්ඛිණං.'' **තී.**

මෙහි ''දක්ඛා'' මද නුවණැති, සිවුපද ගාථාවක් සිවුමසකින් වත් ග්‍රහණය ධාරණය කරගැනීමට අසමත් වූ බැවින් දුර්වල වූ, ''**ගති**'' ඤාණගති, ''ආසි'' විය. ''පරිභූතෝ'' හෙළදක්නා ලද්දෙමි ඒ මෝඩ මූලා ස්වාභාවය නිසා ''අනුවණයෙකි'' යි හෙළාදුටුවෙමි. ''පුරෙ'' පෙර පුනුදුන් කාලයේ, ''භාතා ච'' සමුච්චයාර්ථයේ 'ච' ශබ්දය යෙදේ. හුදෙක් මට නින්දා කලා පමණක් නොවේ, මගේ සෝයුරා ද මා එලවාදැමීය. ''පඤ්චකය, නුඹ දුෂ්ප්‍රාඥ මෝඩයෙකි යි සිතමි, එනිසා පැවිදි කිස මස්තක ප්‍රාප්ත කරගැනීම අසමත් වෙහි. නුඹ මේ ශාසනයට සුදුසු වූවෙක් නොවෙහි, එහෙයින් නුඹ දැන් සියාගේ ගෙදරට යව'' යි එළවා දැමීය. ''භාතා'' සොහොයුරා ''කොට්ඨකෙ'' ද්වාරකොට්ඨකය, දොරකඩ සමීපයේ, ''**දුම්මනෝ**'' දොම්නස් සිතින්, ''සාසනස්මිං අපෙබවා'' සම්මා සම්බුද්ධ ශාසනයේ අපේක්ෂා සහිතව, සිවුරු හැර නොයනු කැමතිව, ''**භගවා තත්ථ ආගඤ්ඡි**'' මහාකරුණාවෙන් මෙහෙයු සිත් ඇති භාග්‍යවතුන් වහන්සේ මට අනුග්‍රහකරමින් මා සිටි ස්ථානයට වැඩම කළසේක, පැමිණ ''පඤ්චකය, මම නුඹගේ ශාස්තෘවරයා වෙමි. මහාපඤ්ච ශාස්තෘවරයා නොවේ. නුඹ පැවිදිවූයේ මා උදෙසාය'' යනුවෙන් මා අස්වසමින් මගේ හිස පිරිමැදිසේක. දැලින් වැසුණු, මෘදු, ඉතා ළපටි වූ රන්වන් දිගු අඟිලිවලින් අලංකාර වූ, පිපුණු පියුමක උතුම් ශෝභාව ගෙන දුන් ශ්‍රීමත් සක් ලකුණින් හෙබි අත්ලෙන් ''දැන් මම මොහු මගේ පුත්‍රයකු වන්නේය'' යන්න හඟවමින් ''මගේ හිස පිරිමැද සේක. ''**බාහාය මං ගහෙත්වාන**'' ''නුඹ කුමක් හෙයින්

මෙහි සිටින්නේ ද?''යි අසමින් සඳුන් සුවඳින් සුවඳවත් වූ තමන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මගේ අත අල්ලාගෙන සංඝාරාමයට රැගෙන ගියසේක. ''**පාදාසි පාදපුඤ්ඡනිං**'' පාපිස්නා කඩක් කර දුන්නේය. ''රාජොහරණං'' යනුවෙන් කියමින් මෙනෙහි කරවයි දුන්නේය. යන අරුතයි. ''අදාසීති පාද පූජනී''යන පාඨය ද යෙදේ. ඇතමෙක් ''පාදං පූජනං'' යනු පා පිසදමන සුදු රෙදිකඩක් දුන්නේය යි කියති. සෘද්ධියෙන් මැවූ රෙදිකඩක් දුන් බැවින් මේ ප්‍රකාශය සුදුසුවූවක් නොවේ. ''**එතං සුද්ධං අධිට්ඨෙහි එකමන්තං ඣධිට්ඨිතං**'' ඒ පිරිසිදු රෙදිකඩ රජෝහරණං, රජෝහරණං යනුවෙන් මෙනෙහි කරමින්, මනාව අධිෂ්ඨාන කරගෙන, මේ ගඳකිළියේ විවේක ස්ථානයක එකත් පසෙක හිඳිමින් ''**අධිට්ඨෙහි**'' ඒ රෙදිකඩට තම සිත යොමුකර, සිත සමාධිගත කර පවත්වා ගන්න. ''**තස්සාහං වචනං සුත්වා**'' ඒ භාග්‍යවතුන් වහන්සේ අවවාදය ඇසූ මම ඒ අවවාද අනුශාසනාවන් හි වෙසෙසින් ඇලී, එසේම කටයුතු කළෙමි. පැවසූ පරිදිම පිළිපැද්දෙමි. පිළිපදිමින් සිටියදී ''**සමාධිං පටිපාදෙසිං උත්තමත්ථස්ස පත්තියා**'' උත්තමාර්ථය නම් අර්හත්වයයි. ඒ අර්හත්වය අවබෝධ කරගැනීම සඳහා කසිණ භාවනා වශයෙන් රූපධ්‍යාන උපදවාගෙන, ඒ ධ්‍යානය පාදක කරගෙන විදසුනෙහි සිත පිහිටුවා, මඟ පිළිවෙලින් ආර්යමාර්ග සමාධිය සම්පාදනය කරගත්තෙමි යන අර්ථයයි. මෙහි ''**සමාධිං**'' යන්නෙන් උපචාර සමාධියේ සිට සිවුමාර්ග සමාධිය දක්වා අදහස් කරන ලදී. උත්තමාර්ථය ගැනීමෙන් මෙහි දී අග්‍රඵල සමාධිය දක්වා අදහස් කරන ලදී. උත්තමාර්ථය ගැනීමෙන් මෙහි දී අග්‍රඵල සමාධිය සුවිශේෂ චේතෝ සමාධියක් ලෙස මෙහි දැක්විණි. එනිසා ''කවරෙක් මේ සමාධිය උපදවාගත්තේ ද ?'' යන්න පවසන ලදී. රූපාවචර සමාධියින් හි මේ තෙරණුවෝ ඉතා දක්ෂ බැවින්, ''රූපධ්‍යාන ඉපදවීමේ දක්ෂයෙකි'' යි ප්‍රකට විය. **මහාපන්ථක** තෙරණුවෝ විදර්ශනාවෙහි දක්ෂයෙක් බැවින් අරූපධ්‍යාන ඉපදවීමේ දක්ෂයෙකි. ''මේ දොසොයුරන්ගෙන් එක් අයෙක් සමාධි, සමථ භාවනා විෂයෙහි දක්ෂයෙකි. අනික් තෙරුන් විදර්ශනා භාවනා විෂයෙහි දක්ෂයෙකි. අයෙක් සමාධිය දඩිව ගත්තෙකි. අනික් තෙරුන් විදර්ශනාව දඩිව ගත්තෙකි. අයෙක් අංග සංක්ෂිප්තයෙහි දක්ෂයෙකි. අයෙක් අරමුණු සංක්ෂිප්ත කිරීමෙහි දක්ෂයෙකි. අයෙක් අංග ව්‍යවස්ථාපනයේ දක්ෂයෙකි. අයෙක් ආරම්මණ ව්‍යවස්ථාපනයේ දක්ෂයෙකි.'' යනුවෙන් වර්ණනා කරනු ලැබේ. තවද චුල්ලපන්ථක තෙරණුවෝ අතිශයින් ම රූපාවචර ධ්‍යාන සතර ලබාගත්, එහි වශී බවට පැමිණි හෙයින් රූපධ්‍යාන වැඩීමේ දක්ෂයෙකි. මහා පන්ථක තෙරණුවෝ අතිශයින් අරූප ධ්‍යානලාභීව එහි වශී බවට පැමිණි හෙයින් අරූප ධ්‍යාන වැඩීමේ දක්ෂයෙකි. චුල්ල පන්ථක හිමියෝ රූපධ්‍යාන උපදවා, ඉන් නැගිට රහත් වූ හෙයින් රූපධ්‍යානයෙහි

දක්ෂයෙකි. මහාපඤ්ක හිමියෝ අරූපාවචර ධ්‍යාන උපදවා, ඉන් නැගිට රහත් වූ හෙයින් අරූපධ්‍යානයෙහි දක්ෂයෙකි.

සෙසු මනෝමය කාය නිර්මාණයේ දක්ෂයෝ මනෝමය කාය තුනක් හෝ සතරක් මැවීමට දක්ෂවෙති. බොහෝ මනෝකායන් මැවීමට දක්ෂ නොවෙති. එසේ ම එකම සමාන රූප ඇතිව, එක ම ක්‍රියාව ඇති ව මැවීමට දක්ෂවෙති. මේ චුල්ලපඤ්ක තෙරණුවෝ එම අවස්ථාවෙහි ම ශ්‍රමණ රූප දාහක් මැවූහ. ඒ මනෝකායන්ගේ රූපය දහස් ආකාර විය. එකම කාර්යයක නොයෙදුණේය. විවිධ වූ රූප හා ක්‍රියා ඇතිව මැවූහ. එනිසා චුල්ලපඤ්ක තෙරණුවෝ මනෝමය කාය නිර්මාණයේ අග්‍ර පුද්ගලයා විය. දැන් තමන් වහන්සේ ලබාගත් විශේෂාධිගමයන් දැක්වීමට **"පුබ්බෙනිවාසං ජානාමි"** යනාදී ගාථා දේශනා කරති. ඒ කාන්තයෙන් ම තෙරණුවෝ ෂඩ් අභිඥාලාභියෙක් වූහ. ඒ අභිඥා හැකියාව ආශ්‍රවක්ෂ ඥානාධිගමයට බොහෝ උපකාර විය.

එය දැක්වීමට **"පුබ්බෙනිවාසං ජානාමි, දිබ්බචක්ඛු විසොධිතං"** පෙර විසු කඳපිළිවෙල ද දිවැස ද ලැබුවෙමි යි කියා **"ත්‍රිවිද්‍යාවන්ට පැමිණියෙමි"** පැවසූහ. සෙසු අභිඥා ඥානයන්ට වඩා පූර්වේනිවාසානුස්මෘති ඥානය කර්මානුරූපව නොපැමිණි සංඥාවන්ට ද විදර්ශනාවට බොහෝ උපකාරී වේ. **"සහස්සක්ඛත්තුං"** දහස් වරක්, දහස් අයුරකින්, එක් ආවර්ජනයකින් ම තෙරණුවෝ දහසක් මනෝමය කායන් නිර්මාණය කළහ. දහස් වරකින් නොවේ, ඒ සෑම රූපයක් ම විවිධාකාර විය. විවිධ කටයුතු කළේය, **"කිම සැම බුද්ධශ්‍රාවකයෙකුට ම මෙබඳු වූ සෘද්ධිමය හැකියා ඇතිවේ ද ?"** ඇති නොවේමය. පෙර තැබූ ප්‍රාර්ථනා හා සසර පුරුදු කළ ශක්‍යතා අනුව මේ තෙරුන්ට ම පමණක් මෙම හැකියාව ඇතිවිය. එනිසා එම හැකියාවෙන් චුල්ලපඤ්ක හිමියෝ අග්‍ර වූහ. **"පඤ්කො නිසිදි"** තමන් වහන්සේ වෙනත් අයෙකු මෙන් දක්වති. **"අම්බවනෙ"** අඹවනයේ ජීවක සැදු විහාරයෙහි, **"වෙහාසා"** කරණවාර්ථයේ පංචමී විභක්ති වචනයෙකි. **"අහසින්"** යන අර්ථයයි. 'ද' කාරය පද සන්ධිකරන්නකි. **"අථ"** මම ආසනයේ වැඩහුන් පසුව පිළිගැන්වූ දිය බඳුන පිළිගත්හ. **"ආයාගො සබ්බලොකස්ස"** සියලු දෙවියන් සහිත ලෝකයාගේ අග්‍ර දක්ෂිණෙය්‍ය වූ, දැහැමින් උපයාගත් ධනය වැය කර සකසාගත් දානෝපකරණ පිළිගැන්වීමට සුදුසු වූ. **"ආහුනීනං පටිග්ගහො"** දක්ෂිණාවන් පිළිගන්නා වූ, **"ස්වාමීනී දක්ෂිණෝදකය, (පැන් කෝප්පය) පිළිගන්න"** යි ජීවක විසින් පිළිගැන් වූ බාඳ්‍යභෝඳ්‍යාදී දක්ෂිණාව පිළිගත්සේක. ඉක්බිති බත් කිස නිමවූ බුදුපියාණන් වහන්සේ චුල්ලපඤ්ක තෙරුන්ට **"පුණ්‍යානුමෝදනා කරව"** යි අණ කළ සේක.

ඉක්බිති චුල්ලපන්ථක තෙරණුවෝ මහමෙර ගෙන මුහුද කළඹන්නාක් මෙන් ප්‍රභේදගත සිවුපිළිසිඹියාපත් බැවින් ත්‍රිපිටක බුද්ධ වචනය කළඹමින් ශාස්තෘ අදහසට අනුගතව පුණ්‍යානු මෝදනාව කළසේක. මෙබඳු වූ උපනිශ්‍රය සම්පත් ඇති නමුත් මේ ආයුෂ්මතුන් වහන්සේ, ඊට සුදුසු වූ අකුසල කර්මයක බලපෑමෙන් සිවුපද ගාථාවක් සිවුමසකින්වත් පාඩම් කරගැනීමට අසමත් වූහ. උන්වහන්සේගේ උපනිශ්‍රය සම්පත් බුදුඇසින් දුටු තථාගතයන් වහන්සේ, පූර්වචරිතයන්ට සුදුසු යෝනිසෝ මනසිකාරයක චුල්ලපන්ථක හිමි නියුක්ත කළසේක. එසේම එදා ජීවකගේ සිත එකඟ වී විදර්ශනා වීථියට පිළිගත් බවදැන., තමන් වහන්සේ වැඩහුන් ආකාරයෙන් ම දක්වා "පන්ථකය, යම්සේ මේ රෙදි කඩ දුවිලි වැකී කිලිටිවූවේ ද මේ ආර්ය විනයෙහි කෙලෙස් දුවිලි නිසා සිතට සත්‍යාවබෝධ නොවේ" යැයි දක්වන සේක් මේ ගාථා තුන වදාළසේක.

"රාගො රජො න ච පන රෙණු වුච්චති,
රාගස්සෙතං අධිවචනං රජොති."

එතං රජං විප්පජහිත්ව භික්ඛවො,
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ."

"දොසො රජො - පෙ - සාසනෙ."
"මොහො රජො - පෙ - සාසනෙ."

"ශ්‍රමණ, රාගය රජසකි. එයට "දුවිල්ලකි" නොකියයි. මේ කිලුටට "රාගය" යන නම යෙදේ. මේ රාගය නම් රජස දුරුකරව, රාගය දුරුකළ පුද්ගලයෝ කෙලෙස් දුවිලි රහිතව මේ සසුන ශෝභමාන කරති.

"ශ්‍රමණ ද්වේෂය රජසකි,
පෙ - සසුන ශෝභමාන කරමින් වෙසෙති."

"ශ්‍රමණ මෝහය රජසකි,
- පෙ -සසුන ශෝභමාන කරමින් වෙසෙති."

ගාථා තුන අවසානයේ දී චුල්ලපන්ථක තෙරණුවෝ ෂඩ් අභිඥාවන් සමඟ සිවු පිළිසිඹියාපත් මහරහත් භාවයට පත්වූහ.

චුල්ලපන්ථක ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.1.5

''නානාකුලමල සම්පුණ්ණා'' යනු ආයුෂ්මත් **කප්ප** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කළ ප්‍රාර්ථනා ඇති ව ඒ ඒ භවයේ දී කුසල් දහම් රැස්කරමින් අවුත්, **සිද්ධත්ථ** භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ දී මහත් ධනවත් පවුලක ඉපිද නුවණැති බවට පත්වූහ. ඔහු නානාවිධ වර්ණවත් විසිතුරු වස්ත්‍රයන්ගෙන් ද නානාප්‍රකාර ආභරණයන් ගෙන් ද, නානාප්‍රකාර මැණික් රත්නයන්ගෙන් ද බොහෝ මල්මාලා දියෙන් ද කප්රුක්ක් අලංකාරව සාදා ඉන් ශාස්තෘන් වහන්සේගේ චෛත්‍යයට පූජා කළේය. ඒ පින්කමේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසැරූ හෙතෙම, මේ බුද්ධෝත්පාදයේ දී මගධ රට මණ්ඩලික රජ පවුලක ඉපිද පියාගේ ඇවෑමෙන් රාජ්‍යයේ පිහිටා කාමයන් හි අතිශයින් ගිජුව, ඇලී වාසය කළේය. මහා කරුණා සමාපත්තියෙන් නැගිට ලොව දෙස බැලූ ශාස්තෘන් වහන්සේගේ ඤාණ දැලට ඔහු හසුවිය. ''ඔහුට කුමක් සිදුවන්නේ ද ? විමසු තථාගතයන් වහන්සේ, ''මෙතෙම මා සමීපයේ දී අසුභ කථාව අසා කාමයන් හි නොඇලුණු සිත් ඇතිව පැවිදි ව, රහත්වන්නේය'' යි දැන අහසින් එතැනට වැඩමවා මේ ගාථාවන්ගෙන් කප්ප රජුට දහම් දෙසුහ.

''නානාකුලමල සම්පුණ්ණා මහා උක්කාරසම්භවෝ
චඤ්චනිකංව පරිපක්කං මහාගණ්ඩෝ මහාවණ්ණෝ.''

''පුබ්බරුහිර සම්පුණ්ණා ගූථකූපෙන ගාළ්හිතෝ
ආපොපගඝරණෝ කායෝ සදා සන්දති පූතිකං''

''සට්ඨී කණ්ඩර සම්බන්ධෝ මංසලෙපනලෙපිතෝ
චම්ම කඤ්චුක සන්නද්ධෝ පූතිකායෝ නිරත්ථකෝ''

''අට්ඨී සංඝාටසටිතෝ නහාරුසුත්ත නිබන්ධනෝ
නෙකෙසං සංගතීභාවා කප්පෙති ඉරියාපථං.''

''ධුවප්පයාතෝ මරණස්ස මච්චුරාජස්ස සන්තිකෙ
ඉධෙව ඡඩ්ඩයිත්වාන යෙනකාමං ගමෝ නරෝ.''

''අවිජ්ජාය නිවුතෝ කායෝ, චතුගන්ථෙන ගන්ථිතෝ,
ඔඝ සංසීදනෝ කායෝ, අනුසයජාලමොත්ථතෝ.''

''පඤ්චනීවරණෙ යුත්තො, චිතක්කෙන සමප්පිතො,
තණ්හාමූලෙනානුගතො මොහඡ්ජනඡාදිතො.''

''එවායං චත්තනී කායො කම්මයන්තෙන යන්තිතො,
සම්පත්ති ච විපත්‍යන්තා, නානාභාවො විපජ්ජති.''

''යෙමං කායං මමායන්ති අන්ධබාලා පුථුජ්ජනා,
වඩ්ඪෙන්ති කටසිං සොරං, ආදියන්ති පුනබ්භවං.''

''යෙමං කායං විවජ්ජෙන්ති ගූථලිත්තංව පන්නගං,
භවමූලං වමිත්වාන පරිනිබ්බායිස්සන්ත්‍යනාසවා.'' ති.

මේ ගාථාවන්ගෙන් අනේක ප්‍රකාර ව තත්ත්වාකාරයෙන් ම ශරීරස්වභාවය දක්වෙන අසුභ කථාව ඇසූ එරජු, තම කය පිළිකුල් කරමින්, අප්‍රියකරමින් හටගත් සංවේගයට පත් සිතින් යුක්තව ශාස්තෘන් වහන්සේට වැන්දේය. වැඳ ''ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් පැවිද්ද ලැබේ නම් මැනවි. උපසම්පදාව ලැබේ නම් මැනවි.'' යි පැවිද්ද ඉල්වීය. ශාස්තෘන් වහන්සේ සමීපයෙහි සිටි භික්ෂුවක් කැඳවා, ''මහණ, යව මොහු පැවිදි උපසම්පදා කර රැගෙන එව'' යි අණකළ සේක. ඒ භික්ෂුව තම පක්ද්වක කර්මස්ථානය දී පැවිදි කරන අවස්ථාවේ ඒ රජතුමා හිසකෙස් බාද්දීම සිවුපිළිසිඹියාපත් මහ රහත් ඵලයට පත්විය.

අපදාන පාළියේ දී කප්ප හිමියෝ මෙසේ වදාළහ.

''මම සිද්ධත්‍ථ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ස්තූපය ඉදිරියෙහි විසිතුරු දුහුල් එල්ලා කප්රුකක් පිදුවෙමි. දිව්‍ය වූ මනුෂ්‍ය වූ ආත්මභාවයන් හි දී මාගේ දොරටුව හොබවමින් කප් රුකක් පිහිටියේය. මම ද මා ඇසුරු කළ සැම ද ඒ කප්රුකින් දුහුල් ගෙන හැන්දෙමු. මෙයින් කල්ප අනූඅහතරකට පෙර යම් කප්රුක් පූජාවක් කළෙම් ද එදා සිට මම දුගතියක නූපන්නෙමි. කප්රුක් දානයේ විපාක මෙබඳුය. මෙයින් සත්වන කල්පයේ සත්රුවනින් හෙබි මහත් බලැති සුචෙල නම් සක්විති රජුව අට වරක් සැප විඳිමි. දැන් මම කෙලෙස් දැවුයෙමි. - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් බවට පත් වූ උන්වහන්සේ උපසම්පදාව ලබා, ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ වැඳ එකක් පසෙක හිඳ, තමා රහත් වූ බව ප්‍රකාශ

කරනු සඳහා බුදුරදුන් මුලදී වදාළ ගාථා දහය ම නැවතත් දේශනා කළහ. එනිසා ම එම ගාථාවන්ට ''කප්ප තෙරගාථා'' නාමය විය.

එම ගාථාවන් හි ''**නානාකුලමල සම්පුණ්ණා**'' නානාකප්‍රකාර අශුචියෙන් මලයෙන් පිරුණු, කෙස්, ලොම් ආදී නානාවිධ අශුචි කොටස්වලින් පිරුණු, ''**මහා උක්කාරසම්භවෝ**'' උක්කාර යනු වැසිකිළිය යි. මවගේ කුසේ හුමාලයෙන් තැම්බූ වැසිකිළියක මෙන් සිට උපදින බැවින් ''මහා උක්කාර''යනු මවුකුස යි. ඒ මවු කුසින් මේ ශරීරය උපන්නේය යන අරුතින්. ''මහා උක්කාර සම්භව'' නම් වේ ''**චඳ්දිකං**'' ඉදුල් දිය, ගැබ්මල් ආදිය දමන ස්ථානයක් බඳු, යමක දණක් පමණ අසුභයන්ගෙන් පිරී පවතී ද එබදු ගවරවලක් බඳු, ''**පරිපක්කං**'' පරණ වූ, පැරණි සැඩොල් ගම් දොරටුවක ශ්‍රීෂ්ම කාලයේ කැපූ වලකට විශාල වැසි බිනු ඇති මහා වැස්සක් වැටී මෙන් මුළු ගමේම වූ මළමුත්‍ර, ඇට, සම්, නහර, කෙළ, සෙම් සොටු ආදී නානාප්‍රකාර කුණුප දිය පහරින් ගසා ගෙන ගොස්, මඩ මිශ්‍ර වතුර සමඟ දින කිහිපයක් පැසීමෙන්, මී මැසි මඳුරු පණු ආදීන්ගෙන් පිරීගිය, සුර්යතාපයෙන් තැවී පැසී ගිය, මතුපිට පෙන බුබුළු පිරි, ඉතා තද කළු පාටින් යුතු, අතිශය දුගඳ හමන, පිළිකුල් වූ ගවරවළක් බඳුය.'' යන අදහසයි. එසේම දුක්ගෙනදෙන හුලක් බඳුවූ, අශුචි වැගිරෙන බැවින් ද ජරාමරණ උපදවන බැවින් ද ඉදිමෙන, පැසෙන, බිඳියන ස්වභාව ඇති බැවින් ද මහත් ගඬුවක් වැනි වූ මේ කය ''**මහාගණ්ඩෝ**'' මහා තුවාලයකි. සෑම තැනකම දුක් වේදනා ගෙනදෙන ගඬුවලින් පිරි, අශුචි වැගිරෙන මහත් වණයක් බඳුය ''**මහාවණෝ**'' වර්චස්වලින් යුතු ''**ගූථකුපෙන ගාළ්හිතෝ**'' නැතහොත් අශුචි වැගිරෙන, ''**ගූථ කුපෙ නිබාහිතෝ**'' යන පාඨය ද යෙදේ. ''**අශුචිවලින් නික්මෙන**'' යන අර්ථය එහි ඇත. ''**ආපෝ පඨාරණෝ කායෝ සදා සන්දති පූතිකං**'' මේ කය ආපොධාතුව නිසා සැමදාම වැගිරෙයි. කිසි දිනෙක පවිත්‍ර දේ නොවැගිරෙයි. ''සට්ඨිකණ්ඩරසම්බන්ධෝ'' බෙල්ලෙ උඩ සිට ශරීරය පුරාම පැතිරී ගිය, පුර්ව, පශ්චිම, දකුණු, වම් යන පැති සතරේ පහ පහ බැගින් වූ නහර සතලිසකි. මෙසේ සැට කඩකට බෙදීගිය සැටක් මහනහරින් මුලු ශරීරයම වෙලී පවතී ''**සට්ඨිකණ්ඩරසමන්ධෝ**'' නම් වේ. ''**මංස ලෙපන ලෙපිතෝ**'' මංස, මස් නම් බදාම තවරන ලද. නවසීයක් මස් පෙති වලින් තවරන ලද ''**චම්මක කඤ්චුක සන්නද්ධෝ**'' සම නම් කඤ්චුකයෙන් සර්ව ප්‍රකාරයෙන්ම, වටකර වසන ලද්දේය. ''**පූතිකායෝ**'' සෑම ආකාරයෙන්ම කුණු ගඳ ඇති කය ''**නිරත්ථකෝ**'' ප්‍රයෝජනයක් නැත. අනිකුත් සතුන්ගේ ශරීරයේ සම් ආදී ද්‍රව්‍ය ඉතා ප්‍රයෝජනවත් වන නමුත් මිනිස් ශරීරයේ කිසිවක්

ප්‍රයෝජනයට නොගනියි. ''**අයිසංඛාරසිතෝ**'' අතිරේක වූ තුන්සියයක් ඇට වලින් එකට බැඳි සම්බන්ධ කරන ලද ''**නහාරූ සුත්තනිබන්ධනෝ**'' නූල් වැනි නවසියයක් නහර වලින් පෙලනා ලද ''**නෙකෙසං සංගතිභාවා**'' සිවු මහා භූත, ජීවිතින්ද්‍රිය, ආශ්වාස, ප්‍රාශ්වාස, විඤ්ඤාණයේ එක්වීමෙන්, ඒකරාශිවීමෙන් සම්බන්ධ වී නූල් යෙදී ක්‍රියා කරන යන්ත්‍රයක් මෙන් සිටීම් ආදී ඉරියවු පවත්වයි. ''**ධුවභයානෝ මරණස්ස**'' මරණය සඳහාම ඒකාන්ත වූ ගමන් ඇති, උපතේ පටන් මරණය කරා නිරතුරුව පැමිණෙන ඒ මෘත්‍යුරාජ නම් මරණය සමීපයේ සිටී. ''**ඉධෙවඡඩ්ඩියිත්වාන**''මේ ලෝකයේ ම කය හැරදමා තමා කැමති ස්ථානයකට මේ සත්ත්වයා ගමන් කරයි. කය මෙහි ම හැර දමා යන බැවින් මේ කය සමඟ එක්වීමක් නොකළ යුතුයි. ''**අවිජ්ජාය නිවුතෝ**''අවිද්‍යා නීවරණයෙන් වැසුණු , වෙලීගත් ''ඒ අවිද්‍යාව නිසාම මේ කයට සත්ත්වයා ඇලී පවතියි'' යන අදහසයි. ''**චතුගන්ථන**'' අභිධ්‍යාව ආදී කය පිළිබඳ දැඩි ඇල්ම ප්‍රමුඛ සිවුවැදරුම් ග්‍රන්ථයන්ගෙන් වෙලීගත්, වෙලාගැනීම් වශයෙන් ශරීරය දැඩිවගත්, ''**ඕඝසංසිදනෝ**'' කාමාදී සිවු ඕඝයන්හි ගැලුණු, බැසගත්, ප්‍රහීණ නොවී සත්ත්ව සන්තානයේ ඇලී පැවතීම් හේතුවෙන් කාමරාගාදිය ''**අනුසය**'' නම් වේ. ඒ අනුසය දැලින් මැඩගත්, අභිභවනය කළ බැවින්, ''**අනුසයජාලමොත්ථනෝ**'' මෙහි 'ම' කාරය පදසන්ධි කරන්නකි. ගාථාව සුබෝවිචාරණය පිණිස දීර්ඝ කරන ලදී. ''**පඤ්චනීවරණෙ යුත්තෝ**'' කාමච්ඡන්ද ආදී පස් වැදරුම් නීවරණ ධර්මයන්ගෙන් යුක්තව, මෙය කරණාර්ථයේ සත්තමී විභක්ති පදයකි. කාමවිතර්කාදී මිත්‍යා විතර්කවලින් යුක්ත වූ, ''**විතක්කෙන සමප්පිතෝ,**'' ''**තණ්හාමූලෙනානුගතෝ**'' තණ්හාව නම් භවමූලයෙන් ලුහුබැඳ ගත්, ''**මොහවජ්ජනජාදිතෝ**'' මෝහ නම් පියනින් වසන ලද, මේ සියලුම විඤ්ඤාණ සහිත කරජ කාය සඳහා මෙය කියන ලදී, ආත්මභාවය සවිඤ්ඤාණික වූවක් මය. ''මහණෙනි, සිඳ දැමූ භවයන්ට පැමිණවීම් ඇති තථාගත ශ්‍රී ශරීරය මෙහි සිටියි. මේ කය මය, නාමරූප බාහිර ධර්ම වේ,'' ආදියෙහි ආත්මභාවයට ''කාය'' නම යෙදේ, ''**එවායං වත්තනි කායෝ**'' නොයෙක් කුණුපයන්ගෙන් සම්පූර්ණ වූ ද අවිද්‍යාවෙන් වැසුණා වූ ද ආදී වශයෙන් ඉහත පැවසු ලෙස මේ කය පවතියි. මෙසේ මේ කය පවතියි, ක්ෂේම නම් නිවණට යා නොදී, යෑමට නොහැකියේ හකුළුවයි. සුගති දුගති වලම උපදවමින් සසර පැවැත්ම ඇතිකරයි. ''**සම්පත්ති ච විපත්තඤ්ඤා**'' මෙහි යම් සම්පත්තියක් වේ නම් එය විපත් කෙළවර කර ඇත. සියලු යෞවනභාවයන් ජරාව කෙළවර කර ගෙන ඇත. සියලු ම නිරෝගිකම ව්‍යාධිය, ලෙඩවීම අවසර කර ඇත. සියලු ම ජීවිත මරණය කෙළවර කර ඇත. සෑම එක් වීමක් ම වෙන්වීමකින් අවසන් වේ. එනිසා ''**නනාභාවො**

විපජ්ජති'' යැයි කියන ලදී. නානාභාව නම් වෙනස් වීමයි, විප්‍රයෝගය යි. එය කිසිකලෙක ''වෙන්වන'' පුද්ගල වශයෙන් ද කිසිකලෙක ''වෙන්වියයුතු'' වශයෙන් ද යනාදී ලෙස විවිධතාවයට පැමිණේ. ''**යෙ මං කායං මමා යන්ති**,'' අදබාල පුහුදුන් පුද්ගලයෝ මෙසේ අසුභ වූ අනිත්‍ය වූ, අස්ථිර වූ, දුක්ගෙන දෙන, නිසරු, මේ ශරීරය ''මෙය මාගේය'' මමායනය කර ගනිමින් ඡන්දරාගය උපදවති, ජාති වශයෙන් සෝර භයානක වූ, අනුවණයන් විසින් ඇලියයුතුහෙයින් ''සොහොන'' නම් වූ සසරට නැවත නැවත ඉපිද මැරීම් වශයෙන් පැමිණෙති. සසර වර්ධනය කර ගනිති. ''**ආදියන්ති පුනබ්භවං**'' යි එනිසා කියන ලදී. ''**යෙමං කායං විවජ්ජෙන්ති ගුථලිත්තංව පන්නගං**'' යම් සැප කැමති, ජීවත්වනු කැමති පුරුෂයකු අසුචි වැකුණු සර්පයකු දැක, උෂ්ණ ඉතා පිළිකුල් බැවින් ද අතිශය භය උපදවන බැවින් ද දුරින් ම දුරු කරන්නේ ද, එමෙන් ම පණ්ඩිත කුලපුත්‍රයෝ අශුචි භාවයෙන් පිළිකුල් සහගතවූ ද අනිත්‍යභාවයෙන් බිය සහිතවූ ද මේ කය දුරුකරති. කය පිළිබඳව ඇති ඡන්දරාගය ප්‍රහාණය කරති. ඔවුහු සසරට මුල් වූ අවිද්‍යාව, භව තණ්හාව වමාරා, නැතිකර, අතිශයින් ම දුරුකර, ඒ නිසාම සර්වප්‍රකාරයෙන් ම ආශ්‍රව රහිත වූ සෝපාදිසේස හා අනුපාදිසේස නිර්වාණධාතූන්ගෙන් පිරිනිවෙන්නෝ වෙති.

කප්ප තේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.1.6

''**විචිත්තං අජ්ජ නිග්ඝොසං**'' යනු ආයුෂ්මත් උපසේන තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. ඒවායේ උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ සමයේ දී හංසවතී නුවර, කුලගෙයක ඉපිද, තරුණවියට පැමිණ ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ දහම් ඇසුහ. දිනක් ඔහු ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් සෑම ආකාරයෙන් ම සතුට ගෙනදෙන (සමන්ත පාසාදික) තෙරවරුන්ගෙන් අග්‍රභාවයට පත්කරනු දැක, ඒ සඳහා ප්‍රාර්ථනා කර බුදුරජාණන් වහන්සේගෙන් විවරණ ලැබ, දිවි ඇතිතාක් පින් දහම් රැස්කරමින්, දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා පැමිණ, මේ බුද්ධෝත්පාද කාලයේ දී නාල ග්‍රාමයේ රූපසාරී බැමිණියගේ කුස උපන්නේය. ඔහු උපසේන නම් විය. වැඩිවියට පත් උපසේන කුමරු ත්‍රිවේද පාරගතව, දිනක් ශාස්තෘන් වහන්සේගෙන් දහම් අසා, ලැබූ ශ්‍රද්ධා ඇතිව පැවිදි විය. උපසම්පදා වී එක් වස් ඇති උපසේන

හිමියෝ., ''ආර්ය ගැබ වඩන්නෙමි'' යි තවත් භික්ෂුවක් උපසම්පදා කරවා ගෙන, උන්වහන්සේ සමඟ ශාස්තෘන් වහන්සේ බැහැදැකීමට ගියහ. ශාස්තෘන් වහන්සේ උපසේන හිමි එක් වස් ඇති ව උපසම්පදා කරගත් භික්ෂුව සද්ධිවිහාරික බව අසා ''හිස් පුරුෂය, යම් මේ පිරිස් බැඳ ගැනීම නම් වූ බහුලභාවයක් වේද, ඒ පිරිස් පිරිවරා ගැනීමට නුඹ ඉනා ඉක්මණින් වැටුනෙහිය'' යනුවෙන් ගැරහූ සේක.

දැන් මම යම් පුද්ගලයකු නිසා ශාස්තෘන් වහන්සේගේ ගැරහීමට ලක්වූයෙමි ද ඒ පුද්ගලයා නිසා ම ශාස්තෘ ප්‍රසාදය ලබාගන්නෙමි'' යි අධිෂ්ඨාන කරගත් උපසේන හිමියෝ., විදසුන් වඩා නොබෝ කලකින් ම රහත් වූහ.

අපදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''කඳුපාමුලක වැඩ හුන් මනුෂ්‍යත් අතර උත්තම වූ ලෝකජ්‍යේෂ්ඨ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වෙත මම එළඹුනෙමි. මනාව පිපුණු කිණිහිරි මලක් දුටු මම එය නටුවෙන් කඩාගෙන, ඒ මලින් ඡත්‍රය අලංකාර කර එය ශාස්තෘන් වහන්සේට දරුවෙමි. සුන්දර රසවත් ආහාරයක් ද පූජාකළෙමි. ඒ පිණ්ඩාපාත දානයෙන් කරගත්තා වූ, අග්‍ර පුද්ගල වූ මහාවීර වූ බුදුපියාණන් වහන්සේ මා හට පුණ්‍යානුමෝදනා කළසේක.''

''මෙම ඡත්‍ර දානය ද ආහාර දානය ද හේතු කරගෙන, එම චිත්ත ප්‍රසාදය ද නිසා මෙතෙම කාම සම්පත් අනුභව කරන්නේ ය. සතිස් වරක් ශක්‍රදේවේන්‍රයා උපදින්නේ ය. සක්විති රජ ව විසිඑක් වරක් උපදින ලක්ෂයකට පසුව ඔක්කාක වංශයේ උපදින ගෞතම නම් ශාස්තෘන් වහන්සේගේ සසුන බබළන මෙතෙම, උන්වහන්සේගේ ධර්මයට දායාද වූ, ධර්මයෙන් නිර්මිත වූ උපසේන නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.''

''මෙය මාගේ අවසාන ආත්මභාවයයි. සියලු භව නැසුවෙමි. සේනා සහිත මාරයා ජයගෙන අන්තිම ශරීරය දරමි. දැන් මම සියලු කෙලෙස් දුවුයෙමි - පෙ - බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව ඉටුකළෙමි.''

රහත් උපසේන හිමියෝ තනිව ම සියලු ධුතාංග ධර්ම සමාදන්වූහ. අන්‍ය භික්ෂූන් ද සඳහා යොමුකර වූහ. එනිසා භාග්‍යවතුන් වහන්සේ උපසේන මහ රහතන් වහන්සේ, සමන්තපාසාදික භික්ෂූන්ගෙන් අග්‍රභාවයට පත් කළ සේක. ඊට පසුකාලයක දී කොසඹෑනුවර කලහය ඇති වී භික්ෂු සංඝයා දෙකඩ වූ කල්හි., එක් භික්ෂුවක් විසින් ඒ කලහය වර්ජනය කරනු

කැමැත්තෙන්, ''දැන් මේ සංඝයා භේද කරන කළහය ඉපදුණි. මවිසින් කෙසේ පිළිපැදිය යුත්තෙත් ද ?'' යි විචාරන ලද්දේ, උපසේන හිමියෝ විවේකවාසයේ සිට ඔහු පිළිපැදිය යුතු අයුරු ප්‍රකාශ කරමින් මේ ගාථා වදාළහ.

''විවිත්තං අප්පනිඝොසං වාළමිගනිසෙවිතං
සෙවෙ සෙනාසනං භික්ඛු පටිසල්ලාන කාරණා.''

''සංකාර පූඤ්ජා ආහත්වා සුසානා රථියාහි ච
තතො සංඝාටිකං කත්වා එළබං ධාරෙය්‍ය චීවරං.''

''නීචං මනං කරිත්වාන සපදානං කුලාකුලං
පිණ්ඩිකාය චරෙ භික්ඛු ගුත්තද්වාරො සුසංවුතො.''

''එළෙන පිච සන්තුසෙ, නා ඤඤං පත්ථෙ රසං බහුං
රසෙසු අනුගිද්ධස්ස ඣානෙ න රමතී මනො.''

''අප්පිච්ඡො චෙව සන්තුට්ඨෝ පවි විත්තෙ වසෙ මුනි
අසංසට්ඨෝ ගහට්ඨෙහි අනාගාරෙහිචූභයං.''

''යථා ජළොව මූගෝ ච අත්තානං දස්සයෙ තථා
නාතිවෙලං පභාසෙය්‍ය සංඝමජ්ඣම්හි පණ්ඩිතෝ.''

''නසෝ උපවදෙ කඤ්චි උපඝාතං විවජ්ජයෙ,
සංවුතෝ පාතිමොක්ඛස්මිං මත්තඤ්ඤූ චස්ස භොජනෙ.''

''සුගාහිත නිමිත්තස්ස සො චිත්තස්සුප්පාද කොවිදෝ
සමථං අනුයුඤ්ජෙය්‍ය කාලෙන ච විපස්සනං.''

''විරියඝාතවව සම්පන්නෝ යුත්තයොගෝ සදා සියා
න ච අප්පත්වා දුක්ඛන්තං විස්සාසං එය්‍ය පණ්ඩිතෝ.''

''එවං විහරමානස්ස සුද්ධිකාමස්ස භික්ඛුනෝ
බියන්ති ආසවා සබ්බෙ නිබ්බුතිඤ්ඣාධිගච්ඡති.'' **නී.**

එහි ''**විවිත්තං**'' යනු ජනශූන්‍ය, ජනයාගෙන්තොර ආරණ්‍යාදිය. ''**අප්පනිඝොසං**'' නිශ්ශබ්ද, ශබ්ද ගැටීම් රහිත, ''**වාළමිගනිසෙවිතං**''

සීහව්‍යග්ඝාදී චණ්ඩ සිවුපාවුන් ගැවෙසෙන මේ ප්‍රකාශයෙන් ද ජනශූන්‍ය බව ම දක්වයි. වනසෙනසුනක් බව දක්වයි. ''**සෙනාසනං**'' නිදාගැනීමට, වාසයට සුදුසු වූ වාසස්ථානයක් වූ සෙනසුන යක අරුනින් ''**පටිසල්ලානකාරණා**'' යන්න යෙදේ, පටිසල්ලාන යනු සිත නානාවිධ අරමුණු කරා යෑම නවත්වා, සිත භාවනා වෙහිම මනාව යෙදවීමට සමත් පරිසරයි. මෙසේ සෙනසුන භාවනාවට ඉතා යෝග්‍ය බව දක්වා අනතුරුව චීවරාදී ප්‍රත්‍ය ලබන අයුරු ''සංකාරපුඤ්ජා'' යනුවෙන් දක්වන ලදී. එහි කසල එකතුවන ස්ථානය ''**සංකාරපුඤ්ජා**'' නම් වේ. හෙවත් කසළ ගොඩයි. ඒ කසළ ගොඩින් ''**ආහච්ච**'' ගෙනවුත්, ''**තතො**'' එසේ රැගෙන ආ රෙදි කඩින්. මේ කරණාර්ථයේ පංචමී විභක්ති වචනයකි. ''**එඛං**'' සහට එඛ, රජන එඛා දී වශයෙන් රූක්ෂ වූ, චර්ණවත් මටසිලිටි නොවූ ''ධාරෙය්‍ය'' හැඳීම් පෙරවීම් වශයෙන් පරිහරණය කරන්නේ ය. මේ ගාථාවෙන් චීවර පිළිබඳ තෘප්තිමත් භාවය පළකරයි.

''**නීචං මනං කරිත්වාන**'' යනු ''මහණෙනි, මේ ශාසනයේ ජීවත්වන්නෝ ශාන්තය'' ආදී වශයෙන් දෙසූ සුගතාවවාද සිහිකර, මාන දර්ප නැති කළ සිතින් ''**සපදානං**'' ගෙයක්, ගෙයක් පාසා ගෙවල් අත්නොහැර එනිසා ''**කුලාකුලං**'' යි කියන ලදී. ගෙපිළිවෙලින්, කුල අනුපිළිවෙලින්, කුලයෙන් කුලයට ''**පිණ්ඩිකාය**'' මිශ්‍ර වූ භික්ෂාව මේ ප්‍රකාශයෙන් පිණ්ඩපාතයෙන් සන්තෝෂ වන බව දක්විණි. ''ගුත්තද්වාරෝ'' මනාව සංවර කරගත් ඇස ආදී ඉඳුරන් ඇතිව, ''**සුසංවුතො**''අන් කුකුස් ආදිය නොමැති හෙයින් මනාව යටපත් කළ, සුසංයත වූ. ''**එඛෙනපි වා**'' ''**අපි**'' ශබ්දය සමුච්චාර්ථයේ යෙදේ. ''**වා**'' විකල්පාර්ථයේ යෙදේ. දෙවෑදරුම් රූක්ෂ ප්‍රතිපාදාවෙන් ද අල්ප වූ ද අසුභ වූ ද සෑම සන්තෝෂයකින් ම එකසේ මනාව සතුටුවන්නේ ය. එනිසා ''**නාඤ්ඤං පතෙ රසබ්‍රූහං**'' යි කියන ලදී. තමාට ලැබුණු දෙයින් තුටුවේ, වෙනත් මිහිරි රසවත් බොහෝ ප්‍රණීතාහාර පාන නො පතන්නේය, කැමති නො වන්නේය, මෙයින් ගිලානපච්චය පිළිබඳ සන්තෝෂය දක්වන ලදී. රසයන් හි නොඇලීමට හේතුව ''රසෙසු අනුගිද්ධස්‍ස ඣානෙ න රමතී මනො'' යි දක්වේ. රසයන් හි ගිජුවුවහුට හෙවත් ඉන්ද්‍රිය සංවරයක් නොමැති පුද්ගලයාට චිත්ත සමාධියක් කොයින් ද ? යන අදහසයි. මෙසේ සිවුපසයෙහි කෙලෙස් ලියා දමන පිළිවෙත දක්වා, පසුව ඉතිරි වූ කථාවස්තුව දක්වීමට ''**අජ්ඣෙොගාහෙව**'' යනාදී ගාථා කියන ලදී. එහි ''**අජ්ඣෙොගා**'' යනු කැමැත්තක් නැතිව, අල්පේච්ඡව, ප්‍රත්‍ය පිළිබඳව ආශාරහිතව, එයින් සිවු වැදරුම් තණ්හාව ඉපදීමේ හේතු විෂ්කම්භනය කිරීම දක්විණි. ''**සන්තුට්ඨෙ**'' සිවු පසයෙහි යථාලාභ (ලැබූ පරිදි සතුටුවීම) සන්තෝෂාදියෙන් සතුටුව.

එහිදී

''අතීතං නානුසොචෙය්‍ය නප්පජප්පෙය්‍යනාගතං
පච්චුප්පන්නෙන යාපෙය්‍ය සො සන්තුට්ඨොති පවුච්චති.'' ති.

යනුවෙන් සන්තෝෂයෙන් යුතු භික්ෂුව අතීතය පිළිබඳව ශෝක නොකරයි, අනාගතය පිළිබඳ සංකල්ප ගොඩනොනඟයි, වත්මනෙහි පමණක් යැපේ, වත්මන පමණක් දිවිගෙවන්නේ ය.

''**පවිවිත්තෙහා**'' සමූහ සාකච්ඡාවලින් දුරුව, කායික විවේකයෙන් යුතුව, හුදකලාව චිත්ත විවේකයෙන් යුතුව. ''**වසෙ**'' යන්න සෑම පදයකට ම යෙදිය යුතුයි. හුදකලාව තනිව සිටීමින් මොනෙය්‍ය **ප්‍රතිපදාව** ගෙනයන්නා ''මුනි'' නම් වේ, ''**අසංසට්ඨො**'' දර්ශන, ශ්‍රවණ, සතුටු සාමීචි කථාව, එක්ව කිරීම ආදී වශයෙන් කාය සංසර්ග නොමැති බැවින් සම්බන්ධ නොවූ, සංසර්ග එක්වීම් රහිත වූ, ''**උභයං**'' ගිහි, පැවිදි දෙපිරිසෙන්ම වෙන්ව, අමිශ්‍රව, මෙය කරණාර්ථයේ ප්‍රථමා විභක්ති වචනයකි. ''**අත්තානං දස්සයෙ තථා**'' ජඩ නොවූ, ගොළු නොවූ තමා ජඩවුවෙකු, ගොළුවූවකු මෙන් දක්වන්නේ ය. මෙයින් උඩඟු බව දුරුකිරීම පැවසුණි, ''ජළො ච මුගොව'' යනුවෙන් ගාථාව සුඛෝච්චාරණය සඳහා හ්‍රස්ව කරන ලදී. 'ව' ශබ්දය සමුච්චයාර්ථයේ යෙදේ. ''**නාතිවෙලං පභාසෙය්‍ය**'' වැඩිවේලාවක්, පමණ ඉක්මවා කථා නො කරන්නේ ය. මඳ කථා ඇත. පමණ දැන කථා කරයි. ''**සංඝමජ්ඣම්හි**'' භික්ෂු සංඝයා හෝ සමූහයක් මැද, ''**න සො උපවදෙ කඤ්චි**'' මේ දැක්වූ පිළිවෙත් සහිත භික්ෂුව තමාට වඩා පහත් වූ හෝ සම වූ හෝ උසස් වූ හෝ කිසිවෙකුට ආක්‍රෝශ පරිභව නො කරන්නේ ය. ''**උපඝාතං විවජ්ජයෙ**'' කියන් අනුන්ට හිංසා පීඩා කිරීම් දුරුකරන්නේය. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් සංවරව වෙසේ, ''**සංවුතො පාතිමොක්ඛස්මිං**'' කායවාග් සංවර භාවයෙන් යුතුවේ. ''**මනාකඤ්ච භොජනෙ**'' සෙවීම්, පිළිගැනීම්, පරිභෝගකිරීම් හා අත්හැරීම් යන සෑම කාර්යකදීම භෝජනයේ, ආහාරයේ පමණ දන්නේ වේ. ''**පඟහිත නිමිත්තස්ස**'' මෙසේ සිහිකරන මාගේ සිත සමාධිගත විය. තම පිළිවෙත් මඟ සලකා බලමින්, මනාව ගත් සමාධි නිමිත්ත ඇත්තේ වේ. ''පඟහිත නිමිත්තොසො'' යන පාඨය ද සුදුසුය. ''යමෙක් වේ ද ඔහු'' යන අර්ථය යි. ''**චිත්ත සුසුපාදකොච්දො**'' මෙසේ වඩනා ලද සිත හෘජු වූ සංවර වූ සිතෙහි ධම්මවිචය, විරිය, පීති යන බොජ්ඣංග ධර්ම වැඩිය යුතුයි. ඉන්පසු පස්සද්ධිය ඇතිවේ. ඉන්පසු සමාධි, උපේක්ෂා යන බොජ්ඣංග දහම් වැඩීම ද සැමදා කැමතිවිය යුතුයි.

භාග්‍යවතුන් වහන්සේ එනිසා මෙසේ වදාළසේක. ''මහණෙනි යම් සමයක සිත පිරිසිදු වේ ද එ සමයේ දී මේ ධර්මවිචය **සම්බොජ්ඣංගය** වැඩීමට සුදුසුය'' ආදී වශයෙනි. ''**සමථං අනුයුඤ්ජේය්‍ය,**'' සමථ භාවනාව වඩන්නේය. නුපත් සමාධිය සිතේ උපදවන්නේය. උපන් සමාධිය, සිතෙහි වසඟභාවයට පත්වන තෙක්ම වැඩිය යුතුය. වර්ධනය කළ යුතුය. ''**කාලෙව විපස්සනං**'' මෙසේ ලද සමාධියට, තෘෂ්ණාවසඟ වීමෙන් පිරිහීමට යන්නේ ද මධ්‍යස්ථව සිටින්නේ ද නියුණු අවබෝධයට ද නොපැමිණ සුදුසු කාලයේ දී විදර්ශනා භාවනාව වඩන්නේය. නැත හොත් සුදුසු කාලයේ දී විදර්ශනාව ද සමථය ද වඩන්නේය. එහි ස්ථිරවන අවස්ථාවෙහි නොහැකිලී ආර්ය මාර්ගාවබෝධය සඳහා විදර්ශනාව වඩන්නේය. ඒ සඳහා මෙය කියන ලදී.

''අථවා සමාධිලාභෙන විචිත්තසයනෙන වා
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං'' තී.

සිත සමාධිගත කර ගැනීමෙන් හෝ නිදාගැනීමෙන් වෙන් වී ජාගරියානුයෝගයෙන් හෝ භික්ෂුව විශ්වාසයට නොපැමිණේ ද ඒ දක්වා නිවණට නොපැමිණියේ වේ. එනිසා ''**විරිය සාතච්චසම්පත්තෙහා**'' යි කියන ලදී. නිතර ම, නිරන්තර ව වීර්යයෙන් යුක්ත වූයේ, නිතර ඔසවා තැබූ වීර්ය ඇතිව, ''**යුත්තයොගො සදා සියා**'' සියලු කාලයෙහි ම භාවනාවේ යෙදී යන අර්ථයයි. ''**දුක්ඛන්තං**'' සංසාර දුකෙහි අන්තය, කෙළවර, නිරෝධයට, නිවණට නොපැමිණ විශ්වාසයට නො පැමිණෙන්නේ ය, නො යන්නේ ය, මම ඉතා පිරිසිදු සිල් ඇතිව, ධ්‍යානලාභීව, අභිඥා උපදවාගෙන විදර්ශනාව මස්තකප්‍රාප්ත කරගෙන සිටියෙමි, විශ්වාස කළයුතු පුද්ගලයෙක් නොවේ ද ?'' යන අදහසයි. ''**එවං විහරමානස්ස**'' සෙනසුන් ආදියේ නො ඇලී සිතින් සිවුපසය පරිභෝග කරමින්, විදර්ශනාව වැඩීමෙහි යෙදීමෙන් නිවන් දැක, කළයුතු දේ කොට නිමවූ මාහට ''**සුද්ධිකාමස්ස**'' ඤාණදර්ශන විශුද්ධියට, අතිශයින් පිරිසිදු වූ නිවණට, අර්හත් ගේ ''**ආසවා**'' කාමාදී සියලු ආශ්‍රවයෝ ''**ඛීයන්ති**'' ක්ෂය වෙති, ගෙවීයති, ඒ ආශ්‍රව පැමිණේ. නිර්වාණය අවබෝධ කර ගනියි. මෙසේ උපසේන තෙරණුවෝ, ඒ ප්‍රශ්න ඇසූ භික්ෂුවට අවවාද දීම් වශයෙන් තමා විසින් අනුගත පිළිවෙත් මඟ දක්වමින් සිය රහත්භාවය ප්‍රකාශ කළහ.

උපසේන ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

10.1.7

''විජානෙය්‍ය සකං අත්ථං'' යනු ආයුෂ්මත් අපර ගෝතම තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදුවී ද ? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි තැබූ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙර දී ම සැවැත් නුවර උසස් බමුණු කුලයක ඉපිද නිසිවියට පත් හෙතෙම ත්‍රිවේද පාරගතව, වාද මාර්ගයක් මනාව ඉගෙන එහි කෙළවරට ම ගියේ ය. තමා හා වාද කිරීමට සමත් කිසිවෙක් නො ලබමින් ඒ ඒ තැන වාද විවාද කථාවෙහි යෙදී වාසය කරන සමයෙහි, අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව, දම්සක් දෙසුම් පවත්වා අනුපිළිවෙලින් යස ආදීන් හික්මවූසේක්, අනේපිඬු සිටුනුගේ ඇරයුමෙන් සැවැත් නුවරට වැඩම කළසේක. එදා ජේතවනාරාමය පිළිගන්නා උත්සවයට සම්බන්ධ වූ මේ බමුණා බුදුසිරි දැක පැහැදී ශාස්තෘන් වහනසේගේ ධර්ම දේශනාවක් අසා ලැබූ ශ්‍රද්ධාවෙන් පැවිදි වීමට අවසර ඉල්ලීය. ශාස්තෘන් වහන්සේ එක් පිණ්ඩපාතික භික්ෂුවක් කැඳවා, ''මහණ, මොහු පැවිදි කරවන්නැයි වදාළ සේක. පිණ්ඩපාතික භික්ෂුව විසින් පැවිදි කරනු ලැබූ ඒ බමුණා, හිස කෙස් බාද්දීම රහත් විය. පැවිදි ව කෝසල ජනපදයට වැඩම කළහ. උන්වහන්සේගේ බොහෝ ඤාතීහු සමීපයට පැමිණ, ''මේ ලෝකයේ සංසාරික ශුද්ධිය පෙන්වන ඉගැන්වීම් දක්වන බ්‍රාහ්මණයෝ බොහෝ වෙති. ඔවුන් අතුරින් නෛර්යාණික වූයේත් පිළිපැදීමෙන් සංසාරික ශුද්ධිය ලැබෙන්නෙත් කාගේ වාදයෙන් ද ? යි විමසුහ. තෙරණුවෝ ඔවුන්ගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මේ ගාථාවන් වදාළහ.

''විජානෙය්‍ය සකං අත්ථං, අවලොකෙය්‍යාථ පාවචනං
යඤ්හවත්‍ථ අස්‍ස පතිරූපං සාමඤ්ඤං අජ්ඣුපගතස්‍ස.''

''මිත්තං ඉධ කල්‍යාණං සික්ඛා විපුලං සමාදානං
සුස්සූසා ච ගරූනං, එතං සමණස්‍ස පතිරූපං.''

''බුද්ධෙසු ච සගාරවතා ධම්මෙ ච යථාභූතං
සංඝෙ ච චිත්තීකාරෝ එතං සථ්‍යස්‍ස පතිරූපං.''

''ආචාරගොචරෙ යුත්තෝ ආජීවෝ සොධිතෝ අගාරෙහි
චිත්තස්‍ස සණ්ඨපනං, එතං සමණස්‍ස පතිරූපං.''

''චාරිත්තං අථ වාරිත්තං ඉරියාපථියං පසාදනීයං
අධිවිත්තෙ ච ආයොගො, එතං සමණස්ස පතිරූපං.''

ආරඤ්ඤකානි සෙනාසනානි පන්තානි අප්පසද්දානි
භජිතබ්බානි මුනිනා, එතං සමණස්ස පතිරූපං.''

''සීලඤ්ච බාහුසච්චඤ්ච ධම්මානං පවිචයෝ යථාභූතං
සච්චානං අභිසමයෝ, එතං සමණස්ස පතිරූපං''

''භාවයෙ අනිච්චන්ති අනත්තසඤ්ඤං අසුභ සඤ්ඤඤ්ච
ලොකසම්ඤ්ච අනභිරතිං, එතං සමණස්ස පතිරූපං''

''භාවෙය්‍ය ච බොජ්ඣංගෙ ඉද්ධිපාදානි ඉන්‍රිය බලානි
අධ්‍යාගමගාවරියං, එතං සමණස්ස පතිරූපං.''

''තණ්හං පජහෙය්‍ය මුනි සමූලකෙ ආසවෙ පදාළෙය්‍ය,
විහරෙය්‍ය විප්පමුත්තො, එතං සමණස්ස පතිරූපං.''

එහි ''විඤ්ඤෙය්‍ය සකං අත්ථං'' නුවණැති පුරුෂයා තමාගේ යහපත යථා ස්වභාවයෙන් විමසා දැනගන්නේ ය. විමසා දැන ''අවලොකෙය්‍යාථ **පාවචනං**''මේ ලෝකයේ බොහෝ වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් කියන ලද ඉගැන්වීම් දර්ශනවාද අතරින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්මය ''පාවචන'' නම් වේ. එහි නෛර්යාණික වූ යමක් වේද එය ප්‍රඥා ඇසින් බලන්නේ ය, දකින්නේ ය, සෙසු නානාතීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණයෝ අනිත්‍ය වූ වෙහි නිත්‍ය සංඥාව ද අනාත්ම වූ වෙහි ආත්ම සංඥාව ද අශුද්ධි මාර්ගයක් ම ශුද්ධි මාර්ගයක් ම ශුද්ධි මාර්ගයැයි ගෙන මිසදිටු බව නිසා ඔවුනොවුන්ට විරුද්ධව ක්‍රියාකරති. එනිසා ඔවුන්ගේ වාද නෛර්යාණික නොවේ. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහී ''සියලු සංස්කාර අනිත්‍යය, සියලු ධර්ම අනාත්මය, නිර්වාණය ශාන්තය'' යනුවෙන් තමන්වහන්සේ ම සිය නුවණින් තත්ත්‍වාකාරයෙන් දැන දේශනා කරති. එනිසා උන්වහන්සේගේ ඉගැන්වීම, ''නිවණම අවබෝධ කරවන්නකි'' යි ශාස්තෘ අනුශාසනාවම ගෞරවයෙන් පිළිගත යුත්තේය යන අදහසයි. ''**යං වෙජ්ජ අස්ස පතිරූපං සාමඤ්ඤං අජ්ඣුපගතස්ස**'' ශ්‍රමණබව, පැවිද්ද, මහණකම සඳහා එළඹී කුලපුත්‍රයාට මේ බුද්ධශාසනයේ දී කළයුතු සුදුසු වූ යෝග්‍ය වූ සාරූප්‍ය වූ කැප වූ දෙය බලන්නේ ය. ''ඒ කැපසරුප් කටයුතු මොනවා ද ? යන්න ඉන්පසු ගාථාවන් හි විස්තර වේ.

''**මිත්තං ඉධ කල්‍යාණං**'' මේ ශාසනයේ කල්‍යාණමිත්‍ර ආශ්‍රය ශ්‍රමණයාට ඉතා සුදුසුවූවකි. මේ න්‍යාය අන්‍ය පදවලට යෙදේ. කලණ මිතුරා නිසා අකුසල් දුරුවේ. කුසල් වඩයි. තමා ඉතා පිරිසිදු වූවෙකු ලෙස හැසිරෙයි. ''**සික්ඛා විපුලං සමාදානං**'' මහත් වූ ශික්ෂා සමාදානය, නිර්වාණබෝධය ගෙන දෙන අධිශීල ශික්ෂාවෙහි පිහිටීම යන අර්ථයයි. ''**සුසුසූසා ච ගරූනං**'' ගුරුවරුන්ගේ, ආචාර්ය උපාධ්‍යායවරුන්ගේ, කළණමිතුරන්ගේ අවවාද අසනු කැමති බව හා සේවාකිරීම, ''එතං'' මේ කලණමිතුරන් ඇසුර ආදී කාරණා ''**බුද්ධෙසු සගාරවතා**'' සර්වඥයන් වහන්සේ කෙරෙහි සම්මා සම්බුද්ධය, භාග්‍යවත්ය ආදී වශයෙන් ගරු කිරීම, ගෞරවයෙන් හැසිරීම, ''**චිත්තීකාරෝ අපචිති යථාභූතං**'' ආර්යධර්මයට තත්ත්වාකාරයෙන් පිදීම, ආදරයෙන් පිදීම, ''**සංසෙ**'' ආර්ය සංඝරත්නය කෙරෙහි සත්කාර සම්මාන කිරීම ''**එතං**'' මේ තුණුරුවනට ගරු සත්කාර කිරීම, ගෞරව හැසිරීම, ''**ආචාරගොචරෙ යුත්තො,**'' කායික වාචසික ශික්ෂා පද කඩමින් අනාචාරීව හැසිරීම, එසේ පිණ්ඩපාතාදියට එළඹීමට අයෝග්‍යස්ථාන වූ වෛශ්‍යා ගෘහ ආදී අගෝචර ස්ථාන ද හැර දමා, කායික වාචික සංවරභාවයෙන් යුතු ආචාරයෙන් ද පිණ්ඩපාතා දී අවශ්‍යතා, සඳහා එළඹීමට සුදුසු වූ යෝග්‍ය වූ ගෝචර ස්ථානයන්හි හැසිරෙමින්, ආචාරගෝචර සම්පන්නව, ''**ආජීවෙ සොධිතො**'' වේළඳානාදී බුදුරදුන් විසින් ගැරහූ නුසුදුසු ජීවන පැවතුම් අත්හැර, නිවැරදිව උපන් සිවුපසය සේවයනය කරන්නාගේ ආජීව ය ද පිරිසිදු වූවකි. ඉතාම පිරිසිදු වූවකි. එනිසාම නුවණැත්තන්ගේ ගැරහුම් නොලබන්නේමය. ''**චිත්තස්ස ච සණ්ඨපනං**'' චක්ෂු ආදී ද්වාරයන්ගේ රූපාදී අරමුණු පිළිබඳව දැඩි ලෝභකිරීම් ආදී අන්තගාමීත්වයෙන් වැලකී දක්නා ලද්දෙහි දැකීම් පමණක් ලෙස සිත මනාව හසුරුවා ගැනීම ''**එතං**'' ආචාරගෝචර සම්පත්තිය, ආජීව පාරිශුද්ධිය හා ඉන්ද්‍රිය සංවරභාවය යන මේ තුන ''**චාරිත්තං**'' හැසිරීමෙන් පිරියයුතු ශීලය ''**වාරිත්තං**'' වැළකීමෙන්, නොකිරීමෙන් පිරියයුතු ශීලය, ''**ඉරියාපථියං පසාදනියං**'' අනුන්ගේ පැහැදීමට හේතුවන පරිදි ආකල්ප සම්පත්ති ඇති, ඉරියවු පැවතුම් සහිත සිහිනුවණ ඇති බව, ''අධිවිත්තෙ ච ආයොගො'' සමථ විදර්ශනාදී භාවනාවෙහි යෙදීම ''**ආරඤ්ඤකානි**'' ආරණ්‍යයක වූ වන සෙනසුන්. ''**පන්තානි**'' ජනශූන්‍ය වූ ''**සීලං**'' චතුපාරිශුද්ධි ශීලය, ඉහතින් වෙන් වෙන් ව දක් වූ චතුපාරිශුද්ධි ශීලය මෙහි දී එකට ගෙන දක්වයි. ''**බාහුසච්චං**'' බහුශ්‍රැතභාවය. ඒ භාවනායෝගියාට බොහෝ උපකාර ඇති බොජ්ඣංග ධර්ම වැඩීමෙහි දක්ෂව, අනුත්තර වූ සමථ විදර්ශනා භාවනා වැඩීමට හැකිවේ. එම භාවනා වඩයි ''**ධම්මානං පවිචයෙ යථාභූතං**'' රූපාරූප ධර්මයන්ගේ

නොවෙනස්වන ලක්ෂණයන් ද ශ්‍රමණභාවයේ ලක්ෂණ ද තත්ත්වාකාරයෙන් විමසාබැලීම, මෙයින් අධිප්‍රඥාව විදර්ශනා ධර්මය කියන ලදී. **''සච්චානං අභිසමයෝ''** දුක්ඛ සත්‍යාදී ආර්යසත්‍ය පිරිසිඳ දැනීම් වශයෙන් ප්‍රතිවේධ කරගැනීම, ධර්මාවබෝධය, ඒ මේ සත්‍යාවබෝධය යම්සේ වේද, එය දැක්වීමට **''භාවයෙ''** යන ගාථාව කියන ලදී. එහි **''භාවයෙ''** යනු වඩන්නේය. **''අනිච්චං''** ''සියලු සංස්කාරයෝ අනිත්‍යයහ'' යි විභාගනොකිරීම් වශයෙන් ද යම් අතීත, අනාගත, පච්චුප්පන්න රූපයක් වේද ආදී වශයෙන් විභාග කිරීමෙන් ද සෑම සංඛත වස්තුවක් ම අනිත්‍යයැයි සිතන්නේය. අනිත්‍ය සංඥාව වඩන්නේය, උපදවන්නේය. **''අනත්තසඤ්ඤං,''** ''සියලු ධර්ම අනාත්ම වේ. ආත්ම වශයෙන් ගත නොහැක. ශූන්‍යය'' යනුවෙන් පවතින අනාත්ම සංඥාව ද වඩන්නේය. මෙසේ සෙසු පදයන්හි ද අර්ථ ගතයුතුය. **''අසුභ සඤ්ඤං''** සිවුමහා භූතමය මේ ශරීරය මුලුල්ලෙහි ම තෙහුමික සංස්කාරයන් හි කෙලෙස්, අශුචි වැගිරීම් වශයෙන් ''අසුභය'' ලෙස පවත්නා සංඥාව ලෙස ද ගන්නා ලදයි දතයුතුයි. **''ලොකම්හි ච අනභිරතිං''** තෙහුමික සංස්කාර වූ මුලු ලෝකයෙහි ම අනභිරති (නො ඇලීම්) සංඥාව වඩන්නේය. මේ ප්‍රකාශයෙන් ආදීනව සිහිකිරීම ද සංවේගයට පැමිණීම ද යන ආදීනවානුපස්සනාව හා නිබ්බිදානුපස්සනාව අදහස් වේ. මෙසේ විදර්ශනා භාවනාව වඩන්නා ඒ භාවනා ම ඔසවා තබා, එයම වර්ධනය කළයුතු බව **''භාවෙය්‍ය ච බොජ්ඣංගෙ''** යන ගාථාවෙන් පෙන්වාදෙයි. එහි අර්ථ මෙසේය. බුද්ධත්වයෙන් ද සිහිය ආදී සප්තවිධ ධර්ම එක්වීමෙන් ද ඒ සත්ධර්මයන්ගෙන් යුතු පුද්ගලයාට අංග වන බැවින් සප්ත බෝධි අංග ධර්ම, සති ආදී බොජ්ඣංග සත වඩන්නේ ය. සතර ඍද්ධිපාද, ශ්‍රද්ධා ආදී පඤ්ච ඉන්ද්‍රිය, ශ්‍රද්ධා ආදී පඤ්ච බල, සම්මා දිට්ඨි ආදී ආර්ය අෂ්ඨාංගික මාර්ගය ද **''ච''** ශබ්දයෙන් සතර සතිපට්ඨානයන් හා සතර සම්‍යක් ප්‍රධානයන් ද යන මේ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් ම වඩන්නේය, දියුණු කරන්නේ ය, එහි ඉදින් මේ ධර්ම පළමු මාර්ග ක්ෂණයේ දීම වැඩීම පැවිදි වූ භික්ෂුවට ඉතා සුදුසුය.

''මෙසේ බෝධිපාක්ෂික ධර්මයන් හි පිහිට ඉහළ මාර්ග සිත් වඩන්නා වූ භික්ෂුවට වැඩිය යුතු යැයි අවබෝධයෙන් (භාවනාභිසමය වශයෙන්) මාර්ග සත්‍යය ද ප්‍රහාණ කළ යුතු යැයි දැන ගැනීමෙන් (සච්ඡිකිරියාභිසමය) නිරෝධ සත්‍යය ද අවබෝධ වේ.'' මේ කාරණය දක්වමින් **''තණ්හං පජහෙය්‍ය''** යන අවසන් ගාථාව දක්වන ලදී.

එහි **''තණ්හං පජහෙය්‍ය''** කාමා දී සියලු තණ්හා ප්‍රභේදයන් ආර්ය මාර්ගයෙන් මුලිනුපුටා දමන්නේය ''මොන'' යනු ඤාණයයි. ඒ ඤාණයෙන්

යුතු බැවින් ''මුනි'' නම් වේ. ''**සමූලකෙ ආසවෙ පදාළෙය්‍ය**'' කාමරාගාදී අනුසය ධර්ම, මුල් සහිත ආශ්‍රව, කාමාශ්‍රවාදී සියලු ආශ්‍රව ධර්ම බිඳලන්නේය, මුලිනුපුටා දමන්නේය, ''**විහරෙය්‍ය විසමුත්තො**'' මෙසේ සියලුම ආකාරයෙන් කෙලෙස් ප්‍රහීණකළ බැවින්, සෑමතැනකින් ම මිදී, සියලු උපධි හෙවත් අල්ලාගැනීම් නම් වූ නිරෝධය, නිර්වාණය සාක්ෂාත් කරගෙන වෙසෙන්නේ ය. ''**එතං**'' ඉදින් මෙසේ විසීම, කෙලෙස් තවන වීර්යය ඇති භික්ෂුවට සුදුසු වූ යෝග්‍යවූ දෙයකි. මෙසේ තෙරුන් වහන්සේ ශ්‍රමණ යෝග්‍ය පිළිවෙත් ප්‍රකාශ කිරීම් වශයෙන් ශාසනයේ නෛර්යාණික බව පෙන්වීමෙන් ඊට ප්‍රතිවිරුද්ධ බාහිර සමයන්හි අනෛර්යාණික බව ප්‍රකාශ කළහ. මේ ප්‍රකාශය ඇසූ ඒ බමුණු මහසල් කුලවන්තයෝ බුදුසසුන පිළිබඳව වඩාත් ප්‍රසන්නව සරණ සිල්හි පිහිටියහ.

අපර ගෝතම ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දසවෙනි නිපාතයේ ගාථා අර්ථ වර්ණනාව සමාප්තයි.

11.1.1

එකොළොස්වන නිපාතයේ **''කිං තවත්‍ථෝ වනෙ තාත''** යනාදී ගාථාවන් ආයුෂ්මත් **සංකිච්ච** තෙරුන් වහන්සේගේය. උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇති ව ඒ ඒ භවයේ දී නිවන් පතාගෙන කුසල් දහම් රැස්කරමින් අවුත් මේ බුද්ධෝත්පාද කාලයේ දී, සැවැත් නුවර බමුණු මහසල් කුලයක පිළිසිඳ ගත්හ. ඒ කුමරු පිළිසිඳ කුසෙහි සිටින සමයේ දී රෝගී වූ මව කළුරිය කළාය. ඇගේ සිරුර සොහොනට ගෙන ගොස් දැවූවත් ගැබ නොපිළිස්සුණි. මිනිස්සු හුල්වලින් කුස පලනුයේ දරුවාගේ ඇස් කෙළවරට ගැසුහ. කුස ප්‍රදේශය ද දැවුනේය. අඟුරු මත රන් පිළිමයක් වැනි දරුවෙක් පියුම් ගැබක සිටින්නාක් මෙන් බබළමින් සිටියේය. පශ්චිම භවිකයා මහමෙරින් වැටුනත් රහත්නොවී ජීවිතක්ෂයට පත්වීමක් නම් සිදුනොවේමය. දෙවන දිනයේ සොහොනට ගිය මිනිස්සු එසේ සිටි දරුවා දැක, ආශ්චර්ය අද්භූත ජනක සිත් ඇතිව දරුවා රැගෙන ගමට ගොස් නිමිති පාඨකයන්ට මේ තොරතුරු පැවසුහ. නිමිති පාඨකයෝ, ''මේ දරුවා ගිහිගේ වසන්නේ නම් ඔහුගේ සත් මුතු පරම්පරාවම දුක්පත් වන්නේය. ඉදින් පව්දි වුවහොත් පන්සීයක් තෙරවරුන් පිරිවරාගෙන වාසය කරන්නේ ය'' යැයි පැවසූහ. ඒ දරුවාගේ නෑයෝ, ''වේවා, මොහු හැදීවැඩුණු පසු අපගේ ආර්යයන් වහන්සේ වූ සැරියුත් මහ තෙරුන් වෙත පැවිදි කරවන්නෙමි'' යි කියා, හුලින් ඇණ තුවාල වූ ඇස් කෙළවර ඇති හෙයින් **''සංකිච්ච''** යැයි නම් තැබුහ.

සත්හැවිරිදි වූ ඒ කුමරු තමා ගැබේ සිටියදීම මව මැරුණු බවත්, තමා පිළිබඳ තොරතුරුත් දැන හටගත් සංවේගයෙන්, ''පැවිදිවන්නෙමි''යි පැවසීය. ඤාතීහු ''දරුව, මැනවි'' යි පවසා ධර්මසේනාපති මහතෙරුන් වහන්සේ සමීපයට පමුණුවා ස්වාමීනි මොහු පැවිදි කරන්නැයි පවරා දුන්හ. තෙරුන් වහන්සේ ඔහුට තවපසක්වක කර්මස්ථානය දී පැවිදි කළසේක. හිසකෙස් බාද්දීම සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේ නමක් බවට පත් වූ සංකිච්ච හිමියෝ භික්ෂූන් තිස් දෙනෙක් සමඟ අරණ්‍යයෙහි විසූහ. සොරුන් දමනය කර, පැවිදි කරවා ඒ සෑම දෙනාවහන්සේ සමඟ ම එක් අරණ්‍යායතනයේ විසූ සංකිච්ච හිමියෝ, ඒ හිමිවරු වාදිවිවාදයන්හි යෙදී සිටිනු දැක ''අන්තැනකට යමි'' යි භික්ෂූන්ට දැන්වූහ. මේ කථාව මෙහි දක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් ධම්මපදට්ඨකථාව බලා දතයුත්තේය. ඉක්බිති එක්තරා උපාසකයෙක් උන්වහන්සේට උපස්ථාන කරනු කැමතිව ඊට ආසන්න ස්ථානයක වෙසෙන ලෙස ආයාචනා කරමින් මේ පළමු ගාථාව පැවසීය.

''කිං තවත්‍ථෝ වනෙනාත උජ්ජුහානොව පාවුසෙ
වෙරම්බා රමණීයා තෙ, පවිවෙකො හි ඣායිනං.'' තී.

එය ඇසූ තෙරුණුවෝ මේ ඉතිරි ගාථා වදාලහ.

''යථා අබ්භානි වෙරම්බා වාතො නුදති පාවුසෙ,
සඤ්ඤා මෙ අභිකීරන්ති විවෙකපටිසඤ්ඤුතා''

''අපණ්ඩරො අණ්ඩ සමාවො සීවථිකාය නිකෙතචාරිකො,
උපපාදයතෙව මෙ සතිං සඤ්ඤෙහසම්ං විරාගනිස්සිතං''

''යඤ්ච අඤ්ඤෙ න රක්ඛන්ති, යො ච අඤ්ඤෙ න රක්ඛති,
සවෙ භික්ඛු සුඛං සෙති කාමෙසු අනපෙක්ඛවා

''අවෙජ්ජිකා පුථුසිලා ගොණංගුල මිගා යුතා,
අම්බු සෙවාල සඤ්ඡන්නා තෙ සෙලා රමයන්ති මං.''

''වසිතමෙ අරඤ්ඤසු කන්දරාසු ගුහාසු ච
සෙනා සනෙසු පන්තෙසු වාළමිග නිවෙසිතෙ''

''ඉමෙ හඤ්ඤන්තු වජ්ඣන්තු දුක්ඛං පප්පොන්තු පාණිනො
සංකප්පං නාභිජානාමි අනරියං දොසසංහිතං.''

''පරිචිණ්ණා මයා සත්ථා, කතම්බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො, භවනෙත්ති සමූහතා.''

''යස්ස චත්ථාය පබ්බජිතො අගාරස්මා අනගාරියං,
සො මෙ අත්ථෝ අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.''

''නාභිනන්දාමි මරණං, නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පටිකංඛාමි නිබ්බිසං හතකො යථා

''නාභිනන්දාමි මරණං, නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පටිකංඛාමි සම්පජානො පතිස්සතො.'' තී

මෙහි ''කිං තවත්‍ථෝ වනෙ,'' ''කිං'' යනු ලිංග විපර්යාස වශයෙන් කියන ලදී. ''වන වාසයෙන් නුඹට කවර ප්‍රයෝජනයක් ද? යන අර්ථය යි. ''තාත'' ළදරු සමාණේරයෙක් බැවින් තම පුත්‍රස්ථානයේ තබා ආමන්ත්‍රණය කරයි. ''උජ්ජුහානොව පාවුසෙ'' උජ්ජුහාන නම් පර්වතය ගස් වැල් පිරීගිය

ගණ කැළෑවකි. බොහෝ දියකඳුරු නිසා ඒ ඒ තැන දියගලා යයි. වර්ෂාකාලයේ දී මේ ගණ වනය වාසයට නුසුදුසු වේ. ''මේ වැසි කාලයේ දී වාසයට අපහසු මේ පර්වතයේ විසීමෙන් නුඹට කවර ප්‍රයෝජනයක් ද ? ඇතැමෙක් මෙහි උජ්ජුහාන නම් එක් කුරුල්ලෙක් සීතළ ඉවසමින් වර්ෂාකාලයේ වන ගොමුවල සැඟවී වාසය කරන්නේයයි කියති. ඔවුන්ගේ අදහස අනුව ''උජ්ජුහාන පක්ඛියා මෙන් වැසිකාලයේ මේ වනයේ විසීමෙන් ඔබට කවර ප්‍රයෝජනයක් ද ? ''**වෙරම්බා රමණීයා තෙ**'', වේරම්බ වාතය හමයි. එය නුඹට සිත්කලු ද ? යන අර්ථයයි. ඇතමෙක් වේරම්බ යනු එක් පර්වත ගුහාවකැයි කියති. ඒ ස්ථානය ගමනාගමනයට පහසු, ජනයාගෙන් තොරවුවකි. සෙවණ හා ජලය සහිතය, එනිසා වේරම්බය රමණීයවේ ඒ වනයේ විසීමට සුදුසුය. කුමක් නිසා ද ? ''**පවිවෙකො හි ඣායිනං**'' නුඹවැනි ධ්‍යන වඩන්නන්ට කිසියම් තැනක විශේෂ විවේකයම කැමති විය යුතුයි. එනිසා ඉතා දුර වූ අරණ්‍යායතනයට නොගොස් වේරම්බාවේ වසන්න. දරුව, යි කියයි.

මෙහි අර්ථ මෙසේ දතයුතුයි - ''යම්හෙයකින් ධ්‍යානවඩන්නන්ට ප්‍රකර්ෂ විවේකය ඇති වාසයට පහසු සෙනසුනක් ලැබීමෙන් ම ධ්‍යාන වැඩීම සාර්ථක වේත් ද එනිසා ම මෙබදු සීත කාලයක කිසිම වනයක විසීමට නොහැක. පර්වත ගිරි ගුහාවකම විසිය හැකියැ'' යි උපාසකයා පැවසූවිට තෙරණුවෝ., ''මාහට ධ්‍යාන වැඩීමට වනයම සුදුසුයැ'' යි දක්වමින් ''**යථා අඛ්‍යානි**'' යන ගාථා වදාළහ. වැසි කාලයේ දී වැහි වලාකුළු වේරම්බවාතයෙන් ඉවත්කරයි, ඉවත දමයි, බැහැර කරයි. එමෙන් ම මගේ සිත විවේකප්‍රතිසංයුක්ත සංඥාවෝ විවේකස්ථානයට ම ඇදගෙනයති. පමුණුවති. තව ද ''**අපණ්ඩරෝ**'' කලුපාට ''**අණ්ඩසම්භවො**'' බිත්තරයෙන් උපදින කපුටා ''**සීවථිකාය**'' සොහොනහි ''**නිකෙතචාරිකො**'' ඒ සොහොනෙහිම වාසස්ථානය සාදාගෙන හැසිරෙයි, ''**උප්පාදයතෙව මෙ සතිං සඤ්ඤඤ්ච විරාග නිස්සිතං**'', කයෙහි විරාග නිඃශ්‍රිත වූ කායගතාසති කම්ටහන් මඟ පිළිබඳ මගේ සිහිනය උපදින්නේ ම ය. එක් දිනක් මේ තෙරුන් වහන්සේ කපුටකු විසින් කනු ලබන මිනිස් මළ සිරුරක් දැක අසුභසංඥාව උපදවා ගත්හ. ඒ සිදුවීම නිසා මෙසේ පැවසූහ. ඉන් සර්වප්‍රකාරයෙන් ම කය පිළිබඳ ඡන්දරාගයක් නොමැති හෙයින් වනයෙහි ම වසනු කැමතිබව දැක්වීණි.

''**යඤ්ච**'' මෙහි 'ච' ශබ්දය සමුච්චයාර්ථයේ යෙදේ. ''මම වනවාසයේ ඇලී සිටීමට තවත් හේතුවත් අසවයි'' මේ ගාථාව පැවසූහ. පැවිදි වූ භික්ෂුව මෙත් සිතින් වෙසෙන බැවින් ද ආශාකරන පිරිකරාදියක් නොමැති හෙයින්

ද ආරක්ෂාකරගත යුතු කිසිවක් නොමැති හෙයින් සේවකාදී හු නොරකිති, එමෙන් පැවිද්දා විසින් පළිබෝධ වූ වන මොණර ආදීන් නොරකියි, අන්‍යයෝ තමා නොරකිති, තමා ද අන්‍යයන් නොරකියි. එනිසා **''සබ්බෙ භික්ඛු සුඛං සෙති''** ඒ භික්ෂුව මුලිනුපුටා දැමූ කෙලෙස් කාම ඇති බැවින් ද සියලු වස්තු කාමයන් හි අපේක්ෂා රහිතවූ බැවින් ද කිසි සැකසංකාවක් නොමැති හෙයින් වනයේ හෝ ගමේ හෝ ඕනෑම තැනක සුවසේ නිදයි. ඉන්පසුව පර්වත, වන ආදියේ රමණීය බව ද වාසයට සුදුසුබව ද දක්වමින් **''අඤ්ඤදිකා''** යන ගාථාව වදාළහ. එහි **''වසිතඤ්ඤෙ''** මවිසින් පෙර විසුවිරූය. **''වාළමිගනිසෙවිතෙ''** සිංහ ව්‍යාඝ්‍ර මුව ආදීන් විසින් සෙවුනා ලද වනයෙහි.

''සංකප්පං නාභිජානාමි,'' ''මෙලොව කිසියම් ප්‍රාණියෙක් අන් සත්ත්වයෝ ආයුධ, ඊතල, සැත් ආදියෙන් ගැසීමෙන් නසත්වා, මරත්වා, මිටින් පහරදීම් ආදියෙන් වදයට පමුණුවත්වා, බාධා කෙරෙත්වා, වෙනත් කිසියම් හෝ ආකාරයකින් දුකට පැමිණෙත්වා, පමුණුවත්වා'' යනාදී ලෙස ද්වේෂයෙන්, තරහෙන් යුතු වූ ඒ අනාර්ය වූ ව්‍යාපාද, විහිංසාදී ප්‍රභේද ඇති පාප සිතුවිල්ලක් උපන් බවක්වත් නොදනිමි. මිත්‍යා විතර්ක නුපන් විරූබව දැක්වීමෙන් මෙත් සහගත විහරණය දක්වයි.

දැන් **''පරිවිඤ්ඤා''** යනුවෙන් තමන් වහන්සේ විසින් කළ කටයුතු දක්වයි. එහි **''පරිවිඤ්ඤා''**, අවවාද අනුශාසනා අසමින් ඇසුරු කළෙමි. යොමුකළ බහා තැබූ කත් අතිව, ගරුකරමින් ගෞරවණීයව හැසිරුණෙමි. **''නාභිනන්දාමි මරණං''**, ''කෙසේනම් මරණය සිදුවේ ද ? යි ආදී ලෙස මරණය නොකැමැත්තෙමි. **''නාභිනන්දාමි ජීවිතං''**, ''කෙසේනම් මම බොහෝ කලක් ජීවත් වෙමි ද ?'' යි ජීවත්වීම ද නොකැමැත්තෙමි. මේ ප්‍රකාශයෙන් මරණය හා ජීවිතය පිළිබඳ සමාන වූ සිත් ඇති බව දක්වයි. **''කාලඤ්ච පටිකංඛාමි''** පිරිනිවන්පාන කාලය බලමින් සිටිමි. **''නිබ්බිසං''** කුලියට, වැටුපට සේවාකම් කරන. **''භතකො යථා''** සේවකයෙන් අනුන්ගේ වැඩක් කරමින් ක්‍රියා සිද්ධිය පිළිබඳව නොසතුටුවූවත් (අපේක්ෂාවක් නැතත්), කාර්ය කරමින් ම දවස ගෙවීයාම බලා සිටියි. වැටුප ලැබෙන තෙක් බලා සිටියි. එලෙසින් ම මම ද ජීවිතය පිළිබඳ සතුටු නොවූවත් (අපේක්ෂා රහිත වූවත්) ආත්මභාවයේ යැපීම කරමි. මරණය පිළිබඳ අපේක්ෂා රහිතවූවක් අවසාන කාලය කැමති වෙමි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

සංකිච්ච ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

එකොළොස්වන නිපාතයේ ගාථා වර්ණනාව සමාප්තයි.

12.1.1

දොළොස්වන නිපාතයේ ''**සීලමෙව**'' යනු ආයුෂ්මත් **සීලව** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ ද ? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇති ව, ඒ ඒ භවයේ දී නිවන් ප්‍රාර්ථනා කරගනිමින් කුසල් දහම් රැස්කරමින් අවුත්, මේ බුද්ධෝත්පාද කාලයේ දී රජගහ නුවර බිම්බිසාර මහරජුගේ පුතු ලෙස උපන්නේය. එකුමරු **සීලව** නමින් ප්‍රකට විය. වැඩිවියට පත් එකුමරු මරා දැමීමට අජාසත් මහරජු චණ්ඩ මතැතෙකු පිට නැංවීම් ආදී අනේකවිධ උපක්‍රම යෙදුවත්, ඒ සියල්ල අසාර්ථක විය. පශ්චිම භාවිකයා රහත් නොවී කිසිසේත් ම මරණයට පත් නොවන බැවිණි. **සීලව** කුමරුට ඇති උපද්‍රව දුටු භාග්‍යවතුන් වහන්සේ මහමුගලන් තෙරුන් කැඳවා ''**සීලව** කුමරු මෙහි රැගෙන එන්න'' යි අණකළ සේක. තෙරණුවෝ ඍද්ධි බලයෙන් මහා හස්තියා බුදුරදුන් වෙත ගෙන්වූහ. **සීලව** කුමරු ඇතු පිටින් බැස භාග්‍යවතුන් වහන්සේට වැද එකත් පසෙක සිටියේ ය. ඔහුගේ අදහස් අනුව භාග්‍යවතුන් වහන්සේ සඳහම් දෙසුසේක. ධර්මශ්‍රවණයෙන් ලැබූ ශ්‍රද්ධා ඇති එ කුමරු සසුනේ පැවිදිව විදසුන් කමටහන වඩා, නොබෝ දිනකින් ම රහත්භාවයට පත්විය. **සීලව** තෙරුන් කොසොල් රට වසන බව ඇසූ අජාසත් රජු, ''ඔහු මරව'' යි රාජපුරුෂයන්ට නියෝග කළේය. තෙරුන් සමීපයට ගිය ඒ රාජපුරුෂයෝ, තෙරුන්ගේ දහම් දෙසුම් අසා හටගත් සංවේග සිත් ඇතිව, තෙරුන් කෙරෙහි පැහැදී පැවිදිවූහ.

ඔවුන් ඇමතූ **සීලව** තෙරණුවෝ මේ ගාථා වලින් දහම් දෙසුහ.

''**සීල** මෙවෙධ සික්ඛථ අසමිං ලොකෙ සුසික්ඛිතං
සීලං හි සබ්බ සම්පත්තිං උපනාමෙති සෙවිතං.''

''**සීලං** රක්ඛෙය්‍ය මෙධා වී පඤ්ඤානෝ තයෝ සුඛෙ
පසංසං විත්තිලාභඤ්ච පෙච්ච සග්ගෙ ච මොදනං.''

''**සීලවා** හි බහූ මිත්තෙ සඤ්ඤමෙනාධිගච්ඡති
දුස්සිලෝ පන මිත්තෙහි ධංසතෙ පාපමාචරං

අවණ්ණඤ්ච අකිත්තිඤ්ච දුස්සීලෝ ලභතෙ නරෝ
වණ්ණකිත්තිං පසංසඤ්ච සදා ලභති **සීලවා**

''ආදි සීලං පතිට්ඨා ච කල්‍යාණානඤ්ච මාතුකං
පමුඛං සබ්බධම්මානං තස්මා සීලං විසොධයෙ.''

''වෙලා ච සංවරෝ සීලං චිත්තස්ස අභිභායනං
තිත්ථං ච සබ්බබුද්ධානං, තස්මා සීලං විසොධයෙ.''

''සීලං බලං අප්පටිමං සීලං ආවුධමුත්තමං
සීලං ආභරණං සෙට්ඨං, සීලං කවචමබ්භුතං.''

''සීලං සෙතු මහෙසක්ඛා, සීලං ගන්ධෝ අනුත්තරෝ
සීලං විලෙපනං සෙට්ඨං යෙන වාති දිසොදිසං.''

''සීලං සම්බලමෙවග්ගං, සීලං පාථෙය්‍යමුත්තමං
සීලං සෙට්ඨෝ අතිවාහෝ යෙන යාති දිසොදිසං.''

''ඉධෙව නින්දං ලභති පෙච්චාපායෙ ච දුම්මනෝ
සබ්බත්ථ දුම්මනෝ බාලෝ සීලෙසු අසමාහිතෝ.''

''ඉධෙව කිත්තිං ලභති පෙච්ච සග්ගෙව සුම්මනෝ
සබ්බත්ථ සුමනෝ ධීරෝ සීලෙසු සුසමාහිතෝ.''

''සීලමෙව ඉධ අග්ගං පඤ්ඤවා පන උත්තමෝ
මනුස්සෙසු ච දෙවෙසු සීලපඤ්ඤාණතෝ ජයං.'' **තී.**

මෙහි ''සීලමෙවිධ සික්ඛථ අසමිං ලොකෙ'' 'ඉධ' යනු නිපාතයකි. මේ සත්ව ලෝකයේ තමාට හිත වැඩ කැමති කුලපුත්‍රයා චාරිත්‍ර වාරිත්‍රා දී භේද ඇති සීලය ම මුලසිට රකින්නේය. සිල් ආරක්‍ෂා කරමින් මනාව හික්මීම, සිල් පද නොකැඩීම් වශයෙන් මනාව ශික්ෂිතව, සුපරිශුද්ධව, සුපිරිසුන්ව හික්මෙන්නේය. ''අසමිං ලොකෙ'' මේ සංස්කාර ලෝකයේ හික්මිය යුතු ධර්මයන්හි සීලය මුල්කරගෙන හික්මෙන්නේය. සම්මා දිට්ඨි ආදි සම්පත් ද සීලය මත පිහිටා ඇති බැවින් ''**සීලංහි**''යනාදිය පැවසූහ. එහි ''හි'' හේතුව දක්වීමේ වචනයකි. මනාව සේවනය කළ, දිගුකලක් සුරැකි, මනාව ආරක්‍ෂා කළ සීලය නිසා මනුෂ්‍ය සම්පත් දිව්‍ය සම්පත්, බ්‍රහ්ම සම්පත්, නිවන් සම්පත්, යනාදී සෑම සම්පත්තියක්ම ඒ සීලයෙන් යුක්ත සත්ත්වයාට ලැබේ. ''සීලය සියළු සම්පත් එළවන්නේය.'' යනුවෙන් සංක්ෂිප්තව පැවසූ අදහස විස්තර කරමින් ''සීලං රක්ඛෙය්‍ය'' යන ගාථාව

පැවසූහ. එහි ''**රක්ඛෙය්‍ය**'' ආරක්ෂා කරන්නේය. ප්‍රාණඝාතයෙන් වැලකෙමින් චත්පිළිවෙත් පුරමින් පාපයට විරුද්ධ වූ හෙයින් සීලය ''රකියි'' නම් වේ. ''**මෙධාවී**'' නුවණැත්තා. මෙයින් සීලය රක්ෂා කිරීමේ උපාය දැක්විණි. ඤාණබලය නිසා සමාදන් වූ ශීලය නොකඩා ආරක්ෂා කරයි. ''**පඤ්ඤායනො**'' කෙනෙහිව පතමින් ''**තයො සුඛෙ**'' ත්‍රිවිධ සැප සැප නිමිති හෝ ''සැප'' යැයි ගනු ලැබේ. ''**පසංසං**'' කීර්තිය, නුවණැත්තන්ගේ ප්‍රශංසාව ''**විත්තිලාභං**'' සන්තෝෂ ලාභය. ''විත්තලාභං'' යන පාඨය ද යෙදේ. ''ධනලාභ'' යන අරුත එහි ඇත. සිල්වතා අප්‍රමාදී බැවින් මහත් වූ භෝග සම්පත් ලබන්නේය. ''**පෙච්ච**'' කළුරිය කොට ''**සගෙහ මොදනං**'' දිව්‍ය ලෝකයේ ඉෂ්ට මනාප කාමගුණයන්ගේ සතුට පතමින් මේ ලෝකයේදී ප්‍රශංසාව ද ධනලාභ (සැප ලාභය) ද පරලොව දිව්‍ය සම්පත් ලබා සතුටු වීමද කැමැත්තෝ සිල් රකිත්වා යන අර්ථයයි. ''**සඤ්ඤමෙන**'' කාය වාග් සංවරයෙන්, කාය දුශ්චරිතාදියේ නොයෙදී කිසිවකු නොපෙලමින් සතුන්ට අභය ධානය දෙන පුද්ගලයාට ප්‍රියමනාප භාවය නිසා මිතුරෝ ඇතිවෙති. ''ධංසතෙ'' දුරුවේ. ''**පාපමාචරං**'' ප්‍රාණඝාතාදී පව්කම් කරමින්, දුසිල්ව ජීවත්වන පුද්ගලයා, තමාට හිතවැඩ කැමති සත්ත්වයන් විසින් ඒකාන්තයෙන්ම දුරු කරනු ලබයි. ඇසුරු නොකරනු ලබයි. ''අවණ්ණං'' නුගුණ, ඉදිරියේ ගැරහුම්. ''**අකිත්තිං**'' අපකීර්තිය, අයස ''වණ්ණං'' ගුණය ''**කිත්තිං**'' කීර්තිය, පැතිරුණු යසස. ''**පසංසං**'' ඉදිරියේ කරන ප්‍රශංසාව ''**ආදිං**'' කුසල ධර්මයන්ගේ මූලය සීලයයි. එනිසා ''මහණ, නුඹ මුලදීම සීලයෙන් පිරිසිදුවන්න''යි ද ''කුශල ධර්මයන්ගේ මූල ඉතාපිරිසිදු ශීලය හැර වෙන කුමක් ද ? යි කියන ලදී. ''**පතිට්ඨා**'' ප්‍රතිෂ්ඨාවයි. සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන් හි ප්‍රතිෂ්ඨාව ශීලයයි. ''සීලෙ පතිට්ඨාය'' යනුවෙන් එය දැක්වේ. එනිසා කියන ලදී. ''**කල්‍යාණානං ච මාතුකං**'' සමථ විදර්ශනා දී කල්‍යාණධර්මයන් උපදවන මෑණියෝ නම් ශීලයයි. ''**පමුඛං සබ්බධම්මානං**'' සියලු නිරවද්‍ය ධර්මයන්ට ප්‍රමුඛව, ප්‍රධානව පවතිනුයේ ශීලයයි. එනිසා මුලදීම ශීලය පිරිසිදු කරන්නේය, නොකඩා සම්පූර්ණ කරන්නේය, ''වෙලා'' දුශ්චරිතයන් විසින් නො ඉක්මවිය යුතු වෙරළ, සීමාව යන අර්ථයයි. දුසිල් බව ඉක්මවායි, විද්වංසනය කරයි යන අරුතින් ''වෙලා'' නම් වේ. කායදුශ්චරිතාදියට උප්පත්ති ද්වාරය සීලයෙන් වසනු ලැබේ. ''**අභිභායනං**'' විපිළිසර හේතු නොමැති හෙයින් සීලය සන්තෝෂ කාරණයකි, චිත්තප්‍රසාදයට, ප්‍රීතියට හේතුවකි. ''**තිපඤ්ඤා සබ්බබුද්ධානං**'' බුද්ධශ්‍රාවක, පසේ බුදු, සම්මා සම්බුදු යන සියලුම බුදුවරුන්ගේ කෙලෙස් මල සෝදාහරින පූණ්‍යතීර්ථයකි. සීලය, නිර්වාණය නම් මහා සමුදුරයට බැසගන්නා තීර්ථයකි. ''**සීලං බලං අප්පටිමං**'' මාරසේනාව මැඩලීමේ දී අසදෘශ බලයකි, සේනාවකි,

වීර්යකි. ''ආවුධමුත්තමං'' කිලිටි දහම් සිඳීමෙහි උතුම් ආයුධයකි. ගුණ ශරීරය ශෝභමාන කරන අර්ථයෙන් ආභරණයකි. ''**සෙඨං**'' සෑමකල්හිම උතුම් නුවණකි. ප්‍රාණීන් ආරක්ෂා කරන බැවින් අද්භූත සන්නාහයකි. ''අඛිදං'' යන පාඨය ද යෙදේ ''නොබිඳෙන' යන අර්ථයයි. අපාය මහෝඝයෙන් හා සංසාර මහෝඝයෙන් එතෙර වීමට උදවුවන බැවිනුත්, කෙලෙස්වලින් සෙලවිය නොහැකි බැවිනුත් සීලය සේතුවකි, ඒ දණ්ඩකි, ''මහෙසක්ඛා'' මහා බලයකි. ''**අනුත්තරෝ ගන්ථෝ**'' උඩුසුලඟට, සැමදිසාවකම හමන බැවිනුත්, සියලු ජනයා අලංකාර කරන බැවිනුත් අනුත්තර සුවඳකි. එනිසා ''**යෙනවාති දිසෝ දිසං**'' යම් සීල සුගන්ධයන සෑම දිසාවෙහිම, දස දෙසම හමයි ද එය ''දිසොදිසා''යන පාඨය ද යෙදේ. ''**සම්බලමෙවගහං**'' සම්බල නම් බත් මුලකි. එය රැගෙන යන පුද්ගලයා අතර මඟ දී සාදුකින් නොපෙලේ, ක්ලාන්ත නොවේ. මෙසේ සීල්වතා ද පිරිසිදු සීලය නම් බත් මුලකි. ගෙන සසර, කතරට පැමිණ, ගිය ගියතැන නොවෙහෙසේ, ක්ලාන්ත නොවේ, එනිසා ශීලය රසවත් බත් මුලකි. එසේම සීලය උතුම් මාර්ගෝපකරණයකි සොරු ආදීන්ට හසුනොවෙන බැවින් ද ඒ ඒ තැන අපේක්ෂිත සම්පත් නිපදවන බැවින් ද සිටිතැනින් තම කැමති තැනට ගෙනයන, පමුණුවන බැවින් ද සීලය ''**අත්ථාහෝ**'' යානාවකි. කිසිවකුගේවත් උපද්‍රවකට නොපත්ව අපේක්ෂිත ස්ථානය පමුණුවන ශීලය ශ්‍රේෂ්ඨ යානාවකි. ''**යෙන**'' යම් යානාවකින්, ''**යාති දිසෝ දිසං**'' සුගතියෙන් සුගතියට, ඒ ඒ දිශාවට සුවසේමයයි. ''**ඉධෙව නින්දං ලහති**'' මෙලොවදී ම ''**දුම්මනෝ**'' නපුරුරාගාදී දූෂිත සිත් ඇති දුස්සීලයා ''පාපයෙකි'' යි නින්දා, අපහස, ගැරහුම් ලබයි පරලොවදීත් අපායේ ඉපිද ''මිනිස් බව කෙලෙසාගත් අවජාතකය'' අදී වශයෙන් යම පුරුෂයන්ගේ නින්දා අපහාස ලබයි. හුදෙක් නින්දා ලැබීම පමණක් ම සිදුනොවේ. සෑමතන් හි නපුරු සිතින් යුතු බාලයා, ''**සබ්බත්ථ දුම්මනෝ බාලෝ**'' මෙලොව දුශ්චරිතයෙන් දූෂිත වූ සිතැතිව පරලොවදී විපාක විඳීම් වශයෙන් දුකට භාජනව සැම තැනම කිලිටි සිත් ඇතිව වෙසේ. ''**සීලෙසු අසමාහිතෝ**'' මනාව ශීලයෙහි පිහටුවාගත් සිත් නැති; සීලයෙහි නොපිහිටි සිතැති. ''**ඉධෙව කිත්තිං ලහති**'' මෙලොව දීම යහපත් සිත් ඇති සත්පුරුෂ, කළඳ දහම් ඇති සිල්වතා කීර්තිය ලබයි. සත්පුරුෂ සිල්වතා පරලොවදී ද ස්වර්ගයේ ඉපිද, ''දෙවියන් හා සහවාසයට පැමිණියේ ය' ආදී ය සම්පන්න, ශීලයෙහි මනාව පිහිටි සිතැති, ශීලයෙහිම බැසගත් සිතැති ''**සබ්බත්ථ**'' මෙලොව සුචරිතවත් වීමෙන් ද පරලොව දී සම්පත් ප්‍රතිලාභයෙන් ද සතුටින් සොමිනසට පැමිණ වෙසේ. සුවසේ වෙසේ. ''**සීලමෙව ඉධ අග්ගං**'' ශීලය ලෞකික හා ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් වේ. ඉන් ලෞකික

ශීලය කාමලෝකයේ ක්ෂත්‍රිය මහාසාල කුලයන් හිද දිව්‍ය, බ්‍රහ්ම ලෝකවල ද උප්පත්තිය ගෙනදෙයි. ඒ භවයන්හි උපතට උපකාරී වේ. ලෝකොත්තර ශීලය සියලුම සංසාරික දුක් ඉක්මවා නිවන් සැප ගෙනදෙයි. එසේම මෙය කියන ලදී.

> ''හීනෙන බ්‍රහ්මචරියෙන බත්තියෙසූපපජ්ජති,
> මජ්ඣිමෙන ච දෙවත්තං, උත්තමෙන විසුජ්ඣති''

හීන වූ ශීල සමාදානයෙන්, බ්‍රහ්මචරියාවෙන් ක්ෂත්‍රිය උපත ගෙන දෙයි. මධ්‍යම බඹසරින් දේවත්වයට පත්වේ. උතුම් බ්‍රහ්ම චර්යාවෙන් නිර්වාණය ද අවබෝධ වේ.

''මහණෙනි ඉඳින් භික්ෂුව චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය, භේසජ්ජ පරිෂ්කාරාදිය ලබනු කැමති නම් මේ ශීලයම එම පැතුම ඉටුකරගන්නේය.'' මහණෙනි, සිල්වත් භික්ෂුවට චෙතොප්‍රණිධියෙන් විශුද්ධත්වය සම්පූර්ණ වේ'' ලෝකෝත්තර සුවය ගෙන දෙන, සර්වප්‍රකාරයෙන්ම කෙලෙස් සතුරන් ප්‍රහීන කරන ලද, සංසර උපතේ සිට විදි සංසාරික දුක්ඛය ඉක්මවා පවතින බැවින් ශීලයේ අග්‍රභාවය පිළිබඳව කිවයුත්තක් නැත. ''**පඤ්ඤවා පන උත්තමෝ**'' ප්‍රඥාවන්ත පුද්ගලයා උතුම් ශ්‍රේෂ්ඨයාම වේ. පුද්ගලාධිෂ්ඨානයෙන් ප්‍රඥාවම ශ්‍රේෂ්ඨ බව මින් කියවේ. දැන් සීලයේ හා ප්‍රඥාවේ ශ්‍රේෂ්ඨබව කෘත්‍ය වශයෙන් දක්වමින්, ''**සීලපඤ්ඤාණතො ජයං**'' යැයි කියන ලදී. ''**ජයං**'' යන්න ලිංග විපර්යාස වශයෙන් දතයුතුයි. ''ආහු''වීය යනු ඉතිරි වචනයයි. ජයවිය. එහි ''විශේෂයෙන් දනගනියි'' යන අරුතින් හෝ සලකුණු වශයෙන් හෝ ''ප්‍රඥා'' නම් වේ. ඉන් විරුද්ධව ලබන ජයක් නැත. සීලයෙන් තොරව ප්‍රඥාව නූපදී. ප්‍රඥාවෙන් තොරව ශීලය අර්ථවත් නොවේ. කටයුතු වශයෙන් මේ දෙකම ඔවුනොවුන්ට උපකාරී වේ. අන්‍යොන්‍ය උපකාරීවේ. එනිසා ''සීලයෙන් ප්‍රඥාව පිරිසිදු වේ. ප්‍රඥාවෙන් ශීලය පිරිසිදු වේ.'' යැයි කියන ලදී. ''**මනුස්සෙසු දෙවෙසු**'' මෙය ඔවුන්ගේ ස්ථාන විශේෂ දක්වීමයි. මේ කාමසුගතින්හි දී ම සීල, ප්‍රඥා දෙක සුවිශේෂී වේ. මෙහි සමාධිය, ප්‍රඥාවෙන් අධිෂ්ඨාන කළයුතු බැවින් සීල පාඤ්ඤික නැතහොත් වැඩිය යුතු බැවින් හා සීලාධිෂ්ඨාන වන බැවින් ප්‍රඥා පාඤ්ඤික වේ. මෙසේ තෙරුන් වහන්සේ ඒ භික්ෂූන්ට ශීලය ප්‍රධාන කරගනිමින් දහම් දෙසන සේක් තමන් වහන්සේගේ සීලාදී ගුණ ප්‍රකට කිරීම් වශයෙන් අර්හත්ව ප්‍රකාශ කළසේක.

සීලව ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

12.1.2

''නීචෙ කුලම්හි'' යනු ආයුෂ්මත් **සුනීත** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදුවීද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයේදී පින්දහම් රැස්කරමින්, දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණියහ. බුද්ධ ශූන්‍ය කාලයක සිටුගෙයක ඉපිද, වැඩිවියටපත්ව දරුවන් සමඟ ක්‍රීඩා කරමින් යන්නේ, එක් පසේ බුදුවරයෙක් ගමේ පිඬුසිඟා වඩිනු දැක, ''නුඹගේ මේ මුළු සිරුරේම තුවාල ඇත්තකුමෙන්, මුළු ශරීරයම වසාගෙන පිඬුසිඟා යෑමෙන් කවර ප්‍රයෝජනයක් ද ? කෘෂිකර්ම, වෙළඳාම් ආදී ජීවිකාවකින් දිවි පැවැත්වීම අකැප ද? ඉදින් ඒවා කිරීමට අසමත් නම් ගෙවල් වල මළමූත්‍රාදී අපද්‍රව්‍ය බැහැර කරමින් කශල ශෝධකයෙක්ව ජීවත් වන්න''යි අක්‍රෝශ කළේය. එම පාපකර්මය නිසා නිරයේ පැසුණු හෙතෙම, ඒ කර්මයේම විපාක වශයෙන් මිනිස් ලොව ද බොහෝ ජාති සිය ගණනක කශල ශෝධක කුලයෙහි ම ඉපිද දිවිගෙවීය. මේ බුද්ධෝත්පාද කාලයේදී ද කශලශෝධක සැඩොල් කුලයේ සුනීත නමින් ඉපිද, අශුචි ඉවත් කරමින් කෑම් ඇදීම් පමණක්වත් නොලැබ දිවිගෙවීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රැ මධ්‍යම යාමයේ දී දිගුකලක් බුදුවරුන් විසින් පුරුදු කළ මහා කරුණා ඵල සමවතට සමවැදී ඉන් නැගිට, බුදු ඇසින් ලොව දෙස බැලූ සේක්; සුනීතගේ චිත්තාභ්‍යන්තරයේ කළයක දැල් වූ පහනක් මෙන් බබලන අර්හත්ඵයට උපනිශ්‍රය වූ හේතු සම්පත් දුටුසේක. රාත්‍රිය ඉක්මගිය කල්හි පෙරවරු සමයේ හැද පෙරව පා සිවුරු රැගෙන භික්ෂු මහා සංඝරත්නය පිරිවරාගත් තථාගතයන් වහන්සේ රජගහ නුවරට පිඬුසිඟා වැඩිසේක. සුනීත අශුචි ඉවත් කරන වීථියට වැඩම කළ බුදුපියාණෝ ඉදිරියටම වැඩියහ. සුනීත ද ඒ ඒ තැනින් ඉඳුල්, මළ මුත්‍රා, කැලි කසලාදිය රැස්කරගෙන කුඩයක දමාගෙන කදකින් ගෙන යමින් සිටියේය. තමාගේ ඉදිරියට මහා සංඝරත්නය පිරිවරාගෙන වැඩම වන ශාස්තෘන් වහන්සේ දැක, ගෞරවාදරයෙන් වික්ෂේපයට පත් සිතින් යුක්ත වූවේ, ගමන් මඟින් සැඟවීමට අවස්ථාවක් නොලැබ, කුණු කද බිත්තිය පසෙක තබා, එක් පසෙකින් බිත්තිය ඇතුලට පිවිසෙන්නාක් මෙන් බිත්තියේ එල්ලී ඇඳිලි බැඳගෙන සිටියේය. ''බිත්ති සිදුරකින් ඉවතට යනු කැමතිව සිටියේය.'' යි ද කියති. ශාස්තෘන් වහන්සේ සුනීත ලඟට පැමිණ; මෙතෙම තමාගේ කුසල මූලයෙන් මෙහෙයවා තමාවෙත පැමිණි, මා පිළිබඳව ගෞරව භය දක්වමින් ජාතියෙන් ද කර්මයෙන් ද ඉතා පහත් බැවින් ඉදිරියේ සිටියත් ලැජ්ජාවේ. ඒකාන්තයෙන් ම මොහු විශාරදත්වයට පත්කරන්නෙමි''යි කොවුල් හඬින් මනෝඥ වූ

මේස ශබ්දය හා සමාන ගැඹුරු බ්‍රහ්මස්වරයෙන් **''සුනීත''** යැයි ඇමතුසේක. ''මේ දුක්ඛිත ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද? පැවිදිවීමට අකමැතිද?'' විමසූ සේක. ඒ ශාස්තෘ වදන් ඇසූ සුනීත; අමෘතයෙන් අභිෂේක කරන ලද අවස්ථාවක මෙන් මහත් උදාර වූ ප්‍රීති සොම්නසට පැමිණ, ඒ සතුට විඳිමින්; ''ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා වැන්නවුන් ද මේ බුදුසසුනේ පැවිදි කරන සේක් නම්, මම පැවිදි නොවී සිටින්නේ කුමක් හෙයින් ද? භාග්‍යවතුන් වහන්ස, මා පැවිදි කරන සේක්වා'' යි පැවසීය. ශාස්තෘන් වහන්සේ ''එව, මහණ'' යි වදාළ සේක. ඒ සමඟම ඒහි භික්ෂුභාවයෙන් **පැවිදි** උපසම්පදා දෙකම ලැබූ සුනීත සෘද්ධිමය පා සිවුරු ලබා සියවස් **සපිරි** මහතෙර නමක් මෙන්, ශාස්තෘන් වහන්සේ ගේ ඉදිරියේ පෙනී **සිටියේය.**

භාග්‍යවතුන් වහන්සේ සුනීත තෙරුන් විහාරයට කැඳවාගෙන ගොස් කමටහන් දුන්සේක. උන්වහන්සේ පළමුව අෂ්ටසමාපත්ති හා පංචාභිඥා උපදවාගෙන පසුව විදසුන් වඩා ෂඩභිඥාලාභී වූහ. සුනීත තෙරුන් වෙත පැමිණි ශක්‍රාදී දෙවියෝ ද බ්‍රහ්මයෝ ද උන්වහන්සේට වැන්දහ. එනිසා කියන ලදී.

> ''තාව දෙවනා සත්තසතා උළාරා බ්‍රහ්ම විමානා උපසංකමිත්වා
> අජානියං ජාතිජරාභිභූතං නීතං නමස්සන්ති පසන්නචිත්තා'' ති.

''ඒ මහත් බ්‍රහ්ම විමානයන්ගෙන් සත්සියයක් දෙවියෝ පැමිණ, ජාති ජරා මැඩලූ, නැවත නූපදින්නා වූ සුනීත තෙරුන්ට පහන් සිතින් නමස්කාර කරති.''

භාග්‍යවතුන් වහන්සේ දේව සමූහයා පෙරටුකරගෙන වැජඹෙන සුනීත තෙරුන් දැක, සිනාපහළ කර ප්‍රශංසා කරමින් **''තපෙන බ්‍රහ්මචරියෙන''** යන ගාථාවෙන් දහම් දෙසූ සේක. ඉක්බිති බොහෝ භික්ෂුභූ සුනීත තෙරුන් ලවා සිංහ නාදය පවත්වනු කැමතිව පිරිස් මැද දී, ඇවැත් සුනීතය, නුඹ කවර කුලයකින් මේ බුදුසසුනේ පැවිදිවූයෙහි ද? කෙසේ ආර්ය සත්‍ය අවබෝධ කළෙහි ද ?'' යි විමසූ සේක. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන සුනීත හිමියෝ සිංහනාද කරමින් මේ ගාථා වදාළහ.

> '' නීචෙ කුලම්හි ජාතෝ දළිද්දෝ අප්පභොජනෝ
> හීනං කම්මං ආසි, අහොසිං පුඤ්ඡඩ්ඩකෝ''

''ජිගුඵජීතෝ මනුස්සානං පරිභූතෝ ච වම්භිතෝ
නීචං මනං කත්වාන වන්දිස්සං බහුකං ජනං''

''අථද්දසාසිං සම්බුද්ධං භික්ඛුසංඝපුරක්ඛතං
පවිසන්තං මහාවීරං මාගධානං පුරුත්තමං''

''නික්ඛිපිත්වාන බ්‍යාභඟිං වන්දිතුං උපසංකමිං
මමෙව අනුකම්පාය අට්ඨාසි පුරිසුත්තමෝ''

''වන්දිත්වා සත්ථුනෝ පාදෙ එකමන්තං ඨිතෝ තදා
පබ්බජ්ජං අහමායාචිං සබ්බසත්තාන මුත්තමං''

''තතෝ කාරුණිකෝ සත්ථා සබ්බලෝකානුකම්පකෝ
එහි භික්ඛූ' ති මං ආහ, සාමෙ ආසූපසම්පදා''

''සොහං එකෝ අරඤ්ඤස්මිං විහරන්තෝ අතන්දිතෝ
ආකාසිං සත්ථු වචනං යථා මං ඔවදී ජිනෝ''

''රත්තියා පඨමං යාමං පුබ්බජාතිමනුස්සරිං
රත්තියා මජ්ඣිමං යාමං දිබ්බං චක්ඛුං විසොධයිං''

''රත්තියා පච්ඡිමෙ යාමෙ තමොක්ඛන්ධං පදාළයිං
තතෝ රත්‍යා විවසනෙ සුරියස්සුග්ගමනං පති''

''ඉන්ද්‍රා බ්‍රහ්මා ච ආගන්ත්වා මං නමස්සිංසු පඤ්ජලී
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම''

''යස්ස තෙ ආසවා බීණා, දක්ඛිණෙය්‍යොසි මාරිස,
තතෝ දිස්වාන මං සත්ථා දෙවසංඝපුරක්ඛතං
සිතං පාතුකරිත්වාන ඉමමත්ථං අභාසථ''

''තපෙන බ්‍රහ්මචරියෙන සංයමෙන දමෙන ච
එතෙන බ්‍රාහ්මණෝ හොති, එතං බ්‍රාහ්මණමුත්තමං'' **ති.**

මෙහි ''**නීචෙ**'' යනු ළාමක වූ සියල්ලන්ට පහත්, උසස් පහත් බව සත්ත්වයන් ගේ අසමාන, සමානතා විමසීමකි. මෙතෙම සියල්ලන්ටම හීන වූ පහත් වූ ''පුක්කුස'' නම් කසල ශෝධක කුලයේ උපන්නෙකි. එය දක්වීමට '' පහත් කුලයේ උපන් මම'' යැයි දැක්වීණි. එනිසා ''**නීචෙ**'' යැයි කියන ලදී. සියල්ලන්ටම වඩා පහත් කුලයේ ''**දළිද්දෝ**'' දිළිඳු වූයෙමි.

දිළින්දෝ ද කිසිකලෙක කෑම් ඇඳීම් ලබා දුක් සහගත නොවූ පැවතුම් ඇත්තෝ වෙති. නමුත් මම සැමදාම දුක් කරදර සහිතව, උදුනේ ගෙනැවිත් තැබූ සැළියක් දැකීමටවත් නොලැබුයෙමි. ඒ අර්ථය දැක්වීමට ''**අප්පාහොජනො**'', අල්ප භෝජන ඇත්තෙමි'' යි කියන ලදී. පහත් කුලිකයෝ, ඉතා දිළිඳුවුවත්, ඇතමෙක් පහත් රැකියා නොකර ජීවත් වෙති. මම එසේ නොවුනෙමි යි දක්වනු සඳහා ''**නීචං කම්මං ආසිං**'' යි කියන ලදී. එය කවරාකාර රැකියාවක් ද ? ''**අහොසිං පුප්ඵඡඩ්ඩකො**'' අත් විකල් වුවහුට ''අත්කොරා'' යි කියන්නාක් මෙන් මොහුට මේ නම උපචාර වශයෙන් යෙදුණි. ''පුප්ඵඡඩ්ඩක'' යනු මැලවුණු මල්, කසල, අපද්‍රව්‍ය නගරයෙන් පිටතට ගෙනයන්නායි. අපද්‍රව්‍ය දමන ස්ථානය ද මෙනමින් හැඳින්වේ. ''**ජිගුච්ඡිනො**'' ජාතියෙන් මෙන්ම ක්‍රියාවෙන් ද පිළිකුල් කරන ලද්දෙමි. ''**මනුස්සානං**'' මිනිසුන් විසින් ''**පරිභූතො**'' අවමන් කරන ලද්දෙමි. ''**වණ්ණිනො**'' ගරහන ලද්දෙමි. ''**නීචං මනං කරිත්වාන**'' අත් උසස් කුලික මිනිසුන් මහමෙර මෙන් ඔසවා තබා, ඔවුන්ගේ පාවැකි දුලි මෙන් තමා ඉතා පහත් කර සිතා, යටහත් පහත් සිතැතිව, ''**වන්දිස්සං බහුකං ජනං**'' බොහෝ මහජනයාට දුටුදුටු අවස්ථාවෙහි වැන්දෙමි. හිසේ අඳලි බැඳ වැන්දෙමි ''අථ'' අධිකාර්ථය දක්වන නිපාතයකි. ''**අඳ්ඨාසිං**'' දුටුවෙමි. ''**මාගධානං**'' මගධ නම් ජනපදයේ, රජකුමාරවරු ඔවුන්ගේ නිවාසය වූ එක ජනපදයකට 'මගධ' යැයි කියන ලදී. මගධ ජනපදයේ යන අරුතයි. ''**පුරුත්තමං**'' උතුම් නුවරට, ''**බ්‍යාහංගිං**'' කුණු කද ''**පබ්බජිං අහං ආයාචිං**,'' ශාස්තෘන් වහන්සේ ''සුනීතය, පැවිදිවීමට හැකි ද ?'' යි අවසර දුන් කල්හි මම පැවිද්ද ඉල්ලුයෙමි. ''**ආසූපසම්පදා**,'' ''එව මහණ'' යි යන ශාස්තෘ වචන මාත්‍රයෙන් ම උපසම්පදා වූයෙමි. ''**යථා මං ඔවදිං**'' මෙසේ සමථය පුර්වාංගම වූ විදර්ශනාව වඩන්න' යැයි මාහට අවවාද දුන් ශාස්තෘ වචනය ඉටුකළෙමි. ඒ අනුව පිළිපැද්දෙමි. ''**රත්තියා**'' ඒ පිළිවෙත් මඟ දැක්වීමයි. එහි පෙරවිසු කඳ පිළිවෙල දක්නා නුවණ ද නොපැමිණි ඤාණයන් ද අතිහෙයින් පළමු යාමයේ බොහෝ කටයුතු ඇත. ''**මජ්ඣිමං යාමං**'' යනු අත්‍යන්ත සංයෝගයේ දුතියා විභක්ති වචනයකි. ආශ්‍රවක්ෂය ඤාණය එසේ එකම අවබෝධයක් වශයෙන් නොපවතියි. ''**පච්ඡිමේ යාමෙ**'' යි සත්තමී විභක්ති කාලාර්ථය යෙදුණු තැනකි. ''**ඉන්‍දෙ**'' ශක්‍රදිව්‍ය රාජයා, ''**බ්‍රහ්මා**'' මහා බ්‍රහ්මයා, ඉන්‍ද්‍රබ්‍රහ්ම දෙදෙන ගැනීමෙන් සෙසු කාමසුගති දෙවියන්ගේ පැමිණීම දක්වන ලදී. මෙය ඉතා උසස් කරදක්වීමකි. ''රජ්ජු පැමිණියේය'' යනාදිය මෙනි. ''**නමස්සිංසු**'' කයින් වචනයෙන් නමස්කාර කළහ. එහි කයින් කළ නමස්කාරය දක්වමින් , ''**පඤ්ජලී**,'' ''ඇදිලිබැඳ'' යි පවසා, වචනයෙන් කළ නමස්කාරය ''**නමො තෙ**'' යනුවෙන් දැක්වීය.

''දෙවසංඝපුරක්ඛතං'' දේව යන්නෙන් උත්පත්ති දෙවියන් ගත් බැවින් බ්‍රහ්මයෝ ද අදහස් වේ. ''සිතං පාතු කරිත්වාන'' තමාගේ මහත්ඵල දැක්වීමට සහ දිවැ බ්‍රහ්ම සමුහයාගේ ගුණ භක්තිය නිසා ශාස්තෘන් වහන්සේ සිනා පහළ කළ සේක. අනෘයන් මෙන් දත් විදහා නොදක්වන උන්වහන්සේ, මුව මදක් විවර කරන සේක. එවිට ම බබළන දිවැ ස්ඵටික මුතුවල ආලෝකය සුදු සඳ රැස් රේඛාවක් මෙන් ඉතා පිරිසිදු දන්වලින් නික්මුණු සත රශ්මි රේඛාවක් ශාස්තෘ මුව වටා ප්‍රදක්ෂිණා කරයි. එය දැක යන්නෝ ද එන්නෝ ද ශාස්තෘන් වහන්සේ සිනාසුණු බව දන හඳුනාගනිති. ''තපෙන'' ඉන්ද්‍රිය සංවරයෙන් ඇතමෙක් ''ධුතංග ධර්ම සමාදානයෙන්'' යි අර්ථ කියති. ''සංයමෙන'' සීලයෙන් යුතුව, ''දමෙන'' ප්‍රඥාවෙන්, ''බ්‍රාහ්මචරියෙන'' ඉතිරි ශ්‍රේෂ්ඨ චර්යාවෙන් ''එතෙන'' ඉහතින් දැක්වූ අකාරයෙන් ඉන්ද්‍රිය සංවර ඇත්තා බහා තැබූ පාපධර්ම ඇති බැවින් බ්‍රාහ්මණ නම් වේ. ''බ්‍රාහ්මණමුත්තමං'' ''උතුම් වූ සියල්ලන්ට ම ශ්‍රේෂ්ඨ වූ ''ආහු'', කීහ. යන වචනය ගාථාවේ පිටතින් යොදන වචනයකි. ''බ්‍රාහ්මණං'' ''උතුම් බ්‍රාහ්මණයෙකි'' යි කීහ. මෙසේ උතුම් බ්‍රහ්ම බව ''උපතින් නොලැබේ'' යන අදහසයි. ආර්යභාවයට පත්වීමට ජාති, කුල, ප්‍රදේශ, ගෝත්‍ර, සම්පත් ආදිය හේතු නොවේ. අධිශීල ශික්ෂාදියම ඊට හේතු වේ. එනිසා කියන ලදී.

''යථා සංඛාරධානසම්ං උජ්ඣිතසම්ං මහාපථෙ,
පදුමං තත්ථ ජායෙථ සුච්චිගන්ධං මනොරමං''

''එවං සංඛාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ,
අතිරොචති පඤ්ඤාය සම්මා සම්බුද්ධ සාවකො''

මහා මාර්ගයේ කුණු ආදිය දමන දිය සහිත කසළ ගොඩෙක, සුවඳැති සිත්කලු පියුමක් හටගන්නාක් මෙන්, කසළ ගොඩක් බඳු වූ නුවණ නැති පුහුදුන් ලෝවැස්සා අතරින් උපන්, සම්මා සම්බුද්ධ ශ්‍රාවකයා ප්‍රඥාවෙන් සෙසු ජනයා ඉක්මවා බබළයි.

මෙසේ සුනීත තෙරණුවෝ ඒ භික්ෂූන් විසින් විමසූ අර්ථය මේ ගාථාවලින් ප්‍රකාශ කරමින් සීංහනාද පැවැත්වූහ.

සුනීත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දොළොස්වන නිපාතයේ අර්ථ වර්ණනාව සමාප්තයි.

13.1.1

දහතුන්වන නිපාතයේ "**යාහු රථෙ**" යනු ආයුෂ්මත් **කොලිවිස සෝණ** තෙරුන් වහන්සේගේ ගාථාවන්ය. ඒවායේ උපත කෙසේ සිදුවී ද ? උන්වහන්සේ ද පෙරබුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව පින්දහම් රැස්කර ගත්හ. "**අනෝමදස්සි**" භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සමයේ දී හෙතෙම ඉතා ධනවත් සිටුවරයෙක් ව ඉපිද, උපාසකවරුන් සමග විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේගෙන් දහම් ඇසීය. ඉන් පැහැදුණු සිත් ඇති හෙතෙම ශාස්තෘන් වහන්සේ සක්මන් කරන මළුව හුණු බදාමයෙන් පිරියම් කරවා, නානා වර්ණවත් මලින් අලංකාර කරවා, ඒ මත නානාවිධ වස්ත්‍රයන්ගෙන් වියනක් බැඳවීය. එසේම ශාස්තෘන් වහන්සේගේ භික්ෂු මහා සංඝරත්නයට ද දිගුශාලාවක් කරවා පූජාකළේය. ඒ පින්කම් වල විපාක විඳිමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරූ හෙතෙම; **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේගේ කාලයේදී හංසවතී නුවර සිටුගෙදරක උපත ලැබ, "**සිරිවඩ්ඪ**" නාමයෙන් ප්‍රකට විය. තරුණවියට පත් ඔහු විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේ සමීපයේ සිට දහම් අසමින් සිටි අවස්ථාවක, ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක්, ආරද්ධවීරිය භික්ෂූන්ගෙන් අග්‍රභාවයට පත්කරනු දුටුවේය. සිරිවඩ්ඪ සිටුවරයා ද ඒ තනතුරම පතමින් සත්දිනක් බුදුපාමොක් මහසඟනට මහදන් පවත්වා ප්‍රණිධානය පැවසීය. ඔහුගේ ප්‍රාර්ථනාව ඉටුවෙනු බව දුටු ශාස්තෘන් වහන්සේ ද නියත විවරණ දුන්සේක. දිවි ඇතිතාක් පින් දහම් කළ හෙතෙම දෙව්මිනිස් දෙගතියේ සැරිසරමින් අවුත්; කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිවි පසුව, අපගේ බුදුනු පහළවීමට පෙර දී බරණැස සිටු ගෙයක උපන්නේය. නුවණැතිබවට පත් ඔහු ගඟක් අසබඩ පන්සලක් සාදවා එහා පසේ බුදුවරයකු වඩා හිඳුවා සිවුපසයෙන් ඇප උපස්ථාන කළේය. විසූ වස් ඇති, පිරිපුන් පිරිකර ඇති පසේ බුදුරජාණන් වහන්සේ ගන්ධමාදන පර්වතයටම වැඩිසේක. ඒ සිටුපුතු ද දිවිතාක් තව තවත් පින්දහම් සිදුකර ඉන් චුතව කාමසුගතීන් හි සැප විඳිමින් සසර සැරිසරා අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී **චම්පා** නුවර **උසභ** සිටුහුගේ ගෙයි ඉපදුනේය. ඒ දරුවා පිළිසිඳගත් මොහොතේ සිට ම සිටුවරයාගේ භව භෝග සම්පත් වැඩුනේය. ඔහු උපන් දිනයේදී මුලු නුවර වැසියන්ට ම මහත් සත්කාර සම්මාන ලැබිණි. උපදින අවස්ථාවේදී ද පෙර අත්බවෙකදී පසේ බුදුවරයෙකුට ලක්ෂයක් අගනා රතු කම්බිලියක් පිදූ පිනින් ඉතා පිරිසිදු රන්වන් වර්ණයෙන් බබළන අතිශය සියුම් ශරීරයක් ඔහුට ලැබිණි. එනිසා එකුමරුට "**සෝණ**" නම තබන ලදී. මහත් පිරිවරින් වැඩිණු සෝණගේ අත් පා තල බඳුවද මල් පැහැයෙන් බැබලුණි. සියක්

වර පෙළු කපුපුවුන් බඳු සුට පහස් ඇති ශරීර විය. පාවල යටිපතුලේ මිණිකොඩෙල් වර්ණ ඇති ලෝම හටගත්තේය. නිසිවියට එළඹී සෝණට නුන් සෘතුවට යෝගය ප්‍රාසාද තුනක් කරවා නාටකාංගනාවන් සහිතව පැවරීය. ඔහු ඒ කාම සම්පත් දිව්‍යකුමාරයකු මෙන් විඳිමින් කල් ගෙවීය. මේ කාලයේදී අපගේ ශාස්තෘන් වහන්සේ සර්වඥපදවිය ලබා, පැවැත් වූ දම්සක් දෙසුම් ඇතිසේක්; රජගහ නුවර වෙසෙති. බිම්සර මහරජුගේ කැඳවීම අනුව අසූදහසක් ගම්පතිහු සමඟ රජගහ නුවරට පැමිණි සෝණ කුමරු ද, බුදුරදුන් වෙත ගොස් ධර්මශ්‍රවණය කළේය. සසුන පිළිබඳව පැහැයුණු සිතැති සෝණ ශ්‍රද්ධා වෙන් පැවිදිව, ලැබූ උපසපන් බව ඇතිව, ශාස්තෘන් වහන්සේගෙන්ම කමටහන් ගෙන, ජනයාගෙන් වෙන්ව සීතවනයේ වාසය කළේය. උන්වහන්සේ, ''මගේ ශරීරය ඉතා සියුමැලිය සැපෙන් සැප ලැබීමට නම් නොහැකිකමය. කය වෙහෙස වා කමටහන් වැඩිය යුතුය''යි සිතා සක්මනට ම සිත යොදවා වීර්යයෙන් යුතුව කෙලෙස් දුරුකිරීමෙහි යෙදුණුසේක. පා තල පැලී වේදනා ඇතිවුවත් දැඩිවීර්යයෙන් යුතුවම සක්මන් කළ නමුත්, ''මම ආර්ය මාර්ගයක් හෝ ආර්ය ඵලයක් උපදවා ගැනීමට අසමත් වෙමි. මේ පැවිද්දෙන් කවර ප්‍රයෝජනයක් ද ? ගිහිව කාම සම්පත් විඳ පින්දහම් කරගන්නෙමි''යි සිතූ උන්වහන්සේගේ එම සිත දුටු බුදුපියාණන් වහන්සේ එතැනට වැඩම කළසේක. වීණෝපමාවෙන් දහම් දෙසූ තථාගතයන් වහන්සේ වීර්ය සමතාවයට සෝණහිමියන්ගේ සිත යොමුකරවා, කමටහන ද පිරිසිදු කර දී ගිජුකුළු පවුවට වැඩිසේක. සෝණ තෙරණුවෝ ද බුදු මුවින් ලද අවවාද ඇතිව, වීර්ය සමතාවෙහි පිහිටා විදසුන් වඩා රහත් වූහ.

අපාදාන පාළියේ දී උන්වහන්සේ මෙසේ වදාළහ.

''මම නාදිගුණ ඇති ලෝක ජ්‍යේෂ්ඨවූ අනෝම දස්සි බුදුරජාණන් වහන්සේට හුනුබදාමයෙන් අලේප කළ සක්මන් මළුවක් පිදුවෙමි. නානාවර්ණ මල් සමූහයෙන් සක්මන් මළුව වැසූ මම, එය වැසෙන සේ අහසෙහි වියනක් බඳවා උතුම් බුදුපියාණන් ලවා පරිභෝග කරවූයෙමි. මනා චුත ඇති බුදුරදුන් දෙසට ඇදිලි බැඳගත් මම භාග්‍යවතුන් වහන්සේට දීර්ඝ ශාලාව පිළිගැන්වීමි. ලොව අනුත්තර වූ භාග්‍යවත් වූ පසැස් ඇති උන්වහන්සේ මගේ සිත්දුන මේ සියලු පූජා පිළිගත්සේක. සදෙව් ලොවම දක්ෂිණාවට සුදුසු වූ සර්වඥයන් වහන්සේ බික්සඟන මැද වැඩහිඳ මෙසේ වදාළසේක.''

''යමෙක් සතුටු සිතින් දීර්ඝ ශාලාවක් කරවා පූජාකළේ ද ඔහු කවරෙකුවේ ද? යි මම පවසමි. එසේ පවසන මාගේ වචන අසවු මේ පින්

බලයෙන් මොහුට මරණාසන්න අවස්ථාවේ දහසක් අසුන් යෙදූ අශ්වරථයක් පැමිණියේය. ඒ යානයෙන් දෙව්ලොව යන මෙතෙම දෙවියන් සමඟ තුටුවන්නේය. රන් සුණු ආලේප කළ, උතුම් කුළඟෙවල් සහිත මාහැඟි, ශ්‍රේෂ්ඨ සඳලු ඇති විමානයක වාසය කරන්නේය. කල්ප තිහක් දෙව් සැප විඳින මොහු කල්ප විසිපහක්ම දිව්‍ය රාජ්‍ය කරන්නේ ය. සක්විති රජව සැත්තෑ සත්වරක් සැපවිඳින මොහුගේ නාමය ''**යසෝධර**'' නම් වේ. ඒ සියල්ලෝම එකම නම් ඇත්තෝ වෙති. දෙව් මිනිස් දෙසැප විඳ, තවත් පින් සිදුකරන මෙතෙම මින් කල්ප විසි අටකට පසුව ද සක්විති රජව උපදින්නේය. එහි විස්කම් දෙවි පුතු මැවූ උතුම් විමනකි. දශවිධ ශබ්දයෙන් පිරි එනුවර අධිපතිව සැපවිඳින්නේය.''

''මීට අප්‍රමාණ කල්පයක පෘථිවිය පාලනය කරන මහත් ඍද්ධි ඇති **ඔක්කාක** නම් රජෙක් පහළවේ. සොළොස් දහසක් ස්ත්‍රීන්ට නායක වූ **ක්ෂත්‍රිය** දුවණියක් හා සැපවිඳින එරජුට දූවරු පහක් ද පුතුන් හතරක් දුයි දරුවෝ නමදෙනෙකි. නව දරුවන් වැදූ බිසව කළුරිය කළ පසුව නව අග මෙහෙසියක් පත්වන්නීය. ඇය ඔක්කාක රජුගෙන් වරයක් ලද්දී, නව දරුවන් රටින් පිටුවහල් කරවන්නීය. සිය නුවරින් නික්ම හිමවතට යන ඔවුහු ජාති භේදවේ යන බියෙන් සොයුරියන් සමඟ එක්ව විසූහ. ඉන් එක් දුවකට කුෂ්ඨ ව්‍යාධියක් ඇතිවන්නේ ය. ක්ෂත්‍රිය කුමාරවරු ඇය ''ජාති මිශ්‍රවීම නොකරත්වා''යි වළක දමා උඩින් වසති. රාම නම් රජෙක් ඇය වළෙන් ගොඩ ගෙන එක්ව විසීමෙන් ඔක්කාක කුලයේ ජාතිමිශ්‍රවීම සිදුවේ. ඔවුන්ගේ දරුමුණුබුරු පරපුර කෝලිය නම් වෙති. ඔවුහු අප්‍රමාණ සැප සම්පත් අනුභව කරති. එයින් ද චුතවන මෙතෙම දෙව්ලොව ඉපිද, මනහර දෙව් විමනක දෙව් සැප විඳින්නේය. නැවත පින් මහිමයෙන් මිනිසත් බව ලැබ **සෝණ** නමින් ප්‍රකටවන මෙහෙතම, බුදුසසුනේ පටන්ගත් වීර්ය ඇති, නිවණට මෙහෙයූ සිත් ඇතිව වෙර වඩා සියලු ආශ්‍රව සිඳ දමා රහත්ව පිරිනිවන් පාන්නේ ය. අනන්ත නය දක්නාවූ ශාක්‍ය කුල ජ්‍යෙෂ්ඨ වූ සියල්ල විශේෂයෙන් දත්තා වූ **ගෞතම** බුදුහු මෙතෙම අග්‍රස්ථානයේ තබති.''

''දැන් මම උතුම් දමනයෙන් දමුනෙමි. මා සිත මනාව පිහිටුවා ගත්තෙමි. සියලු බර බහා තැබූ මම ආශ්‍රව රහිතව පිරිනිවුනෙමි. අංගීරස නම් වූ මහානාග නම් වූ ශ්‍රේෂඨ ජන්ම ඇති කේශර සිංහයකු වැනි බුදුහු භික්ෂු සංඝයා මැද වැඩහිඳ මා අග්‍රස්ථානයේ තැබූ සේක. මව්සින් සියලු කෙලෙස් දවූයෙමි. - ප - බුදුරදුන්ගේ අනුශාසනාව ඉටුකළෙමි. ''

අපදාන පාළියේ නොඑන මේ ගාථාව තේරගාථාවේ කථාවේ පමණක් ඇත්තකි.

''වඩ්ඪමිහි දෙවෙ චතුරඞ්ගුලෙ පතිතෙ අනිලෙරිතා පාදපසම්පසුයෙ
ඣානෙ රතසසපසුතසස තාදිනො තතො රති පරමතරා න විජ්ජති''

එම ගාථාවේ උචිත බවක් නොපෙනේ. රහත්බවට පත් සෝණ හිමියෝ තම පිළිවෙත් මඟ සිහිකර, ප්‍රීතිය පහළ කිරීම් වශයෙන් සිය රහත් බව මේ ගාථාවලින් පැවසූහ.

''යානු රත්‍යෙ සමඤ්ඤථො රත්‍යෙසූසා අඞ්ගසස පද්ධගූ
සඞ්ඛ්‍ය ධම්මෙසු උඤ්ඤථො සොණො දුඤ්ඛසස පාරගූ''

''පඤ්ච ජීනෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ
පඤ්ච සංගාතිගො හික්ඛූ ඔඝතිණ්ණොති වුච්ච ති''

''උනහළසස පමත්තසස බාහිරාසසස හික්ඛුනො
සීලං සමාධි පඤ්ඤා ච පාරිපූරිං න ගච්ඡති''

''යං හි කිච්චං තදපවිද්ධං, අකිච්චං පන කයිරති
උනහළානං පමත්තානං, තෙසං වඩ්ඪන්ති ආසවා''

''යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතා සති
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනෙ''

''සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා
උප්පුම්ගහමිහි අඤ්ඤාතෙ ගච්ඡථ මා නිවත්තථ''

''අත්තනා චොදයත්තානං නිබ්බාණමභිහාරයෙ
අච්චාරද්ධමිහි විරියමිහි සත්‍ථා ලොකෙ අනුත්තරෙ''

''වීණොපමං කරිත්වා මෙ ධම්මං දෙසෙසි චක්ඛුමා
තසසාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො''

''සමතං පටිපාදෙසිං උත්තමත්‍ථසස පත්තියා
තිසසො විජ්ජා අනුප්පත්තා කතම්බුද්ධසස සාසනං''

''පොඛමෙම අධිමුත්තසස පවිවෙකඤ්ච චෙතසො
අබ්‍යාපජ්ඣාධිමුත්තසස උපාදානක්ඛයසස ච''

''නඤ්ඤායාධිමුත්තස්ස අසම්මොහඤ්ච චෙතසෝ
දිස්වා ආයතනුප්පාදං සම්මා චිත්තං විමුච්චති''

''තස්ස සම්මා විමුත්තස්ස සන්තචිත්තස්ස භික්ඛුනෝ
කතස්ස පතිචයෝ නත්ථි කරණීයං න විජ්ජති''

''සෙලෝ යථා එකඝනෝ වාතෙන න සම්මිති
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සාව කෙවලා''

''ඉට්ඨා ධම්මා අනිට්ඨාව නප්පවෙධන්ති තාදිනෝ
ඨිතං චිත්තං විසංයුත්තං වයං වස්සානුපස්සති'' තී.

එහි ''යානූ රථෙ සමුක්කථෝ'' යමෙක් රටේ අසූ දහසක් ගම්පතීන් අතුරින් ඉසුරුමත් බවින් ඉතා උතුම් බවට, උත්කෘෂ්ඨ බවට , උසස් බවට පැමිණියේ ද (ඒ සෝණ) ''රක්ඛෙඤ්ඤා අංගස්ස පඬිගූ'' සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාව සතුටුකරන, රැක්ෂණය කරන බැවින් ''රජු'' නම් වූ අංගාධිපති බිම්බිසාර මහරජුගේ පිරිවරට අයත් වූ, උපතින් ම ඒ රටේ සුවිශේෂී කෙළෙඹියෙක් වූ ''ඝාජ්ජ ධම්මෙසු උක්කථෝ'' ඒ සෝණ අද ලෝකෝත්තර ධර්මයෙහ උත්කෘෂ්ඨ බවට පත්ව සිටියි. ගිහි කාලයේ ලෞකික ධර්මයන් හි උත්කෘෂ්ඨ බවට ද පැවිදි වූ මේ අවස්ථාවෙහි ලෝකෝත්තර ධර්මයේ උත්කෘෂ්ඨ බවට ද පැමිණියේය. තමාම අනිකකු මෙන් දක්වයි. ''දුක්ඛස්ස පාරගූ'' සියලු සංසාරික දුකෙහි පරතෙරට, අවසානයට ගියේය. මෙහිදී ''ධම්මෙසු උක්කථෝ'' යැයි විශේෂයක් නැතිව කියන ලදී. උත්කෘෂ්ඨ භාවය නම් විශේෂයෙන්ම අර්හත් මාර්ගාවබෝධයයි.

අනතුරුව යම් පිළිවෙතකින් දුකෙහි කෙළවර දුටුවේද, රහත්බව ප්‍රකාශ කරමින් එය දක්වනු සඳහා, ''පඤ්ච ඡින්දෙ'' ගාථාව දක්වයි. එහි අර්ථය මෙසේය. අපාය කාම සුගතීන්ට සත්ත්වයා පමුණුවන ඕරම්භාගිය සංයෝජන පස පයෙහි බැඳි රැහැනක් මෙන්, නුවණැත්තා විසින් යටම වූ මාර්ග තුන (සෝවාන්, සකෘදාගාමී, අනාගාමී) නම් සැතින් සිදිය යුතුයි. රූපා රූප භවයන්ට සත්ත්වයා පමුණුවන උද්ධම්භාගිය සංයෝජන පස, නුවණැත්තා විසින් බෙල්ලේ බැඳි රැහැනක් මෙන් අර්හත් වූ අග්‍ර මාර්ගයෙන් සිඳිය යුතුය. ඒ අතුරින් උද්ධම්භාගිය සංයෝජන ප්‍රහාණය කිරීමට ශ්‍රද්ධාදී පසක් වූ ඉන්ද්‍රියයන් වැඩිය යුතුයි. මෙසේ වූ භික්ෂුව රාග, දොස, මෝහ, මාන හා දිට්ඨි යන සංග පස ඉක්මවා, මැඩපැවැත්වීමෙන් ''පඤ්ච සංගාතිගෝ'' ඕඝයන් තරණය කළ බැවින් ඒ භික්ෂුව ''ඔඝතිණ්ණ'' නම් වේ. මෙසේ ඕඝතරණ ප්‍රතිපත්තිය ද සීලාධීන්ගේ සම්පූර්ණත්වයද දක්වා,

සීලාදි ගුණදහම් මානාදිය ප්‍රහාණයට උපකාරීවනු දක්වීමට ''**උත්තත්ත ළක්ඛණ**'' යන ගාථාව දක්වන ලදී. එහි ''උත්තත්ත ළක්ඛණ'' යනු උස්ව නැගුණු හිස් වූ මාන ඇති, මානය උඩුකුරුවූ පැවැතුම් ඇති හිස් වූවක් බැවින් බට ගසක් බඳුය. ''**නළ**'' යනු බට ගසයි. ''**පමත්තස්ස**'' සිහිය නොමැතිව, සිහිමුර්ඡාවීමෙන් ප්‍රමාදයට පැමිණි. ''**බාහිරස්ස**'' බාහිර අයතනයන්හි ආශාව ඇති, කාමයන්හි රාගය දුරු නොවූ කාමාශක්ත ''**සීලං සමාධි පඤ්ඤා ච පාරිපූරිං නගච්ඡති**'' ඒ භික්ෂුවට සීලාදියට විරුද්ධ වූ හැසිරීම් ඇති හෙයින් ලෞකික වූ ද ශීලාදි ගුණදහම් නොපිරේ. ලෝකෝත්තර ගුණධර්ම නොපිරේ යැයි කිවයුතු නොවේ. ඊට හේතු දක්වමින් ''**යංහි කිච්චං**'' ගාථාව වදාළහ. යම් භික්ෂුවක් පැවිදි වූදා පටන් අප්‍රමාණ වූ **සීල** ස්කන්ධය ආරක්ෂා **කිරීම**, අරණ්‍යවාසීව ධූතඟ සමාදන්ව භාවනාවෙහි ඇලී විසීම ආදිය ''**කිච්චං**'' කටයුතු නම් වේ. මෙසේ පැවිදි වූවහු විසින් කළයුතු, තමාට අයත් කටයුතු බැහැරලා, දුරු කර, ඉවතලා පාත්‍ර සැරසීම, චීවර, කායබන්ධන, අංසකඩය, කුඩය, පාවහන්, කුඩා තැටිය, පෙරහන්කඩ යනා දී පිරිකර සැරසීම, සිවුපසය රැස්කිරීම ආදී භික්ෂුව විසින් නොකළ යුතු ''**අකිච්චං**'' කටයුතු කරයි. ඒ භික්ෂූන්ගේ මානය වර්ධනය වී උස්වගිය මන්ඇතිව, ප්‍රමාදීව, සතර ආශ්‍රව වර්ධනය වේ. යමෙකුට ප්‍රඥාදී ගුණ වර්ධනය වේද ඒ පිළිවෙත් දක්වීමට ''**යෙසං**'' යන ගාථාව දක්වීණි. එහි ''**සුසමාරද්ධා**'' මනාව පිළිගන්නා ලද, මනාව ඇරඹූ ''**කායගතාසති**'' කායානුපස්සනා භාවනාව ''**අකිච්චං තෙ**'' ඔවුහු පාත්‍ර සැරසීම් ආදිය, නො කරති. ''**න සෙවන්ති**', ''**කිච්චෙ**'' පැවිදි වූ අවස්ථාවේ සිට කළයුතු අප්‍රමාණ **සීල** ස්කන්ධය ආරක්ෂා කිරීමෙහි නොනැවතී ක්‍රියා කරන, ''**සාතච්චකාරිනො**'' සිහියෙන් නොවන්ව, නිතරම සිහි ඇතිව, ''**සතානං**'' සාර්ථක, සප්පාය, ගෝචර, අසම්මෝහ යන සිවුවැදෑරුම් විමසන නුවණින් ''**සම්පජානානං**'' සම්ප්‍රජඤ්ඤයන්ගෙන් යුතු වූවන්ගේ ''**ආසවා**'' සිවු ආශ්‍රව ධර්මයෝ ''**අත්ථං ගච්ඡන්ති**'' ගෙවීමට, ක්ෂයවීමට යති. දැන් සෝණ හිමියෝ තමන් වහන්සේ සමීපයේ සිටින භික්ෂූන්ට අවවාද කරමින් ''**උජුමග්ගමහි**'' යන ගාථාව දේශනා කරති. එහි ''**උජුමග්ගමහි අක්ඛාතෙ**'' අන්ත දෙක දුරුකර, කාය වංකාදිය බැහැර කර, ඍජුවූ මධ්‍යම ප්‍රතිපදාවට පැමිණි, ශාස්තෘන් වහන්සේ පෙන්වාදුන් ආර්ය මාර්ගයේ යවූ, එය පිළිපදිවූ, නොනවතී වූ, අතරමග නතර නොකරවූ. ''**අත්තනා චොදයත්තානං**'' මෙලොව තමාට හිතවැඩ කැමති පුද්ගලයා අපායේ බියජනක බව සිහිකිරීම් ආදියෙන් තමා ම තමාට චෝදනා කරගනිමින්, ''**නිබ්බාණමභිහාරයෙ**'' තමාම නිවණට පමුණුවන්නේ ය, ගෙනයන්නේ ය, යම්සේ නිවන් සාක්ෂාත් කරා න්නේ ද එසේ පිළිපදින්නේ ය. අනතුරුව මවිසින් ද එසේම පිළිපදින ලදැයි තමාගේ පිළිවෙත් මඟ

දැක්වීමට ''අධිච්චාරද්ධමෙහි'' යනාදිය කියන ලදී. ''අධිච්චාරද්ධමෙහි විරියමෙහි'' විදසුන් වඩන්නාවූ මැවිසින් සමාධියෙන් සමානව නොකර, ඉතා දැඩිව වීර්ය උපදවාගෙන, පමණ ඉක්මවූ වීර්ය ඇතිව සෝණ හිමි ක්‍රියා කළ අයුරු ඉහතින් දැක්විණි. ''**වීණෝපමං කරිත්වා මෙ**'' ආයුෂ්මත් සෝණට, ''ඇතැම් බුද්ධ ශ්‍රාවකයෝ අරඹන ලද වීර්ය ඇතිව වාසය කරති. ඔවුන් අතුරින් මම එක් ශ්‍රාවකයෙක්මි. නමුත් මගෙ සිත තවම අශ්වයන්ගෙන් නොමිදුණේය. එනිසා මම සිවුරු හැර යන්නෙමි'' යි යන සිත උපන් කල්හි, ශාස්තෘන් වහන්සේ ඍද්ධියෙන් උන්වහන්සේ ඉදිරියට වැඩමවා, ''සෝණ කුමක් නිසා නුඹ සිවුරු හැර යන්නෙමි යන සිත ඉපදවුයෙහිද?'' විචාරා, ''නුඹ පෙර ගිහිව සිටිය දී වීණාවාදනයට දක්ෂ වූ යෙහි ද ?'' විමසුසේක. එවිට සෝණ හිමි ''එසේය ස්වාමිනි'' යි පැවසීය. ''සෝණය, නුඹ කුමක් සිතන්නේ ද ? යම් අවස්ථාවක නුඹ වීණාවෙහි තත් තදින් අදනා ලද විට තදින් පිරිමඳින ලද විට, නුඹගේ වීණාවේ මිහිරි හඬක් ඇති වී ද ? ''වීණාගායනාවට එය සුදුසුවුයේ ද ?'', ''එසේ නො වේමය, ස්වාමීනි'' ''සෝණ, නුඹ කුමක් සිතන්නෙහි ද ? යම් අවස්ථාවක නුඹගේ වීණාවේ තත් ඉතා තද නොවී, ඉතාලි හිල් නොවී සමගුණයේ පිහිටා පිරිමැදිනුයේ ද කිම එකල්හි නුඹගේ වීණාවේ මිහිරි හඬ අතිවේ ද? වීණා ගායනාවට සුදුසු ද?'' යි ඇසු කල්හි සෝණ හිමියෝ ''එසේය, ස්වාමිනි'' යි පිළිතුරු දුන්හ. ''සෝණ, එලෙසින් ම දැඩිව ගත් වීර්යය උඩඟු බව පිණිස පවතියි. හැකිළුණු, ලිහිල් වූ වීර්යය කුසීතබව පිණිස පවතීයි. සෝණ, එනිසා නුඹ වීර්යයේ සම බව ඉටා ගනුව. ඉඳුරන්ගේ සමබව දැන ගනුව. එහි නිමිති ගනුව.'' යි බුදුහු මෙසේ වීණාව උපමා කරගෙන පැවැත් වූ වීණෝපමාවාදයෙන් මට දහම් දෙසුහ. ''**තස්සානං වචනං සුත්වා**'', ඒ භාග්‍යවතුන් වහන්සේගේ වීණෝපමාවාදය අසා, භාවනාව අතරමඟ උපන් සිවුරු හැර යෑමේ අදහස ඉවතලා බුදුසසුනේ ඇලී දැඩිව ඇලී විසුවෙමි. වාසය කරමින් ම ''**සමථං පටිපාදෙසං**'' වීර්ය සමතාවෙහි යෙදීම පිණිස, ශ්‍රද්ධා ප්‍රඥාවන්ගේ ද සමාධි වීර්යයන්ගේ ද යුද්ධ සීයක් උපදවා ධ්‍යානාධිෂ්ඨානයෙන් විදර්ශනා සමාධිය උපදවා ගත්තෙමි, විදර්ශනා වැඩුවෙමි. එහි ප්‍රයෝජන අනතුරුව දැක්වේ. ''**උත්තමත්ථස්ස පත්තියා**'' අර්හත්ඵය අවබෝධ කර ගැනීම සඳහා අනතුරුව පිළිපදින ලද සමථ විදර්ශනා සමවැදීම් පිළිබඳව සිය රහත්බව ප්‍රකාශ කරමින් ''**නෙක්ඛම්මෙ**'' යනාදිය දැක්විණි. එහි ''**නෙක්ඛම්මෙ**'' කාමයෙන් වෙන්ව පැවිදිවීමෙහි, ''**අධිමුත්තස්ස**'' ඒ කෙරෙහි නැමුණු, ඇලුණු, යෙදුණු සිතින් පළමුව පැවිදිවීමේ ආශාවෙන් යුතුව කාමයන් හැර දමා පැවිදිවූයෙමි. පැවිදිව සීල පිරිසිදු කිරීම්, අරණ්‍යවාස, ධූතංගසමාදාන ආදියෙන් නිරවද්‍ය ධර්මයන්

හි යෙදෙමින් ''විවෙකඤ්ඤ චෙතසෝ'' සිතේ ප්‍රකර්ෂ විවේකයෙහි නෛෂ්ක්‍රම්‍ය අධිමුක්තියෙහි සිටුවන, පස්වන ධ්‍යානයන් ඉපදීමෙන් විවේකයෙහි යෙදුණු ''අබ්‍යාපජ්ඣාධිමුත්තඤ්ඤ'' නිදුක් නිරෝගීභාවයේ යෙදුණු, ඒ කෙරෙහි නැමුණු ධ්‍යාන සමාපත්ති උපදවා සමථ භාවනාවේ හි නියුක්ත වූවහුට, ''උපාදානක්ඛයඤ්ඤ ච'' සිටුවැදුරුම් උපාදානයන් ගේ ක්ෂයවීමෙන් අර්හත්වයට නැමුණු. මෙය සත්තම් අර්ථයේ ඡට්ඨී විභක්ති පදයකි. මෙසේ තමා අවබෝධ කරගත්, උපදවාගත් ධ්‍යානය පාදක කරගෙන අර්හත්වාවබෝධය සඳහා විදර්ශනාවෙහි යෙදුණු පුද්ගලයාට ''**තණ්හා ක්ඛයාධිමුත්තඤ්ඤ**'' තණ්හාව ක්ෂය වේ, නැතිවේ යනු ''තණ්හක්ඛය'' නම් වේ. එනම් නිවණයි. භය වශයෙන් උපාදාදිය ද ක්ෂේම වශයෙන් අනුපාදාදිය ද දැක්වීමෙන් නිවණට යොමු වූ නැමුණු තැනැත්තාට, ''**අසම්මොහඤ්ඤ චෙතසෝ**'' ආර්ය මාර්ගයෙහි විමසන නුවණින් යුතුව, සිතේ නොමුලාව පැවැත්ම, මුලාව - මෝඩකම මුලිනුපුටා දැමීමෙන් සිත නොමුලාවූ, ආර්ය මාර්ගයට නැමුණු, ''දිස්වා ආයතනුප්පාදං'' ඇස්කන් ආදී ආයතනයන්ගේ සිය ප්‍රත්‍යයන්ගෙන් ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදින, නිරෝධයට ප්‍රතිපක්ෂ වූ ද විදර්ශනා ප්‍රඥා සහිත වූ ද මාර්ග ප්‍රඥාවෙන් දැකීමෙන්, දැකීම නිසා, ''සම්මා චිත්තං විමුච්චති'' යහපත් ව, මනාව, අර්ය මාර්ගයේ පිළිවෙලින් ගමන් කරීමෙන් සියලු ආශ්‍රවයන්ගෙන් සිත මිදෙයි. ''**තඤ්ච සම්මා විමුත්තඤ්ඤ**'' යනාදියේ මේ සංක්ෂිප්තාර්ථ යයි.

මෙසේ ඉහතින් පැවසූ ලෙසම මනාව සියලුම කිලිටි බව ඇතිකරන කෙලෙසුන්ගෙන් මිදුණු තැනැත්තාට, එසේ ම අතිශයින් ම සන්සිඳුණු සන්සුන් සිත් ඇති ක්ෂීණාශ්‍රව භික්ෂුවට, කරන ලද කුසලා කුසලයන්ට රැස්කිරීම් නැත. කළයුතු කටයුතු නිමවූ බැවින්, ආර්යමාර්ගයෙන් ම කෙලෙස් මුලිනුපුටා දැමූ බැවින්, විශේෂ දැනීම් ආදී ප්‍රභේද ඇති බැවින් කළයුත්තක් නැත. මෙසේ කටයුතු සිදු කරගත් රහතන් වහන්සේ., ඒකඝන පර්වතයක් සාමන්‍ය සුලඟින් නොසැලී, අකම්පිතව පවතින්නාක් මෙන්, ඉෂ්ටානිෂ්ට රූපාදී අරමුණු නිසා ස්ථීර වූ ස්ථීර ව පිහිටි, තෘෂ්ණා රහිත වූ, සියළු සංයෝග ප්‍රහීණ කළ, කෙළෙසුන්ගෙන් වෙන් වූ සිත., නොසැලේ, කම්පා නොවේ, ඒ ආයුෂ්මත්තන් වහන්සේ තමාට පැමිණෙන අරමුණු ධර්මයන්ගේ කලින් කලට ඵල සමවතට සමවැදීමෙන් යථාතත්ත්වය අවබෝධ කරගෙන, අරමුණු වල ව්‍යයවීම, නිරෝධය, ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳීයෑම බලති.

සෝණ කෝලිවිස ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දහතුන්වන නිපාතයේ ගාථා අර්ථවර්ණනාව සමාප්තයි.

14.1.1.

දාහතරවන නිපාතයේ ''යදා අහං'' යනු ආයුෂ්මත් බදිරවණීය රේවත තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. ඒ ගාථාවේ උපත කෙසේ සිදුවී ද ? මේ තෙරුන් වහන්සේගේ ගාථාවක් ඉහත ඒකක නිපාතයේ දක්වීණි. එහිදී උන්වහන්සේ සිය බෑණාවරුන් වූ සාමණේරයන් ට සිහිය ඉපිදවීම සඳහා ඒ ගාථාව දේශනා කළසේක. එනිසා එම ගාථාව ඒකක නිපාතයේ සංග්‍රහ කර දක්වීණි. මෙහි වනාහි තෙරුන් පැවිදි වූ තැන් පටන් පිරිනිවණ දක්වා වූ ප්‍රතිපත්ති මාර්ගය දක්වන ගාථා දහතරක් ඇතුලත්ය. එනිසා එය චුද්දස නිපාතයේ සංග්‍රහ කරන ලදී. එහි අර්ථෝත්පත්තිය ඉහතින් පැවසූ ලෙසම දතයුතුයි. මෙහි ඇති විශේෂත්වය පහත දක්වේ. රේවත තෙරුන් වහන්සේ රහත් බවට පත්ව, කලින් කලට ශාස්තෘන්වහන්සේ, ධර්මසේනාපති ප්‍රමු ඛ මහතෙරුන් වහන්සේලාට උපස්ථාන කරමින් දින කිහිපයක් නගරයේ වාසය කර, පසුව කිහිරි වනයට ම වැඩම වා ඵලසමවත් සුවයෙන් ද බ්‍රහ්මවිහරණයෙන් ද කල්යැවූසේක. මෙසේ කල්ගත කරන උන්වහන්සේ, වෘද්ධභාවයට, මහලු භාවයට පත්වූහ. එක් දිනක් බුද්ධෝපස්ථානයට පැඩම කළ රේවත හිමියෝ අතරමඟ සැවැතට නුදුරු අරණ්‍යයක විසූහ. එදින සොරු නගරයෙන් බඩු සොරාගෙන, ආරක්ෂක පුරුෂයන් ලුහුබැඳ එන හෙයින් පලායන්නාහු., ගත් බඩු තෙරුන් සමීපයේ දමා සැඟවී ගියහ. සොරු ලුහුබැඳ පැමිණි මිනිස්සු තෙරුන් වහන්සේ සමීපයේ දමා තිබූ සිය භාණ්ඩ දක., තෙරුන් බැඳගෙන ''සොරෙකි'' යි යන හැඟමෙන් රජුට දක්වූහ. ''රජතුමනි, මේ සොරෙකි'' යි පැවසුවත් රජු තෙරුන්ගේ බැඳුම් මුදා, ''ස්වාමීනි, ඔබවහන්සේ මේ සොරකම කළේ ද ?'' යි විමසීය. තෙරණුවෝ, ''මම වනාහි උපතේ සිට ම සොරකමක් නොකළෙමි. සියලු කෙලෙසුන් නැසූ බැවින් පැවිදි වූ අවස්ථාවේ සිට එවැනි සොරකම් කිරීමක් කෙසේවත් සිදුනොවේ.'' එබඳු දෙයක් සිදුවීමට නොහැකි බව ප්‍රකාශ කරමින් සමීපයේ සිටින භික්ෂූන්ට ද රජුට ද දහම් දෙසමින් මේ ගාථා වදාළහ.

''යදා අහං පබ්බජිතෝ අගාරස්මා අනගාරියං,
නාභිජානාමි සංකප්පං අනරියං දොසසංහිතං.''

''ඉමෙ හඤ්ඤන්තු වජ්ඣන්තු දුක්ඛං පප්පොන්තු පාණිනෝ,
සංකප්පං නාභිජානාමි ඉමස්මිං දීඝමන්තරෙ.''

''මෙත්තඤ්ච අභිජානාමි අප්පමාණං සුභාවිතං,
අනුපුබ්බං පරිචිතං යථා බුද්ධෙන දේසිතං.''

සබ්බමිත්තො සබ්බසඛො සබ්බහූනානු කම්පකො,
මෙත්තං චිත්තඤ්ච භාවෙමි අබ්‍යාපජ්ඣරතො සදා''

''අසංහීරං අසංකුප්පං චිත්තං ආමොදයාමහං,
බ්‍රහ්මවිහාරං භාවෙමි අකාපුරිසසෙවිතං.''

''අවිතක්කං සමාපන්නො සම්මා සම්බුද්ධසාවකො,
අරියෙන තුණ්හීභාවෙන උපෙතා හොති තාවදෙ.''

''යථා පි පබ්බතො සෙලො අචලෝ සුප්පතිට්ඨිතෝ,
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතොව න වෙධති''

''අනංගනස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො
වාළඟමත්තං පාපස්ස අබ්භාමත්තං ච ඛායති.''

''නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,
එවං ගොපෙථ අත්තානං ඛණෝ වො මා උපච්චගා.''

''නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පටිකංඛාමි නිබ්බිසමාහතකො යථා.''

''නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පටිකංඛාමි සම්පජානො පතිස්සතො.''

''පරිචිණ්ණා මයා සත්ථා කතම්බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරෝ, භවනෙත්ති සමූහතා.''

''යස්සත්ථාය පබ්බජිතෝ අගාරස්මා අනගාරියං,
සෝ මෙ අත්ථෝ අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයෝ.''

''සම්පා දෙථප්පමාදෙන එසා මෙ අනුසාසනී
හන්දහං පරිනිබ්බිස්සං විප්පමුත්තාම්හි සබ්බධී'' ති.

මේ ගාථාවන්ගේ අනුපුර්ව පදවර්ණනාව මෙසේය.

''ඉමස්මිං දිවසමන්තරෙ'' යම් දිනක මම පැවිදි වූ යෙම් ද එදින සිට මේ ජීවිතයේ අවසාන කාලය දක්වාම, මේ දීර්ඝ කාලය තුල ''මෙ මාහට

වේවා''යි දැඩිලෝභයෙන් හෝ ''මේ සත්ත්වයෝ නැසෙත් වා'' යි තරහ සිතින් හෝ අනාර්ය වූ ද්වේෂ සහිත සිතක්, සංකල්පයක් නූපදුවෙමි. ඉපදුණු බවක් නොදනිමි. ''**මෙත්තං ච අභිජානාමි**'' මෘදුවේ, සිනිදුවේ අරුතින් ''මෙත්තා'' නම් වේ. මෙත්තා භාවනාව, මෙත්තා බ්‍රහ්මවිහාරයයි ''ච'' වදනින් ඉනිරි බ්‍රහ්ම විහාර වූ කරුණා, මුදිතා, උපේක්ෂා යන සිත් ද අදහස් වේ. ''**අභිජානාමි**'' ඉදිරියේ සිට දනිමි. අවබෝධ කරගත් ධ්‍යානය ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්, ප්‍රත්‍යවේක්ෂා කරන ඤාණයට අභිමුඛ වේ. ඒ කෙසේ ද ? ''**අපමාණං**'' යම්සේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද්දේ ද එලෙසින් ම කිසිවකු උදෙසා, වෙන් කර නොගෙන අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කරගෙන, අප්‍රමාණ වූ ප්‍රගුණ බලවත්භාවයන් ඉපදවීමෙන් මනාව වැඩූ බැවින් ''**සුභාවිතං**'' පළමුව මෙත් සිත ද දෙවනුව කරුණාව ද ඉන්පසු මුදිතාව ද අවසන උපේක්ෂාව ද යන මේ අනුපිළිවෙළින්, අනුක්‍රමයෙන් පුරුදුපුහුණු කළ, සේවන කළ, බොහෝ කොට කරන ලද බව දනිමි.

සියලු සත්ත්වයන්ට ම මිතුයෙකි. ඒ සියලු දෙන මාගේ මිතුයෝ ය යන අර්ථ දෙකින් ම ''සබ්බමිත්තො'' හැමට මිතුරුව. මෙත් සිත වැඩීමෙන් සත්ත්වයන්ට ප්‍රියවේ. ''**සබ්බසබ්බො**'' සැමට යහළුව මෙහිද පළමු න්‍යායමයි. **සබ්බභූතානුකම්පකො**'' සියලු සත්ත්වයන්ට ම අනුග්‍රහකිරීම් වශයෙන්, ''මෙත් සිත වඩමි'', මෙත් සහිත, මෛත්‍රී සම්ප්‍රයුක්ත සිත විශේෂයෙන් වඩමි, දියුණු කරමි, ප්‍රකාශ කරමි, වචනයෙන් ප්‍රකාශ නොකළත් වැඩීමෙන් ඉතා උසස්බවට, ඉතා උඩට පැමිණෙන බැවිනි. ''මෙත්තං චිත්තඤ්ච භාවෙමි'' යන පාඨය ද යෙදේ. එහි අර්ථ ඉහතින් පවසන ලදී. ''**අබ්‍යාපජ්ඣරතො**'' අව්‍යාපාදයේ, සත්ත්වයන්ගේ හිත වැඩෙහි, යහපතෙහි විශේෂයෙන් ඇලුනෙමි ''**සදා**'' සැමදෑම ඉන් උන්වහන්සේගේ සෑම ක්‍රියාවක් ම දක්වයි. ''**අසංගීරං**'' ආකර්ෂණ රහිත වුවක් අසන්න සතුරා වූ රාගයෙන් නො අදිනු ලබන්නේ, ''**අසංකුප්පං**'' කෝප නොවී, සතුරාගෙන් දුරුවීමෙන් ව්‍යාපාදයෙන් කෝපනොවන, අකෝප්‍ය වූ මෙසේ කටයුතු කර, මගේ මෙත් සිත සතුටු කරමි. ඉතා සතුටුවෙමි. බ්‍රහ්ම විහාර වඩමි. ''**අකා පුරිස සෙවිතං**'' ළාමක, නීචයන් විසින් සේවන නොකළ කාපුරුෂ, නින්දිත, පුරුෂයන් නොවූ බුද්ධාදී ආර්යයන්, උතුමන් විසින් සේවනය කරන බ්‍රහ්ම, ශ්‍රේෂ්ඨ, නිර්දෝෂ, මෙත්තා විහාරය වඩමි. මෙසේ ගාථා පහකින් තමා උදෙසා, තමාගේ පිළිවෙත් මඟ (ප්‍රතිපත්තිය) දක්වා දැන් එය රහත්බව ප්‍රකාශ කරමින් ''**අවිතක්කං**'' යන ගාථා සතර වදාළහ. එහි ''**අවිතක්කං සමාපන්නො**'' විතර්ක රහිත දුතිය ධ්‍යානයට සමවැද, මෙයින් තෙරුන්

රහන්සේගේ ද්විතියධ්‍යානාධිගමය පැවසූහ. යම් හෙයකින්, තෙරණුවෝ එම ධ්‍යානයම පාදක කරගෙන විදසුන් වඩා එක් අසුනෙහි ම රහත් වූ සේක් ද එනිසා එම අදහස රහත්බව ප්‍රකාශ කිරීම වශයෙන් දක්වමින්, ''අවිතක්කං සමාපන්නො'' යි කියා ''එකෙණෙහිම සම්මා සම්බුද්ධ ශ්‍රාවකයා ආර්ය වූ තුෂ්ණීම්භාවයෙන් යුක්ත වේ'' යැයි පැවසූහ. එහි වචිසංඛාරයන් නොමැති හෙයින් විතර්ක විචාර නැති සමාධිය ''තුෂ්ණීම්භාවය'' යැයි කියති. ''මහණෙනි, නුඹලා රැස්වූ විට කළයුතු කාර්ය දෙකකි. දැහැමිකථා කිරීම හෝ ආර්ය වූ තුෂ්ණීම්භාවයයි. මෙහි චතුර්ථධ්‍යානවූ අග්‍රඵල සමාපත්තිය අදහස් වේ. අනතුරුව ඒ සමාධියට සමවැදුණු බැවින් ලෝක ධර්මයන්ගෙන් කම්පා නොවන බව උපමාවකින් පවසමින්, ''යථාපි පබ්බතො'' යන ගාථාව දක්වන ලදී. ''යථාපි පබ්බතො සෙලො'' ශිලාමය ඒකඝන ගල්පර්වතයක් මෙන්, එය පස් පර්වතයක් හෝ ගල්, පස් මිශ්‍ර පර්වතයක් හෝ නො වේ. ''අචලො සුප්පතිට්ඨිතො'' මනාව පිහිටි මුල් ඇති බැවින් ප්‍රකෘති වාතයෙන් (ස්වාභාවික සුලඟින්) නොසැලේ, කම්පා නො වේ, එලෙසින් ම මෝහන ක්ෂය කළ භික්ෂුව නම් පර්වතය ද ''න වෙධති'' නොසැලේ. මෝහය මුලිනුපුටා දමා, ප්‍රහීණ කළ හෙයින් මෝහය මුල් කරගත් සියලු අකුසල් ප්‍රහීණ විය. සියලු අකුසල් ප්‍රහීණකළ භික්ෂුව ස්වාභාවික සුළඟින් නො සැලෙන ගල් පර්වතයක් මෙන් අෂ්ට ලෝක ධර්මයන්ගෙන් නොසැලේ. කම්පානොවේ, ''මොහක්ඛය'' යැයි රහත්බවට ද නිර්වාණයට ද අර්හත්වයට ද පැමිණෙන හෙයින් චතුරාර්ය සත්‍යයන් හි මනාව පිහිටයි. සමාපත්තියට සමනොවැදුණු විට ගල් පර්වතයක් මෙන් නොසැලේ. සමාපත්තීන් සමවැදුණු විට නොසැලී සිටීම පිළිබඳව කියනු කිම? අනතුරුව පාපය නම් අශුචියකි. එනිසා පාපයේ නොහැසිරෙයි. සීලය පිරිසිදුවූවකි. පිරිසිදු වූවහුට අණුවක් වුවත් පිරුණු දෙයක් මෙන් වැටහෙන බව දක්වනු සඳහා '' අනංගනඤ්ඤ'' ගාථාව වදාළහ. එහි අර්ථ මෙසේය - රාගාදී අංගණ රහිත වූ, කිලිටි රහිතවූ, සැමකල්හිම පිරිසිදු වූ නිරවද්‍ය දහම් පමණක්ම සොයන්නා වූ සත්පුරුෂයාට වල්ගක් පමණ වූ හෝ කෙසඟක් පමණ වූ හෝ පාපය, කිලුට ඉතා ස්වල්පයක් වුවත් මුලු ලෝකධාතුවේම පැතිර සිටි වළාකුලක් මෙන් වැටහේ. එනිසා ''මෙම සොරකම සම්බන්ධව මා වැන්නවුන් පිළිබඳව සැක නොකළ යුතුයි.'' යන අර්ථයයි; ''නික්ලේෂී රහතුන්ට වුවත් අඤ්ඤාලයෝ මෙබඳු අපවාද උපදවති.'' එනිසා තමාට හිත වැඩ කැමති පුද්ගලයා විසින් සකසා, මනාව තමා සුරැකිව යුතුයැයි අවවාද දෙමින් ''නගරං යථා'' යන ගාථාව වදාළහ. එහි අර්ථය මෙසේය. යම් සේ ප්‍රත්‍යන්ත නගර වාසී මිනිස්සු; ප්‍රත්‍යන්ත නගර ද්වාරප්‍රාකාර ආදිය ස්ථිර කරත් ද, නුවරින් ඇතුලත දිය අගල් ආදිය ස්ථිර

කරන් ද, සර්ව ප්‍රකාරයෙන්ම නගරය ඇතුලත බාහිර දෙකින්ම ආරක්ෂා සංවිධාන ඇතිකරයි ද, එලෙසින් නුඹලා ද සිහිය පිහිටුවා, ආධ්‍යාත්මික දොරටු සය එසා ඉන්ද්‍රාදි ද්වාරයන් රැකිය යුතුයි. සිහිය නොවිසුරුවා ගනිමින් බාහිරායතන සයෙන් ගනුලබන අරමුණ අධ්‍යාත්මය වැනසීමට හේතුවේ නම් එබඳු අරමුණු නොගෙන, එම ඉන්ද්‍රිය ද්වාරයන් ස්ථිරව තබාගෙන ඒ විෂ, දූෂිත අරමුණ නොපිළිසෙන සේ ඉඳුරන් ආරක්ෂා කරගත යුතුයි. සිහිය පිහිටුවාගෙන හැසිරෙමින් තමා මැනවින් රැකගනිවු. කුමක් හෙයින් ද? ''**බණෙ වො මා උපච්චගා**'' ක්ෂණය නුඹලා ඉක්ම නොයවා යමෙක් මෙසේ තමා නොකරයි ද ඒ පුද්ගලයා බුද්ධෝත්පාද ක්ෂණය, මනුෂ්‍යාත්ම භාවක්ෂණය, මජ්ඣිම දේශයේ උප්පත්තික්ෂණය, සම්මා දිට්ඨිය ලැබීමේ ක්ෂණය හා ආයතන සය විකල් නොවී පැවතීමේ ක්ෂණය යනාදී මේ සියලු ක්ෂණ සම්පත් නො ඉක්මවයි. '' ඒ ක්ෂණ සම්පත්තිය ඉක්මවා නොයන්න'' යැයි තෙරණුවෝ මේ ගාථාවෙන් රජු සහිත පිරිසට ද භික්ෂූන්ට ද අවවාද දී; අනතුරුව මරණයේ හා ජීවිතයේ තමාගේ සම සිත් ඇති බවද කළ කටයුතු ඇතිබවද ප්‍රකාශ කරමින් ''**නාභිනන්දාමි මරණං**'' යන ගාථා වදාළහ. එහි අර්ථ ඉහතදී පැවසූ පරිදිම දත යුතුයි. මෙසේ වදාළ තෙරුන් වහන්සේ, තම පිරිනිවන් පාන කාලය පැමිණි බව දැක ඉතා සංක්ෂිප්තව ඔවුන්ට අවවාද කරමින් පිරිනිවණ පිළිබඳව පවසමින් මේ අවසාන ගාථාව දෙසූහ. එහි ''**සම්පාදෙථ සමාදෙන**'' යනු සම්පාදනය කරගත යුතු දාන සීලාදිය අප්‍රමාදීව සම්පාදනය කරවු. මෙලෝ පරලෝ ප්‍රභේද ඇති ගිහි පැවිදි කටයුතු වලද සිල් රැකීමෙහි ද සමථ හා විදසුන් භාවනා වැඩීමෙහි ද අප්‍රමාදීවවු.

''**එසා මෙ අනුසාසනී**'', ''දාන සීලාදියෙහි අප්‍රමාදීව යෙදෙවු'', යන මාගේ අවවාදයේ ස්ථිරව පිහිටා හික්මෙන්නාවූ නුඹලා මා මෙන් ගිනි සිළුවක් මෙන් පරාර්ථ චර්යාවේ. නියැලී ලොව බබුළුවා, ආත්මාර්ථ ප්‍රතිපත්තියේ ද මස්තකප්‍රාප්තවවු. යි පවසනු සඳහා ''මම ඒකාන්තයෙන් පිරිනිවෙන්නෙමි. මම සියලු භවයන් කෙරෙන් මිදුනෙමි'' යි වදාළහ. සර්වප්‍රකාරයෙන්ම කෙලෙසුන් ගෙන් ද භවයන්ගෙන් ද මිදුනෙමි. එනිසා ඒකාන්තයෙන්ම පිරිනිවන් පාන්නෙමි. මෙසේ වදාළ තෙරුන් වහන්සේ, අහසේ පළක් බැඳගත් සේක, තේජෝ ධාතුවට සමවැඳ දිළිසෙමින් අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළසේක.

බදිරවණීය රේවත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

14.1.2

''යථාපි භද්දෙ '' යනු ආයුෂ්මත් ගෝදත්ත තෙරුන් වහන්සේගේ ගාථාවන් ය. ඒවායේ උපත කෙසේද? උන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවේ කළ ප්‍රාර්ථනා ඇතිව, ඒ ඒ භවයේදී නිවන් පතාගෙන කුසල් දහම් රැස්කරමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා පැමිණිය. හෙතෙම මේ බුද්ධෝත්පාද කාලයේදී සැවැත් නුවර සත්ත්වවාහක කුලයේ ඉපිද ''ගෝදත්ත'' නමින් වැඩිවියට පත්විය. පියා කළුරිය කල කල්හි, පවුල ආරක්ෂා කරමින් පන්සීයයක් ගැල්වලින් බඩු රැගෙන ඒ ඒ තැන හැසිර වෙළඳාමෙන් දිවිගෙවූ ගෝදත්ත පොහොසත්කම අනුව පින් ද කළේය. දිනක් අතරමඟදී ගැලේ වියෙහි යොදූ ගොනෙකු, එය ඉසිලීමට අසමත් ව වැටුනේය. මිනිස්සු උත්සාහ කළත් උඹ නැගිටුවීම ඉතා අපහසු විය. එතැනට ගිය ගෝදත්ත ගොනාගේ වලිගය අල්ලා දැඩිසේ විද්දේය. ගොනා ''මේ අසත් පුරුෂයා මගේ බල දුබලතා නොදැන දැඩිව හිංසා කළේය''යි කිපී මිනිස් බසින් ''එම්බා ගෝදත්තය, මම මෙපමණ කලක් තමාගේ බලය නොපිරිහවාගෙන නුඹගේ බර ඉසුලුවෙමි. අද අසමර්ථ බව නිසා වැටුනෙමි. ඒ මට නුඹ දැඩිසේ හිංසා කළෙහිය. වේවා, මෙයින් මම මැරීගොස් උපනුපන් ආත්ම භාවයේදී නුඹට පීඩා කිරීමට සමත් සතුරෙක් වේවා''යි ප්‍රාර්ථනා කරන ලෙසින් කෑගැවේය. එය ඇසූ ''ගෝදත්ත මෙබඳුවූ සත්ත්වයෙකුට හිංසා කළ මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද ? යි සංවේගයට පත්ව, සියලු සම්පත් හැරදමා එක්තරා මහතෙර නමක් සමීපයේ පැවිදිව විඳසුන් කමටහන වඩා නොබෝ දිනකින්ම අරහත් ඵලය ලැබ සමවත් සුවයෙන් කල්යැවීය. දිනක් ගෝදත්ත තෙරණුවෝ තමා සමීපයට පැමිණි ගිහි පැවිදි පිරිසට ලෝක ස්වභාව ධර්මයෙන් අරබයා දහම් දෙසමින් මේ ගාථා වදාළසේක.

''යථාපි භද්දො ආජඤ්ඤා ධුරෙ යුත්තො ධුරාසහො
මථිතො අතිභාරෙන සංයුගං නාතිවත්තති,''

''එවං පඤ්ඤාය යෙ තිත්තා සමුද්දො වාරිනා යථා
න පරෙ අති මඤ්ඤන්ති, අරියධම්මොව පාණිනං''

''කාලෙ කාලවසං පත්තා භවාභවවසං ගතා
නරා දුකඛං නිගච්ඡන්ති, තෙධ සොචන්ති මානවා''

"උන්නතා සුඛධම්මෙන දුක්ඛධම්මෙන වොනතා
ඛ්‍රයෙන බාලා හඤ්ඤන්ති යාථාභූතං අදස්සිනො"

"යෙව දුක්ඛෙ සුඛසඤ්ඤ මඤ්ඤ සිඛනිමවවගූ
ඨිතා තෙ ඉන්‍රඛ්ලොව, න තෙ උන්නතඔනතා"

"නහෙව ලාභෙ නාලාභෙ අයසෙ න ච කිත්තියා
න නින්‍දායං පසංසාය නතෙ දුක්ඛෙ සුඛමහි ච"

"සඛඛපථ තෙ න ලිපපන්ති උදබින්‍දුව පොක්ඛරෙ
සඛඛපථ සුඛිතා වීරා සඛඛපථ අපරාජිතා"

"ධම්මෙනව අලාභො යො යො ච ලාභො අධම්මිකො
අලාභො ධම්මිකො සෙය්‍යො යං චෙ ලාභො අධම්මිකො"

"යසො ච අපපබුද්ධිනං විඤ්ඤූනං අයසො ච යො
අයසොව සෙය්‍යො විඤ්ඤූනං න යසො අපපබුද්ධිනං"

"දුම්මෙධෙහි පසංසා ච විඤ්ඤූහි ගරහා ච යා
ගරහාව සෙය්‍යො විඤ්ඤූහි යං චෙ බාලපපසංසනා"

"සුඛඤ්ච කාමමයිකං දුක්ඛඤ්ච පවිවෙකියං
පවිවෙකියං දුක්ඛං සෙය්‍යා යඤ්චෙ කාමමයං සුඛං"

"ජීවිතඤ්ච අධම්මෙන ධම්මෙන මරණං ච යං
මරණං ධම්මිකං සෙය්‍යො යඤ්චෙ ජීවෙ අධම්මිකං"

"කාමකොපපහීණා යෙ සන්තචිත්තා භවාභවෙ
චරන්ති ලොකෙ අසිතා, නඤ්ඤ තෙසං පියාපියං"

"භාවයිත්වාන බොජ්ඣඞ්ගෙ ඉන්‍රියානි බලානි ච
පපපුය්‍ය පරමං සන්තිං පරිනිබ්බන්ති අනාසවා" ති.

එහි "ආජඤ්ඤදා" යනු ආජානෙය්‍ය වෘෂභයා "ධුරෙ යුත්තො" ගැලෙහි වියදණ්ඩෙහි යොදනලද "ධුරාසහෙ" රියබර උසුලන, ගාථාව සුබෝච්චාරණය කරණු පිණිස මෙහි ඊ කාරය දීර්ඝ කර යොදන ලදී. කරත්ත බර ඉසිලීමට සමත් යන අර්ථයයි. "මථිතො අතිභාරෙන" මහාබරින්,

ගරුභාවයෙන් මැඩී, ''**මඳිනෝ**'' යන පාඨය ද යෙදේ. එහි ද එම අර්ථය මය.'' **සංයුගං**'' තමාගේ කඳෙහි, යෙදූ ස්ථානයෙහි සිටින වියදණ්ඩ නොඉක්මවන, කෑ නණ ටමාරා කමින් වියදණ්ඩ හැරදමා නොසිටියි. ''එවං'' ඒ වියදණ්ඩෙහි යෙදූ ගවයා; තමා හදුවූ ආජානෙය්‍ය වෘෂභයකු බැවින් ද, තමාගේ ධීරවීරතාවයෙන් ද තමාගේ බර නො ඉක්මවා අත් නොහැර සිටින්නාක් මෙන්, යමෙක් මහමුහුද ජලය ලැබීමෙන් තෘප්තිමත් වන්නාක් මෙන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවෙන් සතුටුවෙමින්, එය දරමින්, ඉන් පිරිපුන් වූ වාහු ද; ඔවුනු හීන වූ ප්‍රඥා ඇති නිහීනයන් ඉක්මවා නොසිතති. පරිභව නොකරති. ඊට හේතු මෙසේ දක්වයි. ''අරියධම්මො ච පාණිනං'' මේ සත්ත්වයන් අතර ඇති ආර්ය ධර්මයකි. ඒ ප්‍රඥාවේ පරතෙරට ගිය බැවින් ලාභලෝභාදියෙන් තමා උසස් කර, නොලැබීම් ආදියෙන් අනුන්ට අවමන් නොකරයි ද එය ආර්ය ධර්මයකි. මෙසේ ප්‍රඥාවේ පරතෙරට පත්, ආර්ය සුඛවිහරණ ය දක්වා අනතුරුව, ඉන් බැහැර වූ අනාර්ය දුක්ඛ විහරණය පිළිබඳව දැක්වීමට ''**කාලෙ**'' යන ගාථාව පැවසූහ. එහි ''**කාලෙ**'' ලාභ, අලාභයන්ගෙන් යුක්ත කාලයෙහි. ''**කාලවසං පත්තා**'' ලාභාදිය ලැබෙන කාලයේ මරු වසඟයට ගොස් ලාභාදියෙන් සොම්නස් වේ. අලාභාදියෙන් දොම්නස් වේ. ''භවාභව වසංගතා'' ඔවුනු වීම්, නොවීම් වසඟයට ගියාහු, වෘද්ධි හානියට පැමිණියාහු වෙති. ''**නරා දුක්ඛං නිගච්ඡන්ති, තෙධ සොචන්ති මානවා**'' ඒ මිනිස්සු, නරයෝ මානවයෝ යැයි නම් ලද සත්ත්වයෝ; ලාභ අලාභ ආදී වශයෙන්ද වෘද්ධි පරිහානි වශයෙන් ද අනුකූලත්වයට ද විරෝධයට ද පැමිණියා හු මෙලොවදීත් පරලොවදී ත් නිරායාදීයෙදීත් දුකට යති, පැමිණෙති. යන අර්ථයයි. ''**ඤාතා**'' යන ගාථාවෙන් ද ලෝකධර්ම වශයෙන් සත්‍යයන්ගේ අනර්ථයට පැමිණීමම දක්වයි. එහි ''**ඤාතා සුඛධම්මෙනා**'' සැප හේතුවෙන්, සුඛ ප්‍රත්‍යයෙන් භවභෝග සම්පත් ආදියෙන් උන්නතියට, මානයට ගියාහු; ''භෝගම දාදියෙන් මත්වූවාහු'' යන අර්ථයයි. ''**දුක්ඛධම්මෙන චොනතා**'' දුක් හේතුවෙන් , දුක් ප්‍රත්‍යයෙන්, භෝගවිපත්ති ආදියෙන් **නිහීන** බවට ගියාහු. දිළිඳුවීමෙන් නින්දිත, පිරිහෙන තත්ත්වයට පැමිණියාහු. ''**ඒවයෙන**'' ඉහතින් දැක්වූ පරිදි ඉහළ නැගීම්, පහත වැටීම් වශයෙන් ද ලාභ අලාභ වශයෙන් ද බාල පුහුදුන් මෝඩ පුද්ගලයෝ නැසෙති. අනුකූලත්ව, විරෝධ දැක්වීම් ආදියෙන් බාධාවෙති. පෙළෙති. කුමක් නිසාද ? **තත්ත්වාකාරයෙන්** ලෝකස්වභාවය නොදකින බැවිණි. ඔවුනු ධර්ම ස්වභාවය තත්ත්වාකාරයෙන් අවබෝධ කර නොගන්නා නාක්, පිරිසිඳ දතයුතු බව හෙවත් පරිඤ්ඤාත ස්කන්ධය ද කෙලෙස් ප්‍රහීණ **කිරීම** ද නොලබන හෙයිණි. ''යථාභූතං අදස්සනා'' යන පාඨය ද යෙදේ. '' නොදකින හෙයින්''

යන අර්ථයයි. ''යෙ ච දුක්ඛෙ සුඛසඤ්ඤං මඤ්ඤි සිඛිනිමඩ්ඩවගූ'' ආර්ය පුද්ගලයෝ දුක්වේදනාවෙහිත්, සැප වේදනාවෙහිත්, මැදහත් වේදනා වෙහිත්; ඒ වේදනාව සමඟ ප්‍රතිබද්ධ වූ ආශාව, තණ්හාව යන මූල හේතුව ආර්ය මාර්ගධිගමයෙන් ඉක්මවුහ. නැති කළහ, එනිසා ඔවුහු සුළඟින් නොසැලී සිටින ඉඳුබිලයන් මෙන් ලෝක ධර්මයන්ගෙන් නොසැලී, අකම්පිතව සිටිති. ඔවුහු උඩගු උන්නත බවට ද හීන අවනතියට ද කිසිකළෙකත් නොපැමිණෙති, සර්වප්‍රකාරයෙන් ම මිත්‍ර බව තරහ නැතිකළ බැවිණි. මෙසේ වේදනාධිෂ්ඨානයෙන් රහතන් වහන්සේගේ නො ඇලීම දක්වා, අනතුරුව ලෝකධර්මයන් බෙදා දක්වමින්, ඒ සෑම තැනක ම නොඇලෙන බව දක්වමින්, ''නහෙව'' යන ගාථාව වදාළහ. එහි ''ලාභෙ'' ච්චරාදී සිවුපසය ලැබීමෙහි. ''අලාභෙ'' ඒ සිවුපස ආදිය නොලැබීමෙ හි, ''අයසෙ'' පිරිවර හානිවීම, ''**කිත්තියා**'' ඉදිරියේ සිට ගුණ පැවසීම් වශයන් පැතිරුණු කීර්ති ඇති, ''**නින්දැයං**'' ඉදිරියේ සිට ගැරහීම, ''**පසංසාය**'' ප්‍රත්‍යක්ෂ වශයෙන් ම ඇති ගුණ වර්ණනා කිරීම, ''**දුක්ඛෙ**'' දුක උපන් කල්හි, ''**සුඛෙ**'' මෙහි ද මෙම න්‍යායමයි. සෑමතැනකම ඉහත දක්වූ අට වැදෑරුම් ලෝක ධර්මයන් හි, හෝ රූපාදී පංචාරම්මණයන් හි ඒ රහතන් වහන්සේලා නො ඇලෙති. සර්වප්‍රකාරයෙන් ම සෑම ක්ලේශයක් ම සිඳදැමූ බැවිණි. ඒ කෙසේ ද ? නෙළුම් පතෙහි දිය මෙණි. නෙළුම් කොළයේ ජල බිඳු නො ඇලී සිටින්නාක් මෙන් රහත්හු කාම ලෝක සම්පත්වල නො ඇලී සිටිති. නෙළුම් පතේ දියමෙන් ඒකාන්තයෙන් සැප සම්පත්වලින් වෙන් ව සිටිති.

මෙසේ රහතන් වහන්සේලාට ද ලාභාලාභ ආදී අටලෝදහම් පැමිණි විට ද රූපශබ්දා දී පංචාරම්මණ සිතට යොමු වූ විට ද ඉන් වෙන් ව සිටිති. එනිසා ම ඒ නුවණැති ධීරයෝ සෑමතැන්හි ලාභාදියෙහි ඤාණ සුඛයෙන් ද ප්‍රිය නිමිතිවල ශෝකාදිය නොමැතිවීමෙන් ද සුවපත් වූ සැපවිඳින්නෝ වෙති. ඔවුහු අභිභවනය, මැඬලිය නොහැකි හෙයින් සෑමතැන්හිම අපරාජිතයෝ ම වෙති. දැන් ලාභාලාභාදියෙහි ශ්‍රේෂ්ඨ බව වෙන්කර දක්වමින් ''ධම්මෙන'' යනාදිය පවසති. එහි ''ධම්මෙනව අලාභො යො'' නුවණින් කල්පනා කර දහම් රක්ෂා කරන්නාට, ඒ නිමිති කරගෙන අලාභයක්, ලාභයන්ගේ අභාවයක්, ලාභයන්ගේ පිරිහීමක් වෙද, එය අධාර්මිකව, අදහැමිව, නුසුදුසු බුදුරදුන් අගය නොකළ අයුරකින් උපන්නා වූ යම් ලාභයක් වේද, එයට වඩා ධාර්මිකව, යහපත්ව, සිදු වූ අලාභය ඉතා උතුම්ය. යම් ලාභයක් දුරුකරන්නාගේ, වර්ජනය කරන්නාගේ අකුසල දහම් පිරිහී, කුසල් දහම් වැඩේ ද එබදු දෙයකින් සිදුවන අලාභය යහපත ගෙනදේ. නුවණැත්තෝ පසසති. අර්ථවත්ය, ''**යඤ්චේව ලාභො අධම්මිකො**''

යම් ලාභයක් අධාර්මිකව උපන්නේ නම් එය ශ්‍රේෂ්ඨ නොවේ යන අදහසයි. **''යසො ච අපඤ්ඤදීනං විඤ්ඤූනං අයසො ච යො''** යම් අල්ප බුද්ධියෙන්, දුෂ්ප්‍රාඥ මෝඩයන්ගේ කීර්තියක්, යසසක් වේ ද; නුවණැති පඬිවරුන්ගේ අපකීර්තියක් අයසක් වේ; මේ දෙකින් නුවණැත්තන්ගේ අයස ලැබීම ම ශ්‍රේෂ්ඨ වේ. යමෙකුගේ සිතේ අකුසල් දහම් පිරිහී කුසල් දහම් වර්ධනය වේද එබඳු වූ යසභානිය හෙවත් අයස වුවත් කැමතිවිය යුතුයි. නුවණැති පුද්ගලයා ඒ අගුණ දුරුකර ගුණයෙහි පිහිටන්නේය. **''න යසො අපඤ්ඤදීනං''** මෝඩ, අනුවණයන්ගේ යසස උතුම් නොවේ. ඒ මෝඩ, අසත්පුරුෂයන් විසින් තමාතුල නොමැති (අභූත) ගුණ ප්‍රකට කිරීම් වශයෙන් උපදවා ගන්නා කීර්තිය (යසස), මෙලොවදීම නුවණැත්තන්ගේ ගැරහීමෙන් දුකට ද පරලොවදී දුගතිගාමීවීමෙන් දුක්, පිරිතැවීම්වලට ද පත්වන හෙයින් අනර්ථවත්ය. අවැඩ දායකය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේ එහෙයිනි. - ''ලාභ කීර්ති ප්‍රශංසා සත්කාර ආදිය වැරදි ආකාරයෙන් ලබාගත් යමෙක් වේද ඒ නින්දිත පුරුෂයා කීර්ති සත්කාර ආදියෙන්ම නැසේ.''

''දුම්මෙධිහි'' මෝඩයන්, ප්‍රඥාව නැත්තන් විසින් **''යඤ්ඤව බාලපසංසනා''** බාල, අනුවණයන් විසින් කරන ප්‍රශංසාව. **''කාමමයිකං''** වස්තුකාමමය වූ කාමගුණ නිසා උපදින **''දුක්ඛඤ්ඤව පවිවෙකිය''** ප්‍රකාර්ශ විවේකයෙන් හටගත් කය වෙහෙසවීම්, ක්ලාන්තවීම් වශයෙන් පවතින, විෂම ආහාරපානාදිය ගැනීමෙන් වන කායික දුක් ද නුවණැත්තෝ පසසන, අගයන් දුක්ඛයන් වේ. නිරාමිෂ වූ සසරින් මිදීම සඳහාම වූ දුක් බැවිණි. එනිසා **''පවිවෙකියං දුක්ඛං සෙය්‍යො''** යි කියන ලදී. **''ජීවිතඤ්ඤව අධමෙමන''** අධාර්මිකව ජීවිතය ගෙනයාම, ජීවත්වීමට අධාර්මික කටයුතු කිරීම. **''ධමෙමන මරණං''**, දහැමින් මැරීම නම් මෙවැනි පව්කම් කරමින් ජීවත්වීමට වඩා මැරෙන්නෙමි. දහැමින් මැරීමයි. කිසිවකු ගේ නියමයෙන් තමා මරණයට පත්වුවත් පව්කම් නොකර, ධර්මය විකෘති නොකර, දහම් නොනසා, ධර්ම හේතුවෙන් මරණයට පත්වීම ශ්‍රේෂ්ඨ වේ. එබඳු මරණය ධර්මයෙන් තොර නොවූ බැවින්, ධර්මයෙන් දිව්‍ය ලෝකයට පමුණුවන බැවින්, නිවණ උපකාරිවන බැවින් නුවණැත්තෝ අතිශයින් පසසති. ඒ සඳහා කියල ලදී.

''ධනංඤ්ඤවජෙ යො පන අංගහේතු
අංගං චජෙ ජීවිතං රක්ඛමානො,


අංගං ධනං ජීවිතං චාපි සබ්බං
චජේ නරෝ ධම්මමනුස්සරන්තෝ''

යමෙක් ශරීරයේ අංග ප්‍රත්‍යංග රැකගැනීමට ධනය අත්හරින්නේය. ශරීරාංග හැරදමා ජීවිතය රැකගන්නේ ය. ධර්මය සිහිකරන පුද්ගලයා ඒ ධර්මය නිසා සිය ධනය, අංග, ජීවිතය යන සියල්ලම අත්හරින්නේය. ''**යඤ්ච ජීවෙ අධම්මියං**'', යම් පුරුෂයෙක් ධර්මයෙන් වෙන්ව ජීවිතය ගෙනයන්නේ නම් ඔහු ඇසුරු නොකරන්න. ණුවණැත්තන්ගේ ගැරහීම ද අපායට පැමිණීම ද සිදුවන බැවිණි. දැන් ඉහත දැක් වූ පරිදි රහතන් වහන්සේලාගේ නො ඇල්මට හේතු දක්වමින් ''**කාමකොපපහීණා**'' යන ගාථාව වදාළහ. එහි ''**කාමකොප පහීණා**'' යනු ආර්ය මර්ගයෙන් සර්වප්‍රකාරයෙන් ම ප්‍රහීණ කළ ඇලීම්, ගැටීම් ඇති, ශාන්ත වූ සිත් ඇති ''භවාභවෙ'' ඉතා කුඩා වූ ද ඉතා මහත් වූ ද භව ප්‍රහීණ කරන ලද, කෙලෙස් පිරිනැවීමේ දාහයන් නොමැති හෙයින් සන්සුන් සිතැති ''ලොකෙ'' ස්කන්ධ දී ලෝකයෙහි ''අසිතා'' තණ්හා, දෘෂ්ඨි ආශ්‍රය නොකරන හෙයින් අනිශ්‍රිත වූ. **නත්ථි තෙසං පියා ජ්‍ජියං**'' ඒ රහතන් වහන්සේලාගේ සිත්වල කිසිදු ලාභා දී දහමක හෝ රූපාදී අරමුණක හෝ ප්‍රිය, අප්‍රියභාවයට හේතුව කෙලෙස් ධර්ම සර්වප්‍රකාරයෙන් ම මුලිනුපුටා දැමූ බැවිණි. මෙසේ ''යම් භාවනාවකින්, යමක් වැඩීමෙන් ඒ ආර්යයෝ මෙබඳු ස්වරූප ඇත්තෝ වුහ'' යි දක්වා, අනතුරුව දේශනාවේ කූට ප්‍රාප්තිය ගනිමින් අනුපාදිසේස නිර්වාණ ධාතුව විදහා දක්වමින් ''**භාවයිත්වාන**'' යන අවසන් ගාථාව වදාළහ. එහි ''**පපුය්‍ය**'' පැමිණ සෙසු පදයන්ගේ අර්ථ ඉහතින් විස්තර කළ පරිදිම දත යුතුයි. මෙම ගාථාවන් ම ගෝදත්ත තෙරුන් වහන්සේගේ රහත්බව ප්‍රකාශ කරන ගාථා ද විය.

ගෝදත්ත ථේරගාථා අර්ථ වර්ණනාව නිමියේය.

දහ හතරවෙනි නිපාතයේ ගාථා අර්ථ වර්ණනාව සමාප්තයි.

භදන්තාචරිය ධම්මපාල තෙරුන් වහන්සේ විසින් ලියන ලද
පරමත්ථදීපනී නම් වූ ථේරගාථාඨ්‍ය කථාවේ I සිංහල පරිවර්තනය
රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමි වන මවිසින්
රචනා කරන ලදී.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිංහළටයකරා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234
ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ISBN 978-955-1604-11-0